පාලි අට්ඨකථා සිංහල පරිවර්තන - 46

භදන්තාචරිය උපසේන ස්ථවිර පාදයන් විසින් විරචිත

සද්ධම්මපජ්ජෝතිකා නම් වූ
මහා නිද්දෙසට්ඨ කථා
(සිංහල පරිවර්තනය)

සිංහල පරිවර්තනය

බෙලිඅත්ත නිහිළුව සිරිධම්මානන්ද පිරිවෙන්පති
රාජකීය පණ්ඩිත, ශාස්ත්‍රපති, ත්‍රිපිටකාචාර්ය

පූජ්‍ය හත්තොටුවේ ඉන්දරතන හිමි

රාජකීය පණ්ඩිත, ශාස්ත්‍රපති, ත්‍රිපිටකාචාර්ය,
බී.ඒ. ගෞ. පේරාදෙණිය - එම්.ඒ. කැළණිය

අධීක්ෂණය

ශාස්ත්‍රාචාර්ය හේමචන්ද්‍ර දිසානායක මහතා
ශාස්ත්‍රපති මැදඋයන්ගොඩ විජයකිත්ති හිමි

ප්‍රකාශනය

බෞද්ධ සංස්කෘතික මධ්‍යස්ථානය
125, ඇන්ඩර්සන් පාර, නැදිමාල, දෙහිවල.
දුරකථන: 2734256 ෆැක්ස්: 2736737

භදන්තාචරිය බුද්ධඝෝෂ ස්ථවිර පාදයන් විසින් විරචිත

සද්ධම්මපජ්ජෝතිකා නම් වූ
මහා නිද්දෙසට්ඨ කථා

(සිංහල පරිවර්තනය)

ප්‍රථම මුද්‍රණය 2008

I S B N - 978-955-1604-41-7

පරිගණක අකුරුකරණය

උපමාලි කුලසේකර - කටුගස්තොට.

පිටකවරය

සුසිල් ජයශාන්ත පෙරේරා - මහරගම.

මුද්‍රණය

අජිත් ප්‍රින්ටර්ස් (ප්‍රයිවට්) ලිමිටඩ්

342, පරණ කැස්බෑව පාර, රත්තනපිටිය, බොරලැස්ගමුව.

දුරකථනය: 0112517269

ප්‍රකාශනය

බෞද්ධ සංස්කෘතික මධ්‍යස්ථානය

125, ඇන්ඩර්සන් පාර, නැදිමාල, දෙහිවල.

දුරකථන: 2734256, 2728468, 2726234 ෆැක්ස්: 2736737

විද්‍යුත් තැපෑල: bcc456@sltnet.lk

www.buddhistcc.com

ප්‍රස්තාවනා (අට්ඨකථා)

පාළි භාෂාව මධ්‍යතන ඉන්දු ආර්ය පූර්ව අවධියට අයත් ප්‍රාකෘත විශේෂයක් බවත්, එම ප්‍රාකෘතය වූ කලී එකල උත්තර භාරතයේ ඒ ඒ ප්‍රදේශවල පැවති පොදු ජනයාගේ කථා ව්‍යවහාරය බවත්, පිළිගත් විද්වත් මතයයි. ප්‍රාකෘත ව්‍යවහාරය පොදු ජනතාවගේ හා ශ්‍රමණ සම්ප්‍රදාය ගරු කළ චින්තකයන්ගේ ද භාෂා මාධ්‍යය විය. එය උත්තර භාරතයේ පැතිරී ගිය ඉන්දු යුරෝපීය භාෂා ව්‍යවහාරයෙන් ජනිත වූවක් සේ සැලකිය යුතුය. මෙම ප්‍රාකෘත ව්‍යවහාරයේ ලිඛිත සාධක අනුව මූල අවස්ථාවක් සේ පෙනෙන පාළි භාෂාව උත්තර භාරතයේ කිසියම් විශේෂ ප්‍රදේශයක කථා ව්‍යවහාරයේ මාධ්‍යයක් විය.

1. පාළි භාෂාව ක්‍රි.පූ. 6 වැනි 7 වැනි සියවස්වල කොසොල් රට පැවති කථා ව්‍යවහාරය පදනම් කොට ඇති වූවෙකැයි ද එය නොයෙක් ජනපදවල ජනයාගේ පොදු භාෂා මාධ්‍යය වී යැයි ද මහාචාර්ය රීස් ඩේවිඩ්ස් තුමා පවසයි.

2. පාළිය උජ්ජයිනී ප්‍රදේශයේ භාෂාව යැයි වෙස්ටර් ගාඩ් සහ ඊ කුන් සහ ඔටෝ ප්‍රොන්කේ වැනි විචාරකයෝ පවසති.

3. පාළිය මගධයේ කථා ව්‍යවහාරයයි යන බුද්ධඝෝෂ හිමියන්ගේ මතය මහාචාර්ය ගෛගර් තුමා අනුමත කරයි.

4. බුදුරජාණන් වහන්සේ මුලදී කොසොල් රට බසින් දහම් දෙසන්නට ඇතැයි සලකන වින්ටර්නීට්ස් පාළි ත්‍රිපිටකයේ භාෂාව පැරණි මගධ ව්‍යවහාරය බව පදනම් කොට වෙනත් ප්‍රදේශ ව්‍යවහාරයන්ගේ සම්මිශ්‍රණයද ඇතිව ගොඩනැගුණු බෞද්ධයන්ගේ සාහිත්‍යයික භාෂාවකැයි පවසයි.

5. බුදුන් වහන්සේ ධර්ම ප්‍රචාරයේ යෙදුණු පන්සාළිස් වසින් වැඩි කොටසක් කොසොල් මගධ ප්‍රදේශවල සැරිසැරූ බව බෞද්ධ සාහිත්‍යයේ පෙනෙන බැවින් පාළි භාෂාව කොසොල් මගධ දෙරට

කථා ව්‍යවහාරය පදනම් කොටගෙන බිහි වූවාක් සේ සැලකීමට පුළුවන් බව ඊ කුන් නම් විචාරකයා පෙන්වා දෙයි.

මෙම විග්‍රහයන් ශාස්ත්‍රීය වශයෙන් වැදගත් වන අතර විශේෂයෙන් සැලකිය යුත්තේ බුදුන් වහන්සේගේ මතයයි. බුදුරජාණන් වහන්සේ දක්වා වදාළ ආකල්ප විග්‍රහ වන්නේ මජ්ඣිම නිකායේ අරණ විභංග සූත්‍රයෙනි. මෙම සූත්‍රයෙන් පෙන්වන්නේ උන්වහන්සේ භාෂා මාධ්‍යයෙහි අනවශ්‍ය ලෙස දැඩිව එල්බ ගත් ශාස්තෘවරයෙකු නොවන බවයි. එකම දෙය විවිධ ජනපදවල නාම කීපයකින් හඳුන්වනු ලබන කල ඒ එක නාමයක් දැඩිව අල්ලා නොගෙන ඒ ඒ ලෙසට ව්‍යවහාර කළ යුතු බවත් ලෝක ව්‍යවහාරය නොඉක්මවිය යුතු බවත් අරණ විභංග සූත්‍රයෙහි උගැන්වෙයි.

බුද්ධ පරිනිර්වාණයෙන් පසුව ත්‍රිපිටකය සංගීත වූ භාෂාව වන පාළි භාෂාව ථේරවාදීන්ගේ ආගමික භාෂාව විය. එය සමස්ත ත්‍රිපිටකය පුරා රැඳී ගියේය. ථේරවාදීන්ගෙන් බිඳී ගිය මහායානිකයෝ බුද්ධ ධර්මය සංස්කෘතයට පෙරළා ගත්හ. ඔවුන්ගේ සංස්කෘත සාහිත්‍යය දියුණුවීමත් මුස්ලිම් ආක්‍රමණ වැනි ආක්‍රමණත් මහායානික දර්ශනය විශ්ව විද්‍යාල මගින් රට මුළුල්ලෙහි බෙදා හැරීමත්, මහායානිකයන් ආමිස පූජා යන්ත්‍ර, මන්ත්‍ර ආදියෙන් පෘථග්ජන ප්‍රසාදය දිනාගැනීමත්, භික්ෂු විනය නීති ලිහිල් ලෙස මහායානිකයන් විසින් සකස් කිරීමත් ආදිය නිසා බුද්ධ ධර්මයත් පාළි භාෂාවත් බුද්ධජන්මභූමියෙන් අතුරුදහන් විය. එය ශ්‍රී ලංකාදීපයේ තහවුරු විය.

හෙළඅටුවා

සම්බුද්ධ පරිනිර්වාණයෙන් දෙසිය පන්තිස් වැන්නෙහි අශෝක අධිරාජයාගේ දායකත්වයෙන් පැලලුප් නුවරදී තුන්වන සංගායනාව පැවැත්වීය. මොග්ගලීපුත්තතිස්ස මහ රහතන් වහන්සේගේ ප්‍රධානත්වයෙන් රහතන් වහන්සේලා දාහක් සම්බන්ධ වෙමින් මෙම සංගායනාව පවත්වා ඇත. සාහස්සිකා නමින් හඳුන්වන මෙම සංගායනාව නව මසකින් සම්පූර්ණ විය.

තෘතිය සංගායනාවසානයේ දඹදිව ථේරවාදාචරිය පරම්පරාවේ අවසන් පුරුෂයා වූ මොග්ගලීපුත්තතිස්ස මහ රහතන් වහන්සේගේ ශිෂ්‍ය

මිහිඳු මහ රහතන් වහන්සේ විසින් තෘතීය සංගායනාවේදී තෝරා බේරා ගෙන සංග්‍රහ කළ, ථේරවාදී ත්‍රිපිටකය ශ්‍රී ලංකාවට ගෙන එන ලදි. මිහිඳු හිමියන් විසින් ලක්දිවට ගෙන එන ලද පාළි ත්‍රිපිටකය මහා අරිට්ඨ රහතන් වහන්සේ ප්‍රමුඛ කොට ඇති සිංහල භික්ෂූන් වහන්සේලා උගත්හ. පාළියෙන් තිබූ ත්‍රිපිටකයේ ගැටලු තැන් සිංහල ජනතාවට පැහැදිළි කර දීම අවශ්‍ය විය. බුද්ධ කාලයේ සිට වාචනා මාර්ගයෙන්, ආචාර්ය පරම්පරා වලින් පැවත ආ අර්ථ විවරණ ක්‍රම මිහිඳු හිමියන්ගෙන් සිංහල භික්ෂූන් වහන්සේලා උගෙන ත්‍රිපිටකයේ ගැටලු තැන් හෙළ බසින් අරුත් විවරණය කළහ. හෙළටුවා නමින් මේවා හඳුන්වයි.

අටුවා වනාහි ත්‍රිපිටකයට අයත් පොත් වලට ලියා ඇති ව්‍යාඛ්‍යාන සංග්‍රහ සමූහයයි. අටුවාවල පරමාර්ථය පෙළෙහි ඇති දුරවබෝධ වචන සහ ධර්මයේ ගැඹුරු තැන් විස්තර කිරීමත් අවශ්‍ය තැන්වලදී විස්තරාර්ථ සැපයීමත්ය. මෙම පරමාර්ථයෙන් ලියන ලද හෙළටුවා නම්,

මහා අට්ඨකථා
කුරුන්දි අට්ඨකථා
පච්චරිය අට්ඨකථා නම් වේ.

හෙළ අටුවා අතුරින් ප්‍රමුඛ ස්ථානය දැරුවේ මහා අට්ඨකථාව හෙවත් මූල අට්ඨ කථාවයි. බුද්ධඝෝෂ හිමියන්ගේ අට්ඨ කථා සියල්ලටම පාහේ ශරීරය කරගෙන ඇත්තේ මෙම අටුවාවයි. තුන් පිටකයටම අයත් අට්ඨ කථාවන්හි මහා අට්ඨකථාව ගැන සඳහන් වන බැවින් එය තුන්පිටකයම අළලා සකස් වුනු හෙළටුවාවක් වශයෙන් සැලකිය හැකිය. වස්තු විෂය අතින් සෙසු හෙළටුවාවන්ට වඩා පරිපූර්ණ වී තිබුණ මහා අට්ඨකථාවේ ලක්දිව සිදුවූ දේ පිළිබඳව බොහෝ වෘතාන්ත ද සඳහන්ව තිබුණ බව සිතා ගත හැකිය.

මහා පච්චරිය අට්ඨකථාවට එම නම ලැබුනේ පච්චරියක් හෙවත් පහුරක් උඩදී එය ලියන ලද බැවිනි. කුරුන්දිවේලු විහාරයේදී ලියන ලද හෙයින් කුරුන්දි අටුවා නම් විය.

මෙම ප්‍රධාන හෙළටුවාවන්ට අමතරව තවත් අටුවා කීපයක් දක්නට ඇත. අන්ධ අට්ඨකථාව එයින් එකකි. දකුණු ඉන්දියාවේ කාඤ්චිපුර

(කොන්ජිවරම්) යෙහි පැවති අටුවාවයි. ඒය ආන්ධ්‍රා භාෂාවෙන් ලියා ඇතැයි සැලකේ.

බුද්ධඝෝෂ හිමි

දඹදිව බෝමැඩට නුදුරු ඝෝෂ නම් ග්‍රාමයේ බමුණු කුලයක උපත ලද බුද්ධඝෝෂ වාදයෙහි දක්ෂ වූ රේවත නම් මහා තෙරපාණන් වෙත පැවිදි වූ බව ප්‍රචලිත මතයයි. බුද්ධඝෝෂ මහාබෝධී මණ්ඩපයට දකුණුදිග බමුණුගම උපන් බව සද්ධම්මසංගහ නම් පොතෙහි සඳහන් වේ. බෝමැඩට නුදුරෙහි ඝෝෂ නම් වූ ගමේ උපන් බව බුද්ධඝෝසුප්පත්ති නම් කථාවේ ද සඳහන් වේ. මෙවැනි විවිධ කරුණු විමංශනයෙන් පසුව බුද්ධඝෝෂ ජන්ම භූමිය මොරණ්ඩඛේටක නම් ගම බව පිළිගෙන ඇත. ආන්ධ්‍ර දේශයේ ගුන්ටූර් දිස්ත්‍රික්කයේ පාල්නාඩ් තලුන් පෙදෙසේ "කෝටනේමලී පුරිගුන්ඩ්ලු පල්ලි" යන ලඟ පිහිටි ගම් දෙක මොරන්ඩඛේටක යැයි පැවසේ. උන්වහන්සේ උපන් පෙදෙස මොරන්ඩඛේටක යැයි විසුද්ධි මග්ගයෙන් පෙනේ. මජ්ඣිමනිකායට්ඨ කථාවේ කර්තෘ සංදර්ශක ගාථාවක මයුර සුත්ත පට්ඨන හෝ මයුර රූප පට්ඨන සඳහන් වන බැවින් එතුමා එහි විසූ බව ද සිතිය හැකිය.

ව්‍යාකරණ විෂයෙහි ද දර්ශන ශාස්ත්‍රයෙහි ද වෛදික ග්‍රන්ථ විෂයෙහි ද ඉතිහාස පුරාවිද්‍යා විෂයෙහිද කාය ව්‍යවච්ඡේද විද්‍යාවන් හීද ලක්ෂණ ශාස්ත්‍රයෙහිද පැතිරී ගිය බුද්ධි ප්‍රභාවයක් එතුමා කෙරෙහි පැවති බව පැහැදිලිය. බුද්ධඝෝෂ හිමියන් ලංකාවට පැමිණීමට පෙර ඤාණෝදය නම් ධර්ම ප්‍රකරණයත් අත්ථසාලිනී අටුවාවත් දඹදිව දී කළ බවද සඳහන්ය. බුද්ධෝඝෝෂ හිමියන් කලින් සර්වාස්ති වාදියෙකුව සිට පසුව ථේරවාදී වූ බව ඇතැම් විචාරකයන්ගේ පිළිගැනීමයි.

බුද්ධඝෝෂ හිමියන් ලක්දිවට පැමිණියේ අනුරාධපුරය රාජධානිය කරගත් මහානාම රජ දවසය. බුද්ධවර්ෂ 953-975 අතර කාලයේය. උන්වහන්සේ ලංකාවට වඩින විට අට්ඨකථා සංහිතා කීපයක්ම මේ දිවයිනේ පැවති බවත් ඒවා හෙළ බසින්ම උගත් බවත් මෙයින් සමහරක් ග්‍රන්ථ ස්වරූපයෙන්ද සමහරක් පූර්වාචාරීන්ගේ මතවාද ඇතුලත් වුන සාහිත්‍යය වශයෙන්ද පැවති බවත්' ආචාර්ය අදිකාරම් මහතා පවසයි.

මිහිඳු හිමියන් දවසම ආරම්භ වූ සිංහල අටුවා කථා වසර 700ක පමණ කාලයක් සිංහල ත්‍රිපිටකය හෙළි පෙහෙළි කරමින් පැවතියහ. ත්‍රිපිටක පාළියට සිංහල අටුවා ලියා ඇති බව දඹදිව විසූ රේවත හිමියන්ද දැන ගැනීමෙන් සිංහල අටුවා පාළියට පරිවර්තනය කිරීම, බුදුදහම චිරස්ථායී වීමට හේතුවක් යැයි උන්වහන්සේ ද සලකා හෙළටුවා පාළියට පරිවර්තනය කිරීම සඳහා බුද්ධඝෝෂ හිමියන් ලක්දිවට එවන්න ඇතැයි සැලකිය හැකිය.

බුද්ධඝෝෂ හිමියන් මෙහි පැමිණ බුදුන් වදාල දෙලක්ෂ පන්සැත්තෑ දහස් දෙසියපනස් ග්‍රන්ථ සංඛ්‍යාවක් ඇති ආගමයට තුන්ලක්ෂ එක්සැට්දහස් සත්සියපනස් ග්‍රන්ථ සංඛ්‍යාවක් පමණ අටුවා කථා ලියා ආගමයෙහි පහන් නැගූ සේකැයි දත යුතු යැයි පූජාවලියේ සඳහන්ව තිබේ.

සංස්කාරකයෙකු හා අනුවාදයකු වශයෙන් බුද්ධඝෝෂ හිමියන්ගේ කාර්යය වූයේ තමන් ඉදිරියෙහි වූ හෙළටුවාවන්හි අන්තර්ගත වූ විවරණ වෙනස් කිරීම නොව, ඒවා සකස් කිරීම සහ අවශ්‍ය ස්ථාන පිඬු කරමින්, අවශ්‍ය ස්ථාන විස්තරාර්ථ දක්වමින්, විධිමත්ව සුගමව පාළි භාෂාවට නැගීමයි. බුද්ධඝෝෂ හිමියන්ට අට්ඨකථා සකස් කරන්නට මහාවිහාරයෙන් ඉඩ ලැබී ඇත්තේ මහාවිහාර වාචනා 'මාර්ගයට විරුද්ධ මත ඒවායේ ඇතුලත් නොවිය යුතුය' යන කොන්දේසිය ද සහිතවය.

"මහා අට්ඨකථාව ශරීරය කොටගෙන මහාපච්චරිය කුරුන්දි ආදී විශ්‍රැතඅර්ථ කථාවන්හි යම් විනිශ්චයක් වේද එහි යුක්තාර්ත සහ ඇතුලත් වන්නා වූ ස්ථවිර වාදයද අත්නොහරිමින් සංවර්ධනය හොඳින් ආරම්භ කරන්නෙමු."

තව ද එම අර්ථ කථාවලින් භාෂාන්තරය පමණක් අත්හැර විස්තර තැන් පිඬුකොට සියලුම විනිශ්චයන් ඇතුලත් කොට කිසිම තන්හි යුත් අත් නොඉක්මවා සංවර්ණනය කරන්නෙමු යි බුදුගොස් හිමියෝ පවසති.

බුද්ධඝෝෂ හිමියන් විසින් කරන ලද අට්ඨකථා සියල්ලම මිහිඳු මාහිමියන් විසින් ලක්දිවට ගෙන එන ලදුව මහා විහාරිකයන් විසින් ආරක්ෂා කරනු ලැබූ හෙළටුවාවන්හි පාළි අනුවාද බවත් මහා අට්ඨකථාවේ සාරය ගෙන පාළි අට්ඨකථා රචිත බවත් මෙම අට්ඨකථාවල සඳහන් වේ.

මේ අනුව බුදුගොස් හිමියන්ගේ කාර්යය වූයේ බුදුසමය පිළිබඳව අමුතුවෙන් පොත් ලිවීම නොව එතෙක් හෙළටුවාවන්හි ආ කරුණු විධිමත්ව හා සුගමව පාළි භාෂාවට නැගීම වෙයි. පාළි අටුවා පොත්වලින් අඩකටත් වඩා සපයා ඇත්තේ බුදුගොස් හිමියන් විසිනි. බෞද්ධ අට්ඨකථාචාරීන් අතුරෙන් එතුමා ශ්‍රේෂ්ඨතමයායි. එතුමාගේ ජීවන චරිතය වටා විවිධ ජනප්‍රවාද ගෙතී ඇත්තේ ඒ නිසාමය. එතුමා මෙලොව පහළ වූයේ බුදුන්ගේ පර්යාප්ති ශාසනය දීර්ඝ කාලයක් නිර්මලව පවත්වාගෙන යාම සඳහා පාළි අට්ඨකථා ලිවීමටමය යන ජන ජනප්‍රවාදයක් ද ඇත.

අටුවා විස්තරය

විනය පිටකය

	පෙළ	අටුවාව	කර්තෘ	කාලය
උභය විභංග	1 පාරාජිකා පාලි	1 ආණා දෙසනා සමන්තපාසාදිකා	බුද්ධඝෝෂ හිමි	5වන ශ.ව.
	2 පාචිත්තිය පාළි	2 යථාපරාධ සාසන විනය අට්ඨකථා		
ඛන්ධක	3 චුල්ල වග්ග පාළි	3 සංවරාසංවර කථා		
	4 මහාවග්ග පාළි			
පරිවාර	5 පරිවාර පාළි			
		භික්ඛුපාතිමොක්ඛ කඞ්ඛා විතරණී	බුද්ධඝෝෂ හිමි	5වන ශ.ව.
		භික්ඛුණී පාතිමොක්ඛ (මාතිකඨ කථා)		

අභිධර්ම පිටකය

1 ධම්මසංගණිප්පකරණ	1 පරමත්ථ දේසනා	අත්ථසාලිනී	බුද්ධඝෝෂ හිමි	5වන ශ.ව.
2 විභංගප්පකරණ	2 යථාධම්ම සාසන	සම්මොහ විනොදනී	බුද්ධඝෝෂ හිමි	5වන ශ.ව.
	3 නාමරූප පරිච්ඡේද කථා			
3 කථාවත්තුප්පකරණ			බුද්ධඝෝෂ හිමි	5වන ශ.ව.
4 පුද්ගලපඤ්ඤත්තිප්පකරණ				
5 ධාතුකථාප්පකරණ		පරමත්ථදීපනී		
6 යමකප්පකරණ		පඤ්චප්පකරණට්ඨකථා		
7 පට්ඨානප්පකරණ				

සූත්‍ර පිටකය

1 දීඝනිකාය	1 වොහාරා දේශනා	සුමංගල විලාසිනී	බුද්ධඝෝෂ හිමි 5වන ශ.ව.
2 මජ්ඣිමනිකාය	2 යථානුලෝමසාසන	පපඤ්ච සූදනී	බුද්ධඝෝෂ හිමි 5වන ශ.ව.
3 සංයුක්තනිකාය	3 දිට්ඨි විනිවෙඨන කථා	සාරත්ථප්පකාසිනි	බුද්ධඝෝෂ හිමි 5වන ශ.ව.
4 අංගුත්තරනිකාය		මනෝරථපූරණී	බුද්ධඝෝෂ හිමි 5වන ශ.ව.
5 බුද්දක නිකාය			
1 බුද්දකපාඨ	පරමත්ථ ජෝතිකා		බුද්ධඝෝෂ හිමි 5වන ශ.ව.
2 ධම්මපද	ධම්මපදට්ඨ කථා		බුද්ධඝෝෂ හිමි 5වන ශ.ව.
3 උදාන	පරමත්ථ දීපනී		ධම්මපාල ආචාර්ය 5වන ශ.ව.
4 ඉතිවුත්තක	පරමත්ථ දීපනී		ධම්මපාල ආචාර්ය 5වන ශ.ව.
5 සුත්තනිපාත	පරමත්ථ ජෝතිකා		බුද්ධඝෝෂ හිමි 5වන ශ.ව.
6 විමානවත්ථු	පරමත්ථ දීපනී		ධම්මපාල ආචාර්ය 5වන ශ.ව.
7 පේත වත්ථු	පරමත්ථ දීපනී		ධම්මපාල ආචාර්ය 5වන ශ.ව.
8 ථේර ගාථා	පරමත්ථ දීපනී		ධම්මපාල ආචාර්ය 5වන ශ.ව.
9 ථෙරී ගාථා	පරමත්ථ දීපනී		ධම්මපාල ආචාර්ය 5වන ශ.ව.
10 ජාතක	ජාතකට්ඨකථා		බුද්ධඝෝෂ හිමි 5වන ශ.ව.
11 නිද්දේස (චුල්ල-මහා)	සද්ධම්ම ජෝතිකා		උපසේන ආචාර්ය 6වන ශ.ව.
12 අපදාන (ථේර-ථෙරී)	විසුද්ධ ජන විලාසනී		මහානාම ආචාර්ය 7වන ශ.ව.
13 පටිසම්භිදා මග්ග	සද්ධම්මප්පකාසිනී		ධම්මපාල ආචාර්ය 5වන ශ.ව.
14 බුද්ධවංස	මධුරත්ථප්පකාසිනි		බුද්ධදත්ත හිමි 5වන ශ.ව.
15 චරියාපිටක	පරමත්ථ දීපනී		ධම්මපාල ආචාර්ය 5වන ශ.ව.
	විසුද්ධි මග්ග		බුද්ධඝෝෂ හිමි 5වන ශ.ව.
නෙත්තිප්පකරණ	නෙත්තී අට්ඨකථා		ධර්මපාල ආචාර්ය 5වන ශ.ව.
චතුභාණවාරපාළි	චතුභාණවාර අට්ඨකථා		ආනන්ද වනරතන 8වන ශ.ව.

බුද්ධඝෝෂ හිමියන් විසින් පාළියට නොනගන ලද අට්ඨ කථා පාලියට නගන ලද්දේ බුද්ධදත්ත ධම්මපාල උපසේන සහ මහානාම තෙරවරුන් විසින්ය.

බුද්ධදත්ත හිමි

බුද්ධඝෝෂ හිමියන්ගේ සමකාලීනයෙකි. මධුරත්ථ විලාසිනි නම් බුද්ධවංශ අටුවාව උන්වහන්සේ ලියා ඇත.

උපසේන හිමි

සද්ධම්මජෝතිකා නම් නිද්දේශ අට්ඨකථාව මහාපරිවේනවාසී උපසේන හිමියන් විසින් කරන ලදි.

මහානාම හිමි

පටිසම්භිදාමග්ග අට්ඨකථාව වන සද්ධම්මප්පකාසනිය මුන්වහන්සේ විසින් ලියන ලදී.

ධම්මපාල හිමි

පරමත්ථදීපනී අට්ඨකථා - උදාන - ඉතිවුත්තක - විමානවත්ථු - පේතවත්ථු - ථෙර ථෙරී ගාථා අට්ඨකථා මුන්වහන්සේ ලියන ලදී.

මෙම අට්ඨකථාවන් උගෙන ඒවා ආරක්ෂා කළ අය අට්ඨකථීකා නමින් හඳුන්වා ඇත. අට්ඨකථාචරියා යනු අට්ඨකථා සම්පාදනය කළ ආචාර්යවරයෝය. ආචරිය වාද, ආචරිය මත, ආචරිය වාද යන නම්වලින් කියවෙන්නේ අට්ඨකථාවන් මැයි.

අට්ඨකථාවන් පිළිබඳ විවිධ විවේචන හා මතවාද උගතුන් අතර පවතී. මෑතකාලීන වියතුන් අතුරින් අග්ගමහාපණ්ඩිත පොල්වත්තේ බුද්ධදත්ත හිමියෝ එවැනි විවේචකයෙකි. උන්වහන්සේගේ අටුවා පරීක්ෂණ නම් පොතෙන් එවැනි විවේචන ඉදිරිපත් කර ඇත. අටුවාකථා බුදුන් වහන්සේගේ දේශනා නොවන බව කවුරුත් පිළිගනිති. අටුවාචාරීන් වහන්සේලා අතරද විවිධ මතභේද තිබූ බව දක්නට ඇත. වසර හත්අට සියයක් ගෙන ආ ලිඛිතව නොතිබූ අර්ථ කථා සාහිත්‍යයට එවැනි දේ ඇතුළත් වන්නට පහසුකම් තිබේ. මිහිඳු හිමියන් විසින් ගෙන එන ලද පාළි විවරණ මහාවිහාරික භික්ෂූන් විසින් සිංහලට පරිවර්තනය කොට එම හෙළටුවා පස්වන සියවසේ බුද්ධඝෝෂ හිමියන් විසින් නැවත පාළි භාෂාවට පරිවර්තනය කළ බව පිළිගත් සම්ප්‍රදායයි. මේ තැන්වලදී එම මතිමතාන්තර ඇතුළත් වන්නට ඇති බව සිතිය යුතුය.

මහාවිහාරීය සම්ප්‍රදාය එකකි. අභයගිරි ජේතවන පරම්පරා හිද එවැනි සම්ප්‍රදායන් පැවතුණු බවට සැකයක් නැත. ස්වකීය පාරම්පරික මතවලට පටහැනි සූත්‍ර ධර්මයන් පෙළෙහි ඇති බව දැන දැනත් සිය මතය

තහවුරු කරනු සඳහා ඒවා මදකිනිදු වෙනස් නොකර, ඉවත් නොකර, සංගායනාවලදී පැවති තත්ත්වයෙන්ම ත්‍රිපිටකය රැකගෙන ඒම ගැන මහාවිහාරීය පරම්පරාවට බෞද්ධයාගේ ප්‍රණාම පූර්වක ගෞරවය හිමිවිය යුතුය.

මේ අන්දමින් පැවතගෙන ආ අට්ඨකථා අපේ හාමුදුරුවරු තවත් වර්ෂ සිය ගණනක් තම ආරාමවල පොත්ගුල්වල තබා පුස්තකාලවල තැන්පත්කොට උදේ සවස සුවඳ දුම් අල්ලා ධර්ම ගෞරවයෙන් ධර්ම රත්නය රැකගෙන ආහ. අනගාරික ධර්මපාලතුමාගේ ජාතික ආගමික වැඩපිළිවෙළ ආරම්භ වීමෙන් පසුව එතුමාගේම පවුලේ නෑයන් විසින් අට්ඨකථා මුද්‍රණය කිරීමේ වැඩපිළිවෙළ ආරම්භ කර ඇත. ඒ ධර්මපාලතුමා විසින් ඇතිකරන ලද ආගමික ප්‍රබෝධයේ එක් ආභාෂයකි. 1916 ජූලි 05 දින ත්‍රිපිටක මුද්‍රණසභා නම් ආයතනයක් සයිමන් ඇලෙක්සැන්ඩර් හේවාවිතාරණ මහතුන්ගේ මැදහත්වීමෙන් කොල්ලුපිටියේ පාම් හවුස්හි පිහිටුවා ඇත. 1929 ජුනි 29 දින මෙම ත්‍රිපිටක සභාවේ රැස්වීමක් කොළඹ ධික්මන් පාරේ තක්සලාහිදී පවත්වා තිබේ. මෙම රැස්වීමට අති පූජ්‍ය හික්කඩුවේ ශ්‍රී සුමංගල මහා නාහිමියන්ද, රත්මලානේ ශ්‍රී ධම්මානන්ද ධර්මාලෝක නායක හිමියන්ද ප්‍රධාන පණ්ඩිත ධර්මධර භික්ෂූන් වහන්සේලා 25 නමක් සහභාගී වූ බව සඳහන් වේ. අනගාරික ධර්මපාලතුමා ප්‍රධාන සාසනමාමක පිරිස්ද මෙම රැස්වීමට සහභාගී වී ඇත. මෙම නායක පණ්ඩිත ස්වාමීන් වහන්සේලා එක් එක් අටුවා ග්‍රන්ථ සංස්කරණය භාරගත් බවද සඳහන් වේ.

සවිමන් හේවාවිතාරණ මහතාගේ අභාවයෙන් පසුව සෝමලතා හේවාවිතාරණ ළමාතැනී විසින් ත්‍රිපිටක මුද්‍රණය සඳහා අරමුදල පිහිටුවීය. එම අරමුදල මගින් හේවාවිතාරණ අට්ඨකථා ග්‍රන්ථ සමූහය මුද්‍රණය කර ඇත. ආගම ධර්මය, ඉතිහාසය, පුරාවිද්‍යාව, සාහිත්‍යය ආදී ශ්‍රී ලංකා සංස්කරණ විවිධ ක්ෂේත්‍රයන් පර්යේෂණාත්මක අධ්‍යයනවලට යොමු කරමින් ශාස්ත්‍රීය පොතපත සපයා සංස්කෘතිය පිළිබඳව අවබෝධයක් ජනතාවට ලබාදීමේ අරමුණින් 1845 දී ආරම්භ කළ ශ්‍රී ලංකා රාජකීය ආසියාතික සමිතියේ සිංහල අට්ඨකථා සිංහලට පරිවර්තනය කිරීමේ ව්‍යාපෘතිය මගින් පොත් දහයක් මුද්‍රණය කිරීම මහඟු කාර්යයකි.

අභාවයට යන පැරණි බෞද්ධ පොත්පත් හා අලුතින් ලියැවෙන බෞද්ධ පොත්පත් මුද්‍රණය කරවීමත් ඉංග්‍රීසි බෞද්ධ පොත්පත් සිංහලට

පරිවර්තනය කර මුද්‍රණය කිරීමත් පරපුරෙන් පරපුරට බුද්ධ ධර්මය ගෙන යාමත් බෞද්ධ සංස්කෘතියේ ආරක්ෂාවත් සඳහා පිහිටුවා ඇති අප ආයතනය වන බෞද්ධ සංස්කෘතික මධ්‍යස්ථානය මගින් බුද්ධ ජයන්ති ත්‍රිපිටකයේ පුනර්මුද්‍රණය නිමවීමෙන් පසු අට්ඨකථා සිංහලට පරිවර්තනය කොට මුද්‍රණය කිරීමට ප්‍රතිපත්ති සකස් කරන ලදී. සිංහලෙන් මුද්‍රණය අවසන් කොට අටුවා කථා ඉංග්‍රීසියට පරිවර්තනය කර මුද්‍රණය කිරීම අපේ අදහසයි.

"කථා පවත්තිනී" නම් පාඨයක් ත්‍රිපිටකයේ අංගුත්තර නිකායේ සඳහන් වෙයි. ධර්මදේශකයා පෙළත් අටුවාවත් දනී නම් දහම් අසන්නා පෙළත් අටුවාවත් දනී නම් දහම් දෙසන්නාත් අසන්නාත් දෙදෙනාම පෙළත් අටුවාවත් දනීනම් එම ධර්ම දේශනාව සාර්ථක දේශනාවක් වන බව මෙහි සාමාන්‍ය අදහසයි. තථාගත ධර්මය වඩාත් ප්‍රකට වීම විවෘත වීම එහි පැවැත්මට හා උත්තරීතර භාවයට හේතුවන බව සඳහන්ය. මෙම කරුණු පිළිබඳ විමසිලිමත් වනවිට අට්ඨකථා පරිවර්තනයේ හා මුද්‍රණයේ අවශ්‍යතාව වඩාත් පැහැදිලි වන්නේය. එයට අමතරව විශ්ව විද්‍යාලවල පාළි හා බෞද්ධ අධ්‍යයනාංශවල උසස් අධ්‍යාපනය ලබන ශිෂ්‍යයන්ට විෂය නිර්දේශානුකූල අට්ඨකථාවල සිංහල පරිවර්තන නොමැතිකමේ බාධාවද, එම ගුරු ශිෂ්‍ය දෙපිරිසටම මේ මගින් දුරු කිරීමද අපේ පරමාර්ථයකි.

අපගේ ඉල්ලීමද පූජ්‍ය රාජකීය පණ්ඩිත වැළමිටියාවේ කුසලධම්ම නාහිමියන්ගේ අනුශාසනාවද අනුව අටුවා කථා සිංහලට පරිවර්තනය කර මුද්‍රණය කරවීමේ භාරදූර කර්තව්‍යය ශ්‍රී ලංකා ජනරජයේ වර්තමාන ආගමික අමාත්‍යාංශය මගින් ඉතාම කෙටි කාලයක් තුළ අවසන් කිරීම සඳහා අපට පවරන ලදි. බුද්ධ ජයන්ති ත්‍රිපිටක පුනර් මුද්‍රණය මගින් අප දැක්වූ ආදර්ශයත් ගොඩනැගූ විශ්වාසයත් මෙයට හේතු වූ බව නිසැකය. මෙම කාර්යය අපට පැවරීම පිළිබඳව ශ්‍රී ලංකා ජනරජයේ ගරු ජනාධිපතිතුමන්ට, ගරු අගමැතිතුමන්ට, ගරු බුද්ධශාසන නියෝජ්‍ය ඇමතිතුමන්ට, ආගමික අමාත්‍යාංශයේ ලේකම් මහතාට සහ අමරහේවා මද්දුම මහතාට ද අපේ කෘතඥතාවය, පුණ්‍යානුමෝදනාපූර්වකව පළකරමු.

අටුවා පරිවර්තනයේදී ආමිෂ ලාභයම නොව ශාසනික සේවයම සලකා එක් එක් පොත භාරගෙන මැනවින් සිංහලට පරිවර්තනය කරදුන් පණ්ඩිත ස්වාමීන් වහන්සේලාට ද, උගත් ගිහි මහතුන්ට ද අපගේ

කෘතඥතාව හිමිවේ. සිංහල අටුවා පරිවර්තන සමීක්ෂණය කළ උගත් ගිහි පැවිදි දෙපිරිසටම අපගේ කෘතඥතාව හිමිවේ.

අටුවා කථා පරිවර්තන කාර්යය සම්බන්ධීකරණය කරමින් කටයුතු කළේ විජිතනන්ද සරත්චන්ද්‍ර මහතාය. එම ග්‍රන්ථාවලිය මුද්‍රණය කරවීමේ කාර්යය භාරවූයේ අප ආයතනයේ මුද්‍රණ කටයුතු අධ්‍යක්ෂ පාලිත ලියනගේ මහතාටය. මෙම මහත්වරු දෙපළම ඉතා උනන්දුවෙන් මෙම කටයුතුවල නියැලීම පිළිබඳව එම මහත්වරුන්ටද මාගේ කෘතඥතාවය පළවේ. මෙයට අමතරව මෙම කාර්යයට හොඳහිතින් අවංකව සහාය දුන් සියලු දෙනාටම පින් පුරවමින් ආසිරි පතමිහ.

මෙයට,

ශාසනස්ථිතිකාමී,

කිරම විමලජෝති ස්ථවිර,
අධ්‍යක්ෂක, බෞද්ධ සංස්කෘතික මධ්‍යස්ථානය,
නැදිමාල, දෙහිවල.

බෞද්ධ සංස්කෘතික මධ්‍යස්ථානයේ අට්ඨකථා පරිවර්තක මණ්ඩලය

පූජ්‍ය රාජකීය පණ්ඩිත ආඳාවල දේවසිරි නායක මාහිමිපාණන් වහන්සේ
පූජ්‍ය රාජකීය පණ්ඩිත යාලේගම චන්දකිත්ති හිමිපාණන් වහන්සේ
පූජ්‍ය රාජකීය පණ්ඩිත මැදඋයන්ගොඩ විජයකිත්ති හිමිපාණන් වහන්සේ
පූජ්‍ය රාජකීය පණ්ඩිත වටගෙදර විමලබුද්ධි හිමිපාණන් වහන්සේ
පූජ්‍ය රාජකීය පණ්ඩිත විදුරුපොල ආනන්ද හිමිපාණන් වහන්සේ
පූජ්‍ය රාජකීය පණ්ඩිත හත්තොටුවේ ඉන්දරතන හිමිපාණන් වහන්සේ
පූජ්‍ය රාජකීය පණ්ඩිත පල්ලේගම සමිත හිමිපාණන් වහන්සේ
පූජ්‍ය රාජකීය පණ්ඩිත මාවනානේ සෝමින්ද හිමිපාණන් වහන්සේ
පූජ්‍ය රාජකීය පණ්ඩිත බලපිටියේ සිරිසීවලී හිමිපාණන් වහන්සේ
පූජ්‍ය රාජකීය පණ්ඩිත මැදගම්පිටියේ විජිතධම්ම හිමිපාණන් වහන්සේ
පූජ්‍ය රාජකීය පණ්ඩිත පන්නල සුමේධ හිමිපාණන් වහන්සේ

රාජකීය පණ්ඩිත	කීර්ති නාරම්පනාව මහතා
ශාස්ත්‍රවේදී	ඇන්.එච්. පෙරේරා මහතා
පණ්ඩිත	ජේ.පී. නිමල්ලාල් රංජිත් මහතා
පණ්ඩිත	ටී.ජී. ජයතිලක මහතා
පණ්ඩිත	ඒ.ඇම්.ඩී.වයි. සරත්චන්ද්‍ර අමරතුංග මහතා
පණ්ඩිත	බී.ඇම්.පී. බාලසූරිය මහතා
පණ්ඩිත	සෝමරත්න ගම්ලත් වෙලගෙදර මහතා
පණ්ඩිත	දයා ගුණසේකර මහතා
පණ්ඩිත	ඩබ්ලිව්. ඇල්.පී. ධර්මදාස මහතා
පණ්ඩිත	ජිනදාස ගොඩකන්ද මහතා
පණ්ඩිත	පී.ඇල්.කේ. පෙරේරා මහතා

සම්බන්ධීකරණය:- විජිතනන්ද සරත්චන්ද්‍ර මහතා

බෞද්ධ සංස්කෘතික මධ්‍යස්ථානයේ අට්ඨකථා පරිවර්තක සමීක්ෂණ මණ්ඩලය

1. පූජ්‍ය මැදගම්පිටියේ විජිතධම්ම හිමිපාණන් වහන්සේ
(පේරාදෙණිය ශ්‍රී ලංකා විශ්වවිද්‍යාලයේ කථිකාචාර්ය)
2. පූජ්‍ය කොටියාගල උපරතන හිමිපාණන් වහන්සේ
(කැලණිය විශ්වවිද්‍යාලයේ කථිකාචාර්ය)
3. පූජ්‍ය මැදඋයන්ගොඩ විජයකිත්ති හිමිපාණන් වහන්සේ. (ශාස්ත්‍රපති)
4. පූජ්‍ය ඇස්වත්තේ රේවත හිමිපාණන් වහන්සේ. (ශාස්ත්‍රපති)
5. හේමචන්ද්‍ර දිසානායක මහතා. (ශාස්ත්‍රවේදී)
6. පණ්ඩිත දයා ගුණසේකර මහතා (රාජ්‍ය භාෂා දෙපාර්තමේන්තුව)
7. පණ්ඩිත ඒ ලසිත් නලන්ත මහතා (රාජ්‍ය භාෂා දෙපාර්තමේන්තුව)
8. පණ්ඩිත සිරිමෙවන් සේනක මහතා (ශාස්ත්‍රවේදී)
9. අභිධර්මාචාර්ය බුද්ධික විජේසිංහ මහතා (ශාස්ත්‍රවේදී-විද්‍යාවේදී)

සංඥාපනය

යො පබ්බජී ජාතිසතානි පඤ්ච
පහාය කාමානි මනොරමානි
තං වීතරාගං සුසමාහිතින්ද්‍රියං
පරිනිබ්බුතං වන්දථසාරිපුත්තකං

යමෙක් ආත්මභාව පන්සීයක දී මනරම් වූ සුඛෝපභෝගී ගිහි කාම සම්පත් හැර දමා පැවිදි වීද, ඒ වීතරාගී වූ, දැමුණු ඉඳුරන් ඇත්තා වූ පිරිනිවියා වූ අනුබුදු සාරිපුත්‍ර මහතෙරුන් වහන්සේට වැඳ නමස්කාර කරවූ.

බෞද්ධ ථෙරවාදී සම්ප්‍රදායේ එන ත්‍රිපිටකයෙහි සූත්‍ර පිටකයට අයත් කෙරෙන බුද්දක නිකාය සඳහා සාමාන්‍ය පිළිගැනීම අනුව ග්‍රන්ථ පහළොවක් අයත් කෙරේ. එම ග්‍රන්ථ මාලාවේ එකොළොස්වන ග්‍රන්ථය 'නිද්දේස' නම් වේ. එය මහා නිද්දේස හා චූල නිද්දේස යනුවෙන් කොටස් දෙකකින් සංග්‍රහ වී ඇත. බුද්දක නිකායේ පස්වන ග්‍රන්ථය ලෙස දැක්වෙන සුත්ත නිපාතය මුල්කාලීන බුද්ධ දේශනාවන් ඇතුලත් කෘතියකි. මේ සුත්තනිපාතයේ එන අට්ඨක වග්ගයේ සඳහන් ගාථා සඳහා නිද්දේස සපයමින් 'මහා නිද්දේසය' ද පාරායන වග්ගයට හා ඛග්ග විසාණ සූත්‍රයට නිද්දේස සපයමින් 'චූල නිද්දේසය' ද රචනා වී ඇත.

වරක් අප අමාමැණී බුදුපියාණන් වහන්සේ **සාරිපුත්තෙනා භික්ඛවෙ, මයා පවත්තිතං ධම්මචක්කං අනුප්පවත්තෙතබ්බං** යනුවෙන් තමන්වහන්සේ විසින් දේශිත ධර්මචක්‍රය අනුප්‍රවර්තනය කිරීමට දම්සෙනෙවි සැරියුත් මහ රහතන් වහන්සේම දක්ෂ වන බව වදාළ සේක. භදන්තාචරිය උපසේන මහා අටුවාචාර්ය මාහිමියෝ මහා නිද්දේසය දේශනා කළේ කවරෙකු විසින් දැයි දක්වමින් මෙසේ පැවසූහ.

'සාරිපුත්තෙනා මහා පඤ්ඤා - සත්ථුකප්පෙපා ජිනත්‍රජෝ
ධම්මචක්කං විභාජෙත්වා - මහා නිද්දෙස මධුවී' තී.

ඒ බුද්ධවර්ණිත මහ නුවණැති අනුබුදු මහා සාරිපුත්‍ර තෙරණුවෝ ම ධර්මවක්‍රය විභාග කරමින්, විශිෂ්ට පාඨ නිර්දේශිත මහා නිද්දේස පාළිය වදාළහ. චූල නිද්දේසය ද වදාළේ උන්වහන්සේම ය.

එසේ දේශිත 'නිද්දේස පාළිය' ප්‍රථම ධර්ම සංගායනාවේදී මැනවින් සංග්‍රහ කරන ලදුව මුඛ පරම්පරාවෙන් රැගෙන ආ ථෙරවාදී මහා ස්ථවිර පරම්පරාව මගින් ඊට අටුවාවක් ද සංග්‍රහ කරන ලදී. මෙසේ පරපුරින් පරපුරට රැගෙන ආ නිද්දේස පාළිය හා අටුවාව අශෝක මහාධිරාජයාගේ දවස අනුබුදු මිහිඳු මාහිමියන් විසින් ශ්‍රී ලංකාවට ගෙන වැඩියහ. අප ලංකාද්වීපයේ පහළ වූ අරිට්ඨාදී සිංහල මහා තෙරවරු නිද්දේස පාළිය පාළි බසින් ද එහි අටුවාව සිංහල බසින් ද සංග්‍රහ කරමින් කටපාඩමින් ම පවත්වාගෙන පැමිණියහ. මෙසේ නිද්දේස පාළිය සඳහා 'නිද්දේස හෙළටුවාව' මහා විහාරයේදී ම සංග්‍රහ වූ අතර පසුව එය ලියා තබන්නට ඇත. අභයගිරි, ජේතවන නිකාය ඇතිවූ පසුව 'නිද්දේස හෙළටුවා' තත් විහාරස්ථානවල ද වෙන වෙනම ලියැවිණි. ඒ මහාවිහාරික මතයට පටහැනි වූ ස්වාධීන විචාරශීලී අදහස් හා අර්ථ විවරණ සහිතවයි.

වළගම්බා රජ දවස පැමිණි බැමිණිතියා මහා සාගතය කාලයේදී මේ දක්වා කටපාඩමින් ගෙන ආ 'නිද්දේස පාළිය' ධාරණය කරගෙන සිටියෝ එක් දුශ්ශීල වයෝවෘද්ධ භික්ෂූන් වහන්සේ කෙනෙකි. මහා තෙපිටක තෙරණුවෝ ග්‍රහණ ධාරණයෙහි නිපුණ රක්ඛිත තෙරුන් සමග එකට හිඳිමින්, ඒ දුශ්ශීල භික්ෂුවගෙන් 'නිද්දේස පාළිය' නොම හදාළාහු නම් අපට මහා නිද්දේස හා චූල නිද්දේස යන පෙළ ග්‍රන්ථ දෙකම නොලැබී යනු ඇත. එසේ අපමණ කැපකිරීම් මධ්‍යයේ සිංහල මහ තෙරවරු නිද්දේස පෙළත් එහි අර්ථ හෙළ බසින් ලියූ 'නිද්දේස හෙළටුවාවනුත්' පරපුරින් පරපුරට පිරිසිදුව රැගෙන ආ අතර ක්‍රි.ව. පස්වන සියවසේ දී මෙතෙක් හෙළබසින් තිබූ ථෙරවාදී අට්ඨකථා පාලි බසට (ජාත්‍යන්තර බසකට) නැගීමේ මනා ලෝකශාසනික අත්‍යුදාර සේවාව ඇරඹිණි. ඒ මහා අටුවාචාර්ය බුද්ධඝෝෂ මාහිමියන්ගේ ප්‍රධානත්වයෙනි.

පළමු අග්‍රබෝධි නාමයෙන් වසර 34 ක් රාජ්‍ය කරවූ සිරිනිවාස සිරි සංඝබෝධි රජතුමාගේ අභිෂේකයෙන් විසිහය (26) වන වසරේ දී අනුරපුර මහා විහාර විශ්වවිද්‍යාලයානුබද්ධ මහා චේතියට බටහිරින් වූ

කිත්තිසේන (භත්තිසේන) නම් ඇමතියා කරවූ මාහ පිරිවෙන්පති ධුරන්ධර, මහා ප්‍රාඥ වූ උපසේන භදන්තාචරිය මාහිමිපාණන් වහන්සේ විසින් උක්ත මහා විහාරීය නිද්දේස හෙළටුවාව මූලාශ්‍ර කරගනිමින් මහාට්ඨකථාවාදී සෙසු හෙළටුවාත්, අභයගිරික හා ජේතවනික විශ්වවිද්‍යාලයන්හි ලියවූ තිබූ නිද්දේස හෙළටුවාත් එක්රැස් කර සද්ධම්ම පජ්ජොතිකා නාම මහා නිද්දෙසට්ඨ කථා ව මහා නිද්දේස පාළිය සඳහා වූ අටුවා ලෙස ලියන ලදී. පසුව උන්වහන්සේ ඊටම බද්ධ කෙරෙමින් සද්ධම්මපජ්ජොතිකා නාම චූල නිද්දෙසට්ඨ කථාව ද ලියූහ. මෙසේ නිද්දේස පාළිය සඳහා 'පුබ්බට්ඨ කථාව' නමින් උපසේන මාහිමියන් හඳුන්වාදෙන මහා හෙළටුවාවට අමතරව තවත් ත්‍රෛනිකායික විද්‍යාස්ථානයන්හි වූ හෙළටුවා රැසක් භාවිත කරමින් 'සද්ධම්මපජ්ජොතිකා' නමින් පාලි අට්ඨකථාව සංග්‍රහ කර ඇත. පූජ්‍ය බොරුග්ගමුවේ රේවත මාහිමිපාණන් වහන්සේ පවසනුයේ අනුරපුරයේ රජකළ මහානාග රජුගේ සෝයුරකු වූ උක්ත උපසේන මාහිමියන් විසින් නිද්දේසට්ඨකථාව මෙන්ම කර්තෘ අඥාත වූ බව පැවසෙන අපදානට්ඨ කථාව ද රචනා කළ බවයි. (මහා නිද්දේසට්ඨ කථා - හේවා වී. 1921 - iv පිටුව)

ඉන්දියාවේ පවා ප්‍රචලිත මහත් කීර්තියක් දැරූ මහා විහාරික විද්‍යාස්ථානයක අධිපති වූ උපසේන මාහිමියන් වහන්සේ විසින් පාලි බසට පරිවර්තිත මහා නිද්දේස හා චූල නිද්දේස අටුවාව සඳහා 'ශ්‍රී සද්ධර්මය ප්‍රකාශනය කිරීමේ, ප්‍රකට කිරීමේ හා විදහා දැක්වීමේ මහා ප්‍රදීපයක් (පජ්ජෝත) වන බැවින් සද්ධම්මපජ්ජොතිකා යන නාමය තබන ලදී.

මෙසේ පාලියෙන් රචනා වූ 'සද්ධම්මපජ්ජොතිකාව' ලංකාවේ මෙන්ම බුරුම සියම් රටවල ද බෙහෙවින් ප්‍රචලිත වූ කල්හි, ඊට මූලාධාර වූ (මූලාශ්‍ර වූ) හෙළටුවා අභාවිතව පසුව නැත්තට ම නැතිවිය. එංගලන්ත පාලි පොත් සමාගමෙන් ද බුරුම-සියම් රටවල ද ලංකාවේ ද සද්ධම්ම පජ්ජොතිකා පුස්කොළ පොත් ආශ්‍රයෙන් සංශෝධිත ග්‍රන්ථ මුද්‍රණයෙන් පළ කළ අතර, ඒ සියලු ග්‍රන්ථ ආශ්‍රය කරමින් 1921 වර්ෂයේ දී චාර්ලිස් අල්විස් හේවාවිතාරණ මහතාගේ ආරාධනාවෙන් කොළඹ, නුගේගොඩ,ශ්‍රී සුභද්‍රාරාම පිරිවෙන් වැසි ආචාර්ය බෝරුක්ගමුවේ ශ්‍රී රේවත මහා ස්ථවිරපාදයන් විසින් 'භදන්තා චරිය උපසේනත්‍ථෙරවර විරචිතා සද්ධම්ම

පජ්ජොතිකා නාම මහා 'නිද්දේසට්ඨකථා' නම් ග්‍රන්ථය සංස්කරණය කරන ලදී. එම පොත ආශ්‍රයෙන් කොළඹ, දෙහිවල, බෞද්ධ සංස්කෘතික මධ්‍යස්ථානාධිපති පූජ්‍යපාද කිරම විමලජෝති මාහිමිපාණන් වහන්සේ ගේ බෙලිඅත්ත, නිහිලුව, හ/සිරි ධම්මානන්ද මූලික පිරිවෙන්පති රාජකීය පණ්ඩිත හත්තොටුවේ ඉන්දරතන හිමි නම් වන මවිසින් මෙම සිංහල පරිවර්තනය සිදුකරන ලදී.

මහා නිද්දේසට්ඨකථාවේ විශේෂතා

සෙසු පාලි අටුවාවන්ට වඩා අර්ථ, ව්‍යඤ්ජනාදී වශයෙන් දෝෂ බහුල පුස්කොළ පොත් ආශ්‍රයෙන් සංස්කරණය කරගත් මහා නිද්දේසට්ඨකථාව මෙන්ම එහි පෙළ ද විවිධ පරස්පරතාවලින් යුතු බව වියත්හු පිළිගනිති. උදාහරණයක් ලෙස මහානිද්දේසට්ඨකථාවේ 'සතතසස සුද්ධිං ඉධ පණ්ඩිතාසෙ' යනුවෙන් (254 පිටුව) දැක්වෙන ගාථා පාඨය මහානිද්දේස පාළි බු.ජ.ත්‍රි. මුද්‍රණයේ (382 පිටුව) 'යකඛසස සුද්ධිං ඉධ පණ්ඩිතාසෙ' යනුවෙන් දක්නට ඇත. අටුවාවේ යෙදූ 'සතතසස' යන්න පෙළෙහි 'යකඛසස' ලෙස යෙදී ඇති බව මේ අනුව පැහැදිලි වේ. මෙවැනි අර්ථ-ව්‍යඤ්ජන පරස්පරතාවලින් යුතු වුවත් මහා නිද්දේසට්ඨකථාව ධර්මදේශකයන්ට, ඉතිහාස ගවේෂකයන්ට, වාග් කෝෂ සාදන්නන්ට මෙන්ම ධර්ම ශාස්ත්‍ර ගවේෂකයන්ට ද ඉතා ප්‍රයෝජනවත් මූලාශ්‍ර ග්‍රන්ථයකි.

ධම්මපදට්ඨ කථාවේ අස්ථිර සිත පිළිබඳ විවරණයේ දී 'අසුපිට තැබූ කොමඩු ගෙඩියක් මෙන් ද දහයියා ගොඩක සිටුවා ලූ කණුවක් මෙන් ද මුඩු හිසෙක තැබූ කොලොම් මලක් මෙන් ද (චිත්ත වග්ග - 6 ගාථා විවරණය) යනුවෙන් අස්ථිර-වැනෙන-සෙලවෙන බව දක්වන උපමා තුනක් දැක්වේ. මහානිද්දේසට්ඨකථාවේ මේ අර්ථයෙන්ම මෙම උපමා තුන දැක්වෙනුයේ මෙසේ ය. (230 සහ 320 පිටු) 'එකො පුගගලො හලිද්දිරාගො විය ථුසරාසිමහි නිබාතබාණු විය අසසපිටෙථ ඨපිතකුමහණඩ මිව ච න ඨිතකථො හොති' මෙහි අසුපිට තැබූ කොමඩු ගෙඩියක් මෙන්, දහයියා ගොඩක සිටුවූ කණුවක් මෙන් යන උපමා දෙක නිද්දේසට්ඨකථාවේ ද එසේම දැක්වෙන නමුත් 'මුඩු හිසක තැබූ කොලොම් මලක් මෙන්' යන උපමාව දක්නට නැත. ඒ වෙනුවට ඇත්තේ 'හලිද්දිරාගො විය' යන උපමාවයි. මෙය සිංහලයට නැගීමේදී ගැටලුවක් මතු විය. 'හලිදදා' හෝ 'හලිද්දි' යනුවෙන් 'කහ අල' අදහස් වන බව පොල්වත්තේ

බුද්ධදත්ත හිමියන්ගේ පාලි-සිංහල අකාරාදියේ දැක්වේ. 'හලිද්දිරාග' යන්නට T.W. Rhys Davids මහතාගේ 'Pali-English Dictionary යේ like the colour of turmeric යනුවෙන් කහපාට මෙන් යනුවෙන් දැක්වේ. ඒ අනුව කහ දියරයක්, කහ කුඩක් මෙන් යන අර්ථ ඇත. ඉංග්‍රීසි කහපාට හැඳින්වීමට වෙනම වචනයක් ඇති බැවින් turmeric යනු කුළුබඩු අතර එන 'කහ' නම් ඖෂධය විය යුතුය. වියලි කහපාට රෙද්දක තදින් පිහිටන බැවින් මෙහිදී 'අමු කහපාට මෙන්' යන අර්ථය ගත්තෙමි.

සාමාන්‍යයෙන් ආහාරේ පටික්කුල සංඥාව සඳහා සෙසු අටුවාවන්හි අපට හමුවනුයේ පුත්තමංස උපමාව පමණි. නමුත් මහා නිද්දේසට්ඨකථාවේ 'සාකටිකස්ස අක්ඛ අබ්භඤ්ජන උපමං ච කුට්ඨබ්‍යාධිනො වණානං පටිච්ඡාදන තෙල පිලොතික උපමං ච යනුවෙන් පුත්ත මංසූපමාවට අමතරව තවත් උපමා දෙකක් දක්නට ලැබේ. බුද්ධකාලීනව තිබූ අජ ව්‍රත, ගෝ ව්‍රත, කුක්කුර ව්‍රත ඉතා ප්‍රකටය. අස්ස ව්‍රත හා හත්ථී ව්‍රත ද අත්‍යකිලමථානුයෝගීන් විසින් භාවිත වූ බව මහා නිද්දේසට්ඨ කථාව ද තහවුරු කරයි. (154 පිටුව)

සිත්ගන්නා සුලු නිරුක්ති කථන ද මහා නිද්දේසට්ඨ කථාවේ බහුලව හමුවේ. මමායතීති මාතා, පියායතීති පිතා, භජතීති භාතා, පුං තායති රක්ඛතීති පුත්තො (182 පිටුව) යනාදී විසිතුරු පද නිරුක්ති සිංහලට නැගීමේ දී නියම අර්ථ ප්‍රකට වේද යන්න සැකයකි.

සෙසු අටුවාවන්හි විස්තර කළ විවරණ මහා නිද්දේසට්ඨ කථාවේ ඉතා සංක්ෂිප්තව පැවසෙන අවස්ථා ද හමුවේ. 'අසංසග්ග කථා' යන්නට අටුවා සපයන මජ්ඣිම නිකායට්ඨ කථාව (II භාගය - 119-121 පිටු) සංසර්ග පහ දක්වා ඒ එකිනෙක විස්තර කරයි. නමුත් මහා නිද්දේසට්ඨ කථාව සංසර්ග පහ නම් වශයෙන් පමණක් දක්වා ඉතා සංක්ෂිප්ත විස්තරයක් දක්වයි. අසුවල් අටුවාව බලන්න යැයි පවසන සෙසු අටුවාචාරීන්ගේ ග්‍රන්ථ ලාඝව උපක්‍රමය ද මෙහිදී අභාවිත බව පෙනේ.

විශුද්ධි මාර්ගයේ මෙන්ම 'භගවා' ආදී පද විස්තර කරන මුත් පාඨකයා විශුද්ධි මාර්ගයට යොමු නොකරයි. නමුත් විශුද්ධි මාර්ගයට පාඨකයා යොමුකරන අවස්ථා ද මහා නිද්දේසට්ඨ කථාවේ ඇත.

පෙළට වැඩි අර්ථකථන දීමේ හැකියාව අනුව උපසේන හිමියන්ගේ මහා පාණ්ඩිත්‍යය වටහාගත හැකිය. මහානිද්දේස පාළියේ 'ගැබ්නැසෙන කාරණා' දෙකක් පමණක් දැක්වේ. 'පාණකෙහි වා වාතකුපෙපහි වා' යනු එම කරුණු දෙකයි. මහානිද්දේසට්ඨ කථාවේ ගැබ් නැසෙන හේතු තුනක් දැක්වේ. 'වාතෙන වා පාණකෙහි වා කමෙමන වා' යනු එම කරුණු තුනයි. මේ සඳහා කර්මවාදී අදහස් හා දර්ශන උපසේන හිමියන්ට බලපාන්නට ඇත.

මහා නිද්දේසට්ඨ කථාව පාලි අටුවා අතර ඉතා ගැඹුරු, දුෂ්කර පද බාහුල්‍යජනයන්ගෙන් ආකුල වූවකි. මහානිද්දේස පාළිය ද පොදු ජනයාගෙන් බැහැර වූ උගතුන්ට පමණක් සීමා වූ පෙළ පොතකි. මෙනිසා මහා නිද්දේසට්ඨකථාව සිංහලට නැගීමට මා වැනි ළදරුවෙකු හට ඉතා අමාරු කාර්යයකි. නමුත් පැවරුණු වගකීම කෙසේ හෝ ශක්ති ප්‍රමාණයෙන් ඉටුකළෙමි. මෙම පරිවර්තනය අධීක්ෂණය කළ ගාල්ල, බෝපෙ, වටරක පාරේ, අංක 4/3 පදිංචි හේමචන්ද්‍ර දිසානායක මහතා මා පරිවර්තනය කළ සාවද්‍ය කොටස් නැවත ලියා දීම ඉතා ඇගයිය යුතු ක්‍රියාවකි. ඒ සත්පුරුෂ ආශ්‍රය මෙන්ම මාතර, පහළ පීක්වැල්ල පඤ්ඤාරාමාධිපති විචිත්‍රභාණී මහෝපාධ්‍යාය උෆරුමුත්තේ සෝමරතනාභිධාන මාතර පළාතේ ප්‍රධාන සංඝනායක මාහිමියන්ගෙන් සහ සහෝදර පැවිදි ශිෂ්‍ය පිරිසෙනුත්, බෙලිඅත්ත, නිහිලුව, ශ්‍රී අශ්වත්ථාරාමාධිපති විෂ වෛද්‍ය ශූරී පූජ්‍යපාද තාරාපේරියේ සෝරත හිමිපාණන් ඇතුළු සහෝදර ආචාර්ය මණ්ඩලයෙන් හා ශිෂ්‍ය හිමිවරුන්ගෙනුත් ලද සත්පුරුෂ උපකාර ද පුණ්‍යානුමෝදනා පූර්වකව සිහිපත් කරමි.

හත්තොටුවේ ඉන්දරතන හිමි

පටුන

පිටු අංකය

1.	කාම සූත්‍ර නිර්දේශ වර්ණනා	1
2.	ගුහට්ඨක සූත්‍ර නිර්දේශ වර්ණනා	107
3.	දුට්ඨට්ඨක සූත්‍ර නිර්දේශ වර්ණනා	217
4.	සුට්ඨට්ඨක සූත්‍ර නිර්දේශ වර්ණනා	240
5.	පරමට්ඨකසූත්‍ර නිර්දේශ වර්ණනා	267
6.	ජරා සූත්‍ර නිර්දේශ වර්ණනා	273
7.	තිස්සමෙත්තෙය්‍ය සූත්‍ර නිර්දේශ වර්ණනා	286
8.	පසුර සූත්‍ර නිර්දේශ වර්ණනා	307
9.	මාගන්දිය සූත්‍ර නිර්දේශ වර්ණනා	325
10.	පුරාභේද සූත්‍ර නිර්දේශ වර්ණනා	336
11.	කලහ විවාද සූත්‍ර නිර්දේශ වර්ණනා	373
12.	චූල වියූහ සූත්‍ර නිර්දේශ වර්ණනා	382
13.	මහා වියූහ සූත්‍ර නිර්දේශ වර්ණනා	387
14.	තුවටක සූත්‍ර නිර්දේශ වර්ණනා	394
15.	අත්තදණ්ඩ සූත්‍ර නිර්දේශ වර්ණනා	445
16.	සාරිපුත්ත සූත්‍ර නිර්දේශ වර්ණනා	458

සද්ධම්මපජ්ජොතිකා නම් වූ

මහානිද්දෙසට්ඨ කථා

(සිංහල පරිවර්තනය)

නමෝ තස්ස භගවතෝ අරහතෝ සම්මා සම්බුද්ධස්ස

ඒ භාග්‍යවත් වූ අර්හත් වූ සම්මා සම්බුදුරජාණන් වහන්සේට
නමස්කාර වේවා !

අවිජ්ජාලඞ්ගිං සාටෙනෙතා නන්දිරාගඤ්චව මූලතෝ
භාමෙනනට්ඨඞ්ගිකං මගගං ඵුසී යෝ අමතං පදං

අවිද්‍යා නමැති අගුලද නන්දිරාග තෘෂ්ණාවද මුලින්ම ගලවා දමා, ආර්ය අෂ්ටාංගික මාර්ගය වඩමින්, යම් කෙනෙක් තුමූ අමෘත පද සංඛ්‍යාත නිර්වාණය ස්පර්ශ කළාහුද,

පාපුණිත්වා ජිනෝ බොධිං මිගදායං විගාහිය
ධම්මචක්කං පවත්තෙත්වා ථෙර කොණ්ඩඤ්ඤ මාදිතෝ

(ඒ ජිනයන්) බුදුරජාණන් වහන්සේ බුද්ධත්වයට පැමිණ (ඉක්බිති) මිගදායයට වැඩමවා, දම්සක් දෙසුම් පවත්වා, එහි කොණ්ඩඤ්ඤ තෙරුන් ප්‍රමුඛ කොට.

අට්ඨාරසන්නං කොටීනං බොධෙසි පිතාමහෙ තහිං
වන්දෙහං සිරසා තඤ්චව සබ්බසත්තානා මුත්තමං

අටළොස් කෙළෙක (කෙලක් පමණ වූ) බ්‍රහ්මයන්ට ධර්මාවබෝධය කරවූවහුද, සියලු සත්ත්වයනට වඩා උතුම් වූ ඒ බුදුරජාණන් වහන්සේ සිරස නමා වඳිමි.

තථා ධම්මුත්තමඤ්ඤේවව සංඝඤ්ඤවාපි අනුත්තරං
සංඛිත්තෙන හියෝ වුත්තං ධම්මචක්කං වවිභාගසෝ

එසේම උතුම් වූ ධර්මයද, අනුත්තර වූ (ශ්‍රාවක) සංඝයාද (වඳිමි.) බොහෝ සෙයින් සංක්ෂිප්ත කොට දේශනා කරන ධම්මචක්ක දේශනාව විස්තර විභාග වශයෙන් දක්වමින්

සාරිපුත්තෙනා මහාපඤ්ඤා සත්ථුකප්පෙපා ජිනත්‍රජෝ
ධම්මචක්කං විභාජෙත්වා මහානිද්දෙසමබ්‍රවි

මහාප්‍රාඥ වූ, ශාස්තෘන් වහන්සේ හා සමාන වූ, ජිනරාජ පුත්‍ර වූ, සැරියුත් මහ තෙරුන් වහන්සේ, ධම්මචක්ක දේශනාව විභාග කර දක්වමින් මහානිද්දේසය දෙසූ සේක.

පාඨෝ විසිට්ඨෝ නිද්දෙසෝ තං නාම විසෙසතෝ ච

විශේෂ කොට දන්වන ලද පාඨය නිද්දේස නමි. එම (ග්‍රන්ථ) නාමයද (මෙකී) විශේෂාර්ථ වශයෙන් වේ.

තං සාරිපුත්ත ජිනරාජපුත්තං ථෙරං ථිරානෙක ගුණාභිරාමං
පඤ්ඤාසභාවුගත නාමකිත්තිං සුනීච වුත්තිඤ්ච අථෝ නමිත්වා

අනතුරුව, ජිනරාජ පුත්‍ර වූ, ස්ථිරසාර නොයෙක් ගුණ මහිමයෙන් ශෝභිත වූ, ප්‍රඥා ස්වභාවයෙන් උස්ව නැගි කීර්තිරාව ඇති, මනා වූ නිවාත ගුණයෙන් (නිහතමානී බවින්) හෙබි පැවතුම් ඇති, ඒ ශාරිපුත්‍ර තෙරණුවන්ද නැමද,

ඛමා දයාදියුත්තෙන යුත්ත මුත්තාදි වාදිනා
බහුසසුතෙන ථෙරෙන දෙවෙන අභියාචිතෝ

ඉවසීම, දයාව ආදී ගුණයෙන් යුත්, ගුණ යුක්ත, දෝෂ මුක්ත ආදි ආකාරයෙන් කථාකරන සුලු, බහුශ්‍රැත වූ දේව නම් තෙරුන් විසින් ආරාධිත වූයෙමි.

මහාවිහාරවාසීනං සඤ්ඤායමහි පතිට්ඨිකො
ගහෙතබ්බං ගහෙත්වාන පොරාණෙසු විනිච්ඡයං

මහා විහාර වාසීන්ගේ ඉගෙනීම් සම්ප්‍රදායෙහි පිහිටියෙමි, පුරාණාචාර්යවරයන්ගේ අර්ථ විවරණයන්ගෙන් ගතයුතු විනිශ්චයද ගෙන,

අවොක්කමනෙත්තා සමයං සකඤ්ඤව අනාමසනෙත්තා සමයං පරඤ්ඤව
පුබ්බාපරෙපටිඨ කථානයඤ්ඤව යථානුරූපං උපසංහරනෙත්තා

සමය නො ඉක්මවමින්ද, පරසමය ස්පර්ශ නොකරමින්ද, (මෙකී) පෙර පසු දෙ කරුණෙහිදීම, සුදුසු පරිදි, අට්ඨකථා නය හකුලුවමින්ද (පිඬුකොට දක්වමින්ද),

ඤාණප්පභෙදා වහනසස තසස යොගෙහි නෙකෙහි නිසෙවිතසස
ඉච්ඡං අපුබ්බං අනුවණ්ණයනෙත්තා සුත්තඤ්ච යුත්තිඤ්ච අවොක්කමනෙත්තා

(මාර්ග-ඵල ආදී වූ) ඥාන ප්‍රභේදයන් ගෙන දෙවන, බොහෝ වූ යෝගීන් විසින් සෙවුනා ලද, එම නිද්දේස පාළියෙහි අපූර්ව වූ අර්ථය වර්ණනා කෙරෙමින්, සූත්‍ර පාඨයද, යුක්ති යුක්තතාවද නො ඉක්මවමින්

ආරභිසසං සමාසෙන මහානිද්දෙස වණ්ණනං
සද්ධම්ම බහුමානෙන නාත්තුක්කංසන කම්‍යතා

තමා හුවා දැක්වීමේ කැමැත්තෙන් නොව, සද්ධර්මය කෙරෙහි බහුමානයෙන් යුක්තව මහා නිද්දේස පාළියෙහි අර්ත්‍ථ වර්ණනාව බොහෝ විස්තර නැතිව අරඹන්නෙමි.

වක්ඛාමහං අට්ඨකථං ජනසස හිතාය සද්ධම්ම චිරට්ඨිතත්ථං
සක්කච්ච සද්ධම්ම පජොතිකං කථං සුණාථ ධාරෙථ ච සාධු සනෙතා

හික්මවිය යුතු ජනයාගේ හිතසුව පිණිස, සද්ධර්මයේ චිරස්ථිතිය අපේක්ෂාවෙන් සද්ධර්මය අතිශයින් ජ්‍යොතිමත් කරන කථා ඇති එම. (සද්ධම්ම පජ්ජොතිකා නම් වූ) අට්ඨකථාව මම කියමි. සාධු ජනයිනි, එය යහපත් සිතින් මනාකොට අසවු. ධාරණයද කරගනිවු.

එහි, **පායො විසිට්ඨා නිදෙසො තං නාම විසෙසතොව** යනුවෙන් කී බැවින්, පාඨය ද්විවිධ වේ. ව්‍යඤ්ජන පාඨය, අත්‍ථ පාඨය යනුවෙනි. ඒ අතුරින් ව්‍යඤ්ජන පාඨය අක්ඛර, පද, ව්‍යඤ්ජන, ආකාර, නිරුක්ති, නිද්දේස වශයෙන් සවැදෑරුම් වේ. අත්‍ථපාඨයද සංකාසන, පකාසන, විවරණ, විභජන, උත්තානී කරණ, ප්‍රඥප්ති යනුවෙන් ස-වැදෑරුම් වේ.

එහි තුන් දොරෙහි පිරිසිදුව යෙදීම් වශයෙන් පිරිසිදු කරන්නවුන්ගේ සිතින් පවත්වන ලද දේශනාව වචනයෙන් කියන ලද බැවින්ද (වචනයෙන්ම) සෙවුනා ලබන බැවින්ද **අක්ඛර** නම් වීය. එය (වචනය)ම පිහිටකොට ගත් බ්‍රහ්මයන්ගේ මනසින් අසන ලද ප්‍රශ්නයන්ට අනුව භාග්‍යවතුන් වහන්සේ විසින් රුවන් ගෙහි වැඩහිඳ සම්මර්ශනය (විමසීම) කරන ලද පට්ඨාන මහා ප්‍රකරණ වශයෙන්ද **අක්ඛර** නම් වෙති'යි ගතයුතුය.

නැතහොත් පිරිපුන් (සම්පූර්ණ) පදය '**අක්ඛර**' යයි ගත යුතුය. 'සට්ඨිවස්ස සහස්සානි'[1] යන ආදියෙහි මෙනි. මෙහි **ස** කාර, **න** කාර, **සො** කාර ආදිය **අක්ඛර** යයි ගෙන ඇතැමෙක් එක අකුරෙකින් සැදි පදය හෝ **අක්ඛර** යයි පවසති. 'යායං තණ්හා පොණොභවිකා'[2] යන ආදියෙහි විභක්ත්‍යන්ත වූ අර්ථයක් ප්‍රකට කරන අකුරු - පිඬ **පද** නම් වේ. 'නාමඤ්ච රූපඤ්ච' යන ආදියෙහි බොහෝ අක්ෂරයන්ගෙන් යුතු පදය **නාම**[3] යයි කියන ලද පදය ප්‍රකට කරයි.

පදයෙන් නො මුතු වූයේ **ව්‍යඤ්ජන** යි. එනම් වාක්‍යයමැයි. 'චත්තාරො ඉද්ධිපාදා'[4] යනුවෙන් සංක්ෂිප්ත කොට දෙසූ අර්හත්වය 'කතමෙ චත්තාරො' ඡන්ද සමාධිපධාන සංඛාර - සමන්නාගතං ඉද්ධිපාදං භාවෙති, විරිය-චිත්ත-

---

1. සැටදහසක් හවුරුදු
2. පුනර්භවය ඇතිකරන යම් මේ තෘෂ්ණාවක් වේද,
3. නාමයද රූපයදැයි.
4. ඍද්ධිපාද සතරෙකි.

වීමංස සමාධි පධාන-සංඛාර-සමන්නාගතං ඉද්ධිපාදං භාවෙති'[1] යන ආදි තන්හි ප්‍රකට කිරීමේ අර්ථයෙන් **ඛ්‍යඤ්ජන** නම් වේ.

ඛ්‍යඤ්ජනයන්ගේ විභාගය හෙවත් විග්‍රහය ප්‍රකට කිරීම **ආකාර** යි. 'කතමා ඡන්දෝ? යො ඡන්දෝ, ඡන්දියතා, කත්තුකම්මතා[2] යන ආදියෙහි කියන ලද ඛ්‍යඤ්ජනය නොයෙක් ආකාරයෙන් (නැවත) විභාග කිරීම **ආකාර** නම් වේ. ආකාර වශයෙන් කියන ලද පදය නිර්වචන කිරීම **නිරුත්ති** නම්. 'ඵස්සො වෙදනා[3] යන ආදී තන්හි ආකාර වශයෙන් කියන ලද දෙය (නැවත) 'ඵුසතීති ඵස්සො වෙදියතීති වෙදනා'[4] යනුවෙන් ගෙනහැර දැක්වීම **නිරුත්ති** නම්.

නිර්වචන කළ දෙය (නැවත) නියමකොට නිශ්චිත කොට දැක්වීම **නිද්දේස** යි. 'වෙදියතී ති වෙදනා'[5] යනුවෙන් නිර්වචන කළ ශබ්ද පාදය 'සුඛා, දුක්ඛා, අදුක්ඛමසුඛා, සුඛයතීති සුඛා, දුක්ඛයතීති දුක්ඛා, නෙව දුක්ඛයති, නසුඛයතීති අදුක්ඛමසුඛා'[6] යනුවෙන් අර්ථ විස්තරය නිර්වශේෂ වශයෙන් කියන ලද හෙයින් **නිද්දේස** නම් වේ.

මෙසේ සවැදෑරුම් ඛ්‍යඤ්ජන පාඨය පැහැදිලි කොට, ඉක්බිති සවැදෑරුම් අර්ථ පාඨයන් අතුරෙන්, පළමු කොට, 'කාසනා' යනුඃ සංක්ෂේපයෙන් අරුත් හැඟවීම, හෙලි කිරීම **සංකාසන** යි. 'මඤ්ඤමානො ඛො ගිකුඛූ බදෙධා මාරසස, ආමඤ්ඤමානො මුත්තො පාපිමතො'[7] යන ආදී තන්හි සංක්ෂිප්ත කොට අර්ථ දැක්වීම **සංකාසනා** නම්. මේ තෙරණුවෝ වනාහි භාග්‍යවත් බුදුරජාණන් වහන්සේ විසින් මෙසේ සංක්ෂිප්ත කොට පවසන ලද අර්ථය, අඤ්ඤාතං භගවා, අඤ්ඤාතං සුගත'[8] යයි පවසනු සමත් වූවාහු (රහත්ඵලය) ප්‍රතිවේධ කළහ.

---

1. කවර නම් සතරෙක් ද? මේ යස්නෙහි භික්ෂු තෙමේ ඡන්ද-සමාධි-පධාන-සංඛාරයෙන් සමන්විත වූ ඍද්ධිපාදය වඩයි. විරිය, චිත්ත, වීමංස-ය - සමාධි - පධාන සංඛාරයෙන් සමන්විත වූ ඍද්ධිපාදය වඩයි.
2. එහි ඡන්ද' යනු කවරේද? යම් කැමැත්තක්, නැඹුරු බවක්, කරනු කැමැති බවක් වේද,
3. ස්පර්ශය, චින්දනය.
4. ස්පර්ශ කෙරෙති යි 'ඵස්ස' නම්. විඳිනු ලබනි'යි වේදනා නම්.
5. විඳිනු ලබනි'යි වේදනා යි.
6. ඵය සැප වේදනාය, දුක් වේදනාය, දුක් නොවූ සැපද නොම වූ වේදනා යයි.....
7. 'මහණ, හඟිනුයේ වනාහි මාරයා වෙත බැඳුණේ වේ. නොහඟිනුයේ පාපී මාරයාගෙන් මිදුණේ වේ.
8. 'භාග්‍යවතුන් වහන්ස, වැඩහිණි. සුගතයන් වහන්ස, වැටහිණි.'

මත්තෙහි (පසුව) කිවයුතු අර්ථය පළමුව ප්‍රකාශ කිරීම **පකාසනා** යි. 'සබ්බං භික්ඛවෙ ආදිත්තං'[1] යන ආදියෙහි පසුව කිවයුතු අර්ථය ප්‍රථම වචනයෙන්ම දක්වා තිබීම **පකාසනා** නම් වේ. මෙසේ ප්‍රථමයෙන් දැක්වූ අර්ථය නැවත ප්‍රකට කොට දැක්වීම් වශයෙනි. 'කිඤ්ච භික්ඛවෙ සබ්බං ආදිත්තං, චක්ඛුං භික්ඛවෙ ආදිත්තං, රූපං ආදිත්තං'[2] යනුවෙන් මේ ආදිය පැවසූ විට, තියුණු ඉන්ද්‍රිය සහිත පුද්ගලයා සංක්ෂිප්ත කොට දෙසන ලද අර්ථය අවබෝධ කරගනීය'යි කියන ලද හෙයින් මෙකී (සංකාසනා, පකාසනා යන) අර්ථ පද දෙකම තීක්ෂණ ඉන්ද්‍රිය ඇත්තාට උපකාර වශයෙන් කියන ලදි.

සංක්ෂිප්ත කොට කියන ලද දෙයද, එක් වරක් පමණක් විස්තර කොට පවසන ලද දෙයද නැවත විස්තර කිරීම **විවරණ** යි. 'කුසලා ධම්මා'[3] සංක්ෂිප්ත වශයෙන් පවසන ලද දෙය නැවත, 'කතමෙ ධම්මා කුසලා යස්මිං සමයෙ කාමාවචරං කුසලං චිත්තං උප්පන්නං හොති'[4] යනුවෙන් නිද්දේස වශයෙන් විස්තර කිරීමද, විස්තර වශයෙන් නැවත කීමද 'විවරණ' නම් වේ.

එය විභාග (විග්‍රහ) කොට දැක්වීම 'විභජන'යි. 'තස්මිං සමයෙ'[5]යි විවරණ කරන ලද කුසල ධර්මයන්, 'තස්මිං සමයෙ එසෙසා හොති, වෙදනා හොති'[6] යනුවෙන් විභාග කිරීම 'විභජන' නම් වේ. විවරණ කරන ලද දෙයද, විස්තර පැවසීමෙන් ව්‍යවස්ථා කරන ලද දෙය උපමා කීමෙන් තවදුරටත් පැහැදිලි කිරීම **උත්තානී කරණ** යි, විවරණයෙන් හෙළි පෙහෙළි කරන ලද අර්ථය, 'කතමො තස්මිං සමයෙ එසෙසා හොති, යො තස්මිං එසෙසා ඵුසනා, සම්ඵුසනා'[7] යනුවෙන් තවදුරටත් විවරණ කර පැවසීමද විභජනය මගින් විග්‍රහකොට දක්වන ලද දෙය, 'සෙය්‍යථාපි භික්ඛවෙ ගාවී නිව්වම්මා, එවමෙවඛ්වාහං භික්ඛවෙ එස්සාහාරො දට්ඨබ්බා'ති වදාමි'[8]

---

1. 'මහණෙනි, සියල්ල ගිනිගෙන ඇත.'
2. 'මහණෙනි, කවරනම් සියල්ල ගිනි ගෙන ඇත්ද? මහණෙනි, චක්ඛායතනය ගිනිගෙන ඇත. රූපායතනය ගිනිගෙන ඇත.'
3. කුසල ධර්මයෝ.
4. 'කුසල ධර්මයෝ කවරහුද? යම්කලෙක කාමාවචර කුසල් සිතක් උපන්නේ වේද?
5. 6. 'එකල්හි ස්පර්ශය වෙයි. වේදනාව වෙයි.'
7. 'එකල්හි ස්පර්ශය යනු කිමෙක්ද? එකල්හි යම් පහසක් පහස් බවක්, සුපහස් බවක් වේද?'
8. 'මහණෙනි, යම රහිත දෙනක් යම්සේ වේද, මහණෙනි, එස්සාහාරයද එසේම යයි දැකිය යුතුයයි කියමි.'

යන ආදී වශයෙන් උපමාකථනයෙන් වඩාත් පැහැදිලි කිරීමද **උත්තානීකරණ** නම් වේ.

දහම් අසන්නවුන්ගේ සිත්හි දහම් දෙසීමෙන් අනේක ප්‍රකාරයෙන් සොම්නස් ඉපදවීමද, තීක්ෂණ නොවූ බුද්ධි ඇත්තවුන්ගේ ඥානය නොයෙක් ආකාරයෙන් තීක්ෂණභාවයට පත් කිරීමද **පඤ්ඤත්ති** නම්. එසේ දහම් අසන්නවුන්ගේ සිත තොස්වමින්ද, ධර්මය වෙතට යොමවමින්ද ප්‍රඥාව වඩති'යි **පඤ්ඤත්ති** නම් වේ.

මෙහිදී භාග්‍යවතුන් වහන්සේ අක්ෂරයන්ගෙන් (දහම් කරුණු) සංකාසනය (සංක්ෂේපයෙන් ඇර දැක්වීම) කරති. පදයන්ගෙන් ප්‍රකාශනය කරති. ව්‍යඤ්ජනයන්ගෙන් විවරණය කරති. ආකාරයන්ගෙන් විභජනය කරති. නිරුත්තීන්ගෙන් උත්තානීකරණය කරති. නිද්දේසයන් පඤ්ඤායනය (ප්‍රඥා වර්ධනය) කරවති. කුමක් කියන ලද්දේද යත්, භාග්‍යවත් බුදුවරයෝ තුමූ ඇතැම් වෙනෙය ජනයනි, (හික්මවිය යුතු පුද්ගලයන්ට), ඇතැම් දේශනයෙක්හිදී අක්ෂරයන් මගින් අර්ථ සංකාසනය කෙරෙති. -පෙ- නිද්දේසයන් මගින් අර්ථාවබෝධනය කරවති'යි යනු මෙහි අභිප්‍රායයි.

නොහොත් අක්ෂරයන්ගෙන් සංකාසනය (සංක්ෂිප්තාර්ථය දැක්වීම) කොට පදයන්ගෙන් පකාසනය (නිගමනය කළ යුතු අර්ථය දැක්වීම) කරති. ව්‍යඤ්ජනයන්ගෙන් අර්ථ විවරණය කොට ආකාරයන්ගෙන් විභජනය (බෙදා දැක්වීම) කෙරෙති. නිරුත්තියෙන් උත්තානීකරණය කොට නිද්දේසයෙන් පඤ්ඤාපනය (අර්ථාවබෝධනය) කරවති. කුමක් කියන ලද්දේද යත්, මෙබඳු වූ ධර්මදේශනයෙන් ඇතැම් තැන්වලදී ඇතැම් ශෛක්ෂයන් (හික්මවිය යුතු පුද්ගලයන්) හික්මවති' යනුයි.

නොහොත්, අක්ෂරයන්ගෙන් වැසුම් හරවා පදයන්ගෙන් ප්‍රකාශනය කරමින් **උග්ඝටිතඤ්ඤූ** නම් ශෛක්ෂ්‍යයා හික්මවති. ව්‍යඤ්ජනයන්ගෙන් විවරණය කොට ආකාරයන්ගෙන් විභජනය කෙරෙමින් **විපචිතඤ්ඤූ** නම් ශෛක්ෂයා හික්මවති. නිරුත්තීන්ගෙන් උත්තානීකරණය කොට, නිද්දේසයන්ගෙන් අර්ථාවබෝධනය කරවමින් **නෙය්‍ය** නම් ශෛක්ෂයා හික්මවති. මෙසේ වෙනේය ජනයන් වශයෙන්ද යෙදිය යුත්තේමය.

මෙහි අර්ථ වශයෙන් වනාහි 'ව්‍යඤ්ජන පාඨ' යනු කවරේද? 'අත්‍ථපාඨ' යනු කවරේදැ'යි යතහොත්, දහම් දෙසන්නා වූ භාග්‍යවත් බුදුවරයන්ගේ අර්ථයක් ගෙන දෙන, විඤ්ඤැතති (ඇඟවීමක්) සහිත යම් ශබ්දයක් වේද, එය **ව්‍යඤ්ජන පාඨ** යි. එම දේශනාවෙන් අවබෝධ කරගත යුතු, ලක්‍ෂණ, රස, ආදියෙන් යුත් යම් ධර්මයක් වේද එය අත්‍ථ පාඨයි යනුවෙන් දතයුතුය.

යලිදු 'පාඨ' යනු, සන්‍ධාය භාසිත, ව්‍යඤ්ජන භාසිත, සාවසේස පාඨ, අනවසේස පාඨ, නීත, නෙය්‍ය යනුවෙන් සවැදෑරුම් වේ. එහි අනේකාර්ථ (යටි අරුත්) හඟවන පාඨ **සන්‍ධාය භාසිත** නම් වේ. 'මාතරං පිතරං හන්‍ත්වා රාජානො දෙව ඛත්තියෙ[1] යන ආදිය මෙනි. ඒකාර්ථවත් පාඨය **ව්‍යඤ්ජන භාසි** නම්. 'මනො පුබ්බංගමා ධම්මා'[2] ආදියයි. **සාවසෙස** යනු, 'සබ්බං භික්ඛවෙ ආදිත්තං[3] යන ආදියයි. එයට (සාවසේසයට) විපරීත ඤාණමුඛෙ ආපාථං ආගච්ඡන්ති[4] යන ආදියයි. වචනය අනුවම අවබෝධ කළයුතු පාඨය **නීත** යි. 'අනිච්චං දුක්ඛං අනත්තා'[5] යන ආදියයි. යුක්ති යුක්ත වන සේ සිහි කළ යුතු පාඨය **නෙය්‍ය** නම්. 'එක පුග්ගලො භික්ඛවෙ'[6] යන මේ ආදියයි.

'අත්‍ථ' යනුද පාඨත්ථය, සභාවත්ථය, ඤායත්ථය, පාඨානුරූපය, නපාඨානුරූපය, සාවසේසත්ථය, නිරවසේසත්ථය, නීතත්ථය, නෙය්‍යත්ථය යනාදී වශයෙන් අනේකප්‍රකාර වේ. එහි, මඳ වූ (සුලු) අරුතක් හැඟවීම පිණිස යම් පාඨයක් උච්චාරණය කරනු ලැබේද, එය **පාඨත්ථ** යි, 'සාත්‍ථං සබ්‍යඤ්ජනං'[7] ආදිය **සභාවත්ථ** යි, 'සම්මා දිට්ඨිං භාවෙති'[8] යන ආදියෙහි මෙනි. යම් අර්ථයක් දැනගනු ලබනුයේ හිතසුව පිණිස පවත්නේද එය (අනුන් හට) දැන්වීම සුදුසුයයි **ඤායත්ථ** යි, 'අත්‍ථවාදී ධම්මවාදී[9] යන ආදියෙහි මෙනි. පාඨයට අනුරූපීව කියන ලද අර්ථය **පාඨානුරූප** යි. 'චක්‍ඛුං භික්ඛවෙ පොරාණ කම්මං'[10] යනුවෙන් භාග්‍යවතුන් වහන්සේ විසින් දෙසන ලදි.

---

1. 'මව්ද, පියාද, ක්‍ෂත්‍රිය රජුන් දෙදෙනාද නසා'
2. (චෛතසික) ධර්මයෝ සිත මුල්කොට ඇත්නාහ.
3. 'මහණෙනි, සියල්ල ගිනිගෙන ඇවිලී ඇත.'
4. 'සියලු ධර්මයෝ සියලු ආකාරයෙන් භාග්‍යවත් බුදුරජාණන් වහන්සේගේ ඥානමුඛයට අයත් විෂයපථය තුළට පැමිණෙති.'
5. 'අනිත්‍යය, දුඃඛය, අනාත්මය'
6. 'මහණෙනි, එක් පුද්ගලයෙක් නෙමේ'
7. 'අර්ථ සහිත, ව්‍යඤ්ජන සහිත'
8. 'සම්‍යග් දෘෂ්ටිය වඩයි'
9. 'අර්ථවාදී වූ, ධර්මවාදී වූ'
10. 'මහණෙනි, චක්‍ඛු (ඇස) යනු පෙරකර්මයෙකි.' (කර්මයෙක ඵලයෙකි.)

එහෙයින් ඇසද කර්මයයි' යන ව්‍යඤ්ජනච්ඡායාවෙහි අර්ථය බැහැර කිරීම වශයෙන් කියන ලද අර්ථය **න පාඨානුරූප** යි එය පාඨයෙන් නො අනුදන්නා ලද්දේ, ප්‍රතික්ෂේප නොකරන ලද්දේ පාඨාර්ථයෙන් වියුක්ත වූයේ ද වේ.

සංග්‍රහ කළයුතු දෙය සංග්‍රහ නොකොට, ඉවත් කළයුතු දෙය ඉවත් නොකොට, කිවයුතු දෙය ඉතිරි නොකොට කියන ලද්දේ වුවද **සාවසෙසත්ථ** වේ. 'චකඛුඤ්ච පටිච්ච රූපෙච උප්පජ්ජති චකඛුවිඤ්ඤාණං'[1] 'සබ්බෙ තසන්ති දණ්ඩස්ස සබ්බෙ භායන්ති මච්චුනො'[2] ආදියෙහි මෙනි. එයට (සාවසේසත්ථයට) විපරීත වූයේ **නිරවසේසත්ථ** යි, 'සඤ්ඤාවිතං සංසරිතං මමඤ්චව තුම්හාකඤ්ච'[3] 'තත්‍ර භික්ඛවෙ, කො මන්තා කො සන්ධාතා අඤ්ඤත්‍ර දිට්ඨපදෙහි'[4] යන ආදියෙහි මෙනි.

ශබ්ද වශයෙන්ම දතයුතු අර්ථය **නීතත්ථ** යි. 'රූපා සද්දා රසා ගන්ධා ඵොට්ඨබ්බා ච මනොරමා'[5] යන ආදියෙහි මෙනි. සම්මුති වශයෙන් දතයුතු වූයේ **නෙය්‍යත්ථ** නම්. 'චත්තාරො' මෙ භික්ඛවෙ වලාහකොපමා පුග්ගලා'[6] යන ආදියෙහි මෙනි. මේ ආකාරයෙන් පාඨයද, අර්ථයද මනාව දැන සිටියේ. බොහෝ කාලයක් තීර්ථක ස්ථානයෙක විසීමෙන් වුවද අන්‍ය ලබ්ධිකයන් විසින් (පැහැරගනු ලැබිය) හැක්කේ නොවේ. (ස්ථිරව බුදු දහමෙහි පිහිටියේය යන අර්ථයි.)

මෙසේ නොසෙල්විය හැකි බැවින් යම්තාක් ආගම-අධිගම සම්පත්තිය වේද, ඒ තාක් ඒ පිළිබඳව කථා කිරීමට හැකි වේ. සංක්ෂේප-විස්තර ක්‍රමයන් මගින්, හේතු උදාහරණාදියෙන් අවබෝධ කරවීමට සමත් වේ. මෙසේ වූ බව දත් කල තමා මෙන්ම මෙරමාද පිරිසිදු කරවීමට සමත් බැවින් දුසිල්-මිසදිටු මල - විරහිතතාව ඇති වේ. (දුසිල්, මිසදිටු යන) දෙදෙනා අතරින්ද, දුස්සීලයා වනාහි තෙමේම නැසේ. එහෙයින් නොපිළිගත හැකි වචන ඇති හේ තෙමේ, වස්ත්‍ර ආභාර නැතිව හැසිරෙනුයේ, මව් දෙන වෙත යාමට

---

1. 'ඇසද, රූපයන්ද නිසා චක්ෂුර්විඥානය උපදී.'
2. 'සියල්ලෝම දඬුවමට තැති ගනිති. මරණයට බිය වෙති.'
3. 'මාගේ ද තොපගේ ද ධාවනය (දිවීම), සංසරණය (සැරිසැරීම)
4. 'මහණෙනි, එහිදී දක්නා ලද පදයන් (ගේ අර්ථය) හැර 'අන් දෙයක්) වටහාගන්නා කවරේද? ගලපා ගන්නා කවරේද?'
5. 'මනරම් වූ රූප-ශබ්ද-රස-ගන්ධ-ස්පර්ශයෝ.....'
6. 'මහණෙනි, මේ පුද්ගලයන් සිවුදෙනා වලාකුළු වැන්නෝය.'

ආශාවෙන් පෙළෙන වස්සකු මෙන් වේ. මිථ්‍යාදෘෂ්ටි ගත්තේද තෙමේම නැසේ. ඇසුරු කළවුන් විසින් ද දුරුකරනු ලැබේ. සර්ප ගුහාවලින් ගැවසි පියුම් ලැහැබක් මෙනි.

දෙ අතින්ම විනාශයට පත්වූයේ වනාහි සර්වප්‍රකාරයෙන්ම ඇසුරු නොකළ යුත්තේය. අසූචි මත තිබෙන සොහොන් පෙනෙල්ලක්ද, අසූචි මත සිටි කෘෂ්ණ සර්පයකු ද සෙයිනි. (සිල්වත් බවින් මෙන්ම සම්‍යග් දෘෂ්ටික බවින්) යන දෙ අතින්ම සම්පත්තියට (හෙවත් සමෘද්ධභාවයට පත් වූයේ වනාහි සර්වප්‍රකාරයෙන්ම ඇසුරු කළ යුත්තේය. නුවණැත්තන් විසින් සේවනය කළ යුත්තේය. උපද්‍රව රහිත රුවන් ආකරයක් සෙයිනි. මෙසේ වූයේම, දරු (හෝ ශිෂ්‍ය) පරම්පරාවෙන් පවත්වාගෙන ආ යුතු ගුරුමුෂ්ටි, සූත්‍ර සූත්‍රානුලෝම, ආචාර්යවාද, අත්තනෝමති සංඛ්‍යාත චාරිත්‍රයන් අත් නොහරිනුයේ (කඩ නොකරනුයේ) ඒ චාරිත්‍රයන්ට අනුව විස්තර කරන ලද්දේ වේ.

එකංස වචනං එකං විභජ්ජවචනං පදං
තතියං පටිපුච්ඡෙය්‍ය චතුත්ථං පන ඨාපයේ'ති

ඒකාන්ත වශයෙන් කියන වචනය එකෙකි. විග්‍රහකොට කියන වචය (දෙවන) පදයයි. තුන්වන වචනය අනුව ප්‍රතිප්‍රශ්න විචාරන්නේය. සතරවැන්න අනුව (කියන ලද දෙය) ස්ථාපනය කරන්නේය. (තහවුරු කළ යුත්තේය) යන

මේ චාරිත්‍ර ධර්මයන් හෝ නොහරින්නේයි. එහෙයින්ම ඵල-හේතූන් පිළිබඳ සිත සාධනයෙහි නියුතු වූ හෙයිනි. එහෙයින්ම මේ ධර්මයන් අවබෝධ කිරීමෙහිලා අනලස් (උත්සුක) වෙති'යි (යන අර්ථයි.)

මෙහිලා මෙසේද කීහු :-

පාඨඤ්ච්ච සංහීරෝ වත්තා සුචි අමච්ඡරෝ
චතුන්නං අපරිවාගී දෙසතඤ්ඤ හිතච්චිතෝ

පාඨාර්ථයන් මැනවින් දත්, අවල ස්වභාව ඇති, අර්ථවත් කථා ඇති, පිරිසිදු චරිත ඇති, නොමසුරු වූ (ඉහත කී) චතුර් ධර්මයන් අත් නොහරිනුයේ හිත කැමැති දේශකයෙක් වන්නේය.

මෙහි, 'දෙසකසස' යනු, දෙසකො අසස = භවෙය්‍ය, දේශකයෙක් වත්තෝය යන අර්ථයි. 'හිතනිතෝ' හිතසුව අනුව ගියේ, හිත කැමැති සිත් ඇත්තේයි. ඒ මේ හිත සිත් ඇති ආචාර්ය තෙමේ (දේශක තෙමේ) ශිෂ්‍යයා කෙරෙහි (ඉහත කී) චතුර් ධර්මයන් අත් නොහරින හෙයින් අචල ස්වභාවයෙන් සම්භාවනීය බවට පත් වූයේ, හිත සිත් ඇති හෙයින් වචනයෙහි දක්ෂ වූයේ, පාඨාර්ථයන් දත් හෙයින් ගැඹුරු ලෙස කථා කරනුයේ, මසුරු නොවන හෙයින් නිසි තැන්හි (ශිෂ්‍යයා) යොදවන්නේ ය'යි මෙසේ,

පියො ච ගරු භාවනීයො වත්තා ච වචනක්ඛමො
ගම්භීරඤ්ච කථං කත්තා නො චට්ඨානෙ නියොජකො'ති

'ප්‍රියමනාප වූ, ගෞරවාර්හ වූ, අර්ථවත් කථා කියන, වචනයෙහි දක්ෂ, ගැඹුරු ලෙස කථා කරන ගුරුවර තෙමේ (ශිෂ්‍යයා) නොනිසි තන්හි නොයොදවන්නේ වේ' යනුවෙන්,

පසසන ලද දේශක (ආචාර්ය) තෙමේ ශ්‍රාවකයකු (ශිෂ්‍යයකු වශයෙන් හුදෙක් පදයන් අධ්‍යයනය කරන්නෙක් නොවේ. (ඉහත සඳහන් චතුර්ධර්මයන් කෙරෙහි ගරුසරු ඇති හෙයිනි. කථාවට (දේශනාවට) පරිභව නොකරයි. ආචාර්යවරයා කෙරෙහි ගරුසරු ඇති හෙයිනි. දෙසන ලද්දට (ධර්මයට) පරිභව නොකරයි. ශ්‍රද්ධා, ප්‍රඥාදී ගුණයෙන් උපලක්ෂිත වූ හෙයිනි. තමාට පරිභව නොකරයි. කපටි මායා ස්වභාව නැති හෙයිනි. නිවනට යොමු වූ හෙයින් නොවිසුරුණ සිත් ඇත්තේ වේ. ඉතා නුවණැති බැවින් නුවණින් මෙනෙහි කරයි.

කියන ලද මැයි භාග්‍යවතුන් වහන්සේ විසින් 'මහණෙනි, අංග පසෙකින් සමන්විත වූ අසන්නා සද්ධර්ම ප්‍රතිපදාවට පත්වීමට, කුසල් දහම්හි ප්‍රීණනයට (සතුටට) පත්වීමට සමත් වේ. කවර අංග පසෙකින්ද යත්, දේශනාවට පරිභව නොකරයි. දෙසන ලද්දට (ධර්මයට) පරිභව නොකරයි. තමාට පරිභව නොකරයි. නොවිසුරුණ සිතින් ධර්මය ශ්‍රවණය කරයි. එකඟ වූ සිතින් නුවණින් මෙනෙහි කරයි. එම ලක්ෂණයනට පත්වූ හෙයින් ඇසුරට සුදුසු වේ.

මෙහිලා මෙසේද කීහු :-

ධම්මාචරිය ගරු සද්ධා පඤ්ඤාදිගුණ මණ්ඩිතො
අසඨා මායාවිකසස සුමෙධො අමතාභිමුඛො ඉති වතතා ච සොතාව

'ධර්මාචාර්ය ගෞරව ඇති, ශ්‍රද්ධා සම්පන්න, ප්‍රඥාදී ගුණයෙන් හෙබි, කපටි-මායා බවින් තොර, නුවණැත්තේ නිවනට යොමුවන්නේය. දේශක ශ්‍රාවක යන දෙදෙනාම මෙසේ (විය යුතු)ය.

කියන ලද ආකාරයෙන් මෙසේ බ්‍යඤ්ජනයද, අර්ථයද දක්වා ඉක්බිති, විශේෂ කොට කියන ලද හෙයින් 'මහා සමුද්ද, මහාපඨවි' (මහ මුහුද, මහ පොළොව) යනුවෙන් 'මහා ච සො නිදෙදසො චාති, මහා නිදෙදසො' (මහා වූයේ ද එම නිද්දේස වූයේ ද, මහා නිද්දේසයයි.) යනුවෙන් යමෙක් කියාද, ඒ මහා නිද්දේසය වර්ණනා කරන්නෙමි.

'ආයසමතා සාරිපුතතතථෙරෙන භාසිතං තදෙතං මහානිදෙදසං සුතවා ආයසමා ආනන්දතථෙරෝ පඨම මහා සංගීතිකාලෙ යථාසුතමෙව සංගහං ආරොපෙසි' (ආයුෂ්මත් සැරියුත් තෙරණුවන් විසින් කියන ලද ඒ මේ මහා නිද්දේසය අසා ආයුෂ්මත් අනඳ තෙරණුවෝ ප්‍රථම මහා සංගායනාවස්ථාවෙහිදී අසන ලද පරිද්දෙන්ම සංග්‍රහයට නැගූහ)යි යනු සම්බන්ධයයි.

ඒ මහා නිද්දේසය අර්ථ සම්පන්නය. බ්‍යඤ්ජන සම්පන්නය. ගැඹුරුය. ගැඹුරු අර්ථ ඇත්තේය. ලෝකෝත්තර අර්ථයන් ප්‍රකාශ කරන්නේය. ශූන්‍යතාවෙන් (නිර්වාණ ස්වභාවයෙන්) යුක්තය. ප්‍රතිපත්ති-මාර්ග-ඵල ගුණ විශේෂයන් සාධනය කරන්නේය. ප්‍රතිපත්ති විරෝධ වූ තත්ත්වයන් වලක්වන්නේය. යෝගාවචරයන්ගේ විදර්ශනා ඥානාචාරයට ආකරයක් වූයේය. ධර්මකථිකයන්ගේ ධර්මකථා විලාශය අලංකාර කිරීමට විශේෂ හේතු වූයේය.

සසර බිය ඇත්තනට දුකින් මිදීමට අවශ්‍ය උපාය මාර්ගය දැක්වීමෙන් ආශ්වාද ජනනය පිණිස, ප්‍රතිපක්ෂ උපාය මාර්ගයන් නසනු පිණිස, ගැඹුරු අරුත් ඇති නොයෙක් සූත්‍රාන්ත පදයන්ගේ අර්ථ විවරණයෙන් නුවණැත්තන්ගේ හදවත්හි සතුට දනවනු පිණිස,

තථාගත වූ අර්හත් වූ සම්‍යක් සම්බුදුරජාණන් වහන්සේ විසින්, සියලු තන්හි නොපැකිලෙන සර්වඥතා ඥාන නමැති මහා ප්‍රදීපයෙහි ආලෝකයෙන්, සියලු සත්ත්වයා වෙත පතළ මහාකරුණා නමැති තෙලින්, වෙනෙය ජනයන්ගේ හදවත්හි කෙළෙස් අඳුරු දුරුකිරීම පිණිස දල්වන ලද සද්ධර්ම ප්‍රදීපයෙහි ඒ අභිප්‍රාය පතුරුවනු සඳහා තෙල් වැගිරවීමෙන් මෙත් පන්දහස් වස් තරම් ඉතා දිගු කලක් (එම සද්ධර්ම ප්‍රදීපය) දැල්වෙනු කැමැති, ලෝකානුකම්පී වූ, ශාස්තෘන් වහන්සේ හා සමකළ හැකි තරම් වූ, ධර්මරාජයන් වහන්සේගේ ධර්මසේනාපති වූ, ආයුෂ්මත් සැරියුත් තෙරණුවන් විසින් කියන ලද (මහා නිද්දේසය) අසා (ධාරණය කොටගෙන) ආයුෂ්මත් ආනන්ද තෙරණුවෝ ප්‍රථම මහා සංගායනාවස්ථාවෙහිදී අසන ලද පරිදිම සංග්‍රහයට නැගුහ.

ඒ මේ (මහා නිද්දේසය) වනාහි, විනය පිටකය, සූත්‍ර පිටකය, අභිධර්ම පිටකය යන තුන් පිටකයෙන් සූත්‍ර පිටකයට අයත් වේ. දීඝනිකාය, මජ්ඣිම නිකාය, සංයුත්ත නිකාය, අංගුත්තර නිකාය, බුද්දක නිකායය යන පංච මහා නිකායයන් අතුරෙන් බුද්දක මහා නිකායයට අයත් වේ. සුත්ත, ගෙය්‍ය, වෙය්‍යාකරණ, ගාථා, උදාන, ඉතිවුත්තක ජාතක, අබ්භූතධම්ම, වේදල්ලය යන නව සත්ථුසාසනාංගයන් අතුරෙන්, සම්භව වූ පරිදි, ගාථා, වෙය්‍යාකරණ යන අංගද්වයය තුළ සංග්‍රහ කරන ලද්දේය.

දවාසීතිං බුද්ධතො ගණිං දෙව සහස්සානි භික්ඛුතො
චතුරාසීති සහස්සානී යෙ මෙ ධම්මා පවත්තිතො

දෙ-අසූ දහසක් බුදුරදුන්ගෙන් ද, දෙදහසක් ධර්මස්කන්ධය භික්ෂු, භික්ෂුණී උභය සංඝයාගෙන්ද ලබා ගතිමි. මෙසේ යම් ඒ සද්ධර්ම ස්කන්ධයක් වේද, එය පවත්නා පරිදි සුවාසූ දහසක් වේ.'

කරුණු පහක් පිළිබඳව අග තන්හි තබනු ලැබූ ධර්ම භාණ්ඩාගාරික තෙරුන් විසින් අනුමත කරන ලද සුවාසූ දහසක් ධර්ම ස්කන්ධයන් අතුරෙන් භික්ෂූන්ගෙන් ගන්නා ලද දෙදහසක් වූ ධර්මස්කන්ධයන් තුළ නොයෙක් සිය ගණන් ධර්මස්කන්ධයන් සංග්‍රහ කරනු ලැබ ඇත. (ඔවුනතුරෙන්) ඒ මහා නිද්දේසයට අට්ඨක වග්ග, පාරායනිකවග්ග යන වර්ග දෙකද, ඛග්ගවිසාණ සූත්‍රයද අයත් වේ. එක් එක් වර්ගයෙහි සොළොසක්

සොළොසක් බැගින්. (සූත්‍ර දෙතිසක්) ද, බග්ගවිසාණ සූත්‍රයද සමග, කාමසූත්‍රයෙන් පටන්ගෙන බග්ගවිසාණ සූත්‍රයෙන් අවසන් වන තෙතිසක් සූත්‍රයෝ වෙති.

මෙසේ නන් අයුරින් ව්‍යවස්ථාපනය කරන ලද මේ මහා නිද්දේසයේ පදාර්ථ වර්ණනාව අනුපිළිවෙළින් කරන්නෙමි.

මේ මහා නිද්දේසය පාඨ වශයෙන්ද අර්ථ වශයෙන්ද (මතු ඡේදයෙහි දැක්වෙන පරිදි) උද්දේස කරන්නහුද, නිද්දේස කරන්නහුද විසින් මැනවින් උද්දේසද, නිද්දේසද කළ යුතුය. උගන්නහු විසින් ද සකසා ඉගැනීමද ධාරණයද කළයුතුය. කවර හෙයින්ද? මේ මහා නිද්දේසය ගැඹුරු හෙයින් හා ලොවට හිතසුව පිණිස එය බොහෝකලක් ලෝකයෙහි පවතිනු පිණිසද වේ.

එහි මුල් සූත්‍රය කාමසූත්‍රයයි. එහිද මුල් ගාථාව **කාමං කාමයමානස්ස** යනුයි. එය (ඒ ගාථාව) උද්දේස, නිද්දේස වශයෙන් තුන් අයුරෙකින් සිටියේය. **කාමං කාමය මානස්ස** යන මේ ආදිය උද්දේසයි. **'කාමා' ති උද්ධානතො දෙව කාමා, වත්‍ථුකාමොමා කිලෙසකාමොච** යනුවෙන් (වෙසෙසා) දැක්වීම නිද්දේසයි. **කතමෙ වත්‍ථුකාමා, මනාපිකා රූපා** යන මේ ආදිය පටිනිද්දේසයි. එහි **කාමං** මනාප වූ ප්‍රියරූපාදී තෙභූමක ධර්ම නම් වූ වස්තු කාමයයි. **කාමයමානස්ස** යනු, කැමැති වන්නහුටයි. **තස්ස චෙ තං සමිජ්ඣති** යනු, ඒ කැමතිවන සත්ත්වයා හට, ඉදින් ඒ කැමතිවන කාම සංඛ්‍යාත වස්තුව සමෘද්ධ වේ නම්, 'ඉදින් ඔහු එය ලබතොත්' යයි කී නිසයි. **අඳධා පීති මනො හොති** යනු ඒකාන්තයෙන් සතුටු සිත් ඇත්තෙක් වේ. ලඳධා යනු ලැබ, **මචෙවා** යනු ඒ සත්ත්වයායි. 'යදිචඡති' යමක් කැමැති වෙතොත් එයයි. මේ වනාහි සංක්ෂේප වශයෙන් පදාර්ථයන් දැක්වීම පමණෙකි. විස්තරය වනාහි පෙළෙහි (මහා නිද්දේස පාළියෙහි) ආ නයින්ම දතයුතුය. මෙහි යම් සේද, මින්මතු සියලු තන්හි එසේය.

'කාමා' යනු මතුකොට දැක්විය යුතු පදයයි. 'උද්ධානතො' යනු, වර්ග වශයෙන් නැවත ගැනීමයි. 'කිණෙය්‍ය' (තෝරා) මිලට ගන්නේය) යන ආදියෙහි මෙන් නැතහොත්, මතු මත්තෙහිත් දැක්වීම් වශයෙන් විස්තර කිරීමයි. මතු මත්තෙහිද සේදීමෙන් පිරිසිදු කිරීමේ අර්ථයෙන් 'වොදාන' යන වචනය මෙනි. විස්තර කරන බැවින් හෝ 'කාමා' යන පදය

වෙන්කොට දැක්විය යුතුය. දෙව යනු, සංඛ්‍යාව දෙක යයි පිරිසිඳ දැක්වීමයි. එකක් හෝ තුනක් නොවෙති'යි යනුවෙනි. වත්‍ථුකාමාච යනු ප්‍රියමනාප රූපාදී වූ වස්තු කාමයෝ ද, තැවීම් අරුතින් හා බාධා කිරීම් අරුතින් ද ක්ලේශ කාමයෝද ගැනෙති. ඔවුන් (වස්තුකාම ක්ලේශකාමයන්) අතරෙන් වස්තු කාමය පිරිසිඳ දතයුතුය. ක්ලේශකාමය පහකළ යුතුය. එහි වස්තුකාමය ක්ලේශකාමය මගින් පැතිය යුත්තේ නුයි, පතනු ලබන්නේ නුයි 'කාම' නම් වේ. ක්ලේශකාමය වස්තුකාමයන් පිළිබඳ අපේක්ෂාවනට හේතුවන බැවින්, මෙය (ක්ලේශ කාමය) හේතු කොටගෙන පතනු ලැබෙනුයි 'කාම' නම් වේ. එහි රූපාදී වූ ස්කන්ධය තුළ සංගෘහීත වූයේ වස්තු කාමයයි. සංඛාර ස්කන්ධය තුළ සංගෘහීත වූයේ ක්ලේශකාමයයි. (චක්ඛු විඤ්ඤාණ ආදී) ෂඩ් විඥානයන් මගින් දතයුත්තේ වස්තු කාමයයි. හුදෙක් මනෝ විඤ්ඤාණයෙන් දතයුත්තේ ක්ලේශ කාමයයි. කෙලෙසුනට පිහිට ආධාර වෙතැ'යි හේතු වෙතැ'යි යන අරුතින්ද වස්තුකාම නම් වේ.

න තෙ කාමා යානි චිත්‍රානි ලොකෙ සංකප්පරාගො පුරිසස්ස කාමො
තිට්ඨන්ති චිත්‍රානි තථෙව ලොකෙ අථෙත්ථ ධීරා විනයාකි ඡන්දං'ති

ලොව යම් විසිතුරු කාමයෝ වෙත්ද, ඔව්හු කාමයෝ නොවෙති. පුරුෂයාගේ සංකල්ප රාගයම කාමය වේ. ලොව විසිතුරු වස්තූහු එසේම පවතිත්. මෙහි (ඒ බව දත්) නුවණැත්තෝ වස්තූන් කෙරෙහි ඇතිවන ආශාව හික්මවා ගනිති.

නෑඳ මානවක සෝරෙය්‍ය සිටු පුත් ආදීන්ගේ කථා වස්තු මෙහිලා නිදර්ශන වේ. ක්ලේශ කාමයෝ තැවීම් අරුතින් ද, බාධා කිරීමේ අරුතින්ද, තුමූම කැමැති වෙත්නුයි 'කාම' නම් වේ. කියන ලදමැයි. 'බ්‍රාහ්මණය, රාගයට හසු වූයේ, රාගයෙන් මඩනා ලද්දේ තමාට දුක් පිණිස සිතයි. -පෙ- දෙපිරිසේම දුක් පිණිස සිතයි' යනු ද, 'බ්‍රාහ්මණය, රාගයට ගොදුරු වූයේ පර පණඳ නසයි. නුදුන් දෙයද ගනියි. පරඹුවන් කරාද යෙයි. බොරුද කියයි' යනුද නිදර්ශන වේ. එයම පටිනිද්දේස වශයෙන් විස්තරකොට කියනු කැමැතිව **කතමෙ වත්‍ථුකාමා** යන ආදිය කීහු. එහි 'කතමෙ' යනු, (තමාම) කියනු කැමැතිව ප්‍රශ්න කිරීම (කථෙතු කම්‍යතා පුච්ඡා) යි. පුච්ඡාව (ප්‍රශ්න කිරීම) පස්වැදෑරුම් වේ. ඒ පිළිබඳ විභාගය පෙළෙහිම මතු විස්තර

වශයෙන් දැක්වේ. ඒ (පස්වැදෑරුම්) පුච්ඡාවන් අතුරෙන් මෙය කථෙතුකම්‍යතා පුච්ඡා'යි.

එහි **මනාපිකා** යනු, මන පිනවති'යි, මන වඩති'යි යන අරුතින් 'මනාප' නමි. මනාප වූයේම (තදර්ථ තද්ධිත) 'මනාපික' වේ. **රූපා** යනු කම්ම, චිත්ත, උතු, ආහාර යන මොවුන්ගෙන් හටගැනීම් වශයෙන් ඇතිවන චතු සමුට්ඨානික රූපාරම්මණයෝයි. රූපයනති'ති, රූපා-රූපණය වෙති'යි 'රූප' නමි. වර්ණ විකාරයට පත්වෙමින් හදවත කරා ළඟා වන බව පවසති'යි යන අර්ථයි. එහි, කවර අරුතෙකින් 'රූප' නම් වේද, විනාශ වෙතැ'යි යන අරුතෙනි. වදාරන ලදමැයි භාග්‍යවතුන් වහන්සේ විසින් 'මහණෙනි, 'රූප' යනු කුමකැ'යි කියහුද? මහණෙනි, විනාශ වෙති'යි යන අරුතින් 'රූප' යයි කියනු ලැබේ. එය කුමකින් විනාශ වේද? සීතලෙන් විනාශ වේ. උණුසුමින් විනාශ වේ. සාගින්නෙන් විනාශ වේ. පිපාසයෙන් විනාශ වේ. මැසි, මදුරු, අවු, සුළං, සර්ප ස්පර්ශ ආදියෙන් ද විනාශ වේ යන අරුතින්, 'මහණෙනි, 'රූප' යයි කියනු ලැබේ.

එහි, 'රූපපති' යනු, ඇවිසෙති'යි, ගැටෙති'යි, පෙළෙති'යි, බිඳෙති'යි යන අර්ථයි. ශීතයෙන් විනාශවීම ලෝකාන්තරික නරකයෙහි ප්‍රකට වේ. මහිංස රට ආදී හිම වැටෙන ශීත ප්‍රදේශයන්හිද එය ප්‍රකට වේමය. එහි ජීවත්වන සත්ත්වයෝ ශීතයෙන් පෙළුණ ශරීර ඇතිව ජීවිතක්ෂයට පවා පැමිණෙති. උෂ්ණයෙන් විනාශ වීම අවීචි මහ නිරයෙහි ප්‍රකට වේ. එහි රත් වූ ලෝහමය පොළොව මත හොවා පංචවිධ වධ බන්ධනයන් කරන කල සත්ත්වයෝ මහ දුක් විඳිති. සාගින්නෙන් වන විනාශය ප්‍රේත ලෝකයෙහි මෙන්ම දුර්භික්ෂ කාලයෙහිද ප්‍රකට වේ. ප්‍රේත ලෝකයෙහි සත්ත්වයෝ බුද්ධාන්තර දෙකතුනක් කිසිම ආහාරයක් අතින් ගෙන මුවෙහි බහාලන්නාහු නම් නොවෙති. උදරය ඇතුළත ගිනිගත් සිදුරු සහිත ගසක් මෙන් දැවේ. දුර්භික්ෂ කාලයෙහිදී කැදිත්තක් පමණකුදු නොලැබ මරණයට පත් වන්නන්ගේ ප්‍රමාණයක් නැත.

පිපාසයෙන් වන විනාශය කාලකංජ ආදී ලෝකයන්හි ප්‍රකට වේ. එහි වනාහි සත්ත්වයෝ බුද්ධාන්තර දෙකතුනක් මුළුල්ලෙහි හදවත තෙමන පමණකුදු, දිව තෙමන පමණකුදු පැන්පොදක් ලැබීමට නොහැකි වෙති. පැන් බොන්නමු'යි ගඟට බටවුනට ගඟෙහි වැලිතලාවම මතුවී එයි. මහ

මුහුදට පනිනවුනට පවා මහ මුහුද මතුපිට පාෂාණයක්ම (ගල්තලාවක්ම) වේ. ඔව්හු මෙසේ වියලෙන්නාහු බලවත් දුකින් පෙළෙමින් හඬති.

මැසිමදුරු ආදීන්ගෙන් විනාශවීම මැසිමදුරුවන් බහුල ප්‍රදේශයන්හි ප්‍රකටය. එය වනාහි, 'කතමං තං රූපං, සනිදස්සනං සප්පටිඝං' (නිදර්ශන සහිත වූ, ප්‍රතිඝ සහිත වූ ඒ රූපය කවරේද) යන ආදී වශයෙන් අභිධර්මයෙහි විස්තර කරන ලද්දේමය.

ශබ්ද කරනු ලැබෙත්නු'යි **සද්දා** ශබ්ද නම් වෙති. කියනු ලැබෙතැ'යි යන අර්ථයි. ශබ්දයෝ ඝාතු හා චිත්ත වශයෙන් ද්විසමුට්ඨානික වෙති. විඳිනය කෙරෙති'යි **ගන්ධා** ගන්ධ නම් වෙති. තමාට අයත් වස්තූන් ප්‍රකාශ කෙරෙති'යි යන අර්ථයි. සත්ත්වයෝ එහි රස විඳිති'යි යන අරුතින් **රසා** රස නම් වෙති. ආශ්වාදනය කෙරෙති යන අර්ථයි. ස්පර්ශ කරනු ලැබෙත්නුයි. ඵොට්ඨබ්බ ස්පර්ශ නම් වෙති. මෙකී ගන්ධ ආදිය චතු සමුට්ඨානිකම වේ. එහි පිළිවෙල විභාගය අභිධර්මයෙහි විස්තර කරන ලද්දේමය. එම අර්ථයම විස්තර වශයෙන් දක්වන්නාහු **අත්ථරණා, පාපුරණා** යන ආදිය කීහු.

එහි, අතුරා හොවිති'යි යන අරුතින් **අත්ථරණා**, ආස්තරණ නම් වෙති. ශරීරය වෙලා පොරොවනු ලැබෙති'යි **පාපුරණ** ප්‍රාවරණ නම් වෙති. (තමා සතු ගම් බිම් සීමා) ඇතුළත උපන් (පාරම්පරික) ආදී සතර වර්ගයකට අයත් **දාසී දාසා** දැසි දස්සෝ මෙහි 'ඛෙත්ත වත්ථු' ශීර්ෂයෙන් කෙත්වතු මෙන්ම වැව් තඩාගාදියද ගන්නා ලදි. **හිරඤ්ඤං** යනු කහවණුය. **සුවණ්ණං** යනු රන්ය. හිරණ්‍ය ස්වර්ණ යන දෙක ගැනීමෙන් ලොහො මුවා, ලහ මුවා, දැවමුවා ආදී සියලු මසු (කාසි) වර්ග ගැනේ. **ගම නිගම රාජධානියෝ** යනු, ඒකකුටික (යටත් පිරිසෙයින්) එක් නිවෙසක් හෝ (දෙකක්, තුනක් ආදි වශයෙන්) ඇත්තේ ගමයි. ආපණ (සල්පිල්) සහිත වූයේ නිගම (නියම්ගම්)යි, එක් රජකුගේ ආඥාව පවත්නා ප්‍රදේශ සීමාව රාජධානියයි. **රට්ඨං** (රට) යනු, ජනපදයෙක එක් කොටසෙකි. 'ජනපදෝ' (ජනපදය) යනු කාසි, කෝසල ආදී ජනපදයි. **කොසෝ** (ක්‍රෝධ) යනු, දුර ප්‍රමාණයෙකි. එය සතර වැදෑරුම් වේ. ඇත්, අස්, රිය, පාබල යනුවෙනි. **කොට්ඨාගාරං** (කෝෂ්ඨාගාර) යනු, ධන කෝෂ්ඨාගාර, ධාන්‍ය කෝෂ්ඨාගාර, වස්ත්‍ර කෝෂ්ඨාගාර යන ත්‍රිවිධ කෝෂ්ඨාගාරයි. **යංකිඤ්චි** යනු, කිසිවක් ඉතිරි නොවන සේ, සියල්ල ඇතුළත් කොට දැක්වීමේ වචනයෙකි. **රජනීයං** යනු, ඇලුම් කළයුතුය යන අරුති. අනතුරුව, ත්‍රික වශයෙන් (තුනක් තුනක්

බැගින්) කාමය වර්ගකොට දක්වනු සඳහා, අතීත තිකය, අජ්ඣත්ත තිකය, හීන තිකය, ඕකාස තිකය, පයෝග තිකය, කාමාවචර තිකයයි ත්‍රික සයක් කීහු.

එහි පළමුකොට අතීත තිකයෙහි, තමාගේ ස්වභාවය උප්පාද (ඉපදීම) ආදී ලක්ෂණයන්ට පමුණුවා ඉක්මගියහ'යි **අතීතා** අතීත නම් වෙති. (ඉපදීම, ඉක්මයාම යන) දෙකම (මෙතෙක්) නො ආහ'යි **අනාගතා** අනාගත නම් වෙති. ඒ ඒ කාරණය නිසා උපන්හ'යි යන අරුතින් **පච්චුපපන්නා** (වර්තමාන) නම් වෙති. මෙය භවයෙන් සීමා වූවෙකි. පිළිසිඳීමේ පටන් අතීත (ඉකුත් වූ) භවයන්හි අවසන්වරට ඉකුත් භවයෙහි හෝ උපන්නාහු වෙත්වයි, කල්ප කෝටි සියදහසක් පෙර උපන්නාහු හෝ වෙත්වයි ඒ සියලු කාමයෝ **අතීත** නම් ම වෙති. චුතියෙහි පටන් අනාගත භවයන්හි උපදින කාමයෝ, අනතුරුව (මීළඟ) භවයෙහි උපදින කාමයෝ වෙත්වයි, කල්ප කෝටි සියදහසක් මතුයෙහි උපදින කාමයෝ වෙත්වයි, ඒ සියලු කාමයෝ **අනාගත** නම් ම වෙති. චුතිය හා ප්‍රතිසන්ධිය යන දෙක අතර වූ කාමයෝ **පච්චුපපන්න** වර්තමාන නම් වෙති. අජ්ඣත්ත තිකයෙහි මෙසේ (අතීත, අනාගත, පච්චුප්පන්න වශයෙන්) පවත්නා වූ, 'අපි ආත්මය'යි යන ග්‍රහණයට යන්නමෝය යන මෙවන් අභිප්‍රායයෙන් මෙන්, තමා අධිකාරී කොට තම සන්තානයෙහි පවත්නා, ඒ ඒ පුද්ගලයාට ආවේණික වූ කාමයෝ **අජ්ඣත්තිකා කාමා** අභ්‍යන්තර කාම නම් වෙති. එයින් පිටත පවත්නා, ඉන්ද්‍රියබද්ධ වූ හෝ, ඉන්ද්‍රිය බද්ධ නොවූ හෝ කාමයෝ **බහිද්ධා** බාහිර වූ කාමයෝය. මෙහි තුන්වන පදය වශයෙන් මේ දෙක්හිම මිශ්‍ර බව **අජ්ඣත්ත බහිද්ධා කාමා** යන්නෙන් කියන ලදි.

හීනත්තිකයෙහි, **හීනා** යනු ලාමක වූ කාමයෝය. **මජ්ඣිමා** යනු හීන-ප්‍රණීත යන දෙක මැද පවතින්නු'යි මධ්‍යම නම් වෙති. සෙසු කාමයෝ උත්තමාර්ථයෙන් **ප්‍රණීතා** ප්‍රණීත නම් වෙති. තවද එකිනෙක සංසන්දනය කොට උසස් පහත් බව සැලකීමෙන් හීන, මධ්‍යම, ප්‍රණීත බව දතයුතුය. නිරය වැසි සතුන්ගේ කාමයෝ (පහත්ම) කෙළවරට පැමිණියාහු **හීනා** හීන නම් වෙති. ඔවුන් හා සමග සසඳන කල තිරිසන් යෝනියෙහි, නාග සුපර්ණාදීන්ගේ කාමයෝ **පණීතා** නම, ප්‍රණීත නම් වෙති. සෙසු තිරිසන් සතුන්ගේ කාමයෝ **මජ්ඣිමා** මධ්‍යම නම් වෙති. එම (නාග සුපර්ණයන්ගේ) කාමයෝ ද **හීන** නම් වෙති. ඔවුන් සමග සසඳන කල මහේශාක්‍ය ප්‍රේතයන්ගේ කාමයෝ **පණීත** ප්‍රණීත වෙති. සෙසු ප්‍රේතයන්ගේ කාමයෝ

මජ්ඣිමා, මධ්‍යම නම් වෙති. ඔවුන්ගේ (මහේශාක්‍ය ප්‍රේතයන්ගේ) කාමයෝ ද **හීන** වෙති. ඔවුන් හා සමග සසඳන කල ජනපද වැසියන්ගේ කාමයෝ **පණීතා, ප්‍රණීත** නම් වෙති. පිටුසර වැසියන්ගේ කාමයෝ **මජ්ඣිමා** මධ්‍යම නම් වෙති. ඔවුන්ගේ (ජනපද වැසියන්ගේ) කාමයෝද **හීන** වෙති. ඔවුන් හා සසඳන කල ග්‍රාම භෝජකයන්ගේ කාමයෝ **පණීත** ප්‍රණීත වෙති. ඔවුන්ගේ (ග්‍රාම භෝජකයන්ගේ) සේවකයන්ගේ කාමයෝ **මජ්ඣිමා** මධ්‍යම නම් වෙති. ඔවුන් (ග්‍රාම භෝජකයා) ගේද, කාමයෝ **හීනා** හීන නම් වෙති. ඔවුන් හා සසඳන කල ජනපද ස්වාමීන්ගේ කාමයෝ **පණීතා** ප්‍රණීත නම් වෙති. ඔවුන්ගේ සේවකයන්ගේ කාමයෝ **මජ්ඣිමා**, මධ්‍යම නම් වෙති. ඔවුන් (ජනපද ස්වාමීන්)ගේද කාමයෝ **හීනා** හීන වෙති. ඔවුන් හා සසඳන කල ප්‍රදේශ රජවරුන්ගේ කාමයෝ **පණීතා** ප්‍රණීත නම් වෙති. ඔවුන්ගේ ඇමතිවරුන්ගේ කාමයෝ **මජ්ඣිමා** මධ්‍යම නම් වෙති. ඔවුන් (ප්‍රදේශ රජුන්)ගේද කාමයෝ **හීනා** හීන නම් වෙති. ඔවුන් හා සසඳන කල චක්‍රවර්ති රජවරුන්ගේ කාමයෝ **පණීතා** ප්‍රණීත නම් වෙති. ඔවුන්ගේ ඇමතිවරුන්ගේ කාමයෝ **මජ්ඣිමා**, මධ්‍යම නම් වෙති. ඔවුන් (චක්‍රවර්ති රජුන්) ගේද කාමයෝ **හීනා** හීන නම් වෙති. ඔවුන් හා සසඳන කල බූමාටු දෙවියන්ගේ කාමයෝ **පණීතා**, ප්‍රණීත නම් වෙති. ඔවුන්ගේ සේවක දෙවියන්ගේ කාමයෝ **මජ්ඣිමා**, මධ්‍යම නම් වෙති. ඔවුන් (බූමාටු දෙවියන්) ගේද, කාමයෝ **හීනා**, හීන නම් වෙති. ඔවුන් හා සසඳන කල චාතුර්මහාරාජික දෙවියන්ගේ කාමයෝ **පණීතා**, ප්‍රණීත නම් වෙති. යන ආදී වශයෙන් අකනිට්ඨ වැසි දෙවියන් කාමයෝ උසස්තම බවට පත්වූවාහු ප්‍රණීත නම් වෙති. මෙසේ ඒ ඒ සත්ත්වයන්ගේ කාමයන් නැවත නැවත සංසන්දනය කිරීමෙන් හීන, මධ්‍යම, ප්‍රණීත කාමයෝ දතයුත්තාහ.

ඕකාසතිකයෙහි, **ආපායිකා කාමා** යනු, 'අනභිවෘද්ධිය'යි කියනු ලබන, අහහුදයෙන් (අභි+උද්+අය) තොර වූ, සිවු අපායෙහි (අප+අය) උපන් කාමයෝ ආපායිකා ආපායික නම් වෙති. මිනිස්ලොවෙහි උපන් කාමයෝ 'මනුස්ස කාමා', මනුෂ්‍යකාම නම් වෙති. දෙවියන් අතර උපන් කාමයෝ දිබ්බා දිව්‍ය නම් වෙති.

පයෝගත්තිකයෙහි, එළඹ සිටි කාමයන් වළඳන හෙයින් නිරය වැසියන් හැර, සෙසු තුන් අපාය වැසි සතුන්ගේද, මනුෂ්‍යයින්ගේද, චාතුර්මහා රාජිකයෙහි පටන් තුසිත දෙව්ලොව දක්වා වූ දෙවියන්ගේ කාමයෝ **පච්චුපට්ඨිතා කාමා**, පච්චුපට්ඨිත (එළඹ සිටි) කාම නම් වෙති. ප්‍රකෘතියෙන්

(ස්වාභාවික වශයෙන්) පිළියෙල වූ ආරම්මණයෙන් බැහැරව, අතිරේක වශයෙන් කෙරෙති'යි **නිර්මාණරතී** දෙවියන්ගේ කාමයෝ **නිම්මිතා කාමා** නිර්මිත කාම නම් වෙති.

තමන්ගේ අදහස දැන අනුන් විසින් නිර්මිත අරමුණු සේවනය කරත්නු'යි පරනිර්මිත වසවර්ති දෙවියන්ගේ කාමයෝ **පරනිම්මිතා කාමා** පරනිර්මිත කාම නම් වෙති. **පරිගහිතා** යනු, මෙය මාගේය'යි ග්‍රහණය කරගත් කාමයෝ ය. **අපරිගහිතා** යනු, එසේ නොගන්නා ලද උතුරුකුරු වැසියන්ගේ වැනි කාමයෝය. **මමායිතා** යනු, තෘෂ්ණා වශයෙන් මෙය මාගේය'යි ගන්නා ලද කාමයෝය. **අමමායිතා** යනු, මෙකී කාමයනට ප්‍රතිපක්ෂ (එසේ නොගන්නා ලද කාමයෝය.)

සබ්බපි කාමාවචරා ධම්මා යනු, යටින් අවීචි නිරය කෙළවර කොටැ'යි යන මේ ආදී වශයෙන් කියන ලද කාමාවචර ධර්මයන්හි ඇතුළත් වූ කාමයෝය. මේ එහි වචනාර්ථයි. විස්තර වශයෙන් වස්තුකාමය, ක්ලේශකාමයයි දෙකකි. **කිලෙසකාමො** 'ක්ලේශ කාම' යනු, අර්ථ වශයෙන් ඡන්ද රාගයයි. **වත්ථු කාමා**, වස්තුකාම යනු, තෙහුමක වූ පැවැත්මයි. මෙහි, ක්ලේශකාමය, 'ආශා කෙරේනු'යි **කාමා**, කාම නම් වෙයි. අනෙක (වස්තු කාමය) ආශා කරනු ලැබෙති'යි යන අරුතින් 'කාම' නම් වේ. යම් පෙදෙසෙක්හි මේ ද්විවිධ වූම කාමයෝ පැවතීම් වශයෙන් හැසිරෙත්ද, එය සතර අපාය, මනුෂ්‍යලෝකය හා ෂඩ් දිව්‍යලෝක වශයෙන් එකොළොස් වැදෑරුම් ප්‍රදේශයයි.

මෙහි කාමය හැසිරේනුයි **කාමාවචරෝ** කාමාවචර නම් වේ. එයට අයත් සියලු ධර්මයන් (ස්වභාවයන්) සඳහා 'සබ්බපි කාමාවරා ධම්මා'යි කියන ලදි. තමාගේ ස්වභාවය දරත්නු'යි ධම්මා, ධර්ම නම් වෙති. **රූපාවචරා ධම්මා** යනු, පහළින්ම පිහිටි බ්‍රහ්මලෝකය ඇතුළු කොටැ'යි යන ආදී නයින් කියන ලද රූපාවචර ධර්මයන්ගේ වශයෙන් සියලුම ධර්මයෝ රූපාවචර ධර්ම නම් වෙති. **අරූපාවචරා ධම්මා** යනු, යටින් ආකාසානඤ්චායතන (අරූප) ලෝකයෙහි දෙවියන් ඇතුළු කොටැ'යි යන ආදී නයින් කියන ලද සියලුම අරූපාවචර ධර්මයෝයි. එහි රූප විෂයයෙහි හැසිරෙත්නු'යි රූපාවචර නම් වෙති. අරූප විෂයයෙහි හැසිරෙත්නු'යි අරූපාවචර නම් වෙති.

තණ්හා වත්‍ථුකා ප්‍රතිෂ්ඨා යන අර්ථයෙන් ද, 'හේතු' යන අර්ථයෙන්ද තණ්හාවට වස්තු වූවාහුය. **තණ්හාරම්මණා** යනු, ඔවුහු (වස්තු කාමයෝ) ඵල්බගෙනම තණ්හා-ප්‍රවෘත්ති වශයෙන් එයට අරමුණු වූවාහුය. **කමනීයට්ඨෙන** යනු, ප්‍රාර්ථනා කළයුතුය යන අර්ථයෙනි. **රජනීයට්ඨෙන** යනු, ඇලීමට යෝග්‍ය වූ යන අර්ථයෙනි. **මදනීයට්ඨෙන** යනු කුල මද ආදිය ඉපැදවිය හැකිය යන අර්ථයෙනි. 'තඤ්ච කතමෙ වත්‍ථුකාමා මනාපිකා රූපා' (එහි, වස්තු කාමයෝ කවරහුද යත්, මනාප වූ රූපයෝ) යනුවෙන් අර්ථා 'යං කිඤ්චි රජනීය වත්‍ථුං' (යම්කිසි ඇලුම් කටයුතු වස්තුවක්) යනුවෙන් සවිඤ්ඤාණික අවිඤ්ඤාණික වශයෙන් අවසානය කියන ලදි. ඉතිරිය එක් වතුෂ්කයක් හා ත්‍රිකයන් සයක් වෙති'යි දතයුතුය.

මෙසේ වස්තුකාමය දක්වා ක්ලේශකාමය දක්වනු පිණිස, 'කතමෙ කිලෙසකාමා' (ක්ලේශකාමයෝ කවරහුද යත්) යන ආදිය කීහු. එහි **ඡන්දෝ** (ඡන්දය) යනු දුර්වල රාගය යි. **රාගෝ** (රාග) යනු, එයට වඩා බලවත් රාගයයි. මතු පැවසෙන රාග විශේෂ තුනම මෙකී දෙකට වඩා බලවත් වේ. **කාමෙසු** යනු, පංචකාම ගුණයන් විෂයයෙහි ය. **කාමච්ඡන්දෝ** (කාමච්ඡන්ද) යනු 'කාම' යයි කියනු ලබන ඡන්දය (කැමැත්ත)යි. කත්තුකම්‍යතා ඡන්දය (කුසල් කරනු කැමැත්ත) නොවේ. ධර්මය කෙරෙහි ඇති කැමැත්ත හෝ නොවේ. කැමැති කරවීම් වශයෙන් ද ඇඳුම් කරවීම් වශයෙන්ද, කාමයම රාගය වෙති'යි **කාමරාගෝ** කාමරාග නම් වේ. කැමැති කරවීම් වශයෙන්ද, සතුටු කරවීම් වශයෙන්ද කාමයම නන්දී (සතුට) වෙති'යි, **කාමනන්දි**, කාමනන්දි නම් වේ. සියලු තන්හි මෙසේයි. 'කාම' යන්නෙහි අර්ථය මෙසේ දැන, තෘෂ්ණා ඉපදවීමේ අරුතින් **කාම තණ්හා** කාම තෘෂ්ණා නම්ද, සෙනෙහ දැනවීමේ අරුතින් **කාම සිනෙහ** (කාම ස්නේහ) නම්ද, දාහ දැනවීමේ අරුතින් **කාම පරිළාහ** කාම පරිදාහ නම්ද, මුසපත් කරවීමේ අරුතින් **කාම මුළ්හා** (කාම මූර්ඡා) නම්ද ගැලී අවසන් කිරීමේ අරුතින් **කාමජ්ඣොසානං** (කාම අධ්‍යවසාන) නම්ද, සසර වටෙහි ගැලෙති'යි, ගිලෙති'යි **කාමොඝෝ** කාමෝඝ නම්ද, සසර වටෙහි යොදවති'යි **කාමයෝගා** කාමයෝග නම්ද වෙති'යි දතයුතුය. දැඩි වශයෙන් තෘෂ්ණා දෘෂ්ටි ගැනීම **උපාදානං** උපාදාන නම් වේ. සිත වසා දමති'යි, හාත්පසින් වෙළා ගනිති'යි **නීවරණං** නීවරණ නම් වේ. **අඳසං** යනු, දිටිමි'යි යන අර්ථයි. **කාමා** යනු, එම්බා කාමය යි ඇමතීමයි. **තෙ** යනු තොපගේ යන අර්ථයි. **මූලං** යනු, ප්‍රතිෂ්ඨාවයි. මුලයි. **සංකප්පා** යනු, පරිකල්පනයෝයි. තොප ගැන සංකල්පනය නොකරමි'යි

නොතකමි'යි යන අර්ථයි. **න භොභිසි** යනු, නො වන්නෙහිය. නො උපදනෙහි'යි යන අර්ථයි.

ඉච්ඡමානසස යනු, අපේක්ෂා කරන්නා හටයි. **සාදිය මානසස** යනු, ආශ්වාදනය කරන්නා හටයි. **පත්ථය මානසස** යනු, ප්‍රාර්ථනය උපදවන්නා හටයි. **පිය මානසස** පැමිණෙනු පිණිස කැමැත්ත උපදවන්නා හටයි. **අභිජප්ප මානසස** යනු, තණ්හා වශයෙන් තෘප්තිය උපදවන්නා හටයි. නොහොත් **අභිවදනතසස ඛත්තියසස වා** (මනාකොට පවසන ක්ෂත්‍රියයකුට හෝ) යන ආදිය ක්ෂත්‍රිය ආදී චතු ජාති වශයෙන් කියන ලදී. 'ගහටඨසසවා පබබජිතසසවා' (ගිහියකුට හෝ පැවිද්දකුට හෝ) යනු ලිංග වශයෙන් කියන ලදි. **දෙවසසවා මනුසසසසවා** (දෙවියකුට හෝ මිනිසකුට හෝ) යනු, උත්පත්ති වශයෙන් කියන ලදි. **ඉජ්ඣති** (නිපැදේ) **සම්ඉජ්ඣති** මනාකොට නිපැදේ. **ඉජ්ඣති** යනු විශේෂ රූප ප්‍රතිලාභ වශයෙනි. 'ලභති' යනු, දර්ශනීය රූප ප්‍රතිලාභ වශයෙනි. **ඵලභාති** යනු, ප්‍රාසාදනීය රූප ප්‍රතිලාභ වශයෙනි. **අධිගච්ඡති** යනු, සණ්ඨාන රූප ප්‍රතිලාභ වශයෙනි. **විඳති** යනු, අභිප්‍රසාද රූප ප්‍රතිලාභ වශයෙනි. නොහොත්, **ඉජ්ඣති** යනු සෞභාග්‍ය මහත්වයෙනි. **ලභති** යනු, ජාති මහත්වයෙනි. **පටිලභති** යනු ඓශ්වර්ය මහත්වයෙනි. **අධිගච්ඡති** යනු, සුඛ මහත්වයෙනි. **විඳති** යනු, සම්පත් මහත්වයෙනි.

එකංස වචනං යනු, ඒකාංශයක් (එක් කොටසක්) ගැන පැවසෙන වචනයයි. එකංසං චීවරං කත්වා' (සිවුර ඒකාංශකොට) එකංස ව්‍යාකරණීයො පඤ්හා ඒකාන්ත ලෙස විවරණය කළයුතු ප්‍රශ්නය යන ආදී තන්හි සෙයින් අනේක අංශයන් ගැනීම ප්‍රතික්ෂේප කිරීමයි. **නිසසංසය වචනං** යනු, සැකයෙන් තොරව (ඒකාන්ත කොට) කියන වචනයි. සන්දේශය (සැකය) නිෂේධ කරන වචනයි. **නිකකංඛා වචනං** යනු, මෙය කෙසේද, මෙය කෙසේදැ'යි සංකා ප්‍රතික්ෂේප කිරීමේ වචනයි යන අර්ථයි. **අදෙවජ්ඣ වචනං** යනු ද්විවිධත්වය (දෙවැදෑරුම් බව) 'දෙවජ්ඣ' යනුවෙන් (තද්ධිත) වේ. එසේ (ද්විධත්වයක්) නොවන හෙයින් අද්වෙජ්ඣ වචනයි. ද්විවිධ භාව විරහිතය යන අර්ථයි. 'අදෙවජ්ඣ වචනා බුදධා' (බුදුවරයෝ වචන දෙකක් නැත්තාහු වෙති) යන ආදී තන්හි සෙයින් විමති ප්‍රතික්ෂේප වචනයි. **අදෙවළාක වචනං** යනු, දෙසිතක් (දෙබිඩියාවක්) නොවූ හෙයින් අදෙවළාක නම් වේ. ඉතිහාස (ඉති+ඉහ+ආසි) (මෙහි මෙසේ වීලූ) යන්න වැනි පරෝක්ෂ (දෙබිඩියා) වචන ප්‍රතික්ෂේප කිරීමයි. **නියොග වචනං** එක් අර්ථයෙක්හි

වචන දෙකක් නොයෙදෙතැ'යි නියෝග වචන' නම්. ද්විවිධ මාර්ග (දැබ්ඩි මං) ප්‍රතික්ෂේපයයි. අන්තැනෙක්හි වනාහි 'නියොගා', නියෝග යනු, අනාගත (තවමත් නොපැමිණි) අරමුණයයි (පවත්වාගෙන) ආයේය.

අපණ්ණක වචනං යනු, ප්‍රලාප රහිත වූ, අවිරුද්ධ කාරණ රහිත වූ සාරවත් වචන යි. අපණ්ණකං ඨානමෙතං (නිරවද්‍ය කාරණය'යි ඇතැමෙක් යෙති) යන ආදී තන්හි කියයි. නිරවද්‍ය ක්‍රියාවක් කරනවිට (එය අනුමත කරනු පිණිස) දෙනු ලබන පිළිතුර වැනි වචනයෙකි. **අවත්‍ථාපන වචනමෙතං** යන මේ වචනය, ගැඹුරට මුල්බැසගෙන තිරව පිහිටි දෙයක් තවදුරටත් තහවුරුකොට නිමකිරීමයි.

මේ මහා නිද්දේසයෙහි බෙදීමට නගන ලද පද බෙදීමට යන කල හේතු තුනක් අනුව බෙදීමට යෙයි. නානත්වයට පත්වන කල හේතු සතරක් අනුව නානත්වයට පත්වේ. මෙහි වනාහි පසුව කරනු ලබන අර්ථ විවරණ කරුණු දෙකක් අනුව කරනු ලැබේ. කෙසේද යත්,

එසේ බෙදීමට යන පද ව්‍යඤ්ජන වශයෙන්ද, උපසර්ග වශයෙන්ද, අර්ථ වශයෙන්දැ'යි යන කරුණු තුන අනුව බෙදීමට යෙයි. එහි, කොධො (ක්‍රෝධය), කුජඣන (කිපීම), කුජඣිතත්තං (කිපෙන බව), දොසො (ද්වේෂය), දූසනා (ද්වේශ කිරීම), දුසසිතත්තං (ද්වේෂ කිරීමේ ස්වභාවය යනුවෙන් මෙසේ ව්‍යඤ්ජන වශයෙන් බෙදීමට යාම දතයුතුය. මෙහි වනාහි එක්ම ක්‍රෝධය ව්‍යඤ්ජන වශයෙන් බෙදීමට ගියේය. 'ඉජඣති (ඉටු වේ) සමිජඣති (සමෘද්ධ වේ), ලභති (ලැබේ), පටිලභති (නතු වේ) අධිගච්ඡති (සාක්ෂාත් කෙරේ) යනුවෙන් වනාහි උපසර්ග වශයෙන් මෙසේ බෙදී යාම දතයුතුය. 'පණ්ඩිචචං (පාණ්ඩිත්‍යය), කොසලලං (කෞශල්‍යය), නෙපුඤඤං (නෛපුණ්‍යය) වෙභව්‍ය (විභූතිය) චින්තා (චින්තනය), උපපරිකඛා (මනසිකාරය) යනුවෙන් මෙසේ අර්ථ වශයෙන් බෙදී යාම දතයුතුය.

මෙම බෙදීම්වලදී, පළමුකොට 'පීති' යන පදය නිර්දේශ කිරීමේදී මෙකී ත්‍රිවිධ වූම බෙදීම් ලැබේ. 'පීති (ප්‍රීතිය, පාමොජ්ජ (ප්‍රමෝදය, හාසො (හාස්‍යය) යනුවෙන් ව්‍යඤ්ජන වශයෙන් බෙදී යාම වේ. 'ආමොදනා (අධික මෝදනය) පමොදනා (බලවත් මෝදනය) හාසො (හාස්‍යය) පහාකයා (අධික හාස්‍යය) යනුවෙන් උපසර්ග වශයෙන් බෙදීම වේ. 'ඔදගගං (ඔකඳ බව),

අත්තමනතා (සතුටු සිත් ඇති බව) යනුවෙන් අර්ථ වශයෙන් බෙදීම වේ. මේ නයින් සියලු පද නිර්දේශයන්හි බෙදියාම දතයුතුය.

නානාවිධ වන්නාහු ද නාම නානත්තය, ලක්ඛණ නානත්තය කිච්ච නානත්තය, පටික්ඛෙප නානත්තය යන මේ සතර කාරණයෙන් නානාවිධ වෙති.

'තත්‍ථ කතමො ව්‍යාපාදෝ යො තසමිං සමයෙ දොසො දුස්සතා' (එහි ව්‍යාපාදය යනු කවරේද යත්, එසමයෙහි යම් ද්වේෂයක් කිපීමක් වේද) යන මෙහි ව්‍යාපාද යයි ද ද්වේෂ යයි ද යන වචන දෙකින් ම අදහස් කෙරෙනුයේ එකම ක්‍රෝධයයි. නමුත් නම් වශයෙන් නානත්වයට ගියේය. මෙසේ නාම නානත්වයෙන් වන විවිධත්වය දතයුතුයි. රාශි අර්ථයෙන් පංචස්කන්ධය එකම ස්කන්ධයක් වේ. මෙහි වනාහි 'රූපය විනාශවීම් ලක්ෂණයෙන් යුක්තය. වේදනාව විඳීම් ලක්ෂණයෙන් යුක්තය. සංඥාව හැඳිනීම් ලක්ෂණයෙන් ද චේතනාව සිතීම් ලක්ෂණයෙන් ද විඤ්ඤාණය දැනගැනීම් ලක්ෂණයෙන් ද යුක්ත වේ' යනුවෙන් පංචස්කන්ධය මේ ලක්ෂණ නානත්වයෙන් යුක්ත වන බව දතයුතුයි. මෙසේ ලක්ෂණ නානත්වයෙන් වන නානාවිධ බව දතයුතුයි.

චත්තාරො සම්මප්පධානා, ඉධ භික්ඛු අනුප්පන්නානං පාපකානං අකුසලානං ධම්මානං අනුප්පාදාය ඡන්දං ජනෙති වායමති වීරියං ආරභති චිත්තං පග්ගණ්හාති පදහති' (සම්‍යක් ප්‍රධාන වීර්ය සතරකි. මේ ශාසනයෙහි භික්ෂු තෙමේ නූපන් පාපී වූ අකුශල ධර්මයන් නො ඉපදවීම පිණිස සිත දැඩිකර ගනී. දැඩි ලෙස උත්සාහ කරයි.) යනුවෙන් එකම වීර්යය කෘත්‍ය නානත්වයෙන් සතර තැනෙක්හි ආයේය. මෙසේ කෘත්‍ය නානත්වයෙන් නානාවිධ වන බව දතයුතුයි.

'චත්තාරො අසද්ධම්මා, කොධගරුකා න සද්ධම්ම ගරුතා මක්ඛගරුතා න සද්ධම්මගරුතා ලාභගරුතා න සද්ධම්මගරුතා සක්කාරගරුතා න සද්ධම්ම ගරුතා' මේ ආදී තන්හි වනාහි පටික්ඛෙපනානත්ත වශයෙන් නානත්වය දතයුතුය. මේ සතර නානත්වය වනාහි හුදෙක් 'පීති' විෂයයෙහිම ලැබෙනුයේ නොවේ. යථාලාභ වශයෙන් (ලැබෙන පරිද්දෙන්) සියලු තන්හි ම ලැබේ. ප්‍රීතිය පිළිබඳ (එම) පීති යන නාමය (චිත්තසස චිත්තං) 'සිතට ධනය වෙති'යි යන අරුතිනි. (මෙහි පෙළෙහි එන චිත්තසස චිත්තං යනු මුද්‍රණ දෝෂයක් විය යුතුයි.)

ප්‍රීතිය ද පැතිරෙන ලක්ෂණයෙන් යුතුය. වේදනාව විඳින ලක්ෂණයෙන් යුතුය. සංඥාව හැඳිනීම් ලක්ෂණයෙන් යුතුය. චේතනාව සිතීමේ ලක්ෂණයෙන් යුතුය. විඤ්ඤාණය දැනගැනීම් ලක්ෂණයෙන් යුතුය. (මේ ලක්ෂණ නානත්වයයි.)

එසේම ප්‍රීතිය පැතිරීම කෘත්‍යකොට ඇත්තේය. වේදනාව විඳීම කෘත්‍යකොට ඇත්තේය. සඤ්ඤාව හැඳිනීම කෘත්‍යකොට ඇත්තේය. චේතනාව සිතීම කෘත්‍යකොට ඇත්තේය. විඤ්ඤාණය දැනගැනීම කෘත්‍යකොට ඇත්තේය. මෙසේ කෘත්‍ය නානත්වයෙන් නානාවිධ බව දතයුතුයි. පටිකෙඛප නානත්වය පීති පදයෙහි නොමැත. අලෝභාදී පද නිර්දේශයන්හි, 'අලොභො අලුබභතා අලුබභිතතතං' (අලෝභය, ලෝභ නොකීම, ලෝභ නොකරන බව) ආදී ක්‍රමයෙන් ලැබෙන්නේ යැ'යි මෙසේ පටික්ඛෙප නානත්වයෙන් නානත්වය දතයුතුයි. මෙසේ සියලුම පද නිර්දේශයන්හි ලැබෙන පරිදි චතුර්විධ වූ ම නානත්වය දතයුතුය.

අපරදීපතාව (තවදුරටත් විස්තර කිරීම) **පදපුථුති** වශයෙන් හෝ **දළ්හීකම්ම** වශයෙන් හෝ මෙසේ ආකාර දෙකකට යයි. සැරයටි කෙළවරින් මඩින්නාක් මෙන් එක්වරක්ම 'පීති'යි කී කල්හි, මෙසේ ඒ පදය පිපී ගිය, අලංකෘත වූ විභූෂිත වූවක් නම් නොවේ. නැවත නැවත ව්‍යඤ්ජන වශයෙන්, උපසර්ග වශයෙන් හා අර්ථ වශයෙන් 'පීති පාමොජ්ජං ආමොදනා පමොදනා හාසො පහාසො විත්ති'යි පැවසූ කල්හිම පිපී ගිය, අලංකෘත වූ විභූෂිත වූ පදයක් නම් වේ. යම්සේ ළදරුවෙකු නහවා මනරම් වස්ත්‍රයක් අන්දවා, මලින් සරසා අඳුනින් ඇස් ගල්වා, ඉන්පසු ඔහුගේ නළලේ එකම රත්සිරියල් බිඳුවක් තබන්නේ නම්, එපමණකින් එය විසිතුරු තිලකයක් නම් නොවේ. නානා වර්ණයෙන් පිරිවරා බිඳුව තැබූ විට එය විසිතුරු තිලකයක් නම් වේ. මේ කරුණ මෙසේ දතයුතුයි. මෙය **පදපුථුති** (පද වර්ණනය) නම් වේ.

ව්‍යඤ්ජන වශයෙන්, උපසර්ග වශයෙන් හා අර්ථ වශයෙන් නැවත නැවත පැවසීම ම **දළ්හීකම්ම** (අවධාරණය) නම් වේ. යම්සේ ද, ඇවැත්නි! ස්වාමීනි!යි හෝ යක්ෂයෙක, සර්පයෙකැයි හෝ පැවසූ පමණින් එය දළ්හීකම්ම නම් නොවේ. 'ඇවැත්නි! ඇවැත්නි'යි හෝ 'ස්වාමීනි! ස්වාමීනි!යි හෝ යක්ෂයෙක යක්ෂයෙක'යි හෝ 'සර්පයෙක සර්පයෙක'යි හෝ පැවසූ කල්හිම දළ්හීකම්ම නම් වේ. මෙලෙසින් එක්වරක්ම සැරයටි කෙළවරින්

අවුස්සන්නාක් මෙන් 'පීති'යි පැවසූ පමණින් දළහීකම්ම නම් නොවේ. නැවත නැවත බ්‍යඤ්ජන වශයෙන් ද උපසග්ග වශයෙන් ද අර්ථ වශයෙන් ද 'පීති, පාමොජ්ජං, ආමොදනා, පමොදනා, හාසො, පහාසො, විත්තී' යැයි පැවසූ කල්හිම දළහීකම්ම නම් වේ. මෙසේ අපරදීපනාව ආකාර දෙකකට යයි. (ස්වරූප දෙකකින් සිදුවේ.) මේ අපරදීපනා වශයෙන් ද ලැබෙන පද නිද්දේසයන්හි දී සෑම තැනකම අර්ථ දතයුතුයි.

එහි පිනා යනුයේනුයි **පීති** නම් වේ. ඒ ප්‍රීති මැනවින් ප්‍රිය කරවීම ලක්ෂණ කොට ඇත්තේය. කය සිත පිනවීම කෘත්‍යකොට ඇත්තේය. ඔකඳ බවේ වැටහීම් කාරණ කොට ඇත්තේය. යම් ප්‍රීතියක් පංචකාම ගුණයන්ගෙන් යුක්ත වූයේ ද රූපාදී පංචකාම ගුණ කොට්ඨාසයන්ගෙන් යුක්ත වූයේ ද ඒ ප්‍රීතිය පිනා යන්නේනුයි **පීති** නම් වේ. මෙය ස්වභාව පදයකි. ප්‍රමුදිතභාවය **පාමොජ්ජං** (පාමොජ්ජ නම් වේ.) ආමෝදයට පත්වීම් ආකාරය **ආමොදනා** (ආමෝදනා නම් වේ.) ප්‍රමෝදයට පත්වීම් ආකාරය **පමොදනා** (පමෝදනා නම් වේ.) යම්සේ බෙහෙත් හෝ තෙල් හෝ උණුදිය, සිසිල්දිය හෝ එක්කිරීම 'මෝදනා' යැයි කියනු ලැබේ ද එසේම මේ ධර්මයන්ගේ එක්වීමෙන් **මොදනා** (මෝදනා නම් වේ.) උපසර්ග වශයෙන් සරසා 'අමොදනා පමොදනා' යැයි කියන ලදී.

සිනහ නගනුයේ නුයි **හාසො** නමි. ප්‍රහර්ෂය ගෙනදෙනුයේනුයි **පහාසො** නම් වේ. තුටුපහටු ආකාරයට මේ අධිවචන යි. විත්දනය කරත්නේනුයි **චිත්තං** (චිත්ත නම් වේ.) මේ ධනයට නමෙකි. මේ ප්‍රීතිය වනාහි සොම්නසට ප්‍රත්‍යය (හේතු) වූ බැවින් (සතුට ගෙනදෙන හෙයින්) ධනය හා සමාන වූ නිසා විත්ති නම් වේ. යම්සේ ධනවතාට ධනය නිසා සොම්නසක් උපදියි ද එසේම ප්‍රීතිමත් පුද්ගලයාට ප්‍රීතිය නිසා සොම්නසක් උපදියි. එනිසා 'විත්ති' යැයි කියන ලදී. තුෂ්ටි ස්වභාවයෙන් යුක්ත හෙයින් ප්‍රීතියට මේ නම යෙදේ. ප්‍රීතිමත් පුද්ගලයා කය සිත ඔදවැඩීමෙන් උද්යෝගවත් වීමෙන් **උදග්ග** (උදග්ර) යැයි කියනු ලැබේ. උදග්ර වූ ස්වභාවය ඔදග්ගං නම් වේ.

තමා සතු සිතක් ඇති බව (තුටු සිත් ඇති බව) **අත්තමනතා** නමි. සතුටින් තොර පුද්ගලයාගේ සිත දුකට පදනම් වූ හෙයින් තමා සතු සිත නම් නොවේ. සතුටින් යුතු පුද්ගලයාගේ සිත සැපයට පදනම් වූ හෙයින් තමා සතු සිත නම් වේ. (සතුටු සිත) මෙසේ තමා සතු සිත් ඇති බව

ආත්තමනතාව නම් වේ. ස්වකීය සිත් ඇති බව යන අර්ථයයි. ඒ ආත්තමනතාව යම්හෙයකින් අන් කිසිවකුගේ 'තමා සතු සිත් ඇති බව' නොව, සිත පිළිබඳ වූම ශෝභන ස්වභාව ඇති චෛතසික ධර්මයක් වේද, එහෙයින් **අත්තමනතා චිත්තස්ස** යි කියන ලදී. සිත චිත්‍ර විචිත්‍ර වූ බැවින් **චිත්තං** නම් වේ. අරමුණු මැනීම දන්නේනුයි 'මන' නම් වේ. 'මානසං' යනු මනෝ යන්නෙහිම ස්වාර්ථ පදයෙකි. 'අත්තලිකඛවරෝ පායෝ සවායං චරති මානසෝ' (අහසෙහි හැසිරෙන මලපුඩුවක් ඒ මේ සිත හැසිරෙයි) යන මෙහි සිතේ මනාව යෙදුණු (සම්ප්‍රයුක්ත වූ) ධර්මය 'මානස' යැයි කියන ලදී.

කථං හි භගවා තුය්හං සාවකෝ සාසනෙ රතා
අපපත්තමානසෝ සෙඛෝ කාලං කයිරා ජනෙසුතා'තී

භාග්‍යවත් (ජනෙසුත) බුදුරජාණන් වහන්ස, ඔබවහන්සේගේ ශාසනයෙහි ඇලුණු ශ්‍රාවකයෙක් තෙමේ කෙසේනම් රහත්ඵලයට නොපැමිණි සේඛියයෙක්ව කළුරිය කරන්නේ ද?

යන මෙහි රහත් බව 'මානසං' යැයි කියන ලදී.

මෙතැන්හිදී මන නම් වූ සිතම (ස්වාර්ථ වශයෙන්) 'මානසං' නම් වේ. බ්‍යඤ්ජන වශයෙන් මේ පදය වර්ධනය කරන ලදී. **හදයං 'චිත්තං වා තෙ බිපිසසාමි, හදයං වා තෙ එලෙසසාමි'** (තාගේ සිත හෝ සුණු කරන්නෙමි. ළය හෝ එලන්නෙමි.) යන තැන්හි උරස්ථලය (පපුව) සඳහා හදය යැයි කියන ලදී. **'හදයා හදයං මඤ්ඤෙ අඤ්ඤාය තච්ඡති'** (සිතින් සිත දැන සසිති'යි හඟිමි.) යන තැන්හි හදයං යනු සිතයි. **'වකකං හදයං'** යන තැන්හි හදයං යනු හදවතයි. මෙතැනදී හදයං යනු සිතමයි. ශරීරාභ්‍යන්තරයේ යන අර්ථයෙන් 'හදය'යි කියන ලදී. එයම ඉතා පිරිසිදුය යන අරුතින් **පණ්ඩරං** නම් වේ. භවාංග සිත සඳහා මෙය කියන ලදී. **'පභසසරමිදං භිකඛවෙ චිත්තං තඤ්ච ඛො ආගන්තුකෙහි උපක්කිලෙසෙහි උපක්කිලිට්ඨං'** (මහණෙනි, මේ සිත ප්‍රභාස්වරය. එය වනාහි ආගන්තුක වූ උපක්ලේශයන්ගෙන් කිලිටි වී ඇත.) යනුයි. ඒ භවංග සිතින් නික්මෙන් හෙයින් කුසලය ද (පෙළෙහි අකුසලම්පි යනු මුද්‍රණ දෝෂයෙකැයි හැඟේ. එය 'කුසලම්පි' යනුවෙන් නිදොස් විය යුතුය.) මහා ගංගාවෙන් නික්මෙන (බෙදී යන) නදිය ගංගා නම් වන්නාක් මෙන් ද ගෝදාවරී ගඟින් නික්මෙන

නදිය ගෝදාවරී නම් වන්නාක් මෙන් ද 'පණ්ඩර' යැයි ම කියන ලදී. **මනො මනායතනං** යන මෙහි වනාහි 'මනො' යනුවෙන් ගැනීම මනස ම (සිතම) ආයතන වන බව දක්වනු පිණිසයි.

එහෙයින් මෙය පැහැදිලි කොට දක්වයි. 'දේවායතන' යන පදය මෙන් මනස පිළිබඳ ආයතනයක් වූ බැවින් 'මනායතන' යන පදය සිද්ධ වූයේ නොවේ. එහෙත් මනසම ආයතන වූ බැවින් 'මනො එව ආයතනං' විග්‍රහයෙන් 'මනායතන' නම් විය. එහි නිවාසයං යන අරුතින් ද ආකාරය යන අරුතින් ද සමොසරණ ස්ථාන අරුතින් ද සංජාතිදේස අරුතින් ද කාරන අරුතින් ද **ආයතනං** (ආයතන) නම් වූ බව දතයුතුයි. යම්සේ ලෝකයෙහි ඉස්සරායතනය, වාසුදේවායතනය යනාදියෙහි නිවාසය, වෙසෙන තැන ආයතන යැයි කියනු ලැබේ. 'සුවණ්ණායතනං රජතායතනං' (ස්වර්ණායතනය රජතායතනය) යනාදියෙහි ආකරය යන අර්ථයි. සසුනෙහි වනාහි 'මනොරමෙ ආයතනෙ සෙවනති නං විහංගමා' (අහසෙහි සැරිසරන පක්ෂීන් සෙයින් ඔවුහු මනරම් ආයතනයෙක්හි සැරිසරති.) යනාදියෙහි සමෝසරණ ස්ථානාර්ථයෙනි. 'දකඛිණාපථො ගුනනං ආයතනං' (දක්ෂිණා පථය ගවයන්ගේ ජාතභූමියයි.) යනාදියෙහි සංජාතිදේශ (උපන් දේශය යන) අර්ථයයි. 'තත්‍රතත්‍රෙව සකඛිභබබතං පාපුණාති සති සති ආයතනෙ' (හේතුවක් ඇති ඇති කල්හි දී සාක්ෂි පිණිස යෝග්‍යභාවයට පත් වේ.) යනාදියෙහි කාරණාර්ථයයි. (හේතු අර්ථයි.) මෙතැනදී ආයතන යන්නෙන් සංජාති දේශාර්ථය ද සමෝසරණ ස්ථානාර්ථය ද කාරණාර්ථය ද යන තුන් ආකාරයම සුදුසුය.

'ස්පර්ශාදී ධර්මයෝ මෙහි හටගනිති' යන අරුතින් සංජාති දේශාර්ථයෙන් මෙය ආයතනයකි. 'බාහිර වූ රූප, සද්ද, ගන්ධ, රස, ඵොට්ඨබ්බ යන ධර්මයෝ අරමුණු වශයෙන් මෙහි සැරිසරති'යි යන අරුතින් සැරිසරන ස්ථානය ද ආයතන වේ. ස්පර්ශාදීන් පිළිබඳ සහජාත ධර්මයන් ප්‍රත්‍යයාර්ථයෙන් කාරණ වන හෙයින් කාරණය (හේතුව) ආයතන බව දතයුතුය. එම මනසම මනන (සිතීම්) ලක්ෂණයෙන් ප්‍රධාන බව, අධිපති බව කරන්නේනුයි (ඉන්‍දටඨ කරොතීති) ඉන්‍ද්‍රිය නම් වේ. මනසම ඉන්‍ද්‍රිය වූයේ **මනින්‍ද්‍රියං** නම් වේ.

'විජානනය කරන්නේනු'යි (විජානාති ති) **විඤ්ඤාණං** (විඤ්ඤාණ නම් වේ. විඤ්ඤාණය ම ස්කන්ධය වූයේ **විඤ්ඤාණකඛන්ධො**

විඤ්ඤාණක්ඛන්ධ නම් වේ. එහි රාශි ආදී වශයෙන් අර්ථ දතයුතුයි. 'මහා උදකක්ඛන්ධොත්වේව සංඛං ගච්ඡති' ති යනු 'මහා දියකඳ' මෙහි රාශිය යන අරුතින් 'ඛන්ධෝ'යි කියන ලදී. 'සීලක්ඛන්ධ, සමාධික්ඛන්ධ' යන තැන්හි ගුණ අර්ථ (රූඪී) යෙන් ද 'අද්දසා ඛො භගවා මහන්තං දාරුක්ඛන්ධං' (භාග්‍යවතුන් වහන්සේ මහත් දර ගොඩක් දුටු සේක.) යන තැන්හි ප්‍රඥප්ති මාත්‍රයෙන් ද 'ඛන්ධ' යන්න යෙදී ඇත. මෙහි වනාහි රූඪී වශයෙන් 'ඛන්ධ' යැයි කියන ලදී. රාශි අර්ථයෙන් වනාහි විඤ්ඤාණ ස්කන්ධයෙහි ඒකදේශයකි. (කොටසකි.) එක් විඤ්ඤාණයෙකි.

එහෙයින්, යම්සේ ගසෙක එක් කොටසක් සිඳින කල්හි 'ගස් සිඳිති' යන වහර ඇතිවන්නාක් මෙන් විඤ්ඤාණයේ ඒකදේශයක් වූ එක් විඤ්ඤාණයකුදු රූඪී වශයෙන් 'විඤ්ඤාණක්ඛන්ධ' යැයි කියන ලදී.

තජ්ජා මනෝ විඤ්ඤාණ ධාතු (එයින් හටගත් මනෝවිඤ්ඤාණ ධාතුව) යනු ඒ ස්පර්ශාදී ධර්මයන් නො උපදවන මනෝ විඤ්ඤාණ ධාතුවයි. මේ පදයෙහි එක ම සිත මැනීම් අර්ථයෙන් 'මනෝ' යැයි ද දැනගැනීම් (විජානන) අර්ථයෙන් විඤ්ඤාණ යයි ද ස්වභාවාර්ථයෙන් හෝ 'සත්ත්වයකු නොවෙති යන අර්ථයෙන් 'ධාතු' යැයි ද යනුවෙන් 'මනෝ නාම' තුනෙකින් කියන ලදී. **සහගතෝ** නොහරන ලදුයේයි, **සහජාතෝ** ළංව යේයි. එකට උපන්නේයි. සංසට්ඨා මිශ්‍ර වී, එකිනෙක සම්බන්ධ වී සිටියේ යි. **සම්පයුත්තෝ** යනු සම ප්‍රකාරයෙන් එක්ව යෙදුණේයි. කවර ප්‍රකාරයෙන්ද? එකට ඉපදීම ආදී වශයෙනි. 'අන් කිසි ධර්මයක් හා සමග එක්ව යෙදුණු කිසි ධර්මයක් නැද්දැ'යි මෙසේ අසන ලද මේ ප්‍රශ්නය ප්‍රතික්ෂේප කිරීමෙන්, යම්කිසි ධර්මයක් සමග සහගත වූ, සහජාත වූ, සංසට්ඨ වූ, එකට උපන්, එකට නිරුද්ධ වූ, එක් වස්තුවක් වූ, එක් අරමුණක් වූ ධර්මයක් ඇත්තේ නොවේ ද? මෙසේ එකට ඉපදීම් ආදී වශයෙන් සම්ප්‍රයෝග (එකට යෙදුණු) අර්ථය කියන ලදී.

මෙසේ ඒ එකුප්පාදතාදී සම ප්‍රකාරයෙන් යුතු බැවින් සම්ප්‍රයුක්තය. **එකුප්පාදෝ** යනු 'එකට උපන්නේ යි. වෙන් නොවූයේ යි' යන අර්ථයි. **එකනිරොධෝ** යනු එකට ම නිරුද්ධ වන්නේ යි. **එකවත්ථුකෝ** හදවතේ පැවතීම් වශයෙන් ඒකවස්තුක වූයේ යි. **එකාරම්මණෝ** රූපාදී වශයෙන් එක් අරමුණක පවත්නේ යි.

මෙහි 'සහගත' ශබ්දය, තබ්භාවයෙහි, ඔකිණ්ණයෙහි, ආරම්මණයෙහි, නිස්සයයෙහි, සංසට්ඨයෙහි යන අර්ථ පසෙහි යෙදී ඇති අයුර බුද්ධවචනයෙහි දක්නට ඇත. 'යායං තණ්හා පොනොභවිකා නන්දිරාග සහගතා' (පුනර්භවය ඇතිකරන නන්දිරාගයෙන් යුත් යම් මේ තෘෂ්ණාවක් වේ ද) යන තැන්හි තත්භාවයෙහි ('එයම වෙති'යි යන අර්ථයෙහි) යෙදුණු බව දතයුතුයි. 'නන්දිරාග වූ' යන අර්ථයි. 'යා භික්ඛවෙ වීමංසා කොසජ්ජ සහගතා කොසජ්ජ සම්පයුත්තා' (මහණෙනි, යම් වීමංසාවක් කුසීත බවින් යුක්ත වේද) යන මෙහි ඕකිණ්ණ අර්ථයෙහි යෙදී ඇත. අතරින් පතර උපදින්නා වූ, කුසීතකමින් ගැවසියේ යි යන අර්ථයි. 'ලාභී හොති රූප සහගතානං වා සමාපත්තීනං අරූප සහගතානං වා සමාපත්තීනං' (රූපාරම්මණ වූ හෝ අරූපාරම්මණ වූ සමාපත්තිලාභියෙක් වේ.) යන තැන්හි ආරම්මණාර්ථයෙහි යෙදී ඇත. රූපාරම්මණයන්ගේයි. අරූපාරම්මණයන්ගේයි යන අර්ථයි. 'අට්ඨිකසඤ්ඤා සහගතං සති සම්බොජ්ඣංගං භාවෙති' (අට්ඨික සඤ්ඤා සහගත වූ සති සම්බොජ්ඣංගය වඩයි) යන මෙහි නිස්සයාර්ථයෙහි (නිශ්‍රිතැයි යන අර්ථයෙහි) යෙදී ඇත. 'අට්ඨි' යන සංඥාව ඇසුරුකොට, අට්ඨික සංඥාව වඩා ලබන ලද්දේය' යන අර්ථයි. 'ඉදං සුඛං ඉමාය පීතියා සහගතං හොති සහජාතං සම්පයුත්තං' (මේ සැපය, මේ ප්‍රීතියෙන් මුසුවූයේය, සහජාත වූයේය, සම්ප්‍රයුක්ත වූයේය) යන මෙහි සංසට්ඨාර්ථය ඇත. 'සම්මිශ්‍ර වූයේ'යි යන අර්ථයි. මෙතැන්හිදී 'සහගත' යනු 'මිශ්‍ර වූ' යන අර්ථයෙහි යෙදී ඇත.

සහජාත ශබ්දය 'සහජාතං පුරෙජාතං පච්ඡාජාතං' (සමග උපන්, පළමුව උපන්, පසුව උපන්) යන තැන්හි මෙන් සහජාතාර්ථයෙහි ය. සංසට්ඨ ශබ්දය 'ගිහී සංසට්ඨොති' ච (ගිහියන් සමග සංසර්ගයෙහි යෙදුණේ.) යන තැන්හි ද 'එවං සංසට්ඨා භනෙත' (ස්වාමීනි, මේ ආකාරයෙන් සංසර්ගයෙහි යෙදුණේ.) යන තැන්හි ද සංසර්ගාර්ථයෙහි ය. 'කිසෙ ථූලෙ විවජ්ජෙත්වා සංසට්ඨා යොජිතා හයා' (කෘශ වූ ද ස්ථූල වූ ද අසුන් හැර එක සමාන වූ අස්හු යොදන ලද්දාහ.) යන මෙතැන්හි සදෘශාර්ථයෙහි ය.

පුච්ඡන්ති පරිවාරෙ අමෙඛා තෙ දධිවාහන
මූලං මූලෙන සංසට්ඨං සාඛා සාඛා නිසෙවරෙ'තී

'දධිවාහනය! තොපගේ අඹගස කොහොඹ ගස් පිරිවරා ඇත. මූලෙන් මුල එක්ව වෙළී ඇත. අත්තෙන් අත්ත ඇසුරු කෙරේ.'

යන මෙහි සංසට්ඨ ශබ්දය උපචිත (රැස්වීම්) අර්ථයෙහි ය. 'චිත්ත සංයුත්තා ධම්මා' යන මෙහි චිත්ත සම්ප්‍රයුක්ත ධර්ම විෂයයෙහි ය. මෙහි වනාහි ඒ (යො යනු සො යනුවෙන් නිදොස් විය යුතුයි.) විඤ්ඤාණ ස්කන්ධය ඵල ප්‍රධානයෙහි (විපාක දීමෙහි) දී, වෙන් නොවන ස්වභාවයක් වන හෙයින් බෙදා වෙන් නොකොට ඒකුප්පාද (එක්ව උපදනා) ස්වභාවයට පත්වීමෙන් 'සම්ප්‍රයුක්ත' යැයි කියනු ලැබේ. නැතහොත් 'සහගත' යැයි පවසා, 'එම විඤ්ඤාණ ස්කන්ධය පසුපසින් ලුහුබැඳ පැමිණි පුත්‍රයා මෙන් නොවෙති'යි දැක්වීමට **සහජාතො** යි කියන ලදී. (තවද) 'සහජාත සමග එකට උපන් රූප අරූප ස්කන්ධ ධර්ම මෙන් නොවෙති'යි දැක්වීමට සංයුත්තා යි කියන ලදී.

එම (විඤ්ඤාණ ස්කන්ධය) ද (වෙන්කළ හැකි) කිරි දිය මෙන් නොවෙතියි දක්වනු පිණිස **සම්පයුත්තෙනා** (මැනවින් යෙදුණේය)යි කියන ලදී. වෙන් කරනු නොහැකි වන හෙයින් (එසේ වුව ද) සමග උපන්, එකට යෙදුණ (එහෙත් වෙන් කළ හැකි) කිරි තෙල් වැනි ස්වභාවයෝ ඇත්තාහු, නොවෙත් ද, කිරෙන් ඉවත් කළ වෙඩරු කොයින් එසේ වෙන්කර ලද්දාහුද වෙති. එවැනි ලක්ෂණයට පත් වූයේ, ඒකුප්පාදී (එක්ව උපන්) ලක්ෂණ ඇත්තේ ම වේ'යැයි දක්වනු පිණිස **එකුප්පාදො** (එක්ව උපන්) යනාදිය කියන ලදී.

මෙහි ඒකුප්පාද සහජාත ධර්මයන්ගේ නානාකාර බව (වෙනස) කුමක් ද? ඉපදීමේදී අතරක් නොමැති වීම ඒකුප්පාද යයි. එම විඤ්ඤාණ ස්කන්ධය (කිරි) දී බවට පත්ව බොහෝ කාලයක් ඉකුත්ව ගිය ද මැඩීමෙහිදී ප්‍රකටවන වෙඩරු මෙන් හෝ පෙරබත් කාලය (පෙරවරු) පසුබත් කාලය (පස්වරු) වශයෙන් එක් දිනයකම ඉපැදීම මෙන් හෝ එය නොවන බව දක්වනු පිණිස 'එකම ක්ෂණයෙහි උපන්නේය'යි සහජාත නම් වේ.

පිහිටීම් අර්ථයෙන් **එකවත්ථුකො** ඒකවත්ථුක නම් වේ. එක් පිරිසිදීමෙන් (එකක් ලෙස ගැනීමෙන්) ඒකවත්ථුක නම් වේ. භික්ෂූන් දෙදෙනෙකුගේ ඒකවත්ථු කතාව මෙන් ස්ථාන අතර වෙනසක් නැත. **එකාරම්මණො** යන

අනියත වූ ඒකාරම්මණ (එක් අරමුණු) ඇති බවයි. චක්ඛු විඤ්ඤාණය මෙන් නොවෙති'යි මෙසේ ඇතැමෙක් අර්ථ වර්ණනා කරති.

මච්චෝ යනු මුල් පදය යි. රූපාදියෙහි ඇලුණහ යි, ලැගියහයි, ලැගුණහ යි **සත්තෝ** සත්ව නම් වේ. කියන ලද මැයි, 'සත්ත්වයා සත්ත්වයා යැයි කියනු ලැබේ. ස්වාමීනි, කොපමණකින් සත්ත්ව නම් වේද?' 'රාධය, රූපයක් කෙරෙහි යම් කැමැත්තක්, යම් රාගයක් වේද, එහි යමෙක් ඇලුණේද, පැටලුණේ ද, එහෙයින් සත්ත්වයා යැයි කියනු ලැබේ.' අත්බව්හි යෙදීමෙන් හෝ සත්ත්වයා යැයි කියනු ලැබේ.

සුගති දුගති දෙකට ගෙන යන්නේනුයි **නරෝ** නර නම් වේ. ඔහුගේ පුත් වූයේ **මාණවෝ** මානව නම් වේ. උපකරණවලින් තමා පෝෂණය කරගත්තේනුයි **පොසෝ** පොස නම් වේ. පුං යනු නිරයයි. ඒ නිරයෙහි ගැලෙනුයි **පුග්ගලෝ** පුද්ගල නම් වේ. ජීවිතින්ද්‍රිය චෛතසිකය දරන්නේනුයි **ජීවෝ** ජීව නම් වේ. චුතියෙන් පසුව ජාතියට (ඉපදීමට) යන්නේනුයි **ජාගු** නම් වේ. ජායති, උපදින්නේනුයි **ජන්තු** නම් වේ. ඉන්ද්‍රියයන්ගෙන් අරමුණු වෙත ගෙන යන්නේනුයි **ඉන්දගු** නම් වේ. නොහොත් අධිපතියකු වැනි වූ කර්මය හේතුකොට යන්නේ නුයි **ඉන්දගු** නම් වේ. **හින්දගු** යනු ද පෙළෙහි යෙදේ. 'හින්දං' යනු මරණයයි. ඒ මරණයට පත්වන්නේනුයි **හින්දගු** නම් වේ. ඔහුගෙන් උපන්නේය යන අරුතින් **මනුජෝ** නම් වේ. **යං සාදියති** යනු යම් රූපාදියක් ආශ්වාදනය කරයි ද යන අර්ථයි. සෙසු පදයන්ගේ අර්ථ කියන ලද ක්‍රමයෙන් ම දතයුතුයි.

ඉන් අනතුරුව ඉහත කී අර්ථය නිගමනය කරමින්, අවසන් කර දක්වමින් **තෙනාහ භගවා 'කාමං කාමයමානස්ස** -පෙ- **යදිච්ඡති** යැයි දක්වන ලදී. මින්පසුව එන ගාථා විස්තරයන්හි මෙතෙකුදු විස්තර නොදක්වා විශේෂ මාත්‍රයක්ම (හුදෙක් විශේෂකොට කිවයුතු අර්ථයක් ම) දක්වන්නෙමි.

1.2. කාම සූත්‍රය දෙවන ගාථාවයි.

තස්ස මෙ කාමයමානස්ස යනු ඒ කාම සම්පත් කැමතිවන පුද්ගලයාට නැතහොත් කාමයෙන් පිනායෑම කැමතිවන, **ඡන්ද ජාතස්ස** උපන් තණ්හා ඇති **ජන්තූනං** සත්ත්වයාට **තෙ කාමා පරිහායන්ති** ඉදින්

ඒ කාමයෝ පිරිහී යත් නම්, **සල්ලවිද්ධොව රුප්පති** එවිට ඔහු යකඩ ආදියෙන් කළ හුලකින් විදින ලද්දකු මෙන් පීඩාවට පත් වේ. මින්පසුව මූලින් පැවසූ පදයන්ගේ අර්ථ හැර නොපැවසූ පදයන්හි අර්ථයම කියන්නෙමි.

ඇස පිනවන අරමුණට පැමිණීම් වශයෙන් 'යෙති'යි, 'පැමිණෙති'යි, 'දර්ශනීය වශයෙන් ප්‍රිය කෙරෙති'යි, 'අරමුණු වශයෙන් සමීපයට පැමිණෙති'යි යන අරුතින් **නීයති** යනු වේ. 'ඇසිය යුත්තක්ව කණ, ශ්‍රෝතස පිහිටීම ආරම්මණ වශයෙන් ඇදගනිති'යි යන අරුතින් **ආයුහති** යනු වේ. සිහිකළ යුත්තක්ව සිත පිහිටීම, 'ආරම්මණ වශයෙන් ගෙන එක්තැන් කරති'යි, 'ළඟට පමුණුවති'යි යන අරුතින් සංහරීයති යනු වේ. යථා යනු උපමාර්ථයේ නිපාතයකි. 'ඇතු පිටින් යෙති'යි, 'ගමන් කරති'යි යන අරුතින් හත්ථියානෙන යනු වේ. වා යනු විකල්පාර්ථයේ 'හෝ' යන නිපාතයයි. 'අසු පිටින් යෙති'යි ගමන් කරති'යි යන අරුතින් **අස්සයානෙන** යනු වේ. ගවයකු යෙදූ, ගවයකු අදින යානයෙන් (රථය) ගෙනයාතුයි. **ගොයානෙන** ගෝයානයෙනි. අජ යානාදියෙහි ද මෙම නය වේ.

කැමති ලෙසට උපන්නේ නුයි **සඤ්ජාතො** සඤ්ජාත නම්. අරමුණ ප්‍රියත්වය අනුව උපන්නේ නුයි **අභිනිබ්බත්තෙනා** අභිනිබ්බත්ත නම්. අරමුණට මනාප පහළ වූ හෙයින් **පාතුභූතො** පාතුභූත නම්. නැතහොත්, කාමරාග වශයෙන් හෝ උපන්නේ **සඤ්ජාතො**, සඤ්ජාත නම්. කාම නන්දි (සතුට) වශයෙන් උපන්නේ **අභිනිබ්බත්තෙනා** අභිනිබ්බත්ත නම්. කාම ආශා වශයෙන්ද කාම ස්නේහ වශයෙන් ද කාමච්ඡන්ද වශයෙන් ද කාම පිරිතැවීම් (පරිදාහය) වශයෙන් ද **පාතුභූතො** පාතුභූත යැයි දතයුතුයි.

තෙ කාමා පරිහායන්ති ඒ වස්තු කාමාදිය පිරිහීමට පත් වේ. ගිලිහීමට පත් වේ. **සො වා කාමෙහි පරිහායති** යනු මේ ක්ෂත්‍රියාදී පුද්ගලයා වස්තු කාමාදී කාමයන්ගෙන් පිරිහී යයි. ගිලිහී යයි.

පුබ්බෙව මච්චං විජහන්ති භොගා
මච්චෝ ධනෙ පුබ්බතරං ජහාති'ති

'පළමුකොට ම භෝගයෝ මිනිසා අත්හරිති. එයටත් වඩා පළමුව මිනිසා ධනය හැර යයි.'

යනාදියෙහි මෙනි. **කථං** යනු කවරාකාරයකින් ද? **තිටඨනතසෙසව** යනු ජීවත්ව සිටියදීම **තෙ භොගෙ** ඒ වස්තුකාමාදී භෝග සම්පත් **රාජානොවා** පෘථිවි පාලක රජවරු හෝ **හරනති** රැගෙන යති. පැහැර ගනිති. **චොරාවා** හන්දි සිදින (ගෙවල් බිඳින) සොරු හෝ අගහවා යනු ලැව්ගිනි ආදියෙන් හෝ. **දහති** දවයි. හලු කරයි. **උදකං වා'** ගං හෝ ආදී ජලය **වහති** ගසාගෙන ගොස් මහ මුහුදේ තැන්පත් කරයි. **අපපියා** වා අකමැති අමනාප වූවෝ හෝ. **හරනති දායාදා** යනු උරුමයක්, හිමිකමක් නැත්තෝ දායාද කොට ගෙන යති. **නිහිතං වා** නිධන්කර තබන ලද ධනය හෝ **නාධිගචඡති** 'නො විඳිති'යි, 'නොලබති'යි, 'නොදකිති'යි යන අර්ථයි. **දුපපයුතතෙතා** යනු වරදවා යෙදූ කෘෂි වණික් ආදී කර්මාන්තයි. **භිජජනති** යනු බිඳීමට පත්වෙති. නොපවතියි යන අර්ථයි. 'භිජජති තං අජානනතා' (නොදැනීමෙන් ද විනාශ වෙයි.) යනාදියෙහි සම්භවය දතයුතුයි.

කුලෙ ඝාතකො වා කුලඛහාගෙ උපපජජති යනු ක්ෂත්‍රියාදී කුල නසන්නා කුලයේ අවසන් පුරුෂයාව උපදියි. **කුලෙ වා කුලගාරො** යනු ද පාළි (පෙල)යි. **යො තෙ භොගෙ විකිරති** යනු යමෙක් අන්තිමයා වූයේ ද හේ තෙමේ, ඒ අමුරන් ආදී භෝගයන් ක්ෂය කරයි. **විධමති** යනු වියෝග කරයි. දුරුකරයි. **විදධංසෙති** යනු නසයි. මකා දමයි. නැතහොත් ස්ත්‍රී ලෝලියෙක්ව **විකිරති** භෝග විසුරුවයි. සුරාසොඬෙක්ව **විධමති** භෝග වනසා දමයි. දූකෙළින්නෙක්ව **විදධංසෙති** භෝග විනාශ කර දමයි. නැතහොත් **විකිරති** යනු උපන් අය ආදායම් නොදැනීමෙනි. **විධමති** යනු වියදම් කිරීමේ සුවය නොදැනීමෙනි. **විදධංසෙති** යනු ආරක්ෂා කරන්නන්ගේ අසංවිධානයෙන් තිබූ තැනින් දුරුවේ. මේ ආදිය සමග යෙදිය යුතුයි.

අනිචචතායෙව අඨඨමී යනු අනිත්‍යතාවම භෝග විනාශයට අටවන හේතුවයි. **හායනති** යනු නො දක්නා බවට පැමිණෙති. **පරිහායනති** නැවත දක්නට නො ලැබෙති. **පරිධංසනති** යනු තුබූ තැනින් ඉවතට යති. **පරිපටනති** යනු වැගිරෙති. **අනතරධායනති** යනු අතුරුදහන්වීමට, නොදැකීමට යති. **විපපලුජජනති** සුණුවිසුණු වී පහවෙති.

තිටඨනෙතව තෙ භොගෙ යනු ඒ ධනය තිබියදීම 'තිටඨනෙත නිබබතෙත ච' යනාදියෙහි මෙනි. **සො** ඒ භෝග හිමි පුද්ගලයා චවති යනු දෙව්ලොවින් නම් චුත වේ. **මරති** යනු මිනිස්ලොවදී නම් මැරෙයි.

විපලුජ්ජති නාග සුපර්ණාදී ලෝකයන්ගෙන් නම් අතුරුදහන් වෙයි. **නැතහොත් හායති** යනු ධාන්‍ය කෝෂ්ඨාගාර වශයෙන් ගෙවී ක්ෂය වෙයි. **පරිහායති** යනු ධන කෝෂ්ඨාගාර වශයෙන් පිරිහේ. **පරිධංසති** යනු ඇත්, අස්, ගව ආදී සම්පත් වශයෙන් වැනසෙයි. **පරිපටති** යනු දැසි දස් වශයෙන් ඉවත්වී යයි. **අනතරධායති** යනු බිරින්දන් පැහැර ගැනීම් (අපහරණ) වශයෙන් අතුරුදහන් වේ. නස්සති යනු ජලාදියෙන් නැසේ' යනුවෙන් ද ඇතැමෙක් අර්ථ දක්වති.

අයොමයෙන යනු කාල ලොහයෙන් (යකඩින්) නිපද වූ **සලෙලන** යනු ඊතලයකින් **අට්ඨිමයෙන** යනු මිනිස් ඇට හැර සෙසු සත්ත්වයන්ගේ ඇටවලින් සෑදූ **දන්තමයෙන** යනු ඇත්දත්වලින් සෑදූ **විසාණමයෙන** යනු (සිඟුමුවා) ගව අං ආදියෙන් කළ හීයකින් **කට්ඨමයෙන** උණු ආදී දැවමුවා හීයකින්, විද්ධා යනු ඉහතින් කියන ලද ආකාරයේ හී අතුරින් එක් හීයකින් විදන ලදුයේ **රුප්පති** යනු විසිරෙයි. විකාරයට පත්වෙයි. **කුප්පති** යනු සසල වෙයි. කෝපය උපදවයි. **සට්ඨියති** ගැටෙයි. **පීළියති** පෙළේ. පහර ලදුයේ **කුප්පති** කිපෙයි. තෙවන දින වෙදාගේ ලොහොකුර පිවිසවා සෝදන කල්හි **සට්ඨියති** ගැටෙයි. ක්ෂාර (ලුණුදිය) දමා සෝදනවිට **පීළියති** පෙළේ. නැතහොත්, 'පහර ලද තැන සෝදන කල්හි **රුප්පති** විසිරේ. ඒ දුක උපදින කල්හි **කුප්පති** කිපෙයි. වෙද කුර පිවිසෙනවිට **පීළියති** පෙළේ. කරදියෙන් සෝදනවිට දී **සට්ඨියති** ගැටේ, යනුවෙන් ඇතැමෙක් විස්තර කරති.

ව්‍යථිතො පහර ලැබ පෙළෙනුයේ, **දොමනස්සිතො** යනු දොම්නසට පත්වූයේ **විපරිණාමඤ්ඤථාභාවා** යනු ප්‍රකෘති ස්වභාවය හැර වෙනස් වූ ආකාරයකට පත්වූවහු විසින්, ඇතුලතින් තැවීම් ආදී **සොකො** ශෝකය ද **වදනින්** විලාපකිම් ආදී **පරිදෙවො** පරිදේවයන් ද, කයින් පෙළීම ආදී **දුක්ඛං** දුක ද සිතින් පෙළීම ආදී **දොමනස්සං** දොම්නසට පත්වීම් ද, බොහෝ වූ **වෙහෙස, උපායාසො** උපායාසය ද විඳිනු ලැබේ. මෙසේ කියන ලද ආකාරයෙන් ශෝකාදිය උපදියි. පැළඹීමට යෙයි.

1.3 කාම සූත්‍රයේ තෙවන ගාථාව

තෙවන ගාථාවේ සංක්ෂිප්ත විස්තරය මෙසේ ය. 'යමෙක් මේ **වත්ථුකාම**, ක්ලේශකාමයන්හි ඡන්දරාගය, විෂ්කම්භන වශයෙන් හෝ

සමුච්ඡේද වශයෙන් හෝ තමාගේ පාදයෙන් සර්ප හිසක් ඉවතලන්නාක් මෙන් ඉවත් කරයි ද ඒ භික්ෂු තෙමේ, මුළු ලොවම පතුරුවාගෙන සිටි බැවින්, ලෝකයේ විසත්තික නම් වූ තණ්හාව අත්හැර සිහියෙන් යුතුව වෙසෙයි.'

යො යනු බෙදා දැක්විය යුතු පදයයි. **යො යාදිසො** යනාදිය එහි විභජන පදයි. මෙහිද යම්හෙයකින් **යො** යන අර්ථ සහිත පදයක් වේද, එය ද අනියම් වශයෙන් පුද්ගලයකු දක්වයි. එහෙයින් එහි අර්ථ දක්වමින් අනියමින් පුද්ගලයකු දැක්වෙන **යො** ශබ්දය ම කීහ. එනිසා මෙහි මෙසේ අර්ථ දතයුතුයි. **යො** යනු යම්කිසිවෙක් යැයි කියන ලදී. යම්හෙයකින් හේ **යො කොචි** නම් වේ ද එහෙයින් ඔහුගේ ලිංග යුක්ති යම්සේ සිටී ද, යම් ප්‍රකාර වූයේ ද, යම් න්‍යායකින් යුතු වේ ද, සද්ධර්මයෙන් යුක්තවීම් වශයෙන්, මේ ආකාරයෙන් පැහැදිලි වේ. එහෙයින් ඔහු මෙහි දී දැන්වීම දැක්වීමට (අදහස් කිරීමට) ඒ ප්‍රභේද ප්‍රකාශ කරමින් **යාදිසො** යනාදිය කීහ. එහි යාදිසො යනු ලිංග වශයෙන්, යම්සේ හෝ එසේ වේවා, (කෙසේ හෝ වේවා) උස් හෝ මිටි හෝ වේවා, කලු හෝ සුදු හෝ මඟුරු සම් පැහැ ඇති හෝ වේවා, කෘශ හෝ ස්ථූල වූ හෝ වේවා යන අර්ථයි.

යථායුත්තො යනු යෙදීම් වශයෙන් යම්කිසි කාර්යයෙක යෙදුණේ හෝ වේවා. නව කර්මාන්තයක යෙදුණේ හෝ වේවා, ප්‍රාතිමෝක්ෂ උද්දේසයෙහි යෙදුණේ හෝ වේවා. වාසධුරයෙහි යෙදුණේ හෝ වේවා යන අර්ථයි. **යථා විහිතො** යනු යම්සේ යොදවන ලද්දේ ද එසේ නව කර්මාන්ත පාලනය කිරීම් ආදී වශයෙනි. **යථාපකාරො** පිරිස් නායක ආදී වශයෙන් යම් ආකාරයකින් පිහිටුවන ලදුයේ යි. **යං ඨානං පත්තො** සේනාපති, සිටු ආදී යම් ඨානාන්තරයකට පත්වූයේ යි. **යං ධම්ම සමන්නාගතො** ධුතංගාදී යම් දහමකින් යුක්ත වූයේ යි. **විකඛමභනතො වා** උපචාර, අර්පණා, සමාධි මගින් කෙලෙසුන් දුරු කිරීමෙන් හෝ කළයේ පහරින් දියසෙවෙල් ඉවත් කරන්නාක් මෙන් තාවකාලික වශයෙන් හෝ **සමුච්ඡෙදතො වා** නැවත නොපවතින සේ කොට, අත්‍යන්ත වශයෙන් (සෝතාපත්ති ආදී) මාර්ගයෙන් කෙළෙසුන් මුලිනුපුටා දමා, සමුච්ඡේද වශයෙන් මුළුමනින් ම ප්‍රහීණ කිරීමෙනි.

අට්ඨිකංකලූපමා කාමා ආදි එකොළොස් පදය විදර්ශනා භාවනා වශයෙන් කියන ලදී. **බුද්ධානුස්සතිං භාවෙනෙතා** ආදී වශයෙන් ද

මරණානුසසතිං භාවෙනෙතාපි උපසමානුසසතිං භාවෙනෙතා පි යනාදී වශයෙන් ද උපචාර ධ්‍යාන වශයෙන් ද කියන ලදී.

ආනාපාන සතිං භාවෙනෙතාපි කායගතාසතිං භාවෙනෙතාපි පඨමජ්ඣානං භාවෙනෙතාපි ආදී වශයෙන් ඇරඹී **නෙවසඤ්ඤා නාසඤ්ඤායතන සමාපතතිං භාවෙනෙතා පි** යන්නෙන් අවසන් වන භාවනා අර්පණා ධ්‍යාන වශයෙන් කියන ලදී.

එහි **අටඨීකංකලූපමා කාමා** යනු මනාව ඉවත් කිරීමෙන් මස් රහිත වූ ලෙයින් වැකුණු සත්ත්ව ඇටයකි. 'මේ කාමයන්ට උපමා වෙති'යි අටඨීකංකලූපමා කාමා (කාමයෝ ඇටසැකිල්ලක් බඳු වෙති.) **අපපසාදථෙන** යනු අල්ප වූ සුලු වූ ආශ්වාද ඇතැයි යන අරුතින්, **ආදීනවෝ එත්ථ භියෝ** යනු මෙහි බොහෝ ආදීනව ඇතැයි යන දර්ශන අර්ථයෙන්, **පසසනෙතා** එසේ පවතිනතාක් ඒ බල්ලා ක්ලාන්තයට පීඩාවට බඳුන් වන්නේ යැ'යි නුවණැසින් බලමිනි. **පරිවජ්ජෙති** යනු ඉතා දුරු කරයි. භාග්‍යවතුන් වහන්සේ විසින් දෙසන ලදමැයි. 'ගහපතිය, බඩසයින් දුබල වී පෙළෙන බල්ලෙක් ගවඝාතක ස්ථානයකට පැමිණියේ වේ. දක්ෂ වූ ගෝ ඝාතකයා හෝ ගව ඝාතක අතවැසියා හෝ මනාව මස් නහර ඉවත් කළ, මස් නැති ලෙයින් වැකුණු ඇටසැකිල්ලක් උෆට දෙන්නේ ය. ගහපතිය, ඔබට කුමක් සිතේ ද? ඒ බල්ලා මේ මනාව මස් ඉවත් කළ ලේ වැකුණු ඇට කැබැල්ල ලොවින්නේ නමුත් උගේ සාගිනි දුබල බව දුරුවන්නේ ද?' (ගහපතියා) 'ස්වාමීනි! නැත'යි (පිළිතුරු දුන්නේ ය.) 'ඊට හේතු කුමක් ද?'යි (භාග්‍යවතුන් වහන්සේ විචාළ විට ඒ ගහපති තෙමේ) 'ස්වාමීනි, මේ ඇටකැබැල්ල මනාව මස් ඉවත් කළ ලේ වැකුණු එකක් වන හෙයිනි. එය එසේ තිබෙනතාක් ඒ බල්ලා වෙහෙසට, ක්ලාන්තයට, පීඩාවට භාජන වන්නේ ය'යි පිළිතුරු දුන්නේ ය. බුදුහු එවිට මෙසේ වදාළහ.) 'ගහපතිය, එලෙසින්ම මේ ආර්ය ශ්‍රාවක තෙමේ මෙසේ සිතන්නේය. 'භාග්‍යවතුන් වහන්සේ විසින් කාමය ඇටසැකිල්ලක් වැනියැයි, බොහෝ දුක් ඇතැයි, බොහෝ උපායාස ඇතැයි දෙසන ලදී. මෙහි ආදීනව බොහෝ යයි, තත්වාකාරයෙන් ම මනා නුවණින් දැක, යම් උපේක්ෂාවක් නානාප්‍රකාර වේද, නානාශ්‍රිත වේද එය ඉවත දමා, යම් උපේක්ෂාවක් ඒකවිධ වේද, ඒකාශ්‍රිත වේද, යම් උපේක්ෂාවකදී ලෞකික උපාදානයෝ සර්වප්‍රකාරයෙන් නිරවශේෂ වශයෙන් නිරුද්ධ වෙත් ද ඒ උපේක්ෂාවම වඩන්නේය.

'මාංසපේශී උපමාව මොවුනට (මේ කාමයන්ට) ගිජුලිහිණි ආදීන් හා සමග සාධාරණ (පොදු) වෙති'යි **මංසංපසූපමා** වේ. 'බොහෝදෙනාට සාධාරණ (පොදු) වෙති'යි යන අරුතින් **බහුසාධාරණා** නම්. ඇවිලගත් තණසුල මොවුනට (මේ කාමයන්ට) උපමා වෙති'යි **තිණුකකූපමා** නම් වේ. **අනුදහනත්‍ථෙන** යනු 'අත් ආදිය දවති' යන අර්ථයෙනි. 'පුරුෂයකුගේ උස ප්‍රමාණයට අධික වූ, ගිනිසිළු හා දුම් පහ වී ගිය, අඟුරුවලින් පිරුණු අඟුරුවළක් මේ කාමයන්ට උපමා වෙති'යි **අංගාරකාසූපමා** වේ. **මහාපරිලාහත්‍ථෙන** යනු 'මහත් පරිදාහ දනවති'යි යන අර්ථයෙනි. 'ආරාම (උයන්) ආදියෙහි රමණීය බව පිළිබඳ සිහිනය මේ කාමයනට උපමා වෙති'යි **සුපිනකූපමා** වේ. **ඉත්තර පචචුපට්ඨානත්‍ථෙන** යනු (වෙතට) නොපැමිණ, මඳක් සමීපව සිටැ'යි යන අර්ථයෙනි. යැදීමෙන් ලද යානා ආදී භාණ්ඩ මොවුනට (මේ කාමයන්ට) උපමා වෙති'යි **යාචිතකූපමා** නම් වේ. **තාවකාලිකත්‍ථෙන** යනු (අඛණ්ඩව) බැඳී නොසිටිතැයි යන අර්ථයෙනි. 'ඵල සම්පන්න වූ ඵල හරිත ගස මොවුනට උපමා වෙති'යි **රුක්ඛඵලූපමා** නම් වේ. **සමභජ්ජන පරිභඤ්ජනත්‍ථෙන** යනු ශාඛා බිඳීම් අර්ථයෙන් හා හාත්පසින් අතු කපා ගස කපා බිම හෙළීම් අර්ථයෙනි. කඩුව හා මස්වැදැල්ල ද මොවුනට (මේ කාමයන්ට) උපමා වෙති'යි **අසිසුණ්ඩූපමා** නම් වේ. **අධිකුට්ටනත්‍ථෙන** යනු සිදීම් අර්ථයෙනි. සැත්හුලක් මොවුනට (කාමයන්ට) උපමා වූයේනුයි **සත්තිසූලූපමා** නම් වේ. **විනිවිජ්ඣනත්‍ථෙන** 'ඇට ඉවත් කරමින් ගමන් කරන විනිවිද යන බැවින් බිය දනවති'යි යන අර්ථයෙනි. සර්ප හිසක් මේ කාමයන්ට උපමා වේනුයි **සපපසිරූපමා** නම් වේ. **සප්පටි භයත්‍ථෙන** යනු අභිමුඛ වූ භය සමග යැයි යන අර්ථයෙනි. දුක් ජනනය කරන ගිනිකඳක් මේ කාමයන්ට උපමා වේනුයි **අගගික්ඛන්ධූපමා** නම් වේ. **මහාභිතාපත්‍ථෙන** යනු මහ ගින්නෙන් තැවීම්, පීඩා ඇති කරතියි යන අර්ථයෙනි. මෙසේ කාමය දුරු කෙරෙති'යි මෙසේ වදාරණ ලදී.

'ගහපතිය, ගිජුලිහිණියෙක් හෝ කපුටෙක් හෝ උකුස්සෙක් හෝ ඒ මස්වැදැල්ල ගෙන ඉගිලෙන්නේ ය. ගිජුලිහිණියෝ ද කපුටෝ ද උකුස්සෝ ද පසුපස ලුහුබඳිමින්, කොටමින් එය උදුරන්නේය. ගහපතිය, ඔබ කුමක් සිතන්නෙහි ද? ඒ ගිජුලිහිණියා හෝ කපුටා හෝ උකුස්සා තමා ගත් මස්වැදැල්ල වහා නොමුදන්නේ නම් මරණයට හෝ මරණ සමාන දුකකට පත්වන්නේ ද?' 'එසේය, ස්වාමීනි!', 'ගහපතිය, එලෙසින්ම ආර්යශ්‍රාවකයා මෙසේ සිතන්නේ ය. 'භාග්‍යවතුන් වහන්සේ විසින් මස් වැදැල්ලක්

උපමා කර කාමය එබඳු යැයි වදාළ සේක. -පෙ- එම (ඉහත කී) ඒකවිධ වූ ඒකාශ්‍රිත වූ උපේක්ෂාව වඩයි. 'ගහපතිය, පුරුෂයෙක් ගිනි ඇවිලගත් තණසුලක් ගෙන උඩු සුළඟට යන්නේ ය. 'ගහපතිය, ඔබ කුමක් සිතන්නේ ද? ඒ පුරුෂයා ඇවිලගත් තණසුල වහා ඉවත නොලන්නේ නම්, ඒ තණසුල ඇවිලී ඔහුගේ අත හෝ දවන්නේ ය. බාහුව හෝ දවන්නේ ය. වෙනත් ශරීරාංගයක් හෝ දවන්නේ ය. ඉන් ඔහු මරණයට හෝ මරණ සමාන දුකට පත්වන්නේ ද?' 'එසේය, ස්වාමීනි.' 'ගහපතිය, එලෙසින් ම ආර්ය ශ්‍රාවකයා මෙසේ සිතන්නේ ය. 'භාග්‍යවතුන් වහන්සේ විසින් මේ කාම සම්පත් තණසුලකට උපමා කර ඇත. එහි බොහෝ දුක්, බොහෝ වෙහෙසවීම් ඇත. -පෙ- එම උපේක්ෂාවම වඩයි. ගහපතිය, පුරුෂ ප්‍රමාණයට අධික වූ, පහ වූ ගිනිසිලු හා දුම් ඇති කකියන අඟුරු පිරි වළක් ඇත. ඒ වළ සමීපයට ජීවත්වනු කැමති, නොමැරෙනු කැමති, සැප කැමති, දුක පිළිකුල් කරන පුරුෂයෙක් එන්නේය. බලවත් පුරුෂයෝ දෙදෙනෙක් ඒ මිනිසා නානාබාහුක ලෙසින් (තමාගේ අත් දෙකින් ඔහුගේ එක් අතක් බැගින්) අල්වාගෙන අඟුරු වළ වෙත ඇදගෙන යන්නේය. ගහපතිය, ඔබ කුමක් සිතන්නේ ද? ඒ පුරුෂයා 'ඉතිව ඉතිව' (මෙසේ ද මෙසේ ද) කියමින් සිය කැමැත්තෙන්ම අඟුරු වළ වෙත සිය කය නො එළවන්නේ වේද?' 'ස්වාමීනි, එසේය.' 'ඊට හේතු කවරේ ද?' 'ස්වාමීනි, ඒ පුරුෂයා 'මම මේ අඟුරු වළට ඉදින් වැටෙන්නේ නම්, ඉන් මරණයට හෝ මරණ සමාන දුකකට හෝ පත්වන්නෙමි'යි දන්නා හෙයිනි. 'ගහපතිය, එලෙසින්ම ආර්ය ශ්‍රාවකයා මෙසේ සිතන්නේ ය. 'භාග්‍යවතුන් වහන්සේ විසින් කාමය අඟුරු වළකට උපමා කළ සේක. -පෙ- එම උපේක්ෂාව ම වඩයි.'

'ගහපතිය, පුරුෂයෙක් උයනෙහි රමණීය බව, වනයෙහි රමණීය බව භූමියෙහි රමණීය බව, පොකුණුවල රමණීය බව පිළිබඳ සිහින දක්නේද, ඔහු පිබිද සිටි කල්හි ඒ කිසිවක් නොදක්නේය. ගහපතිය, එලෙසින්ම ආර්ය ශ්‍රාවකයා ද මෙසේ සිතයි. 'භාග්‍යවතුන් වහන්සේ විසින් කාමය සිහිනයකට උපමා කරන ලද සේක. -පෙ- එම උපේක්ෂාවම වඩයි.'

'ගහපතිය, පුරුෂයෙක් වෙනත් අයගෙන් ඉල්ලාගත් භෝගයත්, යානාවන් උතුම් මණිකුණ්ඩලාභරණාදිය පරිහරණය කරන්නේය. ඔහු ඒ ඉල්ලාගත් භෝගයන්ගෙන් පිරිවරාගෙන, වටකරගෙන වෙළඳම් පිළට (වෙළඳපොළට) යන්නේ ය. ඔහු දුටු මිනිස්සු මෙසේ කියන්නෝ ය.

'පින්වත් මේ පුරුෂ තෙමේ මෙබඳු මහා භෝග සම්පත් වැළඳීමට සුදුස්සෙක්ව සම්පත් වළඳන්නේය. ඔහු භෝග සම්පත් ඉල්ලාගත් වස්තු හිමියෝ යම් යම් තැනෙක්හි සිට එය දක්නාහුය. ගහපතිය, ඔබ කුමක් සිතන්නෙහිද? ඒ පුරුෂයාගේ වෙනසකට, අමුත්තකට එය ප්‍රමාණවත් වේද?' 'ස්වාමීනි, එය එසේ නොවේ. 'ඊට හේතු කවරේ ද?' 'ස්වාමීනි, වස්තු හිමියන් විසින් තම තමන්ගේ වස්තු රැගෙන යන බැවිනි. 'ගහපතිය, මෙලෙසින් ම ආර්ය ශ්‍රාවකයා ද මෙසේ සිතයි. 'භාග්‍යවතුන් වහන්සේ විසින් කාමයෝ ඉල්ලාගත් වස්තුවට උපමා කළ සේක. -පෙ- එම උපේක්ෂාවම වඩන්නේ ය.

'ගහපතිය, යම්සේ ගමක හෝ නියම්ගමක හෝ නුදුරෙහි මහත් වනලැහැබක් ඇත. එහි ඵලයෙන් යුතු හටගත් ඵල ඇති ගසක් ඇත. එහි කිසිදු ගෙඩියක් බිම වැටී නැත. ඉක්බිති ඵල අවශ්‍ය (කැමති) ඵල සොයමින් යන පුරුෂයෙක් ඒ වනලැහැබේ ඇවිදිනුයේ එම ගස දකින්නේය. ඵල හරිත වූ හටගත් ගෙඩි ඇති ගස දුටු හෙතෙම මෙසේ සිතන්නේය. 'මේ හටගත් ගෙඩි ඇති, ඵල හරිත වූ ශක්තිමත් ගසකි. මෙහි කිසිදු ගෙඩියක් බිම වැටී නැත. මම ගසට නැගීමට දන්නෙමි. මම ගසට නැග ඇතිතාක් ඵල කා, එකුරුතුපට (ඔඩොක්කුව) ද පුරවාගන්නෙමි නම් යෙහෙකි.' හේ මේ ගසට නැග ඇතිතාක් ඵල කන්නේය. ඔඩොක්කුව ද පුරවා ගන්නේය. ඉක්බිති දෙවැනි පුරුෂයෙක් ද ඵල කැමතිව, ඵල සොයමින්, ඵල පිණිස හැසිරෙනුයේ තියුණු පොරවක් ද ඇතිව ඒ වනලැහැබ වෙත අවුත්, හටගත් ඵල ඇති, ඵලහරිත වූ ඒ ගස දකින්නේය. ඔහු මෙසේ සිතයි. 'මේ ගස හටගත් ඵලයෙන් හරිතව ඇත. කිසිදු ඵලයක් බිම වැටී නැත. මම මේ ගසට නැගීමටද නොදන්නෙමි. මම මේ ගස මුලින් ම සිඳ දමා, ඇති තාක් ගෙඩි කා එකුරුතුපට (ඔඩොක්කුව) ද පුරවා ගන්නෙමි නම් යෙහෙකි.' මෙසේ සිතූ හෙතෙම ගස මුලින්ම සිඳින්නේ ය. ගහපතිය, ඔබ කුමක් සිතන්නෙහිද? ඒ පළමුව ගසට නැගි පුරුෂයා ඉදින් වහා නො බසින්නේ නම්, ඒ ගස කපා වැටෙනවිට ඔහුගේ අත හෝ පය හෝ වෙනත් අවයවයක් හෝ බිඳී යන්නේ ය. ඔහු එයින් මරණයට හෝ මරණ සමාන දුකට පත්වන්නේ ද?' 'එසේය, ස්වාමීනි.' 'ගහපතිය, එලෙසින්ම ආර්ය ශ්‍රාවකයාද මෙසේ සිතන්නේය. 'භාග්‍යවතුන් වහන්සේ විසින් බොහෝ දුක් ඇති, බොහෝ වෙහෙස ඇති, බොහෝ ආදීනව ගෙන දෙන කාමයන් ඵල දරන ගසකට උපමා කළ සේක.

මෙසේ තත්ත්වාකාරයෙන් සම්‍යක් ප්‍රඥාවෙන් දැක, යම් ඒ උපේක්ෂාවක් නානාවිධව, නානාවිධත්වය ඇසුරු කළේ ද ඒ උපේක්ෂාව හැර දමා යම් ඒ උපේක්ෂාවක් ඒකවිධව, ඒකවිධත්වය ඇසුරු කළේ ද, යම් උපේක්ෂාවෙක්හි සර්වප්‍රකාරයෙන්ම ලෝකාමිෂ උපාදානයෙක් ඉතිරි නොවන සේ නිරුද්ධ වෙත්ද, ඒ උපේක්ෂාවම වඩන්නේය'යි මෙසේ ඇටසැකිල්ල පිළිබඳ උපමාවෙන් පටන්ගෙන ගිනිකඳේ උපමාවෙන් අවසන්කොට ඇති විදර්ශනාව දක්වා, දැන් උපචාර සමාධිය දක්වමින් 'බුද්ධානුස්සතිං භාවෙනෙතා' යනාදිය කීහු.

එහි නැවත නැවත ඉපදවීම් වශයෙන් සිහිය පැවැත්වීම 'අනුස්සති' නම් වේ. පැවැත්විය යුතු ස්ථානයෙහි ම පවත්වන ලද බැවින් ශ්‍රද්ධාවෙන් පැවිදි වූ කුලපුත්‍රයාට අනුරූප වූ සතිය ද **අනුස්සති** නම්. බුදුරදුන් අරබයා උපන්නා වූ අනුස්සතිය **බුද්ධානුස්සති** යයි. අර්හත්වාදී බුදුගුණ අරමුණු කොටගෙන පවත්නා සිහියට මෙය අධිවචනයෙකි. **බුද්ධානුස්සතිං භාවෙනෙතා** යනු බුද්ධානුස්සතිය වඩමින්, වර්ධනය කරමින් ධර්මරත්නය අරබයා උපන් සිහිකිරීම (අනුස්සතිය) **ධම්මානුස්සති** යයි. ස්වාක්ඛාත ආදී දහම් ගුණ අරමුණු කරගෙන පවතින්නා වූ සතියට මෙය අධිවචනයකි. සංඝරත්නය අරබයා පවත්නා වූ අනුස්සතිය **සංඝානුස්සති** යයි. සුපටිපන්නාදී සඟ ගුණ අරමුණු කරගෙන පවතින සිහියට මේ අධිවචනයෙකි. සීලය අරබයා උපන් අනුස්සතිය සීලානුස්සතියයි. තමාගේ නොකැඩුණු සිල්ගුණ අරමුණු කරගෙන පවතින සිහියට මේ අධිවචනයකි. ත්‍යාගය අරමුණු කරගෙන උපන් අනුස්සතිය **චාගානුස්සති** යයි. තමාගේ මුත්තචාගතා (දීම පිණිස සැදී පැහැදී සිටින බව) ආදී ත්‍යාගී ගුණ අරමුණු කරගෙන පවතින සිහියට මේ අධිවචනයකි.

දෙවියන් අරබයා උපන් අනුස්සතිය **දෙවතානුස්සති** යයි. දෙවියන් සාක්ෂි ස්ථානයේ තබාගෙන, තමාගේ සිත් තුළ ඇති ශ්‍රද්ධාදී ගුණ අරමුණු කරගත් සිහියට මේ අධිවචනයෙකි. ආශ්වාස ප්‍රශ්වාසයන් අරබයා උපන් අනුස්සතිය **ආනාපාන සති** යයි. ආනාපාන නිමිත්ත අරමුණු කරගෙන පවතින සිහියට මේ අධිවචනයෙකි. මරණය අරබයා උපන් සිහිය **මරණසති** යයි. එක භවයක් තුළ සිදුවන ජීවිතින්ද්‍රිය උපච්ඡේදක සංඛ්‍යාත මරණය අරමුණු කොට පවත්නා සිහියට මේ අධිවචනයෙකි. පිළිකුල් සහගත වූ කෙස් ආදී දෙතිස් කුණපයනට අයත් වූ බැවින්, ඊට ආකරයක් වූ බැවින්, 'කාය' නම් වූ ශරීරය කෙරෙහි පැවැති, නොහොත් ශරීරය හෝ කය

වෙත යොමු වූ සිහිය, (කායං ගතා සති) 'කායගත සතී' යැයි කිවයුතු තැන ත කාරය හ්‍රස්ව නොකොට **කායගතාසතී** යැයි (තා ලෙස දීර්ඝ කර) කියන ලදී. කෙස් ආදී කායික කොටස්වල පිළිකුල් බව පිළිබඳ නිමිති (අරමුණු) කොට පවත්නා සිහියට මේ අධිවචනයෙකි.

උපසමය, සන්සිඳීම අරබයා උපන් අනුස්සතිය **උපසමානුස්සති** යයි. සියලු දුක්වල සන්සිඳීම හෙවත් නිවන අරමුණු කරගත් සිහියට මේ අධිවචනයෙකි. 'විතක්ක, විචාර, පීති, සුඛ, ඒකග්ගතා සහිත වූ ප්‍රථම ධ්‍යානය වඩනුයේයි, පීති, සුඛ, ඒකග්ගතා සහිත ද්විතීය ධ්‍යානය වඩනුයේයි. සුඛ ඒකග්ගතා සහිත තෘතීය ධ්‍යානය වඩනුයේයි. උපේක්ඛාව හා ඒකග්ගතාව සහිත චතුර්ථ ධ්‍යානය වඩනුයේ යි. -පෙ- නේවසඤ්ඤානාසඤ්ඤායතනය වඩනුයේයි. කාමයන් දුරු කරන්නේය' යනුවෙන් විෂ්කම්භන ප්‍රහාණය දක්වා, ඉක්බිති සමුච්ඡේද වශයෙන් කාමයන්ගේ ප්‍රහාණය දක්වනු පිණිස **සොතාපත්ති මගඤ භාවෙනෙතාපි** යනාදිය කීහු.

එහි ආර්ය මාර්ග නම් ශ්‍රෝතසට (ප්‍රවාහයට) පැමිණීම **සෝතාපත්ති** නම්. සෝතාපත්තිය පිළිබඳ මාර්ගය **සොතාපත්ති මගෙහා** සෝතාපත්ති මාර්ගයයි. **අපායගමනීයෙ කාමෙ** යමෙක් අපායට ගෙනයත් ද, ඒ අපායට පමුණුවන කාමයන් (මුලිනුපුටා දැමීමෙන්) සෝතාපත්ති මාර්ගය වඩනුයේ සමුච්ඡේද වශයෙන් දුරුකරයි. ප්‍රතිසන්ධි වශයෙන් එක් ම වරක් මේ ලෝකය එත්නුයි **සකදාගාමී** සකෘදාගාමී නම් වේ. ඒ පිළිබඳ මාර්ගය **සකදාගාමී මගෙහා** සකෘදාගාමී මාර්ගයයි. ඒ මාර්ගය වඩනුයේ **ඔළාරිකෙ** යනු පිරිතැවීමට පරිළාහයට පත් වූ කාම යනුයි. ප්‍රතිසන්ධි වශයෙන් නැවත කාමභවයට කිසිසේත් නො පැමිණෙත්වායි යන අරුතින් **අනාගාමී** නම් වේ. ඒ පිළිබඳ මාර්ගය **අනාගාමී මගෙහා** අනාගාමී මාර්ගය නම් වේ. එය වඩනුයේ අනුසහගතෙ යනු, සියුම් බවට පත් කාම යනුයි. කෙලෙසුන් කෙරෙන් දුරු වූ හෙයින් ද කෙලෙස් සතුරන් හැර ගිය හෙයින් ද සංසාරය නමැති චක්‍රයේ අර සිඳ දැමූ හෙයින් ද පව් කිරීමේ රහසිගත බවක් නොමැති වූ හෙයින් ද ප්‍රත්‍යාදිය ලැබීමට සුදුසු වූ හෙයින් ද **අරහං** අරහත් නම් වේ. අරහත්භාවය 'අරහත්ත' නම්. එය කුමක් ද? අරහත්ව ඵලයයි. අරහත්වයට යන මාර්ගය **අරහත්තමගෙහා** අර්හත් මාර්ග නම් වේ. ඒ අර්හත් මාර්ගය වඩනුයේ යි.

සබෙබන සබබං යනු සර්වප්‍රකාරයෙන් සියල්ල සබබථා සබබං සියලුම ආකාරයෙන් සියල්ලයි. **අසෙසනිසෙසසං** තිර වශයෙන් ම ස්කන්ධ මාත්‍රයක් හෝ නොතබා නැතහොත් **සබෙබන සබබං** සහමුලින් සබබථා සබබං යනු ආකාර නිප්පදේස දැක්වීම් වශයෙනි. අසෙස නිසෙසසං යනු භාවනා නිප්පදේස දැක්වීම් වශයෙන් 'එසේම මුල් පදයෙන් දුශ්චරිතය නොමැති වීමෙනැයි ද දෙවැනි පදයෙන් පරියුට්ඨාන (පෙළඹීම්) නොමැති වීමෙනැයි ද තෙවැනි පදයෙන් අනුසය (දුබලව පැවති කාමරාගාදී කෙලෙසුන් පවා නොමැති වීමෙනැයි ද යනුවෙන් ඇතැමෙක් අර්ථ වර්ණනා කරති.)

සපෙපා වුච්චති අහි යනු යම් කිසිවෙක් වැනෙමින් හැසිරෙයි. **කෙනඤ්ඵෙන** යනු කවර අරුතකින්ද යත්, **සංසප්පනෙතා ගච්ඡති** යනු යම්හෙයකින් දෙපසට වැනෙමින් යේනුයි සප්ප නම් වේ. **භුජනෙතා** යනු වකුටු වෙමින් යේනුයි. **පනනසිරෝ** යනු පහතට නැමුණු හිස ඇතිවයි. සිරෙන සුපති යනු දරණ වැළ තුල සිදුරෙක මෙන් ඔබාගත් හිසින් නිදන්නේනුයි, 'සිරිංසප' නම් වේ. බිලයෙහි නිදන්නේනුයි බිලාසයෝ බිලාසය නම්. 'බිලසයෝ' යන පාඨය ද පෙළෙහි වේ. එය සුන්දර වචනයකි. ගුහාවේ නිදන්නේනුයි ගුහාසයෝ ගුහාසය නම්. **දාඨා තසස ආවුධෝ** යනු ඒ සර්පයාගේ දළ දෙකක් පහර දෙන ආයුධ ලෙස පවතියි. **විසං තසස සොරං** යනු සර්පයාගේ බ්‍යාමප්ප නම් වූ (බ්‍යාමප්ප අර්ථය හෝ නිරුක්තිය පැහැදිලි නැත.) විෂ දරුණුය. කර්කශය. **ජිව්හා තසස දුවිධා** යනු ඒ සර්පයාට දිව දෙකකි. **ඒහි ජිව්හාහි රසං සායති** යනු දිව දෙකින් රස දැනගනියි. ආශ්වාද විඳියි. ඉවසයි. ජීවත්වීමට කැමැත්තේනුයි **ජීවිතුකාමෝ** ජීවිතුකාම යයි. මෙසේම **අමරිතුකාමෝ** යනු නොමැරෙනු කැමැත්තේයි, සැප කැමැත්තේනුයි **සුඛකාමෝ. දුකඛපටිකකූලෝ** යනු දුක් නොඉවසන්නේයි. **පාදෙන තමාගේ පයින්. සප්පසිරං** සර්පයාගේ හිස. **වජ්ජය්‍ය** පෙරටුවම වර්ජනය කරන්නේය. ඉවතලන්නේය. **විවජ්ජය්‍ය** සර්පයාට ගැසීමෙනි. **පරිවජ්ජය්‍ය** හාත්පසින්ම දුරුකරන්නේය. **අභිනිවජ්ජය්‍ය** සිවුරියනක් පමණ ඉවතටයි. නැතහොත්, 'පළමු පදයෙන් හිසින් ද දෙවන තෙවන පදවලින් දෙපසින් හා සිවුවන පදයෙන් පසුපසින්, කාම සම්පත්වලට නොපැමිණියහුගේ ඒවා සෙවීමට මුල් වූ දුකට වස්තු වන හෙයින් **වජ්ජය්‍ය** යනු කියන ලදී. කාමසම්පත් ලබාගත්තහුගේ ඒවා ආරක්ෂා කරගැනීමට මුල් වූ දුකට වස්තු වන හෙයින් **විවජ්ජය්‍ය** යි කියන ලදී. ඤාණ පරිදාහ දුකට වස්තු වන හෙයින් **පරිවජ්ජය්‍ය** යි කියන ලදී. භෝග සම්පත් විනාශයට පත්වීමේ දී ප්‍රියවිප්‍රයෝග දුකට

වස්තු වන හෙයින් **අභිනිවජ්ජය්‍ය** යි කියන ලදී' යනුවෙන් ඇතැමෙක් වර්ණනා කරති.

සිත් ඇලවීම් වශයෙන් **රාගො** රාග නම්. කාම සම්පත් විෂයෙහි සත්ත්වයන් තුළ පවත්නා අනුකූල බව (අනු අනු නයනතො) **අනුනයො** අනුනය නුයි. අනුකූල, එකඟ වන්නේ නුයි **අනුරොධො** අනුරෝධ යි. කැමති වෙයි යන අර්ථයි. යම්කිසි තැනෙක සොයන්නා වූ සත්ත්වයන් 'මෙයින් සතුටට පත් වෙති'යි 'තමාම සතුටු වෙති'යි යන අරුතින් **නන්දි** නන්දි නම්. නන්දි වනුයේ දැඩිව රංජනාර්ථයෙන් රාග නම් වනුයේ ද **නන්දිරාගො** නන්දිරාග නම්. එහි එක් අරමුණක වරක් උපදින තණ්හාව **නන්දි** නන්දි නම්. නැවත නැවත ඉපදෙන තණ්හාව **නන්දිරාගො** නන්දිරාග යැයි කියනු ලැබේ. **චිත්තසස සරාගො** යනු යමක් බලවත් සේ සිත් ඇලවූවකැයි යන අර්ථයෙන් 'සරාග' යැයි කියන ලද ද, ඒ තණ්හාව, ඒ ඒ සිතට ම සරාග වෙතියි යන අර්ථයි.

මෙයින් අරමුණ කැමති වේනුයි **ඉචඡා** ඉච්ඡා නම්. කෙලෙස් බහුල බැවින් මේ සත්ත්වයෝ මේ රාගයෙන් මුසපත් වෙත්නුයි **මුචඡා** මුච්ඡා නම්. ගිල අවසන් කරගැනීම් වශයෙන් **අජ්ඣොසානං** අජ්ඣොසාන නම්. මෙයින් සත්ත්වයෝ ගිජු වෙති. ගිජු බවට පත්වෙති යන අරුතින් ගෙධො ගේධ නම්. එයම බහුල වූ අර්ථයෙන් **පළිගෙධො** පළිගේධ නම්. ගිජුභාවයන්ගේ එක්රැස්වීම, බහුලවීම යන අරුතින් ම කියන ලදී. දෙවන පදයට උපසර්ගයක් යෙදීමෙන් අර්ථය වර්ධනය කර ඇත. නැතහොත් 'සර්ව ප්‍රකාරයෙන් ම ගිජුබවට පත්වූහ'යි හෝ **පළිගෙධො** පළිබෝධ නම් වේ. 'අරමුණෙහි ඇලෙති'යි යන අරුතින් **සංගො** සංග නම්. 'ලැගෙති'යි 'එල්බෙති'යි යන අර්ථයෙන් හෝ **සංගො** නම්. 'බැසගති' යන අරුතින් **පංකො** පංක නම්. ආකර්ශනය කරගැනීම් වශයෙන් **එජා** ඒජා නම්. 'ඒජා නම් තණ්හාව මේ පුරුෂයා ඒ ඒ භවයෙහිම ඉපදීම පිණිස ඇදගනියි. යැයි කියන ලදී. වංචා කරන, රවටන අරුතින් **මායා** මායාව නම්. 'සංසාරයෙහි සත්ත්වයන් ජනනය කෙරෙති'යි යන අරුතින් **ජනිකා** නම්. තණ්හාව මිනිසා ජනනය කරවයි. ඔහුගේ සිත ඔබිනොබ (භවයන්හි) දිව යයි යනුවෙන් කියන ලදී. 'දුක හා සමග සංයෝජනය කරමින් උපදවති'යි යන අරුතින් **සඤ්ජනනී** නම් වේ. ගලපති යි යන අර්ථයෙන් **සිබ්බති** නම්. ('ඝටනත්‍ථෙන' යනු නිවැරදි පදය සේ පෙනේ.) ඇඳුම් මසන්නෙකු එක් රෙදිකඩක් තවත් රෙදිකඩක් හා සමග ගලපන්නා සේ

මේ තෘෂ්ණාව චුති-ප්‍රතිසන්ධි වශයෙන් සත්ත්වයා සසර මඩෙහි ගලපයි. එහෙයින් සටන (සට්ටන නොවේ.) අර්ථයෙන් **සිබ්බනී** (සිබ්බති ගලපති) යැයි කියන ලදී.

'අනේකප්‍රකාර කාම විෂය දැලක් ඇතැයි හෝ තණ්හාවෙන් දැඟලීමෙන් එය තුළට පිවිසෙති'යි කියනු ලබන දැලක් තෘෂ්ණාවට ඇතැයි යන අරුතින් හෝ **ජාලිනී** නම් වේ. ආකර්ශනය කරගන්නා යන අරුතින් ශීඝ්‍ර දිය පහරක් වැනි යැයි **සරිතා** සරිතා නම් වේ. තෙතයි යනු මෙහි තෘෂ්ණාවයි. කියන ලදමැයි : 'සරිතානි සිනෙහිතානි ච සොමනස්සානි භවන්ති ජන්තුනො' (තෙත් වූ ද ගල්වන ලද්දා වූ ද දෙය සත්ත්වයා හට සොම්නස් උපදවන්නේ වේ.) යනුවෙනි. සරිතා යන්නෙන් තෙත් වූ ද තෙල් ගල්වන ලද්දා වූ ද යනු මෙහි පදාර්ථයි. නොයෙකුත් විපත් ඇතිකරවන අර්ථයෙන් ඉදිබුවන් බැඳි හුයක් මෙන් යැයි **සුත්තං** සුත්ත නම් වේ. කියන ලදමැයි:- 'සුත්තනන්ති බොහිකඛවෙ නන්දිරාගසෙඝතං අධිවචනං' (මහණෙනි, සුත්තං යනු නන්දි රාගයට අධිවචනයකි. රූපාදියෙහි පැතිර පවතීනුයි අරුතින් **විසතා** විසතා නමි. ඒ ඒ භවයන්හි උපත ලැබීමට සත්ත්වයන් රැස්කරවයි යන අරුතින් **ආයූහනී** ආයූහනී නමි. 'කළකිරීමට ඉඩ නොදී සසර පැවැත්මට සහාය වෙති'යි යන අර්ථයෙන් **දුතියා** නමි. මේ තණ්හාව සත්ත්වයන්ට සසර පිළිබඳව කළකිරීමට ඉඩ නොදෙයි. ගිය ගිය තැන ප්‍රිය යහලුවෙකු මෙන් සිත පිනවයි. එහෙයින් කියන ලදී.

තණ්හා දුතියෝ පුරිසෝ දීඝමද්ධාන සංසරං
ඉත්ථභාවඤ්ඤථාභාවං සංසාරං නාතිවත්තති'ති

තණ්හාව දෙවැන්නා (සහායකයා) කොටගත් පුරුෂ තෙමේ දිගු සසර මඟ සැරිසරනුයේ වර්තමාන ස්වභාවය අන්‍යථාභාවයට (වෙනස් බවට) පත්කරන එම සසර නො ඉක්මවයි. (අවසන් නො කරයි.)

ප්‍රාර්ථනා (ප්‍රතිඛාන) වශයෙන් **පණිධි** ප්‍රණිධි නම් වේ. **භවනෙත්ති** යනු භව නැමති රැහැනයි. මේ තණ්හාවෙන් බැඳි සත්ත්වයෝ ගෙල බැඳ රැහැනින් ගොනුන් ගොපල්ලා කැමති තැනට ගෙනයන මෙන් මාරයා විසින් ගෙන යනු ලබයි. ඒ ඒ අරමුණ අල්ලා ගනිති යි, භජනය කරතියි ඇලී සිටිතියි **වනං** වන නම් වේ. **වනථො** යනුවෙන් ව්‍යඤ්ජනාක්ෂරයක් එක් කර පදය වර්ධනය කරන ලදී. අනර්ථ දුක්ඛයන් හටගන්වති යන

අර්ථයෙන් ද ගහන වෙති යන අරුතින් ද වනයක් වැනි යයි **වනං** වන නම් වේ. බලවත් තණ්හාවට මේ නම යෙදේ. ඉතා ගහන වීමෙන් (ග්‍රහණතර අරුතින්) ඉතා බලවත් වූයේනුයි යන අර්ථයෙන් ද **වනථො නාම** තණ්හාව 'වනථ' නම් වේ. එහෙයින් කියන ලදී.

වනං ඡින්දථ මා රුක්ඛං - වනතො ජායතෙ භයං
ඡෙත්වා වනඤ්ච වනථඤ්ච - නිබ්බනාහොථ භික්ඛවො'තී

ගස් නොකපා වනය සිඳින්න. වනයෙන් බිය හටගනී. වන (තෘෂ්ණාව) ද වනථය (බලවත් තෘෂ්ණාව) ද සිඳ දමා මහණෙනි ! නිර්වාණ (තෘෂ්ණාව නැති) බවට පත් වවු.

ඇසුරු කිරීම් වශයෙන් (සඤ්ච වශයෙන්) **සඤ්ඡො** සඤ්ච නමි. සංසර්ගය යි යන අර්ථයි. සඤ්චය ද්විවිධ වේ. තණ්හා සඤ්චය හා මිත්‍ර සඤ්චය යනුවෙනි. ඒ දෙකින් මෙහිදී තණ්හා සඤ්චය අභිප්‍රේතයි. (අදහස් කරන ලදී.) ස්නේහ වශයේ **සිනෙහො** සිනේහ නමි. ආලය කිරීම් වශයෙන් අපේක්ෂා ඇත්තේනුයි **අපෙක්ඛා** අපේක්ෂා නමි. මෙය කියන ලද මැයි. 'දේවයිනි, මේ කුසාවතී රාජධානිය ප්‍රමුඛ වූ සුවාසූ දහසක් නගර ඇති රාජ්‍ය සම්පත් ඔබට ඇත. මෙහි කැමැත්ත ඇතිකර ගන්න. ජීවිතාපේක්ෂා වර්ධනය කරගන්න' ඇලුම් කරනු මැනවැයි යනු මෙහි අර්ථයයි. වෙන් වෙන් වූ අරමුණුවල බැඳෙති යි, හෝ ඤාති වෙති'යි යන අර්ථයෙන් හෝ 'එක්තරා ඤාතියෙකි'යි **පටිබන්ධු** නමි. නිත්‍ය සන්නිශ්‍රිත අර්ථයෙන් ද සත්ත්වයා හට තණ්හාව හා සම වූ ඤාතියෙක් නම් නැත.

අරමුණු අනුභව කරන හෙයින් **ආසා** ආශා නම් වේ. මැඩ වසාගෙන සිටීමෙන් හා පසුපස යමින් පරිභෝජනය කිරීමෙනියි යන අර්ථයි. ප්‍රාර්ථනා වශයෙන් **ආසිංසනා** ආසිංසනා නමි. ප්‍රාර්ථනා සහිත භාවය **ආසිංසිතත්තං** ආසිංසිතත්ත නමි. ඉක්බිති ඒ ආශාව, අපේක්ෂාව පවත්නා ස්ථානය දැක්වීමට **රූපාසා** යනාදිය කියන ලදී. එහි ප්‍රාර්ථනා වශයෙන් ආශාවය යන අර්ථය ගෙන, රූප විෂයයෙහි පවත්නා ආශාව **රූපාසා** නමි. මෙසේ පද නවයෙහිම අර්ථ දතයුතුයි. මෙහි මුලින් දැක්වූ පස පස්කම් ගුණ වශයෙන් දැක්විණි. සවැන්න පිරිකර කෙරෙහි ලෝභ කිරීම් වශයෙනි. එය විශේෂයෙන් පැවිද්දන් සඳහාය. ඉන් අනතුරුව දැක්වෙන තුන ගිහියනට අකැප වූ වස්තු වශයෙනි.

ඒ ගිහියනට ධනය, පුත්තුය, ජීවිතය යන මේවාට වඩා ප්‍රිය වූවක් නොමැත. 'අසුවල් දෙය මගේය, මෙය මාගේය', හෝ 'අසුවලා විසින් මට මෙය දෙන ලදී හෝ නොදෙන ලදී' යනුවෙන් 'සත්ත්වයන් ජල්පනය (ජප) කරවති'යි හෝ **ජප්පා** ජප්පා නම්. අනෙක් **පජප්පා** හා **අභිජප්පා** යන දෙපදය උපසර්ග යොදා වැඩිකරන ලදී. ඉන් අනතුරුව වෙනත් ආකාරයකින් බෙදා දැක්වීම අරඹන ලද බැවින්, නැවත **ජපපා** යැයි කියන ලදී. ජල්පනය කරන ආකාරය **ජපපනා** යි. ජල්පිත ස්වභාවය **ජපපිතත්තං** ජප්පිතත්ත යි. නැවත නැවත කාම සම්පත් විෂයයෙහි ලොල් කරවති'යි, ආකර්ෂණය කරතියි **ලොලුපෝ**. ලොල් කරවීමේ ස්වභාවය **ලොලුප්පං** ලෝලුප්ප නම් ලෝලුප්පයෙහි ආකාරය **ලොලුප්පායනා** නම්. ලොල්වීමෙන් යුක්ත වූ ස්වභාවය **ලොලුප්පායිතත්තං** ලෝලුප්පායිතත්ත නම් වේ.

පුච්ඡඤ්ඣවකතා යනු යම් තෘෂ්ණාවක් හේතුකොට ලාභයක් ලැබෙන ස්ථානයන්හි දී වලිගය සොලවන බල්ලන් මෙන් සසල වෙමින් හැසිරෙත්ද ඒ සසල වන තෘෂ්ණාවට මේ නමෙකි. යහපත් කැමැති කැමැති විෂයයෙහි කාමය උපදවත්නේ නුයි **සාධුකම්මං** සාධුකර්ම නම් වේ. එහි ස්වභාවය **සාධුකම්‍යතා** සාධුකම්‍යතා නම්. මව, මවගේ සහෝදරිය ආදීන් කෙරෙහි, නුසුදුසු තැන්හි ඇතිවන රාගය **අධම්මරාග** අධම්ම රාග නම්. සුදුසු තැනෙක වුවත් බලවත්ව නැගි ලෝභී සිතිවිල්ල **විසමලොභෝ** විෂමලෝභ නම්. නොහොත් 'රාගය විෂම'යි ආදී වචන වශයෙන් සුදුසු තැන වුවද උපන් රාගය **ඡන්දරාගෝ** ඡන්දරාග නම්. අධර්ම වූ අරුතින් **අධම්මරාගෝ** යනුවෙන්ද විෂම වූ අර්ථයෙන් **විසමලොභෝ** යනුවෙන් ද දතයුතුයි.

අරමුණුවලට ආශා කිරීම් වශයෙන් **නිකන්ත** නිකන්ති නම්. ආශා කරන ස්වභාවය **නිකාමනා** නිකාමනා නම්. පැතීම් වශයෙන් **පත්ථනා** ප්‍රාර්ථනා නම්. ප්‍රිය කිරීම් වශයෙන් **පිහනා** නම්. මනාව ප්‍රාර්ථනා කිරීම **සමත්ථනා** සම්පත්ථනා නම්. පංචකාම ගුණයන් කෙරෙහි පවතින තණ්හාව **කාමතණ්හා** වයි. රූප අරූප භවයන් කෙරෙහි පවතින තණ්හාව **භව තණ්හා** නම්. උච්ඡේද නම් වූ විභවය කෙරෙහි පවතින තණ්හාව **විභව තණ්හා** නම්. රූප භවයෙහි ම පවතින තණ්හාව **රූප තණ්හා** වයි. අරූප භවයෙහි පවතින තණ්හාව **අරූප තණ්හා** නම්. නොහොත් උච්ඡේද දෘෂ්ටියෙන් යුක්ත රාගය යි. නිරෝධයෙහි පවතින තණ්හාව **නිරෝධ තණ්හං** නම් වේ.

ශබ්දය පිළිබඳ වූ තණ්හාව **සද්දතණ්හා** නම් වේ. **ගන්ධ තණ්හා** දියෙහි ද මේ ක්‍රමයම දතයුතුයි. **ඔසෝ යොගෝ** යනාදියේ අර්ථ මේ ක්‍රමයෙන් දතයුතුයි.

'කුසල් දහම් අවුරති'යි (ආවරණය කරයි) නුයි **ආවරණං** ආවරණ නම්. වසාදැමීම් වශයෙන් ඡදනං ඡදන නම්. සත්ත්වයන් සංසාරයෙහි බැඳ තබන්නේනුයි **බන්ධනං** බන්ධන නම්. 'සිත ලඟට පැමිණ කෙලෙසති'යි, 'කිලිටි කරති'යි යන අරුතින් **උපක්කිලෙසෝ** උපක්කිලේශ නම්. බලවත් බවට ගිය අර්ථයෙන් අත්නොහැර පවතිති'යි **අනුසයෝ** අනුසය නම්. 'උපදින සිත ඔසවා තබති'යි **පරියුට්ඨානං** පරියුට්ඨාන නම්. ඉපදීමට නොදීමෙන් 'කුසල වාරය පැහැර ගනිති'යි යන අර්ථයි. 'චොරා මඟෙ පරියුට්ඨිංසු, ධුත්තා මඟෙ පරියුට්ඨිංසු' (මාර්ගයෙහි සොරු නැඟී සිටියාහුය. මාර්ගයෙහි ධූර්තයෝ නැඟී සිටියාහුය' යන ආදියෙහි මාර්ගය අත්පත් කරගත්හ යන අර්ථයි.) මෙහිද අත්පත් කරගැනීම් අර්ථයෙන් **පරියුට්ඨානං** යන පදය යෙදුණු බව දතයුතුයි. වැලක් මෙන් වෙළාගන්නා බැවින් තණ්හාවට **ලතා** යන නම යෙදේ. 'ලතා උබහිජ්ජ තිට්ඨති (වැලක් ලියලා සිටිනු වැනිය) යන තැන්හි ද මේ තණ්හාව නම් ලතාව අදහස් වේ.

විවිධාකාර වූ වස්තු කැමැත්තේනුයි **වෙචිච්ඡං** වේ විචිඡ නම්. සංසාර දුකට මුල්වන බැවින් **දුක්ඛමූලං** දුක්ඛමූල නම්. එම දුකටම නිදාන වන හෙයින් **දුක්ඛ නිදානං** දුක්ඛනිදාන නම්. ඒ දුක මෙයින් (තණ්හාවෙන්) හටගන්නේ නුයි **දුක්ඛපපභවෝ** දුක්ඛප්පභව නම්. බැඳීම් අර්ථයෙන් මලයක් මෙන් වූයේ, මාර පාශයක් වූයේ **මාරපාසෝ** මාරපාශ නම්. තණ්හාව අමාරුවෙන් වමාරා දැමිය යුතුය යන අර්ථයෙන් බිලියක් මෙන් වූයේ, මාරයාගේ බිලියක් වූයේ **මාරබලිසං** මාරබලිස නම්. තණ්හාවෙන් මඬනා ලද්දාහු ඒ මරුගේ විෂයය නො ඉක්මවති'යි ඔවුන් මත්තෙහි මාරයා සිය ආධිපත්‍ය පවත්වති'යි යන මේ නියාමයෙන් ද මාරයාගේ විෂය වූයේ **මාර විසයෝ** මාර විෂය නම්. ගලාබසිති යි යන අරුතින් තණ්හාව නදියක් වැනි යයි **තණ්හා නදී**. තණ්හා නදී නම්. පැතිර, වසාගෙන යන අරුතින් තණ්හාව දැලක් වැනියයි **තණ්හා ජාලං** තණ්හාජාල නම්. යම්සේ දම්වැලින් බැඳි බල්ලෝ (ස්වාමියාට) අවශ්‍ය තැනට පමුණුවනු ලබත් ද එමෙන්ම තණ්හාවෙන් බැඳි සත්ත්වයෝ ද (මාරයාට අවශ්‍ය තැනට) පමුණුවනු ලබති. දැඩි බැඳීමෙන් දම්වැලක් මෙන් වූ බැවින් 'ගද්දූල' නම් වේ. තණ්හා නැමති දම්වැල **තණ්හා ගද්දූලං** තණ්හා ගද්දූල නම්. පිරවීම, තෘප්තියට

පත්වීම අසීරු හෙයින්, ඒ අර්ථයෙන් තණ්හාව සමුද්‍රයක් වැනි යැයි තණ්හා සමුද්දෝ තණ්හා සමුද්ද නම්.

(යලි යලිත් ලෝභී) චින්තාවන්හි යෙදීමේ අර්ථයෙන් **අභිජ්ඣා** නම් වේ. 'මෙය කරණකොට ඇලෙති'යි 'තමා ම හෝ ඇලෙති'යි, ඇලීම මාත්‍රයක් හෝ ලොභො ලෝභ නම්. සම්ප්‍රයුක්ත වූ අකුසලයන්ට ප්‍රතිෂ්ඨා අර්ථයෙන් මුල් වේ. **විසතතිකා** යනු ඇලීම ඇතිකරන ස්වභාවය යි. කෙනඤ්ඡන යනු කවර ස්වභාවයකින්ද? **විසතා** යනු පැතිරුණේය. රූපාදියෙහි විශාල වූහයි **විපුලා** විපුලා නම්. **විසටා** යනු භූමිත්‍රයෙහි පැතිරීම් වශයෙන් 'විසෘෂ්ට වූ පැතිර ගියහ'යි විසට නම්. මුල් **විසතා** යන පදයේ 'ත' යන්නට 'ට' යන්න ආදේශ කර, ව්‍යඤ්ජන විසභාග (වෙනස්) කර කියන ලදී. **විසකකතී** යනු දරා ගනියි. ඉවසා ගනියි. රාගයෙන් මඬනා ලද්දේ එම රාගයට වස්තු වූවහු විසින් එයින් තළනු ලබන නමුත් ඉවසයි. දරාගනියි. පසුබැසීම හෝ කම්පා වීම, **විසකකනං** යන්නෙන් අදහස් වන බව ද කියති. ඇතැමෙක් 'කුසලා කුසලයන් කරනු හැකි වෙති'යි පවසති.

විසංහරති යනු ඒ ඒ ආකාරයෙන් කාමයන්හි ඇති ආනිසංස දැකීමින්, විවිධාකාරයෙන් නෙක්ඛම්මයට අභිමුඛව පැවති සිත හකුළුවා ගනියි, සංක්ෂේප කරතියි, නැතහොත් විෂ වූ දුකට හෝ පමුණුවතියි යන අර්ථයි. විෂ වූ දුක් එක්තැන් කර දෙයි යන අරුතයි. **විසංවාදිකා** යනු අනිත්‍යාදී වස්තූන් නිත්‍යාදී වශයෙන් ගනිමින් විසංවාදනය කරයි. විපරීත කොට ගනියි.

දුක උපදවන කර්මයට හේතුවන බැවින් **විසමූලා** විෂමූල නම්. විෂ හෝ දුක මුල් කරගත් වේදනාව මෙයට (තණ්හාවට) මුල්වේනුයි විසමූල නම් වේ. දුක ඇතිවීමට හේතුවන හෙවත් විෂ වූ ඵලයක් ඇතැයි යන අරුතින් **විසඵලා** විෂඵල නම් වේ. තණ්හාවෙන් රූපාදිය මුල්කොට ඇති දුක්ඛයන්ට පරිභෝගය වෙති'යි, 'නිවන් පරිභෝගය නොවෙති'යි යන අරුතින් **විසපරිභොගො** විෂ පරිභෝග යැයි කියන ලදී. සියලු තන්හි නිරුත්ති වශයෙන් පද සිද්ධිය දතයුතුයි.

ඒ තණ්හාවේ විශේෂත්වය දක්වනු කැමතිව 'රූපයෙහි ඒ තණ්හාව විශාල වේ' යනාදිය කියන ලදී. එහි **විසාලා වා පන** යනු ඉතා මහත්

වූවාමය. ආශා දනවති'යි යන අරුතින් තණ්හා නමි. රූපාදී පස්කම් සුවයෙන් ඇලීම් වශයෙන් කියන ලදී. **කුලගණෙ** ආදී වූ එකොළොස් පදය ලෝභ ඉපදවීම් වශයෙන් කියන ලදී. **කාමධාතුතතිකො** යනු කාමධාතු ත්‍රිකය කර්ම වශයෙන් බෙදන ලදී. **කාමභවතතිකො** කාම භව ත්‍රිකය විපාක වට්ට වශයෙන් බෙදන ලදී. **සඤ්ඤා භවතතිකො** සඤ්ඤා භව ත්‍රිකය සංඥා වශයෙන් බෙදන ලදී. **එකවොකාර භවතතිකො** ඒකවෝකාර භව ත්‍රිකය ස්කන්ධ වශයෙන් බෙදන ලදී. **අතීතතතිකො** අතීත ත්‍රිකය ස්කන්ධ වශයෙන් බෙදන ලදී. **අතීතතතිකො** අතීත ත්‍රිකය කාල වශයෙන් බෙදන ලදී. දිටඨ **චතුකෙකා** දෘෂ්ට චතුෂ්කය අරමුණු වශයෙනි. **අපායතතිකො** අපාය ත්‍රිකය අවකාශ වශයෙනි. **බන්ධතතිකො** ස්කන්ධ ත්‍රිකය නිස්සත්ව, නිජ්ජීව වශයෙන් බෙදන ලදැයි දතයුතුයි. එහි සංක්ෂිප්ත වූ අර්ථ දැක්වීම හා වර්ණනය මෙසේ ය.

'එහි 'කාමධාතු' යනු කවරේද? යටින් අවීචි නිරය කෙළවර කොට, උඩින් පරනිම්මිති වසවත්ති දෙවියන් ඇතුලත්ව, මේ සීමා දෙක අතර ඇති, ඒ දෙකට ඇතුලත් වූ ස්කන්ධ, ධාතු, ආයතන, රූප, වේදනා, සංඥා, සංඛාර, විඤ්ඤාණ යන මේවා 'කාම ධාතු' යැයි කියනු ලැබේ.

'එහි 'රූප ධාතු' යනු කවරේද? යටින් බ්‍රහ්ම ලෝකය කෙළවර කොට උඩින් අකනිට්ඨ දෙව්ලොව ඇතුළත්ව, මේ දෙසීමාව අතරට අයත් වූ, ඇතුළත් බවට පැමිණියහුගේ හෝ උපන්නහුගේ දිට්ඨධම්ම සුඛ විහාරී වූ චිත්ත චෛතසික ධර්මයක් වේද? මේ රූපධාතු යැයි කියනු ලැබේ.'

'එහි 'අරූප ධාතු' යනු කවරේද? යටින් ආකාසානඤ්චායතනයට පැමිණි දෙවියන් කෙළවරකොට, උඩින් නේවසඤ්ඤානාසඤ්ඤායතනයට පැමිණි දෙවියන් ඇතුලත්ව, මේ දෙසීමා අතරට අයත් වූ, ඇතුළත් බවට පැමිණියහුගේ හෝ උපන්නහුගේ දිට්ඨධම්ම සුඛවිහාරී වූ යම් චිත්ත චෛතසික ධර්මයක් වේද එය 'අරූප ධාතු' යැයි කියනු ලැබේ. අට්ඨකථාවෙහි (හෙළටුවාවෙහි) වනාහි **කාමධාතු** යන්නෙන් කාමභවයේ පංචස්කන්ධය ලැබේ. **රූපධාතු** යන්නෙන් රූප භවයෙහි පංචස්කන්ධය ලැබේ. **අරූපධාතු** යන්නෙන් අරූපභවයේ චතු ස්කන්ධය ලැබේ'යැයි කියන ලදී.

නැතහොත් කාමරාග නම් වූ, කාමයෙන් යුතු ධාතු 'කාමධාතු' නම් වේ. කාම යැයි නම් කළ ධාතු හෝ කාමධාතු නම් වේ. කාමය හැර රූපයෙන් යුතු ධාතු 'රූපධාතු' නම් වේ. නොහොත් රූප යැයි නම් කළ ධාතු රූපධාතු නම් වේ. කාමභවයත් රූප භවයත් හැර අරූපභවයේ යුතු ධාතු අරූපධාතු නම් වේ. නැතහොත් අරූප යැයි නම් කළ ධාතු අරූප ධාතු නම් වේ. එම ධාතූන් ම නැවත භව පර්යායයෙන් දක්වන ලදී. 'වන්නේ'නුයි භව යැයි කියනු ලැබේ. 'ත්‍රිවිධ භව' යැයි කියති. සංඥාවෙන් යුක්ත භවය හෝ සංඥා සහිත භවය හෝ මේ භවයේ සංඥාව ඇත්තේය යන අරුතින් **සඤ්ඤා භවෝ** සඤ්ඤා භව නම්. ඒ කාමභවය ද අසංඥා භවයෙන් තොර වූයේ ය. රූප හා අරූප භවයෝ නේවසඤ්ඤා-නාසඤ්ඤායතන භවයෙන් තොර වූහ.

සංඥා රහිත භවය **අසඤ්ඤභවෝ** අසඤ්ඤා භවයයි. රූපභවයේ එක් කොටසක් ඔළාරික බවින් තොර වූ හෙයින්, නේවසඤ්ඤා නම්. සූක්ෂම ස්වභාවයෙන් නාසඤ්ඤා නම්. ඒ අංග දෙකින් යුක්ත වූ භවය **නෙවසඤ්ඤා නාසඤ්ඤාභවෝ** නේවසඤ්ඤානාසඤ්ඤා භව නම් වේ. නැතහොත් ඔළාරික වූ සංඥාවේ අභාවයෙන් ද සූක්ෂම වූ ස්වභාවයෙන් ද මේ භවයෙහි සංඥාව නොමැත. සංඥාව නැත්තේ ද නොවේ යන අරුතින් **නෙවසඤ්ඤා නාසඤ්ඤා භවෝ** නේවසඤ්ඤානාසඤ්ඤා භව නම් වේ. එය අරූප භවයේ එක් කොටසකි. එකක් වූ රූපස්කන්ධයෙන් පමණක් යුක්ත වූ භවය 'එකම ස්කන්ධයකින් (වෝකාර) යුතුය යන අරුතින් **එකවොකාර භවෝ** ඒකවෝකාර භව නම්. ඒ අසංඥභවය ද සතර අරූප ස්කන්ධයන්ගෙන් යුක්තය. 'සතරක් වූ ස්කන්ධයන්ගෙන් මේ භවය යුක්තය' යන අරුතින් **චතුවොකාර භවෝ** චතුවෝකාර භව නම්. එය සම්පූර්ණ අරූප භවය ම වේ.

පංචස්කන්ධයෙන් යුක්ත වූ භවය හෝ පංචස්කන්ධයක් සහිත භවය යන අරුතින් **පංචවෝකාර භවෝ** පංචවෝකාර භව නම්. එයට කාමභවය ද රූප භවයේ එක් කොටසක් ද අයත් වේ. අතීත ත්‍රිකය ඉහත පැවසූ පරිදිම දත යුතුය. **දිට්ඨං** චතුසමුට්ඨානික රූපාරම්මණයි. **සුතං** ද්විසමුට්ඨානික ශබ්දාරම්මණයයි. **මුතං** දැන, විඳගත යුතු චතු සමුට්ඨානික වූ ගන්ධ, රස, ස්පර්ශ යන ආරම්මණයෝ ය. **විඤ්ඤාතබබං** විඤ්ඤාතබ්බ නම්. එනම් මනසින් දතයුතු ධම්මාරම්මණයයි. ඒවා අතුරෙන් දැකිය

යුතු, ඇසිය යුතු, විඳිය යුතු, දතයුතු යන ධර්මයන්හි **විසතා විසටතා** යනු 'මහත් සේ පතළාහ' යන අර්ථයයි.

අපායලොකෙ යනු වැඩීම යැයි කියන ලද අය සක් (කීර්තියක්) නොමැති හෙයින් අපාය නම් වේ. එම අපාය ලෝකයෙහි ය. **ඛන්ධලොකෙ** යනු ඇලීම් අර්ථයෙන් රූපාදී පංචස්කන්ධයෝම ලෝක නම් වෙති. **ධාතු ලොකෙ** යනු ශූන්‍යතා (හිස් බව) යන අර්ථයෙන් චක්ඛු ධාතු ආදී ධාතු දහඅටම ලෝක නම්. **ආයතන ලොකෙ** යනු ආයතන ආදී හේතූන් නිසා දොළොස් ආයතනයම 'ලෝක' නම් වේ. සියල්ල නැසෙති යි යන අර්ථයෙන් ලෝක නම් වේ. මෙසේ කියන ලද ආකාර ඇති ලෝකයෙහි 'විසිර ගියහ'යි, 'පැතිර ගියහ'යි **විසතතිකා** විසත්තිකා නම් වේ. **සතො** යනු සිහිකරන්නේය. සිහි ඇති පුද්ගලයායි. සිහිය පමණක් මෙහිදී අදහස් නොකරන ලදී.

එහි සිහිකරන ලක්ෂණය **සති** නම්. 'එය කරණකොට සිහිකරති'යි, 'තමාම සිහිකරති'යි හෝ සිහිකිරීම් පමණක්ම හෝ **සති** නම් වෙයි. (සර සිහිකිරීමේ ධාතුවෙන් නිපන් භාව කෘදන්ත පදය 'සරණ' නම්. සිහිකිරීම යන අර්ථයි.) ඒ සිහිය වනාහි නො ඉල්පෙන ලක්ෂණ ඇත්තේ ය. නොමුළාවන කෘත්‍ය ඇත්තේය. ආරක්ෂාවෙහි නියුතු බව (විමසිලි සහිත බව) පච්චුපට්ඨාන (වැටහීම් හේතුව) කොට ඇත්තේය. අදාළ විෂයයට අභිමුඛ (අවධාන සහිත) බව හෝ පච්චුපට්ඨාන කොට ඇත්තේය. සඤ්ඤාව (දැනීම හෙවත් දැනුවත් බව) පදට්ඨාන (පදනම්) කොට ඇත්තේ ය. කායානුපස්සනාදී සතිපට්ඨානයන් හෝ පදනම් කොට ඇත්තේය. අරමුණේ දැඩිව පිහිටි බැවින් ඉඳුබීලයක් වැනි යැයි ද චක්ඛුරාදී ද්වාරයන් ආරක්ෂා කරන බැවින් දොරටුපාලයකු වැනියයි ද දතයුතුයි. ඒ සිහිය පවතින ස්ථානය දක්වමින්, **කායෙ කායානුපසසනං භාවෙනෙතා** යනාදී ක්‍රමයෙන් සතර සතිපට්ඨානයන් දැක්වූහ.

එහි **කායෙ** යනු රූපකායයි. රූප කය වනාහි මෙහි අඟපසඟ ආදියේ ද කේශාදී ධර්මයන්ගේ ද සමූහාර්ථයෙන් හස්තිකාය, රථකාය (ඇතුන් සමූහය, රිය සමූහය) මෙන් **කායො** යි අභිප්‍රේතයි. යම් සේ සමූහාර්ථයෙන් වේ ද මෙසේ ම පිළිකුල් වූ දෙතිස් කුණපයනට උත්පත්ති ස්ථාන යයි යන අර්ථයෙන්, අතිශයින් පිළිකුල් වූ වස්තූනට 'ආය වෙති'යි කාය නම් වේ. (කු+ආය) 'ආය' යනු උත්පත්ති ප්‍රදේශයයි. එහි මේ

වචනාර්ථයයි. 'ඉන් හටගත්තේය. උපන්නේ නුයි ආය නම්. කවරක් හටගත්තේ ද යත්, මේ පිළිකුල් වූ කේශාදියයි. මෙසේ පිළිකුල් සහගත වස්තූනට උත්පත්ති ස්ථාන යැයි යන අර්ථයෙන් ද **කායෝ** කාය නම් වේ. **කායානුපස්සනා** යනු කය අනුව බැලීමයි. **කායෙ** යැයි කියන යලිත් **කායානුපස්සනා** යි දෙවනුව ද කාය ග්‍රහණය (කාය යැයි ගැනීම) කය පිළිබඳ අසම්මිශ්‍ර නොව (හෙවත් වේදනා, චිත්ත, ධම්ම යන අනුපස්සනා තුන බැහැරකොට, හුදෙක් කායානුපස්සනාවම) ව්‍යවස්ථා කිරීම (නියම කිරීම) හා ඝන විනිබ්භෝගාදිය දක්වනු පිණිස කරන ලදැයි දතයුතුයි.

එයින් කය කෙරෙහි වේදනානුපස්සනාව හෝ චිත්ත ධම්මානුපස්සනාව හෝ නොවේ. හුදෙක් **කායානුපස්සනායෙව** 'කායානුපස්සනාව ම වෙති'යි, කාය සංඛ්‍යාත වස්තු විෂයයෙහි කායානුපස්සනාකාරයම දැක්වීමෙන්, අසම්මිශ්‍ර වශයෙන් කාය විෂයයෙහි අංග ප්‍රත්‍යයන්ගෙන් මිදුණු එකම ස්වභාවයක් අනුව බැලීමද නොවේ. තවද මෙහි කේශලෝමාදී අශුභයන්ගෙන් මිදුණු ස්ත්‍රීපුරුෂ ශරීර අනුව බැලීම ද නොවේ. භූත රූපයන්ගේ ද උපාදාය රූපයන්ගේ ද සමූහය යැයි කියනු ලබන යම් කයක් වේ ද, එසේ වුවත් භූත උපාදාය රූපයන්ගෙන් බැහැර වූ එකම ධර්ම ස්වභාවයක් අනුව බැලීමක් නැත.

ඉක්බිති රථ සරයක් (රිය කුඩුවක්) අනුව බලන්නකුගේ (අටුවාවෙහි රථසර යන්න රථසර විය යුතුයි.) වැනි අඟපසඟ සමූහය පිළිබඳ අනුපස්සනාව හා නගරයක අවයව අනුව බලන්නකුගේ වැනි කෙස් ලොම් ආදී සමූහය පිළිබඳ අනුපස්සනාව ද (පිළිවෙලින්) කෙසෙල් කඳක් කොළ පතුරු ගලවා වෙන් කරන්නකුගේ වැනි භූත රූප සමූහය පිළිබඳ අනුපස්සනාව හා හිස් මිටක් දිගහැර බලන්නකුගේ වැනි උපාදාය රූප සමූහය පිළිබඳ අනුපස්සනාව ම වෙතැ'යි යනුවෙන් සමූහ වශයෙන් ම (එකක් වශයෙන් නොව) කාය සංඛ්‍යාත වස්තුව නානාප්‍රකාර වශයෙන් දක්වන්නහු විසින් ඝන විනිබ්භෝගය (එක්ව බැඳී පවත්නා වස්තු කොටස් සමූහයක් බෙදා වෙන්කොට දැක්වීම) කරන ලද්දේ වේ.

මෙහිදී දැක්වූ පරිදි ස්කන්ධාදියෙන් විනිර්මුක්ත වූ ස්ත්‍රී පුරුෂ කායයන් හෝ අන්කිසි ධර්මයක් (ස්වභාවයක්) හෝ නොපෙනේ. කියන

ලද පරිදි ධර්මයන්ගේ සමූහ මාත්‍රය කෙරෙහි ම ඒ ඒ ආකාරයෙන් සත්ත්වයෝ වැරදි අයුරින් සෙවීම කරති. එහෙයින් කීහු පුරාණාචාර්යයෝ:-

යං පසසති න තං දිටඨං යං දිටඨං තං න පසසති
අපසසං බජඣතෙ මූළෙහා බජඣමානො නමුචචතී ති

'යමක් බලයි ද එය (තත්වාකාරයෙන්) නො දක්නා ලදී. යමක් දක්නා ලද්දේ ද එය (මනාව) නො දකියි. නොදකිනුයේ (යථාර්ථය) මුළා වූයේ (මරහු විසින්) බඳනා ලැබේ. බඳනා ලබනුයේ සසරින් නොමිදේ" යනුයි.

'ඝන විනිබ්භෝගාදිය දක්වනු පිණිසයි' කියන ලදී. මෙහි 'ආදි' ශබ්දයෙන් පහත දැක්වෙන අර්ථය ද අවබෝධ කටයුතුයි. මේ වනාහි මේ කයෙහිම කායානුපස්සනා අනුව බැලීම මිස අන් කිසිදු ධර්මයක් පිළිබඳ අනුපස්සනාවක් නොවේ. කුමක් කියන ලද්දේ ද යත්, 'යම්සේ දිය නැති වුවත් මිරිඟුව දෙස බැලීමේදී උදකානුපස්සනාව වේ ද, එමෙන් අනිත්‍ය-දුක්ඛ-අනාත්ම- අශුභ වූ මේ කයෙහි නිත්‍ය-සුඛ-ආත්ම-ශුභ වශයෙන් අනුපස්සනාවක් නොවේ. තව ද 'කායානුපස්සනා' යනු අනිත්‍ය-දුක්ඛ-අනාත්ම-අශුභ යන ආකාර සමූහය පිළිබඳ අනුපස්සනාව ම යැයි කියන ලද්දේ වේ.

නැතහොත් මෙකරුණ මහා සතිපට්ඨාන සූත්‍රයෙහි :- 'මහණෙනි, මේ සසුනෙහි භික්ෂුව අරණ්‍යයට ගියේ -පෙ- ඔහු සිහි ඇතිවම ආශ්වාස කරයි' ආදී නයින් ආශ්වාස ප්‍රශ්වාසාදියේ සිට ඉතා සූක්ෂම වූ ඇට දක්වා වූ කය දක්වන ලදී. එමෙන්ම පටිසම්භිදා මග්ගයෙහි සතිපට්ඨාන කථාවෙහිදී 'මෙහි ඇතැමෙක් පඨවි කය අනිත්‍ය වශයෙන් විමසා බලති. ආපෝ කය, තේජෝ කය, වායෝ කය, කේශ කය, ලෝම කය, ඡවි කය, මාංස කය, රුධිර කය, නහර කය, ඇට කය, ඇටමිදුලු කය යනාදී වශයෙන් කය පිළිබඳව විග්‍රහ කරන ලදී. ඒ සෑම තැනකම මේ කයෙහිම සිත පිහිටුවා ඒ අනුව විමසා බැලීමෙන් 'කායානුපස්සනාව' සිදුවන්නේය යන අර්ථය දතයුතුයි.

නැතහොත් 'කයෙහි මම ය, මාගේය යනුවෙන් ගතයුතු කිසිවක් නො දැකීමෙන්, ඒ ඒ කේශලෝමාදී නානාධර්ම සමූහය අනුව විමසා

බැලීමෙන්, 'කයෙහි කේශාදී සමූහයැ'යි කියන ලද කායානුපස්සනය' යනුවෙන් මෙහි අර්ථ දතයුතුයි. තවද මේ කයෙහි අනිත්‍ය වශයෙන් මිස නිත්‍ය වශයෙන් නො බලයි' ආදී අනුපිළිවෙළින් පටිසම්භිදා මග්ගයෙහි ආ ක්‍රමයට සියලුම අනිත්‍ය ලක්ෂණාදිය ආකාර, සමූහ සංඛ්‍යාත වූ කය අනුව විමසා බැලීම ද 'කය කෙරෙහි වූ කායානුපස්සනා' යැයි මෙසේ ද අර්ථ දතයුතුයි. මෙය සතර සතිපට්ඨානයන්ට ම සාධාරණ වූ අර්ථයයි.

සතිපට්ඨානං යනුවෙන් ස්මෘතියට ගෝචර වූ, තවද කරුණු තුනක් ගැනේ. එනම්: තුන් ආකාරයෙකින් පිළිපන් ශ්‍රාවකයන් කෙරෙහි, බුදුරදුන්ගේ දොම්නස හා ඇල්ම ඉක්ම ඕ (ඒ දෙකින් තොර වූ) බවයි. ආකල්පයයි. 'චතුණ්ණං භික්ඛවෙ සතිපට්ඨානානං සමුදයඤ්ච අත්ථගමඤ්ච දෙසිස්සාමි, තං සුණාථ සාධුකං -පෙ- කතමා ච භික්ඛවෙ කායස්ස සමුදයො? ආහාර සමුදයා කාය සමුදයො' (මහ ණෙනි! සතර සතිපට්ඨානයන්ගේ ඇතිවීමත්, නැතිවීමත් පිළිබඳව දේශනා කරමි. එය මනාව අසවු. -පෙ- මහණෙනි! කුමකින් කය හටගනී ද? ආහාර හේතුවෙන් කය හටගනියි.) යනාදියෙහි සති ගෝචරය සතිපට්ඨාන යැයි කියයි. එසේම 'කායො උපට්ඨානං නො සති, සති උපට්ඨානඤ්චව සති චාති' (කය එළඹ සිටින්නක් මිස සිහිය නොවේ. සිහිය එළඹ සිටින්නක් මෙන් ම සිහිය ද වේ.) යනාදියෙහි ද එම අර්ථයයි. 'මෙහි පිහිටති'යි ය න අරුතින් 'පට්ඨාන' නම් වේ. (එනම්) කයයි. නො එළඹ සිටි සිහිය යි. සිහියෙහි පිහිටීම, 'සතිපට්ඨානං' නම් වේ. නැතහොත් - ප්‍රමුඛ (ප්‍රධාන) වූයේ නුයි පට්ඨාන නම් වේ. සිහියේ ප්‍රධානත්වය, පිහිටීම සතිපට්ඨානයයි. 'හත්‍ථිට්ඨාන', 'අස්සට්ඨාන' ආදිය මෙනි. 'තයො සතිපට්ඨානා යදරියො සෙවත යදරියො සෙවමානො සත්ථා ගණමනුසාසිතුමරහති' (යම් සතිපට්ඨානයක් ආර්යයන් වහන්සේ ඇසුරු කෙරෙත් ද, යම් සතිපට්ඨානයක් ඇසුරු කරන ශාස්තෘ වූ ආර්යයන් වහන්සේ (ශ්‍රාවක) ගණයාට අනුශාසනය කරනු යුතු වේ ද, එම සතිපට්ඨාන තුනයි.) යන මෙහි ත්‍රිවිධාකාරයෙන් පිළිපන් ශ්‍රාවකයන් කෙරෙහි ශාස්තෘන් වහන්සේගේ දොම්නස හා ඇල්ම (යන දෙකම) ඉක්මවා සිටි බව සතිපට්ඨානයැයි කියන ලදී.

එහි අර්ථ මෙසේයි. පිහිටුවිය යුතු බැවින් පට්ඨාන නම් වේ. පැවැත්විය යුතු බැවිනැයි යන අර්ථයි. කුමකින් පිහිටුවිය යුතු ද? සිහියෙනි. සිහියෙන් පිහිටුවීම සතිපට්ඨාන යයි. 'සතර සතිපට්ඨානයෝ වඩන ලද්දාහු. පුරුදු කරන ලද්දාහු සප්ත බෝධ්‍යංගයන් සම්පූර්ණ කෙරෙති.'

(චතතාරෝ සතිපටඨානා භාවිතා බහුලීකතා සතතබොජඣංගෙ පරිපූරෙනති) ආදියෙහිද එම අරුත වේ. නැවත සිහිය ම 'සතිපටඨානං' යැයි කියන ලදී. එහි අර්ථ මෙසේයි. පිහිටානුයි පට්ඨාන නම් වේ. 'එළඹ සිටිති'යි දුව-පැන (පසුව එක්තැන) පවතිති'යි යන අර්ථයි. සිහියම සතිපට්ඨාන නම් වේ. නැතහොත් හැසිරෙති යන අර්ථයෙන් සති (සිහිය) නමි. පිහිටුවීම් අර්ථයෙන් පට්ඨාන නමි. 'සති' වූයේ ද එම 'පටඨාන' වූයේ ද එම 'සතිපටඨාන' වේ. මෙසේ මෙහිදී මේ අර්ථය අභිප්‍රේතයි.

ඒ සතිපට්ඨානය **භාවෙනෙතා** යනු වඩමිනි. මෙහිදී ද ත්‍රිවිධාකාරයෙන් පිළිපන් ශ්‍රාවකයන් කෙරෙහි ශාස්තෘන් වහන්සේගේ දොම්නස හා ඇල්ම ඉක්මවා සිටින ස්වභාවය සතිපට්ඨාන යයි කියන ලදී. එය මේ සූත්‍රයෙන් ගතයුතුයි. භාග්‍යවතුන් වහන්සේ විසින් මෙසේ දෙසන ලදී. 'තයෝ සතිපටඨානා යදරියෝ සෙවති යදරියෝ සෙවමානො සත්ථා ගණමනුසාසි තුමරහති' (යම් සතිපට්ඨානයක් ආර්යයන් වහන්සේ ඇසුරු කෙරෙත් ද, යම් සතිපට්ඨානයක් ඇසුරු කරන ශාස්තෘ වූ ආර්යයන් වහන්සේ (ශ්‍රාවක) ගණයාට අනුශාසනය කරනු යුතු වේ ද, එම සතිපට්ඨාන තුනයි.) යනුවෙන් මෙය දක්වන ලදී. කුමක් නිසා මෙය දක්වන ලද්දේ ද යත්, 'මහණෙනි! මේ සසුනෙහි ශාස්තෘන් වහන්සේ ශ්‍රාවකයන්ට දහම් දෙසන සේක්, අනුකම්පකව, හිතෛෂීව, අනුකම්පාව උපදවා, 'මෙය ඔබට හිත පිණිස පවතී' 'මෙය ඔබට සුව පිණිස පවතී' යනුවෙන් දෙසති. උන්වහන්සේගේ ශ්‍රාවකයෝ එය මනාව නො අසති. මනාව කන් යොමු නොකරති. දැනගැනීමේ සිත නො එළවති. ඔවුහු ශාස්තෘ ශාසනයෙන් ඉවත්ව ජීවත් වෙති. මහණෙනි, එකල්හි තථාගතයන් වහන්සේ නොසතුටු සිත් ඇති නොවෙත්මය. නොසතුටු සිත් ඇති බව නොම විඳිති. සිහි ඇතිව, මනාකොට දැන (කෙලෙසුන්ගෙන්) නොතෙත්ව (නොකිලිටිව) වැඩ වෙසෙති. මහණෙනි, මේ පළමු සතිපට්ඨානය යම් (සතිපට්ඨානයක්) ආර්යයන් වහන්සේ -පෙ- සුදුසු වේ.

'මහණෙනි, නැවත ද ශාස්තෘන් වහන්සේ -පෙ- 'මෙය ඔබට සුව පිණිස පවතී' එය ඇතැම් ශ්‍රාවක කෙනෙක් මනාව නො අසති. -පෙ- වසති. ඇතැම් ශ්‍රාවක කෙනෙක් මනාව අසති. -පෙ- මේ ශාස්තෘ ශාසනයෙන් නො ඉවත්ව වෙසෙති. මහණෙනි, එහිදී තථාගතයන් වහන්සේ සතුටු සිත් ඇති නොවෙති. සතුටු සිත් ඇති බව නොම විඳිති. අසතුටු සිත් ඇති නො වෙති. අසතුටු සිත් ඇති බව නො විඳිති. අසතුටු

සිත් ඇති නො වෙති. අසතුටු සිත් ඇති බව නො විදිති. සතුටුසිත් ඇති බව ද නොසතුටු සිත් ඇති බව ද යන දෙකම වලක්වා උපේක්ෂා සහගතව, සිහි ඇතිව මනාකොට දැන වැඩ වෙසෙති. මහණෙනි, මෙය දෙවැනි -පෙ-'

'නැවත ද මහණෙනි, -පෙ- සුව පිණිස පවතියි. උන්වහන්සේගේ ශ්‍රාවකයෝ මනාව අසති. -පෙ- පවතිති. මහණෙනි, තථාගතයන් වහන්සේ සතුටු සිත් ඇත්තේම වෙති. සතුටු සිත් ඇති බව ද අත්විඳිති. සිහි ඇතිව මනාකොට දැන (කෙලෙසුන්ගෙන්) නොතෙත්ව (කිළිටි නොවී) වැඩ වෙසෙති. මහණෙනි, මේ තෙවැනි -පෙ-'

මෙසේ දොම්නස හා ඇල්ම යන දෙකින් නො කිළිටි වූ, එළවූ සිහි ඇති බැවින් ඒ දෙක ඉක්මවා පැවතීම, 'සතිපට්ඨාන' යැයි කියන ලදී. සම්මා සම්බුදුවරුන්ගේ ම නිතර එළඹ සිටි සිහි ඇති බව වේ. පසේබුදු ආදීන්ගේ එසේ නොවෙති.

වේදනාවන් කෙරෙහි වේදනානුපස්සනා සතිපට්ඨාන ආදියෙහි ද, වේදනාවන් නැවත කීමෙහි යෙදීම කායානුපස්සනාවෙහි පැවසූ පරිදිම යෝග්‍ය සේ යොදා අර්ථ දතයුතුයි.

මේ වනාහි (සතිපට්ඨාන සතරටම) පොදු වූ අර්ථයි. සුඛ (වේදනාව) ආදී අනේකප්‍රභේද ඇති වේදනාවන් අතුරෙන් එක් එක් වේදනාවක් වෙන වෙන ම ගෙන අනිත්‍යාදී ත්‍රිලක්ෂණ වශයෙන් සිහිනුවණින් බැලීම (හෙවත් වේදනානුපස්සනාව) ද, සරාග සිත් සොළොසක් ප්‍රභේද ඇති සිත් එකක් එකක් වෙන් වෙන්ව ගෙන අනිත්‍යාදී වශයෙන් සිහි නුවණින් බැලීම (හෙවත් චිත්තානුපස්සනාව) ද කාය-වේදනා-චිත්තයන් හැර, සෙසු ත්‍රෛභූමික ධර්මයන් අතුරෙන් එකක් එකක් වෙන් වෙන්ව ගෙන සිහිනුවණින් බැලීම (හෙවත් ධම්මානුපස්සනාව) ද සතිපට්ඨාන සූත්‍රයෙහි කියන ලද නයින් නීවරණ ආදී ධර්මයන් සිහිනුවණින් බැලීම (හෙවත් නීවරණාදී) ධම්මානුපස්සනාවදැයි යනුවෙනි. මෙහි ද 'කායෙ' යනුවෙන් ඒකවචනය ශරීරය ඒකත්වයෙන් (එකක් වශයෙන්) ගැනීමෙන් ද 'චිතෙත' යැයි ඒකවචනය සිතේ ස්වාභාවික භේද නොමැති හෙයින් ජාති ග්‍රහණයෙන් ද කරන ලදැයි දතයුතුයි.

යම්සේ වේදනාදිය විමසා බැලිය යුතු වේද, එසේ වූ වේදනාවන් විමසා බැලීම වේදනානුපස්සනා නම් වේ. සිත පිළිබඳව විමසා බැලීම චිත්තානුපස්සනාවයි. ධර්මයන් පිළිබඳව විමසා බැලීම 'ධම්මානුපස්සනා'වයි යනුවෙන් අවබෝධ කරගත යුතුයි. පළමුව වේදනාවන් කෙසේ විමසා බැලිය යුතු ද? පළමුව සැප වේදනාව පවතී ද, ඒතාක් වූ සැප වේදනාව දුක් වශයෙන් ද, දුක් වේදනාව හුලක් වශයෙන් ද අදුක්ඛමසුඛ වේදනාව අනිත්‍ය වශයෙන් ද විමසා බැලිය යුතුයි. එනිසා කියන ලදී.

යො සුඛං දුක්ඛතො දදක්ඛි දුක්ඛමදක්ඛි සල්ලතො
අදුක්ඛමසුඛං සන්තං අදක්ඛි නං අනිච්චතො
සවෙ සම්මදසො භික්ඛු පරිජානාති වෙදනා

යමෙක් සැප වේදනාව දුක් වශයෙන් ද දුක් වේදනාව හුලක් වශයෙන් ද අදුක්ඛමසුඛ වේදනාව ශාන්ත වශයෙන් ද, අනිත්‍ය වශයෙන් ද දකියි නම් ඒ භික්ෂු තෙමේ මනාව දකිනුයේ ම ඒකාන්තයෙන් ම වේදනාව පිරිසිඳ දැනගනියි.

ඒ සියලු වේදනාවන් දුක් වශයෙන් ද විමසා බැලිය යුතුයි. මෙය කියන ලදී. 'යම්කිසි විදිය යුත්තක් වේද ඒ සියල්ල දුක යැයි කියමි'යි සැප දුක් වශයෙන් ද විමසා බැලිය යුතුයි. 'සුඛ වේදනාව පවත්නා තාක් සැප වේ. වෙනස්වීම දුක් වේ. දුක් වේදනාව පවතින තාක් දුක් වේ. වෙනස්වීම සැප වේ. අදුක්ඛමසුඛ වේදනාව දැනගැනීම සැප වේ. නොදැනීම දුක වේ.' තවද අනිත්‍යාදී සත් අනුපස්සනා වශයෙන් ද බැලිය යුතුය. චිත්ත ධම්මයන් අතුරෙන් ද පළමුව සිත ආරම්මණාධිපති, සහජාත යන ප්‍රත්‍යය වශයෙන් ද භූමිකම්ම කිරිය ආදී නානාවිධ භේද වශයෙන් ද අනිත්‍යාදී සත්ත අනුපස්සනාවන් හා සරාග ආදී ෂෝඩෂ ප්‍රභේදයන් වශයෙන් ද විමසා බැලිය යුතුයි. ධර්මයෝ සලක්ඛණ සාමාන්‍ය ලක්ෂණයන් වශයෙන් ද ශූන්‍යතා ධර්මයක් වශයෙන් ද අනිත්‍යාදී සත්ත අනුපස්සනාවන් වශයෙන් ද ශාන්ත ආශාන්තාදීන් වශයෙන් ද විමසා බැලිය යුතුයි.

මේ සතර සතිපට්ඨානයෝ පූර්වභාගයෙහි මාර්ග ක්ෂණයට ප්‍රථමයෙන් නානාවිධ චිත්තයන්හි ලැබෙති. 'එක් සිතෙකින් කය පරීක්ෂා කරයි. අනෙක් සිතෙකින් වේදනාව ද අනෙකෙකින් සිත ද, තවද

අනුනෙකෙකින් ධර්මයන් ද පරීක්ෂා කරයි. ලෝකෝත්තර මාර්ග ක්ෂණයෙහි වනාහි එක් සිතෙකම ලැබෙයි' යනාදී වශයෙන් කය පිළිබඳව මූලපටන් පරීක්ෂා කර, පැමිණියහුගේ විදර්ශනා සම්ප්‍රයුක්ත සිහිය 'කායානුපස්සනා' නම් වේ. එම යතියෙන් සමන්විත පුද්ගල තෙමේ කායානුපස්සී නම් වේ. විදර්ශනාව උත්සාහවත් කරවා ආර්ය මාර්ගයට පැමිණියහුගේ මාර්ග ක්ෂණයෙහි මාර්ග සම්ප්‍රයුක්ත වූ සිහිය කායානුපස්සනා නම් වේ. එම සිහියෙන් යුක්ත වූ පුද්ගලයා 'කායානුපස්සී' නම් වේ.

වේදනාව පරීක්ෂා කර, -පෙ- සිත පරීක්ෂා කර -පෙ- ධර්මයන් පරීක්ෂා කර පැමිණියහුගේ විදර්ශනා සම්ප්‍රයුක්ත වූ සිහිය -පෙ- ධම්මානුපස්සනා නම් වේ. එය සිහිකිරීමෙන් යුතු පුද්ගලයා ධම්මානුපස්සී නම් වේ. විදර්ශනාව උත්සාහවත් කොට ආර්ය මාර්ගයට පැමිණි තැනැත්තාගේ මාර්ග ක්ෂණයෙහි මාර්ග සම්ප්‍රයුක්ත වූ සිහිය ධම්මානුපස්සනා නම් වේ. ඒ සිහියෙන් යුක්ත වූයේ ධම්මානුපස්සී නම් වේ. මෙසේ මේ දේශනාව පළමුව පුද්ගලයා වෙත සිටියි. (යොමුවෙයි.) කය විෂයයෙහි 'ශුභ' යැයි යන විපර්යාසය (විපරීත සිත) ප්‍රහීණ කරන කය පිළිබඳ සිහිය මාර්ගයෙන් සමෘද්ධ වෙතියි 'කායානුපස්සනා' නම් වේ. වේදනාව විෂයයෙහි, 'සුවයකැ'යි යන විපර්යාස සිත ප්‍රහීණ කරන, වේදනාව පිළිබඳ සිහිය 'මාර්ගයෙන් සමෘද්ධ වෙති'යි වේදනානුපස්සනා නම් වේ. සිත විෂයයෙහි 'නිත්‍යයැ'යි යන විපරීතය ප්‍රහීණ කරන සිත පිළිබඳ සිහිය මාර්ගයෙන් සමෘද්ධ වෙති'යි චිත්තානුපස්සනා නම් වේ. ධර්මයන් කෙරෙහි ආත්ම යැයි විපර්යාසයව ඇති සිත ප්‍රහීණ කරන, ධර්මයන් පිළිබඳ සිහිය මාර්ගයෙන් සමෘද්ධ වෙති'යි ධම්මානුපස්සනා නම් වේ. මෙසේ 'මාර්ග සම්ප්‍රයුක්ත වූ එකම සතිය කෘත්‍ය සතරක් සිදු කෙරෙති'යි යන අරුතින් නම් සතරක් ලබයි.

එහෙයින් 'ලෝකෝත්තර මාර්ග ක්ෂණයෙහි දී වනාහි එකම සිතෙක ලැබෙති'යි කියන ලදී. උපකාර වශයෙන් ද අපරිහීන (නොපිරිහීම) වශයෙන් ද ප්‍රගුණ වශයෙන් ද යලිදු අනෙක් චතුෂ්ක (සිවුආකාර) තුන දක්වන ලදී.

එහි **අසති පරිවජ්ජනාය** යනු සති (සිහි) නොවනුයේ 'අසති' නම් වේ. සිහිය මෙහි නැත්තේනුයි හෝ අසති නම්. මුළා වූ සිහියට මේ තවත් සමාන අරුත් ඇති වදනෙකි. **පරිවජ්ජනාය** යනු හාත්පසින්ම වර්ජනය

කිරීමෙන්, බත් දැමූ කළ කවුඩන් මෙන් මුළා සිහි ඇති පුද්ගලයන් පරිවර්ජනය කිරීමෙනි. එළ වූ සිහි ඇති පුද්ගලයන් සේවනය කිරීමෙන් සිටීම්, හිඳීම් ආදියෙහි සිහිය පිහිටුවා ගැනීම පිණිස නැඹුරු වූ ප්‍රවණ වූ වෙතට නැමුණා වූ සිත් ඇති බැව්හි සිහිය උපදියි. **සතිකරණීයානං ධම්මානං** යනු සිහිය පවත්වාගත යුතු ධර්මයන්ගේ. **කතත්තා** යනු කරන ලද බැවිනි. සතර මාර්ගයන් 'කරන ලද බැවිනි'යි, 'වඩන ලද බැවිනි'යි යන අරුති. **සතිපට්පක්ඛානං ධම්මානං හතත්තා** යනු කාමච්ඡන්දාදී සිහියට ප්‍රතිවිරුද්ධ ධර්මයන් නසන ලද බැවිනි. **සතිමිත්තානං ධම්මානං අපම්මුට්ඨත්තා** යනු සිහිය පවත්වා ගැනීම පිණිස නිමිති කොටගත යුතු කායාදී අරමුණු නොනට බැවිනි. (විනාශ නොවූ බැවිනි.) 'සිහියෙන් යුක්ත වූ බැවිනි'යි සිහිය පිළිබඳ ධර්මයන් වෙත ආ බැවින් හා පිරිහී නොගිය බැවිනි. **වසිත්තා** යනු වශීභාවයට පත්වූ බැවිනි. **පාගුඤ්ඤත්තාය** ප්‍රගුණ වූ බැවිනි. **අපචෙවාරොහනාය** යනු නොපෙරලෙන බැවිනි. නොපසුබස්නා බැවිනි. **සත්තත්තා** යනු ස්වභාවයෙන් විද්‍යමාන වන බැවින්, **සන්තත්තා** යනු නිවුණු බැවින් **සමිත්තත්තා** යනු කෙලෙසුන් සන්සිඳුණු බැවිනි. **සනතධම්ම සමන්නාගතත්තා** යනු සත්පුරුෂ ධර්මයන්ගෙන් නොපිරිහුණු බැවිනි. බුද්ධානුස්සති ආදිය ඉහතින් පැවසූ පරිදි ම වේ.

සිහිකිරීම් වශයෙන් සිහිය අදහස් කරන ස්වභාවික පදය **සති** නම් වේ. නැවත නැවත සිහිකිරීමෙන්, අනුස්මරණය කිරීම් වශයෙන් **අනුස්සති** නමි. ඉදිරියට ගොස් මෙන් සිහිකරන හෙයින්, යලි සැමරීම් වශයෙන්. **පටිස්සති** නම් වේ. නැතහොත් මෙය උපසර්ග වශයෙන් හෝ හුදෙක් අර්ථය වැඩිකිරීම් පමණකි. සිහිකරන ආකාරය **සරණතා** නමි. යම්හෙයකින් **සරණතා** යනු ත්‍රිවිධ රත්නයට ද නමක් වේ ද එහෙයින් (එසේ අර්ථ ගැනීම) වළකනු සඳහා නැවත 'සති' යන්න යොදන ලදී. (දෙවරක් 'සති' යන පදය යෙදූ හේතුව දක්වයි.) මෙහි සති සංඛ්‍යාත වූ සරණයයි. සූත්‍ර පර්යාප්තිය දරණ බව **ධාරණතා** නම් වේ.

අනුපවිසන සංඛ්‍යාත වූ (පිවිසීම යැයි කියනු ලබන) අවගාහාර්ථයෙන් (ගිලීම) යන අර්ථයෙන් නො ඉල්පෙන බව **අපිලාපනතා** නමි. යම්සේ ලබුකලස් ආදිය (දියමත) ඉල්පේද, (දියෙහි) නොගිලේ ද, අරමුණෙහි යොදවන ලද සිහිය එසේ නොවේ. මේ (සිහිය) වනාහි අරමුණෙහි ප්‍රවිෂ්ට වෙයි. එහෙයින් 'අපිලාපනතා' (නො ඉල්පීම) යි කියන ලදී.

බොහෝ කාලයක් කරන ලද, බොහෝ කාලයක් කියන ලද කරුණු අමතක නොවී, විස්මෘත නොවී පවත්නා බව **අසම්මුස්සනතා** නම්. සමීපව සිටි හෝ එළඹ සිටි ලක්ෂණයෙහි ප්‍රධාන බව කරන්නේනුයි **ඉන්ද්‍රිය** නම්. සිහිය නම් වූ ඉන්ද්‍රිය **සතින්ද්‍රියං** සතින්ද්‍රිය නම්. ප්‍රමාදයෙකින් නොසැලේනුයි **සති බලං** නම්. විය යුතු ආකාර වූ සිහිය, නිදහස (මෝක්ෂය) වෙත යොමු කරවන සිහිය, කුසල් සිහිය **සම්මා සති** නම්. අවබෝධ කරගන්නහුගේ අංගය 'බොජ්ඣංග' නම්. ප්‍රශස්ත වූ, සුන්දර වූ, බොජ්ඣංගය සම්බොජ්ඣංග නම් වේ. 'සති' යනු ම (සිහිය ම) **සම්බොජ්ඣංග** වූයේනුයි **සති සමෙබාජ්ඣංගො** සති සම්බොජ්ඣංග නම් වේ.

ඒකායන මගෙහා යනු එකම මඟ වූයේ, 'මේ මාර්ගය ද්විවිධ මාර්ගයක් (දෙමඟකින් යුතු වූවක්) නොවේ.' යනුවෙන් අරුත් දතයුතුයි. නැතහොත් 'තනිවම වැඩිය යුතුය' යන අරුතින් ද 'ඒකායන' නම් වේ. එකෙන (එකලා වූවහු විසින්) යනු සමූහ වාසය හැරදමා විවේක ස්ථානයක ඉතා විවේකීව සිටියහු විසින් 'අධිතබෙබා' යනු පිළිපැදිය යුතුය. මෙයින් යෙත්නුයි හෝ 'අයන' නම්. 'සංසාරයෙන් නිවනට යෙති'යි යන අර්ථයි. අසහාය වූවහුගේ අයනය (මාර්ගය) 'ඒකායන' නම් වේ. 'ඒක' යනු ශ්‍රේෂ්ඨයන් වහන්සේගේයි. භාග්‍යවතුන් වහන්සේ සියලු සත්ත්වයින්ට ශ්‍රේෂ්ඨ වෙත්මය. එහෙයින් 'භගවතො'යි කියන ලදී. එතෙකුදු වුවත් ඒ (මාර්ගයෙන්) අන්‍යයෝ ද යෙති. එසේ ද වුවත් එම මාර්ගය භාග්‍යවතුන් වහන්සේගේම ය. උන්වහන්සේ විසින් උපදවන ලද හෙයිනි.

යම්සේ කීහු ද, 'සොහි බ්‍රාහ්මණ භගවා අනුප්පන්නස්ස මගස්ස උප්පාදෙතා' (බ්‍රාහ්මණය, ඒ භාග්‍යවතුන් වහන්සේ නූපන්නා වූ මාර්ගය පළමුව උපදවන සේක්මයි.) යන ආදියයි. 'යේනු'යි අයන නම්. 'යෙති'යි පවතිති'යි යන අරුති. එකම තැනෙක්හි වූ අයනය ඒකායන නම් වේ. 'මෙම ධර්ම විනයෙහිම ඒ නිවන් මාර්ගය පවතියි. අන් සසුනක නැතැ'යි කී නියාසය යම්සේ කීහු ද, 'ඉමස්මිං බො සුභද්‍ර ධම්ම විනයෙ අරියො අට්ඨංගිකො මගෙහා උපලබ්භති (සුභද්‍රය, මේ ධර්ම විනයෙහි ම ආර්ය අෂ්ටාංගික මාර්ගය ලැබිය හැකිය) යනුවෙනි. මෙය දේශනා නයෙහි භේදයක් වුවත් අර්ථ වශයෙන් එකක්මය. තවද 'එකං අයති'ති, 'එකක් ම කරා යෙති'යි යන අරුතින් ඒකායන නම් වේ. 'පූර්ව භාගයේ දී (මුලදී) නානාවිධ භාවනා වැඩීම් වශයෙන් පැවතියේ වුව ද පසුභාගයෙහි එකම නිවන කරා යෙති'යි කී නියාය. යම්සේ කීහුද සහම්පති බ්‍රහ්ම තෙමේ.

එකායනං ජාතිඛයන්තදස්සී - මඟඤ පජානාති හිතානුකම්පී
එතෙන මඟෙන තරිංසු පුබ්බ - තරිස්සන්ති යෙවාපි තරන්ති ඔඝංති

ඉපදීම හා නැතිවීම යන මේ දෙක්හි සසරෙහි කෙළවර දක්නා වූ සත්ත්වයා කෙරෙහි හිතානුකම්පී වූ තථාගතයන් වහන්සේ ඒකායන මාර්ගය දන්නා සේක. මේ මගින් සත්ත්වයා පෙර සසර නැමති හොය තරණය කළහ. දැනුදු එතෙර වෙති. මතුදු එතෙර වන්නෝ ය.

මඟෙහා යනු කවර අර්ථයකින් මග්ග නම් වේද? නිවනට පමුණුවන අර්ථයෙනි. නිවන සොයන්නවුන් විසින් සෙවිය යුතුය යන අරුතිනි. **උපෙතෝ** යනු ආසන්නයට ගියේයි. **සමුපෙතෝ** ඊටත් වඩා ආසන්නයට ගියේයි. මේ පද දෙකින්ම 'සිහියෙන් නො පිරිහුණේ'යි යන අරුතයි. **උපගතෝ** යනු සමීපයට පැමිණ සිටියේ යි. **සමුපගතෝ** යනු එක්වී සිටියේයි. **උපාගතෝ** යනු ද පෙළෙහි ඇත. මේ පද දෙකින් ම සිහිය එක්වීමට, සමීපයට ආයේය යන අර්ථයි.

උපපන්නෝ යනු වියෝ නොවූයේයි **සමුපපන්නෝ** යනු පිරිපුන් වූයේයි. **සමන්නාගතෝ** යනු නොවිකලව විද්‍යමාන වූයේ යි. 'උපෙතෝ, සමුපෙතෝ' යන දෙපදයෙන් පැවැත්ම කියන ලදී. 'උපගතෝ, සමුපගතෝ' යන දෙපදයෙන් ප්‍රතිවේධය පැවසුණි. 'උපපන්නෝ සමුපපන්නෝ සමන්නාගතෝ' යන පද තුනින් ප්‍රතිලාභය කියන ලදැයි ඇතැමෙක් විස්තර කෙරෙති.

ලොකෙ වෙසා විසත්තිකා යනු මේ අනේකප්‍රකාරයෙන් පැවසූ විසත්තිකා නම් තණ්හාව ස්කන්ධ ලෝකයෙහිම මිස ස්කන්ධයන් කෙරෙහි බැහැර අන් තැනෙක්හි නොපවතී'යි යන අර්ථයි. **ලොකෙ චෙතං විසත්තිකං** යනු ස්කන්ධ ලෝකයෙහි මෙසේ පවත්නා මේ විසත්තිකා නම් වූ තණ්හාව **තරති** යනු කාමයන් හැරදමනුයේ **උත්තරති** කෙලෙස් දුරුකරනුයේ **පතරති** ඒ කෙලෙසුනට ප්‍රතිෂ්ඨා වන හේතුව සිඳිනුයේ **සමතික්කමති** සංසාරය ඉක්මවා යනුයේ **පීතිවත්තති** ප්‍රතිසන්ධි වශයෙන් නැවත උත්පත්තියක් නොවිය හැකි බවට පත්කරමින් (තරණය කරයි.)

නැතහොත් **තරති උතතරති** යනු චිත්තානුපස්සනාවෙන් ඉක්මවීමයි. සියල්ලෙන් ම **වීතිවතත ති** යනු ධම්මානුපස්සනාවෙන් හෝ ඉක්මවීමයි. නැතහොත් **තරති** 'සීලයෙන්, **උතතරති** සමාධියෙන්, **පතරති** විදර්ශනාවෙන් තරණය කරයි. **සමතිකකමති** මාර්ගයෙන්, **වීතිවතතති** ඵලයෙන් ඉක්මවයි යන ආදිය හා සමග යෙදිය යුතුය.

1-4 කාම සූත්‍රයේ සිවුවන ගාථාව

සතරවන ගාථාවේ සංක්ෂිප්තාර්ථය මෙසේ ය. 'යමෙක් මේ හැල් කෙත් ආදී කෙත් හෝ, ගෙවතු ආදී වතු හෝ, කහවණු නම් වූ අමුරන් හෝ, ගව අශ්වාදී ප්‍රභේද ඇති ගව, අශ්වයන් හෝ අන්තෝජාත (ඇතුළත උපන්) දාසාදීන් හෝ භටකාදී කුලීකරුවන් හෝ ස්ත්‍රී සංඥා ඇති ස්ත්‍රීහු හෝ ඥාතිබන්ධු ආදී ඥාතීන් හෝ, අනික් ප්‍රියමනාප රූපාදී බොහෝ කාමයන් හෝ ප්‍රාර්ථනා කරයි. **සාලිකෙඛතතං** යනු යම් කෙතක හැල් වැඩෙයි ද, ඒ කෙත් ය, **වීහිකෙඛතතා** දියෙහි ද එම නයයි. වීහි යනු සෙසු වී ආදී ධාන්‍ය වර්ගයි. 'මෝදයට පත් කරති'යි මුගෙහා මුග්ග නම් වේ.

සරවත්‍ථුං ගෙවල් සෑදීමට සකස් කළ භූමිභාගයයි. **කොට්ඨකවත්‍ථු** ආදියෙහි ද මෙම නයයි. **කොට්ඨකො** යනු දොර, කොටු ආදියයි. **පුරෙ** යනු ගෙයට ඉදිරියෙන් **පච්ඡා** යනු ගෙයට පසුපසිනි. 'මෙහි සිත අලවති'යි, 'සිත සතුටු කරති'යි යන අරුතින් **ආරාමො** ආරාම නම් වේ. මලින්, ඵලින්, සෙවණින් හා දස්නෙන් ද සිත් අලවති යි යන අර්ථයි. **පසුකාදයො** යනු එළු ආදීහුය. **අනෙතා ජාතො** යනු ගෙතුළ වසන දාසියකගේ කුසින් උපන්, **ධනකකී තො** මිලදී ගෙන තමා සතු කරගත්, **සාමංවා** යනු තෙමේ ම (සිය කැමැත්තෙන්) හෝ දාස බවට පත් වූයේ, **දාස වියං** යනු දාස බව, දාසව්‍ය නම්. එයම දාස විය යි. **උපෙති** එළඹේ. **අකාමතො වා** නොකැමැත්තෙන් හෝ යුද්ධයකදී ජීවග්‍රහයෙන් අල්ලා ගෙනෙන ලදැයි යන සතර ආකාර දාසයන් නැවත දක්වනු සඳහා **ආමාය දාසාපි භවනති** හෙකෙ (ඇතැමෙක් ගෙහි තුළ උපන් දාසයෝ වෙති.) යනාදිය කීහ. **ආමාය දාසා** යනු ගෙයි ඇතුළත උපන් දාසයෝ හා අනුන්ගෙන් මිළදී ගත් ගෘහස්ථ දාසයෝ යි. 'යීතො ථුල්ලානි ගජ්ජති' යන මෙහි ද මොවුන් (දාසයන්) පිළිබඳව කියන ලදී.

ධනයෙන් මිලදී ගත් ධන දාසා ධනදාසයෝ යි. **සාමඤ්ච එකෙ,** ඇතැමෙක් (සිය කැමැත්තෙන්) තුමූ ම දාසබවට පත්වූවාහුය. **භයාපනුනනා** යනු බිය නිසා නො කැමැත්තෙන් දාස වූවාහුය. භයාපනුනනා බියෙන් දාස බවට වැටුණාහුය. **හතකා** යනු කුළියෙන් (වැටුපෙන්) ජීවත් වන්නාහුය. 'කෘෂිකර්මාන්තාදී කටයුතු කරති'යි **කම්මකරා** කම්මකාර නම් වෙති. සම්මන්ත්‍රණාදියෙන් සමීපයට පැමිණ ගිවිසුම්කොට, ඇසුරෙහි ජීවත් වන්නාහු **උපජීවිතො** 'උපජීවී' නම් වෙති. **ඉත්ථී** යනු ස්ත්‍රීහුය. 'මැය කෙරෙහි ගැබ පිහිටානු'යි ඉත්ථී නම් වේ. **පරිගහෙතා** යනු සැමියා සහිත ස්ත්‍රීහුය. මාපිය නෑයෝ ද **ඤාතිබන්ධු** නම් වෙති. සිය ගෝත්‍රයේ වූවෝ **ගොත්තබන්ධු** නම් වෙති. එකම ආචාර්ය කුලයක හෝ එක් ජාති මන්ත්‍රයක් හෝ උගත් මන්ත්‍රාදිය ඇත්තේ **මන්තබන්ධු** නම් වේ. දුනු ශිල්පාදිය සමග එක්ව උගත්තේ **සිපපබන්ධු** නම් වේ. තවද **මිත්තබන්ධවාපී බන්ධූ** යන පාඨයද කිසියම් පොතෙක දක්නා ලැබේ.

ගිජ්ඣති යනු කෙලෙස් කාමයෙන් ප්‍රාර්ථනා කරයි. අනුගිජ්ඣති යනු තව තවත් ගිජු වේ. පුන පුනා ප්‍රාර්ථනය කරයි. **පළිගිජ්ඣති** යනු හාත්පසින්ම ප්‍රාර්ථනා කරයි. **පළිබජ්ඣති** යනු සෙසු දෙයක් නොපතයි. උදාරත්වයෙන් නිමිති ගැනීම් වශයෙන් **ගිජ්ඣති** ගිජු වෙයි. **අනුගිජ්ඣති** අනුබ්‍යඤ්ජන (සුලු ලකුණු) ගැනීම් වශයෙන් **පළිගිජ්ඣති** හාත්පසින් ගිජු වේ. හාත්පසින්ම බැඳේ. (පළිබජ්ඣති) යැයි ඇතැමෙක් විස්තර කෙරෙති.

1.5 කාම සූත්‍රය පස්වන ගාථාව

පස්වන ගාථාවේ සංක්ෂිප්ත අර්ථය මෙසේ ය. 'ඒ පුද්ගලයා දුර්වල බැවින් ක්ලේශයෝ ඔහු බලය යොදා යටපත් කරගනිති. දමනය කරති. මර්දනය කරති. 'ශ්‍රද්ධා බල ආදියෙන් තොර වූ බැවින් හෝ දුර්වල වූ ඒ පුරුෂයා දුබල බැවින් බලාත්කාරයෙන් යටත් කරගනිති'යි යන අර්ථයි. ඉක්බිති ඒ කාමයට ගිජු වූ, කාමයෙහි ඇලුණු, කාමය සොයන්නහු සිංහාදී වූ ප්‍රකට අන්තරායයෝ ද කාය දුශ්චරිතාදී අප්‍රකට අන්තරායයෝ ද මර්දනය කරති. ඉක්බිති අප්‍රකට අන්තරායයන් විසින් මඬනා ලද ඒ පුද්ගලයා පසුපස ජාති ආදී දුක් එයි. බිඳී ගිය නැවක් තුළට ජලය වදනා සේය.

අබලා යනු 'මොවුනට බලයක් නැත්නු'යි අබල නම් වෙති. බලයෙන් තොර වූවාහුයි. **දුබ්බලා** යනු මද වූ ප්‍රයෝග (ප්‍රායෝගිකත්වයක්, කාර්යක්ෂම භාවයක්) ඇත්තාහුයි, බලයෙන් කළයුතු කටයුතු විරහිත වූවාහුයි. **අපපබලා** අල්ප වූ, සුලු වූ බලයක් මොවුනට ඇත්නු'යි අප්පබල නම් වෙති. යෙදීමට (නියුතුවීමට අසමත් වූවාහු'යි. **'අපපථාමා'** යනු අල්ප වූ සුලු වූ වීර්යයක්, වෑයමක්, උත්සාහයක් මොවුනට ඇත්නුයි අප්පථාප නම්. වීර්යයෙන් හීන වූවාහුයි, ප්‍රයෝග හීන වූ බැවින් **ඔමකා** 'ඕමක' (ප්‍රායෝගිකත්වයෙන් අවම) නම් වෙති. වීර්යය දුර්වල වූ හෙයින් **ඡත්තක** නම් වෙති. (එනම් හතු මෙන් පහසුවෙන් මඩිනු ලැබිය හැකි වෙති.) අදහස් හීන වූ බැවින් **පරිත්තා** යනු පරිත්ත (ලඝු) නම් වෙති. ශක්තියෙන් හීන වූ හෙයින් (කාය දුශ්චරිතාදී වූ අප්‍රකට අන්තරායයෝ) යටත් කරගනිති. මැඩගනිති. ගැටීම් උපදවති. **පරිසහනති** යනු සර්වප්‍රකාරයෙන් ම මැඩ ගනිති. **අභිභවනති** යනු ඒ ඒ භවයෙහි උත්පත්ති වශයෙන් **අජ්ඣාචරනති** යනු නැවත නැවත උත්පත්ති වශයෙන් මැඩගනිති. **පරියාදියනති** යනු වියලවා (ක්ෂය කරවා) සිටීමෙන්, **මද්දනති** යනු කුසල් ඉපදීම වැළැක්වීමෙන් මඩිති.

සද්ධාබලං යනු 'මෙය කරණකොට ගෙන අදහති'යි, 'තමාම (තනිවම) යමක් කරණ කොටගෙන) අදහති'යි, මෙය හුදු ඇදහීම් මාත්‍රයකි'යි හෝ 'සද්ධා' නම්. එය ඇදහීම ලක්ෂණකොට ඇත්තේය. විශ්වාස කිරීම හෝ ලක්ෂණ කොට ඇත්තේ ය. මනාකොට පැහැදවීම (රස) කෘත්‍යකොට ඇත්තේය. ජලය පහදවන මැණිකක් මෙනි. ශීඝ්‍ර චලනය (සැණෙකින් ක්‍රියාත්මක වීම) හෝ කෘත්‍යකොට ඇත්තේ ය. ඕඝයක් තරණය කිරීමේ දී නැවක් මෙනි. විචිකිච්ඡා ආදියෙන් නොකිළිටි බව පච්චුපට්ඨාන (වැටහීම් කාරණය) කොට ඇත්තේ ය. නැඹුරු බව වැටහීම් කාරණ කොට ඇත්තේය. ඇදහිය යුතු බව පදට්ඨාන (පදනම්) කොට ඇත්තේ ය. සෝතාපත්ති අංගය (විචිකිච්ඡා රහිත බව) හෝ පදට්ඨාන කොට ඇත්තේ ය. 'මැනවින් මඬනා ලද (නිසැකයෙන් ඵලදාව ඇතිකරන) බිජුවට මෙනැ'යි දතයුතුය. 'අවිශ්වාසයෙන් (සැකයෙන්) කම්පා නොවෙති'යි **සද්ධාබලං** සද්ධා බල නම්. **විරිය බලං**, විරිය බල යනු වීරයාගේ ස්වභාවය 'විරිය' (වීර්ය) නම්. වීරයන්ගේ කාර්යය හෝ විධිමත් නයින් (උපායයෙන්) කියවිය යුතු වූයේ, පැවැත්විය යුතු වූයේ හෝ විරිය (වීර්ය) නම්. ඒ මේ (වීර්යය) උපස්ථම්භනය (රුකුල්දීම) ලක්ෂණකොට ඇත්තේ ය. උත්සාහය ලක්ෂණකොට ඇත්තේ ද

වේ. සහජාත (එක්ව උපන්) ධර්මයනට රුකුල්දීම කෘත්‍යකොට ඇත්තේය. 'සංවිගෙහා යොනිසො පදහති) (සංවේගයට පත්වූයේ නුවණින් වීර්ය කරයි.) යනු කී හෙයින් සංවේගය (කලකිරීම) පදට්ඨාන (පදනම්) කොට ඇත්තේ ය. වීර්යාරම්භයට වස්තු (ආශ්‍රය) වූ දෙය හෝ පදට්ඨාන කොට ඇත්තේ ය. මැනවින් අරඹන ලද්දේ සියලු සම්පතට මුල්වෙතැයි දතයුතුය. කුසීතකමින් කම්පා නොවෙති'යි **විරිය බලං** විරිය බල නම් වේ.

සිහියෙහි ලක්ෂණාදිය (ඉහතින්) පවසන ලද්දේම ය. මුළා වූ සිහියෙන් කම්පා නොවේනුයි **සති බලං**, සති බල නම් වේ. 'සහජාත (එක්ව උපන්) ධර්මයන් මනාව ආධාරකොට ගනිති'යි, 'පිහිටුවා ගනිති'යි **සමාධි** නම් වේ. එය (සමාධිය) ප්‍රමුඛත්වය ලක්ෂණකොට ඇත්තේ ය. අවික්ඛේපය (ඒකාග්‍රතාව) හෝ අවිසාර (නො විසුරුණු බව) හෝ ලක්ෂණකොට ඇත්තේ ය. සහජාත (එක්ව උපන්) ධර්මයන් පිළිබඳ අරමුණෙහි දී සම්පිණ්ඩනය (පිඬුකොට ගැනීම) කෘත්‍යකොට ඇත්තේ ය. (සඳුන්, කොකුම් ආදී) නහන සුවඳ කුඩුවලට (සුවඳ සුණු) ජලය මෙනි. උපසමය (සන්සිඳීම) වැටහීම් කාරණ කොට ඇත්තේ ය. ඥානය හෝ වැටහීම් කොට ඇත්තේ ය. 'සමාහිතො යථාභූතං පජානාති පසසති' (සමාධියෙන් යුක්ත වූයේ තත් වූ පරිදි දනියි. දකියි.) යනුවෙන් කියන ලදී.

විශේෂයෙන් සුඛය (සුවපහසු බව) පදට්ඨාන (පදනම්) කොට ඇත්තේය. සුළඟින් ආවරණය වූ තැනෙක පහන් සිළුවේ නිසල පැවැත්ම මෙන් සිතෙහි නිසල බව දතයුතුයි. 'උද්ධච්චයෙන් කම්පා නොවෙති'යි **සමාධිබලං** සමාධි බල නමි. 'විශේෂයෙන් දැනගන්නේ නු'යි **පඤ්ඤා** නම් වේ. කුමක් දැනගනී ද? 'මේ දුකය.....' යනාදී නයින් ආර්ය සත්‍යයන් දැනගනියි. එය යථා ස්වභාව (තත් වූ පරිදි අවබෝධ කිරීම) ප්‍රතිවේධය ලක්ෂණකොට ඇත්තේ ය. අක්ඛලිත පටිවේධය (නොපැකිලෙන) හෝ ලක්ෂණකොට ඇත්තේ වේ. දක්ෂ දුනුවායකුගේ දුන්නෙන් නිකුත් වූ ඊතලයක් (නිවැරදිව ඉලක්කය කරා යන්නා වැනිය.) මෙන් ප්‍රස්තුත විෂය කරාම යන්නේය. ප්‍රස්තුත විෂයය පහනක් මෙන් හෙළිපෙහෙළි කිරීම කෘත්‍යකොට ඇත්තේය. අසම්මෝහය (නොමුළා බව), නොමුලාව කැලෑ මං නිවැරදිව පෙන්වන්නෙකු මෙන් පච්චුපට්ඨාන (වැටහීම් කාරණය) කොට ඇත්තේය.

අවිද්‍යාවෙන් කම්පා නොවේනුයි **පඤ්ඤා බලං** පඤ්ඤා බල නම්. අහිරික බවින් (ලැජ්ජා නැති බැවින්) කම්පා නොවේනුයි **හිරිබලං** හිරිබල නම්. අනොත්තප්පයෙන් (පව් කිරීමට නොබිය වන බැවින්) කම්පා නොවේනුයි **ඔත්තප්පබලං** ඔත්තප්ප බල නම් වේ.

මේ එම දෙපදයේ අර්ථ වර්ණනාවයි. කාය දුශ්චරිතාදියෙහි ලැජ්ජා වෙනුයේ 'හිරි' හිරි නම්. ලජ්ජාවට මේ අධිවචනයෙකි. ඒ කාය දුශ්චරිතාදිය සිදුකිරීමට බිය වේනුයි **ඔත්තප්පං** ඔත්තප්ප නම්. පාපයට බියවීමට තැති ගැනීමට මේ අධිවචනයෙකි. මේ දෙපදය වෙන්කර පැහැදිලි කරනු පිණිස සමුට්ඨාන, අධිපති හා ලජ්ජාදී ලක්ෂණයන් ද යන මේ මාතෘකා තබා, අනතුරුව මේ සවිස්තර කථාව කියන ලදී. ඇතුලතින් හටගන්නේ (සමුට්ඨාන) හිරි නම් වේ. බාහිරව (පිටතින්) හටගන්නේ ඔත්තප්ප නම් වේ. තමා අධිපති කොට උපන්නේ හිරි නම් වේ. ලෝකයා අධිපති කොට උපන්නේ ඔත්තප්ප නම් වේ. ලජ්ජා ස්වභාවයෙන් සිටියේ හිරි නම් වේ. භය ස්වභාවයෙන් සිටියේ ඔත්තප්ප නම් වේ. අප්‍රගල්භ (යටහත් පහත් පැවතුම් ඇති) ලක්ෂණය ඇත්තේ හිරි නම් වේ. වරදට බිය වන ථරදෙහි බිය දක්නා ලක්ෂණය ඇත්තේ ඔත්තප්ප නම් වේ.

එහි අභ්‍යන්තරව හටගන්නා හිරිය කාරණා සතරකින් උපදියි. එනම්, තමාගේ ජාතිය පිළිබඳව සලකා බලා ද, වයස සලකා බලා ද, ශූරභාවය සලකා බලා ද තමාගේ බහුශ්‍රැතභාවය සලකා බලා දැයි යන කරුණු සතරෙකි. කෙසේද යත්, 'පව්කම් කිරීම නම් උසස් කුලවතුනට සුදුසු වූවක් නොවේ. මසුන් මරන කේවට්ටාදී කරන ක්‍රියාවෙකි. 'ඔබ වැනි උසස් කුලවතුන්ට මෙවැනි ක්‍රියා කිරීම නොහොබී' යනුවෙන් තමාගේ ජාති සම්පන්නභාවය සිහිකර බලා, ප්‍රාණඝාතාදී පව්කම් නොකරනුයේ පව් කිරීමට ලජ්ජාව උපදවා ගනියි. එසේම 'පව්කම් කිරීම නම් ළදරුවන් විසින් කළ යුත්තකි. ඔබ වැනි වැඩිහිටි වියෙහි සිටියකු විසින් මෙවැනි පව්කම් කිරීම නොහොබී' යැයි වයස පිළිබඳව සිහිපත් කර බලා ප්‍රාණඝාතාදී පවු නොකරනුයේ ලැජ්ජාව උපදවා ගනියි. එසේම 'පව්කම් නම් දුර්වල වූවන්ගේ ක්‍රියාවකි. ඔබ වැනි ශූරභාවයට පත්වූවකු විසින් මෙවැනි පාපකර්ම කිරීම නුසුදුසුය'යි මෙසේ තම ශූරභාවය සිහිපත් කර බලා ප්‍රාණඝාතාදී පවුකම් නොකරනුයේ ලජ්ජාව උපදවා ගනියි. එසේම 'පව්කම් කිරීම නම් අඳබාලයන්ගේ ක්‍රියාවෙකි. පඬිවරුන්ගේ ක්‍රියාවක්

නොවේ. ඔබ වැනි බහුශ්‍රැත පඬිවරුනට මෙවැනි ක්‍රියා සිදුකිරීම නොහොබී' යැයි මෙසේ තම බහුශ්‍රැතභාවය සිහිපත් කිරීමෙන් පව්කම් නොකරනුයේ ලජ්ජාව උපදවා ගනියි.

මෙසේ අභ්‍යන්තරව හටගන්නා හිරිය සිවු ආකාරයකින් උපදවා ගනියි. එසේ උපදවා ගෙන, යලිදු තමාගේ සිත තුළ පිහිටාගෙන පවුකම් නො කරයි. මෙසේ අභ්‍යන්තරයෙන් හටගන්නා පව් කිරීමට ඇති ලජ්ජාව හිරි නමි. ඔත්තප්ප සිතුවිල්ල කෙසේ බාහිරව හටගන්නේ ද? ඉදින් ඔබ පව්කම් කරතොත් සිවු පිරිස් අතර ගැරහීමට පත්වූවෙක් වන්නාහුය.

ගරහිස්සනති තං විඤ්ඤූ අසුචී නාගරිකො යථා
විවජ්ජිතො සීලවනෙතහි කථං භික්ඛූ කරිස්සසී'ති

'නුවණැත්තෝ ඔහුට නගරවැසියෙකු අශුචි පිළිකුල් කරන්නාක් මෙන් ගරහති. සිල්වතුන් විසින් අත්හැරෙති. ඒ භික්ෂුව කෙසේ (මහණකම්) කරන්නේ ද?'

මෙසේ සිහිපත් කරමින් බාහිර හටගන්නා වූ ඔත්තප්පය (බිය) නිසා පවුකම් නොකරයි. මෙසේ බාහිරව හටගන්නා (පවු නොකරන සිතුවිල්ල) ඔත්තප්ප නම් වේ. කෙසේ අත්තාධිපති ධර්මය හිරි නම් වේද? මේ සසුනෙහි කිසියම් කුලපුත්‍රයෙක් තමා අධිපතියකු, ජ්‍යෙෂ්ඨයකු කර, 'ඔබ වැනි ශ්‍රද්ධාවෙන් පැවිදි වූ බහුශ්‍රැත වූ ධුතංගධරයෙකුට පව්කම් කිරීම නුසුදුසුය'යි සිතා පව්කම් නොකරයි. මෙසේ තමා ප්‍රධාන කරගත් (අත්තාධිපති) ධර්මය හිරි නමි. එහෙයින් භාග්‍යවතුන් වහන්සේ මෙසේ වදාළහ. 'ඔහු තමාම අධිපති කරගෙන අකුසල් දුරුකරයි. කුසල් වඩයි. සාවද්‍ය දේ බැහැරලයි. නිවැරදි ක්‍රියා වඩයි. පිරිසිදු වූ ආත්මභාවය පරිහරණය කරයි' යනුවෙනි.

ලෝකාධිපති ධර්මය ඔත්තප්ප නම් වූයේ කෙසේද? මේ සසුනෙහි කිසියම් කුලපුත්‍රයෙක් ලෝවැසි ජනයා ප්‍රධාන කරගෙන, ජ්‍යෙෂ්ඨ කරගෙන පව්කම් නොකරයි. යම්සේ කීහුද, 'මේ ලෝක සන්නිවාසය වූ කලී ඉතා මහත්ය. ඒ ඉතා මහත් වූ ලෝක සන්නිවාසයෙහි ඍද්ධිමත්, දිවැස් ඇති, අනුන්ගේ සිත් දන්නා ශ්‍රමණ බ්‍රාහ්මණයෝ වෙති. ඔවුහු ඉතා දුර වුවත් දකිති. සමීපයෙහි වූවත් දිස් නොවෙති. (නොදකිති.) තම සිතින් (පර) සිත්

'ඔවුහු මා මෙසේ දැනගනිති'යි දැනගනිති. 'පින්වතුනි, බලවු! මේ කුලපුත්‍රයා ශ්‍රද්ධාවෙන් ගිහිගෙන් නික්ම අවුත් පැවිදි වූයේ පවිටු අකුසල ධර්මයන්ගෙන් ගැලවී වාසය කරයි' යනුවෙනි. එසේම ඍද්ධිමත්, දිවැස් ඇති, අනුන්ගේ සිත් දන්නා වූ දේවතාවෝ වෙති. ඔවුහු ඉතා දුර වුවත් දකිති. සමීප වූවත් නොපෙනෙති. තම සිතින් පර සිත් දැනගනිති. ඒ දෙවියෝ ද මා පිළිබඳව මෙසේ දැනගනිති. 'පින්වතුනි, බලවු! මේ කුලපුත්‍රයා ශ්‍රද්ධාවෙන් ගිහිගෙන් නික්ම අනගාරික සසුනෙහි පැවිදි වී, පාපක අකුසල ධර්මයන්ගෙන් ගැලවී ගෙන වාසය කරයි' යනුවෙනි. ඔහු මෙසේ ලෝකයාම අධිපති කරගෙන අකුසල් බැහැරලයි. කුසල් වඩයි. වැරදි කටයුතු අත්හැර නිවැරදි කටයුතු වර්ධනය කරගනියි. පිරිසිදු වූ ආත්මභාවය පරිහරණය කරයි. මෙසේ ලෝකාධිපති වූ ධර්මය ඔත්තප්ප නම් වේ.

ලජ්ජා ස්වභාවයෙහි පිහිටියේ හිරි නම් වේ. භය ස්වභාවයෙහි පිහිටියේ ඔත්තප්ප නම් වේ. මෙහි වනාහි **ලජ්ජා** යනු ලජ්ජා ආකාරයයි. ඒ ස්වභාවයෙන් යුතු වූයේ හිරි නම්. **භයං** යනු අපාය භයයි. ඒ ස්වභාවයෙන් යුතු වූයේ ඔත්තප්ප නම්. මේ දෙකම පාපයන් දුරු කිරීමෙහි ප්‍රකට වේ. ඇතැමෙක් වනාහි යම්සේ හුදකලා වූ කුලපුත්‍රයෙක් තෙමේ මළ මුත්‍ර කරමින් සිටියේ ලජ්ජාවිය යුතු කෙනෙකු දැකීමෙන් ලජ්ජාවට පත්ව, හැකිලෙනුයේද එසේම අභ්‍යන්තර වශයෙන් ලජ්ජාවිය යුතු ස්වභාවය හැරපියා පවුකම් නොකරති. එහිලා මේ උපමාවයි.

'යම්සේ වනාහි යකඩ ගුලි දෙකක් ඇත. ඉන් එකක් අසූචිවලින් වැකුණේ සීතල වූයේ ද, අනික රත් වී ගිනියම් වූයේ ද, එවිට නුවණැත්තා සීතල වූ යකඩ ගුලිය අශුචි වැකුණු හෙයින් පිළිකුල් කොට, අතට නොගනියි. අනික පිලිස්සීමේ බිය නිසා අතට නොගනියි.' මේ උපමාවේ එන සීතල වූ අශුචි වැකි ගුලිය පිළිකුල නිසා අතට නොගන්නාක් මෙන් අභ්‍යන්තර ලජ්ජී ධර්මය ඉක්මවා පවු නොකිරීම දතයුතුයි. උණුසුම් වූ යකඩ ගුලිය 'දැවෙති'යි යන බිය නිසා අතට නොගන්නාක් මෙන් අපාය දුකට බියෙන් පවු නොකිරීම දතයුතුයි.

සපතිසස ලකඛණා හිරි, වජ්ජභීරුක භය දස්සාවී ලකඛණං ඔත්තපපං අප්‍රගල්භ (යටත් පහත් පැවතුම් ඇති, ගරු සරු ඇති) බව හිරි නම්. වරදෙහි බිය දක්නා ලක්ෂණ ඇති බව ඔත්තප්ප නම්.) මේ දෙක පාප දුරුකිරීමෙහිම ප්‍රකට වේ. ඇතැම්හු සිය කුලවත් බව සිහිපත් කිරීමෙන්, ශාස්තෘවරයාගේ

මහත් බව සිහිපත් කිරීමෙන්, දායාද මහත් බව සිහිපත් කිරීමෙන්, සබ්‍රහ්මචාරීන්ගේ මහත් බව සිහිපත් කිරීමෙනැයි යන සිවු කාරණයෙන් අප්පගබ්භ ලක්‍ෂණ සහිත හිරිය ඉපදී පවුකම් නොකරති. ඇතැම්හු අත්තානුවාද භයින්, පරානුවාද භයින්, දඬුවම් භයින් සහ දුගතියට යෑමේ භයින් යන සිවු කරුණින් වරදට බිය වන ලක්‍ෂණ ඇති ඔත්තප්පය උපදවාගෙන පවුකම් නොකරති. මෙහිලා ජාති මහත්වය, කුලවත් බව සිහිකිරීම් ආදී සතරත්, අත්තානුවාද භයාදී සතරත් විස්තර කර කිවයුතු වේ. මෙසේ කියන ලද සත්වැදෑරුම් බලය යම් පුද්ගලයෙකුට නැත්තේ ද ඒ කෙලෙස්හු එම පුද්ගලයා යටත් කරගනිති. -පෙ- හාත්පසින් ගනිති. මැඩලති.

දෙව පරිසඝයා යනු ප්‍රකට, අප්‍රකට වශයෙන් උපද්‍රවයෝ දෙකක් ම වෙති. එකක් හෝ තුනක් නොවෙති. ඒ දෙක විභාග කර දැක්වීමට **කතමෙ පාකට පරිසඝයා** යනාදිය කීහු. (එහි **කොකා** යනු වෘකයෝය. මෙය අප පාඨයකි.) **චොරා** යනු සොරකම්හි නිරතයෝ ය. **මානවා** යනු සැහැසිකම්වලින් යුතු පුද්ගලයෝ ය. **කතකම්මා** ගෙවල් බිඳීම් ආදී සොරකම් කලාහුය. **අකතකම්මා** එවැනි කටයුතු නොකළ නමුදු කිරීමට නික්මුණු පුද්ගලයෝ ය. මෙහි **අඝසූ** යනු වන්නෝය යන අර්ථයි. (අඝ වීමෙහි ධාතුවෙන් නිපන් වර්තමාන කාලික ප්‍රථම පුරුෂ බහුවචන රූපයයි. 'වෙති' යනුයි.) **චක්ඛු රොගො** යනු ඇසෙහි උපන් රෝගයයි. 'වේදනා දෙනුයේනු'යි රෝග නම් වේ. චක්ෂු රෝගාදිය වස්තු වශයෙන් දතයුතුයි. උපතින්ම චක්ඛු ආදී ප්‍රසාදයන් හීන වූ රෝගයක් නම් නැත. (උපතින්ම පංච ප්‍රසාදයන් දුබලවීම රෝගයක් නොවේ.) **කණ්ණරොගො** යනු පිට කණෙහි සැදෙන රෝගයයි. **මුඛරොගො** මුවෙහි උපන් රෝගයි. **දන්තරොගො** යනු දත්මුල් රෝගයි. **කාසො** යනු ක්‍ෂය රෝගයයි. **සාසො** යනු ඇදුම හෙවත් මුහ රෝගයයි. **පිනාසො** යනු පිට නාසයේ රෝගයකි. **ඔහො** ශරීරයේ උපදින්නා වූ උණයි. **මූළ්හා** මුසපත් වීමයි. **පක්ඛන්දිකා** ලෝහිත පක්ඛන්දිකා හෙවත් අතීසාර රෝගයයි. **සූලා** යනු ආමශූල නම් කුසේ රෝගයකි. **විසූචිකා** මහත් වූ විරේචනයයි. **කිලාසො** කුෂ්ඨ රෝගයයි. **සොසො** වියලි ඇදුම රෝගයයි. **අපමාරො** අපස්මාරයයි. හෙවත් අමනුෂ්‍යයකු, වෛරී යක්‍ෂයකු ආවේශ වීමයි. දද්දූ දද පිළිකායි. **කණ්ඩූ** කුඩා දද පිළිකායි. කච්ඡු මහා කුෂ්ටයි. **රඛසා** නියවලින් හූරා දැමූ තැන් ඇති රෝගයයි. **රක්ඛසා** යන පාඨය ද පෙළෙහි යෙදේ. **විතච්ඡිකා** අත් පා තල තීරු තීරු ආකාරයෙන් පැළෙමින් උපදින රෝගයකි.

ලොහිත පිත්තං ලේ පිතයි. රත් පිත යැයි කියන ලදී. මධුමෙහො යනු ශරීරාභ්‍යන්තරයේ හටගන්නා බලවත් රෝගයකි. 'තවද මධුමේහය බලවත් (පහසුවෙන් සුවකළ නොහැකි) රෝගයකි'යි කියන ලදී. 'අංසෝ' යනු අර්ශස් රෝගයයි. **පිළකා** යනු ලේ පිළිකා රෝගයයි. 'යෝනිය නොහොත් ගුදය පළති'යි භගන්දලා නම්. මළ මාර්ගය පළති'යි යන අර්ථයි. **පිත්ත සමුට්ඨානා** යනු 'මේ (රෝගයන්ගේ) හටගැනීම, උපත, පිතෙත් වෙති'යි පිත්ත සමුට්ඨාන නම්. ඔවුහු දෙතිසක් වෙති. **සෙම්හ සමුට්ඨානා** දියෙහිද මෙම නයයි.

සන්නිපාතිකා යනු වා, පිත්, සෙම් ආදියේ එක්රැස් වීමෙන්, එකතු වීමෙන් උපන් රෝගයි. 'රෝගයන් ඇති කරති'යි යන අර්ථයෙන් ආබාධා නම්. **උතු පරිණාමජා** යනු පරිණාමයට (වැඩීමට) පත් වූ අති උෂ්ණ, අති ශීත ස්වභාවයෙන් උපදින රෝගයෝ යි. **විසම පරිහාරජා** යනු නුසුදුසු ස්ථානවල හිඳීම් ආදී විෂම දේ කිරීමෙන් උපන් රෝගයෝ යි. **ඔපක්කමිකා** වධ බන්ධනාදී උපක්‍රමයෙන් උපන් රෝගයෝයි. **කම්ම විපාකජා** යනු බලවත් කර්ම විපාකයන්ගෙන් හටගත් රෝගයෝයි. බලවත් කර්ම විපාකයෙන් හටගත් රෝග කෙරෙයි.

සීත උණ්හං -පෙ- සම්ඵස්සා ඉති වා යනු මෙසේ හෝ මේ රෝගයන් ගැන කියනු ලැබෙති'යි නිගමනය කරමින් කියන ලදී. **කතමෙ පටිඝ්ඝනා** පරිස්සයා අප්‍රකට, වැසුණු උපද්‍රවයෝ **කතමෙ** යනු කවරහුද?යි විචාරයි. එහි **කාය දුච්චරිතං** යනු ප්‍රාණඝාත, අදින්නාදාන, මිථ්‍යාචාරී චේතනායි දැතයුතුයි. **වචී දුච්චරිතං** මුසාවාද, පිසුණාවාච, ඵරුසාවාච, සම්ඵප්පලාප චේතනා යැයි දැතයුතුයි. **මනො දුච්චරිතං** දැඩි ලෝභය, ව්‍යාපාදය, මිථ්‍යාදෘෂ්ටිය යන මොවුහු යැයි දැතයුතුයි. කයෙහි පවතින, කයින් හෝ පවත්වන දුෂ්ට චරිත හැසිරීම, කෙලෙස්වලින් කිලිටි වූ බැවින් දුෂ්ට වූ චරිතය **කාය දුච්චරිතං** නම් වේ. වචී, මනෝ දුශ්චරිතයන් පිළිබඳව ද මේ නයයි.

පතනු ලබන්නේ නුයි **කාමා** නම් වේ. පංචකාම ගුණයෝ යි. කාමයන් කෙරෙහි ඇති කැමැත්ත **කාමච්ඡන්දො** කාමච්ඡන්දයයි. පතනු ලැබේනුයි කාමයි. **කාමො** කාමයම ඡන්දය වේනුයි **කාමච්ඡන්දො**, කාමච්ඡන්දයයි. කත්තුකම්‍යතා ඡන්ද (කරනු කැමති බව, ප්‍රාර්ථනාව) සංඛ්‍යාත කුසල චේතනාව නොවේ. කාම තණ්හාව ම මෙනම් වේ.

කුසල්දහම් වළකනුයේනුයි **නීවරණං** නීවරණ නම් වේ. කාමච්ඡන්දයම නීවරණ වූයේ **කාමච්ඡන්ද නීවරණං** කාමච්ඡන්ද නීවරණ නම් වේ. සෙසු පදයන්හි අර්ථ ද මෙසේය. 'එය කරණ කොටගෙන සිත ගැහැටට පත්වෙති'යි කිලිටි බවට පත්වෙති'යි හෝ වෛර කරති'යි හෝ විනයගරුක ආචාරශීලී බව ද හිතසුව ආදිය ද නසති'යි **ව්‍යාපාද** නම් වේ. කුසල් දහම් වලක්වන්නේ නුයි **නීවරණ** නම් වේ. ව්‍යාපාදයම නීවරණ වූයේ **ව්‍යාපාද නීවරණං** ව්‍යාපාද නීවරණ නම් වේ. සිතෙහි අකර්මණ්‍ය බව, මැනි බව **ථීන** යැයි. කයෙහි අකර්මණ්‍ය බව, මැලි බව **මිද්ධ** යි. උත්සාහ නොමැති (අලස) කමින් සම්පත් විනාශ වීමයි යන අර්ථයි. ථීනයත් මිද්ධයත් එක්වූයේ **ථීනමිද්ධ** ථීනමිද්ධ නමි. එහි ථීන යනු උත්සාහ නොමැති බව ලක්ෂණකොට ඇත්තේය. වීර්ය, ප්‍රඥාව දුරුකිරීම කෘත්‍ය කොට ඇත්තේය. පසුබට වීම පච්චුපට්ඨාන (වැටහීම් කාරණ) කොට ඇත්තේ ය. මිද්ධ යනු අකර්මණ්‍ය බව ලක්ෂණකොට ඇත්තේය. පසුබැස්වීම කෘත්‍යකොට ඇත්තේය. සැඟවෙන සුලුබව (වැටහීම්) කාරණා කොට ඇත්තේය. නැතහොත් නිදිබර බව හෝ පච්චුපට්ඨාන කොට ඇත්තේය. මේ දෙකම නොඇලීම, නිදිමත, ඇලිමැලි බව ආදියෙහි අයෝනිසෝ මනසිකාර (නුනුවණින් මෙනෙහි කිරීම) පදට්ඨාන (පදනම්) කොට ඇත්තේය. විසිරුණු ස්වභාවය **උද්ධච්චං** නම් වේ. එය අසහනය ලක්ෂණකොට ඇත. සුළං ගැටී සෙළවෙන ජලය මෙන් අනවට්ඨාන නිසලව නොසිටීම ලක්ෂණකොට ඇත. සුළං ගැටීමෙන් සැලෙන පතාක මෙන් භ්‍රාන්ත වූ බව පච්චුපට්ඨාන කොට ඇත. ගල් පහරින් උඩට නැගුණු අළු මෙන් සිතෙහි නොසන්සුන් බවයි. අයෝනිසෝ මනසිකාරය පදට්ඨාන කොට ඇත. එනම් චිත්ත වික්ෂේපයැයි දතයුතුයි.

නින්දිතව කරන ලද්ද කුකත නමි. ඒ කුකත යන්නෙහි ස්වභාවය **කුකකුච්චං** කුක්කුච්ච නමි. එය පශ්චාත්තාපය ලක්ෂණකොට ඇත. කළ නොකළ දෙය (කළ අකුශල කර්ම හා නොකළ කුශල කර්මයන්) පිළිබඳව ශෝක කිරීම කෘත්‍යකොට ඇත. විපිළිසර බව පච්චුපට්ඨාන කොට ඇත. කළ නොකළ (අකුසල හා කුසල්) පදට්ඨාන කොට ඇත. උද්ධච්ච කුක්කුච්ච දෙක දාසත්වය (දාස බව) මෙනැයි ද දතයුතුයි. දුරු වූ විචිකිච්ඡාව (ප්‍රතිකාරයන් නැති බව) විචිකිච්ඡා නමි. ස්වභාවය හෝ සොයමින් 'මෙයින් ගැහැට විඳිති'යි, දුකට පත්වෙති'යි, වෙහෙසට පත්වෙති'යි **විචිකිච්ඡා** නමි. එය සැක කිරීම ලක්ෂණකොට ඇත. සංසප්පනය (ඒ මේ අත වැනෙන සුලු

බව) කෘත්‍ය කොට ඇත. නිශ්චය රහිත බව පච්චුපට්ඨාන (වැටහීම් කාරණ) කොට ඇත. නැතහොත් විචිකිච්ඡාව අනේකංසගාහය (නොයෙක්, නොයෙක් පැති ගැනීම) පච්චුපට්ඨාන කොට ඇත්තේ ය. අයෝනිසෝ මනසිකාරය (නුනුවණින් මෙනෙහි කිරීම) පදට්ඨාන කර ඇත. මෙය ප්‍රතිපත්තියට අන්තරායකර බව දතයුතුයි. රඤ්ජනය (ඇලුම් කිරීම) ලක්ෂණකොට ඇත්තේ **රාගො** රාගයයි. සිත දූෂ්‍ය කරන ලක්ෂණය ඇත්තේ **දොසො** ද්වේෂයයි. මුළාවන ලක්ෂණය ඇත්තේ **මොහො** මෝහයයි. කිපෙන ලක්ෂණය ඇත්තේ **කොධො** ක්‍රෝධයයි. නැතහොත් සැඩපරුෂ බව ලක්ෂණකොට ඇත්තේය. සිත දූෂ්‍ය කරන ලක්ෂණ ඇත්තේ, සැඩපරුෂ බව ලක්ෂණකොට ඇත්තේ ක්‍රෝධයයි. එය ආඝාතය (වෛර බැඳීම) කෘත්‍යකොට ඇත්තේය. දූෂණය පච්චුපට්ඨාන කොට ඇත්තේ ය. වෛර බැඳීම් ලක්ෂණ ඇත්තේ **උපනාහො** උපනාහ යයි. වෛරය අත්නොහැරීම කෘත්‍යකොට ඇත්තේය. ක්‍රෝධය නොසිඳී පවත්නා බව පච්චුපට්ඨාන කොට ඇත්තේය. කියන ලදමැයි. 'පුබ්බංකාලං කොධො අපරකාලං උපනාහො' (පූර්ව කාලයේ ක්‍රෝධයයි. පසුකාලයේ උපනාහ යයි.) යනාදියයි. අනුන්ගේ ගුණ මකන ලක්ෂණය ඇත්තේ **මක්ඛො** මක්ඛයයි. අනුන් ගුණ නැසීම කෘත්‍යකොට ඇත. අනුන් ගුණ වසාදැමීම පච්චුපට්ඨාන කොට ඇත. තරඟකාරී බව ලක්ෂණකොට ඇත්තේ **පළාසො** පළාසයයි. අනුන්ගේ ගුණ සමග තමාගේ ගුණ සමාන කිරීම කෘත්‍යකොට ඇත. අනුන්ගේ ගුණ ප්‍රමාණයට වඩා ඉහළින් නැගී සිටීම පච්චුපට්ඨාන කොට ඇත. අනුන්ගේ සම්පත්තීන් අඩුකොට තැකීම ලක්ෂණකොට ඇත්තේ **ඉස්සා** ඊර්ෂ්‍යාවයි. එය නො ඉවසන බව ලක්ෂණකොට ඇත. එහි නොකැමති බව කෘත්‍යකොට ඇත. ඉන් ඉවත හැරවූ මුහුණ ඇති බව (දැකීමට නොකැමති බව) පච්චුපට්ඨාන කොට ඇත. තමාගේ සම්පත් සැඟවීම ලක්ෂණකොට ඇත්තේ **මච්ඡරං** මච්ඡේරයයි. තමාගේ සම්පත්තීන් අනුන්ට ද බෙදීයාම නො ඉවසීම කෘත්‍යකොට ඇත. හැකිලීම පච්චුපට්ඨාන කොට ඇත්තේය. කළ පවු වසා දැමීම ලක්ෂණකොට ඇත්තේ **මායා** මායාවයි. එය සඟවන බව කෘත්‍යකොට ඇත. එය වසන් කිරීම පච්චුපට්ඨාන කොට ඇත. තමා තුළ අවිද්‍යමාන ගුණ ප්‍රකාශ කිරීම ලක්ෂණ කොට ඇත්තේ **සාඨෙය්‍යං** සාඨෙය්‍ය නම්. එම ගුණ මතු කොට පෙන්වීම කෘත්‍ය කොට ඇත්තේය. සිතේ උඩඟු බව ලක්ෂණකොට ඇත්තේ **ථම්භො** ථම්භයයි. නිගරු පැවැත්ම කෘත්‍ය කොට ඇත්තේ ය. අමද්දවය (දරදඬු බව) පච්චුපට්ඨාන කොට ඇත්තේය. එකටෙක කිරීම ලක්ෂණ කොට ඇත්තේ **සාරම්භො** සාරම්භයයි. විරුද්ධ බව කෘත්‍යකොට ඇත. අගෞරවය

පච්චුපට්ඨාන කොට ඇත. ඉහළට නැඹුරු වූ බව ලක්ෂණකොට ඇත්තේ **මානො** මාන යයි. එය අහංකාරය කෘත්‍ය කොට ඇත. උඩඟු බව පච්චුපට්ඨාන කොට ඇත. අතිශයින්ම ඉහළට නැඹුරු වූ බව ලක්ෂණකොට ඇත්තේ **අතිමානො** අතිමානයයි. අතිශය අහංකාරය කෘත්‍යකොට ඇත. අතිශයින්ම උඩඟු බව පච්චුපට්ඨාන කොට ඇත. මත් වූ ලක්ෂණය මදො මදයයි. මද ග්‍රහණය කෘත්‍යකොට ඇත. උමතු බව පච්චුපට්ඨාන කොට ඇත. පංචකාම ගුණයන් වෙත සිත හැරුණු බව ලක්ෂණ කොට ඇත්තේ **පමාදො** ප්‍රමාදයයි. සිත හැරීමට ඉඩදීම කෘත්‍යකොට ඇත. සිහියෙන් වෙන්වීම පච්චුපට්ඨාන කොට ඇත. මෙසේ මේ ධර්මයන්ගේ ලක්ෂණාදිය දතයුතුයි. මේ දැක්වූයේ එම පදයන්ගේ සංක්ෂිප්ත අර්ථයයි.

විස්තර වශයෙන් වනාහි 'තත්‍ථ කතමො කොධො' ආදී වශයෙන් විභංගයෙහි දැක්වූ පරිදි ම දතයුතුයි. මෙහි විශේෂ වශයෙන් - ආමිෂයට ගිජුව තමාට නොලැබී අන් කෙනෙකුට ලැබෙනවිට ලබන්නා කෙරෙහි කිපෙයි. ඔහුට එක්වරක් (පළමුවර) උපදිනුයේ **කොධං** ක්‍රෝධයයි. ඉන්පසුව උපදිනුයේ **උපනාහො** වෛරයයි. ඔහු මෙසේ කිපී වෛර බඳිනුයේ ම ලාභී වූ අන්‍යයාගේ සත්‍ය වශයෙන් ඇත්තා වූ ම ගුණ මකයි. 'මම ද ඔහු හා සමාන වෙමි'යි තරඟ කරයි. මෙය ඔහුගේ **මක්ඛා** මකු බව ද **පලාසො** තරඟකාරී බව ද වේ. ඔහු මෙසේ අනුන්ගේ ගුණ මකමින්, අනුන් වෙත තරඟකාරී වෙමින් අනුන්ගේ ලාභ සත්කාරාදියෙහි 'මොහුට මෙයින් කවර ප්‍රයෝජන ද?' යනුවෙන් ඊර්ෂ්‍යා කරයි. ද්‍රෝහ කරයි. මෙය මොහුගේ **ඉස්සා** ඊර්ෂ්‍යාවයි. ඉදින් ඔහුට කිසියම් සම්පත්තියක් වේද එහි පොදු බවක් ඔහු නො ඉවසයි ද මෙය ඔහුගේ **මච්ඡරං** මසුරුකමයි. සිවුපස ලාභ හේතුවෙන් තමා කෙරෙහි ඇත්තා වූ ද දොස් වසාලයි ද, මෙය ඔහුගේ **මායා** මායාවයි. නොමැති ගුණ ප්‍රකාශ කිරීම **සාඨෙය්‍යං** කපටි බවයි. ඔහු මෙසේ පිළිපන්නේ, ඉදින් අදහස් පරිදි සිවුපස ලාභ ලබයි ද එයින් ඵෙද්ධා දැඩි සිත් ඇත්තේ, මෘදු නොවූ සිතැත්තේ වේ. මෙය මෙසේ නොකළ යුතු යැයි අවවාද දීමට නොහැකිවන්නේ ද මෙය මොහුගේ ථම්භයයි. ඉදින් කිසිවෙක් 'මෙය මෙසේ නොකළ යුතු'යැයි කිසිවක් කියයි ද, එයින් කෝප වූ සිතැතිව බැම හකුලාගත් මුහුණෙන් 'ඔබ මගේ කවුද'යි දොස් කියයි. මෙය **සාරම්භා** එකටෙක කීමයි. මෙසේ වූ ස්ථම්භනයෙන් 'මම ම උතුම්' යැයි තමා පිළිබඳව සිතමින් මාන උපදවයි. එකටෙක කිරීමෙන් 'මොවුහු කවුරුද'යි අන්‍යයන්ට අවඥා

කෙරෙමින්, තමා උසස්කොට සළකනුයේ **අතිමානී** වේ. මෙසේ ඔහුගේ **මානො** මානය ද **අතිමානො** අතිමානය ද වේ. ඔහු මේ මාන, අතිමානයන් හේතුකොට ජාති මද ආදී අනේකවිධ වූ මද උපදවයි. මත් වූයේ ම පංචකාම ගුණාදී භේද ඇති කාම වස්තූන්හි පමා වේ. මෙය ඔහුගේ **මදො** මදයත්, **පමාදො** ප්‍රමාදයත් ලෙස දතයුතුයි.

සබ්බෙ කිලෙසා යනු සියලුම ක්ලේශ ධර්මයෝ තැවීම් අරුතින් ද බාධා කිරීම් අරුතින් ද කෙලෙස්වලින් කිලිටි වූ බැවින් **දුච්චරිතා** දුශ්චරිත නම් වෙති. 'කෙලෙස් දාහය ඇති කරති'යි යන අරුතින් **දරථා** දරථ නම් වෙති. ඇතුලත දැවීම් ආදිය කිරීම් අර්ථයෙන් **පරිදාහා** පරිදාහ නම් වෙති. සන්තාප, සිත්තැවුල් ඇතිකරන අරුතින් **සන්තාපා** සන්තාප නම් වෙති. 'අකුසල වශයෙන් හටගත්හ'යි යන අර්ථයෙන් ද අභිසංඛාරණාර්ථයෙන් ද **සබ්බෙ අකුසලාභිසංඛාරා** සියල්ලෝම අකුසලාභිසංඛාර නම් වෙතියි යන අර්ථයි. **කෙනඤ්ඡන** යනු කවර අරුතකින් ද අභිභවනාදී ත්‍රිවිධ අර්ථ දැක්වීම පිණිස 'පරිසහනති ති පරිසස්සයා' (ඉවසති'යි, විඳිති'යි පරිස්සය නම් වෙති) යන ආදිය කීහු.

පරිසහනති යනු දුක් උපදවතියි, අභිභවනය කරති. **පරිහාණාය සංවත්තනති** කුසල් දහම් අත්හැරීම පිණිස හේතු වේ. **තත්‍රාසයා** යනු ඒ ශරීරයෙහි අකුසල් දහම් පවතියි. වෙසෙයි. උපදියි යන අර්ථයි. **තෙ පරිස්සයා** යනු කාය දුශ්චරිතාදී උපද්‍රවයෝ යි. **කුසලානං ධම්මානං අනතරායාය** යනු ධාතු කිවයුතු සම්‍යක් ප්‍රතිපදා දී කුශල ස්වභාවයෙන් හටගත් ධර්මයන්ගේ අතුරුදහන්වීම පිණිස, නොපෙනී යෑම පිණිස පවතිත්. **සම්මා පටිපදාය** යනු සුන්දර වූ, ප්‍රශස්ත වූ, ප්‍රතිපදාවෙනි, මිථ්‍යා (වැරදි) පිළිවෙතින් නොවේ. **අනුලෝම පටිපදාය** යනු විරුද්ධ නොවූ ප්‍රතිපදාවෙනි. ප්‍රතිලෝම වූ ප්‍රතිපදාවෙන් නොවේ. **අපච්චනික පටිපදාය** යනු විරුද්ධ නොවූ සතුරු නොවූ ප්‍රතිපදාවෙනි.

අනවඤ්ඤ පටිපදාය අර්ථයට (වෘද්ධියට, වැඩීමට) අනුගත වූ ප්‍රතිපදාවෙනි. මතු මත්තෙහි වඩනා ලද ප්‍රතිපදාවෙනි. යම්සේ අර්ථය (වෘද්ධිය) වේද එසේ පිළිපැදිය යුතු ප්‍රතිපදාව (වුත්තං හොති) කී නියායයි. **අත්තඤ්ඤපටිපදාය** ආත්මාර්ථය (තමාගේ අභිවෘද්ධිය පිණිස) යන පාඨය ද පෙළෙහි එයි. එය අසුන්දරය. **ධම්මානුධම්ම පටිපදාය** යනු ධර්මය නම් නවලෝකෝත්තර ශ්‍රී සද්ධර්මයයි. අනුධර්ම නම් විදර්ශනාදී ඒ ධර්මයට

අනුරූප ප්‍රතිපදාවයි. අනුධර්ම ප්‍රතිපදාවයි. ඒ ධර්මානුධර්ම ප්‍රතිපදාව පිණිසයි.

සීලෙසු පරිපූරකාරිතාය යනු ප්‍රාතිමෝක්ෂ ශීලයෙහි පරිපූර්ණ කොට සිටීම පිණිස, **ඉන්ද්‍රියෙසු ගුත්තද්වාරතාය** යනු 'ඇසින් රූප දැක' ආදී වශයෙන් කියන ලද මනස සයවැනි කොට ඇති ඉන්ද්‍රියයන්හි මනාසේ රක්නා ලද ද්වාර ඇති බව පිණිස, **භොජනෙ මත්තඤ්ඤුතාය** ප්‍රතිග්‍රහණාදියෙහි ප්‍රමාණයෙන් යුතු බැවින් අලංසාටකාදී (බමුණු) ක්‍රියාවලින් වෙන්ව, පමණ දත් බොජුන් ඇති බව පිණිස, **ජාගරියානුයොගස්ස** යනු දවස තුළ සක්මනින් හා හිඳීමෙන් (වැලැක්විය යුතු ක්ලේශ ධර්මයන්ගෙන්) යන ආදී නයින් සද්ධින්ද්‍රියාදී පස්වැදෑරුම් පංච ජාගරණ ධර්මයන්හි සාවධානව යෙදුණහුට,

සතිසම්පජඤ්ඤස්ස සියලු කමටහන් භාවනාවන්හි අනුයුක්ත (සාවධානව යෙදුණා) වූ සියලු යෝගීන්ට සියලු කල්හි උපකාරී වූ සති සම්පජඤ්ඤයෙහි (සිහි ඇති බවෙහි) **සතිපට්ඨානානං** යනු ආරම්මණයන්හි බැස එළඹ සිටින හෙයින් 'පට්ඨාන' නම්. සතිය ම පට්ඨාන වූයේ 'සතිපට්ඨානං'. සතිපට්ඨාන නම්. කාය, වේදනා, චිත්ත, ධම්ම යන සිහි මගින් අශුභ, දුඃඛ, අනිත්‍ය, අනාත්ම යන සිවු ආකාරයන් ප්‍රහාණය කිරීම් වශයෙන් ශුභ, සුඛ, නිත්‍ය, ආත්ම සංඥාවන්ගේ ප්‍රහාණ කෘත්‍යය සාධනය කිරීම් වශයෙන් පවත්නා හෙයින් සිවු අයුරකින් ප්‍රභේද වේ. ඒ සතර සතිපට්ඨානයන්ගේ **චතුනනං සම්මප්පධානානං** යනු ස්ථිර ලෙස පිහිටුවති. මෙයින් ප්‍රමුඛ වේනුයි, ශෝභන වූ ප්‍රධන් වීර්යය සම්‍යක් ප්‍රධානයයි. මෙය කරණකොට වීර්ය කරත්නුයි 'පධාන' නම්. ශෝභන වූ පධානය සම්මප්පධාන යයි. මෙය කරණ කොට මනාසේ වීර්ය කෙරෙත්නුයි හෝ සම්මප්පධාන නම්. ශෝභන වූ ඒ (ප්‍රධාන වීර්යය) කෙලෙසුන්ගෙන් විරූපත්වයට පත්ව වසන්නහුට ප්‍රධාන වශයෙන් හිතසුව නිපදවන බැවින් ශ්‍රේෂ්ඨ භාවය ගෙනදීම් වශයෙන් ද ප්‍රමුඛත්වය ඇති කරන හෙයින් ද සම්මප්පධාන නම් වේ. මෙය වීර්යයට අධිවචනයකි. (සමානාර්ථවත් පදයකි.) පිළිවෙලින් උපන් නූපන් හා නූපන්-උපන් වශයෙන් සතරක් වූ අකුශල හා කුශලයන්ගේ ප්‍රහාණය අනුත්පාදය (නො ඉපදවීම) උත්පාදය (ඉපැදවීම) ස්ථිතිය (පැවැත්ම) යන සතරවැදෑරුම් කෘත්‍යයන් සාධනය කිරීම් වශයෙන් පවත්නා හෙයින් ප්‍රධාන වීර්යය පිළිබඳ ප්‍රභේදය සතර ආකාර වේ. එම සතර සම්‍යක් ප්‍රධානයන්ගේ ය.

චතුන්නං ඉද්ධිපාදානං යනු මෙහි ඡන්ද වීර්ය චිත්ත වීමංස යන මොවුන් අතුරෙන් එක් එක් ධර්මයක් සිද්ධ වේනුයි **ඉද්ධි** ඉද්ධි නම්. 'සමෘද්ධ වෙති'යි 'නිපදවෙති'යි යන අර්ථයි. නැතිනම් සමෘද්ධ වේනුයි හෝ මෙය කරණකොට සත්ත්වයන් සමෘද්ධ වූවත්, වූද්ධියට පත්වූවත්, උසස් බවට පත්වූවන් වෙති'යි හෝ 'ඉද්ධි' නම්. පළමු අර්ථයෙන් ඉද්ධි වූයේ ම පාද ද වේනුයි ඉද්ධිපාද නම්. සෘද්ධි කොට්ඨාසයේ යන අරුති. දෙවැනි අර්ථයෙන් සෘද්ධියට පාද වනුයේනුයි 'ඉද්ධිපාද' නම්. පාද යනු ප්‍රතිෂ්ඨාවයි. (පිහිටයි.) අධිගම උපායයි යන අර්ථයි. එහෙයින් මනාව මතු මතුයෙහි විශේෂ සංඛ්‍යාත සෘද්ධීන් උපදවති'යි, සෘද්ධීනට පැමිණෙති'යි යන අරුතින් 'පාද' යැයි කියනු ලැබේ. ඒ සතර සෘද්ධිපාදයන්ගේ ය.

සත්තන්නං බොජ්ඣංගානං යනු චතුස්සත්‍යාවබෝධයෙහි හෝ එම අවබෝධය සඳහා වීර්ය වඩන්නාගේ අංගයයි. කියන ලද මැයි. 'සා එසා ධම්ම සාමග්ගි.....බොධීති වුච්චති' (යනුවෙන් ක්‍රියා කාරක සම්බන්ධය වේ.) කවරාකාර සාමග්‍රීතාවයක් ද යත්, ලෝකෝත්තර මාර්ගක්ෂණයෙහි දී උපදින, සැඟවුණ උද්ධච්චය තුළ පිහිටීම හා රැස්කිරීම සිදුවන කාමසුඛ-අත්තකිලමථයන් සමග අනුයෝගය (යෙදීම) උච්ඡේද-ශාස්වත දෘෂ්ඨීනට පිවිසීම ආදී නොයෙක් උපද්‍රවයනට ප්‍රතිපක්ෂ වූ, සති-ධම්මවිචය-විරිය-පීති-පස්සද්ධි-සමාධි-උපෙක්ඛා යන ධර්මයන්ගේ යම් සාමග්‍රියක් (එක්වීමක්) විසින් ආර්ය ශ්‍රාවක තෙමේ බෝධනය කරනු ලැබේ යැයි සලකා බෝධි යැයි වහරනු ලැබේ ද, යම් සාමග්‍රියක් කරණකොට ක්ලේශ පරම්පරා නමැති නිද්‍රාවෙන් නැගී සිටී ද චතුරාර්ය සත්‍යයක් හෝ ප්‍රතිවේධ කෙරේ ද නිවනම හෝ ප්‍රත්‍යක්ෂ කෙරේ ද එම ධර්ම සාමග්‍රී සංඛ්‍යාත වූ බෝධියෙහි අංගයන් වෙතැයි ද බොජ්ඣංග නම් වෙති. ඣානංග මග්ගංග ආදිය මෙනි. තවද මේ ආර්ය ශ්‍රාවක තෙමේ කියන ලද ප්‍රකාර ඇති මේ ධර්ම සාමග්‍රිය විසින් බෝධනය කරනු ලැබෙයැයි සලකා 'බෝධි' යැයි වහරනු ලැබේ ද ඔහුගේ අංගයන් වෙති'යි බොජ්ඣංග නම් වෙති. සේනංග ආදිය මෙනි. එහෙයින් අටුවාචාරීහු මෙසේ කීහ. 'අවබෝධ කරගත් පුද්ගලයාගේ අංග වෙතැයි හෝ බොජ්ඣංග නමි' යනුවෙනි. ඒ සත්ත බොජ්ඣංගයන්ගේයි. **අරියස්ස අට්ඨංගික මග්ගස්ස** යන මෙහි අරිය යනු ඒ ඒ මාර්ගයෙන් නැසිය යුතු කෙලෙසුන් කෙරෙන් දුරු වූ බැවින් ද ආර්යභාවය ඇතිකරන බැවින් ද ආර්යඵල ප්‍රතිලාභය කරන බැවින් ද 'ආර්ය' යැයි කියනු ලැබේ. එහි අංග අටක් ඇත්තේනුයි අට්ඨංගික නම්. එය චතුරංග සේනාව මෙන් ද

පංචගික තූර්ය මෙන් ද අංග මාත්‍රයක් ම වේ. අංග විනිර්මුක්ත වූවක් නොමැත. 'නිවන සොයති'යි, 'කෙලෙසුන් ද නසමින් යෙති'යි යන අරුතින් මග්ග නම්. ඒ ආර්ය අෂ්ඨාංගික මාර්ගය පිළිබඳ භාවනාවෙහි යෙදුණහුට (වඩන්නාට) **ඉමෙසං කුසලානං ධම්මානං** යනු ඉහත දක්වන ලද ලෝකෝත්තර කුසල ධර්මයන්ගේයි. **අනන්තරායාය** යනු ලෝකෝත්තර ධර්මයන්ගේ අන්තරාය පිණිසය. අතුරුදහන් වීම පිණිසය. ලෞකික ලෝකෝත්තර ධර්මයන්ගේ අත්හැරීම පිණිසය. ඒ දෙක අතුරින් ලෝකෝත්තර ධර්මයන්ට ඉපදීමට නොදෙන අර්ථයෙන් **පරිසඝයා** පරිස්සය නම්. ඔවුහු වනාහි නිරුද්ධ වෙමින් උපද්‍රව ගෙන දෙති.

එහි **තෙ** යනු ඒ ආත්මභාවයෙහි මේ, **පාපකා** ළාමක පාපධර්මයෝයි. **අත්තභාව සනනිසඝයා** යනු ආත්මභාවය ඇසුරු කරමින්, එය අරමුණු කොට උපදිතියි එනම් වේ. ඇතැමෙක් 'පරිසඝය' යැයි කියති. **චුත්තං හෙත්තං** යනු මෙය කියන ලදැයි යන අරුති. **සාන්තෙත වාසිකො** යනු 'අන්තේවාසික' යැයි කියන ලද කෙලෙසුන් සමග එක්ව වසති'යි යන අරුතින් 'සාන්තේවාසික' නම් වේ. සමුදාචරණ යැයි කියන ලද කෙලෙසුන් සමග එක්ව වසති යි යන අරුතින් **සාචරියකො** සාචරියක නම්. (ඇතුලත වසති'යි යන අරුතින් සාන්තේවාසික නම්. සිත ඇතුලත ශිෂ්‍යයකු මෙන් ඇවතුම් පැවතුම් ඇතිව, දුබලව පවතින කෙලෙස් අන්තේවාසික නම්. සමුදාචරණ - සං+උද්+ආ+චර ධාතුවයි. සමුදාචරණ යනු ප්‍රබලව, උසස් ලෙස පෙළඹීමයි. ආචාර්යවරයාගේ මෙන් පැවතුම් ඇතිව, පහසුවෙන් තමා යටත්කර ගැනීමට සමත් කෙලෙස්.)

චක්ඛුනා රූපං දිසවා යනු චක්ඛු විඤ්ඤාණයෙන් රූප දැක, මතු කියනු ලබන **සොතෙනසද්දං සුත්වා** යනාදියෙහි ද මේ ක්‍රමයම වේ. **උප්පජ්ජන්ති** යනු මනාකොට, උසස්ව හැසිරෙති. **සරසංකප්පා** යනු නානාවිධ අරමුණු කෙරෙහි හැසිරීම් වශයෙන් උපදින පරිකල්පනයි. **සඤ්ඤාජනීයා** යනු අරමුණු බවට පත් වූ සංයෝජනයන්ගේ සංවර්ධනයෙන්, සංයෝජනයන්ට හිත වූ **ත්‍යාසසා** යනු (තෙ+අසස) යනු ඒ පවිටු කෙලෙස්හු මේ පුද්ගලයාගේ **අනෙතාවසනති** යනු අභ්‍යන්තරයෙහි (සිතේ) වාසය කරති. **අඤ්ඤාසස වසනති** යනු සන්තානයට පිවිස, බොහෝසෙයින් ලුහුබැඳ වෙසෙති. එහෙයින් මේ අකුසල ධර්මයෝ එම පුද්ගලයා **සමුදාචරන්ති** යනු බලවත්ව හසුරුවති. ඔහු කෙරෙහි ප්‍රබල ලෙස පවතිති'යි යන අර්ථයි.

කිළිටි කරන අර්ථයෙන් **මලා** මලනම් වෙති. සතුරුය යන අර්ථයෙන් **අමිත්තා** අමිත්ත නම් වෙති. වෛරී අර්ථයෙන් **සපත්තා** සපත්ත නම් වෙති. නැසීමේ අර්ථයෙන් **වධකා** වධක නම් වෙති. පසමිතුරු අර්ථයෙන් **පච්චත්ථිකා** පච්චත්ථික නම් වෙති. නැතහොත් **මලා** යනු සූර්යයාට උපක්ලේශ වූ වලාකුළු මෙනි. **අමිත්තා** යනු සූර්යයාට දුම මෙනි. **සපත්තා** යනු සූර්යයාට පොළව මෙනි. **වධකා** යනු සූර්යයාට දූවිලි මෙනි. **පච්චත්ථිකා** යනු සූර්යයාට රාහු මෙනි. **මලා** යනු රන්වල මළ බැඳීම මෙන් සිතේ ප්‍රභාව නසන්නාහුය. **අමිත්තා** යනු යකඩ මළ මෙන් සිතේ සිනිඳු බව නසන්නාහුය. **සපත්තා** යනු මුහුණට මුහුණ දී යුධ කරන සතුරන් මෙන් සිතේ පිහිටි ධර්මයන් නසන්නාහුය. **වධකා** යනු මනුෂ්‍ය ඝාතකයන් මෙන් ධර්මය නසන්නාහුය. පච්චත්ථිකා යනු ජීවග්‍රහයෙන් අල්වාගන්නා ලද රජෙකුගේ විනාශය මෙන් මෝක්ෂ මාර්ගය වළකන්නාහුය' යනුවෙන් ඇතැමෙක් විවරණ කරති.

අනත්ථජනනෝ යනු අර්ථය නොවූයේ අනර්ථයයි. ඒ අනර්ථය උපදවන්නේය යන අරුතින් අනත්ථජනනා නම්. **කොධෝ** ක්‍රෝධයයි. **ලොභෝ චිත්තපපකොපනෝ** යනු සිත අවුස්වන, සසල කරන, කුසල් වළක්වා සිත අවහිර කරතියි යන අර්ථයයි. **භය මනන්තරතෝ ජාතං** යනු අභ්‍යන්තරයෙහි තමාගේ සිත තුළ ම උපදින, අනර්ථය ජනනය කිරීම් ආදී භයට හේතු වූ උපද්‍රවයෝ යි. **තං ජනෝ නාව බුජ්ඣතී** යනු අඥාන වූ මහජනයා ඒ උවදුරු හැඳිනගෙන එතෙරවීමට නොදනිති. **අත්ථං** යනු කුපිත වූ පුද්ගලයා ලෞකික වූ ද ලෝකෝත්තර වූ ද හිතවැඩ නොදනියි. **ධම්මං** යනු අර්ථයට හේතුවයි. **අන්ධතමං** යනු ඝන අන්ධකාරයයි.

යං යනු යම්හෙයකින්, නොහොත් යම් මිනිසෙක්, **සහතෙ** යනු අභිභවනය කරයි. **අජ්ඣත්තං** යනු ස්වකීය සන්තානයෙහි **උපපජ්ජමානා උපපජ්ජන්ති** යනු පූර්වාන්තයෙන් මතු වී උපදනාහ. අහිත පිණිස, දුක් පිණිස උපදිති. ඒ දෙකින්ම සැපයෙන් තොර විහරණය අදහස් වේ. **අහිතාය** යනු චෛතසික වශයෙන් දුක් බව පිණිස ය. **දුක්ඛාය** යනු කායික වශයෙන් දුක් බව පිණිස ය. **අඵාසුවිහාරාය** ඒ දෙකින් ම අපහසු විහරණය පිණිසය. නැතහොත් **උපපජ්ජමානා උපපජ්ජන්ති** යනු භවංග චලනයේ සිට ඔත්තප්පනය දක්වා වූ චිත්ත ක්ෂණ, 'උපපජ්ජමාන' නමි. 'ඔත්තප්පනයට පැමිණ නොනවත්නා බැවින් උපපජ්ජන්ති නම් වෙති'යි ඇතැමෙක් අර්ථ වර්ණනා කරති.

තචසාරං ච සංඵලං තමාගේ ම ඵලයෙන් නැසුණා වූ උණ ගස මෙනි. **අරති** යනු කුසල් දහම්හි කළකිරුණු බවයි. **රතී** යනු පස්කම් ගුණයෙහි විශේෂ ඇල්ම (දැඩි ඇල්ම)යි. **ලොමහංසො** යනු කටුවක් මෙන් උඩුකුරුව නැමුණ රෝමයි. **ඉතො නිදානා** යනු 'මේ ආත්මභාවය මොවුනට නිදාන වෙති'යි, ප්‍රත්‍ය වෙතියි ඉතෝනිදාන නම් වෙති. **ඉතො ජාතා** යනු මේ ආත්මභාවයෙන් උපන්නාහු යි. **ඉතො සමුට්ඨාය මනො චිතක්කා** යනු යම්සේ දිග නූලකින් පය බැඳි කපුටෙකු දරුවෝ ඒ නූලේ කෙළවර ඇඟිල්ලේ වෙළාගෙන අත්හරින් ද, කපුටා ඉතා දුර ගොස් පවා නැවත දරුවන්ගේ පාමුලම වැටේ ද එමෙන් ම මේ ආත්මභාවයෙන් නැගී පාප විතර්කයෝ සිත හැර යති. **සත්තෙවාසිකො** යනුවෙන් දක්වන ලද පළමු සූත්‍රය කෙලෙසුන් සමග එක්ව විසීම සඳහා කියන ලදී. **තයො මෙ භික්ඛවෙ අනතරා මලා** යනුවෙන් දක්වන ලද 'මහණෙනි, ඇතුලතින් කිලිටි වීම් තුනෙකි' යන දෙවන සූත්‍රය කුසල්දහම් කිළිටි කිරීම් වශයෙන් ද අර්ථය හා අනර්ථයන් (වැඩ අවැඩ) නොදැනීම් වශයෙන් ද **තයො ඛො මහාරාජ පුරිසස්ස ධම්මා අජ්ඣත්තං උපපජ්ජමානා** යනුවෙන් (මහරජ, ධර්මත්‍රයක් පුරුෂයාගේ අභ්‍යන්තරයෙහි උපදනාහු) දක්වන ලද තුන්වැනි සූත්‍රය තමාගේ ආශ්‍රය නැසීම් වශයෙන් ද **රාගො ච දොසොච ඉතො නිදානා** යනුවෙන් (රාගය ද ද්වේෂය ද මේ ආත්මභාවය නිදානකොට ඇත්තාහුය.) දක්වන ලද සිවුවන සූත්‍රය කෙලෙසුන්ගේ ප්‍රතිෂ්ඨාව (පදනම) දැක්වීම් වශයෙන් ද කියන ලදැයි දතයුතුයි. **තතො පරිස්සයතො** යනු ඒ උපද්‍රව හේතුවෙන්, **තං පුග්ගලං** යනු කියන ලද ආකාරයෙන් කෙලෙසුන්ගෙන් පිරි පුද්ගලයායි. **දුක්ඛං අන්වෙති** යනු දුක පසුපස ගමන් කරයි. මව පසුපස යන කිරි දරුවකු මෙනි. **අනුගච්ඡති** යනු වධයට පැමිණියකු (සොරෙකු) කරා යන වධකයකු මෙන් සමීපයට යයි. **අඤ්ඤායිකං හොති** යනු පැමිණියේ වේ. හිස ගසාදමන දංගෙඩිය ලඟට මෙන් දුක සමීපයට පැමිණේ. **ජාති දුක්ඛං** යන මෙහි ජාති ශබ්දයෙහි අනේක අර්ථයෝ දක්වන ලදහ.

කෙසේද යත්:-

භවො කුලං නිකායො ච සීලං පඤ්ඤත්ති ලක්ඛණං
පසූති සන්ධි චෙවාති ජාති අට්ඨා පවෙදිතා

ජාති යන්නෙහි භවය, කුලය, නිකායය, සීලය, පඤ්ඤත්තිය, ලක්ඛණය, ප්‍රසූතිය, සන්ධියයි යන අර්ථයෝ දක්වන ලදහ.

ඒ එසේමැයි. 'එකම්පි ජාති ද්වෙපි ජාතියෝ' (එක් ආත්මභාවයක් ද ආත්මභාව දෙකක්දැයි) යනාදියෙහි භවය යන අර්ථයයි. 'අකඛිත්තෙනා අනුපකකුට්ඨෝ ජාතිවාදෙන' (කුලවාදය හේතුකොට බැහැර කරන ලද්දේ, හෙළා දකින ලද්දේ නොවේ.) යන තැන්හි කුලය යන අර්ථයයි. 'අත්ථිවිසාඛෙ නිගණ්ඨා නාම සමණ ජාති' (විශාඛාවෙනි. නිඝණ්ඨ නම් ශ්‍රමණ ජාතියක් ඇත.) යන තැන්හි නිකාය යන අර්ථයයි. 'යතෝ'හං භගිනි, අරියාය ජාතියා ජාතෝ නාභිජානාමි' (නැගනියනි, මා ආර්ය ජාතියෙහි උපන් තැන් පටන්) යන තැන්හි ආර්ය ශීලය යන අර්ථයයි. 'තිරියා නාම තිණ ජාති නාභියා උගඝනත්ථා නභං ආහච්ච ඨිතා අහොසි' (තිරියා නම් තෘණ වර්ගය නාභි ප්‍රමාණයෙන් ඉහළට නැග අහස වසා සිටියේ විය.) යන මෙහි ව්‍යවහාරය යන අර්ථයයි. 'ජාති ද්වීහි ඛන්ධෙහි සංගහීතා' (හටගැනීම ස්කන්ධ දෙකකින් සංගෘහීත වේ.) යන මෙහි සංඛත ලක්ෂණයයි. 'සම්පති ජාතෝ ආනන්ද බොධිසත්තෝ (ආනන්දය, උපන් කෙණෙහි ම බෝධිසත්ව තෙමේ) යන මෙහි ප්‍රසූති අර්ථයයි. 'භව පච්චයා ජාති', 'ජාතිපි දුක්ඛාති' (භවය හේතු කොට ඉපදීම වේ. 'ඉපදීම ද දුකකි.) යන තැන්හි පර්යාය (සම්මුති) වශයෙන් පටිසන්ධි ක්ෂණය අදහස් වේ. නිෂ්පරියාය (පරමාර්ථ) වශයෙන් ඒ ඒ තැන උපදින සත්ත්වයන්ගේ යම් යම් ස්කන්ධයෝ පහළ වෙත් ද ඒ ස්කන්ධයන්ගේ පළමු පහළවීමයි.

මේ ජාතිය (ඉපදීම) දුකක් වනුයේ කවර හෙයින් ද? නොයෙක් ආකාර දුක්ඛයනට වස්තු වූ හෙයිනි. දුක් වනාහි බොහෝ ය. ඒ කෙසේද යත්, දුක්ඛ දුක්ඛය, විපරිණාම දුක්ඛය, සංඛාර දුක්ඛය, පටිච්ඡන්න දුක්ඛය, අපටිච්ඡන්න දුක්ඛය, පරියාය දුක්ඛය, නිෂ්පරියාය දුක්ඛය යනුවෙනි. මෙහි කායික චෛතසික දුක්ඛය වේදනා ස්වභාව වශයෙන් ද නාම වශයෙන් ද දුක් බැවින් 'දුක්ඛ දුක්ඛ' යැයි කියනු ලැබේ. සුඛ වේදනාව, විපරිණාමයෙහිදී දුක්ඛ උත්පත්තියට හේතුවන බැවින් 'විපරිණාම දුක්ඛ' යැයි ද උපේක්ෂා වේදනාව අවශේෂ වූ ත්‍රෛභූමික සංඛාරයෝ ද ඇතිවීම හා නැතිවීමෙන් දැඩිසේ පෙළුණු බැවින් සංඛාර දුක්ඛ යැයි ද කියනු ලැබේ. කන් කැක්කුම, දත් කැක්කුම, රාගයෙන් උපන් පරිදාහය, ද්වේෂ මෝහ යන දෙකින් උපන් පරිදාහය යන කායික චෛතසික ආබාධ විචාරා දතයුතු වන බැවින් ද, උපක්‍රමයෙන් අප්‍රකටව පවත්නා බැවින් ද පටිච්ඡන්න (සැඟවුණු) දුක් වේ. දෙතිස් වධ බන්ධණ ආදියෙන් හටගත් ආබාධ නොවිචාරාම දත හැකි බැවින් ද, උපක්‍රමයන් ප්‍රකටව පවත්නා බැවින් ද අප්පටිච්ඡන්න (නො සැඟවුණු) දුක් වේ. දුක්ඛ දුක්ඛය හැර

සෙසු දුක් සච්ච විභංගයෙහි (ඇතුලත්ව) ආයේය. ජාති ආදී සියල්ල ම ඒ ඒ දුක්ඛයට වස්තු වන බැවින් පර්යාය (අනියත) දුක්ඛයකි. දුක්ඛ දුක්ඛය නිෂ්පරියාය (නියත) දුක්ඛයකි.

මෙහි මේ ජාති හෙවත් ඉපදීම, බාල පණ්ඩිත ආදී සූත්‍රයන්හි දී භාග්‍යවතුන් වහන්සේ විසින් ද උපමා වශයෙන් දෙසන ලද යම් අපා දුකක් වේද, තවද, 'සුගති' යැයි කියනු ලබන මිනිස්ලොව ද ගැබ පිළිසිඳ ගැනීම් ආදිය මුල්කරගත් යම් දුකක් උපදී ද එයට වස්තූන් විද්‍යමාන වන හෙයින් දුක්ඛ නම් වේ. එහි ගබ්හොක්කන්ති (මවුකුස පිළිසිඳීම්) ආදිය මුල්කොට ඇතිවන දුක් මෙසේ යි. 'මේ සත්ත්වයා මවුකුස පිළිසිඳ ගනුයේ උපුල්, රත් පියුම්, හෙළ පියුම් ආදියෙහි නූපදියි. ආමාශයට යටින් ද පක්වාශයට උඩින්ද උදර පටලයට හා කොඳු ඇටයටත් දෙකට මැදි වූ, අතිශයින් බාධා සහිත වූ ඝන අන්ධකාර ඇති නානාප්‍රකාර කුණපවලින් පිරි අතිශයින් දුගඳ හමන, ඉතාමත් පිළිකුල් කටයුතු වූ කුස් පෙදෙස්හි කුණු වූ මසකු තුළ, පිළුණු කොමු පිඩක්ව (පිට්ටුවක්) තුළ, ගවරවළ ආදිය තුළ උපදින පණුවකු මෙන් උපදියි. එහි උපන් ඒ (සත්ත්ව) තෙමේ දසමසක් මවුකුස හටගන්නා උණුසුමින් තැම්බුම් උන්නක් මෙන් පැසෙමින්, පිටි පිඩක් (පිට්ටුවක්) මෙන් හුමාලයෙන් තෙත්වෙමින්, අත්පා හැකිලීම්, දිගහැරීම් ආදියෙන් තොරව අතිශයින් දුක් විඳියි. මෙය **ගබ්භොක්කන්ති මූලකං දුක්ඛං** ගබ්හොක්කන්තිය මුල්කොට ඇතිවන දුක නම්.

ඒ සත්ත්ව තෙමේ මව වහා ඇකිලීම්, පැකිලීම්, ගමන් කිරීම්, හිඳගැනීම් නැගිටීම්, පෙරලීම් ආදිය කරනවිට, සුරාසොඬෙකුට හසු වූ එළු පැටවකු මෙන් ද අහිකුණ්ටිකයකු අතට පත් නයි පැටවකු මෙන් ද ඉදිරියට පසුපසට ඇදීම්, උඩු අතට - යටි අතට ගැස්සීම් ආදී උපක්‍රමයන්ගෙන් අධිමාත්‍ර වූ යම් දුකක් අනුභව කරයි ද එසේම මව ශීතල දිය පානය කරන කල්හි සීත නිරයේ උපන්නෙකු මෙන් ද, උණු කැඳබත් ආදියක් අනුභව කරන කල්හි අඟුරු වැස්සකට හසුවූවකු මෙන් ද ලුණු ඇඹුල් ආදිය අනුභව කරන කල්හි සිරුර තීරු තීරු කොටපළා (කේදිලා) කාඩි ගැල්වීම වැනි වධයට පත්වූවකු සෙයින් ද, තියුණු දුක් අනුභව කරයි ද, මෙය **ගබ්භ පරිහරණමූලකං දුක්ඛං** යනු ගැබ් පරිහරණය මුල්කොට ඇති දුකයි.

යම්හෙයකින් මව මූඪගර්භ (ගබ්සා) ඇත්තියක් වුවහොත්, මිතුරන්, ලැදියන්, හිතවතුන් ආදීන් විසිනුදු දැකිය නොහැකි තරම් දුක් ඉපදීමට හේතු වූ කැපුම් පැළුම් ආදියෙන් යම් දුකක් උපදී ද, මෙය **ගබ්භවිපත්තිමූලක** (ගැබ විනාශවීමෙන් ඇතිවන) දුකයි. ප්‍රසූති කාලයෙහි දී මවගේ කර්මජ වාතයෙන් පෙරලී අවුත් නරක ප්‍රපාතයක් වැනි අතිභයානක වූ යෝනි මාර්ගයට පිවිසවනු ලබනවිට ද අතිශය සම්බාධ සහිත වූ යෝනි මුඛයෙන් පිටතට නෙරපවනු ලබන විට ද යතුරු සිදුරකින් නික්මවනු ලබන මහ ඇතෙකුට මෙන් ද සංඝාත නිරයේ පර්වතවලින් සුණුවිසුණු කරන ලද නිරි සතෙකුට මෙන් ද යම් දුකක් උපදී ද, මෙය **විජයානමූලකං දුක්ඛං** වැදීම මුල්කර ගත් දුකයි.

අලුත් වණයක් බඳු සුකුමාර ශරීරයක් ඇතිව උපන්නහුට අතින් අතට ගැනීම්, නැහැවීම්, සේදීම්, රෙදිවලින් පිරිමැදීම් ආදිය කරනවිට හිදි තුඩු දැලිපිහි තල ආදියෙන් විඳීම්-පැළීම් ආදිය කරනවිට මෙන් යම් දුකක් විඳියි ද මෙය මවුකුසින් **බහිනික්ඛමනමූලකං දුක්ඛං** පිටතට නික්මෙනවිට ඇතිවන දුකයි.

ඉන්පසු දිවිපැවැත්මෙහිදී තමා විසින් ම තමාට වධ දී ගැනීමෙන් අචේලක (නිගණ්ඨ) ව්‍රත ආදියෙන් ඇතුළතින්-පිටතින් සිරුර තවා ගන්නා විට ද ක්‍රෝධ වශයෙන් (තරහ වී) ආහාර නොගෙන සිටිනවිටද (සිරුර විද කොකුවලින්) එල්බ සිටිනවිට ද යම් දුකක් උපදී ද, මේ **අත්තූපක්කම මූලකං දුක්ඛං** තමාගේ ම උපක්‍රම මුල්කොට උපන් දුකයි. අනුන්ගේ වධබන්ධන විඳින්නාට යම් දුකක් උපදියි ද, මේ **පරූපක්කම මූලකං දුක්ඛං** අනුන්ගේ උපක්‍රම මුල්කොට ඇතිවන දුකයි. මෙසේ දැක්වූ සියලුම දුක්ඛයන්ට මෙලොව උපතම (ජාති) වස්තු වේ. මෙය **ජාති දුක්ඛං** ඉපදීමේ දුක නම්.

ජරා දුක්ඛං ජරාව දෙවැදෑරුම් වේ. සංඛත ලක්ෂණ වශයෙන් හා කැඩීම් වැටීම් ආදී වශයෙන් සම්මත වූ පැවැත්මෙහි එකම භවයකට අයත් වූ ස්කන්ධයන්ගේ දිරායෑම, පැරණිවීම වශයෙනි. මෙහිලා දෙවැනි කරුණ අභිප්‍රේතයි. (අදහස් වේ.) සංඛාර දුක් ඇතිකරන බැවින් මෙන් ම දුකට වස්තුවන බැවින් ද ඒ මේ ජරාව (දිරායෑම) දුකක්මය. අඟපසඟ ලිහිල්වීම, ඉඳුරන් විකෘති වීම, විරූපී බව, යොවුන් බව නැසීම, වීර්යය හීන වීම, සිහිකල්පනා නැතිකරන, අනුන්ගේ රොස් පරොස් ඇසීම් ආදී අනේකප්‍රකාර

වූ හේතු නිසා කායික චෛතසික වූ යම් දුකක් වේද, එයට ආධාර (වස්තු) වනුයේ ජරාවයි. එහෙයින් කියන ලදී.

අංගානං සිථිලීභාවා ඉන්‍ද්‍රියානං විකාරතො
යොබ්බනස්ස විනාසෙන බලස්ස උපඝාතකො

අතපය ආදී ශරීරාවයව ලිහිල් වීමෙන් ද ඉඳුරන් විකෘති වීමෙන් ද යොවුන් බව විනාශවීමෙන් ද බලය-ශක්තිය නැසීමෙන් ද

විප්පවාසා සතාදීනං පුත්තදාරෙහි පත්තතො
අපසාදනියතො චෙව භීයෝ‍ා බාලත්තපත්තියා

සිහිකල්පනාදිය ඉවත යාමෙන් ද තමාගේම අඹුදරුවන්ට පවා අප්‍රියවීමෙන් ද බොහෝසෙයින් ළදරුවන්ගේ ස්වභාවයට පත්වීමෙන් ද,

පපෙපාති දුක්ඛං යං මචෙවා කායිකං මානසං තථා
සබ්බමෙතං ජරාහෙතු යසමා තසමා ජරා දුඛා

මනුෂ්‍ය තෙමේ යම් කායික වූ ද එසේම මානසික වූ ද යම් දුකකට පැමිණේ ද, ඒ සියලු දුක් ජරාවට පත්වීම හේතුකොට සිදු වේ. එහෙයින් ජරාව දුකකි.

මේ ජරා දුක පුද්ගලයා ලුහුබැඳ පැමිණේ යැයි සම්බන්ධ කළයුතුයි. ව්‍යාධී යනු විවිධ වූ දුක් ඇතිකරයි. ගෙනදෙයි නුයි ව්‍යාධි නමි. රෝගී කරයි. සෞඛ්‍යයට බාධා කරයි. කම්පිත කරයි යන අරුතින් ද ව්‍යාධි නමි. මරණ දුක්ඛං යනු මරණ දුකයි. මෙහිද මරණය දෙ-ආකාර වේ. 'ජරාමරණං දවීහි බන්ධෙහි සංගහිතං' (ජරා-මරණ යන දෙක ස්කන්ධ දෙකකින් සංගෘහිත වේ.) යනුවෙන් කියන ලද (සංඛත ලක්ඛණං) සංඛත ලක්ෂණය හා 'නිච්චං මරණතො භයං' (මරණයෙන් නිරතුරුව උපදින බිය) යනුවෙන් කියන ලද (එක භව පරියාපනන ජීවිතප්පබන්ධ විච්ඡදො) එක් භවයකට අයත් ජීවිතේන්ද්‍රිය සම්බන්ධය බිඳී යාමයි. මෙහි අභිප්‍රේත වනුයේ (දෙවනුව කී) ජාති පච්චය (ඉපදීම හේතුකොට) සිදුවන මරණයයි.

ඉපදීම හේතුකොට ඇතිවන මරණය, උපක්‍රම මරණය, සරස මරණය, (ස්වාභාවික මරණය) ආයුක්ඛය මරණය හා පුඤ්ඤක්ඛය මරණය යනු ද එයට ම නම් වේ. නැවත ක්ෂණික මරණය, සම්මුති මරණය හා සමුච්ඡේද මරණය යැයි මරණයේ ප්‍රභේද දතයුතුයි.

පැවතියදීම (ජීවත්ව සිටියදීම) රූප අරූප ධර්මයන්ගේ ක්ෂණයක් පාසා බිඳියාම ක්ෂණික මරණය නමි. 'තිස්ස මළේය', 'ඵුස්ස මළේය' යනු පරමාර්ථ වශයෙන් සත්ත්වයකු නැති හෙයින් ද 'ශෂ්‍ය මළේය. ගස මළේය' යනු ජීවිතේන්ද්‍රියක නැති හෙයින් ද සම්මුති මරණ නමි. රහතන් වහන්සේගේ ප්‍රතිසන්ධියක් නොමැතිව (කළුරිය කිරීම) පිරිනිවන්පෑම සමුච්ඡේද මරණ නමි. බාහිර සම්මුති මරණය හැර සෙසු සම්මුති මරණ ද, ඉහත දැක්වූ පරිදි බැඳීම් සිදින බැවින් මෙහිදී සංග්‍රහ කර දැක්විණි. දුකට හේතු වස්තු වන බැවින් මරණය දුකකි. එහෙයින් මෙය කියන ලදී.

පාපසස්ස පාප කම්මාදි නිමිත්තමනුපසස්සතො
භද්දස්ස පසහනතස්ස වියොගං පියවත්ථුකං

මීයමානස්ස යං දුක්ඛං මානසං අවිසෙසතො
සබ්බසං වා පියං සන්ධි බන්ධනච්ඡේදනාදිකං

විතුජ්ජමානම්මමානං හොති දුක්ඛා සරීරජං
අසයහ මපජතීකාරං දුක්ඛස්ස තස්සිදං යතො
මරණං වත්ථුතෙනෙදං දුක්ඛම්වෙවව භාසිතං

පාපියාට පාපකර්මාදී නිමිති පෙනෙන විට ද පින්වතාට ප්‍රිය වස්තූන්ගේ වියෝගය ඉවසාගත නොහැකි වන විට ද මරණාවස්ථායෙහි දී අවිශේෂයෙන් යම් මානසික දුකක් වේද, සියල්ලන් හටම සන්ධි බන්ධනච්ඡේදනාදී වූ (අත් පා, අඟ පසඟ සිඳීම්) මර්මස්ථානයනට හානි කරන වධ වේදනාවන්ට භාජන වනවිට ද, පමණ කළ නොහැකි, නො ඉවසිය හැකි, ප්‍රතිකාර නැති යම් ශාරීරික දුකක් වේද, මෙකී සියලු දුකට මේ මරණය යම් හෙයකින් වස්තු වේ ද, එහෙයින් මෙය දුකක්ම යැයි කියන ලදී.

සොක පරිදෙව දුකඛ දොමනසසුපායාසදුකඛං යන මෙහි, ශෝකාදියෙහි සොකො ශෝකය නම්, ඤාති ව්‍යසනාදියෙන් හටගත්තා වූ ඇතුළත තැවීම් ලක්ෂණ ඇති චිත්ත සන්තාපයයි. එය (ඉහත කී) දුක්ඛ දුක්ඛය වන බැවින් ද දුක වස්තුකොට ඇති බැවින් ද 'දුක්ඛ' නමි. එහෙයින් කියන ලදී.

සත්තානං හදයං සොකො විසසල්ලංව තුජ්ජති
අගගිතත්තොව නාරාචො භුසංව දහතෙ පුන

සමාවහතිච ව්‍යාධි ජරාමරණ රොදනං
දුකඛඤඤ විවිධං යසමා තසමා දුකෙඛාති වුචචති

ශෝකය සත්ත්වයන්ගේ හදවත විෂ පෙවූ හීයකින් මෙන් පෙළයි. තවද ගින්නෙන් රත්කළ යකඩ හුලකින් මෙන් අතිශයින් දවයි. යම්හෙයකින් (එය) ව්‍යාධි, ජරා, මරණ, වැලපීම වැනි විවිධාකාර දුක් ගෙනදෙයි ද එහෙයින් ශෝකය දුකකැයි කියනු ලැබේ.

පරිදෙවො පරිදේව නම් ඤාති ව්‍යසනාදියෙන් පහරන ලද්දහුගේ වාග් ප්‍රලාපයයි. වැලපීමයි. (ඉහත කී පරිදි) සංඛාර දුක්ඛ වන බැවින් ද, දුකට වස්තු වන බැවින් ද දුක්ඛ නම් වන්නේය. එහෙයින් මෙය කියන ලදී.

යං සොකසල්ල විහතො පරිදෙවමානො
කණෙඨාටඨ තාලුගල සොසජ මපපසයහං

භීයේ‍යාධිමත්තමධිගච්ඡති යෙන දුකඛං
දුකෙඛාති තෙන භගවා පරිදෙවමාහ

'යම් ශෝක නම් හුලෙන් පහරන ලදුව වැළපෙනුයේ බොහෝසෙයින් උගුර, තොල්, තල්ල වියලීමෙන් හටගත් නො ඉවසිය හැකි අපමණ දුකකට පත් වේ. එහෙයින් භාග්‍යවතුන් වහන්සේ පරිදේවය දුකෙකැයි වදාළ සේක.'

දුකඛං දුක නම් කය පෙළන ලක්ෂණ ඇති කායික දුකයි. ඉහත කී පරිදි දුක්ඛ දුක්ඛ වන බැවින් ද, කායික දුක් එළවන බැවින් ද, මානසික දුක් ඇතිකරන බැවින් ද දුක්ඛ නම් වන්නේ ය. එහෙයින් මෙය කියන ලදී.

පීළෙති කායිකමිදං දුක්ඛං දුක්ඛං ච මානසං භීය්‍යෝ
ජනයති යස්මා තස්මා දුක්ඛන්ති විසෙසතෝ වුත්තං

යම්හෙයකින් මේ කායික දුක්ඛය (සත්ත්වයා) පෙළයි ද එමෙන් ම බොහෝසෙයින් මානසික දුක්ඛය ද දනවයි ද එහෙයින් විශේෂයෙන් ද දුකෙකැයි කියන ලදී.

දොමනස්සං දෝමනස්ස නම් සිත පෙළන ලක්ෂණ ඇති මානසික දුකයි. දුක්ඛ දුක්ඛ ස්වභාවයෙන් ද කායික දුක් එළවන හෙයින් ද දෝමනස්සය දුක්ඛ නම්. මානසික දුක්ඛයෙන් පෙළුණාහු කෙස් විසුරුවාගෙන ළෙහි අත් ගසති. පෙරළෙති. ඒ මේ අත පෙරළෙති. කඩතොලු ඇති ප්‍රපාතයට පනිති. සැතින් ඇනගනිති. වස විස කති. ගෙළ වැලලා ගනිති. ගිනි වදිති. මෙසේ නානාප්‍රකාර වූ දුක් විඳිති එහෙයින් මෙය කියන ලදී.

පීළෙති යතෝ චිත්තං කායස්ස ච පපීළනං
සමාවහති දුක්ඛන්ති දොමනස්සං තතෝ අහූ

යම්හෙයකින් සිත පෙළයි ද කායික පීඩා පවා ගෙන එයි ද එහෙයින් දෝමනස්සය දුක්ඛ නම් විය.

උපායාසෝ උපායාස නම් ඤාතිව්‍යසනාදිය හේතුකොට දැනෙන අතිමාත්‍ර මානසික දුකින් උද්දීප්ත ආයාසය (දැඩි වෙහෙස)මයි. සංස්කාර ස්කන්ධයට ඇතුලත් එක්තරා ධර්මයෙකැයි ඇතැමෙක් පවසති. උපායාසය ඉහත කී පරිදි සංඛාර දුක්ඛ වන හෙයින් ද සිත දවන, තවන බැවින් ද කායික වෙහෙස ඇතිකරන බැවින් ද දුක් වන්නේ ය. එනිසා මෙය කියන ලදී.

චිත්තස්ස පරිදහතා කායස්ස විසාදනා ච අධිමත්තං
යං දුක්ඛං උපායාසෝ ජනෙති දුක්ඛා තතොවුත්තෙතා

අධිකව සිත දැවීමෙන් ද කය වෙහෙසීමෙන් ද අතිමාත්‍ර වූ යම් දුකක් දනවාද, එහෙයින් උපායාසය දුකෙකැයි කියන ලදී.

මෙහි වනාහි ශෝකය මද ගින්නෙන් බඳුනක් තුළ පැසීම වැනියැයි ද පරිදේවය තද ගින්නෙන් පැසෙන බඳුනක වූ දෙය පිටතට උතුරායෑම වැනියැයි ද උපායාසය පිටතට නික්මීමට නොහැකි ඉතිරිය බඳුන තුළම සිදී අවසන් වනතෙක් පැසීම වැනියැයි ද දතයුතුයි.

නෙරයිකං දුකඛං යනු නිරයෙහි පංචවිධ වධ බන්ධනාදී වූ දුක් (සත්ත්වයා) ලුහුබැඳ එයි. එය දේවදූත සූත්‍රය අනුව විස්තර කළයුතුයි. එහෙයින් මෙය කියන ලදී.

ජායෙථ නො චෙ නරකෙසු සත්තො
තත්ථග්ගිදාහාදිකමප්ප සයහං
ලභෙථ දුකඛං නු කුහිං පතිට්ඨං
ඉච්චාහ දුකඛාති මුනීධ ජාති

ඉදින් සත්ත්ව තෙමේ නරකයෙහි නො උපදින්නේ නම්, එහි ගිනිගැනීම් ආදී නො ඉවසිය හැකි දුක් කොතැනක ප්‍රතිෂ්ඨාවක් ලබන්නේද? එහෙයින් (ශාක්‍ය) මුනීන්‍ද්‍රයන් වහන්සේ ජාතිය (ඉපදීම) දුකෙකැයි වදාළ සේක.

තිරච්ඡාන යොනිකං දුකඛං යනු තිරිසනුන් අතරෙහි කසයෙන්, කෙවිටෙන් තැළීම් විදීම් ආදී අනේකප්‍රකාර දුක් පැමිණේ. මෙහිදී බාලපණ්ඩිත සූත්‍රයෙහි එන ලෙස ගතයුතුයි. එහි මෙසේ කියන ලදී.

දුකඛං තිරච්ඡෙසු කසාපතොද
දණ්ඩාභි ඝාතාදිභවං අනෙකං
යනතං කථං තත්ථ භවෙය්‍ය ජාතිං
විනා තහිං ජාති තතොපි දුකඛං

තිරිසන් සතුන් අතර, කස-කෙවිටි-මුගුරු පහර ආදියෙන් ඇතිවන යම් දුකෙක් වේද එහි ඉපදීමෙන් තොරව එය කෙසේ සිදුවේද? එහෙයින් ද ඉපදීම දුකකි.

පෙතති විසයිකං දුකඛං යනු ප්‍රේත ලෝකයෙහි සා පිපාසා අව් වැසි සුළං ආදියෙන් උපදනා දුක් ඇත. තියුණු අන්ධකාරය ඇති ලෝකන්තරික

(අසුර නිකායෙහි) ඉවසිය නොහැකි ශීතාදී දුක් ද පැමිණෙයි. එහෙයින් මෙය කියන ලදී.

පෙතෙසු දුක්ඛං පන බුභුක්ඛිපාසං - වාතාතපාදිප්පභවං විචිත්තං
යස්මා අජාතස්ස න තත්ථ අත්ථි - තස්මාපි දුක්ඛං මුනි ජාතිමාහ

ප්‍රේත ලෝකයෙහි සා පිපාසා, අව්වැසි සුළං ආදී විචිත්‍ර වූ නොයෙක් දුක්විඳිය යුතු වේ. එම ප්‍රේත ලෝකයේ නූපන්නහුට එබඳු දුකෙක් නැත. එහෙයින් බුදුහු ජාතිය (ඉපදීම) දුකෙකැයි වදාළහ.

නිබ්බන්ධකාරෙ ච අසයහ සීතෙ - ලොකන්තරෙ යං අසුරෙසු දුක්ඛං
නතං භවෙ තත්ථ න චස්ස ජාති - යතො අයං ජාති තතොපි දුක්ඛං

ඝනාන්ධකාර සහිත වූ නො ඉවසිය හැකි ශීතයෙන් යුත් ලෝකාන්තරිකයෙහි, අසුර නිකායෙහි යම් දුකෙක් ඇති ද යම් ලෙසකින් ඉපදීමක් නැත්නම්, එම දුක නොවන්නේය. එහෙයින් ද මේ ඉපැදීම දුකෙකි.

මානුසකං දුක්ඛං යනු මිනිසුන් අතර ඇතිවන වධ බන්ධනාදී දුක්ය. **ගබ්භොක්කන්තිමූලකං දුක්ඛං** යනු 'මේ සත්ත්වයා මව්කුස උපදිනුයේ උපුල්, රත්පියුම්, හෙළ පියුම් ආදියෙහි නූපදියි' යනාදී වශයෙන් යම් ජාති දුකක් ඉහත විස්තර කරන ලද්දේ ද, මේ ගැබ පිළිසිඳ ගැනීම මූලිකව ඇතිවන දුක පළමු කොට සත්ත්වයා ලුහුබැඳ එයි.

ගබ්භට්ඨිති මූලකං දුක්ඛං යනු (සත්ත්වයා පිළිසිඳගත් පසු ඔහුගේ) 'මවගේ වහා පය පැකිලීම්, ගමන් කිරීම්, හිඳීම් ආදී නයින් යම් තියුණු දුකක් කියන ලද ද, ඒ ගැබ පිහිටීම් මුල්කොට ඇතිවන දුක ද සත්ත්වයා ලුහුබැඳ එයි. **ගබ්භවුට්ඨානමූලකං දුක්ඛං** යනු 'මව මූඪගර්භ වීමෙන් (ගබ්සා වීමෙන්) මිත්‍රාමාත්‍ය නෑ හිතමිතුරන් ආදීන් විසිනුදු දක්නට නොහැකි දුක් උපදින ස්ථානයකි. මෙසේ යම් දුකක් ඉහත කියන ලද ද, මේ මව්කුසින් පිටතට නික්මීම මුල් කරගත් දුක සත්ත්වයා පසුපස එයි. එහෙයින් මෙය කියන ලදී.

යං චාපි ගූථනරකෙ විය මාතුගබ්භා
සත්තා වසං චිරමතෝ බහි නික්ඛමඤ්ච
පප්පොති දුක්ඛමතිඝොර මිදමපි නත්ථි
ජාතිං විනා ඉතිපි ජාති අයංහි දුක්ඛා

මවුකුසේදී, ගූථ නිරයේ දී මෙන් සත්ත්වයා බොහෝ කලක් දුක් විඳ, ඉක්බිති ඉන් පිටතට නික්මීමේ දී ද යම් අතිශය බිහිසුණු දුකකට පත් වේද, ඉපදීමක් නැතොත් මෙය ද නොවන්නේ ය. එහෙයින් මේ ජාතිය (ඉපදීම) වනාහි දුකෙක්ම ය.

කිං භාසිතෙන බහුනා නනුයං කුහිඤ්චි
අත්ථීධ කිංචිදපි දුක්ඛමිදං කදාචි
නෙවත්ථි ජාති විරහෙ යදතෝ මහෙසී
දුක්ඛාති සබ්බ පඨමං ඉමමාහ ජාතිං

බොහෝකොට පැවසීමෙන් කවර ප්‍රයෝජන ද? මේ ලෝකයෙහි කවර තැනෙකවත්, කවර කලෙකවත් මේ කවර හෝ දුකෙක් ඇත්නම්, ඒ කිසිවක් ඉපදීමක් නැත්නම් සිදුනොවනුයේ නොවේ ද? මෙසේ හෙයින් මහා මුනීන්ද්‍රයන් වහන්සේ සියල්ලටම ප්‍රථම මේ ඉපදීම දුකෙකැයි වදාළ සේක.

ජාතසඞ්ඛාරපනිබන්ධන දුක්ඛං යනු මෙලොව උපන්නහුට පෙකනිවැල බැඳීම, නෑවීම්, ආලේපන තැවරීම්, කැවීම්, පෙවීම් ආදී වශයෙන් හැදී වැඩීම් පිළිබඳ දුක් ලුහුබැඳ එයි. **ජාතස්ස පරාධෙය්‍යතං දුක්ඛං** යනු අනුන්ට අයත්ව පැවතීම් වශයෙන් පරාධීනතාව පිළිබඳ දුක ලුහුබැඳ එයි. අනුන්ට යටත්ව පැවතීම් පිළිබඳ සියලු දුක් යැයි කියන ලදී.

අත්තපක්කමං දුක්ඛං යනු තමාම තමාට දුක් පමුණුවා ගන්නහුට ද, අවේළක ව්‍රතාදී වශයෙන් තැවීම්, පිරිතැවීම් සහිත අත්තකිලමථානුයෝගයෙහි යෙදෙන්නහුට ද, ක්‍රෝධ වශයෙන් නිරාහාරව සිටින්නහුට හා ගෙල වැළලා ගන්නහුට ද දුක් ඇති වේ. තමාගේ ම උපක්‍රමයෙන් ඇතිවන මෙම දුක් ඔහු කරා එයි.

පරූපක්කම දුක්ඛං යනු අනුන්ගේ වධ බන්ධනාදියට ලක් වන්නහුට උපදින දුකයි. අනුන්ගේ උපක්‍රම නිසා ඇතිවන මෙම දුක පුද්ගලයා ලුහුබැඳ එයි. **දුක්ඛ දුක්ඛං** යනු කායික වූ ද චෛතසික වූ ද දුක් වේදනාව ස්වභාව වශයෙන් ද, නාම වශයෙන් ද 'දුක්ඛ දුක්ඛ' යැයි කියන ලදී. මේ දුක්ඛ දුක්ඛය පුද්ගලයා ලුහුබැඳ එයි. **සංඛාර දුක්ඛං** යනු උපේක්ෂා වේදනාව මෙන්ම සෙසු ත්‍රෛභූමික සංස්කාරයෝ ද ඇතිවීම, නැතිවීම හෝ ඉපදීම මරණාදියෙන් දැඩිව පෙළුණු බැවින් සංස්කාර දුක පුද්ගලයා ලුහුබැඳ එයි.

විපරිණාම දුක්ඛං යනු සැප වේදනාව විපරිණාමයට පත්වීමේදී දුකට හේතුවන බැවින් විපරිණාම දුක්ඛ නම් වේ. මේ විපරිණාම දුක සත්ත්වයා ලුහුබැඳ එයි. **මාතු මරණං** යනු මවගේ මරණයයි. **පිතුමරණං** යනු පියාගේ මරණයයි. **භාතු මරණං** යනු ජ්‍යෙෂ්ඨ කණිෂ්ඨ (වැඩිමල්, බාල) සොයුරන්ගේ මරණයයි. **භගිනි මරණං** ජ්‍යෙෂ්ඨ කණිෂ්ඨ සහෝදරියන්ගේ මරණයයි. **පුත්ත මරණං** යනු පුතුන්ගේ මරණයයි. **ධීතු මරණං** යනු දූන්ගේ මරණයයි. **ඤාතිව්‍යසන දුක්ඛං** යනු ඤාතීන්ගේ වියෝවයි. සොර බිය, රෝග බිය ආදියෙන් ඤාතීන්ගේ ක්ෂය වීමයි. විනාශ වීමයි යන අර්ථයි. එසේ ඤාතීන්ගේ විනාශයෙන් පහරන ලද්දහුට, මැඩුනහුට, පෙළුණහුට ඇතිවන දුක ඤාති ව්‍යසන දුක්ඛයයි. ඒ ඤාති ව්‍යසන දුක පුද්ගලයා ලුහුබැඳ එයි. සෙසු පදයන්හි ද මෙම නයයි.

මෙහි ඇති විශේෂ පද නම්, **භොගව්‍යසනං** යනු භෝගයන්ගේ විනාශයයි. රජ, සොර ආදී වශයෙන් භව භෝග සම්පත් ක්ෂයවීමයි. විනාශ වීමයි යන අර්ථයි. ඉහත පැවසූ පරිදිම ඒ භෝග ව්‍යසන දුඃඛය සත්ත්වයා ලුහුබැඳ එයි. රෝගය ම ව්‍යසනය, විපත වූයේනුයි **රොග ව්‍යසන** රෝග ව්‍යසනයි. රෝගය වනාහී නිරෝගී බව විනාශ කෙරේනුයි ව්‍යසන වේ. ඉහත පැවසූ පරිදිම ඒ රෝග ව්‍යසන දුඃඛය පුද්ගලයා පසුපස එයි. **සීලව්‍යසන දුක්ඛං** යනු ශීලය විනාශවීම = සීල ව්‍යසනයි. දුසිල් බවට මේ නමෙකි. කී නයින්ම එම ශීල ව්‍යසන දුඃඛය (සත්ත්වයා) කරා එයි. ඉහත පැවසූ පරිදිම සීලය විනාශවීමෙන් ඇතිවන දුක ද පුද්ගලයා පසුපස එයි.

සම්මා දිට්ඨිය විනාශ කරමින් උපදින දෘෂ්ටියම **දිට්ඨි ව්‍යසනං** දිට්ඨි ව්‍යසන නමි. පෙර පැවසූ පරිදි ම ඒ දිට්ඨි ව්‍යසන දුඃඛය පුද්ගලයා පසුපස එයි. මෙහි ද මුලින් පැවසූ ව්‍යසන දෙක අනිෂ්පන්නයෝය. පසුව

පැවසූ ව්‍යසන තුන නිෂ්පන්නයෝ ය. ත්‍රිලක්ෂණය විනාශ කරන්නෝය. මුලින් දැක්වූ ව්‍යසන තුන කුසල හෝ අකුසල නොවේ. සීල, දිට්ඨි ව්‍යසන දෙක අකුසලයි. **යථා** යනු උපමාව දැක්වීමේ නිපාතයි. **භින්නනාවං** යනු ලිහිල්ව බැඳී දිරාගිය හෝ පුවරු ගැලවී ගිය හෝ නැවයි. **ඉවොදකං** යනු ජලය ඇතුලට එන ජලය ඇතුලට පිවිසෙන්නාක් මෙනි. **තතො තතො උදකං අනෙවති** යනු ඒ ඒ තැනින් බිඳී ජලය ඇතුලට පිවිසෙයි. **පුරතොපිනාවාය** යනු නැවේ ඉදිරිපසින් ද **පච්ඡතොපි** යනු එහි පසුපසින් ද **හෙට්ඨතොපි** යනු යටි පැත්තෙන් ද **පසසතො පි** යනු දෙපසින්ම ද මේ අතරතුර යම් වචනයක අර්ථ නොපවසන ලද ද ඒ වචනයන්හි අර්ථ මේ අනුසාරයෙන් දතයුතුයි.

එහෙයින් සත්ත්ව තෙමේ කායගතා සති ආදී භාවනා විෂයයෙහි සියලු කල්හි සිහි ඇතිව, රූපාදී වස්තු කාමයන් කෙරෙහි පවත්නා සියලුම ආකාරයේ කෙලෙස් කාමය, විෂ්කම්භනය, සමුච්ඡේද වශයෙන් දුරුකරනුයේ කාමයන් දුරු කරන්නේය. මෙසේ ඒ කාමයන් අත්හැර, ඒ කාමයන් ප්‍රහාණය කරන ශෝකාපත්ති ආදී මාර්ගයෙන්ම චතුරෝඝය තරණය කරන්නේය. තරණය කිරීමට හැකිවන්නේය. යම්සේ පුරුෂයෙක් තෙමේ ජලයෙන් බර වූ නැව ඉස දමා (ජලය හිස් කර) සැහැල්ලු වූ නැවින් අල්ප වූ ආයාසයෙකින්ම (සුලු වෙහෙසකින් ම) තරණය කරනුයේ පරතෙරට යන්නේද, එසේම කෙලෙස් ජලයෙන් බර වූ ආත්මභාව නමැති නැව ඉසීමෙන් සැහැල්ලු වූ විට පරතෙරට පත්වන්නේය. 'සියලු දහම්හි කෙළවරට, නිවනට ගියේ වන්නේය', අර්හත්වයට පත්වන්නේ ය. 'අනුපාදිසේස නිර්වාණ ධාතුවෙන් පිරිනිවීමෙනැ'යි මෙසේ අර්හත්වයට යොමුකිරීමෙන් දේශනාව නිම කළ සේක.

සයවන ගාථාව

තසමා යනු යම්හෙයකින් ජාතිය මුල්කරගත් දුක් ඒ පුද්ගලයා වෙත එයි ද එහෙයිනි. **තං කාරණා තං හෙතු** යනාදියෙහි ද මෙම නයයි. යම්හෙයකින් කියන ලද ආකාර වූ දුක් මේ සත්ත්වයා ලුහුබැඳ එයි ද ඒ හේතුවෙනි. යම්හෙයකින් ලුහුබැඳ එයි ද, එය ප්‍රත්‍ය කොටගෙන ලුහුබැඳ එයි ද එම නිදානයෙනි. යනුවෙන් පදයෝජනාව කළ යුතුයි. හෙතු යනාදිය කාරණ පර්යාය වචන යි. කාරණය වනාහි 'එයින් එම ඵලය

ඇතිවේ'නුයි, 'පවතීනු'යි හේතු නම්. ඒ ඒ ඵලය උදෙසා 'ඒනුයි, පවතීනු'යි **පච්චයෝ පච්චය** නම්. 'වහා මොහු ගනිවු' යැයි දක්වන්නාක් මෙන් තමාගේ ඵලය දක්වානුයි **නිදානං** නිදාන නම්.

තං කාරණා යනු නිෂ්කාරණ බව ප්‍රතිෂේධ කිරීමයි. **තං හෙතු** යනු අහේතුක බව, මහාභූත හේතු නොවන බව වැලැක්වීමයි. **තං පච්චයා** යනු හේතු රහිත බව හා සමග පොදු නොවූ ප්‍රත්‍ය සහිත බව වැලැක්වීමයි. **තං නිදානා** යනු නිදානයක් මුල් හේතුවක් නොමැති බව හා සමග ආගමාධිගමයෙහි නිදානයක් (මුල් හේතුවක් ඇති බව) වැලැක්වීම යැයි, මෙසේ ඇතැමෙක් අර්ථ දක්වති. **එතං ආදීනවං සමපසසමානෝ** යනු මෙසේ කියන ලද ආකාරයෙන් තමාට ඇතිවන උපද්‍රව විදසුන් නුවණින් මැනවින් බලමින් දකිමින්, **සදා** යනු මූල පදයයි. **පුන සදා** යනු අර්ථ පදයයි. **සදා** යනු සදහටම ය. **සබබදා** යනු සදාකාලයටම ය.

සබබකාලං පෙරවරු ආදී සියලු කාලයෙහි ය. **නිච්චකාලං** දිනපතායි. දවසින් දවස ය. **ධුවකාලං** යනු අවිච්ඡින්නවයි. **සතතං** නිරන්තරයෙනි. **සමිතං** එක දිගටම ය. **අඛ්බොකකිණණං** අනිකක් සමග අසම්මිශ්‍රව යි. **පොංඛානුපොංඛං** පිළිවෙලින් එකින් එක ගෙතීමෙනි. 'පොංඛානුපොංඛං අවිරාධිතං උපඨාති' (පිළිවෙල නොසිඳ උපස්ථාන කරයි.) ආදියෙහි මෙනි. **උදකොමිකාජාතං** යනු දියෙහි හටගත් රළ පෙළක් මෙනි. **අවීචි** යනු අවිරලවයි. **සනතති** යනු නොකඩවා යි. **සහිතං** යනු එක්කොට ගලපන ලදුවයි. 'සහිතමෙම අසහිතනෙතති' (මට ගැලපෙන දෙය ඔබට නොගැලපෙයි.) යනාදියෙහි මෙනි. **ථූසසිතං** යනු නිවහනක් මෙන් ආවරණ සහිතවයි. 'ථූසසිතගහලෙ (දොරගුල් දැමූ) යනාදියෙහි මෙනි. **පුරෙ භත්තං පච්ඡා භත්තං** යන දෙපදය දිවාකාලයේ කාලය - විකාලය හැඳින්වීම් වශයෙනි. **පුරිමයාමං මජ්ඣිමයාමං පච්ඡිමයාමං** යන තුන රාත්‍රී භාග වශයෙනි. **කාලෙ ජුණ්හෙ** යනු අඩ මස් වශයෙනි. **වසෙස -පෙ- හෙමනෙත - ගිමෙහ** යන තුන ඍතු වශයෙනි. **පුරිමෙ වයො ඛන්ධෙ -පෙ- පච්ඡිමෙ වයො ඛන්ධෙ** යන තුන වයස් තුන - බාල, තරුණ, මහලු යනුවෙන් දක්වන ලදැයි දතයුතුයි.

සතො යනු කයෙහි, කය අනුව බලන, කායානුපස්සනා සතිපට්ඨානය වඩමිනි. 'මෙසේ සමුච්ඡේද වශයෙන් කාමයන් දුරු

කරන්නේය'යි අවසන් කරමින් 'සතෝ' යනාදිය කියන ලද්දේමය. තවද **සන්තත්තා සතෝ** යනු ත්‍රිවිධ වස්තුවෙහි ඇලීම් හේතුවෙන් හෝ ත්‍රිවිධ ක්ලේශයන් ඉවත් කිරීමට ශක්තිමත් හෙයින් හෝ **සන්තත්තා සතෝ** යි කියන ලදී. **සන්තත්තා** යනු ක්ලේශ උපක්ලේශයන් පලවා හැර සිටීමෙන් ද අරමුණුවලින් සිත මුදවාගෙන සිටීමෙන් ද ශාන්ත සන්සුන් බවට පැමිණියේනුයි, **සතෝ** 'සතෝ'යි කියන ලදී. **සමිත්තා** යනු ඉෂ්ට ඵල දායක වූ පිනෙන් ද, අනිෂ්ට ඵල දායක පවින්දැයි යන පින් පවු දෙකම සන්සිඳවූ හෙයින් **සතෝ** සතොයි කියන ලදී. **සන්ත ධම්මසමන්නාගතෝ** යනු සත්පුරුෂ දහම් ඇසුරු කිරීමෙන් ද බුද්ධාදී ආර්ය පුද්ගලයන් සේවනය කිරීමෙන් ද ලබාගත් ශාන්ත ධර්මයන්ගෙන් යුක්ත වූ බැවින් සතෝ යි කියන ලදී. **වත්ථුකාමෙ පරිජානිත්වා** යනු මෙසේ ඉහත විස්තර කළ පරිදි තෙභූමික වස්තුකාමයන් පිළිබඳව තීරණ පරිඥාවෙන් පිරිසිඳ දැන, **පහාය** කෙලෙස් කාමයන් ප්‍රහාණ පරිඥාවෙන් අත්හැර.

පජහිත්වා යනු ඉවත්කර, කුඩයකින් කුණුකසල ඉවත් කරන්නාක් මෙන්ද නැත. ඒ කෙලෙස් දුරුකර, අත්හැර, විඳහැර, බැහැර හැර, කෙවිටෙන් ගවයකු එළවන්නාක් මෙන් ද නැත. තව ද එම කෙලෙස් අවසන්කොට, බැහැර බවට පත්කොට, යටත් පිරිසෙයින් ගතිමාත්‍රයක් හෝ ඉතිරි නොවන සේ කොට, කෙසේ නම් වනාහි ඒ ආකාරයෙන් නසන ලද්දේ වේ ද **අනභාවං ගමෙත්වා** යනු අනු+අභාවං, නැවත නූපදනා බවට පමුණුවා, සමුච්ඡේද ප්‍රහාණ වශයෙන් යම්සේ මුලිනුපුටා දමන ලද්දේ ද, එසේකොටැයි කී නියායි. කාමච්ඡන්ද නීවරණාදියෙහි ද මේ නයයි.

කාමොඝො යනාදියෙහි, පංචකාම ගුණික රාගය අදහස් වේ. 'එහි ගිලෙති'යි යන අර්ථයෙන් කාමය ඕඝයකැයි කියනු ලැබේ. **භවොඝො** යනු රූපාරූප භවයන් කෙරෙහි පවත්නා ඡන්ද රාගයයි. ධ්‍යානයන් කෙරෙහි පවත්නා බලවත් කැමැත්ත ද භවෝඝයයි. **දිට්ඨොඝො** යනු ශාස්වත දෘෂ්ටි ආදියෙන් යුතු භවය පිළිබඳව පවත්නා ප්‍රාර්ථනාවමයි. මෙසේ දිට්ඨෝඝය සහ භවෝඝය එක්වීමට පත්වෙයි. **අවිජ්ජොඝො** අවිජ්ජාඝය වනාහි චතුරාර්ය සත්‍ය පිළිබඳ නොදැනීමයි. එහි පංචකාම ගුණයන් ආශ්වාදනය කිරීමෙන්, එහි ආශ්වාද කිරීමෙන්, නූපන් කාමෝඝය උපදියි. උපන් කාමෝඝය වර්ධනය වේ. මහද්ගත ධර්මයන් ආශ්වාදනයෙන්, සිහිකිරීමෙන් නූපන්නා වූ ද භවෝඝය උපදියි. උපන්නා වූ භවෝඝය ද

වර්ධනය වේ. තෙභූමික ධර්මයන්හි සතර විපර්යාසයන් පදනම්කොට ඇති බැවින් නූපන්නා වූ ද අවිජ්ජෝඝය උපදියි. උපන්නා වූ ද අවිජ්ජෝඝය වැඩේ යැයි දතයුතුයි. ඉහත පැවසූ ක්‍රමයට ප්‍රතිපක්ෂ වශයෙන් යහපත් පක්ෂය විස්තර කළ යුතුයි.

(ප්‍රණිධි හෙවත් තෘෂ්ණා රහිත) අප්‍රණිහිත විමෝක්ෂය වෙතට පිළිපන්නේ කාමෝඝය ද, අනිමිත්ත (නිමිති රහිත) විමෝක්ෂයට පිළිපන්නන් භවෝඝය ද සුඤ්ඤත (ශූන්‍යතා හෙවත් නිර්වාණ) විමෝක්ෂයට පිළිපන්නේ අවිජ්ජෝඝය ද **තරෙය්‍ය** තරණය කරන්නේ ය. පළමු ආර්ය මාර්ග වශයෙන් **තරෙය්‍ය** තරණය කරන්නේය. දෙවැනි ආර්ය මාර්ග වශයෙන් **උත්තරෙය්‍ය** එතෙර වන්නේ ය. තෙවැනි ආර්ය මාර්ග වශයෙන් **පතරෙය්‍ය** ප්‍රතරණය (පූර්ණ වශයෙන් තරණය) කරන්නේය. සිවුවන ආර්ය මාර්ග වශයෙන් **සමතික්කමෙය්‍ය** අතික්‍රමණය කරන්නේය. ඵල වශයෙන් **වීතික්කමෙය්‍ය** ඉක්මවන්නේය. නැතහොත් කාමෝඝ වශයෙන් **තරෙය්‍ය** තරණය කරන්නේය. භවෝඝ වශයෙන් **උත්තරෙය්‍ය** එතෙර වන්නේ ය. දිට්ඨෝඝ වශයෙන් **පතරෙය්‍ය** පූර්ණ වශයෙන් තරණය කරන්නේ ය. අවිජ්ජෝඝය වශයෙන් **සමතික්කමෙය්‍ය** අතික්‍රමණය කරන්නේය. සිවු ඕඝ වශයෙන් ම **වීතිවත්තෙය්‍ය** ඉක්මවන්නේය යනුවෙන් ද ඇතැමෙක් අර්ථ දක්වති.

ගරුකං යනු සැහැල්ලු නොවූ, **භාරිකං** බර වූ බඩු මෙහි තබන ලද්දේනුයි භාරික වූ, **උදකං සිත්වා** ජලය ඉස, **උසසිඤ්චිත්වා** මනාව දිය ඉවතලා, **ඡඩ්ඩෙත්වා** හැරදමා, **ලහුකායා** යනු සැහැල්ලු වූ (නැවෙන්) **ඛිප්පං** වේගයෙන් වහා **ලහුකං සැණෙකින් අප්පකසිරෙනෙව** යනු නිරායාශයෙන්ම **පාරං වුච්චති අමතං නිබ්බාණං** යනු ස්වකාය නමැති මෙතෙර සිට එතෙර වීම වාණ නම් වූ තණ්හාවෙන් නික්මීම, නිවන යැයි කියනු ලැබේ.

යොසෝ යනු යම් ඒ 'සබ්බසංඛාර සමථෝ' (සියලු සංස්කාරයන්ගේ සංසිඳීම) යැයි යමක් කියන ලද ද ඒ සියල්ලම නිවනම වන්නේය. යම්හෙයකින් ඒ නිවනට පැමිණීමෙන් සියලු සංස්කාරයන්ගෙන් හටගන්නා සියලු කම්පාවෝ සන්සිඳෙත් ද, මනාව සන්සිඳෙත් ද එහෙයින් **සබ්බ සංඛාර සමථෝ** යනු සබ්බ සංඛාර සමථ යැයි කියනු ලැබේ. යම්හෙයකින් ඒ නිවනට පැමිණීමෙන් සියලු උපධීහු දුරුවෙත් ද සියලු තණ්හාවෝ ක්ෂය වෙත් ද සියලු කෙලෙස් කිලුටු පහ වේද සියලු දුක් නිරුද්ධ වේද එහෙයින්

නිවනට **සබ්බූපධිපටිනිස්සග්ගෙ** සබ්බූ පධිපටිනිස්සග්ග යැයි ද **තණ්හක්ඛයෙ** තණ්හක්ඛය යැයි ද **විරාගෙ** විරාග යැයි ද **නිරොධෙ** නිරෝධ යැයි ද කියනු ලැබේ. ඒ මේ තණ්හාව එක් භවයක් හා සමග තවත් භවයක් ද ඵලය හා සමග කර්මය ද දවටති යි, වියති යි යන අරුතින් වාණ යැයි කියනු ලැබේ.

ඒ වාණ නම් තණ්හාවෙන් නික්මුණු බවට, නිවන නම් පරතෙරට යන්නේය. නිමිති වශයෙන් හුදකලාව නැගී සිටි ගෝත්‍රභූ ඤාණයෙන් නිවන නම් පරතෙරට පැමිණෙන්නේය. අවබෝධ කරන්නේය. නිමිති පැවතීම් යන දෙ අංශයෙන් උපන් මාර්ග ඤාණයෙන් නිවන නම් පරතෙරට විශේෂයෙන් පැමිණෙන්නේය. ස්පර්ශ කරන්නේය. නිබ්බානාරම්මණ (නිවන අරමුණුකොට ඇති) ඵල සිත් වශයෙන් නිවන නම් පරතෙර ස්පර්ශ කරන්නේ ය. **සච්ඡිකරෙය්‍ය** යනු ගුණ වශයෙන් ස්පර්ශ කොට ප්‍රත්‍යවේක්ෂා ඤාණයෙන් නිවන නම් පරතෙර ප්‍රත්‍යක්ෂ කරන්නේය.

නැතහොත් පළමු ආර්ය මාර්ගයෙන් **පාරං ගවෙඡය්‍ය** පරතෙර යන්නේය. දෙවන මාර්ගයෙන් **අධිගවෙඡය්‍ය** අවබෝධ කරන්නේය. තෙවන මාර්ගයෙන් **එසෙසය්‍ය** ස්පර්ශ කරන්නේය. සිවුවැන්නෙන් **සච්ඡිකරෙය්‍ය** සාක්ෂාත් කරන්නේ යැයි යනුවෙන් ද ඇතැමෙක් අර්ථ වර්ණනා කරති. **යොපි පාරං ගනතුකාමො** යනු යම්කිසි විදසුන් නුවණෙහි පිහිටියා වූ ආර්ය පුද්ගලයෙක් තෙමේ, නිවන් පරතෙරට යනු කැමති වේද, හෙතෙමේද අවශ්‍යයෙන් ම එහි යන්නේ ය. යන අරුතින් 'පාරගූ' නම් වේ. කියන ලදමැයිඃ- 'මම ජාතියෙන් ද, ජරාවෙන් ද, මරණයෙන් ද, ශෝකයෙන් ද, පරිදේවයෙන් ද, දුකෙන් ද, දොම්නසින් ද, උපායාසයෙන් ද එතෙර වූයෙමි' ආදී වශයෙනි.

පූර්වභාගයේ (ආරම්භයෙහි) පැවති අදහස් වශයෙන් ද (පසුව) විදසුන් භාවනාව වැඩීම් වශයෙන් ද එම යෝගාවචරයා ද 'පාරගූ' නම් වේ. **යොපි පාරං ගචඡති** යනු යමෙක් ආර්ය මාර්ගයන්ගෙන් යුතුව නිවන් නමැති පරතෙරට යයි ද, ඔහු ද පාරගූ නම් වේ. **යොපි පාරං ගතො** යනු යමෙක් ආර්ය මාර්ගයේ කටයුතු නිමවා, ඵලයෙහි සිටියේ නිවන් නමැති පරතෙරට ගියේ වේ ද, ඔහු ද පාරගූ නම් වේ. එය බුද්ධ වචනයෙන් ම දක්වනු සඳහා 'වුත්තමපි හෙතං භගවතා තිණ්ණො පාරගතො ඨලෙ තිඨතී බ්‍රාහ්මණො'

(භාග්‍යවතුන් වහන්සේ විසින් දෙසන ලදමැයි :- බ්‍රාහ්මණ තෙමේ එතෙර වූයේ, පරතෙරට ගියේ ගොඩ වී සිටියි.) යනාදිය දක්වන ලදී.

අභිඤ්ඤා පාරගූ අවබෝධ කරගත් ඤාණයෙන්, පිරිසිඳ දත් නුවණින් නිවන් පරතෙරට යනු කැමති වෙති යි, යෙති යි, ගියහ යි, පාරගූ නම් වේ. **පරිඤ්ඤා පාරගූ** යනු සියලු ධර්මයන්ගේ ස්වභාවය තීරණ පරිඥාවෙන් මනාව ඉක්මවා ඉහත පැවසූ පරිද්දෙන්ම පාරගූ නම් වේ. **පහාන පාරගූ** යනු සමුදය සංඛ්‍යාත තෘෂ්ණා පක්ෂයෙහි වූ ක්ලේශයන් ප්‍රහාණ පරිඥාවෙන් මනාව ඉක්මවා, ඉහත පැවසූ නයින් ම පාරගූ නම් වේ. යමෙක් සියලු ස්වභාවයන් මනාව පිරිසිඳ දනියි ද, ඔහු ත්‍රිවිධ පරිඥාවන් - ඤාත පරිඥාවෙන්, තීරණ පරිඥාවෙන් හා ප්‍රහාණ පරිඥාවෙන් පිරිසිඳ දනියි.

එහි 'ඤාත පරිඥා' යනු කවරේ ද? සියලු ස්වභාවයන් පිළිබඳව, මොහු අභ්‍යන්තර ස්වභාවයෝ ය. මොහු බාහිර ස්වභාවයෝ ය. මෙය මෙහි ලක්ෂණයි. මොහු මෙහි කෘත්‍ය, පච්චුපට්ඨාන, පදට්ඨාන (ආසන්න කාරණය හෙවත් පදනම) යෝ යැයි දනියි ද, මේ ඤාත පරිඥාවයි. එහි තීරණ පරිඥාව යනු කවරේද? මෙසේ ධර්මයන් පිළිබඳව දැනගෙන, ඒ ධර්මයන් පහළ වීමේ දී සියලු ධර්මයන් පිළිබඳව අනිත්‍ය වශයෙන්, දුක්ඛ වශයෙන්, අනාත්ම වශයෙන් තීරණය කරයි ද, මේ තීරණ පරිඥාවයි. ප්‍රහාණ පරිඥාව යනු කවරේ ද? මෙසේ සියලු ධර්මයන් පිළිබඳව තීරණය කර, ආර්ය මාර්ගයෙන් ඡන්දරාගය දුරුකරයි ද, මේ ප්‍රහාණ පරිඥාවයි. මේ පරිඥාවන් සඳහා **සො අභිඤ්ඤා පාරගූ පරිඤ්ඤා පාරගූ පහාන පාරගූ** යි (හේ අභිඥා පාරගුය. පරිඤ්ඤා පාරගුය. පහාන පාරගූ යයි) කීහු.

භාවනා පාරගූ යනු භාවනාවෙහි කෙළවරට පත්ව, මාර්ග වශයෙන් නිවන් නම් පරතෙරට ගියේයි. **සච්ඡිකිරියා පාරගූ** යනු ඵල නිබ්බාණ වශයෙන් ප්‍රත්‍යක්ෂ කිරීමෙන් නිවන් ඵලයෙහි පරතෙරට ගියේ යි. **සමාපත්ති පාරගූ** යනු සමාපත්ති අටෙහි පරතෙරට පත්වූයේ යි. **සබ්බ ධම්මානං** යනු පංචස්කන්ධාදී සියලු ධර්මයන්ගේයි. **සබ්බදුක්ඛානං** යනු ඉපදීමේ දුක ආදී සියලු දුක්ඛයන්ගේයි. **සබ්බකිලෙසානං** යනු කාය දුශ්චරිතාදී සියලු කෙලෙසුන්ගෙනි. **අරිය මගඝානං** යනු සෝවාන් ආදී සතර ආර්ය මාර්ගයන්ගේයි. **නිරොධස්ස** යනු නිර්වාණයේ යි. **සබ්බ සමාපත්තීනං** යනු

සියලුම රූපාරූප සමාපත්ති අටෙහි ය. **සෝ** යනු ඒ ආර්ය පුද්ගල තෙමේයි. **වසිප්පත්තෙතා** යනු වශීභාවයට (පලපුරුදු බවට) පත්වූයේ යි.

නැතහොත්, කාන්තභාවයට - ඉසුරුමත් බවට, නිසසල බවට පත් වූයේයි. **පාරමී පත්තෙතා** යනු පාරමී යනු අවසානයට, නිෂ්ඨාවට හෝ උත්තම භාවයට පැමිණියේයි. කවර විෂයයෙක්හි (උත්තම භාවයට) පැමිණියේ ද? යන්නට පිළිතුරු දෙමින්, ආර්ය වූ සීලයෙහි යනාදිය කියන ලදී. එහි **අරියසම්ං සීලසම්ං** නිදොස් වූ සීලයෙහි ය. **අරියසම්ං සමාධිසම්ං** නිදොස් වූ සමාධියෙහි යි. **අරියාය පඤ්ඤාය** නිදොස් වූ ප්‍රඥාවෙහි ය. **අරියාය විමුත්තියා** නිදොස් වූ ඵල විමුත්තියෙහි යි.

මුල් කරුණින් (සීලයෙන්) වාචා, කම්මන්ත, ආජීවය යන අංග තුනය ගන්නා ලදී. දෙවැන්නෙන් (සමාධියෙන්) වායාම, සති, සමාධි යන අංගත්‍රයය ගන්නා ලදී. තෙවැන්නෙන් (ප්‍රඥාවෙන්) විතක්ක සම්මා දිට්ඨිය ගන්නා ලදී. සිවුවැන්නෙන් (විමුත්ති) එය හා සම්ප්‍රයුක්ත වූ සෙසු ධර්මයෝ (සම්මා ඤාණ, සම්මා විමුත්ති) ගන්නා ලදහ යි දතයුතුයි.

අනතගතො යනු සංස්කාර ලෝකයේ අන්තයට ගියේයි. **අනතපපත්තෙතා** එම ලෝකාන්තය නමැති නිවනට ඵලයෙන් පත් වූයේයි. **කොටිගතො** යනු ආර්ය මාර්ගයෙන් සංස්කාරයන්ගේ කෙළවරට ගියේයි. **කොටිපපත්තෙතා** යනු එම කෙළවරට ම ඵලයෙන් පත්වූයේයි. **පරියනතගතො** යනු ආයතනාදී ලෝකයේ පර්යන්තයට පිරිසුන් බවට මාර්ගාන්තයට ගියේයි. **පරියනතපපත්තෙතා** යනු එම ලෝකයම ඵලයේ කෙළවර කොට ගියේයි. **වොසානගතො** යනු මාර්ගයෙන් අවසානයට ගියේයි. **වොසානපපත්තෙතා** යනු ඵලයෙන් අවසානයට පත්වූයේයි.

තානගතො යනු මාර්ගයෙන් රක්ෂා ස්ථානයට ගියේයි. **නානාපපත්තෙතා** යනු ඵලයෙන් රක්ෂා ස්ථානයට ගියේයි. **ලෙනගතො** යනු මාර්ගයෙන් රැකවරණයට ගියේයි. **ලෙනපපත්තෙතා** යනු ඵලයෙන් රැකවරණයට ගියේයි. **සරණගතො** මාර්ගයෙන් අචල ප්‍රතිෂ්ඨාවට ගියේයි. **සරණපපත්තෙතා** යනු ඵලයෙන් අචල ප්‍රතිෂ්ඨාවට පැමිණියේයි. **අභයගතො** මාර්ගයෙන් නිර්භය ස්ථානයට ගියේ යි. **අභයපපත්තෙතා** ඵලයෙන් අභය ස්ථාන නැමති නිවනට පත්වූයේයි. **අචුතිං ගතො** යනු මාර්ගයෙන් චුති රහිත නිර්වාණයට ගියේයි.

අවවුතිපපත්තෙතා යනු එයට ම ඵලයෙන් පත්වූයේයි. **අමත ගතො** යනු මාර්ගයෙන් අමෘත වූ නිවනට ගියේයි. **අමතපපත්තෙතා** යනු එයට ම ඵලයෙන් පත්වූයේයි. **නිබබාණ ගතො** යනු වාණ සංඛ්‍යාත තෘෂ්ණාවෙන් නිකුත්, නිවනට ආර්ය මාර්ගයෙන් ගියේ යි. **නිබබාණපපත්තෙතා** යනු එම නිවනටම ඵලයෙන් පත්වූයේ යි.

යො වුසථවාසො යනු 'ඒ රහතුන් වහන්සේ දස වැදෑරුම් ආර්ය වාසයන්හි වුසූහ'යි 'දිගුකල් වුසූහ'යි 'වැස නිම කළහ'යි 'වුසථවාස' නම් වෙති. **චිණණචරණො** යනු ශීලය හා සමග වූ අටවැදෑරුම් සමාපත්තීන්හි බොහෝ කල් වුසූහ'යි බොහෝකල් හැසිරුණහයි, චිණ්ණචරණ නම් වෙති. **ගතද්ධා** යනු සංසාර මාර්ගය ඉක්මවූහ. **ගතදිසො** යනු සිහිනෙනුදු පෙර නොගිය විරූ නිවන නම් දිශාවට ගියහ. **ගත කොටිකො** යනු අනුපාදිසේස නිර්වාණයේ කෙළවරට පැමිණ සිටියහ. **පාලිත බ්‍රහමචරියො** යනු රක්නා ලද බඹසර ඇත්තාහ. **උතතම දිටඨි පත්තෙතා** යනු උතුම් වූ සම්මා දිට්ඨියට පත්වූවාහුය.

පටිවිද්ධාකුපෙපා යනු අකෝප්‍ය වූ අචල වූ අර්හත්ඵලය අවබෝධ කර සිටියාහ. **සචඡිකත නිරොධො** යනු නිරෝධය, නිර්වාණය සාක්ෂාත් කර සිටියාහ. **දුකඛං තසස පරිඤඤාතං** යනු ත්‍රිවිධ දුඃඛය ඔවුන් විසින් සමතික්‍රමණය කර, පිරිසිඳ දක්නා ලදී. **අභිඤඤෙයයං** යනු ස්වභාව, ලක්ෂණ අවබෝධ කිරීම් වශයෙන් ශෝභන වූ ආකාරයෙන් දතයුතු ස්වභාවයයි. **අභිඤඤාතං** යනු අධික වූ ඥානයෙන් දන්නා ලදී. **පරිඤඤෙයයං** සාමාන්‍ය ලක්ෂණ අවබෝධ කරගැනීම් වශයෙන් ද, කෘත්‍යයෙහි නියැලීම් වශයෙන් ද පලපුරුදු ලැබීමෙන් පිරිසිඳ දතයුතු ස්වභාවයයි. **පරිඤඤාතං** යනු සකලා කාරයෙන්ම දන්නා ලදී.

භාවෙතබබං වැඩිය යුතු දෙයයි. **සචඡිකාතබබං** ප්‍රත්‍යක්ෂ කරගත යුතු දෙයයි. සාක්ෂාත් කරගැනීම දෙවැදෑරුම්ය. ප්‍රතිලාභ සාක්ෂාත් කරණය හා ආරම්මණ සාක්ෂාත් කරණය යනුවෙනි. **උකඛිතත පලිසො** යනු මෙහි 'පලිඝ' යනු සසර වටට මුල් වූ අවිද්‍යාවයි. එය වනාහි උදුරා දැමීම අපහසු හෙයින් පලිඝ නම්. ඒ රහතුන් වහන්සේ විසින් අවිද්‍යාව උදුරා දමන ලද හෙයින් නිවනට උක්ඛිත්ත පලිඝ යැයි කියන ලදහ.

සංකිණ්ණ පරිඛෝ යනු පරිඛා නම් පුනර්භවය ඇතිකරවන, භවයන්හි ඉපදවීම් වශයෙන් මෙන්ම සැරිසැරීම් වශයෙන් ද ජාති සංසාරය යැයි නම් ලද පුනර්භව ස්කන්ධයනට ප්‍රත්‍යය වූ කර්මාභිසංස්කාරය යි, එය වනාහි පුන පුනා උත්පත්ති ඇතිකිරීම් වශයෙන් වටකොට සිටි බැවින් 'පරිඛා' යැයි කියනු ලැබේ. ඒ (රහතුන් වහන්සේ විසින්) මේ (කර්මාභි සංස්කාරය) විහිදුවාලන ලදහෙයින්, විසුරුවා හරන ලද හෙයින්, 'සංකිණ්ණ පරිඛ' යැයි කියන ලදහ.

අබ්බූළ්හෙසිකෝ යනු එසිකා නම් සසර පැවැත්මට මුල් වූ තණ්හාවයි. මේ තණ්හාව වනාහි ගැඹුරුය. උදුරා දැමීම අපහසු හෙයින් 'ඒසිකා' (ඉහුබීල) යැයි කියනු ලැබේ. මොවුන් විසින් ඒ තණ්හාව උදුරා දමන ලද හෙයින්, උගුලා හරන ලද හෙයින් 'අබ්බූළ්හෙසික' යැයි කියනු ලබති. **නිරගඝලෝ** යනු 'අග්ගල' නම් පහළ භවයෙහි උපදවන, කාම භවයෙහි උත්පත්තියට හේතුවන ඕරම්භාගිය සංයෝජන ධර්ම පසයි. මේ (සංයෝජනයෝ) නගර දොරක් වසා සිටි මහත් දොරබාවක් සෙයින් අවුරා සිටි හෙයින් අග්ගල යැයි කියනු ලබති. ඒ රහතුන් වහන්සේ විසින් ඒ සංයෝජනයන් අඟුල් හැර සිඳලන ලද හෙයින් 'නිරග්ගල' යැයි කියන ලදහ.

අරියෝ යනු නිකෙළෙස් වූවාහුය. පිරිසිදු වූවාහුය. **පනනද්ධජෝ** යනු හෙළන ලද මාන නමැති ධජ ඇත්තාහ. **පනනභාරෝ** යනු ස්කන්ධභාර- කෙළෙස් භාර - අභිසංස්කාර භාර - පංචකාම ගුණ භාරයන් මොවුන් විසින් මුදාහරින ලදහ'යි බහාතබන ලදහයි, 'පන්නභාර' නම් වෙති. තවද මෙහි මාන භාරයම බහා තබන ලද හෙයින් 'පන්නභාර' නම් වෙතියි අභිප්‍රේතයි. **විසංයුත්තෝ** යනු චතුර්යෝගයන් කෙරෙන් ද සියලු කෙලෙසුන් කෙරෙන් ද විසංයුක්ත වූහ. මෙහි වනාහි මාන යෝගය කෙරෙන් ම දුරු වූ බැවින්, 'විසංයුත්ත' නම් වෙතියි අභිප්‍රේතයි.

මෙපමණෙකින් (සැරියුත්) තෙරුන් වහන්සේ විසින් ආර්ය මාර්ගයෙහි ගමන් කිරීමෙන් සියලු කෙලෙස් ගෙවා නිවන නම් උතුම් සයනයට පැමිණි රහතුන් වහන්සේගේ නිවන් අරමුණුකොට ඇති ඵල සමවතට පැමිණ වෙසෙන අවස්ථාව දක්වන ලදී.

යම්සේ වනාහි නගර දෙකක් වේ ද එකක් සොරුන්ගේ නගරයෙකි. අනික ක්‍ෂේම වූ (නිරුපද්‍රිත) නගරයෙකි. එවිට එක් මහා යෝධයෙකුට

මෙවැනි සිතක් ඇතිවේ. 'යම්තාක් මේ සොරුන්ගේ නගරය පවතියි ද ඒ තාක් මේ ක්ෂේම නගරය සොර බියෙන් නොමිදේ. 'සොර නගරය විනාශ කරන්නෙමි'යි යනුවෙනි. ඉක්බිති සන්නාහ සන්නද්ධව, කඩුවක් ගෙන සොර නුවරට පැමිණ, නගර ද්වාරයේ ඔසවන ලද ඉන්ද්‍රඛීලයත් කඩුවෙන් සිඳ දමා, දොර බා සමග නගරද්වාරය ද බිඳ, දොරපොලු උගුලුවා දමා, පවුර බිඳිනුයේ දියඅගල විසුරුවා, නුවර අලංකාරයට ඔසවා තුබූ ධජ පහත හෙළා, නුවර ම ගින්නෙන් දවා, ක්ෂේම නගරයට පිවිස ප්‍රාසාදයේ මතුමහලට නැග, ඤාති සමූහයා පිරිවරාගෙන ඉතා රසවත් භෝජන අනුභව කරන්නේ ද, මෙසේ (මේ උපමාවේ එන) සොර නගරය සත්කාය (ස්ව ශරීරය) වැනිය. ක්ෂේම නගරය නිවන වැනි ය. යෝගාවචරයා මහා යෝධයකු වැනිය. ඔහුට මෙසේ සිතේ. 'යම්තාක් මේ ස්වකාය වෘත්තය (සිය කය පිළිබඳ අග් මුල් නැති වටයි) පවතී ද, ඒතාක් දෙතිසක් වධ බන්ධනයන්ගෙන් ද, අටානූවක් රෝගයෙන් ද පස්විසි මහ භයින් ද මිදීමක් නම් නැත.' ඔහු මහා යෝධයකු මෙන් සීල නමැති සන්නාහයෙන් සන්නද්ධව, ප්‍රඥාව නමැති කඩුව ගෙන, කඩුවෙන් ඉන්ද්‍රඛීලයන් මෙන් අර්හත් මාර්ගයෙන් තණ්හාව නමැති ඉන්ද්‍රඛීලය සිඳ දමයි. ඒ යෝධයා දොර බා සහිත නගර දොරටුව මෙන් ඕරම්භාගිය සංයෝජන පස නමැති දොර අගුල උගුලා දමයි. ඒ යෝධයා දොර පොල්ල මෙන් අවිද්‍යා පලිඝය බිඳ දමයි. ඒ යෝධයා ප්‍රාකාර බිඳිමින් දිය අගල මෙන් කර්මාභිසංස්කාරය බිඳිමින්, ජාති සංසාර නමැති දිය අගල වනසයි. ඒ යෝධයා නගරය ශෝභමාන කිරීමට ඔසවා තිබූ ධජයන් මෙන් මාන නමැති ධජය පහත හෙළයි. ස්වකාය නමැති නගරය ගිනිලා, ඒ යෝධයා ක්ෂේම නගරයට පිවිස මතු මහලට නැගී ඉතා රසවත් බොජුන් අනුභව කරන්නාක් මෙන් නිවන නමැති නගරයට පිවිස, අමෘත මහා නිර්වාණය අරමුණු කොට ඇති ඵලසමවත් සුව අනුභව කරමින් කල්යවයි. භාග්‍යවතුන් වහන්සේ විසින් දෙසන ලදමැයි:-

'මහණෙනි, භික්ෂු තෙමේ කෙසේනම් උක්ඛිත්තපලිඝ (උදුරා දැමූ දොරගුලු ඇත්තේ) වේද? මහණෙනි! මේ සසුනෙහි භික්ෂුවගේ අවිද්‍යාව ප්‍රහීණ කරන ලද්දේ ද, සිඳින ලද මුල් ඇත්තේ ද, කරටියෙන් කපන ලද තල්ගසක් මෙන් කරන ලද්දේ ද, නැවත නොවැඩෙන සේ කරන ලද්දේ ද, මතු නො-උපදින සේ කරන ලද්දේ ද, මහණෙනි! මෙසේ වනාහි භික්ෂු තෙමේ 'උක්ඛිත්ත පලිඝ' නම් වේ.

'මහණෙනි! කෙසේ නම් භික්ෂු තෙමේ සංකිණ්ණ පරිබ නම් වේද? මහණෙනි! මේ සසුනෙහි භික්ෂුවගේ පුනර්භවය ඇතිකරන ජාති සංසාරය ප්‍රහීණ කරන ලද්දේ ද -පෙ- මහණෙනි! මෙසේ ඒ භික්ෂු තෙමේ සංකිණ්ණ පරිබ (විසුරුවන ලද කර්මාභිසංඛාර නමැති පරිබා ඇත්තේ) වේ.'

'මහණෙනි! කෙසේ නම් භික්ෂු තෙමේ අබ්බූල්හේසික (උදුරන ලද තණ්හා නැමති ඉඳුබීල ඇත්තේ) වේද? මහණෙනි! මේ සසුනෙහි භික්ෂුවගේ තණ්හාව ප්‍රහීණ කරන ලද්දේ වේද -පෙ- මහණෙනි! මෙසේ ඒ භික්ෂු තෙමේ අබ්බූල්හේසික නම් වේ.'

'මහණෙනි! කෙසේ නම් භික්ෂු තෙමේ නිරග්ගල (හරන ලද අගුල් ඇත්තෙක්) වන්නේ ද? මහණෙනි! මේ සසුනෙහි භික්ෂුවගේ ඕරම්භාගිය සංයෝජන පස ප්‍රහීණ කරන ලද්දේ ද -පෙ- මහණෙනි, මෙසේ භික්ෂු තෙමේ නිරග්ගල (උගුලා දැමූ අගුල් ඇත්තෙක්) වන්නේය.'

'මහණෙනි! කෙසේ නම් භික්ෂු තෙමේ ආර්ය නම් ද පන්නද්ධජ (පහත හෙලූ මාන ධජ ඇත්තෙක්) නම් ද 'පන්නභාර' (බහා තැබූ කෙලෙස් බර ඇත්තෙක්) නම් ද විසංයුක්ත (මිදුණු සිත් ඇත්තෙක්) නම් ද වන්නේද? මහණෙනි! මේ සසුනෙහි භික්ෂුවගේ අස්මි මානය ප්‍රහීනය වූයේ ද? උදුරා දැමූ මුල් ඇත්තේ වේ ද, කරටිය කැපූ තල්ගසක් මෙන් කරන ලද්දේ ද, මතු නොවැඩෙන තත්ත්වයට පත්කරන ලද්දේ ද, මහණෙනි! මෙසේ භික්ෂු තෙමේ ආර්ය නම් ද, පන්නධජ (බිම හෙලූ ධජ ඇත්තේ) නම්ද, පන්නභාර (බහා තැබූ බර ඇත්තේ) නම් ද, විසංයුක්ත නම් ද වන්නේය. මහණෙනි! මෙසේ මිදුණු සිත් ඇති භික්ෂුව (ඇතුළතින්) පිරික්සා බැලීමට සක්දෙවිඳු, බඹුන් හා මහ බඹු ඇතුළු දෙවියෝ නො සමත් වෙති. මෙම (විෂයය) තථාගතයන් වහන්සේගේ විඤ්ඤාණය ඇසුරුකොට පවතින්නෙකි.

පංචංග විප්පහීනෝ යනු කාමච්ඡන්ද ආදී පංච (නීවරණ) අංගයන් විවිධාකාර උපායයන්ගෙන් දුරුකර සිටියේ යි. කියන ලදමැයි. 'මහණෙනි! කෙසේනම් භික්ෂු තෙමේ පංචංගයන් දුරුකොට සිටියේ වේද? මහණෙනි, මේ සසුනෙහි යෙදුණු භික්ෂුවගේ කාමච්ඡන්දය ප්‍රහීණ කරන ලද්දේ වේද, ව්‍යාපාදය ද ථීනමිද්ධය ද උද්ධච්චකුක්කුච්චය ද විචිකිච්ඡාව ද ප්‍රහීණ

කරන ලද්දේ වේද, මහණෙනි! මෙසේ භික්ෂු තෙමේ පංචංගයන් ප්‍රහීණ කොට සිටියේ වේ.'

ඡළංගසමන්නාගතො යනු සදොරෙහි රූපාදී අරමුණු පිළිබඳව පවත්නා ගැටීම් හා ඇලීම් දුරලා උපේක්ෂා වශයෙන් සිහිඇතිව, සාවධානව විසීම් වශයෙන් ෂඩංගයන් සම්පූර්ණ කොට සිටි බැවින් ඡළංග සමන්නාගත යැයි කියන ලදී. කියන ලදමැයිඃ- 'මහණෙනි! කෙසේ නම් භික්ෂු තෙමේ ඡළංග සමන්නාගත වේද? මහණෙනි! මේ සසුනෙහි භික්ෂුව ඇසින් රූප දැක සතුටු නොවන්නේම ය. නො සතුටු ද නොවේ. උපේක්ෂා සහගතව සිහියෙන් සාවධානව වෙසේ. කණින් ශබ්ද අසා -පෙ- නාසයෙන් ගඳසුවඳ ආඝ්‍රාණය කොට -පෙ- දිවෙන් රස විඳ -පෙ- කයින් පහස ලැබ -පෙ- සිතින් ධර්මය (ස්වභාව සිද්ධිය) දැන සතුටු නොවන්නේම, නොසතුටු ද නොවේ. උපේක්ෂා සහගතව සිහියෙන් සාවධානව වෙසේ. මහණෙනි! මෙසේ භික්ෂු තෙමේ ඡළංග සමන්නාගත වේ.'

එකාරක්ඛො යනු සිහිය ආරක්ෂා කරගැනීම් වශයෙනි. ඒක සංඛ්‍යාව නොව, උතුම් වූ ආරක්ෂාව යමෙකුට වේද හේ 'ඒකාරක්ඛ' නමි. කියන ලදමැයි. 'මහණෙනි, කෙසේ නම් භික්ෂු තෙමේ 'ඒකාරක්ඛ' වේ ද? මහණෙනි! මේ සසුනෙහි භික්ෂු තෙමේ සිහිය ආරක්ෂා කරගත් සිතින් වෙසේ ද, මහණෙනි! මෙසේ භික්ෂු තෙමේ 'ඒකාරක්ඛ' නම් වේ. **චතුරපසෙසනො** යනු ප්‍රඥාවෙන් ප්‍රතිසේවන, පරිවර්ජන, විනෝදන, පජහන යනාදී වශයෙන් සතර වැදෑරුම් අපශ්‍රයන්ගේ, එනම් ඔබිනොබ නොපෙරලී සිටීම් වශයෙන් 'චතුර පස්සේන' නම් වේ. ඒ සිවු අපශ්‍රයනට මනාව පැමිණ සිටියේයි. කියන ලදමැයි. 'මහණෙනි! කෙසේ නම් භික්ෂුව 'චතුරපසෙසන' වේද? මහණෙනි! මේ සසුනෙහි භික්ෂුව එක් කරුණක් විමසා බලා සේවනය කරයි. එක් කරුණක් විමසා බලා දුර හරියි. එක් කරුණක් විමසා බලා බැහැර කරයි. එක් කරුණක් විමසා බලා අත්හරියි' යන ආදී නයින් විස්තර කළ යුතුයි.

පණුනන පවෙවක සවෙවා මේ දර්ශනයම සත්‍යයයි. මෙය ම සත්‍යයයි යනුවෙන් මෙසේ වෙන වෙනම ගන්නා ලද බැවින් ප්‍රත්‍යෙක නම් වූ ශාස්වත ආදී දෘෂ්ටි සත්‍යයන් බැහැර කරන ලදැයි, ඉවත් කරන ලදැයි, ප්‍රහීණ කරන ලදැයි යන අරුතින් එම භික්ෂු තෙමේ 'පණුන්න පච්චේක සච්ච' නම් වේ. **සමවය සටෙඨසනො** යන මෙහි, අවය යනු අනූනය යන

අර්ථයි. සට්ඨ යනු විසුරුවා හරින ලදැයි යන අර්ථයි. මොහු විසින් මනාසේ නොඅඩුව, ඒෂණයන් (සෙවීම්) හරනා ලදී නුයි 'සමවය සට්ඨෙසන' නම් වේ. මනාසේ විසුරුවා හරන ලද සියලු ඒෂණයන් (සෙවීම්) ඇත්තේය යන අරුති. **කෙවලී** යනු පිරිපුන් වූයේයි. **වුසිතවා** යනු වැස නිම වූ බඹසර ඇත්තේයි. ගරු සංවාස (ගුරුන් හා සම විසීම්) යෙහි ද ආර්ය මාර්ගයෙහිද දස ආර්ය වාසයන්හි ද වැස නිමවූයේයි. **උත්තම පුරිසෝ** යනු ක්ෂය කරන ලද කෙලෙස් ඇති බැවින් විශේෂ පුරුෂයෙක් උත්තම පුරුෂයෙක් වූයේයි.

පරමපුරිසෝ යනු උත්තම පුරුෂයාට ම මේ නමෙකි. උතුම් ප්‍රතිලාභයට පැමිණි හෙයින්, පරම ප්‍රාප්තියට පත්වූයේ යි, උතුම් වූ පරම වූ පැමිණිය යුතු වූ අර්හත්ව ප්‍රතිලාභයට පැමිණියේ යි. අනුත්තර පුණ්‍යක්ෂේත්‍ර වූ උතුම් පුරුෂයෙක් වේ. ඒ අර්ථයෙන්ම පරම පුරුෂයෙක් ද වේ. අනුත්තර වූ (නිරෝධ) සමාපත්තියට සමවැදීමට, අමෘත ප්‍රතිලාභයට පත් වූ බැවින් **පරමප්පත්තිපත්තෝ** පරම පත්තිපත්ත නම් වේ. නැතහොත් 'ගෘහ වාසයේ' (ගිහිගෙයි) ආදීනව දැන හඳුනාගෙන විදසුන් භාවනාවට පිවිසීම් වශයෙන් පරම පුරුෂ වූයේයි. කෙලෙස්හි ආදීනව අවබෝධ කරගෙන විශේෂ වූ ආර්ය භූමියට පිවිසියේ, පරම ප්‍රාප්තියට පැමිණියේය' යනුවෙන් ඇතමෙක් අර්ථ පවසති.

නෙව ආචිනාති යනු කුසලාකුසලයන් ප්‍රහීණ කරන ලද බැවින් එහි විපාක රැස් නොකරයි. **න අපචිනාති** යනු ඵලයෙහි සිටි හෙයින් විපාක විනාශ නොකරයි. **අපචිනිත්වා** යීතෝ යනු පටිප්පස්සද්ධි (මුළුමනින්ම බහා තැබීම්) ප්‍රහාණයෙහි පිහිටි හෙයින්, කෙලෙස් විද්වංසනය කර සිටියේයි. මින්පසුව එන පදත්‍රයෙන් මාර්ගඵල වශයෙන් ම යෙදිය යුතුයි.

නෙව පජහති යනු පහ කළයුතු ක්ලේශයක් නැති බැවින් කෙලෙස් දුරු නො කරයි. **න උපාදියති** තණ්හා මාන දෘෂ්ටි වශයෙන් ගතයුත්තක් නොමැති හෙයින් ගැනීමක් නොකරයි. **පජහිත්වා** යනු දුරුකර, අත්හැර සිටියේයි. **නෙවසං සිබ්බති** යනු තණ්හා වශයෙන් නොබැඳෙයි. **න උසසිනෙති** යනු මාන වශයෙන් ද උසස්කොට නොතකයි. **විසිබෙබත්වා** යීතෝ යනු තෘෂ්ණා බන්ධනය නොකර සිටියේ වේ, යනුවෙන් ඇතමෙක් අර්ථ කියති. **නෙව විධූපෙති** යනු කෙලෙස් ගිනි නොනිවයි. **න සන්ධූපෙති** කෙලෙස් ගිනි නොදල්වයි. **විධූපෙත්වා** යීතෝ කෙලෙස් ගිනි නිවා සිටියේ වේ.

අසෙකඛන සීලකඛන්ධන නැවත හික්මවිය යුතු නොවන හෙයින් ශෛක්ෂ්‍ය නොවූ වාචා, කම්මන්ත, ආජීව යන සීල ස්කන්ධයෙන් යුතුව සිටියේයි, ශීල භාවනාවෙන් සමන්විතව සිටියේ යි. අපරිහීන භාවයෙන් සිටියේයි. **සමාධිකඛන්ධන** යනු වායාම, සති යන අංගයන්ගෙන් යුක්ත වූ සමාධියෙනි. **විමුතතිකඛන්ධන** යනු විමුත්තියෙන් යුක්ත වූ ස්කන්ධයෙනි. **විමුතතිඤාණ දසසනකඛන්ධන** යනු ප්‍රත්‍යවේක්ෂණා ඤාණයෙනි. **සචචං සමපටිපාදයිතචා** යනු චතුරාර්ය සත්‍යය ස්වභාව වශයෙන් ස්වකීය සන්තානයෙහි අවබෝධ කරගෙන, ප්‍රතිවේධ කරගෙන සිටියේයි.

මෙසේ **සමතිකකමිතචා** යනු යම් බඳු තණ්හාවක් වේ ද එය ඉක්මවා, **කිලෙසගිං** යනු රාගාදී කෙලෙස් ගිනියි. **පරියාදයිතචා** යනු ගෙවා දමා, ක්ෂය කර, **අපරිගමනතාය** යනු සංසාරයෙහි ගමන් නැති බැවින්, නැවත ඒමක් නැති බැවින් යන අර්ථයි. **කථං සමාදාය** යනු නය ග්‍රහණයෙන් ගෙන, **මුතතිපටිසෙවනතාය** යනු සියලු කෙලෙසුන්ගෙන් මිදී රූපාදී අරමුණු වශයෙනි. නැතහොත් සියලු කෙලෙසුන් විදාරණ විමුක්තිඵල සමාපත්ති සේවනය කිරීම් වශයෙනි. **මෙතතාය පාරිසුදධියා** යනු කිලිටි, බාධාවලින් මිදුණු, පිරිසිදුභාවයෙහි පිහිටි, මෛත්‍රියෙහි පිහිටියේයි. කරුණා දියෙහි ද මෙම නයයි.

අචචනත පාරිසුදධියා යනු සසර කෙළවර ඉක්ම වූ පාරිශුද්ධ භාවයෙන් පාරිශුද්ධත්වයේ කෙළවරට පැමිණ සිටියේයි. **අතමමයතාය** යනු තෘෂ්ණාව, මිසදිටු බව හා මානය යන තුන 'තම්මය' නම් වේ. ඒවායෙන් දුරු වූ බව 'අතම්මයතා' නම් වේ. ඒ තෘෂ්ණා, දෘෂ්ටි, මානයන් කෙරෙන් තොරව සිටියේයි. කියන ලදමැයි. 'සො තාදිසො ලෝකවිදූ සුමෙධො - සබබෙසු ධමමෙසු අතමමයො මුනී' (ඒ තාදී වූ ලෝකවිදූ වූ මනා නුවණැති මුනීන්‍දයන් වහන්සේ සියලු ධර්මයන්හි තණ්හා මාන දෘෂ්ටි විරහිත වූහ.) යන මෙහිද අතම්මයො යනු තණ්හා, මාන, දෘෂ්ටි විරහිත වූයේය යන අර්ථයි. **විමුතතතතා** යනු සියලු කෙලෙසුන්ගෙන් මිදුණු බැවිනි. **සනතුසිතතතා** යනු යථාලාභ, යථාබල, යථා සාරුප්‍ය යන සන්තෝෂයන්ගේ වශයෙන් සන්තුෂ්ටි භාවයෙහි සිටියේයි. **ඛනධපරියනෙත** යනු ඒක - චතු - පංච ස්කන්ධයන් ත්‍රිවිධ පරිඥාවන් මගින් දවා අන්තයෙහි, අවසානයෙහි සිටියේයි. ධාතු පරියනතාදියෙහි ද මේ නයයි. මේ වනාහි විශේෂ යි.

ධාතු පරියනෙත යනු අටළොස් ධාතූන්ගේ පර්යන්තයෙහියි. **ආයතන පරියනෙත** යනු දොළොස් ආයතනයන්ගේ පර්යන්තයෙහිය. **ගතිපරියනෙත** යනු නිරයාදී පංචගතීන්ගේ අවසානයෙහි ය. **උපපත්ති පරියනෙත** යනු සුගති දුගති දෙකේ ඉපදීමේ පර්යන්තයෙහි ය. **පටිසන්ධි පරියනෙත** යනු කාම, රූප, අරූප භවයන්හි ප්‍රතිසන්ධියේ අවසන්හි ය. **භව පරියනෙත** යනු ඒකවොකාර, චතුවෝකාර, පංචවෝකාර, සඤ්ඤායතන, නේවසඤ්ඤා නාසඤ්ඤායතන, කාම, රූප, අරූපාදී භවයන්ගේ අන්තයෙහිය. **සංසාර පරියනෙත** යනු ස්කන්ධ, ධාතු, ආයතනයන්ගේ නොසිඳී පැවැත්මේ අවසන්හිය. **වටට පරියනෙත** යනු කර්ම විපාක, ක්ලේශ වෘත්තයන්ගේ (සංසාර) පර්යන්තයෙහි, **අනන්තිමභවෙ** යනු අවසාන උත්පත්ති භවයෙහි, **අනන්තිම සමුසසයෙ ඨිතො** යනු අවසාන වූ අන්තිම ශරීරයෙහි සිටියේයි. **අනන්තිම දෙහධරො** යනු අන්තිම වූ අවසාන වූ දේහය, ශරීරය දරනුයේනුයි 'අන්තිම දේහධර' නම් වේ.

අරහා යනු කෙලෙස් සතුරන්ගෙන් දුරු වූ බැවින්, සංසාර චක්‍රයෙහි අරයන් (ගරාදි) සිඳලූ බැවින්, ප්‍රත්‍යලාභයට සුදුසු වූ හෙයින්, රහසින්වත් පවු නොකරන බැවින් අර්හත් නම් වේ. **තසසාය පච්ඡිමකොටි** යනු ඒ ක්ෂීණාශ්‍රවයන් වහන්සේගේ මේ අවසාන ආත්මභවයයි. **චරිමො** යනු අල්ප වූ, මඳ වූ, 'චරිමො ආලොපො', 'චරිමං කබලං' (අවසාන බත් පිඩ) යනාදියෙහි මෙන් අවසන් ශරීරයයි. නැවත පිළිසිඳ ගැනීමක් නොමැති හෙයින් 'ජාති මරණ සංසාරො නත්ථි තසස පුනබභවො' (ජාති මරණාදී සංසාරය, පුනර්භවය ඔහුට නැත)යි කියන ලදී. ඉපදීම, ජනනය **ජාති** නමි. මෙය හේතුකොට මැරේනුයි **මරණං** මරණ නමි. ස්කන්ධාදීන්ගේ නොසිඳීමෙන් සසර පැවැත්ම ද නැවත ඒ රහතුන් වහන්සේට නැතැයි කියන ලද බව නිගමනය කරමින් දක්වන ලදී. එහෙයින් භාග්‍යවතුන් වහන්සේ මේ ගාථාව වදාළහ. 'තසමා ජනතු -පෙ- නාවං සිඤාව පාරගූ' යනුවෙනි. මේ සූත්‍රයෙහි අතරතුර යමක් නොපවසන ලද ද, ඒ පාඨානුසාරයෙන් (සෙසු පදයන්ගේ අනුසාරයෙන්) ගතයුතුයි.

සද්ධම්මපජ්ජොතිකා නම් මහා නිද්දේසට්ඨකථාවේ
පළමු කාමසූත්‍ර නිර්දේශ වර්ණනාව නිමියේ ය.

2

දෙවන සූත්‍රයේ පළමු ගාථාවේ **සත්තෝ** යනු ඇලුණේයි. ගුහායං කයෙහි, ශරීරයෙහි, කය නම් රාගාදී ව්‍යාල මෘගයනට විසීමට අවකාශ ඇති හෙයින් 'ගුහා' යැයි කියනු ලැබේ. **බහුනාභිචජනෙනා** යනු බොහෝ රාගාදී ක්ලේශ විශේෂයන්ගෙන් වැසුණේයි. මෙහි අභ්‍යන්තර බන්ධනය කියන ලදී. **තිට්ඨං** යනු රාගාදී වශයෙන් සිටිනුයේ, **මොහනසම්ං පගාළෙනා** යනු මෝහන නම් පංචකාම ගුණයෝ යි. මෙහි වනාහි දෙවියෝ ද මිනිස්සුද මුළා වෙති. එහි ගැලී සිටින හෙයිනි. මෙහිදී බාහිර බන්ධනය කියන ලදී.

දූරෙ විවෙකාහි තථාවිධො සො යනු මෙබඳු වූ පුද්ගලයා ත්‍රිවිධාකාර කාය විවේකාදී විවේකයන්ගෙන් ඉතා දුරුව, නො සමීපව වෙසේ. කුමක් නිසාද? ලෝකයෙහි කාමයෝ වනාහි කිසිවකුටත් පහසුවෙන් අත්හළ නොහැකි වෙති. ලෝකයෙහි කාමයන් පහසුවෙන් අත්හළ නොහැකි හෙයිනැයි කී නියායි. **සත්තො හි බොා වුත්තං** යනු සත්ත්වයා, නරයා, මානවයා මේ ආදී නයින් කියන ලද්දේම ය. ගුහායං යනු පළමුකොට ගුහාවකැයි කිවයුතු හෙයින් මුලදීම ගුහාවකැයි කියන ලදී. 'කායොති වාති' යනාදියෙහි පළමුකොට මේ පද යෝජනාවයි. කය හෝ ගුහාව හෝ කුම්භ (කළය) හෝ යනුවෙනි. එහි **කායො** යනු පිළිකුල් වූ කුණපයන්ට උත්පත්ති ස්ථාන වේනුයි (කුච්ඡිතානං ආයොති) කාය නම් වේ ආදී වශයෙන් ඉහත සතිපට්ඨාන කථාවෙහි (31 වන පිටුවෙහි) දක්වන ලද්දේමය. රාගාදී ව්‍යාල මෘගයනට වාසයට අවකාශ ඇතැයි යන අරුතින් කය ගුහා නම් වේ. 'රාගාදී ධර්මයන් සැඟවීමේ අරුතින් ද ගුහා නම් වෙති'යි ඇතැමෙක් පවසති. 'දූරංගමං එකචරං අසරීරං ගුහාසයං' ආදියෙහි මෙනි. රාගාදියෙන් දවනු ලබතැයි යන අර්ථයෙන් දෙහො දේහ නම් වේ. 'තෙ හිත්වා මානුසං දෙහං' ආදියෙහි මෙනි.

'ප්‍රමාද බවට පත්කරති'යි යන අර්ථයෙන් **සන්දෙහො** සන්දේහ නම් වේ. 'භිජ්ජති පූතිසන්දෙහො මරණන්තං හි ජීවිතං' (පිළිකුල් සහිත මේ දේහය බිඳේ. ජීවිතය මරණයෙන් කෙළවර වේ. 'සිඤ්ඤ භික්ඛු ඉමං

නාවං සිත්තා තෙ ලහුමෙසසතී' යනාදියෙහි (මහණ! මේ නැව ඉසිනු. ඉසින ලද නැව සැහැල්ලු බවට එන්නේය.) මෙනි.

ඉරියව් පැවතුම් ඇති හෙයින් රථො රථනම් වේ. 'රථො සීලපරිකඛාරො ඣානකෙඛා චකකවීරියො' (ශීල නමැති පිරිකර හෙවත් අංගෝපාංග ඇති, ධ්‍යාන නැමති අක්ෂ ඇති, චක්‍රයන් වැනි වීර්ය ඇති මේ ශරීර නමැති රථය) ආදියෙහි මෙනි. ඉතා උස් හෙයින් ධජො ධජ නම්. 'ධජො රථසස පඤඤාණො' (ධ්වජය රථයෙහි ප්‍රකටව පෙනෙන සලකුණයි.) ආදියෙහි මෙනි. කෘමි කුලයනට වාසස්ථාන වන බැවින් වම්මිකො වම්මික නම්. 'වම්මිකොති බො භික්ඛූ ඉමසෙසතං චාතුම්මහා භූතිකසස කායසස අධිවචනං' (මහණ! වම්මික යනු, සතර මහාභූතයන්ගෙන් නිපන් මේ කයට අධිවචනයි.) බාහිර වශයෙන් 'වම්මික' යනුවෙන් හැඳින්වෙන තුඹස වනාහි බැහැර කෙරෙති'යි, අත්හරින ලද්දෙකැයි, වමනය කිරීමෙන් ගොඩනංවන ලදහ'යි, 'වමනය කරන ලද කෙල දියරෙන් බැඳුණාහ'යි යන සිවු කරුණෙන් 'වම්මික' යැයි වහරනු ලැබේ.

ඒ තුඹස වනාහි සර්ප, මුගටි, මී, සුණු ආදී නානාප්‍රකාර ප්‍රාණීන් පිටතට නික්මවති'යි යන අරුතින් 'වම්මික' නම්. 'වේයන් විසින් අත්හරින ලදහ'යි 'වම්මික' නම්. වේයන් විසින් මුව තුඩින් තෙමමින් ඔසවා බැඳි පස් සුණුවලින් තුනටිය පමණ උසට හෝ මිනිසකු පමණ උසට හෝ ඔසවා සාදන ලදහ'යි යන අරුතින් ද තුඹස වම්මික නම් වේ. වේයන් විසින් වැමෑරූ කෙළ නම් තෙත් බැවින් බැඳී ඇති හෙයින් සත් සතියක් වුව වැසි වස්නා කල්හි පවා නොවිසිරේද, (දිය වී නොයේ ද) ග්‍රීෂ්ම කාලයේ පවා එයින් පස් මිටක් ගෙන එය තදින් මිරිකනු ලබන කල්හි තෙත් බව පිටවේද, මේ ආකාරයට වැමෑරූ තෙතමනයෙන් බැඳුණාහ'යි යන අරුතින් ද 'වම්මික' නම්.

මෙලෙසින් ශරීරය ද 'ඇසින් කබ ආදී වශයෙන් නානාප්‍රකාර අශුචි කිලුටු මල ආදිය වගුරුවති'යි යන අරුතින් වම්මික නම් වේ. 'බුදු, පසේබුදු, මහරහත් උතුමන් මේ ආත්මභාවය කෙරෙහි ආශාව මැඩලීමෙන් ආත්මභාවය අත්හැර දමා ගියහ'යි යන අරුතින් ද 'ආර්යයන් විසින් අත්හරින ලදහ'යි යන අරුතින් ද 'වම්මික' නම් වේ.

ඒ මේ කය ද තුන්සියයක් ඇටවලින් ඔසවන ලදුව, නහරින් බැඳී මසින් ආලේප කරන ලදුව, තෙත් වූ සමින් වසන ලදුව, 'සිවියෙන් සරසන ලදුව සත්ත්වයන් රවටති'යි යන සියල්ලම ආර්යයන් විසින් අත්හරින ලද හමැයි, මෙසේ වමාරා ඔසවන ලදහයි යන අරුතින් ද 'වම්මික' නම් වේ.

'තණ්හා ජනෙති පුරිසං චිත්තමසස විධාවතී' (තෘෂ්ණාව පුරුෂයා උපදවයි. ඔහුගේ සිත ඒ මේ අත දුවයි.) මෙසේ තණ්හාවෙන් උපදවන ලද බැවින් ආර්යයන් විසින් වමාරන ලද්දා වූ ම තණ්හා නැමති බැඳීමෙන් මේ ශරීරය බැඳුණහ'යි මෙසේ වත්ත සිනේහ සම්බන්ධ වමාරන ලද තෘෂ්ණා ස්නේහ සම්බන්ධයන් ඇතියහයි යන අරුතින් ද 'වම්මික' නම් වේ.

යම්සේ තුඹස තුළ නානාප්‍රකාර ප්‍රාණීහු එහිම උපදින් ද, එහිම මලමුත්‍රා පහකරත් ද ගිලන්ව වැතිරෙත් ද මැරී වැටීමෙන් ද මේ ආකාරයෙන් එම තුඹස (එම ප්‍රාණීන්ට) සූතිකාගාරය ද වැසිකිළිය ද ආරෝග්‍යශාලාව හා සුසානභූමිය ද වන්නේය. එසේම ක්ෂත්‍රිය මහාසාර කුලවල උපන්නවුන්ගේ කය ද මහානුභාව ඇත්තවුන්ගේ ගෝපනය නොකළ, ආරක්ෂා නොකළ ආහරණයෙන් සරසන ලද කයදැයි විශේෂයක් නොසිතා ම, සිවිය ආශ්‍රිත ප්‍රාණීහු ද සම ආශ්‍රිත ප්‍රාණීහු ද නහර ආශ්‍රිත ප්‍රාණීහු ද ඇට ආශ්‍රිත ප්‍රාණීහු හා ඇටමිදුළු ආශ්‍රිත ප්‍රාණීහු දැයි මෙසේ කුල ගණනින් අසූවක් වූ දහස් ගණන් කෘමිජාතීහු මේ ශරීරය තුළම හටගනිති. මේ තුළම මලමුත්‍රා කරති. ගිලන් බවට පත්ව වැතිරෙති. මැරී වැටෙති. මෙසේ මේ ශරීරය ද ප්‍රාණීන්ගේ සූතිකාගාරය ද වැසිකිළිය ද ආරෝග්‍ය ශාලාව ද සුසානභූමිය ද වෙතියි යන අරුතින් ද 'වම්මික' (තුඹසකි) යන සංඛ්‍යාවට ගියේය.

'මනාප අමනාපයන් සැරිසරවති'යි යන අර්ථයෙන් නගරං නගර නමි. 'සකකාය නගරං' (ස්වකාය නම් නගරය) ආදියෙහි මෙනි. රෝග ආදියට නිවහනක් (කූඩුවක්) වන හෙයින්, කැදැල්ලක් වන හෙයින් ද නීළං නීළ හෝ නීඩං නීඩ නමි. 'රොගනීඩං පභංගුරං' (රෝගයනට කැදැල්ලක් වූ බිඳෙන සුලු වූ) ආදියෙහි මෙනි. ප්‍රතිසන්ධියට නිවාස ගෘහයක් (ලැගුම් ගෙයක්) වෙති'යි යන අර්ථයෙන් කූටී කුටි නම් වේ. 'පඤ්චදවාරායං

කුටිකායං පසක්කිය' (පංචද්වාර නමැති ලැගුම් ගෙහි රැස් වී) යනාදියෙහි මෙනි. පිළිකුල් ස්වභාවය නිසා ගණ්ඩා ගඩුවකි. 'රොගො'ති භික්ඛවෙ, 'ගණ්ඩා'ති භික්ඛවෙ, 'සල්ලො'ති භික්ඛවෙ කායසෙසතං අධිවචනං' (මහණෙනි, රෝගයෙකැයි, ගඩෙකැයි හුලෙකැයි කයට අධිවචනයි.)

බිඳීම් අරුතින් **කුම්හා** කුම්භ නමි. 'කුම්භූපමං කායමිමං විදිත්වා' (මේ කය කළයක් වැනියැයි දැන) ආදියෙහි මෙනි. **කායසෙසතං අධිවචනං** යනු මෙසේ කියන ලද ආකාර ඇති, සතර මහා භූතයන්ගෙන් නිර්මිත වූ, නින්දිත ස්වභාවයනට රැස්වීම් පොලක් වූ ශරීරයට අධිවචනයි යන අර්ථයි. **ගුහායං** යනු ශරීරයෙහි ය. **සත්තො** යනු ඇලී පවත්නේයි. **විසත්තො** යනු (ඡවි) වර්ණයෙහි ඇලීම්, ආදී වශයෙන් විවිධාකාරයෙන් ඇලුණේයි. **ආසත්තො** යනු සණ්ඨානරාග (කඩවසමෙහි, හැඩහුරුවෙහි ඇලීම්) වශයෙන් ඇලුණේයි. එහිම (කයෙහි ම) සුභයැයි, සැප යැයි ගැනීම් වශයෙන් **ලග්ගා** ලග්ග නමි. ආත්මරාග (ආත්මයෙහි ඇලීම්) වශයෙන් **ලග්ගිතො** ලග්ගිත නමි. **පළිබුද්ධා** යනු ස්පර්ශ රාග වශයෙන් නොමිදී සිටියේයි. **හිත්තිබ්බිලෙ** යනු බිත්තියක සවිකළ කොකුවෙක, නාගදන්ත එවැනිම ඇත්දත් සමාන වක් දඬුවක හෝ, **සත්තං** යනු බිත්ති කොකුවෙක එල්බුණු, **විසත්තං** යනු නාගදන්තයෙක එල්බුණු, **ආසත්තං** යනු සිවුරු දණ්ඩෙහි එල්බුණු **ලග්ගං** යනු සිවුරු රැහැනේ එල්බුණු, **ලග්ගිතං** යනු පුටු කකුලෙහි එල්බුණු, **පළිබුද්ධං** යනු ඇඳ කකුලෙහි එල්බුණු, යන ආදී නයින් අර්ථ යෙදිය යුතුයි. **ලග්ගනාධිවචනං** යනු විශේෂයෙන් ඇලීම් ප්‍රකාශ කිරීමයි. **ඡන්නො** යනු කියන ලද ආකාරයෙන්ම කෙලෙසුන්ගෙන් වසන ලදුයේයි, නැවත නැවත ඉපදීම් වශයෙන් මතු මතුයෙහි වසන ලද්දේනුයි **උච්ඡන්නො** උච්ඡන්න නමි. **ආවටො** යනු අවුරන ලදුයේයි. **නිවුතො** යනු මුවහකරන ලදුයේයි. **ඔඵුටො** යනු යලි යලිත් වසන ලදුයේයි. **පිහිතො** බඳුනකින් සැළිමුවවිටක් වසන්නාක් මෙන් වසන ලද්දේයි, **පටිච්ඡන්නො** යනු හාත්පසින් වසන ලදුයේයි.

පටිකුජ්ජිතො යනු යටිකුරු කර තබන ලදුයේයි, එහි තණපත් ආදියකින් වසන ලද්දාක් මෙන් වැසුණේයි, උච්ඡන්න යනු නදිය ආවරණය කරන භේදණ්ඩක් මෙනි. ආවට්ට යනු ජනයා හැසිරෙන මාර්ගයක් වසන්නාක් මෙන් වැසීමයි.

විනිබන්ධා මානවසෙන යනු මාන වශයෙන් නානාවිධ වූ ආරම්මණයන්හි බැඳී සිටියි. **පරාමට්ඨා දිට්ඨිවසෙන** යනු දෙසැටක් මිසදිටු වශයෙන්, **සිතින්** දැඩිව අල්ලාගන්නා ලදුයේයි, **විකෙඛපගතො උද්ධච්චවසෙන** යනු ආරම්මණයෙහි නොපිහිටීම් වශයෙන් චිත්ත වික්ෂේපයට පැමිණියේයි. **අනිට්ඨංගතො විචිකිච්ඡාවසෙන** යනු රත්නත්‍රයාදිය කෙරෙහි සංකා සංඛ්‍යාත විචිකිච්ඡාවෙන් නිගමනයට නොපැමිණියේයි. **ථාමගතො අනුසයවසෙන** යනු ඉවත් කිරීමට අපහසු අප්‍රහීණ (කාමරාගාදී) අනුශය වශයෙන් ස්ථිර බවට පැමිණියේයි.

උපගතො හුත්වා තිට්ඨති රූපූපායං යනු තෘෂ්ණා දෘෂ්ටි උපාය වශයෙන් රූපයට පැමිණ, අරමුණු කරගෙන, **විඤ්ඤාණං තිට්ඨමානං** යනු ඒ අරමුණෙහි රූපාරම්මණ විඤ්ඤාණය සිටියි. එම රූපාරම්මණය **රූපපපතිට්ඨං** යනු රූපයේ ම එල්බගෙන, රූපයම පිහිට කරගෙන, **නන්දූපසෙවනං** යනු ප්‍රීතිය සහිත වූ තණ්හා නැමති දියෙන් තෙමන ලද විඤ්ඤාණය, **වුද්ධි** යනු වෘද්ධිභාවයට **විරූළ්හිං** යනු වැඩීම් වශයෙන් මතුයෙහි වැඩීමට **වෙපුල්ලං** යනු තදාරම්මණ වශයෙන් විපුලත්වයට,

අත්ථිරාගො යනු අත්ථිරාග ආදිය ලෝභයට ම නම් වේ. එය වනාහි (රඤ්ජන) ඇලීම් වශයෙන් **රාගො** රාග නම්. සතුටුවීම් (නන්දන) වශයෙන් **නන්දි** නම්. තණ්හා ජනනය කිරීම් වශයෙන් **තණ්හා** යැයි කියනු ලැබේ. **පතිට්ඨිතං තත්ථ විඤ්ඤාණං විරූළ්හං** යනු කර්මය බලගන්වා ප්‍රතිසන්ධිය ඇදීමට සමත් වූ බැවින් පිහිටියේ ද වැඩුනේ ද වේ. **යත්ථ** ත්‍රෛභූමික සංසාර වට්ටයෙහි, භූමියකි. නැතහොත් සියලුම පූර්ව පදයන්හි මේ 'භූම්ම' යන්න ඇත. එහි **සංඛාරානං වුද්ධි** යනු මේ විපාක වට්ටයෙහි සිටියහුට, **ආයතිං** යනු සසරට මුල් වූ සංස්කාරයන් සඳහා කියන ලදී. **යත්ථ අත්ථි ආයතිං පුනබ්භවාභි නිබ්බත්ති** යනු යම්තැනක අනාගතයේ පුනර්භවයක්, නැවත ඉපදීමක් ඇත්ද, එතැනයි. එහි මුල් සූත්‍රය රූපාදී අරමුණු ලැබීම් වශයෙන්, කියන ලදී. දෙවන සූත්‍රය ඒ අරමුණේම සතුටුවීම් වශයෙන් කියන ලදී. තෙවන සූත්‍රය විඤ්ඤාණය පිහිටීම් වශයෙන් කියන ලදී. සිවුවන සූත්‍රය සතරවැදැරුම් ආහාර වශයෙන් ද කුසලාකුසල විඤ්ඤාණ පිහිටීම් වශයෙන්ද කියන ලදැයි දතයුතුයි.

යෙභුය්‍යෙන යනු බොහෝසෙයින්, **මුයහනති** යනු මුළාවට පැමිණෙති. **සම්මුයහනති** යනු විශේෂයෙන් මුළා වෙති. **සමපමුයහනති** යනු සියලුම

ආකාරයෙන් මුළා වෙති. නැතහොත් රූපාරම්මණය නිසා **මුයහනති** මුලා වෙති. ශබ්දාරම්මණය නිසා **සම්මුයහනති** විශේෂයෙන් මුළා වෙති. ස්පර්ශාරම්මණය නිසා **සම්පමුයහනති** සියලු ආකාරයෙන් මුළා වෙති. **අවිජ්ජාය අන්ධිකතා** යනු බුද්ධාදී අටතැන්හි නොදැනීම් හේතුවෙන්, අවිද්‍යාවෙන් අන්ධ කරන ලද, අන්ධිගතා යන පාඨය ද යෙදේ. 'අන්ධබවට පැමිණියාහු' යන අර්ථයයි. **පගාළෙහා** යනු පිවිසියේ. **ඔගාළෙහා** යනු යටි භාගයට (ගැඹුරට) පිවිසියේ. **අජෙඣාගාළෙහා** යනු ඉතා ගැඹුරට බැසගෙන, වැතිරී ඇතුළට පිවිස, විශේෂයෙන් පිවිසියේ. **නිමුගෙහා** යනු ඕගාළ්හයි. ශ්‍රවණ සංසර්ගයෙන් අජෙඣාගාළෙහා අජෙඣාගාළ්හ යි. වචන සංසර්ගයෙන් **නිමුගෙහා** නිමුග්ගයි. නැතහොත් සත්පුරුෂ සංසර්ගයෙන් තොරවූ හෙයින් **ඔගාළෙහා** ඔගාළ්හ යි. සද්ධර්ම ශ්‍රවණයෙන් තොර වූ හෙයින් **අජෙඣාගාළෙහා** අජ්ඣෙගාගාළ්හයි. ධර්මානුධර්ම ප්‍රතිපත්තියෙන් තොර වූ හෙයින් **නිමුගෙහා** නිමුග්ග යි.

විවෙකො යනු විවික්තයට හෝ විවේකයට පත්වීම, විවේකයයි. **තයො** යනු සංඛ්‍යාව දැක්වීමයි. **කාය විවෙකො** යනු කයින් විවේකයයි. ඉවත්වීමක් නොමැති බවයි. චිත්ත විවේකාදියෙහි ද මෙම නයයි. **ඉධ භික්ඛූ** යනු මේ සසුනෙහි, සසර භය දක්නා හෙයින් (එනම් වූ) භික්ෂු තෙමේ, **විවිත්තං** යනු ජනශූන්‍ය වූ, අල්ප ශබ්ද ඇති, අල්ප වූ ඝෝෂා ඇති යන අර්ථයි. මෙය සඳහාම විභංගයෙහි 'විවත්තනති සනතිකෙ වෙපි සෙනාසනං හොති තං ච අනාකිණ්ණං ගහට්ඨෙහි පබ්බජිතෙහි තං විවිත්තං' (විවිත්තං යනු ඉදින් සමීපයෙහි වුවද සේනාසනයක් වේද, එය ගිහියන්ගෙන් ද පැවිද්දන්ගෙන් ද ගැවසීගත්තේ නොවේ ද? එය විවිත්ත (විවේක සහිත) යැයි කියන ලදී.

මෙහි වැතිරෙතියි ද හිඳිතියි ද යන අරුතින් **සෙනාසනං** නම් වේ. මෙය ඇඳපුටු ආදියට අධිවචනයි. එහෙයින් 'සේනාසන'යැයි කීහු. ඇඳ ද සේනාසනයි. කොට්ට මෙට්ට ආදිය ද විහාරය ද අඩ්ඪයෝග (ගුරුළු පියාපත් වැනි වහල ඇති ගෙය) ද ප්‍රාසාදය ද (මහල් ගෙය) හම්මිය (සඳළු සහිත ගෙය) ද ගුහාව ද අටලු ගෙය ද එක්මහල් ගෙය ද ලෙන ද උණගොමුව ද රුක්මුල ද මණ්ඩපයද සේනාසන නම්. යම්තැනෙක සිට භික්ෂූහු පෙරළා යෙත් ද ඒ සියල්ල සේනාසනයි.

තවද 'විහාරය, අඩ්ඪයෝගය, ප්‍රාසාදය, හම්මියය, ගුහා' යන මේවා විහාර සේනාසන නමි. 'ඇඳ පුටු කොට්ට මෙට්ට' ආදිය ඇඳපුටු සෙනසුන් නමි. පාපිසි, සම්කඩ (පත්කඩ), තණඇතිරි, කොළ ඇතිරි' ආදිය සන්‍ථාර සේනාසන නමි. යම්තැනෙකට භික්ෂූහු පෙරළා යෙත් ද එය ඕකාස සෙනසුන් නමි. මෙසේ සෙනසුන් සතරවැදෑරුම් වේ. ඒ සියලුම සෙනසුන් මෙහි සේනාසනයයි ගන්නා ලදී. මෙහිදී වනාහි පක්ෂියකු හා සමාන වූ සිවුදිගින් පැමිණෙන භික්ෂුවට යෝග්‍ය වූ සේනාසන දක්වමින් **අරඤ්ඤං රුක්ඛමූලං** යනාදිය කීහ. එහි **අරඤ්ඤං** යනු 'ඉන්ද්‍රඛීලයෙන් පිටතට නික්මුණු කල්හි ඇති සියලු ප්‍රදේශය අරණ්‍ය නම් වේ' යැයි මෙසේ භික්ෂුණීන්ට සුදුසු යැයි, අරණ්‍ය යයි.' අරණ්‍ය නම් සෙනසුන දුනු පන්සියයකින් පිටතයයි දක්වන ලදී. මෙය වනාහි භික්ෂුවට යෝග්‍ය වූ අරණ්‍යයයි. එම අරණ්‍යයෙහි ලක්ෂණ විසුද්ධි මාර්ගයේ ධුතාංග නිර්දේශයේ දක්වන ලදී.

රුක්ඛමූලං යනු යම්කිසි ඝන වූ සෙවණ ඇති තනි රුක්මුලෙකි. **පබ්බතං** යනු ගල් පර්වතයකි. එහි වනාහි ගලේ පිහිටි දියපොකුණු ආදියෙන් දියකිස නිමවා, සිසිල් රුක් සෙවණෙහි හුන්නහුගේ සිත, නානා දිශාවෙන් හමන ඉතා සිහිල් සුළඟින්, පවන් සලනු ලබනවිට එකඟ වේ. **කන්දරං** යන්නෙහි **කං** යනු ජලයයි. එයින් දැදුරු වූ, ජලයෙන් බිඳුණු පර්වත ප්‍රදේශය කන්දර නමි. ඊට නිතම්බ යැයි ද නදීකුජ්ජ යැයි ද කියති. එහි රිදීපටක් හා සමාන වැලිතලා ඇත. නදිය මතුයෙහි මැණික් වියනක් බඳු වනගහණයයි. අත්කර බඳු දියකඳුරු වැගිරෙයි. මෙබඳු වූ දියකඳුරක බැස, පැන් බී, ගත සිසිල් කරගෙන වැලි ගොඩක් ගසා, ඒ මත පාංශුකූල චීවරය අසුනක් සේ පනවාගෙන වැඩහිඳ මහණදම් වඩන්නහුගේ සිත එකඟ වේ.

ගිරිගුහං යනු පර්වත දෙකක් අතර, නැතහොත් එකම පර්වතයක හෝ ඇති උමගක් හා සමාන මහා විවරයකි. සුසාන ලක්ෂණ විසුද්ධි මාර්ගයෙහි කියන ලදී. **වනපත්‍ථං** යනු ග්‍රාමන්තය ඉක්මවා, මිනිසුන්ගේ ගැවසීමක් හෝ සීසෑම්, වැපිරීම් ආදියක් නොමැති ස්ථානය වනපත්‍ථ නමි. එහෙයින් කියන ලදී. 'වනපත්‍ථ යනු දුරින් පිහිටි සෙනසුන්වලට අධිවචනයි.' ආදී වශයෙනි. **අබ්භොකාසෝ** යනු නිරාවරණ වූ තැනයි. එය අපේක්ෂා කරනුයේ සිවුරු කුටියක් සාදාගෙන වෙසෙයි. **පලාලපුඤ්ජං** යනු පිදුරු කුටියකි. මහත් වූ පිදුරු කුටියකින්, පිදුරු ගෙන පබ්භාර

(ඉදිරියට නෙරාගිය පර්වත පාර්ශ්වවල ඇති) ලෙන් හා සමාන ආවාස සාදාගනිති. රුක්ගොමු ආදියෙහි ද මත පිදුරු දමා එහි හිඳ මහණදම් කරති. මේ සියල්ල සඳහා 'කායෙන ච විවිතෙතා විහරති' (කයින් ද විවේකීව විහරණය කෙරෙති)යි කියන ලදී. හුදෙකලාව සක්මන් ඉටාගනියි. 'සක්මන් පවත්වති'යි කී නියායයි. **ඉරියති** යනු ඉරියවු පවත්වයි. **වත්තති** යනු ඉරියවු පැවැත්ම උපදවයි. **පාලෙති** යනු ඉරියවු පැවැත්ම ආරක්ෂා කරගනියි. **යපෙති** පෝෂණය කරයි. **යාපෙති** පෝෂණය කරවයි.

පඨමජ්ඣානං සමාපජ්ජනසස යනු කුසල ධ්‍යානයෙන් යුක්ත වූවහුගේ, **නීවරණෙහි චිත්තං විවිත්තං** යනු උපචාර සමාධිය මගින් නීවරණයන් කෙරෙන් වියුක්ත වූ සිත අර්පණා සමාධිය තුළදී මැනවින් විවික්ත වූයේ (මිදුණේ) නම් වෙති යි දක්වනු පිණිස, 'පඨමජ්ඣානං සමාපජ්ජනසස නීවරණෙහි චිත්තං විවිත්තං හොති' (ප්‍රථම ධ්‍යානයට සමවැදුනහුගේ සිත නීවරණයන් කෙරෙන් වියුක්ත වූයේ වේ.) යනුවෙන් කියන ලදී. ද්විතීය (දෙවන), තෘතීය (තෙවන), චතුර්ථ (සිවුවන) ධ්‍යානයනට සමවන්නවුන්ගේ සිත විතක්ක, විචාර, පීති, සුඛ, දුක්ඛ යන මෙයින් විවික්ත වීමද මෙම නයයි. **රූප සඤ්ඤාය** යනු කුසල (චිත්ත), විපාක (චිත්ත), කිරිය (චිත්ත) වශයෙන් (පංචමධ්‍යානයත් සමග පසක් වූ ධ්‍යානයන් තුනෙන් ගුණ කිරීමෙන් ලැබෙන) පසළොසක් වූ රූපාවචර ධ්‍යානයන් පිළිබඳ සංඥාවෙනි. **පටිඝසඤ්ඤා** යනු ඇස හා රූපය ආදී වශයෙන් ගැටීමෙන් උපන් කුසලාකුසල විපාක හා කිරිය වශයෙන් වූ දෙපස් විඤ්ඤාණ නම් පටිඝ සංඥාවෙන් ද **නානත්ත සඤ්ඤායා** යනු නානාවිධ අරමුණුවල පැවති සූසාළිසක් වූ කාමාවචර සංඥාවෙන් ද සිත විවික්ත වේ. ශූන්‍ය වේ. (මුක්ත වේ.)

ආකාසානඤ්චායතනං සමාපජ්ජනසස යන මෙහි, මෙයට අන්තයක් (කෙළවරක්) නැත්නුයි 'අනන්ත'යි, ආකාසය අනන්ත වේනුයි 'ආකාසානත්ත'යි, ආකාසානත්ත යනුම (ස්වාර්ථ තද්ධිත වශයෙන් ආකාසානත්ත්‍ය) 'ආකාසානඤ්ච' වේ. අධිට්ඨාන (ගැවසෙති'යි යන) අර්ථයෙන් 'දෙවානං දෙවායතනං' (දෙවියන් ගැවසෙන ස්ථානය දේවායතන) වන සේ, මේ සම්ප්‍රයුක්ත ධර්ම ධ්‍යානයට ආයතන වේනුයි ආකාසානඤ්චායතන නම් වේ. (පරිච්ඡින්න-ආකාස) කසිණයෙන් වෙන්කොට (හඳුනා) ගතයුතු (අනන්ත වූ) ආකාශය අරමුණුකොට ඇති ධ්‍යානයට මේ අධිවචනයි. එම ආකාසානඤ්චායතනයට සමවන්නහුගේයි.

එනම් කුශල ක්‍රියා ධ්‍යානයට සමවන්නහුගේය. **රූපසඤ්ඤාය** යන මෙහි සඤ්ඤා ශීර්ෂයෙන් රූපාවචර ධ්‍යාන වශයෙන් මෙන් ම තදාරම්මණ වශයෙන් ද රූපාවචර ධ්‍යානය ද 'රූප'යයි කියනු ලැබේ. **රූපී රූපානි පසසති** යනාදියෙහි ය. (රූප ඇත්තේ රූපයන් දකියි.) එහි අරමුණ ද ('රූප' යයි කියන ලදී.) **බහිද්ධා රූපානි පසසති සුවණ්ණදුබ්බණ්ණානි** යනාදියෙහිය. (මනා හා නොමනා පැහැ ඇති බාහිර රූපයන් දකියි.) එහෙයින් මෙහි, රූප සඤ්ඤා, 'රූපසඤ්ඤා' යනුවෙන් මෙසේ සඤ්ඤා ශීර්ෂයෙන් රූපාවචර ධ්‍යානයට 'රූපසඤ්ඤා' යන මේ අධිවචනයි. මෙයට (මේ ධ්‍යානයට) රූපයේ සංඥාව ඇත්තේනුයි 'රූප සඤ්ඤා' යනු මේ ධ්‍යානයට නාම යැයි කී නියායි. මෙසේ පඨවි කසිණාදී භේද ඇති තදාරම්මණයට (රූපාවචර ධ්‍යානයට අයත් අරමුණට) ද මේ අධිවචනයයි දතයුතුයි.

මේ කුසල, විපාක, ක්‍රියා වශයෙන් (ඉහත කී පරිදි) පසළොස් වැදෑරුම් වූ, ධ්‍යාන සංඛ්‍යාත සංඥාවෙන් ද, මේ පඨවි කසිණාදී වශයෙන් (ආලෝක, පරිච්ඡින්නාකාස යන දෙක හැර) අටවැදෑරුම් වූ අරමුණු සංඛ්‍යාත රූප සංඥාවෙන් ද **පටිඝ සඤ්ඤාය** යනු චක්ඛු ආදී වස්තූන්ගේ ද, රූපාදී ආරම්මණයන්ගේ ද ගැටීමෙන් උපන්නා වූ සංඥාවෙන්, රූප සංඥාදීන්ට මේ අධිවචනයි. කියන ලදමැයි. 'එහි පටිඝ සඤ්ඤා යනු කවරේ ද? රූප සඤ්ඤා, සද්ද සඤ්ඤා, ගන්ධ සඤ්ඤා, රස සඤ්ඤා හා ඵොට්ඨබ්බ සඤ්ඤා යන මොහු පටිඝ සඤ්ඤාවෝ යැයි කියනු ලැබෙති. කුසල විපාක පසෙකැයිද අකුසල විපාක පසෙකැයි ද යන මේ පටිඝ සංඥාවෙනි. **නානත්ත සඤ්ඤාය** යනු නානාවිධ වූ ගෝචරයන් (අරමුණු) කෙරෙහි පැවැත්තා වූ සංඥාවෙන් හෝ නානාප්‍රකාර වූ සංඥාවෙනි. කියන ලදමැයි. එහි නානත්ත සඤ්ඤා යනු කවරේද? (ධ්‍යානයන්ට) නො සමවන් මනෝධාතුවෙන් යුක්ත වූවහුගේ හෝ මනෝවිඤ්ඤාණ ධාතුවෙන් යුක්ත වූවහුගේ සඤ්ඤාව, සංජානනය, සංජාති තත්ත්වය යන මේ නානත්ත සඤ්ඤා යැයි කියනු ලැබේ' යනුවෙන් මෙසේ විභංගයෙහි බෙදා දක්වන ලදී. මෙහි එම සඤ්ඤාවෝ අභිප්‍රේතයහ. ධ්‍යානයන්ට නොසමවන්නහුගේ මනෝධාතු මනෝ විඤ්ඤාණ ධාතූන්ගෙන් සංග්‍රහ කරන ලද රූප, ශබ්දාදී භේද ඇති සඤ්ඤාවෝ නානත්වයෙහි, නානා ස්වභාව ඇති ගෝචරයන් (අරමුණු) කෙරෙහි පවත්නාහුය.

යම්හෙයකින් මේ කාමාවචර කුසල සංඥා අට ද අකුසල සංඥා දොළොසද කාමාවචර කුසල විපාක සංඥා එකොළොසද අකුසල විපාක සංඥා දෙක ද කාමාවචර ක්‍රියා සංඥා එකොළොසදැයි යන සූසාළිස් සංඥාවෝ මෙසේ නානාවිධව, නානා ස්වභාව ඇතිව, ඔවුනොවුන්ට අසමානව පවත්නාහු ද, එහෙයින් 'නානත්ත සංඥා' යැයි කියන ලදහ. ඒ නානත්ත සංඥාවෙනි. **විවිත්තං හොති** යනු ආකාසානඤ්චායතනයට සමවන්නහුගේ ධ්‍යාන සිත රූපසංඥා, පටිඝ සංඥා, නානත්ත සංඥා සංඛ්‍යාත සංඥාවන්ගෙන් විවික්ත වූයේ, තොර වූයේ, බැහැර වූයේ වේ. **විඤ්ඤාණඤ්චායතනං** යනු මේ විඤ්ඤාණය ම ගැවසෙතැයි යන අර්ථයෙන් මෙම ධ්‍යානයට ආයතන වන්නේනුයි විඤ්ඤාණඤ්චායතන නමි. ආකාශයෙහි පැවති විඤ්ඤාණය අරමුණුකොට ඇති ධ්‍යානයට මේ අධිවචනයි. ඒ ධ්‍යානයට සමවන්නහුගේ සිත පළමු කියන ලද ආකාර ඇති ආකාසානඤ්චායතන සංඥාවෙන් විවික්ත (මිදුණේ) වෙයි. **ආකිඤ්චඤ්ඤායතනං** යන මෙහි, මේ (ධ්‍යානයට) කිසිවක් නැත්තේනුයි 'අකිඤ්චන' නම් වේ. යටත් පිරිසෙයින් භංග මාත්‍රයක් (බිඳීගිය කොටසක්) හෝ මෙම ධ්‍යානයට ඉතිරිව නැතැයි කී නිසායි. අකිඤ්චනයෙහි ස්වභාවය (තද්ධිත හෙයින්) 'ආකිඤ්චඤ්ඤ' නමි. ආකාසානඤ්චායතන විඤ්ඤාණය පහවී යාමට මේ අධිවචනයි. ඒ ආකිඤ්චඤ්ඤකය ගැවසීමේ අර්ථයෙන් මෙහි ඇත්නුයි 'ආකිඤ්චඤ්ඤායතන' නමි. ආකාශයෙහි පැවති විඤ්ඤාණපගමය (විඤ්ඤාණය පහවී යාම) අරමුණු කොට ඇති ධ්‍යානයට මේ අධිවචනයි. ඒ ආකිඤ්චඤ්ඤායතනයට සමවන්නහුගේ සිත ඒ විඤ්ඤාණඤ්චායතන සංඥාවෙන් විවික්ත වේ. (මිදේ.)

නෙවසඤ්ඤානාසඤ්ඤායතනං යන මෙහි වනාහි, යම් සංඥාවක් නොමැති වීමෙන් එය, 'නේවසංඥායතන'යි කියනු ලැබේද, විධි වූ පරිදි පිළිපන්නහුට එම සංඥාව වේ. එය දක්වනු පිණිස විභංගයෙහි, පළමුකොට 'නෙවසඤ්ඤී නාසඤ්ඤී' යැයි මතුකොට දක්වා, 'එම (පළමු කී) ආකිඤ්ඤඤ්චායතනය ම සත්තා (ඇති බව)* වශයෙන් මෙනෙහි කරයි. සංස්කාර වශයෙන් ශ්ලේෂ වී ඇති (ආකිඤ්චඤ්ඤායතන) සමාපත්තිය වඩයි. එහෙයින් 'නෙවසඤ්ඤී නාසඤ්ඤී' (සංඥාවක් ඇත්තේ ද සංඥාවක් නැත්තේ ද නොවන) යැයි කියනු ලැබේ' යනුවෙන් කියන ලදී. එහි

---

* 'සත්ත' යනු 'ශාන්ත' යන අරුත ද 'ඇත' යන අරුත ද 'සත්ජනයා' යන අරුත ද දෙයි. මෙහි ඇත, සත්ජනයා යන අරුත්වල යෙදෙනුයේ අස් භූමි ධාතුවෙන් ලැබෙන වර්තමාන කෘදන්ත පදය වන 'සත්ත' ශබ්දයයි.

සන්තතො මනසිකරොති යනු ඒකාන්තයෙන් මේ සමාපත්තිය ඇත්තේමය. යම් (සමාපත්තියක්) කෙරෙහි වනාහි අසත්තාව (නැති බව) ද අරමුණු වශයෙන් මෙනෙහි කොට වාසය කෙරෙති'යි, මෙසේ ඇතැයි යන අරමුණ කෙරෙහිම (නා සත්තා ති) නැතැයි යනු ද මෙනෙහි කරයි. එම නේවසඤ්ඤානාසඤ්ඤා යතනය අර්පණාවට නගා හුන්නහුගේ ධ්‍යාන චිත්තය එම ආකිඤ්චඤ්ඤායතන සඤ්ඤාවෙන් ශූන්‍ය (හිස්) වේ.

සොතාපන්නස්ස යනු සෝවාන් ඵලයට පත්වූවහුගේ යි. **සක්කාය දිට්ඨියා** යනු විසිවැදෑරුම් සක්කාය දෘෂ්ටියෙනි. **විචිකිච්ඡාය** යනු අටතැන්හි සැකයෙනි. **සීලබ්බත පරාමාසා** යනු (තීර්ථකයන් විසින් දක්වනු ලබන) ශීලයෙන්, ව්‍රතයෙන් ශුද්ධිය වෙතැයි යන ග්‍රහණයෙන් උපන් දෘෂ්ටියෙනි. දිට්ඨානුසයා යනු ප්‍රහීණ නොවීම් අර්ථයෙනි. සන්තානය තුළ ඉතිරි වී, සැඟවී පවත්නා දෘෂ්ටීන්ගෙනි. **තදෙකට්ඨේහි ච** යනු එකී සක්කාය දිට්ඨි ආදී වූ ක්ලේශයන් හා සමග එක්ව සිටි (අවශේෂ) ක්ලේශයන්ගෙනි. ක්ලේශයෝ ශ්‍රෝතස (සෝතාපත්තියට) වෙත පැමිණෙනතුරු තැවීම් හා බාධක ඇති කරති. එම සක්කාය දිට්ඨි ආදී ක්ලේශයන් කෙරෙන් විවික්ත වූයේ (මිදුණේ) ශූන්‍ය (හිස්) වූයේ ද වෙයි. මෙහි **තදෙකට්ඨං** යනු මෙහි ඒකට්ඨ (එක්ව විසීම්) පහානෙකට්ඨය, සහජෙකට්ඨය යැයි දෙයාකාර වේ.

අපාය ගමනට හේතුවන ක්ලේශයෝ සෝවාන් මාර්ගයෙන් යම්තාක් ප්‍රහීණ නොවී පවතිත් ද ඒතාක් දෘෂ්ඨි විචිකිච්ඡාවන් හා සමග එකම පුද්ගලයකු තුළ සිටියාහු යැයි පහානෙකට්ඨ නම් වේ. දශවිධ ක්ලේශයන් අතුරෙන් මෙහි සක්කාය දිට්ඨි විචිකිච්ඡා යන දෙක පමණක් අදහස් කෙරිණි. අනුසයන් අතුරෙන් දිට්ඨානුසය විචිකිච්ඡානුසය යන දෙක ආයේය. සෙසු අපායගාමිනී ක්ලේශයන් වන ලෝභය, ද්වේෂය, මෝහය, මානය, ථීනය, (මැලිබව), උද්ධච්චය (විසිරුණු ස්වභාවය), පවට ලැජ්ජා නොවීම, පවට බිය නොවීම යන අට දිට්ඨි විචිකිච්ඡා දෙකත් සමගම පහානේකට්ඨ වශයෙන් අනුශය දෙකත් සමගම සෝවාන් මාර්ග ලාභයෙන් ප්‍රහීණ වෙයි. නැතහොත් රාග, ද්වේෂ, මෝහ ප්‍රමුඛ වූ කෙලෙස් එක්දහස් පන්සියය අතුරින් සක්කාය දිට්ඨිය සෝවාන් මාර්ගයෙන් ප්‍රහීණ කරනවිට, එම දිට්ඨියත් සමගම විචිකිච්ඡාව ද ප්‍රහීණ වේ. දිට්ඨානුසය හා විචිකිච්ඡානුසයන් සමග අපායගාමිනීව සියලු කෙලෙස්හු පහානෙකට්ඨ වශයෙන් ප්‍රහීණ වෙති. සහජෙකට්ඨ යනු සක්කාය දිට්ඨියත්, විචිකිච්ඡාවත් සමග එක් එක් සිතෙහි සිටි ඉතිරි ක්ලේශයෝ යි.

සෝවාන් මාර්ගයෙන් දිට්ඨි සම්ප්‍රයුක්ත අසංඛාරික සිත් දෙක ප්‍රහීණ වන කල්හි, ඒ දෙක සමග උපන් ලෝභය, ද්වේෂය, මෝහය, උද්ධච්චය, අහිරිකය, අනොත්තප්පය යන මේ කෙලෙස් සහජෙකට්ඨ වශයෙන් ප්‍රහීණ වේ. දිට්ඨි සම්ප්‍රයුක්ත සසංඛාරික සිත් ප්‍රහීණ වන කල්හි ඒ දෙසිත සමග උපන් ලෝභය, මෝහය, ථීනය, උද්ධච්චය, අහිරිකය හා අනොත්තප්පය යන මේ කෙලෙස් සහජෙකට්ඨ වශයෙන් ප්‍රහීණ වේ. විචිකිච්ඡා සහගත සිත ප්‍රහීණ වන කල්හි, ඒ සමග උපන් මෝහය, උද්ධච්චය, අහිරිකය, අනොත්තප්පය යන මේ කෙලෙස් සහජෙකට්ඨ වශයෙන් ප්‍රහීණ වේ. දෙවැදෑරුම් ඒකට්ඨයන්ගෙන් **කිලෙසෙහි චිත්තං විචිත්තං හොති** යනු කෙලෙසුන්ගෙන් මාර්ග සිත වෙන් වේ. ඵල සිත විවේකයට, වියුක්ත බවට, තිබූ තැනින් පහවීමට, ශූන්‍ය බවට පත් වේ යන අර්ථයයි. **සකදාගාමිස්ස ඔලාරිකා කාමරාග සඤ්ඤාජනා** යනු ඕලාරික (දළ) වූ, එනම් කායද්වාර-වාග් ද්වාර සීමාවන් ව්‍යතික්‍රමණය (උල්ලංඝනය) කිරීමේ හේතුවෙන් තර වූ මෛථුන රාග සංඛ්‍යාත වූ සංයෝජනයෝ. එය වනාහි 'කාම භවයෙහි සත්ත්වයා බැඳ තබති'යි යන අර්ථයෙන් සංයෝජන යැයි කියනු ලැබේ.

පටිඝ සඤ්ඤාජනා යනු ව්‍යාපාද සංයෝජනයෝ යි. එය අරමුණෙහි ගැටෙතියි යන අරුතින් පටිඝ යැයි කියනු ලැබේ. ඒවා බලවත් වීමෙන් සන්තානයෙහි වැතිර පවතිති යි අනුශය නම් වේ. **අනුසහගතා** යනු සූක්ෂම වූ (සියුම්) කාමරාග සංයෝජනය ද පටිඝ සංයෝජනය ද අනුසහගත නම් වේ. **කාමරාගානුසයා පටිඝානුසයා** යනු ප්‍රහීණ නොවූහයි යන අරුතින් සන්තානයෙහි අප්‍රකට ව, සූක්ෂමව පවතින කාමරාග හා පටිඝ අනුශයෝ, **තදෙකට්ඨෙහි ච** යනු ඉහත කියන ලද අර්ථ ඇති දෙවැදෑරුම් ඒකට්ඨයනට ඇතුළත් කෙලෙස්වලින් සිත වෙන් වේ. මිදේ. ශූන්‍ය වේ. **අරහතෝ** යනු කෙලෙස් සතුරන් නැසූ බැවින් 'අර්හත්' යැයි ලැබූ නම් ඇති, **රූපරාගා** යනු රූප භවය කෙරෙහි පවතින ඡන්දරාගය (දැඩි කැමැත්ත)යි. **අරූපරාගා** යනු අරූපභවය පිළිබඳව ඇතිවන ඡන්දරාගයයි. **මානා** යනු අර්හත් මාර්ගයෙන්ම නැසිය යුතු මානයමයි. එසේම උද්ධච්ච, අවිජ්ජා, මාන යන අනුශයෝ ද අර්හත් මාර්ගයෙන් ම නැසිය යුත්තාහුය. මේවා අතුරින් උන්නති (ඉහළට නැමුණ) ලක්ෂණය මානයයි. නොසන්සිඳීමේ, නොසන්සුන් බවෙහි ලක්ෂණය උද්ධච්චයයි.

අන්ධ බව, නොදැනීම් ලක්ෂණය අවිද්‍යාවයි. රූපරාග, අරූපරාග වශයෙන් පවත්නාහු භවරාගානුශයෝ ය. **තදෙකට්ඨෙහි ච** යනු ඔවුන් සමග එක්ව සිටියා වූ කෙලෙසුන්ගෙනි. **බහිද්ධා ච සබ්බනිමිත්තෙහී** යනු අභ්‍යන්තර චිත්ත සන්තානයෙහි වූ අකුසල ස්කන්ධය වෙන්කොට ගැනීමෙන් බාහිර යැයි (කියන ලද) සම්මත වූ, අභ්‍යන්තරය හැර පිටත පවත්නා සියලු සංස්කාර නිමිත්තවලින් ද මාර්ග චිත්තය (විවික්ත) වෙන් වේ. පහ වේ. ඉවත් වේ. ඵල චිත්තය ද වෙන් වූයේ ඉවත් වූයේ වේ. එහිදී කෙලෙස් පිළිවෙළින් ද මාර්ග පිළිවෙළින් ද යන දෙපරිද්දෙන් ම අනුශයයන්ගේ නැතිවී යාම දතයුතුයි.

කෙලෙස් පිළිවෙළින් (කිලේස පටිපාටිය) වනාහි, කාමරාගානුසය හා පටිඝානුසයන්ගේ අභාවය තුන්වන මාර්ගයෙහි සිද්ධ වේ. මාන අනුශය විනාශය සිවුවන මාර්ගයෙන් ද දිට්ඨානුසය විචිකිච්ඡානුසයන්ගේ විනාශය පළමු මාර්ගයෙන් ද භවරාගානුශය අවිජ්ජානුශයයන්ගේ විනාශය සිවුවන මාර්ගයෙන් ද සිද්ධ වේ. මාර්ග පිළිවෙළින් (මඟ පටිපාටිය) වනාහි, පළමු මාර්ගයෙන් දිට්ඨානුසය හා විචිකිච්ඡානුසයයන්ගේ අභාවය වේ. දෙවැනි මාර්ගයෙන් කාමරාගානුසය හා පටිඝානුසයයන්ගේ තුනීවීම ද, තෙවැනි මාර්ගයෙන් ඒ දෙක සර්වප්‍රකාරයෙන් ම විනාශවීම ද සිවුවන මාර්ගයෙන් මානානුසය භවරාගානුසය හා අවිජ්ජානුසයයන්ගේ අභාවය වේ.

චිත්ත විවෙකො යනු මහග්ගත හා ලෝකෝත්තර සිත් කෙලෙසුන්ගෙන් මිදී ශූන්‍යව හිස්ව පවත්නා බවයි යන අර්ථයයි. **උපධි විවෙකො** යනු කෙලෙස්, ස්කන්ධ, අභිසංස්කාර යන උපධීන්ගෙන් ශූන්‍ය වූ බවයි. පළමුව උපධීන් දක්වනු සඳහා **උපධිවූවනති කිලෙසා ච** යනාදිය කීහ. යමෙකුට රාගාදීහු උපදිත් ද ඔහුට තැවීම් ඇති කරත් ද බාධක ඇතිකරත්දැයි යන අරුතින් ක්ලේශයෝ ද උපාදාන වශයෙන් ගෝචර වූ රූපාදී වූ පංචස්කන්ධයෝ ද උපාදාන වශයෙන් හටගත් පුඤ්ඤ, අපුඤ්ඤ හා අනෙඤ්ජාභි සංස්කාරයෝ ද උපධි නම් වෙති. **අමතං** යනු මොහුට මරණ නම් වූ අමෘතභාවය නැත්තේනුයි 'අමත' නම් වේ. එසේම කෙලෙස් නම් විෂට ප්‍රතිවිරුද්ධ වූ බැවින් ද මරණයක් නැත්තේනුයි අමත නම් වේ. 'සංසාර යෝනීන්හි ගති, උත්පත්ති, විඤ්ඤාණ ස්ථිති, සත්තාවාසයන්හි බඳවති'යි, 'නැඹුරු කරවති'යි යන අරුතින් තණ්හාව 'වාණ' යැයි කියනු ලැබේ. එහි ඒ තණ්හාව නැතැයි 'නිබ්බාණ' (නි+වාණ) නම් වේ.

වවකටඨකායානං යන ගණ සංගණිකාවෙන් (සමූහ වාසයෙන් වෙන් වූ) සිරුරු ඇත්තවුන්ගේ **නෙක්ඛම්මාභිරතානං** යනු නෙක්ඛම්මයෙහි කාමාදියෙන් නික්ම ප්‍රථම ධ්‍යානාදියෙහි සිත් ඇලවූවන්ගේ, නෛෂ්ක්‍රම්‍යය වෙත නැඹුරු වූවන්ගේ, **පරමවොදානප්පත්තානං** උතුම් පිවිතුරු බවනම් ඵලයට පැමිණ සිටියවුන්ගේයි. උපක්ලේශයන්ගෙන් තොර වූ බැවින් පිරිසිදු සිත් ඇත්තවුන්ගේයි. කෙලෙසුන්ගෙන් මිදුණු බැවින් අතිශය පිරිසිදු භාවයට පත්වූවන්ගේයි. විෂ්කම්භන ප්‍රහාණ වශයෙන් පිරිසිදු සිත් ඇත්තන්ගේයි. සමුච්ඡේද ප්‍රහාණ වශයෙන් අතිශය පාරිශුද්ධභාවයට පත්වූවන්ගේයි යනුවෙන් ද ඇතැමෙක් අර්ථ කියති. **නිරූපධීනං** යනු දුරු වූ උපධි ඇත්තවුන්ගේයි. **විසංඛාරගතානං** යනු සංස්කාර ආරම්මණය අත්හැර, සංස්කාර හෙවත් රැස්කිරීම දුරුකළවුන්ගේයි. නිවනට අරමුණු වශයෙන් පැමිණියවුන්ගේයි. **විසංඛාරගතං චිත්තං** යන මෙහි ද නිවනම 'විසංඛාර' යැයි කියන ලදී.

විදූරෙ යනු ඉතා දුරෙහිය. **සුවිදූරෙ** යනු අතිශයින් දුරෙහිය. **නසනතිකෙ** යනු නො සමීපයෙහිය. **න සාමනතා** යනු එකත්පසෙක නොවූ, **අනාසනෙන** යනු අතිශයින් සමීපයෙහි නොවේ. **වවකටෙඨ** යනු නුදුරෙහි, බැහැර නොව සිටියේයි, යන අර්ථයයි. **තාදිසො** ඒ හා සමාන වූයේයි. **තසසඨිතො** යනු ඒ ආකාරයෙන් සිටියේයි. **තපපකාරො** යනු ඒ ප්‍රකාරයෙන් සිටියේයි. **තප්පටිභාගො** ඒ කොටසෙහි වූයේ, නැතහොත් ආත්මභාව නැමති ගුහාවෙහි ලැගි හෙයින් **තාදිසො** 'තාදිස' නම් වේ. කෙලෙසුන්ගෙන් වැසුණු බැවින්, **තසසණ්ඨිතො** තස්සණ්ඨිත නම් වේ. මෝහයෙහි ගිලුණු බැවින් **තප්පකාරො** තප්පකාර නම් වේ. ත්‍රිවිධ විවේකයන්ගෙන් දුරු වූ බැවින් **තප්පටිභාගො** තප්පටිභාග නම් වේ, යනුවෙන් ඇතැමෙක් අර්ථ කියති.

දුප්පභායා යනු සුවසේ ප්‍රහාණය කළ හැකි නොවේ. **දුව්වයා** යනු සුවසේ අත්හැරීමට නොහැක, **දුප්පරිච්චජා** යනු සර්වප්‍රකාරයෙන් ම අත්හැරීමට නොහැක. **දුනනිම්මදයා** මදයෙන් තොර කිරීමට, නිර්මද කිරීමට නොහැකිය. **දුබ්බිනිවෙඨයා** යනු ලිහාලීම, මුදාලීමට නොහැකිය. **දුත්තරා** යනු එතෙර වී, ඉක්මවාලීමට නොහැකිය. **දුප්පතරා** යනු විශේෂයෙන් එතෙර වීමට නොහැකිය. **දුසසමතික්කමා** දුකසේ අතික්‍රමණය කළ හැකි වේ. **දුබ්බනිවත්තා** නැවැත්වීම දුෂ්කරය. නැතහොත් ප්‍රකෘති වශයෙන්

අත්හැරීම දුෂ්කරය. විකෘති වශයෙන් නිර්මද බවට පත්කිරීම දුෂ්කරය. නාග පාශයක් මෙන් ලිහාලීමට නොහැකිය. ග්‍රීෂ්ම කාලයෙහි නිරුදක කාන්තාරයක් මෙන් **දුතතරා දුපපතරා** තරණය කළ නොහැකි ය. ව්‍යාඝ්‍රාදීන්ගෙන් ගැවසුණු වනයක් මෙන් තරණය කළ නොහැකිය. **දුසසමතිකකමා** මුහුදු රළ මෙන් **දුබ්බිති වත්තා** නැවැත්විය නොහැකි ය' යනුවෙන් ද ඇතැමෙක් අර්ථ කියති.

මෙසේ පළමු ගාථාවෙන් 'එබඳු වූ පුද්ගලයන් ත්‍රිවිධ විවේකයෙන් දුරුවෙතියි නිගමනය කොට, නැවත මෙබඳු පුද්ගලයන්ගේ ස්වභාවය ප්‍රකට කරමින් 'ඉච්ඡානිදානා' යන දෙවන ගාථාව වදාළහ. එහි **ඉච්ඡා නිදානා** යනු තණ්හාව හේතුකොට ඇති, **භාවසාතබද්ධා** යනු සුබවේදනාදී භව සුවයෙහි බැඳුණාහු, **තෙ දුපපමුඤ්චා** යනු යම් භව සුඛයට වස්තු වූ ධර්මයෝ වෙත් ද එහි බැඳුණු තණ්හාව නිදාන කරගත් ඒ සත්ත්වයෝ දුකසේ මිදිය යුත්තෝ වෙති. **නහි අඤ්ඤමොකඛා** යනු අනිකකු මිදවීමට නොහැකි වෙති. නැතහොත් මෙය කරණවිබත් වචනයි. 'ඒ සත්ත්වයෝ දුකසේ මිදිය යුත්තෝ වෙති. කවර හෙයින් ද? අනිකකු විසින් මිදවිය හැක්කෝ නොවන හෙයිනි. එම සත්ත්වයෝ (සසර දුකින්) මිදෙතොත්, ස්වශක්තියෙන් ම මිදිය යුත්තාහුය' යනු මෙහි අර්ථයි.

පච්ඡා පුරෙවාපි අපෙකඛමානා යනු අනාගතයෙහි වසන්නා වූ අතීතයෙහි වූ කාමයන් අපේක්ෂා කරමින්, **ඉමෙව කාමෙ පුරිමෙව ජප්පං** යනු මේ වර්තමානයෙහි ඇති කාමයන් හෝ පළමු කී අතීතානාගත කාමයන් හෝ බලවත් තණ්හාවෙන් ප්‍රාර්ථනා කරමින්, මෙකී දෙපදය **තෙ දුපපමුඤ්චා නහි අඤ්ඤමොකඛා** යන මේ පදය සමග ම සම්බන්ධ කර අර්ථ දතයුතුයි.

(එසේ පද සම්බන්ධය නොකොට) 'අපේක්ෂා කරන්නාහු කුමක් කරත්ද?යි හෝ කුමක් කළාහුද'යි නොදක්වන්නාහු ය. (නොපැහැදිලිය යන අර්ථයි.) **භවසාතබද්ධා** යනු භවයෙහි සැපය. 'භවසාත' නම්. ඒ භව සුඛයෙහි, සුඛාශ්වාදයෙහි බැඳී සිටියාහු වේ. එය බෙදා දැක්වීම පිණිස **එකං භවසාතං, සුඛාවෙදනා** යනාදිය දැක්වීය. යොවුන් බව **යොබඛඤ්ඤං** යොබ්බඤ්ඤයයි. නීරෝගී බව **ආරොගඃං** ආරෝග්‍යයයි. ජීවිතින්ද්‍රිය පවත්වා ගන්නා ස්වභාවය **ජීවිතං** ජීවිතයයි. ලාභො යනු සිවුපස ලාභයයි. **යසො** යනු

පිරිවරයි. **පසංසා** යනු කීර්තියයි. **සුඛං** යනු කායික, චෛතසික සුඛයයි. **මනාපිකා රූපා** යනු මන වඩන රූපයයි. සෙසු පදයන්හි ද මෙම නයයි.

චක්ඛු සම්පදා යනු පැහැදිලිව පෙනෙන ඇස් ඇති බවයි. මාගේ චක්ෂුඃ සම්පත්තිය මැණික් විමනෙක එසවූ සී මැදුරු කවුළුවක් මෙන් වැටහෙති'යි ඇසෙන් උපන් සුඛාශ්වාදය සඳහා 'චක්ඛු සම්පදා' යැයි කියන ලදී. සෝත සම්පදාදියෙහි ද මෙම නයයි. සුඛ වේදනාවෙන් සත්ත්වයෝ බැඳුණාහුය. විශේෂයෙන් බැඳුණාහුය යනු (-පෙ- විබද්ධා) මූලපදයයි. **විබද්ධා** යනු විවිධාකාරයෙන් බැඳුණාහුය. **ආබද්ධා** යනු විශේෂයෙන් මුල සිට බැඳුණාහුය. **ලගනා** යනු අරමුණ සමග ඇලුණාහුය. **ලගිතා** නාග දන්තයෙක (බිත්තියේ ගැසූ කොක්කෙක) එල්බන ලද කළයක් මෙන් එල්බුණාහුය. මෙහි නොකියන ලද 'සතෙතා විසතෙතා' ආදී පදයන්හි අර්ථ මුලදී පැවසූ අයුරින්ම ගතයුතුයි. **නහි අඤ්ඤමොකඛා** යනු අනුන් විසින් නො මුදවනු ලබති. **තෙවා භවසාතවත්ථූ දුපපමඤ්ඤා** යනු භවයේ සුඛාශ්වාදයට වස්තු වූ ධර්මයෙන් හෝ මිදීමට අපහසුය. **සතතා වා එතෙතා දුමෙමාචයා** යනු නැතහොත් සත්ත්වයෝම හෝ මේ භවාශ්වාද වස්තූන්ගෙන් මිදීම පහසුවෙන් නොකළ හැක්කාහුය. **දුරුඦරා** යනු ආශ්වාද වස්තූන්ගෙන් දුරුවීම අපහසුය. **දුසස මුදඛරා** යනු හාත්පසින්ම බිඳීගිය ඉවුරු ඇති නිරා වළක වැටුණකු මෙන් උඩුකුරුව ගොඩඒමට නොසමත් වෙති. **දුවුටඨාපයා** යනු එසවීමට ඉතා අපහසු ය. **දුසසමුටඨාපයා** යනු සූක්ෂ්ම ආත්ම භාවයක් පොළවෙහි පිහිටුවීම මෙන් ඔසවා තැබීම අතිශය දුෂ්කරය.

ඔවුහු **අතතනා පලිපපළිපනනා** යනු ගැඹුරු මඩ වගුරෙක හිස දක්වාම ගිලුණාහු **න සකෙකානති පරං පලිපපළිපනනං උදධරිතුං** යනු එසේම (මඩෙහි) ගිලුණු අනිකෙකු අතින් හෝ හිසින් හෝ ගෙන ගොඩ තැබීමට නොසමත් වෙති. **සො වත වුඤ** යන මෙහි **සො** යනු කිවයුතු ආකාර ඇති පුද්ගලයා දක්වන නිද්දේස වචනයි. එහි **යො** යන මේ උද්දේස වචනය ගෙන, 'යො අතතනා පලිපපළිපනෙනාව සො වත වුඤ පරං පලිපපළිපනනං උදධරිසසතී'ති (යමෙක් තමා මඩෙහි ගිලී සිටිමින්ම, වුන්දය හෙතෙමේ මඩෙහි ගිලුණු අනිකෙකු ගොඩ ගන්නේය) යනුවෙන් මෙසේ සෙසු පද සම්බන්ධය දතයුතුයි.

පලිපපළිපනනා යනුවෙන් ගැඹුරු මඩෙහි ගිලුණු තැනැත්තා කියනු ලැබේ. චුන්දය! යම්සේ යම්කිසි පුරුෂයෙක් තෙමේ නාසිකාග්‍රය දක්වා ගැඹුරු මඩවළෙක ගැලී සිටිනුයේ එසේම ගිලුණු අනිකෙකු අතින් හෝ හිසින් ගෙන ගොඩ කරන්නේය යන මෙකරුණ, **නෙතං යානං විජජති** යනු යම් ලෙසකින් හෙතෙමේ ඔහු ඔසවා ගොඩ තබන්නේය යනු සිදුවිය හැකි කරුණක් නොවේමය.

අදනෙතා අවිනීතො අපරිනිබ්බුතො යන මෙහි සන්සුන් නොවූ බැවින් අදන්ත (නො දැමුණේය.) නො හික්මවන ලද විනය ඇති බැවින් අවිනීත (නො හික්මුණේ) ය. නොනිවන ලද කෙලෙස් ඇති බැවින් අපරිනිබ්බුත (නො පිරිනිවියේ) යැයි දතයුතුයි. එබඳු වූ ඒ පුද්ගලයා **පරං දමෙසසති** යනු අනිකෙකු සන්සුන් කරවති යි **විනෙසසති** යනු 'ත්‍රිවිධ ශික්ෂාවන්හි හික්මවති'යි **පරිනිබ්බාපෙසසති**, 'ඔහුගේ කෙලෙස් පිරිනිවීමට පත් කරවති'යි යන්න (සිදු නොවේමය.)

නත්ථඤ්ඤා කොචි යනු මිදවීමට සමත් අනික් කිසිදු පුද්ගලයෙක් නැත. **සකෙන ථාමෙන** යනු තමාගේ ඤාණ ශක්තියෙන් බලෙන යනු ඤාණ බලයෙන් **විරියෙන** යනු ඤාණ සම්ප්‍රයුක්ත චෛතසික වීර්යයෙන් **පුරිස පරකකමෙන** යනු ඒ ඒ තැන් මඩින මහත් වූ වීර්යයෙන් **නාහං සහිසසාමි** යනු මම නොසමත් වෙමි. නොහැක්කෙමි. වෑයම් නොකරන්නෙමියි කී නියායි. **පමොචනාය** යනු මුදවනු පිණිස ය. **කථංකථී** සැක ඇතිව, **ඛොතකා** යනු ආමන්ත්‍රණයයි. **තරෙසි තරණය** කරන්නෙහිය.

අත්තනා පකතං පාපං අත්තනා සංකිලිසසති
අත්තනා අකතං පාපං අත්තනාව විසුජ්ඣති
සුද්ධි අසුද්ධි පච්චත්තං නාඤ්ඤා අඤ්ඤං විසොධයෙ'ති

මෙහි අර්ථ මෙසේය. 'යමෙකු විසින් තමන්ම පව්කම් කරන ලද්දේ ද, ඔහු සතර අපායෙහි දුක් විඳිමින්, තමන් ම කිලුටට පත්වන්නේය. යමෙකු විසින් පව් නොකරන ලද්දේ ද, ඔහු සුගතියට ම යන්නේ තමා ම පිරිසිදු බවට පත්වේ. කුසල කර්ම නම් වූ ශුද්ධිය ද අකුසල කර්ම නම් වූ අශුද්ධිය ද වෙන් වෙන්ව එය කරන සත්ත්වයාට ම විපාක දෙයි. කිසි පුද්ගලයෙක් අනික් පුද්ගලයෙකු පිරිසිදු නොකරයි. කිලිටි නොකරයි. පිරිසිදු ද නොකරයි, යනු කී නියායි.

තිට්ඨතෙව නිබ්බාණං යනු අමෘත මහ නිර්වාණය පවත්නේමය. **නිබ්බාණගාමී මගෙහා** යනු පූර්වභාග විදර්ශනාවෙහි පටන් වූ ආර්ය මාර්ගයයි. **තිට්ඨාමහං සමාදපෙතා** යනු ඒ නිර්වාණගාමී මාර්ගය ගන්වන, සමාදන් කරවන මම ද පවත්නේ වෙමි. ශ්‍රාවකයන් එහි පිහිටුවමි. **එවං ඔවදියමානා එවං අනුසාසිය මානා** යනු මවිසින් මෙසේ අවවාද කරනු ලබන්නාහු, මෙසේ අනුශාසනා කරනු ලබන්නාහු, මෙහි කිසියම් කරුණක් මතු වූ විට කැරෙනුයේ 'ඔවදති නාම' ඔවදති යනුයි. (අවවාදයි.)

එසේ කරුණක් නූපන් කල්හි පවා, 'ඔබට මෙසේ අයසක්, අයහපතක් වන්නේය' ආදී වශයෙන් අනාගතය දක්වමින් කැරෙනුයේ (අනුසාසති නාම) අනුසාසති යනුයි. (අනුශාසනායි.) අභිමුඛයෙහි සිට කීමද ඔවදති නාම, ඔවදති යනුයි. අවවාදයි. අනභිමුඛයෙහි සිටිමින් දූතයකු මගින් හසුන් යවා කැරෙනුයේ අනුශාසනාවයි. එක්වරක් පමණක් කැරෙනුයේ 'ඔවාද' යයි. නැවත නැවත පැවසීම 'අනුශාසනා'යයි. නැතහොත් අවවාද දීම ම හෝ අනුශාසනා නම් වේ. **අපෙකචෙව** යනු කිසිවෙක්, ඇතැමෙක් යන අර්ථයි. **අචචනත නිට්ඨං නිබ්බාණං ආරාධෙනති** යනු 'ක්ෂය, ව්‍යය නම් වූ අන්තය ඉකුත් වූහ'යි අච්චන්තයි. අච්චන්ත වූයේ ද එම, සියලු සංස්කාරයන්ගේ නොපවත්නා ස්ථාන වන බැවින්, නිෂ්ඨා වූයේ ද 'අචචනත නිට්ඨං' අච්චන්ත නිට්ඨ නම් වේ. ඒකාන්ත නිෂ්ඨාව යන අර්ථයි. ඒ අත්‍යන්ත නිෂ්ඨාව වූ නිවන ලබා ගනිති. සම්පාදනය කරගනිති. **න ආරාධෙනති** යනු (ඇතැම් ශ්‍රාවක කෙනෙක්) සම්පාදනය කර නොගනිතියි, නොලබතියි යන අරුතයි. **එසාඛ්‍යාහං** යනු මෙහිලා, මම කුමක් කරම් ද? යන අර්ථයි. **මගගකඛායී** යනු පිළිවෙත් මග දේශනා කරනුයේ **ආචිකඛතී** යනු කියයි. **අතතනා පටිපජජ මානා මුඤෙචයයුං** යනු පිළිවෙත් පිළිපදිමින් සසරින් මිදෙන්නෝ ය.

අතීතං උපාදාය යනු අතීතය නිසා, **කථං අපෙකඛං කරොති** යනු කවරාකාරයකින් අපේක්ෂාව, බැලීම කරයි ද? **එවරූපො අහොසි** යනු දික්, කෙටි, කුදු, මහත් ආදී වශයෙන් මෙබඳු ජාති ඇත්තේ වීමි. මෙබඳු රූප ඇත්තේ වීමි. **තත්‍ර නන්දිං සමනනා නෙති** යනු ඒ රූපාරම්මණයෙහි තණ්හාව ඇතිකර ගනියි. එළවයි. ඡේදනාදියෙහි ද මෙම නයයි. 'ඉති මෙ චකඛු' (මාගේ ඇස මෙසේය.) ආදිය වස්තු ආරම්මණ වශයෙන් තණ්හාව ඉපදීම දක්වමින් කීහු. **ඉතිරූපා** යනු මෙවන් රූප ඇත්තාහුය. **තත්‍ර ඡන්දරාග පටිබඳධං** යනු ඒ චක්ෂු රූපාදිය කෙරෙහි දුර්වල යැයි

කියනු ලබන ඡන්දරාගය ද බලවත් යැයි කියනු ලබන සිතයි. **ඡන්දරාග පටිබද්ධතනා විඤ්ඤාණසස** යනු ඒ ජවන විඤ්ඤාණය ඡන්දරාගයෙන් බැඳුණු බැවිනි. **තදභිනන්දති** යනු ඒ අරමුණ තණ්හා වශයෙන් අභිනන්දනය (පිළිගැනීම) කරමින්, **යානිසස තානි** යනු ඔහුගේ යමක් වීද ඒ සියල්ල, පුබ්බ යනු අතීතයෙහි, **සද්ධිං** යනු එක්ව, සමග **හසිත ලපිත කීළිතානි** යනු දත් විදහා පෑම් ආදී සිනහසීම් ද හඬනගා කියන වදන් ද කායික ක්‍රීඩාදියද **තදස්සාදෙති** යනු එය ආශ්වාදනය කරයි. එහි ආශ්වාදය විඳියි. රසවිඳියි. **තං නිකාමෙති** යනු එය කැමති වෙයි. එය අපේක්ෂා කරයි. **විතතිං ආපජ්ජති** යනු සතුටට පැමිණෙයි.

සියා යනු වන්නේය. **අප්පටිලද්ධසස** යනු නොලැබුණු දෙය ලබාගැනීමට, **චිතතං පණිදහති** යනු සිත පිහිටුවයි. **චෙතසෝ පණිධාන පච්චයා** යනු සිත පිහිටුවීමේ හේතුවෙන්, **සීලෙන වා** යනු පංචශීලාදී ශීලයෙන් හෝ **වතෙන වා** ධුතාංග සමාදානයෙන් හෝ **තපෙන වා** යනු විර්ය සමාදානයෙන් හෝ, **බ්‍රහමචරියෙන වා** යනු මෛථුනයෙන් වැලකීමෙන් හෝ, **දෙවෝ වා** යනු මහානුභාව සම්පන්න දෙව්රජෙක් හෝ, **දෙවඤ්ඤතරෝවා** යනු ඒ දෙවියන් අතරින් එක්තරා දෙවියෙක් හෝ, **ජපපනතා** යනු ගුණ වශයෙන් කියමින්, **පජපපනතා** ප්‍රකාර වශයෙන් කියමින්, **අභිජපපනතා** විශේෂයෙන් කියමින්, නැතහොත් එකම අර්ථය උපසර්ග යොදා වර්ධනය කළ නියායි.

මෙසේ පළමු ගාථාවෙන් 'එබඳු වූ පුද්ගලයා ත්‍රිවිධ විවේකයෙන් දුරුවේ.' යැයි පවසා, දෙවන ගාථාවෙන් එබඳු වූවන්ගේ ස්වභාවය ප්‍රකට කර, ඉක්බිති ඔවුන්ගේ පාපයට හේතුව ප්‍රකට කරනු සඳහා, **කාමෙසුගද්ධා** යන ගාථාව වදාළහ. එහි අර්ථයඃ ඒ සත්ත්වයෝ කාමයන් කෙරෙහි පරිභෝග තණ්හාවෙහි **ගිද්ධා** යනු කාමවස්තු සෙවීම් ආදියෙහි යෙදුණු හෙයින්, **පසුතා** යනු මුලාවට පැමිණි බැවින් **සම්මූළහා** පහළට යන ගමන් ඇති බැවින් ද මසුරු බැවින් ද බුද්ධාදීන්ගේ වචන (අවවාද) නො පිළිගන්නා බැවින් ද **අවදානියා** යනු කාය විෂමාදියෙහි, **විසමෙ නිවිට්ඨා** යනු මරණාසන්න අවස්ථාවෙහි මරණ දුක්ඛයට පැමිණියාහු 'මෙයින් චුත වී කවුරු වන්නමෝ ද?'යි වැළපෙති.

ගිද්ධා යනු කාමරාගයෙහි ගිජු වූවාහු. **ගථිතා** සංකල්ප රාගයෙන් අපේක්ෂා කරමින් ගෙතුණාහු **මුච්ඡිතා** කාමතණ්හාවෙන් අතිශයින් මුසපත්ව

අජ්ඣාපන්නා යනු කාමනන්දියෙන්, කාම තෘෂ්ණාවෙන් දැඩිව ගිලුණාහු, බැසගත්තාහු **ලග්ගා** යනු කාම ස්නේහයෙන් එක්ව ඇලුණාහු, **ලග්ගිතා** යනු කාම පරිදාහයෙන් එක්වූවාහු **පළිබුද්ධා** කාම සංඥාවෙන් වෙළුණාහු, නැතහොත් දැකීමෙහි. **ගිද්ධා** නිතර දැකීමෙහි **ගථිතා** ගෙතුණාහු, සංසර්ග ක්‍රියාවෙහි **මුච්ඡිතා** මුසපත් වූවාහු, විශ්වාස ක්‍රියාවෙහි **අජ්ඣාපන්නා** යනු ගිලුණාහු, සෙනෙහසින් වැළඳ ගැනීමෙහි **ලග්ගා** ඇලුණාහු මෛථුන සේවනයෙන් **ලග්ගිතා** එක්ව බැඳුණාහු, ඔවුනොවුන් මුදවමින් **පළිබුද්ධා** වෙළුණාහු යැයි මෙසේ ඇතැමෙක් අර්ථ දක්වති.

එසනති යනු අපේක්ෂා කරති. **ගවෙසනති** යනු සොයති. **පරියෙසනති** යනු සර්ව ප්‍රකාරයෙන් කැමති වෙති. ප්‍රාර්ථනා කරති. නැතහොත් දක්නා ලද අරමුණෙහි සුභ අසුභ වශයෙන් ඇත් ද? නැත්ද'යි **එසනති** සොයති. සුභාසුභ ආරම්මණයන් ප්‍රත්‍යක්ෂ කර සුභ වශයෙන් **ගවෙසනති** ගවේෂණය කරති. කාරණ වශයෙන් **පරියෙසනති** පර්යේෂණය කරති. ඒ දෙවැදෑරුම් කාමයන්හි ගැලී බැස හැසිරෙතියි, **තච්චරිතා** තච්චරිත නම් වෙති. ඒ කාමයන් බහුලව බොහෝසෙයින් වර්ධනය කරතියි, පවත්වා ගනිතියි, **තම්බහුලා** තම්බහුල (එය බොහෝකොට ඇත්තාහුය. ඒ කාමයන් ගරු සිත් උපදවා දෙවෙති යි, **තගරුකා** තග්ගරුක නම් වෙති. ඒ කාමයන් වෙතට නැඹුරුව, නැමී වාසය කරති'යි, **තන්නින්නා** තන්නින්න නම් වෙති. ඒ කාමයන් වෙතට නැඹුරුව වෙසෙති යි, **තප්පොණා** තප්පෝණ නම් වෙති. ඒ කාමයන්හි එල්බී, ඒ කෙරෙහිම නැමී වෙසෙති'යි, **තප්පබ්භාරා** තප්පබ්භාර නම් වෙති. ඒ කාමයන්හි බැසගෙන මුසපත්ව (ශෝකාදියෙන්) වෙළෙමින් ඇලී වෙසෙති යි, **තදධිමුත්තා** තදධිමුත්ත නම් වෙති. 'ඒ කාමයන් අධිපතිකොට හැසිරෙති'යි **තදධිපතෙය්‍යා** තදධිපතෙය්‍ය නම් වෙති. නැතහොත් අරමුණ සිතට ප්‍රියභාවයෙන් **තච්චරිතා**, අරමුණ කාන්ත බැවින් **තබ්බහුලා** තබ්බහුල නම්. අරමුණ මනාප බැවින් **තගරුකා** තග්ගරුක නම්. අරමුණ ප්‍රියවන බැවින් **තන්නිනා** තන්නිත්ත නම්. අරමුණ කාමයෙන් යුක්ත වන හෙයින් **තප්පොනා** තප්පෝන නම්. අරමුණේ ඇලීම් ඇතිකරන බැවින් **තප්පබ්භාරා** තප්පබ්භාර නම්. අරමුණෙහි මුසපත් බැවින් **තදධිමුත්තා** තදධිමුත්ත නම්. අරමුණ බන්ධන ස්වභාව ඇති හෙයින් **තදධිපතෙය්‍යා** තදධිපතෙය්‍ය නම්. යනුවෙන් ඇතැමෙක් විස්තර කරති.

රූපෙ පරියෙසනති යනාදියෙහි **පරියෙසනති** යනු නොලැබූ වස්තු ලබා ගැනීමට සෙවීම් වශයෙන්, **පටිලභනති** අත්පත්වීම් වශයෙනි. **පරිභුඤ්ජනති** යනු වැළඳීම් වශයෙන් කියන ලදැයි දතයුතුයි. කලහ විවාද කෙරේනුයි **කලහකාරකො** කලහකාරක නම්. එහි නිරත වූයේනුයි **කලහපසුතො** කලහපසූත නම්. කම්මකාරකාදී කෙරෙහි ද මේ නයයි. **ගොචරෙ චරං** යනු වෙශ්‍යාදීන් වැනි අගෝචර ස්ථානයන්හි හෝ සතිපට්ඨානාදී ගෝචරයන්හි හැසිරෙනුයේ, එහි නිරත වූයේ **ගොචර** පසුතො ගෝචරපසූත නම්. අරමුණ පිළිබඳව නැවත නැවත සිතීම් වශයෙන් ධ්‍යානය මොහුට ඇත්තේනුයි **ඣායී** නම්. එහි නිරත වූයේ **ඣාන පසූතො ඣාන පසූත** නම්.

අවගච්ඡනති යනු අපායට යයි. **මච්ඡරිනො** යනු සිය සම්පත් සඟවනුයේ, **වචනං** යනු කථා කිරීමයි. **ව්‍යප්පථං** යනු වාක්‍ය මාර්ගයයි. වදන් මගයි. **දෙසනං** යනු විසර්ජනයයි. අවවාද - දේශනාවයි. **අනුසිට්ඨිං** යනු අනුශාසනාවයි. **න ආදියන්ති** යනු නොපිළිගනිති. ගරු නොකරති. න අලලීයන්ති යනු හෝ පායයි. එම අර්ථයමයි.

අර්ථ වශයෙන් මසුරු බව, දක්වනු පිණිස **පඤ්චමච්ඡරියානි** ආවාසමච්ඡරියං යනාදිය දක්විණි. එහි ආවාසය කෙරෙහි පවත්නා මසුරු බව **ආවාස මච්ඡරියං** ආවාස මච්ඡරියයි. සෙසු පදයන්හිද මෙම නයයි. 'ආවාස' යන නමින් සියලු ආරාමය ද පිරිවෙණ ද එක් ගබඩාගෙය ද රාත්‍රී ස්ථානාදිය ද ගැනේ. ඒවායෙහි වසන්නෝ සුවසේ වෙසෙති. සිවුපසයද ලබති. එහි වසන එක් භික්ෂුවක් තෙමේ වත්සම්පන්න ශික්ෂාකාමී වූ අනෙක් භික්ෂුවකගේ එහි පැමිණීම නො ඉවසයි. පැමිණියහොත් නොපමාව යතොත් මැනවැයි සිතයි. මෙය **ආවාස මච්ඡරියං** ආවාස මච්ඡරිය නමි. කලහකාරාදීන්ගේ එහි විසීම නො කැමති වන්නහුට ආවාස මච්ඡරියය සිදු නොවේ. **කුලං** යනු උපස්ථායක කුලය හා ඤාති කුලයයි. එහි වෙනත් භික්ෂුවකගේ පැමිණීම නොකැමති වන්නහුට **කුලමච්ඡරියං** කුලමච්ඡරිය වේ. පාපී පුද්ගලයකුගේ පැමිණීම නොකැමති වීම කුල මච්ඡරියක් නොවේ. ඒ පාපී තෙමේ ඔවුන් කෙරෙහි ඇති ප්‍රසාදය බිඳ දැමීමට ක්‍රියා කරයි. ප්‍රසාදය, ශ්‍රද්ධාව සුරැකීමට සමර්ථ වූ ම භික්ෂුවකගේ එහි පැමිණීම නොකැමති වන්නහුට මච්ඡරිය වේ. **ලාභො** යනු සිවුපස ලැබීමයි. අනික් සිල්වතකු ලබන කල්හිම 'ඔහුට නොලැබේවා'යි සිතන්නහුට

ලාභ මච්ඡරියං ලාභ මච්ඡරිය වේ. හෙතෙමේ වනාහි ශ්‍රද්ධාවෙන් දෙන ලද දෙය නැති කරයි. අපරිභෝග, දුෂ්පරිභෝග ආදී වශයෙන් විනාශ කරයි. කුණුවී යන දේ අනුන්ට දෙයි. එය දැක 'ඉදින් මෙය මොහුට නොලැබේ නම් අනික් සිල්වතෙකුට ලැබේ නම් යෙහෙකි. අනිකෙකු මෙය පරිභෝග කරන්නේ නම් මැනවි'යි සිතන්නාට මසුරුබවක් නම් නොවේ. **වණ්ණා නාම** යනු ශරීර වර්ණය හා ගුණ වර්ණයයි. එහි ශරීර වර්ණ මච්ඡරිය ඇත්තේ වනාහි 'අසුවලා ප්‍රසාද එළවන රූ ඇත්තෙකැ'යි කී කල්හි ඒ පිළිබඳව කථා කරනු නො කැමති වේ. ගුණ වර්ණ මසුරුකම ඇත්තා අන්‍යයන්ගේ සීලයෙන්, ධුතාංගයෙන්, ප්‍රතිපදාවෙන්, හැසිරීමෙන් ගුණ වැනුම් පැවසීම නොකැමති වේ. **ධම්මා** යනු පර්යාප්ති ධර්මය හා ප්‍රතිවේධ ධර්මයයි. එහි ආර්ය ශ්‍රාවකයෝ ප්‍රතිවේධ ධර්මයට මසුරුකම් නොකරති. තමා විසින් අවබෝධ කරගත් ධර්මය දෙවියන් සහිත ලෝකයා විසින් අවබෝධ කරගැනීම කැමති වෙති. තමා විසින් ලබාගත් 'ඒ ප්‍රතිවේධය (තමා ප්‍රතිවේධලාභියකු බව) අන් කෙනෙක් දනිත්වා'යි නොකැමති වෙති. ධර්ම මච්ඡරියය වනාහි තන්ති (පර්යාප්ති) ධර්මයෙහිම ඇති වේ. එම ධර්ම මච්ඡරියෙන් යුතු පුද්ගල තෙමේ යම් රහසිගත ග්‍රන්ථයක් හෝ කථා පිළිවෙලක් හෝ දනියි ද, එය අන්‍යයන් හට දන්වනු නොකැමති වේ. යමෙක් පුද්ගලයකු විමසා බලා ධර්මානුග්‍රහයෙන් හෝ ධර්මය විමසා බලා පුද්ගලානුග්‍රහ වශයෙන් හෝ නොදෙයි ද මෙය ධර්ම මච්ඡරියට අයත් නොවේ. එහි ඇතැම් පුද්ගලයෙක් ලොල් වූවෙක්ව එක් කලෙක ශ්‍රමණයෙක් වේ. තවත් කලෙක බ්‍රාහ්මණයෙක් වේ. කාලයකට නිගණ්ඨයෙක් වේ. 'යම්කිසි භික්ෂුවක් තෙමේ මේ පුද්ගලයා පරපුරෙන් ආ මෘදු සියුම් පෙළ දහම බිඳ කළඹන්නේය'යි නොදේ ද, මෙය පුද්ගලයා විමසා බලා ධර්මානුග්‍රහ හේතුවෙන් නොදීම නම් වේ.

යමෙක් වනාහි 'මේ ධර්ම මෘදුය. සූක්ෂමය. ඉදින් එය මේ පුද්ගලයා ගන්නේ ද අනිකක් විවරණය කර, තමා ප්‍රකට කර දක්වනේය'යි නොදේද, මෙය ධර්මය විමසා බලා පුද්ගලානුග්‍රහයෙන් නොදීම නම් වේ. යමෙක් වනාහි 'ඉදින් මොහු මේ දහම ඉගෙන ගන්නේ ද, අපගේ සමය ප්‍රතිලාභ බිඳලීමට සමර්ථ වන්නේය'යි (තම දහම) නොදෙයි ද මෙය ධර්ම මච්ඡරිය නම් වේමැයි.

මේ මච්ඡරිය ධර්ම පහ අතුරින් ආවාස මච්ඡරිය හේතුවෙන් එම භික්ෂුව යක්ෂයෙක් හෝ ප්‍රේතයෙක් වී, එම ආවාසයේ ම කැළිකසල

ගියින් ඔසවාගෙන හැසිරෙයි. කුලමච්ඡරිය හේතුවෙන්, 'ඒ කුලයෙහි (නිවසේ) අන්‍ය භික්ෂූන් හට දානමානාදිය පවත්වනු දැක, ඒකාන්තයෙන්ම මේ කුලය මා කෙරෙන් බිඳුණේය'යි සිතමින් මුවින් ලේ හෝ වමනය කරයි. කුස විරේචනය වීම හෝ සිදුවෙයි. අන්ත්‍රයන් හෝ (බඩවැල්) කඩ කඩව නික්මෙයි.

ලාභ මච්ඡරියෙන යනු සංඝයා හෝ ගණයා සන්තක වූ ලාභය කෙරෙහි මසුරු සිත් උපදවා, එය පෞද්ගලික දෙයක් මෙන් පරිභෝග කොට, යක්ෂයෙක් හෝ ප්‍රේතයෙක් හෝ මහා පිඹුරෙක් හෝ වී උපදියි. ශරීර වර්ණ, ගුණ වර්ණයන් පිළිබඳ මච්ඡරියයන් හේතුකොට ගෙනද පර්යාප්ති ධර්ම මච්ඡරිය හේතුවෙන් ද තමාගේ වර්ණනාව කරයි. අනුන්ගේ වර්ණනාවේදී 'මොහුගේ කවර වර්ණනාවක් ද?'යි ඒ ඒ දොස් දක්වමින් පර්යාප්තිය ද කිසිවෙකුටත්, කිසිවක් නොදෙමින් දුර්වර්ණ වූවෙක් මෙන් ම කෙළතොළු වූවෙක් ම වී උපදියි.

තවද **ආවාස මච්ඡරියෙන** යනු ලෝභයෙන් කළ ගෙයි (යකඩින් කළ ගෙයි) පැසේ. **කුල මච්ඡරියෙන** යනු අල්ප වූ ලැබීම් ඇත්තේ වේ. **ලාභ මච්ඡරියෙන** ගුථ නම් නිරයේ උපදියි. **වණ්ණ මච්ඡරියෙන** යනු සසර උපන්නහුගේ ශරීර වර්ණයක් නම් ඇති නොවේ. **ධම්ම මච්ඡරියෙන** යනු කුක්කුල නිරයේ උපදියි. මසුරුකම් කිරීම් වශයෙන් **මච්ඡෙරං** මච්ඡේර නම්. මසුරුකම් කිරීමේ ආකාරය **මච්ඡරායනා** මච්ඡරායන නම්. මසුරුකමින් වැඩුණහුගේ මසුරුකමින් යුක්ත වූවහුගේ ස්වභාවය **මච්ඡරායිතත්තං** මච්ඡරායිතත්ත නම්. 'සියල්ල මට ම වේවා. අනිකකුට නොවේවා'යි සියල්ලම තම සම්පත් පතුරුවනු කැමති බව විවිච්ඡ නම් වෙයි. විවිච්ඡයෙහි ස්වභාවය **වෙවිච්ඡං** නම් වේ. මෘදු වූ මසුරුකමට මේ නම යෙදේ. **කදරියෝ** යනු අනාර්යයායි. ඔහුගේ ස්වභාවය **කදරියං** කදරිය නම් වේ. තද මසුරුකමට මේ නම යෙදේ. එයින් යුක්ත පුද්ගලයා අනිකකු වෙනත් අයෙකුට දෙන දේද වලක්වයි. කියන ලදමැයි.

> කදරියෝ පාප සංකප්පෝ මිච්ඡාදිට්ඨි අනාදරෝ
> දදමානං නිවාරෙති යාවමානාන භොජනං

මිසදිටු වූ අනාදර ස්වභාවයෙන් යුක්ත වූ දැඩි මසුරු බවින් යුක්ත වූ පාප සංකල්පනා ඇති පුද්ගලයා බුදිනු පිණිස යමක් ඉල්ලන්නා හට එය දෙන්නා වලක්වයි.

යාචකයකු දැක කර්කශ භාවයෙන් සිත හැකිලේනුයි පැකිලේනුයි කටු කඤ්චුක නමි. ඔහුගේ ස්වභාවය **කටුකඤ්චුකතා** කටුකඤ්චුකතා නමි. තවත් ක්‍රමයකට අර්ථ දක්වතොත්: කටුක යනු හැන්දෙන් ගැනීමයි. ගැට්ටට ම පිරුණු බත් සැළියකින් බත් ගන්නේ, සැම අතින්ම කොටසක් අඩුකොට හැන්ද අගින් ගනියි. හැන්ද පුරවා ගැනීමට නොහැකි වේ. මෙසේ මසුරු පුද්ගලයාගේ සිත හැකිලෙයි. එකල්හි ඔහුගේ කය ද එසේම හැකිලෙයි. වැහැරෙයි. කෘශ වෙයි. දිග නොහැරෙයි. මසුරුබවින් ඇති වූ හැකිලෙන ස්වභාවයයි කී නියායයි. **අගහිතතතං චිතතසස** යනු අනුන්ට උපකාර කිරීමෙහිදී දන්දීම් ආදී වශයෙන් යම්සේ අත දිග හැරේද, නොහැකිලීමෙන් ගන්නා ලද චිත්ත ස්වභාවයයි. යම්හෙයකින් වනාහි මසුරු පුද්ගලයා තමා සතු සම්පත් අනුනට දෙනු නොකැමති වේද, අනුන්ගේ දෙය ගනු කැමැත්තේ වේද, එහෙයින් 'මේ ඉසුරුමත් බව මටම වේවා. අනිකකුට නොවේවා'යි මෙසේ පැවතීම් වශයෙන් තම සම්පත් සඟවන ලක්ෂණ ඇති බව ද, අනුන්ගේ සම්පත් ගන්නා ලක්ෂණ ඇති බවද දතයුතුයි. **බණඩමචඡරියමපි මචඡරියං** යනු තමාගේ පංචස්කන්ධ සංඛ්‍යාත උත්පත්ති භවය 'අන්‍යයන් හා සාධාරණ නොවූ ආශ්චර්යව මා හටම වේවා, අනිකකුට නොවේවා'යි පැවති මසුරු බව බඤ්ඣ මච්ඡරිය නම් වේ.

ධාතු ආයතන මච්ඡරියයන්හිද මෙම නයයි. ගාහො යනු ග්‍රහණ නිශ්චය වශයෙන් ගැනීමයි. **අවදඤඤතාය** යනු සර්වඥ බුදුවරුන් විසින් පවා දෙසන ලද දෙය නොදන්නා බැවින්, යාචකයන් හට නොදෙනුයේ ඔවුන් විසින් කියන ලද දෙය නොදනී. **ජනා පමතතා** යනු සිහියෙන් තොර වූ ජනයා **වචනං** යනු සංක්ෂිප්ත කොට කීමයි. **වයපපථං** යනු විස්තර කොට කීමයි. **දෙසනං** යනු උපමා දක්වමිනි. අර්ථ සන්දර්ශනය කරන වචනයි. **අනුසිටඨං** යනු නැවත නැවත සැලකිල්ල යොමුකරවන වචනයි. නැතහොත් නැවත නැවත දක්වමින් කීම **වචනං** වචන නම වේ. කරුණු පිළිගන්වමින් කථා කිරීම **වයපපථං** වයප්පථ නමි. සතුටු කරවමින් කරන කථාව **දෙසනං** නමි. කරුණු දක්වා කථා කිරීම **අනුසිටඨ** නමි.

නැතහොත් හිරුකතා (බියසුලු බව) පිළිබඳ දුක නසමින් කරන කථාව **වචනං** වචන නම් වේ. පරිළාහ දුක නසමින් කරන කථාව වයප්පථ නම් වේ. අපා දුක් නසමින් කරන කථාව දෙසනං නම් වේ. බවදුක් නසමින් කරන කථාව **අනුසිටඨි** නම් වේ. නැතහොත් දුක්ඛ සත්‍යය

පිරිසිඳ දැනීමේ අවබෝධයෙන් යුතු වූයේ **වචනං** වචන නම් වේ. සමුදය සත්‍ය ප්‍රහාණය කිරීමේ අවබෝධයෙන් යුතු වූයේ **ව්‍යපපථ** නම් වේ. නිරෝධ සත්‍ය සාක්ෂාත් කිරීමේ අවබෝධයෙන් යුතු වූයේ **දෙසනං** දේශනා නම් වේ. මාර්ග සත්‍ය වැඩීමේ අවබෝධයෙන් යුතු වූයේ **අනුසිට්ඨී** අනුසිට්ඨි නම් වේ. මේ ආදී නයින් ඇතැමෙක් අර්ථ වර්ණනා කරති.

න සුසසූසනති යනු නො අසති. **නසොතං ඔදහනති** යනු අසනු පිණිස සවන් නොයොදති. නො පිහිටුවති. **න ඇඤඤා චිතතං උපටඨපෙනති** යනු දැනගැනීම සඳහා සිත නොඑළවති. **අනසසවා** යනු අවවාද නො අසන්නාහු, **අවචනකරා** යනු ඇසුවද කියන ලද දෙය නොකරතියි අවවනකර නම් වෙති. **පටිලොමවතතිනො** යනු ප්‍රතිවිරුද්ධ ලෙස පවතින්නාහු, **අඤඤෙනෙව මුඛං කරොනති** යනු (කී දෙය) කරමින් වුවද මුව ඉවත හරවති'යි (අනවධානයෙන් නො සැලකිලිමත් ලෙස කරති'යි) යන අර්ථයි. **විසමෙ** යනු කාය සුචරිතාදී වූ සමයට, සමථයට විරුද්ධ වූ හෙයින් විෂම වූයේයි, ඒ විෂමයෙහි, **නිවිටඨා** යනු ප්‍රවිෂ්ඨ වූවාහු, ඉවත් කළ නො හැක්කාහු, **කායකමෙම** යනු කය කෙරෙන් වන්නා වූ හෝ කයින් පවත්වන්නා වූ ක්‍රියාවෙනි. කාය කර්මයෙහි ය. වචී කර්මාදියෙහි ද මෙම නයයි. දුශ්චරිත වශයෙන් බෙදන ලද කාය කර්ම, වාක් කර්ම, මනඃ කර්මයෝය.

දස අකුසල කර්මපථ වශයෙන් බෙදන ලද ප්‍රාණඝාතාදිය දතයුතුයි. මෙය වනාහි මෙහි සාධාරණ (සාමාන්‍ය) පද වර්ණනාවයි. අසාධාරණ (විශේෂ) වර්ණනයන්හිදී වනාහි ප්‍රාණයකියි සිඳලීම, පාණාතිපාත යයි. ප්‍රාණවධයයි. ප්‍රාණඝාතයයි. කී නියායි. ප්‍රාණ යනු මෙහි ව්‍යවහාර වශයෙන් සත්ත්වයායි. පරමාර්ථ වශයෙන් ජීවිතින්ද්‍රියය. නැසීම පිණිස, උපක්‍රම හටගන්වන - කාය, වාග් ද්වාරයන් මගින් පැවති වධක චේතනාව 'පාණාතිපාත' නමි. එය ගුණ විරහිත වූ තිරිසන්ගත ආදී ප්‍රාණීන් අතුරින්, කුඩා ප්‍රාණීන් කෙරෙහි අල්ප සාවද්‍ය වේ. මහත් ශරීර ඇති සත්ත්වයන් කෙරෙහි මහා සාවද්‍ය වේ. කවර හෙයින් ද? (කවර කරුණක් නිසාද?) ප්‍රයෝග (ස්වභාව සිද්ධ) වශයෙන් වූ මහත් බව ඇති නිසාය. ප්‍රයෝග වශයෙන් සමත්වය ඇති කල්හි, වස්තු වශයෙන් (ප්‍රමාණයෙන්) වූ මහත් බව නිසාය. ගුණවත් මනුෂ්‍යාදීන් අතුරින් අල්ප වූ ගුණ ඇති ප්‍රාණීන් කෙරෙහි අල්පසාවද්‍ය වේ. මහත් ගුණ ඇති ප්‍රාණීන් කෙරෙහි මහා සාවද්‍ය වේ. ශරීරයෙන් ද ගුණයෙන් ද සමවූ විට කෙලෙසුන්ගේ ද

උපක්‍රමයන්ගේ ද මෘදුභාවයෙන් අල්ප සාවද්‍ය වේ. තීව්‍රභාවයෙන් (දැඩි බැවින්) මහා සාවද්‍ය වේ යැයි දත යුතුයි. එහි සම්භාර (සම්පූර්ණ විය යුතු කරුණු) පහකි. ප්‍රාණියකු වීම, ප්‍රාණ සංඥාව (පණ ඇති බව දැනීම), වදක සිත, උපක්‍රම යෙදීම, එයින් මරණයට පත්වීම යන කරුණු පහයි. එහි ප්‍රයෝග සයකි. සාහත්‍ථික (තම අතින් කරන), ආණත්‍ථික (අණ දීමෙන් කරනු ලබන), නිස්සග්ගිය (තමාම මැරෙන්නට සැලැස්වීම) ථාවර (මරණීය දණ්ඩනය දීම) විජ්ජාමය (විද්‍යා බලයෙන් නැසීම) හා ඉද්ධිමය (ඍද්ධි බලයෙන් නැසීම) යනුවෙනි.

මෙහිදී මෙම සිකපදය තවදුරටත් විස්තර කරන කල්හි, අතිශයින් ප්‍රපඤ්ච (පමා) ඇතිවේ. එහෙයින් එය සවිස්තරව නොදක්වමු. මෙබඳු වූ අනෙක් කරුණු ද දැනගනු කැමැත්තවුන් විසින් සමන්තපාසාදිකා විනයට්ඨ කතාව බලා දැනගත යුතුයි.

නොදුන් දෙය ගැනීම අදිනනාදානං අදින්නාදානයයි. අනුන්ගේ දෙය පැහැර ගැනීම, සොරකම චොරිකා නමැයි කී නියායි. අදිනනං යනු අනුන් සන්තක වූ වස්තුවයි. යමක් (වස්තුවක්) කෙරෙහි අනෙකෙක් තමා කැමති සේ කැමැති දෙයක් කරනුයේ (අදණ්ඩාරහෝ) දඬුවම් ලැබීමට සුදුස්සෙක් නොවේද, චෝදනා ලැබිය යුත්තෙක් නොවේ ද, එබඳු වූ අනුන් සන්තක වස්තුව, අනුන් සන්තක බව දැන දැන තමා සතු කරගනු පිණිස උපක්‍රම හටගන්වන ථෙය්‍ය චේතනාව (සොර සිත) අදින්නාදානයයි.

එය හීන වූ (සුලු අගයක් ඇති) පරසන්තක වස්තු විෂයයෙහි අල්ප සාවද්‍ය වේ. ප්‍රණීත වූ (වැඩි අගයක් ඇති) වස්තු විෂයයෙහි මහා සාවද්‍ය වේ. කවර හෙයින්ද? වස්තු මහන්තත්වය හෙයිනි. වස්තු සමතාවය ඇතිකල්හි, ගුණ මහත්ත්වය ඇතියවුන්ගේ වස්තු විෂයයෙහි මහා සාවද්‍ය වේ. ගුණාධික වූ ඒ ඒ පුද්ගලයාගෙන් පටන්ගෙන (අනුක්‍රමයෙන්) ගුණයෙන් හීනවන ඒ ඒ පුද්ගලයා සතු වස්තු විෂයයෙහි (අනුක්‍රමයෙන්) අල්ප සාවද්‍ය වේ. එහිද සම්භාර (සම්පූර්ණ විය යුතු කරුණු) පහකි. අන් සතු වස්තුවක් වීම, අන් සතු බව දැනීම, සොර සිත, උපක්‍රමය, එයින් (උපක්‍රමයෙන් පැහැර ගැනීම) යනුවෙනි. ප්‍රයෝග ද සයකි. ස්වහත්‍ථික (සාහත්‍ථික) ආදී වශයෙනි. ඒ ප්‍රයෝග සය (6) සුදුසු පරිදි ථෙය්‍යාවහාර (සොරෙන් පැහැර ගැනීම) පසය්හාවහාර (බලාත්කාරයෙන් පැහැර ගැනීම) පටිච්ඡන්නාවහාර (රහසින් පැහැර ගැනීම) පරිකප්පාවහාර (රවටා පැහැර

ගැණීම) හා කුසාවහාර (තර්ජනයෙන් පැහැර ගැනීම) යන මේ පැහැරගැනීම් වශයෙන් පැවැත්තේ යයි දතයුතුයි. මේ මෙහි සංක්ෂේපයයි. සවිස්තර වශයෙන් සමන්තපාසාදිකාවේ කියන ලදී.

කාමෙසු මිච්ඡාචාරෝ යන මෙහි වනාහි කාමෙසු යනු මෛථුන සමාචාරයෙහි ය. **මිච්ඡාචාරෝ** යනු ඒකාන්තයෙන් නින්දිත ලාමක හැසිරීමයි. ලක්ෂණ වශයෙන් වනාහි මෛථුන අභිප්‍රායයෙන් කායද්වාරයෙහි පැවති නොයා යුතු ස්ථාන ඉක්මවීමේ චේතනාව කාමෙසුමිච්ඡාචාරයයි. එහි අගමනීයට්ඨාන (නොයා යුතු ස්ථාන) නම්, පළමුකොට පුරුෂයන් හට - මව විසින් රක්නා ලද්දිය (මාතු රක්ඛිතා), පියාගුරා විසින් රක්නා ලද්දිය (භාතු රක්ඛිතා), පියාගුරිය විසින් රක්නා ලද්දිය (භගිනී රක්ඛිතා), නෑයන් විසින් රක්නා ලද්දිය (ඤාති රක්ඛිතා), ගෝත්‍රය විසින් රක්නා ලද්දිය (ගොත්ත රක්ඛිතා), චාරිත්‍ර ධර්මය මගින් සහ ධාර්මිකයන් විසින් රක්නා ලද්දිය (ධම්ම රක්ඛිතා), ගැබේ සිටම 'මැය මගේ'යැයි ආරක්ෂකයින් විසින් රක්නා ලද්දිය (සාරක්ඛා), දණ්ඩන (දඩ) පැනවීමෙන් රක්නා ලද්දිය (සපරිදණ්ඩා) යැයි මෙසේ මාතුරක්ඛිතාදී වූ ස්ත්‍රීහු දස දෙනෙක් ද

මිලදී ලබාගන්නා ලද්දිය (ධනක්කීතා), සිය කැමැත්තෙන් අවුත් ප්‍රිය පුරුෂයකු සමග වසන්නිය (ඡන්දවාසිනී), භවභෝග ලැබ (පුරුෂයකු සමග) වසන්නිය (භෝග වාසිනී), ඇඳුම් ඇඟලුම් ලැබූ පුරුෂයකු සමග වසන්නිය (පටවාසිනී), දිය බඳුනක අත් තබා 'මේ ජලය මෙන් එක්ව වසමු'යි සපථකොට ලබාගත් භාර්යාවය (ඔදපත්තකිනී), හිසින් දරදිය ආදී බඩු උසුළාගෙන යන දාසිය (ඕ හට චුම්බටා)කගේ හිස මත වූ දරණුව ඉවත් කිරීමෙන් නිදහස්කොට ලබාගත් භාර්යාව, වහලුන් අතරින් ඉන් මුදවා භාර්යා තනතුරට ගන්නා ලද භාර්යාවය (දාසීභරියා), මෙහෙකරුවන් අතරින් ලබාගන්නා ලද භාර්යාවය (කම්මකාරී), යුදකොට දිනාගත් සතුරු දේශයෙන් ගෙනා භාර්යාවය (ධජාහටා) තාවකාලිකව මොහොතකට ගත් භාර්යාවය (මුහුත්තිකා) යැයි මෙසේ ධනක්කීතාදී වූ ස්ත්‍රීහු දස දෙනෙක්දැයි විසිදෙනෙක් වෙති.

ස්ත්‍රීන් අතුරෙන් වනාහි සාරක්ඛා, සපරිදණ්ඩා යන දෙදෙනාද ධනක්කීතාදී දසදෙනාදැයි යන දොළොස් දෙනා හට (සමග වසන පුරුෂයා හැර) අන්‍ය පුරුෂයෝ අගමනීයට්ඨාන නම් වෙති. ඒ මේ මිථ්‍යාචාරය

වනාහි සීලාදී ගුණ රහිත වූ නොයා යුතු ස්ත්‍රී පුරුෂයන් කෙරෙහි අල්පසාවද්‍ය වේ. සීලාදී ගුණ සම්පන්නයන් කෙරෙහි මහා සාවද්‍ය වේ. මෙහිදී සම්පූර්ණ විය යුතු කරුණු සතරෙකි. නොයා යුතු ස්ථානයක් වීමය, එහි සෙවුනා කැමැත්තය, සේවනය පිණිස උපක්‍රමයක් යෙදීමය, සංවාසය ඉවසීමය යනුවෙනි. මෙහි එක්ම ප්‍රයෝගය (යෙදෙන ආකාරය) සාහත්‍ථික (තමා විසින්) ම වේ.

මුසා යනු අසත්‍ය කථා පෙරටු කරගත්තහුගේ තථ්‍යාර්ථය බිඳින වාක් ප්‍රයෝගය හෝ කාය ප්‍රයෝගයයි. ඇති තතු විපරීත කිරීමේ අභිප්‍රායයෙන් කරනු ලබන, අනුන් රවටන කාය වාක් ප්‍රයෝග දනවන චේතනාව මුසාවාදයයි.

තවත් ක්‍රමයකට මෙසේ අර්ථ දැක්වේ. මුසා යනු අභූත වූ අසත්‍ය වූ වස්තුව (කරුණ)යි. 'වාද' යනු එය අසත්‍ය ලෙසින් තථ්‍ය ලෙසින් ඇඟවීමයි. ලක්‍ෂණ වශයෙන් වනාහි අතථ්‍ය වූ වස්තුවක් (කරුණ) තථ්‍ය ලෙස අනුනට අඟවනු කැමැත්තහුගේ එසේ දැන්වීම කරවන චේතනාව මුසාවාදෝ මුසාවාද නම් වේ. නිෂේධ කරනු ලබන කරුණ සුලු වනවිට අල්ප සාවද්‍ය වේ. මහත් කරුණක් වූ විට මහා සාවද්‍ය වේ. තවද ගිහියන් විසින් තමා සතු දෙයක් නොදෙනු කැමතිව නැතැයි ආදී වශයෙන් පැවති මුසාව අල්ප සාවද්‍ය වේ. ශාක්‍ෂ්‍යකරුවෙක්ව ඇති තතු වැලකීමට කියන ලද මුසාව මහා සාවද්‍යයකි. පැවිද්දන් විසින් වනාහි අල්ප වූ තෙල්, ගිතෙල් ආදියක් ලැබ සිනහසීම් අදහසින්, 'අද ගමෙහි තෙල් ගඟක් ගලන්නේය'යි සිතමි' යනාදී වශයෙන් පුරාණ (ප්‍රලාප) කථා නයින් පැවතියේ අල්ප සාවද්‍ය වේ.

'නොදුටු දෙයක් දක්නා ලදැ'යි ආදී වශයෙන් කියන්නවුනට මහා සාවද්‍ය වේ. මේ මුසාවාදයේ සම්පූර්ණ විය යුතු කරුණු සතරෙකි. අසත්‍ය පුවතක් වීමය, රැවටීමේ චේතනාවය. එයින් උපන් උත්සාහය ය හා අන්‍යයන් එහි අර්ථ දැනගැනීමය යනුවෙනි. මෙහි එක්ම ප්‍රයෝගය සාහත්‍ථික (තමාම විසින්) නමි. එයින් කයින් හෝ කය හා බැඳුණු වචනයෙන් හෝ අනුන් රැවටීමේ ක්‍රියාවෙහිදී වෙතැයි දතයුතුයි. එම සංචේතනික ක්‍රියාවෙන් අන්‍යයා එහි අර්ථය දැනගනියි ද මෙතෙමේ (තමාගේ) ක්‍රියාවෙන් උපන් චේතනාව ඇති වූ කෙණෙහිම මුසාවාද කර්මයෙන් බැඳෙයි.

පිසුණාවාචා ආදියෙහි යම් වචනයකින්, යමෙකුට යම් වචනයක් පැවසීමෙන් ඔහුගේ හදවතේ තමා කෙරෙහි ප්‍රිය භාවයක් ද, අන්‍යයන් කෙරෙහි ශූන්‍ය භාවයක් - කළකිරීමක් ඇතිකරයි ද එය පිසුණාවාචා නම්. යම් වදනකින් තමා ද අන්‍යයා ද සැඩපරුෂ වූවකු කරයි ද, යම් වචනයක් ස්වභාවයෙන්ම එරුෂ වේද කණට ප්‍රිය නොවේද, හදවතට සැප ගෙන නොදේද, එබඳු වචන **එරුසා වාචා** එරුසා වාචා නම්. යමෙකින් (වදනෙකින්) නිරර්ථක වූ ප්‍රලාප දොඩවාද ඒ වචනය **සම්ඵප්පලාපෝ** සම්ඵප්‍රලාප නම්. එකී අකුසල් තුනට මුල් වූ චේතනාව පිසුණාවාචාදී නාමයම ලබයි. එම අර්ථයම මෙහි අභිප්‍රේතයි. එහි, කිලිටි සිත් ඇත්තාගේ අනුන් බිඳීමට හෝ තමා කෙරෙහි ප්‍රියභාවය කැමැත්තෙන් හෝ කායවාග් ප්‍රයෝගයෙන් උපදවනු ලබන චේතනාව පිසුණාවාචා නම්. යමෙකු භේද කරයි ද ඔහු අල්පගුණ ඇත්තකු වූ කල අල්ප සාවද්‍ය වේ. මහත් ගුණ ඇත්තකු වූ කල මහා සාවද්‍ය වේ. එය සම්පූර්ණවීමට කරුණු සතරක් සම්පූර්ණ විය යුතුයි. බිඳවිය යුතු අන්‍ය පුද්ගලයාය. මොවුහු මෙසේ වෙනස් වන්නාහුය. වෙන් වන්නාහුයැයි බිඳුවීමේ කැමැත්ත පෙරටු කරගත් චේතනාව හෝ මෙසේ මොහුට ප්‍රියයෙක්, විශ්වාසවන්තයෙක් වන්නෙමියි ප්‍රිය වනු කැමති බව, එම (චේතනාවෙන්) උපන් ව්‍යායාමය හා එම (බිඳවිය යුතු) පුද්ගලයා එම පිසුණු වචනය තේරුම් ගැනීම යනු ඒ කාරණා සතරයි.

අන්‍යයන්ගේ මර්මස්ථාන බිඳින්නාක් මෙන් ඇතිවන කාය වාග් ප්‍රයෝගයන් උපදවන ඒකාන්ත එරුෂ චේතනාව **එරුසාවාචා** එරුසාවාචා නම්. මර්මච්ඡේදක වූද (කාය-වාග්) ප්‍රයෝගය කරනු ලබනුයේ සිතේ සෙනෙහසින් නම් එය එරුෂ වචනයක් නොවේ. මවුපියෝ ද ඇතැම්විටෙක සිය දරුවනට 'සොරු තොප කඩ කඩ කරත්වා'යි පවසති. නමුත් ඔවුහු තම දරුවන් මත මහනෙල් පතක් වැටීම පවා හදවතින් නො කැමති වෙති. ආචාර්ය උපාධ්‍යායයෝ ද විටෙක තම ඇසුරෙහි සිටින ශිෂ්‍යාදීනට 'මේ හිරි ඔතප් (විලිබිය) නැතියවුන්ගෙන් ඇති ඵලය කිම? ඔවුන් පන්නා දමවු'යැයි පවසති. නමුත් ඔවුන්ගේ ආගම, අධිගම සම්ත්තිය ම කැමති වෙති. (එම වචන එරුෂ වචන ලෙස නොගැනේ.)

යම්සේ සෙනෙහස් සිතින් කී හෙයින් එරුෂ වචනයක් නොවේද, එසේම වචනයේ මෘදුතාව ඇතිවූ පමණින් (සිතේ එරුෂ බවක් වේ නම්) වචනයක් 'අඵරුස වාචා' වනුයේ ද නොවේ. යමෙකු මරනු කැමතිව,

'මෙහි සුවසේ සැතපෙන්න' යන මේ ප්‍රිය වචනය අඵරුස වචන නොවේ. මෙය සිතෙහි ඇති සැඩපරුෂ බව නිසාම ඵරුස වචනයක් වේ. ඒ පරුෂ සිත යමෙකු කෙරෙහි පවත්වන ලදුයේ, ඒ පුද්ගලයා අල්ප ගුණ ඇත්තකු වෙතොත් අල්ප සාවද්‍ය වේ. මහත් වූ ගුණ ඇත්තකු වෙතොත් මහා සාවද්‍ය වේ. පරුෂ වචනය සම්පූර්ණ වීම සඳහා කරුණු තුනක් තිබිය යුතුය. අක්‍රෝශ කළයුතු අන්‍යයකු සිටීම, ඔහු කෙරේ කිපි සිත, අක්‍රෝශ කිරීම යනුවෙනි.

අනර්ථය හඟවන කාය වාග් ප්‍රයෝගයන් උපදවන අකුසල චේතනාව සම්ඵප්ප්‍රලාප යයි එය ද සෙවුනා ලද්දහුගේ අල්පගුණ බවින් අල්පසාවද්‍ය වේ. ඇසුරු කළවුන්ගේ ගුණ මහත් බැවින් මහා සාවද්‍ය වේ. මෙහි සම්පූර්ණ විය යුතු කරුණු දෙකකි. 'භාරත යුද්ධ සීතාහරණාදී නිරර්ථක කථාවන් පෙරටු කරගත් බව සහ ඒවා පිළිබඳ සාකච්ඡා කිරීමය' යනුවෙනි.

'දැඩිසේ ලෝභ සිතිවිලි සිතති'යි **අභිජ්ඣා** අභිධ්‍යා නම් වේ. 'අන් සතු බඩු බාහිරාදිය වෙත යොමුවී, ඒ වෙතට නැඹුරුව පවතිති'යි යන අර්ථයි. එය 'අහෝ මේ සම්පත් මට ඇත්නම්' යන මේ ආකාරයෙන් අන්සතු සම්පත් ප්‍රාර්ථනා කරන ලක්ෂණ ඇත්තේය. අදින්නාදානය මෙන්ම අල්පසාවද්‍ය ද මහා සාවද්‍ය ද වේ. මෙහිදී සම්පූර්ණ විය යුතු කරුණු දෙකකි. 'අන්සතු සම්පතක් තිබීම හා එය තමාට පිරිනම්වා ගැනීම' යනුවෙනි. අනුන් අයත් වස්තුවෙහි ලෝභය උපන්නත්, 'අනේ මටම මෙය ලැබේවා'යි තමාට පිරිනම්වා ගැනීම නොවනතෙක්ම මෙම අකුසල කර්මය සිදු නොවේ.

'හිතසුව වනසති'යි **ව්‍යාපාදෝ** ව්‍යාපාදයයි. එය අනුන් වැනසීම සඳහා වූ සිත දූෂ්‍ය (කිලිටි) කරවන ලක්ෂණ ඇත්තේ යි. ඵරුසා වාචා යන්න මෙන් මෙහි අල්ප සාවද්‍ය, මහා සාවද්‍ය බව වේ. මෙහිද සම්පූර්ණ විය යුතු කරුණු දෙකෙකි. 'අන්‍ය සත්ත්වයකු සිටීම හා ඔහු විනාශ කිරීමේ සිත' යනු ඒ දෙකයි. අන් සත්ත්වයකු කෙරෙහි ක්‍රෝධයක් ඉපැදුණ'මුත්, අහෝ! මොහු ඒකාන්තයෙන්ම මැරේවා. වැනසේවා යනුවෙන් ඒ සත්ත්වයාගේ විනාශය නොසිතන තාක්ම අකුසල කර්මය සිදු නොවේ. 'ඇති තතු ගැනීම් වශයෙන් වරදවා ගනිති'යි **මිච්ඡාදිට්ඨි** මිථ්‍යාදෘෂ්ටි නම්. එය 'දුන් දෙයෙහි විපාක නැත' ආදී වශයෙන් පවතින

විපරීත දර්ශනය ලක්ෂණකොට ඇත්තේය. සම්ප්‍රජ්ඵලාපය මෙන් අල්පසාවද්‍ය හා මහා සාවද්‍ය බව වේ.

සඤ්ඤී අසඤ්ඤී නෙවසඤ්ඤී නාසඤ්ඤී භවිසසාම (සංඥා ඇත්තෙක්, සංඥා නැත්තෙක්, නැතහොත් සංඥා ඇත්තෙක් ද නොවන ඇත්තෙක් ද නොවන කෙනෙක් වන්නමෝ දෝ හෝ යි) යනුවෙන් රූපාදී වශයෙන් සැක උපදවති. **භවිසසාම නුඛො මයං** (අපි වන්නමු දෝහෝ යි) ආදී වශයෙන් තමන් පිළිබඳව සැක කරති. එහි **භවිසසාම නුඛො නනුඛො භවිසසාම** (වන්නමු දෝ නොවන්නමු දෝ හෝ යි) යනුවෙන් ශාස්වතවාදයත්, උච්ඡේදවාදයත් අනුව අනාගතයේදී තමන්ගේ විද්‍යමානත්වය හා අවිද්‍යමානත්වය පිළිබඳව සැක උපදවති. **කිං නුඛො භවිසසාම** යනු ජාති, ලිංග උත්පත්තීන් නිසා ක්ෂත්‍රිය කෙනෙක් වන්නමෝද? බ්‍රාහ්මණ, වෛශ්‍ය, ශූද්‍ර, ගෘහස්ථ, ප්‍රව්‍රජිත, දේව, මනුෂ්‍ය ආදීන්ගෙන් වන්නමෝදයි සැක උපදවති.

කථනනු ඛො භවිසසාම යනු සටහන්, කඩවසම් ආකාර අනුව දීර්ඝ ශරීර ඇති කෙනෙක් වන්නමෝ ද? මිටි, සුදු, කලු පමණ කළ හැකි, පමණ කළ නොහැකි ආදී සිරුරු ඇත්තවුන් අතුරෙන් කෙනෙක් වන්නමෝද?යි සැක උපදවති. ඇතැමෙක් මෙහිදී ඊශ්වර නිර්මාණ ආදී හේතූන් අනුව කවර කාරණයකින් වන්නමෝදැයි, සැක උපදවතියි කියති. **කිං හුත්වා කිං භවිසසාම නු ඛො මයං** යනු ජාති ආදිය අනුව ක්ෂත්‍රියයන් වී බ්‍රාහ්මණයෝ වන්නමෝ ද? -පෙ- දෙවියන් වී මනුෂ්‍යයෝ වන්නමෝද?'යි යනුවෙන් තමන්ගේ ගතිපරම්පරාව පිළිබඳව සැක උපදවති. **සබ්බඤ්ඵව පන අද්ධානං** සියලුම තන්හි, 'අද්ධානං' යනු කාලයට අධිවචනයි.

දැන් සිවුවන ගාථාවයි. යම්හෙයකින් මෙම 'තසමාහි සික්ඛථ ඉධෙව ජනතු -පෙ- අපපංහි තං ජීවිතං ආහු ධීරා' යන (සිවුවන) ගාථාව වේද, එහි 'සික්ඛථ' යනු ත්‍රිවිධ ශික්ෂාවන් ආවර්ජනය කරන්නේය (කළ යුතුය) යනුයි. **ඉධෙව** යනු මෙම ශාසනයෙහිදීම, එහිද භික්මිය යුතු වෙතියි ශික්ෂායි. **තිසෙසා** යනු සංඛ්‍යාව පිරිසිඳ දැක්වීමයි. **අධිසීල සික්ඛා** යනු අධික වූ උතුම් වූ ශීලය වන්නේනුයි, අධිසීල නමි. 'අධි සීල' වූයේ ද එම, භික්මිය යුතුය යන අර්ථයෙන්, සික්ඛා වූයේ ද 'අධිසීල සික්ඛා' නම් වේ. 'අධි චිත්ත', 'අධි පඤ්ඤා' ශික්ෂාවන් පිළිබඳව ද මෙම නයයි.

මෙහි 'සීල' යනු කවරේ ද? 'අධි සීල' යනු කවරේ ද? 'චිත්ත' යනු කවරේද? 'අධි චිත්ත' යනු කවරේ ද? 'පඤ්ඤා' යනු කවරේ ද? 'අධිපඤ්ඤා' යනු කවරේ ද?'යි කියනු (විස්තර කරනු) ලැබේ. පංචාංග, දසාංග ශීලය පළමුකොටම 'සීල' නම් වේ. එය වනාහි බුදුන් ලොව පහළ වුනත්, නැතත් ලොව පවතියි. බුදුන් උපන් කල්හි, එම ශීලයෙහි බුදුවරු ද ශ්‍රාවකයෝ ද මහජනයා සමාදන් කරවති. බුදුවරු නූපන් කාලයෙහි දී මේ ශීලයෙහි පසේ බුදුවරු ද කර්මවාදී ධාර්මික ශ්‍රමණ බ්‍රාහ්මණයෝ ද සක්විති මහරජවරු ද මහා බෝධි සත්ත්වයෝ ද සමාදන් කරවති. නුවණැති ශ්‍රමණ බ්‍රාහ්මණයෝ තමන්ම මේ ශීලය සමාදන් වෙති. ඔවුහු කුසල දහම් වඩා දෙව් මිනිස් ලෝකයන්හි සම්පත් අනුභව කරති.

ප්‍රාතිමෝක්ෂ සංවර ශීලය 'අධිශීල' යයි කියනු ලැබේ. එය වනාහි දීප්තිමත් වස්තූන් අතුරෙන් සූර්යයා මෙන් ද, පර්වතයන් අතුරෙන් මහමෙර මෙන් ද, සියලු ලෞකික ශීලයන් අතුරෙන් අධික මෙන් ම උතුම් වූ ද සීලයයි. එය බුද්ධෝත්පාද කාලයෙහිම ලොව පවතියි. බුද්ධෝත්පාදයෙන් තොරව නොපවතියි. එම ප්‍රඥප්තිය උගුලුවා අනෙක් සත්ත්වයෙක් තෙමේ අනෙකක් පිහිටුවීමට නොසමත් වෙති. බුදුවරයෝම සර්ව ප්‍රකාරයෙන් කාය වාග් ද්වාරයන් පිළිබඳ සාවද්‍ය ආචාර ප්‍රවාහය සිඳ දමා, ඒ ඒ ශික්ෂාපද කඩ කිරීමට සුදුසු වන පරිදි ඒ ශීල සංවර ක්‍රමය පනවති. ප්‍රාතිමෝක්ෂ සංවරයටත් වඩා මාර්ගඵල සම්ප්‍රයුක්ත වූ ම ශීලය, අධිශීල නම් වේ. කාමාවචර කුසල් සිත් අට ද ලෞකික අෂ්ට සමාපත්ති සිත් ද එක් කර, 'චිත්ත' නම වෙතියි දතයුතුයි.

අබුද්ධෝත්පාද කාලයෙහිද එය පවතියි. සමාදන්වීම ද සීලයෙහි කියූ පරිදි දතයුතුයි. විදර්ශනාපාදක වූ අට්ඨ සමාපත්ති සිත 'අධිචිත්ත' යැයි කියනු ලැබේ. එය වනාහි ශීලයන් අතුරෙන් අධිශීලය මෙන්, සියලු ලෞකික සිත් අතුරින් අධික වූයේ ද, උතුම් වූයේ ද වේ. අධි චිත්තය බුද්ධෝත්පාද කාලයෙහි ම මිස බුද්ධෝත්පාදයෙන් තොරව නොම පවතියි. එයිනුදු මාර්ගඵල සිත ම 'අධිචිත්ත' වේ.

'දුන් දෙයෙහි විපාක ඇත. පරිත්‍යාගයෙහි විපාක ඇත' ආදී වශයෙන් පැවති කර්මය ස්වායත්ත (තමාම අයත්) බව දන්නා ඤාණය ප්‍රඥාවයි. එය වනාහි බුදුන් උපන්නත් නූපන්නත් ලොව පවතියි. බුද්ධෝත්පාද කාලයේ දී එම ප්‍රඥාවෙන් බුදුවරු ද ශ්‍රාවකයෝ ද මහජනයා

සමාදන් කරවති. අබුද්ධෝත්පාද කාලවලදී පසේ බුදුවරු ද කර්මවාදී ධාර්මික ශ්‍රමණ බ්‍රාහ්මණයෝ ද සක්විති මහ රජදරුවෝ ද මහ බෝසත්වරුද මෙම ශීලයෙහි මහජනයා සමාදන් කරවති. පඬිවරු (නුවණැත්තෝ) තමන් ම මෙය සමාදන් වෙති. ඒ එසේමැයි. අංකුර තෙමේ වර්ෂ දස දහසක් මහදන් පැවැත්වීය. වේලාම තෙමේ ද වෙස්සන්තර තෙමේ ද අන්‍ය වූ බොහෝ නුවණැති මිනිස්සු ද මහදන් පැවැත්වූහ. ඔවුහු ඒ කුසල දහම් සපුරා දේව, මනුෂ්‍ය ලෝකවල සම්පත් අනුභව කළහ. ත්‍රිලක්ෂණ ආකාරය පිරිසිඳ දන්නා වූ විදර්ශනා ඥානය 'අධිපඤ්ඤා' යැයි කියනු ලැබේ. එය වනාහි අධිසීල, අධිචිත්තයන් වැනි සීල, චිත්ත ආදිය අතුරෙන් ද සියලු ලෞකික ප්‍රඥාවන් අතුරින් ද අධික මෙන් ම උතුම් ද වේ. බුද්ධෝත්පාද කාලයෙහි හැර මෙය ලොව නොපවතියි. එයිනුදු මාර්ගඵල ප්‍රඥාවම 'අධිප්‍රඥා' නම් වේ. ක්බිති මේ එක එකක් වෙන් වෙන්ව දක්වමින් 'අධිශීල ශික්ෂාව කවරේද? මේ සසුනෙහි භික්ෂු තෙමේ සිල්වත් වේ ද ප්‍රාතිමෝක්ෂ සංවරයෙන් යුතුව වෙසේද?' යනාදිය කීහු.

ඉධ යනු පූර්වභාග කරණීය (පළමුකොට කළ යුතු) සම්ප්‍රදායයෙන් සමන්විත, ශීල පරිපූරණය කරන පුද්ගලයාගේ සන්නිශ්‍රය ස්ථාන වූ මේ ශාසන පරිදීපනය ගෙනහැර දැක්වීම හා අන්‍ය ශාසනයන්ගේ එසේවීම ප්‍රතික්ෂේප කරන වචනයි කියන ලදමැයි. 'ඉධෙව භික්ඛවෙ සමණො -පෙ- සුඤ්ඤා පරපපවාදා සමණෙහි අඤ්ඤෙ' (මහණෙනි, ශ්‍රමණයකු වෙතොත්, මේ ශාසනයෙහි මය. -පෙ- (ප්‍රතිපදාවෙන්) ශූන්‍ය වූ පරප්‍රවාද ගත්තාහු ශ්‍රමණයන් කෙරෙන් අන්‍යයෝය.) යනුවෙනි. **භික්ඛූ** යනු ඒ ශීලය සම්පූර්ණ කරන පුද්ගලයා දැක්වීමයි. **පාතිමොක්ඛ සංවර සංවුතො** යන මෙය ඔහු ප්‍රාතිමෝක්ෂ සංවරයේ පිහිටි බව දැක්වීමයි. **විහරති** යන මෙය ඔහු එයට අනුරූප වූ විහරණයෙන් යුක්ත වූ බව දැක්වීමයි.

ආචාරගෝචර සම්පන්නො යනු මෙය ඔහුගේ ප්‍රාතිමෝක්ෂ සංවරයට උපකාරක වූ ධර්ම දැක්වීමයි. **අණුමත්තෙසු වජ්ජෙසු භයදස්සාවී** යන මෙය ඔහු ප්‍රාතිමෝක්ෂයෙන් නොමිදෙන ස්වභාව ඇත්තෙකු බව දැක්වීමයි. **සමාදාය** යනු මේ සිකපදයන් ඉතිරි නොකර ම සියල්ල ගැනීම දැක්වීමයි. **සික්ඛති** යනු ඔහු මේ ශික්ෂාවෙන් සමන්විත බව දැක්වීමයි. **සික්ඛාපදෙසු** යන මෙය ඔහු විසින් හික්මිය යුතු කරුණු දැක්වීමයි. එහි **භික්ඛු** යනු සසර බිය දක්නේනුයි භික්ඛු නම් වේ. මොහු සීලයෙන් යුතු වන්නේනුයි

සීලවා යනු වේ. මෙහි සීලං යනු සීලන (පුරුදු කිරීම) අර්ථයෙන් සීල නම් වේ.

මේ සීලන නම් කවරේද යත්, සමාධාන හෙවත් කායකර්මාදීන් සුසීලතාවයෙන් නො විසිර පවත්නා බවය යන අර්ථයි. නොහොත් උපධාරණ හෙවත් කුශල ධර්මයන් ප්‍රතිෂ්ඨා වශයෙන් දරා සිටින බවය යන අර්ථයි.

මෙහි මෙකී අරුත් දෙක පමණක් ශබ්ද ලක්ෂණ හඳුනන්නෝ අනුදනිති. අන්‍යයෝ වනාහි අධිසේවන (බහුල ලෙස සේවනය කිරීම), ආචාර (හැසිරීම), සීලන (පරිශීලනය), සිර (ශීර්ෂ)ය, සීතල (ශීතල), සිව (යහපත) යන අර්ථයන්ගෙන් ද සීල නම් වෙතියි විස්තර කෙරෙති.

සීලනං ලකඛණං තසස භිනනසසාපි අනෙකධා
සනිදසසනත්තං රූපසස යථාභිනනසස නෙකධා

යම්සේ නොයෙක් ආකාරයෙන් බෙදී ගිය නමුදු රූපයෙහි (පොදු) ලක්ෂණය නිදර්ශන සහිත බව (දැකිය හැකි බව) වේ ද, එසේම නොයෙක් ආකාරයෙන් බෙදා දක්වන ලද ශීලයෙහි (පොදු) ලක්ෂණය ශීලනය වේ.

නීලපීතාදී බෙදීම් වශයෙන් නොයෙක් ආකාරයෙන් භින්න වූ රූපායතනයෙහි නිදර්ශන සහිත බව (දැකිය හැකි බව) පොදු ලක්ෂණය වේ. නීලාදී භේද වශයෙන් භින්න වුවද, සනිදර්ශනත්වය (දැකිය හැකි බව) නො ඉක්මවන බැවිනි. එසේම, චේතනාදී භේද වශයෙන් නන් අයුරින් භින්න වූ ශීලයෙහි, යම් මේ කාය කර්මාදියෙහි නොවිසිරීම් වශයෙන් හා කුශල ධර්මයනට ප්‍රතිෂ්ඨා වශයෙන් කියන ලද එම ශීලනය (පොදු) ලක්ෂණය වේ. චේතනාදී භේද වශයෙන් භින්න වුවද සමාධාන (නො විසිර පැවැත්ම) හා පතිපට්ඨාන (ප්‍රතිෂ්ඨා බව) නො ඉක්මවන බැවිනි.

මෙවන් ලක්ෂණ ඇති මේ ශීලයෙහි වනාහි :-

දුසසීල්‍යවිදධං සනතා අනවජජගුණා කථා
කිචව සමපතති අතථෙන රසො නාම පවුචචති

දුසිල් බව විධ්වංසනය කරන බව හා එසේම නිරවද්‍ය ගුණ ඇති බව, කෘත්‍ය හා සම්පත් යන අර්ථයෙන් 'රස' නම් වෙතියි කියන ලදී.

එනිසා මේ ශීලය නම් කෘත්‍යය යන අරුත් ඇති රසයෙන් වනාහි දුසිල් බව විධ්වංසනය කිරීමයි. සම්පත්තිය යන අරුත් ඇති රසයෙන් අනවද්‍ය (නිරවද්‍ය) රසය යැයි දතයුතුයි.

සොචෙය්‍ය පච්චුපට්ඨානං තයිදං තසස විඤ්ඤූහි
ඔත්තප්පඤ්ච හිරිඤ්ච ව පදට්ඨානනති වණ්ණිතං

ඒ මේ ශීලය පිරිසිදු බව පච්චුපට්ඨාන (වැටහීම් කාරණය) කොට ඇත්තේ යැයි ද හිරි ඔතප් දෙක එහි පදට්ඨාන (පදනම) වෙතැයි ද නුවණැතියන් විසින් වර්ණනා කරන ලදී.

ඒ මේ ශීලය වනාහි කාය සොචෙය්‍ය (කාය දුශ්චරිතයෙන් වෙන් වූ බව) වචී සොචෙය්‍ය (වාග් දුශ්චරිතයෙන් වෙන් වූ බව) මනොසොචෙ (මනෝ දුශ්චරිතයෙන් වෙන් වූ බව) යැයි මෙසේ කියන ලද පිරිසිදු බව පච්චුපට්ඨාන (වැටහීම් කරණ) කොට ඇත්තේ ය. පිරිසිදු බව හේතුකොට ගෙන වැටහෙයි. එය නිරතුරු ගැවසෙන බවට පැමිණෙයි. හිරි ඔතප් දෙක ශීලයෙහි පදනම ලෙස නුවණැත්තන් විසින් වර්ණනා කරන ලදී. ආසන්න කාරණය යන අර්ථයි. හිරි ඔතප් දෙක ඇතිවිටම සීලය උපදනුයේ මෙන්ම පිහිටනුයේ ද වේ. ඒ දෙක නොමැතිවිට සීලය නූපදනුයේ මෙන්ම නොපිහිටනුයේ ද වේ. මෙබඳු වූ සීලයෙන් සිල්වතෙක් වේ. මෙහි සීලය නමින් පාණාතිපාතාදියෙන් වැළකෙන හෝ වත්පිළිවෙත් පුරන පුද්ගලයාගේ චේතනාදී ධර්මයන් දතයුතුයි.

පටිසම්භිදාවෙහි මෙය කියන ලදී. 'සීලය යනු කුමක්ද? චේතනාව සීලයයි. චෛතසිකය සීලයයි. සංවරය සීලයයි. අවිතික්කමය (නො ඉක්මවීම) සීලය යි.' මෙහි **චෙතනා සීලං** චේතනා සීලය නම්, ප්‍රාණඝාතාදියෙන් වැලකෙන්නහුගේ හෝ වත් පිළිවෙත් පුරන්නහුගේ චේතනාවයි. **චෙතසිකං සීලං** චෛතසික සීලය නම් ප්‍රාණඝාතාදියෙන් වැලකෙන්නහුගේ විරතියයි. තවද චේතනා සීලය නම්, පාණාතිපාතාදිය දුරුකරන්නහුගේ සප්ත කර්මපථ චේතනාවයි. චෛතසික සීලය නම්, අභිධ්‍යාව දුරුකරන්නහුගේ සප්ත කර්මපථ චේතනාවයි. චෛතසික සීලය

නම්, අභිධ්‍යාව අත්හැර, දුරු වූ අභිධ්‍යා සහිත සිතින් වාසය කරයි ආදී නයින් සංයුත්ත මහා වග්ගයෙහි කියන ලද අනභිධ්‍යාය, අව්‍යාපාදය, සම්‍යක් දෘෂ්ටිය යන මේ ධර්මයෝ යි. සංවර සීලය නම්, මෙහි, පංචවිධ වශයෙන් සංවරය දතයුතුයි. එනම්, ප්‍රාතිමෝක්ෂ සංවරය, සති සංවරය, ඤාණ සංවරය, ඛන්ති සංවරය, වීර්ය සංවරය යනුවෙනි.

එහි නානාකරණීය (වෙන් වෙන්කොට දැක්වීම) මතු විස්තර වන්නේය. අවිතික්කම සීලය නම්, සමාදන් වූ ශීලය කායික වාචසික වශයෙන් නො ඉක්මවීමයි. මෙහි ද සංවර සීලය, අවිතික්කම සීලය යන මෙය ම නිෂ්පරියාය (සාමාන්‍ය) වශයෙන් සීල නම් වෙතියි ද දතයුතුයි. **පාති මොක්ඛං** යනු ශික්ෂාපද ශීලයයි. එය වනාහි යමෙක් එය රකී ද ආරක්ෂා කරයි ද ඔහු අපායාදී දුකින් මුක්තියට පමුණුවයි. මුදවයි. එහෙයින් ප්‍රාතිමෝක්ෂ යැයි කියන ලදී. **පාතිමොක්ඛ සංවර සංවුතෝ** යනු ප්‍රාතිමෝක්ෂ සංවරයෙන් යුක්ත වූයේ යි.

ආචාරගොචර සම්පන්නෝ යනු ආචාරයෙන් ද ගෝචරයෙන් ද (අයෝග්‍ය ස්ථානයන්හි නො හැසිරීමෙන්) සමන්විත වූයේ යි. **අණුමත්තෙසු** යනු අල්පමාත්‍ර වූ ද **වජ්ජෙසු** යනු අකුශල ධර්මයන්හි, **භයදස්සාවී** යනු භය දක්නේ **සමාදාය** යනු මනාව සමාදන්ව **සික්ඛති සික්ඛාපදෙසු** යනු ඒ ඒ ශික්ෂාපදය සමාදන්ව එහි හික්මෙයි. තවද **සමාදාය සික්ඛති සික්ඛාපදෙසු** යනු යම්කිසි ශික්ෂාපදයෙක් හි, ශික්ෂාපද කොටසෙක්හි, හික්මිය යුතු වේද, කායික වූ හෝ චෛතසික වූ ඒ සියල්ල මනාව ගෙන හික්මෙයි. **ඛුද්දකෝ සීලක්ඛන්ධෝ** යනු සංඝාදිසේසාදී වශයෙන් අවශේෂ වූ ශීල ස්කන්ධය, **මහන්තෝ** යනු පාරාජිකාදී නිරවශේෂ වූ (අවශ්‍යම වූ) ශීල ස්කන්ධයයි. යම්හෙයකින් වනාහි ප්‍රාතිමෝක්ෂ සංවර ශීලය නිසා භික්ෂු තෙමේ සසුනෙහි පිහිටියේ නම් වේද, එහෙයින් එම (ශීලය) ප්‍රතිෂ්ඨා යැයි කියන ලදී. භික්ෂු තෙමේ මෙහි පිහිටයි යන අරුතින් හෝ කුශල ධර්මයෙන්ම මෙහි පිහිටතියි යන අරුතින් ප්‍රතිෂ්ඨා නම් වේ. මේ අර්ථය 'සීලෙ පතිට්ඨාය නරෝ සපඤ්ඤෝ' යනු (නුවණැති මනුෂ්‍ය තෙමේ සීලයෙහි පිහිටා.....) ද 'පතිට්ඨා මහාරාජ සීලං සබ්බසං කුසලානං ධම්මානං' (මහරජ, සියලු කුශල ධර්මයනට ශීලය ප්‍රතිෂ්ඨා වේ.) යනු ද 'සීලෙ පතිට්ඨිතස්ස ඛෝ මහාරාජ සබ්බෙ කුසලාධම්මා න පරිහායන්ති' (මහරජ, ශීලයෙහි පිහිටියහුට වනාහි, සියලු කුශල ධර්මයෝ නො පිරිහෙති. නොපිරිහෙන ස්වභාවයට පත් වෙති.) යනු ද මේ ආදිය සූත්‍ර වශයෙන්

දැතයුතුයි. මේ සීලය පූර්ව උත්පත්ති (ප්‍රථමයෙන් උපදිති) යි යන අර්ථයෙන් 'ආදි' නම් වේ. කියන ලදමැයි. 'තසමාතීහ තවං ඛත්තිය ආදිමෙව විසොධෙහි කුසලෙසු ධම්මෙසු කොසාදි කුසලානං ධම්මානං සීලං ච සුවිසුද්ධං දිට්ඨි ච උජුකා' (ක්ෂත්‍රියය, එහෙයින් ඔබ මෙහිදී කුශල ධර්මයන් අතුරෙන් 'ආදිය' (ආදී වූ ශීලය) ම පිරිසිදු කරව, කුශල ධර්මයන් අතුරෙන් 'ආදි' වූයේ කවරේ ද? සුවිශුද්ධ (ඉතා පිරිසිදු) වූ ශීලය ද ඍජුකොට ගන්නා ලද දෘෂ්ටිය ද යන මෙයයි.) යම්සේ වනාහි නගරයක් සාදනු කැමති නගර නිර්මාපක තෙමේ පළමුව නගරය පිහිටන ස්ථානය හෙළිපෙහෙලි කරයි. ඉන්පසු සිවුමහා වීදි, මංසන්ධි ආදිය පිරිසිදීම් වශයෙන් බෙදා නගරය ගොඩ නගයි.

මෙලෙසින් ම භාවනා වඩන යෝගාවචර තෙමේ මුලදීම ශීලය පිරිසිදු කරයි. ඉන්පසු සමාධි, විදර්ශනා, මාර්ගඵල, නිවන් යනාදිය සාක්ෂාත් කරයි. යම්සේ රජකයා පළමුව ක්ෂාරත්‍රයෙකින් වස්ත්‍රය සෝදා, වස්ත්‍රය පිරිසිදු වූ කල්හි තමා කැමති වර්ණයක් පොවන්නේ ද, නැතහොත් යම්සේ දක්ෂ වූ සිත්තරෙක් රූප අඳිනු කැමතිව මුලදීම බිත්තියේ හුණු පිරියම් කරන්නේ ද, ඉන්පසුව එහි රූප අඳින්නේ ද, එසේම යෝගාවචර තෙමේ මුලදීම ශීලය පිරිසිදු කොට ඉන්පසු සමථ විදර්ශනාදී ධර්මයන් සාක්ෂාත් කරයි. එහෙයින් සීලය 'ආදි' යැයි කියන ලදී. ඒ මේ ශීලය චරණයනට (පාදයනට) සමාන වන බැවින් චරණ නම් වෙති. **චරණානි** යනුවෙන් පාදයෝ කියනු ලබති. යම්සේ වනාහි සිදුණු පා ඇති පුරුෂයාගේ දිශාවන්හි සැරිසැරීමක් සිදුනොවේ ද, පිරිපුන් පා ඇත්තහුට ම එය ලැබේද එසේම යමෙකුගේ ශීලය බිඳී යයි ද කඩ වී අපරිපූර්ණව පවතියි ද ඔහුට නිර්වාණාධිගමනය පිණිස වූ ඤාණාධිගමය නො ලැබේ. යමෙකුගේ ශීලය නොබිඳී, කඩ නොවී පිරිපුන්ව පවතී ද ඔහුට නිර්වාණාධිගමනය පිණිස වූ ඤාණාධිගමය සැපයේ. එහෙයින් ශීලය 'චරණ' යැයි කියන ලදී. එම ශීලයම සංයම වශයෙන් **සඤ්ඤමො** සඤ්ඤම නම්. සංවර වශයෙන් **සංවරො** සංවර නම්. මේ වචන දෙකින් ම සීල සංයමයත්, සීල සංවරයත් කියන ලදී. මෙහි වචනාර්ථය වනාහි ව්‍යතික්‍රම (ඉක්මවීම්, කඩවීම්) හා 'සසලවීම් සන්සුන් කරති'යි පුද්ගලයා හෝ හික්මවතියි, 'ව්‍යතික්‍රම වශයෙන් සසලවීමට ඔහුට ඉඩ නොදෙති'යි 'සංයම' නම් වේ. 'ව්‍යතික්‍රමයට පිවිසෙන දොර අවුරති'යි, 'වසති'යි සංවර නම් වේ. **මොක්ඛං** යනු උතුම් හෝ ප්‍රමුඛ වූයේ යි. යම්සේ සත්ත්වයන්ගේ සතරවැදෑරුම් වූ ආහාර මුවින් පිවිස අංග ප්‍රත්‍යංගයන් වෙත පැතිර යන්නේ ද, එසේම

යෝගාවචරයාගේ ද චාතුර්භූමික කුශලය සීල නැමති මුඛයෙන් පිවිස, අර්ථ සිද්ධිය සම්පාදනය කරයි. එහෙයින් සීලය **මොක්ඛං** යනු ප්‍රමුඛ වේ. **සාධු** යනු ප්‍රමුඛ, පූර්වාංගම, ශ්‍රේෂ්ඨ හෝ ප්‍රධාන වෙති යි යන අර්ථයි. **කුසලානං ධම්මානං සමාපත්තියා** චාතුර්භූමික කුශල ධර්මයන්ගේ ප්‍රතිලාභය පිණිස මුල් වෙති'යි, මුඛ්‍ය වෙතියි, පූර්වාංගම වෙතියි, ශ්‍රේෂ්ඨ වෙතියි, ප්‍රධාන වෙතියි දතයුතුය.

විවිච්චෙව කාමෙහි යනු කාමයන් කෙරෙන් දුරුවී, වෙන්වී, ඉවත්වී, මෙහි යම් **එව** කාරයෙක් වේද, එය නියමාර්ථ (නිශ්චයාර්ථ) ඇත්තේයැයි දතයුතුය.

යම්හෙයකින් නිශ්චයාර්ථ වේද, එහෙයින්, ප්‍රථමධ්‍යානයට පැමිණ වෙසෙනවිට අවිද්‍යමාන වුව ද, එම ප්‍රථමධ්‍යානයට ප්‍රතිපක්ෂ වූ කාමයන්ගේ පරිත්‍යාගයෙනි. (අත්හැරීමෙන් ම එහි (ධ්‍යානයෙහි) අධිගමය වෙති'යි දක්වයි.) කෙසේද යත්, **විවිච්චෙව කාමෙහි** යනුවෙන් මෙසේ නිශ්චය කරනු ලබනවිට, කාමයෝ ද්විතීය ධ්‍යානයට ප්‍රතිපක්ෂයහ. එම කාමයන් ඇති කල මෙය (ද්විතීය ධ්‍යානය) නොපවතිතැයි යන මෙය පැනවේ. (හැඟවේ.) අන්ධකාරය ඇති තැන ප්‍රදීපාලෝකය මෙන් එම (කාමයන්) අත්හැරීමෙන් ම එහි (එම ධ්‍යානයෙහි) අධිගමය සිද්ධ වේ. මෙතෙර හැරයාමෙන් එතෙරට යාම වන හෙයිනි. එහෙයින් (නියමං කරොති) 'නියම කෙරෙති'යි කී නියායි. එහි, කවර හෙයකින් වනාහි, මෙය (**එව** කාරය), (විවිච්ච අකුසලෙහි ධමෙමහි යන) පසුපදයෙහි නො කියා (**විවිච්චෙව** කාමෙහි යන) පෙර පදයෙහි පමණක් කියන ලද්දේ ද යත්,

'අකුසල ධර්මයන්ගෙන් නොවෙන් වුව ද ධ්‍යානයට පැමිණ විසිය හැකියයි මෙසේ මෙය නො දතයුතුයි. එය නිස්සරණ (ඉවත්වීම්) වශයෙන් පූර්ව පදයෙහිම කියන ලදී. කාමධාතුව ඉක්මවා පැවතීමෙන් ද කාමරාගයට ප්‍රතිපක්ෂ වූ බැවින් ද මේ ධ්‍යානය කාමයන් කෙරෙන් ම නිස්සරණ යයි. (නික්මීමයි.) කියන ලදමැයි. 'යම් මේ ධ්‍යානයෙක් වේ ද එය කාමයන් කෙරෙන් නික්ම යාම ය, නෛෂ්ක්‍රම්‍යය මැයි' යනු කී හෙයින් පසු පදයෙහි ද (එව කාරය) වේ. පසුපදයෙහි ද යම්සේ 'ඉධෙව භික්ඛවෙ සමණො ඉධ දුතියො සමණො'යි (මහණෙනි, සෝවාන් ශ්‍රමණ තෙමේ මේ සසුනෙහි ම වේ. දෙවනු කී සකෘදාගාමී ශ්‍රමණ තෙමේ ද මේ සසුනෙහිම වේ.) යන මෙහි 'එව' කාරය පමුණුවා කියනු ලැබේ ද

මෙසේ ම මෙහිදී ද කිවයුතුය. මෙයින් බාහිර සසුනක වූවන් විසිනුදු නීවරණ සංඛ්‍යාත වූ අකුශල ධර්මයන්ගෙන් නොවෙන් ව ධ්‍යානයනට පැමිණ විසීමට නොහැකි ය. එහෙයින් 'කාමයන්ගෙන් වෙන්ව ම, අකුසල ධර්මයන්ගෙන් වෙන්ව ම'යි මෙසේ දෙපදයෙහි ම 'ම' වෙතියි දතයුතුයි.

එතෙකුදු වුවත් **විවිච්ච** යැයි දෙපදයෙහිම යෙදේ. මේ සාධාරණ (පොදු) වචනයෙන් තදංග, වික්ඛම්භණ, සමුච්ඡේද, පටිප්පස්සද්ධි, නිස්සරණ යන විවේකයෝ ද චිත්ත කාය උපධි විවේකයෝ ද සංග්‍රහයට යෙති. එසේම පූර්ව භාගයෙහි (මුල් අවස්ථාවෙහි) කාය, චිත්ත විවේකයන්ද විෂ්කම්භන විවේකයන් ද දතයුතුයි. ලෝකෝත්තර මාර්ග ක්‍ෂණයෙහි දී කාය විවේකය, චිත්ත විවේකය, සමුච්ඡේද විවේකය හා නිස්සරණ විවේකය දතයුතුයි. **කාමෙහි** යන මේ පදයෙන් (කාම සූත්‍ර නිද්දේසයෙහි) 'කතමෙ වත්‍ථුකාමා, මනාපිකා රූපා (වස්තු කාමයෝ කවරහුද? මනාප වූ රූපාදියයි.) ආදියෙන් ඉහතදී වස්තු කාමයෝ කියන ලද්දාහුමය. විභංගයෙහි, 'ඡන්‍දය කාමයයි. රාගය කාමයයි. ඡන්‍දරාගය කාමයයි. සංකල්පය කාමයයි. රාගය කාමයයි. සංකල්පය කාමයයි. රාගය කාමයයි. සංකල්ප රාගය කාමයයි' යනුවෙන් මෙසේ කෙලෙස් කාමය විස්තර කරන ලදී. ඒ සියල්ලම එක්ව ගෙන මෙහි අර්ථ දතයුතුයි. මෙසේ ඇතිකල්හි **විවිචෙවව කාමෙහි** යන්නෙන් 'වස්තු කාමයන් කෙරෙන් ද තොර වූයේම ය' යන අර්ථය යෙදේ. එයින් කාය විවේකය අදහස් කරන ලදී. **විවිචච අකුසලෙහි ධම්මෙහි** යනුවෙන් 'කෙලෙස්' කාමයන්ගෙන්, සියලු අකුසලයන්ගෙන් හෝ වෙන්වමැ'යි යන අර්ථය යෙදේ. ඉන් චිත්ත විවේකය අදහස් වේ. මෙහිදී පූර්ව වචනයෙන් කාමයෙන් දුරුවීම කී හෙයින් කාමසුඛ පරිත්‍යාගය (අත්හැරීම) ද දෙවන වචනයෙන් කෙලෙස් කාමයන්ගෙන් වෙන්වීම පැවසෙන හෙයින් නෙක්ඛම්ම සුඛ පරිග්‍රහණය ද විස්තර කරන ලද්දේ වේ.

මෙසේ වස්තුකාම, කෙලෙස් කාම දෙකින් දුරුවීමෙන් ම, මේ දෙක අතුරින් පළමුවැන්නෙන් කෙලෙස් දනවන වස්තු කාමයන්ගේ ප්‍රහාණය හා දෙවැන්නෙන් ක්ලේශ කාමයන්ගේ ප්‍රහාණය ද පළමුවැන්නෙන් ලොල් බවෙහි හේතු පරිත්‍යාගය හා දෙවැන්නෙන් අඥානතා ප්‍රහාණය ද පළමුවැන්නෙන් ප්‍රයෝග සිද්ධිය හා දෙවැන්නෙන් ආශ්‍රය ශෝධනය ද දක්වන ලදැයි දතයුතුයි. මේ පළමු නයයි. **කාමෙහි** යන මෙහි වස්තුකාම පක්‍ෂයෙහි 'වස්තුකාමයෙන්'යි කියන ලදී. කෙලෙස් කාම පක්‍ෂයෙහි වනාහි ඡන්දය ද රාගය ද යන මේ ආදී වශයෙන්

අනේක භේද ඇත්තේ වේ. කාමච්ඡන්දය ද කාමය යැයි අදහස් කරන ලදී. එය ද අකුසල පර්යාපන්න (ඇතුළත්) වූයේම 'තත්ථ කතමො කාමච්ඡන්දො කාමො' (එහි කාමච්ඡන්ද කාමය කවරේද?) ආදී නයින් විභංගයෙහි ධ්‍යානයනට ප්‍රතිපක්ෂ වශයෙන් වෙනම දක්වන ලදී. කෙලෙස් කාම වූ බැවින් හෝ මුල්පදයෙහි ද අකුසල පර්යාපන්න (ඇතුළත්) වූ බැවින් දෙවන පදයෙහි ද කියන ලදී. මෙහි (කාමයෙහි) අනේක භේද වශයෙන් **කාමතො** යැයි නොපවසා **කාමෙහි** යැයි කියන ලදී. සෙසු ධර්ම ස්වභාවයන්ගේ ද අකුසල භාවය විද්‍යමාන වන කල්හි, 'කතමෙ අකුසලා ධම්මා කාමච්ඡන්දො' එහි 'අකුසල ධර්මයෝ කවරහුද? කාමච්ඡන්දය.....' ආදී නයින් විභංගයෙහි මතු ධ්‍යානාංගයනට විරුද්ධ බව, ප්‍රතිපක්ෂ බව දැක්වීම් වශයෙන් නීවරණයෝ ම කියන ලද්දාහ. නීවරණයෝ වනාහි ධ්‍යානාංගයනට විරුද්ධයහ. ධ්‍යානයෙන්ම **නෙසං** එම නීවරණයනට (ධ්‍යානාංගයන්) ප්‍රතිපක්ෂයහ යි විධිවංශකය හ'යි, විඝාතකයහ'යි කී නියායි. ඒ එසේමැයි. 'සමාධිය කාමච්ඡන්දයට ද ප්‍රීතිය ව්‍යාපාදයට ද චිත්තර්කය ථීනමිද්ධයට ද සුඛය උද්ධච්ච කුක්කුච්චයට ද විචාරය විචිකිච්ඡාවට ද ප්‍රතිපක්ෂයහ'යි පේටකෝපදේසයෙහි කියන ලදී. මෙසේ මෙහිදී **විවිචෙවව කාමෙහි** යන මෙයින් කාමච්ඡන්දයේ විෂ්කම්භන විවේකය දක්වන ලදී. **විවිචච අකුසලෙහි ධමෙමහි** යන මෙයින් නීවරණ පංචකය ම නොගැනීමෙන්, පළමු පදයෙන් කාමච්ඡන්දයෙහි හා දෙවැන්නෙන් සෙසු නීවරණයන්ගේ ද, එසේම පළමුවැන්නෙන් ත්‍රිවිධ අකුශල මූලයන්හි පංචකාම ගුණභේද විෂය වූ ලෝභයෙහි හා දෙවැන්නෙන් ආඝාත වස්තු (වෛරයට හේතු) ආදිය විෂයකොට ඇති ද්වේෂ මෝහයන්ගේද, පළමුවැන්නෙන් ඕඝාදී ධර්ම අතුරින් කාමෝඝ, කාමයෝග, කාමාශ්‍රව, කාමූපාදාන, අභිධ්‍යා, කාය ග්‍රන්ථ, කාමරාග සංයෝජනයන්ගේ හා දෙවැන්නෙන් සෙසු ඕඝ යෝග - ආශ්‍රව - උපාදාන - ග්‍රන්ථ සංයෝජනයන්ගේ ද, පළමුවැන්නෙන් තණ්හාවෙන් සහ ඒ හා සම්ප්‍රයුක්ත ධර්මයන්ගේ හා දෙවැන්නෙන් අවිද්‍යාවෙන් සහ ඒ හා සම්ප්‍රයුක්ත ධර්මයන්ගේ ද පළමුවැන්නෙන් ලෝභ සම්ප්‍රයුක්ත අෂ්ට අකුසල චිත්තුප්පාදයන්ගේ හා දෙවැන්නෙන් සෙසු දෝස - මෝහ චතුෂ් කුසල චිත්තුප්පාදයන්ගේ ද විෂ්කම්භන විවේකය කියන ලදැයි දතයුතුයි.

මෙපමණෙකින් ප්‍රථමධ්‍යානයෙන් ප්‍රහීණ කළයුතු අංගයන් දක්වා ඉක්බිති සම්ප්‍රයෝගාංගයන් (ධ්‍යානය සමග සම්ප්‍රයුක්ත අංගයන්) දැක්වීමට 'සවිතක්කං සවිචාරං' යනාදිය කියන ලදී. එහි අරමුණෙහි සිත නංවන,

පිහිටුවන ලක්ෂණය **විතක්කෝ** විතක්ක යි. අරමුණු පිරිමදින සිත හසුරුවන ස්වභාවය **විචාරෝ** විචාරයි. මේ දෙකෙහි අවියෝගත්වය (වෙන් නොවීම) කිසි තැනෙක්හි ඇතත් ඕලාරික (මහත්ය යන) අර්ථයෙන් ද පූර්වාංගම (පෙරටුව යතැයි යන) අර්ථයෙන් ද, ඝණ්ටා ප්‍රහාරයක් වැනි සිතෙහි පළමු (අරමුණේ) හැපීම විතර්කයයි. සියුම්ය යන අර්ථයෙන් ද පිරිමදින ස්වභාවයෙන් ද ඝණ්ටානුරාවය මෙන් (ඝණ්ඨාව ගැසීම) අනුව නො නැවතී පවතිනුයේ විචාරයයි. මෙහි විතර්කය පළමුව උපදින අවස්ථාවේ සිතෙහි ස්පන්දනය (ඝසල වීම) වැනි වූ පැතිරයාමයි. එය අහසට නගිනු කැමති පක්ෂියකුගේ පියාපත් චංචලවීම මෙන් ද සුවඳ අනුව පැමිණි බඹරෙකු පියුමක් මතට බැසීම මෙන් ද වේ. විචාරය සිතෙහි සසලවීම අධික නොවූ සන්සුන් පැවැත්මයි. එය අහසට නැගි පක්ෂියා පියාපත් දිගහැර අහසේ පියාසර කිරීම මෙන් ද පියුමට වැසූ බඹරා පියුම මත හැසිරීම මෙන් ද වේ.

දුක නිපාත අටුවාවෙහි මෙසේ විස්තර වේ. 'අහසින් පියඹා යන මහා පක්ෂියාගේ පියාපත් දෙකින් වාතය (රුකුල්) ගෙන පියාපත් සන්සිඳුවා (නිසලව තබාගෙන) යාම මෙන් අරමුණෙහි සිත නැංවූ ස්වභාවයෙන් පවතිනුයේ විතර්කයයි. වාතය (රුකුල්) ගැනීමට පියාපත් ගසමින් ගමන් කිරීම මෙන් පිරිමැදීම් ස්වභාවයෙන් පවතිනුයේ විචාරයයි.' මෙම ක්‍රියාවලිය නොනවත්වා පැවැත්වීම වේ. මේ විතක්ක විචාර දෙකෙහි විශේෂය (වෙනස්කම) ප්‍රථම, ද්විතීය ධ්‍යානයන්හි ප්‍රකටව වේ. තවද මල බැඳුණු යකඩ භාජනයක් එක් අතකින් දැඩිව ගෙන, අනික් අතින් සුණු තෙල් සහිත සුඹුලුවෙකින් පිරිමදිනවිට, එම භාජනය දැඩිව ගත් අත විතර්කය වැනිය. පිරිමදින අත විචාරය වැනි ය.

එසේම කුම්භකාරකයකු දණ්ඩෙන් ගසා සක කරකවා භාජනයක් සෑදීමේදී තදින් අල්ලාගත් අත විතර්කය වැනිය. ඔබමොබ සැරිසරන අත විචාරය වැනිය. එසේම, අරමුණෙහි පිහිටන විතර්කය, වෘත්තයක් (වටයක්) අදින්නහුගේ මධ්‍යයෙහි සිටුවාගත් හුල වැනිය. පිරිමදින ස්වභාව ඇති විචාරය, පිටතින් (වටකොට) බමන (රැහැන් අග බැඳි) හුල වැනිය. මෙසේ (විස්තර කළ) 'මේ විතක්කයෙන් ද විචාරයෙන් ද යුක්තව පවතින ඵලින් හා මලින් යුතු ගසක් මෙන් 'මේ ධ්‍යානය සවිතක්කය. සවිචාර යැයි කියනු ලැබේ. **විවෙකජං** යනු 'මෙහි විවික්ත බව විවේකයයි. නීවරණයන්ගෙන් වෙන්වීමය' යන අර්ථයි. 'වෙන් වූයේ හෝ විවේකයි.

නීවරණයන්ගෙන් තොර වූ ධ්‍යාන සම්ප්‍රයුක්ත ධර්ම රාශියයි යන අර්ථයි. එම විවේකයෙන් හෝ එම විවේකයෙහි උපන්හ'යි යන අර්ථයෙන් 'විවේකජ' නම් වේ. **පීතිසුඛං** යනු මෙහි පිනවානුයි පීති නම්. එය ප්‍රියකරවන ලක්ෂණ ඇත්තේ ය. එම ප්‍රීතිය :- බුද්දක ප්‍රීතිය, ඛණික ප්‍රීතිය, ඔක්කන්තික ප්‍රීතිය, උබ්බේග ප්‍රීතිය හා ඵරණ ප්‍රීතිය යනුවෙන් පංචවිධ වේ.

එහි, බුද්දක ප්‍රීතිය ශරීරයේ ලොමුඩැහැගැනීම පමණක්ම ජනිත කිරීමට සමත් වේ. ඛණික ප්‍රීතිය ක්ෂණයක් ක්ෂණයක් පාසා උපදින විදුලිය හා සමාන වේ. ඔක්කන්තික ප්‍රීතිය මුහුදු තීරයේ රළ පෙළ මෙන් කය තුළ නැගි නැගී බිඳී යයි. උබ්බේග ප්‍රීතිය බලවත් වේ. කය ඔසවා අහසට නංවන්නට තරම් බලවත් වේ. ඵරණ ප්‍රීතිය ඉතා බලවත් වේ. ඒ ප්‍රීතිය උපන් කල්හි මුලු සිරුරම පිඹ පුරවා දැමූ වස්තියක් මෙන් ද මහත් ජල ප්‍රවාහයක් ඇතුලට වැදී ගිය පර්වත ගුහාවක් මෙන් ද හාත්පසින් පැතිරගත්තේ වේ. මේ පංචවිධ ප්‍රීතිය ගැබ්ගෙන (ඇතුළත හටගෙන) මුහුකුරා යනුයේ කාය පස්සද්ධිය හා චිත්ත පස්සද්ධිය යන දෙවැදෑරුම් පස්සද්ධි සම්පූර්ණ කරයි. පස්සද්ධිය ගැබ්ගෙන මුහුකුරා යනුයේ කායික චෛතසික සුඛය සම්පූර්ණ කරයි. සුඛය ගැබ්ගෙන මුහුකුරා යනුයේ ඛණික සමාධිය, උපචාර සමාධිය, අර්පණා සමාධිය යන ත්‍රිවිධ සමාධිය සම්පූර්ණ කරයි.

එම (පංචවිධ ප්‍රීතින්) අතුරෙන් අර්පණා සමාධියට මූලාධාර වී වැඩෙන සමාධිය හා සමග සම්ප්‍රයෝගයට ගිය යම් ඵරණ ප්‍රීතියක් වේද, එය මේ අර්ථයෙහි දී **පීති** යන්නෙන් අභිප්‍රේත වූ ප්‍රීතියයි. අනික් වදන වනාහි සැපයට පත් කරන්නේනුයි **සුඛං** සුඛ නම් වේ. යමෙකුට එය ඉපදීමෙන් ඔහු සැපයට පත්කරයි යන අර්ථයයි. නැතහොත්, සුඛිත වීම 'සුඛ' නම් වේ. 'කායචිත්ත ආබාධයන් මනාකොට කා දමති'යි, සාරා දමති'යි හෝ සුඛ නම් වේ. සෝමනස්ස වේදනාවට මේ නමෙකි. එය සමනය කිරීම ලක්ෂණ කොට ඇත්තේ ය. කිසිතැනෙක්හි, එම කාය චිත්ත ආබාධයන්ගේ අවියෝගය ඇති කල්හි (එම ආබාධයන් සුව නොවී තිබියදී) පවා ඉෂ්ටාලම්භණ ප්‍රතිලාභයෙන් (සිතූ පැතූ ඉටු අරමුණු ලැබීමෙන්) ඇතිවන සතුට පීති නම් වේ. ප්‍රතිලබ්ධ ආලම්බන රසානුභවය (ලද අරමුණු රස විඳීම) 'සුඛ' නම් වේ. යම්තැනෙක ප්‍රීතිය වේද එතැන සුඛය ඇත. යම්තැනෙක සුඛය වේද එතැන නියත වශයෙන් ප්‍රීතිය ඇත්තේ නොවේ. ප්‍රීතිය සංඛාර ස්කන්ධයෙහි සංගෘහිත වේ. සුඛය

වේදනා ස්කන්ධයෙහි සංගෘහිත වේ. ප්‍රීතිය කාන්තාරයෙහි විඩාවට, වෙහෙසට පත්වූවහුට වනරොදක්, සිසිල් දිය පහරක් දැකීම බඳුය. සුඛය වනරොදට පිවිසීම, ජල පරිභෝගය බඳුය. ඒ ඒ අවස්ථා අනුව, ප්‍රකට වන ස්වභාවය අනුව මේ දෙපදය පවසන ලදැයි දතයුතුයි.

මෙසේ ප්‍රීතියත්, සුඛයත් මෙම ධ්‍යානයෙහි හෝ මෙම ධ්‍යානයට ඇත්තේනුයි මෙම ධ්‍යානය 'පීති-සුඛය'යි කියනු ලැබේ. නැතහොත් ප්‍රීතිය ද සුඛය ද 'පීතිසුඛ'යි, ධර්මවිනය ආදිය මෙනි. විවේකයෙන් හටගත් පීති සුඛය මේ ධ්‍යානයට හෝ මේ ධ්‍යානයෙහි ඇත්තේනුයි **විවෙකජං පීතිසුඛං** විවේකජ පීතිසුඛ නම් වේ. ධ්‍යානය යම්සේ ද පීති සුඛය ද එසේම මෙහි විවේකජ වේ. එයද (විවේකජය ද) මෙයට (පීති සුඛයට) ඇත්තේනුයි, අලුප්ත සමාස කොට එක් පදයක් වශයෙන් ම කිවයුතුය. **පඨමං** යනු අනුපිළිවෙලින් ගණනය කිරීම් වශයෙන් 'පඨම'යි, 'පළමුව උපන්හ'යි ද පඨම වේ. **ඣානං** ඣාන යනු ධ්‍යානයයි. එය ආරම්මණූපනිජ්ඣාන හා ලක්ඛණූපනිජ්ඣාන වශයෙන් දෙවැදෑරුම් වේ. එහි අෂ්ට සමාපත්ති පඨවි කසිණාදී අරමුණු නැවත නැවත සිහිපත් කරන්නේනුයි ආරම්මණූපනිජ්ඣාන නම් වේ. විදර්ශනා මාර්ගඵල (මෙනෙහි කිරීම) වනාහි ලක්ඛණූපනිජ්ඣාන නම් වේ.

එහි විදර්ශනා, අනිත්‍යාදී ලක්ෂණයන් පුන පුනා සිහිකිරීම් වශයෙන් ලක්ඛණූපනිජ්ඣාන නම් වේ. විදර්ශනාවෙන් කෘත්‍ය කෘත්‍ය (නිම කළ කටයුතු) ඇත්තහුගේ මාර්ග ඥානයෙන් සමෘද්ධ වීම් වශයෙන් ආර්ය මාර්ගය ලක්ඛණූපනිජ්ඣාන නම් වේ. ඵලය වනාහි නිරෝධ සත්‍යය තථ ලක්ෂණය පුන පුනා මෙනෙහි කරන්නේ නු යි, ලක්ඛණූපනිජ්ඣාන නම් වේ. මේ ධ්‍යාන දෙකින් පූර්වභාගයෙහි (මුල් අවස්ථාවෙහි) ආරම්මණූපනිජ්ඣානය ද, ලෝකෝත්තර මාර්ග ක්ෂණයෙහි ලක්ඛණූපනිජ්ඣානයද අදහස් කරන ලදී. එහෙයින් ආරම්මණූපනිජ්ඣාන වශයෙන් ද, ලක්ඛණූපනිජ්ඣාන වශයේ ද විරුද්ධ වූ නීවරණාදී සතුරන් දවන බැවින් (ධ්‍යාන) ඣාන නම් වේ යැයි දතයුතුයි. **උපසම්පජ්ජ** යනු ලඟට පැමිණ, සමීපයට විත් යයි කී නියායි. සමීපයට පමුණුවා හෝ නිෂ්පාදනය කොට යයි කී නියායි. **විහරති** යනු එයට අනුරූප වූ ඉරියවු ඇතිව පවතියි යැයි කියන ලද ආකාර ඇති ධ්‍යානයෙන් යුක්තව, ජීවිතය හැසිරවීම, පැවැත්වීම සලස්වා ගනියි.

ඒ මේ ප්‍රථම ධ්‍යානය වනාහි අංග පසෙකින් හීන වූයේ, අංග පසෙකින් සමන්විත වූයේ ත්‍රිවිධ කල්‍යාණයෙන් හා දස ලක්‍ෂණයෙන් යුක්ත වූයේ ද වේ.

එහි කාමච්ඡන්ද, ව්‍යාපාද, ථීනමිද්ධ, උද්ධච්ච කුක්කුච්ච, විචිකිච්ඡා යන මේ පංච නීවරණ ධර්මයන්ගේ ප්‍රහාණ වශයෙන් අංග පසෙකින් ප්‍රහීණවීම දතයුතුයි. මේ පස ප්‍රහීණ නොවූ කල්හි කිසිසේත්ම ධ්‍යානය නූපදී. එහෙයින් එහි (ධ්‍යානයෙහි) ප්‍රහාණාංග යැයි කියනු ලැබේ. තවද ධ්‍යාන ක්‍ෂණයෙහි අන්‍ය වූ ද අකුශල ධර්මයන් ප්‍රහීණ වෙතත්, මොහුම (පංච නීවරණයෙහි ම) විශේෂයෙන් ධ්‍යානයට අන්තරාය කර වෙති.

කාමච්ඡන්දය හේතුකොට වනාහි නොයෙක් නොයෙක් විෂයයන්හි පොළඹවන ලද සිත එක් අරමුණෙක්හි සමාධිගත නොවේ. කාමච්ඡන්දය විසින් මඬනා ලද ඒ (සිත) කාම ධාතු ප්‍රහාණය පිණිස වූ පිළිවෙතට නො පිවිසෙයි. ව්‍යාපාදය හේතුකොට ගෙන ද අරමුණෙහි හැපෙමින් නිරතුරුව නො පවතියි. ථීනමිද්ධයෙන් මඬනා ලද සිත අකර්මණ්‍ය වේ. උද්ධච්ච කුක්කුච්ච දෙකින් පීඩිත වූ සිත නොසන්සිඳුණේ ම ඒ මේ අත බමයි. විචිකිච්ඡාවෙන් මැඩුණු සිත ධ්‍යානාධිගමය සාධනය කරන පිළිවෙතට නො නගියි.

මෙසේ ධ්‍යානයට වෙසෙසින් අන්තරායකර බැවින් මොහුම ප්‍රහාණංගයෝ යැයි කියන ලදහ. විතර්කය අරමුණට සිත නංවයි. විචාරය අරමුණෙහි සිත හසුරුවයි. ඒ දෙකේ එකතුවෙන් සැපයුණ ප්‍රයෝග (යෙදීම්) සහිත සිත පිළිබඳ එම ප්‍රයෝග සම්පත්ති රාශිය පිනවීම (ප්‍රීතිය)ද විවිධ සුඛයන් ද වර්ධනය කරයි.

ඉක්බිති, සිත පිළිබඳ සෙසු සම්ප්‍රයුක්ත (සිත හා බැඳුණු) ධර්මයන් සහිත වූ ද, අභිනිරෝපණ (අරමුණට නැංවීම), අනුබන්ධන (හැසිරවීම), ඵීනන (පිනවීම), උපබෘහන (වර්ධනය) යන මේ විතක්කාදී සිවු අංගයන් විසින් අනුග්‍රහ කරන ලද්දා වූ ද, (පස්වන අංගය වූ) ඒකග්ගතාව එක්ම අරමුණෙක සිත සමසේ, මනාකොට පිහිටුවයි. එහෙයින්, විතර්ක, විචාර, ප්‍රීති, සුඛ, චිත්තෙකාග්‍රතාය යන මේ පසෙහි උත්පත්ති වශයෙන් පංචාගයෙන් සමන්විත වූ බව දතයුතුය.

මේ අංග පස උපන් කල්හි ධ්‍යානය උපන්නා නම් වේ. එහෙයින් පළමු ධ්‍යානය මේ ධ්‍යානයෙහි පංච සමන්නාගතාංග (සමන්විත අංග පස) යැයි කියනු ලැබේ. එහෙයින් මේ අංගයන්ගෙන් යුතු අනික් ධ්‍යානයක් නම් ඇතැයි නොගත යුතුයි. යම්සේ වනාහි අංග මාත්‍ර වශයෙන් ම ගෙන චතුරංග සේනාය, පංචාංගික තූර්යය, අෂ්ඨාංගික මාර්ගයයි කියනු ලැබේ ද, එසේම මෙය (මේ ධ්‍යානය) ද අංගමාත්‍ර වශයෙන් ම 'පංචංගිකය', 'පංචංග සමන්නාගත' යයි කියනු ලැබෙති'යි දතයුතුයි. මෙම අංග පස ද ඇතැම්විටෙක උපචාර ක්ෂණයෙහි ද ඇත. එවිට උපචාරයෙහි ප්‍රකෘතිය බලවත් වේ. මෙහිදී වනාහි, උපචාරයට ද වඩා බලවත්ව, රූපාවචර ක්ෂණයට පැමිණ නිපන්නාහ. මෙහිදී වනාහි, විතක්කය ඉතා පැහැදිලි ආකාරයෙන් අරමුණෙහි සිත නංවමින් උපදියි.

විචාරය අතිශයින් ම අරමුණ පිරිමදිනුයේ පීති සුඛ යන දෙක මුළු සිරුර පුරා පැතිර පවතියි. එහෙයින් කීහ. 'මේ මුළු සිරුරෙහි ම විවේකයෙන් හටගත් පීති සුඛයෙන් නො පතළ කිසිදු තැනක් නොවේ.' චිත්ත ඒකාග්‍රතාව ද යටින් ඇති කරඬු පියන මත, උඩින් වූ කරඬු පියන මෙන් අරමුණ මනාසේ ස්පර්ශ කරමින් උපදියි. මේ ධ්‍යානාංගයන්ගේ එකිනෙක අතර වෙනස, එහි චිත්තේකාග්‍රතාව 'සවිතකකං සවිචාරං' යැයි මේ පාඨයේ නො දක්වන ලදුයේ නමුදු විභංගයෙහි, 'ධ්‍යානය යනු විතක්ක, විචාර, පීති, සුඛ, චිත්තේකග්ගතා යයි' කියන ලද බැවින් එය අංගයක්ම වේ. භාග්‍යවතුන් වහන්සේ විසින් යම් අභිප්‍රායයෙකින් උද්දේස කරන ලද ද ඒ අභිප්‍රායෙන් ම විභංගයෙහි ප්‍රකාශ කරන ලද්දේ වේ. **තිවිධ කල්‍යාණං දසලක්ඛණ සමපනනං** යන මෙහි වනාහි ආදි, මධ්‍ය, පරියෝසාන වශයෙන් ත්‍රිවිධ කල්‍යාණතාව වේ. එම ආදි, මධ්‍ය, පර්යවසානයන්ගේ ලක්ෂණ වශයෙන් දස ලක්ෂණයෙන් සමන්විත බව දතයුතුය. මේ එහි පෙළයි.

'පඨමස්ස ඣානස්ස පටිපදා විසුද්ධි ආදි උපෙඛානුබ්‍රූහනා මජ්ඣං සමපහංසනා පරියොසානං.....' (මෙසේ පෙළෙන් උපුටා දක්වන පාඨයේ අර්ථය පහත දැක්වේ.)

'පළමු ධ්‍යානයෙහි ප්‍රතිපදා විශුද්ධිය ආදිය යි. උපේක්ෂාවෙහි වැඩීම මධ්‍යයයි. සම්පහංසනය (සතුටුවීම) පරියෝසානයයි. පළමු ධ්‍යානයෙහි ප්‍රතිපදා විශුද්ධිය ආදියේ ලක්ෂණ කීපයක් වේ ද? ආදියේ

ලක්ෂණ තුනෙකි. එම ධ්‍යානයට යම් උවදුරක් වේද, එයින් සිත පිරිසිදු වේ. පිරිසිදු වූ හෙයින් සිත මධ්‍යම සමථ නිමිත්තට පිළිපන්නේ වෙයි. (පිවිසියේයි.) පිළිපන් බැවින් එහි සිත ඇතුළට වදියි. යම්සේ සිත උවදුරුවලින් මිදී පිරිසිදු වේද, යම්සේ පිරිසිදු වූ සිත මධ්‍යම වූ සමථ නිමිත්තයට පිළිපන්නේ වේද, යම්සේ පිළිපන් හෙයින් සිත එයට පිවිසියේද, මෙසේ ප්‍රථම ධ්‍යානයට පටිපදා විසුද්ධිය ආදියයි. (ආරම්භයයි.) ආදියෙහි මෙකී ලක්ෂණ තුන ඇත්තේ ය. එහෙයින් කියනු ලැබේ. 'ප්‍රථම ධ්‍යානය ආදි කල්‍යාණ නම් ද ත්‍රිලක්ඛණ සම්පන්න නම් ද (යහපත් ආරම්භයක් ඇත්තේ ද ලක්ෂණත්‍රයයෙකින් යුක්ත වූයේ ද) වේ.' යනුයි.

ප්‍රථමධ්‍යානයෙහි මධ්‍යාවස්ථාවෙහිදී උපේක්ෂාව වැඩීම (මෙනෙහි කිරීම) වේ. මධ්‍යාවස්ථාවෙහි ලක්ෂණ කොතෙක් ද? මධ්‍යාවස්ථාවෙහි ලක්ෂණ තුනෙකි. විශුද්ධ වූ සිත කෙරෙහි අධ්‍යුපේක්ෂිත (උත්සාහ රහිත) වෙයි. සමථ ප්‍රතිපදාව කෙරෙහි අධ්‍යුපේක්ෂිත වෙයි. ඒකාග්‍රතාවෙහි එළඹීම් පිළිබඳව අධ්‍යුපේක්ෂිත වෙයි. යම් සේ විශුද්ධ වූ සිත කෙරෙහි අධ්‍යුපේක්ෂිත වේද, යම් සේ සමථ ප්‍රතිපදාව කෙරෙහි අධ්‍යුපේක්ෂිත වේද, යම්සේ ඒකාග්‍රතාවෙහි එළඹීම පිළිබඳව අධ්‍යුපේක්ෂිත වේද, මෙසේ ප්‍රථමධ්‍යානයෙහි මධ්‍යාවස්ථාවෙහි දී උපේක්ෂා වැඩීම වේ. මධ්‍යාවස්ථාවෙහි වූ ධ්‍යානයෙහි මෙකී ලක්ෂණත්‍රයය වේ. එහෙයින් කියනු ලැබේ. 'ප්‍රථම ධ්‍යානය 'මජ්ඣෙ කල්‍යාණ' නම් ද, 'තිලක්ඛණ සම්පන්න' නම් ද වේ' යනුවෙනි.

'සම්පහංසනා' (සම්ප්‍රහර්ෂණය හෙවත් ප්‍රීතිය) ප්‍රථම ධ්‍යානයෙහි පරියෝසානය (අවසන් අවස්ථාව)යි. පරියෝසානයෙහි ලක්ෂණ කෙතෙක්ද? පරියෝසානයෙහි ලක්ෂණ සතරෙකි. එහි උපන්නා වූ සමාධි පඤ්ඤා යන (යුගල) ධර්මයන් එකිනෙක නො ඉක්මවා පවතිනැයි යන අරුතින් 'සම්පහංසන' නම් වේ. (ශ්‍රද්ධාදී) 'ඉන්ද්‍රියයන් ඒකරස (එක්ම කෘත්‍යයක් ඇති)යහ'යි යන අරුතින් සම්පහංසන' නම් වේ. 'ධ්‍යානය වෙත එළඹෙන වීර්යය ගෙන එති'යි යන අරුතින් 'සම්පහංසනා' නම් වේ. ආසේවන (සේවනය) යන අරුතින් 'සම්පහංසනා' නම් වේ. (මෙසේ) සම්පහංසනාව ප්‍රථම ධ්‍යානයෙහි පරියෝසානයයි. පරියෝසානයෙහි මෙකී ලක්ෂණ සතර ඇත. එහෙයින් කියනු ලැබේ. 'ප්‍රථමධ්‍යානය 'පරියෝසාන කල්‍යාණ' නම් ද, 'ලක්ඛණ සම්පන්න' නම් ද වේ' යනුයි.

එහි ඇතැමෙක් මෙසේ අර්ථ දක්වති. 'ප්‍රතිපදා විශුද්ධිය නම් පිරිවර සහිත වූ උපචාර සමාධියයි. 'උපේක්ෂා වර්ධනය' නම් අර්පණා සමාධියයි. සම්පහංසනා නම් ප්‍රත්‍යවේක්ෂණයයි.

ඇතැමෙක් මෙසේ අර්ථ දක්වති. 'එහි පටිපදා විසුද්ධි නම් සයම්භාරික (සහජාත ධර්මයන් සහිත) උපචාර සමාධියයි. උපෙක්ඛානු බ්‍රූහනා (උපේක්ෂා වර්ධනය) නම් අර්පණා සමාධියයි. සම්පහංසනා (සම්ප්‍රහර්ෂණය හෙවත් ප්‍රීතිය) නම්, ප්‍රත්‍යවේක්ෂණය මෙනෙහි කිරීමයි.' යනුවෙනි. 'ඒකාග්‍රතාවට පත් සිත ප්‍රතිපදා විශුද්ධි ලක්ෂණ ඇත්තේ යැයිද, උපේක්ෂාවට අනුගතව වඩන ලද්දේ යැයි ද, ඥානයෙන් සම්ප්‍රහර්ෂිත (ප්‍රීතියට පත්) වූයේ යයි ද 'පෙළෙහි කියන ලදී. එහෙයින් අර්පණාව තුළදීම පැමිණීම් වශයෙන් පටිපදා විසුද්ධිය ද, 'තත්‍රමජ්ඣත්තුපෙක්ඛා' (හෙවත් පූර්ණ මධ්‍යස්ථාවෙහි කෘත්‍ය වශයෙන් උපේක්ෂා වර්ධනය ද, (සමාධි-පඤ්ඤා යන) ධර්මයන් එකිනෙක නො ඉක්මවන බව ආදිය සිද්ධවීමෙන් පරියෝදපක (පිරිසිදු කරන) ඥානයෙහි කෘත්‍ය නිෂ්පත්ති (කාර්යයන් ඉටුවීම්) වශයෙන් සම්පහංසනාව (ප්‍රීතිය) දතයුතුය.

කෙසේද යත්, යම්කලෙක අර්පණාව උපදියි ද, ඒ තුල යම් නීවරණ සංඛ්‍යාත වූ කෙලෙස් සමූහයක් ඒ ධ්‍යානයට උවදුරක් වේද, එයින් සිත පිරිසිදු වේ. පිරිසිදු වූ බැවින් ආවරණයන්ගෙන් තොරව සිත මධ්‍යයෙහි වූ සමථ නිමිත්තට පිවිසෙයි. මධ්‍යයෙහි වූ සමථ නිමිත්ත නම්, මැනවින් පවත්නා වූ අර්පණා සමාධිය මැයි. 'ඉන් අනතුරුව, පළමු සිත ඒක සන්තති පරිණාමයෙන් පසක් බවට යනුයේ මධ්‍යම වූ සමථ නිමිත්තට පිවිසෙනුයේ නම් වේ. මෙසේ පිළිපන් බැවින් පසක් බවට පැමිණීමෙන් එහි වදිනුයේ නම් වේ. මෙසේ පළමුකොට ප්‍රථම චිත්තයෙහි විද්‍යමාන වූ ආකාරය නිපදවන පටිපදා විසුද්ධිය ප්‍රථම ධ්‍යානය උපන් කෙනෙහිම පැමිණීම් වශයෙන් දතයුතුයි.

මෙසේ පිරිසිදු වූ සිත නැවත පිරිසිදු කිරීමක් අනවශ්‍ය බැවින් පිරිසිදු කිරීමෙහි උත්සාහයක් නොකරනුයේ, 'විශුද්ධ වූ චිත්තය අධ්‍යුපේක්ෂා කරනුයේ නම් වේ. සමථ භාවයට පැමිණීමෙන්, සමථ භාවයට පිළිපන් සිත නැවත සන්සුන් කිරීමෙහි උත්සාහ නොකරනුයේ, සමථයට පිළිපන් සිත අධ්‍යුපේක්ෂා කරනුයේ නම් වේ. සමථයට පිළිපන් බැවින් මෙසේ

ක්ලේශ සංසර්ගය අත්හැර, ඒකාග්‍රතාවෙන් සිටි මේ චිත්තය නැවත ඒකාග්‍රතාවෙහි තැබීමට උත්සාහයක් නොකරනුයේ ඒකාග්‍රභාවයෙහි සිටුවීම පිළිබඳව අධ්‍යුපේක්ෂා කරනුයේ නම් වේ. මෙසේ තත්‍රමජ්ඣත්ත - උපේක්ෂාවෙහි කෘත්‍ය වශයෙන් උපේක්ෂා වර්ධනය (භාවනය) දතයුතුයි.

මෙසේ උපේක්ෂාව වැඩීමෙන් එහි උපන් යම් ඒ සමාධි-පඤ්ඤා සංඛ්‍යාත වූ යුගනද්ධ (එක්ව බැඳුණු) ධර්ම යුගලයක් එකිනෙක නොඉක්මවා පැවතියේ ද, ශ්‍රද්ධාදී වූ යම් ඉන්ද්‍රිය සමූහයක් අනේකාකාර ක්ලේශයන්ගෙන් මිදුණ හෙයින් විමුක්ති රසයෙන් එක සමානව පැවතියේ ද, එකී (සමාධි, පඤ්ඤා යන) ධර්මයන් එකිනෙක නො ඉක්මවන ස්වභාවයට ගිය, තවද ඒක කෘත්‍යභාවයට (සමාන කිසක් ඇති බවට) පත් එම ධර්මයනට යෝග්‍ය වූ යම් වීර්යයක් පවත්නේ ද, 'එකෙණෙහි එම වීර්යයෙහි පැවති යම් අසේවනයක් වේදැ'යි යනුවෙන් මෙසේ ඒ සියලු ආකාරයෝ ඥානයෙන් සංක්ලේශයන් පිරිසිදු කිරීමෙහි දී, ඒ ඒ ආදීනවයන් හා ආනිසංසයන් දැක, ඒ ඒ ආකාරයෙන් සම්ප්‍රහර්ෂිත (ප්‍රීති) වූ හෙයින්, පිරිසිදු කරන ලද හෙයින්, පවිත්‍ර කරන ලද හෙයින් හටගත්තාහුය. එහෙයින් (එකී සමාධි-පඤ්ඤා ආදී) ධර්මයන් එකිනෙක නො ඉක්මවීම් ආදිය සිදුවීමෙන් පරියෝදපක ඥානයෙහි කෘත්‍ය නිෂ්පත්ති වශයෙන් සම්පහංසනා (සම්ප්‍රහර්ෂණය) දතයුතුය. **විතක්ක විචාරානං වූපසමා** යනු විතර්ක විචාර යන මේ දෙක සන්සිඳීමෙන්, දුතිය ධ්‍යාන ක්ෂණයෙහි ඒ දෙක පහළ නොවන බැවිනැයි කී නියායි.

එහි ද්විතීය ධ්‍යානයෙහි, ප්‍රථම ධ්‍යානයෙහි ඇතැයි පැවසූ සියලුම ධර්මයන් නොපවතිතත්, ප්‍රථම ධ්‍යානයෙහි එස්සාදිය එකෙකි. මෙහි (ද්විතීය ධ්‍යානයෙහි) අනෙකකි. ඕලාරික වූ ඕලාරික අංගය ඉක්මවීමෙන් ප්‍රථම ධ්‍යානයෙන් අන්‍ය වූ ද්විතීය ධ්‍යානාදීන්ගේ අධිගමය වෙති'යි දක්වනු සඳහා 'විතක්ක විචාරානං වූපසමා' යනුවෙන් මෙසේ කියන ලදැයි දතයුතුයි. **අජ්ඣත්තං** යනු මෙහිදී ස්වකීය චිත්ත සන්තානය අභිප්‍රේතයි. 'තමා තුල උපන්', 'තමාගේ සන්තානයෙහි උපන්' යන අර්ථයි. **සම්පසාදනං** යනු ශ්‍රද්ධාව සම්පසාදන යැයි කියනු ලැබේ. සම්ප්‍රසාදනය හා සමග යෙදීමෙන් ධ්‍යානය ද සම්ප්‍රසාදන වේ. නීල වර්ණය යෙදීමෙන් වස්ත්‍රය නිල් වස්ත්‍ර නම් වන සෙයිනි. යම්හෙයකින් තෘතීය ධ්‍යානය සම්ප්‍රසාදනයෙන් යුක්ත වූ බැවින් විතක්ක, විචාරයන්ගේ

කැළඹීම් සංසිඳවීමෙන් චේතනාව පැහැදීමට පත් වේද, එහෙයින් සම්ප්‍රසාදන යයි කියන ලදී. මෙම අර්ථ විකල්පයෙහි 'සම්පසාදනං චෙතසෝ' (සිත පැහැදීම) යනුවෙන් පද සම්බන්ධය දතයුතුයි. පෙර පැවසූ (ද්විතීය ධ්‍යානයෙහි) අර්ථ විකල්පයෙහි දී 'චෙතසෝ' යන මෙය 'එකොදි භාව' යන්න හා සමග යෙදිය යුතුය. මේ එහි අර්ථ යෝජනාවයි. 'එකො උදෙතී'ති එකොදි' ශ්‍රේෂ්ඨව උපදිනුයි යන අරුතින් 'එකෝදි' නම් වේ. විතක්ක, විචාරයන් උස්ව නො නැඟුණු බැවින් අග්‍ර වී, ශ්‍රේෂ්ඨ වී උදාවෙයි යන අර්ථයයි. ලෝකයෙහි සෙටෙඨා පි (ශ්‍රේෂ්ඨයා ද) එකො (ඒක) යැයි කියනු ලැබේ. විතක්ක විචාර විරහිත වූයේ හෝ එකො (අග්‍ර වූයේ) අසහායො (අසහාය වූයේ) පවතියි.

නැතහොත්, සම්ප්‍රයුක්ත ධර්මයන් (උද්දායති) වඩවති'යි යන අරුතින් 'උදි'යි, 'නංචති'යි යන අර්ථයි. 'ශ්‍රේෂ්ඨ' ය යන අරුතින් 'එක' වූයේ ද එම 'උදි' වූයේ ද, 'එකෝදි' යි වේ. මේ සමාධියට අධිවචනයි. මෙසේ මේ එකෝදිය (සමාධිය) 'භාවනය කෙරෙති'යි, 'වඩවති'යි යන අරුතින් ද්විතීය ධ්‍යානය 'එකෝදිභාව' නම් වේ.

ඒ මේ එකෝදිය (සමාධිය) යම්හෙයකින් සත්ත්වයකුගේ, ජීවියකුගේ නොව සිත පිළිබඳව ම වේද, එහෙයින් මෙය **චෙතසෝ එකොදිභාවං** සිතෙහි ඒකාග්‍රතාවයයි කියන ලදී.

මේ ශ්‍රද්ධාව සහ ඒකෝදිභාව නම් සමාධිය ප්‍රථම ධ්‍යානයෙහි ද ඇත්තේ නොවේ ද? එසේනම් කවර හෙයින් මෙය (ද්විතීය ධ්‍යානය)ම 'සම්පසාදනං චෙතසෝ එකොදිභාවං' (සම්ප්‍රසාදන සහිත සමාධියේ ඒකෝදිභාවය' යැයි කියන ලද්දේ ද? (එම චෝදනාවට මෙසේ පරිහාර) කියනු ලැබේ. මේ ප්‍රථම ධ්‍යානය විතක්ක, විචාර දෙකින් කැළඹීම හේතුකොට, රළපතරින් කැළඹී ගිය ජලාශයක් මෙන්, මනාව ප්‍රසන්න වූයේ නොවෙයි. එහෙයින් ශ්‍රද්ධාවෙන් යුක්ත වුව ද 'සම්ප්‍රසාදනය'යි නොකියන ලදී. සුප්‍රසන්න නොවූ බැවින් පමණක් නොවේ. මෙහි සමාධිය ද මනාව ප්‍රකට වූයේ නොවේ. එහෙයින් 'එකොදිභාවං' යැයි ද නොකියන ලදී. මේ (දෙවන) ධ්‍යානයෙහි විතක්ක-විචාර පළිබෝධයන් නොමැති බැවින් ලද අවකාශ ඇති ශ්‍රද්ධාව ඉතා බලවත් වේ. බලවත් ශ්‍රද්ධාවෙහි සහායය ලැබීමෙන් ම සමාධිය ද ප්‍රකට වේ. එහෙයින් මෙය (ද්විතීය

ධ්‍යානය)ම මෙසේ (චෙතසො එකොදිභාව) යැයි කියන ලදැයි දතයුතුය. **අවිතක්කං අවිචාරං** යනු භාවනාවෙන් ප්‍රහීණ වූ බැවින්, 'එම ධ්‍යානයෙහි හෝ ධ්‍යානයේ විතර්කය නැතැ'යි යන අරුතින් 'අවිතක්ක' නම් වේ. මේ නයින් ම 'අවිචාර' නම් ද වේ.

මෙහිලා කීහු:- 'විතක්ක විචාරානං වූපසමා' (විතක්ක විචාරයන්ගේ සන්සිඳීමෙන්) යන මෙයින් ද මේ අර්ථය සිද්ධ වූයේ නොවේ ද? එසේනම් නැවත **අවිතක්කං අවිචාරං** යනු කියන ලදුයේ කවර හෙයින් ද? (මෙම චෝදනාවට පරිහාර) කියනු ලැබේ. එය එසේය. මේ අර්ථය සිද්ධ වූයේමය. මෙය වනාහි එම අර්ථයම දීපනය කරනුයේ නොවේ.

'ඕළාරික වූ ධ්‍යානයෙහි ඕළාරික අංගයන් මනාකොට ඉක්මවීමෙන් ප්‍රථම ධ්‍යානයෙන් පසු ද්විතීය ධ්‍යානාදීන්ගේ සමධිගමය වෙති'යි කීවමෝ නොවේ ද? එම අරුත දැක්වීම සඳහා 'විතක්ක විචාරානාං වූපසමා' යැයි මෙසේ කියන ලදී. තවද, මේ සම්පසාදනය (ශ්‍රද්ධාව) ඇතිවනුයේ විතක්ක විචාරයන් සන්සිඳුවීමෙන් මිස කෙලෙස් කිලුටු නැති කිරීමෙන් නොවේ. ඒකෝදිභාවය ඇතිවනුයේ ද විතක්ක - විචාරයන් සන්සිඳුවීමෙන් විනා උපචාර ධ්‍යානය මෙන් නීවරණ ප්‍රහාණයෙන් හෝ ප්‍රථම ධ්‍යානය මෙන් ධ්‍යානාංගයන් පහළවීමෙන් හෝ නොවේ. මෙසේ මෙය සම්පසාදන - ඒකෝදිභාවයනට හේතු දක්වනුයේ වේ. එසේම මේ අවිතක්ක - අවිචාරයන් ඇතිවනුයේ විතක්ක - විචාරයන් සංසිඳුවීමෙන් විනා, තෘතීය-චතුර්ථ ධ්‍යානයන් මෙන් ද, චක්බු විඤ්ඤාණාදිය මෙන් ද (එම විතක්ක-විචාරයන්ගේ) අභාවයෙන් නොවේ. මෙසේ අවිතක්ක අවිචාරයනට හේතු දක්වනුයේ ද වේ. ඉදින්, හුදෙක් විතක්ක-විචාරයන්ගේ අභාවමාත්‍රය දක්වනුයේ නම්, අවිතක්ක - අවිචාර යන මේ (සමාස කරන ලද) වචනයම යෝග්‍ය වේ. එහෙයින්, ('විතක්ක විචාරානං වූපසමා' යන) පළමුවැන්න කියා වුව ද, (අවිතක්කං අවිචාරං' යනු) වේ මය.

සමාධිජං පඨම ධ්‍යාන සමාධියෙන් හෝ සම්ප්‍රයුක්ත ද්විතීය ධ්‍යාන සමාධියෙන් හෝ උපන්නේයි යන අර්ථයි. එහි පඨම ධ්‍යානය ද සම්ප්‍රයුක්ත සමාධියෙන් උපන්නේ නමුදු මේ ද්විතීය ධ්‍යානය ම 'සමාධියෙන් උපන්හ'යි කීමට සුදුසු වේ. විතර්ක විචාර කැළඹීම් විරහිත බැවින්, අතිශයින්ම නිශ්චල වූ හෙයින් හා ඉතා ප්‍රසන්න ද ශාන්ත ද වූ හෙයිනි. එහෙයින් එහි ගුණ වර්ණනා කරනු සඳහා මේ දෙවන ධ්‍යානයට ම

සමාධිජං සමාධිජ යැයි කියන ලදී. **පීතිසුඛං** යන මෙය ඉහත කී නයින්ම වේ. **දුතියං** යනු අනුපිළිවෙලින් ගණනය කිරීමයි. මෙම ධ්‍යානය දෙවැනිව උපන්හයි ද දුතිය නම් වේ.

පීතියා ච විරාගා යනු මෙහි විරාග නම් කියන ලද ආකාර ඇති ප්‍රීතිය පිළිබඳව කලකිරීමයි. නොහොත්, එය ඉක්මවීමයි. 'පීතියා', 'විරාගා' යන මේ පද දෙක අතර ඇති 'ච' කාරය සම්පිණ්ඩනාර්ථ ඇත්තේ වේ. එය 'වූපසමා' යනු හෝ 'විතක්ක විචාරානං වූපසමා' යනු සම්පිණ්ඩනය කරයි. එහි, 'වූපසමා' යනු පමණක් සම්පිණ්ඩනය කෙරේ නම්, එකල 'පීතියා විරාගා ච' යන්නට අමතරව 'වූපසමා ච' යනුවෙන් ද පද යෙදිය යුතුය. මෙම යෙදීමෙහි 'විරාග' යනු ජුගුප්සා (කලකිරීම්) අර්ථ ඇත්තේ වේ. එහෙයින් 'පීතිය පිළිබඳව කළකිරීමෙනැයි' 'එය ඉක්මවීමෙනැ'යි යන මේ අර්ථය දතයුතුය.

යම්කලෙක වනාහි 'විතක්ක විචාරානං වූපසමා' යනු සම්පිණ්ඩනය කෙරේ නම්, එකල 'පීතියා ච විරාගා' යන්නට අමතරව 'විතක්ක විචාරානං වූපසමා' යැයි මෙසේ පද යෝජනා දතයුතුය. මේ යෙදීමෙහි ද 'විරාගො' යනු, ඉක්මවීම් අර්ථය ඇත්තේ වේ. එහෙයින් පීතිය ඉක්මවීමෙන් ද, විතක්ක විචාරයන් සන්සිඳුවීමෙන්දැයි යන මේ අර්ථය දතයුතුය.

ඒකාන්තයෙන් එම විතක්ක විචාර යන දෙක ද්විතීය ධ්‍යානයෙහිදීම සන්සිඳුවන ලදී. මෙය වනාහි මෙම (තෘතීය) ධ්‍යානයට මග පෙන්වීම පිණිස එහි ගුණ පැවසීමෙකියි කියන ලදී. 'විතක්ක විචාරානං වූපසමා' යැයි කී කල්හි, විතක්ක විචාරයන් සන්සිඳවීම මේ ධ්‍යානයට මාර්ගය නොවේදැයි යන මේ චෝදනාව (ප්‍රශ්නය) ප්‍රකාශ වේ. (පරිහාරය): යම්සේ වනාහි තෘතීය ආර්ය මාර්ගයෙහි (අනාගාමි වීමේ) දී ප්‍රහීණ නොකරන ලද (එහෙත් පළමුවන, දෙවන-සෝවාන්, සකෘදාගාමී මාර්ගවල දී ප්‍රහීණ කරන ලද) 'සක්කායදිට්ඨි ආදී පංච ඕරම්භාගිය සංයෝජනයෙන් ප්‍රහීණ කිරීමෙනැ'යි මෙසේ ප්‍රහාණයන් ගැන කී කල්හි, එය ගුණ වර්ණනයක් වේද, එම (අනාගාමී ඵලය) අවබෝධ කිරීමට උත්සුක වූවන්ගේ උත්සාහ ජනනය පිණිස වේද, මෙසේම, මෙහිදී (ද්විතීය ධ්‍යානයෙහි දී මිස) මෙහි (තෘතීය ධ්‍යානයෙහි) දී සන්සිඳුවනු නො ලද්දා වූ ද විතක්ක විචාරයන්ගේ සන්සිඳුවීම ගැන කියනු ලබන කල එය ගුණ වර්ණනයෙක් වේ. එහෙයින්

'පීතිය ඉක්මවීමෙන් ද, විතක්ක විචාරයන් සන්සිඳුවීමෙන්දැ'යි යන අර්ථය කියන ලදී.

උපෙක්ඛකො ච විහරති යන මෙහි 'සුදුසු පරිදි බලති'යි උපෙක්ඛා නම් වේ. 'සමසේ දකිති'යි, 'අපක්ෂපාතීව බලති'යි යන අර්ථයි. ඒ පැහැදිලි වූ විපුල වූ බලවත් වූ එම (උපේක්ෂාවෙන්) යුතු වූ බැවින් තෙවන ධ්‍යානයෙන් යුක්ත වූයේ උපේක්ෂා ඇත්තේ යැයි කියනු ලැබේ. උපේක්ෂාව වනාහි දසවැදෑරුම් වේ. ඡළංගුපෙක්ඛා, බ්‍රහ්මවිහාරුපෙක්ඛා, බොජ්ඣංගුපෙක්ඛා, වීරියුපෙක්ඛා, සංඛාරුපෙක්ඛා, වේදනානුපෙක්ඛා, විපස්සනානුපෙක්ඛා, තත්‍රමජ්ඣත්තුපෙක්ඛා, ඣානුපෙක්ඛා, පාරිසුද්ධි උපෙක්ඛා යනුවෙනි.

එහි, 'මේ ශාසනයෙහි, ක්ෂීණාශ්‍රව භික්ෂු තෙමේ, ඇසින් රූප දැක සොම්නස් නොවෙයි. දොම්නස් ද නොවෙයි. සිහි ඇතිව, මනා නුවණින් යුතුව, උපේක්ෂා ඇතිව විහරණය කෙරේ' යනුවෙන් යම් උපේක්ෂාවක් මෙසේ දක්වන ලද්දේ ද, ක්ෂීණාශ්‍රවයාගේ ඡඩ්ද්වාරයෙහි ඉෂ්ටානිෂ්ට ඡඩාලම්බනයන් සම්මුඛ වීමෙහිදී, පිරිසිදු පියවි බව නොහරනා ආකාරයෙන් එය මේ උපේක්ෂාව 'ඡළංගුපෙක්ඛා' නම් වේ. යම් ඒ උපේක්ෂාවක්, 'උපෙක්ෂා සහගත සිතින් එක් දිශාවක් පතුරුවා විහරණය කරයි' යනුවෙන් මෙසේ දක්වන ලද්දේ ද, සත්ත්වයන් කෙරෙහි මධ්‍යස්ථාකාර වූ මේ උපේක්ෂාව බ්‍රහ්මවිහාර උපෙක්ෂාව නම් වේ. යම් උපේක්ෂාවක් 'විවේක නිශ්‍රිත වූ උපෙක්ඛා සම්බොජ්ඣංගය වඩයි' යනුවෙන් මෙසේ දක්වන ලද්දේ ද, සහජාත (එක්ව උපන්) ධර්මයන් අතර මධ්‍යස්ථාකාරව පවත්නා මේ උපේක්ෂාව 'බොජ්ඣංගුපෙක්ඛා' නම් වේ.

යම් උපේක්ෂාවක් 'කලින් කල උපෙක්ඛා නිමිත්ත සිහිකරයි' යනුවෙන් මෙසේ දක්වන ලද්දේ ද, ඉතා දැඩි ලෙසින් නො ඇරඹී, ඉතා ලිහිල් ද නොවූ වීර්යයි කියනු ලබන මේ උපේක්ෂාව වීරියුපෙක්ඛා නම් වේ.

'සමාධි වශයෙන් සංඛාර උපේක්ෂා කීයක් උපදී ද? විපස්සනා වශයෙන් සංඛාර උපේක්ෂා කීයක් උපදී ද? සමාධි වශයෙන් සංඛාර උපේක්ෂා අටක් උපදියි. සංඛාර උපේක්ෂා දහයක් විපස්සනා වශයෙන් උපදියි' යනුවෙන් යම් උපේක්ෂාවක් මෙසේ දක්වන ලද්දේ ද, නීවරණාදිය නුවණින් විමසා බලා, නිශ්චය කර ගැනීමෙහි දී මධ්‍යස්ථ වූ යම්

උපේක්ෂාවක් වේද, එය සංඛාරුපෙක්ඛා නම් වේ. යම් උපේක්ෂාවක් 'යම් කලෙක උපේක්ෂා සහගත කාමාවචර කුසල් සිතක් උපදින්නේ වේදැ'යි විස්තර වේ ද, අදුක්ඛමසුඛ සංඥා සහිත වූ මේ උපේක්ෂාව 'වේදනා උපෙක්ඛා' නම් වේ. යම් උපේක්ෂාවක් 'යමක් (ස්කන්ධ පංචකයක්) ඇත්තේ වේද, යමක් පැවතියේ වේද, එය අත්හරිනුයේ උපේක්ෂාව ලබයි' යනුවෙන්, මෙසේ දක්වන ලද්දේ ද, (කර්මයන්) රැස් කිරීමෙහිලා ඒ උපේක්ෂාව 'විපස්සනූපෙක්ඛා' නම් වේ. යම් උපෙක්ෂාවක් ඡන්දාදී වූ 'යේවාපනක' (යම් බඳු තවත්) ධර්මයන්) යේවාපනක යනු අභිධර්මයෙහි එන පාරිභාෂික වචනයෙකි. යම්බඳු, තවත්, අනික් යන අර්ථයි.) අතර දක්වන ලද්දේ ද, සහජාත ධර්මයන් සමග සමව ගෙනෙන ලද්දේ ද, එය තත්‍රමජ්ඣත්ත උපෙක්ඛා නම් වේ. යම් උපේක්ෂාවක් 'උපේක්ෂා සහගතව වෙසේ' යනුවෙන් මෙසේ දක්වන ලද්දේ ද, අග්‍ර වූ ධ්‍යාන සුඛයෙහි පවා අපක්ෂපාතී බව ජනනය කරන ඒ උපේක්ෂාව, ඣානුපෙක්ඛා නම් වේ. යම් උපේක්ෂාවක් 'උපෙක්ඛා සති පාරිසුද්ධි සහිත චතුර්ථ ධ්‍යානය' යනුවෙන් දක්වන ලද්දේ ද, සියලු (නීවරණ) ප්‍රතිපක්ෂයන් කෙරෙන් පිරිසිදු වූ, එම (නීවරණ) සතුරන් ව්‍යුපසමනයේ දී පවා ව්‍යාපාර රහිත වූයේ ද එය පාරිසුද්ධි උපෙක්ඛා නම් වේ.

මෙසේ දැක්වූ උපේක්ෂාවන් අතුරෙන් ඡළංගුපෙක්ඛාව ද බ්‍රහ්ම විහාරුපෙක්ඛාව ද බොජ්ඣංගුපෙක්ඛාව ද ඣානුපෙක්ඛාව ද පාරිසුද්ධි උපෙක්ඛාව ද අර්ථ වශයෙන් එකම තත්‍රමජ්ඣත්ත උපෙක්ඛාව ම වේ. ඒ ඒ අවස්ථාවට අනුව උපේක්ෂාව පිළිබඳ මේ ප්‍රභේදය වේ. එක්ම වූ පුද්ගලයකු පිළිබඳව වුවද කුමාර, යුවරාජ, සේනාපති, රාජ ආදී වශයෙන් ඇති භේදය මෙනි. එහෙයින් ඒ උපේක්ෂාවන් අතුරින් යම්තැනෙක ඡළංගුපෙක්ඛාව වේනම් එහි බොජ්ඣංගුපෙක්ඛා ආදිය නොවේ. යම්තැනෙක බොජ්ඣංග උපෙක්ඛාව වේනම්, එහි ඡළංගුපෙක්ඛා ආදිය නො වෙතියි දතයුතුය.

යම්සේ අර්ථ වශයෙන් මෙකී උපේක්ෂාවන්ගේ සමාන බවක් ඇත්තේ ද එසේම සංඛාරුපෙක්ඛා, විපස්සනූපෙක්ඛා යන දෙකෙහි ද අර්ථ වශයෙන් සමාන බවෙක් ඇත. ප්‍රඥාව ම කෘත්‍ය වශයෙන් දෙ ආකාරයකට බෙදුණේ වේ. යම්සේ වනාහි ගෙට පිවිසි සර්පයකු අජපද (එළු කකුලක් මෙන් නැමුණු) දණ්ඩක් ගෙන සොයන පුරුෂයකු, කොටුවෙහි හුන් සර්පයා දැක, සර්පයෙක් දෝ, නැද්දෝ හෝ යි බලනවිට

ස්වස්තික ලකුණු තුන දැක විමති රහිතව, 'සර්පයෙක්ද? නොවේද?'යි සෙවීමෙහි මධ්‍යස්ථතාව උපදියි ද එනයින් ම අරඹන ලද විදර්ශනා ඇත්තහුගේ විදර්ශනා ඥානයෙන් ලක්ෂණත්‍රයය දුටුකල්හි සංස්කාරයන්ගේ අනිත්‍යාදී ස්වභාවය විමසීමෙහි මධ්‍යස්ථතාව උපදියි. මේ විපස්සනා උපෙක්ඛාවයි.

යම්සේ වනාහි ඒ පුරුෂයා එළුපද දණ්ඩෙන් ඒ සර්පයා දැඩිව ගෙන, 'මම කෙසේනම් මේ සර්පයා පීඩාවට පත්නොකර, තමන් ද දෂ්ට කරවා නොගෙන මුදාහරින්නෙම්දෝ'යි බැහැර කරන ආකාරයක් සොයනවිට ඔහුට ග්‍රහණයෙහි මධ්‍යස්ථතාව ඇති වේද, එසේම ලක්ෂණත්‍රයය (තිලකුණු) දක්නා ලද හෙයින් භවත්‍රයය ඇවිලගියාක් මෙන් දක්නා ඔහුට සංස්කාර ග්‍රහණයෙහි මධ්‍යස්ථතාවක් වන්නේ ද එය සංඛාරුපෙක්ඛා නම් වේ.

මෙසේ විදර්ශනා උපේක්ෂාව සිද්ධ වූ කල්හි සංස්කාරුපෙක්ඛාව ද සිද්ධ වූයේ වේ. මෙකී ප්‍රඥාව වනාහි විමසීම් ගැනීම් යන දෙක්හි මධ්‍යස්ථතා සංඛ්‍යාත වූ කෘත්‍යයෙන් දෙවැදෑරුම්ව බෙදුණේ වේ. වීර්ය උපෙක්ඛාව හා වේදනා උපෙක්ඛාව ද ඔවුනොවුන්ගෙන් හා සෙසු උපෙක්ඛාවන්ගෙන් ද බෙදුණේම වේ.

මජ්ඣත්ත බ්‍රහ්ම බොජ්ඣංග ඡළංගඛානසුද්ධියෝ
විපස්සනා ච සංඛාර වෙදනා විරියං ඉති

විත්‍ථාරතෝ දසුපෙක්ඛා ඡ මජ්ඣත්තාදිතෝ තතෝ
දුවෙ පඤ්ඤා තතෝ දවීහි චතසෙසාව භවන්තිමා'ති

තත්‍රමජ්ඣත්තය, බ්‍රහ්ම විහාරය, බොජ්ඣංගය, ඡළංගය, ඛානය, පරිසුද්ධිය, විපස්සනාය, සංඛාරය, වේදනාය, විරිය යැයි විස්තර වශයෙන් උපේක්ෂා දසයෙකි. එයින් තත්‍රමජ්ඣත්තය ආදිකොට ඇති (ඒකාර්ථවත්) උපේක්ෂා සයක් වේ. ඉක්බිතිව ප්‍රඥා ප්‍රභේද වූ (විපස්සනා, සංඛාර යන) දෙක ද ඉතිරි වූ (වේදනා, විරිය යන) දෙක ද සමගින් මේ උපේක්ෂා සතරක් වේ.

මෙසේ දැක්වූ උපේක්ෂාවන් අතුරින් මෙහිදී ධ්‍යාන උපේක්ෂාව අදහස් කරන ලදී. එය මධ්‍යස්ථ ලක්ෂණයෙන් යුතුය. මෙහිලා (චෝදනාවක්) කීහු. 'මේ ඣාන උපේක්ෂාව අර්ථ වශයෙන් තත්‍රමජ්ඣත්තතා උපේක්ෂාව ම වේ.' එය ප්‍රථම ද්විතීය ධ්‍යානයන්හි ද ඇත. එහෙයින් එහිදී ද **උපෙක්ඛකො ච විහරති** යනුවෙන් කිවයුතු වේ. එසේ නොකියන ලද්දේ කවර හෙයින් ද? අපරිව්‍යක්ත (ප්‍රකට නොවූ) කෘත්‍ය ඇති හෙයිනි. (යනු එහි වනාහි එම ඣානානුපෙක්ඛාවෙහි කෘත්‍යය ප්‍රකට නොවේ. විතක්කාදියෙන් යටපත් වූ හෙයිනි. මෙහි (තෙවන ධ්‍යානයෙහි) විතක්ක, විචාර, පීති යන මෙයින් නොමඬනා ලද බැවින්, හිස ඔසවා ගත්තෙකු සෙයින්, පරිව්‍යක්ත (ප්‍රකට වූ) කෘත්‍ය ඇත්තේ වේ. එහෙයින් 'උපෙක්ඛකො ච විහරති' යැයි කියන ලදී.

සතො ච සම්පජානො යන මෙහි 'සිහි කරති'යි සත නම්. මනාව දැන ගනිතියි සම්පජාන නම්. මෙහි පුද්ගලයකු මිස සිහියද සම්පජඤ්ඤයද නොපැවසිණි. එහි සිහිකරන ලක්ෂණය 'සති' සිහියයි. මුලානොවන ලක්ෂණය සම්පජඤ්ඤයයි. එතෙකුදු වුවත්, මේ සතිසම්පජඤ්ඤය (ප්‍රථම ද්විතීය යන) ධ්‍යානයන්හි ද ඇත. සිහිමුළා වූවහුට, මැනවින් නොදත්තහුට උපචාර මාත්‍රයක්වත් නොලැබේ. අර්පණා ධ්‍යානයක් කැල ම සිද්ධ නොවේ. එම පූර්ව ධ්‍යානයන් ඕලාරික වන හෙයින්, භූමියෙහි පුරුෂයකුගේ ගමන මෙන්, සිතෙහි ගමන පහසු වේ. එම ධ්‍යානයන් මේ සති සම්පජඤ්ඤයන්ගේ කෘත්‍යය ප්‍රකට නොවේ. (විතක්ක, විචාර, පීති යන) ඕළාරිකංග ප්‍රහාණයෙන් සියුම් වූ බැවින් මේ තෙවන ධ්‍යානයේ දී, පුරුෂයකුගේ කරකැති (දැලිපිහි) මුවහතෙහි ගමන මෙන්, සති සම්පජඤ්ඤ කෘත්‍යයෙන් ව්‍යක්ත වූ ම සිතෙහි ගමන් කැමති විය යුතුයැයි මෙහිම කියන ලදී. යලි බොහෝ කොට පවසනු කිම?

යම්සේ දෙනගෙන් කිරිබොන වස්සෙක් මව්දෙනගෙන් ඉවත ගෙනයන ලද්දේ, නොරක්නා ලදහොත් නැවත දෙන වෙතම පැමිණෙන්නාක් මෙන් මේ තෘතීය ධ්‍යාන සුඛය ද ප්‍රීතියෙන් වෙන්කරන ලදුයේ සති සම්පජඤ්ඤයෙන් නොරක්නා ලදහොත්, නැවත ප්‍රීතිය වෙත පැමිණෙන්නේය. ප්‍රීතිය හා සමග සම්ප්‍රයුක්ත වූ ද්විතීය ධ්‍යානයම හෝ වන්නේය. සුඛයෙහි ද ඒ සත්ත්වයෝ ඇලෙති. මෙය (තෘතීය ධ්‍යාන සුඛය) ද ඉතා මිහිරි සුවයකි. එයට වඩා සුවයක් නොමැති හෙයිනි. සති සම්පජඤ්ඤ බලයෙන් ම මෙහි ඇති සුඛයෙහි නො ඇලී සිටීම සිදුවේ.

අන් අයුරකින් නොවේ. මේ අර්ථ විශේෂය ද දැක්වීමට මේ දෙපදය මෙහි (තෘතීය ධ්‍යානයෙහි) ම කියන ලදැයි දතයුතුය.

ඉක්බිති සුඛං ච කායෙන පටිසංවෙදෙති යනු, මෙහි තෘතීය ධ්‍යානයෙන් යුක්ත වූවහු විසින් සුඛය විඳීමක් නැති වුව ද, එසේ වූ කල්හි පවා, යම් හෙයකින් ඔහුගේ නාමකායයෙන් යුක්ත වූ සුඛයක් වේද, නොහොත් නාම කායය හා සමග යෙදුණ යම් සුඛයක් වේ ද, යම් හෙයකින්, එයින් හටගත් ඉතා ප්‍රණීත වූ රූපයෙකින් ඔහු (ධ්‍යානලාභියා) ගේ රූපකායය ස්පර්ශ කරන ලද්දේ වේ ද, (එම රූපයෙන්) ස්පර්ශ කරන ලද හෙයින්, ධ්‍යානයෙන් නැගී සිටි කල්හි ද කායික සුඛය විඳින්නේ ය. එහෙයින් මෙම අර්ථය දක්වමින් **සුඛං ච කායෙන පටිසංවෙදෙති** යි කීහු.

ඉක්බිති යන්තං අරියා ආචික්ඛන්ති උපෙක්ඛකො සතිමා සුඛවිහාරී යනු ධ්‍යානය හේතුකොට, ධ්‍යානය කරණකොට, බුද්ධාදී ආර්යයෝ යම් තෘතීය ධ්‍යානයකින් සමන්විත වූ පුද්ගලයකු ප්‍රකාශ කෙරෙත් ද, දෙසත් ද, පණවත් ද, පිහිටුවත් ද, විවරණ කෙරෙත් ද, විග්‍රහ කෙරෙත් ද, විවර්ණනය කෙරෙත් ද, ප්‍රකට කෙරෙත් ද, ප්‍රශංසා කෙරෙත්දැයි යන අදහසයි. කිමෙකැයි ප්‍රකාශ කරත් ද? 'උපෙක්ඛකො සතිමා සුඛවිහාරී' (උපේක්ෂා සහගත වූයේ සිහි ඇති වූයේ සුඛ විහරණයෙන් යුක්ත වූයේ) යනුවෙනි. ඒ තෙවන ධ්‍යානයට පැමිණ විහරණය කරති'යි මෙසේ මෙහි අර්ථ යෝජනාව දතයුතුයි. කවර හෙයින් ඔහු (ආර්යයෝ) ඒ ධ්‍යානලාභියා මෙසේ පසසත් ද? ප්‍රශංසාවට සුදුසු හෙයිනි. යම්හෙයකින් මේ ධ්‍යානලාභී තෙමේ ඉතා මිහිරි සුව ඇති සුඛයෙහි කෙළ පැමිණි තෘතීය ධ්‍යානයෙහි පවා උපේක්ෂා සහගතව, එහි ඇති සුවයෙහි ඇලීමෙන් ආකර්ෂණය කරනු නොලැබේද, යම්සේ ප්‍රීතිය නූපදී ද, මෙසේ ම, එළඹ සිටි සිහියෙන් සතිමත් වූයේ ද තවද යම්හෙයකින් ආර්යකාන්ත (ආර්යයනට ප්‍රිය) වූ ආර්යජනයා විසින් සෙවුනා ලද්දාම වූ අසංකිලිට්ඨ වූ (නොකිලිටි වූ) සුවය නාම කායයෙන් විඳින්නේ ද, එහෙයින් හෙතෙම (ආර්යයන්ගේ) ප්‍රශංසාවට සුදුසු වේ. මෙසේ ප්‍රශංසාවට සුදුසු හෙයින්, ආර්යයෝ ප්‍රශංසාවට හේතු වූ ගුණ ප්‍රකාශ කරමින් 'උපෙක්ඛකො සතිමා සුඛවිහාරී'යි (උපේක්ෂා ඇත්තේ ස්මෘතිමත් වූයේ සිහියෙන් යුතු විහරණ ඇත්තේ) පවසතියි දතයුතුයි.

තතියං යනු අනුපිළිවෙල ගණනයෙන් තෙවැන්නයි. 'තෙවැනිව උපන්හ'යි ද 'තතිය' නම් වේ. **සුඛස්ස ච පහාණා දුක්ඛස්ස ච පහාණා** යනු කායික සුවය ද කායික දුක ද ප්‍රහීණ කිරීමෙනි. **පුබ්බෙව** යනු චතුර්ථ ධ්‍යාන ක්ෂණයෙහි නොව ඊට පෙරාතුව ම, **සොමනස්සදොමනස්සානං අත්ථංගමා** යනු චෛතසික සුඛයේ ද චෛතසික දුක්ඛයේ ද යන මේ දෙක පූර්වයෙන් ම අස්තයට, ප්‍රහාණයට ගිය බවම කී නියායි. මේ ප්‍රහාණය කවර මොහොතක වේද? චතුර් ධ්‍යානයන්ගේ උපචාර ක්ෂණයෙහිදීය, සෝමනස්සය වනාහි චතුර්ථ ධ්‍යානයෙහි උපචාර ක්ෂණයෙහි ම, ප්‍රහීණ වේ. දුක්ඛ, දෝමනස්ස, සුඛ යන මොහු පළමු, දෙවන, තෙවන ධ්‍යානයන්ගේ උපචාර ක්ෂණයෙහි ප්‍රහීණ වේ. මෙසේ මේ වේදනාවන්ගේ ප්‍රහාණය වන ක්‍රමයෙහි නොපැවසූ කරුණු, ඉන්ද්‍රිය විභංගයේ ඉන්ද්‍රියයන්ගේ උද්දේස ක්‍රමයෙන් ම මෙහිද කියන ලද සුඛ, දුක්ඛ, සෝමනස්ස, දෝමනස්සයන්ගේ ප්‍රහාණය දතයුතුයි. ඉදින් මේ සුඛදුක්ඛාදී ඒ ඒ ධ්‍යානයෙහි උපචාර ක්ෂණයෙහිම ප්‍රහීණ වේ නම් (චෝදනායි.)

කොතැන උපන් දුක්ඛින්ද්‍රියය ශේෂ නොවී නිරුද්ධ වේද? මහණෙනි, මේ සසුනෙහි භික්ෂුව කාමයන්ගෙන් වෙන්වම -පෙ- පළමු ධ්‍යානයට පැමිණ විහරණය කරයි. මෙහි උපන් දුක්ඛින්ද්‍රියය ශේෂ නොවීම නිරුද්ධ වේ. කොතැන්හි උපන් දෝමනස්සින්ද්‍රියය, සුඛින්ද්‍රියය, සෝමනස්සින්ද්‍රියය අශේෂ වශයෙන් නිරුද්ධ වේද? මහණෙනි, මේ සසුනෙහි භික්ෂුව සුඛය ද ප්‍රහීණවීමෙන් -පෙ- චතුර්ථ ධ්‍යානයට පැමිණ විහරණය කරයි. මෙහි උපන් සෝමනස්සින්ද්‍රිය අශේෂ වශයෙන්ම නිරුද්ධ වේ.' යනුවෙන් මෙසේ ධ්‍යානයන්හිදීම නිරෝධය කියන ලදහ'යි අතිසය නිරෝධ වන බැවිනි. අතිසය නිරෝධය වනාහි මේ ප්‍රථම ධ්‍යානාදියෙහි නොමැත. උපචාර ක්ෂණයෙහි දී හුදු නිරෝධයම මිස අතිසය නිරෝධය නොවේ. ඒ එසේමැයි, නානා ආවර්ජන සහිත ප්‍රථම ධ්‍යාන උපචාරයෙහිදී දුක්ඛින්ද්‍රිය නිරුද්ධව සිටි කල පවා ඩැහැ ලේ බොන මැසි මදුරු ආදීන්ගේ ස්පර්ශයෙන් හෝ විෂම වූ ආසන (සූර්ය) තාප ආදියෙන් දුක ඉපදීම වේ. අර්පණා ධ්‍යානය තුළදී දුක්ඛය නැත්තේමය. මෙහි දී උපචාරයෙහිදී නිරුද්ධ වුවත් මනාව නිරුද්ධ වූයේ නොවේ. ප්‍රතිපක්ෂ ධර්මයෙන් නොනස්නා ලද හෙයිනි.

අර්පණාව ඇතුළතදී වනාහි පීති (අංග)ය පැතිරීමෙන් මුළු කය පුරා සුඛය වැදගත්තේ වේ. සුඛය වැදගන්නා ලද කය ඇත්තහුගේ

දුක්ඛින්ද්‍රියය, මනාකොට නිරුද්ධ වූයේ වේ. ප්‍රතිපක්ෂ ධර්මය නස්නා ලද හෙයිනි. නානා ආවර්ජන සහිත ද්විතීය ධ්‍යානෝපචාරයෙහිදී, ප්‍රහීණ වූ ද දෝමනස්සින්ද්‍රියය විතක්ක විචාරයන් හේතුකොට හටගත් කාය පීඩා චිත්ත පීඩා ඇතිකල්හි යම්හෙයකින් උපදනේ නමුදු, විතක්ක විචාරයන්ගේ අභාවයෙහිදී නොම උපදනේය. යම්තැනෙක උපදනේද, ඒ විතක්ක විචාරයන් ඇති තන්හිය. ද්විතීය ධ්‍යානෝපචාරයෙහි විතක්ක විචාරයෝ අප්‍රහීණයෝ ම වෙති. එහි (දෝමනස්සින්ද්‍රියයෙහි) මේ උපත සිදුවන්නේය. ප්‍රහීණ නොවූ ප්‍රත්‍යය (හේතු) ඇති හෙයිනි. එහෙත් ද්විතීය ධ්‍යානයෙහි දී සිදුනොවන්නේමය. ප්‍රහීණ වූ ප්‍රත්‍යය ඇති හෙයිනි.

එසේම තෘතීය ධ්‍යානෝපචාරයෙහි දී පීතියෙන් උපන් ප්‍රණීත රූපයෙන් ස්පර්ශ කරන ලද කය ඇත්තහුගේ, ප්‍රහීණ වූ ද සුඛින්ද්‍රියයෙහි උපත සිදුවන්නේය. තෘතීය ධ්‍යානයෙහි දී සිදු නොවන්නේමය. තෘතීය ධ්‍යානයෙහි දී වනාහි 'සුඛයට ප්‍රත්‍යය වූ ප්‍රීතිය සර්වප්‍රකාරයෙන්ම නිරුද්ධයහ'යි දතයුතුය. චතුර්ථ ධ්‍යානෝපචාරයෙහි දී ප්‍රහීණ වූ ද සෝමනස්සින්ද්‍රියය ආසන්නව සිටි හෙයින් ද, අර්පණාවට පත් උපේක්ෂාවක් නැති හෙයින් ද (එම සෝමනස්සින්ද්‍රියය) මනාකොට නො ඉක්මවන ලද හෙයින් ද එහි උපත සිදුවන්නේ, එහෙත් චතුර්ථ ධ්‍යානය තුළ දී එය සිදු නොවන්නේම ය.

එහෙයින්ම මෙහි (ප්‍රථම ධ්‍යානයෙහි) උපන් දුක්ඛින්ද්‍රිය 'නිරවශේෂ වශයෙන් නිරුද්ධ වේ'යැයි ඒ ඒ ධ්‍යානයෙහි අශේෂ ග්‍රහණය කරන ලදී. මෙහිලා කීහුඃ (චෝදනායි) එසේ නම්, ඒ ඒ ධ්‍යානයෙහි උපචාරාවස්ථාවෙහි දී ප්‍රහීණ වූ ද මේ දුක්ඛාදී වේදනාවන් කවර හෙයින් මෙහි ගෙනහැර දක්වන ලද්දේ ද? සුවසේ අවබෝධ කරවීම පිණිසයි. (පරිහාර) යම්සේ මෙහි 'අදුක්ඛමසුඛං' යැයි අදුක්ඛමසුඛ වේදනාවක් කියන ලදී ද, එය ඉතා සූක්ෂම ය. දුකසේ දතයුතුය. පහසුවෙන් අවබෝධ කරගත නොහැකිය. එහෙයින් යම්සේ සමීපයට පැමිණ අල්ලා ගැනීමට අපහසු චණ්ඩ ගොනෙකු අල්ලා ගැනීම පිණිස ගොපල්ලෙක් සියලු ගවයන් එක් ගාලක රැස්කොට ගාලෙන් එක එක ගවයා බැගින් පිටතට යැමට සලස්වා, පිළිවෙලින් පැමිණි චණ්ඩ ගොනා 'මේ ඒ ගොනාය, අල්වවු' යැයි අල්ලා ගන්නේ ද, එසේම සුඛාවබෝධය පිණිස මේ සියල්ල ගෙනහැර දක්වන ලදී. මෙසේ ගෙනහැර දැක්වූ විට සුඛ ද නොවූ, දුක්ඛද

නොවූ, සෝමනස්ස ද නොවූ, දෝමනස්ස ද නොවූ මෙය 'අදුක්ඛමසුඛ වේදනාවය'යි ඉතා පහසුවෙන් අවබෝධ කරවිය හැකි වේ.

තවද අදුක්ඛමසුඛ වූ (උපේක්ෂා සහගත) චේතෝ විමුක්තියට ප්‍රත්‍ය වූ ධර්මයන් දක්වනු පිණිස ද මෙය කියන ලදැයි දතයුතුයි. සුඛ දුක්ඛ ප්‍රහාණාදිය එම (චේතෝ විමුක්තියෙන් ම) ප්‍රත්‍ය වේ. යම්සේ කීහුද, 'ඇවැත්නි, අදුක්ඛමසුඛ වූ චේතෝ විමුක්ති සමාපත්තියේ ප්‍රත්‍යය සතරෙකි. ඇවැත්නි, මේ සසුනෙහි භික්ෂු තෙමේ සුඛය ද ප්‍රහාණය කර -පෙ- චතුර්ථ ධ්‍යානයට පැමිණ විහරණය කරයි. ඇවැත්නි, මේ සතර අදුක්ඛමසුඛ වූ චේතෝ විමුක්ති සමාපත්තියට ප්‍රත්‍යය වේ' යනුයි. නොහොත් යම්සේ අන්තැනෙකදී ප්‍රහීණ වූ ද සක්කායදිට්ඨි ආදිය තෙවැනි මාර්ගයේ ආනිසංස පැවසීමේ දී, එහිදී ප්‍රහීණ වියැයි පවසන ලද ද, මෙසේ මේ සිවුවන ධ්‍යානයේ අනුසස් පැවසීම පිණිස මෙය මෙහිදී පවසන ලදැයි දතයුතුය. නොහොත් ප්‍රත්‍යය නැසීමෙන් හෝ මෙහි රාග ද්වේෂයන්ගේ අතිදූරභාවය දැක්වීම පිණිස ද මෙය කියන ලදැයි දතයුතුයි. මේ දුක්ඛාදී ඉන්ද්‍රියයන් අතුරින් සුඛය සෝමනස්සයට ද, සෝමනස්සය රාගයට ද, දුක්ඛය දෝමනස්සයට ද, දෝමනස්සය ද්වේෂයට ද ප්‍රත්‍යය (හේතු) වේ.

තවද 'සුඛ ආදිය නැසීමෙන් ප්‍රත්‍යය සහිත වූ රාග දෝෂයන් නසන ලදහ'යි, 'ඉතා දුරෙහි වෙති'යි **අදුක්ඛමසුඛං** යනු වේ. දුක නැති හෙයින් අදුක්ඛ නම් වේ. සුඛය නැති හෙයින් අසුඛ නම් වේ. මෙයින් (අදුක්ඛමසුඛ යන්නෙන්) මෙහි දුක් සැප දෙකට විරුද්ධ වූ තෙවන වේදනාව ප්‍රකට කෙරේ. හුදෙක් දුක්ඛ සුඛ අභාවමාත්‍රයම නොවේ. තෙවැනි වේදනාවට නම් අදුක්ඛ-අසුඛ වේදනාවයිද උපේක්ෂා යයි ද කියනු ලැබේ. ඒ (උපේක්ෂාව) ඉෂ්ට-අනිෂ්ට විපරීතය (රුචි-අරුචි යන දෙකම හැඟීමක්) විඳීම ලක්ෂණ කොට ඇත්තේය. මධ්‍යස්ථතාව රස හෙවත් කෘත්‍යය කොට ඇත්තේය. අප්‍රකට ස්වභාවය වැටහීම් කාරණකොට ඇත්තේය. සුඛ-දුක්ඛ යන දෙකම නිරුද්ධවීම පදනම්කොට ඇත්තේය'යි දතයුතුය. **උපෙක්ඛා සති පාරිසුද්ධි** යනු උපේක්ෂාවෙන් ජනිත වූ ඉතා පිරිසිදු සිහියයි. මේ ධ්‍යානයෙහි, ඉතා පිරිසිදු සිහියක් වේ ද, ඒ සිහියේ යම් පිරිසිදු බවක් වේද, එය උපේක්ෂාව විසින් කරන ලදී. අනෙකක් විසින් නොවේ. එහෙයින් මෙය 'උපෙක්ඛාසති පාරිසුද්ධි' යැයි කියනු ලැබේ. තවද මෙහි යම් උපේක්ෂාවකින් සති පාරිශුද්ධිය වේද එය අර්ථ වශයෙන් 'තත්‍රමජ්ඣත්තතාව' යැයි දතයුතුයි. හුදෙක් මෙහිදී එම තත්‍රමජ්ඣත්තතාවෙන් පිරිසිදු වනුයේ

හුදෙක් සිහිය මතු නොවේ. ඒ හා සමග (යෙදෙන) සියලු සම්ප්‍රයුක්ත ධර්මයන් සති ශීර්ෂයෙන් දේශනා කරන ලද්දාහුය. මේ උපේක්ෂාව කිසියම් ප්‍රමාණයෙකින් පහළ ධ්‍යාන තුනෙහි ද විද්‍යමාන වේ.

යම්සේ වනාහි දහවල හිරු රැසින් මඬනා ලද සෙයින් සෞම්‍ය භාවයෙන් හෝ, උපකාරක වශයෙන් යෙදෙන රාත්‍රී කාලය නොලැබීමෙන් හෝ, දිවාකාලයෙහි විද්‍යමාන වූ ද, චන්ද්‍රලේඛාව පිරිසිදු වූයේ නොවේද, පැහැදිලි නොවූයේ වේද, එසේම මේ තත්‍රමජ්ඣත්තුපෙක්ඛා නැමති චන්ද්‍රලේඛාව ද විතක්ක ආදී ප්‍රතිපක්ෂ ධර්මයන්ගේ තේජසින් මඬනා ලද හෙයින් ද එක්ව යෙදෙන උපේක්ෂා වේදනා නැමති රාත්‍රිය නො ලැබීමෙන් ප්‍රථම ධ්‍යානාදියෙහි ද විද්‍යමාන වන නමුදු, එය පිරිසිදු නොවූයේම වේ. එම තත්‍ර මජ්ඣත්තුපෙක්ඛාව පිරිසිදු නොවූ හෙයින් දහවල නොපැහැදිලි චන්ද්‍රලේඛාවෙහි ප්‍රභාව මෙන් සති ආදී වූ සහජාත ධර්මයෙන් ද නො පිරිසිදු වෙති. එහෙයින්, එම ධ්‍යාන තුන අතුරෙන් එකකදීවත් 'උපෙක්ඛාසති පාරිසුද්ධි' යැයි නොපැවසුණි. මෙම චතුර්ථ ධ්‍යානයේදී විතර්කාදී සතුරු ධර්ම බලයෙන් නොමඬනා ලද බැවින් සභාග වූ (පාලි අටුවාවෙහි 'විතක්කාදි.....තෙජාභිභවා' යනු සදොස් සේ පෙනේ. එය 'තෙජාභිභවාභාවා' යනුවෙන් නිදොස් වූ විට අර්ථය පැහැදිලි වේ. අධීක්ෂක) උපෙක්ඛා වේදනා නැමති රාත්‍රිය ලැබීමෙන් මේ තත්‍රමජ්ඣත්තුපෙක්ඛා නැමති චන්ද්‍රලේඛාව ඉතාමත් පිරිසිදුය. එය පිරිසිදු වන බැවින් පිරිසිදු චන්ද්‍රලේඛාවේ ප්‍රභාවය මෙන් එක්ව උපන්නා වූ සති ආදී ධර්මයෝද පිරිසිදු වෙති. බැබළෙති. එහෙයින් මෙයම 'උපෙක්ඛාවෙහි පාරිසුද්ධිය'යි කියන ලද බව දතයුතුයි.

චතුත්ථං යනු ගිනීමේ අනුපිළිවෙළින් සිවුවැන්නයි. සිවුවැනිව උපන්හයි ද චතුත්ථ නම් වේ. **පඤ්ඤවා හොති** යනු ප්‍රඥාව මොහුට ඇත්තේනුයි පඤ්ඤවා නම් වේ. **උදයත්ථගාමිනියා** යනු අභ්‍යුදය කරා යන, අභිවෘද්ධිය කරා යන, **සමනනාගතො** යනු පිරිපුන් වූයේයි. **අරියාය** යනු නිදොස් වූ **නිබ්බෙධිකාය** යනු නිර්වේද (කලකිරීම්) පක්ෂයෙහි වූ **දුක්ඛක්ඛය ගාමිනියා** යනු නිවනට පමුණුවන **සො ඉදං දුක්ඛනති** යන ආදියෙහි දී 'මෙතෙක් දුක්ය, මෙයට වඩා දුකක් නැතැ'යි සර්වප්‍රකාර දුක්ඛ සත්‍යය 'රස, ලක්ෂණ, ප්‍රතිවේධ සහිතව තත්ත්වාකාරයෙන් ම දැනගනියි. අවබෝධ කරගනියි. ඒ දුක නිපදවන්නා වූ තණ්හාව මේ

දුක්ඛ සමුදය (දුකට හේතුව) යැයි දැනගනියි. ඒ (දුක හා තණ්හාව යන) දෙක යම්තැනකට පැමිණ නිරුද්ධ වේනම්, ඒ දෙකෙහි නොපැවැත්ම වූ නිවන මේ 'දුක්ඛ නිරෝධ'යැයි දැනගනියි. එය (නිවන) කරා පමුණුවන ආර්ය මාර්ගය 'මේ දුක්ඛනිරෝධගාමිනී ප්‍රතිපදාව' යැයි ද, රස, ලක්ෂණ, ප්‍රතිවේධ සහිත තත්වාකාරයෙන් දැනගනිති'යි, 'අවබෝධ කරති'යි මෙසේ අර්ථ දතයුතුය.

මෙසේ ස්වරූප වශයෙන් සත්‍යයන් දක්වා ඉක්බිති කෙලෙස් වශයෙන් විස්තර ආකාර දක්වමින්, **ඉමෙ ආසවා** යනාදිය කී, එම විස්තරාර්ථයක, පැවසූ පරිදිම දතයුතුය. මෙසේ ත්‍රිවිධ ශික්ෂාවන් දක්වා, ඉක්බිති එම ශික්ෂාවන් පිරිපුන් බවට පත්වන ආකාරය දක්වනු පිණිස **ඉමා තිස්සො සික්ඛායො ආවජ්ජනෙතා සික්ඛිතබ්බා** (මේ ත්‍රිශික්ෂාවන් ආවර්ජනය කෙරෙමින් පුහුණු වන්නේය) යනාදිය කීහු. එහි අර්ථය ඒ ශික්ෂාවන් එකක් එකක් පුරනු පිණිස ආවර්ජනය කරමින් ද හික්මෙන්නේ ය. ආවර්ජනය කොට මෙනම් ශික්ෂාව යැයි දැනගනිමින් ද නික්මෙන්නේ ය. දැනගෙන ද නැවත නැවත දකිමින් ද හික්මෙන්නේ ය. (එසේ) දැක ද දුටුසේ ප්‍රත්‍යවේක්ෂා කරමින් ද හික්මෙන්නේ ය. ප්‍රත්‍යවේක්ෂා කොට ද එහිම සිත නො සැලෙන සේ පිහිටුවමින් ද හික්මෙන්නේ ය. ඒ ඒ ශික්ෂාව හා සම්ප්‍රයුක්ත වූ සද්ධා, විරිය, සති, සමාධි, පඤ්ඤාවන්ගෙන් එකිනෙකට අයත් කාර්යයන් කරමින් ද ත්‍රිශික්ෂාවන්හි නික්මෙන්නේය. මනාකොට දතයුතු දෙය නොකොට දනිමින් හික්මෙන්නේය. අධි සීලයෙහි හැසිරෙන්නේය. අධි චිත්තයෙහි මනාව හැසිරෙන්නේ ය. අධි පඤ්ඤාවෙහි මනාව ගෙන පවතින්නේ ය. **ඉධ** යනු (පෙළෙහි) මූලපදයයි. 'ඉමිස්සා දිට්ඨියා' (මේ දැක්මෙන්) ඉධ ඉමිස්සා දිට්ඨියා, ඉමිස්සා ඛන්තියා, ඉමිස්සා රුචියා යනාදී වශයෙන් දක්වන ලද දස පදයෙහි, ශික්ෂාත්‍රය සංඛ්‍යාත සර්වඥ බුද්ධ ශාසනයම අදහස් කරන ලදී. එය වනාහි බුද්ධ වූ භාග්‍යවතුන් වහන්සේ විසින් දක්නා ලද බැවින් දිට්ඨි යැයි කියනු ලැබේ. එයම ඉවසීම් වශයෙන් **ඛන්ති** යැයි ද රුචිකිරීම් වශයෙන් **රුචි** යැයි ද ගැනීම් වශයෙන් **ආදාය** යැයි ද ස්වභාවාර්ථයෙන් **ධම්ම** යැයි ද හික්මිය යුතුය යන අරුතින් **විනය** යැයිද ඒ දෙකින්ම යුක්තවීමෙන් **ධම්මවිනය** යැයි ද මනාව දෙසන ලදැයි යන අර්ථයෙන් **පාවචන** යයි ද ශ්‍රේෂ්ඨ චර්යාවය යන අරුතින් **බ්‍රහ්මචරිය** යයි ද අවවාද දීම් වශයෙන් **සත්ථු සාසන** යයි ද කියනු ලැබේ.

යම්හෙයකින් 'ඉමිසසා දිටඨියා' යනාදියෙහි මේ බුදුරදුන් විසින් දක්නා ලද්දෙහි, මේ බුද්ධ ඛත්තියෙහි, මේ බුද්ධ රුචියෙහි, මේ බුද්ධ ආදායෙහි (පිළිගන්නා ලද්දෙහි), මේ බුද්ධ ධර්මයෙහි, මේ බුද්ධ විනයෙහිඃ 'ගෝතමිය, ඔබ යම් ධර්මයක් පිළිබඳව, 'මේ ධර්මය විරාගය පිණිස නොව සරාගය පිණිස පවතියි. විසංයෝගය පිණිස නොව සංයෝගය පිණිස පවතියි. අපචය (විසුරුවීම) පිණිස නොව ආචය (රැස්කිරීම) පිණිස පවතියි. පටිනිස්සග්ගය (අත්හැරීම) පිණිස නොව උපාදානය (දැඩිව ගැනීම) පිණිස පවතියි. අල්පේච්ඡතාව පිණිස නොව මහේච්ඡතාව පිණිස පවතියි. සන්තුෂ්ටිය පිණිස නොව අසන්තුෂ්ටිය පිණිස පවතියි. පවිවේකය (හුදෙකලා විහරණය) පිණිස නොව ගණ සංගණිකාව (පිරිස් හා සමග විසීම) පිණිස පවතියි. වීර්යාරම්භය පිණිස නොව කුසීත බව පිණිස පවතියි. සුභරතාවය (පහසුවෙන් පෝෂණය කළ හැකි බව) පිණිස නොව දුභරතාව (එසේ නොවන බව) පිණිස පවතියි' යනුවෙන් දනිතොත්, ගෝතමිය, 'ඒකාන්තයෙන් මේ ධර්මය නොවෙයි, මේ විනය නොවෙයි, මේ ශාස්තෘ ශාසනය නොවෙයි' යනු සිතට ගනුය, ගෝතමිය ඔබ යම් ධර්මයක් පිළිබඳව, 'මේ ධර්මය විරාගය පිණිස මිස සරාගය පිණිස නොපවති, -පෙ- සුභරතාව පිණිස මිස දුභරතාව පිණිස නොපවතියි' යනුවෙන් දනිතොත්, ගෝතමිය, ඒකාන්තයෙන් 'මේ ධර්මයයි, මේ විනයයි, මේ ශාස්තෘ ශාසනයයි' යනු සිතට ගතයුතුය' යනුවෙන් කියන ලද මේ බුදු දහම් විනයෙහි ය. මේ බුද්ධ ප්‍රවචනයෙහිය. මේ බුද්ධ බ්‍රහ්මචරියෙහිය. මේ බුද්ධ ශාස්තෘ ශාසනයෙහිය යන මේ අර්ථ දතයුතුයි. තවද ශික්ෂාත්‍රය සංඛ්‍යාත මේ මුලු සසුනම භාග්‍යවතුන් වහන්සේ විසින් දක්නා ලද බැවින්, සම්‍යක් දෘෂ්ටිය ප්‍රත්‍යය කරගත් බැවින්, සම්‍යක් දෘෂ්ටිය පූර්වාංගම වූ බැවින් ද මේ බුදුදහම **දිටඨි** නම් වේ. භාග්‍යවතුන් වහන්සේ විසින් ඉවසන ලද බැවින් **ඛන්ති** නම් වේ. උන්වහන්සේ රුචිකිරීම් වශයෙන් **රුචි** නම් වේ. උන්වහන්සේ විසින් ග්‍රහණය කරගත් බැවින් **ආදාය** නම් වේ. තමා අනුගමනය කරන්නහු අපායෙහි නොවැටෙන සේ දරනුයේ නුයි **ධම්මො ධම්ම** නම් වේ. ඔහුගේ ම ක්ලේශ පක්ෂය දුරුකරන්නේනුයි **විනයො විනය** නම් වේ. ධම්ම වූයේ ද එම විනය වූයේ ද එම **ධම්මවිනයො ධම්මවිනය** නම් වේ. මේ කුසල ධර්මයන්ගෙන් අකුසල ධර්මයන් වැලැක්වීමයි. ධර්මය පිළිබඳ විනය හෝ ධර්මවිනය නම් වේ. එහෙයින් කියන ලදමැයි. 'ගෝතමිය, ඔබ යම් මේ ධර්මයක් විරාගය පිණිස පවතින්නේය. -පෙ- ඒකාන්තයෙන් ගෝතමිය 'මේ විනයයි', 'මේ ශාස්තෘ ශාසනයයි' යනුවෙන් සිතට ගතයුතුය. නොහොත් දඬු ආදියෙන්

(දඬුවමින්) නොව ධර්මයෙන් හික්මවීමයි යන අරුතින් ද ධම්මවිනය නම් වේ.

කියන ලදමැයි :-

දණ්ඩෙනෙකෙ දමයනති අංකුසෙහි කසාහි ච
අදණ්ඩෙන අසත්ථෙන නාගො දනෙතා මහෙසිනා

ඇතැමෙක් දණ්ඩෙන් ද අංකුසයෙන් ද (හෙණ්ඩුවෙන්) කශයෙන් ද දමනය කරති. මහර්ෂී බුදුරජාණන් වහන්සේ විසින් දඬු නොමැතිව, ආයුධ නොමැතිව ඒ හස්තියා දමනය කරන ලදී.'

එසේම 'ධමෙමන නයමානානං කා උසුය්‍යා විජානතං' (ධර්මය විසින් මෙහෙයවනු ලබන බහුශ්‍රැතයනට කවර ඊර්ෂ්‍යාවක් ද?) යන තැන්හි මෙන් ධර්මයෙන් හික්මවීම හෝ ධම්මවිනය නම් වේ. මෙහි 'විනය' යනු නිරවද්‍ය ධර්මය යන අර්ථයි. වංචාව යන අරුත නොවේ. එහෙයින් භාග්‍යවතුන් වහන්සේ මෙසේ දෙසූහ. 'මහණෙනි, මේ බ්‍රහ්මචර්යාව ජනයා රැවටීම පිණිස නො වසනු ලැබේ' යන විස්තරයයි. පුණ්ණ තෙරහුද කීහු. 'ඇවැත්නි, නිරුපදිශේෂ නිර්වාණය පිණිසම භාග්‍යවතුන් වහන්සේ වෙත බඹසර වෙසෙනු ලැබේ. 'විශිෂ්ටත්වයට ගෙන යනුයේනුයි හෝ විනය නම් වේ. ධර්ම වශයෙන් විනය වූයේ හෝ ධර්ම විනයයි. සංසාර ධර්ම වශයෙන්, ශෝකාදී ධර්ම වශයෙන් හෝ මෙය විශිෂ්ට වූ නිවනට ගෙන යයි. ධර්මය පිළිබඳ හික්මීම මිස අන්‍ය තීර්ථකයන්ගේ දහමක් නොවෙති යි යන අරුතින් හෝ ධම්මවිනය නම් වේ. ධර්මභූත (මූර්තිමත් ධර්මයම) වූ භාග්‍යවතුන් වහන්සේ විශේෂ වූ විනයක් ද වෙති. නොහොත්, යම් ධර්මයෙකින් ම (දතයුතු දෙය) මනාකොට දතහැකි වේද, පරිසමාප්ත ලෙසින් දතහැකි වේද, (පහ කළ යුතු දෙය) පහ කළ හැකි වේද, (වැඩිය යුතු දෙය) වැඩිය හැකි වේද, (සාක්ෂාත් කළ යුතු දෙය) සාක්ෂාත් කළ හැකි වේද, එම (මූර්තිමත්) ධර්මයෙනි. සත්ත්වයකු ජීවියකු වෙත නොව ධර්මය වෙත වූ විනයැයි හෝ 'ධම්මවිනය' නම් වේ.

අර්ථ සහිත බව, ව්‍යඤ්ජන සහිත බව ආදියෙන් අන්‍යයන්ගේ වචනයට වඩා ප්‍රමුඛ වූ වචනය 'පවචන' නම් වේ. පවචන වූයේම **පාවචනං** (ස්වාර්ථ වශයෙන් පාවචන වේ.) සියලුම චර්යාවන් අතුරෙන් විශිෂ්ට වූ චර්යාව (හැසිරීම) වූ හෙයින් **බ්‍රහ්මචරිය** නම් වේ. දෙව් මිනිසුනට

ශාස්තෘෘ වූ භාග්‍යවතුන් වහන්සේගේ අනුශාසනතාවය යන අරුතින් **සත්‍ථුසාසනං** සත්‍ථුසාසන නම් වේ. 'ශාස්තෘෘ වූ ශාසනය' යන අරුතින් ද සත්‍ථුසාසන නම් වේ. 'එය මාගේ ඇවෑමෙන් පසුව ඔබලාගේ ශාස්තෘෘ වන්නේය'යි ධර්ම විනය ද ශාස්තෘෘ යැයි කියන ලදැ'යි මෙසේ මේ පදයන්ගේ අර්ථය දතයුතුයි.

යම්හෙයකින්, මේ සම්බුද්ධ ශාසනයෙහි ම සර්වප්‍රකාරයෙන් ශික්ෂාත්‍රය සම්පූර්ණ කරන භික්ෂුව දක්නට ලැබේ ද, වෙනත් සසුනක දක්නට නොලැබේ ද, එහෙයින් ඒ ඒ තන්හි (මෙහිම යන අරුත ඇති) **'ඉමසම්ං' 'ඉමිස්සා'** යන නියමයන් කරන ලදැයි දතයුතුයි.

තත් සම්ප්‍රයුක්ත (එය හා එකට යෙදුණු) ධර්මයන් එය හා සමග ජීවත් වෙතියි **ජීවිතං** ජීවිත නම් වේ. රැකීම්, පාලනය කිරීම් ලක්ෂණයෙහි ප්‍රධානත්වය ඉටු කෙරෙතියි **ඉන්‍ද්‍රිය** නම් වේ. ජීවිතය ම ඉන්‍ද්‍රිය වූයේ **ජීවිතින්‍ද්‍රියං** ජීවිතින්‍ද්‍රිය නම් වේ. එය පවත්නා කල්හි චිත්ත සන්තතියට අධිපති බව වන්නේය. ලක්ඛණ (රස) ආදියෙන් වනාහි, තමාගෙන් වෙනස් නොවූ ධර්මයන් පාලනය කිරීම ලක්ෂණකොට ඇති ජීවිතේන්‍ද්‍රියයි. (එම ජීවිතේන්‍ද්‍රියය) එම ධර්මයන් පැවැත්වීම රස (හෙවත් කෘත්‍ය) කොට ඇත්තේය. එම ධර්මයන්ම පිහිටුවීම වැටහීම් කාරණාකොට ඇත්තේය. යැපිය යුතු ධර්මයන් පදට්ඨාන (පදනම්) කොට ඇත්තේය. අනුපාලන ලක්ෂණාදිය පිළිබඳ මේ විධානය මෙසේ පැවතියදී වුව ද, (මේ ජීවිතින්‍ද්‍රියය) ඒ (සම්ප්‍රයුක්ත) ධර්මයන්, (අත්‍ථිකඛණෙ) ඇති විටෙක ම පාලනය කරයි. ජලය උත්පලාදිය[1] (ඇති විටෙකම) පාලනය කරන්නා සේය.

යිතිපරිත්තතාය වා යනු ස්ථිතික්ෂණයේ මද බැවිනි. සුලු බැවිනි. **අප්පකං** යනු මද වූයේ යි, ළාමක වූයේ යි. **සරස පරිත්තතාය වා** යනු තමා හට ප්‍රත්‍ය වූ කෘත්‍යයන් හෝ සම්පත්තීන් අල්ප බැවිනි. දුබල බැවිනි. ඒ දෙකට හේතුව විභාග වශයෙන් දක්වනු පිණිස **කථං යිතිපරිත්තතාය** යනාදිය කීහු. එහි 'අතීත චිත්තක්ෂණයෙහි ජීවිතයක් වීය' යන මේ ආදී වූ පංචවෝකාර භවයෙහි පැවැත්මෙහිදී සිත නිරුද්ධ

---

1. 'උපපලාදිනි' යන්නෙහි පටන් 'ධානී' යන්න දක්වා යෙදී ඇති 'යථාසකං නිරයපාලං බාලපථසපවවයෙහි උපපනෙනපි ච ධමෙම පාලෙති' යන වාක්‍ය ඛණ්ඩයෙහි ක්‍රියාකාරක සම්බන්ධය ගැලපිය නොහැකිය. එහෙයින් ම අර්ථය ද උකහාගත නොහැක. හුම දෝෂයකින් සිදු වූ අප - පාඨයක් සේ පෙනේ.

වන කල්හි සියලුම රූපාරූප ධර්මයන් නිරුද්ධ නොවන කල්හිදු රූපයට වඩා අරූපය ප්‍රධාන වන බැවින් හෝ අරූප ජීවිතය සඳහා වූ චුති චිත්තය හා සමග සියලු රූපාරූප ධර්මයන් නිරුද්ධ වන බැවින් හෝ පංචවෝකාර භවයෙහි වූ චුති චිත්තය නැතහොත් චතුවෝකාර භවයෙහි රූපස්කන්ධය නැති හෙයින් එම චතුවෝකාර භවය සඳහා කියන ලදැයි දතයුතුය.

අතීතෙ චිත්තක්ඛණෙ යනු අතීත චිත්තයේ භංග ක්ෂණයෙන් යුක්ත කාලයෙහි ඒ සිතින් යුක්ත පුද්ගලයා 'ජීවත්විය' (ජීවිඨ) යි කියනු ලැබේ. 'ඉදානි න ජීවති' යනු 'දැන් ජීවත් වේ' යැයි කියනු නොලැබේ. 'න ජීවිස්සති' යනු මතු ජීවත් වන්නේ යයි ද කියනු නොලැබේ. **අනාගතෙ චිත්තක්ඛණෙ ජීවිස්සති** යනු අනාගත චිත්තය උත්පත්ති ලක්ෂණයෙන් යුක්ත නොවූ කාලයෙහි 'ජීවිස්සතී' යැයි කියනු ලැබේ. 'න ජීවති' යනු 'ජීවත් වේ' යැයි කියනු නොලැබේ. 'න ජීවිඨ' යනු ජීවත් වී යයි ද කියනු නොලැබේ. **පච්චුප්පන්නෙන චිත්තක්ඛණෙ** වර්තමාන චිත්තක්ෂණයෙන් යුක්ත කාලයෙහි **ජීවති** යනු දැන් ජීවත් වේ යැයි කියනු ලැබේ. **න ජීවිඨ** 'ජීවත්විය'යි කියනු නොලැබේ. **න ජීවිස්සතු** මතු ජීවත්වන්නේ යැයි ද කියනු ලැබේ.

ජීවිතං අත්තභාවෝ ච යන ආදී මේ ගාථාව පංචවෝකාර භවය අත් නොහැර (පංච වෝකාර භවයෙහිම) ලැබෙන දුක්ඛ වේදනාව ගන්නා ලද බැවින්, පංචවෝකාර භවය සඳහා ම කියන ලදී. කෙසේද? **ජීවිතං** යනු ජීවිත ශීර්ෂයෙන් සංස්කාර ස්කන්ධය ගන්නා ලදී. **අත්තභාවෝ** යනුවෙන් රූපස්කන්ධය ගන්නා ලදී. උපේක්ෂාව ශාන්ත වන හෙයින් සුඛ වේදනාව ම පවසන ලදැයි කියන ලදී. උපේක්ෂාව වේදනාවද ඇතුළත් කර, **සුඛ දුක්ඛා ච** යන්නෙන් (පූර්ණ) වේදනා ස්කන්ධය අදහස් කරන ලදී. **විඤ්ඤාණං** යැයි විඤ්ඤාණස්කන්ධය කියන ලදී. මේ චතුස්කන්ධයන් කියන ද හෙයින් ම ස්කන්ධ ලක්ෂණයන් සමාන ලක්ෂණ ඇති බැවින් ලක්ෂණ, ආකාර වශයෙන් සංඥා ස්කන්ධය ද මෙහිදී කියන ලදැයි දතයුතුයි. මෙසේ දක්වන ලද පංචස්කන්ධයන්ගෙන් අරූප (රූප නොවන) ධර්මය අත්හැර කර්මයන්ගෙන් හටගත් රූපයක් නොපවත්නා බැවින් **එක චිත්ත සමායුත්තා** යි අරූප ස්කන්ධයන්ගේ ප්‍රධාන බව කියන ලද්දේ වේ.

කෙසේද? අසංඥ සත්ත්වයෙහි එනම් බඹලොවෙහි රූපය ද මෙහි පංචවොකාර භවයෙහි සචිත්තක වූ කර්මබලය අත්නොහැර ම පවතිනුයේ කෙසේද? නිරෝධ සමාපත්තියට සම වන්නවුන්ගේ රූපය පවා ප්‍රථම සමාපන්න සමාපත්ති බලය අත්නොහැර ම පවතියි. මෙසේ තමා නොපවත්නා ස්ථානයන්හි පවා රූපයේ පැවැත්ම තමා සන්තකයක්ම කොටගෙන, පැවැත්වීම් ස්වභාව ඇති අරූප ධර්මයන් තමා පවතින ස්ථානයෙහි රූපය පැවැත්වීමේ ප්‍රධානත්වය ඇති බැවින් **එකචිත්ත සමායුත්තා** යි සිතේ ප්‍රධාන බව කියන ලදැයි දතයුතුයි. මෙසේ පංචවෝකාර භවයෙහි පවතින රූප ප්‍රවෘත්තියේ ප්‍රධාන වූ සිත නිරුද්ධ වීමෙන් රූපය ඇති කල්හිම සත්ත්වයන්ගේ නිරෝධය (නිරුද්ධ වීම) වන්නේ යැයි අරූප ධර්මයන්ගේ වශයෙන් ම 'ලහුසො චිත්තක්ඛණො' (චිත්ත ක්ෂණය ඉතා ලුහු (සුලු)යයි කියන ලදී.

නැතහොත් පංචවෝකාර භවයෙහි චුති චිත්තය සඳහා මෙය කියන ලදැයි දතයුතුයි. මෙසේ කියනු ලබන කල්හි, **සුඛදුක්ඛා ච** යනුවෙන් කායික, චෛතසික සුඛ වේදනාව ද කායික චෛතසික දුක්ඛ වේදනාවද චුති චිත්තක්ෂණයෙහි නොවෙතත්[1] එක සන්තතියක පැවතීම් වශයෙන් චුති සිතත් සමගම නිරුද්ධ වේ යැයි කියන ලදී. මෙය චතුවෝකාර භවය සඳහා හෝ කියන ලදැයි ද දතයුතුයි. ඒ කෙසේද? මෙතැන්හිදී **අත්තභාවො** යනු මේ පදයෙන් සංඥා ස්කන්ධය ගන්නා ලදී. බඹලොව කායික සුවදුක්, සෝමනස්ස - දෝමනස්සයන් නොවන්නේ නමුදු[2] **සුඛ දුක්ඛා ච** යනුවෙන් වේදනාව හා සමාන වශයෙන් ගනු ලබන වේදනා ස්කන්ධය ගන්නා ලදැයි දතයුතුයි. සෙසු පදයන්හි අර්ථය ඉහත පැවසූ පරිදිම වේ. මේ ත්‍රිවිධ විකල්පයන්හි **කෙවලා** යනු ස්ථිර, සුඛ, ශුභාත්මතාවක් නැත. කේවල පදාර්ථය ඒවායෙන් මිශ්‍ර වූයේ නොවේ.

'ලහුසො වත්තති බණ්ඩො'යි කියන ලද පරිදි එක් චිත්තක්ෂණයක් වන බැවින් ඉතා ලුහුව, ඉතා කෙටිව ජීවිතාදිය පිළිබඳ ක්ෂණයක් පවතියි. දෙසිතක් එක්ව නොපවත්නා බව දක්වමින් **චූලාසීති සහසසාති** යන ගාථාව කීහු.

---

1. මෙහි 'අහොනහි පි' යනු හ්‍රස්වයක් සේ පෙනේ. එය 'න හොනහි පි' යනුවෙන් නිදොස් විය යුතුය. නිෂේධාර්ථයෙහි 'න' නිපාතයට 'අ' කාරාදේශ වනුයේ කෘදන්ත විෂයයෙහිදී මිස ආඛ්‍යාත විෂයයෙහි නොවේ.

2. 'අහොතම්පි' යනු ද එසේ ම 'න හොතම්පි' යනුවෙන නිදොස් විය යුතුය.

චුලාසීති සහසසානි කපපා තිට්ඨනති යෙ මරූ යනු යම් දේව සමූහයක් සුවාසූ දහසක් කප් ආයු ඇතිව නේවසඤ්ඤානාසඤ්ඤා-යතනයෙහි සිටිත් ද, 'යෙ නරා' යන යෙදුම ද පෙළපොත්හි එයි. **නඤ්ඤෙව තෙපි ජීවනති දිවිහි චිතත සමොහිතා** ඒ දෙවියෝ ද දෙසිතකින් එකතුව, යුගල වශයෙන් බැඳුණු සිතින් නොම ජීවත්වේමැයි, 'එක් එක් සිතක් ඇතිවම ජීවත්වෙති'යි යන අර්ථයි. ඉක්බිති, මරණාවස්ථාව දක්වමින් **යෙ නිරුද්ධා** යන ගාථාව කීහු.

එහි **යෙ නිරුද්ධා** යනු යම් ස්කන්ධයක් නිරුද්ධ වූයේ ද අස්තංගත වූයේ ද **මරනතසස** මළහුගේයි. **තිට්ඨමානසස** නොහොත් ජීවත් වන්නහුගේයි, ජීවත් වන්නාගේ **සබ්බපි සදිසා ඛන්ධා** යනු චුතියෙන් පෙර නිරුද්ධ වූ ස්කන්ධයක් හෝ වේවා, පැවැත්මෙහිදී නිරුද්ධ වූ ස්කන්ධයක් හෝ වේවා නොගැටෙනු හැකිය යන අර්ථයෙන් සියලුම ස්කන්ධයෝ සමාන වෙති. **ගතා අපපටි සන්ධිකා** යනු නිරුද්ධ වූ, ස්කන්ධයන් පෙරළා අවුත් පිළිසිඳ ගැනීමක් නොවන හෙයින් 'ගතා අපපටි සන්ධිකා' (පිළිසිඳීමක් නැතිවම ගියාහුය) යැයි කියනු ලැබෙති. ඉක්බිති කාලත්‍රයෙහි නිරුද්ධ වූ ස්කන්ධයන්ගේ නානත්වයක් නැතැයි දැක්වීමට **අනනතරා** යන ගාථාව කීහු.

එහි **අනනතරා ච යෙ භංගා යෙ ච භංගා අනාගතා** යනු යම් ස්කන්ධයක් අනන්තරව, අතීතව සිට බිඳී ගියේ ද, යම් අනාගත ස්කන්ධයක් බිඳී යන්නේ ද **තදනතරෙ** මේ අතීත-අනාගත ස්කන්ධයන් අතරෙහි නිරුද්ධ වූ ප්‍රත්‍යුත්පන්න ස්කන්ධයන්ගේ **වෙසමමං නත්ථි ලකඛණෙ** යන්නෙහි වේසම්ම නම් විෂම භාවයයි. ඒ වෛෂම්‍ය නැති, නානත්වය, විෂම බව නැත යන අර්ථයි. ලකුණු කරනු ලැබේනුයි ලක්ඛණයි. එකෙණෙහි පවත්නා ලක්ෂණයයි. ඉක්බිති අනාගත ස්කන්ධයන් හා වර්තමාන ස්කන්ධයන්ගෙන් අමිශ්‍ර බව දක්වමින් **අනිබබත්තෙන න ජාතෝ** යන ගාථාව කීහු. **අනිබබත්තෙන න ජාතෝ** යනු නූපන්නා වූ නො පහළ වූ අනාගත ස්කන්ධයෙන් ජනිත නොවූයේ යි, මෙයින් අනාගත ස්කන්ධය වර්තමාන ස්කන්ධයෙන් අමිශ්‍ර බව කීහු. **පචචුපපනෙන න ජීවති** යනු ප්‍රත්‍යුත්පන්න ක්ෂණයෙහි, වර්තමාන ස්කන්ධයෙහි, ජීවත් නොවේ. මෙයින් එක්කෙනෙක්හි දෙසිතෙකින් ජීවත් නොවේ යැයි කියන ලදී. **චිතත භංගාමතෝ** යනු දෙසිත වේ. **උපරිතෝ චිතතභංගා** චිත්ත භංගයෙන් පසුව ද යනු ද පෙළෙහි එයි. එම සරල අර්ථයමය. (සිත බිඳීමෙන් පසුව)

පඤ්ඤත්ති පරමට්ඨීති යනු, 'මනුෂ්‍යයන්ගේ රූපය දිරා යයි. නාම ගෝත්‍රය නොදිරයි' යන වචනය අනුව, ප්‍රඥප්ති මාත්‍රය නොදිරන බැවින්, 'පරම වූ පැවැත්ම මෙයට ඇත්තේනුයි 'පරමට්ඨීති' නම් වේ. 'ස්වභාවයෙන් සිටිති'යි යන අරුතයි. 'දත්ත නැමැත්තේ මළේය. 'චිත්ත නැමැත්තේ මළේය' යනුවෙන් හුදෙක් ප්‍රඥප්ති මාත්‍රය ම ව්‍යවහාරයෙහි සිටියි.

නැතහොත් **පරමත්ථියා** පරමාර්ථ වශයෙන් පරම වූ අර්ථය මෙහි වූයේ නුයි පරමත්ථියා නම් වේ. අජටාකාශ විෂයයෙහි 'ආකාස' යන ප්‍රඥප්තිය (එහි) ස්වභාවය නිසා (ඒ අනුව) කීමක් නොවන්නා සේ ම, 'මළොා' (මළේය) යන ප්‍රඥප්තිය ද (එහි) ස්වභාවය නිසා නොකියනු ලැබ්. ජීවිතින්ද්‍රිය සංඛ්‍යාත වූ ස්වභාවය නිසා නොකියනු ලැබේ. **අනිධානගතා භංගා** යනු යම් ස්කන්ධයක් බිඳුණාහු ද ඒවා නිධානයට, රැස්වීමට, එකතුවීමට නොයෙති යි 'අනිධාගතා' නම් වේ. **පුඤ්ඤා නත්ථි අනාගතෙ** යනු අනාගතයෙහි ද ඒවායේ කැටි ගැසීමක්, ඒකරාශි වීමක් නැත. **නිබ්බත්තා යෙ ච තිට්ඨන්ති** යනු ප්‍රත්‍යුත්පන්න වශයෙන් උපන්නාහු (ජීවිතින්ද්‍රියයාගේ) ස්ථිති කාරණයෙහි විනාශය ස්වභාවකොට ඇතිව සිටිති. කෙසේද? **ආරග්ගෙ සාසපූපමෝ** යනු ඉඳිකටු අග වූ අබැටක් මෙනි. ඉක්බිති, ස්කන්ධයන්ගේ නැසෙනසුලුබව දක්වන්නාහු. **නිබ්බත්තානං** යන ආදි ගාථාව කීහු. එහි **නිබ්බත්තානං ධම්මානං** යනු ප්‍රත්‍යුත්පන්න ස්කන්ධයන්ගේයි. **භංගො තෙසං පුරක්ඛතො** යනු මේ ධර්මයන්ගේ බිඳීම පෙරටුකොට තබන ලදී. **පලොකධම්මා** යනු නැසෙනසුලු ස්වභාවයයි. **පුරාණෙහි අමිස්සිතා** යනු පෙර උපන් ස්කන්ධයන් සමග අමිශ්‍ර වූවාහුයි, එකතු නොවූවාහු යි, ඉක්බිති ස්කන්ධයන්ගේ නොදිස්නා බව දක්වන්නාහු, **අදස්සනොතො ආයන්ති** යන ආදී ගාථාව කීහ. එහි **අදස්සනතො ආයන්ති** යනු නො දිස්නාහු ම එති. උපදිති. **භංගා ගච්ඡන්ති අදස්සනං** යනු බිඳීමෙන්, බෙදී යාමෙන් පසුව නො දිස්නා බවට යති. **විජ්ජුප්පාදොව ආකාසෙ** යනු විවෘත ආකාශයෙහි විදුලිඑළිය පැතිරෙන ලෙසිනි. **උච්ඡිජ්ජන්ති වයන්ති ච** යනු පූර්වාන්තයෙන් විනාශ වී යති. බිඳී යති. වැනසී යතියි යන අර්ථයි. 'චන්ද්‍රයා උදාවෙයි. පූර්ණත්වයට යෙයි' යනාදියෙහි මෙනි.

මෙසේ 'ඨිති පරිත්තකාදි (ස්ථිතියෙහි, පැවැත්මෙහි අල්ප බව) දක්වා ඉක්බිති සරස පරිත්තතාව දක්වන්නාහු **කථං සරසපරිත්තතාය** යනාදිය කීහු. එහි **අස්සාසූපනිබද්ධං ජීවිතං** යනු අභ්‍යන්තරයට නාසයෙන්

පිවියෙන වාතය (ආශ්වාසය) හා බැඳුණු ජීවිතින්ද්‍රිය යයි. **පස්සාසෝ** යනු නාසයෙන් පිටතට නික්මෙන වාතයයි. (ප්‍රශ්වාසය) **අස්සාස පස්සාසෝ** යනු ඒ ආශ්වාස ප්‍රශ්වාස දෙකයි. **මහාභූතූප නිබඳධං** යනු චතු සමුට්ඨානික වූ පඨවි, ආපෝ, තේජෝ, වායෝ යන මහාභූතයන් හා බැඳුණු ජීවිතයයි. **කබලිංකාරාහාරූප නිබඳධං** යනු කෑම්, පීම් ආදි කබලිංකාර ආහාරය හා බැඳුණු **උසමූපනිබඳධං** යනු කර්මජ තේජෝ ධාතුව හා බැඳුණු, **විඤ්ඤාණූපනිබඳධං** යනු භවංග විඤ්ඤාණය හා බැඳුණු, යමක් සඳහා 'ආයු උස්මාච විඤ්ඤාණං - යදා කායං ජහනතිමං' (යම්කලෙක ආයුෂ, උණුසුම හා විඤ්ඤාණය මේ ශරීරය අත්හරියි ද) යනුවෙන් කියන ලද්දේ ද එය මෙහිදී අදහස් වේ.

ඉක්බිති මේවායේ දුර්වල හේතු දක්වන්නාහු **මූලමපි ඉමෙසං දුබබලං** යනාදිය කීහු. එහි **මූලමපි** යනු පිහිටීම් අර්ථයෙන් මුල් වූ ආශ්වාස ප්‍රශ්වාසයනට කරජ (කර්මයෙන් උපන්) කය මුල් වේ. මහාභූතයනට අවිද්‍යා, කර්ම, තණ්හා ආහාර යන මොහු මුල් වෙති. **ඉමෙසං** කියන ලද ආකාර ඇති ආශ්වාසාදී වූ ජීවිතින්ද්‍රියට ප්‍රතිකාරණා වශයෙන් කියන ලද, මේවායින් එක එකක් නොපවත්නා කල්හි ජීවිතින්ද්‍රිය නොසිටියි. **දුබබලං** යනු අල්ප ශක්ති ඇත්තේය.

පුබබහෙතු පි යනු අතීත ජාතියෙහි මේ විපාක වට්ටයට හේතුභූත කාරණ සංඛ්‍යාත වූ අවිද්‍යා සංඛාර, තණ්හා, උපාදාන, භව යන මොහුද, දුර්වල වූ මොවුනට යමක් ප්‍රත්‍ය වී නම් ඔහු ද දුර්වලයහ යි යම් ආරම්මණාදී වූ පොදු ප්‍රත්‍යයෙන් ය. **පභවිකා** යනු ප්‍රධාන වී උපන් තණ්හාවයි. **සහභූ** යනු එක්ව උපන් රූපාරූප ධර්මයෝයි. **සම්පයොගාපි** යනු එක්ව යෙදුණු අරූප ධර්මයෝ යි. **සහජාපි** එක්ම සිතෙහි එක්ව උපන්නාහු ද **යාපි පයොජිකා** යනු චුතිප්‍රතිසන්ධි වශයෙන් යොදන පිණිස නියුක්ත වූහයි, පයෝජික් නම් වූ වට්ටමූලක තණ්හාවයි කියන ලදමැයි, තණ්හාව දෙවැනි කොට ඇති පුරුෂයායි. **නිච්ච දුබබලා** යනු නිරන්තරයෙන් දුර්වල වූයේයි, **අනවටඨිතා** යනු මැනවින් නොපිහිටියේයි, මුල්බැස නොගත්තේයි, **පරිපාතයනති ඉමෙ** යනු මොහු ඔවුනොවුන් පිරිහෙලති. වනසා ගනිති. **අඤ්ඤමඤ්ඤස්ස** යනු එකෙක් අනිකෙකුට, එකිනෙකාටයි යන අර්ථයි. **හි** යනු කාරණාර්ථයෙහි නිපාතයි. **නත්ථිතායිකො** යනු රකින්නෙක්, ආරක්ෂා කරන්නෙක් නැත. **න ඨපෙනති අඤ්ඤමඤ්ඤං** යනු එකෙක් අනිකකු පිහිටවනු සමත් නොවෙති. **යොපි නිබබත්තකො**

සො න විජ්ජති යනු මොවුන්ගේ උත්පාදක වූ යම් ධර්මයක් වේද, එයද දැන් නැත.

න ච කෙනචි කොචි හායති යනු කිසිවෙක් එකෙක් හෝ වශයෙන් කිසිවෙකුට නොපිරිහෙවයි, (හානි නොකරවයි). **ගන්ධබ්බා ච ඉමෙහි සබ්බසො** යනු මේ සියලු ම ස්කන්ධයෝ සර්වප්‍රකාරයෙන් ම බිඳීමට පත්විය යුත්තාහුය. **පුරිමෙහි පභාවිතා** යනු මේ වර්තමාන ස්කන්ධයෝ පූර්වහේතු ප්‍රත්‍යයෙන් උපදවන ලද්දාහුය. **යෙපි පභවකා** යනු පූර්වහේතු ප්‍රත්‍යයෙන් උපදවන ලද යම් මේ වර්තමානයට නොපැමිණ පළමුව මරණයට පත්වූවාහුය. **පුරිමාජි ච පච්ඡිමාපි ච** යනු පෙර වූ පූර්වහේතු ප්‍රත්‍යයෝ ද පසුව වූ වර්තමාන ප්‍රත්‍යයෙන් උපන්නා වූ ස්කන්ධයෝ ද **අඤ්ඤමඤ්ඤං න කදාචි මදදසුං** යනු ඔවුනොවුන් කිසිකලෙක නොදුටුවිරෑය. මෙහි 'ම' කාරය සන්ධි වශයෙන් (ආගම කොට) කියන ලදී.

චාතුම්මහාරාජිකානං දෙවානං යනු ධ්‍රැතරාෂ්ට්‍ර, විරූඪ, විරූපාක්ෂ හා කුවේර නම් වූ සිවු වරම් මහරජ දරුවෝ මේ (දෙවියන්ට) අධිපති වූවාහුයි චාතුම්මහාරාජික නම් වෙති. රූපාදියෙන් බබළත්නුයි දේව නම් වෙති. ඔවුහු මහාමේරු පර්වත මධ්‍යයෙහි වෙසෙති. ඔවුන් අතර පර්වතවාසීහු ද ආකාශස්ථ වූවාහුද සිටිති. ඔවුන්ගේ පරපුර චක්‍රවාට පර්වතය දක්වා පතළේය. බිඩ්ඩාපදෝසික, මනෝපදෝසික, සීත වලාහක හා උෂ්ණ වලාහක දෙවියෝ ද චන්දිම හා සූරිය දේවපුත්‍රයෝ ද චාතුම්මහාරාජික දේව ලෝකයෙහි ම වෙසෙති. ඒ චාතුම්මහාරාජිකයන්ගේ ජීවිතයයි. **උපාදාය** යනු නිසා (අනුව සසඳන විට) **පරිත්තකං** යනු වැඩි බව වැලැක්වීමයි. අල්ප වූ, (දෙව්ලොව ආයුෂ හා සසඳන කල මිනිස්ලොව ආයු ප්‍රමාණය ඉතා අඩු බව හා කෙටි බව කී සේයි.) **ථොකං** යනු මඳ වේ. දීර්ඝ බව වැළැක්වීමයි. **ඛණිකං** යනු ක්ෂණික වේ. කාලාන්තරය වැලැක්වීමයි. **ලහුකං** යනු ලුහු වේ. ලැසි බව වැලැක්වීමයි. **ඉත්තරං** ශීඝ්‍ර බව, බලවත් බව වැලැක්වීමයි. **අනද්ධනිකං** යනු කාල වශයෙන් දිගුකලක් නොපැවති හැකි වේ. **න චිරට්ඨිතිකං** දවසක් දවසක් පාසා බොහෝ කලක් නොපවත්නුයි, චිරස්ථිතික නොවේ. දවස් ගණන වැලැක්වීමයි.

තාවතිංසානං යනු තෙතිස් ජනයා එහි උපන්හයි, 'තාවතිංස' නම් විය. තවද තාවතිංස යනු ඒ දෙවියන්ගේ නාමය ම වන බව ද කියන ලදී.

ඔහු ද පර්වතවාසීහු ද ආකාශස්ථයෝ ද වෙති. ඔවුන්ගේ පරපුර ද යක්වල ගල දක්වා පතළේය. එසේම යාම ආදී අන්කිසි දෙව්ලොවෙක දෙවියන්ගේ පරපුර සක්වල ගල දක්වා නොපතළේ නම් නැත. දිව්‍ය යුබයට ගියාහුය. පැමිණියාහුයි, සපැමිණියාහුයි යන අරුතින් **යාමා** නම් වෙති. තුටු පහටු වූවාහුයි යන අරුතින් **තුසිතා** නම් වෙති. ප්‍රකෘතියෙන් පිළියෙල වූ අරමුණට වඩා වැඩියෙන් රමණය කරනු කැමති විටෙක, කැමති පරිදි ඒ සම්පත් මවාගෙන රමණය කෙරෙති යි **නිම්මාණරතී** නම් වෙති. සිතැඟි දැන අනුන් විසින් නිමවූ සම්පත් ස්ව වශයෙහි පවත්වතියි නුයි **පරනිම්මිත වසවත්තී** නම් වෙති. බ්‍රහ්ම සමූහයා අතර, බ්‍රහ්ම සමාගමයෙහි නියුක්ත වූහ යි **බ්‍රහ්මකායිකා** නම් වෙති. මෙයින් සියලුම පංචවෝකාර (ස්කන්ධ පංචකය ඇති) බ්‍රහ්මයෝ ගන්නා ලදහ. **ගමනීයෝ**ා යනු යායුතු වේ. **සම්පරායෝ** පරලොවයි. **යෝ හිකඛවෙ චිරං ජීවති සෝ වසසසතං** යනු යමෙක් බොහෝකල් ජීවත් වෙතොත්, හේ සියවසක් පමණ ජීවත් වේ. **අපපං වා භියෝ**ා යනු සියවසකට වඩා ජීවත් වෙතත් සියවස් දෙකක් ජීවත්වන්නෙක් නම් නැත. **හීලෙය්‍ය නං** යනු මනුෂ්‍ය ජීවිතය අවඥා කරන්නේය. ලාමක කොට සිතන්නේය. නැතහොත් 'හීලෙය්‍ය නං' එය සුලුකොට තැකිය යුතුයැයි පුන පුනා කියන්නේ ය. **අවයනති** යනු ඉක්මවති. **අහොරත්තා** යනු රෑ දාවල් පිරිසිඳ දැක්වීමෙනි. **උපරුජ්ඣති** යනු ජීවිතින්ද්‍රියය නිරුද්ධ වේ. අභාවයට යෙයි. **ආයුඛ්‍යති මචචානං** යනු සත්ත්වයන්ගේ ආයු සංස්කාරය ක්ෂයවීමට යෙයි. **කුනනදීනං ව ඔදකං** යනු ජලය සිඳුණු කුඩා නදීන්ගේ ජලය මෙන් මිනිසුන්ගේ ආයුෂ ගෙවී යයි. පරමාර්ථ වශයෙන් සත්ත්වයන්ගේ ජීවිතක්ෂණය ඉතාම අල්ප වේ. එක් චිත්ත ක්ෂණයක් පමණ ම වේ.

යම්සේ රිය සකක් පෙරළෙනුයේ එකම නිම්වළලු පෙදෙසකින් පෙරළේ ද නවතිනුයේ ද එකම නිම් වළල්ලකින් ම නවතී ද, එසේම සත්ත්වයන්ගේ ජීවිතය එක් චිත්තක්ෂණයක් පමණ වේ. ඒ සිත නිරුද්ධ වූ පමණින් සත්ත්වයා නිරුද්ධ වූයේ යැයි කියනු ලැබේ. **ධීරා** යනු නුවණැත්තෝ යි. නැවත **ධීරා** යනු පණ්ඩිතයෝයි. **ධිතිමා** යනු ධෛර්යය මොහුට ඇත්තේනුයි ධිතිමා නම් වේ. **ධිති සම්පනනා** යනු පාණ්ඩිත්‍යයෙන් යුතු වූවෝයි, **ධිකකිත පාපා** යනු ගැරහූ (පිළිකුලෙන් ඉවත දැමූ) පවු ඇත්තෝ යි, එම පර්යාය ම දැක්වීමට, 'ධී' යනු ප්‍රඥාවයි යනාදිය කීහු. එහි විශේෂයෙන් දැනගනීනුයි **පඤඤා** නම් වේ. කුමක් විශේෂයෙන් දැනගනියි ද, 'මේ දුකය' ආදී වශයෙන් ආර්ය සත්‍ය විශේෂයෙන්

දැනගනියි. අටුවාවෙහි (හෙළටුවායෙහි) වනාහි පැණවීම් වශයෙන් 'පඤ්ඤා' නම් වෙති යි කියන ලදී. කිමෙකැයි පණවා ද? අනිත්‍යය, දුක්ඛය, අනාත්මයැයි පණවයි. ඒ ප්‍රඥාව අවිද්‍යාව අභිභවනය කරන හෙයින් අධිපති අර්ථයෙන් **ඉන්ද්‍රියං** ඉන්ද්‍රිය නම් වේ. දර්ශන ලක්ෂණයෙහි ප්‍රධාන බව ඇති කරන්නේ නුයි ද ඉන්ද්‍රිය නම්. ප්‍රඥාවම ඉන්ද්‍රිය වූයේ **පඤ්ඤින්ද්‍රියං** පඤ්ඤින්ද්‍රිය නම්. ඒ මේ ප්‍රඥාව ආලෝක කිරීම හා විශේෂයෙන් දැනගැනීම ලක්ෂණකොට ඇත්තේ ය. යම්සේ සිවු බිත්තියක් ඇති ගෙයි රාත්‍රියේ පහනක් දැල්වූ විට අන්ධකාරය දුරුවේද, ආලෝකය පහළ වේද, මෙසේම ප්‍රඥාව ආලෝක කිරීම ලක්ෂණකොට ඇත්තේය. ප්‍රඥාලෝකය හා සමාන ආලෝකයක් නම් නැත. එක පළඟකින් හුන් ප්‍රඥාවන්තයා හට වනාහි දස දහසක් ලෝකධාතුව ඒකාලෝක වේ. එහෙයින් තෙරුන්වහන්සේ මෙසේ වදාළහ. 'මහරජ, යම්සේ පුරුෂයෙක් අන්ධකාර ගෙයකට තෙල් පහනක් ගෙනයන්නේ ද, ගෙනගිය පහන අඳුර වහා දුරුකරයි ද, ආලෝකය දනවයි ද ප්‍රභාව පතුරුවයි ද රූපාදිය පෙනෙන්නට සලස්වයි ද එසේම මහරජ, ප්‍රඥාව උපදිනුයේ ම අවිද්‍යා අන්ධකාරය නසයි. විද්‍යාවභාසය ඇතිකරයි. ඤාණාලෝකය පතුරුවයි. ආර්ය සත්‍යයන් ප්‍රකට කරයි. මහරජ, මෙලෙසින් ප්‍රඥාව ඕභාසන ලක්ෂණයෙන් යුක්තය. යම්සේ වනාහි දක්ෂ වෛද්‍යවරයෙක් රෝගීන්ගේ පථ්‍යාහාරාදිය දනියි ද, එසේම ප්‍රඥාව උපදින විට ම කුසලාකුසලයන්, සේවනය කළයුතු, සේවනය නොකළ යුතු, හීණ-ප්‍රණීත ධර්ම, කළු හා සුදු වැනි (පව් පින්) ධර්මයන් විශේෂයෙන් දැනගනියි. දම්සෙනෙවි සැරියුත් මහතෙරුන් විසින් කියන ලදමැයි, 'ඇවැත්නි, එහෙයින් විශේෂයෙන් දැනගනුයේය යන අරුතින් 'ප්‍රඥා' යැයි කියනු ලැබේ. කුමක් දැනගනියි ද? මේ දුකයැයි දැනගනියි. යනුවෙන් විස්තර කළ යුතුයි. මෙසේ ප්‍රඥාවේ ඇති පජානන ලක්ෂණය දතයුතුයි.

තවද ක්‍රමයකි. ප්‍රඥාව යථා ස්වභාවය අවබෝධ කිරීම ලක්ෂණකොට ඇත්තේ වේ. නොපැකිල අවබෝධ කිරීම ලක්ෂණකොට ඇත්තේ හෝ වේ. දක්ෂ දුනුවායෙකුගේ දුන්නෙන් විදි ඊයක් නියමිත ඉලක්කය ලබාගන්නා සේය. විෂය වස්තූන් හෙළිකරන පහනක් සේය. නොමුළා බව වැටහීම් කාරණකොට ඇත්තේය. ආරණ්‍යගත දක්ෂ මගපෙන්වන්නකු සේය. **ඛන්ධ ධීරා** යනු පංචස්කන්ධ විෂයයෙහි ඤාණය පවත්වතියි **ධාතුධීරා** ධාතුධීර නම් වෙති. සෙසු පදයන්හි ද මේ ක්‍රමයෙන් අර්ථ ගතයුතුයි. **තෙ ධීරා එවමාහංසු** යනු ඒ පණ්ඩිතයෝ මෙසේ කීහ. **කථෙනති** යනු අල්පයි සුලු යැයි කියති. **භණනති** යනු ඉතා මද යැයි, ක්ෂණික යැයි කියති.

දීපයනති ලඝු යැයි, ස්වල්ප යැයි දක්වති. **වොහරනති** යනු දිගුකල් නොපවතියි. චිරස්ථිතික නොවේ යැයි නානා ප්‍රකාරයෙන් ව්‍යවහාර කරති.

ඉක්බිති යමෙක් මෙසේ නොකරත් ද ඔවුනට සිදුවන ව්‍යසනාදිය දක්වනු සඳහා **පසසාමි** යන ගාථාව කීහු. එහි **පසසාමි** යනු මසැස් ආදියෙන් බලමි. **ලොකෙ** යනු අපායාදියෙහි යි. **පරිඵන්දමානං** යනු ඔබමොබ පනින. මේ සත්ත්ව කායයි. ප්‍රජාවයි. **තණ්හාගතං** යනු තණ්හාවෙන් ගිය 'මඬින ලද', 'එහි වැටුණු' යන අදහසයි. **භවෙසු** යනු කාමභවාදියෙහි ය. **හීනා නරා** හීන කාය කර්මාදිය ඇති ජනයායි. **මච්චුමුඛෙ ලපනති** යනු මරණකාලය පැමිණිවිට, මරණ මුඛයෙහි සිට වැළපෙති. **අවීත තණ්හාසෙ** යනු දුරුනොවූ තණ්හා ඇත්තාහුයි, **භවා** කාමාදී භවයන්ය. **භවෙසු** කාම භවාදියෙහි ය.

නැතහොත් **භවාභවෙසු** යනු භවයෙන් භවයෙහි, නැවත නැවත ඉපැදීමෙහි යි කී නියායි. **පසසාමි** යනු මසැසින් ද දකිමි. මසැස දෙවැදෑරුම්ය. සසම්භාර චක්ඛු හා පසාද චක්ඛු වශයෙනි.

යටින් ඇස්වළෙහි ඇටයෙන් ද උඩින් බැම ඇටයෙන් ද දෙපසින් ඇස් කොන්වලින් ද පිටතින් ඇස්වළෙන් ද පිරිසුන් (සීමා වූ) ඇස්වළෙහි මැද පිහිටි නහරවැලින් හිස්මොළ හා සමග බැඳුණු, 'සේත-කණ්හ' යනුවෙන් වහරෙහි එන, කෘෂ්ණ මණ්ඩලයෙන් (කළු ඉංගිරියාවෙන්) විචිත්‍ර වූ යම් මේ මස් පිඬුවක් වේද, මෙය 'සසම්භාර චක්ඛු' නම් වේ. මෙය ඇසුරු කරමින්, මෙය හා සමග බැඳී සතරමහා භූතයන් ග්‍රහණය කිරීමෙන් යම් පසාදයක් (ප්‍රතිචාර දනවන තැනක්) වේද, මෙය 'පසාද චකඛු' නම් වේ. (මෙහි) මෙය අභිප්‍රේතයි. ඒ මේ පසාද චක්ඛුව එම සසම්භාර චක්ඛුවෙහි ශ්වේත මණ්ඩලයෙන් (සුදු ඉංගිරියාවෙන්) පරික්ඛිප්ත (වට) වූ කෘෂ්ණ මණ්ඩලය (කළු ඉංගිරියාව) මැද, ඉදිරියෙහි සිටියවුන්ගේ ශරීරච්ඡායාව (බබා) පිළිබිඹු වන තන්හි ඇති දෘෂ්ටි මණ්ඩලයෙහි, පුලුන් පටල සතක් තුළ තෙලින් බොඳකළ පුලුන් පටල වැනි අක්ෂි පටල (ඇස් සිවි) සතෙක ව්‍යාප්තව, ප්‍රමාණයෙන් උකුණු හිසක් තරම් ව, චක්ඛු විඤ්ඤාණාදියට සුදුසු පරිදි වස්තු ද්වාරභාවය සලසමින් සිටියි. එය දක්නේනුයි, 'චකඛු' නම් වේ. ඒ මසැසින් දකිමි. **දිබ්බෙන චකඛුනා** යනු 'මහණෙනි, මම පිරිසිදු වූ දිවැසින් දුටුවෙමි' යන මේ ආකාර වූ දිවැසින්. **පඤ්ඤා චකඛුනා** යනු

දුරු වූ කෙලෙස් දූවිලි ඇති මල ඇති, දහම් ඇස පහළ විය යනුවෙන් මෙසේ පවසන ලද ප්‍රඥා චක්ෂුයෙන්, **බුද්ධ චක්ඛුනා** යනු 'මහණෙනි, මම බුදුඇසින් ලොව බලනුයෙමි දුටුවෙමි' යනුවෙන් දක්වන ලද බුදුඇසින්, **සමන්ත චක්ඛුනා** යනු 'සමන්ත චක්ඛු නම් සර්වඥතා ගුණයයි' යනුවෙන් දක්වන ලද සමතැසිනි. **පසසාමි** මසැසින් අත්ලෙහි තැබූ නෙල්ලිගෙඩියක් මෙන් මසැසින් රූපය දකිමි. **අක්ඛාමි** යනු දිවැසින් (සත්ත්වයන්ගේ) චුති උත්පත්තීන් දැනගනිමි. **ඔලොකෙමි** යනු ප්‍රඥා චක්ෂුයෙන් චතුරාර්ය සත්‍යය බලමි. **නිජ්ඣායාමි** යනු ශ්‍රද්ධාදී පංචඉන්ද්‍රියන් පිළිබඳව බුදුඇසින් සිතමි. **උපපරික්ඛාමි** යනු හාත්පසින් සමන්තචක්ෂුයෙන් පස්වැදෑරුම් ඤෙය්‍ය පථයන් විමසා බලමි. **තණ්හාඑඳනාය එඳමානං** යනු තණ්හා චලනයෙන් සසල වෙමින්, මින් අනතුරුව දිට්ඨි එඳනයෙහි (දෘෂ්ටියෙන් සසල වීමෙහි) පටන් දෘෂ්‍යාසන දුකින් එඳමාණය (සසල වීම) තෙක් වූ පාඨය, කියන ලද නයම වන හෙයින් අර්ථය ප්‍රකට වේ. **සපඵඳමානං** යනු නැවත නැවත ස්ඵඳනය වනුයේ **විපඵඳමානං** යනු නන් අයුරින් සසල වනුයේ, **වෙධමානං** යනු කම්පා වනුයේ **පවෙධමානං** යනු ප්‍රධාන වශයෙන් කම්පාවන **සම්පවෙධමානං** යනු නැවත නැවත කම්පා වනුයේ, උපසර්ග යෙදීමෙන් පදයන්ගේ අර්ථ වැඩිකරන ලදී. **තණ්හානුගතං** යනු තණ්හාවට අනුව ප්‍රවිෂ්ඨ වූයේ, **තණ්හානුසටං** යනු තණ්හාවෙන් විසිරුවන ලදුයේ, **තණ්හාධිපනනං** යනු තණ්හාවෙහි ගිලුණේ. **තණ්හාය පාතිතං** යනු තණ්හාවෙහි හෙලන ලදුයේ, 'පරිපාතිතං' යනු හෝ පාඨයි. **අභිභූතං** යනු තණ්හාවෙන් මැඩුණේ, වසාදමන ලදුයේ **පරියාදිණ්ණ චිත්තං** යනු ක්ෂයකොට ගන්නා ලද සිතයි.

නොහොත්, **තණ්හා ගතං** යනු, ජල ප්‍රවාහයෙකින් ගසාගෙන ගියා වැනි, **තණ්හානුගතං** යනු දැඩිව ගන්නා ලද රූප ප්‍රත්‍යයෙහි වැටී ගියා වැනිය. **තණ්හානුසටං** යනු ජලය මතුපිට වසා පැතිරුණ සෙවෙල් සහිත ජල තලයක් වැනිය. **තණ්හාධිපනනං** යනු වැසිකිළි වළෙක ගිලී ගියා වැනිය. **පාතිතං** යනු රුක් මුදුනෙකින් වැටී නැවත නිරයෙහි වැටුණා වැනිය. **තණ්හාය අභිභූතං** යනු දැඩිව අල්ලාගත් රූපයෙහි සිත යෙදීම වැනිය. **තණ්හාය පරියාදිනන චිත්තං** යනු දැඩිව අල්ලාගත් රූපය පරිග්‍රහණය කරන්නහුට උපන් දර්ශනය වැනිය. නොහොත්, **තණ්හාගතං** යනු කාමච්ඡන්ද වශයෙනි. **තණ්හානුගතං** යනු කාම පිපාසා වශයෙනි. **තණ්හානුසටං** යනු කාමාශ්‍රව වශයෙනි. **තණ්හාධිපනනං** යනු, කාම පරිදාහ වශයෙනි. **තණ්හාය පාතිතං** යනු, කාමයෙහි එල්බීම් වශයෙනි. **තණ්හාය**

අභිභූතං යනු කාම ඕඝ වශයෙනි. **තණ්හාය පරියාදින්න චිත්තං** යනු කාම උපාදාන වශයෙනියි යනුවෙන් ඇතැමෙක් විස්තර කෙරෙති.

කාමභවෙ යනු කාමාවචරයෙහි ය. **රූපභවෙ** යනු රූපාවචරයෙහිය. **අරූපභවෙ** යනු අරූපාවචරයෙහි ය. ඒවායෙහි නානත්වය ඉහත ප්‍රකාශ කරන ලද්දේමය. **භවා භවෙසු** යනු භවයන්හි හා අභවයන්හි, 'භව' නම් කාම ධාතුවයි. 'අභව' නම් රූපාරූප ධාතුය. නැතහොත්, 'භව' යනු කාම හා රූප ධාතුය. 'අභව' යනු, අරූප ධාතුවයි. ඒ භව-අභවයන්හිය. **කම්ම භවෙ** යනු කම්වටෙහිය. **පුනබ්භවෙ** යනු පුනර්භව සංඛ්‍යාත විපාක වට්ටයෙහිය. **කාම භවෙ** යනු කාම ධාතුවෙහිය. **කම්මභවෙ** යනු කම්ම වට්ටයෙහිය.

එහි **කම්ම භවො** යනු වඩන්නේනුයි **භවො** භව නම්. **කාමභවෙ පුනබ්භවෙ** යනු කාමධාතුවෙහි, උප්පත්ති භවයෙහි, විපාක වට්ටයෙහියි, 'විපාක භවො' යනු වන්නේ නුයි **භවො** භව නම් වේ. රූප භවාදියෙහි ද මේ ක්‍රමයමයි. මෙහිදී කාමභවය, රූප භවය, අරූප භවය යනුවෙන් ඕකාස භවය අදහස් කරන ලදී. ඒ තුනෙහිම **කම්ම භවෙ** යනු කර්ම භවයයි. එසේම **පුනබ්භවෙ** යනු, උත්පත්ති භවය සඳහා කියන ලදී. **පුනප්පුනං භවෙ** යනු නැවත නැවත ඉපැදීමෙහිය. **ගතියා** යනු පංච ගතීන් අතුරෙන් එක්තරා ගතියෙක්හි **අත්තභාවාභිනිබ්බත්තියා** යනු ආත්ම භාවයන්ගේ නැවත නැවත ඉපදීමෙනි. **අවීත තණ්හා** යනු මේ මුල් පදයයි. (දුරු නොවූ තණ්හා ඇත්තාහුයි), **අවිගත තණ්හා** යනු ක්ෂණික සමාධිය මෙන් ක්ෂණිකව ප්‍රහාණය නොවන හෙයින් විගත නොවූ තණ්හාව මොවුනට වෙති'යි අවිගත තණ්හා ඇත්තාහුයි. **අචවන්න තණ්හා** යනු තදංග ප්‍රහාණයක් නොවන හෙයින් අත් නොහළ තණ්හා ඇත්තාහුයි. **අවන්න තණ්හා** යනු විෂ්කම්භන ප්‍රහාණයක් නොමැති හෙයින් වමාරා නොදමන ලද තණ්හා ඇත්තාහුයි, **අමුත්ත තණ්හා** යනු අත්‍යන්ත වශයෙන් සමුච්ඡේද ප්‍රහාණයක් නැති හෙයින්, නොමිදුණු තණ්හා ඇත්තාහුයි, **අප්පහීන තණ්හා** යනු පටිප්පස්සද්ධි ප්‍රහාණයක් නොමැති හෙයින්, අප්‍රහීණ වූ තණ්හා ඇත්තාහුයි, **අප්පටිනිස්සට්ඨ තණ්හා** යනු නිස්සරණ (නික්ම යෑම) ප්‍රහාණයක් නොමැති හෙයින් භවයෙහි පිහිටි, අරූප කෙලෙස් අත්නොහැර සිටි හෙයින් අප්පටිනිස්සට්ඨ (ඉවත නොදැමූ) තණ්හා ඇත්තාහුයි.

ඉක්බිති යම්හෙයකින් අවීත තණ්හා ඇත්තාහුම සසල වෙත්ද, සැලෙත් ද එහෙයින් ඒ තණ්හාව හික්මවීමෙහි සමාදන් කරවමින් 'මමායිතෙ' යන ආදී ගාථාව වදාළහ. එහි, **මමායිතෙ** යනු තණ්හා දෘෂ්ටි මමත්වයෙන් මාගේ යැයි දැඩිව ගත් වස්තු විෂයයෙහි **පසසථ** යනු ශෝකයෙන් පීඩිත වූවන් අමතමින් මෙසේ කීහ. **එතමපි** මේද ආදීනවයි. සෙසු පදයන්ගේ අර්ථය ප්‍රකට වේ මය.

දෙව මමතතා යනු ආලය දෙ ආකාර වේ. **යාවතා** යනු පරිච්ඡේද (පිරිසිඳීම් අර්ථයෙහි) නිපාතයි. **තණහා සංඛාතෙන** යනු තණ්හා පක්‍ෂයෙහි **සංඛා සංඛාතං** යනු සංඛා සංඛාත යන දෙකම අර්ථ වශයෙන් එකකි. තණහා නිදානාහි පපංච සංඛා - තණ්හාව නිදානකොට ඇත්තාහු පපඤ්ච හෙවත් ප්‍රමාද සංඛ්‍යාවට වැටෙති.

ආදියෙහි මෙනි. **සීමාකතං** යනු පිරිසිඳ නොදැක්වීමේ දොසින් තොර වූයේ යි. **මරියාඅකතං** යනු සීමා කරන ලද, 'යොජනපරමං සීමං සමමනෙනය්‍ය' (යොදුනකට නොවැඩි සීමාවක් පණවන්නේ ය.) යනාදියෙහි මෙනි. **ඔධිකතං** යනු කට වචනයෙන් කළ පිරිසිඳීමෙන් ඇතිවිය හැකි දොසින් තොර වූයේ, පිරිසිඳීම් කළ සීමාන්තරික (සීමා දෙකක් අතර සිටුවන ලද රුකක් සේය.)

පරියනත කතං යනු පිරිසිඳීම් කරන ලදුයේ, සීමා අතර පිහිටි ගස දෙපසට ම පොදුය. මෙය එකට බැඳි තල්ගස් පෙළක් මෙන් කරන ලද්දේ නුයි, පරියන්තකත නම් වේ. **පරිගහිතං** යනු කලාතුරෙකින් හෝ පිරිසිඳීම් (සීමා නියමයන් නොහැර සියලු ආකාරයෙන්) පිළිගන්නා ලදුයේ යි, **මමායිතං** යනු ඇලුම් කරන ලදුයේ යි, වස් එළඹි සෙනසුනක් මෙනි. **ඉදං මම** යනු (මෙය මාගේය) සමීපයෙහි සිටියෙකි. **එතං මම** යනු දුර සිටියෙකි. **එතතකං** යනු පරිකබාර නියම කිරීමයි. 'මෙපමණක්ම මගේයැ'යි පැවසීම, එතතකමපි නපපටිභාසෙය්‍ය (මෙපමණකුදු නොපවත්නේය.) ආදියෙහි මෙනි. **එතතාවතා** පිරිසිඳීම් (සීමා කිරීම්) අර්ථයෙහි ද නිපාත නිශ්චය කිරීමයි. 'එතතාවතා බො මහානාම' ආදියෙහි මෙනි. **කෙවලමපි මහාපඨවිං** යනු සියලුම මහා පෘථිවියයි.

අටඨ සතං තණහා විචරිතං යනු එකසිය අටක් තණ්හා ප්‍රභේද විස්තර කර දැක්වීමයි. කෙසේනම් තණ්හාව එකසිය අටක් වේද? රූප

තණ්හා -පෙ- ධම්ම තණ්හා යනුවෙන් මෙසේ චක්ඛුද්වාරාදියෙහි ජවන පීඨියේ පවතින තණ්හාවයි. 'සිටු පුතා', 'බමුණු පුතා' යන ආදියෙහි පියාගෙන් ලද නම මෙන් පියා සමාන අරමුණු සහිත වූ තෘෂ්ණාවයි. මෙහිද රූපාරම්මණ තණ්හාව, රූපය පිළිබඳව ඇතිවන තණ්හාව රූප තණ්හාවයි. එය කාමරාග වශයෙන් රූපය ආශ්වාදනය කරමින් පවතිනුයේ කාම තණ්හාවයි. 'ශාස්වත දෘෂ්ටි සහගත රාග වශයෙන් රූපය නිත්‍යය, ස්ථිරය, ශාස්වතය' යනුවෙන් මෙසේ ආශ්වාදනය කරමින් පවතිනුයේ භව තණ්හාවයි. උච්ඡේද දෘෂ්ටි සහිත වූ රාග ස්වභාවයෙන් රූපය බිඳෙයි. නැසෙයි. 'මතුවට ද නොවන්නේය' යනුවෙන් ආශ්වාදනය කරමින් පවතිනුයේ විභව තණ්හාවයි. මෙසේ රූප තණ්හාව (කාම, භව, විභව යැයි) තුන්වැදෑරුම් වේ. රූප තණ්හාව මෙන්ම සද්ද තණ්හාදී පසද තුන්වැදෑරුම් වීමෙන් (6x3) තණ්හාව දහඅට වැදෑරුම් වේ. එම දහඅට ද අභ්‍යන්තර රූපාදියෙහි අටළොසක් හා බාහිර රූපාදියෙහි අටළොසකැයි බෙදියාමෙන් තණ්හාව සතිස් වැදෑරුම් වේ. මෙසේ අතීත තණ්හා සතිසෙක, අනාගත සතිසෙක, වර්තමාන සතිසෙකැයි තණ්හාව එකසිය අටක් වේ.

අභ්‍යන්තර රූපය දැඩිව ගැනීමෙන් 'වෙමි'යි හෝ 'මෙසේ වෙමි'යි යන සිහිය වේ නුයි මේ ආදී වූ අභ්‍යන්තර රූපාදිය ඇසුරුකොට ඇතිවන තෘෂ්ණා ප්‍රභේද අටළොසෙක, බාහිර රූපය දැඩිව ගැනීමෙන් 'මෙය හේතුකොටගෙන වෙමි'යි හෝ 'මෙය හේතු කොටගෙන මෙසේ වෙමි'යි යන සිහිය වේනුයි 'බාහිර රූපාදිය ඇසුරුකොට ඇතිවන අටළොසෙකැ'යි මෙසේ සතිසෙක් වේ. මේ ආකාරයෙන් අතීත සතිසෙක, අනාගත සතිසෙක, වර්තමාන සතිසෙකැයි තෘෂ්ණා ප්‍රභේද එකසිය අටෙක් වේ. **වීසතිවත්ථුකා සක්කාය දිට්ඨි** යනු රූපාදී පංචස්කන්ධයන් අතුරෙන් එකක් එකක් කෙරෙහි රූපය ආත්ම වශයෙන් දකියි යන ආදී නයින් සිවු ආකාරව ගැනීම් වශයෙන් පවතින වස්තු නිමිති කරගෙන උපන්, විද්‍යමාන අර්ථයෙන් වූ සිහිය ස්කන්ධ පංචක සංඛ්‍යාත කය කෙරෙහි වූ දෘෂ්ටියයි. සක්කාය දිට්ඨි නම් වේ. දසවත්ථුකා මිච්ඡාදිට්ඨි යනු 'දුන් දෙයෙහි විපාක නැත. පුදන ලද්දෙහි විපාක නැත' ආදී වශයෙන් පවතින මිථ්‍යාදෘෂ්ටි යයි. අතථ්‍ය වූ අවදෘෂ්ටිය, වරදවා ගැනීමෙන් විකෘත වූ දෘෂ්ටිය මිච්ඡා දිට්ඨි නම් වේ. අනර්ථය ගෙනදෙන බැවින් පඬිවරුන් විසින් පිළිකුල් කරන ලද දෘෂ්ටිය යන අරුතින් ද මිච්ඡාදිට්ඨි නම් වේ. එය නුනුවනින් පිවිසීම ලක්ෂණ කර ඇත්තේය. (සීලබ්බත) පරාමාසය

කෘත්‍යකොට ඇත්තේය. මිථ්‍යා ප්‍රවේශය වැටහීම් කාරණා කොට ඇත්තේය. ආර්යයන් නොදකිනු කැමතිවීම පදනම්කොට ඇත්තේය. අතිමහත්ම වරදෙකැයි දතයුතුයි.

දසවත්‍ථුකා අනන්තගාහිකා දිට්ඨි යනු ලෝකය ශාස්වතය. ලෝකය අශාස්වතය, ලෝකය අන්ත සහිතය, යන ආදී වශයෙන් පැවති, එක් එක් කොට්ඨාසය පිහිටාධාර කොටගෙන ග්‍රහණ (ගැනීම්) වශයෙන් මෙසේ පවත්නා දෘෂ්ටිය දශවස්තුක අන්තග්‍රාහික දෘෂ්ටියයි. **යා එවරූපා දිට්ඨි** යනු මෙබඳු වූ යම් දෘෂ්ටියක් වේද එයයි. **දිට්ඨිගතං** යනු දෘෂ්ටීන් වෙත නැඹුරු වූයේ යි, මේ දෘෂ්ටිය දෙසැටක් මිසදිටුවලට ඇතුළත් වූ බැවින් දිට්ඨිගත නම් වේ. දෘෂ්ටිය ම ඉක්මවීම අපහසු වෙතැයි යන අර්ථයෙන් ග්‍රහණ නම් වූයේ **දිට්ඨි ගහනං** දෘෂ්ඨි ගහන නම් වේ. තෘණ ගහණ, වන ගහණ, පර්වත ගහණ ආදිය මෙනි. සැක සහිතය. බිය සහිතය යන අර්ථයෙන් **දිට්ඨි කන්තාරං** දිට්ඨි කන්තාර නම් වේ. චෝර කාන්තාර, ව්‍යාල (වල් මෘගයන් ගැවසෙන) කාන්තාර, නිරුදක කාන්තාර, දුර්භික්ෂ කාන්තාරාදිය මෙනි. සම්මා දිට්ඨිය විනිවිදලීමේ අර්ථයෙන් ද විලෝමන (වැලැක්වීමේ) අර්ථයෙන් ද **දිට්ඨි විසූකායිකං** දිට්ඨි විසූකායික නම් වේ. මිථ්‍යා දර්ශන වනාහි උපදිනුයේ සම්‍යග් දර්ශනය විනිවිදලන්නේද විලෝම කරන්නේ ද වේ.

කිසිකලෙක ශාස්වතය ද කිසිකලෙක උච්ඡේදය ද ගැනීමෙන් දෘෂ්ටියෙන් විරූපව (විකෘත වූ) සසල වෙති'යි **දිට්ඨි විප්ඵන්දිතං** දිට්ඨි විප්ඵන්දිත නම් වේ. දෘෂ්ටිගතිකයා වනාහි එක් මතයක පිහිටීමට නොහැක්කේ වේ. කිසිවිටෙක ශාස්වතය ද තවත් විටෙක උච්ඡේදය ද අනුව පවතියි. දෘෂ්ඨියෙන් ම බැඳීමේ අර්ථයෙන් සංයෝජන වූයේ **දිට්ඨි සංයොජනං** දිට්ඨි සංයෝජන නම් වේ. කිඹුල් ආදීන් පුරුෂයකු ඩැහැගන්නා සේ අරමුණු දැඩිව ගනිතියි යන අරුතින් ගාහො 'ගාහ' නම් වේ. පිහිටුවීමේ අරුතින් **පතිට්ඨාහො** පතිට්ඨා නම් වේ. මේ මිථ්‍යා දෘෂ්ටිය බලවත්ව පැවැත්වීමෙන් පිහිටුවා ගනියි. නිත්‍ය ආදී වශයෙන් ඇදගීමට පිවිසෙති. **අභිනිවෙසො** අභිනිවේස නම්. ධර්ම ස්වභාවය ඉක්මවා නිත්‍ය ආදී වශයෙන් දැඩිව ගනිති'යි (ස්පර්ශ කරති'යි) **පරාමාසො** පරාමාස නම් වේ.

අර්ථය ගෙන දෙන නින්දිත මාර්ග යැයි නැතහොත් නින්දිත වූ අපායට යන මගයැයි **කුම්මගෙහා කුම්මග්ග** නම් වේ. යෝග්‍ය නොවන අවපථ (වැරදි මාර්ගය) වූ හෙයින් **මිච්ඡාපථ** නම් වේනුයි **මිච්ඡාපථො**, යම්සේ දිසාමූඪයකු (මංමුළා වූවකු) විසින් 'මෙය අසුවල් ගමට යන මාර්ගය'යැයි ගන්නා ලද මුත්, එම ගමට නොපැමිණේ ද එසේම දෘෂ්ටිගතිකයා විසින් සුගතිගාමී මග යැයි ගන්නා ලද දෘෂ්ටිය ඔහු සුගතියට නොපමුණුවන්නේනුයි, අයථා අවපථයක් වන හෙයින් එය මිථ්‍යා පථයකි. ස්වභාව සහිත වූ හෙයින් **මිච්ඡත්තං** මිච්ඡත්ත නම් වේ. එහිම පරිභ්‍රමණය වන හෙයින් බාලයෝ මෙහි තරණය කරති'යි **තිත්ථං** තීර්ථ නම් වේ. තීර්ථ වූයේ ද එම අනර්ථයට ආයතන වූයේ ද **තිත්ථායතනං** තීර්ථායතන නමි. තීර්ථකයන්ගේ නිජබිමැයි යන අරුතින් ද 'නිවාස'යැයි යන අරුතින් ද 'නිවාස වූ' අර්ථයෙන් ද ආයතන නම් වූයේයි තීර්ථායතන නම් වේ.

විපරීත ඒෂණ (සෙවීම්) වූ ගැනීම හෝ විපරීත සෙවීම් වශයෙන් ගැනීම **විපරියෙසගාහො** විපරියෙසගාහ නම් වේ. **අසභාවගාහො** යනු විපරීත වූ ග්‍රහණයයි. අනිත්‍යයෙහි නිත්‍යයැයි ආදී නයින් පැවතීම් වශයෙන් පටලවා ගැනීම **විපල්ලාසො ගාහො** 'විපල්ලාස ගාහ' නම් වේ. උපාය රහිත ග්‍රහණය මිථ්‍යා ග්‍රහණයයි. ස්වභාව නොවූ අතථ්‍ය විෂයෙහි තථ්‍ය ස්වභාවය යැයි ගැනීම ද තථ්‍ය විෂයයෙහි අතථ්‍ය යැයි ගැනීම ද මිථ්‍යාග්‍රාහ වේ.

යාවතා යනු යම්තාක්, **දවාසටඨි දිටඨිගතානි** යනු බ්‍රහ්මජාල සූත්‍රයෙහි දැක්වුණු ද්වාෂෂ්ටි දෘෂ්ටීහු ය. **අවෙජ්ද සංකිනොපි එඳනති** යනු පැහැර, මැඬලා බලාත්කාරයෙන් ගනිතියි උපත් සැකයෙන් ද සසල වෙති. **අවඡිඳනෙතපි** යනු මෙහි කී පරිදි පැහැරගන්නා කල්හි ද **විපරිණාම සංකිනොපි** යනු විපර්‍යාස වශයෙන් අන්‍ය ස්වභාවයට යෙති'යි සැක කරමින් ද සැළෙනුයේ **විපරිණාමනෙතපි** යනු විපරිණාමයට පැමිණෙන කල්හි ද **විපරිණතෙ පි** යනු විපරිණාමයට පත් වූ කල්හි ද **එඳනති** යනු සසල වෙති. **සංඑඳනති** යනු සර්වප්‍රකාරයෙන් ම සසල වෙති. **විපඑඳනති** විවිධාකාරව සසල වෙති. **වෙධති** යනු බිය දැක කම්පා වෙති. **පවෙධති** තැති ගැනීම් බියෙන් විශේෂයෙන් කම්පා වෙති. **සමපවෙධෙති** යනු ලොමුඩැහැ ගැනීම් බියෙන් සර්වප්‍රකාරයෙන් ම කම්පා වෙති.

එසමානෙ යනු දුතියා විභක්ති බහුවචනයි. **අපොදකෙ** යනු මද දියෙහි **පරිතොදකෙ** යනු කැළඹුණු දියෙහි **උදක පරියාදානෙ** යනු **ක්ෂීණ** වූ, **ක්ෂය** වූ දියෙහි **බලාකාහි වා** යනු කියන ලද අවශේෂ පක්ෂි ජාතීන් විසින් හෝ **පරිපාතියමානා** යනු වෙහෙසනු ලබන්නාහු, පෙළනු ලබන්නාහු **උකඛිපියමානා** යනු මඩ අතරින් අදිනු ලබන්නාහු, ගිලිනු ලබන්නාහු, **බජ්ඣමානා** යනු කනු ලබන්නාහු, කවුඩන් විසින් (ගනු ලබන කල්හි) **එඤ්ඤති** වෙවුලති. උකුසන් විසින් (ගනු ලබන කල්හි) **සම්ඵන්දති** බෙහෙවින් සැලෙති. කොකුන් විසින් (ගනු ලබන කල්හි) **විපඵන්දති** විශේෂයෙන් සසල වෙති. තුඩුවලින් ගන්නා ලද කල්හි මරණ බියෙන් **වෙධති** වෙවුලති. තුඩුවලින් විදිනු ලබන කල්හි **පවෙධති** බෙහෙවින් වෙවුලති. මැරෙන කල අතිශයින්ම සැලෙති. -පෙ-

පසඤ්ඤා යනු අගුණ, ආදීනව දැක, **තුලයිත්වා** ආනිසංස හා ආදීනව තුලනය කර, **තීරයිත්වා** යනු ආනිසංස හා ආදීනව විස්තර විමසා **විභාවයිත්වා** යනු වස්තු හීනතා දෝෂයෙන් මුදවා, ඉවත්කොට, **විභූතං කත්වා** යනු පැහැදිලිව නිගමනයකොට, සම්මතියක් බවට පත්කොට, නැතහොත් සංකීර්ණ (නො පැහැදිලි) දෝෂයෙන් මුදවා, වස්තු විභාග කිරීම් වශයෙන් දැක, නොපිරිසිදීම් දොසින් මුදවා ප්‍රමාණ කිරීම් වශයෙන් තුලනය කර, වස්තු දෝෂයෙන් මුදවා විග්‍රහ කිරීම් වශයෙන් තීරණය කර, මුලාවීම් දෝෂයන් හරවා අග්‍ර දෙය අගය විභාග කිරීම් වශයෙන් විභාවනය කර (සලකා බලා) ගැටලු දොස් හරවා, ස්වභාවය විග්‍රහ කිරීම් වශයෙන් ප්‍රකට කර, **පහාය** යනු අත්හැර **පටිනිස්සජ්ජිත්වා** යනු දුරුකර, **අමමායනෙතා** යනු තෘෂ්ණා දෘෂ්ටීන් හේතුකොට ඇලුම් නොකරනුයේ, **අගණ්හනෙතා** යනු දෘෂ්ටියෙන් පූර්වභාගයෙහි ප්‍රඥාවෙන් නොගනුයේ, **අපරාමසනෙතා** යනු විතර්කයෙන් කල්පනා නොකරනුයේ **අනභිනි විසනෙතා** යනු නියාමයෙන් බැසගත් දෘෂ්ටි වශයෙන් නො පිවිසෙනුයේ, **අකුබ්බනෙතා** යනු පරිග්‍රාහ තණ්හා වශයෙන් ඇලුම් නොකරනුයේ, **අජනයමානො** යනු පුනර්භව තණ්හා වශයෙන් නූපදවනුයේ **අසඤ්ජයමානො** යනු වෙසෙසින් ම නූපදවනුයේ **අනිබ්බත්තයමානො** යනු වස්තූන් පිළිබඳ තණ්හා වශයෙන් නූපදවනුයේ, **අනුඅභිනිබ්බත්තයමානො** යනු සර්වප්‍රකාරයෙන් ම නූපදවනුයේ, මේ වචනවල උපසර්ග යෙදීමෙන් අර්ථය වැඩිකරන ලදී. මෙසේ මෙහි පළමු ගාථාවෙන් ආශ්වාදය ද ඉන් අනතුරුව දැක්වූ ගාථා සතරින් ආදීනවයද දක්වා, ඉක්බිති උපාය සහිත නිස්සරණය ද (නික්මීම) නිස්සරණයෙන් මතු නිස්සරණානිසංසය ද

දක්වනු පිණිස, නැතහොත් මේ ගාථා සියල්ලෙන්ම කාමයන්ගේ ආදීනවය ද ළාමක බව හා කිලිටි බව ද දක්වා, ඉක්බිති නෙක්ඛම්මයෙහි ආනිසංසය දක්වනු පිණිස **උභොසු අනෙතසු** යන ආදී ගාථාද්වයය කීහු. එහි **උභොසු අනෙතසු** යනු එස්ස - එස්ස සමුදයාදිය දෙකක් දෙකක් බැගින් වෙන් කිරීමෙහි **විනය්‍ය ඡන්දං** යනු ඡන්දරාගය දුරුකර, **එසසං පරිඤ්ඤාය** යනු චක්ෂු සම්ඵස්සාදී ස්පර්ශය, නොහොත් ස්පර්ශානුසාරයෙන් එය හා සම්ප්‍රයුක්ත (යෙදුණු) වූ සියලු අරූප ධර්මයන් ද, එහි වස්තු ආරම්මණ වශයෙන් රූප ධර්මයන් ද යන සියලු ම නාමරූප ධර්මයන් ත්‍රිවිධ පරිඥාවන්ගෙන් මනාව දැන,

අනනුගිදෙධා යනු රූපාදී සියලු ධර්මයන්හි ගිජු නොවූයේ **යදත්තගරහි තද කුපපමානො** යනු යම් ක්‍රියාවක් තමාට ම ගර්හාවක් වේද (ආත්ම ගෞරවයට හානිකර වේද) එබඳු දෙයක් නොකරනුයේ, **නලිප්පති දිටඨීසු තෙසු ධීරො** මෙබඳු ස්වරූප ඇති ධෛර්ය සම්පන්න ධීරයා දුටු, ඇසූ ධර්මයන් කෙරෙහි (තණ්හාලේප, දිට්ඨිලේප යන) දෙකින් එක් ලේපයකින් (කිලුටෙකින්) හෝ නො වැකුණේ වේ. අහස මෙන් නොවැකුණේ පිරිසිදු බවට පැමිණියේ වේ. **එසෙසා එකො අනෙතා** යනු ස්පර්ශය එක් සීමාවෙකි. ස්පර්ශ කරනු ලැබේනුයි එස්ස නමි. ඒ මේ ස්පර්ශය, ස්පර්ශ කිරීම ලක්ෂණකොට ඇත්තේය. ගැටීම කෘත්‍ය කර ඇත. සන්නිපාතය (එක්වීම) වැටහීම් කොට ඇත්තේය. යොමු වූ විෂයය පදනම් කොට ඇත්තේය. මෙය අරූප ධර්මයක් වූයේම අරමුණු ස්පර්ශ කිරීම් ආකාරයෙන්ම පවතින්නේ නුයි ස්පර්ශය ලක්ෂණ කොට ඇත්තේය. තැනෙකින් හෝ නො ඇලෙනුයේ නමුදු ඇස රූපය මෙන් ද කණ ශබ්දය මෙන් ද 'වස්තුව හා අරමුණු ගැටෙති'යි ගැටීම කෘත්‍යකොට ඇත්තේය. වස්තු අරමුණු යන දෙකෙහි ගැටීමෙන් උපන් බැවින් හෝ සම්ප්‍රාප්ති අර්ථ සහිත රස (කෘත්‍ය) වශයෙන් ගැටීම රසය (කෘත්‍ය) කොට ඇත්තේ යයි දතයුතුයි.

අටුවායෙහි මෙය කියන ලදමැයි, 'කාම, රූප, අරූප, ලෝකෝත්තර යන චතුර්භූමික ස්පර්ශය ස්පර්ශන ලක්ෂණ නැත්තේ නම් නොවේ. සංඝට්ටන රසය (කෘත්‍ය) වනාහි පංචද්වාරික ම වේ. පංචද්වාරික ගැටීමට වනාහි ඵුසන ලක්ඛණය, සංඝට්ටන රසය යන නම් වේ. මනෝද්වාරික ගැටීමට 'ඵුසන ලක්ඛණ'ය යන නම යෙදේ. 'සංඝට්ටන රස' යන නම නොයෙදේ.' යනුවෙන් මෙසේ ද කියා මෙම සූත්‍රය ද කීහ.

'යම්සේ මහරජ, බැටළුවන් දෙදෙනෙක් පොර වදින්නාහු ද, එක් බැටළුවෙක් ඇස මෙනැයි දැකිය යුත්තේ ය. අනෙකා රූපය මෙනැ'යි දැකිය යුත්තේය. ඔවුන්ගේ එක්වීම ස්පර්ශය මෙනැ'යි දැකිය යුත්තේය. මෙසේ ස්පර්ශය, ස්පර්ශන ලක්ෂණ ඇත්තේ ද, සංඝට්ටන (ගැටීම්) කෘත්‍ය ඇත්තේ ද වේ. තවද, මහරජ, යම්සේ කයිතාලම් දෙකක් වාදනය කරනු ලබන්නේ ද, එසේම අතුල් දෙකක් ද වාදනය කරනු ලබන්නේ ද (තාලය ගැනීමට අත්ලෙන් අත්ල ගසනු ලබන්නේ ද) එවිට, එක් අත්ලක් ඇස මෙනැ'යි දැකිය යුත්තේ ය. අනෙක රූපය මෙනැ'යි දැකිය යුත්තේය. අතුල් දෙක එක්වීම ස්පර්ශය මෙනැ'යි ද දැකිය යුත්තේ ය. මෙසේ ස්පර්ශය ස්පර්ශන ලක්ෂණ ඇත්තේ ද, සංඝට්ටන කෘත්‍ය ඇත්තේ ද වේ.' යනුවෙන් විස්තර වේ.

යම්සේ 'චක්ඛුනා රූපං දිසවා' ආදියෙහි චක්ඛු විඤ්ඤාණාදිය චක්ඛු ආදී නාමයෙන් ම කියන ලද ද, මෙසේ මෙහි ද ඒ චක්ඛු විඤ්ඤාණාදිය චක්ඛු නාමයෙන් කියන ලදැ'යි දතයුතුයි. එහෙයින් එවං චකඛු දට්ඨබබං යන ආදියෙහි එවං චකඛු විඤඤාණං දට්ඨබබං (මෙසේ චක්ඛු විඤ්ඤාණය දතයුතුයි.) යන මේ නයින් අර්ථය දතයුතුයි. මෙසේ ඇතිකල්හි, චිත්ත හා ආරම්මණ යන දෙකෙහි ගැටීමෙන් මේ සූත්‍රයෙහිද කෘත්‍යාර්ථවත් වූම රස ශබ්දයෙන් 'සඝටටන රසෝ' යනු සිද්ධ වේ. (වත්‍ථු, ආරම්මණ, විඤ්ඤාණ යන) ත්‍රිකයෙහි එක්වීමෙන් වූ සමූහය තමාගේ පැවැත්මට හේතුකාරණා වීම් වශයෙන් දක්වන ලද බැවින්, මෙම සන්නිපාතය (ස්පර්ශයෙහි) වැටහීම (ඵලය) වන්නේය. මෙය වනාහි, සූත්‍රයෙහි 'තිණ්ණං සංගති එසෙසා' යනුවෙන් කාරණා යෝග වශයෙන් දක්වන ලද බැවින්, එම ආකාරයෙන්ම එළඹ සිටින්නේ ද වෙති'යි 'සන්නිපාත පච්චුපට්ඨානං'ති (සන්නිපාතය වැටහීම් කාරණයකොට ඇත්තේ යැයි) කියන ලදී.

ඵලාර්ථයෙහි වූ 'පච්චුපට්ඨාන' ශබ්දයෙන් ද 'වේදනා පච්චුපට්ඨාන (වේදනාව එළඹ සිටි ඵලය කොට ඇත්තේ) නම් වේ. එම (ත්‍රිකයෙහි) ඵලය වූ වේදනාව එළවති'යි, දනවති'යි යන අර්ථයි. උපදවනුයේ ද යම්සේ බාහිර වූ උණුසුම ප්‍රත්‍යයකොට ඇත්තා වූම ලාක්ෂා (ලහ) යැයි කියනු ලබන ධාතු විශේෂය ඇසුරු කළ උණුසුම, තමා ඇසුරෙහි වූ (ලහ කඩෙහි) මොළොක් බව ඇති කරන්නේ වේ. (එහෙත්) තමාට ප්‍රත්‍යය වූයේ නමුදු, ගිනිසිළු හා අඟුරු පහවී (නිවී) උණුසුම නැති වූ කල එසේ

නොවේ. මෙලෙසින් ම වස්තු - ආරම්මණ සංඛ්‍යාත වූ අනෙකක් ප්‍රත්‍යය කොට ඇත්තා වූම (වේදනාව), සිත ඇසුරෙහි ම වූ හෙයින්, තමාට නිශ්‍රය වූ සිත ම මේ වේදනා - උප්පාදක (වේදනාව උපදවන්නා) වේ. (එහෙත්) තමාට ප්‍රත්‍යය වූ නමුදු (හුදෙක්) හා ආරම්මණ කෙරෙහි (උපදිනුයේ) නොවේයැ'යි දතයුතුය. එයට (අදාළ විෂයයට) අනුරූප වූ පරිදි යොමුකරන ලද ඉන්ද්‍රියය විසින් පිළියෙළ කරන ලද විෂයයෙහි බාධා රහිතව උපදවන ලද හෙයින් මේ (ස්පර්ශය) 'ආපාථගත විසය පදට්ඨාන' (යොමුවට පැමිණි විෂයය පදට්ඨාන පදනම්කොට ඇත්තේය)යි කියනු ලැබේ. ස්පර්ශය යමෙකින් හටගනියි ද, උපදියි ද, එය 'එස්ස සමුදය' යි කියනු ලැබේ. කියන ලදැමයි. 'සළායතන පච්චයා ඵස්සෝ' (ෂඩායතනයෙන් ප්‍රත්‍යය කොටගෙන ස්පර්ශය උපදියි.) යනුවෙනි. අතිගරුක වූ (සුඛ-දුක්ඛ) වේදනා දුකය (ද්විකය) කාල වශයෙන් කියන ලදී. උපේක්ෂාව වනාහි ශාන්ත වූ හෙයින් සුඛම වෙතැ'යි කියන ලද හෙයින් උපේක්ෂා වේදනාව සුඛ වශයෙන් ගෙන සුඛ-දුඃඛ වශයෙන් ද, නාම-රූප දුක (ද්වික) ය, රූප අරූප වශයෙන් ද, ආයතන දුකය. සසර පැවැත්ම වශයෙන් ද, සක්කාය දුකය පංචස්කන්ධ වශයෙන් ද කියන ලදැයි දතයුතුයි.

එහි සැප ගෙන දෙතියි **සුඛා** සුඛ (වේදනා)යි, 'විඳිනු ලැබෙති'යි **වෙදනා** වේදනායි. **දුක්ඛා** දුක් ගෙන දෙතියි දුඃඛ (වේදනා) යි, නැමීම් ලක්ෂණ ඇත්තේනුයි නාමං නම්. විනාශවීම් ලක්ෂණකොට ඇත්තේ **රූපං** රූපයයි. චක්ෂු ආයතනාදී අභ්‍යන්තර ආයතන සයයි. රූපායතනාදිය බාහිරායතන හයයි. රූපස්කන්ධාදී පංච ස්කන්ධයයි. විද්‍යමානාර්ථයෙන් **සක්කායෝ** සක්කායයි. අවිද්‍යා කර්ම, තණ්හාව, ආහාර, ඵස්ස, නාමරූප යන මොවුහු **සක්කාය සමුදයෝ** සක්කාය සමුදයයි. **චක්ඛු සම්ඵස්සෝ** යන්නෙහි 'චක්ඛතීත චක්ඛු' (දක්නේනුයි චක්ඛු නමි.) රූපය ආශ්වාදනය කරති'යි, විභාවනය කරති'යි, යන අර්ථයි. චක්ෂුයෙන් පවත්නා ස්පර්ශය 'චක්ඛු සම්ඵස්ස' නම් වේ. එය වනාහි තමා හා එක්ව යෙදුණු වේදනාව සමග (සූවිසි ආකාර ප්‍රත්‍යයන් අතුරෙන්) සහජාත, අඤ්ඤමඤ්ඤ, නිස්සය, විපාක, ආහාර, සම්ප්‍රයුක්ත, අත්ථි, අවිගත වශයෙන් අට ආකාරයකින් ප්‍රත්‍යය වේ. අසනුයේ නු'යි **සොතං** සෝත නම්. එය සම්භාර (උපකරණ) සහිත කන්සිදුර ඇතුළත තුනී තඹවන් ලොම් එක්වීමෙන් සෑදුණ මුද්දක ආකාර ඇති පෙදෙසෙහි ශ්‍රෝත විඤ්ඤාණාදියට සුදුසු පරිදි වස්තු ද්වාර භාවය සපයමින් සිටියි. ශ්‍රෝතයෙන් පැවති ස්පර්ශය **සොත සම්ඵස්ස**

නමි. සාණ සම්ඵස්ස ආදියෙහි ද මේ නයයි. ආසාණ කරනුයේ නු'යි **සාණං** සාණ නමි. එය සම්භාර සහිත නාස බිලයෙහි ඇතුළත, එළු පියසටහන් ඇති ප්‍රදේශයෙහි සාණ විඤ්ඤාණාදියට සුදුසු පරිදි වස්තු ද්වාරභාවය සපයමින් සිටියි. ජීවිතය කැඳවානු'යි **ජීවහා** ජීව්හා නමි. රස විඳීමේ අරුතින් හෝ ජීව්හා නමි. එය සම්භාර (උපරකණ) සහිත දිවෙහි අග, මුල හා පැති හැර උපරිම තල මධ්‍යයෙහි බිඳුණු උපුල් පෙත්තක ආකාර ඇති පෙදෙසෙහි ජීව්හා විඤ්ඤාණාදියෙහි යෝග්‍ය පරිදි වස්තු ද්වාර භාවය සපයමින් සිටියි.

පිළිකුල් සහගත වූ ආශ්‍රව සහිත ධර්මයනට නිවාස වූයේනු'යි **කායො** කාය නමි. 'ආය' යනු උත්පත්ති ස්ථානයයි. මේ කයෙහි යම්තාක් තමාගේ යැයි දැඩි ලෙස ගනු ලබන පැවැත්මක් වේද, එහි බොහෝසෙයින් ඒ කාය ප්‍රසාදය කාය විඤ්ඤාණාදීනට සුදුසු පරිදි වස්තු ද්වාරභාවය සපයමින් සිටියි. දන්නේ නුයි 'මන' නම් වේ. **මනො** මන නම් වේ. අවබෝධ කරතියි යන අර්ථයි.

'මනො' යනු, ආවර්ජන සහිත භවාංගයයි. මනසින් පැවති ස්පර්ශය **මනො සම්ඵස්සා** මනෝ සම්ඵස්ස නම් වේ. ස්පර්ශය සවැදෑරුම් වුවත් දෙවැදෑරුම් ව ම සංග්‍රහ වන බව දැක්වීමට **අධිවචන සම්ඵස්සා පටිඝ සම්ඵස්සා** අධිවචන සම්ඵස්සය පටිඝ සම්ඵස්ස යැයි කියන ලදී. මනෝද්වාරිකව සිදුවන ස්පර්ශය අධිවචන සම්ඵස්ස නමි. පංචද්වාරික වූ වස්තු ආරම්මණාදීන්ගේ ගැටීමෙන් උපදින බැවින් පටිඝ සම්ඵස්ස නම් වේ. සුඛ වේදනා සහිත අරමුණ කෙරෙහි ඇතිවනුයේ සුඛවේදනීය ස්පර්ශයයි. දුක්ඛ වේදනා සහිත අරමුණෙහි ඇතිවනුයේ දුක්ඛ වේදනීය ස්පර්ශයයි. අදුක්ඛම සුඛ වේදනා සහිත අරමුණෙහි ඇතිවනුයේ අදුක්ඛමසුඛවේදනීය ස්පර්ශයයි. එහි සැප ගෙනදෙනුයේ **සුඛං** සුඛයයි. එය යමකු කෙරෙහි ඇතිවේ ද, ඔහු සුවපත් කරති'යි යන අර්ථයි. සුඛ නම් වේ. කාය චිත්ත ආබාධයන් කා දමති'යි, මනාසේ සාරා දමති'යි හෝ යන අරුතින් ද සුඛ නම් වේ. දුකට පමුණුවනු'යි **දුක්ඛං** දුක්ඛයි. එය යමකු තුල උපදී ද, ඔහු දුකට පත්කරති'යි යන අර්ථයි. දුක් ද නොව සැප ද නොවූයේ **අදුක්ඛමසුඛං** නම් වේ. 'ම' යන්න පද සන්ධි පිණිස කියන ලදී. එහි **කුසලො** යනු එක් විසි කුසල් සිත්වලින් යුක්ත වූයේයි, **අකුසලො** යනු දොළොස් අකුසල් සිත්වලින් යුක්ත වූයේ **අව්‍යාකතො**

යනු ඉතිරි විපාක, කිරිය යන අව්‍යාකත චිත්තයන්ගෙන් යුක්ත වූයේ, පුනර්භව ප්‍රභේද වශයෙන් දක්වනුයේ **කාමාවචරෝ** යන ආදිය කීහු.

පනස් හතරක් (54) වූ කාමාවචර සිත්වලින් යුක්ත වූයේ, **කාමාවචරෝ** කාමාවචර නමි. කාමය හැරදමා රූපයෙහි හැසිරෙනුයේනු'යි **රූපාවචරෝ** රූපාවචර නමි. කුසල අව්‍යාකත වශයෙන් පසළොස් රූපාවචර සිත්වලින් යුක්ත වූයේයි, කාමය ද රූපය ද අත්හැර අරූපයෙහි හැසිරෙනුයේ නු'යි **අරූපාවචරෝ** අරූපාවචර නමි. කුසල, අව්‍යාකත වශයෙන් දොළොස් අරූපාවචර සිත්වලින් යුක්ත වූයේනු'යි අරූපාවචර නමි. ඉක්බිති නැඹුරුවීම් වශයෙන් දක්වමින් **සුඤ්ඤතෝ** යන ආදිය කීහු. එහි **සුඤ්ඤතෝ** යනු රාග දෝස මෝහයන්ගෙන් ශූන්‍ය වූ බැවින් ශූන්‍යතා නම් වේ. රාග, ද්වේෂ, මෝහ යන නිමිතිවලින් මිදුණු බැවින්, ඒ නිමිති රහිත බැවින් **අනිමිත්තෝ** නම් වේ. රාග, ද්වේෂ, මෝහ යන ප්‍රණිධීන්ගේ (පැතුම්වල) අභාවයෙන්, **අප්පණිහිතෝ** අප්පනිහිත යැයි කියනු ලැබේ. ඉක්බිති සසර වටට ඇතුළත් වීම හා ඇතුළත් නොවීම් වශයෙන් දක්වනු සඳහා 'ලොකියෝ' යනාදිය කීහු.

කැඩීම් බිඳීම් අරුතින් සංසාර වර්තය 'ලෝක' යැයි කියනු ලැබේ. එහි ඇතුලත් වූ බැවින්, ලෝකයෙහි නියුක්ත වූයේයි යන අර්ථයෙන් **ලොකියෝ** ලෝකිය නම් වේ. උත්තීර්ණ වූයේනුයි උත්තර නම් වේ. ලෝකයට ඇතුලත් නොවූ බැවින් ලෝකයෙන් එතරවූයේ යන අර්ථයෙන් **ලොකුත්තරෝ** ලෝකුත්තර නම් වේ. **ඵුසනා** යනු ස්පර්ශ කිරීම් ආකාරයයි. **සමඵුසනා සමඵුසිතත්තං** යි යනුවෙන් උපසර්ග යොදා එහි අර්ථය දියුණු කරන ලදී. **එව ඤාතං කත්වා** යනු මෙසේ ප්‍රකට බවට පත්කොට,

ජානනෙනා තීරෙති යනු ඉදින් මතු කිවයුතු ආකාරයෙන් සිතතොත්, අනිත්‍ය ආකාර වූ අවසානයක් ඇති හෙයින් ද ආරම්භයක් හා අවසානයක් ඇති හෙයින් ද **අනිච්චතෝ** අනිත්‍ය වශයෙන් තීරණය කරයි. ඉපදීමේ හේතුවෙන් නැවත නැවත පෙළනු ලබන හෙයින් ද දුකට වස්තුවන හෙයින් බැවින් **දුක්ඛතෝ** දුක් වශයෙන් තීරණය කරයි. ප්‍රත්‍යයන් (ගිලාන ප්‍රත්‍යය)ගෙන් යැපිය යුතු වන හෙයින් ද, රෝගයන්ට මුල්වන හෙයින් ද **රොගතෝ** රෝග වශයෙන් (තීරණය කරයි) සූලයනට (රුජාවනට) යෝග්‍ය වූ හෙයින් දුක් වශයෙන් ද, කෙලෙස් අසූචි (සැරව) වගුරුවන හෙයින් හා

උත්පාද (ඉපැදීම) ජරා, භංග (මරණ)යන්ගෙන් ඉදිමී, පැසවා, බිඳී යන හෙයින් **ගණ්ඩතො** ගඩක් (ගෙඩියක්) වශයෙන් ද (තීරණය කරයි) පීඩා ජනක වන බැවින් ද ඇතුළත පාරවන බැවින් හා ඉවත් කිරීමට අපහසු බැවින් **සල්ලතො** හුලක් වශයෙන් ද (තීරණය කරයි.) විෂ පතුරුවන බැවින් ද පරිහානිය ලඟා කරන බැවින් ද දුකට වස්තුවන බැවින් ද **අඝතො** විපතක් වශයෙන් ද පරාධීන බව ඇතිකරන හෙයින් ද ආබාධයනට පදනම වන බැවින් ද **ආබාධතො** ආබාධ වශයෙන් ද වසඟ කළ නොහැකි බැවින් ද වෙනස්වන ස්වරූප ඇති බැවින් ද **පරතො** තමා සතු නොවීම් වශයෙන් ද (තීරණය කරයි.) ව්‍යාධි ජරා මරණයන්ගෙන් සිදී බිඳී යන බැවින් **පලොකතො** නැසෙනසුලු වූවක් වශයෙන් ද නොයෙක් ව්‍යසන එළවන ගෙනදෙන හෙයින් **ඊතිතො** උපද්‍රවයක් වශයෙන් ද (තීරණය කරයි.)

අවිපරීත නොවරදිනසුලු වූ, මහත් වූ අනර්ථයන් එළවන හෙයින්ද සියලු උවදුරුවලට වස්තුවන හෙයින් ද **උපද්දවතො** උපද්‍රව වශයෙන්ද සියලු භයට ආකරයක් වූ බැවින් ද 'දුක්ඛවූපසම' යැයි කියනු ලබන පරම (උතුම් ම) අස්වැසිල්ලට ප්‍රතිවිරුද්ධ වූ බැවින් ද **භයතො** භය වශයෙන් ද නොයෙක් අනර්ථයන් විසින් ලුහුබඳනා ලද බැවින් ද, දොස් නැමති හුල් ඇවිණී ඇති බැවින් ද උපසර්ගයක් (උපද්‍රවයක්) මෙන් ඉවසිය හැකිවන හෙයින් ද **උපසගතො** උපද්‍රවයක් වශයෙන් ද ව්‍යාධි ජරා මරණයන්ගෙන් මෙන් ම ලාභාදී අෂ්ටලෝක ධර්මයන්ගෙන් ද සැලෙන හෙයින් **චලතො**. චල වශයෙන් ද කෘත්‍ය සහිත උපක්‍රමයෙන් බිඳීමට පමුණුවනසුලු බැවින් **පභංගුතො** පභංගු (බිඳෙනසුලු) වශයෙන් ද (තීරණය කරයි.)

සියලු අවස්ථාවන්හිදී ම විනාශ වන බැවින් ද කල් පැවතීම තිර නොවන හෙයින් ද **අද්ධුවතො** අස්ථීර වශයෙන් ද රැකවරණ සහිත හෙයින් ද ක්ෂේම ස්වභාවයක් ආරක්ෂාවක් නොලැබිය හැකි හෙයින් ද **අතානතො** අනාරක්ෂිත වශයෙන් ද (ආරක්ෂා සඳහා) සැඟවීමට නොසුදුසු වන රැකවරණ සැලසීමක් නොකළ හැකි බැවින් ද, **අලෙනතො** සැඟවුණාවුන්ට ද රක්ෂස්ථාන නොවීම් වශයෙන් ද ආශ්‍රිතයන්ට භයට සරණ (පිහිට) වන බවක් නැති හෙයින්, **අසරණතො** අසරණ (සරණ නොවීම්) වශයෙන් ද පරිකල්පනය කළ පරිදි ස්ථිර, සුභ, සුඛ ස්වභාවයෙන් හිස් වූ හෙයින් **රිත්තතො** රික්තයක් වශයෙන් රික්ත වූ බැවින් ම **තුච්ඡතො**

තුච්ඡ වශයෙන් ද අල්ප (මද) බව හෝ අල්ප වූ දෙයක් ලෝකයෙහි තුච්ඡයැයි කියනු ලැබේ. ස්වාමියකු, නේවාසිකයකු, වේදකයකු (දන්වන්නකු) කාරකයකු (කළමනා කරන්නකු) අධිෂ්ඨායකයකු (කාර්ය විධායකයකු) නොමැති හෙයින් **සුඤ්ඤතො** ශූන්‍ය වශයෙන් ද (තීරණය කරයි.)

තමා ද (තමාට ම) මේ අස්වාමික වීම් ආදියෙන්) **අනත්තතො** අනාත්ම වශයෙන් (තීරණය කරයි.) පැවැත්ම දුකක් වන හෙයින් ද, දුක ද ආදීනවයක් වන හෙයින් ද **ආදීනවතො** ආදීනව වශයෙන් (තීරණය කරයි.) නැතහොත් දිළිඳු බව පැමිණෙති'යි පවතිති'යි යන අරුතින් ආදීනවො ආදීනව නමි. දිළිඳු මිනිසාට මේ අභිධානයෙකි. ස්කන්ධයන් ද දිළින්දන් මෙන් ආදීනව හා සමානවන බැවින් ආදීනවතො, ආදීනව වශයෙන් (තීරණය කරයි.) ජරාවෙන් ද මරණයෙන් ද යන දෙපරිද්දෙන්ම වෙනස්වන ස්වභාව ඇති හෙයින් **විපරිණාම ධම්මතො** විපරිණාම ධර්ම වශයෙන් (තීරණය කරයි.) දුබල බැවින් බොරුහර (එළය) මෙන් සුබ නැමති හරය නොදැනවිය හැකි හෙයින් ද **අසාරකතො** අසාර වශයෙන් (තීරණය කරයි.) දුකට හේතුවන බැවින් **අසමූලතො** අසමූල වශයෙන් චිත්තමුඛ (මිහිරි වදන් ඇති) සතුරකු මෙන් විශ්වාසය නසන හෙයින්, **වධකතො** වධකයකු වශයෙන් දිවි තොර කරන හෙයින් ද අභාවය ඇතිකරන බැවින් ද **විභවතො** විභව වශයෙන් ද ආශ්‍රවයනට පදනම වන බැවින් **සාසවතො** සාශ්‍රව වශයෙන් හේතු ප්‍රත්‍යයෙන් හටගන්වන ලද බැවින් **සංඛතතො** සංඛත වශයෙන් මෘත්‍යුමාර කෙලෙස් මාරයනට ගොදුරුවන බැවින් **මාරාමිසතො** මාරාමිස වශයෙන් ද (තීරණය කරයි.)

ජාති, ජරා, ව්‍යාධි, මරණ ස්වභාව කොට ඇති බැවින් **ජාති ජරා ව්‍යාධි මරණධම්මතො** ජාති ජරා ව්‍යාධි මරණ ස්වභාව වශයෙන්, ශෝක පරිදේව උපායාසයන්ට හේතුවන බැවින් **සොක පරිදෙව උපායාස ධම්මතො** ශෝක පරිදේව උපායාස ස්වභාව වශයෙන් තණ්හා, දෘෂ්ටි, දුශ්චරිත සංකිලේසයනට විෂය ස්වභාව ඇති බැවින්, **සංකිලෙසික ධම්මතො** සංක්ලේශ ස්වභාව (වශයෙන්) ද අවිද්‍යා, කර්ම, තණ්හා, සළායතන වශයෙන් උපදින හෙයින් **සමුදයතො** සමුදය වශයෙන් ද ඔවුන්ගේ අභාවයෙන් **අත්ථංගමතො** අස්තංගම වශයෙන් ද ස්පර්ශයෙහි ඡන්දරාග වශයෙන් මිහිරි වූ ආශ්වාදයෙන් **අසසාදකො** ආශ්වාද වශයෙන් ද,

ස්පර්ශයේ විපරිණාම (වෙනස්වීමේ) ස්වභාවයෙන් **ආදීනවතො** ආදීනව වශයෙන් ද ආශ්වාද ආදීනව දෙකින්ම නික්මීම් වශයෙන් **නිසසරණතො** යනු නිස්සරණ වශයෙන් ද **තීරෙති** යනු තීරණය කරයි යනුවෙන්, මේ සියලුම තන්හි ඉතිරි (සම්පූර්ණ කළ යුතු) පාඨයයි.

පජහති යනු ස්ව සන්තානයෙන් බැහැර කරයි. **විනොදෙති** යනු දැඳුරු කරයි. (පහ කරයි.) **බ්‍යනතීකරොති** අවසන් කරයි. **අනභාවංගමෙති** යනු ක්‍රමයෙන් අභාවයට පමුණුවයි. යම්සේ වනාහි තල්ගසෙක් මුල උදුරා, එය පිහිටා තිබූ එම බිම් පෙදෙස පමණක් ඉතිරි කළ කල්හි, නැමැත එම තල්ගසෙහි හටගැනීමක් සිදු නොවේද, මෙසේ ආර්ය මාර්ග නැමති ක්‍ෂත්‍රයෙන් (සැතින්) රූපාදී (ස්කන්ධ) කෘත්‍යයන් උදුරා එම රූපාදීන් පෙර උපන් විරූ බැවින් වස්තු මාත්‍රයක් බවට පත්කරන ලද කල්හි, ඒ සියල්ල **තාලවත්ථුකතා** (තාල වස්තු බවට පත්කරන ලදැ'යි) කියනු ලැබේ.

යසසසො යනු යම් පුද්ගලයෙකුගේ මේ ගිජු බව, **සමුචඡිනෙනා** යනු මනාව සිඳිනා ලද්දේ ද, **වූපසනෙනා** යනු ආර්ය ඵලයෙන් සන්සිඳුවන ලද්දේ ද **පටිපසසඳෙධා** යනු පටිප්පසද්ධි ප්‍රහාණයෙන් බහාතබන (මුදාහරින) ලද්දේ ද, උපසර්ග යෙදීමෙන් පදයන්ගේ අර්ථය දියුණු කරන ලදී. **අභබබුපපතතිකො** යනු නැවත ඉපැදිය නොහැකි බවට පත්කරන ලද්දේ ද, **ඤාණගහිනා දඬෙඪා** යනු මාර්ග ඥාන නැමති ගින්නෙන් දවන ලද්දේ ද, නොහොත්, බහා තැබූ බඳුනත් සමග ම ඉවත දමන ලද විසක් මෙන් පිහිටා තුබූ තැනත් සමගම ප්‍රහීණ කරන ලදැයි ද, මුලින් සිඳින ලද විස වැලක් මෙන් මුලත් සමග සිඳලන ලදැයි ද, 'සමුචඡින්න' නම් වේ. උඳුනෙක්හි දිය ඉස නිවා දැමූ අඟුරු මෙනැයි 'වූපසන්ත' නම් වේ. නිවා දමන ලද අඟුරු මත වැටුණු ජලය මෙනැයි 'පටිප්පස්සද්ධ' නම් වේ. අංකුර හටගැනීමේ හේතු සිඳලන බීජයන් මෙනැ'යි 'අභබ්බුප්පත්තික' නම් වේ. හෙණ ගැසූ විස රුකක් මෙනැ'යි 'ඤාණග්ගිනා දඩ්ඪ' නම් වේ, යනුවෙන් ඇතැමෙක් විස්තර කෙරෙති.

චතතගෙධො යන මෙය ස්වකීය භාවය අත්හැරීම් වශයෙන් කියන ලදී. **විගතගෙධො** යන මෙය අරමුණෙහි ආලය සහිත බව අත්හැරීම් වශයෙනි. **වනතගෙධො** මෙය නැවත නොගන්නා බව දැක්වීම් වශයෙනි. **මුතතගෙධො** යන මෙය මිදුනහුගේ ද කිසිතැනෙක නැවැත්මක්

(ඇතහිටීමක්) නැති බව දැක්වීම් වශයෙනි. **පටිනිසසටඨගෙධො** යනු මෙය ගත් විරූ දෙය අත්හැරීම දැක්වීම් වශයෙන් කියන ලදී. **විතරාගො** යනු දුරු වූ රාග ඇත්තේ, **චතතරාගො** යනු ඉහත කියූ පරිදි යෙදිය යුතුයි. එහි ගිජුවීම් වශයෙන් **ගෙධො** ගේධ යැයි කියන ලදී. රඤ්ජනය (ඇලීම්) වශයෙන් **රාගො** රාග යැයි කියන ලදී. **නිචඡාතො** යනු තණ්හා නැත්තේයි, 'නිචඡදො' යන පාඨය ද යෙදේ. තණ්හා නැමති වහලින් තොර වූයේයි.

නිබබුතො යනු නිවුණු ස්වභාව ඇත්තේයි. **සීතිභූතො** සීත ස්වභාව ඇත්තේ යි, **සුඛපටිසංවෙදී** යනු කායික චෛතසික සුවය අනුභව කිරීම් ස්වභාව ඇත්තේය. **බ්‍රහමභූතෙන** උතුම් ස්වභාව ඇති, **අතතනා** යනු සිතින්, **කතතනා ච පවිකම් කළ බැවින්, අතතනා ච කුසල් නොකළ බැවින්, කතං මෙ කායදුචචරිතං අකතමෙම කාය සුචරිතං** යන ආදිය ද්වාර වශයෙන් ද අවිරති විරති වශයෙන් ද කර්මපථ වශයෙන් ද කියන ලදී. **සීලෙසු න පරිපූරකාරී** යන ආදිය චතු පාරිශුද්ධි ශීල වශයෙන් කියන ලදී. **ජාගරියමන යුතතො** යනු පංච ජාගරණ (නිදිවැරීම්) වශයෙන් **සති සමපජඤඤෙන** යනු අර්ථ සහිත සිහිකිරීම් වශයෙන්, **චතතාරො සතිපටඨානා** යන ආදිය (බෝධිපාක්ෂික ධර්ම) ලෞකික ලෝකෝත්තර වශයෙන් බෝධිපාක්ෂික ධර්මයෝ යි. **දුකඛං මෙ අපරිඤඤාතං** ආදී වූ පද සතර, ආර්ය සත්‍ය වශයෙන් කියන ලදැයි දතයුතුයි. එය අර්ථ වශයෙන් ඒ ඒ තැන කියන ලද බැවින් ප්‍රකට වූයේමය. **ධීරො පණඩිතො** යන මේ පද සතෙහි අර්ථ ඉහත කියන ලද්දේමය. තවද දුකෙහි කම්පා නොවීම් අර්ථයෙන් **ධීරො** ධීර නම් වේ. සුවයෙහි නො ඉල්පීම් අර්ථයෙන් **පණඩිතො** පණ්ඩිත නම් වේ. දිට්ඨ ධම්මික මෙලෝ පරලෝ යහපතෙහි කළ පරිචය (පුරුදු) ඇත්තේ **පඤඤවා** පඤ්ඤාවන්ත නම් වේ. ආත්මාර්ථ පරාර්ථ දෙක්හි නිසල වූයේ යන අරුතින් **බුදධිමා** බුද්ධිමා නමි. ගැඹුරු මෙන්ම ප්‍රකටය යන අර්ථයෙන් ද නොපසුබස්නා යන අර්ථයෙන් ද **ඤාණී** ඤාණී නම් වේ. සැඟවුණු වැසුණු යන අර්ථයෙන් ද අවකාශ සැලැස්වීමේ අර්ථයෙන් ද **විභාවී** විභාවී නම් වේ. කෙලෙස් රහිත, විශිෂ්ට චරිතයකැ'යි යන අර්ථයෙන් තුලාවක් සමාන වූයේයි. **මෙධාවී** මේධාවී නම් වේ.

නලිපපති යනු ඉපැදීම කෙරෙහි අහසෙහි ඇදි ඉරක් මෙනි. **න සංලිපපති** යනු විශේෂයෙන් නො ඇලෙයි. **න උපලිපපති** සංයෝග වී (එක්ව) සිටිය ද නොඇලේ. අත්ලෙහි ඇති රේඛාවක් මෙනි. **අලිතතො**

යනු සංයෝග වී සිටියත්, කිළිටි නොවූයේ යි. කසී වස්ත්‍රයක (කසී සලුවෙක) තැබූ මැණිකක් මෙනි. **අසංලිත්තෙතා** යනු විශේෂයෙන් කිළිටි නොවූයේයි. මිණිරුවනෙක වෙළන ලද කසී වස්ත්‍රයක් මෙනි. **අනුපලිත්තෙතා** යනු සමීපයට පැමිණියද නො ඇලේ. නෙලුම් කොළයෙහි දිය බිඳුවක් මෙනි.

නික්ඛන්තෙතා යනු පිටතට නික්මෙනුයේ බන්ධනාගාරයෙන් පලා යන්නකු මෙන් **නිස්සතෙතා** යනු විශේෂයෙන් ප්‍රහීණ වූයේයි. සතුරකු හැඳ තුබූ කිළිටි වතක් මෙනි. **විප්පමුත්තෙතා** මනාව මිදුණේයි. ගතයුතු බවට පත් වස්තුවෙහි ආශාව හැරදමා, නැවත නො එන සේ කොට, **විසංයුත්තෙතා** යනු කෙලෙසුන් සමග එක්ව නොයෙදුණු, ආබාධයෙකින් මිදුණු ගිලනකු මෙනි. **විමරියාදිකතෙන චෙතසා** දුරුකළ සීමා කිරීම් ඇති සිතින්, සියලු භවයෙන්, සියලු අරමුණුවලින්, සියලු කෙලෙසුන්ගෙන්, වියුක්ත වූ, මිදුණු සිතිනියි යන අර්ථයි.

සඤ්ඤං පරිඤ්ඤා යන ආදී ගාථාවෙහි, මේ සංක්ෂිප්තාර්ථයයි. හුදෙක් ස්පර්ශය මතු නොවේ. තවද කාම සංඥාදී භේද සහිත සංඥාව හෝ සංඥානුසාරයෙන් ඉහත කී නයින්ම නාමරූපයන් ත්‍රිවිධ පරිඥාවන්ගෙන් මනාව දැන මේ ප්‍රතිපදාවෙන් සිවු වැදෑරුම් වූ ම ඕඝය තරණය කරන්නේය. ඉක්බිති ඕඝයන් තරණය කළ හේ තෙමේ තෘෂ්ණා දෘෂ්ටි පරිග්‍රහණයන්හි, තෘෂ්ණා දෘෂ්ටි කෙලෙස් ප්‍රහාණය කිරීමෙන් ඇලීමෙන් තොර වූ ක්ෂීණාශ්‍රව මුනි වූයේ රාගාදී හුල් උදුරා දැමූ බැවින්, 'අබ්බූළ්හසල්ලෝ' නම් වේ. ස්මෘති විපුලත්වය (සිහි මහත් බව) ඇතිවීමෙන් අප්‍රමාදීව හැසිරෙනුයේ නොහොත් මුලපටන්ම, අප්‍රමාදීව හැසිරෙමින්, අප්‍රමාදී වූ හැසිරීමෙන් උගුලා දැමූ හුල් ඇතිව, තමන්ගේ හා අනුන්ගේ වශයෙන් වූ භේද ද මෙලොව හා පරලොව ද නොපතයි. ඒකාන්තයෙන් ම අවසන් චිත්ත නිරෝධයත් සමග, උපාදාන රහිතවම ගින්නක් මෙන් නිවී යති'යි අර්හත්වයෙන් දේශනාව කුළුගන්වමින් නිමා කළ සේක. හුදෙක් ධර්මෝපදේශයක් තැබීම පමණක් කරමිනි. රහත් කෙනෙකු හට දෙසන ලද හෙයින් මේ සූත්‍ර දේශනාවෙන් මාර්ගයක් හෝ ඵලයක් නො ඉපැදවිණි.

නිල් ආදී භේද ඇති අරමුණ හැඳින ගත්තේනුයි **සඤ්ඤා** සඤ්ඤා නමි. එය සංජානන (හැඳින ගැනීම) ලක්ෂණකොට ඇත්තේය. ප්‍රත්‍යභිඥානය

(මනා අවබෝධය) කෘත්‍යය කොට ඇත්තේය. චතුර්භූමික සංඥාවෝ වනාහි සංජානන ලක්‍ෂණ නැත්තාහු නම් නොවෙති. ඒ සියලුම සංඥාවෝ සංජානන ලක්‍ෂණය ඇත්තාහුම වෙති. යම් සංඥාවක් වනාහි, මෙහි අවබෝධ කිරීමේ ලකුණක් (සලකුණක්) නොමැතිව හඳුනා ගැනීම පමණක් කෙරේද, එය ප්‍රත්‍යභිඥානය (සලකුණකින් අවබෝධ කිරීම) රස (කෘත්‍ය) කොට ඇත්තේ නම් වේ. එය වඩුවකු ලී වල සලකුණු තබා පසුව ඒ සලකුණු අනුව ලී හැඳිනගන්නා විට ද පුරුෂයකුගේ කළු පැහැති ලප ආදිය සලකා, පසුව ඒ සලකුණුවලින් 'මේ අසුවලා' යැයි හැඳිනගන්නා විටද රජකුගේ ආභරණ ආරක්ෂා කරන භාණ්ඩාගාරිකයා ඒ ඒ ආභරණයෙහි නම් ලියූ කොළ බැඳ තබා (පසුව) 'අසුවල් ආභරණය ගෙන එව'යි කී කල පහනක් දල්වා භාණ්ඩාගාරයට පිවිස, නම් ලියූ කොළ කියවා, ඒ ඒ ආභරණයම රැගෙන එනවිට ද (ඒ අනුව) ඒ සඤ්ඤාවෙහි පැවතීම් ස්වභාවය දතයුතුය.

(මේ දිග වාක්‍යයෙහි අන්තර් වාක්‍ය තුනෙකි. පළමුවැනි හා දෙවැනි කොටස් 'පච්චභිජානන කාලෙ' යනුවෙන් ද තුන්වැනි කොටස 'ආභරණ කාලෙ ච' යනුවෙන් ද අවසන් වේ. වාක්‍යයෙහි මුලින්ම ඇති 'තස්සා' යන වචනය 'අවසානයෙහි 'පවත්ති වෙදිතබබා' යන වචන දෙකක් සමග සම්බන්ධ කොට අර්ථය ගතයුතුය. (ඒ සංඥාවෙහි පැවතීම් ස්වභාවය මේ අනුව දතයුතුය) යනුවෙනි.

මේ අර්ථ දැක්වීමේ තවද ක්‍රමයකි. සියල්ල පොදු වශයෙන් හඳුනා ගැනීම ලක්‍ෂණකොට ඇත්තේ **සඤ්ඤා** වයි. නැවත හඳුනාගැනීමට හේතු නිමිති ඇති කිරීම එහි රස හෙවත් කෘත්‍යයයි. දැව ආදියෙහි (යට කී) වඩු ආදීන් මෙනි. ගන්නා ලද නිමිති වශයෙන් අභිනිවෙසකරණය (ලබ්ධීන් හෝ මතයන් හටගැන්වීම) වැටහීම් කොට ඇත්තේය. ඇතා ගැන හඳුන්වන අන්ධයකු මෙනි. අරමුණෙහි (ගැඹුරු ලෙස) නො බැසගත් ස්වභාව ඇති හෙයින් වැඩිකල් නොතිබීම වැටහීම් කොට ඇත්තේ හෝ වේ. විදුලිය මෙනි. වටහාගන්නා ලද ආකාර ඇති විෂය පදනම්කොට ඇත්තේ ය. පඹයන් කෙරෙහි මුව පොව්වන්ගේ 'මිනිසෙකි'යි යන සංඥාව මෙනි. යම් සංඥාවක් මෙහි ඤාණ සම්ප්‍රයුක්ත වේද, ඒ සංඥාව ඤාණයම අනුව පවතියි. පිරිවර සහිත පඨවි ආදී විෂයයෙහි සෙසු ධර්මයන් ද පඨවි ආදිය මෙනැයි දතයුතුයි. කාම ප්‍රතිසංයුක්ත සංඥාව **කාම**

සඤ්ඤා වයි. ව්‍යාපාද තරහ ප්‍රතිසංයුක්ත සංඥාව **ව්‍යාපාද සඤ්ඤා** වයි. විහිංසාව හා ප්‍රතිසංයුක්ත සංඥාව **විහිංසා සඤ්ඤා** වයි.

ඒ ත්‍රිවිධ සංඥාවන් අතුරෙන් දෙකක් සත්ත්වයන් කෙරෙහිද දෙකක් සංඥාවන් කෙරෙහි ද උපදියි. කාම සංඥාව වනාහී ප්‍රියමනාප සත්ත්වයකු හෝ සංස්කාරයක් කෙරෙහි විතර්කනය කරන්නාට උපදියි. ව්‍යාපාද සංඥාව අප්‍රිය අමනාප සත්ත්වයකු හෝ සංස්කාරයක් කෙරෙහි කිපී බලන කල පටන් එය නැසීම දක්වාම උපදියි. විහිංසා සංඥාව සංස්කාරයන් කෙරෙහි නො උපදියි. දුකට පත්කරවිය යුතු සංස්කාරයෙක් නම් නැත. මේ සත්ත්වයෝ නසනු ලැබෙත්වා'යි හෝ සමූලඝාතනය කැරෙත්වායි හෝ නැසෙත්වායි සිතන කල්හි සත්ත්වයන් කෙරෙහි එම විහිංසා සංඥාව උපදියි.

නෛෂ්ක්‍රම්‍ය ප්‍රතිසංයුක්ත වූ සංඥාව **නෙක්ඛම්ම සඤ්ඤා** නෙක්ඛම්ම සංඥා නමි. එය අසුභ භාවනා පූර්ව භාගයේදී කාමාවචර වේ. අසුභ ධ්‍යානයේ දී රූපාවචර වේ. එම ධ්‍යානය පාදක කරගෙන උපන් මගඵල ඇති කල්හි ලෝකෝත්තර වේ. අව්‍යාපාද ප්‍රතිසංයුක්ත වූ සංඥාව **අව්‍යාපාද සඤ්ඤා** වයි. එය මෛත්‍රී භාවනා පූර්වභාගයේ දී කාමාවචර වේ. මෛත්‍රී ධ්‍යානයෙහි දී රූපාවචර වේ. ඒ ධ්‍යානය පාදක කරගෙන උපන් මාර්ගඵල ඇතිකල්හි ලෝකෝත්තර වේ. අවිහිංසා ප්‍රතිසංයුක්ත වූ සංඥාව **අවිහිංසා සඤ්ඤා** වයි. එය කරුණා භාවනා පූර්වභාගයෙහි දී කාමාවචර වේ. කරුණා ධ්‍යානයේ දී රූපාවචර වේ. ඒ ධ්‍යානය පාදක කරගෙන උපන් මාර්ගඵල ඇති කල්හි ලෝකෝත්තර වේ. යම්කලෙක අලෝභය ප්‍රධාන වේද, එකල්හි අනික් (අව්‍යාපාද සංඥා අවිහිංසා සංඥා යන) දෙක ඒ අනුව යන්නේ වේ. යම්කලෙක මෛත්‍රිය ප්‍රධාන වේද, එකල්හි සෙසු (නෛෂ්ක්‍රම්‍ය සංඥා, අවිහිංසා සංඥා යන) දෙක එය අනුව යන්නේ වේ. යම්කලෙක කරුණාව ප්‍රධාන වේද, එකල්හි, සෙසු (අව්‍යාපාද සංඥා, නෛෂ්ක්‍රම්‍ය සංඥා යන) දෙක එය අනුව යන්නේ වේ.

රූපාරම්මණය අරබයා උපන් සංඥාව **රූප සඤ්ඤා** නමි. ශබ්ද සංඥාදියෙහි ද මෙම නයයි. එම සංඥාවෙහි ම අරමුණෙන් අරමුණුවල නිසා නම කියන ලද හෙයිනි. චක්ඛු සම්ඵස්සජාදී වස්තූහු ද කියන ලද්දාහු වෙති. **යා එවරූපා සඤ්ඤා** යනු අන්‍ය වූද 'පටිඝ සමඵස්සජ සඤ්ඤා 'අධිවචන සමඵස්සජ සඤ්ඤා' යන මේ ආදිය ද එසේම දතයුතුයි.

එහි අධිවචන සම්ඵස්සජ සංඥාව ද පර්යාය වශයෙන් තතු ලෙසින් ඡද්වාරික ම වේ. (වේදනා, සංඛාර, විඤ්ඤාණ යන) අරූපී ස්කන්ධ ත්‍රයය තමාම පිටවැටියක්ව සිට, (ආධාරයක් ලෙසින්) තමා හා සහජාත වූ සඤ්ඤාවට 'අධිවචන සම්ඵස්සජා සඤ්ඤා' යැයි නම් කරයි. නිෂ්පර්යාය (යාමාන්‍ය) වශයේ වනාහි පටිඝ 'සම්ඵස්සජා සඤ්ඤාව' නම්, පංචද්වාරික සංඥාවයි. 'අධිවචන සම්ඵස්සජා සඤ්ඤාව' නම් මනෝද්වාරික සංඥාවයි. මෙයින් අතිරේක සංඥාවන් ගන්නා ලදැයි (ඇතුලත් කළ බව) දතයුතුයි. 'සඤ්ඤා' යනු ස්වභාව නාමයයි. **සඤ්ඤානනා** යනු සංජානන (හඳුනාගැනීම්) ආකාරයයි. **සඤ්ඤානිතතතං** යනු සංජානිත භාවය (හඳුනාගත් බව)යි. **අවිඤ්ඤාඝං** යනු නොපිරිය යුතුය යන අර්ථයෙන් කාය දුශ්චරිතාදිය 'අවිඤ්ඤිය' නම් වේ. (නොවිඳිය යුතු) 'නොලැබිය යුතු වේ' යන අර්ථයි. ඒ අවිඤ්ඤිය ය (නොවිඳිය යුතු දෙය) 'විඳිති'යි අවිද්‍යා නම් වේ. එයට විපරීත වශයෙන් කාය සුචරිතාදිය විඤ්ඤිය නම් වේ. ඒ විඤ්ඤිය (විඳිය යුතු දෙය) නොවිඳිතියි ද අවිද්‍යා නම් වේ. ස්කන්ධයන්ගේ ඝාස (වෙසෙති'යි යන අර්ථය, ආයතනයන්ගේ ආයතනාර්ථය ද ධාතූන්ගේ ශූන්‍යාර්ථය ද ඉන්ද්‍රියයන්ගේ අධිපතියි යන අර්ථය ද (මතු) සත්‍යයන්ගේ තථ්‍යාර්ථය ද නොදනිති'යි අවිද්‍යා නමි.

දුක්ඛ (දුක්) ආදියෙහි පෙළීම් ආදී වශයෙන් කියන ලද, සතරවැදෑරුම් අර්ථය නොදනිති'යි ද අවිද්‍යා නම් වේ. අන්තයක් නැති සංසාරයෙහි යෝනි, ගති, භව, විඤ්ඤාණට්ඨිති සත්තාවාසයන්හි සත්ත්වයන් දුවවති'යි අවිද්‍යා නම් වේ. පරමාර්ථ වශයෙන් අවිද්‍යමාන වූ ස්ත්‍රීපුරුෂාදීන් කෙරෙහි දුවති'යි විද්‍යමාන වූ ස්කන්ධාදියෙහි නොදුවති'යි අවිද්‍යා නම් වේ. තවද චක්ඛු විඤ්ඤාණාදියේ වස්තු ආරම්මණයන් නිසා උපන් ධර්මයන් වසන ස්වභාවයෙන් ද අවිද්‍යා නම් වේ. එය අවිජ්ජෝඝය, කාමෝඝ වශයෙන් **උත්තරෙය්‍ය** එතෙර කරවිය යුතුය. භවෝඝ වශයෙන් **පතරෙය්‍ය** වෙසෙසින් එතෙරවිය යුතුය. දිට්ඨ ඕඝ වශයෙන් මැනවින් ඉක්මවිය යුතුය. **සමතික්කමෙය්‍ය** මැනවින් එතෙර විය යුතුය. අවිද්‍යා ඕඝ වශයෙන් **වීතිවතෙතය්‍ය** පසුකළ යුතුය.

නැතහොත්, සෝවාන් මාර්ගයෙන් ප්‍රහාණ වශයෙන් තරණය කළ යුතුය අරුතින් **උත්තරෙය්‍ය** නමි. සකෘදාගාමි මාර්ගයෙන් ප්‍රහාණ වශයෙන් වෙසෙසින් තරණය කළයුතුය අරුතින් **පතරෙය්‍ය** අනාගාමි මාර්ගයෙන් ප්‍රහාණ වශයෙන් **සමතික්කමෙය්‍ය** මැනවින් ඉක්මවිය යුතුය. අර්හත්

මාර්ගයෙන් ප්‍රහාණ වශයෙන් **වීතිවත්තෙතය්‍ය** පසුකොට යා යුතුය. නැතහොත්, 'තරෙය්‍ය' ආදී පද පස තදංගාදී පංච ප්‍රහාණයන් සමග යෙදිය යුතුයැයි ඇතැමෙක් කියති. **මොනං වුච්චති ඤාණං** (මොන' යනු ඥානයයි) කියා එහි ප්‍රභේද වශයෙන් දක්වනු පිණිස, **යා පඤ්ඤා පජානනා** යනාදිය දක්වන ලදී. එය ඉහත කී පරිදි ම යයි තබා, අමොහො ධම්ම විචයො (අමෝහ යනු ධම්මවිචයයි.) යන පදය (ගනිමු.) අමෝහය කුසල කර්මයන් නොවැඩීමට ප්‍රතිවිරුද්ධ වූ වැඩීමේ හේතුවයි. අමෝහය හේතුකොට මුළා වූවහුගේ විපරීත ග්‍රහණය හැරදමා අවිපරීතය (තත්වාකාරය) ගනියි. අමෝහය හේතුකොට යථා තත්ත්වය දරනුයේ යථා ස්වභාවයෙහි පවතියි. මුළා වූයේ වනාහි, තථ්‍යය (සැබෑ තතු) අතථ්‍යය (නො සැබෑ තතු)යි ගනියි. ඒ ආකාරයෙන් ඉච්ඡිතාලාභ දුක්ඛය (කැමති දෙය නොලැබීමේ දුක) වේ. මුළා නොවූවහුට 'මෙහි කොතැනකින් එය ලැබිය හැකිද? (නොහැකිය)'යි මේ ආදී වශයෙන් ප්‍රත්‍යවේක්ෂණය පහළවීමෙන් මරණ දුක ඇති නොවේ.

මුළා වී මරණයට පත්වීම දුකෙකි. එය නොමුළා වූවහුට සිදු නොවේ. පැවිද්දන් හට සුඛසංවාස (සුවසේ විසීම) වේ. තිරිසන් යෝනියෙහි ඉපදීමක් නොවේ. මෝහයෙන් වනාහි නිත්‍ය වශයෙන් මුළා වූවාහු තිරිසන් යෝනියෙහි පදිති. මෝහයට ප්‍රතිවිරුද්ධ වූයේ අමෝහයයි. මෝහ වශයෙන් අමධ්‍යස්ථභාවය නැති කරයි. අමෝහයෙන් අවිහිංසා සංඥාව ධාතු සංඥාව මධ්‍යම ප්‍රතිපදාව පිළිපැදීම හා (සීලබ්බත පරාමාස, ඉදං සච්චාභිනිවේස) සිදුවේ. (චිත්තානුපස්සනා ධම්මානුපස්සනා යන) අවසන් සතිපට්ඨාන දෙක ද යන පශ්චිම කායග්‍රන්ථ ද්වයයෙහි බිඳීම සමෘද්ධ වේ. අමෝහය දීර්ඝායුෂ්කතාවට හේතු වේ. නොමුළා වූයේ වනාහි හිත අහිත දෙක මනාව දැන, අහිත වූ දෙය දුරුකරමින්, හිත වූ දෙය පරිහරණය කරනුයේ දීර්ඝායුෂ ඇත්තේ වේ. අග්‍ර වූ මෝක්ෂ සම්පත්තියෙන් නො පිරිහුණේ වේ. නොමුළා වූයේ වනාහි තමාට හිතවූ දෙයම කරනුයේ තමාගේ යහපත සලස්වා ගනියි. ආර්ය විහරණයට ප්‍රත්‍යය වේ. උදාසීන පක්ෂයෙහි නිවුණේ වේ.

නොමුළා වූවහුට සියල්ල සැක කරන ස්වභාවයක් නොමැති හෙයින් අමෝහය හේතුකොට මාර්ග දර්ශනය ඇති වේ. නොමුළා වූයේ වනාහි තත්ත්වාකාරයෙහි දක්ෂයෙක් වූයේ, පාලනය කළ නොහැකි ස්කන්ධ පංචකය පාලනය කළ නොහැක්කක් ලෙස අවබෝධ කරගනියි. යම්සේ

මෙයින් (අමෝහයෙන්) අනාත්ම දර්ශනය වේද එසේම මෝහයෙන් ආත්ම දර්ශනය වේ. කවරෙක් නම් ආත්ම ශූන්‍යතාව අවබෝධ කරගෙන, නැවත මුළාවට පැමිණෙන්නේ ද? **තෙන ඤාණෙන සමන්නාගතො** යනු මේ කියන ලද ආකාරයෙන් යුතු ඤාණයෙන් යුක්ත වූයේ ශෛක්ෂ්‍ය ආදී වූ මුනිවරයෙක් වේ. **මොනපපත්තො** යනු ලබන ලද ඤාණයෙන් මුනි බවට පත්වූයේ, **තීණි** යනු සංඛ්‍යා වශයෙන් පිරිසිඳ දැක්වීමයි. **මොනෙය්‍යානි** යනු මුනිබව, මෝනෙය්‍ය බව ඇතිකරන ප්‍රතිපදා ධර්මයෝයි. **කාය මොනෙය්‍යං** යනාදියෙහි විඥප්ති කාය, රූපකාය වශයෙන් පැනවිය යුතු වූයේ, **කාය මොනෙය්‍යං** කය පිළිබඳ මුනි බවයි. විඥප්ති වාචා, ශබ්ද වාචා වශයෙන් පැණවිය යුතු වූයේ **වචීමොනෙය්‍යං** වචනය පිළිබඳ මුනි බවයි. මනෝද්වාරික චිත්තාදි වශයෙන් පැණවිය යුතු වූයේ **මනො මොනෙය්‍යං** මනො මොනෙය්‍ය (සිත පිළිබඳ) මුනි බවයි.

තිවිධ කායදුච්චරිතානං පහානං යනු ප්‍රාණඝාතාදී ත්‍රිවිධ වූ කයින් කෙරෙන දුශ්චරිතයන් අත්හැරීමයි. **කාය සුචරිතං** යනු කයින් පැවති මනා හැසිරීමයි. **කායාරම්මරණ ඤාණං** යනු කය අරමුණු කර අනිත්‍යාදී වශයෙන් පැවැත්වෙන කායාරම්මණ ඤාණයයි. **කාය පරිඤ්ඤා** යනු කය ඤාත, තීරණ, ප්‍රහාණ යන ත්‍රිවිධ පරිඥාවන්ගෙන් දැනගැනීම් වශයෙන් පැවති ඤාණයයි. **පරිඤ්ඤා සහගතො මගො** යනු අභ්‍යන්තරික කය පිළිබඳව විමර්ශනය කොට උපදවන ලද පරිඥා සහගත මාර්ගයයි. **කායෙ ඡන්දරාගස්ස පහානං** යනු කාය තණ්හාව සහිත ඡන්දරාගය දුරුකිරීමයි. **කායසංඛාර නිරොධො** යනු ආශ්වාස ප්‍රශ්වාසයන් නැවැත්වීමයි. වැලැක්වීමයි. චතුර්ධ්‍යාන සමාපත්තීනට සමවැදීමයි. **වචී සංඛාර නිරොධො** යනු විතක්ක විචාරයන් නැවැත්වීමයි. දෙවන ධ්‍යාන සමාපත්තියට සමවැදීමයි.

චිත්ත සංඛාර නිරොධො යනු සංඥා වේදනාවන් නැවැත්වීමයි. වැලැක්වීමයි. සඤ්ඤා වේදයිත නිරෝධ සමාපත්තියට සමවැදීමයි. පළමු ගාථාවෙහි **කාය මුනිං** යනාදියෙහි කාය දුශ්චරිතයන් ප්‍රහාණය කිරීම් වශයෙන් **කාය මුනි** නම් වේ. වාග් දුශ්චරිත ප්‍රහාණය කිරීම් වශයෙන් වාචා මුනි නම් වේ. මනෝ දුශ්චරිත ප්‍රහාණය කිරීම් වශයෙන් මනෝ මුනි නම් වේ. සියලු අකුසල් ප්‍රහාණය කිරීම් වශයෙන් අනාසව මුනි නම් වේ. මුනිභාවයෙන් යුක්ත යැයි දැන, ඵලයෙහි සිටි හෙයින් 'මොනෙය්‍ය සම්පන්න' නම් වේ. **ආහු සබ්බපහායිනං** යනු සියලු කෙලෙස් දුරුකර,

සිටි බැවින් සබ්බප්පහායී (සියල්ල ප්‍රහාණය කරන ලද) යි කිවයුතුයි. දෙවන ගාථාවෙහි **නිනහාත පාපකං** යමෙක් අභ්‍යන්තර බාහිර සංඛ්‍යාත සියලුම ආයතනයන්හි, අභ්‍යන්තර බාහිර අරමුණු වශයෙන් ඉපදිය හැකි සියලු පව් මාර්ග ඤාණයෙන් මුලුමනින්ම නහා සෝදා සිටි බැවින් ඔහු 'නින්හාත පාපක' යැයි කීහ'යි මෙසේ අර්ථය දතයුතුයි. ගිහිගෙයි වසන්නෝඅගාඝ **මුතිනො** අගාරමුනි නම් වෙති. පැවිද්දට එළඹියෝ **අනගාර මුනිනො** අනගාර මුනි නම් වෙති. සප්ත සේඛයෝ **සෙඛ මුනිනො** සේඛ මුනි නම් වෙති. රහත්හු **අසෙඛ මුනිනො** අසේඛ මුනි නම් වෙති. පසේ බුදුවරු **පචෙචක මුනිනො** පච්චේක මුනි නම් වෙති. සම්මා සම්බුදුවරු මුනි **මුනිනො** මුනි මුනි නම් වෙති.

යලිදු කියනු කැමතිව ප්‍රශ්න කිරීම් (කථෙතු කම්‍යතා පුච්ඡා) වශයෙන් 'අගාරමුනිහු නම් කවරේ ද?' යනාදිය කීහු. **අගාරිකා** යනු කෘෂි, කර්මාන්ත, ගවපාලන ආදී ගෘහස්ථ කර්මාන්තයන්හි නියුතු වූවාහුය. **දිටඨපදා** යනු නිවන් දුටුවාහුයි. **විඤඤාත සාසනා** යනු මොවුන් විසින් ශික්ෂාත්‍රය ශාසනය දන්නා ලදැයි 'විඤ්ඤාත සාසන' නම් වෙති.

අනගාර යනු කෘෂිකර්ම, ගවපාලන ආදී ගෘහස්ථ කර්මාන්තාදිය මොවුනට නැතැයි පැවිදි වූවෝ අනගාරික නම් වෙති. **සතත සෙඛා** යනු සෝතාපන්න ආදී වූ සත්දෙනයි. ත්‍රිවිධ ශික්ෂාවෙහි හික්මෙන්නෝයි, සේඛ නම් වෙති. රහත්හු (හික්මීම් අවසන් බැවිනි.) නො හික්මෙන්නෝ යැයි **අසෙඛා** නම් වෙති. ඒ ඒ කාරණය නිසා ගුරූපදේශ රහිතව හුදකලාව චතුරාර්ය සත්‍යය අවබෝධ කරගත්හ'යි පසේ බුදුවරු **පචෙචක මුනිනො** 'පච්චේක මුනි' නම් වෙති. **මුනි මුනිනො** යනු තථාගත සම්මා සම්බුදුවරු මුනි මුනි යැයි වහරනු ලබති. මෙහි අට කරුණෙකින් භාග්‍යවතුන් වහන්සේ **තථාගතො** තථාගත නම් වෙති. 'එසේ ආවේනු'යි **තථාගතො** තථාගත නම් වෙති. එසේ ගියේනු'යි **තථාගතො** තථාගත නම් වෙති. තථ (සැබෑ) ලක්ෂණයට ආවේනු'යි **තථාගතො** තථාගත නම් වෙති. තථ ධර්මයන් යථාර්ථයෙන් ම අවබෝධ කළහ'යි **තථාගතො** තථාගත නම් වෙති. ඇති තතු දක්වන හෙයින් **තථාගතො** තථාගත නම් වෙති. තථාවාදී බැවින් **තථාගතො** තථාගත නම් වෙති. තථාකාරී වන බැවින් **තථාගතො** තථාගත නම් වෙති. අභිභවන අර්ථයෙන් ද **තථාගතො** තථාගත නම් වෙති. කෙසේ නම් භාග්‍යවතුන් වහන්සේ 'එසේ ආවාහුනු'යි 'තථාගත' වනසේක්ද, මුළු ලොවට ම හිත පිණිස, උත්සාහවත් බවට

පැමිණ, පෙර සම්මා සම්බුදුවරු පැමිණියාහුද, එසේ පැමිණියහ. කුමක් කියන ලද්දේ ද යත්, යම් අභිනීහාරයෙකින් පෙර බුදුවරු ආවාහු ද, අභිනීහාරයෙන් ම අපගේ භාග්‍යවතුන් වහන්සේ ද ආ සේක. නොහොත්, යම්සේ පෙර බුදුවරු දාන, සීල, නෙක්ඛම්ම, පඤ්ඤා, විරිය, ඛන්ති, සච්ච, අධිට්ඨාන, මෙත්තා, උපෙක්ඛා යන දස පාරමිතා, දස උපපාරමිතා, දස පරමත්‍ථ පාරමිතා යන සමත්‍රිංශත් පාරමීන් පුරා, අංග පරිත්‍යාග, ඇස්, ධන, රාජ්‍ය අඹුදරු පරිත්‍යාග යන පංචමහා පරිත්‍යාගයන් සම්පූර්ණ කර, පූර්වයෝග (පෙර යෙදුණු) පූර්ව චර්යා (පෙර පුරුදු කළ) ධර්මස්කන්ධයන්ගේ දන්නා ලද අර්ථචර්යාදිය පුරා, බුද්ධි චර්යාවෙහි කෙළ පැමිණ ආ සේක්ද, සේම අපගේ භාග්‍යවතුන් වහන්සේ ද ආ සේක. යම්සේ පෙර භාග්‍යවතුන් වහන්සේ සතර සතිපට්ඨාන, සතර සම්‍යක් ප්‍රධාන, සතර ඍද්ධිපාද, පංච ඉන්‍ද්‍රිය, පංච බල, සත්ත බොජ්ඣංග, ආර්ය අෂ්ඨාංගික මාර්ග යන ධර්මයන් වඩමින්, පුරමින් ආවාහුද, එසේම අපගේ භාග්‍යවතුන් වහ්නසේ ද ආහ. 'එසේ ආවාහු' යි තථාගත නම් වෙති.

යථා ච දීපංකර බුද්ධ ආදයෝ
සබ්බඤ්ඤුභාවං මුනයෝ ඉධාගතා
තථා අයං සක්‍ය මුනීපි ආගතෝ
තථාගතෝ වුච්චති තෙන චකඛුමා'ති

යම්සේ මේ ලෝකයෙහි දීපංකර ආදී බුද්ධ මුනිවරයන් වහන්සේ සර්වඥතාවට පැමිණි සේක් ද, එසේම මේ අපගේ ශාක්‍ය මුනීන් වහන්සේද ආ සේක. එහෙයින් පසැස් ඇති උන්වහන්සේ 'තථාගත' යැයි කියනු ලබන සේක.

කෙසේ නම් 'එසේ ගියාහුනු'යි තථාගත නම් වන සේක්ද? යම්සේ උපන් ඇසිල්ලෙහි පෙර බුදුවරු ගියාහු ද එසේය. ඔවුහු කෙසේ ගියාහුද? ඔවුහු උපන් ඇසිල්ලෙහි පාද සමකොට පොළොවෙහි පිහිටා, උත්තරාභිමුඛව සත් පියවරක් ගියාහුය. යම්සේ කීහුද, 'ආනන්දය, උපන් ඇසිල්ලෙහි බෝධිසත්ත්ව තෙමේ සමපාදයන්ගෙන් පිහිටා උතුරු දෙසට අභිමුඛව සත්පියවරක් තබමින් යයි. පසුපසින් සේසතක් දරනු ලබන කල්හි සියලු දිසා අවලෝකනය කරයි. ශ්‍රේෂ්ඨ වචනය කථා කරයි.

අග්ගොහමස්මි ලොකස්ස - ජෙට්ඨොහමස්මි ලොකස්ස
සෙට්ඨොහමස්මි ලොකස්ස - අයමන්තිමා ජාති නත්ථිදානි පුනබ්භවෝ තී

මම ලොවට අග්‍ර වෙමි. මෙලොවට ජ්‍යෙෂ්ඨ වෙමි. මම ලොවට ශ්‍රේෂ්ඨ වෙමි. මේ මාගේ අවසාන ආත්මභාවයයි. දැන් මාගේ පුනර්භවයක් නැත.

ඒ බෝසතාණන්ගේ ගමන ද තථ (සැබෑ) වූවක්ම විය. අවිතථ (තථ නොවූවක්) නොවීය. අනේකවිධ විශේෂාධිගමයනට පෙරනිමිති වශයෙන් මෙසේ යති. උපන් ඇසිල්ලෙහි සම්පාදයන්ගෙන් පිහිටා සිටිති. මේ ඔවුන්ගේ චතුර් ඍද්ධිපාද ප්‍රතිලාභයට පෙරනිමිත්තකි. උතුරුදෙසට අභිමුඛව යෑම මුළු ලෝකයාට ම (උත්තර) අග්‍ර වන බවට පූර්ව නිමිත්තකි. සත් පියවරක් ඉදිරියට යෑම සප්ත බොජ්ඣංග රත්න ප්‍රතිලාභයට ද 'සුවණ්ණ දණ්ඩාවීති පතනති චාමරා' (රන්මිට සහිත චාමරයෝ සැලෙති)යැයි මෙහි කියන ලද (දෙවියන් විසිනි.) සෙමෙර සැලීම, සියලු තීර්ථකයන් මැඩලීමට ද (දෙවියන් විසින් ම) සේසත් දැරීම, අර්හත් විමුක්ති නැමැති උතුම් නිර්මල ශ්වේතච්ඡත්‍ර ප්‍රතිලාභයට ද සියලු දිශාවන් අවලෝකනය කිරීම සර්වඥතා අනාවරණ ඥාන ප්‍රතිලාභයට ද ශ්‍රේෂ්ඨ වචනය කථා කිරීම (අන් කිසිවකු විසින්) නොපැවැත්විය හැකි, උතුම් දම්සක් පැවතුමට ද පෙරනිමිති වේ. එසේම මේ අපගේ භාග්‍යවතුන් වහන්සේ ද ඒ මගම ගියහ. මොවුන් වහන්සේගේ ඒ ගමන ද එම විශේෂාධිගමයනට පෙරනිමිති වශයෙන්, එසේම තථ (සැබෑ) මෙන් ම අවිතථ (නො සැබෑ නොවන) ද විය. එහෙයින් කීහු. පුරාණාචාර්යවරයෝ,

මුහුත්තජාතොව ගවම්පතී යථා - සමෙහි පාදෙහි ඵුසී වසුන්ධරං
සො විකකමී සත්තපදානි ගොතමෝ - සෙතඤ්ච ඡත්තං අනුධාරයුං මරූ

ගන්ත්වාන සො සත්තපදානි ගොතමෝ - දිසා විලොකෙසි සමා සමන්තතෝ
අට්ඨංගපෙතං ගිරමබ්භු දීරයී - සීහෝ යථා පබ්බත මුද්ධ නිට්ඨිතෝ

එකෙණෙහි උපන් ගවරජෙකු මෙන් සමවූ පාදයන්ගෙන් පොළව ස්පර්ශ කළ ගෞතම බෝසතාණන් වහන්සේ සත්පියවරක් ගියහ. දෙවියෝ ඔවුන් හට සේසතක් දැරූහ. ඒ ගෞතම බෝසතාණන් වහන්සේ සත් පියවරක් ගොස් හාත්පස දිසාවන් අවලෝකනය කළහ. පවු මුදුනෙක

සිට සිංහනාද කරන සිංහ රාජයකු සේ අංග අටකින් සමන්විත වූ ශ්‍රේෂ්ඨ වචනය උච්චාරණය කළහ.

මෙසේ 'එසේ ගියේනු'යි තථාගත නම් වේ. නොහොත්, පෙර බුදුවරු මෙන් ම මේ බුදුරජාණන් වහන්සේ ද එසේම අභිනික්මනින්, කාමච්ඡන්දය ද ප්‍රථම ධ්‍යානයෙන් නීවරණයන් ද අනිච්චානුපස්සනාවෙන් නිත්‍ය සංඥාව ද -පෙ- අර්හත් මාර්ගයෙන් සියලු කෙලෙස් ද දුරුකර, ගිය සේක්, එහෙයින් ද 'එසේ ගියේනු'යි තථාගත නම් වෙති.

තථ ලක්ෂණයට පැමිණියේනු'යි තථාගත වන්නේ කෙසේද? පඨවි ධාතුවෙහි කර්කශ දැඩි ලක්ෂණය අවිතථ නොව තථ ම වේ. ආපෝ ධාතුවෙහි වැගිරෙන ලක්ෂණය ද තේජෝ ධාතුවෙහි උෂ්ණත්ව ලක්ෂණයද වායෝ ධාතුවෙහි පිම්බෙන ලක්ෂණය ද ආකාස ධාතුවෙහි ස්පර්ශ නොවන ලක්ෂණය ද විඤ්ඤාණ ධාතුවෙහි විජානන ලක්ෂනය ද රූපයෙහි රූප්පන (විකාරයට පත්වන) ලක්ෂණය ද වේදනාවෙහි විඳින ලක්ෂණය ද සංඥාවේ සංජානන (හැඳිනීමේ) ලක්ෂණය ද සංස්කාරයන්ගේ රැස්කරන ලක්ෂණයද විඤ්ඤාණයෙහි විජානන ලක්ෂණය ද විතර්කයෙහි අරමුණට නැග්වෙන ලක්ෂණය ද සුබයෙහි සායන ලක්ෂණය ද චිත්තේකග්ගතාවෙහි වික්ඛිප්ත නොවන ලක්ෂණයද ඵස්සයේ ඇති ස්පර්ශ වන ලක්ෂණය ද සද්ධින්ද්‍රියයෙහි අධිමොක්ඛ (පැහැදීම්) ලක්ෂණය ද විරියින්ද්‍රියෙහි උත්සාහ සහිත ලක්ෂණයද සතින්ද්‍රියෙහි එළඹ සිටීමේ ලක්ෂණය ද සමාධින්ද්‍රියයෙහි අවික්ඛේප ලක්ෂණයද පඤ්ඤින්ද්‍රියයෙහි පජානන (වෙසෙසින් දැනගැනීමේ) ලක්ෂණය ද ශ්‍රද්ධා බලයෙහි, ශ්‍රද්ධා විරහිත භාවයෙහි අකම්පිය (කම්පා නොවන) ලක්ෂණය ද විරිය බලයෙහි කුසීත බැව්හිදී ද සති බලයෙහි සිහිමුළා බැව්හිදී ද, සමාධි බලයෙහි උද්ධච්ච විෂයයෙහිදී ද පඤ්ඤා බලයෙහි අවිද්‍යා විෂයයෙහිදී ද අකම්පිය (කම්පා නොවීමේ) ලක්ෂණය ද විරිය බලයෙහි කුසීත බැව්හිදී ද සති බලයෙහි සිහිමුළා බැව්හිදී ද සමාධි බලයෙහි උද්ධච්ච විෂයයෙහිදී ද පඤ්ඤා බලයෙහි අවිද්‍යා විෂයයෙහි දී ද අකම්පිය (කම්පා නොවීමේ) ලක්ෂණය සම්මා දිට්ඨියෙහි දර්ශන ලක්ෂණයද සම්මා සංකප්පයේ අරමුණට සිත යොමුකරන ලක්ෂණයද සම්මා වාචාවෙහි පරිග්‍රහණ ලක්ෂණයද, සම්මා කම්මන්තයෙහි සමුට්ඨාන ලක්ෂණය ද සම්මා ආජීවයෙහි පිරිසිදු කරන ලක්ෂණය ද සම්මා වායාමයෙහි උත්සාහ කිරීමේ ලක්ෂණය ද සම්මා සතියෙහි උපට්ඨාන (එළඹ සිටීමේ) ලක්ෂණය ද සම්මා සමාධියෙහි

අවික්ඛේප ලක්ඛණය ද අවිද්‍යාවේ ඇති අඤාන (නොදන්නා) ලක්ඛණයද සංස්කාරයන්ගේ චේතනා ලක්ඛණය ද විඤ්ඤාණයේ විජානන (දැනගන්නා) ලක්ඛණය ද නාමයේ ඇති නැමෙන සුලු ලක්ඛණය ද රූපයේ ඇති විකාරයට පත්වන ලක්ඛණය ද සළායතනයෙහි ආයතන ලක්ඛණය ද ඵස්සයේ ස්පර්ශ ලක්ඛණය ද වේදනාවෙහි විඳිය යුතු ලක්ඛණය ද තණ්හාවේ හේතු ලක්ඛණය ද උපාදානයේ ග්‍රහණය කරගන්නා ලක්ඛණය ද භවයේ රැස්කිරීමේ ලක්ඛණය ද ජාතියෙහි ඉපදීමේ ලක්ඛණය ද ජරාවේ දිරීමේ ලක්ඛණය ද මරණයෙහි චුති ලක්ඛණය ද ධාතූන්ගේ ශූන්‍යතා ලක්ඛණය ද ආයතනයන්ගේ ආයතන ලක්ඛණය ද සතිපට්ඨානයන්ගේ එළඹීමේ (උපට්ඨාන) ලක්ඛණය ද සම්‍යක් ප්‍රධානයන්ගේ අධිපති ලක්ඛණය ද බලයන්ගේ අකම්පිත (කම්පා නොවන සුලු) ලක්ඛණය ද බොජ්ඣංගයන්ගේ නෛර්‍යාණික ලක්ඛණය ද මාර්ගයෙහි හේතු ලක්ඛණය ද සත්‍යයන්ගේ තථ (සැබෑ) ලක්ඛණය ද සමථයෙහි අවික්ඛේප ලක්ඛණය ද දිට්ඨි විසුද්ධියෙහි දර්ශන ලක්ඛණය ද ක්ෂයවීම පිළිබඳ ඤාණයෙහි සමුච්ඡේද (සිඳලීමේ) ලක්ඛණය ද අනුප්පාද (නො ඉපදීම පිළිබඳ) ඤාණයෙහි පස්සද්ධි (බහාලීම්) ලක්ඛණය ද ඡන්දයේ මූල (මුල්වීමේ) ලක්ඛණය ද මනසිකාරයෙහි සමුට්ඨාන (එළඹ සිටීමේ) ලක්ඛණය ද ඵස්සයේ සමෝධාන (එක් කිරීමේ) ලක්ඛණය ද වේදනාවෙහි (එක්රැස්වීමේ) සමෝසරණ ලක්ඛණය ද සමාධියෙහි ප්‍රමුඛ ලක්ඛණය ද සිහියෙහි ආධිපතෙය්‍ය (ආධිපත්‍ය) ලක්ඛණය ද ප්‍රඥාවේ තතුත්තරිය (වඩා ශ්‍රේෂ්ඨ) ලක්ඛණය ද විමුක්තියෙහි සාර ලක්ඛණය ද අමා ඔසුවක් වන නිවනෙහි පර්යවසාන (සමාප්ති) ලක්ඛණය ද ඇති තථය (සැබෑ තතු) යි, අවිතථය (නො සැබෑ තතු) යි. ඤාණ ගතියෙන් ආ සේක්, මේ තථ ලක්ඛණයට නොවරදවා පැමිණි සේකැයි අනුපිළිවෙළින් පැමිණිසේකැයි යන අරුතින් තථාගත නම් වේ. මෙසේ තථා ලක්ඛණයට පැමිණිසේකැයි තථාගත නම් වේ.

'තථ ධර්මය තත්වාකාරයෙන්ම අවබෝධ කරගත් සේකැයි යන අරුතින් තථාගත වන්නේ කෙසේද? තථ ධර්මය නම් චතුරාර්ය සත්‍යයයි කියන ලදමැයි. 'මහණෙනි, මේ ධර්ම සතර තථය, අවිතථය, අනන්‍යථ (අන්‍ය බවකට නොයයි) ය, කවරනම් ධර්ම සතරක්ද, මේ දුකය යන මේ කරුණ මහණෙනි, තථය, අවිතථය, අනන්‍යථය' යන ආදී විස්තරයයි. ඒ සත්‍යයන් භාග්‍යවතුන් වහන්සේ අවබෝධ කළසේකැයි තථයන් අවබෝධ කරගත් බැවින් 'තථාගත' නමැයි කියනු ලැබෙති. මෙහි 'ගත' ශබ්දය අවබෝධ කිරීමේ අර්ථයෙහි වේ. තවද ජරා මරණයන් ජාති ප්‍රත්‍යයෙන්

හටගත්හයි, සමුදාගත (පහළ වුණාහ)යි යන අර්ථයෙන් තථය, අවිතථය, අනඤ්ඤථය, සංස්කාරයන්ගේ අවිද්‍යා ප්‍රත්‍යයෙන් හටගත්හ'යි පහළ වුණහ'යි, යන අර්ථයෙන් තථය, අවිතථය, අනඤ්ඤථය, අවිද්‍යාව සංස්කාරයනට ප්‍රත්‍යය වෙතැ'යි යන අර්ථය -පෙ- ජාතිය (ඉපදීම) ජරා මරණයනට ප්‍රත්‍යය වෙතැ'යි යන අර්ථයෙන් තථය, අවිතථය, අනඤ්ඤථය, ඒ සියල්ල භාග්‍යවතුන් වහන්සේ අවබෝධ කරගත් සේක. එහෙයින්, අවිතථයන් අවබෝධ කළ හෙයින් තථාගත වූ සේක. මෙසේ තථ ධර්මයන් යථා ස්වභාවයෙන් අවබෝධ කළ සේකැයි තථාගත නම් වෙති. තථදර්ශී ඇති දක්වන බැවින් තථාගත වන්නේ කෙසේද? භාග්‍යවතුන් වහන්සේ දෙවියන් සහිත ලෝකයෙහි -පෙ- දෙව්මිනිසුන් සහිත අප්‍රමාණ වූ ලෝකධාතූන්හි අප්‍රමාණ සත්ත්වයන්ගේ චක්ෂු ද්වාරයෙහි පහළ වන්නා වූ යම් රූපාරම්මණයක් ඇත් ද, එය සර්ව ප්‍රකාරයෙන් ම දනිති. දකිති. මෙසේ දන්නා වූ දක්නා වූ ද, එය ඉටු අනිටු ආදී වශයෙන් හෝ දිට්ඨ, සුත, මුත, විඤ්ඤාත යන තන්හි ලැබෙන පදයක් හෝ, 'රූපායතන වූ ඒ රූපය කවරක් ද? යම් රූපයක් සතරමහා භූතයන් නිසා වර්ණ ආලෝක පෙනෙන පටිඝ සහගත නීල පීත යයි ආදී ක්‍රමයෙන් නොයෙක් නම්වලින් දහතුන් වැදෑරුම්ව හෝ, පනස් දෙවැදෑරුම්ව හෝ බෙදනු ලබනුයේ තථම වේද (සත්‍ය ම) අසත්‍ය නොවේ ද, සෝතද්වාර ආදීන්හි ද පහළවන්නා වූ ශබ්ද ආදීන්හි ද මේ ක්‍රමයමැයි. භාග්‍යවතුන් වහන්සේ විසින් මෙසේ කියන ලදී. 'මහණෙනි, දෙවියන් සහිත ලෝකයෙහි -පෙ- දෙව්මිනිසුන් සහිත ලෝකධාතූන්හි දිට්ඨ, සුත, මුත, විඤ්ඤාත, පත්ත, පරියේසිත, අනුවිචරිත යම් දෙයක් ඇත් ද එය මම මනසින් ද දනිමි. මම එය මැනවින් අවබෝධ කළෙමි. 'එය තථාගතයන් වහන්සේ දන්නා ලදී. එය තථාගතයන් වහන්සේට වැටහුණි. 'මෙසේ තථදර්ශී (ඇති තතු දක්වන) බැවින් තථාගත නම් වෙති. මෙහි තථදර්ශී අර්ථයෙහි තථාගත යන පදය සිද්ධ වූ බව දතයුතුයි.

තථාවාදී බැවින් තථාගත වන්නේ කෙසේද? යම් රූයක භාග්‍යවතුන් වහන්සේ බෝමැඩ අපරාජික පර්යංකයෙහි හුන් සේක් සිවු මාරයන්ගේ මස්තයන් සිඳ අනුත්තර වූ සම්මා සම්බුද්ධත්වය අවබෝධ කරගත් සේක් ද, යම් රූයක සල්ගස් දෙකක් අතර වැඩහිඳ අනුපදිසේස නිර්වාණ ධාතුවෙන් පිරිනිවන්පෑ සේක් ද, යන මේ කාරණා දෙක අතර වූ සතලිස් පස්වසර තුළ ප්‍රථම බෝධියෙහි ද මධ්‍යම බෝධියෙහි ද පශ්චිම බෝධියෙහි ද වූ භාග්‍යවතුන් වහන්සේ විසින් දේශනා කරන ලද සූත්‍ර, ගෙය්‍ය, -පෙ-

වේදල්ල යන යම් ධර්මයක් වේද ඒ සියල්ල අර්ථ වශයෙන් ව්‍යඤ්ජන වශයෙන් උපවාද නොකළ යුතු, අඩු වැඩි නොවූ සර්වප්‍රකාරයෙන් ම පරිපූර්ණ වූ රාග මද නැති කරන දෝස, මෝහාදී මද වළඟ මාත්‍රයක්වත් නොතබා දුරුකරයි ද ඒ සියල්ල එක් මුද්‍රාවකින් ලස් තැබුවාක් මෙන්, එක් නැළියකින් මැන්නාක් මෙන්, එක් තුලාවකින් තුලනය කළාක් මෙන් සත්‍ය ම (තථ) වේ. වෙනස් ආකාරයකින් (අවිතථ) නොවේ. එහෙයින් කියන ලදී. 'චුන්ද, යම් රූයක තථාගතයන් වහන්සේ අනුත්තර වූ සම්මා සම්බෝධිය අවබෝධ කරගත් සේක් ද, යම් රූයක අනුපදිසේස නිර්වාණ ධාතුවෙන් පිරිනිවන් පාන්නේ ද මෙදාතුර යමක් උන්වහන්සේ කථාකරන සේක් ද කියන සේක් ද, දක්වන සේක් ද ඒ සියල්ල එසේම (තථ) වේ. අන් ලෙසකින් නොවේ. එහෙයින් තථාගත යැයි කියනු ලැබේ. මෙහි 'ගද' ශබ්දය ම 'ගත' වෙයි. මෙසේ තථාවාදී බැවින් තථාගත වේ. තවද ආගදනය ආගදෝ වචනය යන අර්ථයි. (ගද ධාතුව කීම් අර්ථයේ යෙදේ.) තථා වූ විපරීත නොවූ ප්‍රකාශනයක් (ආගදෝ) ඔහුට ඇත්තේනුයි දකාරයට තකාරය කොට තථාගත නම් වේ. මෙසේ ද මෙම අර්ථයෙහි පදසිද්ධිය දතයුතුයි.

තථාකාරී බැවින් තථාගත වන්නේ කෙසේ ද? භාග්‍යවතුන් වහන්සේගේ වචනයට අනුව කය පවතී ද කය ද වචනයට අනුකූල කෙරේ ද එහෙයින් යථාවාදී තථාකාරී ද යථාකාරී තථාවාදී ද වන සේක. මෙසේ වූ උන්වහන්සේගේ වචනය යම් සේද කය ද එසේ ය. එසේ පැවතියේ ය යන අර්ථයි. කය යම්සේ ද වචනය ද එසේ ගියේනුයි තථාගත නමි. එහෙයින් කීහ. 'මහණෙනි, තථාගත තෙමේ යථාවාදී ද තථාකාරී වේ. යථාකාරී ද තථාවාදී වේ. එනිසා තථාගත යැයි කියනු ලැබේ. 'මෙසේ තථාකාරී බැවින් තථාගත නම් වේ.

අභිභවන අර්ථයෙන් තථාගත වන්නේ කෙසේද? උඩින් භවාග්‍රය ද යටින් අවීචිය ද කෙළවර කොට ඇති සරසට අප්‍රමාණ වූ ලෝකධාතුවල සියලු සත්ත්වයන් ශීලයෙන් සමාධියෙන් ප්‍රඥාවෙන් විමුක්තියෙන් විමුක්තිඤාණ දර්ශනයෙන් අභිභවනය කරන සේක් ද, උන්වහන්සේට තුල්‍යයකු පමණ කළ හැක්කකු නොමැති ද එනිසා ම උන්වහන්සේ අතුල්‍ය, අප්‍රමෙය්‍ය, අනුත්තර, රාජාතිරාජ, දේවාතිදේව, ශක්‍රාතිශක්‍ර, බ්‍රහ්මාතිබ්‍රහ්ම නම් වන සේක. එනිසා කියන ලදී. 'මහණෙනි, දෙවියන් සහිත ලෝකයෙහි -පෙ- දෙවි මිනිසුන් සහිත ලෝකයෙහි තථාගත

තෙමේ අභිභවන කළ නොහැකිය, අනභිභවනීය වේ. සියල්ල දක්නේය, සියල්ල තම විෂයෙහි පවත්නේ වේ, එනිසා තථාගත යැයි කියනු ලැබේ. එහි මෙසේ පද සිද්ධිය දතයුතුයි. අගද වැනි වූයේ අගදෝ නම්. ඒ කවරෙක් ද? දේශනා විලාශයෙන් ද පිනට උත්සාහවත් කිරීමෙහි ද උන්වහන්සේ, මහානුභාව සම්පන්න වෛද්‍යවරයෙකු දිව්‍ය ඖෂධයෙන් සර්පයකු මැඬපවත්වන්නාක් මෙන් දෙවියන් සහිත සියලු පරප්‍රවාදී ලෝකයා අභිභවනය කරන සේක. මෙසේ සියලු ලෝකය අභිභවනයෙහි තථ ලක්ෂණය ඇත්තේනුයි, සත්‍ය වූ විපරීත නොවූ දේශනා විලාශමය වූ ද පුණ්‍යමය වූ ද අගදය (බෙහෙත) මොහුට ඇත්තේනුයි ද කාරයට ත කාරය කොටැ, තථාගත (පද සිද්ධිය වූ බව) දතයුතුයි. මෙසේ අභිභවන අර්ථයෙන් තථාගත නම් වන සේක.

තව ද තථා+ආගතෝ යන්නෙන් ද තථාගත වේ. තථං+ගතෝ යන්නෙන් ද තථාගත වේ. මෙහි ගතෝ යනු අවගත, අතීත, පත්ත, පටිපන්න යන අර්ථයන්හි වේ. එහි මුළු ලොවම තීරණ පරිඥාවෙන් තත් වූ පරිදිම අවබෝධ කළේනුයි (අවගතෝ) තථාගත නම්. ලෝක සමුදය ප්‍රහාණ පරිඥාවෙන් ඉක්මවන ලද්දේනුයි (අතීතෝ) තථාගත නම්. ලෝක නිරෝධය සාක්ෂාත් කරගැනීමෙන් තත් වූ පරිදිම පැමිණියේ නුයි (පත්තෝ) තථාගත නම්, ලෝකනිරෝධගාමිනී ප්‍රතිපදාවට තත්වාකාරයෙන් ම පිළිපන්නේනුයි (පටිපන්නෝ) තථාගත නම්. එහෙයින් භාග්‍යවතුන් වහන්සේ මෙසේ වදාළ සේක. 'මහණෙනි, තථාගතයන් විසින් ලෝකය අවබෝධ කරන ලදී. ලෝකයෙන් තථාගතයන් වහන්සේ වෙන්වූයේ වෙති. මහණෙනි, ලෝක සමුදය තථාගතයන් වහන්සේ විසින් අවබෝධ කරන ලදී. ලෝක සමුදය තථාගතයන්ට ප්‍රහීණ වූයේ වේ. මහණෙනි, ලෝක නිරෝධය තථාගතයන් වහන්සේ විසින් අවබෝධ කරන ලදී. තථාගතයන් වහන්සේ ලෝකනිරෝධය සාක්ෂාත් කරගත් සේක. මහණෙනි, ලෝකනිරෝධගාමිනී ප්‍රතිපදාව තථාගතයන් වහන්සේ විසින් අවබෝධ කරන ලදී. තථාගතයන් වහන්සේ විසින් අවබෝධ කරන ලදී. තථාගතයන් වහන්සේ ලෝකනිරෝධය සාක්ෂාත් කරගත් සේක. මහණෙනි, ලෝක නිරෝධගාමිනී ප්‍රතිපදාව තථාගතයන් වහන්සේ විසින් අවබෝධ කරන ලදී. තථාගතයන් වහන්සේ ලෝකනිරෝධගාමිනී ප්‍රතිපදාව වඩන ලදී. මහණෙනි, දෙවියන් සහිත ලෝකයේ -පෙ- යමක් වේද ඒ තථාගතයන් වහන්සේ විසින් මනසින් පුරුදු පුහුණු කරන ලද සියල්ල මැනවින්

උන්වහන්සේ අවබෝධ කරගත් සේක. එනිසා තථාගත නම් වෙති.' තථාගත පදයෙහි මෙසේ ද අර්ථ දතයුතුයි. මෙය ද තථාගත බව දැක්වීමෙහි මුඛමාත්‍රයක් පමණි. සර්වප්‍රකාරයෙන් ම තථාගතයන් වහන්සේගේ තථාගත බව තථාගතයන් වහන්සේ කෙනෙකුම වර්ණනා කරන්නේ ය. සියලු බුදුවරු තථාගත ගුණයෙන් ද සම සමවන හෙයින් සියලු බුදුවරුන්ට සාධාරණ වශයෙන් 'තථාගතො' යැයි කියන ලදී.

අරහනෙනා කෙලෙසුන් කෙරෙන් දුරු වූ හෙයින්, කෙලෙස් සතුරන් ද සංසාර චක්‍රයෙහි අරයන් ද නැසූ හෙයින් ප්‍රත්‍යාදිය ලැබීමට සුදුසුවන හෙයින් රහසින්වත් පව් නොකරන හෙයින් තථාගතයන් වහන්සේ අරහං නම් වන සේක. ඒ භාග්‍යවතුන් වහන්සේ සියලු කෙලෙසුන්ගෙන් දුරු වූ සේක. දුරින් ම දුරු වූ සේක. ආර්ය මාර්ගයෙන් වාසනා ගුණ සහිත ක්ලේශයන් නැසූ හෙයින්, කෙලෙසුන්ගෙන් දුරු වූ හෙයින් අරහං නම් වන සේක.

සො තතො ආරකා නාම යසස යෙනා සමංගිතා
අසමංගී ච දොසෙහි නාථො තෙනාරහං මතො

යම් කෙනෙකුන්ගේ කිසිම වස්තුවක් හා සමග නොබැඳුණු බවෙක් වේ ද, ඒ නාථයන් වහන්සේ එම හේතුවෙන් 'ආරකා' (දුරින් සිටියේ) නම් වන සේක. දෝෂයන්ගෙන් ද විනිර්මුක්ත වූ (ලෝක) නාථයන් වහන්සේ එහෙයින් අර්හත් යයි දන්නා ලද සේක.

කෙලෙස් නමැති සතුරෝ ද මොවුන් විසින් මාර්ග ඥානයෙන් නසන ලද්දාහු යි, සතුරන් නැසූ හෙයින් අර්හත් නම් වන සේක.

යසමා රාගාදි සංඛාතා සබ්බෙපි අරයො හතා
පඤ්ඤාසත්ථෙන නාථෙන තසමාපි අරහං මතො

යම්හෙයකින් රාගාදී සංඛ්‍යාත වූ සියලු ම කෙලෙස් සතුරෝ ඒ නාථයන් වහන්සේ විසින් ප්‍රඥා නමැති සැතින් නසන ලද්දාහුද එහෙයින් ද අර්හත් නම් වන සේක.

අවිද්‍යා, භව තෘෂ්ණා යන මෙයින් නිර්මිත වූ නාභියක් ඇති, පුණ්‍යාදී අභිසංස්කාර නමැති අර සහිත ජරාමරණ නමැති නිම්වළලු ඇති ආසව සමුදයෙන් සැදී අක්ෂයෙන් විද ත්‍රිභව නැමති රථයෙහි යොදන ලද අනාදිමත් කාලයක් පවත්නා යම් මේ සංසාර නැමති චක්‍රයක් වේද ඒ චක්‍රයෙහි සියලු අරයෝ මොවුන් විසින් බෝධිමූලයෙහි දී ශීල නම් පොළොවෙහි වීර්ය නම් වූ පාවලින් සිට, ශ්‍රද්ධා නම් අතින් කර්ම ක්ෂය කරන සුලු නුවණ නැමති පොරවෙන් ගසා සියලු අරයන් සිඳලූ බැවින් ද අර්හත් නම් වන සේක.

අරා සංසාර චකකසස හතා ඤාණාසිනා යතො
ලොකනාථෙන තෙනෙව අරහනති පවුච්චතී

යම්හෙයකින් ලෝකනාථයන් වහන්සේ විසින් ඥාන නැමති කඩුවෙන් සංසාර නැමති චක්‍රයෙහි අරයෝ සිඳින ලද්දාහු ද, එහෙයින් උන්වහන්සේට අර්හත් යැයි කියනු ලැබේ.

අග්‍ර දක්ෂිණාර්හ වන හෙයින් චීවරාදී සිවුපසය ද පූජා විශේෂයන් ද ලැබීමට සුදුසු වෙති. එහෙයින් ම තථාගතයන් උපන් කල්හි යම්කිසි මහේශාඛ්‍ය දේව මනුෂ්‍ය කෙනෙක් වෙත් ද ඔවුහු අන්‍ය තීර්ථකයන් වෙත පූජාවන් නො කෙරෙති. ඒ එසේමැයි, සහම්පති නම් බ්‍රහ්ම තෙමේ මේරු පර්වතය පමණ වූ රුවන් දාමයකින් තථාගතයන් වහන්සේ පිදීය. අන් දෙවියෝ ද බිම්බිසාර-කෝසලාදී රජවරු ප්‍රධාන මනුෂ්‍යයෝ ද ශක්ති පමණින් උන්වහන්සේට පිදූහ. අශෝක මහරජ තෙමේ පිරිනිවියා වූ ද භාග්‍යවතුන් වහන්සේ උදෙසා සයානූකෙළක් ධනය වැයකොට මුළු දඹදිව් තලයෙහි අසූහාර දහසක් විහාරයන් කරවීය. අන්‍ය වූ පූජා විශේෂයන් ගැන කවර කතාවක් ද?යි ප්‍රත්‍යයන්ට සුදුසුවන හෙයින් අර්හත් නම් වන සේක.

පූජා විසෙසං සහපච්චයෙහි යසමා අයං අරහති ලොකනාථො
අත්‍ථානුරූපං අරහනති ලොකෙ තසමා ජිනො අරහති නාමමෙතං

යම්හෙයකින් මේ ලෝකනාථයන් වහන්සේ ප්‍රත්‍යයන් සහිත වූ පූජා විශේෂයන්ට සුදුසු වෙත් ද එහෙයින් ඒ ජිනේන්ද්‍රයන් වහන්සේ මේ ලෝකයෙහි අන්වර්ථවත් වූ අරහං යන මේ නාමයට සුදුසු වෙති.

තවද ලෝකයෙහි යම්කිසි පණ්ඩිතමානී වූ අඥාන කෙනෙක් අපකීර්තියට බියෙන් රහසිගතව පව් කෙරෙත් ද එනමුත් මේ භාග්‍යවතුන් වහන්සේ කවර කලෙකවත් එසේ නොකරති. පව් කිරීමෙහි රහස් නැති හෙයින් ද අර්හත් නම් වන සේක.

යස්මා නත්ථි රහො නාම පාපකමෙමසු තාදිනො
රහාභාවෙන තෙනෙස අරහං ඉති විස්සුතො

එවන් (තාදී ගුණ ඇති) භාග්‍යවතුන් වහන්සේට යම්හෙයකින් පව්කම්හි රහස් නැත්තේ ද, එසේ රහස් නැති බැවින් ද උන්වහන්සේ අරහං (අර්හත්) නමින් ප්‍රකට වූ සේක.

මෙසේ සර්වප්‍රකාරයෙන් ම

ආරකත්තා හතත්තා ච කිලෙසාරීන සො මුනී
හතසංසාර චකකාරො පචචයාදීනචාරහො
න රහො කරොති පාපානි අරහං තෙන පවුචචතී

ඒ මුනිවරයන් වහන්සේ කෙලෙස් සතුරන්ගෙන් දුරු වූ හෙයින් ද එම කෙලෙස් සතුරන් නැසූ හෙයින් ද සංසාර චක්‍රයෙහි අරයන් සිඳ දමා ප්‍රත්‍යයාදීනට සුදුසු වූවාහු ද රහසින්වත් පව් නොකරන්නාහු ද වෙති. එනිසා උන්වහන්සේ අරහං නම් වන සේක.

සියලු බුදුවරු අරහත් ගුණයෙන් ද සම සම වන බැවින් සියලු බුදුවරුන්ට සාධාරණ වශයෙන් 'අරහන්තො' යැයි කියන ලදී.

සම්මා සම්බුද්ධා යනු සියලු ධර්මයන් තමන් වහන්සේම මනාකොට අවබෝධ කළ හෙයින් සම්මා සම්බුද්ධ නම් වන සේක. ඒ එසේමැයි, තථාගතයන් වහන්සේ සියලු ධර්මයන් අවබෝධ කළ සේක් සම්මා සම්බුද්ධයහ, මැනවින් දතයුතු ධර්මයන් තමන්වහන්සේම මැනවින් අවබෝධ කළහ. පිරිසිඳ දතයුතු ධර්මයන් පිරිසිඳ දතයුතුයයි දත්හ. පහකළ යුතු ධර්මයන් පහකළ යුතු යයි දත්හ. සාක්ෂාත් කටයුතු ධර්මයන් සාක්ෂාත් කටයුතුයැයි දත්හ. වැඩිය යුතු ධර්මයන් මැනවින් වැඩිය යුතුයැයි දත්හ. එනිසා කීහු:-

අභිඤ්ඤෙය්‍යං අභිඤ්ඤාතං භාවෙතබ්බඤ්ච භාවිතං
පහාතබ්බං පහීනමෙම තසමා බුද්ධොසමී බ්‍රාහමණාතී

'බ්‍රාහ්මණය, මවිසින් මනාව දතයුතු ධර්ම මනාව දන්නා ලද්දේය. වැඩිය යුතු ධර්ම මනාව වඩනා ලද්දේය. පහකළයුතු ධර්ම මැනවින් පහකරන ලද්දේය. එහෙයින් මම බුද්ධ නම් වෙමි.'

නැතහොත් 'චක්ඛුරායතනය දුකකැ'යි යන දුඃඛ සත්‍යය ද එම චක්ඛුරායතනයට මුල් වූ හේතු වශයෙන් උත්පාදක පූර්ව තෘෂ්ණා වන සමුදය සත්‍යය ද ඒ දෙකෙහි ම නොපැවැත්ම වන නිරෝධ සත්‍යය ද එම නිරෝධය ප්‍රතිවේධ කිරීමේ ප්‍රතිපත්ති මාර්ගය වන මාර්ග සත්‍යයදැයි මෙසේ එක් එක් පදයෙන් නිර්ධාරණය වන (වෙන්කොට දැක්වෙන) සියලු ධර්මයන් මනාකොට තමන් ම අවබෝධ කළහ. සෝත - ඝාන - ජිව්හා - කාය - මනෝ යන ආයතනයන් කෙරෙහි ද මෙම නය වේ. මෙනයින් ම රූපාදී වූ ෂඩායතනයන් ද චක්ඛු විඤ්ඤාණාදී ෂඩ් විඤ්ඤාණයන් ද චක්ඛු සම්ඵස්සාදී ෂට් ස්පර්ශයන් ද චක්ඛු සම්ඵස්සාදියෙන් හටගත් ෂඩ් වේදනාවන් ද රූපතෘෂ්ණාදී ෂට් තෘෂ්ණාවන් ද රූප විතක්කාදී ෂඩ් විතර්කයන් ද රූපවිචාරාදී ෂඩ් විචාරයන් ද රූපස්කන්ධාදී පංච ස්කන්ධයන් ද දස කසිණයන් ද දස අනුස්සතීන් ද උද්ධුමාතක සංඥාදී වශයෙන් එන දස අසුභ සංඥාවන් ද කේශාදී වූ දෙතිස් කුණප කොට්ඨාස පිළිබඳ වූ ද්වත්තිංසාකාරය ද ද්වාදශායතනයන් ද අටළොස් ධාතූන් ද කාමභවාදී නව භවයන් ද ප්‍රථම ධ්‍යානාදී වූ චතුර් ධ්‍යානයන් ද මෛත්‍රී භාවනාදී වූ අප්පමඤ්ඤා සතර ද අරූප සමාපත්ති සතර ද ප්‍රතිලෝම වශයෙන් ජරාමරණාදිය හා අනුලෝම වශයෙන් අවිද්‍යාදිය දැයි යන පටිච්ච සමුප්පාදංගයන් ද යෙදිය යුතුයි. එහි එක් පදයක යෝජනා ක්‍රමය මෙසේ ය. ජරාමරණ දෙක දුඃඛ සත්‍යයයි. ඉපදීම සමුදය සත්‍යයයි. මේ දෙකෙහි ම නැවැත්ම නිරෝධ සත්‍යයයි. නිරෝධය දැනගැනීමට හේතුවන ප්‍රතිපදාව මාර්ගය සත්‍යයයි' යනුවෙන් මෙසේ එක් එක් පදය ගෙන බැලීමෙන් සියලු ධර්මයන් තමන් ම මනාකොට අවබෝධ කළහ. තත්වාකාරයෙන් දත්හ. විනිවිද දත්හ. එහෙයින් මනාකොට (සම්මා) තමන්ම (සාමඤ්ච) සියලු ධර්මයන් අවබෝධ කළ හෙයින්, දැනගත් හෙයින්, තත්වාකාරයෙන් දත් හෙයින් සම්මා සම්බුද්ධ නම් වන සේක. යම්කිසි අවබෝධ කළයුතු (නෙය්‍ය) දෙයක් වේනම් ඒ සියල්ල මැනවින් අවබෝධ කරගත් හෙයින් ද සම්මා සම්බුද්ධ නම් වෙති. මෙම පදයන්ගේ

විභාගය මතුයෙහි විස්තර වන්නේය. සියලු බුදුවරු සම්මා සම්බුද්ධ ගුණයෙන් ද සම සම වන බැවින් සියලු බුදුවරුන්ට සාධාරණ වශයෙන් 'සම්මා සම්බුද්ධා' යැයි කියන ලදී.

මොනෙය්‍යෙන යනු ඒකාන්තයෙන් මොනෙය්‍ය ප්‍රතිපදාව නම් වූ මාර්ග ඤාණ මොනෙය්‍ය භාවයෙන් මුනි නම් වේ. මෙහිදී වනාහි තුෂ්ණීම්භාවය (නිශ්ශබ්දව සිටීම) සඳහා මොනෙය්‍යෙන යනුවෙන් කියන ලදී.

මූළ්හරූපෝ යනු හිස් වූ ස්වරූප ඇති. **අවිද්‍දසූ** යනු නුවණ නැති. මෙබඳු වූ නිශ්ශබ්ද වූවහු මුනි නම් නොවෙති. නැතහොත් මොනෙය්‍යමුනි නම් වෙති. හිස්බව වනාහි නොදන්නා අඥානකම ම වේ යන අර්ථයි. **යෝ ච තුලංව පග්ගය්හ** යනු යම්සේ තරාදියක් ගෙන සිටි තැනැත්තෙක් අතිරික්ත දෙයක් වේනම් එය ඉවත්කරයි. අඩුවක් වේනම් එය දමා පුරවයි ද, එසේ ම යමෙක් අතිරික්ත (වැඩි වූ) දෙයක් ඉවත් කරන්නාක් මෙන් පාපයන් ඉවතලයි. දුරුකරයි. අඩු වූවක් පුරවන්නාක් මෙන් කුසලයන් සම්පූර්ණ කරයි. මෙසේ ද වනාහි කරන්නා වූ ඒ මුනිතෙම සීල සමාධි ප්‍රඥා විමුත්ති විමුත්තිඤාණ දර්ශන සංඛ්‍යාත වූ උතුම් උතුම් කුසල ධර්මයන් ම ගෙන, පාපී වූ අකුසල ධර්මයන් දුරුකරයි ද එනිසා හෙතෙම මුනි නම් වේ යන අර්ථයි. **තෙන සෝ මුනි** හෙතෙම කවර හෙයින් මුනි නම් වේද? 'ඉහත දැක්වූ කාරණයෙන් හෙතෙම මුනි නම් වේ' යන අර්ථයි. **යෝ මුනාති උභෝ ලෝකෙ** යනු යම් පුද්ගලයෙක් මේ ස්කන්ධාදී ලෝකයන් තරාදියකට නංවා මනින්නාක් මෙන්, 'මේ අධ්‍යාත්මික ස්කන්ධය, මේ බාහිර ස්කන්ධයන්ය' ආදී වශයෙන් මේ අර්ථ දෙකින් මනියි. **මුනි තෙන පවුච්චතී** ඒ කාරණයෙන් වනාහි මුනියැයි කියයි යන අර්ථයයි. **අසතඤ්ච** යනාදී ගාථාවේ මේ සංක්ෂිප්තාර්ථයයි.

යමෙක් මේ කුසලාකුසල ප්‍රභේද ඇති, අසත්පුරුෂ ධර්මය ද සත්පුරුෂ ධර්මය ද අධ්‍යාත්මික බාහිර සියලු ධර්මයන් ද මේ මුළු ලෝකයෙහි ප්‍රවිචය ඤාණයෙන් සත්පුරුෂ හා අසත්පුරුෂ වශයෙන් මැනවින් දැන, ඔහු ධර්මය මැනවින් දත් බැවින් ම රාගාදී ප්‍රභේද ඇති සත්විධ සංගතණ්හා දිට්ඨි භේදයෙන් දෙවැදෑරුම් වූ දැල ද ඉක්මවා සිටියේ වේද, හෙතෙම ඒ මොන (මුනි) සංඛ්‍යාත ප්‍රවිචය ඤාණයෙන් යුක්ත වූ බැවින් මුනි නම් වේ. **දෙවමනුසෙසහි පූජිතෝ** යන මෙය ඒ

මුනිවරයාට කෙරෙන ස්තුති වචනයකි. හෙතෙම ආශ්‍රවයන් ක්ෂය කළ මුනිවරයකු වන බැවින් දෙව්මිනිසුන්ගේ පූජාවන්ට සුදුසු වේ. එනිසා මෙසේ කියන ලදී.

සල්ලං යනු මූල පදයයි. **සත්තසල්ලානි** යනු ගණන වෙන්කර දැක්වීමයි. **රාග සල්ලං** යනු රඤ්ජන (අලවයි) අර්ථයෙන් ම රාගය, පීඩා ඇති කරන බැවින්, ඇතුලත විදින බැවින්, ඉවත්කිරීම අසීරු හෙයින් හුලක් වූයේනුයි රාගසල්ල නම්. දොස සල්ලාදියෙහි ද මෙම නය ම වේ. **සල්ලෝ** යනු මූලපදයයි. **අබ්බූළ්හ සල්ලෝ** යනු ඉවත්කළ හුල් ඇති, **උද්ධත සල්ලෝ** උඩට ගෙන නැසූ හුලයි. **සමුද්ධරිත සල්ලෝ** උපසර්ග වශයෙන් කියන ලදී. **උප්පාටිත සල්ලෝ** ඉගිල්ලූ හුලයි. **සමුප්පාටිත සල්ලෝ** උපසර්ග වශයෙන් වූ වෙනසකි. (අර්ථ එකම ය.) **සක්කච්චකාරී** දානාදී කුසල ධර්ම වර්ධනය කිරීමෙන් පුද්ගලයාගේ හෝ දෙය්‍ය ධර්මයේ හෝ සකසා කිරීම් වශයෙන් මනාසේ සැලකිලි ඇතිව කරන්නා වූ යන අර්ථයයි. නිරන්තරයෙන් කරන බැවින් **සාතච්චකාරී** නම්, නොසිට-නොනැවතී කරන බැවින් **අට්ඨිතකාරී** නම්, යම්සේ කුකණ්ටකයා (නපුරු කටුව) මදක් ගොස් මදක් නැවතී සිටියි ද නිරන්තරව නොයයි ද එසේම යම් පුද්ගලයෙක් එක් දිනක් දන් දී පූජාවක් හෝ කර, එසේත් නැතිනම් ධර්මදේශනාවක් අසා හෝ මහණදම් පුරා හෝ කර, එසේත් නැතිනම් ධර්මදේශනාවක් අසා හෝ මහණදම් පුරා හෝ නැවත බොහෝ කාලයකින් එය නැවත කරයි ද නිරන්තරව නොකරයි ද හෙතෙම අසාතච්චකාරී ද අනට්ඨිතකාරී ද නම් වේ. මෙතෙම එසේ නොකරයි යන අරුතින් අට්ඨිතකාරී නම්. **අනොලීන වුත්තිකෝ** නිරන්තරව කිරීම් සංඛ්‍යාත වූ පැතිරීම් භාවයෙන් දුරුවූ ලීනවුත්තික (අප්‍රකට පැවැතුම් ඇති) නොවූයේනුයි අනොලීන වුත්තික නම්. **අනික්ඛිත්ත ඡන්දෝ** කුසල් කිරීමෙහි වීර්ය කැමැත්ත බහා නොතැබූ බැවින් අනික්ඛිත්ත ඡන්ද නම්. **අනික්ඛිත්ත ධුරෝ** යනු වීර්ය ධුරයට ආරෝපනය නොවීමෙන් අනික්ඛිත්තධුර නම්. නොපසුබස්නා සිත් ඇති යන අර්ථයි. **යෝ තස්ථ ඡන්දෝවායාමෝ ච** යනු යමෙක් ඒ කුසල දහම්හි කරනු කැමති වූ ධර්මය නම් ඡන්දය ද ඡන්දෝ ප්‍රයත්න (වෑයම) සංඛ්‍යාත වායාමෝ ද උත්සාහ කිරීම් වශයෙන් **උස්සාහෝ** ද අධික වූ උත්සාහ කිරීම් වශයෙන් **උස්සෝළ්හී** ද, ව්‍යායාමය වනාහි පරතෙරට යෑම් අර්ථයෙනි. උත්සාහය වනාහි පූර්වාංගම වූ අර්ථයෙනි, උස්සෝළ්හී යනු අධිකමාත්‍ර වූ අර්ථයෙනි. **අපපටිවානීච** පසුනොබැසීමයි. නො නැවතීමයි. **සති ච සම්පජඤ්ඤං ච** සිහිකරන්නේනුයි සති නම්.

මනාව දන්නේනුයි සම්පජඤ්ඤ නමි. හාත්පසින් ම, සර්වප්‍රකාරයෙන් ම දනියි යන අර්ථයයි. සාත්‍ථක සම්පජඤ්ඤය, සප්පාය සම්පජඤ්ඤය, ගෝචර සම්පජඤ්ඤය හා අසම්මෝහ සම්පජඤ්ඤය යනුවෙන් මේ සම්පජානයේ ප්‍රභේද දතයුතුයි.

ආතපපං යනු කෙලෙස් තවන වීර්යයයි. **පධානං** යනු උතුම් වීර්යයයි. අධිට්ඨානං යනු කුසල් කිරීමෙහි ප්‍රතිඥා භාවයයි. **අනුයොගො** යනු අනුව යෙදීමයි. **අපපමාදො** යනු නොපමාවීමයි. සිහියෙන් නොවෙන්ව වාසය කිරීමයි. **ඉමං ලොකං නාසිංසතී** යනු මූල පදයයි.

සකත්තභාවං තමාගේ ආත්මභාවයයි. **පරත්ත භාවං** යනු පරලෝකයේ ආත්මභාවයයි. ස්වකීය රූප වේදනාදිය තමාගේ පංචස්කන්ධයෙහි වේ. අනුන්ගේ රූපවේදනාදිය ද පරලොව පංචස්කන්ධයෙහි වේ. **කාමධාතුං** යනු කාම භවයයි. **රූපධාතුං** යනු රූප භවයයි. **අරූපධාතුං** යනු අරූප භවයයි. නැවත ද රූපාරූප වශයෙන් දුක දැක්වීමට කාමධාතු රූපධාතු දෙක එකක් කර, අරූප ධාතුව එකක් කර කියන ලදී.

ගතිවා පිහිටීම් වශයෙන් පංචගතියක් කියන ලදී. **උපපත්තිවා** ඉපදීම් වශයෙන් සිවු යෝනිය (උත්පත්ති ක්‍රම හතර) කියන ලදී. **පටිසන්ධි වා** තුන් භවයෙහි ගැටීම් වශයෙන් ප්‍රතිසන්ධි යැයි කියන ලදී. **භවං වා** කර්ම භව වශයෙනි. **සංසාරං වා** යනු ස්කන්ධාදීන්ගේ නොනැවතී පැවැත්ම වශයෙනි. **වට්ටං වා** ත්‍රෛභූමික වට්ටය නො නසයි යන අර්ථයි.

දෙවැනි සද්ධම්මපජ්ජොතිකා නම් වූ මහානිද්දේසට්ඨකථාවේ
ගුහට්ඨක සූත්‍ර නිර්දේශ වර්ණනාව
නිමියේ ය.

3.

දුට්ඨට්ඨක සූත්‍රයේ පළමු ගාථාවේ අර්ථ පළමුව කියනු ලැබේ. **වදනති** යනු භාග්‍යවතුන් වහන්සේට ද භික්ෂු සංඝයාට ද උපවාද කරති. **දුට්ඨමනාපි එකෙ අථොපි වෙ සචවමනා එකෙ** යනු ඇතැම් දුෂ්ඨ සිත් ඇත්තෝ, ඇතැම් එසේ සංඥා ඇත්තෝ වී, දුෂ්ඨ සිතැති තීර්ථකයන්ගේ බස් අසා ඒවා අදහන්නෝ, එම දුෂ්ඨයන්ගේ ප්‍රකාශ සත්‍යයැයි සිතන්නෝ යන අර්ථයි. **වාදං ච ජාතං** මේ ආක්‍රෝශවාදය උපන්නේය. **මුනි නො උපෙති** කාරකයකු නැති බැවින් ද නොකිපෙන බැවින් ද බුද්ධ මුනි වෙත නො පැමිණෙයි. **තසමා මුනී නත්ථි බීලො කුහිඤ්චි** මේ කාරණයෙන් මේ බුද්ධ මුනිවරයාට රාගාදී බීලයන් නැත. බීලයන් කොයින් ද?යි දතයුතුයි.

දුට්ඨමනා යනු උපන්නා වූ දෝෂයන්ගෙන් දූෂිත වූ සිත් ඇති බැවින්. **විරුද්ධමනා** ඒ කෙලෙසුන් මගින් කුසල් දොර වසා කුසලින් සිත් වැලැක්වූ බැවින් **පටිවිරුද්ධමනා** උපසර්ග යොදා පදය වැඩිකරන ලදී. **ආහතමනා** පටිඝයෙන් එළවන ලද සිත මොවුන්ට ඇත්තේනුයි ආහතමනා නම්, **පචචාහතමනා** උපසර්ග යෙදීමක් පමණි. **ආඝාතිතමනා** විහිංසා (හිංසා) කිරීම් වශයෙන් ආඝාත (තරහ) සිතක් මොවුන්ට ඇත්තේනුයි ආඝාතිත මනා නම්. **පචචා ඝාතිතමනා** යනු උපසර්ග යොදා පදය වැඩිකිරීමකි. නැතහොත් ක්‍රෝධ වශයෙන් **දුට්ඨමනා**. වෛර කිරීම් වශයෙන් **පදුට්ඨමනා**. මකුවීම් වශයෙන් **විරුද්ධමනා**. අනුන්ගේ දොස් කීම් වශයෙන් **පටිවිරුද්ධමනා**. ද්වේෂ වශයෙන් **ආහතපචචාහතමනා**. ව්‍යාපාද වශයෙන් **ආඝාතිත පචචාඝාතිතමනා**. ප්‍රත්‍යයන්ගේ නොලැබීමෙන් **දුට්ඨමනා පදුට්ඨමනා**. අයස වශයෙන් **විරුද්ධමනා පටිවිරුද්ධමනා** ගැරහීම් වශයෙන් **ආහතපචචාහතමනා**. දුක් වේදනාවෙන් යුක්ත වූ බැවින් **ආඝාතිත පචචාඝාතිත මනාති** මෙසේ ද ඇතැමෙක් අර්ථ කියති. **උපවදනති** යනු ගර්හා (නින්දා) උපදවති. **අභූතෙන** යනු විද්‍යමාන නොවීමෙන්, අභූත වූ **සද්දහනතා** යනු ප්‍රසාද වශයෙන් ශ්‍රද්ධාව උපදවමින්, **ඔකපෙපනතා** යනු සම්ප්‍රසාදන වශයෙන් සනිටුහන් කොට ඔවුන්ගේ කථාව ඉවසමින් **සචචමනා** යනු සත්‍යයැයි සිතමින් **සචච සඤ්ඤිනො** යනු සත්‍යය යන සංඥා ඇතිව. **තථමනා** විපරීත නොවූවක්ය යන සිතින්. **භූතමනා** සිදුවූවක්ය යන සිතින්. **යථාවමනා** යනු නිශ්චල සිතින්. **අවිපරීතමනා** යනු නිශ්චය කරගනිමින්.

එහි **සච්චමනා සච්චවඤ්ඤිනො** යනු සත්‍යවාදී ගුණයයි. **තථමනා තථවඤ්ඤිනො** යනු සත්‍යවඤ්ඤී ගුණයයි. **භූතමනා භූතවඤ්ඤිනො** යනු චෙතොභූත ගුණයයි. **යථාවමනායථාවවඤ්ඤිනො** යන්නෙන් සච්චායික ගුණය ද **අවිපරීතමනා අවිපරීතවඤ්ඤිනො** යන්නෙන් අවිසංවාද ගුණය ද කියන ලදැයි දතයුතුයි.

පරතො සොසො අන්‍යයන්ගේ සමීපයේදී උපන් ශබ්දයයි. **අක්කොසො** යනු ජාති ආදී දශ අක්‍රෝශ වස්තුවෙන් එකකින් ආක්‍රෝශ කිරීමයි. **යො වාදං උපෙති** යම් පුද්ගලයෙක් උපවාදයට පැමිණෙයි ද කාරකොවා කරන ලද දොස් ඇත්තෙක් හෝ. **කතකොධතාය** තරහින් කරන ලද බැවින් **වුච්චමානො** කියනු ලබනුයේ **උපවදීයමානො** දෝෂ උපදවනු ලබන්නේ, **කුප්පති** කෝප කරයි. **බිලජාතතාපි නත්ථි** සිතේ තද බව නැමති සිතේ කිළිටි නම් වූ පටිඝහුල මෙහි උපන්නේනුයි බිලජාතො නම්, එය ඇති බව බිල ජාතතා නම්, එය ද නැත. **නඝනති පඤ්චපි චෙතො බීලා** කාමලෝකයන්හි අවීතරාගීව, රූපලෝකයන්හි අවීතරාගීව ඇතිතාක් බඩපිරෙනතාක් අනුභව කොට සෙය්‍යසුබයෙහි, එස්ස සුබයෙහි හා මිද්ධ සුබයෙහි ඇලී ගැලී වසයි ද, එක්තරා දේව නිකායක් පතාගෙන බඹසර සුරකියි ද, 'මම මේ සීලයෙන් හෝ ව්‍රතයෙන් හෝ තපසින් හෝ බඹසරින් හෝ දෙවියෙක් හෝ වන්නෙමි, අන්‍යතර දෙවියෙක් හෝ වන්නෙමි'යි මෙබඳු වූ සිතුවිලි පහ ද සිතේ තද බව - කිළිටි බව නම් වූ චෙතො බීලයන් ද නැත.

මේ ගාථාව දෙසූ භාග්‍යවතුන් වහන්සේ ආනන්ද තෙරුන්ගෙන් මෙසේ විචාළ සේක. 'ආනන්දය! මෙසේ භික්ෂූන්ට පීඩා කරමින්, දොස් දක්වමින් නින්දා කරන කල්හි ඒ භික්ෂූහු කුමක් කියත් ද?' යනුවෙනි. එවිට ආනන්ද තෙරහු 'භාග්‍යවතුන් වහන්ස! භික්ෂූහු කිසිවක් නොකියති'යි වදාළහ. 'ආනන්දය, මම සිල්වතෙක්මි'යි සැමතැනම නිශ්ශබ්දව නොසිටිය යුතුයි. ලෝකයෙහි කියන්නවුන්ගේ වචනයේ ඇති වැරදි නිවැරදි බව පණ්ඩිතයෝ දැනගනිති. අනුවණයෝ නොදනති'යි දෙසූ බුදුහු 'ආනන්දය, ඒ මිනිස්සු චෝදනා කරන කල්හි ධර්මදේශනා වශයෙන් 'අභූතවාදී නිරයං උපෙති' යන ගාථාව කිවයුතුයි' වදාළහ. ආනන්ද තෙරණුවෝ එම ගාථාව ඉගෙන භික්ෂූන්ට ඇවැත්නි! නුඹලාට මිනිසුන් චෝදනා කරන කල්හි මේ ගාථාවෙන් ප්‍රතිචෝදනා කරවු'යි පවසා ගාථාව භික්ෂූන්ට

ඉගැන්වූහ. භික්ෂූහු එසේ කළහ. නුවණැති මිනිස්සු නිශ්ශබ්ද වූහ. රජතුමා ද රාජපුරුෂයන් සැමතැනම යවා යම් ධූර්ත පිරිසක් තීර්ථකයන්ගෙන් අල්ලස් ගෙන ඇය මරන ලද්දේ ද ඒ සියලු ධූර්තයන් අල්වා නිග්‍රහ කරන ලදී. ඒ පුවත දැනගත් රජු තීර්ථකයන්ට දෝෂාරෝපණය කළේය. ජනයා ද තීර්ථකයන් දැක 'මොවුහු භාග්‍යවතුන් වහන්සේට අපකීර්තියක් ඇතිකළහ'යි ගල්මුල්වලින් ගසති, පස්වලින් ගසති. ආනන්ද තෙරණුවෝ එය දැක බුදුරදුන්ට මෙය දැන්වූහ. භාග්‍යවතුන් වහන්සේ ආනන්ද තෙරුන්ට මේ ගාථාව වදාළ සේක.

'සකං හි දිට්ඨිං -පෙ- වදෙය්‍ය' යන ගාථාවේ අර්ථය. යම් ඒ අන්‍ය තීර්ථකයන්ගේ දෘෂ්ටියක් 'සුන්දරිය මරා ශ්‍රමණ ශාක්‍යපුත්‍රයන්ගේ නුගුණ ප්‍රකාශ කරවා, මේ උපායෙන් ඔවුන්ට ලැබෙන සත්කාර ඉවත් කරවන්නෙමු'යි යනුවෙන් පැවතියේ ද ඒ දෘෂ්ටිය ඔහු කෙසේනම් ඉක්මවන්නේ ද? ඉක්බිති ඒ අයස (අපකීර්තිය) එය නිපදවූ තීර්ථක ජනයා පසුපසම ගියේය. ඒ වැරදි දෘෂ්ටිය ඉක්මවීමට නොහැක. යමෙක් ශාස්වතවාදී වේ ද හෙතෙමේ ද සක්කාය දිට්ඨිය කෙසේනම් ඉක්මවන්නේ ද? ඒ දිට්ඨිච්ඡන්දයෙන් පැමිණවූ ඒ දිට්ඨි රුචිකත්වයෙන් ඇලුණු ඔවුහු තමන්ම සමර්ථයන් යැයි සිතමින් තමන්ම පරිපූර්ණ වූවෝ යැයි සිතමින් ඒ දෘෂ්ටිගතිකයන් නිර්මාණය කරනුයේ යම්සේ දැනගන්නේ ද එසේම එය කියන්නේ ය. **අවණ්ණං පකාසයිත්වා** අගුණ ප්‍රකට කර. **සක්කාරං** සිවුපසය සකසා දීම **සම්මානනං** සිතින් බුහුමන් කිරීම. **පච්චා හරිස්සාම** යනු මෙසේ ලාභාදිය උපදවන්නෙමු යි. **එවං දිට්ඨිකා** යනු මෙවැනි ලබ්ධි ඇති, 'යම්හෙයකින් ඔවුන්ට ලාභාදී සත්කාර උපදවන්නෙමු'යි යන මේ අදහස ඔවුන්ට ඇත. එසේ ම මවිසින් කියූ ආකාර ඇති ධර්මය ද ඇත. මොවුන්ට එය රුචි වේ. එමෙන්ම එය ඉවසයි. මෙසේ ඔවුන්ගේ සිත ස්වභාවයෙන් ම ඇත. මගේ සිත ද එකල්හි ඒ දෘෂ්ටිය වේ. දිට්ඨියත් සමග කැමැත්ත හෝ දිට්ඨිඛන්ති සමග රුචිය හෝ දිට්ඨිඛන්තිරුචි යන ධර්ම සමග ලබ්ධිය හෝ දිට්ඨිඛන්තිරුචි ලබ්ධි යන ධර්ම සමග අජ්ඣාසය හෝ දිට්ඨිඛන්තිරුචිලබ්ධි අජ්ඣාසය යන ධර්ම සමග අධිප්පාය හෝ වේයැයි දක්වනුයේ 'එවං දිට්ඨිකා -පෙ- එවං අධිප්පායෝ' යනාදිය කියන ලදී.

සකං දිට්ඨිං යනු තමාගේ දැක්මයි. දර්ශනයයි. **සකං ඛන්තිං** යනු තමාගේ දැරීමයි. **සකං රුචිං** යනු තමාගේ රුචියයි. **සකං ලද්ධිං** යනු

තමාගේ ලබ්ධියයි. **සකං අජ්ඣාසයං** යනු තමාගේ අදහසයි. **සකං අධිප්පායං** යනු තමාගේ භාවයයි. **අතික්කමිතුං** මනාව ඉක්මවීමට. **අථඛො සොයෙව අයසො ඒකාන්තයෙන් ම ඒ අයස තෙ පචවාගතො** ඔවුන්ගේ පසුපස ආවේය. **තෙ** යනු ඡට්ඨී විභක්ති අර්ථයේ දුතියා විභක්ති වචනයකි. **අථවා** අර්ථයන්ගේ අතරක් දැක්වීමයි. (විකල්පාර්ථ දැක්වීමයි) **සසසතො** නිත්‍ය ධ්‍රුව ස්ථිර වූ. **ලොකො** ආත්මභාවය **ඉදමෙව සචවං මොසමඤ්ඤං** යනු මෙයම සත්‍ය වේ. අන් මත තුච්ඡ (හිස්) වේ. **සමත්තා** යනු සම්පූර්ණය. **සමාදිනනා** යනු මනාව ගන්නා ලද **ගහිතා** ලඟට පැමිණ ගන්නා ලද. **පරාමට්ඨා** සර්වප්‍රකාරයෙන්ම පරාමර්ශනය කොට ගන්නා ලද. **අභිනිවිට්ඨා** විශේෂයෙන් ලබන ලද පිහිට ඇති. **අසසසතො** කියන ලද්දෙහි විපර්යාසයෙන් දතයුතුයි.

අනතවා යනු අන්තයක් සහිත වූ. **අනනතවා** යනු අනන්තවත්ව වැඩෙන **තං ජීවං** යනු ඒ ජීවය ලිංග විපර්යාස කොට කියන ලද්දකි. ජීවය යනු ආත්මය මය. **තථාගතො** යනු සත්ත්වයා. ඇතැමෙක් රහතන් වහන්සේ යැයි කියති. **පරං මරණා** මරණයෙන් පසුව, පරලොවදී යන අර්ථයයි. **න හොති තථාගතො පරම්මරණා** යනු මරණයෙන් පසුව නොවේ. **හොති ච න ච හොති තථාගතො පරම්මරණා** මරණයෙන් පසුව වන්නේ ද නොවන්නේ ද වේ. **නෙව හොති න නහොති තථාගතො පරම්මරණා** යනු උච්ඡේද වශයෙන් නොවේ. තාර්කික වශයෙන් නොවන්නේ ද නොවේ. **සකකායදිට්ඨියා** ආදිය කරණ විභක්ති වචනයි. **අලලීනො** යනු ඒකීභූත වූ. **සයං සමත්තං කරොති** යනු තමාගේ ඌණ (අඩු) භාවයෙන් මුදවා තමා මැනවින් දක්ෂයකු, සමර්ථයකු කරයි.

පරිපුණණං යනු අතිරේක දෝෂයන්ගෙන් මුදවා සම්පූර්ණ කරයි. **අනොමං** යනු හීන වූ දෝෂයන්ගෙන් මුදවා ළාමක නොවූවකු කරයි. අගගං යනාදිය ද එසේමය. **සෙට්ඨං** යනු ප්‍රධාන වූ නිර්දෝෂී වූ. **විසෙට්ඨං** යනු ජ්‍යෙෂ්ඨ වූ. **පාමොක්ඛං** යනු අධික වූ. **උත්තමං** විශේෂයෙන් ශ්‍රේෂ්ඨ වූ. **පවරං කරොති** යනු අතිරේක වශයෙන් උත්තමයෙක් කරයි. නැතහොත් ආසය දෝෂයන්ගෙන් මිදීමෙන් අගගං අග්‍ර වේ. සංකිලේස දෝෂයන්ගෙන් මිදීමෙන් **සෙට්ඨං** ශ්‍රේෂ්ඨ වේ. උපක්ලේශ දෝෂයන්ගෙන් මිදීමෙන් **විසෙට්ඨං** විසෙට්ඨ වේ. සත්වැදෑරුම් දෝෂයන්ගෙන් මිදීමෙන් **පාමොක්ඛං** පාමොක්ඛ නම් වේ. මධ්‍යම දෝෂයන්ගෙන් මිදීමෙන් **උත්තමං** උත්තම

වේ. උත්තම, මධ්‍යම දෝෂයන්ගෙන් මිදීමෙන්. **පවරං** පවරයකු කරන්නේ නුයි ඇතැමෙක් වර්ණනා කරති.

අයං සත්‍ථා සබ්බඤ්ඤූ යනු මේ අපගේ ශාස්තෘන් වහන්සේ සියල්ල දන්නා නිසා සර්වඥ නම් වන සේක. **අයං ධම්මෝ සුආක්ඛාතෝ** මේ අපගේ ශ්‍රී සද්ධර්මය මැනවින් දෙසන ලදී. **අයං ගණෝ සුපටිපන්නෝ** මේ අපගේ සංඝරත්නය මැනවින් පිළිපන්නේය. **අයං දිට්ඨී භද්දිකා** මේ අපගේ ලබ්ධිය සුන්දරය. **අයං පටිපදා සුපඤ්ඤත්තා** මේ අපගේ පූර්වභාග වූ අත්තන්තප ආදී ප්‍රතිපදාවන් මැනවින් පනවන ලදී. **අයං මග්ගෝ නියාණිකෝ** යනු මේ අපගේ නිවනට, මෝක්ෂයට යොමු වූ මාර්ගය නෛර්යාණිකය. මෙසේ තමන් සමර්ථයකු කරයි. **කථෙය්‍ය** යනු ලෝකය ශාස්වතය ආදී වශයෙන් කියන්නේ ය, මෙය ම ඇත්තයි සෙස්ස බොරුයැයි දක්වන්නේ ය. ලෝකය අන්තවත් යැයි ව්‍යවහාර කරන්නේය. වන්නේ ද නොවෙන්නේ ද වේ යනාදී ලෙස නානාවිධව ගන්වන්නේය.

ඉක්බිති රජතුමා සත්දිනකට පසු (බුදුරදුන්ට හා සංඝයාට එල්ල වූ) ඒ කුණපය (චෝදනාව) ඉවත්කරවා සවස් කාලයෙහි විහාරයට ගොස් භාග්‍යවතුන් වහන්සේට වැඳ මෙසේ කීවේය. 'ස්වාමීනි! මෙවැනි අපකීර්තියක් ඇති වූ කල්හි මාහට දැන්විය යුතු නොවේ ද?' යනුවෙනි. රජතුමා මෙසේ පැවසූවිට භාග්‍යවතුන් වහන්සේ "මහරජතුමනි! 'මම සිල්වතෙක්මි'. සීල සම්පන්නයෙක්මි'යි අනුන්ට දැන්වීම ආර්යයන්ට සුදුසු නොවන්නකි"යි වදාළහ. ඒ අර්ථෝත්පත්ති කොටගෙන "යො අත්තනො සීලවතානී"යි යනාදී අවශේෂ ගාථා වදාළ සේක.

එහි **සීලවතානි** යනු ප්‍රාතිමෝක්ෂාදී සීලයන් ද ආරඤ්ඤකාදී ධුතංග ධර්මයන් ද වේ. **අනනුපුට්ඨෝ නොවිචාළේ. පාවදා** කියයි. **අනරියධම්මං කුසලාතමාහු යො ආතුමානං සයමෙව පාවා** යනු 'යමෙක් මෙසේ තමා පිළිබඳව තමන්ම කියයි ද ඔහුගේ ඒ වාදය අනාර්ය ධර්මයකි'යි කුසලයෝ මෙසේ කියති. **අත්ථි සීලං වෙව වතඤ්ච** යනු සීලන අර්ථයෙන් සීලයක්ද ඇත. සමාදාන අර්ථයෙන් ව්‍රතයක් ද ඇත. ව්‍රතය සීලය නොවේ යැයි කී අර්ථයෙන් ව්‍රතයක් ඇත. එය සීලය නොවේ. **කතමං** යනු කථෙතුකම්‍යතා පුච්ඡාවයි. (කරුණු දක්වනු කැමති ප්‍රශ්න කිරීමයි.) **ඉධ භික්ඛූ සීලවා** යනාදිය කියූ පරිදිමය. **සංවරත්ථෙන** යනු සංවර කිරීම් අර්ථයෙන් වීතික්කම

ද්වාරය වැසීම් අර්ථයෙන්. **සමාදානහේතුන** යනු ඒ ඒ ශික්ෂාපද මැනවින් ගන්නා වූ අර්ථයෙන්.

ආරඤ්ඤකඞගං යනු අරඤ්ඤයෙහි වාසය කිරීම මොහුට ඇත්තේනුයි ආරඤ්ඤක නම්. ඔහුගේ අංගය ආරඤ්ඤකංගයයි. **පිණ්ඩපාතිකඞග** යනු භික්ෂා සංඛ්‍යාත ආමිස පිණ්ඩයන්ගේ පතනය පිණ්ඩපාතයයි. අනුන් විසින් දෙන ලද පිණ්ඩයන් පාත්‍රයේ වැටීම යැයි කියන ලදී. ඒ පිණ්ඩපාතය රැස්කරයි. ඒ ඒ කුලයට ගොස් සොයයි නුයි පිණ්ඩපාතික නම්. පිණ්ඩයන්ගේ වැටීමට හෝ ඒකාන්තයෙන් යන්නේනුයි පිණ්ඩපාතී නම්. වැටීමට යනු හැසිරීමටයි. පිණ්ඩපාතී පුද්ගලයා ම පිණ්ඩපාතිකො නම්. ඔහුගේ අංගය පිණ්ඩපාතිකඞගයයි. අංගය යනු කාරණයයි. එහෙයින් යම් සමාදානයකින් ඔහු පිණ්ඩපාතිකයෙක් වේද ඔහුට මේ තවත් නමෙකියි දතයුතුයි.

මේ නයින්ම මංමාවත් සොහොන් කසල ගොඩවල් පස්ගොඩවල් යනාදී යම්කිසි පාංශූන්ගේ මස්තකයේ සිටි බැවින්, ඒ පාංශූන්ගෙන් උඩට නැගුණු හෙයින් කුලයක් (ඉවුරක්) මෙන් වූයේනුයි **පංසුකූලං** පංසුකූල නම්. නැතහොත් පස් මෙන් නින්දිත බවට ගියේනුයි පංසුකූල නම්, පිළිකුල් බවට යන්නේ ය යන අර්ථයයි. මෙසේ ලැබූ නම් ඇති පංසුකූලය දැරීමද පංසුකූල නම්. පංසුකූලය දැරීම මොහුගේ ස්වභාවය වෙති යි පංසුකූලික නම්. පංසුකූලිකයාගේ අංගය **පංසුකූලිකංග** නම්. මෙසේම සඟල සිවුරය, පොරෝනා සිවුරය, අඳනකඩය යන තුන් සිවුරු පමණක් දැරීම මොහුගේ ස්වභාවය වෙතියි තෙචීවරික නම්. ඒ තෙචීවරිකයාගේ අංගය **තෙචීවරිකඞගං** චේවරිකංගයයි.

දාන යනු සිඳීමයි. දානයෙන් ඉවත්වූයේ අපදානයයි. අපදාන සහිත වූයේ සපදානයයි. සිඳීම නැතිව, අතරක් නැතිව, ගෙපිළිවෙලින් යන අර්ථයයි. සපදානයෙහි හැසිරීම මොහුගේ ස්වභාවය වූයේනුයි සපදානචාරී නම්, සපදානචාරීයා ම සපදානචාරික නම්. ඔහුගේ අංගය **සපදානචාරිකඞගං** සපදානචාරිකංග නම්. ඛලු යනු ප්‍රතිශේධාර්ථයේ නිපාතයකි. අහරකිස නිමවීමෙන් පසු ලද අහර පච්ඡාභත්ත නම්. පච්ඡාභත්තය වැළඳීම පච්ඡාභත්ත භෝජන නම්. එම පච්ඡාභත්ත භෝජනය පච්ඡාභත්ත යයි ගෙන, පච්ඡාභත්තය මොහුගේ ස්වභාවය වෙති'යි පච්ඡාභත්තික නම්. පච්ඡාභත්තික නොවූයේ බලුපච්ඡාභත්තික

නමි. සමාදන්වීමෙන් ප්‍රතික්ෂිප්ත අතිරේක භෝජනයට මේ නමෙකි. ඔහුගේ අංගය **බලුපච්ඡාභත්තිකඞගං** බලු පච්ඡාභත්තිකංග නමි. වැදහෙවීම, පිළිකෙව් කොට හිඳීම් පමණක් විහරණය කොට ඇත්තා, එවැනි ස්වභාව ඇත්තා නේසජ්ජික නමි. ඔහුගේ අංගය **නෙසජ්ජිකංගං** නමි. යම් සෙනසුනක් පමුණුවන ලද්දේ ද එය යථාසන්‍ථත නමි. මෙය ඔබට පැවරේනුයි පළමුකොට පමුණුවන ලද සෙනසුනට මේ තවත් වචනයකි. එම යථා සන්‍ථත සෙනසුනෙහි විසීම මොහුගේ ස්වභාවය වෙතියි යථාසන්‍ථතික නමි. ඔහුගේ අංගය **යථාසන්‍ථතිකංගං** නමි.

සියලු ම මේ ධුතංග ධර්ම සමාදන්වීම් වශයෙන් කෙලෙස් සොලවාලන හෙයින් ධුත නම් ඇති, භික්‍ෂුවගේ අංග වෙති යි, කෙලෙස් සොලවාලන හෙයින්, ධුත යැයි ව්‍යවහාරයට පත් ඥානය මොහුට අංග වීයැයි හෝ ධුතංග නම් වේ. නැතහොත් ප්‍රතිපක්‍ෂ වූ ක්ලේශයන් කම්පා කරවන හෙයින් ධුත නම් ද වේ. ශීලාදී ප්‍රතිපත්තියට අංග වෙතියි ධුතංග නම් ද වේ. මෙසේ පළමුකොට වචනාර්ථ වශයෙන් මෙහි විනිශ්චය දතයුතුයි. මේ සියලු ධුතංගයෝ සමාදාන චේතනාව ලක්‍ෂණ කර ඇත. කියන ලදමැයි. 'යමෙක් සමාදන් වේද හේ පුද්ගලයෙකි. යමක් කරණ කොටගෙන සමාදන් වේද එය ධුතංග යයි. යමක් පිළිකෙව් කෙරේ ද එය වස්තුයි.' සියලු ධුතංගයෝ තෘෂ්ණා විධ්වංසනය රසය හෙවත් කෘත්‍යකොට ඇත්තාහුය. තෘෂ්ණා රහිත බව ආසන්න ඵලය කොට ඇත්තාහුය. අල්පේච්ඡතාදි ආර්ය ධර්මයන් ආසන්න කාරණය කොට ඇත්තාහුය. මේ ආකාරයෙන් ලක්‍ෂණාදී විනිශ්චය දතයුතුයි.

විරිය සමාදානමපි වීර්ය ග්‍රහණය ද කාමං ඒකාන්තයෙන් යන අර්ථ ඇති නිපාතයකි. **තචො ච නහාරූ ච සිවිය**, නහරවැල් ආදිය ද **අට්ඨීඤ්ච** සියලු ඇට ද **අවසිස්සතු තිබ්බේවා** (ඉතිරි වේවා) **උපසුස්සතු මංසලොහිතං** යනු සියලු මස් ද ලේ ද වියැලේවා. **තචො** යනු එක් අංගයකි. **නහාරූ** එකකි. **අට්ඨී** එකකි. **උපසුස්සතු මංසලොහිතං** යනු එක් අංගයකි. **යනතං** මතු කියන පදය සම්බන්ධ කිරීමයි. **පුරිසථාමෙන** පුරුෂයාගේ කායික වූ ඌනාණබලයෙන්. **විරියෙන** චෛතසික ඌනාණ වීර්ය තේජසින්. **පරකකමෙන** ඒ ඒ තැන් ඉක්මවීමෙන් දැඩි උත්සාහවත් වූ වීර්යයෙන්. **පත්තබබං** යම් තැනකට පැමිණිය යුතු ද **න තං අපාපුණිත්‍වා** එතැනට (පැමිණිය යුතු තැනට) නො පැමිණ. **විරියස්ස සන්‍ථානං භවිස්සති**

කියන ලද ආකාරයෙන් වීර්යයේ, ලිහිල් බවට, ගිලාබැසීමට නො යන්නේය. **සණ්ඨානං** යනු ද මේ අර්ථයේ ම පදයකි.

චිත්තං පගණ්හාති සිත උත්සාහ ගන්වයි. **පදහති** පිහිටුවයි. **නාසිස්සං** නොකන්නෙමි, අනුභව නොකරන්නෙමි. **න පිවිස්සාමි** කැද පාන වර්ගාදිය නොබොන්නෙමි. **විහාරතෝ න නික්ඛමෙ** සෙනසුනින් පිටතට නොයන්නෙමි. **න පි පස්සං නිපාතෙස්සං** ඇඳක හෝ පුටුවක හෝ බිම හෝ අතුරා සෑදූ තට්ටුවක හෝ ඇලපත තැබීම නො කරන්නෙමි. **තණ්හා සලෙල අනූහතෙ** තෘෂ්ණා නැමති කටුව නූගුල්ලා දැමූ කල්හි දුරු නොකල කල්හි යන අර්ථයි.

ඉමං පල්ලංකං යනු හාත්පසින්ම වෙළාගත් උරුබද්ධාසනයයි. **න භින්දිස්සාමි අත්** නොහරින්නෙමි. **යාව මෙ න අනුපාදාය සතර** උපාදානයන්ගේ ග්‍රහණයෙන් නොගෙන. **ආසවෙහි කාමශ්‍රවාදී සිව** ආශ්‍රවයන්ගෙන් **විමුච්චිස්සතී සමුච්ඡේද විමුක්තියෙන්** නො මිදෙන්නේය. **න තාවාහං ඉමම්හා ආසනා වුට්ඨහිස්සාමි** ආදිකොට යම්තාක් රුක්මුලට නික්මෙන්නෙමියි යන්නට අවසර වශයෙන් කියන ලදී. **ඉමස්මිංයෙව පුබ්බණ්හසමයං අරියධම්ම මාහරිස්සාමි** යනුයි. **යාවගිමෙහ** යන්න කාලය දැක්වීමට කියන ලදී. **පුරිමෙ වයෝ බන්ධෙ** ආදිය ව්‍යය වශයෙන් කියන ලදී. එහි **ආසනා න වුට්ඨහිස්සාමී** යනු හුන් ආසනයෙන් නොනැඟිටින්නෙමි. **අඩ්ඪයොගා** වැල් ආදියෙන් වැසුණු ගෙයයි. **පාසාදා** දීර්ඝ ප්‍රසාදයයි. **හම්මියා** යනු මුදුන වැසූ ගෙයයි. **ගුහායා** පස් ගුහාවයි. **ලෙනා** සීමාවකින් වෙන් කළ හෝ නොකළ පර්වත ලෙනයි. **කුටියා** ආලේප කරන ලද කුටියයි. **කූටාගාරා** යනු කර්ණිකාවට නංවා කරන ලද ගෙයින්. අටවා දොර අටලූය. **මාලා** යනු මහල් ඇති ගෙයයි. **උද්දණ්ඩා** නම් එක්තරා වාසස්ථාන විශේෂයකි. මැනවින් වැසුණු (ඡදනගේහ) ගෙයකැයි ද ඇතැමෙක් කියති. **උපට්ඨාන සාලා** යනු සන්නිපාත ශාලාවයි. භෝජන ශාලාවයි. **මණ්ඩපාදයෝ** අර්ථ ප්‍රකටය. **අරියධම්මං** නිරවද්‍ය ධර්මය. ආර්යයන්ගේ හෝ බුදු, පසේ බුදු, බුද්ධ ශ්‍රාවකාදීන්ගේ ධර්මය. **ආහරිස්සාමි** මගේ සිත ලඟට සීලයෙන් ගෙන එන්නෙමි. **සමාහරිස්සාමි** සමාධියෙන් විශේෂයෙන් ගෙන එන්නෙමි. **අධිගච්ඡිස්සාමි** ප්‍රතිලාභ වශයෙන්. **ගම්ස්සාමි** තදංග වශයෙන්. **එස්සයිස්සාමි** ස්පර්ශ කරන්නෙමි මාර්ගයෙන්. **සච්ඡි කරිස්සාමි** ඵලයෙන් ප්‍රත්‍යක්ෂ කරන්නෙමි. නැතහොත් **සෝතාපත්ති** මාර්ගයෙන්. **ආහරිස්සාමි සකෘදාගාමී** මාර්ගයෙන් **සමාහරිස්සාමි අනාගාමී**

මාර්ගයෙන්. අධිගච්ඡිසසාමි අර්හත් මාර්ගයෙන්. එසසයිසසාමි ප්‍රත්‍යවේක්ෂාවෙන්. සච්ඡිකරිසසාමි මේ දෙනයින්ම. එසසයිසසාමි යනු නාම කායයෙන් නිර්වාණය ස්පර්ශ කරන්නෙමි යන අර්ථයි.

අපුථෙථා යනු මූල පදයයි. ඔහුගෙන් නො විචාළේය යන අර්ථයි. **අපුච්ඡිතො** යනු නොදන්වන ලද්දේ. **අයාචිතො** නො ඉල්වන ලද්දේ. **අනජ්ඣෙසිතො** ආඥා නොකරන ලද්දේ, ඇතැමෙක් නොකැමති වන ලද්දේ යැයි අර්ථ කියති. **අපපසාදිතො** නො පහදවන ලදුයේ. **පාවදති** යනු කියයි. **අහමසමි** මම වෙමි, සිටිමි. **ජාතියා වා ඛත්තිය බ්‍රාහ්මණ ජාති** වශයෙන් හෝ. **ගොතෙතන ගෞතම** ආදී ගෝත්‍රයෙන් හෝ. **කොලපුතතියෙන වා** කුල පුත්‍ර භාවයෙන් හෝ. **ධනෙන වා** ධන සම්පතියෙන් හෝ. **අජ්ඣෙනෙන වා අජ්ඣාය කරණයෙන් හෝ. කමමායතනෙන වා** කර්මය ම කර්මාන්තායතනයයි. ඒ කර්මායතනයෙන්, කෘෂි, ගවපාලනාදී කර්මාන්තයකින්, **සිපපායතනෙන වා** ධනු ශිල්පාදියකින් හෝ, **විජජාටඨානෙන වා** අටළොස් විද්‍යාස්ථානයකින් හෝ. **සුතෙන වා** බහුශ්‍රැත ගුණයෙන් හෝ. **පටිභාණෙන වා** යනු කාරණාකාරණ වැටහෙන ප්‍රතිභාන නම් ඤාණයෙන් හෝ. **අඤඤතරඤඤතරෙන වත්‍ථුනා** යනු ජාති ආදී එක්තරා වස්තුවකින්.

උචචා කුලා ඛත්තිය බ්‍රාහ්මණ කුල, මෙයින් ජාති ගෝත්‍රාදී මහත් වූ කුල දක්වයි. **මහාභොගාකුලා** ගෘහපති මහාසාල කුලයෝ, මෙයින් අඩක් ධනවත් කුල දක්වයි. **උළාරභොගාකුලා** අවශේෂ වූ වෛශ්‍යාදී කුල, මෙයින් බොහෝ ජාතරූප රජතාදී සම්පත් දක්වයි. චණ්ඩාලයන් ද උළාර භෝගවත්හු වෙති. **ඤාතො** ප්‍රකට වූ. **යසසසි** පිරිවරින් යුක්ත. **සුතතනතිකො** සූත්‍රාන්තයෙහි නියුක්ත. **විනයධරො** විනය පිටකධාරී වූ. **ධම්ම කථිකො** ආභිධාර්මික වූ. **අරඤඤකො වා** ආදියෙහි ධුතංග පූර්වාංගම ප්‍රතිපත්ති දර්ශනයට කියන ලදී.

පඨමසඣානසසලාභී ආදියේ රූපාරූප අෂ්ඨ සමාපත්ති දක්වා, ප්‍රතිවේධ දර්ශන වශයෙන් කියන ලදී.

පාවදතී යනු මූල පදයයි. **කථෙති** පිටකාචරිය වෙමි යි කියයි. **භණති** ධුතංගිකයෙක් මි යි ප්‍රකට කරයි. **දීපයති** රූපධ්‍යාන ලාභියෙක්මියි පවසයි. **වොහරති** අරූපධ්‍යාන ලාභියෙක්මියි වාග්භේද කරයි. **බන්ධකුසලා**

පංචස්කන්ධයන්හි, ලක්ෂණ සහිත වූ සාමඤ්ඤ ලක්ෂණයන්හි දක්ෂයෙකුව, ඤාත තීරණ ප්‍රහාණ වශයෙන් දක්ෂයෙක්මි යන අර්ථයි. ධාතු, ආයතන, පටිච්ච සමුප්පාද ආදී ධර්මයන්හි ද මේ නය ම වේ. **නිබ්බාණ කුසලා** යනු නිවනෙහි දක්ෂව. **අනරියානං** යනු ආර්යයන්ගේ නොවේ. එසෝ ධම්මෝ මේ ස්වභාවයයි. **බාලානං** යනු පණ්ඩිත නොවූවන්ගේ. **අසප්පුරිසානං** අයහපත් පුරුෂයන්ගේ. **අත්තං** තමාගේ. **සඤ්ඤා** රාගාදී කෙලෙස් ව්‍යුපසමනයෙන් ශාන්ත වූ, එසේම මැනවින් අවබෝධ කරගත්. **ඉතිහනති සිලෙසු අකත්ථමානෝ** මම සීල සම්පන්නයෙක් වෙමි ආදී වශයෙන් සීලයෙහි කරන ලද මාන ඇති, සීලය නිමිති කරගෙන තමා හුවා දක්වන වචන කියනුයේ යන අදහසි.

තමරියධම්මං කුසලා වදන්ති යනු ඔහුගේ ඒවා නොකිරීම ආර්ය ධර්මයකැයි බුද්ධාදී ස්කන්ධ භේදනයෙහි කුසලයෝ කියති. **යස්සුස්සදා නත්ථි කුහිඤ්චි ලොකෙ** යනු යම් ක්ෂීණාශ්‍රවයකුට රාගාදී සත්ත්ව උස්සදයෝ ලෝකය කෙරෙහි කෙසේවත් ඇති නොවේ. ඒ රහතුන්ගේ රාගාදී නොපැවැත්ම ආර්ය ධර්මයකැයි කුසලයෝ කියති යනුවෙන් පද සම්බන්ධ වේ. **සඤ්ඤා** යනු මූලපදයයි. **රාගස්ස සමිතත්තා** ඇලීම් (රඤ්ජනය කිරීම්) ලක්ෂණ වූ රාගයේ සමිතභාවයෙන්. ද්වේෂාදියෙහි ද මේ නය ම වේ. **විජඤාතත්තා** සියලු පරිළාහයන්ගේ දැවීමෙන්, **නිබ්බුතත්තා** සියලු සන්තාප නිවා දැමූ බැවින් **විගතත්තා** සියලු කුසලාභිසංඛාරයන් දුරුකළ බැවින්, ඉන් ඉතා දුර වූ බැවින්. **පටිප්පස්සද්ධත්තා** සර්වප්‍රකාරයෙන් ම නැවත ඉපදීම අභව්‍ය බැවින්. **සත්තන්නං ධම්මානං භින්නත්තා භික්ඛූ** මතුයෙහි කියනු ලබන සප්ත ධර්මයන් බිඳ දමා සිටි බැවින් භික්ඛු නම් වෙති. ඒවා නම්, සක්කාය දිට්ඨිය, විචිකිච්ඡාව, සීලබ්බත පරාමාසය යන මේ කෙලෙස් ධර්ම තුන සෝවාන් මාර්ගයෙන් බිඳින ලදී. ඕළාරික වූ කාමය, තරහව යන මේ කෙලෙස් ධර්ම දෙක සකෘදාගාමී මාර්ගයෙන් බිඳින ලදී. ඒ ධර්මයන්ම අංශුවක්වත් ඉතිරි නොකර අනාගාමී මාර්ගයෙන් බිඳින ලදී. මෝහය, මානය යන මේ කෙලෙස් ධර්ම දෙක අර්හත් මාර්ගයෙන් බිඳින ලදී. අවශේෂ කෙලෙස් දැක්වීමට **භින්නාසස්ස හොන්ති පාපකා අකුසලා ධම්මා** යි කියන ලදී.

සංකිලෙසිකා යනු කෙලෙස් ප්‍රත්‍යයෙන් (හේතුවෙන්) පොනොභවිකා පුනර්භවය ගෙන දෙන **සඳරා** කෙලෙස් දැවීම් (දරථයන්) මොවුන්ට ඇත්තේනුයි සද්දරා නම්. සදරා යන පාඨය ද යෙදේ. 'සහදරථ' යන

අර්ථමයි. **දුක්ඛවිපාකං** විපාක දෙන අවස්ථාවෙහි දුක් ගෙන දෙන **ආයතිං ජාති ජරාමරණියා** යනු අනාගතයේ ජාතිජරා මරණයන්ට ප්‍රත්‍යවීමෙන්. 'පජෙජන කතෙන අතතනා' යන ගාථාවේ මේ පිණ්ඩාර්ථයයි. (සංක්ෂිප්තාර්ථයයි.) යමෙක් තමා විසින් වඩන ලද මාර්ගයෙන් පිරිනිවනට ගියේ ද, කෙලෙස් පිරිනිවීමට ගිය බැවින් ම දුරුවූ සැක ඇත්තේ, විපත්ති-සම්පත්ති-හානි-වුද්ධි-උච්ඡේද-ශාස්වත-අපුඤ්ඤ-පුඤ්ඤ ප්‍රභේද ඇති විභවය ද භවය ද අත්හැර මාර්ග වාසයෙහි විසූ බැවින් ක්ෂය කළ පුනර්භව ඇත්තේ යැයි ඔවුන්ට මේ ස්තුති වචනය වේ. **අරහා සොභිකඛූති. ඉතිහං** යනුයි. **ඉදහං** යනු ද මේ පාඨය දෙවැදෑරුම්ය. ඉති යනු පද සන්ධි ආදිය සඳහා කියන ලදී. 'ඉදහං' යන පාඨය රුචි නොවේ.

එහි 'ඉති' යැයි යම් පදයක් කියන ලද්දේ ද **පදසඤ්ඤිති** පදයන්ගේ සඤ්ඤිය පදසඤ්ඤියයි. පදගටනාවයි යන අර්ථයි. **පද සංසගෙහා** පදයන්ගේ ඒකීභාවයයි. (එකතු කිරීමයි.) **පදපාරිපූරි** පදයන්ගේ පරිපූරණය, දෙපදයන්ගේ එකීභාවය, **අකඛර සමවායො** එකීභූත වුවත්, අපරිපූර්ණ නොවූයේද වේ. මෙය මෙසේ අක්ෂරයන්ගේ සමවාය, සන්නිපාතය (එකතුවීම) නොවේ යැයි දැක්වීමට අක්ඛර සමවායො යැයි කියන ලදී. **බ්‍යඤ්ජන සිලිට්ඨතා** යනු ව්‍යඤ්ජනාක්ෂර එකතුවීමේ දී අර්ථ සම්පූර්ණ වීමයි. කියන ලද ව්‍යඤ්ජනයන්ගේ, අර්ථ ව්‍යඤ්ජනයන්ගේ අර්ථ ව්‍යක්තිය ඇතිකරන මිහිරි භාවයයි. ගාථාර්ථයේ මෘදු භාවයයි. විෂම බව නොවේ. **පදානු පුබ්බතාපෙතං** යනු පදයන්ගේ අනුපූර්වතාව පදානුපුබ්බතාවයි. පදයන්ගේ පිළිවෙළ යන අර්ථයි. **චෙතං** යනු මේ. **කතමං** යනු ඒ කෙසේද? **මෙතං** යන මෙහි ම කාරය පද සන්ධි කිරීමට කියන ලද්දකි. **කථංහොති** යනු 'මම සිල්වතෙක් වෙමි'යි තමා උසස් කර (හුවා දක්වා) කථා කරන ස්වභාවය වේ. **කත්‍ථති** යනු ඉහත කියූ ක්‍රමයෙන් කියයි. **විකත්‍ථති** යනු විවිධාකාරයෙන් කියයි. **කත්‍ථනා** යනු කීමයි. **ආරතො** යනු ඉතා දුරින් **විරතො** ළං වූ සමීප වූ ස්ථාන වශයෙන් දුරු වූ හෙයින් නො ඇලුණේ, **පටිවිරතො** යනු ඉන් නැවතී සර්වප්‍රකාරයෙන්ම වියුක්ත වූවෙක්ව නො ඇලුණේ. එහි පිසාචයෙක් මෙන් දැක පලායන්නේ **ආරතො** වේ. ඇතෙකු මඩිනකල්හි මෙන් ඔබිනොබ දුවගියේ **විරතො** වේ. යෝධයන්ගේ යුද්ධයක් සන්සිඳුවා, මර්ධනය කර ගියාක් මෙන් **පටිවිරතො. ඛීණාසවස්ස** යනු ක්ෂය වූ කෙලෙස් ඇති රහතන් වහන්සේට. **කම්මුසසදො** යනු පුඤ්ඤාභිසංඛාර, අපුඤ්ඤාභි සංඛාර හා ආනෙඤ්ජාභි සංඛාර සංඛ්‍යාත

වූ කර්මයන්ගේ පිරුණු බවක් උත්සන්නතාවක් **තසසිමෙ** යනු ඒ ක්ෂීණාස්‍රවයාගේ මේ උත්සදයෝ (නැත)

මෙසේ රහතන් වහන්සේගේ පිළිවෙත දක්වා දැන් දෘෂ්ටිගතික වූ තීර්ථකයන්ගේ පිළිවෙතද දක්වමින් (පස්වන ගාථාව) වදාළහ.

'පකප්පිතා සංඛතා' යනාදී ගාථාවෙහි **පකප්පිතා** යනු පරිකල්පනය කළ **සංඛතා** ප්‍රත්‍යයෙන් සකස් කරන ලද. **යසස** යම්කිසි දෘෂ්ටිගතිකයකුගේ. **ධම්මා** දෘෂ්ටීහු. **පුරක්ඛතා** පෙරටුව කරන ලද. **සන්ති** විද්‍යමාන වෙත්. **අවෙවදාතා අපිරිසිදු වූ යදත්තනි පස්සති ආනිසංසං තං නිස්සිතො කුප්ප පටිච්චසන්තිං** යනු යමෙකුගේ ඒ දෘෂ්ටි ධර්මයෝ පෙරටු කරගෙන අපිරිසිදුව සිටිත්ද ඔහු මෙපරිද්දෙන්, තමා කෙරෙහි ඒ දෘෂ්ටියේ ප්‍රත්‍ය සංස්කාරාදිය මේ ලෝක වශයෙන් ද ගති විශේෂාදිය පරලෝක වශයෙන් ද යම් ආනිසංසයක් දක්නේද, එහෙයින් ඒ ආනිසංසය ද ඒ කිපීමද ප්‍රතීත්‍ය සමුත්පන්න බව නිසා ද සම්මුති ශාන්ති බව නිසා ද කෝපී බව දැක්වීම සංඛ්‍යාත දෘෂ්ටිය ද ආශ්‍රය කරගත්තේ වේ. ඔහු ඒ දෘෂ්ටියෙන් වෙලීගත් බැවින් තමා හෝ උසස්කර දක්වන්නේය. අනුන් හෝ පහත්කර දක්වන්නේය. ගුණ දෝෂයන්ගෙන් මැඩලන්නේය. **සංඛාතා** යනු මූලපදයයි. **සංඛතා** යනු ප්‍රත්‍යයන් එකතු වී කරන ලද. උපසර්ග යෙදීම් වශයෙන් පදය වැඩිකරන ලදී. **අභිසංඛතා** ප්‍රත්‍යයන්ගෙන් විශේෂයෙන් සකසන ලද. **සණ්ඨාපිතා** ප්‍රත්‍ය වශයෙන් ම මනාව තැබූ. **අනිච්චා** යනු ඇතිව නැතිවන බැවින් **පටිච්ච සමුප්පන්නා** යනු වස්තු අරමුණක් නිසා උපන් බය ධම්මා ක්‍රමයෙන් ක්ෂය ස්වභාවයට යන. **වයධම්මා** පැවතුම් වශයෙන් පිරිහී යන ස්වභාවය. **විරාග ධම්මා** නොනැවතීම ගමන්කරන ස්වභාවය. **නිරොධ ධම්මා** නිරෝධවන (නැතිවන) ස්වභාවය. නූපදින ධර්මයක්ව නිරෝධ වන ස්වභාවය යන අර්ථයයි.

දිට්ඨිගතිකස්ස දෙසැටක් මිසදිටු ගෙන සිටි පුද්ගලයාට. **පුරෙක්ඛා** මුලින් කළ, **තණ්හා ධජෝ** ඔසවා තබන බැවින් තණ්හාව ධජයකි. තණ්හාව නම් කොඩියක් මොහුට ඇත්තේනුයි තණ්හා ධජ වූ, පෙරටු කරගෙන හැසිරෙන බැවින් තණ්හාවම මොහු කේතුවක් කරගත්තේනුයි **තණ්හා කෙතු, තණ්හාධිපතෙය්‍ය** යනු ඡන්දාධිපති වශයෙන්. තණ්හා අධිපතිභාවට පැමිණියේනුයි තණ්හාධිපතෙය්‍ය නම් වේ. නැතහොත් තණ්හාධිපති බව මොහුට ඇත්තේනුයි තණ්හාධිපතෙය්‍ය වේ. දිට්ඨිධජා ආදියෙහි ද මේ

ක්‍රමයෙන් අර්ථ ගතයුතුයි. අවොදාතා අපිරිසිදු වූ. සංකිලිටඨා තමාම කිලිටි වූ. **සංකිලෙසකා** පසුතැවිලි වන, දෙව **ආනිසංසෙ පසසති** ගුණ දෙකක් දකියි. **දිටඨධම්මිකං ච ආනිසංසං** මේ ආත්මභාවයේදීම ප්‍රත්‍යක්ෂ කරගත් ධර්මය ඇති බව. **සම්පරායිකං** පරලොවදී පැමිණිය යුතු ආනිසංසද **යංදිටඨිකො සත්ථා හොති** ශාස්තෘන් වහන්සේ යම් පිළිගැනීමක් ඇත්තෙක් වේද, **තං දිටඨිකා සාවකා හොනති** උන්වහන්සේගේ වචන අසන ශ්‍රාවකයෝ ද ඒ පිළිගැනීම ම ඇතිව සිටිති. **සකකරොනති** ඒ පිළිගැනීමට සත්කාර කරති. **ගරුකරොනති** ගරු වූ ස්වභාවයට පත් කරති. (ගරු කරති.) **මානෙනති** මනසින් (සිතින්) ප්‍රිය කරති. **පූජෙනති** සිවුපසයෙන් පුද පූජා කරති. **අපචිතිං කරොනති** අපචායනය (පිදීම) කරති. එහි යමෙකුට සිවුපසය සත්කාර කර, මනාව පිළියෙළ කරවා, ප්‍රණීතව ප්‍රණීතව දෙයි ද ඔහු **සකකතො** වේ. යමෙකු කෙරේ ගරුභාවය පිහිටුවා දෙයි ද ඔහු ගරුකතො වේ. යමෙකුට මනුෂ්‍යයෝ ප්‍රිය කරත්ද ඔහු මානිතො වේ. යමෙකුට සියල්ල පූජා කරයි ද ඔහු **පූජිතො** වේ. යමෙකුට අභිවාදනය, සමීපයට එළඹීම්, ඇඳිලි බැඳීම් ආදියෙන් අතිශයින් යටහත් පැවතුම් දක්වයිද ඔහු **අපචිතො** වේ. ඇතැමෙක් කයින් සත්කාර කරති. වදනින් ගරු කරති. සිතින් බුහුමන් කරති. ලාභයෙන් පූජා කරතියි අර්ථ කියති. **අලං නාගත්තාය** වා යනු මේ දෘෂ්ටිය නාග බවට හෝ නාරජ බවට පත්වීමට ප්‍රමාණවත්ය. **සුපණ්ණත්තාය** වා ගුරුළු රජ බවට **යකඛත්තාය** වා යක්ෂ සේනාපති බවට **අසුරත්තාය** වා අසුර බවට **ගන්ධබ්බත්තාය** වා ගාන්ධර්ව දිව්‍ය සමූහයා අතර ඉපදීමට **මහාරාජත්තාය** වා සතරවරම් දෙව් රජවරුන්ගේ කෙනෙකු වීමට **ඉන්දත්තාය** වා ශක්‍ර බවට පත්වීමට **බ්‍රහමත්තාය** වා බ්‍රහ්මකායිකාදීන් අතර කෙනෙකු වීමට **දෙවත්තායවා** සම්මුති දෙවියන් අතරින් කෙනෙකු වීමට **සුදධියා** පිරිසිදු වීමට **දෙවත්තායවා** සම්මුති දෙවියන් අතරින් කෙනෙකු වීමට **සුදධියා** පිරිසිදු වීමට ප්‍රමාණවත්ය. සුදුසුය. **පරිසුදධියා** සර්ව ප්‍රකාරයෙන්ම පිරිසිදු වීම පිණිස එහි තිරිසන් යෝනියේ අධිපති බව ලැබීම ශුද්ධියෙන් වේ දෙව්ලොව අධිපති බව ලැබීම විශුද්ධියේ වේ. බ්‍රහ්ම ලෝකයේ අධිපති බව ලැබීම පාරිශුද්ධියෙන් වේ. කල්ප අසූහාර දාහක් ඉක්මවා මිදීමට පත්වීම **මුත්තියා** අනතුරුවලින් මිදීම - නිරුපද්‍රිත වීම **විමුත්තියා** සර්ව ප්‍රකාරයෙන්ම මිදීම **පරිමුත්තියා** නම් වේ. **සුජඣතනි** ඒ සමයාන්තරයෙහි (ශාසනයේ) පැවිදි බව ලැබීමෙන් පිරිසිදු බවට පත්වෙති. **විසුජඣතනි** පැවිදි බව ලැබ පිළිවෙත් සම්පූර්ණ කිරීම් ආදියෙන් විශේෂයෙන් පිරිසිදු බව වෙති. **පරිසුජඣතනි** නිවනට හෝ මෝක්ෂයට) පැමිණ සර්වප්‍රකාරයෙන්ම පිරිසිදු වෙති. ඔවුන්ගේ

සමයාන්තර ධර්මයෙන් මිදෙති. ඒ ශාස්තෘවරයාගේ අවවාදයෙන් මැනවින් මිදෙති. ඒ ශාස්තෘවරයාගේ අනුශාසනාවෙන් හාත්පසින් මිදෙති. 'සුජ්ඣිසසාමි' යනාදිය අනාගත වශයෙන් කියන ලදී. **ආයතිං එලපටිකංඛී** යනු අනාගතයේ ඵලවිපාක කැමති වෙමින්, මේ දෘෂ්ටිගතිකයන්ගේ මනාව පුරුදු කළ දෘෂ්ටිය, පිළිගැනීම කමැත්තවුන්ට නිරය හෝ තිරිසන්යෝනිය හෝ උපදවයි.

අචචන්ත සන්තී යනු අත්‍යන්ත ශාන්තියයි. නිර්වාණ ශාන්තියයි. **තදංගසන්ති** ප්‍රථම ධ්‍යානාංගයන්ගෙන් නීවරණාදී අයහපත් ධර්ම සමනය කරන බැවින් ධ්‍යාන තදංග ශාන්ති නම් වේ. **සමුති සන්ති** යනු සමාහාර වශයෙන් දෙසැටක් මිසදිටුවලින් මිදීමෙන් ලැබෙන ශාන්තියයි. මේ ශාන්ති වර්ග තුන විස්තර වශයෙන් දැක්වීමට **කතමා අචචන්ත සන්තී** යනාදිය කියන ලදී. 'අමතං නිබ්බාණං' යනාදී පදයන්ගේ අර්ථ ඉහත කියූ පරිදි දතයුතුයි. පළමු ධ්‍යානයට සමවැදුණු යෝගියාගේ නීවරණ සන්සිඳේ යැයි යනාදිය අර්පණා විස්තරයේදී ඉතා දීර්ඝ වශයෙන් දක්වන ලදී.

තවද මේ ශාන්ති අතරින් සම්මුති ශාන්තිය ම ගාථාවේ **සන්ති** යන්නෙන් අදහස් කරන ලදී. ඉතිරි ශාන්ති දෙක ඉවත ලා සම්මුති ශාන්තියම මෙහිදී ගතයුතුයි. **කුප්පසන්ති** යනු විපාක ජනක වශයෙන් ද පරිවර්තන වශයෙන් ද ශාන්තියයි. **පකුප්පසන්ති** විශේෂයෙන් වූ කෝප්‍ය ශාන්තියයි. **පරිතසන්ති පතිකම්පිතසන්ති සමෙරිතසන්ති** අර්ථ වැඩිකරන ලදී. විශේෂයෙන් කම්පිත වන ශාන්තිය **චලිතසන්ති** නමි. එයටම සමාන වදනකි. **සඨිතසන්ති** යනු පීඩිත වූ ශාන්තියයි. **නිසසිතෝ** යනු දෘෂ්ටි සංඛ්‍යාත ශාන්තිය ඇසුරු කළේ. **අසසිතෝ** යනු විශේෂයෙන් ආශ්‍රිත වූ, ඇසුරු කළ. **අලලීනෝ** යනු එකට වැළඳ ගත්තේ. ඒකීභූත වූයේ. මෙසේ ආශ්‍රිත වූයේම ය.

දිටඨී නිවෙසා -පෙ- ආදියති ච ධම්මං යනාදී ගාථාවෙහි මේ ලෝකය ශාස්වතය. මෙයම සත්‍යය' ආදී වශයෙන් පැවති දෘෂ්ටි පිළිගැනීම **දිටඨී නිවෙසා** නම්. **නහි ස්වාහි වත්තා** යනු සුවසේ ඉක්මවිය හැක්කෝ නොවෙති. **ධම්මෙසු නිගචෙඡය්‍ය සමුගහිතං** දෙසැටක් මිසදිටු දහම්හි මනාව බැසගෙන, ඒ ඒ ධර්මය මනාව පිළිගෙන, තදින් අල්ලාගෙන පවතින් ද එහෙයින් මේ දෘෂ්ටි වෙළීම් ඉවත් කිරීම අසීරුය යන අදහසයි.

තසමා තරෝ තෙසු නිවෙසනෙසු නිරඝසති ආදියනිචව ධම්මං යනු ඒ දෘෂ්ටීන් ඉවත් කිරීම අපහසු හෙයින් මිනිසා ඒ දෘෂ්ඨීන්හිම වෙලීගැලී තමා අජ ශීල, ගෝ ශීල, කුක්කුර ශීල, පංචතාපන, මරුප්පපාත, උක්කුටික ප්‍රධාන, කණ්ටක, අපස්සයාදී ප්‍රභේදයන් ද ශාස්තෘන් වහන්සේගේ ධර්ම දේශනාවන්හි ගණාදී ප්‍රභේදයන් ද යන ඒ ඒ ධර්මය (පිළිගැනීම්) අත්හරියි.පිළිගනියි. ඉවත දමයි. නැවත ගනියි. වඳුරෙක් ඒ ඒ අතු අල්ලාගෙන අත හරින්නාක් මෙනැයි කියන ලදී.

මෙසේ අත්හරින්නේ ද පිළිගන්නේ ද නොනවත්වා ම චංචල වූ ඕත් ඇති බැවින්, නොමැත්තා වූ ගුණ දෝෂයන් කරණ කොටගෙන තමාට හෝ අනුන්ට යස අයස උපදවන්නේ ය. **දුරතිවත්තා** යනු ඉක්මවීමට අපහසුය. **දුත්තරා** යනු දුක සේ ඉක්මවිය යුතු දු උත්තරා **දුප්පතරා** (එතෙර වීමට අපහසු) **දුසසමතික්කමා, දුබ්බිතිවත්තා** (ඉක්මවීමට අපහසු) යනුවෙන් උපසර්ග යොදා අර්ථය වැඩිකරන ලදී. **නිච්ඡිනිත්වා** ශාස්වත වශයෙන් නිශ්චය කර, **විනිච්ඡිනිත්වා** ආත්ම වශයෙන් නානාවිධව විනිශ්ය කර, **විචිනිත්වා** පර්යේෂණය කර, **පවිචිනිත්වා** ආත්මවාදයෙහි සර්වප්‍රකාරයෙන්ම විමසා බලා, **නිචිනිත්වා විච්ඡිනිත්වා** යන පාඨ ද යෙදේ. ඔධිගහා හෝ අවධි කොට ගැනීමය. නසා ගැනීමය. බිලගහාහෝ කොටස් වශයෙන් ගැනීමයි. 'බිලසෝ පටිවිභජිත්වා' ආදියෙහි මෙනි. **වරගාහෝ** උතුම් ගැනීමයි. **කොට්ඨාසගාහෝ** අවයව වශයෙන් ගැනීමයි. **උච්චය ගාහෝ** රාශි වශයෙන් ගැනීමයි. **සමුච්චය ගාහෝ** විශේෂ රාශි වශයෙන් ගැනීමයි. **ඉදං සච්චං** මෙය ම ස්වභාවයයි. **තච්ඡං** තථ සත්‍ය බව, නොවෙනස් බව. **තථං** පරිණාමයට පත්නොවන **භූතං** විද්‍යමාන වන, **යථාවං** යථා ස්වභාවය. **අවිපරීතං** විපරීත නොවන. **නිරඝසති** ඉවතලයි. දුරුකරයි. **පරවිච්ඡින්දකාය** වා අනුන් විසින් වෙන්කරනු ලැබීමෙන්, **අනභිසම්භූනනෙත්තාවා** නොපැමිණිනුයේ හෝ නොහැකි වනුයේ දුරුකරයි. අත්හරියි. **පරෝ විච්ඡින්දෙති** අනිකෙක් වියෝග කරයි. මෙහි නැත්තේනුයි නත්ථෙත්ථෝ යනුමෙහි නැත. **සීලං අනභිසම්භූනනෙත්තා** සීලය සම්පාදනය නොකරන්නේ **සීලං නිරඝසති** සීලය අත්හරියි. අනෙක් පදයන්හි අර්ථ ද මෙසේ ම ගතයුතුයි.

යම් කෙනෙක් සියලු මිසදිටු පිළිගැනීම් ආදි දෝෂයන් සෝදාහැර ප්‍රඥාවෙන් යුක්ත වූ බැවින් ධොනෝ වේ. 'තසස ධොනසස හි -පෙ- අනූපයෝ සෝ' යන ගාථාවෙන් කුමක් කියන ලද ද? ධොන නම් ප්‍රඥා

ධර්මයන්ගෙන් යුක්ත වූ බැවින් ධොනයාට, කම්පා කරන ලද සියලු පාපධර්ම ඇති රහතන් වහන්සේට ලොව කිසිතැනෙක්හි ඒ ඒ භවයන්හි සංකල්පනාදී දෘෂ්ටීන් නැත. උන්වහන්සේ ඒ දෘෂ්ටීන්ගේ අභාවයෙන් යුක්ත බැවිනි. යම් ඒ තමා විසින් කළ පව්කම් වසමින් අන්‍ය තීර්ථකයෝ මායාවෙන් හා මානයෙන් මෙසේ අගතියට (නරකයට) යත් ද එම මායාවත් මානයත් දුරුකළ බැවින් රහතන් වහන්සේ, රාගාදී දෝෂයන්ගෙන් කුමකින් යත් ද? මෙලොව හෝ පරලොව, නිරයාදී ගති විශේෂයකට කුමකින් යන්නේ ද? **අනුපායො සො** යනු තණ්හා දිට්ඨී උපායන් දෙක නැති බැවින් අනුපාය නම් වේ. **කිං කාරණා** කවර කරුණකින්, **ධොනා වුච්චති පඤ්ඤා** ධොනා යනු කාරණා කරණ දන්නා ප්‍රඥාව යැයි කියයි. **තාය පඤ්ඤාය කාය දුච්චරිතං** ඒ ඉහතින් කියූ ප්‍රඥාවෙන්. කයින් පැවති දුසිරිත, කුණු කෙලෙස් ඇතිකරන හැසිරීම හෝ දුච්චරිත නම් වේ. **ධුතඤ්ච ධොතඤ්ච** කම්පිත කළ බැවින් ද ධෝවනය කළ බැවින් ද **සනෙධාතඤ්ච** මනාව ධෝවනය කරන ලද බැවින්, **නිදෙධාතඤ්ච** විශේෂයෙන් මනාව සෝදන ලද. **රාගො ධුතො වා** යනාදිය සතර මාර්ග වශයෙන් යෙදිය යුතුයි. **සම්මා දිට්ඨියා මිච්ඡාදිට්ඨී ධුතා වා** මාර්ග සම්ප්‍රයුක්ත වූ සම්මා දිට්ඨියෙන්, මිත්‍යා දෘෂ්ටිය කම්පිත කරන ලදී. සොළවන ලදී. ධෝවනය කරන ලදී. සම්මා සංකප්ප ආදියෙහි ද මේ ක්‍රමයම යෙදිය යුතුයි.

මෙය කියන ලදී. 'මහණෙනි, සම්මා දෘෂ්ටියෙන් මිත්‍යා දෘෂ්ටිය විනාශ කරනු ලබයි' යන සූත්‍ර පාඨය විස්තර කළ යුතුයි. **සම්මා ඤාණෙන** යනු මාර්ග සම්ප්‍රයුක්ත ඤාණයෙන් හෝ ප්‍රත්‍යවේක්ෂණ ඤාණයෙන්. **මිච්ඡා ඤාණං** විපරීත වූ ඤාණය, අයථා ඤාණය, පාප ක්‍රියාවන්හි ඇලීම් වශයෙන් පාප ක්‍රියාවක් කොට 'මවිසින් හොඳ දෙයක් කරන ලදී'යි සිහි කිරීම් වශයෙන් උපදින මෝහයයි. **සම්මා විමුත්තියා මිච්ඡා විමුත්ති** සමුච්ඡේද විමුක්තියෙන් විපරීත බවට, අයථා බවට, මිදීමට ගිය සිහි ඇතිව, විමුත්ති සංඥාවෙන් යුතු, **අරහා ඉමෙහි ධොනියෙහි ධම්මෙහි** රාගාදී කෙලෙසුන්ගෙන් දුර සිටි බැවින්, රහතන් වහන්සේ, ඉහත කියූ පරිදි කෙලෙස් පිරිසිදු කරන ධර්මයන්ගෙන් යුක්ත වන සේක. ධොනො ප්‍රඥාවන්ත පුද්ගලයා. එහෙයින් ම 'සො ධුතරාගො' යනාදිය කියන ලදී.

මායා වුච්චති වංචනිකා චරියා යනු වංචන ක්‍රියාවන්, වංචා කිරීම් මොහුට ඇත්තේනුයි වංචනික චරියා නම් වේ. **තප්පටිච්ඡාදන හෙතු** ඒ

දුශ්චරිතයන්ගේ අප්‍රකාශන හේතුව. වසාදමන කාරණය. **පාපිකං ඉච්ඡං පණිදහති** පවිටු ප්‍රාර්ථනාවක් පිහිටුවයි. **මා මං ජඤ්ඤාති ඉච්ඡති** මවිසින් කළ පවු අන්‍යයෝ නොදැනගනිත්වායි ප්‍රාර්ථනා කරයි. **සංකප්පෙති** විතර්ක උපදවයි. **වාචං භාසති** දැනගෙනම ප්‍රඥප්තිය ඉක්මවන, කඩ කරන භික්ෂුව බැරෑරුම් වූවක් කරයි. අපගේ නම් ශික්ෂාපද ඉක්මවීමක් නැතැ'යි උපශාන්ත වූවෙක් මෙන් කියයි. **කායෙන පරක්කමති** මවිසින් කළ මේ පවුකම, කිසිවෙක් දැන නොගනිත්වා'යි විද්‍යමාන දෝෂ වසා දමමින් කයින් ඊට පිළියම් යොදයි. ඇස් වහන, මුවහ කරන මායාව මොහුට ඇත්තේනුයි **මායාවී** වේ. මායාවී පුද්ගලයාගේ ස්වභාවය **මායාචිතා** වේ. පවක් කර නැවත එය වසා දමමින්, ඇත්ත ඉක්මවා යන ස්වභාවය අඩවයා. කාය වාග් ක්‍රියාවන්ගෙන් එකක් දක්වා රවටන්නේ නුයි **වංචනා**. මෙයින් සත්ත්වයන් රවන්නේ නුයි **නිකති**. වේ. මිථ්‍යා ක්‍රියා කරත් යන අර්ථයයි. **නාහං එවං කරොමි** මම මෙසේ නොකරමි යි යනුවෙන් පාපයන්ගේ අවුල් කිරීම **නිකිරණා** වේ. මම මෙසේ නොකරමි යි බැහැර කිරීම, ප්‍රතික්ෂේප කිරීම **පරිහරණා** වේ. කායාදීන්හි සංවර භාවයෙන් පව් වැසීම **ගූහනා** වේ. හාත්පසින් ම වැසීම **පරිගූහනා** නම් වේ. අශුචියක් තණකොළවලින් වසන්නාක් මෙන් කාය වාග් ක්‍රියාවන්ගෙන් පාපය වසන්නේ නුයි **ඡාදනා** වේ. සර්වප්‍රකාරයෙන් ම වැසීම **පරිච්ඡාදනා**. ප්‍රකට නොකිරීම **අනුත්තානිකම්මං**. පව්කම් කර නොදක්වන්නේ නුයි **අනාවිකම්මං**. මනාව වසා දැමීම **වොච්ඡාදනා**. කරන ලද වසා දැමීම් නිසානැවත නැවත පව් කිරීම **පාප කිරියා**. මෙසේ කරනු ලබන, වසා දමන, අනුන් රවටන ලක්ෂණය මායා නම් වේ. **අයං වුච්චති මායා**. මේ මායාව නම් සිතුවිල්ලෙන් යුතු පුද්ගලයා අළුවලින් වැසී ගිය ගිනි අඟුරක් මෙන් ද, ජලයෙන් වැසීගිය හුලක් මෙන් ද, වස්ත්‍රවලින් වසා දැමූ ආයුධයක් මෙන් ද දතයුතුයි.

එකවිධෙන මානො යනු වෙන් කිරීමකින්, එක් කොටසකින් එක් අයුරකින් 'මාන' නම් වේ. **යා චිත්තස්ස උන්නති** යනු යම් සිතේ පවත්නා අතිශයින් හුවා දැක්වීම, උස් කර දැක්වීම මානය වේ යන අදහසයි. මෙහිදී පුද්ගලයා ස්පර්ශ නොකර උපදින මානයම කියන ලදී. **අතුක්කංසන මානො** යනු තමා උසස් කර දක්වන මානයයි. **පරවමඤ්ඤනමානො** යනු අනුන් හෙළා දකින, ලඝුකර සිතන මානයයි. මේ මාන දෙක බොහෝ වශයෙන් ම එසේ පවත්නා ආකාරයෙන්ම කියන ලදී. **සෙය්‍යො හමස්මීති මානො** යනු ජාති ආදියක් පෙරටු කරගෙන 'මම

උතුම් වෙමි'යි උපන් මානයයි. අසදිස මාන, සදිස මානාදියෙහි ද මේ අර්ථ ක්‍රමයම දත යුතුයි. මෙසේ මේ ත්‍රිවිධ මානය පුද්ගල විශේෂ නිමිති කර නොගෙන එසේ පවත්නා ආකාර වශයෙන් කියන ලදී. ඒ මාන තුනින් සෙය්‍ය, සදිස, හීනයන්ගේ සිත්හි එක් මානයක්ම උපදියි. එහි **සෙය්‍යො හමස්මීතිමානො** 'මම ශ්‍රේෂ්ඨ වෙමි' යන මානය ශ්‍රේෂ්ඨයාටම, යථාවමාන (අනුකූල මාන) වේ. සෙසු අයට අයථාවමාන වේ. **සදිසො හමස්මීතිමානො** 'මම සමාන වෙමි' යන මානය සදිසයාටම යථාවමාන වේ. සෙසු අයට අයථාවමාන වේ. **හීනො හමස්මීති මානො** 'මම කුලහීන වෙමි' යන මානය කුලහීයාට ම යථාවමාන වේ. සෙසු අයට අයථාවමාන වේ. සතරවැදෑරුම් මානය ලෝක ධර්මතා වශයෙන් කියන ලදී. පස්වැදෑරුම් මානය පස්කම් සුව වශයෙන් කියන ලදී. සවැදෑරුම් මානය චක්ෂු ආදී සම්පත් වශයෙන් කියන ලදී.

එහි **මානං ජනෙති** යනු මානය උපදවයි. සත්වැදෑරුම් මාන දැක්වීමෙහි **මානො** යනු උස්ව නැගි මානයයි. **අතිමානො** යනු ජාති ආදියෙන් මා හා සමානයෙක් නැතැයි අනුන් ඉක්මවා සිතීමෙන් උපන් මානයයි. **මානාතිමානො** යනු 'මොහු පෙර මා හා සමාන විය. දැන් මම ශ්‍රේෂ්ඨවෙමි. මොහු හීනතමයෙකි'යි උපන් මානයයි. මෙය ඉතා වැඩි බරක් මෙනි. පෙර සදිස (සමාන) වූ මානය හේතුකරගෙන ඇතිවන මානාතිමානය දැක්වීමට මෙය කියන ලදී.

ඔමානො යනු හීනමානයයි. යමෙක් 'මම හීනයෙක් වෙමි'යි මනියි ද එය ඕමාන නම් වේ. තවද මෙහි 'නුඹ කපුටු ජාතිය මෙන් වූ ජාති ඇත්තෙකි. නුඹ ගෝත්‍ර ඇත්තෙකි. නුඹේ ගෝත්‍රය චණ්ඩාල ගෝත්‍රය මෙනි. නුඹට ස්වරයක් ඇත. එය කපුටු ස්වරය මෙනි. ආදී වශයෙන් තමා හෙළා දැක සිතීම් වශයෙන් ඇතිවනුයේ මේ හීන මානය බව දතයුතුයි.

අධිමානො චතුරාර්ය සත්‍යයට නොපැමිණ, පැමිණියේ යැයි සිතන්නාට, සතර මගෙහි කළයුතු කටයුතු නොකළ කල්හි, මවිසින් කරන ලදැයි සිතන්නාට, චතුරාර්ය සත්‍ය ධර්මය අවබෝධ නොවී අවබෝධ වූයේයයි සිතන්නාට, අර්හත් බව සාක්ෂාත් නොකළත් රහත්වූවෙකු මෙන් සිතන්නාට උපදින අධිගත මානය අධිමානයයි. මේ අධිමානය කාහට උපදීද? කාහට නූපදීද? අධිමානය රහතන් වහන්සේට නූපදීමය. ඒ

අධිමානය මාර්ගඵල, නිවන්, ප්‍රහීණ වූ කෙලෙස්, අප්‍රහීණ වූ කෙලෙස් පිළිබඳ සිහිකිරීමෙන් හටගත් සතුටින් යුතු ආර්ය ගුණ ප්‍රතිවේධයෙහි සැක නැති බැවින් සෝවාන් ආදී මගඵල ලාභීන්ට මම සකෘදාගාමී වෙමි'යි ආදී වශයෙන් නූපදියි. ආර්ය ගුණ අවබෝධ කරගැනීමෙහි ආශා නැති දුස්සීලයාට ද අධිමානය නූපදියි.

සිල්වතෙකු වුවත් කමටහන් අත්හැර දමා, නිද්දාරාමාදියෙහි නිරත වූයේ නම් ඔහුට ද අධිමානය නූපදියි. ඉතා පිරිසිදු සිල් ඇති, අප්‍රමාදීව කමටහන් වඩන්නාට, නාම රූපව්‍යවස්ථාපනය කර ප්‍රත්‍ය පරිග්‍රහණයෙහි දුරු වූ සැක ඇත්තාට, තිලකුණු මෙනෙහි කර සංස්කාරයන්හි සන්සිඳුණු සිත් ඇත්තාට ඇරඹූ විදර්ශනාව ඇත්තහුට මේ අධිමානය උපදියි. උපන් කල්හි ද ශුද්ධ සමථලාභී හෝ ශුද්ධ විදර්ශනාලාභී හෝ යන දෙදෙනාගේ අතර සිටියි. ඔහු වනාහි වසර දහයක්, විස්සක්, තිහක් වුවත් තම සන්තානයේ කෙලෙස් පහළවීමක් නොදක්නේ, 'මම සෝවාන් වෙමි', 'මම සකෘදාගාමී' හෝ අනාගාමී වෙමි'යි සිතයි. සමථ විදර්ශනා ලාභියා මම අර්හත් වෙමි'යි සිතයි. ඒ සමථ විදර්ශනා ලාභියාට සමාධි බලයෙන් කෙලෙස් විෂ්කම්භනය විය. විදර්ශනා බලයෙන් සංස්කාරයෝ මනාව විමසා බලන ලදහ. එනිසා ඔහුට වසර සැටක්, අසූවක් සීයක් ගියත් කෙලෙස් පහළවීමක් සිදු නොවේ. රහතුන්ට මෙන් සිත් හැසිරීම සිදු වේ. හෙතෙම මෙසේ බොහෝ කාලයක් කෙලෙස් හැසිරීමක් නොදක්නේ අතරෙහි නොසිටම 'මම රහත් වූයෙමි'යි සිතයි.

අසම්මානෝ යනු 'රූපයේ මම වෙමි' ආදී වශයෙන් පංචස්කන්ධය පිළිබඳව, මම රූපාදී අරමුණු වෙමි'යි උපන් මානයයි. **මිච්ඡාමානෝ** යනු පාපීන් විසින් කරනු ලබන කර්මාන්ත, ශිල්පායතන, විද්‍යාස්ථාන ආදියේ ඇසීම්, ප්‍රතිභානයන් (වැටහීම්), සීල ව්‍රත ආදී පාපී දෘෂ්ටීන්ගෙන් උපන් මානයයි. එහි පවිටු කර්මාන්ත නම් මස් පිණිස සතුන්, මාලු මැරීම්, බන්ධන කිරීම්, වැදි ආදීන්ගේ ක්‍රියාවන්ය. **පාපකං සිප්පායතනං** පවිටු ශිල්පායතන නම් මත්ස්‍යයන්ට දැල් දැමීම්, කෙමන ඇටවීම් ආදියෙහි මෙන්ම උගුල් ඇටවීම්, හුල් තැබීම් ආදියෙහි ද පවත්නා දක්ෂතාවයයි. **පාපකං විජ්ජාට්ඨානං** පවිටු විද්‍යාස්ථාන නම් යම්කිසි අනුන් නසන, පෙළන විද්‍යාවකි. **පාපකං සුතං** යනු පවිටු ඇසීම නම් භාරත යුද්ධ, සීතා හරණාදියෙන් ප්‍රතිසංයුක්ත දේ ඇසීමයි. **පාපකං පටිභානං** පවිටු ප්‍රතිභානය

නම් දුර්භාෂිතයන්ගෙන් පිරි කාව්‍ය නාටක, විලම්බිත නාටකාදිය වැටහීමයි. ඒ පිළිබඳ ප්‍රතිභානයයි. **පාපකං සීලං** පවිටු ශීලය නම් අජ සීල, ගෝ සීල, ව්‍රත ආදිය ද අජ ව්‍රත, ගෝ ව්‍රත ආදියද වේ. **පාපකා දිට්ඨි** දෙසැටක් දෘෂ්ටිගතයන් අතරින් කිසියම් දෘෂ්ටියක්. අට්ඨවිධ මානො අර්ථ ඉතා ප්‍රකටමය.

මානය නව වැදෑරුම් කර දැක්වීමෙහි දී **සෙය්‍යසස සෙය්‍යො හමසමි** යනාදී වශයෙන් නව මානී පුද්ගලයන් සඳහා කියන ලදී. මෙහිදී වනාහි **සෙය්‍යසස සෙය්‍යො හමසමීති මානො** ශ්‍රේෂ්ඨයාට 'මම ශ්‍රේෂ්ඨ වෙමි'යි ඇතිවන මානය රජුන්ට මෙන්ම පැවිද්දන්ට කවරෙක් මා හා සම වේද?'යි සෙය්‍ය මානය ඇතිකර ගනියි. පැවිද්දා ද සීල ධුතංගාදියෙන් කවරෙක් මා හා සමවේද?යි මානය උපදවා ගනියි. **සෙය්‍යසස සදිසො හමසමීති මානො** ශ්‍රේෂ්ඨයාට 'මම සමාන වෙමි'යි ඇතිවන මානයද මේ දෙදෙනාටම උපදියි. රජුට ප්‍රදේශ හෝ ධනය බලවාහන හෝ නිමිති කරගෙන අන් රජුන් සමග මාගේ කවර වෙනසක්ද? (අන් රජුන් හා මම සම වෙමි) යි මෙසේ මානය ඇතිකර ගනියි. පැවිද්දාට ද අන් භික්ෂූන් සමග සීල ධුතාංගාදියෙන් මාගේ කවර වෙනසක්ද?යි මේ මානය ඇතිවේ. අල්ප වූ ලාභ සත්කාර නිසා **සෙය්‍යසස හීනොහමසමි** සෙය්‍යයාට හීන මානය ඇතිවේ. එයත් ඉහත කී දෙදෙනාටමය. යම් රජෙකුට 'ප්‍රදේශ හෝ ධන බල වාහනාදියක් සම්පූර්ණ නොවේ ද? මට රජුය'යි කීම වචන මාත්‍රයක් පමණි. කෙසේනම් මම රජවෙම් ද?'යි මේ හීනමානය ඇති වේ. පැවිද්දාට ද අල්ප වූ ලාභ සත්කාර ඇති වූ විට 'මම ධර්ම කථිකයෙකි. බහුශ්‍රැතයෙකි. මහා ස්ථවිරයෙකි යනාදිය කථා මාත්‍රයක් පමණි. කෙසේ නම්මම ධර්මකථිකයෙක්, බහුශ්‍රැතයෙක්, මහා ස්ථවිර කෙනෙක් වෙම් ද? ඒ මට කිසිදු ලාභ සත්කාර ආදියෙක් නොමැත' මෙසේ හීන වූ මානය ඇති වේ.

සදිසසස සෙය්‍යො හමසමි යනාදී මානයෙන් අමාත්‍ය ආදීන්ට උපදිති. අමාත්‍යයා වනාහි ප්‍රදේශ, භව භෝග සම්පත්, යාන වාහන නිමිති කරගෙන 'කවර නම් රාජ පුරුෂයෙක් මා හා සම වේදැ'යි සෙය්‍යමානය ද, 'අනෙක් රාජපුරුෂයන් හාමා අතර කවර වෙනසක් ද?'යි සදිස මානය ද, 'මා හට අමාත්‍ය නාමය පමණකි, මා හට කෑම් ඇඳීම් සඳහාවත් සම්පතක් නැත'යි හීන මානය ද ඇතිකර ගනී. **හීනසස සෙය්‍යො**

හමසමි යනාදී මාන තුන දාස කම්කරුවන්ට උපදියි. දාසයා වනාහි මව්පසින් හෝ පියපසින් සලකා 'කවරෙක් නම් මා හා සමාන දාසයෙක් වේද? අන්‍යයෝ ජීවත්වීමට බැරිව කුස හේතුවෙන්ම දාස බවට ගිය නමුත් මම වනාහි ප්‍රවේණියෙන් ම, පරම්පරාවෙන් ම දාස බව ලැබුවෙමි. මා පිය දෙපසින් ම ශුද්ධ දාසයෙක් මි. එනිසා මම දාසයන් අතර ශ්‍රේෂ්ඨ වෙමි'යි සෙය්‍යමානය ඇතිකර ගනියි. 'අසුවල් දාසයන් හා මා අතර කවර වෙනසක් ද? අපි සැම දෙන සමය'යි සදිස මානය ඇතිකර ගනියි. 'මම කුස පිණිස ම (බඩ වඩා ගැනීමට ම) දාස බවට පැමිණියෙමි. මාගේ මාපිය දෙපාර්ශ්වයේම සිටි දාසයෙක් නම් නැත. කෙසේ නම් මම දාසයෙක් වෙම් ද?යි හීන මානය ඇතිකර ගනියි. මෙසේ දාසයන්ට ඇතිවන සෙය්‍ය, සදිස, හීන මානයන් පුක්කුස (කශල ශෝධක) චණ්ඩාල (සැඩොල්) කුලිකයන්ට ද ඇතිවේම ය. මෙහිද උතුම් කුලවතුන්ට 'මම උතුම් අයෙකි' යි ඇතිවන සෙය්‍ය මානය ම යථාවමාන නම් වේ. සෙය්‍යයාට ඇතිවන සෙසු මාන දෙක අයථාවමානා නම් වේ. එසේම සදිසයාට 'මම සමාන වෙමි'යි කියාත්, හීනයාට 'මම හීනයෙක් වෙමි'යි කියාත් උපදින මානය යථාවමාන නම් වේ. සෙසු මාන දෙකම ඔවුන්ට අයථාවමාන නම් වේ. මෙහි යථාවමානය අර්හත් මාර්ගයෙන් ම දුරු වේ. අයථාවමානය සෝවාන් මාර්ගයේ දී නැති වේ. මෙහි සෙය්‍යයාට ඇතිවන 'මම උතුම් අයෙක් වෙමි'යි යන මානය, උතුමාට උතුම් අර්ථයෙන් 'මම ශ්‍රේෂ්ඨ වෙමි'යි මෙසේ උපදින මානයකි. සෙය්‍යයාට 'මම අන්‍යයන් හා සමාන වෙමි'යි ඇතිවන මානය උතුම් පුද්ගලයාට සම අර්ථයෙන් 'මම සමාන වෙමි'යි මෙසේ උපදින මැනීමයි. සෙය්‍යයාගේ හීන මානය නම් උතුම් පුද්ගලයාට ළාමක අර්ථයෙන් 'මම පහත් වෙමි'යි සිතන මානයයි. මේ අනුව සෙය්‍ය මාන, සදිස මාන හා හීන මාන යන තුනම සෙය්‍යයාට උපදියි. සදිසයාට ද මම 'උතුම් අයෙකි'. 'සමානයෙකි'. 'හීනයෙකි'යි මේ මාන තුනම උපදියි. හීනයාට ද 'මම හීනයෙක් මි, සමානයෙක් මි, උතුමෙකි'යි මේ ත්‍රිවිධ මානය ම උපදියි.

දශවිධ මාන නිර්දේශයේ **ඉධෙ කචෙවා මානං ජනෙති** යනු ඇතැම් පුද්ගලයෙක් මානය උපදවයි. **ජාතියා වා** යනු ක්ෂත්‍රියාදී ජාති සම්පත්තියකින් හෝ **ගොතෙතන වා** ගෞතම ගෝත්‍ර ආදී උත්කෘෂ්ට ගෝත්‍රයකින් හෝ. **කොල පුතතයෙන වා** මහත් වූ කුලවත් භාවයෙන් හෝ. **වණණ පොකඛරතායවා** වර්ණ සම්පන්න ශරීර ඇති බැවින් හෝ. ශරීරය වනාහි

'පොකඛරං' නෙළුමකැයි කියනු ලැබේ. එහි ඇති වර්ණවත් භාවය හා ඉතා රූපවත් භාවය නිසයි. **ධනෙන වා** ධන සම්පතින් යුක්ත භාවයෙන් හෝ. 'මගේ නිධන් කරන ලද හෝ තැන්පත් කළ ධනයේ ප්‍රමාණයක් නැත' යන අර්ථයයි. **අජ්ඣයනෙන වා** අධ්‍යයන (ඉගෙනීම්) වශයෙන් හෝ. **කම්මායතනෙන වා** 'අවශේෂ සත්ත්වයෝ සිඳින ලද පියාපත් ඇති කපුටන් හා සමානය. මම වනාහි මහිද්ධිකය. මහානුභාවයෙක්මියි කියා හෝ මම යම් යම් ක්‍රියාවක් කරන්නෙම් ද එය සමෘද්ධ වේ කියා හෝ මේ ආදී ක්‍රමයෙන් පවත්නා කර්මාන්තයෙන් හෝ **සිප්පායතනෙන වා** 'අවශේෂ සත්ත්වයන්ට කිසිදු ශිල්පයක් නැත. මම ශිල්පයන්හි කෙළ පැමිණියෙක්මි'යි ශිල්පායතන නිමිති කරගෙන හෝ. **විජ්ජාඨානෙන වා** මෙහි අර්ථ ඉහත කියූ පරිදිමය. **සුතෙන වා** අනෙක් සත්ත්වයෝ අල්ප ශ්‍රුතයෝය. මම බහුශ්‍රුත වෙමි.' ආදී වශයෙන් පැවති ශ්‍රැතියෙන් හෝ. **පටිභාණෙන වා** අනෙක් සත්ත්වයෝ අප්‍රතිභානිකයෝ ය. මගේ ප්‍රතිභාණයේ ප්‍රමාණයක් නම් නැත'යි මේ ප්‍රතිභාණයෙන් හෝ. **අඤ්ඤතරඤ්ඤතරෙන වත්ථුනා** නොකී වෙනත් කිසි කරුණකින් හෝ **යො එවරූපො මානො** මැනීම් කිරීම් වශයෙන් මානයයි. **මඤ්ඤනා මඤ්ඤිතත්තං** ආකාරය දක්වන නිර්දේශයයි. උස් කර දක්වන අරුතින් **උනනති** වේ. යමෙකුට උපදියි නම් ඒ පුද්ගලයා නොනැමේ. උස් කර තබයි යන අරුතින් **උන්නමෝ** වේ. ඔසවා තැබූ, ඔසවන ලද අරුතින් **ධජෝ** වේ. ඔසවා තබන අරුතින් සිත් මනාව පිළිගත්තේනුයි **සමපගණ්හාහෝ** වේ. **කෙතු** යනු බොහෝ කොඩි, ධජ අතර ඉතා උසට දැමූ ධජයකි. මානය ද නැවත නැවත උපදිනු ලබන්නේ පෙර, පසු මානයන් අල්ලාගෙන, ඉතා උස්ව කේතුවක් මෙන් නැගුනේ යයි කේතු නම් වේ. ඒ කේතුවක් සේ සිටීමට කැමති බව, කේතුකම්‍ය නම්. කේතුකම්‍ය වූ ස්වභාවය **කෙතුකම්‍යතා** වයි. එය සිතේ ඇතිවන්නකි. තමා කෙරෙහි නොවේ. එනිසා කියන ලදී. 'කෙතුකම්‍යතා චිත්තස්සාති, මාන සම්පයුත්තං හි චිත්තං කෙතුං ඉච්ඡති, තස්ස භාවෝ කෙතු සංඛාතෝ මානෝ' කේතුකම්‍යතාව සිතේ යෙදේ. මානයෙන් යුක්ත සිත කේතුවක් මෙන් සිටිනු කැමති වේ. එහි ස්වභාවය කේතු නම් වූ මානයයි.

රහතන් වහන්සේ මායාව ද මානය ද ඉවතලා, බැහැර කර, ඉහත පැවසූ පරිද්දෙන් විනෝදන (දුරු කිරීම) බැහැර කිරීම් වශයෙන් කෙලෙසුන්ගෙන් වෙන්ව සිටි සේක්ද, උන්වහන්සේ කවර රාගාදී ක්ලේශයකින් යන්නේද?

නෙරයිකොති වා නිරයේ උපදින සත්ත්වයෙක් හෝ නිරඡානයොනියාදීසුපි මේ ක්‍රමයමයි. **සො හෙතූනඤ්ඤති** යම් ජනක හේතුවකින් ගති ආදියෙහි උපදවන්නේ ද එබඳු හේතුවක් නැත. **පචචයො** යනු ඊටම සමාන වදනකි. **කාරණං** යනු කාරණයක් නැත. එය අයත් පැවතුම් ඇති බැවින්, තමාගේ ඵලයට 'ඨානං' යයි කියනු ලැබේ. එහෙයින් යම් කරුණකින්, ප්‍රත්‍යයකින්, හේතුවකින් ගති ආදියක උපත ගෙන දෙන්නේ ද එබඳු කරුණක් නැත.

යමෙක් වනාහි ඒ දෙයාකාර උපායයන්ගේ විද්‍යමානත්වයෙන් 'උපය' නම් වේ ද ඔහු සඳහා, **උපයොහි -පෙ- දිටඨිමිධෙව සබබා** යන බවයි. **ධමෙමසු උපෙති** වාදං ඇලුණේය. ගැටුණේය යනුවෙන් ඒ ඒ ධර්මයන්හි වාදයට පැමිණේ. **අනූපයං කෙන කථං වදෙය්‍ය තණ්හා** දෘෂ්ටි දෙක ප්‍රහාණය කිරීමෙන් උපය රහිත බවට ගිය රහතන් වහන්සේ, රාගයෙන් හෝ ද්වේෂයෙන් හෝ කෙසේ නම් ඇලුණෙක් වේද? ගැටුණු අයෙක් වේදැයි කිවයුතු වන්නේ ද? මෙසේ අනුපවද්‍ය වූ, නිරවද්‍ය වූ උන්වහන්සේ තීර්ථකයන් මෙන් කළ දෙය වසන්නෙක් නොවන්නේ ය' යන අදහසයි. **අතතං නිරතතං නහි තසස අතථි එහි** වනාහි ආත්ම දෘෂ්ටියෙන් හෝ උච්ඡේද දෘෂ්ටියෙන් ග්‍රහණයක් හෝ මිදීමක් (අත්හැරීමක්) නැත. ඇලීම්, ගැටීම් පිළිබඳ සිතුවිල්ලකුදු නැත. කුමන කරුණකින් එය නැත්තේ ද? **අධොසි සො දිටඨිමිධෙව සබබා** උන්වහන්සේ මෙලොවදීම, මේ ආත්මභාවයේදී ම ඤාණ නම් දියෙන් සියලු දෘෂ්ටීන්, දෘෂ්ටිගතිකයන් දුරු කළේය. අත්හළේය. පහ කළේය. මෙසේ අර්හත් නිකුටයෙන් (අර්හත්වය දක්වා දේශනාව ගෙන යෑමෙන්) දේශනාව නිමා කළ සේක. එය ඇසූ රජතුමා සතුටු සිත් ඇතිව භාග්‍යවතුන් වහන්සේ වැඳ පිටත්ව ගියේය.

රතෙතානි වා රාගයෙන් ඇලී හෝ **දුටෙඨානි වා** යනාදියෙහි ද මේ ක්‍රමයමයි. **තෙ අභිසංඛාරා අපපහීනා** යම් පුඤ්ඤාභිසංඛාර, අපුඤ්ඤාභිසංඛාර, අනෙඤ්ජාභිසංඛාරයක් වේනම් ඒවා අප්‍රහීනය. **අභිසංඛාරානං අපපහීනත්තා** ඉහතින් කියූ පරිදි කර්මාභි සංස්කාර අප්‍රහීණ භාවයෙන් ප්‍රහීණ නොකළ බැවින්, **ගතියා වාදං උපෙති** ඔහු යන ගතීන්ගෙන් එකක් පිළිබඳව ප්‍රකාශ වේ. ඒ නිමිත්තෙන් **නෙරයිකොති වාදං උපෙති උපගචඡති** යැයි කියන ලදී.

වදෙය්‍ය කියන්නේය. **ගහිතං නත්ථි** ගතයුත්තක් නැත. **මුඤ්චි තබ්බං නත්ථි** මුදාහැර සිටි බැවින් මුදවිය යුත්තක් මිදීමක් නැත. **යඤ්ඤත්ථි ගහිතං** යම් පුද්ගලයෙකුට 'මම ය, මගේ ය'යි ගැනීමක් ඇත් ද **තඤ්ඤත්ථිමුඤ්චි තබ්බං** ඒ පුද්ගලයාට මුදාහළ යුත්තක් වේද, මතු කී පදයන්හි අර්ථ පෙරලා (විරුද්ධාර්ථය) යෙදිය යුතුයි. **ගාහමුඤ්චනා සමතික්කනෙතා** ග්‍රහණයෙන් මිදී ඉක්මවා සිටි රහතන් වහන්සේ **වුද්ධි පරිහානි වීතිවත්තෙතා** අභිවෘද්ධිය ද පරිහානිය ද ඉක්මවා සිටි සේක. **සොවුත්ථවාසෝ** ආදියේ සිට **ඤාණගහිනා දඩ්ඨානි** යන්න දක්වා අර්ථ ඉහත කී පරිදිම දතයුතුයි. **අධොසි කම්පා කළේය.** ධුනි **සන්ධුනි නිද්ධුනි** යනාදියෙහි උපසර්ග යොදා අර්ථ වැඩිකරන ලදී.

තෙවන දුටඨටඨක සූත්‍ර වර්ණනාව නිමියේ ය.

4.

සිවුවන සුද්ධට්ඨක සූත්‍රයේ පළමු ගාථාවෙහි අර්ථය පළමුව දැක්වේ. 'මහණෙනි, මෙබඳු වූ දර්ශනයකින් පිරිසිදු බව ඇති නොවේ. තවද කෙලෙස් කිලුටින් අපිරිසිදු වූ, කෙලෙස් රෝගයන්ගෙන් පිරුණු, අධිගමය (අවබෝධය) රෝගයක්මය. මැවූ ඉන්ද්‍රජාලමය සඳක් වැනි මෙවැනි පුද්ගලයෙකු දකින දෘෂ්ටිගතික බාලයා, 'මම ශුද්ධ වූ උතුම් වූ ආරෝග්‍ය වූවෙකු දුටුවෙමි'යි සිතයි. ඒ දෘෂ්ටි සංඛ්‍යාත දර්ශනයෙන් මිනිසාගේ ශුද්ධිය ඇතිවේ යයි ඔහු මෙසේ සළකන්නේ, සිතන්නේ ඒ දර්ශනය ඉතා උතුම් ය'යි දැන ඒ දර්ශනයෙහි ශුද්ධිය දක්නා සුලු වූයේ, ඒ දර්ශන මාත්‍රයම ඤාණයයි අදහයි. එය වනාහී ආර්ය මාර්ග ඤාණය නොවේ.

පරමං ආරොග්‍ය පත්තං උතුම් නීරෝගීත්වයට (නිවනට) පැමිණ සිටි **තාණ පත්තං** ත්‍රාණයට (පාලනයට) පැමිණි **ලෙණපත්තං** සැඟවීමට පැමිණි **සරණපපත්තං** පිහිටට පැමිණි හෝ දුක් නැසීමට පැමිණි **අභයපපත්තං** අමෘතමහා නිවනට පැමිණි. **නිබ්බාණපත්තං** වාණ නම්

තණ්හා විරහිත බවට පැමිණි, **අභිජානනෙනා** විශේෂයෙන් දන්නා වූ. අජානනෙනා ඒකාන්තයෙන් දන්නේ, **විජානනෙනා** නානාවිධව දන්නාවූ. පටිවිජානනෙනා ඒ ඒ කරුණ නිමිති කරගෙන දන්නා වූ. **පටිවිජ්ඣනෙනා** හදවතේ තබා ප්‍රතිවේධ කරන්නේ, **චකඛු විඤ්ඤාණං රූපදසසනෙ** චක්ෂු විඤ්ඤාණයෙන් රූප දැකීම ඤාණය යැයි සිතයි. පනවයි. අදහයි. **මගෙගාති පවෙචති** උපාය යැයි සලකයි. **පථො** මාර්ගය, සංචාරය **නීයාණං** යෙගෙන යානුයි නීයාණ නම්. නියාණං යන පාඨය ද යෙදේ.

දිටඨෙන වෙ සුද්ධි යනු දෙවන ගාථාවයි. එහි අර්ථ මෙසේය. ඒ රූප දර්ශන සංඛ්‍යාත දෘෂ්ටියෙන්, ඉදින් මිනිසාගේ කෙලෙස් ශුද්ධියක් වේද, ඒ ඥානයෙන් හෝ ඔහු ඉදින් ජාති ආදී දුක්ඛයන් ඉවත් කරයි ද මෙසේ ඇති කල්හි, ආර්ය මාර්ගයෙන් අනික් අශුද්ධි මාර්ගයකින් ඉදින් ශුද්ධියක් වේ නම්, රාගාදී උපධීන්ගෙන් උපධි සහිත වූයේ ම පිරිසිදු වේ යැයි කිවයුතු බවට පැමිණේ. මෙබඳු ශුද්ධියක් නැත. **යම්හෙයකින් දිටඨීහි නං පාව තථා වදානං** දෘෂ්ටිය ම 'මොහු මිසදිටුවෙකි'යි කියයි. දෘෂ්ටියට අනුරූප බව **සසසතො ලොකො** ආදියෙන් වනාහි එසේ එසේයයි කියයි. රාගයත් සමග පවතී. සරාග වූයේ **සරාගො**. රාගික යන අර්ථයයි. සදොසො ආදියෙහි ද මේ ක්‍රමයමයි.

න බ්‍රාහමණො යනු තෙවන ගාථාවයි. එහි අර්ථ - යමෙක් පව් බැහැරලූ බැවින් බ්‍රාහ්මණ නම් වේ ද, ඔහු ආර්ය මාර්ගයෙන් අවබෝධ කරගත් ආශ්‍රවක්ෂය ඇත්තේ ක්ෂීණාශ්‍රව බ්‍රාහ්මණ වූයේ, ආර්යමාර්ග ඤාණයෙන් අන්‍ය වූ අභිමංගල සම්මත රූප සංඛ්‍යාත දැකීමෙහි ද එබඳුම වූ ශබ්ද සංඛ්‍යාත ඇසීමෙහි ද අවිතීක්කම සංඛ්‍යාත සීලයෙහි ද හස්ති ව්‍රතාදී භේද ඇති ව්‍රතයෙහි ද පඨවි (තද ගතිය) ආදී භේද ඇති ස්පර්ශ (මුත) යෙහි ද උපන්නා වූ මිථ්‍යා ඥානයෙන් ශුද්ධිය වේයැයි නොකියයි යනුවෙන් රහතන් වහන්සේගේ වර්ණනාව දක්වනු සඳහා කියන ලදී.

උන්වහන්සේ ත්‍රෛධාතුක පුණ්‍යයෙහිත් සියලුම පාපයන්හිත් **අනුපලිතෙතා**, නොඇලුණු හෙයින් තම ආත්ම දෘෂ්ටියෙන් මිදී යම්කිසිවකු ගැනීම ප්‍රහීණ කළ හෙයින් **අතතඤඣහො**. පුණ්ණාභි සංස්කාරාදිය නොකිරීමෙන් **න ඉධ පකබබමනො** යි කියයි. එනිසා උන්වහන්සේට

මෙසේ පසසමින් කියන ලදී. සියලුම කරුණුවලට මුල්පදයෙන් සම්බන්ධ වීම ගතයුතුයි.

'පිනෙහිත් පාපයෙහිත් නො ඇලී, ආත්මය අත්හැර, මේ ත්‍රෛධාතුක ලෝකයෙහි ඇලීම නොකරනුයේ, ක්‍ෂීණාස්‍රව බ්‍රාහ්මණයා අන්‍ය වූ ශුද්ධියක් නොකියනු ලැබේ. **නාතිපටිකෙඛපො** න යනු ප්‍රතිශේධාර්ථයේ නිපාතයකි. **බාහෙත්වා සබ්බපාපකානි** යන ගාථාවේ අර්ථ - යමෙක් සතර මාර්ගයෙන් සියලු පව් බැහැර ලා ආත්ම දෘෂ්ටියෙන් බැහැරව සිටි බැවින් මෙසේ කියන ලදී.

බැහැරලූ පව් ඇති බැවින් **විමලො** වේ. විමල බවට නිර්මල බවට, බ්‍රහ්ම බවට, ශ්‍රේෂ්ඨත්වයට පත්වූයේ, දුරුකළ සමාධිය, වික්ෂේපාකාර කෙලෙස් මලයෙන් හා මාර්ගඵල සමාධියෙන් **සාධු සමාහිතො** වේ. සංසාර හේතුව ඉක්මවා සිටීමෙන් සසර නිම වූ, ඉක්ම වූ නිෂ්ඨාවට පත් කෘත්‍ය ඇති බැවින් **කෙවලී** යැයි ද තණ්හා දෘෂ්ටියෙන් අමිශ්‍ර වූ, තොර වූ හෙයින් **අසිතො** යි ද ලෝකධර්මයන්හි කම්පා නොවන හෙයින් **තාදී** යැයි ද කියනු ලැබේ. මෙසේ ස්තුතියට සුදුසු වූ හෙයින් **සබ්‍රහ්මා** ඔහු බ්‍රාහ්මණයෙකැයි කියනු ලැබේ. **අඤ්ඤත්‍ර සතිපට්ඨානෙහි** සතර සතිපට්ඨාන අත්හැර, ඉන් වෙන්ව සම්‍යක් ප්‍රධානාදියෙහි ද මේ ක්‍රමයමයි. **සනෙතකෙ සමණබ්‍රාහමණා** ඇතැම් ලෝක සම්මතයෙන් ශ්‍රමණ බ්‍රාහ්මණයෝ යැයි ලැබූ නම් ඇති උතුමෝ විද්‍යමාන වෙති. **දිට්ඨි සුද්ධිකා** දෘෂ්ටියෙන් ශුද්ධ බව කැමතිව. **තෙ එකචචානං රූපානං දසසනං** මේ දෘෂ්ටි ශුද්ධිකයෝ, ඇතැම් රූපාරම්මණයන් දැකීම මංගලං **පචෙචනති** 'ඉෂ්ට කාරණයකි. සියලු සම්පත්තීන්ට හේතුවකි'යි කියති. අදහති. **අමංගලං පචෙචනති** අනිෂ්ට කාරණයකි. සියලු සම්පත්තීන්ට කරුණකැයි නො අදහති. **තෙ කාලතො උට්ඨහිත්වා** ඒ දැකීම මංගලයැයි කියන්නෝ උදේම නැගිට, අහිමංගල ගතානි විශේෂයෙන් අභිවෘද්ධියට ගියහ. **රූපානි පසසනති** නානාවිධ රූපාරම්මණ දකිති. **චටක සකුණං** ගේ කුරුල්ලන්. **ථූසස** බෙලුවලටයි ථූස්ස (ථූස) නැකතින් උපන් (හිඳ වූ) තරුණ බෙලිගසක් ගබහිනිපති ගැබ සහිත ස්ත්‍රියක් **කුමාරකං** ඛන්ධ ආරොපෙත්වා ගච්ඡනතං ළදරුවෙකු අතින් වඩාගෙන යන්නියක. **පුණ්ණඝටං** දිය පිරුණු කළය. **රොහිත මචඡං** රතු රෝහිත නම් මත්ස්‍යයකු. **ආජඤ්ඤරථං** ආජානීය අශ්වයන් යෙදූ රිය. **උසභං** මඟුල් වෘෂභයෙකු **ගොකපිලං** කබර දෙනක්. **පලාල පුඤ්ජං** පිදුරු මිටියක්. **තකකසටං** ගව මෝරු ආදියෙන් පිරූ

කළයක්. **නටං** නළු නාටකාදීන්, ඇතැමෙක් ධූර්ත ක්‍රියා කරන්නන් යැයි පවසති. **නගගසමණකං** නිර්වස්ත්‍ර මහණුන්, **ඛරං** කොටළුවෙකු, **ඛරයානං** කොටළුවකු යෙදූ රථාදියක්, **එකයත්තයානං** එක් ගවයකු යෙදූ රියක්, **කාණං** එකැසක් හෝ ඇස් දෙකම කණ වූවන්, **කුණී** අත් කොර වූවන්, **ඛඤ්ජ** කොර වූ පා ඇති, හරහට ගිය පා ඇති. **පක්ඛහතං** පිළකු, අත් පා දෙකම කොර වූවකු, **ජිණ්ණකං** මහලු වූවන්. **බ්‍යාධිතං** ලෙඩින් පීඩිත වූවන්, **මතං** කළුරිය කළ ශරීර. **සුතසුද්ධිකා** සෝත විඤ්ඤාණයෙන් ඇසීමෙන් පිරිසිදු බව කැමති අය. **සද්දානං සවණං** ශබ්ද අරමුණු ඇසීමට **වඩ්ඪානි වා** ආදිය ලෝකයේ පවතින ශබ්දයන් පමණක් ගෙන කියන ලදී. අවමංගලය වනාහි 'කණ වූවෙකි' ආදී වශයෙන් ඒ ඒ නම්න්ම කරන ශබ්දය පමණක්මය. **ඡිජ්ජන්ති වා** අත් පා සිඳේවායි කියා **භඤ්ඤන්ති වා** විද්‍යමාන නොවේයැයි කියා හෝ. **සීලසුද්ධිකා** ශීලයෙන් විශුද්ධිය කැමතිව. **සීලමත්තෙන වා** සංවර වීම් පමණකින් **සඤ්ඤමමත්තෙන** ඉඳුරන් දැමීම් පමණකින්. **සංවරමත්තෙන** තුන්දොර වැසීම් පමණකින් **අවීතික්කමමත්තෙන** ඉක්මවීම් පමණකින් **සමණෝ මණ්ඩිකා පුත්තෝ** මව්පසින් ලද නම. **සම්පන්න කුසලං** කුශලත්වයෙන් පිරිපුන්ව. **පරමකුසලං** උතුම් කුශලයෙක්ව, **උත්තම පත්තිපත්තං** උතුම් අර්හත්වයට පැමිණිය යුතු බවට පැමිණ සිටී. අයොජ්ඣං පරාද කිරීමට අසමර්ථ වූ ශ්‍රමණයකු **වත්තසුද්ධිකා** සමාදන් වූ ව්‍රතයෙන් ශුද්ධිය කැමතිව. **හත්ථිවතිකා වා** සමාදන් වූ හස්ති ව්‍රතය මොවුන්ට ඇත්තේනුයි හත්ථිවතිකා නම්. සියලු හස්ති ක්‍රියා කරන්නෝය යන අර්ථයයි. කෙසේද? 'අද පටන් ඇතුන් විසින් කළයුතු දේ කරන්නෙමි'යි මෙසේ උපන් සිත් ඇතිව, ඇතුන්ගේ ගමන, සිටින, හිඳින, නිදන ආකාරයෙන් ද මලමුත්‍රා කරන ආකාරය ද අනිකුත් ඇතුන් දැක සොඬ ඔසවා ගමන් කිරීම ද යන සියල්ලම කරන්නෝ හත්ථිවතිකයෝ ය. **අස්සවතිකා** දියෙහි ද මේ ක්‍රමයෙන් ම අර්ථ දැනගත යුතුයි. ඒ ව්‍රත සියල්ල අවසානයේ දැක්වෙන **දිසාවතිකා වා** යනු පෙරදිග ආදී දිශාවන්ට වැඳීම් වශයෙන් සමාදන් වූ ශීලය ඇත්තෝ ය.

මෙසේ කියන ලද ආකාර ඇති ශ්‍රමණ බ්‍රාහ්මණයන්ගේ ව්‍රත සමාදාන සම්පූර්ණ කිරීම හත්ථි ආදීන්ගේ සහව්‍යතාවට පමුණුවයි. ඉදින් මොහුට මම මේ ශීලයෙන්, ව්‍රතයෙන්, තපසින්, බඹසරින් දෙවියෙක් හෝ දෙවියන් අතරින් එක්තරා අයෙකු හෝ වෙමි'යි යන මිසදිටු සිත වේද, නමුත් ඔහුට නිරය තිරිසන් යෝනිය යන දෙකෙන් එකක් වේ යයි දත යුතුය. භාග්‍යවතුන් වහන්සේ මෙසේ වදාළේ එහෙයිනි. 'පුණ්ණය, මෙලොව

ඇතැමෙක් කුක්කුර ව්‍රතය වඩයි. පිරිපුන් මෙන්ම අමිශ්‍ර වූ කුක්කුර ශීලය වඩයි. පිරිපුන් මෙන් ම අමිශ්‍ර වූ කුක්කුර සිත ම වඩයි. පිරිපුන්ව අමිශ්‍රව කුක්කුර ආකල්ප වඩයි. පිරිපුන් අමිශ්‍ර වූ බලු ව්‍රතය, බලු ශීලය, බලු සිත, බලු ආකල්ප වර්ධනය කරන හෙතෙම මරණින් පසු බල්ලන් සමග එක්වීමට පැමිණෙයි. ඉදින් ඔහුට මෙවැනි සිතක්, දෘෂ්ටියක් වේ නම්, 'මම මේ ශීලයෙන් හෝ ව්‍රතයෙන් හෝ බඹසරින් හෝ දෙවියෙක් හෝ වන්නෙමි. ඉන් අන්‍යතරයෙක් (වෙනත් කෙනෙක්) හෝ වෙමි'යි ඒ සිත මිසදිටුවක් වේ. මිසදිටුවාට පුණ්ණය! මම ගති දෙකක් පනවමි. ඒ දෙකනම් - නිරය හෝ තිරිසන් යෝනියයි. ඉදින් පුණ්ණය, මෙසේ කුක්කුර ව්‍රතයට පිළිපන්නහු බල්ලන්ගේ සහව්‍යතාවයට (බල්ලන් සමග එක්වීමට) පැමිණෙති. නැතිනම් නිරයේ උපදිති. 'ගන්ධබ්බ ව්‍රත ඇත්තෝ ගන්ධබ්බාදීන්ගේ සහව්‍යතාවයට යන්නෝය'යි අර්ථ නො ගත යුතුයි. 'මිසදිටු අදහස් පිළිගත්තෝ ම නිරයට, තිරිසන් යෝනියට යති'යි ගත යුතුය. **මුත සුදධිකා** යනු ස්පර්ශයෙන් පිරිසිදු බව කැමැත්තෝ. **පඨවිං ආමසනති** ශාරීරික අඟ පසඟින් මහ පොළව ස්පර්ශ කරති. **හරිතං** යනු තෙත් නිල් තණ පත්, ගොමයං ගවාදීන්ගේ අමු ගොම. **කචඡපං** ඇට කැස්බෑ ආදී නොයෙක් කැස්බෑවන්. **ඵාලං අකකමනති** හීවැල අල්ලති. **තිලවාහං** තල කරත්ත හෝ තල ගොඩවල් ස්පර්ශ කරති. **ථුසස තිලං බාදනති** මගුල් සඳහා සූදානම් කළ තලකති. **ථුසස තෙලං මකෙඛනති** එබඳු වූ තලතෙල් ඇඟෙහි තවරා ගනිති. **දනත කඨං** දැහැටි දඬු. **මතති කාය නහායනති** කොකුම් ආදී සියළු මැටි වර්ගය ශරීරයේ උලා නැති. **සාටකං නිවාසෙනති** මංගලය පිණිස සූදානම් කළ වස්ත්‍ර අඳිති. **වෙඨනං වෙඨෙනති** හිස්වෙළුම් ලෙස පත්තුණ්ණ වස්ත්‍රයන්ගෙන් හිස තබති. පැළඳ ගනිති.

තෙධාතුකං කුසලාභිසංඛාරං යනු කාමධාතු, රූපධාතු, අරූප ධාතු ආදියේ ප්‍රතිසන්ධිය ගෙන දෙන, කුශලත්වයෙන් හටගත් ප්‍රත්‍යාභිසංඛාරයි. **සබබං අකුසලං** දොළොස් වැදෑරුම් අදක්ෂතාවයන්ගෙන් හටගත් අකුසලය. **යතො යම්කලෙක.** දහතුන් වැදෑරුම් පුණ්‍යාභිසංස්කාරය ද දොළොස් වැදෑරුම් අපුණ්‍යාභි සංස්කාරය ද සතරවැදෑරුම් අනෙඤ්ජාභි සංස්කාරයද සුදුසු පරිදි සමුච්ඡේද ප්‍රහාණයෙන් ප්‍රහාණය කරන ලද්දාහු වෙති. **අත්තදිට්ඨිං** ඒ හො, 'මේ මගේ ආත්මයයි' යනුවෙන් ගත් දෘෂ්ටිය අත්හරී. **ගාහං ජහො** 'මේ මම වෙමි'යි මාන සම්ප්‍රයුක්තව ගැනීම අත්හරී. නැවත **අත්තං ජහො** 'මෙය මගේය'යි තණ්හාවෙන් ගැනීම් වශයෙන් ද දෘෂ්ටි

ග්‍රහණ වශයෙන් ද ස්පර්ශ කර දැඩිව ගත්, අනුන්ගේ වශයෙන් ස්පර්ශ කළ, එහි ඇලී ගැටී සිටින බලවත් තණ්හා වශයෙන් ඩැහැගෙන සිටින ඝන බලවත්වම මුදවන ලදී. **සබ්බසස තං චත්තං හොති** යනාදියේ අර්ථ පැවසූ පරිදිම දතයුතුයි.

මෙසේ **න බ්‍රාහමණො අඤ්ඤතො සුද්ධිමාහ** යනුවෙන් පවසා දැන් යම් දෘෂ්ටිගතිකයෝ අන් අයුරකින් ශුද්ධි දක්වත් ද, ඔවුන්ගේ ඒ දෘෂ්ටියේ නිවනට නො පමුණුවන ස්වභාවය දක්වමින්, **පුරිමං පහාය** යන සිවුවන ගාථාව කියන ලදී. එහි අර්ථ මෙසේය. ඔවුන් විසින් අන්‍ය වූ ශුද්ධිවාදයන්ට සමාන වූ ද ඒ දෘෂ්ටියේ අප්‍රහීණභාවයෙන් ග්‍රහණය, මිදීම ආදියෙන් මැඬලූ බැවින් පූර්ව ශාස්තෘ ආදීන් අත්හැර, වෙනත් ශාස්තෘවරුන් ඇසුරු කරන එජා නම් වූ තණ්හාවෙන් අනුව ගිය මඬනා ලද රාගාදී භේද ඇති සංගය තරණය නො කරති. සංසයන් තරණය නොකරමින් ඒ ඒ ධර්ම ඉගෙන ගනිති. බැහැරද කරව. ඒ ඒ අතු අල්ලමින් අතහරින වඳුරෙකු මෙනි.

පුරිමං සත්ථාරං පහාය පූර්වයෙන් පිළිගත් ශාස්තෘ ප්‍රතිඥාව ඉවත දමා, අත්හැර **අපරං සත්ථාරං නිසසිතා** වෙනත් ශාස්තෘ කෙනෙකු වෙත ඇලී බැඳී **පුරිමං ධම්මකඛානං පහාය** ආදියෙහි ද මේ ක්‍රමයෙන්ම අර්ථ ගතයුතුයි. **එජානුගා** තණ්හාව අනුව ගිය. **එජානුගතා** තණ්හාවෙන් අනුව ගිය. **එජානුසටා** තණ්හාවට පිවිසි, බැසගත් **එජායාපනනා පතිතා** තණ්හාවෙහි නිමග්න වූ ද වැටුණා වූ ද, **මකකටො** වඳුරා අරඤ්ඤ වනයෙහි **පවනෙ** මහා වනයෙහි. **චරමානො** හැසිරෙමින්. **එවමෙව** උපමා සන්සන්දනයයි. **පුථූ** නානාවිධ. **පුථුදිට්ඨිගතානි** නානාවිධ වූ දෘෂ්ටි ගති. **ගණ්හනතිච පමුඤ්චනති ච** දැඩිව ගැනීම් වශයෙන් ගනිති. අත්හැරීම් වශයෙන් මිදෙති. **ආදියනති ච නිරසසජනති ච** පළිබෝධ කරති. අත්හරිති. ඉවත දමති.

පස්වන ගාථාවේ සම්බන්ධය - 'ඒ මිසදිටුව' මෙසේත් මේ පුද්ගලයා මිසදිටු අදහස් ඇත්තෙකි'යි කියූ බැවින්, ඔහු තමාම එහි සමාදන් කරවයි එහි **සයං** යනු තමා ම. **සමාදාය** ගෙන, රැගෙන. **වතානි** හස්ති ව්‍රත ආදිය **උච්චාවචං** එකින් එකට හෝ හීන ප්‍රණීත බවට. ශාස්තෘවරයාගෙන් ශාස්තෘවරයාට. **සඤ්ඤසතෙතා** කාම සංඥාදීන්හි ඇලුණු. **විදූවා** වෙදෙහි **සමෙච්ච ධම්මං** පරමාර්ථයන්හි විද්වත් වූ අර්හත් වූ සිවුමග නුවණින්

අවබෝධ කරගත්, චතුරාර්ය සත්‍ය ධර්මය දැනගෙන. සෙසු පදයන්ගේ අර්ථ ඉතා ප්‍රකටය. **සාමං සමාදාය** තමන් ම සමාදන්ව. ආදාය රැගෙන, ගෙන. **සමාදාය** මනාව ගෙන. **ආදියිත්වා** පළිබෝධ කර. **සමාදියිත්වා** මනාව පළිබෝධ කර, ගණ්හිත්වා අත් නො හැර. **පරාමසිත්වා** ඩැහැගෙන, **අභිනිවිසිත්වා** පිහිටුවා, කාමසංඥා ආදියේ පැවසූ පරිදිම අර්ථ ගතයුතුයි. **විඳ්වා** නුවණැති. **විජ්ජාගතො** විජානන (දැනගන්නා) බවට ගිය. **ඤාණී** ප්‍රඥාවෙන් යුක්ත. **විභාවී** නුවණින් විමසන. **මෙධාවී** අනිත්‍යාදී වශයෙන් තුලනය කළ ඤාණය. **පඤ්ඤා** යනාදිය ඉහත පැවසූ ක්‍රමයෙන් ම දතයුතුයි. චතුරාර්ය සත්‍ය ධර්මය දන්නේනුයි **ධම්මවිචය සම්බොජ්ඣංගො** නම් වේ. බොජ්ඣංගයන්ගේ අර්ථ ඉහත පවසා ඇත.

වීමංසා චතුරාර්ය සත්‍ය ධර්මය විමසන ප්‍රඥාවම යි. වීමංසාව ධර්ම විමසීම යැයි කියන ලදී. **විපස්සනා** මාර්ග සම්ප්‍රයුක්තව විවිධාකාරයෙන් දැකීමේ ප්‍රඥාවයි. **සම්මා දිට්ඨිං** ශෝභන වූ, ප්‍රශස්ථ වූ, සුන්දර වූ මාර්ග සම්ප්‍රයුක්ත සම්මා දිට්ඨිය. තෙහි වෙදෙහි ඒ සිවුමඟ නුවණින් ම. **අතීතඅනාගතෙ** ජාති ජරා මරණයන්ගේ කෙළවරට ගිය. **කොටිගතෙ** ආදියේ අර්ථ ඉහත කියූ පරිදිම ය. **වෙදනං වා අනාගතෙ** දැනගත යුතු වූ, අවසානයට පත් වූ, දතයුතු ධර්මයන්හි අවසානයට ගියේ, සිවුමඟ නුවණින් දතයුතු සංසාර දුකේ පර්යන්තයට, අන්තයට එනම් නිවනට ගියේ. **විදිතත්තා** දැනගත් බැවින්, අවබෝධ කරගත් බැවින්.

වෙදානි විවෙය්‍ය කෙවලානී යනාදී ගාථාවේ අර්ථය - යමෙක් සිවුමඟ නුවණින් කෙලෙසුන් ක්ෂය කරමින් නිවනට ගියේ වේද, ඔහු පරමාර්ථ වශයෙන් 'වෙදගූ' නම් වේ. යමෙක් සියලු මහණ බමුණන්ගේ ශාස්ත්‍ර යැයි හඳුන්වන ලද වේදයන්, දතයුතු කරුණු ඒ මාර්ග භාවනාවෙන්ම කෘත්‍ය හෙයින් අනිත්‍යාදී වශයෙන් විමසා බලන්නේය. එහි ඡන්දරාගය ප්‍රහාණය කිරීමෙන්, ඒ ඡන්ද ප්‍රහාණයෙන්ම සියලු වේදයන් ඉක්මවා, යම් වේද ප්‍රත්‍යයකින් වෙනත් ආකාරයකින් හෝ වේදනාවෝ උපදිති. ඒ සියලු වේදනාවන්හි වීතරාගී වේ. එහෙයින් ඒ අර්ථය දක්වමින් 'කුමක් වේදගූ යැයි පතන ලදදැ'යි විචාරා, මෙහි ප්‍රාර්ථනා කරන ලදැයි නො පවසා 'වේදයන් සොයන්නේ නම් -පෙ- ඔහු වේදගූ වේ'යැයි කියන ලදී. යමෙක් පවිචය ප්‍රඥාවෙන් දතයුතු දේ විමසා දැනගන්නේය. එහි ඡන්දරාග ප්‍රහාණයෙන් සියලු වේද ඉක්මවා සිටියි. ඔහු ශාස්ත්‍ර යැයි

කියනු ලබන වේදයන් අවබෝධ කර, දැනගෙන, ඉක්මවා සිටියි. යමෙක් වේදනාවන්හි වීතරාගී වේද, ඔහු ද වේදනාව යැයි දන්නා ලද වේදයන්ගෙන් පහ වූයේ, ඉක්මවා සිටියේ අති වේදනාවට ගියේනුයි වේදගූ නම් වේ. එහෙයින් එහිද අර්ථ දක්වමින් මෙය ප්‍රාර්ථනා කරන ලදැයි නොපවසා, වෙදානි විචෙය්‍ය -පෙ- වෙදගූසෝ යි කියන ලදී. **සමෙච්ච** ඤාණයෙන් පැමිණ. **අභිසමෙච්ච** ඤාණයෙන් පිරිසිඳ දැන. ධම්මං යනු චතුරාර්ය සත්‍ය ධර්මය. **සබ්බෙ සංඛාරා** සියලු ප්‍රත්‍ය සහිත ධර්ම. ඒවා අතරින් සංඛත සංස්කාරයෝ නම් ප්‍රත්‍යයන්හි එක්වීම කරන්නේනුයි සංස්කාර නම් වේ. ඒවා මෙසේ ප්‍රත්‍යයන්හි එකතුවීම කරන ලද බැවින් **සංඛත** යැයි විශේෂ කර කියන ලදී.

තෙභූමක රූපාදී ධර්ම අභිසංඛත සංස්කාරයෝ යැයි අටුවාවන්හි කියන ලදී. ඒවායෙහි ද 'අනිච්චා වත සංඛාරා' ආදියෙහි සංස්කරණය කළ සංස්කාරයන්හි සංග්‍රහ කිරීමට යයි. 'මහණෙනි, මේ අවිද්‍යාගත පුරුෂයා පුණ්‍ය සංස්කාරයන් අභිසංස්කරණය කරයි' යනාදියෙහි අවිද්‍යා ප්‍රත්‍යයෙන් සංස්කාරයෝ ම පැමිණියහ. තෙභූමක කුශල චේතනාව අභිසංස්කරණ සංඛාර නම් වේ. 'යාවතිකා අභිසංඛාරසස ගති තාවතිකං ගන්ත්වා අකඛාහතං මඤ්ඤං අථාසි' ආදියෙහි ආවා වූ කායික චෛතසික වීර්යය පයෝගාභිසංඛාර නම් වේ. 'සඤ්ඤා වේදයිත නිරොධං සමාපන්නසස ඛො ආවුසො විසාඛ භික්ඛුනො පඨමං නිරුජ්ඣති වචී සංඛාරො තතො කාය සංඛාරො තතො චිත්ත සංඛරො' යනාදියෙහි පැමිණි විතක්ක විචාරයෝ වචනය සංස්කරණය කරන්නේනුයි වචී සංඛාර නම් වේ. ආශ්වාස ප්‍රාශ්වාසයෝ කයින් සංස්කරණය කරන්නේනුයි කාය සංඛාර නම් වේ. සංඥාවත් වේදනාවත් සිතින් සංස්කරණය කරන්නේනුයි චිත්ත සංඛාර නම් වේ. මෙහිදී වනාහි සංඛත සංස්කාරයෝ ම අදහස් කරන ලදී.

අනිච්චා යනු වී අභාවයට පත්වන අරුතින් අනිත්‍යය. **දුක්ඛා** නැවත නැවත පෙළන අරුතින්. **සබ්බෙ ධම්මා** නිවන ද ඇතුලත් කර කියන ලදී. **අනත්තා** තමාට අවසඟව පවත්නා බැවින්. **අවිජ්ජා පච්චයා සංඛාරා** මෙහි යමක් නිසා ඵලයක් වේ ද එය ප්‍රත්‍යයයි. පටිච්ච යනු අත් නොහැර. බැහැර නොකර යන අර්ථයි. **එති** පැමිණේ. පවතියි යන අර්ථයයි. තවද උපකාරක අර්ථය ප්‍රත්‍යාර්ථය වේ. අවිද්‍යාව වූයේත් එම ප්‍රත්‍යය වූයේත්

එම අවිද්‍යාප්‍රත්‍ය නම් වේ. එනිසා අවිද්‍යා ප්‍රත්‍යයෙන් සංස්කාරයෝ **සමභවනති** හටගනිති. මෙසේ සම්භවන්ති යන පදය සෙසු පදයන් සමග ද සුදුසු පරිදි යෙදිය යුතුයි. 'එහි අවිද්‍යාව යනු කුමක් ද? දුක නොදැනීම, දුකෙහි ඇතිවීම නොදැනීම, දුකෙහි නිරෝධය නොදැනීම, දුක්ඛ නිරෝධගාමිනී ප්‍රතිපදාව නොදැනීම, පූර්වාන්තය නොදැනීම, අපරාන්තය නොදැනීම, පූර්වාන්ත අපරාන්ත දෙකම නොදැනීම, හේතුප්‍රත්‍ය සමවායෙන් හටගන්නා ප්‍රතීත්‍ය සමුත්පාද ධර්මයන් පිළිබඳව නොදැනීමයි.

සංස්කාර යනු කුමක්ද? පුණ්‍යාභිසංස්කාර, අපුණ්‍යාභිසංස්කාර, අනෙඤ්ජාභිසංස්කාර, කාය සංස්කාර, වචී සංස්කාර, චිත්ත සංස්කාර යනාදියයි. එහි පුණ්‍යාභිසංස්කාර යනු කාමාවචර මහා කුසල් සිත් අට, රූපාවචර කුසල් සිත් පහ යන දහතුනයි. දොළොස් අකුසල් සිත් අපුණ්‍යාභි සංස්කාර නම් වේ. අරූපාවචර කුසල් සිත් සතර ආනෙඤ්ජාභි සංස්කාර නම් වේ. කය පිළිබඳ සිතුවිලි කාය සංස්කාරයන්ය. වචනය පිළිබඳ සිතුවිලි වාග් සංස්කාරයන්ය. මනස පිළිබඳ සිතුවිලි චිත්ත සංස්කාරයන්ය.

මෙහිදී මේ සංස්කාර ප්‍රත්‍ය සඳහා අවිද්‍යාව හේතුවන බව කෙසේනම් දත හැකිද? අවිද්‍යාවේ වැඩීමෙන්, යමකු තුල දුක් ආදිය පිළිබඳව නොදැනීම් නම් වූ අවිද්‍යාව අප්‍රහීණව පැවතියේ ද ඔහු දුක ද පූර්වාන්තාදිය ද නොදන්නා බැවින් සංසාරික දුක් සමූහය 'සුඛයකි, සැපයකි'යි ගෙන, ඒ හේතුවෙන් ම ත්‍රිවිධ වූ සංස්කාර (රැස් කිරීම) අරඹයි. දුකෙහි ඇතිවීමට හේතුවන සමුදය සත්‍යය නොදන්නා බැවින් තණ්හාව හා බැඳි පාප සිතුවිලි සුබ හේතුවෙන් ගෙන රැස්කිරීම (සංඛාර) අරඹයි. දුකෙහි නිරෝධයත් ඊට මගත් නොදන්නා බැවින්, දුක නැති නොකරන ගති විශේෂයන්හි දුක්ඛ නිරෝධ සංඥාවෙන් යුතුවත්, ආර්ය මාර්ගය නොවූ යාගහෝම-පංචතාපනාදියෙහි නිවනට මගය යන සංඥාවෙන් යුතුවත් දුකින් මිදීම පතමින් යාග හෝම - පංචතාපනාදිය ප්‍රධාන කරගෙන සංස්කාර රැස්කරයි.

තව ද ඔහු උක්ත චතුරාර්ය සත්‍යයන් දැන අවිද්‍යාව ප්‍රහීණ නොකළ බැවින්, විශේෂයෙන්ම ජාති ජරා මරණ ආදී නොයෙක් ආදීනවයන්ගෙන් ගැලවුණේ නමුදු, පුණ්‍යඵල නම් වූ දුක, දුක වශයෙන් නොදන්නේ දුක අවබෝධ කරගනු සඳහා කාය-වාග්-චිත්ත යන ප්‍රභේද සහිත පුණ්‍යාභි

සංස්කාර රැස්කරයි. එය දිව්‍ය අප්සරාවන් කැමැත්තෙක් මරු ප්‍රපාතයට පනින්නාක් මෙනි. සැපයැයි සම්මත වූ ඒ පුණ්‍යඵලයේ කෙළවර මහත් වූ පිරිතැවීම්, දැවීම් උපදවයි. විපරිනාමී දුක්ඛයේ ඇති අල්ප වූ ආශ්වාද ඇති බව නොදක්නේ, ඊට ප්‍රත්‍යවන හේතුවන ඉහත කී ලෙසින් පුණ්‍යාභි සංස්කාර රැස්කරයි. පහන් සිලුවට අවුත් වැටී නැසෙන පළඟැටියකු මෙනි. මීබිඳුවලට කෑදරකමින් මීබිඳු තැවරුණු දෙපැත්ත කැපෙන පිහිතලයක් ලෙවකන්නෙකු මෙනි. කාම සේවනාදියෙහි විපාක සහිත ධර්මයන්හිද ආදීනව නොදකිමින්, සැපයකි යන සිතින් ද කෙලෙස්වලින් මැඩුනු බැවින් ද ද්වාරත්‍රයෙහි පවත්නා වූ ද අපුණ්‍යාභි සංස්කාරයන් රැස් කරනුයේ මළපහ සමග සෙල්ලම් කරන ළදරුවෙකු මෙනි. විස කන මැරෙනු කැමැත්තෙකු මෙනි. සතරාරූප්‍ය විපාකයන්හි ද සංස්කාරයන්ගේ ඇති විපරිණාමී ස්වභාවය අනවබෝධයෙන් ශාස්වත ආදී විපර්යාස වශයෙන් චිත්තසංඛාර නම් වූ අනෙඤ්ජාභි සංස්කාර රැස්කරයි. පිසාච නගරයට දිවෙන මගෙහි යන මංමුළා වූවෙකු මෙනි. මෙසේ අවිද්‍යාව හේතුවෙන් ම සංස්කාර ඇති වේ. අවිද්‍යාව නැතිකල්හි සංස්කාර නොවේ. එනිසා 'මේ සංස්කාරයෝ අවිද්‍යා ප්‍රත්‍යයෙන් වෙති'යි යන මේ කරුණ දතයුතුයි.

මෙය කියන ලදී. පළමුව අපි මේ අවිද්‍යාව සංස්කාරයන්ට ප්‍රත්‍ය වේය යන්න (අදහස) ගනිමු. කිම හුදකලා වූ ම මේ අවිද්‍යාව පමණක් සංස්කාරයන්ට ප්‍රත්‍ය වේද? නැතිනම් අන්‍ය ධර්මයෝ ද ඊට ප්‍රත්‍යය වෙත්ද? මෙහිදී ඉදින් අවිද්‍යාව යන එකම හේතුවක් සංස්කාරයන්ට ප්‍රත්‍ය වේනම් එවිට ඒකකාරණවාදයට පැමිණේ. එමෙන්ම වෙනත් ධර්මයෝද සංස්කාරයන්ට හේතුප්‍රත්‍ය වෙත්නම් එවිට 'අවිජ්ජා පච්චයා සංඛාරා' යයි එකම කාරණයක් නිර්දේශ කිරීම නූපදීද? නොම නූපදී. කුමක් හෙයින් ද?

> එකං න එකතො ඉධ - නා නෙකං අනෙකතොපි නො එකං
> එලමත්‍ථි අත්‍ථිපන එක - හෙතුඵලදීපනෙ අත්‍ථො

මේ භවයෙහි හෝ මේ ප්‍රත්‍යය වීමෙහි එක් හේතුවකින් එකම ඵලයක් ඇති නොවේ. එකම හේතුවකින් බොහෝ ඵල ද ඇති නොවේ. බොහෝ වූ හේතූන්ගෙන් එකම ඵලයක් ඇතිවීම ද නොසිදුවේ. 'අවිද්‍යාව

හේතුවෙන් සංස්කාර වේ' යනාදී වශයෙන් එක් එක් හේතු එක් එක් ඵලයන් දැක්වීමෙහි ප්‍රයෝජනයක් ඇත.

භාග්‍යවතුන් වහන්සේ ඇතැම් තැනක ප්‍රධාන හේතුව හෝ ඵලය ද ඇතැම් තැනක ප්‍රකට හේතුව හෝ ඵලය ද ඇතැම් තැනෙක අසාධාරණ හේතුව හෝ ඵලය ද ඇතැම් තැනෙක දේශනා ක්‍රමයට අනුරූප වශයෙන් හේතුව හෝ ඵලය ද ඇතැම් තැනෙක දේශනා ක්‍රමයට අනුරූප වශයෙන් හේතුව හෝ ඵලය ද දේශනා කරන සේක. එහෙයින් මෙහි මේ අවිද්‍යාව විද්‍යමාන කල්හිද සෙසු වස්තු ආලම්බන සහජාත ධර්මාදීවූ සංස්කාර කාරණයන් විද්‍යමාන කල්හිද 'අසසාදානුපසසිනො තණහා පවඩඪති' (ආශ්වාදය අනුව දකින්නා හට තෘෂ්ණාව වැඩේ යයි ද අවිජ්ජා සමුදයා ආසව සමුදයො (අවිද්‍යාවේ හටගැනීමෙන් ආශ්‍රවයන්ගේ හටගැනීම වේ) යයිද වදාළ හෙයින් සෙසු තෘෂ්ණා ආදී වූ සංස්කාර හේතූන්ටද අවිද්‍යාව හේතු වේනුයි ප්‍රධාන කාරණ බැවින්ද 'අවිදවා භිකඛවෙ අවිජජාගතො පුඤඤාභිසංඛාරමපි අභිසංඛරොති' (මහණෙනි, ඥාන තෙමේ අවිද්‍යාවට පැමිණියේ පුණ්‍යාභිසංස්කාරමපි අභිසංඛරොති' (මහණෙනි, අඥාන තෙමේ අවිද්‍යාවට පැමිණියේ පුණ්‍යාභිසංස්කාරයන්ද රැස් කෙරේ) යයි ප්‍රකට බැවින් ද (පුණ්‍යාභිසංස්කරාදීන්ට) අසාධාරණ බැවින්ද සංස්කාරයන්ට හේතූන් වශයෙන් දක්වන ලදැයි දතයුතුයි.

මෙයින්ම එකී එකී හේතුඵලයන් හැඟවීම යන මේ පරිහාර වචනයෙන් හැමතන්හි එකී එකී හේතුඵල දීපනයෙහි ප්‍රයෝජනය දතයුතුයි. මෙහි කීය. මෙසේ ඇතිකල්හිද ඒකාන්තයෙන්ම අනිෂ්ට ඵල ඇති සාවද්‍ය වූ අවිද්‍යාවගේ පුණ්‍යාභිසංස්කාර, ආනෙඤජාභිසංස්කාරයන්ට ප්‍රත්‍යය බව කෙසේ යෙදෙන්නේද?

කොසඹ බීජයකින් කිසි කලෙකත් උක්ගසක් හට නොගන්නේය. එසේම අවිද්‍යාවෙන් අකුශලයක්ම මුත් කුසල් හටගන්නේ යයි කීම යුක්ති සහගත නොවන්නේ නොවේ ද?

විරුඬො චාවිරුඬො ච - සදිසො'සදිසො තථා
ධම්මාන පවචයො සිඬො - විපාකා එව තෙ ච න

යම්හෙයකින් මේ ලෝකයෙහි යම් ස්වභාව ධර්මයකට විරුද්ධ වූ ද අවිරුද්ධ වූ ද එසේම සමාන වූ ද අසමාන වූ ද ප්‍රත්‍ය සංඛ්‍යාත වූ උපකාර කරන්නා වූ ධර්ම ප්‍රකට වේ. හෙවත් සිද්ධ වේ. ඒ ධර්මයෝද විපාකයෝ ම නොවෙත්.

මෙසේ මේ අවිද්‍යාව විපාක වශයෙන් ඒකාන්ත අනිෂ්ට ඵල ඇත්තකි. ස්වභාව වශයෙන් ද සාවද්‍ය බව ඇත්තකි. සියලුම පුණ්‍යාභිසංස්කාර, අපුණ්‍යාභිසංස්කාර, ආනෙඤ්ජාභිසංස්කාරයන්ට සුදුසු පරිදි ස්ථාන කෘත්‍ය ස්වභාව විරුද්ධ අවිරුද්ධ ප්‍රත්‍ය වශයෙන් ද සමාන අසමාන ප්‍රත්‍ය වශයෙන් ද ප්‍රත්‍ය වේයයි දතයුතුයි. තවද අනික් ක්‍රමයක් ද ඇත.

යම් පුද්ගලයෙක් චුති ප්‍රතිසන්ධියෙහිත්, ස්කන්ධායතන ධාතූන්ගේ පිළිවෙල නොසිඳ පැවැත්ම යයි කියන ලද සංසාර වෘත්තයෙහිත්, සංස්කාර ධර්මයන්ගේ ලක්ෂණයෙහිත් ප්‍රතීත්‍ය සමුත්පන්න ධර්මයෙහිත් විශේෂයෙන් ම මුළා වේද, ඒ පුද්ගලයා ත්‍රිවිධ වූ මේ සංස්කාරයන් නැවත නැවත සකස් කරන හෙයින් මේ අවිද්‍යාව ත්‍රිවිධ වූ ඒ සංස්කාරයන්ට ප්‍රත්‍යය වේ. යම්සේ ජාත්‍යන්ධයා කණවැල අල්ලාගෙන යන්නෙකු නැතිව, හුදකලාව මගට පිළිපන්නේ සමහර කාලයක නියම මාර්ගයෙන් ද, සමහර කාලයක නොමගින් ද යන්නේ ද එපරිද්දෙන් ම සැරිසරන්නා වූ අඥානයා විෂම මාර්ගය හැර රහත්මගට පමුණුවන කල්‍යාණ මිත්‍රයකු නැතිවීමෙන් ඇතැම් කාලවල පින් කරයි. සමහර කාලවල පව් කරයි. යම්කලෙක හෙතෙම කලණ මිතුරන්ගේ ඇසුරින් චතුරාර්ය සත්‍යයන් අවබෝධ කරගෙන අවිද්‍යාව සන්සිඳුවා, මුලුමනින්ම අවිද්‍යාව නසා ශාන්තව හැසිරෙන්නේය.

සංඛාරපච්චයා විඤ්ඤාණං යනු විඤ්ඤාණ කාය සයකි. චක්ඛු විඤ්ඤාණය, සෝත විඤ්ඤාණය, ඝාණ විඤ්ඤාණය, ජිව්හා විඤ්ඤාණය, කාය විඤ්ඤාණය හා මනෝ විඤ්ඤාණය යනු ඒ හයයි. එහි චක්ඛු විඤ්ඤාණය කුසල විපාක හා අකුසල විපාක යනුවෙන් දෙවැදෑරුම් වේ. මෙලෙසින්ම සෙසු සෝත, ඝාණ, ජිව්හා, කාය හා මනෝ විඤ්ඤාණයන් ද කුසල හා අකුසල විපාක වශයෙන් දෙවදෑරුම් වේ. මනෝ විඤ්ඤාණය වනාහි කුසලා කුසල විපාක මනෝධාතුක දෙකය. අහේතුක විපාක මනෝ විඤ්ඤාණ ධාතු තුනය. සහේතුක කාමාවචර විපාක සිත් අටය. රූපාවචර විපාක සිත් පහය, අරූපාවචර විපාක සිත් සතර යනුවෙන්

දෙවිසිවැදෑරුම් වේ. මෙසේ ලෞකික විපාක විඤ්ඤාණ සියල්ලම තිස්දෙකකි. එහි මෙ කියන ලද ආකාර ඇති විඤ්ඤාණය සංස්කාර ප්‍රත්‍යයෙන් වේ යැයි කෙසේ නම් දැනගන්නේ ද? කර්ම රැස් කිරීමක් නැතිව විපාක නොවන හෙයිනි. ඒ මෙසේයි. මේ දෙවිසි විඤ්ඤාණයම විපාකමයි. රැස්කිරීමක් නැතිව විපාක උපදින්නේ නම් සියල්ලන්ට සියලු විපාක ඉපදිය යුතුය. එසේ සියල්ලන්ට සියලු විපාක නූපදනා හෙයින් සංස්කාර ප්‍රත්‍යයෙන් මේ විඤ්ඤාණය වේ යයි දතයුතුයි. මේ සියලු විඤ්ඤාණයන් ප්‍රවෘත්ති ප්‍රතිසන්ධි වශයෙන් දෙපරිද්දකින් වේ. මොවුනතුරෙන් විඤ්ඤාණ සිත් දහය, මනෝධාතු සිත් දෙක, සෝමනස්ස සහගත අහේතුක මනෝවිඤ්ඤාණ ධාතුව යන දහතුන පංචස්කන්ධය ඇති භවයෙහි සුදුසු සේ ප්‍රවෘත්තියෙහි ම පවතී. ඉතිරි දහනවය තුන් භවයෙහි සුදුසු පරිදි ප්‍රවෘත්තියෙහි ද ප්‍රතිසන්ධියෙහි ද පවතියි.

ලද්ධ පච්චයමිති ධම්ම - මත්තමෙතං භවනන්තරමුපෙති
නාස්ස තතෝ සංකන්නි - න තතෝ හෙතුං විනා හොති

මෙසේ ලද ප්‍රත්‍ය ඇති මේ රූපාරූප ධර්ම මාත්‍රය භවාන්තරගත වේ. ප්‍රතිසන්ධි විඤ්ඤාණය ඒ පූර්ව භවයෙන් භවාන්තර සංක්‍රමණය නොවේ. ඒ අතීත භවයෙන් හේතුවක් නැතිවැ පහළ වන්නේද නොවේ.

මෙසේ කියන ලද පරිදි ලබන ලද අවිද්‍යාදී ප්‍රත්‍යය ඇති මේ ප්‍රතිසන්ධි විඥානය රූප අරූප ධර්ම මාත්‍රය ඉපදීම් වශයෙන් භවාන්තර ගත වේයයි කියනු ලැබේ. බාහිර පරිකල්පිත සත්ත්වයෙක් හෝ ජීවයෙක් හෝ භවාන්තර ගත නොවේ. ඒ විඤ්ඤාණයේ ද අතීත භවයෙන් මේ භවයට සංක්‍රමණය වීමක් නැත. අතීත භවයෙහි හේතුවක් නැතිව මේ භවයෙහි පහළවීමක් ද නැත. මෙහි ද පූර්ව චිත්තය මේ භවයෙන් ගිළිහෙන හෙයින් **චුති** යැයි ද පශ්චිම චිත්තය අන්‍ය භවයක් හා ගළපන හෙයින් **ප්‍රතිසන්ධි** යැයි ද කියනු ලැබේ.

මෙය කියනලදී. මෙසේ සංක්‍රාන්තියක් නොවීම ඉපදීම ඇතිකල්හි, මේ මිනිසත් භවයෙහි පැවති ස්කන්ධ නිරුද්ධ වූ බැවින් ඵලයට ප්‍රත්‍යය වූ කර්මය ද ඒ ඵලය උපදනා තැනට නොයන හෙයින් ද, කර්මය කළ තැනැත්තාට නොව වෙනත් අයෙකුට ඒ ඵලය වන්නේ නොවේද? ඵලය අනුභව කරන්නකු නැතිවිට ඒ ඵලය කවරකු හට වේද? (ලැබේද?) එනිසා

මේ විධානය (නියමය) අසුන්දර එකක් වන්නේ නොවේද? එහි පිළිතුර මෙසේය.

සන්තානෙ යං ඵලං එතං නාඤ්ඤසස නව අඤ්ඤතො
බීජානං අභිසංඛාරෝ එතසසඤ්ඤසස සාධකො

ඵලසසුපපත්තියා එව සිද්ධා භූඤ්ජක සම්මති
ඵලුප්පාදෙන රුක්ඛසස යථා ඵලති සම්මති

එක් සන්තතියක කර්මය නිපන් පෙළෙහිම උපදනා ඵලය ඒ එකම සන්තතියෙහි නියමයෙන් ම ඒකත්වය ද නානත්වය ද වැලැක්වූ හෙයින් කර්මය සකස් කළ පුද්ගලයාගෙන් පරිබාහිර වෙනත් පුද්ගලයෙකුට විපාකය වේයැයි හෝ ඒ කර්මයෙන් අන්‍ය වූ හේතුවකින් ඒ විපාකය වේයැයි හෝ කිවයුතු නොවේ. මේ අදහසට අඹ බීජ ආදිය චතුමධුරාදියෙහි බහා කරන ලද සකස් කිරීම සාධක වේ.

ඵලයේ උත්පත්තියෙන්ම හටගැනීමෙන් ම රුක ඵල හටගත්තේය යන සම්මුතිය ඇතිවේ. එමෙන් සුවදුක් ආදී විපාකයේ හටගැනීමෙන් ම සත්ත්වයා සුවදුක් විඳින්නේය යන සම්මතය ඇතිවේ.

'මෙසේ සිදුවන මේ සංස්කාරයෝ විද්‍යමාන වූවෝම ඵලයට ප්‍රත්‍ය වෙත් ද? අවිද්‍යමාන වූවෝ ම ඵලයට ප්‍රත්‍ය වෙත් ද?'යි යමෙකු ඇසුවහොත්, (මෙසේ පිළිතුරු දිය යුතුයි.) ඉදින් විද්‍යමාන වූවෝ ඵලයට ප්‍රත්‍ය වෙත්නම් ඒ සංස්කාරයන්ගේ වර්තමාන ක්ෂණයෙහිම විපාකය විය යුතුයි. අවිද්‍යමාන වූවෝම ඵලයට පැමිණ ප්‍රත්‍ය වෙත්නම් කර්මය කිරීමට පෙර ද විපාකය දිය යුතුය. පසුව ද විපාක දිය යුතුයි. නිතරමද විපාක දිය යුතුයි'යනුවෙනි. ඔහුට මෙසේ පිළිතුරු දිය යුතුයි.

කතත්තා පචචයා එතෙ - නව නිචචං ඵලාවහා
පාටිභොගාදිකං තසථ - වෙදිතබබං නිදසසනං

'මේ සංස්කාර කරන ලද හෙයින් තම, තමාගේ ඵලයට ප්‍රත්‍යය වනු විනා නිතර ඵල දීම සිදු නොවේ. ඇප වී ණය ගැනීම මෙහි උදාහරණ වශයෙන් දතයුතුයි' යනුවෙනි.

විඤ්ඤාණ පච්චයා නාමරූපං යන මෙහි **නාම** යනු වේදනා, සංඥා, සංස්කාර යන ස්කන්ධයෝය. සතරමහා භූතද ඒ සතරමහා භූත නිසා පවත්නා විසි හතරක් වූ උපාදා රූප ද **රූප** නම් වේ.

අභාවක ගර්භ සෙය්‍යකයන්ට ද අණ්ඩජයන්ට ද ප්‍රතිසන්ධික්ෂණයෙහි වස්තු කාය දශක වශයෙන් රූපයන්ගෙන් කලාප සත්තති දෙකක් හා අරූප ස්කන්ධ තුනක් ද පහළ වේ. මෙසේ රූප ධර්ම විස්සක් හා අරූප ධර්ම තුනක් යනුවෙන් විසිතුනක් ධර්ම විඤ්ඤාණ ප්‍රත්‍යයෙන් වන 'නාම-රූප' ලෙස දතයුතුයි. සභාවකයන්ට භාව දසකයද ඇතුලත්කොට තිස්තුනක් වේ.

ඕපපාතිකයන් අතුරෙන් බ්‍රහ්මකායිකයන්ගේ ප්‍රතිසන්ධි ක්ෂණයෙහි චක්ඛු-සෝත-වස්තු දහය ද ජීවිතින්ද්‍රිය නවකය ද වශයෙන් තිස්නමයක් රූප 'රූප' වේ. අරූප ස්කන්ධ තුනක්දැයි මේ සතලිස් දෙකක් ධර්ම විඥාන ප්‍රත්‍යයෙන් වන නාමරූප වශයෙන් දතයුතුයි.

කාමභවයෙහි වනාහි භාව සහිතව පරිපූර්ණ ආයතන ඇතිව උපදනා සෙසු ඕපපාතිකයන්ට හෝ සංසේදජයන්ට හෝ ප්‍රතිසන්ධි ක්ෂණයෙහි රූප කලාප සන්තති වශයෙන් චක්ඛු, සෝත, ඝාණ, ජිව්හා, කාය, වත්ථු, භාව දශක සතක් වශයෙන් සැත්තෑවක් ද අරූප ස්කන්ධ තුනත් සමග මේ සැත්තෑ තුනක් වන නාමරූප ධර්ම විඤ්ඤාණ ප්‍රත්‍යයෙන් වන බව දතයුතුයි. මේ උත්කර්ෂ වශයෙනි. (ඉහළම ප්‍රමාණ දැක්වීම්) අවම ප්‍රමාණ දැක්වීම් (අපකර්ෂ) වශයෙන් ඒ ඒ රූප කලාප දශය විකල වූවන්ට ඒවායේ වශයෙන් පිරිහීගොස් ඇතිවන ප්‍රතිසන්ධියෙහි විඤ්ඤාණ ප්‍රත්‍යයෙන් නාමරූප සංඛ්‍යා දතයුතුයි. අරූපීන්ට වනාහි අරූප ස්කන්ධ තුනම ද අසංඥ සත්ත්වයන්ට රූපයෙන් ජීවිතින්ද්‍රිය නවකය පමණක්ද වේ. මේ ප්‍රතිසන්ධියෙහි ක්‍රමයයි. ප්‍රවෘත්තියෙහි (ප්‍රතිසන්ධියේ පටන් චුතිය අතර වූ කාලයෙහි) රූප පවත්නා සියලු තැන්හි ප්‍රතිසන්ධි සිතේ ස්ථිති ක්ෂණයෙහි ප්‍රතිසන්ධි සිත හා පැවති තේජෝ ධාතුවෙන් (ඍතුවෙන්) උතුසමුට්ඨාන ශුද්ධාෂ්ටකය පහළ වේ. ප්‍රතිසන්ධි සිතෙන් මත්තෙහි ප්‍රථම භවාංගයේ පටන් ඒ චිත්ත සමුට්ඨාන ශුද්ධාෂ්ටකය ද ශබ්ද උපදනා කල්හි ප්‍රතිසන්ධියෙන් මත්තෙහි පැවති ඍතුවෙන් ද චිත්තයෙන් ද ශබ්ද නවකය ද උපදී. කබලිංකාර ආහාරය නිසා ජීවත්වන සත්ත්වයන්ගේ මේ

ආහාර සමුට්ඨාන ශුද්ධාෂ්ටකය යැයි මෙසේ ආහාර සමුට්ඨාන ශුද්ධාෂ්ටකයේ උතු චිත්ත සමුට්ඨාන ශබ්ද නවක දෙක යැයි රූප විසිහය වැදෑරුම්ව දැක්වේ. පෙර කර්ම සමුට්ඨාන රූප කලාප දෙකෙහි සිට කලාප සත දක්වා එක් එක් චිත්තයේ තුන් තුන් ක්ෂණයෙහි උපදින්නේ යැයි කියන ලද සැත්තෑ කොටස හා මෙහි කියන ලද චිත්ත සමුට්ඨාන, උතු සමුට්ඨාන දෙ කොටසෙහි වූ සවිසි (26) කොටසද යන මේ අනූහය වැදෑරුම් වූද එහි වූ අරූප ස්කන්ධ තුනත් සමග සංක්ෂිප්ත වශයෙන් නව අනූ වැදෑරුම් වූ ද ධර්මයන් ද ශබ්දය අනියත හෙයින් ඒ දෙකොටස හැර අනූසතක් වූ ධර්ම ද යෙදෙන යෙදෙන පරිදි විඤ්ඤාණ ප්‍රත්‍යයෙන් වන නාමරූප යැයි දතයුතුයි.

එහි ප්‍රතිසන්ධියෙහි වන නාම-රූප විඤ්ඤාණ ප්‍රත්‍යයෙන් වන්නේ යයි කෙසේ දැනගන්නේ ද? එය සූත්‍ර නය වශයෙන් යුක්ති වශයෙන් ද දතයුතුයි. සූත්‍ර නය වශයෙන් 'චිත්තය අනුව පවතින ධර්මය' යනාදී බහු ප්‍රකාරයෙන් වේදනාදීන්ට විඤ්ඤාණය ප්‍රත්‍යය වේයයි සිද්ධය. යුක්ති වශයෙන් වනාහි මෙහි දක්නා ලද චිත්තජ රූපයෙන් නොදක්නා ලද ප්‍රතිසන්ධි කර්මජ රූපයට විඤ්ඤාණය ප්‍රත්‍යය වන්නේය යන කරුණ සිද්ධය. දක්නා ලද දෙයින් නොදක්නා ලද ප්‍රතිසන්ධි රූපයට විඤ්ඤාණය ප්‍රත්‍යය වේ.

නාමරූප පච්චයා සළායතනං යනුවෙන් නාමය කියන ලද්දේමය. මෙහි රූපය නියම වශයෙන් සතර මහාභූත, වස්තු සය, ජීවිතින්ද්‍රිය යනුවෙන් එකොළාස්වැදෑරුම් වේ. සළායතන වනාහි චක්ඛු ආයතන, සෝතායතන ඝාණායතන, ජිව්හායතන, කායායතන, මනායතන නම් වේ. නාමරූපය මේ සළායතනයන්ට ප්‍රත්‍යය වන්නේයයි කෙසේනම් දැනගන්නේ ද? නාමරූප ඇතිකල්හිම සළායතනය ඇතිවන හෙයිනි. ඒ එසේමැයි. 'ඒ ඒ නාමය ද රූප ද ඇතිකල ඒ ඒ ආයතනය වේ. වෙනත් අයුරකින් නොවේ.

සළායතන පච්චයා ඵස්සා

ඡළෙව ඵස්සා සංඛෙපා චකබු සම්ඵස්ස ආදයෝ
විඤ්ඤාණමිව ඛත්තිංස විත්ථාරෙන භවන්ති තෙ

සැකෙවින් චක්ඛු සම්ඵස්ස ආදී ඵස්සයෝ සදෙනෙක්ම වෙති. විස්තර වශයෙන් ඒවා (ඉහත කී) විඥානය මෙන් දෙතිසක් වේ.

ඵස්ස පච්චයා වෙදනා

දාරතෝ වෙදනා වුත්තා චක්ඛු සම්ඵස්ස ජාදිකා
ඡළෙව තා පභෙදෙන ඉධ දවතිංස වෙදනා

ද්වාර වශයෙන් චක්ඛු සම්ඵස්සජාදී වේදනා සයක්ම කියන ලදී. ප්‍රභේද වශයෙන් වේදනාව මෙහි දෙතිස්වැදෑරුම් ව දක්වනු ලැබේ.

වෙදනා පච්චයා තණ්හා

රූප තණ්හාදි භෙදෙන ඡ තණ්හා ඉධ දීපිතා
එකෙකා තිවිධා තස්ථ පවත්තනාකාරතෝ මතා

රූප තණ්හාදී වශයෙන් මෙහිදී තණ්හාවේ ප්‍රභේද සයක් දක්වන ලදී. ඒ තණ්හාව නැවත එක එකක් පැවති ආකාරයෙන් කාමාශ්වාද වශයෙන් (කාම, භව හා දිට්ඨි යනුවෙන්) තුන්වැදෑරුම් වේ.

දුක්ඛී සුඛං පත්ථයති සුඛී භීය්‍යොපි ඉච්ඡති
උපෙක්ඛා පන සන්තත්තා සුඛමිච්චෙව භාසිතා

දුක ඇත්තා සුවය පතයි. සුවය ඇත්තා තව තවත් සුවයන් පතයි. උපේක්ෂාව ශාන්ත හෙයින් සැපය යැයි කියන ලදී.

තණ්හාය පච්චයා තසමා හොනති තිසෙසාපි වෙදනා
වෙදනා පච්චයා තණ්හා ඉති වුත්තා මහෙසිනා

එහෙයින් මේ සුඛ-දුක්ඛ-උපේක්ෂා යන ත්‍රිවිධ වේදනාවම තෘෂ්ණාවට ප්‍රත්‍යය වන හෙයින් වේදනා ප්‍රත්‍යයෙන් තෘෂ්ණාව ඇතිවේ යැයි මහර්ෂී බුදුන් වහන්සේ විසින් දේශනා කරන ලදී.

තණ්හා පච්චයා උපාදානං යන්නෙහි උපාදාන සතරකි. කාමූපාදානය, දිට්ඨූපාදනය, සීලබ්බතූපාදානය හා තත්වාදූපාදානය යනුවෙනි. **උපාදාන පච්චයා භවෝ** මෙහිදී කර්ම භවය අදහස් කරන ලදී. උත්පත්ති භවය වනාහි පදුද්ධාර වශයෙන් කියන ලදී. **භව පච්චයා ජාති** කර්ම භවය ප්‍රත්‍යවීමෙන් ජාතියේ ප්‍රතිසන්ධි ස්කන්ධයන්ගේ පහළවීම සිදුවේ. භවය ජාතියට ප්‍රත්‍ය වන්නේයැයි කෙසේනම් දත හැකිද? බාහිර ප්‍රත්‍යයන්ගේ සමත්ත්වය ඇතිකල්හි ද හීන-ප්‍රණීතතාදී භේදය දක්නා ලැබෙන හෙයිනි. බාහිර වූ මව්පියාදීන්ගේ ශුක්‍ර-ශ්‍රෝණිත ආහාරාදී ප්‍රත්‍යයන්ගේ සමත්වය ඇතිකල්හිද නිඹුල් දරුවන්ගේ ද හීණ-ප්‍රණීතතාදී විශේෂයෙන් ප්‍රකට වේ. එයද හැමකල්හිම හැම සත්ත්වයන්ගේම එකසේ නොවන හෙයින් එය ද අහේතුක නොවේ. තවද ඒ හීන, ප්‍රණීතතා විශේෂය උඵදවන්නා වූ සත්ත්වයන්ගේ අධ්‍යාත්ම සන්තානයෙහි අනෙක් කාරණයක් නැති හෙයින් කර්ම භවයම හේතු කරගෙන ඇත්තේය. භාග්‍යවතුන් වහන්සේ එහෙයින් වදාළහ. 'කර්මයම සත්ත්වයන් හීණ-ප්‍රණීත වශයෙන් බෙදා දක්වයි. 'එනිසා භවය ජාතියට ප්‍රත්‍යය වේයැයි දතයුතුයි.

ජාති පච්චයා ජරා මරණං ආදියෙහි ඉපදීම නැතිවිට ජරාමරණ මෙන්ම ශෝකාදී දුක් ද නොමැත. ජාතිය (ඉපදීම) ඇතිකල්හි ජරාමරණ මෙන් ම ජරාමරණ සංඛ්‍යාත දුක්ඛ ධර්මයන් ස්පර්ශ කරන ලද බාලයාට, ජරාමරණයන්හි සම්බන්ධයෙන් හෝ ඒ ඒ දුක්ඛ ධර්මයෙන් ස්පර්ශ කරන ලද්දේ, ඒ හා සම්බන්ධ නොවූවද ශෝකාදී ධර්ම ඇතිවේ. එනිසා ජාති ප්‍රත්‍යයෙන් ජරාමරණ වේ යැයි කියන ලදී. **සමෙච්ච අභිසමෙච්ච ධම්මං** යනු ඤාණයෙන් චතුරාර්ය සත්‍ය ධර්ම මනාව අවබෝධ කරගෙන, මෙසේ දොළොස් පදයක් සහිත ප්‍රත්‍යාකාරයන්ගේ ප්‍රවෘත්තිය දක්වා, දැන් විවට්ට වශයෙන් අවිද්‍යාදීන්ගේ නිරෝධය දැක්වීමට **අවිජ්ජා නිරොධා සංඛාර නිරොධොති සමෙච්ච අභිසමෙච්ච ධම්මං** යනාදිය කියන ලදී.

මෙහි **අවිජ්ජා නිරොධා** අවිද්‍යාව නැවත නූපදනා පරිදි නිරෝධ කිරීමෙන්, නැවත ඇතිනොවන සේ නැති කිරීමෙන්. **සංඛාර නිරොධො** සංස්කාරයන්ගේ නැවත නූපදනා නිරෝධය වේ. සෙසු පදයන්හි ද මේ ක්‍රමයෙන් අර්ථ ගතයුතුයි. **ඉදං දුකඛං** යනාදිය පෙර කියූ පරිදිම දතයුතුයි. **ඉමෙ ධම්මා අභිඤ්ඤෙය්‍යා** මේ ත්‍රෛභූමික ධර්මයෝ ස්වභාව ලක්ෂණ අවබෝධ කරගැනීම් වශයෙන්, ශෝභන වූ ආකාරයෙන් හෝ අධික

ඥානයෙන් හෝ ස්වභාව වශයෙන් දතයුතුයි. **පරිඤ්ඤෙය්‍යා** සමාන ලක්ෂණ අවබෝධ කරගැනීම් වශයෙන් ද කෘත්‍ය සමාපන වශයෙන් ද හාත්පසින් පිරිසිඳ දතයුතුයි. **ඉමෙ ධම්මා පහාතබ්බා** මේ සමුදය පක්ෂයෙහි වූ ධර්ම ඒ ඒ ගුණාංගයෙන් ප්‍රහීණ කළ යුතුයි. **භාවෙතබ්බා** වැඩිය යුතුයි. **සච්ඡිකාතබ්බා** ප්‍රත්‍යක්ෂ කරගත යුතුයි. සාක්ෂාත් කරගැනීම් දෙකකි. එනම් ප්‍රතිලාභ සාක්ෂාත් කරණය හා ආරම්මණ සාක්ෂාත්කරණය යනුවෙනි. **ඡනනං එසසායතනානං** චක්ෂු ආදී ආයතන සයෙන්. **සමුදයඤ්ච අත්ථගමඤ්ච** ඉපදීමත් නිරෝධයත්.

භූරිපඤ්ඤා භූරී (පොළව) මෙන් වූයේනුයි භූරි නම් වේ. ඒ භූරි (මහත්) ප්‍රඥාවෙන් යුක්ත වූයේ භූරිපඤ්ඤ නම් වේ. මහාපඤ්ඤා ආදියෙහි 'මහා ප්‍රඥා ආදියෙන් යුක්තය' යන අර්ථයයි. ඒ මේ මහා ප්‍රඥාදියේ නානාර්ථවත් භාවයයි.

මහා ප්‍රඥාව නම් කවරේද? මහත් වූ අර්ථයන් හාත්පසින්ම ගන්නේනුයි මහා ප්‍රඥා නම් වේ. මහත් වූ ධර්මයන්, මහත් වූ නිරුක්ති, මහත් වූ ප්‍රතිභානයන් හාත්පසින්ම ගන්නේනුයි මහා ප්‍රඥා නම් වේ. මහත් වූ ශීලස්කන්ධයන් හාත්පසින් ගන්නේනුයි මහාප්‍රඥා නම් වේ. මහත් වූ සමාධි ස්කන්ධයන්, ප්‍රඥා ස්කන්ධ්‍යන්, විමුක්ති ස්කන්ධයන්, විමුක්ති ඤාණ ස්කන්ධයන් හාත්පසින් ගන්නේනුයි මහාප්‍රඥා නම් වේ. මහත් වූ ස්ථාන අස්ථාන, මහාවිහාර සමාපත්ති මහත් වූ ආර්ය සත්‍ය, මහත් වූ සතිපට්ඨාන, සම්‍යක් ප්‍රධාන, ඍද්ධිපාද, මහත් වූ ඉන්ද්‍රියයන්, බලයන්, බොජ්ඣංගයන්, මහත් වූ ආර්ය මාර්ගයන්, මහත් වූ ශ්‍රමණ ඵලයන්, මහත් වූ අභිඥාවන්, මහත් වූ පරමාර්ථ නිර්වාණය හාත්පසින්ම ගන්නේනුයි මහා ප්‍රඥා නම් වේ.

පුථු ප්‍රඥාව නම් කවරේද වෙන් වෙන්ව, නානා ස්කන්ධයන්හි ඤාණය පවත්වන්නේ නුයි පුථු ප්‍රඥා නම් වේ. වෙන් වූ නානාධාතූන්හි, වෙන් වූ නානා ආයතනයන්හි, වෙන් වූ නානා ප්‍රතීත්‍ය සමුත්පාදයන්හි, වෙන් වූ නානා ශූන්‍ය මනුපලබ්දයන්හි, වෙන් වූ නානා අර්ථවත් ධර්මයන්හි, නිරුක්තීන්හි, ප්‍රතිභානයන්හි, වෙන් වූ නානාවිධ ශීලස්කන්ධයන්හි, වෙන් වූ නානා සමාධි ප්‍රඥා විමුත්ති විමුත්ති ඤාණ දර්ශන ස්කන්ධයන්හි, වෙන් වූ නානා ආර්ය සත්‍යයන්හි, වෙන් වූ නානා

සතිපට්ඨානයන්හි, සම්‍යක් ප්‍රධානයන්හි, ඍද්ධිපාදයන්හි, ඉන්ද්‍රියයන්හි, බලයන්හි, බොජ්ඣංගයන්හි, වෙන් වූ නානා ආර්ය මාර්ගයන්හි, ශ්‍රමණ ඵලයන්හි, අභිඥාවන්හි, වෙන් වූ නානාවිහාර සමාපත්ති ජන සාධාරණ ධර්මයන් ඉක්මවා පරමාර්ථ නිවනෙහි ඤාණය පවත්වන්නේනුයි 'පුථු ප්‍රඥා' නම් වේ.

හාසු ප්‍රඥාව කවරේ ද යත්, මෙලොව ඇතැම් හාස්‍ය බහුල, වේද බහුල, තුෂ්ටි බහුල, ප්‍රමෝදය බහුල අයෙකු සිල් සම්පූර්ණ කරයි. ඉන්ද්‍රිය සංවරය සම්පූර්ණ කරයි. භෝජනයෙහි ප්‍රමාණය දන්නේ වේ. නිදිවැරීමෙහි යෙදුණේ වේ. සීල, සමාධි, ප්‍රඥා, විමුත්ති, විමුත්ති ඤාණ දර්ශන ස්කන්ධයන් සම්පූර්ණ කරන්නේනුයි හාසු ප්‍රඥා නමි. හාස්‍ය බහුල වූයේ ප්‍රමෝදය බහුලවූයේ ස්ථාන අස්ථාන මනාව දන්නේනුයි හාසු ප්‍රඥා නම් වේ. හාස්‍ය බහුල වූයේ විහාර සමාපත්ති සම්පූර්ණ කෙරේනුයි හාසු ප්‍රඥා වේ. හාස්‍ය බහුලව ආර්ය සත්‍යයන් පිරිසිඳ දන්නේ නුයි ද සතිපට්ඨානයන් වඩන්නේනුයි ද සම්‍යක් ප්‍රධානයන්, ඍද්ධිපාදයන්, ඉන්ද්‍රියයන්, බලයන්, බොජ්ඣංගයන්, ආර්ය මාර්ගය වඩන්නේනුයි, හාසු ප්‍රඥා නම් වේ. හාසු බහුලයා සාමඤ්ඤඵලයන් සාක්ෂාත් කරයි. අභිඥාවන් අවබෝධ කරගනීනුයි හාසු ප්‍රඥා නම් වේ. හාසු බහුලයා පරමාර්ථ නිවන සාක්ෂාත් කරන්නේනුයි හාසු ප්‍රඥා නම් වේ.

ජවන ප්‍රඥාව කවරේ ද? අතීත, අනාගත, ප්‍රත්‍යුත්පන්න වූ හෝ අධ්‍යාත්මික වූ හෝ බාහිර වූ හෝ ඕලාරික වූ හෝ සූක්ෂම වූ හෝ හීන වූ හෝ ප්‍රණීත වූ හෝ දුර වූ හෝ සමීපයේ වූ හෝ යම්කිසි රූපයක් වේද, ඒ සියලු රූප අනිත්‍ය වශයෙන් වහා දිව යන්නේනුයි ජවන ප්‍රඥා නම් වේ. යම්කිසි වේදනාවක්, යම්කිසි සංඥාවක්, යම්කිසි සංස්කාරයක්, යම්කිසි විඤ්ඤාණයක් වේද අතීත අනාගත ප්‍රත්‍යුත්පන්න වූ හෝ -පෙ- දුර හෝ සමීපයේ ඇති ඒ සියලු විඤ්ඤාණයන් අනිත්‍ය, දුක්ඛ, අනාත්ම වශයෙන් වහා දිව යන්නේනුයි ජවන ප්‍රඥා නම් වේ. ඇස -පෙ- ජරා මරණ, අතීත, අනාගත, ප්‍රත්‍යුත්පන්න වූයේ ඒ සියල්ල අනිත්‍ය වශයෙන්, දුක් වශයෙන්, අනාත්ම වශයෙන් වහා දිවයන්නේනුයි ජවන පඥා නම් වේ. අතීත, අනාගත, ප්‍රත්‍යුත්පන්න වූ රූපය ක්ෂය වන, වැනසෙන හෙයින් අනිත්‍යය වේ. භය ගෙනදෙන හෙයින් දුකකි. අසාර බැවින් අනාත්ම වේ යැයි සමාන කර, තීරණය කර, විස්තර කර, ප්‍රකට කර, රූපය නිරෝධ කිරීමෙහි,

නිවනෙහි වහා දිවයන්නේනුයි ජවන ප්‍රඥා නම් වේ. වේදනා, සංඥා, සංඛාර, විඤ්ඤාණ, ඇස -පෙ- ජරාමරණ, අතීත, අනාගත, ප්‍රත්‍යුත්පන්න වූ ධර්මයන් ක්ෂය වන බැවින් අනිත්‍යය. බිය ගෙන දෙන බැවින් දුකකි. අසාර වූ අර්ථයෙන් අනාත්මය. මෙසේ සමාන කර, තුලනය කර -පෙ- ප්‍රකට කර, ජරාමරණ නිරෝධය නම් නිවනෙහි වහා දිවයන්නේනුයි ජවන ප්‍රඥා නම් වේ. 'අතීත, අනාගත, ප්‍රත්‍යුත්පන්න රූපය අනිත්‍යය, සංඛතය, ප්‍රතීත්‍ය සමුත්පන්නය, ක්ෂය ධර්මයකි, ව්‍යය ධර්මයකි, විරාග ධර්මයකි, නිරෝධ ධර්මයකි'යි තුලනය කර -පෙ- ප්‍රකට කර ජරාමරණ රූප නිරෝධ නම් නිවනෙහි වහා දිව යන්නේනුයි ජවන ප්‍රඥා නම් වේ. වේදනා සංඥා, සංස්කාර විඤ්ඤාණ ඇස -පෙ- ජරාමරණ අතීත, අනාගත, ප්‍රත්‍යුත්පන්න අනිත්‍යය -පෙ- නිරෝධ ධර්මයකැයි තුලනය කර -පෙ- ප්‍රකට කර ජරා මරණ නිරෝධ නම් නිවනෙහි වහා දිවයන්නේ නුයි ජවන ප්‍රඥා නම් වේ.

තික්ඛ ප්‍රඥාව කවරේද යත්, වහා කෙලෙස් සිඳ දමනුයේ නුයි තික්ඛ ප්‍රඥා නම් වේ. උපන් කාම විතර්කය නො ඉවසයි. උපන් ව්‍යාපාද විතර්කය, උපන් විහිංසා විතර්කය, උපනුපන් පවිටු අකුසල ධර්මයන්හි රාගය උපන්නේය. දෝස, මෝහ, ක්‍රෝධ, උපනාහ, මක්ඛ, පලාස, ඊර්ෂ්‍යා, මච්ඡරිය, මායා, සාඨෙය්‍ය, ථම්භ, සාරම්භ, මාන, අතිමාන, මද, පමාද යන සියලු කෙලෙස්, සියලු දුශ්චරිත, සියලු අභිසංස්කාර, සියලු භවගාමී කර්ම නොඉවසයි. දුරුකරයි. ඉවත්කරයි. මැඩපවත්වයි. නැවත නූපදනා තත්ත්වයට පත්කරයි. මේ අරුතින් තික්ඛ ප්‍රඥා නම් වේ. එකම ආසනයෙහි සිවු ආර්ය මාර්ග, සතර ශ්‍රමණ ඵල, චතුපටිසම්භිදාවන්, ෂඩ් අභිඥා අවබෝධ කරගත්තේ වේ. සාක්ෂාත් කරගත්තේ වේ. ප්‍රඥාවෙන් ස්පර්ශ කරන ලද්දේ වේ යන අරුතින් ද තික්ඛ ප්‍රඥා නම් වේ.

නිබ්බේධික ප්‍රඥාව කවරේද? මෙහි ඇතැමෙක් සියලු සංස්කාරයන් පිළිබඳව තැතිගැනුම් බහුලව, උත්‍රාස බහුලව, කළකිරීම් බහුලව, අරති බහුලව, අනභිරති බහුලව, පිටත මුව ඇතිව නොඇලේ. සියලු සංස්කාරයන්හි විනිවිද නොගිය විරූ, පදාළිත නොවූ විරූ ලෝභ ස්කන්ධාදිය විනිවිද යන, පදාළනය කරන ප්‍රඥාව නිබ්බේධික ප්‍රඥාවයි. 'විනිවිද නොගිය විරූ දෙකඩ කිරීම් විරහිත දොසක්ඛන්ධය, මෝහ ස්කන්ධය, ක්‍රෝධය, උපනාහය -පෙ- සියලු භවගාමී කරම් විනිවිද යයි. දෙකඩ කරන ලදී'නුයි නිබ්බේධික ප්‍රඥාව නම් වේ.

ස සබ්බධමෙමසු විසෙනිභූතෝ යංකිඤ්චි දිට්ඨං ව සුතං මුතං වා ඒ හැරිප්‍රාඥ රහතන් වහන්සේ කිසියම් රූපාලම්බනයක් හෝ ශබ්දාලම්බනයක් හෝ ගන්ධ, රස, ස්පර්ශාලම්බනයක් හෝ වේද ඒ සියලු ධර්මයන්හි අකුශලාභි සංස්කාර නම් මරසෙනඟ වනසා සිටි බැවින් 'විසෙනී' නම් වූ සේක. යමක් දකින්නේ නම් හෝ **තමෙව දසසි** එයම විශුද්ධව දකියි. යථාර්ථවත්ව දකියි. **විවටං චරන්තං** තෘෂ්ණාව වසාගැනීම් ආදියෙන් දුරුව, විවෘතව හැසිරෙන, **කෙනීධ ලොකසමිං විකප්පයෙය්‍ය** යනු ඒ රහතුන්ගේ පෙර කියන ලද රාගාදිය ප්‍රහීණ බැවින් මේ ලෝකයෙහි කවර තෘෂ්ණා කල්පයකින් හෝ දෘෂ්ටි කල්ප්‍යකින් හෝ කවරෙක් විකල්පනය කරන්නේද යනුයි.

කාමා තෙ පඨමා සෙනා යනාදී ගාථා සතරෙහි අර්ථ මෙසේය. යම්හෙයකින් මුලින්ම සත්ත්වයන් අගාරිය වූ කල්හි ක්ලේශකාමයෝ වස්තුකාමයන්හි මුලාකරවති. ඒ කාමාදිය මැඬලා අනගාරික බවට පැමිණියවුන්ට, මාර්ගයන්හි හෝ සෙනසුන්හි හෝ වෙනත් කිසියම් තැනකදී අධිකුසල දහම් පිළිබඳව අරතියක් (නොකැමැත්තක්) උපදියි ද එය කියන ලද්දේමය. 'ඇවැත්නි, පැවිදි වූවන්ට ඒ පැවිද්දෙහි කැමැත්ත තබාගැනීම ඉතා දුෂ්කරය' යනුවෙන් ඉක්බිති ඔවුන් අනුන් හා බැඳී පවතින, ජීවිකා ඇති බැවින් සාපිපාසා දෙක බාධා කරයි. එයින් බාධා වූ පර්යේෂණ තෘෂ්ණාව සිත වෙහෙසයි. ඉක්බිති ක්ලාන්ත වූ වෙහෙසට පත් වූ සිත් ඇති ඔවුන් තුලට ථීනමිද්ධය බැසගනියි. ඉක්බිත්තෙන් ගුණ විශේෂයකට පත් නොවන්නා වූ ඉතා අපහසුවෙන් ලැබුණු ආරණ්‍ය වන ප්‍රාන්ත, සෙනසුන්හි වසන ඔවුන්ට තැනිගත් සිත් ඇති බැවින් බිය හටගනී. තැනිගත් සැක සහිත බොහෝ කාලයක් විවේක රසය ආශ්වාදනය නොකරමින් වාසය කරන ඔවුන්ට මේ මාර්ගය වේදැයි පර්යාප්තියෙහි සැක උපදියි. එම සැකය දුරුකොට වසන තැනැත්තන්ට අප්‍රමාදීව විශේෂ අධිගමයන් කරණ කොටගෙන මානය, ගුණමකු බව, තද බව යන සිත් හටගනියි. ඒ පාපී සිත් ද මැඩපවත්වා ගෙන වාසය කරන්නා වූඔවුන්ට ඊටත් වඩා ගුණ විශේෂ හේතුවෙන් ලාභසත්කාර කීර්ති ප්‍රශංසා උපදී. ලාභාදියෙන් මුසපත්ව ධර්ම ප්‍රතිරූපකයන් ප්‍රකාශ කරමින් වැරදි අයුරින් කිත් පැසසුම් ලැබ, එහි ඇලී ගැලී ජාති ආදියෙන් තමා උස්කර දක්වති. අනුන් හෙළා දකිති. එනිසා කාමාදීන්ගේ (මාරයාගේ) පළමු සේනා බව දතයුතුය.

මෙසේ මේ දශවිධ සේනාවන් දක්වා යම් සේ ඒ සේනාව පාප ධර්මවලින් යුක්ත බැවින් පාපධර්ම මාරයාට උපකාර පිණිස පවතින්නේද, එනිසා ඒ නුඹගේ සේනාව යැයි දක්වනුයේ **එසා නමුචි තෙ සෙනා කණ්හසස්සාභිපහාරිනි** යැයි කියන ලදී. එහි **අභිපපහාරිනී** යනු ශ්‍රමණ බ්‍රාහ්මණයන් ඝාතනය කරන්නීය. උපුටා දමන්නීය. අන්තරාය කරන්නීය යන අර්ථයයි. **න තං අසුරෝ ජිනාති ජෙත්වා ච ලභතෙ සුඛං** යනුවෙන් මෙසේ නුඹගේ සේනාව ශූර නොවූ, ශරීරයේත් ජීවිතයේත් අපේක්ෂා සහිත පුද්ගලයා ජය නොගනියි. දක්ෂ වූ ශූරයා ම මරසෙනඟ ජය ගෙන මාර්ගඵල සුවයෙන් සැනසේ. **යතො චතූහි අරියමගෙහි** යම්කලෙක සතරක් වූ නිර්දෝෂ නිවනට පමුණුවන ආර්ය මාර්ගයෙන් **මාරසෙන** යනු මාරයාගේ සේනාව වූ වචනය ක්‍රියාත්මක කරන ක්ලේශයෝය. **පටිසෙනි කරා විරුද්ධ** බව ඇතිකරන ජිතා ච පරාජය කර නසන ලද. **පරාජිතා ච නිග්‍රහ** කර පරදන ලද **භඟා** බිඳින ලද. **විප්පලුගඟා** සුණු විසුණු කරන ලද. **පරංමුඛා** යටිකුරු වූ මුහුණ ඇති බවට පමුණුවන ලද. **විසෙනිභූතො** නිකෙලෙස්ව සිටී. **ඛොදානදසසී** පිරිසිදු බව දක්නේ. **තානිඡඳනානි** මේ තණ්හාදී කෙලෙස් වැස්ම **විවටානී** ප්‍රකට කරන ලද. **විඛංසිතානි** සිටින තැනින් පහකරන ලද. **උගඝාටිතානි** උපුටා දමන ලද. **සමුගඝාටිතානි** විශේෂයෙන්ම උපුටා දමන ලද.

න කපපයනති යන ගාථාවේ සම්බන්ධ අර්ථය - බොහෝ කොට දක්නුයේ කුමකටද? ඉහතින් පැවසූ ආකාර ඇති ඒ ශාන්ත වූ රහතන් වහන්සේලා දෙවැදෑරුම් වූ කල්පනයන්, පුරස්කාරයන් අතුරෙන් කිසිවකින් කල්පනය නොකරති. තණ්හාදියට ගරු නොකරති. පරමාර්ථ වූ අත්‍යන්ත ශුද්ධිය අවබෝධ කරගත් බැවින්, අත්‍යන්තයෙන් ම පිරිසිදු වූවාහු උන්වහන්සේලා, අක්‍රිය ශාස්වත දෘෂ්ටිවාදයන් අත්‍යන්ත ශුද්ධීන් යැයි නො පවසති. **අදානගහඨං ගථිතං විසඤ්ඤා** සතර වැදෑරුම් වූ රූපාදීන්ගේ දැඩිව ගැනීම් ආදී කාය ග්‍රන්ථ, තම චිත්ත සන්තානයෙහි මුල් බැසගත් කෙලෙස්, ආර්ය මාර්ගය නම් සැතින් ඉවත්කර, සිඳ දමා, සෙසු පදයන්ගේ අර්ථ ප්‍රකටමය.

අචවනත සුදධිං අත්‍යන්ත පරම ශුද්ධිය. **සංසාර සුදධිං** සංසාරයෙන් මිදීමේ ශුද්ධිය. **අකිරිය දිටඨිං** කරන්නා නො කරයි. ඔහු වෙත නොපැමිණේ යනුවෙන් ක්‍රියාව ඵල නැතැයි කියන අක්‍රිය දෘෂ්ටියයි. **අසසසතවාදං** නිත්‍ය, ධ්‍රුව, ශාස්වත යන වචන නො කියති. නො පවසති. **ගඤ්ඡා** නාමකාය

බැඳගනිති. චුති ප්‍රතිසන්ධි වශයෙන් සංසාරයේ ගැටෙති. බැඳී පවතිතියි ගැප්‍රා නම් වේ. නාම කාය බැඳ තබන අරුතින් අභිධ්‍යාවද ග්‍රන්ථයක්නුයි අගිජක්ඛා **කායගන්ථා** හිත සුවයට බාධා කරන්නේනුයි **ව්‍යාපාදෝ.** ව්‍යාපාදය ද පෙර කී ලෙසම සත්ත්වයා සසර බැඳතබන ග්‍රන්ථයකැයි ව්‍යාපාදය කාය ග්‍රන්ථයකි. **සීලබ්බත පරාමාසෝ** මේ සසුනින් පිටත ශ්‍රමණ බ්‍රාහ්මණයන්ගේ ශීලයෙන් ශුද්ධිය වේ. ව්‍රතයෙන් ශුද්ධිය වේ යයි පිළිගන්නේය. පරාමර්ශනය කරන්නේය. **ඉදං සච්චාභිනිවෙසෝ** සර්වඥ භාෂිතය ද ප්‍රතික්ෂේප කර, 'ලෝකය ශාස්වතය - මෙයම සත්‍යය, සෙස්ස බොරු යැ'යි යන මේ ආකාරයෙන් ආශා කිරීම වේ. මෙය සත්‍යාභිනිවේෂණයයි. **අත්තනෝ දිට්ඨියා රාගෝ** තමා විසින් ආශා කිරීමෙන් ගන්නා ලද දෘෂ්ටි ඇති ඡන්දරාගය. **පරවාදෙසු ආසා තෝ** අනුන්ගේ වචනයන්හි කෝපවන. **අප්පච්චයෝ** අසතුටුවන ආකාර ඇති. **අත්තනෝ සීලං වා** තමා විසින් සමාදන් වූ හෝ සීලාදී ශීලයකින් හෝ **අත්තනෝ දිට්ඨිං** තමා විසින් ගන්නා ලද, පිළිගත් දෘෂ්ටියකින්. **තෙහි** ගන්ථෙහි මෙසේ කියන ලද නාමකාය ග්‍රන්ථයන්ගෙන්.

රූපං ආදියන්ති චතුසමුට්ඨානික රූපාරම්මණය අල්ලා ගනිති. කැමති වෙති. **උපාදියන්ති** ළඟට පැමිණ දැඩිව ගනිති. **ගණ්හන්ති** තණ්හා ග්‍රහණයෙන් ගනිති. **පරාමසන්ති** දෘෂ්ටි ග්‍රහණයෙන් පරාමර්ශනය කෙරෙති. **අභිනිවිසන්ති** මාන ග්‍රහණයෙන් අභිනිවේශය කරති. **වට්ටං** ත්‍රෛභූමික සංසාර වර්තය **ගන්ථෙ** බන්ධනයෙහි, **වොස්සජ්ජන්ථා** මනාව අත්හැර. **ගථිතෙ** බන්ධනයෙහි. **ගන්ථිතෙ** බන්ධනයෙන් ගැට ගැටගැසූ **විබන්ධෙ** විශේෂයෙන් බැඳි ආබන්ධෙ නොයෙක් විදියෙන් බඳිනා ලද. **පළිබුද්ධෙ** බන්ධනයෙන් නොමිදුණු කල්හි. **පොථයිත්ථා** තණ්හා මාන දිට්ඨි බන්ධනයන්ගෙන් පොළ දුරුකර. **විසඤ්ඤ** අත්හැර, මේ සතර ග්‍රන්ථයන් කෙලෙස් පටිපාටියෙන් හා මාර්ග පටිපාටියෙන් ගෙනහැර දැක්වීම සුදුසුය. කෙලෙස් පටිපාටියෙන් අභිජ්ඣා කාය ග්‍රන්ථය අර්හත් මාර්ගයෙන් ප්‍රහීණ වේ. ව්‍යාපාද කායග්‍රන්ථය අනාගාමී මාර්ගයෙන් ද සීලබ්බත පරාමාස කාය ග්‍රන්ථය හා ඉදං සත්‍යාභිනිවේෂණ (මෙයම සත්‍යයැයි ගත්) කාය ග්‍රන්ථය සෝවාන් මාර්ගයෙන් ප්‍රහීණ වේ. මාර්ග පටිපාටියෙන් ද සීලබ්බත පරාමාස හා ඉදං සත්‍යාභිනිවේෂණ කාය ග්‍රන්ථ දෙක සෝවාන් මාර්ගයෙන් ද ව්‍යාපාද කාය ග්‍රන්ථය අනාගාමී මාර්ගයෙන් ද අභිජ්ඣා කාය ග්‍රන්ථය අර්හත් ආර්ය මාර්ගයෙන් ද දුරු වේ. මේ සතර ග්‍රන්ථ යමකු තුල

පවතීනම් 'ඔහු චුති ප්‍රතිසන්ධි වශයෙන් සසරෙහි බැඳී සිටියි. ගැටී සිටියි'නුයි ග්‍රන්ථ නම් වේ. එම ග්‍රන්ථයන්ගේ භේද සතරකි.

මෙයින් දැඩිව ආශා කරයි. තමා හෝ දැඩිව ආශා කරයි. මේ දැඩිව ආශා කිරීම් මාත්‍රයම 'අභිජ්ඣා' නම් වේ. දැඩි ලෝභයමයි. නාමකාය බැඳ තබයි. චුති ප්‍රතිසන්ධි වශයෙන් සසරෙහි ගැටෙයිනුයි කායගන්ථ නම් වේ. කෝපයට පත් වේ. ඉන් සිත කිලුටු බවට පත්වේ. විපතට පමුණුවයි. හෝ හික්මීම, රූප සම්පත්තිය, හිතසුව යනාදිය විනාශ කරන්නේනුයි ව්‍යාපාද නම් වේ. මේ බුදුසසුනින් බැහැර වූ ශ්‍රමණ බ්‍රාහ්මණයන්ගේ ශීලයෙන් ශුද්ධිය වේ. ව්‍රතයෙන් ශුද්ධිය වේ ආදී ලෙස අල්ලා ගනියි. (පරාමාර්ශනය කරයි) නුයි සීලබ්බත පරාමාස නම් වේ. සර්වඥයන් වහන්සේගේ දේශනාව ද ප්‍රතික්ෂේප කර 'ලෝකය ශාස්වතය, මෙයම සත්‍යය, සෙස්ස බොරුය' යනාදී ආකාරයෙන් ආශාවෙන් පිළිගැනීම ඉදං සත්‍යාභිනිවේෂණ නම් වේ. **යථාවයහංවා** යනාදිය යම්සේ වාහනයක් හෝ රථයක් හෝ යනුවෙන් ග්‍රන්ථයන්ගේ විනාශ කිරීම, වෙන්කිරීම සඳහා උපමාවක් දක්වමින් කියන ලදී. **න ජනෙනති** නූපදවති. **න සඤ්ජනෙනති** නො පහළ කරවති. **නාභිනිබ්බත්තෙතනති** උපසර්ග යොදා පදයන්ගේ අර්ථ වැඩිකරන ලදී. **න සඤ්ජනෙනති** උත්පාද ලක්ෂණය නූපදවති. **නාභිනිබ්බත්තෙතනති** ප්‍රවෘත්ති ලක්ෂණය සඳහා කියන ලදී. කෙලෙස් සීමාවන් ඉක්මවූ බැවින් **සීමාතිගො**, බැහැර කළ පාපධර්ම ඇති බැවින් බ්‍රාහ්මණො. 'මෙසේ වීයැ'යි පරිචිත්ත විජානනයෙන්, පූර්වේ නිවාසානුස්මෘතියෙන් දැන හෝ මසැසින් හෝ දිවැසින් දැක හෝ මනාව පිළිගත්, බැසගත් කිසිවක් නැතැයි කියන ලදී.

තවද උන්වහන්සේට කාමරාග නොමැති හෙයින් **න රාග රාගී** (රාගයෙහි ඇලුණේ නොවේ.) රූප, අරූප රාගයන් ද නොමැති හෙයින් **න විරාග රත්තෙතා** (විරාගයෙහි ඇලුණේ නොවේ.) මෙසේ වූ රහතන් වහන්සේට 'මෙලොව උතුම්'යැයි දැඩිව ගන්නා ලද කිසිවක් නැතැ'යි අර්හත්වය දක්වා දේශනාව යොමු කිරීමෙන් සූත්‍රය නිමාකළ සේක. **චතසෙසා සීමායො** සීමා සතරකි. 'දිට්ඨි අනුසය ද දෘෂ්ටිය ද එය ප්‍රහීණ නොවූ බැවින් අනුසයකි'යි **දිට්ඨානුසයො**, විචිකිච්ඡානුසයාදියෙහි ද මේ ක්‍රමයෙන් ම අර්ථ ගතයුතුයි. කවර අර්ථයකින් අනුසය නම් වේද? අනුසයනාර්ථයෙනි. කවරෙක් මෙහි අනුසයනඤ්ඨ නම් වේද? අප්‍රහීණ,

ප්‍රහීණ නොවූ අර්ථයෙනි. මේවා වනාහි අප්‍රහීනාර්ථයෙන් ඒ ඒ සත්ත්ව සන්තානයන්හි අප්‍රකටව අත්නොහැර සැඟවී පවතින හෙයින් අනුසය යයි කියනු ලැබෙත්. අනුසෙන්ති යනු 'අනුරූප කරණයක් ලැබ උපදිති' යන අර්ථයයි. එසේ වුවත් අනුසයනත්‍ථ නම් අප්‍රහීණාකාරයයි. 'අප්‍රහීනකාරයෙන්ම උපදියි' යනුවෙන් කීම නුසුදුසුය. ඒ අනුසයන් නූපදින බැවිනි. එහි මේ පිළිතුරයි. 'අනුසය අප්‍රහීනාකාර නොවේ. අනුසය වනාහි ප්‍රහීණ නොවන අරුතින් වීර්යයෙන්ම දුරුකළ යුතු (ථාමගත) කෙළෙස් අදහස් වේ. යම් චිත්ත සම්ප්‍රයුක්ත අරමුණු සහිත ප්‍රත්‍ය සහිත අර්ථයෙන්, සහේතුක වූයේ ඒකාන්තයෙන් ම අකුශල සහගත වූයේ අතීත වූයේ ද වෙයි. අනාගත වූයේ ද වෙයි. වර්තමාන වූයේ ද වෙයි. එහෙයින් උපදියි' යැයි කීමට සුදුසුය.

එහි මේ ප්‍රමාණයයි. පළමු පටිසම්භිදා මාර්ගයේ අභිසමය කථාවේදී 'වර්තමාන කෙලෙස් කෙසේ දුරුකරන්නේද?'යි ප්‍රශ්න කර, වර්තමාන අනුසයන්ගේ පැවැත්මක් ඇති බැවින්, 'ථාමගත අනුසයන් දුරුකරයි' යනුවෙන් කියන ලදී. ධර්මසංගණියෙහි 'මෝහය' පිළිබඳ පද භාජනයේදී අවිද්‍යානුසය, අවිද්‍යාවේ නැගීසිටීම (අවිද්‍යා පරියුට්ඨානය), අවිද්‍යා අගුල වූ මෝහය අකුසල මූලයක් වූ මෙය ඒ අවස්ථාවෙහි මෝහය නම් වේ. මෙසේ අකුසල සිතත් සමග ම මෝහයේ ඉපදීම දක්වන ලදී. කථාවත්‍ථුප්පකරණයේ 'අනුසය අව්‍යාකතය, අනුසය අහේතුකය, අනුසය චිත්ත විප්‍රයුක්තයැයි' සියලු වාද ප්‍රතික්ෂේප කරන ලදී. අනුසය යමකයෙහි සත්වැදෑරුම් මහා වාරයන් අතරින් එකක් උපදින වාරයෙහි යමෙකුට කාමරාගානුසය උපදියි ද ඔහුට පටිඝානුසය උපදියි යනාදිය කියන ලදී. 'එනිසා අනුසෙන්ති යනු අනුරූප කරුණක් ලැබ, උපදිති' යමක් කියන ලද ද, එය මේ බුද්ධ වචනවලින් මනාව දේශිත බව දතයුතුයි.

යමක් 'චිත්ත සම්ප්‍රයුක්ත සාරම්මණ' යැයි කියන ලද ද එකරුණද මනාව දේශිතය. අනුසය නම් මෙය පරිනිෂ්පන්න වූ චිත්ත සම්ප්‍රයුක්ත වූ අකුසල ධර්මයෙකැයි නිශ්චයට යා යුතුයි. එහි දිට්ඨානුසය සිව් දිට්ඨි සම්ප්‍රයුක්ත සිත්හි ද විචිකිච්ඡානුසය විචිකිච්ඡා සහගත සිතේ ද අවිද්‍යානුසය දොළොස් අකුසල සිත්හි සහජාත වශයෙන් ද ආරම්මණ වශයෙන් ද යෙදේ. ත්‍රිවිධ වූ දිට්ඨි, විචිකිච්ඡා, මෝහ අනුසයන් විශේෂයක් නැතිව තෙභූමික ධර්මයන්හි ආරම්මණ වශයෙන් යෙදේ. මෙහි ලෝභ

සහගත සිත්හි කාමරාගානුසය සහජාත වශයෙන් හා ආරම්මණ වශයෙන් යෙදේ. මනාප වූ අවශේෂ කාමාවචර සිත්හි (ධර්මයන්හි) ආරම්මණ වශයෙන්ම ලෝභය උපදින්නේ ය. පටිඝානුසය දොම්නස් සහගත සිත්හි සහජාත වශයෙන ද ආරම්මණ වශයෙන් ද යෙදේ. අමනාප වූ ඉතිරි කාමාවචර සිත්හි ආරම්මණ වශයෙන් ම ද්වේෂය උපදියි. මානානුසය දිට්ඨි විප්පයුක්ත ලෝභ සහගත සිත්හි සහජාත වශයෙන් ද ආරම්මණ වශයෙන් යෙදේ. දුක් වේදනාවෙන් තොර වූ අවශේෂ කාමාවචර සිත්හිත්, රූපාවචර හා අරූපාවචර සිත්හිත් ආරම්මණ වශයෙන්ම උපදිනුයේ මානයයි.

භවරාගානුසය සතර දිට්ඨි විප්‍රයුක්ත සිත්හි උපදිනුයේ සහජාත වශයෙන් කියන ලදී. ආරම්මණ වශයෙන් ද රූපාරූපාවචර සිත්හි උපදිනු ලබන ලෝභය කියන ලදී. එහි **දිට්ඨානුසයෝ** දෙසැට වැදෑරුම් දෘෂ්ටි. **විචිකිච්ඡානුසයෝ** අටතැන්හි පවත්නා සැකය. **තදෙකට්ඨා ච කිලෙසා** දෘෂ්ටියෙන් සහජෙකාර්ථ වශයෙන් ද විචිකිච්ඡාවෙන් සහජේකාර්ථ වශයෙන් ද එක්ව සිටි. **මානානුසයෝ** නවවිධ මානයන්. **පරචිත්ත ඤාණෙන වා ඤතවා** අනුන්ගේ සිත් හැසිරීම් දැනගන්නා ප්‍රඥාවෙන් දැන, චෙතෝපරිය ඤාණයෙන් දැනගෙන යැයි කියන ලදී. **පුබ්බ නිවාසානුසසති ඤාණෙන වා** අතීතයේ විසූ (පෙර) කඳපිළිවෙල සිහිකරන ඤාණයෙන් ඒ පිළිබඳව දැන **මංස චක්ඛුනා** ප්‍රකෘති ඇසින්, මසැසින්. **දිබ්බ චක්ඛුනා** දිව්‍ය සමාන හෝ දිව්‍ය විහාර ඇසුරු කරගත් දිවැසින් දැක. **රාග රත්තා** රාගයෙන් රත්ව **යෙ පඤ්චසු කාම ගුණෙසු** යම් පංචවිධ වූ රූපාදී වස්තුකාම කොට්ඨාසයන්හි. **විරාගරත්තා** විරාග සංඛ්‍යාත රූපාරූප සමාපත්තීන්හි දැඩිව ඇලී ගැලී වෙසෙන. **යතො කාමරාගො ච** යම්කලෙක කාමරාගය ද, රූපාරූප භවයන්හි ද මේ ක්‍රමයමයි.

සතරවන සුද්ධට්ඨක සූත්‍ර නිර්දේශ වර්ණනාව නිමියේ ය.

5.

පස්වන පරමට්ඨක සූත්‍රයේ **පරමන්ති දිට්ඨීසු පරිබ්බසානො,** 'මෙය උතුම්'යැයි ගෙන තම තම දෘෂ්ටියෙහි ඇතුලත්ව වසනුයේ. **යදුත්තරිං කුරුතෙ යම්බඳු තම ශාස්තෘ ආදිය උතුම් යැයි කියයි. හීනාති අඤ්ඤං තතො සබ්බමාහාති** ඒ තම ශාස්තෘවරයා හැර, 'ඉන් අන්‍ය වූ සියලු දෙන හීනයෝයැ'යි කියයි. **තසමා විවාදානි අවීතිවත්තො** ඒ කාරණයෙන්,ඒ හේතුවෙන් හෙතෙම දෘෂ්ටි කලහයන් නො ඉක්මවා සිටියි. **වසනති** පළමුවෙන් උපන් දෘෂ්ටි වශයෙන් ගෙන වාසය කරති. **සංවසනති** ඊට පිවිස වෙසෙති. **ආවසනති** විශේෂයෙන් වෙසෙති. **පරිවසනති** සියලු ආකාරයෙන් වෙසෙති. එය උපමාවකින් පෙන්වාදෙනුයේ **යථා අගාරිකා වා** යනාදිය කියන ලදී. අගාරිකා වා ගිහිගේ වසන්නෝ **සරෙසු වසනති** තමාගේ ගෙවල්වල සැක රහිතව වෙසෙත් ද **සාපත්තිකා වා** ආපත්ති බහුල වූ. **සකිලෙසා** රාගාදී කෙළෙස් බහුල වූ. **උත්තරිං කරොති** අතිරේක පූවක් කරයි. **අයං සත්ථා සබ්බඤ්ඤූ** මේ අපගේ ශාස්තෘන් වහන්සේ සියල්ල දනියි. **සබ්බෙ පරවාදෙ චික්ඛිපති** සියලු අන්‍ය ලබ්ධීන් අත්හැරදමයි. **උක්ඛිපති** බැහැර කරයි. **පරික්ඛිපති** ඉවතට හරවා ගත් මුහුණු ඇතිවේ. දිටයී මෙධගානී දෘෂ්ටි වෙහෙසීම්ය.

දෙවන ගාථාවේ අර්ථ මෙසේය. මෙසේ දෘෂ්ටි කලහාදිය නො ඉක්මවූ තැනැත්තා රූපාලම්බනයේ ද ශබ්දාලම්බනයේ ද ශීලව්‍රත දෙකහි ද ගන්ධ රස ස්පර්ශාලම්බනයෙහි ද යන මේ සිවු වස්තූන්හි උපන් දෘෂ්ටි සංඛ්‍යාත තමා කෙරෙහි පෙර කියූ ආකාරයෙන් අනුසස් දකියි. එසේම ඔහු එහි සක්කාය දෘෂ්ටියේ ආනිසංස ශ්‍රේෂ්ඨයැයි තදින් පිළිගෙන, සියලු අන්‍ය ශාස්තෘවරුන් නිහීන යැයි දකියි. **දෙව ආනිසංසෙ පස්සති** ගුණ දෙකක් බලයි. **දිටයධම්මිකං** ච ඇස්පනාපිට, ප්‍රත්‍යක්ෂයෙන් ආත්මභාවයෙහි විපාක දෙන ගුණය ද **සම්පරායිකං** ච පරලොව දී ලැබිය යුතු ගුණය ද **යං දිට්ඨිකො සත්ථා** යම් ලබ්ධික ශාස්තෘවරයෙක්, **තීර්ථායතන** ප්‍රධානියෙක් **අලං නාගත්තාය** වා ඇස්පනාපිට, ප්‍රත්‍යක්ෂ ආත්මභාවයෙහි විපාක දෙන නාග බවට හෝ ඊට කුඩා බවට පත්කරන. **සුපණ්ණත්තා** ආදියෙහි ද මේ ක්‍රමයෙන් අර්ථ ගතයුතුයි. **දෙවත්තාය වා** සම්මුති දේවාදි බවට. **ආයතිඵල පාටිකංඛී හොති** අනාගතයේ විපාක ඵල ප්‍රාර්ථනා කරයි. **දිටඨ සුදධියාපි දෙව ආනිසංසෙ පස්සති** චක්ඛු විඤ්ඤාණයෙන් දුටු

රූපායතනයේ වශයෙන් ශුද්ධියට හේතු වූ ද තමා ග්‍රහණය කරගත් දෘෂ්ටිය නිසා ආනිසංස දෙකක් ලැබේ. **සුතසුද්ධියා** දියෙහි ද මේ ක්‍රමයමයි.

තෙවැනි ගාථාවේ අර්ථය මෙසේය. 'මෙසේ දකින්නා තමාගේ යම් ශාස්තෘවරයෙකු ඇසුරුකරන ලද්දේ, එයින් අන්‍ය වූ වෙනත් ශාස්තෘවරුන් පහත්කර සිතයිද එසේ දැකීම (සිතීම) ද ග්‍රන්ථයක් (බැඳීමක්) ලෙසම දක්ෂ වූවෝ කියති. බන්ධනයකැයි ද කියන ලද්දේ වෙයි. එහෙයින්ම භික්ෂුව රූපාලම්බනය හෝ ශබ්දාලම්බනය හෝ ගන්ධ, රස, ස්පර්ශාලම්බනය හෝ ශීලව්‍රත නම් ධර්මාලම්බනයක් හෝ ඇසුරු නොකරන්නේය. සිත තුලට නොගන්නේ යැ'යි කියන ලදී. **කුසලා** ස්කන්ධාදිය දැනගැනීමෙහි දක්ෂයෝ. **බන්ධ කුසලා** රූපාදී පංචස්කන්ධයෙහි දක්ෂයෝ. ධාතු, ආයතන, ප්‍රතීත්‍ය සමුත්පාද සතිපට්ඨාන, සම්‍යක් ප්‍රධාන, ඉද්ධිපාද, ඉන්ද්‍රිය, බල, බොජ්ඣංග, මාර්ගඵල, නිවනෙහි ද මේ ක්‍රමයෙන්ම අර්ථ ගතයුතුයි. එහි **මගහකුසලා** සතර මාර්ගයෙහි **එල කුසලා** සතර ඵලයෙහි **නිබ්බාණ කුසලා** දෙවැදෑරුම් නිවනෙහි දක්ෂයෝ. **තෙ කුසලා** මේ කියන ලද කරුණුවල දක්ෂයෝ. **එවං වදන්‍ති** මෙසේ කියති. **ගන්ථා එසෝ** දකින්නේ ද තමාගේ ශාස්තෘවර ආදිය දැඩිව ඇසුරුකොට ගනිමින් ද අන්‍ය ශාස්තෘවරුන් හීනවද පහත්කර ද දකින්නේ' යන මෙය ග්‍රන්ථයකැයි ද බන්ධනයකැයි ද කියති.

ලගහනං එතං මෙසේ කියන ලද පරිදිම, ඇත්දළෙහි එල්බුණු අයෙක් මෙන් යටිකුරුව එල්ලී. **බන්ධනං එතං** කැඩීමට දුෂ්කර අර්ථයෙන්, මාංචු බැඳීමක් වැනි බන්ධනය **පළිබොධො එසෝ** සංසාරයෙන් නික්මීමට නො දෙන්නේය යන අරුතින් මෙය පළිබෝධයකි.

සතරවන ගාථාවේ අර්ථය - හුදෙක් ඒ පැවිද්දා දෘෂ්ටි ශ්‍රැතාදිය ඇසුරු නොකරන්නේය. තවද නූපන් මතුමතුයෙහි වන දෘෂ්ටිය ද ලෝකයෙහි කල්පනය නොකරන්නේය. නූපදවන්නේ යයි කියන ලදී. කවරාකාරයෙන් ද? **ඤාණෙන වා සීලබ්බතෙන වා** සමාපත්ති ඤාණාදී ඤාණයකින් හෝ සීල ව්‍රතාදියකින් හෝ නූපදවන්නේය. මේ දෘෂ්ටිය නූපදවන්නේය. හුදෙක් මේ දෘෂ්ඨියම නූපදවන්නේ නොවේ. තවද මානයෙන් ද ජාති ආදි වස්තූන්ගෙන් ද සමයැයි තමා පිළිබඳව නොසිතන්නේය. වෙසෙසින් ම තමා හීනයෙකැයි නොසිතන්නේය. අඨ්ඨ

සමාපත්තී ඤාණෙ වා ප්‍රථම ධ්‍යානාදී අෂ්ට සමාපත්තීන්ගේ සම්ප්‍රයුක්ත ප්‍රඥාවෙන් හෝ **පංචභිඤ්ඤා ඤාණෙන වා** ලෞකික වූ පංචාභිඥාවෙන් සමන්විත ප්‍රඥාවෙන් හෝ, **මිච්ඡා ඤාණෙන වා** විපරීත වූ ස්වභාවයෙන් පැවති ප්‍රඥාවෙන්, ස්පර්ශ නොකළ දෙය ස්පර්ශ කරන ලදැයි මෙසේ උපන් වැරදි ඤානයෙන් හෝ.

පස්වන ගාථාවේ අර්ථය - 'මෙසේ දෘෂ්ටි ආදිය කල්පනය නොකරන, නොසිතන, ඒ රහතන් වහන්සේ ආත්මවාදය හැරදමා, පූර්වයෙන් පිළිගත් සියලු දෘෂ්ටි උපාදාන කර නොගෙන බැහැර ලා, අනිකක් ද අල්ලා නොගෙන, ඉහත කියන ලද ඤාණයෙහි පවා තෘෂ්ණා-දෘෂ්ටි යන දෙයාකාරයෙන් නිඃශ්‍රය නොකරයි. එසේ නොකරන උන්වහන්සේ හින්න වූ නානාවිධ දෘෂ්ටි වශයෙන් බිඳීගිය ඒ සෙසු සත්ත්වයන් අතරෙහි ඡන්දාදී වශයෙන් පක්ෂපාතී නොවී යෑමෙන් දෙසැට මිසදිටුවලින් කිසිදු දෘෂ්ටියක් නොපිළිගනියි. නොපැමිණෙයි යැයි කියන ලද්දේම වෙයි. **චතූහි උපාදානෙහි** කාමූපාදානාදී සිවුවැදෑරුම් උපාදානයන් දැඩිව ගත්. **සවෙ වියතෙනසු** ඒ පුද්ගලයා බිඳී ගියවුන් අතරෙහි, **භිනෙනසු** දෙකඩව බිඳුනවුන් අතර. දැන් යමෙක් පිළිබඳව මේ ගාථාවෙන් කියන ලද්දේ ද ඒ ක්ෂීණාශ්‍රවයන් වහන්සේගේ ගුණ පැවසීම සඳහා **යසසූභයනෙත** යනාදී ගාථා තුන වදාළහ.

ඒ ගාථා තුනින් පළමු ගාථාවේ **යසසූ භයනෙත** පෙර කියන ලද එස්ස සමුදයාදී භේද ඇති **පණිධී** තණ්හාව **භවාභවායා** නැවත නැවත වන භවය සඳහා. **ඉධං වා හුරං වා** ස්වාත්මභාවාදී භේද වශයෙන් හෝ පරාත්මභාවාදී භේද වශයෙන් හෝ. **එසෙසා එකො අනෙතා** චක්ඛු සම්ඵස්සාදී එක් කොට්ඨාසයකි. **එසස සමුදයො** වස්තු ආරම්මණය යමකින් හටගනීද උපදියිද ඒ සමුදය. **දුතියො අනෙතා** දෙවැනි කොට්ඨාසය. **අතීතං** ඉක්මවන ලදී. ඉක්ම ගියේයැයි කියන ලදී. **අනාගතං** නොපැමිණියේ අනාගතයයි. නූපන්නේ යැයි කියන ලදී. සුඛ වේදනාදිය විෂභාග වශයෙන්ද නාමරූප ද්විකය නැමීම් වෙනස් වීම් වශයෙන් ද අධ්‍යාත්මික ආදිය අධ්‍යාත්මික හා බාහිර වශයෙන් ද සක්කායදිය ස්කන්ධ පංචකයේ අසම්පත්ති සමුදය වශයෙන් ද කියන ලදැයි දතයුතුය. **සකත්තභාවො** තමාගේ ආත්මභාවය. **පරත්ත භාවො** අනුන්ගේ ආත්මභාවය.

දෙවැනි ගාථාවේ **දිට්ඨේ වා** දෘෂ්ටි ශුද්ධියෙන් හෝ. **සුතා** දියෙහිද මේ ක්‍රමයමයි. **සඤ්ඤා** සංඥාවෙන් ඔසවා තැබූ දෘෂ්ටිය. **අපරාමසනතං** තෘෂ්ණා, මාන දෘෂ්ටීන්ගෙන් පරාමර්ශනය නොකරන, **අනභිනිවිසනතං** ඒ දෘෂ්ටීන් නොපිළිගෙන, **විනිබද්ධාති වා** මානයෙන් එකට බැඳී. **පරාමට්ඨාති වා** අතිශයින් නිත්‍ය, සුඛ, සුභ වශයෙන් දැඩිසේ සිතින් අල්ලා ගත්. **විකෙඛපගතෝ** උද්ධච්ච වශයෙන්. **අනිට්ඨං ගතෝ** විචිකිච්ඡා වශයෙන්. **ථාමගතෝ** අනුසය වශයෙන්. **ගහියා** යායුතු වශයෙන්.

තෙවන ගාථාවෙහි, **ධම්මාපි තෙසං න පටිඡ්ඡතාසෙ** දෙසැටක් දෘෂ්ටිගත ධර්මයෝ ද ඔවුන්ගේ 'මෙයම සත්‍යය. සෙස්ස බොරුය'යි මෙසේ පිළි නොගත්තේය. **පාරගතෝ න පඤ්ඤෙති තාදී** නිවන් පරතෙරට ගිය, ඒ ඒ මාර්ගයෙන් ප්‍රහීණ වූ ක්ලේශයන්ට නැවත නොපැමිණෙයි. පස් ආකාරයකින් තාදිය වේ. සෙසු වදන්හි අර්ථ ප්‍රකටමය. **වීසති වත්ථුකා සකකාය දිට්ඨි** 'රූපය ආත්ම වශයෙන් දකියි' යනාදී වශයෙන් එක් එක් ස්කන්ධයෙහි සතර සතර ආකාරයන්ගෙන් පංචස්කන්ධයෙහි පිහිටා පවතින විද්‍යමාන වූ කයෙහි පවතින දෘෂ්ටිය. **දසවත්ථුකා මිච්ඡාදිට්ඨි** 'දුන් දෙයෙහි විපාක නැත' ආදී වශයෙන් පවතින දෘෂ්ටිය. **අනතගගානිතා දිට්ඨි** 'ලෝකය ශාස්වතය' 'මෙයම සත්‍යය. සෙස්ස බොරුය' ආදී වශයෙන් පවතින එක් එක් අන්තයක් ඇතැයි රැගෙන පැවති දෘෂ්ටිය. **යා එවරූපා දිට්ඨි** දැන් මතු කියනු ලබන දහනවයක් වූ පදයන්ට සාධාරණ වූ මූලපදය, යම් දෘෂ්ටියක් වේද ඒ දෘෂ්ඨිගතයම, යම් දෘෂ්ටියක් වේද එම දෘෂ්ටි ග්‍රහණයම, මෙසේ සියල්ල සම්බන්ධ කරගත යුතුයි.

යමක් අයථාකාරයෙන් දැකීම් වශයෙන් දෘෂ්ටියක් වේද, ඒ දෘෂ්ටිගතයම, දැකීම දර්ශනය, දෙසැටක් මිසදිටු අන්තර්ගත වූයේනුයි දිට්ඨිගත නම් වේ. යට පදයන්හි අර්ථ කියන ලද්දේමය. අන්ත දෙකෙන් එක් අන්තයකට ගිය හෙයින් ද දිට්ඨිගත නම් වේ.

එහි **සසසතෝ** නිත්‍ය වූ. **ලොකෝ** ආත්මය, මෙහිදී ශරීරයම නැසේ. ආත්මය වනාහි මෙලොව සිට පරලොවට යන්නේයැයි සිතති. එය වනාහි තමන්ම බලන්නේ නුයි ලෝක නම් වේ. **අසසසතෝ** අනිත්‍යය. ආත්මය ශරීරයත් සමගම නැසේ යයි සිතති. **අනතවා** කුඩා වූ (පරිත්ත) කසිණයක් පාදක කරගෙන ධ්‍යාන උපදවා ඒ පරිත්ත කසිණාරම්මණ

චේතනාව කෙළවරක් ඇති ආත්මයකැයි සිතති. **අනන්තවා** අන්තයක් නැත. අප්‍රමාණ වූ කසිණය පාදක කරගෙන ධ්‍යාන උපදවා, ඒ අප්‍රමාණ කසිණාරම්මණ චේතනාව කෙළවරක් රහිත ආත්මයකැයි සිතති. **තං ජීවං තං සරීරං** ජීවයත් ශරීරයත් එයම ය. 'ජීවෝ' යනු ආත්මයයි. ලිංග විපර්යාස වශයෙන් නපුංසක වචනයෙන් තබන ලදී. **සරීරං** යනු රාශි අර්ථයෙන් ස්කන්ධ පංචකයයි. **අඤ්ඤං ජීවං අඤ්ඤං සරීරං** ජීවය අනිකකි. ස්කන්ධ පංචකය අනිකකි. **හොති තථාගතො පරම්මරණා** ස්කන්ධයෝ මෙහිදීම විනාශ වෙති. සත්ත්වයා මරණින් පසුව සිටී. විද්‍යමාන වේ. නොනැසේ. **තථාගතො** යනුවෙන් සත්ත්වයාම අදහස් වේ. ඇතැමෙක් තථාගත යනු රහතන් වහන්සේ යැයි කියති. මොවුහු (මරණින් මතු) නොවෙති'යි යන පක්ෂයේ දෝෂය දැක මෙසේ ගනිති. **න හොති තථාගතො පරම්මරණා** ස්කන්ධයෝ ද මෙහිදීම නැසෙති. සත්ත්වයා ද මරණින් පසුව නොවේ. වැනසේ. මොවුහු (මරණින් මතු) වෙති යන පක්ෂයෙහිදොස් දැක මෙසේ ගනිති. **හොති ච නව හොති** මොවුහු එක් එක් පක්ෂය දැඩිව ගැනීමේ දොස් දැක පක්ෂ දෙකම ගනිති. **නෙව හොති න නහොති** මොවුහු පක්ෂ දෙකෙහිම ගැනීම්වල දෝෂාපත්ති දෙක දැක 'වන්නේද වේ. නොවන්නේද වේ' යනුවෙන් අමරා වික්ඛෙපවාදය පිළිගනිති. මේ දැක්වූයේ අට්ඨකථා න්‍යායයි. 'ලෝකය ශාස්වතය' යනාදී ලෙස දස ආකාරයකින් දෘෂ්ටියේ ප්‍රභේදයම කියන ලදී. එහි **සස්සතො ලොකො** යනු ස්කන්ධ පංචකය ලෝකය යැයි ගෙන මේ ලෝකය, නිත්‍යය, ස්ථිරය, සර්වකාලිකයැයි ගන්නා හට සදාකාලික යැයි ග්‍රහණාගාරයෙන් පවතින දෘෂ්ටියයි. **අසස්සතො** යනු ඒ ලෝකයම සිඳ දමනු ලැබේ. විනාශ වේ යැයි ගන්නා හට උච්ඡේදය ග්‍රහණය කරන අයුරින් පවතින දෘෂ්ටියයි. **අනන්ත වා පරිත්ත කසිණලාභියාගේ කුල්ලක් පමණ හෝ නෑඹිලියක් පමණ වූ හෝ කසිණයෙහි ධ්‍යාන වඩා සමවැදුනහුගේ, සමාපත්තියේ පවතින රූපාරූප ධර්මය පිළිබඳව ලෝකය යැයි ද කසිණය පිරිසිඳීමෙන් අන්තවත් යැයි ද ගන්නා හට ලෝකය අන්තවත් යැයි පිළිගන්නා ආකාරයෙන් පවතින දෘෂ්ටියයි. එය ශාස්වත දෘෂ්ටියක් ද උච්ඡේද දෘෂ්ටියක් ද වේ. මහත් වූ කසිණයක් ගෙන ඒ කසිණයෙහි ධ්‍යාන භාවනා වඩා සමවැදුනහුට කසිණ පරිච්ඡේදය අනන්තවත් බැවින් අනන්තයැයි පිළිගන්නා හට ලෝකය අනන්තවත් යැයි ග්‍රහණය කරගන්නා අයුරින් පවතින දෘෂ්ටියයි. එයද ශාස්වත දෘෂ්ටියක්ද උච්ඡේද දෘෂ්ටියක් ද වේ. **තං ජීවං තං සරීරං** බිඳීම ස්වභාවකොට ඇති

ශරීරයෙහිම පවතියි'යැයි පිළිගත් බැවින් ශරීරය වැනසී යන කල්හි ජීවයද වැනසේ යැයි උච්ඡේද ගහණාකාරයෙන් පවත්නා දෘෂ්ටියයි. පිළිගැනීමයි. දෙවැනි පදයෙන් ශරීරයෙන් අන්‍ය වූවක් ලෙස ජීවිතය ගත් බැවින් ශරීරය වැනසුනත් ජීවය නොනැසේයැයි ශාස්වත යැයි පිළිගත් දෘෂ්ටිය අදහස් වේ. **හොති තථාගතො** ආදියෙහි සත්ත්වයා තථාගත නම් වේ. සත්ත්වයා මරණින් පසු සිටියි යනුවෙන් පිළිගන්නා තැනැත්තාට පළමු ශාස්වත දෘෂ්ටිය වේ. නොපවතියි යැයි පිළිගන්නා තැනැත්තාට දෙවන උච්ඡේද දෘෂ්ටිය වේ. පවතියි ද නොපවතියි ද ගැනීම් වශයෙන් පවතිනුයේ තෙවැනි එකච්ච ශාස්වත දෘෂ්ටියයි. නොමවෙයි, නොපවත්නේ නොවේ යැයි ගන්නා තැනැත්තාට සිවුවන අමරාවික්ඛේප දෘෂ්ටිය වේ යයි කියන ලද ආකාරයේ දසවිධ දෘෂ්ටීන් සුදුසු පරිදි භවදිට්ඨි හා විභව දිට්ඨි යනුවෙන් දෙකොටසකට බෙදේ. ඒ දෘෂ්ඨීන්ගෙන් එකක්වත් ඒ රහතන් වහන්සේ පිළි නොගනිති යන අර්ථයයි. **යෙ කිලෙසා** යම් ක්ලේශයක් සෝවාන් ආර්ය මාර්ගයෙන් ප්‍රහීණ වූයේ ද ඒ කෙලෙස් නැවත ඇති නොවේ. නැවත හටගෙන ප්‍රතිසන්ධියට නො පැමිණේ. **න පච්ඡාගච්ඡති** පසුපස නොයයි. **පඤ්චහාකාරෙහි තාදි** කරුණු පසකින්, කොටස් පහකින් හෝ සමාන වූ. **ඉට්ඨානිට්ඨෙතාදි** ඉෂ්ටාරම්මණයෙහි ද අනිෂ්ටාරම්මණයෙහිද අනුකූල වූ ප්‍රතිඝය අත්හැර සිටි බැවින් දෙකෙක්හි සමාන වූ. **චත්තාවී** කෙලෙස් අත්හැරි. දුරුකළ. **තිණ්ණාවී** සංසාරය ඉක්මවූ. **මුත්තාවී** රාගාදියෙන් මිදුණු, **තංනිද්දෙසාතාදී** ඒ ඒ සීල ශ්‍රද්ධාදියෙන් විස්තර කරමින් කිවයුතු බැවින් ඊට සමාන වූ. මේ පංචවිධ කාරණා විස්තර කර දක්වනු කැමැතිව **කථං අරහා ඉට්ඨානිට්ඨෙ තාදී** යනාදිය කියන ලදී. **තත්‍ථ ලාභෙපි** සිවුපසය ලැබීමෙහි දී **අලාභෙපි** ඒවා නොලැබීමෙහි දී **යසෙපි** පිරිවර ඇතිවිට **අයසෙපි** පිරිවර නැතිවිට **පසංසායපි** ප්‍රශංසා කරනවිට **නින්දායපි** ගරහනවිට **සුඛෙපි** කායික සුඛයෙහි දී **දුක්ඛෙපි** කායික දුකෙහි දී.

එකං වෙ බාහං ගන්ධෙන ලිම්පෙය්‍යං, ඉදින් එක් අතක් සිවු වැදෑරුම් සුගන්ධාලේපයෙන් නැවත නැවත අලංකාර කරන්නේ නම් **වාසියා තච්ඡෙය්‍යුං** අනික් අත වඩුවාගේ වෑයෙන් සැස තුනී කරන්නේ නම් **අමුසමිං නත්ථි රාගො** මේ සුගන්ධාලේපයෙහි සෙනෙහසක්, ඇලීමක් නැත. **අමුසමිං නත්ථි පටිඝං** මේ වෑයෙන් සැස නැසීම පිළිබඳ ප්‍රතිඝයක්, කෝපයක්ද නැත. **අනුනය පටිඝ විප්පහීනො** සෙනෙහස ද කෝපය ද ඉවතලා සිටී.

උගඝාති නිඝාති චිතිවතෙතා ඇලීම් වශයෙන් අනුග්‍රහය ද ප්‍රතිඝ වශයෙන් නිග්‍රහය ද ඉක්මවා සිටී. **අනුරොධ විරොධං සමතිකකනෙතා** අනුකූලභාවයත් ප්‍රතිඝයත් මනාව ඉක්මවා සිටියේ. **සීලෙසති** සීලය විද්‍යමාන වන කල්හි **සීලවා** සීලසම්පන්නයෙකැයි යනාදී ලෙස ප්‍රශංසා ලබයිනුයි තාදි නම් වේ. **සද්ධාය සති සද්ධා** යනාදියෙහි ද මේ ක්‍රමයයි.

පඨවන පරමට්ඨක සූත්‍ර නිර්දේශ වර්ණනාව නිමියේ ය.

6.

සයවන ජරා සූත්‍රයේ **අපප වතං ජීවිතං ඉදං** මේ මිනිස්දිවිය ඒකාන්තයෙන් ම අල්පය. කුඩාය. ස්ථිතික්ෂණ වශයෙන් ද සම්පත්ති ලක්ෂණ වශයෙන් ද ජීවිතය අල්ප වේ යයි ගුහට්ඨක සූත්‍රයේ පැවසූ පරිදි දතයුතුයි. **ඔරං වසසසතාපි මීයාති** වර්ෂ සීයට පෙර කලල ආදී අවස්ථාවන්හි ද මිය යයි. **අතිචචා** වර්ෂ සීයක් ඉක්මවා ද මිය යයි. **ජරසාපි මීයාති** ජරාවෙන් ද මිය යයි. මින් අනතුරුව එන විස්තරය ගුහට්ඨක සූත්‍ර වර්ණනාවේ පැමිණි පරිදිම ගතයුතුයි. **අපපං** මදය. **ගමනීයො සමපරායො** පරලොව යායුතුයි. **කලල කාලෙපි** මෙහි කලලය නම් ප්‍රතිසන්ධි ක්ෂණයෙහි ජාති තුනක සිහින් රෝමකූපවලින් කරන ලද නූල අග තැබූ තෙල් බින්දුවක් පමණ වන අතිශයින් ප්‍රසන්න වූ ආකාරයෙන් පවතින්නකි. ඒ සඳහා කියන ලදී.

තෙල තෙලස්ස යථා බින්දු සපපිමණ්ඩා අනාවිලො
එවං වණ්ණ පටිභාගං කලලනති පවුවවති

ඉතා පිරිසිදු ගිතෙල් මත අමිශ්‍රව තලතෙල් බින්දුවක් පවතින්නාක් මෙන් වර්ණවන්ත භාවයෙන් යුක්ත වූ දෙය කලලයැයි කියනු ලැබේ.

ඒ කලල අවස්ථාවෙහි සත්ත්වයා මිය යයි. **චවතී** ජීවිතය ගිලිහේ. චුත වේ. **මරතී** ජීවිතය වියෝගවීමට පැමිණේ. **අනතරධායති** නොපෙනෙන බවට පත්වේ. **විපපලුජ්ජති** සිදේ. අණ්ඩජ යෝනියෙන් **චවති** (චුත වේ) ජලාබුජ යෝනියෙන් **මරති** (මැරේ) යනුවෙන් ද ඇතැමෙක් වර්ණනා කරති. **අබ්බුද කාලෙපි** අබ්බුදය යනු කලලයට දින සතක් ගතවූ පසුව ඇතිවන මස් සේදූ වතුර මෙන් පැහැය ඇති අවස්ථාවයි. කලලය එවිට අතුරුදහන් වේ. එය කියන ලදී.

සත්තාහං කලලං හොති - පරිපක්කං සම්මූහතං
විවට්ටමානං තං භාවං - අබ්බුදං නාම ජායතී

මුහුකුරා ගිය උදුරා දැමූ සත්දිනක් වූ කලලයට පෙරළෙමින්, පරිවර්තනය වෙමින් පැමිණි අවස්ථාවට අබ්බුද යන නම යෙදේ. ඒ අබ්බුද කාලයේද මිය යයි.

පෙසි කාලෙපි ඒ අබ්බුදයට ද සත්දිනක් ගත වූ පසුව උණු කිරීමෙන් දිය කළ ඊයම් මෙන් වූ අවස්ථාව පේසි නම් වේ. එය මිරිස් මුලක් මෙන් දතයුතුයි. ගම්දරුවෝ ඉතා රතු වූ (පැසුණු) මිරිස් ගෙන සළු කෙළවර පොදියක් සේ තළා බැඳ මණ්ඩයක් ගෙන කබලක බහා ඒ පොදිය අව්වේ තබති. වියලී යන ඒ මිරිස් පොදිය සෑම පැත්තෙන්ම එළියට එයි. පේසිය මෙවැනි ස්වරූප ඇත්තේ වේ. අබ්බුද යන නම අතුරුදහන් වේ. එය කියන ලද්දේමය.

සත්තාහං අබ්බුදං හොති පරිපක්කං සම්මූහතං
විවට්ටමානං තං භාවං පෙසි නාම පජායති

මුහුකුරා ගිය, උදුරා දැමූ සත්දිනක් ගත වූ අබ්බුදය පරිවර්තනය වීමෙන් පේසි නම් වූ තත්ත්වයට පත් වේ. ඒ පේසි අවස්ථාවේදීත් සත්ත්වයා මැරේ. **යනකාලෙපි** ඉක්බිති ඒ පේශියට ද දින සතක් ගතවූ කල්හි, කිකිළි බිත්තරයක් මෙන් පිහිටි ආකාර ඇති 'ඝන' නම් මස්පිඬ උපදියි. පේසි නාමය අතුරුදහන් වේ. එය කියන ලද්දේම ය.

සත්තාහං පෙසී භවති පරිපක්කං සම්මූහතං
විවට්ටමානං තං භාවං ඝනෝ නාම පජායතී

මුහුකුරා ගිය උදුරා දැමුණු පේසියට පෙරළෙමින් සත් දිනක් ගතවූ පසුව ඇතිවන තත්ත්වය ඝන නම යෙදේ. කිකිළි බිත්තරය හාත්පස පිරිමඬුලු බැඳ සිටීද එසේම ඝනයේ රූ සටහන් කර්ම ප්‍රත්‍යයෙන් ඇතිවේ. ඒ ඝන අවස්ථාවේ සත්ත්වයා මැරේ. **පසාඛකාලෙපි** පස්වන සතිය තුලදී දෙක දෙකබැගින් වූ අත් පා ද හිස ද සඳහා ගඩු පහක් වර්ධනය වෙති. ඒ සඳහා කියන ලදී. මහණෙනි, කර්මයෙන් පස්වන සතිය තුලදී ගඩුපහක් වර්ධනය වේ' යනුයි. ඒ ප්‍රසාඛ කාලයෙහි ද සත්ත්වයෝ මිය යති. ඉන් අනතුරුව එන සවන, සත්වන සති ඉක්මවා දේශනාව හකුළුවා සතලිස්වන සතියේ දී, පරිණතියට පත්වූ කල කෙස් ලොම් නිය ආදිය උපන් කාලයේ ද ඒ ජීවියාගේ නාභියෙන් නැගුණු නාලය මවගේ උදර පටලය සමග ඒකාබද්ධ වේ. ඒ නාලයේ නෙළුම් දණ්ඩ මෙන් වූ සිදුරක් ඇත. ඉන් ආහාර රසය රැගෙන ගොස් ජීවියා තුල ආහාර සමුට්ඨාන (ආහාරයෙන් හටගන්නා) රූප උපදවයි. මෙසේ එම ජීවියා කුස තුල දසමසක් යැපේ. ඒ සියල්ල ම නො පවසා (කෙටි කර) **සූතිඝරෙ** යැයි කියන ලදී. 'කෙසා ලොමා නඛාපිච' යන්න ඒ සඳහා කියන ලදී.

යඤ්චස්ස භුඤ්ජතී මාතා අන්නං පානඤ්ච භොජනං
තෙන සො තත්‍ථ යාපෙති මාතුකුච්ඡිගතො නරො

ඒ මවුකුසේ සිටින සත්ත්වයා තම මව යම් ආහාර පානාදියෙන් අනුභව කරන්නේ ද ඉන්, ඒ ආහාරයෙන් ම යැපේ.

එහි **සූතිඝරෙ** යනු ප්‍රසූතිකාගාරයේ දී තිඹිරිගෙයිදී යන අර්ථයි. සූතිකාඝරෙ යන පදය ද යෙදේ. සූතිකාය යැයි පදය සිදීම වේ. **අද්ධමාසිකෙපී** උපන් දවසේ පටන් අඩමසක් මොහුට ගතවීනුයි අර්ධමාසික නම් වේ. **දෙමාසිකා** ගත වූයේනුයි **සංවච්ඡරිකො** නම් වේ. ඉන් ඉහළට යන **දුවස්සිකා** දියෙහිද මේ ක්‍රමයම වේ. **යදා ජිණ්ණා හොති** යම්කලෙක ජරාජීර්ණ වේද ජරාවෙන් අඳුරු වී ගියේ ද වුදෙඩා වයෝවෘද්ධ වූයේ ද මහල්ලකො ජාතියෙන් මහලු වූයේ ද අද්ධගතො තුන් අඩක් ඉක්මවූයේ වයො අනුප්පත්තො තුන්වන වයසට පැමිණියේ. **ඛණ්ඩදන්තො** තැනින් තැන වැටුණු දත් හා පැලුණු දත් ඇත්තේ දිරීම හේතුවෙන් කැඩුණු දත් මොහුට ඇත්තේනුයි ඛණ්ඩදන්ත නම් වේ. **එලිත කෙසො** සුදු වූ කෙස් විලූනං ලියා දැමූ කෙස් මෙන්, සිඳුණු කෙස් ඇති. **ඛලිතං සිරො** හිසකෙස්

නැති (තට්ටය පැදුණු) හිසක් ඇති **වලිතං** හටගත් රැළි ඇති, **තිලකාහත** ගත්තා සුදු තිලක, කලු තිලක ආදී කැළැල්වලින් ගහණ සිරුරු ඇත්තේ, හොඟහා බිඳුණේ, මේ වචනයෙන් ද වක් වූ කුදු වූ සිරුර අදහස් කරයි. **දණ්ඩපරායනෝ** සැරමිටිය පිහිටකර ඇති, සැරමිටිය සහායකයා කරගත්. **සා ජරායපි** ඒ පුද්ගලයා ජරාවෙන් ද මැඩී මරණයට පත් වේ. **නත්ථි මරණතෝ මොක්ඛා** මරණයෙන් මිදෙන උපායක් නොලබයි. එබඳු උපක්‍රමයක් නැත. **එලානම්ව පකකානං පාතෝ පතනතෝ භයං** මුහුකුරා ගිය, ඉදී පැසී නටුව ද වේලී ගිය කොස්ගෙඩි ආදිය ඉතා උදෑසන වැටෙන්නේ යැයි බියවන ඵල හිමියන්ට මෙන් **එවං ජාතානං මච්චානං නිච්චං මරණතෝ භයං** මෙලෙසින්ම උපන්නා වූ සත්ත්වයන්ට මෘත්‍යුනම් වූ මරණයෙන් නිරන්තරව බිය උපදියි.

යථාපි කුම්භකාරස්ස මැටිබඳුන් සාදන කුඹලාට මෙන්, **කතං මත්තිකභාජනං** ඔහු විසින් සෑදූ නිමවූ මැටි බඳුන්. **සබ්බං භෙදන පරියන්තං** සියල්ල බිඳී යාම, කුඩු වී විනාශ වී යෑම අවසන්කර ඇත්තේනුයි භෙදන පරියන්ත වේ. **එවං මච්චානජීවිතං** සත්ත්වයන්ගේ ආයු සංස්කාරය ද එසේමය. මරණයෙන් කෙළවර වේ. **දහරා ච මහන්තා ච ළාබාල දරුවෝද** මහල්ලෝද **යෙ බාලායෙව පණ්ඩිතා** යම් ආශ්වාස ප්‍රශ්වාසයෙන් ජීවත්වන අඳබාලයෝ ද පාණ්ඩිත්‍යයෙන් හෙබි බුද්ධාදී මහා සත්ත්වයෝ ද **සබ්බෙ මච්චුවසං යන්ති** මෙසේ දැක්වූ සියලුම සත්ත්වයෝ මාරයාගේ වසඟයට යති. **තෙසං මච්චුපරෙතානං** මේ මරණයෙන් පීඩිත වූ, මරණය පිරිවරා ගත් සත්ත්වයන්ගේ **ගච්ඡතං පරලොකතෝ** මේ මිනිස්ලොවින් චුතව පරලොවට යන **න පිතා තායතෙ පුත්තං** පියා පුතු නො රකියි. **ඤාති වා පන ඤාතකෙ** මාපියාදී දෙපාර්ශ්ව ඥාතීහු පවා තම ඥාතීන් රැකගැනීමට අසමත් වෙති. **පෙක්ඛ තං යෙව ඤාතීනං** කියන ලද ආකාරයෙන්ම ඤාතීන් බලාසිටියදීම බල බලා සිටියදීම. **පස්ස ලාලපතං පුථූ** 'බලවූ' යැයි අමතන දොඩවන නන් අයුරින් වැලපෙන බොහෝ නෑයන් බලව. **එකමෙකොව මච්චානං ගොවජ්ඣා විය නීයතී** සත්ත්වයන් අතුරින් එක එකාම වධයට ගෙන යන ගවයකු මෙන් මරණයට ගෙනයයි. පමුණුවයි. **එවමබභාහතෝ ලොකෝ** මෙසේම සත්ත්ව ලෝකයා මරණයට බොහෝසෙයින් ගෙනයයි. **මච්චුනා ච ජරාය ච** මරණයෙන් ද ජරාවෙන් ද මඬනා ලද. **මමායිතෙ** මගේ යැයි ගන්නා ලද වස්තු විෂයෙහි **විනාභාවං සන්තමෙවිදං** විද්‍යමාන වූ විනාභාවයම මෙය අවිනාභාවයෙන් විය

නොහැක'යි කියන ලද්දේ වේ. **සොචනති** සිතින් ශෝක කරති. **කිලමනති** කයින් වෙහෙසට පැමිණෙති. **පරිදෙවනති** නානාවිධ වාග් විලාප කියති. **උරත්තාලිං කණ්හනති** පපුවට ගසා ගනිමින් වැළපෙති. **සම්මොහං ආපජ්ජනති** මුළාවට පැමිණෙති. **අනිච්චා** පැවතී නැතිවන බැවින්. **සංඛතෝ ප්‍රත්‍යයන් එකතු වී කරන ලද. පටිච්ච සමුප්පන්නා ප්‍රත්‍යයන්ගේ එකතුව නිසා, ප්‍රත්‍යයන්ගෙන් තොර නොවී මනාව උපන්. ඛයධම්මා ක්ෂය වීමට යන ස්වභාවය යන අර්ථයයි. විරාගධම්මා නොඇලෙන ස්වභාවය. නිරෝධ ධම්මා නිරෝධ වන ස්වභාවය. යාසස පරිගහෝ 'යෝ අසස පරිගහෝ' 'යවාසස පරිගහෝ' යන පාඨය ද යෙදේ. එකම පද වෙන්කිරීමයි. නිච්චා සර්වකාලීනව ධ්‍රුවෝ ස්ථිර සස්සතෝ නොමැරී නොවැනසී පවතින අවිපරිණාමධම්මා ප්‍රකෘතියෙන් ම අත්නොහරින ස්වභාවය. සස්සතිසමං තථේව ඨස්සති** සඳ හිරු මහාමේරුව මහා සමුද්‍රය මහාපොළව පර්වත මෙන් සිටින්නේය. **නානාභාවෝ** ජාතියෙන් වන නානාභාවය. **විනාභාවෝ** මරණයෙන් වන වෙන්වන ස්වභාවය. **අඤ්ඤථාභාවෝ** භවයෙන් අන් ආකාරයකට පත්වන ස්වභාවය. **පුරිමානං පුරිමානං ඛන්ධානං** අතරක් නැතිව පළමු පළමු උපන් ස්කන්ධයන්ගේ **විපරිණාමඤ්ඤථා භාවා** ප්‍රකෘති ස්වභාවය අත්හැර අන් ආකාරයකින් පසුව පසුව පවතින ස්කන්ධාදිය පවතියිද උපදියි යැයි සම්බන්ධ කරගත යුතුයි. **සබ්බං ඝරාවාස පළිබොධං** සියලු ගිහිබවින් ඇතිවන ගැටළු **ඤාතිමිත්තාමච්ච පළිබොධං** මව්පිය දෙපාර්ශ්වයේ ඥාතීන්, මිත්‍ර සහායකයන්, අමාත්‍යයන්, ඇමති සමූහයා. **සන්නිධි පළිබොධං** නිධන් කළ ධන සම්පත් අත්හැර **කෙසමස්සුං ඔහාරෙත්වා** කෙස් ද රැවුල් ද (ඉවත්කර) බහා **කාසායානි වත්ථානි** කසට පෙවූ, කහපාට වස්ත්‍ර හැඳ පොරවාගෙන.

මාමකෝ මගේ උපාසකයෙකි. මගේ භික්ෂුව යන සංඛ්‍යාවට ගිය නැතහොත් බුද්ධාදී වස්තූන් මමායනය කරනුයේ. **තෙසං තෙසං සත්තානං** අනේක වූ සත්ත්වයන්ගේ, සාධාරණ නිර්දේශයයි. යඤ්ඤදත්තගේ මරණය, සෝමදත්තගේ මරණය යනාදී ලෙස දවසක්ම කියූවත් සත්ත්වයෝ අවසන් වීමට නොයන්නේමය. සියලු අපරාර්ථ දීපනය සිදු නොවේ. මේ දෙපදයෙන් කිසිදු සත්ත්වයෙක් ඇතුලත් නොවන්නේ නොවේ. සියලු සතුන්ම ඇතුලත් කරගනී යන අර්ථයයි. **තථා තථා** මේ ගති වශයෙන් අනේකප්‍රකාර සත්ත්ව නිකායන්ගේ සාධාරණ නිර්දේශයයි. **සත්තනිකායා** සත්ත්වයන්ගේ නිකාය, සත්ත්ව රැළ, සත්ත්ව සමූහය යන අර්ථයයි. **චුතී**

චුතුවීම් වශයෙන් කියන ලදී. ඒක ස්කන්ධ, චතු ස්කන්ධ, පංචස්කන්ධ චුතියට යොදන සාමාන්‍ය වචනයයි. **චවනතා** භාවාර්ථයෙන් ලක්ෂණය දැක්වීමයි. **භෙදො චුත** වූ ස්කන්ධයන්ගේ භංග, උත්පත්ති දැක්වීමයි. **අනතරධානං** බිඳුණු කළයක් මෙන්, බිඳුණු ස්කන්ධයන්ගේ කිසියම් පර්යායකින් ගැටෙන ස්වභාවය දැක්වීමයි. **මචවුමරණං** මෘත්‍යු නම් වූ මරණයයි. ක්ෂණික මරණය නොවේ. කාල යනු මාරයායි. ඔහුගේ ක්‍රියාව **කාලකිරියා** නම් වේ. මෙපමණකින් සම්මුති මරණය දක්වන ලදී. දැන් පරමාර්ථ වශයෙන් මරණය දක්වනු සඳහා 'බන්ධානං භෙදො' යනාදිය කියන ලදී. පරමාර්ථ වශයෙන් ස්කන්ධයන්ම බිඳේ. සත්ත්වනම් වූ කිසිවකු නොමැරෙයි. ස්කන්ධයන් බිඳෙනවිටදී 'සත්ත්වයා මැරෙයි' කියාද බිඳුණු කල්හි 'මැරුණි' කියාද ව්‍යවහාරය ඇතිවේ. මෙහිදී ද චතුවෝකාර, පංචවෝකාර භවයන්ගේ වශයෙන් ස්කන්ධ භේදය දැක්විණි. ඒකවෝකාර වශයෙන් ශරීරයේ නික්ෂේපය (ශරීරයේ බහා තැබීම) කියන ලදී. නැතහොත් චතුවෝකාර වශයෙන් ස්කන්ධයන්ගේ බිඳියෑම කියන ලදී. සෙසු එකවෝකාර පංචවෝකාර දෙක වශයෙන් ශරීරයේ බහාතැබීම දතයුතුයි. කාමරූප යන භව දෙකෙහි රූපකාය සංඛ්‍යාත ශරීරයේ හටගැනීම ඇති හෙයිනි. නැතහොත් යම්හෙයකින් චාතුර්මහාරාජිකාදියෙහි ස්කන්ධ බිඳී යන්දීම කිසිවක් ඉතිරි නොවේ ද ඒ චුතවීම සඳහා ස්කන්ධයන්ගේ බිඳී යෑම යැයි කියන ලදී. මනුෂ්‍යාදීන් කෙරෙහි කලේබර (ශරීරයේ) බහාතැබීම වේ. මෙහිදී ද ශරීරයේ බහාතැබීමට හේතුවන බැවින් මරණය කලේබරයාගේ නික්ෂේපයැයි කියන ලදී. **ජීවිතින්ද්‍රියසසු පවෙජ්දො** මේ ඉන්ද්‍රියයන්ගෙන් බැඳුණහුට ම මරණය වේයැයි දැක්විණි. ඉන්ද්‍රියබද්ධ නොවූවහුට මරණයක් නම් නැතැයි දක්වයි. ගොයම මැරුණි. ගස මැරුණේය යනු ව්‍යවහාර මාත්‍රයකි. අර්ථ වශයෙන් මෙබඳු වචනවලින් ගොයම් ආදියේ ක්ෂයවීම, ව්‍යයවීම පමණක්ම දක්වයි.

රූපගතං රූපයම 'රූපගත' වේ. **වෙදනාගතං** යනාදියෙහි ද මේ ක්‍රමයමයි. එහි **පුබ්බෙව මචචං** යනු භෝගයෝ කලින්ම පළමුවන මිනිසා අත්හරිති. නැතහොත් මිනිසාද කලින්ම ඒ භෝගයන් අත්හරියි. **කාමකාමී** සොර රජවරුන්ට අමතයි. පින්වතුනි, කාමයන්හි කැමතිවන, ආශාවන කාමභෝගීහු නම් ලොව අශාස්වතය. අස්ථිරය. භෝගයන් නැසුණුවිට ජීවත්ව සිටිමින්ම භෝග නැති අයෙක් වීමට සිදුවේ. භෝගයන් අත්හැර තමා නැසෙති. එනිසා මම මහජනයාගේ ශෝක කාලයෙහිද ශෝක නොකර සිටිමි. **විදිතා මයා සතතුක ලොකධමමා** චෝරා රජුට අමතන්නේ

එම්බා සත්තුකය, මා විසින් ලාභ, අලාභ, යස, අයස ආදී ලෝකධර්මයෝ දැනගන්නා ලදහ. යම්සේ සඳ උදාවෙයිද පිරෙයිද නැවත ගෙවීයයිද යම්සේ සූර්යයා අඳුර දුරුකරමින් මහත් වූ ලෝක ප්‍රදේශයක් බබුළුවා, නැවත සවස අස්තයට යයිද නොපෙනීමට යයි ද (අඳුර රජකරයි) මෙලෙසින්ම භවභෝග සම්පත් උපදියි. නැතිවෙයි. එහිලා ශෝක කරනුයේ කුමට ද? 'එනිසා මම ශෝක නොකරමි' යන අර්ථයයි. **තණ්හා මඤ්ඤනාය මඤ්ඤතී** තණ්හාවෙන් ජනිත වූ මානයෙන් සිතයි. මැනීම කරයි. **දිට්ඨි මඤ්ඤනාය** දෘෂ්ටිය උපනිශ්‍රය කරගෙන උපන්නා වූ. **මාන මඤ්ඤනාය** සහජාත මාන සිතින්. **කිලෙස මඤ්ඤනාය** කියන ලද ආකාර ඇති තැවීම් අර්ථයෙන් කෙලෙස් මඤ්ඤතාවෙන් මාන කරයි. **කුහා විස්මය** ගෙන දෙන ඵඳා කණුවක් මෙන් තද **ලපා සිවුපස** හේතුවෙන් කථාකරන, **සංඛතං** එක් වූ හෝ දුටුවිරූ හෝ. **පියායිතං** ප්‍රිය කළ. **සංගතං** සම්මුඛ වූ. **සමාගතං** සමීපයට පැමිණි. **සමාහිතං** ඒකීභූත වූ. **සන්නිපතිතං** සන්නිපාත (රැස්) වූ. **සුපිනගතො සිහින** දැකීමට පිවිසි. **සෙනාවියූහං පස්සති** සේනා සමූහයා දකියි. **ආරාමරාමණෙය්‍යකං** පුෂ්පාරාමාදීන්ගේ රමණීය බව. වනරාමණෙය්‍යකාදියෙහි ද මේ ක්‍රමයමයි. **පෙතං** මෙයින් චුතව පරලොවට ගිය **කාලකතං** මළ. **නාමමෙව සිස්සති අකෙඛය්‍ය** සියලු රූපාදි ධර්මයන්ගෙන් හටගත් දේ ප්‍රහීණ වේ. නාම මාත්‍රයම ඉතිරි වේ. බුද්ධරක්ඛිත, ධම්මරක්ඛිත යනාදී වශයෙන් පැවසීමට පමණක් පැමිණේ.

යෙ චකඛු විඤ්ඤාණාභිසමයභූතා යම් චක්ඛු විඤ්ඤාණයෙන් දක්නා ලද, රැස්කළ, දුටු චතුසමුට්ඨානික රූප. **සොතවිඤ්ඤාණාභිසමභූතා** අනුන්ගේ උපදෙස් අසන ශ්‍රෝත විඤ්ඤාණයෙන් රැස්කළ, ඇසූ ද්විසමුට්ඨානික ශබ්ද.

මුනයො රහතන් වහන්සේලා, **ඛීණාශ්‍රව මුනීහු. ඛෙම දසසිනො** නිවන් දකින්නා වූ. **සොකො** ශෝක නිර්දේශයේ වැනසේනුයි 'ව්‍යසන' නම්. හිතසුව දුරුවේ. විද්වංසනය කරයි යන අර්ථයයි. ඤාතීන්ගේ විනාශය **ඤාතිව්‍යසනං** සොර බිය, රෝග බිය ආදියෙන් ඤාතීන් ක්ෂය වෙයි. විනාශ වෙයි යන අර්ථයයි. ඒ ඤාති ව්‍යසනයෙන්. **ඵුට්ඨස්ස** මැඬුනහුගේ, ස්පර්ශ කරන, යුක්ත වූ තැනැත්තාගේ යන අර්ථයයි. සෙසු පදයන්හි ද මේ ක්‍රමයමයි. මේ වනාහි විශේෂයයි. භෝගයන්ගේ විනාශය **භොග ව්‍යසනං** රජ සොර ආදී වශයෙන් භවභෝග ක්ෂයවීම භෝග විනාශය යන අර්ථයයි. රෝගයම විපත වූයේ **රොගව්‍යසනං** යයි. රෝගය වනාහි

නීරෝගි බව නසනුයි විනාශ කරනුයි ව්‍යසන වේ. සීලයේ විනාශය **සීලව්‍යසනං** නම් වේ. දුසිල් බවට මේ තව නමෙකි. සම්‍යක් දෘෂ්ටිය විනාශ කරමින් උපදින දෘෂ්ටියම ව්‍යසනයක් වූයේ **දිට්ඨි ව්‍යසනං** නම් වේ. මෙහිද මුලින් දැක්වූ දෙක අනිෂ්පන්නයෝ ය. පසුව දැක්වූ තුන නිෂ්පන්නයෝ ය. ත්‍රිලක්ෂණයෙන් නසන ලද මුල් තුන් ව්‍යසන කුසල් නොවේ. අකුසල්ද නොවේ. සීල දිට්ඨි, ව්‍යසන දෙකම අකුසල්ය. **අඤ්ඤතරඤ්ඤතරෙන** ගන්නා ලද හෝ කිසියම් අල්ලා නොගන්නා ලද හෝ කිසියම් මිත්‍ර අමාත්‍යව්‍යසනාදිය අතුරෙන් යම්කිසිවක **සමනනාගතස්ස** යනු බැඳි පවතින, අත්නොහැර පවතින (යුක්ත වූ) **අඤ්ඤතරඤ්ඤතරෙන දුක්ඛධම්මෙන** කිසියම් ශෝක දුකට උත්පත්ති හේතුවෙන්. **සොකො** ශෝක කිරීම් වශයෙන් වන ශෝකය. මෙය ඉහත කී කරුණු නිසා උපදින ශෝකයේ ස්වභාවය දැක්වීමයි. **සෝචනා** ශෝක කරන ආකාරයක්. **සොචිතත්තං** ශෝකී බව. **අන්තෙනා සොකො** අභ්‍යන්තර ශෝකය, දෙවැනි පදය උපසර්ගයක් යොදා වර්ධනය කරන ලදී. යමක් අභ්‍යන්තරය වියලවමින් විශේෂයෙන් වියලවමින් උපදියි ද එය **සො අන්තෙනා පරිසොකො** යි කියනු ලැබේ. **අන්තෙනා ඩාහො** අභ්‍යන්තර දාහය. දෙවැනි පදය උපසර්ගයක් යොදා අර්ථය වැඩිකරන ලදී.

චෙතසො පරිජ්ඣායනා සිතේ දැවෙනාකාරයයි. ශෝකය උපදිනවිට ගින්නක් මෙන් සිත දවයි. හුණු කරයි 'මගේ සිත දැවෙන්නේ මට කිසිවක් නොවැටහේ' යැයි කියයි. දුක්බිත වූ සිත දුම්මන නමි. ඒ දුම්මන ස්වභාවය **දොමනස්සං** නම් වේ. ඇතුලට පිවිසි අරුතින් ශෝකයම හුලක් වන්නේනුයි **සොකසල්ලං** වේ.

පරිදේව නිර්දේශයේ 'මගේ දුව, මගේ පුතා'යි මෙය කරණ කොටගෙන මෙසේ පුන පුනා වැලපෙති හඬතියි ආදෙවො වේ. ඒ ඒ ඥාතියාගේ ගුණකථනය කරමින් මෙය කරණකොට වැලපේනුයි **පරිදෙවො** වේ. ඉන් අනතුරුව දෙපදය, දෙපදය වශයෙන් දැක්වූ පද සතර මුල් පද දෙකේම ආකාරය, ස්වභාවය දැක්වීම් වශයෙන් කියන ලදී. වාචා වචන **පලාපො** තුච්ඡ වූ හිස් වූ නිරර්ථක වචන. වැරදි මඟ දැක්වීම්, අනිකක් කීම් ආදී වශයෙන් විරූප (විපරීත) වූ ප්‍රලාපය **විප්පලාපො ලාලප්පා** යනු නැවත නැවත කීමයි. පුනපුනා කියන ආකාරය **ලාලපනා** වේ. ලාලපිතයාගේ ස්වභාවය. **ලාලපිතත්තං** මච්ඡරිය යනාදිය මුලින් කියන ලද අර්ථ ඇත්තේමය.

සත්වන ගාථාව මෙසේ මරණයෙන් පීඩිත ලෝකයේ පවතින අනුරූප ප්‍රතිපත්තිය දැක්වීම සඳහා කියන ලදී. එහි **පතිලීනචරසස** යනු ඒ ඒ තැන වැලැක්වූ, අත්හළ සිත් ඇතිව හැසිරෙන **භික්ඛුනො** යනු කල්‍යාණ පුථුජ්ජනයාට හෝ ශේඛයාට හෝ. **සාමගියමාහු තසෙසතං යො අත්තානං භවතෙ න දසසයෙ** මෙය ඔහුට සුදුසු යැයි කියන ලදී. යමෙක් මෙසේ පිළිපදින්නේ නිරයාදී ප්‍රභේද ඇති භවයෙහි නැවත උපදිමින් තමා නො දක්වන්නේය. මෙසේ ඔහු මේ මරණයෙන් මිදෙන්නේය යන අදහසයි.

පතලීනචරා වුචවනති ඒ ඒ අරමුණෙහි සැඟවී පවතින, අප්‍රකට සිත් හැසිරීම කියනු ලැබේ. **සත්ත සෙකඛා** යනු අධිශීලාදී ශික්ෂාවන්හි හික්මෙති යන අර්ථයෙන් සෝවාන් මාර්ග පුද්ගලයා ගේ සිට අර්හත් මාර්ගස්ථ පුද්ගලයා දක්වා සේඛයෝ සත්දෙනා. **අරහා** යනු අර්හත් ඵලස්ථයා. උන්වහන්සේ කළයුතු දේ කර නිමවූ බැවින් පතිලීන නම් වෙති. ශේඛයන්ගේ ප්‍රකට වූ හැසිරීම් ඇති ස්වභාවයට හේතුව දක්වමින් **කිංකාරණා** යනාදිය කියන ලදී. **තතො තතො** ඒ සත් සේඛයෝ ඒ ඒ අරමුණුවලින්. **චිත්තං පතිලීනතෙතා** තමාගේ සිත සඟවමින් **පතිකුටතෙතා** හකුළුවමින් **පතිවටටතෙතා** පැදුරක් මෙන් හකුළන්නාහු. **සතනිරුමහනතා** පෙරළමින් **සතනිගණහනතා** නිග්‍රහ කරමින් **සතනවාරෙනතා** වළක්වමින් **රකඛනතා** ආරක්ෂා කරමින් **පොපෙනතා** සිත නම් මංපුසාවෙහි තබා ගෝපනය කරමින්. දැන් ද්වාර වශයෙන් දක්වමින් 'චක්ඛුද්වාරෙ' යනාදිය වදාළහ. එහි **චක්ඛුදවාරෙ** යනු චක්ඛු විඤ්ඤාණද්වාරයෙහි, **සොතදවාරා** දියෙහි ද මේ ක්‍රමයමයි. **භික්ඛුනො** පුථුජ්ජන කල්‍යාණ භික්ෂුවට හෝ සේඛ භික්ෂුවට හෝ. භික්ඛු ශබ්දයේ වචනාර්ථ නොපවසා මෙහිදී අදහස් කරන ලද භික්ෂුව ම දක්වන ලදී. එහි පුහුදුන් වූ හෙතෙම කෙලෙස් මුලිනුපුටා නොදැමූ හෙයින්ද කල්‍යාණ (යහපත්) ශීලාදී ප්‍රතිපත්තීන්ගෙන් යුක්ත වූ හෙයින්ද කල්‍යාණ පුථුජ්ජන භික්ෂුව නම් වේ. පුථුජ්ජන කල්‍යාණයාම පුථුජ්ජන **කල්‍යාණකො** ඒ පුථුජ්ජන කල්‍යාණයාට. අධිශීලාදියෙහි හික්මෙන්නේනුයි **සෙකෙඛා** ශෛක්ෂයාට හෝ ඒ සෝවාන් හෝ සකෘදාගාමී හෝ අනාගාමී වූ පුද්ගලයාට.

මෙහි හිඳගනියි, වාඩිවෙයිනුයි **ආසනං** නම් වේ. **යත්ථ** යම් ඇඳපුටු ආදියෙක. **මඤඤවා** ආදිය ආසනයන්ගේ ප්‍රභේද දක්වන වචනයන්ය. ඇඳ ද හිඳගැනීමට අවකාශ ඇති බැවින් මෙහි දී ආසන නාමයෙන්

ගන්නා ලදී. එය වනාහි උඩුවියන් ඇති, සත්ත්ව රූප සහිත කකුල්, විවිටම හාරා වැද්දූ කකුල් ඇති ඇඳන්වලින් එකකි. **පීඨං** පුටුවද ඒ ආසනයන්ගෙන් එකකි. **හිසි** යනු බැටලු ලොමින් කළ කොට්ට, රෙදි කොට්ට, වැහැරි (පට්ටා) වලින් කළ කොට්ට, තණවලින් කළ කොට්ට, වියලි කොළවලින් කළ කොට්ට ආදී එක්තරා කොට්ටයක්. **තට්ටිකා** තල් කොළවලින් වියා සෑදූ පත්කඩ, **චම්මඛණ්ඩා** හිඳීමට සුදුසු කිසියම් සම්කඩක්. **තිණ සන්ථාරාදයෝ** තණ ආදිය එකට ඔතා කරන ලද. **අසප්පාය රූප දස්සනෙන** නුසුදුසු ඉෂ්ට රූපාදිය බැලීමෙන්. **රිත්තං** අභ්‍යන්තර වශයෙන් හිස් වූ. **විවිත්තං** යනු පිටතට පිවිසීමෙන් ශූන්‍ය වූ. **පවිවිත්තං** කිසියම් ගෘහස්ථයෙක් එහි නැතිහෙයින් අනෙකෙකුගෙන් ශූන්‍ය වූ. අසත්පාය ශබ්ද ඇසීමෙහි ද මේ ක්‍රමයම දතයුතුයි. **පඤ්චහි කාමගුණෙහි** ස්ත්‍රීරූප, ශබ්ද, ගන්ධ, රස, ස්පර්ශාදී පංචකාම ගුණයන්ගෙන්. මෙය කියන ලද්දේමය.

> රූප සද්දා රසා ගන්ධා ඵොට්ඨබ්බා ච මනොරමා
> පඤ්චකාම ගුණාලොකෙ ඉත්ථීරූපසමිං දිස්සරෙ

භජතො සිතින් ඇසුරු කරන්නාට. **සමභජතො** මනාව ඇසුරු කරන්නාට. **සෙවතො** සමීපයට එන්නාට. **නිසෙවතො** නිශ්චය කර ඇසුරු කරන්නාට. **සංසේවතො** මනාව සේවනය කරන්නාට. **පතිසෙවතො** නැවත නැවත සමීපයට එන්නාට. **ගණ සාමගි** ශ්‍රමණයන්ගේ එකීභාවය වූ සමගි බව. **ධම්මසාමග්ගී** සත්තිස් බෝධිපාක්ෂික ධර්මයන්ගේ සමූහභාවය. **අනභි නිබ්බත්ති සාමග්ගී** නූපදින්නා වූ නැවත නූපදවන්නා වූ අනුපාදිශේෂ නිර්වාණ ධාතුවෙන් පිරිනිවි රහතන් වහන්සේලාගේ සමූහය. **සමගගා** කියන් නොවෙන්ව. **සමෙමාද මානා සිතින්** මනාව සතුටුවෙමින්, ප්‍රීතිවෙමින්. **අවිවදමානා** වචනයෙන් වාදවිවාද නොකරමින්. **ඛීරොදකීභූතා** කිරි සමග මිශ්‍ර වූ ජලය මෙන්. **තෙ එකතො පක්ඛන්දනති** ඒ බෝධිපාක්ෂික ධර්ම එක් අරමුණකට පිවිසෙයි. එහි බැස ගනියි. ඒ අරමුණෙහිම ප්‍රසාදයට පැමිණෙයි. **අනුපාදිසෙසාය** උපදි විරහිත වූ **නිබ්බාණ** ධාතුයා අමෘත මහා නිර්වාණ ධාතුවෙන්. **ඌනත්තං වා** මෙහි ඌනභාවය ඌනත්ත වේ. අපරිපූර්ණ භාවය යන අර්ථයයි. **පුණ්ණත්තං වා** පරිපූර්ණභාවය, පූර්ණ භාවය, පූර්ණත්වයයි. පූර්ණභාවය හෝ නොපෙනේ. පූර්ණ බවක් නොමැත යන අර්ථයයි. **නෙරයිකානං** නිරයේ උපදවන කර්මයන් ඇති බැවින් නිරයට සුදුසු වූයේනුයි නෙරයික නම් වේ. ඒ **නෙරයිකානං** (නේරයිකයන්ගේ)

නිරයො භවනං යනු නිරය, සත්ත්වයන්ගේ වසන ස්ථානය වූ නිවාසය. **තිරච්ඡානයොනිකානං** යනාදියෙහි ද මේ ක්‍රමයමයි.

තස්සෙසා සාමග්ගී ඒ ක්ෂීණාශ්‍රවයාගේ මේ නිර්වාණ සාමග්‍රිය වේ. **එතං ඡනනං** මෙය සුදුසුය. **පතිරූපං** සමානය. ප්‍රතිරූපය අසමාන අප්‍රතිභාග නොවේ. **අනුචඡවිකං** යනු මෙය ශ්‍රමණ කරණ ධර්මයන්ට හෝ මාර්ගඵල නිවන් ගෙනදෙන ශාසන ධර්මයට හෝ සුදුසුය. මේ ධර්මයන්ගේ සුදුසු භාවයෙන් ඉතා දුරට යයි. (නිරයාදී උප්පත්තිවලින්) නැතහොත් ඒ ධර්මයන්ගේ ඉතා සමීපයට යයි. සුදුසුභාවයම අනුලෝම ද වේ. ඒ ධර්මයන්ගේ අනුලෝමභාවයෙන්, විලෝම නොවූ විරුද්ධ නොවූ ස්වභාවයයි. දැන් යමෙක් තමා නරකාදී භවයන්හි නොදක්වන්නේද මෙසේ වූ රහතන් වහන්සේ පිළිබඳව මේ ගාථාවෙන් දැක්විණි. ඒ රහතන් වහන්සේගේ ගුණ පවසනු සඳහා මින් අනතුරු ගාථා තුන වදාළහ.

ඉන් පළමු ගාථාව **සබ්බත්ථ** ද්වාදස (දොළොස්) ආයතනයන්හි. **න පියං කුබ්බති නොපි අපපියං** යන නිර්දේශයේ **පියා** සිත ප්‍රීතියට පත්කරන, ඒවා විභාග වශයෙන් දක්වමින් **කතමෙ සත්තා පියා? ඉධ යසසතෙ හොනති'** (කවර සත්ත්වයෝ ප්‍රියයෝ වෙත්ද, මෙලොව යම් කෙනෙක් හිතවැඩ කැමති වේනම්)' යනාදිය කියන ලදී. එහි **යසසතෙ** යනු යමෙක් වේද ඔවුහු. **හොනති** වෙති. **අත්ථ කාමා** අභිවෘද්ධිය කැමති. **හිතකාමා** සැප කැමති. **ඵාසුකාමා** සුබ විහරණය කැමති. **යොගකෙඛ කාමා** යනු සිවු යෝගයෙන් ක්ෂේම වූ නිර්භය භාවය කැමති, මමත්වය කරන්නේනුයි **මාතා** යි. ප්‍රියත්වය කරන්නේනුයි **පිතායි**. භජනය කරන්නේනුයි **භාතායි**. භගිනී යනාදියෙහි ද මේ ක්‍රමයමයි. පරපුර සුරකියි, ආරක්ෂා කරයිනුයි **පුත්තෙනා** යි. කුලවංසය දරනුයේ නුයි **ධීතා** යි. **මිත්තා** සහායකයෝ, ඇමතියෝ, ඇමති සමූහයා, **ඤාති** පියපස ඤාතීහු **සාලොහිතා** මව්පස නැයෝ. **ඉමෙ සත්තා පියා** යනු මේ සත්ත්වයෝ ප්‍රීති උපදවන්නෝ ය. කියූ පදයන්ගේ විපර්යාසයෙන් අප්‍රියයෝ දතයුතුයි. **යදිදං දිට්ඨසුත මුතෙසු වා** යනු මෙහි ඉදින් දක්නා ලද, ඇසූ දහම් හෝ චින්දනය කළ දහම් හෝ ඇසූ දහම්හි. **එවං මුනි න උපලිම්පති** යයි මෙසේ සම්බන්ධ කර අර්ථ ගතයුතුයි.

උදකපෙවො දිය බිඳ, 'උදකපෙවකො' යන පාඨය ද යෙදේ. **පදුම පත්තෙ පියුම්පතෙහි. ධොතො නහි තෙන මඤ්ඤතී යදිදං දිට්ඨසුතෙ මුතෙසු වා** දුටු ඇසූ රූප ශබ්දාලම්බනයක් වේද ඒ වස්තුවෙන් මඤ්ඤතා

නොකරයි. නොසිතයි. දැනගත් හෝ විඳගත් ධර්මාලම්භනයක් කෙරෙහි හෝ නොසිතයි. මේ අයුරින් පද සම්බන්ධය දතයුතුයි. **නහි සො රජ්ජති නො වීරජ්ජති** බාල පුහුදුන් අයෙකු මෙන් නො ඇලෙයි. කල්‍යාණ පුථුජ්ජන සේඛයකු මෙන් නො ඇලෙයි. රාගය ක්‍ෂය කළ බැවින් විරක්තයෙකි යන සංඛ්‍යාවට ගැනේ. සෙසු පදයන්ගේ අර්ථ ඉතා ප්‍රකටමය. **කාය පඤ්ඤාය කාය දුච්චරිතං** යනු එය සම්ප්‍රයුක්ත වූ බැවින් පූර්වභාගයේදීම හෝ ප්‍රඥාවෙන් පරිග්‍රහණය කළ යුත්තෙහි පරිග්‍රහණය කරගනිමින් ත්‍රිවිධ කාය දුශ්චරිත සමුච්ඡේද වශයෙන් කම්පා කරයි. මේ පුද්ගලයා ධර්ම දේශනාවෙන් විපතට පත් අයෙකු නොවේ. ධර්මයන් කම්පා කරන කල්හි ඒ ධර්මයන්ගෙන් යුක්ත පුද්ගලයාද කම්පා කරයි නම් වේ. ඒ ධර්මයන්ද ප්‍රඥාවෙන් යුක්තව, එය පවතින ක්‍ෂණයෙහිම කම්පා කිරීමට පටන්ගත් කල්හිම කම්පා කරන ලදැයි කියති. අනුභව කිරීමට ඇරඹූ කල්හි 'අනුභව කළා'යැයි කියන්නාක් මෙනි. මෙහි ලක්‍ෂණ ශබ්ද ශාස්ත්‍රයෙන් දතයුතුයි. ධුතං යනු කර්තෘ සාධනයයි. ධුතං ප්‍රථම ආර්ය මාර්ගයෙන් ධොතං දෙවන ආර්ය මාර්ගයෙන්. **සන්ධොතං** තෙවැනි ආර්ය මාර්ගයෙන්. **නිද්ධොනං** සිවුවන ආර්ය මාර්ගයෙන්. **ධොතො දිට්ඨං න මඤ්ඤති** රහතන් වහන්සේ මසැසින් හෝ දිවැසින් දුටු රූපායතනය පිළිබඳව ත්‍රිවිධ මඤ්ඤනාවන්ගෙන් නොසිතයි. කෙසේ ද? රූපායතනය සුභ වශයෙනුත්, සුඛ වශයෙනුත් නොදකිමින්, එහි ඡන්දරාග නූපදවයි. එය ආශ්වාදනය නොකරයි. සතුටු නොවේ. මෙසේ දක්නා ලද්දේ තණ්හා මඤ්ඤතාවෙන් නො සිතයි.

'මෙසේ මගේ රූපය අනාගතයේ ද වේ' යැයි මෙහි ආත්ම වශයෙන් පැවැත්ම අපේක්‍ෂා නොකරයි. රූප සම්පත්තිය කැමැත්තෙන් දැන් හෝ නොදෙයි. සිල් හෝ නොරකියි. පොහොය කර්ම හෝ නොකරයි. මෙසේ දුටු දෙය පිළිබඳව තණ්හා මඤ්ඤතාවෙන් නොසිතයි. තමාගේ ද අනුන්ගේ ද රූප සම්පත්ති, විපත්ති නිසා මානය නූපදවයි. 'මම මොහුට වඩා උතුම් වෙමි. සමාන වෙමි. හීන වෙමි යනාදී දුටු දෙය පිළිබඳ මාන මඤ්ඤනා නූපදවයි. රූපායතනය ද නිත්‍යය. ස්ථිරය. ශාස්වත යැයි නොසිතයි. තමා ආත්මීය ලෙස නොසිතයි. අවමංගලයක් මංගල ලෙස නොසිතයි. මෙසේ දුටු දෙය දෘෂ්ටි මඤ්ඤතාවෙන් නො සිතයි. **දිට්ඨසම්මං න මඤ්ඤති** යනු රූපයෙහි ආත්මය දැකීම් න්‍යායයෙන් නොසිතන්නේ දුටු දෙයෙහි නොසිතයි. තනයේ ඇති තනකිරි යම්සේ ද එසේම රූපයෙහි රාගාදිය ඇතැයි නොසිතනුයේ දුටු දෙය පිළිබඳව නොසිතයි. ඒ දෘෂ්ටි

මඤ්ඤනාවෙහිම ආත්ම වශයෙන් නොසිතන කල්හි,වස්තුවෙහි සෙනෙහසත් මානයත් නූපදීමෙන් තණ්හා මාන මඤ්ඤනාවන් ද නැතැයි දතයුතුයි. මෙසේ රූපායතනයෙහි ආත්මය ඇතැයි නොසිතයි. **දිට්ඨතො නමඤ්ඤති** මෙහි **දිට්ඨතො** යනු පංචමී විභක්ති වචනයකි. එහෙයින් උපකරණ සහිත දෘෂ්ටි මඤ්ඤනාවෙන් තමාගේ හෝ අනුන්ගේ, ඉහත කියූ ප්‍රභේද ඇති, රූපායතනයෙන් ඉපදීම හෝ නික්මයාම හෝ රූපායතනයෙන් අන්‍ය වූ ආත්මයක් ඇතැයි නොසිතනුයේ 'රූපායතනයෙන් නොසිතයි' යැයි දතයුතුයි. මෙය රහතන් වහන්සේගේ දෘෂ්ටි මඤ්ඤනාවයි. ඒ දෘෂ්ටි මඤ්ඤණාවෙහි නොසිතන කල්හි වස්තුවෙහි සෙනෙහස ද මානය ද නූපදවීමෙන්, තණ්හා මාන මඤ්ඤනාවත් ඇති නොවේ යැයි දතයුතුයි.

දිට්ඨං මෙති න මඤ්ඤති මෙහිදී වනාහි මෙය මගේ යැයි තණ්හා වශයෙන් මමායනය නොකරනුයේ රූපායතනය තණ්හා මඤ්ඤනාවෙන් නො සිතයි. **සුතං** යනු සාමාන්‍ය කණින් (මිනිස්) ඇසූ, දිවකණින් ඇසූ යෙ ශබ්දායතනයට තවත් නමකි. **මුතං** ස්පර්ශ කරගන්නා ලද, ගැටී, පැමිණ ගත් යන අර්ථයයි. ඉන්ද්‍රියන්ගේ ද ආරම්මණයන්ගේ ද අන්‍යෝන්‍ය වූ මිශ්‍රත්වයෙන් උපන්නේ යැයි කියන ලදී. ගන්ධ, රස, ස්පර්ශ යන ආයතනයන්ට මේ තවත් නමකි. **විඤ්ඤාතං** මනසින් දැනගත්. සෙසු ආයතන හතට මේ තවත් නමකි. ධර්මාරම්මණය ද සත්කාය පරියාපන්නවම ලැබේ. විස්තර වශයෙන් රූපායතන වාරයෙහි කියූ පරිදිම දතයුතුයි.

දැන් භාග්‍යවතුන් වහන්සේ වදාළ සූත්‍රවශයෙන් දක්වමින් 'අසමීති භික්ඛවෙ' යනාදිය කියන ලදී. එහි **අසමී** යනු වෙමි. නිත්‍ය බවට මේ තවත් වචනයකි. **මඤ්ඤිතමෙතං** මේ දෘෂ්ටි කල්පනයයි. **අය මහමස්මි** මේ මම වෙමි. **අඤ්ඤත්‍ර සතිපට්ඨානෙහි** සතර සතිපට්ඨානයන් හැර. **සබ්බ බාල පුථුජ්ජනා රජ්ජන්ති** සියලු අන්ධබාල නානා ජනයා ඇලෙති. **සත්තසෙක්ඛා විරජ්ජන්ති** සෝවාන් ආදී ආර්ය ජනයෝ සත්දෙන විරාගයට පැමිණෙති. **අරහා නො රජ්ජති නො විරජ්ජති** කෙළෙසුන්ගේ පිරිනිවීමෙන් ඇලීමත් විරාගයත් යන දෙකම නොකරයි. **ඛයා රාගස්ස** ආදී ත්‍රිවිධ පදයන්ගෙන් නිවනම අදහස් වේ.

සයවන ජරා සූත්‍ර නිර්දේශ වර්ණනාව නිමියේ ය.

7.

සත්වන තිස්ස මෙත්තෙය්‍ය සූත්‍රයේ **මෙථුන මනුයුත්තසස** යනු මෛථුන ධර්ම ක්‍රියාවෙහි නිරත වූවහුට **ඉති** මෙසේ කීය. ආයස්මා යනු ප්‍රිය වචනයකි. **තිසෙසා** යනු ඒ තෙරුන්ගේ නාමයයි. තිස්ස යනු මාපියන් තැබූ නමයි. මෙත්තෙය්‍ය යනු ගෝත්‍රයයි. ගෝත්‍ර නාමයෙන්ම මොහු ප්‍රකට විය. එනිසා අර්ථෝත්පත්තියෙහි (අට්ඨකථාවෙහි) 'තිස්සමෙත්තෙය්‍ය නම් යහලුවෝ දෙදෙනෙකි යි කියන ලදී. **විසාතං** යනු නැසීමයි. බ්‍රූහි කියන්න. **මාරිස** ප්‍රියවචනයකි. මෙය, නිදුකාණෙනි'යි කියන ලද්දේ වෙයි. **සුත්වාන තව සාසනං** නුඹගේ වචනය අසා **විවෙකෙ සිකඛිසසාමසෙ** සහායකයා අරබයා ධර්ම දේශනාවටආයාචනා කරමින් කියයි. ඔහු වනාහි භික්මුණු ශිෂ්‍යා ඇත්තෙක්මය. **මෙථුන ධමෙමානාම** මෙය විස්තර කළ යුතු 'මෙථුන ධම්ම'ය පිළිබඳ උදෙසීමයි. (මාතෘකාවයි.) **අසදධමෙමා** යනු අසත්පුරුෂ නීච ජනයාගේ ධර්මයයි. **ගාම ධමෙමා** යනු ගම්වැසියන් ඇසුරුකරන ධර්මයයි. **වසල ධමෙමා** යනු වසලයන්ගේ ධර්මයයි. කෙලෙස් වැසි වස්වන බැවින් හෝ වර්ෂාවම වසල ධර්මයක් වූයේනුයි වසල ධර්මය වේ. **දුටඨුලෙලා** කෙලෙසුන්ගෙන් දුෂ්ට වූබැවින් දුටෙඨා වේ. අදක්ෂ භාවයෙන් ථුල්ල වූයේනුයි දුටඨුලෙලා වේ. යම්හෙයකින් ඒ මෛථුන ධර්මයෙන් පිරිවැරූ තැනැත්තා දැකීම, ග්‍රහණය, පිරිමැදීම, ස්පර්ශය, ගැටීම, දුටඨුල්ල හෙවත් කෙලෙසුන්ගෙන් දුෂ්ට වූයේ වේද, ඒ නිසාද ඒ මෛථුන ධර්මය දුට්ඨුල්ල නම් වේ. **ඔදකනතිකො** යනු ඒ මෛථුන ධර්මය අවසානයේ ජලයෙන් පිරිසිදුවීම අවශ්‍ය වේනුයි උදකන්ත හෙවත් දියකිස අවසන්කොට ඇත්තේ වෙයි. එයම ඔදකන්තික නම් වේ. රහසින් සැඟවුණු තැනක සිට කළයුතු බැවින් **රහසෙසා** වේ. විනයෙහි වනාහි 'දුටඨුලලං ඔදකනතිකං රහසසං' යන පාඨය යෙදේ. ඒ තුන් පදයෙහි දී 'යො සො' යන පදය පෙරළා 'යං තං' යනුවෙන් යෙදිය යුතුයි. 'යං තං දුටඨුලලං සො මෙථුන ධමෙමා, යනතං ඔදකනතිකං සො මෙථුනධමෙමා, යනතං රහසසං සො මෙථුනධමෙමා' යනුවෙනි. මෙහිදී වනාහි 'යො සො අසදධමෙමා -පෙ- යො සො රහසෙසා මෙථුනධමෙමා' මෙසේ පද යෙදීම දතයුතුයි. දෙදෙනා දෙදෙනා විසින් යෙදිය යුතු බැවින් ද්වයං ද්වය සමාපත්තිය වේ. එහි පද යෙදුම මෙසේය. යමක් ද්වයං ද්වය සමාපත්තිය යැයි කියයි ද එය මෛථුන ධර්මය නම් වේ.

කිං කාරණා වුච්චති මෛථුන ධම්මෝ යනු කවර කරුණකින්, කවර පර්යායකින් මෛථුන ධර්මයැයි කියනු ලැබේද? ඒ කාරණය දක්වමින් 'උභිනනං රත්තානං' යනාදිය වදාළහ. එහි **උභිනනං රත්තානං** රාගයෙන් ඇලුණු ස්ත්‍රී පුරුෂ දෙදෙනාගේ, **සාරත්තානං** විශේෂයෙන් මනාව ඇලුණා වූ **අවසසුත්තානං** කෙලෙසුන්ගෙන් තෙත් වූ. **පරියුට්ඨිතානං** කුසල චාරය මැඩගෙන සිටි සිත් හැසිරීම, 'සොරු මාර්ගයේ මැඩගෙන සිටිති' ආදියෙහි මෙනි. **පරියාදිනන චිත්තානං** කුසල් සිත හාත්පසින්ම යටකරගෙන, ක්ෂය කර සිටි සිත්වලින් **උභිනනං** සදිසානං සමාන කෙලෙස් ඇති දෙදෙනාගේ, **ධම්මෝ** ස්වභාවය. **තං කාරණා** ඒ හේතුවෙන්, මෙකරුණ උපමාවකින් දැක්වීමට 'උභෝ කලහකාරකා' යනාදිය වදාළහ. එහි **උභෝ කලහකාරකා** මුලදී කලහ කරන දෙදෙනා මෙථුනකාති වුච්චනති සමාන යැයි කියති. **භණ්ඩන කාරකා** ඒ ඒ තැනට ගොස් ඩබර කරන **භස්සකාරකා** වදනින් කලහ කරමින් **විවාද කාරකා** විවිධ වචනවලින් විවාද කරන. **අධිකරණ කාරකා** විනිශ්චයට පැමිණෙන විශේෂ කරුණු ඇතිකරන **වාදිනෝ** වාද පථයන්ට පැමිණි **සල්ලාපකා** කථාකරන **එවමෙව** උපමා සන්සන්දනයයි. **යුත්තස්ස** යුක්ත වූවහුට **පයුත්තස්ස** ආදරයෙන් යෙදුණහුට **ආයුත්තස්ස** විශේෂයෙන් යෙදුණහුට **සමායුත්තස්ස** එකට යෙදුණහුට **තංචරිතස්ස** එය කරන්නහුට **තබ්බහුලස්ස** එය බොහෝකොට කරන්නාට **තගරුකස්ස** එය ගරුකරන්නහුට **තන්නිනනස්ස** එහි නැමුණු සිත් ඇත්තාට **තප්පොණස්ස** එහි නැමුණු කය ඇත්තාට **තප්පබ්භාරස්ස** එහි අභිමුඛ වූ කය ඇත්තාට **තදධිමුත්තස්ස** එහි ඇලුණහුට **තදධිපතෙය්‍යස්ස** එය අධිපති කර, ජ්‍යෙෂ්ඨ කර පවතින්නාට

විඝාතං යනු නිර්දේශයේ උද්දේස වචනයයි. **විඝාතං** පෙළීම **උපඝාතං** සමීප කර හිංසා කිරීම. **පීළනං** ගැටීම, පෙළීම **සඨනං** ගැටීම, පෙලීම මේ සියලු පද ඔවුනොවුන්ට සමාන වේ. **උපද්දවං** උපද්‍රවය, හිංසාව **උපසග්ගං** ඒ ඒ තැනට පැමිණ සඟවන ස්වභාවය. බ්‍රූහි කියන්න. **ආචික්ඛ** කියව. **දෙසෙහි** දෙසව, දක්වන්න. **පඤ්ඤාපෙහි** පනවන්න. **පට්ඨපෙහි** පිහිටුවන්න. **විවර** ප්‍රකට කරන්න. **විභජාහි** බෙදන්න. **උත්තානී කරොහි** පමුණුවන්න. **පකාසෙහි** ප්‍රකාශ කරන්න. **තුයහං වචනං** නුඹගේ වචන. **ව්‍යප්පථං** වදන් පෙළ **දෙසනං** දෙසුම **අනුසාසනං** අවවාද **අනුසට්ඨිං** අනුශාසනාව **සුත්වා කණ්ණ්** අසා **සුණිත්වා** ඊට ම සමාන වචනයකි. **උග්ගහෙත්වා** මනාව ඉගෙන **උපධාරයිත්වා** විමසා බලා. **උපලක්ඛයිත්වා**

සළකා බලා. මුසසතෙ වාති සාසනං පර්යාප්ති, ප්‍රතිපත්ති යන දෙවැදෑරුම් ශාසනය ම නැසේ. 'වා' යනු පද පූරණ නිපාතයක් පමණි

තසමිං අනරියං ඒ පුද්ගලයා කෙරෙහි මේ අනාර්ය වූ මිත්‍යා ප්‍රතිපදාව ගාරවාධි වචනං ගුණ විශිෂ්ඨ වූ, සත්ත්වයන් අතර උතුම් වූ ගෞරවණීය වූ ගරු බව ඇතිකරන වචනයකි. පොරාණයෝ එහෙයින් මෙසේ කීහ.

භගවාති වචනං සෙට්ඨං - භගවාති වචන මුත්තමං
ගරුගාරව යුත්තො සො - භගවා තෙන වුච්චති

භගවා යන වචනය ශ්‍රේෂ්ඨය. භගවා යන වචනය උතුම්ය. ඒ උතුම් තථාගතයන් වහන්සේ ගරුකටයුතු, ගෞරව කටයුතු හෙයින් භගවා යැයි කියනු ලැබේ.

නාමය සතරවැදෑරුම්ය. ආවත්තිකය. ලිංගිකය. නේමිත්තිකය. අධිච්ච සමුප්පන වශයෙනි. අධිච්ච සමුප්පන්න යනු ලෞකික ව්‍යවහාරයෙන් යාදිච්ඡකය යැයි ද කියන ලද්දේ වෙයි. එහි 'වච්ඡො ධම්මො බලිවද්දො' යනාදිය ආවත්තිකය. 'දණ්ඩී, ඡත්තී, සිඛී, කරී' යනාදිය ලිංගිකය. 'තෙවිජ්ජො, ඡළභිඤ්ඤො' යනාදිය නේමිත්තිකය. 'සිරිවඩ්ඪකො, ධනවඩ්ඪකො' යනාදී වචනාර්ථ නොබලා පැවති නාම අධිච්ච සමුත්පන්නය. මෙහි භගවා යන නම නේමිත්තිකයකි. එය මහාමායාව විසින් හෝ සුදොවුන් මහරජු විසින් හෝ අසූදාහක් නෑයන් විසින් හෝ නොතබන ලද්දකි. ශක්‍ර සන්තුසිතාදී දේවතා විශේෂයන් විසිනුදු නොතබන ලද්දකි. එය දේශනා පාළියෙහි මෙසේ දැක්වේ. 'භගවාති නෙතං නාම මාතරා කතං -පෙ- පටිලාභා සච්ඡිකාපඤ්ඤත්ති යදිදං භගවා' යනුවෙනි.

භාග්‍යවා භගවා යුත්තො භගෙහි ච විභත්ත වා
භත්තවා වන්ත ගමනො භවෙසු භගවා තතො

භාග්‍යවා, භගවා, භගෙහි, යුත්තො, විභත්තවා, භත්තවා, භවෙසු වන්ත ගමනො යනු හෙයින් උන්වහන්සේ භගවා නම් වන සේක. භාග්‍ය ඇත්තේනුයි භගවා නම් වේ. බින්දේනුයි භගවා නම් වේ. භග ධර්ම ඇත්තේනුයි භගවා නම් වේ. බෙදූ සේක් නුයි භගවා නම් වේ. භජනය

කළේනුයි භගවා නම් වේ. භවත්‍රයෙහි තණ්හාව වමාරා ඇති බැවින් භගවා නම් වේ.

එහි වණ්ණාගමෝ වණ්ණ විපරියයොච
දෙචාපරෙ වණ්ණවිකාර නාසා
ධාතූනමත්‍ථාතිසයෙන යොගෝ
තදුච්චතෙ පඤ්ච විධං නිරුත්තං

වර්ණාගමය, වර්ණ විපර්යාසය, ද්විත්වය, වර්ණ විකාර බව හෙවත් වර්ණ නැසීම, ධාතූන් ගේ අර්ථය විශේෂයෙන් යෙදීම යන පස්විදිය නිරුක්ති ක්‍රමයැයි දැක්විණි.

මෙසේ පැවසූ නිරුක්ති ලක්ෂණ ගෙන පද සිද්ධිය දතයුතුයි. එහි 'නකඛතතරාජාරිව තාරකානං' යන මෙහි ර කාරාගමය මෙන් නැති අක්ෂරයක පැමිණීම වර්ණාගමය නම් වේ. 'හිංසනා හිංසෝ' යැයි කිවයුත්තෙහි 'සීහෝ'යි මෙන් විද්‍යමාන අක්ෂරයන්ගේ උඩ යට මාරු කිරීම් වශයෙන් පෙරළීම (වණ පෙරළිය) වර්ණ විපර්යාස යැයි 'නවචෙඡදකෙ දානෙ දීයති' යන මෙහි අකාරයට එකාරය පැමිණීම මෙන් (ආදේශය) අකුරකට තවත් අකුරක් පැමිණීම වර්ණවිකාර නම් වේ. 'ජීවනසස මුතෝ ජීවනමුතෝ' යයි කිවයුතු තැන්හි 'ජීමුතෝ' යයි වකාර නකාරයන්ගේ හැසිරීමෙන් විද්‍යමාන අක්ෂරයන්ගේ විනාශය වර්ණ විනාශය නම් වේ. 'එරුසාහි වාචාහි පකුබ්බමානෝ ආසජ්ජ මං තවං වදසි කුමාරා' යන මෙහි පකුබ්බමානෝ යන පදයට අනභිභවමාන යැයි අර්ථ ප්‍රතිපාදනය කරන්නාක් මෙන්, ඒ ඒ තැන සුදුසු පරිදි විශේෂාර්ථ යෝගය 'ධාතූන්ගේ විශේෂාර්ථ යෝගය' නම් වේ.

මෙසේ නිරුක්ති ලක්ෂණය ගෙන හෝ ශබ්ද ශාස්ත්‍ර නයින් හෝ 'පෘෂොදරාදීනි යථොපදිෂ්ටම්' යන පාණිනී සූත්‍රයෙන් කියූ පරිදි, පෘෂත්+උදර දෙක ව්‍යාකරණ නයින් පෘෂොදර වන්නාක් මෙන් යම්හෙයකින් ලෞකික ලෝකෝත්තර සැප නිපදවන දාන ශීලාදී පාරමිතා බවට පත් කුසල් නම් භාග්‍ය මොහුට ඇත්තේනුයි එනිසා භාග්‍යවා යයි කිවයුතු තන්හි නිරුක්ති ශබ්ද ශාස්ත්‍ර න්‍යායෙන් භගවා යැයි කියනු ලැබේයයි දතයුතුය.

ලෝභ, දෝස, මෝහ, විපරීත මනසිකාර, අහිරික, අනොත්තප්ප, ක්‍රෝධ, උපනාහ, මක්ඛ, පලාස, ඊර්ෂ්‍යා, මච්ඡරිය, මායා, සඨ, ථම්භ, සාරම්භ, මාන, අතිමාන, මද, පමාද, තණ්හා, අවිද්‍යා, ත්‍රිවිධ අකුශල මූල, දුශ්චරිත, කෙලෙස් මල, විසම සංඥා විතර්ක, ප්‍රපංච, චතුර්විධ විපර්යාස, ආශ්‍රව, ග්‍රන්ථ, ඔඝ, යෝග, අගති, තණ්හූපාදාන, පංචචෙතො ඛිල, විනිබද්ධ, නීවරණ, අභිනන්දන, ඡවිවාද, මූල, තණ්හා කාය, සප්ත අනුසය, අට වැදැරුම් මිත්‍යා දෘෂ්ටි, නව තණ්හා මූල, දස අකුශල කර්මපථ, දෙසැටක් දෘෂ්ටිගතයන්, අටසීයක් තෘෂ්ණා විචරිත ප්‍රභේද ඇති, සියලු දරථ, පරිඩාහ, කෙළෙස් දස දහසක්, සංක්ෂිප්තව හෝ පංච ක්ලේශ ස්කන්ධයන් අභිසංඛාර මෘත්‍යු දේවපුත්ත මාරයන් බිඳ දැම්මේය. එනිසා මේ පරිශ්‍රයන්, කෙළෙසුන් බිඳ දැමූ බැවින් භග්ගවා යැයි කිවයුත්තෙහි භගවා යැයි කියනු ලැබේ.

මෙය කියනු ලැබේ.

භග්ගරාගො භග්ගදොසො - භග්ගමොහො අනාසවො
භග්ගාඝස්ස පාපකා ධම්මා - භගවා තෙන පවුච්චතී

ඒ ශාස්තෘන් වහන්සේ රාගය බිඳින ලදී. ද්වේෂය බිඳින ලදී. මෝහය බිඳින ලදී. ආශ්‍රව රහිතයහ. සියලු පාප ධර්මයන්ද බිඳ දමන ලදී. එහෙයින් භගවා යැයි කියනු ලැබේ.

භාග්‍ය ඇති බැවින් භගවා යන්නෙන් ශතපුණ්‍යශ්‍රී ලක්ෂණධර වූ උන්වහන්සේගේ රූපකාය සම්පත්තිය දක්වන ලදී. භග්න ක්ලේශ ඇත්තේ භගවා යන්නෙන් ධර්මකාය සම්පත්තිය ද දක්වන ලදී. එසේම භාග්‍ය ඇත්තේ භගවා යන්නෙන් සාමාන්‍ය ලෞකික මහජනයා විසින් බුහුමන් කරනු ලබන බව ද ගිහි පැවිදි දෙපිරිසගේ අභිගමනීයතාවය ද (එළඹිය යුතු බව) එළඹි ගිහි පැවිදි දෙපිරිසගේ කාය චිත්ත දුක් පීඩා දුරුකිරීමෙහි පොහොසත් බව ද ආමිෂ දාන ධර්ම දානාදියෙහි උපකාරී බව ද දක්වන ලදී. ලෞකික ලෝකෝත්තර සැප දීමෙහි සමර්ථ බව ද දක්වන ලදී. ලෝකයෙහි ඓශ්වර්ය, ධර්ම, යස, ශ්‍රී, කාම, ප්‍රයත්න යන ෂට් ධර්මයන්හි 'භග' ශබ්දය පවතියි. උන්වහන්සේට තම සිතෙහි පරම ඊශ්වරත්වය, ලෞකික සම්මත අණිම ලඝිම ආදී ඓශ්වර්ය හෝ සර්වාකාරයෙන් පිරිපුන්ව ඇත. එසේම ලෝකෝත්තර ධර්මය ලෝකත්‍රයෙහි පැතිර ඇත. යශස් නම් විද්‍යමාන වූ ම ගුණය කරණ කොටගෙන ලැබුණු තුන් ලෝ

පතළ ඉතා පිරිසිදු කීර්තියයි. ශ්‍රී නම් රූපකාය දර්ශනයෙහි ව්‍යාපෘත වූවන්ගේ මනනුවන් පිණවීමෙහි සමර්ථ වූ සර්වාකාර පරිපූර්ණ සියලු අංග ප්‍රත්‍යංග ගත් ශෝභාවයි. කාම නම් සිතූ පැතූ ආත්ම හිත හෝ පරහිත හෝ සියල්ල සිදුවන බැවින් එසේ අනිෂ්ට සිද්ධි සංඛ්‍යාත කාමයයි. ප්‍රයත්න නම් සියලු ලෝකයාගේ ගෞරවය ලැබීමට හේතු වූ සම්‍යක් ව්‍යායාම නම් වූ උත්සාහයයි. මෙකී භග ධර්මයන්ගෙන් යුක්ත බැවින් භග දහම් ඇත්තේනුයි තථාගතයන් වහන්සේ භගවා යයි කියනු ලැබේ.

සියලු ධර්මයන් කුශලාදී භේද සහිතව, ස්කන්ධ ආයතන, ධාතු - සත්‍ය - ඉන්ද්‍රිය - පටිච්ච සමුප්පාදාදී භේද වශයෙන් හෝ, කුශලාදී ධර්ම පීඩන - සංඛත - සන්තාප - විපරිණාම අර්ථයෙන් දුක්ඛාර්ය සත්‍යය හෝ, සමුදයාර්ථ සත්‍යය ආයූහන - නිදාන - සංයෝග - පළිබෝධ අර්ථ වශයෙන් ද නිරෝධාර්ය සත්‍යය නිස්සරණ - විවේක - අසංඛත - අමත යන අර්ථ වශයෙන් ද මාර්ග සත්‍යය නීය්‍යාණික - විවේක - අසංඛත - අමත යන අර්ථ වශයෙන් ද මාර්ග සත්‍යය නීය්‍යාණික - හේතු - දස්සන - අධිපතෙය්‍ය යන අර්ථ වශයෙන් ද බෙදූ සේක්නුයි බෙදා, විවෘත කර, විවරණය කර, දෙසන ලදැයි කියන ලද හෙයින් විභත්තවා යැයි කිව යුත්තෙහි භගවා යැයි කියනු ලැබේ.

දිව්‍ය විහරණ, බ්‍රහ්ම විහරණ, ආර්ය විහරණ යන විහරණයන්ද කාය - චිත්ත - උපධි විවේකයන් ද සුඤ්ඤත - අප්පණිහිත - අනිමිත්ත යන ත්‍රිවිධ විමෝක්ෂයන් ද අන්‍ය වූ ලෞකික-ලෝකෝත්තර උත්තර මනුෂ්‍ය ධර්මයන් ද භජනය කළ, සේවනය කළ, බහුල කළ සේක්නුයි භත්තවායි කිවයුතු තැන භගවා යැයි කියනු ලැබේ. භවත්‍රයෙහි චමාළ තෘෂ්ණා ගමන් ඇත්තේ නුයි 'භවෙසු වන්තගමනෝ'යි කිවයුතු තැන 'භව' ශබ්දයෙන් භ යන්නත් 'ගමන' ශබ්දයෙන් 'ග' යන්නත් 'වන්ත' ශබ්දයෙන් 'ව' යන්නත් දීර්ඝ කර රැගෙන භගවා යි කියනු ලැබේ. ලෝකයේ 'මොහනස්‍ස ඛස්‍ස මාලා'යි කිවයුතු තැන 'මෙබලා' වූ සේ භගවා යන්න සෑදී ඇත.

නැවත වෙනත් පර්යායක් දක්වමින් අපිච භගහරාගොති භගවා යනාදිය කියන ලදී. එහි භග්න කළ රාග ඇත්තේනුයි භගහරාගෝ. මෙසේ භගදොසා දියෙහි ද අර්ථ දතයුතුයි. කණ්ටකෝ යනු විනිවිද

යන අරුතින් කෙලෙසුන්ම ය. **භජී** උද්දේස වශයෙන් විභාග කර භජනය කරන ලදී. **විභජී** පටිනිර්දේශ වශයෙන් විවිධාකාරව භජනය කරන ලදී. **පටිභජී** පටිනිර්දේශ වශයෙන් විවිධ ප්‍රකාරයෙන් බෙදන ලදී. උග්ඝටිතඤ්ඤූ පුද්ගලයන්ගේ වශයෙන් **භජී**, විපචිතඤ්ඤූ පුද්ගලයන්ගේ වශයෙන් **විභජී** නෙය්‍ය පුද්ගලයන්ගේ වශයෙන් **පටිභජී**. ධම්මරතනං යනු

චිතනීකතං මහගඝඤ්ච අතුලං දුල්ලභදස්සනං
අනොම සත්ත පරිභොගං රතනනෙතන පවුච්චතී

ගෞරව කළ (බුහුමන් කළ) මහාර්ඝ වූ අසම වූ දුර්ලභ දැකීම් ඇති (අවබෝධයට දුෂ්කර) උසස් සත්ත්වයන් විසින් පරිභෝග කළ බැවින් රත්නයකැයි කියනු ලැබේ.

මෙසේ වර්ණනා කරන ලද ධර්ම රත්නය ත්‍රිවිධාකාරයෙන් බෙදන ලදී. **භවානං අනතකරො** කාමභවාදී නව භවයන්ගේ පරිච්ඡේදය (වෙන් කිරීම), සීමාව, කෙළවර කරන්නා, **භාවිතකායො** වඩන ලද කය, භාවිත කය ඇති. ඉතිරි පද තුනෙහිද එසේය. **භජී** සේවනය කළේය. **අරඤ්ඤ වනපත්‍ථානි** ගමේ හෝ නගරයේ හෝ ඉන්‍ද්‍රඛීලයෙන් හෝ පිටත අරණ්‍යයයි. මනුෂ්‍ය වාසයෙන් තොර වූ වන පෙදෙස. **පනනානි** මිනිස්සු නොසීසාන, නො වපුරන ඉතා දුර වූ වන සෙනසුන්, ඇතැම්හු 'වන පත්‍තානි'යයි කියති. (අභයගිරිකාදීහු) ව්‍යාඝ්‍රාදී දරුණු සත්තු යම් වනයක ඇත්ද ඒ වනය ඔවුහු පාලනය කරති. රකිති. එසේ ඔවුන් විසින් ආරක්ෂා කළ හෙයින් **වනපනතානි** නම් වී යැයි කියති. **සෙනාසන** මෙහි සයන කරයි. හිඳගනියි. අරුතින් සෙනසුන් නම් වේ. අල්ප වූ වචන ශබ්ද ඇති බැවින් **අප්පසද්දානි** වේ. ගම් නගරාදියේ පවතින ඝෝෂාවෙන් මිදුණු හෙයින් **අප්පනිගෙඝසාති** වේ. ඇතුලත හැසිරෙන ජනයාගේ ශරීර පිසගෙන එන වාතය රහිත වූ බැවින් **විජනවාතානි** වේද ඇතුලත වෙසෙන ජනයාගේ වාදවලින් තොරවූ යන අර්ථයෙන් 'විජනවාදානි' පාඨයද යෙදේ. ඇතුලත ජන සංචරණයෙන් තොර වූ අර්ථයෙන් 'විජනවානානි' පාඨයද යෙදේ. මිනිසුන්ගේ රහසිගත කටයුතුවලට සුදුසු හෙයින් **මනුසස රාහසෙය්‍යකානි** වේ. විවේකයට සුදුසු වූ බැවින් **පටිසල්ලාන සාරුප්පනති** වේ. **භාගී වා** බුදුහු චීවරාදී සිවුපසයට හිමිකාරයා වූහ. ප්‍රතිලාභ වශයෙන් අර්ථ රසාදි භාගයන්ට ද ස්වාමි වන බැවින් භාගී නම් වන සේක. **අත්‍ථරසසස**

හේතුඵල සම්පත්ති සංඛ්‍යාත අර්ථ රසයට. **ධම්ම රසසස** හේතු සම්පත්ති සංඛ්‍යාත ධර්ම රසයට මෙය කියන ලදී.

'හේතුඵල ධර්මයෙහි ඤාණය අර්ථ ප්‍රතිසම්භිදාවයි. හේතුවෙහි ඤාණය ධර්ම ප්‍රතිසම්භිදාවයි. **විමුත්තිරසසස්‍ය** ඵල සම්පත්ති සංඛ්‍යාත විමුක්ති රසයට, මෙය කියන ලදී. 'කෘත්‍ය සම්පත්ති අර්ථයෙන් 'රස' නම් වේ. **චතුනනං ඣානානං** ප්‍රථම ධ්‍යානාදී සිවු ධ්‍යානයන්ගේ. **චතුනනං අපපමඤ්ඤානං** මෛත්‍රී ආදී අප්‍රමාණව පතුරන, සිවු බඹ විහරණයන්ගේ **චතුනනං අරූප සමාපතතීනං** ආකාසානඤ්චායතනාදී සතර අරූප ධ්‍යානයන්ගේ අට්ඨනනං **විමොකඛානං** 'රූපී රූපානි පසසති' ආදී නයින් කියන ලද, ආරම්මණයන්ගෙන් මිදුණු අෂ්ට විමෝක්ෂයන්ගේ. **අභිභායතනානං** මෙහි අභිභවිත ආයතන මොවුන්ට ධ්‍යාන වන්නේනුයි අභිභායතන ඣාන නම් වේ. **ආයතනානි** යනු නොසිටින අර්ථයෙන් ආයතන සංඛ්‍යාත කසිණාරම්මණ, ඤාණුත්තරික පුද්ගලයා විෂද ඤාණ ඇතිව, 'කිම මේ අරමුණෙහි සමවැදිය යුත්තක් ඇද්ද, මා කෙරෙහි සිත එකඟ කරගැනීමෙහි අපහසුවක් නැතැයි ඒ කසිණාදී අරමුණු මැඩ සමවතට සමවදියි. එහිදී නිමිත්ත ඉපදීමත් සමගම අර්පණා උපදී යන අර්ථයයි. මෙසේ උපදවන ලද ධ්‍යානයන් 'අභිභායතන' යැයි කියනු ලැබෙත්. ඒ අටවැදෑරුම් අභිභායතනයන්හි **නවනනං අනුපුබබ විහාර සමාපතතීනං** මුලින් මුලින් අනුපිළිවෙළින් සමවැදිය යුතු හෙයින් අනුපූර්ව විහාර සමාපත්තීන්ට, අනුපිළිවෙළින් සමවැදිය යුතු යන අර්ථයයි. ඒ නව වැදෑරුම් අනුපූර්ව විහාර සමාපත්තීන්ට. **දසනනං සඤ්ඤාභාවනානං** ගිරිමානන්ද සූත්‍රයේ විස්තර වූ අනිත්‍ය සංඥාදී දස වැදෑරුම් සංඥා භාවනාවන්ගේ. **දසනනං කසිණ සමාපතතීනං** සකලාර්ථයෙන් කසිණ සංඛ්‍යාත පඨවි කසිණ ධ්‍යානාදී දසවැදෑරුම් ධ්‍යානයන්ගේ. **ආනාපානසති සමාපතතියා** ආනාපාන සතියෙන් යුක්ත සමාධියට **අසුභසමාපතතියා** අසුභ ධ්‍යාන සමාපත්තියෙන්, **දසනනං තථාගත බලානං** තථාගතයන්ගේ දසබලයට **චතුනනං වෙසාරජජානං** විශාරද භාවයන්ට, චතුර් වෛශාරද්‍යයන්ට **චතුනනං පටිසමභිදානං** සිවුපිළිසිඹියාපත් ඤාණයන්ට **ඡනනං අභිඤ්ඤාණානං** ඍද්ධිවිධාදී ෂට් අභිඥාවන්ට **ඡනනං බුදධධමමානං** සියලු කාය කර්ම ඤාණය අනුව පරිවර්තනය වේ ආදී නයින් මුලින් පැමිණි ෂට් බුද්ධ ධර්මයන්ට, එහි චීවරාදී ප්‍රත්‍ය භාග්‍ය සම්පත් වශයෙන් කියන ලදී. අර්ථරස ත්‍රිකය ප්‍රතිවේධ වශයෙන් කියන ලදී. අධිසීල ත්‍රිකය

ප්‍රතිපත්ති වශයෙන් ද ධ්‍යාන ත්‍රිකය රූපාරූප ධ්‍යාන වශයෙන් ද විමෝක්ෂ ත්‍රිකය සමාපත්ති වශයෙන් ද ප්‍රඥා චතුෂ්කය උපචාර අර්පණා වශයෙන් ද සතිපට්ඨානාදිය සත්තිස් බෝධිපාක්ෂික ධර්ම වශයෙන් ද තථාගත බලාදිය ආවේණික ධර්ම වශයෙන් ද කියන ලදැයි දතයුතුයි.

ඉන් අනතුරුව **'භගවාති නෙතං නාමං'** ආදිය අර්ථයට අනුව ගිය මෙය ප්‍රඥප්තිය යැයි දැන්වීමට කියන ලදී. එහි **සමණා** යනු පැවිදි බවට පත්වූවෝ. **බ්‍රාහමණා** බ්‍රාහ්මණයෝ සංසිඳවූ පවු ඇත්තෝ හෝ බහා තැබූ පවු ඇත්තෝ. **දෙවතා** ශක්‍රාදී දෙවියෝ හෝ බ්‍රහ්මයෝ **විමොකඛං** යනු විමෝක්ෂ නම් අර්හත් මාර්ග යයි. විමොක්ෂ අන්තයේ වූ අර්හත් ඵලය වේ. ඒ විමෝක්ෂාන්තයේ වීම 'විමොක්ඛන්තික' නම් වේ. සර්වඥත්වය වනාහි අර්හත් මාර්ගයෙන් සිද්ධ වේ. අර්හත් ඵලාධිගමයේදී සිද්ධ වේ. එනිසා සර්වඥත්වය විමෝක්ෂාන්තයේ වීම වේ. ඒ නිමිති කරගැනීමද විමෝක්ෂාන්තයේ වීම නම් වේ. එනිසා 'භාග්‍යවත් බුදුවරුන්ට මෙය විමෝක්ෂාන්තික යයි'යැයි කියන ලදී. **බොධියා මූලෙ සහ සබ්බඤ්ඤුත ඤාණසස පටිලාභා** මහාබෝධි වෘක්ෂ මූලයෙහි පෙර කී ක්ෂණයෙහි සර්වඥ ඥාණ ප්‍රතිලාභයත් සමග **සච්ඡිකා පඤ්ඤත්ති** අර්හත්ඵල සාක්ෂාත් කරණයෙන් හෝ සියලු ධර්ම සාක්ෂාත් කරණයෙන් උපන් ප්‍රඥප්තිය **යදිදං භගවා** 'යම් මේ භගවත්' යන ප්‍රඥප්තියක් වී නම් **දවීහි කාරණෙහි** දෙ කරුණෙකින්, **පරියත්ති සාසනං** ත්‍රිපිටක බුද්ධවචනය. **පටිපත්ති** මෙය පිළිපදියිනුයි පටිපත්ති නම් වේ.

යං තසස පරියා පුතං ඒ පුද්ගලයා විසින් යමක් පුහුණු කරන ලද ද සජ්ඣායනා කරන ලද ද, කරණාර්ථයෙහි ඡට්ඨී විභක්ති වචනයකි. පරියාපුත්තං යන පාඨය ද යෙදේ. **සුත්තං** යනු උභතෝ විභංග, නිද්දේස, ඛන්ධක, පරිවාර, සුත්තනිපාතයෙහි මංගල සූත්‍ර, රතන සූත්‍ර, තුවටක සූත්‍රද අන්‍ය සූත්‍ර නම ඇති තථාගත දේශනාවන් ද 'සූත්‍රයැ'යි දතයුතුයි. **ගෙය්‍යං** යනු සියලු ම ගාථා සහිත සූත්‍ර ගෙය්‍ය යැයි දතයුතුයි. විශේෂයෙන් සංයුත්ත නිකායේ සියලු සගාථක වර්ගයම මීට අයත් ය. **වෙය්‍යාකරණං** යනු සම්පූර්ණ අභිධර්ම පිටකය ද ගාථා රහිත සූත්‍රද අනික් අංග අටට අයත් නොවූ යම් බුද්ධ වචනයක් වේනම් එයද වෙය්‍යාකරණ යැයි දතයුතුයි. **ගාථා** යනු ධම්මපද, ථෙර ගාථා, ථෙරිගාථා සූත්‍ර නිපාතයේ සූත්‍ර නාමය නැති ශුද්ධික ගාථා ද ගාථායයි දතයුතුය. **උදානං** යනු

සොම්නස් සහිත ඤාණයෙන් දේශිත ගාථාවලින් යුතු අසූදෙකක් වූ සූත්‍ර උදාන යැයි දතයුතුයි. **ඉතිවුත්තකං** යනු 'භාග්‍යවතුන් වහන්සේ විසින් මෙසේ දේශනා කරන ලදී'යයි ආදී වශයෙන් පැවති එකසිය දහයක් සූත්‍රාන්ත ඉතිවුත්තක යැයි දතයුතුයි. **ජාතකං** යනු අපණ්ණක ජාතක ආදී පන්සිය පනහක් ජාතක කථා 'ජාතක' යැයි දතයුතුයි. **අබ්භූත ධම්මං** යනු මහණෙනි, ආනන්ද හිමියන් පිළිබඳ මේ ආශ්චර්යාද්භූත ධර්ම සතරකි' ආදී වශයෙන් සියලු අසිරිමත් අද්භූත ධර්ම ඇතුලත් සූත්‍රාන්ත අබ්භූත ධර්මයැයි දතයුතුයි. **වෙදල්ලං** යනු චූල වේදල්ල, මහා වේදල්ල, සම්මා දිට්ඨි, සක්ක පඤ්හ, සංඛාරභාජනීය, මහා පුණ්ණම සූත්‍රාදී සියලුම ඥානයද සතුටද ලද පරිදි විචාළ සූත්‍රාන්ත වේදල්ල යැයි දතයුතුයි.

ඉදං පරියත්ති සාසනං මෙසේ කියන ලද ආකාර ඇති ත්‍රිපිටක බුද්ධ වචනය පුහුණු කළ යුතුය යන අරුතින් 'පරියත්ති' නමින් ද අනුශාසනා කළ යුතුය යන අරුතින් 'සාසන' නමින් ද දක්වා පරියත්ති සාසන වේ. **තම්පි මුස්සතී** ඒ පර්‍යාප්ති ශාසනයද නැසෙයි. **පමුස්සති** මුලදී ම නැසේ. **පරිබාහිරෝ හොති** ඉවත හැරවූ මුහුණ ඇත්තෙක් වේ. **කතමං පටිපත්තිසාසනං** ලෝකෝත්තර ධර්මයෙන් පූර්වභාගය ඒ අර්ථය සඳහා පිළිපදිනු ලබන්නේනුයි ප්‍රතිපත්ති නම් වේ. වෙනේය ජනයාට අනුශාසනා කරයි. පාලනය කරයිනුයි 'සාසන' නම් වේ. **සම්මා පටිපදා** මුලින් පැවසූ ක්‍රමයෙන්ම ය.

පාණම්පි හනති ජීවිතින්ද්‍රිය ද නසයි. **අදිනනම්පි ආදියති** අනුන් අයත් වස්තුව ද ගනියි. **සන්ධිම්පි ඡින්දති** ගෘහසන්ධි ද (ගෙවල්) බිඳියි. **තිලෙලා පම්පි පාරති** ගම් පැහැරගෙන, මහත් හානි පමුණුවයි. **එකාගාරිකම්පි කරොති** පනහක් පමණද හැටක් පමණද වටකොට ජීවග්‍රහයෙන් ගෙන ධනය ගෙන්වා ගනියි. **පරිපන්ථෙපි තිට්ඨති** මංපැහැරීම ද කරයි. **පරදාරම්පි ගච්ඡති** අන් අඹුවන් කෙරෙහි ලිංගික හැසිරීමට පැමිණේ. **මුසාපි හනති** අර්ථය නසන බොරු කියයි. **අනරිය ධම්මෝ** අනාර්ය බව.

එකෝ පුබ්බෙ චරිඤාන පැවිදි සංඛ්‍යාතව හෝ ගණයාගෙන් වෙන්ව හුදකලාව වසන අර්ථයෙන් හෝ පෙර ලොව වැස **යානං භන්තං ච තං ලොකෙ හීනමාහු පුථුජ්ජනං** ඒ නොහික්මුණු පුද්ගලයා, විෂම වූ පාරක යන ඇත්, අස්, ආදී යානයක්, එහි නැගි පුද්ගලයා ද නසා යානය ද

නැසෙන්නාක් මෙන්. **පපාතෙපි පපතී** මෙසේ කාය දුශ්චරිතාදී විෂමයන්ට නැඟීමෙන් නිරයාදියෙහි වැටේ. දෑ ගොත් කුල ද නසා තම යහපත ද බිඳ වැටේ. යානය බිඳී යන්නාක් මෙන් හීන බාල පුහුදුන් පුද්ගලයා ද නැසේ.

පබ්බජ්ජා සංඛාතෙන වා පැවිදි කොට්ඨාසයෙන් හෝ. **පබ්බජිතො සමණො නො** ගණයාට ආරෝපනය කිරීමෙන් හෝ. **ගණවසසගගතෙන වා** ගණයා (සමූහයා) සමග එක්වීම හැරදමා හැසිරෙන අර්ථයෙන් හෝ. **එකො පතිකකමති** හුදකලාව ගමෙන් පිටත්ව යයි. **යො නිසෙවතී** නිර්දේසයේ උදෙසන පදයයි.

අපරෙන සමයෙන ඊට පසු මෑත කාලයේ දී බුදධං සර්වඥ බුදුරදුන්. ධමමං ස්වාක්ඛාතාදී ගුණ පිරි ධර්මය. **සංඝං** සුපටිපන්නාදී ගුණ යුතු සංඝරත්නය. **සිකඛං** අධිසීලාදී හික්මිය යුතු ශික්ෂා. **පචචකඛාය** බුද්ධාදී තෙරුවන් ප්‍රතික්ෂේප කර. **හීනාය** හීන බවට, ගිහි බවට. **ආවතතිතවා** නැවතී, පෙරළී. **සෙවතී** එකවරක් සේවනය කරයි. **නිසෙවතී** අනේකප්‍රකාරයෙන් සේවනය කරයි. **සංසෙවති** ඇලීගෙන සේවනය කරයි. **පටිසෙවති** නැවත නැවත සේවනය කරයි. **භනතං** නො දැමුණු. අදනතං දමනයට, හික්මීමට නො පැමිණි **අකාරිනං** මනාව හික්මුණු ක්‍රියා නොකරන. **අවිනීතං** අවිනීත වූ, ආචාර සම්පත්තියෙන් අශික්ෂිත. **උපපථං ගණහති** කියූ ආකාර ඇති, අදාන්තයන් යෙදූ පාලනය කළ නොහැකි රථයක් විෂම මාර්ගයට පැමිණෙයි. **විසමං බානුමපි පාසානමපි අභිරුහති** විෂමව සිටි, කිහිරි කණු ආදියට ද එසේම පර්වත පාෂාණාදියට ද නැගේ. **යානමපි ආරොහණකමපි භඤ්ඤති** රියදුරා ආදී රථයේ නැගුණු පුද්ගලයන්ගේ ද අත් පා බිඳෙයි. කැඩෙයි. **පපාතෙපි පපති** හුදකලාව සිඳින ලද බෑවුම් ප්‍රපාතයෙහි හෝ වැටෙයි.

සො විඛභනතකො ඒ සිවුර හළ පුද්ගලයා **භනතයාන පටිභාගො** නො දැමුණු රථයක් වැනි වූයේ **උපපථං ගණහති** කුශල කර්ම මාර්ගයෙන් වැලකී අපාගාමී මගෙහි, වැරදි මගට එළඹේ. **විසමං කායකමමං අභිරුහති** සම බවින් තොර වූ කාය දුශ්චරිතාදී, විෂම කාය කර්මයන්ට පැමිණේ. සෙසු පදයන්හි ද මේ ක්‍රමයමැයි. **නිරයෙ අතතානං භඤ්ඤති** නිරාශ්වාද (සතුටක් නැති) සංඛ්‍යාත නිරයෙහි ඉපිද තම ශරීරය සුණු විසුණු වූවක් බවට පත්කරයි. **මනුසසලොකෙ අතතානං භඤ්ඤති** විවිධාකාර ක්‍රියා කිරීම් වශයෙන් බිඳී යයි. **දෙව ලොකෙ අතතානං භඤ්ඤති** ප්‍රිය විප්‍රයෝගාදී දුක්

වශයෙන්. **ජාතිපපාතමපි පපතී** ජාති ප්‍රපාතයෙහි ද වැටෙයි. ජරා ප්‍රපාතාදියෙහි ද මේ ක්‍රමයමයි. **මනුසසලොකෙ** මෙහි අදහස් කරන ලද ලෝකයම දක්වයි. **පුථුජජනා** නිද්දේසයේ උදෙසන පදයයි. එහි **පුථුජජනා** යනු

පුථූනං ජනනාදීහි කාරණෙහි පුථුජජතො
පුථුජජනනෙනා ගධතතා පුථුවායං ජනො

බොහෝ වූ කෙලෙස් ඉපිදවීමාදී කාරණයෙන් පෘථජ්ජන නම් වේ. බොහෝ වූ අනාර්ය ජනයන් කෙරෙහි ඇතුලත් බැවින් ද යථෝක්ත මේ ජන තෙමේ ආර්යයන් කෙරෙන් වෙන්වූයේනුයි ද පෘථජ්ජන නම් වේ.

ඒ පුහුදුන් පුද්ගලයා බොහෝ වූ නානාප්‍රකාර කෙලෙස් උපදවන හේතුවෙන් පුථුජ්ජන නම් වේ. එය විභාග වශයෙන් දක්වනු සඳහා **පුථූ කිලෙසෙ ජනෙනති** යනාදිය කියන ලදී. එහි බොහෝ වූ නානාප්‍රකාර සත්කාය දෘෂ්ටි ආදී කෙලෙස් නොනැසූ බැවින් ඒවා උපදවති. නැතහොත් ඒවා කරණ කොටගෙන උපදින ලදීනුයි පුථුජ්ජන නම් වේ. නොනැසූ බවම 'ජන' ශබ්දයෙන් අදහස් වේ. බොහෝ ශාස්තෘන්ගේ මුහුණ බලන්නෝයි මෙහි බොහෝ නානාවිධ ශාස්තෘ ප්‍රතිඥා මොවුන්ට ඇත්තේනුයි පුථුජ්ජනා වේ යනු වචනාර්ථයයි. බොහෝ වූ සියලු ගතීන්ගෙන් නොවැසුණු බව හෙවත් නොයෙක් භවයන්හි ඉපදිය යුතු හෝ ජනයා මෙහි උපදිත්නුයි පුථුජ්ජන නම් වේ. ගතීහුය. මොවුන්ගේ බොහෝ ජනයෝ වෙත්නුයි පුථුජ්ජන වේ. මේවා කරණ කොටගෙන මෙයින් පසුව උපදිත්නුයි 'ජනා' වේ. අභිසංස්කාරාදියයි. ඒවා මොවුන්ට ඇත්තේනුයි පුථුජ්ජන නම් වේ. අභිසංස්කරණාදී (රැස්කරන) අර්ථයෙහිලා මෙහිදී 'ජන' ශබ්ද දතයුතුයි. **නානා සනතාපෙහි සනතපපනතී** රාගග්ගි ආදී සන්තාපයෝ වෙත්ද ඒවා හෝ ඒ සියලු කෙලෙස් පරිදාහයෝ **පුථු පඤචසු කාමගුණෙසු** මේ ලෝකයෙහි ජනනය වන්නේනුයි 'ජන' නම් වේ. රාගය, ගිජුබව යන මේ ආදී පුහුදුන් පුද්ගලයෝ මෙහි වෙත්නුයි 'පුථුජ්ජනා' නම් වේ. බොහෝ පංචකාමයන්හි ඇලුණා වූ යනුවෙන් රාගාදී අර්ථයෙහි ද 'ජන' ශබ්දය දතයුතුයි. **පළිබුදධා පිළිපන්නෝ.** ආවුතා එතුණාහු. **නිවුතා** නැවැත්තාහු, වැළකුණාහු **ඔවුතාකුජජිතා** යටිකුරු කරන ලද්දාහු. නැතහොත් බොහෝ වූ සංඛ්‍යාත්මකව ප්‍රකාශ කිරීමට අපහසු වූ, ආර්ය ධර්මයට විරුද්ධ වූ, නීච ධර්මය අනුව හැසිරෙන ජනයාගෙන්

යුක්ත ආර්ය ජනයාගෙන් බැහැර වූ හෙයින් 'පුථුජ්ජන' නම් වූ. ඒ මේ පුහුදුන් පුද්ගලයෝ.

දුවෙ පුථුජ්ජනා වුත්තා - බුද්ධෙනාදිච්චබන්ධුනා
අන්ධෝ පුථුජ්ජනෝ එකෝ - කල්‍යාණෙකෝ පුථුජ්ජනෝ

සූර්ය බන්ධු වූ බුදුරදුන් විසින් පුහුදුන් පුද්ගලයෝ දෙදෙනෙක් පෙන්වා දෙන ලදහ. එක් අයෙක් අන්ධ පුථුජ්ජන නම් වේ. දෙවැන්නා කල්‍යාණ පුථුජ්ජන නම් වේ. මෙහිදී අන්ධ පුථුජ්ජන පුද්ගලයාම අදහස් වූ බව දතයුතුයි.

යසෝ කිත්ති ච ලාභසත්කාර ප්‍රශංසාදියයි. පුබ්බ පෙර පැවිදිව සිටියදී **භායතෙවාපි තසස සා** ඒ සිවුරු හළ පුද්ගලයා සිටියදීම පෙර පැවති යසස කීර්තිය පිරිහී යයි. **එතමපි දිසවා** මෙසේ පෙර කිත් යසස් ලැබීමද පසුව එය පිරිහීමද දැක. **සිකෙඛථ මෙථුනං විපපහාතවෙ** යම් ශික්ෂාවක් නික්මෙන්නේද, කවර කරුණක් සඳහාද මෛථුනය දුරුකිරීම සඳහා, මෛථුනය ප්‍රහාණය සඳහා යයි කියන ලද්දේ වෙයි. **කිත්තිවණ්ණහතෝ** දැරූ කීර්ති ශබ්දය හා ගුණ ඇතිව, කීර්ති ශබ්දය මෙන්ම ගුණ සම්පත්තිය ද දරමින් හැසිරෙනුයේ යන අර්ථයයි. විචිත්‍ර වූ නානා ක්‍රමයෙන් පවසන කථනයක් මොහුට ඇත්තේනුයි **චිත්තකථී කල්‍යාණ පටිභානෝ** සුන්දර ප්‍රඥා ඇති, **භායති** නිද්දේසයේ උදෙසන පදය. **පරිභායති** හාත්පසින් පිරිහේ. **පරිධංසති** ගිලිහෙයි. **පරිපටති** හාත්පසින් පහ වේ. **අනන්තරධායති** නොපෙනීමට යයි. **විපපලුජ්ජති** වැනසේ. **බඳ්ධකෝ සීලකඛන්ධෝ** ථුල්ලච්චයාදී කුඩා සිකපද. **මහන්තෝ සීලකඛන්ධෝ** පාරාජිකා සංඝාදිසේසාදිය. **මෙථුන ධම්මසස පහාණාය** තදංගාදී ප්‍රහාණයෙන් දුරුකරනු සඳහා. **වූපසමාය** කෙළෙස් මලයන්ගේ සන්සිඳීමට. **පටිනිසසගගාය** ඇතුලට වැදීම, මෙවුන්දම දුරලීම සඳහා. **පටිපසසද්ධියා** පටිප්පස්සද්ධි නම් ඵලය සඳහා.

යමෙක් මෛථුන ධර්මය අත්නොහරියි ද ඔහුගේ ගති ස්වභාව දැක්වීමට **සංකපපෙහි** -පෙ- **තථාවිධෝ** යි කියන ලදී. එහි **පරෙතෝ** යුක්ත වූ. **පරෙසං නිගෙඝාසං** උපාධ්‍යායාදීන්ට නින්දා වචන කියයි. **මංකු හොති** දොම්නස් ඇතිවේ. **කාම සංකපපෙන** කාම ප්‍රතිසංයුක්ත විතර්කයෙන්, මතු පදයන්හි ද මේ ක්‍රමයමයි. **ඵුට්ඨෝ** විතර්කයන් විසින් ස්පර්ශ කරන

ලද **පරෙතො නොපිරිහුණු සමොහිතො** මනාව බැසගත්, ඇතුලට පිවිසි. **කපණො විය දුප්පත් දිළිඳු** පුද්ගලයකු මෙන් **මඤ්ඤා විය**. අඥානයෙක් මෙන් මොමූහො **විය** මුලා වූවෙක් මෙන් **ඣායතී** සිතයි. **පඣායති** බොහෝකොට සිතයි. **නිඣායතී** අනේක ප්‍රකාරයෙන් සිතයි. **අපඣායති** ඉන් පහවී සිතයි. **උලූකො බකමූණා රුකඛසාඛාය** ගස මතුයෙහි වූ අත්තක හෝ බෙණයක. **මූසිකං මගයමානො** මීයෙකු සොයන්නා වූ, 'මගඅයමානො' යනුවෙන් ද ශබ්ද කරති. **කොඤ්චා සිවලා විලාරො** බළලා. **සන්ධිසමල සංකටීරෙ** ගෙවල් දෙකක් අතර ද දිය දමන තැන, මඩ වගුරුවල, කසළ දමන තැන ද පොළව උස් තැන ද. **වහචඡිනෙනා** කොඳුඇට සිඳුණු. ඉන්පසුව එන ගාථාවන් ප්‍රකට වූ සම්බන්ධය ඇත්තේමය.

එහි **සඨානි** යනු කාය දුශ්චරිතාදිය, ඒවා වනාහි තමාද අනුන්ද සිදින, වනසන අර්ථයෙන් ආයුධයයි කියති. ඒ දුශ්චරිතාදියෙහි ද මේ මුසා කීම මුලසිටම සැතක් මෙන් හානි කරයි. (බොරුවෙන් වැසී පවි කරයි.) **ඉමිනා කාරණෙ නාහං විබහනෙතා** යනු කරුණු දක්වන්නේ, එනිසා කියන ලදී. **එසඛවාසස මහාගෙධො මොසවජ්ජං පගාහතී** එහි **එසඛවාසස** ඒ ඔහුගේ **මහාගෙධො** මහා බන්ධනය. කෙසේනම් එය **මොසවජ්ජං පගාහතී** ඒ ඔහුගේ මුසාවාදයට බැස ගැනීම මහා බන්ධනයකැයි දතයුතුයි. **තීණි සඨානි** ශස්ත්‍ර තුන, කාය දුශ්චරිතය කාය ශස්ත්‍රයයි. **වචී සඨා** දියෙහි ද ඒ ක්‍රමයමැයි. එය විභාග වශයෙන් දැක්වීමට **තිවිධං කාය දුවචරිතං කායසඨං** යි කියන ලදී. **සමපජාන මුසාභාසතී** යනු දැන දැනම හිස්, බොරු වදන් කියයි. **අනභිරතො අහං භනෙත අහොසිං පබබජ්ජාය** 'මම සසුන්පැවිද්දෙහි ඇලීම, ආශාව දුරු වූවෙක් වීමි'යි කියයි. **මාතා මෙ පොසෙතබබා** මවිසින් මව පෝෂණය කළයුතුයි. **තෙනමහි විබහනෙතා ති භණති** එනිසා මම සිවුරු හැර, සසුන ප්‍රතික්ෂේප කර ආවෙමියි කියයි. **පිතා මයා පොසෙතබෙබා** යනාදියෙහි ද මේ ක්‍රමයමයි.

එසො තසස මහාගෙධො ඒ පුද්ගලයාට මෙය මහා බන්ධනයකි. මහාවනං යනු මහා වනය. ගහනං ඉක්මවීම අපහසු වනලැහැබකි. කනතාරො චොර කාන්තාරයක් හා සමානය. **විසමො** කටුකොහොල් ආදියෙන් විෂමය. **කුටිලො** බිලීකටුවක් වැනිය. **පංකො** මඩ වලක් සමානය. **පලිපො** මඩ වගුරක් සමානය. **පළිබොධො** මහා දුර්ගයකි. මහාබන්ධනං මුදාගැනීම අපහසු විශාල බන්ධනයකි. **යදිදං සමපජාන මුසාවාදො** ඒ මේ දැන දැන බොරු කීම, **සභගගතො වා සභාවෙහි සිටියේ** හෝ.

පරිසගඟ තො වා ගම් පිරිසෙහි සිටියේ හෝ ඤාතීමජ්ඣ ගතො වා නෑයන් මැද සිටියේ හෝ **පූගමජ්ඣගතොවා** සේනාව මැද සිටියේ හෝ **රාජකුල මජ්ඣගතො වා** රජපවුලේ මැද මහා විනිශ්චයෙහි සිටියේ හෝ **අභිනීතො** ප්‍රශ්න කිරීමට ගෙනෙන ලදුයේ **සක්ඛිපුට්ඨො සාක්ඛිකර** විචාරන ලදුයේ **එහමෙඟා පුරිස** මෙය ආමන්ත්‍රණයයි. **අත්තහෙතු වා පරහෙතුවා** තමාගේ හෝ අනුන්ගේ හෝ අත්පා නැසීම් නිසා හෝ ධනලාභ නිසා හෝ **ආමිසකිඤ්චික්ඛහෙතු වා** යන මෙහි **ආමිසං** යනු ලාභය, ලැබීම් අදහස් කරන ලදී. **කිඤ්චිකඛං** යම්කිසි අල්ප මාත්‍ර වූවක්. යටත් පිරිසෙන් තිත්වටුවකු, ගිතෙල් පිඬක්, වෙඩරු පිඬක් යනාදී අල්පමාත්‍ර ලාභයක් නිසාවෙන් **සම්පජාන මුසා භාසතී** දැන දැනම බොරු කියයි.

නැවත වෙනත් පර්යායක් දක්වනු සඳහා **අපිච තීහාකාරෙහි මුසාවාදො හොති පුබ්බෙවසස හොතී ති** යනාදි කියන ලදී. එහි **නීහාකාරෙහි** යනු සම්පජාන මුසාවාදයට අංග වූ තුන් කාරණයෙන් **පුබ්බෙවසස හොතී** ඉතා මුලදීම ඔහුට මේ සිත ඇතිවේ. **මුසා භණිසසං** 'බොරුවක් කියන්නෙමි' යනුයි. **භණනතසස හොති** දැන දැන බොරු කියන්නාට මේ සිත වේ. **භණිතසස හොති** දැන දැන බොරු කීවහුට මේ සිත වේ. යමක් කිවයුතුද එය කියන ලද කල්හි මේ සිත වේ යන අර්ථයයි. නැතහොත් **භණිතසස** කියා නිමවූ වචන ඇත්තාට මේ සිත වේ. මෙසේ ඔහු බොරුව කීමට පෙරද දනියි. බොරුව කියන විටද දනියි. පසුවද දනියි. 'මවිසින් බොරු කියන ලදී' යනුයි. ඔහු මෙසේ කියනුයේ මුසාවාද කර්මයෙන් බැඳෙයි යැයි මෙහිදී මේ අර්ථය දක්වන ලදී.

මෙසේ අර්ථය දැක්වූවත් මෙහි ඇති විශේෂය නම්, විමසන ලදුයේ මම බොරු කියන්නෙමි යන පූර්වභාගය ඇත. මවිසින් බොරු කියන ලදැයි එන පසුභාගය නැත. කියූ පමණින් ම කිසිවකුට සිහි නැතිවේ. මතක නැති වේ නම් කිම ඔහුට මුසාවාදය වේද? නොවේද? එය මෙසේ අට්ඨකථාවන්හි විසඳන ලදී. පූර්වභාගයෙහි බොරු කියන්නෙමියි'ද බොරු කියමින් 'දැන් බොරු කියමි'යි ද දැන සිටි තැනැත්තාට පසු භාගයෙහි මවිසින් බොරුවක් කියන ලදැ'යි දැන නොගැනීමට නොහැකිය. එසේ දැන නොගනීද එහෙත් මුසුවාදය වේමය. මුලින් දැක්වූ අංග දෙක ප්‍රමාණික වේ. යමෙකුට මුලදී 'බොරු කියන්නෙමි' යන සිතුවිල්ලක් නැත්ද කියමින් 'දැන් මම මේ බොරු කියමි'යි දනියි ද කීකල්හිද මවිසින් බොරු කියන ලදැ'යි දනීද ඔහුට ද මුසාවාදය ඉදිරිපත් නොකළ යුතුයි.

(චෝදනා නොකළ යුතුයි) පූර්වභාගයම ප්‍රමාණික වන හෙයිනි. එය මුසාවාදයක් නොවන කල්හි එම ප්‍රකාශය ක්‍රීඩාවට කියූවක් හෝ ශබ්ද ප්‍රවාහයක් පමණක් වේ. මෙහිදී ද තඤ්ඤාණතාවය ද ඤාණසමෝධානයද වෙන්කර දතයුතුයි. 'තඤ්ඤාණතාව වෙන්කර දතයුතුය' යනු යම් සිතකින් බොරු කියන්නෙමි'යි දන්නේ ද ඒ සිතින් ම 'බොරු කියමි'යි ද මවිසින් බොරු කීවෙමි'යි දනියිද, මෙසේ එක සිතකින්ම තුන් ක්ෂණයෙහි දනියිද මෙය තඤ්ඤාණතාව වෙන්කර දැනීමයි. ඒ සිතින් ම, ඒ සිත පිළිබඳව දැනගත නොහැක. කඩුවකින් එම කඩුවම සිඳීමට නොහැක්කාක් මෙනි. මුලින් මුලින් ඇතිවූ සිත් පසුව පසුව ඇතිවන සිත් සඳහා උත්පත්ති ප්‍රත්‍යය වී නිරුද්ධ වේ. එනිසා මෙය කියන ලදී.

පමාණං පුබ්බභාගොව තසමිං සති න හෙසසතී
සෙසඤ්ඤයනති තඤ්ඤ තමිති වාචා තිවංගිකා

පූර්වභාගී සිතම ප්‍රාමාණික වේ. එය නොපවත්නා කල්හි මුසාවාදය සම්පූර්ණ නොවේ. සෙසු දෙක ද නැතිකල්හි මුසාවාදය සම්පූර්ණ නොවේ. එනිසා මුසාවාදයේ අංග තුනම සම්පූර්ණ විය යුතුයැයි කියන ලදී.

එහි 'ඤාණ සමෝධානය හැරදැමිය යුතුය' යනු මේ සිත් තුන ක්ෂණයෙහි උපදින ලදැයි පිළිනොගැනීමයි. මෙහි සිතනම්

අනිරුද්ධමහි පඨමෙ න උප්පජ්ජති පච්ඡිමං
නිරන්තරුප්පජ්ජනතො එකං විය පකාසති

මුල් සිත නිරුද්ධ නොවූ කල්හි පසු සිත (දෙවැනි සිත) නූපදියි. නිරන්තර ඉපදීම, නිරුද්ධ වීම සිදුවන බැවින් එක් සිතක් මෙන් ප්‍රකට වේ.

මින් අනතුරුව ඒ පුද්ගලයා 'නොදන්නා ම දෙයක් දනිමියි' ආදී ක්‍රමයෙන් දැන දැන බොරු කීම කරයි. එනිසා ඔහු මෙය අභූත වූවකැයි යන දෘෂ්ටි ඇත්තේ වේ. ඒ අර්ථයෙහි ම මේ ලබ්ධිය වේ. එසේම මෙය අභූතයැයි මෙසේ ඒ සිතට කැමති වේ. රුචි ද කරයි. මෙසේ මේ සිත අභූතය යන්න ස්වභාවයකි. යම්කලෙක බොරු කියනු කැමති වේද, එකල්හි ඒ දෘෂ්ටිය හෝ දෘෂ්ටිය සමග ඉවසීම හෝ දෘෂ්ටි ක්ෂාන්තිය සමග රුචිය හෝ දෘෂ්ටි ඛන්ති රුචිය සමග සංඥාව හෝ දෘෂ්ටි ඛන්ති

රුචි සංඥාව සමග භාවය හෝ සඟවා තබා, වසා තබා, වහන් කර, අසත්‍ය වූවක් ඇත්ත ලෙස කියයි. එනිසා මේ ක්‍රමෝපායන්හි අංග වශයෙන් විවරණ කර දැක්වීම සඳහා **අපිච චතුභාකාරෙහි** යනාදිය කියන ලදී. මෙහි **විනිධාය දිට්ඨිං** බලවත් ධර්ම සැඟවීම් වශයෙන් කියන ලදී. **විනිධාය සඤ්ඤා** මෙහි දී වනාහි සියලු දුර්වල ධර්ම සඟවා තැබීම් වශයෙන්, සංඥා මාත්‍රයක්වත් නොසඟවා තැබේනම් 'සම්පජාන මුසාවාදය' සිදු නොවේ. **මඤ්ඤාව පරිකිසතී** ප්‍රාණවධාදිය කරමින් ඉන් තදබල දුක් අනුභව කරමින්, භෝග සෙවීම්, ආරක්ෂා කිරීම් ආදියද කරමින් මුළා වූ මූඪයකු මෙන් වෙහෙසට පත්වේ.

තමෙනං රාජානො ගහෙත්වා විවිධා කම්ම කාරණා කාරෙනති රජවරු නොකරති. රජුගේ විධාන ලද රාජපුරුෂයෝ නානාප්‍රකාර වධබන්ධන පමුණුවති. **කසාහිපි තාළෙනති** කශයෙන්, දණ්ඩෙන් තර්ජනය කරති. **වෙත්තෙහි** වේවැලෙන් අඬදණ්ඩකෙහි මුගුරු ප්‍රහාරයෙන්, පහර දීමට රියන් හතරක දණ්ඩක දෙකට කඩා ගත් දඬුවලින් **බිලංගථාලිකං** කැඳහැලියේ බහා දෙන දඬුවම, එය කරන්නාහු ශීර්ෂ කපාලය ගලවා, රත්වූ යකඩ ගුලියක් අඬුවකින් ගෙන ඒ තුලට දමති. එය කරන්නාහු උඩුතොල, දෙකන්සිළු, බෙල්ලේ වල යන ස්ථානවලින් සම කා, සියලු කෙස්රොදක් සේ එක් කර ගැටයක් ගසා, දණ්ඩක ඔතා අදිති. එවිට කෙස් සමග සම ගැලවී එයි. ඉන්පසු හිස්කබල තද ගල්වලින් ගටා සෝදමින් හක්ගෙඩි පාට ඇත්තක් කරයි. **රාහුමුඛං** රාහු මුඛ නම් වධයයි. එය කරන්නාහු අඬුවෙන් මුව විවර කර, මුව තුල පහනක් දල්වති. කන්සිළුවෙහි සිට හෝ මුඛය නියනකින් සාරති. ලේ වැගිරී මුව පිරී යයි. **ජොතිමාලිකං** යනු සියලු සිරුර තෙල් පෙඟු කඩමාලුවලින් වෙළා ගිනි අවුලුවන දඬුවමයි. **හත්ථපජ්ජොතිකං** අතෙහි තෙල් පෙඟු කඩමාලුවලින් වෙළා පහනක් මෙන් දල්වති. **එරකවත්තිකං** යනු ඒරකවත්ති නම් දඬුවමයි. එය කරන්නහු බෙල්ලෙන් යට සිට සම වටේට හාරා කපමින් ගොප්ඇටයෙහි හෙළති. ඉක්බිති දඬුවම ලත් පුරුෂයාව යොත්වලින් බැඳ අදිති. ඔහු තමන්ගේ සම වටා පැකිලි පැකිලී ඇදවැටෙයි. **චීරකවාසිකං** යනු චීරකවාසික නම් දඬුවමයි. එය කරන්නහු ඉහතින් කී ලෙසම සම වටේට සාරා කපමින් ඉඟටියේ තබති. ඉඟෙහි පටන් සාරාකපමින් ගොප් ඇටවල තබති. යටි සිරුර මත්තෙහි හණ වැහැරි ඇඳුමක් අඳින ලද්දාක් මෙන් පෙනේ. **එණෙය්‍යකං** යනු එණෙය්‍යක නම් වධයයි. එය සිදු කරන්නහු දෙවැලමිටෙහි ද දෙදණෙහි ද යකඩින් සිදුරු කර, යකඩ හුල්වලින්

අනිති. ඒ දඬුවම් ලැබූ පුරුෂයා එවිට යකඩ හුල් සතරකින් බිම පිහිටා සිටියි. ඉක්බිති යකඩ හුල්වලින් සිටගෙන සිටින්නා වටා ගිනි දල්වති. 'එණෙය්‍යකො ජොති පරිග්ගහො යථා'යි පැමිණි තැන ද මෙයම අදහස් කරන ලදී. ඒ පුරුෂයා වරින් වර යකඩහුල් ඉවත් කර, ඇට කෙළවර සතරින්ම බිම තබති. මෙබඳු වූ දරුණු වධයක් නම් නැත. **බලිසමංසිකං** යනු බලිසමංසික දඬුවමයි. එහිදී මුවතුඩු දෙකක් ඇති බිලී කොකුවලින් ශරීරයට පහර දී සම් මස් නහර උගුලුවා දමති. **කහාපණකං** යනු මුළු සිරුර ම තියුණු වෑවලින් (දැලිපිහිය වැනි කුඩා පිහිවලින්) කෙළවරෙහි පටන් කහවණුවක ප්‍රමාණයට ලියා දමමින් කොටති. **ඛාරාපතච්ඡිකං** යනු ශරීරයේ ඒ ඒ තැනට ආයුධවලින් පහර දී කොසුවලින් ක්ෂාර හෙවත් ලුණු ගල්වති. එවිට සම්මස් නහර වැගිරී දිගට ගලා යයි. ශරීරය ඇටසැකිල්ලක් මෙන් තිබෙයි. **පලිඝ පරිවත්තිකං** එක් පසකින් වැදහොවා, කන් සිදුරෙහි යකඩ හුලක් ඇණ පොළවට ඒකාබද්ධ කරති. ඉක්බිති වධයට ලක් වූ පුරුෂයාගේ පයින් අල්ලාගෙන අදිති.

පලාලපීඨකං යනු දක්ෂ වධකයෝ සිවි මස ඇද, ඇඹරුම් ගල්වලින් ඇට බිඳ, කෙස්වලින් ගෙන ඔසවති. වධයට පත් පුරුෂයා මස් ගොඩක්ම වෙයි. ඉක්බිති ඔහුව කෙස්වලින්ම වෙළා අල්ලා ගනිති. පිදුරු මිටියක්මෙන් කරයළි වෙළති. **සුනඛෙ හිපි**, දින කිහිපයක් කෑම නොදී බඩගින්නෙන් පෙළෙන බල්ලන් ලවා කවති. ඔවුහු මොහොතකින් ම වධයට පත් පුරුෂයාව ඇටසැකිල්ලක් කරති. **එවමපි කිසසති** මෙවැනි වධයටන්ට පැමිණෙයි. **පරිකිසසති** සියලු ආකාරයෙන් ම විනාශයට පැමිණෙයි. **පරිකිලිසසති** තැවීමට, වෙහෙසට පැමිණෙයි.

නැවත අනික් කාරණයක් දක්වමින් **අථ වා කාමතණහාය අභිභූතො** යනාදිය කියන ලදී. එහි **කාමතණහාය** යනු පස්කම් සුවයෙහි ලොල් බවින්, **අභිභූතො** මඬනා ලද **පරියාදින්න චිත්තො** කුසල සිත් ක්ෂය කර, ඉවතලා ගන්නා ලද සිත **හොගෙ පරියෙසනෙතා** ධනය සොයමින් **නාවාය මහා සමුද්දං පක්ඛන්දති** තරණී නම් වූ නැවින් මහත් ලුණු සයුරට පිවිසේ. **සීතසස පුරක්ඛතො** ශීතල පෙරටු කරගෙන **උණ්හසස පුරක්ඛතො** උණුසුම පෙරටු කරගෙන **ඩංසා** ඇටමැස්සෝ, ලබන්නේ. **ඛුප්පිපාසාහි මීයමානො** සාපිපාසා දෙකින් මැරෙනු ලබන්නේ. **ගුම්බ ගච්ඡති** යන්නේ සිට **මූලපදං ගච්ඡති** දක්වා වූ විසිහතරක් වූ පදයන් ඒ ඒ රටවල නම් වශයෙන් කියන ලදී.

මරුකන්තාරං ගච්ඡති වැලි කතරට තරු සංඥාවෙන් යයි. **ජඞ්ඝපථං** යනු දණවලින් යා යුතු පාරයි. **අජපථං** යනු එළුවන් විසින් යායුතු මගයි. **මෙණ්ඩපථං** යනාදියෙහි ද මේ ක්‍රමයමැයි. **සංකුපථං** යනු කණුවක ලණුවක් බැඳ යායුතු දුෂ්කර මාර්ගය, එහි යන්නෝ පර්වත පාදයේ සිට යකඩ කුරුසියක් වැනි දෙයක් යොතින් බැඳ උඩට විසිකර එය පර්වතයේ රඳවා, යොතින් ඊට නැග, දියමන්තියෙන් කළ අග ඇති ලෝහ දණ්ඩකින් පර්වතය විද කණුවක් සාදා ඒ ඒ තැනින් යකඩ කුරුසිය ඇද නැවත උඩට දමා රඳවා, එහි සිට සම් යොතක් එල්ලන එය රැගෙන බැස යටම කණුවේ බැඳ, වම් අතින් යොත තදින් ගෙන, දකුණු අතින් මුගුරක් ගෙන යොතට ගසා කුඩා කණුව (උල) ගලවා නැවත උඩට නගියි. මේ උපක්‍රමයෙන් පර්වතය මුදුනට ම නැග ඉන් බසින විට ද මුලදී මෙන් පළමුව පර්වතය මත කුඩා කණුවක් සිටුවා හම් පසුම්බියක හම් යොත බැඳ කණුවෙහි ඒ යොත වෙළා බැඳ, තමා ඒ පසුම්බියේ හිඳ මකුළුවන්ගේ නූල් විසිකිරීමෙහි දී මෙන් යොත විහිදුවමින් පර්වතයෙන් බසියි. එනිසා 'කණු සිටුවා ඒ මගින් යා යුතු මාර්ගයැ'යි කියන ලදී. **ඡත්තපථං** යනු සම් කුඩයකින් වායුව ගෙන කුරුල්ලකු මෙන් බැසිය යුතු මාර්ගය. **වංසපථං** උණපඳුරක් සිඳින සැතින් සිඳ, එහි උණගස් පොරවෙන් කපා පාරක් සාදමින්, හුණුගසින් හිනිමගක් බැඳ, උණපඳුරට නැගී උණගස් සිඳ, වෙනත් උණ පහුරක් මතට හෙළා මේ ක්‍රමයෙන් හුනු පඳුරු මතින්ම යායුතු මාර්ගය සඳහා 'වංස පථය' යැයි කියන ලදැයි දතයුතුයි.

ගවෙසනෙතා න වින්දති අලාභමූලකමපි දුකඛං දොමනසසං පටිසංවෙදෙති නොලැබීම මූලික කරගත් කායික චෛතසික දුක විඳියි. **ලඳධා** ලැබ. **ආරකඛමූලකං** රැකීම මූලික කරගත් **කිනති** මෙ හොගෙ කවර උපායකින් මගේ භෝග සම්පත් රජු පැහැර නොගනියි ද -පෙ- අප්‍රිය උරුමක්කාරයෝ නොගෙන යත්ද **ගොපයතො** මංජුසාදියෙහි තබා රකින්නාට **විපලුජ්ජති** නැසෙති. **එතමාදීනවඤඤත්වා මුනි පුබබාපරෙ ඉධ** මේ සසුනෙහි පැවිදි තෙම, පෙර මහණකමේ යශස් කීර්ති සම්පත්ති ගිහි වූ විට නැසෙන බව දැන. **තසසයො** මෙතැන් පටන් කියන ලද පූර්ව හා අපර **ඉධ** මේ සසුනෙහි මුනිතෙම පූර්ව පැවිදි බවේ ආනිසංස හා පසු ගිහිවීමේ ආදීනව දැන, **දළහංකරෙයය** නිර්දේශ පදයේ උදෙසීමයි. දැඩි කරන්නේය.

ථීරං කරෙය්‍ය ලිහිල් නො කරන්නේ ය. **දළහ සමාදානො අසස** දැඩි ප්‍රතිඥා, පිහිටීම් ඇත්තේ වන්නේය. **අවටඨිත සමාදානො** සනිටුහන් කළ සමාදාන ඇත්තේය. **එතමරියානමුත්තමං** බුද්ධාදී ආර්යයන්ගේ මේ උතුම් වූ විවේක වාසයෙහිම හික්මෙන්නේ යන අර්ථයයි. **න තෙන සෙට්ඨා මඤ්ඤෙථ** ඒ විවේකය හේතුකරගෙන තමා 'මම ශ්‍රේෂ්ඨ වෙමි'යි නොසිතන්නේය. එයින් මානයෙන් තද වූවෙක් නොවන්නේ ය යන අර්ථයයි. **උනනතී** උසස් කර දැක්වීම, **උනනාමං** උඩට නැංවීම මානං අහංකාරය, ථාමං බලහත්කාරය, ථම්භං දැඩි කිරීම, ථද්ධා තද කිරීම **පඨද්ධා** විශේෂයෙන් දැඩි කිරීම. **පගහිතසිරෝ** ඔසවාගත් හිස ඇති සමනතා ඇත නොවූ ආසනෙන ඉතා දුර නොවූ අවිදූරෙ සමීපයේ උපකට්ඨෙ අසළ.

රිත්තසස (කෙලෙසුන්ගෙන්) හිස් වූ, කාය දුශ්චරිතාදියෙන් වැළකුණු **ඔසතිණණසස පිහයනති කාමෙසු ගථීතා පජා** වස්තුකාමයන්හි ඇලුණු සත්ත්වයෝ, ඒ කාමයන්හි අපේක්ෂා රහිත සිවු ඕඝය තරණය කළ රහතන් වහන්සේ ප්‍රිය කරති. ණයගැතියෝ ණය නැති බව පතන්නාක් මෙනි. මෙසේ අර්හත්වයෙන් සූත්‍ර දේශනාව නිමාකළ සේක.

රිත්තසස සියලු කෙලෙසුන්ගෙන් සිස් වූවහුට **විවිත්තසස** ශූන්‍ය වූවහුට **පවිවිත්තසස** හුදෙකලා වූවහුට, දැන් සිස් වූයේ, ශූන්‍ය වූයේ කුමකින්දැයි දක්වනු සඳහා **කාය දුච්චරිතෙන රිත්තසස** යනාදිය කියන ලදී. එහි සිස්වීම කෙලෙස් පටිපාටියෙන් හා මාර්ග පටිපාටියෙන් යන දෙපරිද්දෙන් දතයුතුයි. කෙලෙස් පටිපාටියෙන් වනාහි පළමුකොට රාගය, මෝහය, ථම්භය, සාරම්භය, මානය, මදය යන මේ කෙලෙස් ධර්ම සය අර්හත් මාර්ගයෙන් සිස් කරනු ලැබේ. ද්වේෂය, ක්‍රෝධය, උපනාහය, ප්‍රමාදය යන සිවු කෙලෙස් ධර්ම අනාගාමී මාර්ගයෙන් සිස් කරනු ලැබේ. අතිමානය, මක්ඛය, පලාසය, ඊර්ෂ්‍යාව, මච්ඡරිය, මායාව, කපටිකම යන කෙලෙස් ධර්ම සත සෝවාන් මාර්ගයෙන් සිස් කරනු ලැබේ. මාර්ග පටිපාටියෙන් වනාහී සෝවාන් මාර්ගයෙන් අතිමානය, මක්ඛය, පලාසය, ඊර්ෂ්‍යාව, මසුරුකම, මායාව හා කපටිකම යන කෙලෙස් ධර්ම හත ශූන්‍ය වේ. අනාගාමී මාර්ගයෙන් ද්වේෂය, ක්‍රෝධය, උපනාහය, ප්‍රමාදය යන සිවු කෙලෙස් ධර්මයන් ද අර්හත් මාර්ගයෙන් රාගය, මෝහය, ථම්භය, සාරම්භය, මානය හා මදය යන කෙලෙස් ධර්ම හය ද ශූන්‍ය වේ.

තීණි දුච්චරිතානි සබ්බකිලෙසෙහි ආදී ක්‍රමයෙන් අවශේෂ වූ ද දුශ්චරිත සුදුසු පරිදි යෙදිය යුතුයි. **වත්ථුකාමෙ පරිජානිත්වා** ත්‍රෙභූමික වූ වස්තුකාමයෙහි ඤාණ, තීරණ පරිඤ්ඤාවන්ගෙන් යුක්ත වීම් වශයෙන් මනාව දැන. **කිලෙසකාමෙ පහාය** ඡන්දාදී කෙලෙස් කාමයන් ප්‍රහාණ පරිඥාවෙන් අත්හැර. **බ්‍යනතීකරිත්වා** දුරුවූවක්, දුරු වූ කෙළවර ඇත්තක් කර, **කාමොඝතිණ්ණස්ස** අනාගාමී මාර්ගයෙන් ආවර්තනය වන (පෙරළෙන) කාමෝඝය තරණය කර සිටියහුට, **භවොඝං** අර්හත් මාර්ගයෙන්, **දිට්ඨොඝං** සෝවාන් මාර්ගයෙන්, **අවිජ්ජොඝං** අර්හත් මාර්ගයෙන්, **සබ්බසංඛාර පථං** සියලු ස්කන්ධ, ධාතු, ආයතන, පිළිවෙල සංඛ්‍යාත සංසාර පථය අර්හත් මාර්ගයෙන්ම තරණය කර සිටියහුට, සෝවාන් මාර්ගයෙන් එතෙර වූවහුට, සකෘදාගාමී මාර්ගයෙන් නිස්සරණය කළහුට අනාගාමී මාර්ගයෙන් කාමධාතුව ඉක්මවූවහුට, අර්හත් මාර්ගයෙන් සියලු භව උපත ඉක්මවූවහුට, ඵලසමවත් වශයෙන් ව්‍යතික්‍රමණය කළහුට **පාර ගතස්ස** යනාදිය නිර්වාණය ලැබීම් වශයෙන් කියන ලදී. **යථා ඉණායිකා ආනණ්‍යා** වැඩෙන ලද ණය නොදී හැසිරෙන්නාහු ණයින් මිදීම **පත්ථෙනති** ප්‍රාර්ථනා කරති. **ආබාධිකා ආරොග්‍යං** පිත් කිපීම ආදී රෝගයන්ගෙන් ආතුර වූවෝ බෙහෙත් කිරීමෙන්, ඒ රෝග දුරුකර නීරෝගී වන්නාක් මෙන්.

යථා බන්ධනබද්ධා නැකැත් දිනයෙහි බන්ධනාගාරයේ බැඳුණු පුරුෂයෝ **යථා දාසා භුජිස්සා** දාසබවින් මිදුණු පුරුෂයෝ තමා කැමති පරිදි හැසිරෙති. කිසිවෙකු එම ක්‍රියා බලාත්කාරයෙන් නොනවත්වන හෙයින් දාසයෝ දාසභාවයෙන් මිදීම පතති. **යථා කන්තාරද්ධාන පක්කන්තා** බලවත් පුරුෂයෝ මාර්ගෝපකරණ රැගෙන ආයුධ සන්නද්ධව සපරිවරින් කාන්තාර මගට පැමිණෙති. සොරු ඔවුන් ඉතා දුරදීම දැක පලා යති. ඒ වීර්යවන්තයෝ සුවසේ කාන්තාර මාර්ගය ඉක්මවා ක්ෂේම ස්ථානයට පැමිණ සතුටු වෙති. එනිසා කාන්තාර මගට පැමිණියෝ ක්ෂේම භූමියට පැමිණීම අපේක්ෂා කරති. මේ සූත්‍ර දේශනාව අවසානයේ දී තිස්ස සෝවාන් ඵලයෙහි පිහිටා පැවිදි වී රහත් බව සාක්ෂාත් කරගත්තේය.

සත්වන තිස්ස මෙත්තෙය්‍ය සූත්‍ර වර්ණනාව නිමියේ ය.

8.

අටවන පසූර සූත්‍ර නිර්දේශයේ පළමු ගාථාවේ සංක්ෂිප්ත අර්ථය මේ දෘෂ්ටිගතිකයෝ තමා පිළිගත් දෘෂ්ටිය නිසා 'මෙහිම ශුද්ධිය වේ'යැයි කියති. 'අන්‍ය ධර්මයන්හි විශුද්ධියක් නැතැ'යි කියති. යමෙක් මෙසේ තම ශාස්තෘන් ඇසුරු කරමින්, ඒ සසුනෙහිම මේ 'සුභවාදියෙකි'යි, තම දෘෂ්ටියෙහි සුභවාදී වෙති. මෙසේ ලෝකයේ බොහෝ ශ්‍රමණ බ්‍රාහ්මණයෝ 'ලෝකය ශාස්වතය' ආදී එක් එක් සත්‍යයන්හි වෙන වෙනම බැසගත්හ.

සබ්බෙ පරවාදෙ බ්‍රූපනති සියලු අන්‍ය ලබ්ධි අත්හරිති. **උක්ඛිපනති** දුරින්ම දුරු කරති. **පරික්ඛිපනති** හාත්පසින්ම බැහැර කරති. **සුභවාදා** යනු නිද්දේසයේ උදෙසන පදයයි. **සොභනවාදා** යනු මෙසේ සුන්දර යැයි කියමින්. **පණ්ඩිතවාදා** 'අපි පඬිවරු වෙමු' මෙසේ කියමින් **ථිරවාදා**, 'නිදොස් වාදයක් දරමු'යි කියමින්. **ඤායවාදා** 'යුතු වූ න්‍යාය වාදයක් දරමු'යි කියමින්. **හේතුවාදා** කරුණු සහිත වූවක් කියමු'යි පවසමින් **ලකඛණවාදා** 'සැලකිය යුත්තක් කියමු'යි පවසමින්. **කාරණවාදා** උදාහරණයෙන් යුතු වාදයක් කියමු'යි පවසමින්. **යානවාදා** ඉවත්ව යෑමට අසමත් වාදයක් කියමු'යි පවසමින්. **නිවිට්ඨා** ඇතුලට පිවිස. **පතිට්ඨිතා** එහිම සිට මෙසේ නැවතී.

තෙ වාද කාමා යනු දෙවන ගාථාවයි. එහි **බාලං දහන්ති මිථු අඤ්ඤමඤ්ඤං** 'මොහු බාලයෙකි', 'මොහු බාලයෙකි'යි මෙසේ වාදාභිමුඛ දෙදෙනාම ඔවුනොවුන් මෝඩයන් සේ දකිති. කියති. **තෙ අඤ්ඤසිතා කථොජ්ජං** ඔවුහු ඔවුනොවුන් ඇසුරු කළ ශාස්තෘවරුන්ගේ වචන ගෙන කලහ කරති. **පසංසකාමා කුසලාවදානා** පැසසීම කැමතිවන ඒ දෙදෙනාම 'අපි වාදයට දක්ෂයෙමු'යි 'අපි පඬිවරු වෙමු'යි යන සිතුවිල්ලෙන් යුතුව **වාදත්ථිකා** වාදයෙන් ප්‍රයෝජන ඇතිව. **වාදාධිප්පායා** වාද අදහස් ඇතිව, **වාද පූරෙක්ඛාරා** වාදය ම පෙරටු කරගෙන හැසිරෙමින් **වාද පරියෙසනං චරන්තා** වාදයම සොයමින් හැසිරෙනුයේ. **විගය්හ පිවිසි ඔගය්හ** බැස **අඡ්ඣා ගය්හ** කිමිදී **පවිසිත්වා** ඇතුලට පිවිස. **අනොජවං ඕජ නැති, තේජස් නැති** යන අර්ථයයි. **සා කථා** ඒ වචනය. **කථොජ්ජං වදන්ති** තේජස් නැතිව කියති. මෙසේ වාදයෙහි, ප්‍රතිවාදයෙහි එකම නියමයක් වේ.

යුත්තෙනා කථායං යන ගාථාවෙහි **යුත්තෙනා කථායං** යනු වාද කථාවේ උත්සාහවත් වූ. **පසංසම්චඡං විනිඝාති හොති** තමාට ප්‍රශංසාව කැමතිව, 'කෙසේ නම් නිග්‍රහ කරන්නෙම්ද?'යි ආදී ක්‍රමයෙන් වාදයට මුලදීම සැක සංකා ඇතිව ගැටෙයි. **අපාහතසම්මං** ප්‍රශ්න විමසන්නන් විසින් අර්ථයට පරිබාහිරව කියන ලද්දේය. බ්‍යඤ්ජනයට පරිබාහිරව කියන ලද්දේය ආදී ක්‍රමයෙන් බැහැර කරන ලද වාදයෙහි. **නින්දාය සො කුප්පතී** මෙසේ තම වාදය බැහැරලූ විට උපන් නින්දාවෙන් ඔහු කිපෙයි. **රන්ධමෙසි** යමකුගේ සිදුරුම සොයමින් ථොමනං කීර්තිය, ප්‍රශංසාව. **කිත්තිං** හොඳ නම ප්‍රකට කිරීම. **වණ්ණහාරියං** ගුණ වැඩීම. **පුබ්බව සල්ලාපා** වාදයට මුලදීම, පෙරාතුවම. 'මෙය කෙසේද?' 'මෙය කෙසේදැ'යි සැක සංකා මොහුට ඇත්තේනුයි **කථංකථී** වේ. **ජයො නුඛො මෙ**, මට ජය වේද? **කථං නිගහං** කවරාකාරයකින් නිග්‍රහ කරන්නේද? **පටිකම්මං කරිස්සාමි** මගේ පිළිගැනීම, ලබ්ධිය පිරිසිදු කරගන්නෙමි. **විසෙසං** විශේෂයෙන් **පටිවිසෙසං** නැවත නැවත විශේෂයෙන් **ආවෙඨියං කරිස්සාමී** වෙළීම කරන්නෙමි. **නිබ්බඩියං** කෙසේ මගේ වෙළුම් හරින්නෙම්ද? **ඡෙදනං** වාද සිදීම. **මණ්ඩලං** වාද මණ්ඩල කිරීම **පාරිසජ්ජා** පිරිවර වූවෝ **පාසාදනියා කාරුණික** වූවෝ. **අපසාදනති** වළක්වති. බැහැර කරති. **අත්ථාපගතතං** අර්ථයෙන් ඉවත් වූවත් 'අර්ථයක් නැත'යිද 'අර්ථයෙන් බැහැර කරති. අර්ථයෙන් වළක්වත්. **අත්ථා තෙ දුනනීතො නුඹලා** අර්ථය මනාව නොඑළවන ලදී. **බ්‍යඤ්ජනනෙත දූරොපිතං නුඹලා** බ්‍යඤ්ජනය වරදවා තබන ලදී. **නිගහො තෙ අකතො නුඹ** විසින් නිග්‍රහ නොකරන ලදී. **පටිකම්මනෙත දුක්කතං නුඹ** විසින් තමාගේ ලබ්ධිය පිහිටුවීම මනාව නොකරන ලදී. **විසමං කථිතං** සමානව නොකියන ලදී. **දුබභණිතං** කියන්නේ ද වරදවා කියන ලදී. **දුල්ලපිතං** මනාව විසඳීම නොකරන ලදී. **දුරුත්තං** අන් අයුරකින් කියන ලදී. **දුබභාසිතං** විරූපව කියන ලදී. **නින්දාය** ගැරහීමෙන් **ගරහාය** දොස් කීමෙන් **අතිනනියා** අගුණ, නුගුණ කීමෙන් **අවණ්ණහාරිකාය** අගුණ වැඩීමෙන්. **කුප්පති** ප්‍රකෘති ස්වභාවය හැරදමා හැසිරේ. **ව්‍යාපජ්ජති** දෝස වශයෙන් කුණුවීමට යයි. **පතිත්ථියති** ක්‍රෝධ වශයෙන් තද බවට යයි. **කොපඤ්ච** කුපිත බව. **දොසඤ්ච** තරහව **අපපච්චයඤ්ච** අසතුටු ආකාරය **පාතුකරොති** ප්‍රකට කරයි. **රන්ධමෙසි** අතුරු සොයයි. **විරන්ධමෙසි** සිදුරු සොයයි. **අපරද්ධමෙසි** ගුණ ඉවතලා දෝෂයම සොයයි. **ඛලිතමෙසි** පැකිලීම සොයයි. **ගලිත මෙසී** ගිලිහීම, වැටීම සොයයි. 'ඝටිතමෙසි' යන පාඨය ද යෙදේ. 'ඔහුගේ පෙළීම සොයයි' යන අරුතයි. **විවරමෙසි** දෝෂ විවර සොයයි.

හුදෙක් කිපීම පමණක් නොව ශෝකාදිය කරන බව **යමස්ස වාදං** යන ගාථාවෙන් කියන ලදී. එහි **පරිහීනමාහු අපාහතං** අර්ථ ව්‍යඤ්ජනාදියෙන් පහ වූයේ පිරිහුනේ යැයි කියති. **පරිදෙවති** ඒ නිමිති කරගෙන ඔහු 'අනික් දෙයක් මවිසින් සිහිකරන ලද'යි ආදී වශයෙන් වැලපෙයි. **සොචති** ඔහුට ජය වීය ආදී ලෙස ශෝක කරයි. **උපවදගාමනති අනත්‍ථුනාති** ඔහු මා වාදයෙන් වාදය ඉක්මවා පරදවන ලදැයි ආදී වශයෙන් දැඩිසේ වැලපේ. **පරිභාපිතං** නොවැඩෙන ලදී. **අඤ්ඤං මයා ආවජ්ජිතං** අන් කරුණක් මවිසින් සිතනලදී' **චිනනිතං** විමසන ලදී. **මහා පකෙඛා** මහත් වූ ඤාති පිරිස් මොහුට ඇත්තේනුයි මහා පක්ෂ ඇති. **මහා පරිසෝ** මහත් වූ පිරිස් මොහුට ඇත. **සමහා පරිවාරෝ** දැසි දස් ආදී මහත් පිරිවර ඇත. **පරිසාචායං** වගහා මෙ පිරිසද බෙදී ඇත. එකතුවී නැත. **පුන භුඤ්ජිස්සාමි** නැවත බිදින්නෙමි. **එතෙ විවාදා සමණෙසු** මෙහි ශ්‍රමණයෝ නම් අන් සසුන්හි පිරිවැජියෝ ය.

එතෙසු උගඝාති නිගඝාති හොති ඒ වාදයන්හි ජය පැදුරම ආදී වශයෙන් සිත අනුග්‍රහයට නිග්‍රහයට පැමිණෙයි. අනුග්‍රහය ද නිග්‍රහය ද කරයි. **විරමෙ කථොජ්ජං** කලහය දුරු කරන්නේය. **න හඤ්ඤදඤ්ඨථි පසංසලාභා** ප්‍රශංසා ලාභයෙන් අන්‍ය වූ අර්ථයක් මෙහි නැත. **උත්තානෙ** වා ගැඹුරු නොවේ යන අර්ථයයි. පස්කම් සැපත ආදියෙහි මෙනි. **ගම්හීරෙ** පිවිසීම අපහසු, නොපිහිටිය හැකි වේ. ප්‍රතීත්‍ය සමුත්පාදය මෙනි. **ගූළ්හෙ** සැඟවී සිටියේ. 'අභිරමනන්‍ද අහං තෙ පාටිභොගෙ' ආදියෙහි මෙනි. **පටිච්ඡන්නෙ** අප්‍රකටව, 'මාතරං පිතරං හනත්වා' ආදී ප්‍රහේලිකා මෙන්. **නෙය්‍යෙ** වා බැහැරින් ගෙන කිවයුතුයි. 'අසඝඩ්ඩා අකතඤ්ඤූච' යනාදියෙහි මෙනි. **නීතොවා** පෙළෙහි සිටි නියාමයෙන් කිවයුතු. 'චත්තාරෙ මෙ භික්ඛවෙ අරියවංසා' යනාදියෙහි මෙනි. **අවජ්ජෙ** වා නිර්දෝෂ අර්ථ ඇති. 'කුසලා ධම්මා' යනාදියෙහි මෙනි. **නිකකිලෙසෙ** වා කෙසේ විරහිතව, විදර්ශනාව මෙනි. **වොදානෙ** වා පාරිශුද්ධත්වය, ලෝකෝත්තර බව මෙනි. **පරමත්‍ථෙ** වා උත්තමාර්ථය, උතුම් වූ අර්ථය, ස්කන්ධ - ධාතු - ආයතන - නිර්වාණය මෙනි.

සයවන ගාථාවේ අර්ථය - යම්හෙයකින් 'මේ වාදයෙහි ප්‍රශංසා ලැබීම හැර අන් ලාභයක් නැති බැවින් 'පරම වූ ලාභය හෙවත් වාදයෙන් දිනුම ලබා 'මෙය යහපත්ය'යි ඒ තම ලබ්ධියට ප්‍රශංසා කරයි. ඒ වාදය

පිරිස් මැද දී ප්‍රකාශ කොට ජය ලබා, ඒ ජයගැනීමේ සතුටින් දත් විදහා සිනහසෙයි. මානය ද (අහංකාරය) උපදවයි. ඔහු ජයගත් බැවින් උපන් සතුටිස් අනුන් හෙළා දැක මාන උපදවන හෙයිනි.

ඵමහයිත්වා පුරවා. **බ්‍රූහයිත්වා** වඩා. මේ ගාථාවේ නිද්දේසයේ අර්ථ ඉතා ප්‍රකටය.

මෙසේ උඩඟු වූයේ ද **යා උනනති** ගාථාවෙන් එය විස්තර වේ. **මානාතිමානං වදතෙ පනෙසො** ඒ මේ උඩඟු බවක් වේද එය ඔහුට උපද්‍රව භූමි වෙයි. නොකිපෙමින් මානයද අතිමානය ද ඇතිකර ගනියි. මෙසේ මෙම ගාථාවේ නිද්දේසය ද අර්ථ ප්‍රකට වේ. මෙසේ වාදයෙහි දොස් දක්වා

දැන් ඔහුගේ වාදය නොපිළිගන්නේ **සූරෝ** යන ගාථාව කියන ලදී. එහි **රාජඛාදාය** රාජ භෝජනයට සුදුසු ඉතා රසවත්, පෝෂ්‍යජනක ආහාරාදියෙන් යයි කියන ලද්දේ වෙමි. **අභිගජ්ජමෙති පටිසූරමිච්ඡං** යම්සේ ශූරයා ප්‍රතිමල්ලවයකු කැමැතිව ගර්ජනා කරන්නේ ද එමෙන් දෘෂ්ටි ගතිකයාද දෘෂ්ටිගතිකයා වෙත වාදාභිලාෂයෙන් එයි. **යෙනෙව සො තෙන පලෙහි** ශූරය, ඒ නුඹගේ ප්‍රතිමල්ලවයා සිටින තැනට යව. **පුබ්බව නත්ථි යදිදං යුද්ධාය** යුද්ධය, වාදය නිසා යම්කිසි වෙහෙසක් ඇතිවේද එබඳු වෙහෙසක් පළමුවෙන් ද මා හට නොවීය. බෝමැඩ මුලදී එය ප්‍රහීණ කළ බව දක්වයි. **සූරෝ** යනු නිද්දේසයේ උදෙසන පදයයි. 'සුටඨු උරො සූරො', දක්ෂ, විශිෂ්ට, දෙන ලද උර ඇත්තේනුයි 'සුර' නම් වේ. **වීරෝ** පරාක්‍රම වූයේ **විකකනෙතා** සංග්‍රාමයට පිවිසෙමින්, **අභිරූ** ආදියේ අර්ථ ද පැවසූ පරිදි දතයුතුයි. **පුථෙථා** නිද්දේසයේ උදෙසන පදය. **පොසිතො** පෝෂණය කරන ලදී. **ආපාදිතො** සමීපයට පැමිණ පාලනය කළ **වඩ්ඪිතො** ඒ ඒ ආහාර පානාදියෙන් වඩන ලදී. **ගජ්ජනෙතා** අව්‍යක්ත, අශීල වදනින් ගර්ජනා කරමින්, **උගජ්ජනෙතා** දැඩිව ගර්ජනා කරමින් **අභිගජ්ජනෙතා** සිංහනාද කරමින් **එති** එයි. **උපෙති** ඉන් සමීපයට යයි. **උගච්ඡති** ඉන් සමීපයට ගොස් නවතියි. **පටිසූරං** භය නැතිව, **පටිපුරිසං** සතුරු පුරුෂයා **පටිසඤ්ඤී** සතුරකුව අභිමුවෙහි සිටී. **පටිමල්ලං** ප්‍රතිමල්ලවයකුව යුද කරනුයේ **ඉච්ඡනෙතා** කැමැත්තෙන් **පලෙහී** යව! **වජ** නොසිටුව (මෙහි), **ගච්ඡ** සමීපයට එළඹෙව. **අභික්කම** එහි ගොස් උත්සාහ කරව. **බොධියාමූලෙ** මහාබෝධි වෘක්ෂ මූලයේ දී **පටිසෙනිකරා**

යෙ **කිලෙසා** ප්‍රතිපක්ෂ වූ විරුද්ධ වූ යම් කෙලෙස් ධර්මයක් වේ නම්. **පටිලොමකරා** හානිකර වූ **පටිකණ්ටකරා** විනිවිද යන සුලු වූ. **පටිපක්ඛකරා** සතුරෙකු වූ.

මින්පසුව එන ගාථා ප්‍රකටව ම මේ කරුණ හා සම්බන්ධ වේ.

එහි **විවාදයන්ති** විවාද කරති. **පටිසෙනිකත්තා** ප්‍රතිලෝම, විරුද්ධ බව ඇති කරන්නා වූ. 'නුඹ මේ දහම් විනය නොදන්නෙහියැ'යි ආදී ක්‍රමයෙන් විරුද්ධ වචනවලින් විවාද කරන. **සහිතමෙම** මගේ වචන අර්ථ සහිතය. **අසහිතං තෙ** නුඹේ වචන අනර්ථකරය. **ආචිණ්ණං තෙ විපරාවත්තං** නුඹ යමක් ඉතා දිගුකලක් ප්‍රගුණ කළේ ද එය මාගේ වාදයට පැමිණීමෙන් නැවතුණි. වැනසුණි. **ආරොපිතො තෙ වාදා** නුඹ මත්තෙහි මගේ දොස් ආරෝපණය කරන ලදී. **චර වාදපපමොක්ඛාය** බත් මුලක් ගෙන, ඒ ඒ තැනට ගොස් වාදයෙන් මිදෙනු සඳහා උත්තර සොයමින් හැසිරෙව. වෙහෙසව. නැතහොත් මවිසින් නගන ලද දෝෂයන්ගෙන් තමා මුදවා ගනුව. **පහොසි** ඉදින් හැක්කේ නම් (සමත් වේනම්) **ආවෙයියාය ආවෙයීතං** වෙළා වැලැක්වීම. **නිබ්බෙයියාය නිබ්බෙයීතං** දොසින් මිදීමෙන් නිදහස් වීම. **ඡෙදනෙන ඡෙදනං** මේ ආදී වචනයන්ගේ අර්ථ ඉහත කී ක්‍රමයෙන් ගෙන සුදුසු පරිදි යෙදිය යුතුයි.

විසෙනි කත්වා කෙලෙස් වශයෙන් විනාශ කර, **කිං ලභෙථ** ප්‍රතිමල්ලවයා කුමක් ලබන්නේද? **පසූර** යනුවෙන් ඒ පරිබ්‍රාජකයාට අමතයි. **යෙසීධ නත්ථි** මේ ගාථාවෙහි නිද්දේසයේ අර්ථ ඉතා ප්‍රකටමය. **පවිතක්කං** 'මට ජය ඇතිවන්නේ ද?' ආදී වශයෙන් විතර්ක කරනුයේ ධොනෙන යුගං සමාගමා නැතිකළ කෙලෙස් ඇති බුදුරදුන් සමග යුද්ධයට වාදයට පැමිණියෙහිය. **නහිත්වං සක්ඛසි සම්පයාතවෙ** සිංහයන් සමග යුද්ධයට ආ සිවලෙකු මෙන් නුඹ වාදාරෝපණය කිරීමට තබා මාගේ සමීපයටවත් ඒමට නොහැකි වන්නෙහිය.

මනො යනු නිද්දේස පදයේ උදෙසීමයි. **යං චිත්තං** චිත්‍ර විචිත්‍ර බැවින් 'චිත්ත' නම් වේ. අරමුණ මනිනු ලබන්නේ, අරමුණ දන්නේනුයි 'මාන' නම් වේ. **මානසං** මනසමය. 'අනන්තළික්ඛ චරොපාසො යවායං චරති මානසො' යන මෙහි මන සම්ප්‍රයුක්ත ධර්මය 'මනස' නම් වේ.

කථංහි භගවා තුය්හං සාවකො සාසනෙ රතො
අපපත්තමානසො සෙකෙඛා කාලං කයිරා ජනෙසුතා

යන මෙහි 'මානස' යනුවෙන් අර්හත්වය අදහස් කරන ලදී. මෙම සූත්‍රයේ 'මන' යන්නම 'ස' ව්‍යඤ්ජනය යොදා වැඩිකිරීම් වශයෙන් 'මානසං' යනුවෙන් යොදන ලදී. හදයං යනු සිතයි. 'චිත්තං වා තෙ බිපිසසාමි හදයං වා තෙ ථාලෙසසාමි' යන මෙහි පපුව 'හදයං' යන්නෙන් අදහස් විය. 'හදයා හදයං මඤ්ඤෙ අඤ්ඤාය තච්ඡති' යන මෙහි හදයං යනු සිතයි. 'වකකං හදයං' යන මෙහි හෘදය වස්තුව අදහස් වේ. මෙහිදී සිතම අභ්‍යන්තර අර්ථයෙන් හදයං යැයි කියන ලදී. එයම පාරිශුද්ධාර්ථයෙන් පණ්ඩරං වේ. භවංග සිත සඳහා මෙය කියන ලදී. එනිසා කියන ලදී. 'මහණෙනි, මේ සිත ස්වභාවයෙන්ම ප්‍රභාස්වරය. එය ආගන්තුක කෙලෙසුන්ගෙන් කිළිටි වේ' යනුයි. ඒ අකුසලයන්ගෙන් නික්මුණු බැවින් ගංගා නම් ගඟෙන් නික්මෙන අතු නදී 'ගංගා' නම් වන මෙන් ද ගෝධාවරී ගඟින් නික්මෙන ගංගා 'ගොධාවරී' නම් වන මෙන්ද 'පණ්ඩර' යැයි කියන ලදී. මනො මනායතනං මෙහි දී මනෝ ග්‍රහණය මනස් ආයතනය බව දක්වයි. එහෙයින් මෙය දක්වයි. මෙහිදී දේවායතනය මෙන් මනසේ ආයතනය මනායතන වූයේ යැයි නොගත යුතුයි. එහෙයින් මනසම ආයතන වූයේනුයි මනායතන නම් වේ.

මෙහි දී නිවාසනර්ථයෙන්, ආකාරාර්ථයෙන්, සමෝසරණාර්ථයෙන්, සංජාතිදේශාර්ථයෙන් හා කාරණාර්ථයෙන් මනස ආයතනයකැයි දතයුතුයි. ඒ එසේමැයි. ලෝකයේ 'ඉසසරායතන වාසු දේවායතන' ආදියෙහි නිවාස අර්තයෙන් ආයතන යැයි කියනු ලැබේ. 'සුවණ්ණායතනං රතනායතනං' ආදියෙහි ආකාරාර්ථයෙන් යෙදී ඇත. සාසනයෙහි වනාහි 'මනොරමෙ ආයතනෙ සෙවනති නං විහංගමා' ආදියෙහි සමොසරණාර්ථයෙන් ද 'දකඛිණාපථො ගුනනං ආයතනං' යනාදියෙහි සඤ්ජාති දේශාර්ථයෙන් ද 'තත්‍ර තත්‍රෙව ගුනනං ආයතනං' යනාදියෙහි සඤ්ජාති දේශාර්ථයෙන් ද කරණාර්ථයෙන් ද ආයතන යන්න යෙදී ඇත. මේ සූත්‍රයේ දී සඤ්ජාති දේශාර්ථයෙන් ද සමෝසරණාර්ථයෙන් ද කාරණාර්ථයෙන් ද යන අර්ථ තුනෙහි 'ආයතන' යන්න යෙදීම සුදුසුය. ස්පර්ශාදී ධර්මයෝ මෙහි හටගනිත්නුයි සඤ්ජාති දේශාර්ථයෙන් මෙය ආයතන නම් වේ. බාහිර රූප, ශබ්ද, ගන්ධ, රස, ස්පර්ශාදී අරමුණු ස්වභාවයෙන් ම මෙහි

බැසගනුයේය යන අරුතින් සමෝසරණාර්ථයෙන් ද ආයතනයක් වේ. ස්පර්ශාදීන්ගේ සහජාත ආදී ප්‍රත්‍යාර්ථයෙන් ඊට කාරණ වූ බැවින් කාරණාර්ථයේද ආයතනයකැයි දතයුතුයි.

මනින්ද්‍රියං යන්නෙහි අර්ථය ඉහත කී පරිදිමය. දැනගන්නේනුයි විඤ්ඤාණ නම් වේ. විඤ්ඤාණයම ස්කන්ධ වූයේනුයි **විඤ්ඤාණක්ඛන්ධෝ** වේ. එහි රාශි ආදී වශයෙන් අර්ථය දතයුතුයි. 'මහා උදකක්ඛන්ධොපෙව සංඛං ගච්ඡති' මෙහි දී රාශි අර්ථයෙන් බන්ධ යැයි කියන ලදී. 'සීලක්ඛන්ධ සමාධික්ඛන්ධ' ආදියෙහි ගුණ අර්ථයෙන් ද 'අද්දසා බො භගවා මහන්තං දාරුක්ඛන්ධ' යන මෙහි ප්‍රඥප්ති මාත්‍ර අර්ථයෙන් ද බන්ධ යන්න යෙදී ඇත. මෙහිදී වනාහි රද්ළ්හාර්ථයෙන් බන්ධ යැයි කියන ලදී. රාශි අර්ථයෙන් විඤ්ඤාණ ස්කන්ධයේ විඤ්ඤාණය එක් කොටසකි. යම්සේ රුකෙහි එක් කොටසක් සිදින විටද 'ගස කපයි' යනුවෙන් වහරන්නාක් මෙන් විඤ්ඤාණ ස්කන්ධයේ එක් කොටසක් වූ එකම විඤ්ඤාණය ආරෝපිත අර්ථයෙන් විඤ්ඤාණ ස්කන්ධය යැයි කියන ලදී.

තජ්ජා මනෝ විඤ්ඤාණ ධාතු ඒ එස්සාදී ධර්මයන්ට යෝග්‍ය වූ මනෝ විඤ්ඤාණ ධාතුවයි. මේ පදයේ දී එකම සිත මැනීම් අර්ථයෙන් 'මන' යනුවෙන් ද විජානන අර්ථයෙන් 'විඤ්ඤාණ' යනුවෙන් ද ස්වභාවාර්ථයෙන් හෝ නිස්සත්ත අර්ථයෙන් 'ධාතු' යැයි නම් තුනකින් කියන ලදී. **යුගසමාගමං** එක් ප්‍රහාරයෙන් ම **සමාගන්ත්වා** පැමිණ **යුගගාහං ගණ්හිත්වා** තරගයට ඒම, වාදයට ඒම ගෙන. **සාකච්ඡං සමාපජ්ජිතුං** එක්ව, සමග කථාවට අදක්ෂ බවට හේතු කාරණා දැක්වීම සඳහා **තං කිස්ස හෙතු පසූරෝ පරිබ්බාජකෝ හීනෝ** යනාදිය කියන ලදී. **සොහි භගවා** අගෙගාව අසමසයන්ට අග්‍ර වූ බැවින්, අසමාන ප්‍රඥා ඇති බැවින් අග්‍ර වෙති. **සෙට්ඨෝ ච සියලු** ගුණයන්හි සමානයකු නැති අර්ථයෙන් ශ්‍රේෂ්ඨ වෙති. **මොක්ඛෝ ච** සවාසනා සකල ක්ලේශයන්ගෙන් මිදුණු බැවින් මෝක්ෂයටද පත්වූහ. **උත්තමෝ ච** තමාට උතුම් වූවකු නැති හෙයින් උතුම් වෙති. **පවරෝ ච** සියලු ලෝකයා විසින් ප්‍රාර්ථනා කළයුතු බැවින් ප්‍රවර වෙති. **මත්තෙන්න මාතංගෙන** ත්‍රිමදගලිත හස්තියකු විසින් **කොඤ්චකෝ** කණ සිවලා **සීහෙන මිගරාජ්ඤා සද්ධිං** කේශර සිංහ මෘගරාජයකු සමග **තරුණකෝ** පැටවෙක් **ධෙනුපකෝ කිරිබොන උසභෙන** මංගල සම්මත (මොල්ලිය ඇති) වෘෂභයෙකු සමග. **චලකකුනා සද්ධිං** සෙලවෙන මොල්ලිය

සමග ධංකො කපුටා. ගරුළෙන වෙනතෙය්‍යෙන සද්ධිං මෙහි ගුරුළු නම් ජාති නාමයයි. වෙනතෙය්‍ය නම් ගෝත්‍ර නාමයයි. චණ්ඩාලො යනු අධම සැඩොලා. චකකවතතිනා සිවු දිවයිනටම අධිපති සක්විති රජු සමග පංසු පිසාචකො කැලිකසළ ගොඩවල උපන් යක්ෂයා ඉන්දෙන දෙවරාජෑඤ්ඤා සද්ධිං ශක්‍ර දිව්‍ය රාජයා සමග. සො හි භගවා මහා පඤ්ඤා ආදී පද හය ද ඉහත විස්තර කරන ලදී.

එහි පඤ්ඤා පභෙදකුසලො තමාගේ අනන්ත විකල්ප ඇති ප්‍රඥා ප්‍රභේදයෙහි දක්ෂ වූ. පභින්න ඤාණො අනන්ත ප්‍රභේදයට පත් ඤාණය. මේ ප්‍රඥා ප්‍රභේදයෙහි දක්ෂභාවය ඇති කල්හි, ඒ ප්‍රඥාවන්ගේ අනන්ත වූ ප්‍රභේද දැක්වීය. අධිගත පටිසමභිදො ලබන ලද අග්‍ර වූ පිළිසිඹියාපත් ඤාණ ඇති චතුවෙසාරජ්ජපපත්තො සතර විශාරද ස්වභාව සංඛ්‍යාත ඤාණයන්ට පැමිණි. එය මෙසේ කියන ලදී. 'සම්මා සම්බුද්ධ යැයි ප්‍රතිඥා කරන්නා වූ නුඹ විසින් මෙනම් ධර්ම අවබෝධ නොකරන ලද්දෙහි යැයි මෙහිලා ඒකාන්තයෙන් ශ්‍රමණයෙක් හෝ බ්‍රාහ්මණයෙක් හෝ දෙවියෙක් හෝ මාරයෙක් හෝ බ්‍රහ්මයෙක් හෝ ලෝකයෙහි කිසිවෙක් හෝ කරුණු සහිතව මා හට ප්‍රතිචෝදනා නගන්නේය යන මේ කාරණය, මහණෙනි, මම නො දකිමි. මහණෙනි, මම මේ කාරණය නොදක්නෙම්, ක්ෂේමයට පැමිණියෙම්, නිර්භය බවට පැමිණියෙම්, විශාරද බවට පැමිණියෙම් වාසය කරමි. ක්ෂීණාශ්‍රව වූයේ යැයි ප්‍රතිඥා කරන නුඹ විසින් මේ ආශ්‍රව ක්ෂය නොකරන ලද්දෙහි යැයි -පෙ- මාර්ගඵලයන්ට අන්තරායකර යම් ධර්මයක් නුඹ විසින් දෙසන ලද ද, ඒ ධර්ම සේවනය කරන්නාට අන්තරායක් නොවන්නේය -පෙ- තොප විසින් යම් අර්ථයක් පිණිස ධර්මය දේශනා කරන ලද්දේනම් ඒ ධර්මය, ඊට අනුව පිළිපදින්නාගේ මනාව දුක් කෙළවර කිරීම පිණිස හේතු නොවන්නේ ය යන මෙකරුණෙහිලා ඒකාන්තයෙන් ශ්‍රමණයෙක් හෝ බ්‍රාහ්මණයෙක් හෝ දෙවියෙක් හෝ මාරයෙක් හෝ බ්‍රහ්මයෙක් හෝ ලෝකයෙහි වෙනත් කිසිවෙක හෝ කරුණු සහිතව මා හට ප්‍රතිචෝදනා නගන්නේය යන මේ කාරණය මහණෙනි, මම නොදකිමි. මහණෙනි, මම මේ කාරණය නොදක්නෙම්, ක්ෂේමයට පැමිණියෙම්, නිර්භය බවට පැමිණියෙම්, විශාරද බවට පැමිණියෙම් වාසය කරමි.'

දසබලධාරී දසබලයක් ඇත්තේනුයි තථාගතයෝ දසබල නම් වෙති. දසබලයන්ගේ බලය 'දසබල බල' නම් වේ. ඒ දසබල බලයන් දරන්නේනුයි

'දශබලධාරී', 'දශබල ඤාණ බලධාරී' නම් වේ යන අරුතයි. මේ වචනත්‍රයේ අනන්ත ප්‍රභේද ඇති ඤාණයන්ගේ ප්‍රභේද මුඛ මාත්‍රය ම දක්වන ලදී. එයම ප්‍රඥා යෝග වශයෙන් අභිමංගල සම්මත අර්ථයෙන් **පුරිසාසභෝ** වේ. සන්ත්‍රාස නොවන අරුතින් **පුරිසසීහෝ** වේ. මහත් වූ අර්ථයෙන් **පුරිසනාගෝ** වේ. දැනගන්නා වූ අර්ථයෙන් **පුරිසාජඤ්ඤෝ** වේ. ලෝකයේ කටයුතු නම් ගැල උසුලන අර්ථයෙන් **පුරිසධොරයෙහා** වේ. ඉන් අනතුරුව තේජාදී අනන්ත ඤාණයෙන් ලැබූ ගුණ විශේෂ දක්වනු කැමතිව, ඒ තේජාදී ධර්ම අතරින් අනන්ත වූ ඤාණයේ මූලික බව දක්වමින් අනන්ත ඤාණ ඇත්තේ යැයි පවසා 'අනන්ත තේජෝ' යනාදිය කියන ලදී. එහි **අනන්ත ඤාණෝ** ගුණ වශයෙන් ද ප්‍රභා වශයෙන්ද කෙළවරක් නැති ඤාණය. **අනන්ත තෙජෝ** හික්මවිය යුතු ජන සන්තානයේ මොහඳුර දුරු කිරීමෙන් අනන්ත ඤාණ තේජස් ඇති. **අනන්ත යසෝ** ප්‍රඥා ගුණයෙන් ම ලෝකත්‍රයෙහි පතළ අනන්ත වූ කීර්ති ඝෝෂාව. **අඩ්ඪා** ප්‍රඥා ධන සමෘද්ධියෙන් සමෘද්ධිමත් වූ. **මහද්ධනෝ** ප්‍රඥා ධනවන්තයා විසිනුදු මහත් වූ ප්‍රභාවෙන් මහත්ව පැවතියා වූ ප්‍රඥා ධනය මොහුට ඇත්තේනුයි **මහද්ධනෝ** 'මහාධනෝ' යන පාඨයද යෙදේ. ධනවා පැසසිය යුතු ප්‍රඥා ධන ඇති හෙයින්, නිත්‍ය යුක්ත ප්‍රඥා ධන ඇති හෙයින්, අතිශය ස්වභාවයෙන් ප්‍රඥා ධන ඇති හෙයින් ධනවත්හ. මේ ත්‍රිවිධ අර්ථයෙහි මේ වචනය ශබ්ද විද්‍යාව දන්නෝ කැමති වෙති. මෙසේ භාග්‍යවතුන් වහන්සේගේ ආත්මාර්ථ සාධනය ප්‍රඥා ගුණයෙන් දක්වා නැවත ඒ ප්‍රඥා ගුණයෙන්ම ලෝකාර්ථ සුභසිද්ධිය දක්වනුයේ, **නෙතා** යනාදිය කියන ලදී.

එහි හික්මවීමෙන් සසර නම් වූ භයංකර ස්ථානයෙන් ජනයා මුදවා නිවන නම් ක්ෂේම ස්ථානයට පමුණුවන හෙයින් **නෙතා** වේ. එහි දර්ශන කාලයෙහි ම සංවර විනය, ප්‍රහාණ විනය වශයෙන් හික්මවිය යුත්තන් **විනෙතා** (හික්මවන්නේය) ධර්මදේශනා කරන කාලයෙහි මෙසේ සැකසංකා සිඳින බැවින් අනුනෙතා වේ. සැක සංකා සිඳ දමා පැණවිය යුතු අර්ථ පණවන හෙයින් **පඤ්ඤාපෙතා** වේ. එසේම පැනවූ අර්ථ නිශ්චය කරන හෙයින් **නිජ්ඣාපෙතා** වේ. එසේ නැවත නැවත සිතා බැලූ අර්ථයේ පිළිවෙත් යෙදීම් වශයෙන් **පෙකඛතා** එසේම පිළිපන් ප්‍රතිපත්ති ඵලයෙන් **පසාදෙතා** වේ. **සෝ හි භගවා** යන මෙහි හි කාරය අනතුරුව කියනු ලබන අර්ථයේ හේතු - කාරණා දක්වන නිපාතයකි. **අනුප්පනනසස මගගසස උපපාදෙතා** ස්ව සන්තානයේ පෙර නූපන් විරූ

අසාධාරණ හේතු වූ, ආර්යමාර්ගය බෝමැඩ මුලදී ලෝක හිතවැඩ සඳහා සිය සන්තානයේ උපදවන ලදහ. **අසඤ්ඤජාතසස මගඝසස සඤ්ඤනෙතා** විනේය ජන සන්තානයේ පෙර නොහටගත් ශ්‍රාවක පාරමී ඤාණයට හේතු වූ අග්‍ර මාර්ගය දම්සක් පැවතුම් දෙසුමේ සිට අද දින දක්වාම විනේයජන සන්තානයේ උපදවන ලදහ. ශ්‍රාවක වෙනේය ජනයාගේ සන්තානයේ ද භාග්‍යවතුන් වහන්සේ විසින් වදාළ වචනයෙන්ම ආර්ය මාර්ගය ඉපදවීම නිසාත් භාග්‍යවතුන් වහන්සේ සඤ්ඤනෙතා නම් වන සේක. **අනක්ඛාතසස මගඝසස අක්ඛාතා** අෂ්ට ධර්ම සමන්නාගත වූවන්ගේ අවබෝධය සඳහා, විවරණ දී පෙර නොකී විරූ පාරමිතා මාර්ගයේ 'බුද්ධ වන්නේය'යි යන විවරණ දීම් පමණකින්ම හෝ බෝධි මූලයේ ඉපිදවිය යුතු වූ ආර්ය මාර්ගය දක්වන ලදහ. මේ න්‍යාය තනි තනිව නිවන් දකිනු රිසි බෝසත්වරුන්ගේ විවරණ දීමෙහි ද ලැබෙන්නේමය. **මගඤ්ඤූ** ප්‍රත්‍යවේක්ෂණා වශයෙන් තමා විසින් උපදවන ලද ආර්ය මාර්ගය දන්නා වූ. **මගවිදූ** විනේය ජන සන්තානයේ ඉපිදවිය යුතු ආර්ය මාර්ගයේ දක්ෂ වූ. **මගඝ කොවිදෝ** බෝසත්වරුන්ට කිවයුතු මාර්ගයේ විචක්ෂණයහ. නැතහොත් අභිසම්බෝධි ප්‍රතිපත්තියේ නිරත හෙයින් **මගඤ්ඤූ** වේ. පසේ බුදු ප්‍රතිපත්තිය **මගවිදූ** වේ. ශ්‍රාවක බෝධි ප්‍රතිපත්තිය **මගකොවිදෝ** වේ. නැතහොත් 'මේ ආර්යමාර්ගය කරණ කොටගෙන (සතර) ඕඝ පෙර තරණය කළහ. (අනාගතයෙහි) තරණය කරන්නාහ. (වර්තමානයෙහි) තරණය කරති' යන වචනය අනුව යෝග්‍ය පරිදි, අතීත-අනාගත-වර්තමාන බුදු, පසේබුදු, මහරහත් උතුමන්ට මාර්ග වශයෙන් ද ශූන්‍යතා නිමිත්ත අප්‍රණිහිත මාර්ග වශයෙන් ද, උග්ඝටිතඤ්ඤූ විපචිතඤ්ඤූ නෙය්‍ය පුද්ගලයන්ට මාර්ග වශයෙන් ද යථා ක්‍රමයෙන් මෙහි අර්ථ යෝජනාව කරති. **මගඤානුච පනසස** භාග්‍යවතුන් වහන්සේ ගිය මගම යමින් මෙහි **ච** ශබ්දය හේතු අර්ථයේ නිපාතයකි. මෙයින් භාග්‍යවතුන් වහන්සේගේ මාර්ග උපදවන ගුණයන්ගේ අවබෝධයට හේතුව කියන ලද්දේ වෙයි. **පන** ශබ්දය කරන ලද අර්ථයේ නිපාතයකි. එයින් භාග්‍යවතුන් වහන්සේ විසින් කරන ලද ආර්ය මාර්ග කාරණය කියන ලදී. **පච්ඡා සමනනාගතා** පළමුව ශීලාදී ගුණයන් අනුව ගිය භාග්‍යවතුන් වහන්සේගේ පසුපස **ශීලාදි** ගුණයෙන් යුක්ත වූ මෙසේ (සැරියුත් මහ) තෙරුන් වහන්සේ නූපන් ආර්ය මාර්ගය උපදවන්නේය' යනාදී වශයෙන් භාග්‍යවතුන් වහන්සේගේ සියලු ශීලාදී ගුණ අර්හත් මාර්ගය නිසාම පැමිණි බැවින් අර්හත් මාර්ගයම ඇසුරු කරගෙන ගුණ කථනය කරන ලදී.

ජානං ජානාති දැනගත යුත්ත දැනගනියි. පඤ්චනෙය්‍ය පථයන්හි යමක් සර්වඥතා ඥානයෙන් දතයුතුද එය ප්‍රඥාවෙන් දැනගනී යන අර්ථයයි. **පසසං පසසති** සියල්ල දක්නා හෙයින් දැකිය යුත්ත දකියි. ඒ ඤාණපථයම ඇසින් දුටුවාක් මෙන් ප්‍රඥා ඇසින් දකියි යන අරුතයි. නැතහොත් ඇතැමෙක් විපරීත වූ දෙයක් ගනුයේ ඒ පිළිබඳව නොදනියි. දකිනුයේ ද එය යථාර්ථවත්ව නොදකියි. භාග්‍යවතුන් වහන්සේට මෙසේ නොවේ. භාග්‍යවතුන් වහන්සේ වනාහි යථා ස්වභාවය අවබෝධ කරගනුයේ දැනගත යුතු දහම් දැනගන්නේමය. දැකිය යුතු දහම් දකින්නේමය. උන්වහන්සේ දර්ශනයට පරිණායකයකු වූ බැවින් **චකඛුභූතො** ය. දැනගන්නා ලදී අරුතින් **ඤාණභූතො** ය. විපරීත නොවූ ස්වභාවාර්ථයෙන් පර්යාප්ති ධර්මය පවත්වන හෙයින් හදවතින් සිතා වදනින් නික්මුණු ධර්මමය වූ හෙයින් **ධම්මභූතො** ය. ශ්‍රේෂ්ඨාර්ථයෙන් **බ්‍රහ්මභූතො** ය. නැතහොත් ඇසක් මෙන් වූයේනුයි **ධම්මභූතො** ය. බ්‍රහ්මයකු මෙන් වූයේනුයි **බ්‍රහ්මභූතො** ය. ඒ තථාගතයෝ ධර්මය දෙසූ හෙයින් හෝ පැවැත්වූ බැවින් (ධර්මයේ නිර්මාපකයා) **වත්තා** වේ. නානාප්‍රකාරයෙන් දෙසූ හෙයින් ද වූ බැවින් ද **පවත්තා** වේ. අර්ථය ගෙනහැර දක්වන හෙයින් **නිත්තෙත්තා** වේ. අමාමහ නිවන අවබෝධ කරවනු සඳහා ප්‍රතිපත්ති දේශනා කරන හෙයින් හෝ නිවන ප්‍රකාශවන ධර්ම දේශනාවෙන් අමාමහ නිවනට සත්ත්වයන් පමුණුවන හෙයින් **අමතසසදාතා** වේ. ලෝකෝත්තර ධර්මය උපදවන ලද බැවින්, හික්මවිය යුත්තන්ට ගැලපෙන අයුරින් සුවසේ ලෝකෝත්තර දහම් දීමෙන් ද ධර්මයෙහි ඉසුරු බව, ප්‍රධානත්වය පවත්වන්නේ නුයි **ධම්මසසාමි** වේ.

තථාගත පදය ඉහතින් විස්තර කර ඇත. දැන් **ජානං ජානාති** ආදී වශයෙන් කියන ලද ගුණ, සර්වඥතා ඥානයෙන් විශේෂ කර දක්වනු කැමතිව සර්වඥත්වය ප්‍රකට කරවමින් **නත්ථි** යනාදිය කියන ලදී. මෙසේ වූ ඒ භාග්‍යවතුන් වහන්සේට, පාරමිතාවගේ පින් ඵල බලමහිමයෙන් නිපන් අර්හත් මාර්ග ඤාණයෙන් සියලු ධර්මයන්හි වාසනා ගුණ සහිත මෝහය නැසූ බැවින් මුලා නොවී සියලු දහම් දැනගත් බැවින් **අඤඤාතං** නොදන්නා දෙයක් නම් නැත. එසේම සියලු දහම් මසැසින් මෙන් නැණ ඇසින් (නුවණැසින්) දක්නා ලද බැවින් **අදිටඨං** නොදුටුවක් නම් නැත. ඤාණයෙන් සම්බුද්ධත්වයට පැමිණි හෙයින් **අවිදිතං** නොදත් දෙයක් නම් නැත. නොමුළාව සාක්ෂාත් කරගැනීමෙන් සාක්ෂාත් කරගත් බැවින් **අසචඡිකතං** (සාක්ෂාත් කරනොගත් දෙයක්) නම් නැත. නොමුළා ප්‍රඥාවෙන්

ස්පර්ශ කරන ලද බැවින් ප්‍රඥාවෙන් **අඵස්සිතං** නම් නැත. (ස්පර්ශ නොකළ දෙයක්) නම් නැත. ප්‍රත්‍යුත්පන්න (වර්තමාන) කාලය හෝ ධර්මය හෝ **පච්චුපන්නං** යනු වේ. **උපාදාය** රැගෙන, ඇතුළත් කර යන අරුතයි. උපාදාය වචනයෙන් ම කාල විනිර්මුක්ත නිවණ ද ගන්නා ලද්දේමය. අතීතාදී වචන ද නැති ආදී වචනයෙන් හෝ 'සබ්බ' යනාදී වචනවලින් හෝ ගථා අර්ථ ගතයුතුයි. **සබ්බ ධම්මා** සියලු සංඛත අසංඛත ධර්ම එකතුව. **සබ්බාකාරෙන** සියලු ධර්මයන් අතර එක් එක් ධර්මයෙක්හි අනිත්‍යාකාරය සියලු ආකාරයන් එක්කර ගැනීම යි. **ඤාණමුඛෙ** ඤාණයට අභිමුඛයේ (ඉදිරියේ). **ආපාථං ආගච්ඡන්ති** රැස්වීමට පැමිණෙති. 'ජානිතබ්බ' යන පදය 'ඤෙය්‍යං' යන පදයේ අර්ථ විවරණය සඳහා කියන ලදී.

අත්තත්ථෝ වා යනාදියෙහි 'වා' ශබ්දය සමුච්චයාර්ථයේ යෙදේ. **අත්තත්ථෝ** යනු ආත්මාර්ථයයි. තමාගේ යහපතයි. **පරත්ථෝ** යනු සෙසු තුන් ලෝකයාගේම යහපත. **උභයත්ථෝ** තමාගේ ද අනුන්ගේ ද යනුවෙන් එක්වරම මේ දෙපිරිසේම යහපත සැලසීම. **දිට්ඨධම්මිකෝ** දුටු දහමෙහි නියුක්ත, මෙලොව ප්‍රයෝජන දෙන අර්ථය. පරලොව නියුක්ත, පරලොව ප්‍රයෝජන ඇති **සම්පරායිකෝ** වේ. **උත්තානතෝ** යනාදියෙහි ව්‍යවහාර වශයෙන් කිවයුතුය. සුවසේ වැටහෙන හෙයින් **උත්තානෝ** වේ. ව්‍යවහාරය ඉක්මවා පැවතිය යුතු, ශූන්‍යතා ප්‍රතිසංයුක්ත දුකසේ අවබෝධ කරගත යුතු හෙයින් **ගම්භීරෝ** **ලොකුත්තරෝ** වේ. අතිශයින් ආර්ය මාර්ගඥේම පවතින හෙයින් ගූළ්හෝ වේ. අනිත්‍යාදී මෝහ සනාන්ධකාරයෙන් වැසුණු හෙයින් **පටිච්ඡන්නෝ** වේ. අල්ප වූ ව්‍යවහාරයෙන් කෑමති පරිදි නොගෙන අදහසට පැමිණවිය යුතු හෙයින් නෙය්‍යාර්ථයෙන් නෙය්‍යෝ වේ. බහුල ව්‍යවහාරයෙන් කිවයුතු වචන මාත්‍රයෙන්ම අදහසට පැමිණවූ හෙයින් නීත වේ. ඉතා පිරිසිදු සීල සමාධි විදර්ශනා අර්ථ ඇති, තදංග විෂ්කම්භන අර්ථයෙන් වරදින් මිදුණු හෙයින් **අනවජ්ජා** වේ. කෙලෙස් සහමුලින් සිඳ දැමීමෙන් ආර්ය මාර්ගාර්ථයෙන් **නික්කලෙසෝ** වේ. කෙලෙසුන්ගෙන් පිරිසිදු කරන බැවින් ආර්ය ඵල අර්ථයෙන් **වොදානෝ** වේ. සංඛත, අසංඛත ධර්මයන්හි අග්‍ර ධර්ම වන බැවින් නිර්වාණය පරමාර්ථයයි. **පරිවත්තති** යනු බුද්ධ ඤාණයට විෂය වන හෙයින් බාහිර නොවූ හෙයින්, බුද්ධ ඤාණය තුල පැතිරී හෝ හාත්පස හෝ අලංකාර කර හෝ විශේෂයෙන් පවතීනුයි පරිවත්තතියි. **සබ්බං කාය කම්මං** ආදියෙන් භාග්‍යවතුන් වහන්සේගේ ඤාණ විෂයතාව දක්වයි. **ඤාණානු පරිවත්තති** ඤාණය

අනුව පවතියි. ඤාණ විරහිතව නොපවතියි යන අර්ථයයි. **අපපතිහතං** නිරාවරණතාව දක්වයි. නැවත සර්වඥත්වය උපමාවකින් දක්වනු කැමතිව **යාවතකං** යනාදිය කියන ලදී. එහි දතයුතුයැයි **ඤෙය්‍යං**, දතයුතු දෙය අවසානයට ම, කෙළවරටම දත් බැවින් **ඤෙය්‍ය පරිවනතිකං**. අසර්වඥයන්ට වනාහි ඤෙය්‍යාවසානයක් නම් නැත. **ඤාණ පරියනතිකං** යනාදියෙහි ද මේ ක්‍රමයමයි. පළමු යුගලයෙහි පැවසූ අර්ථයම මේ යුගලයෙන් විශේෂ කර දැක්විණි. තෙවැනි යුගලයෙන් ප්‍රතිශේධ වශයෙන් වලක්වා දැක්වීය. මෙහි ද ඤෙය්‍ය ඤාණයට පථ වන බැවින් **ඤෙය්‍ය පථෝ. අඤඤමඤඤ පරියනතටයායිනෝ** ඤෙය්‍ය ද ඤාණය ද ඔවුනොවුන් මැඩපවත්වා සිටීමෙන්, ඔවුනොවුන්ගේ කෙළවරෙහි සිටින ස්වභාවයෙන් **ආවජජන පටිබදධා**. මනෝද්වාරාවර්ජනයට අයත් සිත, ආවර්ජිතයට අනතුරුව ම (වහාම) දැනගනියි යන අර්ථයයි. **ආකංඛන පටිබදධා** රුචියට අයත්ය. ආවර්ජනයට අනතුරුව ජවන ඤාණයෙන් දැනගනියි යන අර්ථයයි. සෙසු නිද්දේස පද මේ දෙපදයේ සුදුසු පරිදි අර්ථ ප්‍රකාශනයට කියන ලදී. **ආසයං ජානාති** මෙහි ආසය යනු සිතේ පවත්නා ආකාරයයි. කාමාදියෙන් හෝ නෙක්ඛම්මාදියෙන් හෝ වඩන ලද මිච්ඡාදිට්ඨි හෝ සම්මාදිට්ඨි සන්තානයට මේ තවත් වචනයකි. ඒ සන්තානයේ රහසිගතව, අප්‍රකටව පවතීනුයි **අනුසයා** බලවත් වූ කාමරාගාදියට මේ තවත් නමකි. **අනුසයං ජානාති** අනුසය කථාව ඉහත කියන ලද පරිදිමය. **චරිතං** යනු පෙර කරන ලද කුසලයන්ගේ කුසල කර්ම. **අධිමුත්තිං** කුසලයේ හෝ අකුසලයේ හෝ පවතින සිත අත්හැරීම. **අපපරජකෙඛ** යනු ප්‍රඥාමය වූ ඇසෙහි අල්ප වූ රාගාදී රජස් මොවුන්ට ඇත්තේනුයි අපපරජකඛ නම් වේ. නැතහොත් අල්ප වූ රාගාදී රජස් මොවුන්ට ඇත්තේනුයි අප්පරජක්ඛ නම් වේ. නැතහොත් අල්ප වූ රාගාදී රජස් මොවුන්ට ඇත්තේනුයි අප්පරජක්ඛ නම් වේ. **මහාරජකෙඛ** යනු ඤාණමය ඇසෙහි මහත් වූ රාගාදී රජස් ඇත්තේනුයි මහාරජකඛ නම් වේ. නැතහොත් මහත් වූ රාගාදී රජස් මොවුන්ට ඇත්තේනුයි හෝ මහා රජකඛ නම් වේ. **තිකඛින්ද්‍රියෙ මුදින්ද්‍රියෙ** තියණු වූ ශ්‍රද්ධාදී ඉන්ද්‍රිය මොවුන්ට ඇත්තේනුයි තිකඛින්ද්‍රිය නම් වේ. මෘදු වූ ශ්‍රද්ධාදී ඉන්ද්‍රිය මොවුන්ට ඇත්තේනුයි මුදින්ද්‍රිය නම් වේ. **සවාකාරෙ දවාකාරෙ** සුන්දර වූ ශ්‍රද්ධාදී ආකාර කොට්ඨාස මොවුන්ට ඇත්තේනුයි 'ස්වාකාර' නම් වේ. නින්දිත, ගරහිත, අශ්‍රද්ධාදී ආකාර කොට්ඨාසයෝ මොවුන්ට ඇත්තේනුයි 'ද්වාකාර' නම් වේ. **සුවිඤඤා පයෙ දුවිඤඤාපයෙ** යමෙක් කියූ කාරණය සළකා

බලත් ද සුවසේ අවබෝධ කරගැනීමට හැකිවෙත් ද ඔවුහු 'සුවිඤ්ඤාපය' නම් වේ. ඊට විරුද්ධ වූයේ 'දුවිඤ්ඤාපය' නම් වේ. **භබ්බාභබ්බෙ** භබ්බයන්ද අභබ්බයන්ද, ආර්ය ජාතියේ වෙති. උපදිත්නුයි 'භබ්බ' නම් වේ. සමීපයේ පවතින හෙයින් වර්තමාන වචනයකි. වන්නෝය. උපදින්නෝය යන අරුතින් ද භබ්බ නම් වේ. 'බඳුන් වූ' යන අරුතයි. යමෙක් ආර්ය මාර්ගාවබෝධය ලැබීමට යෝග්‍ය වූ උපනිශ්‍රය සම්පත්තියෙන් යුක්ත ද ඔවුහු 'භබ්බ' නම් වෙති. මෙකී ක්‍රමයට විරුද්ධ වූවෝ 'අභබ්බ' නම් වෙති. **සත්තෙ පජානාති** යනු රූපාදී අරමුණු එළඹී කල්හි ලග්න වූ (ඇලුණු) සත්ත්වයන් දැනගනියි. **සදෙවකො ලොකො**, දෙවියන් සහිත වූයේ සදේවක නම්. මාරයා සමග **සමාරකො**, බ්‍රහ්මයන් සමග **සබ්‍රහ්මකො** ශ්‍රමණ බ්‍රාහ්මණයන් සමග **සස්සමණ බ්‍රාහමණි** ප්‍රජාව වූ බැවින් **පජා** දෙව් මිනිසුන් සමග **සදෙවමනුස්සා 'පජා'** යනු සත්ත්ව ලෝකයාට යෙදුණු තවත් නමකි. මෙහි සදේවක වචනයෙන් කාමාවචර දිව්‍ය ලෝක (මුල්) පහේ දේව සමූහයා අදහස් විය. සමාරක වචනයෙන් සයවන කාමාවචර දිව්‍ය ලෝකයේ දේව සමූහයා අදහස් විය. සබ්‍රහ්ම යන වචනයෙන් බ්‍රහ්ම කායිකාදී බ්‍රහ්ම සමූහයා අදහස් විය. සස්සමණ බ්‍රාහ්මණ වචනයෙන් සසුනට සතුරු වූ පසමිතුරු වූ ශ්‍රමණ බ්‍රාහ්මණ සමූහයා ද සන්සිඳ වූ පවු ඇති, බහා තැබූ පාප ධර්ම ඇති ශ්‍රමණ බ්‍රාහ්මණ සමූහයාද අදහස් විය. පජා වචනයෙන් සත්ත්ව ලෝකයාම අදහස් විය. සදෙවමනුස්ස වචනයෙන් සම්මුති දෙවියන් ද අවශේෂ මනුෂ්‍ය සමූහයා ද අදහස් විය. මෙසේ මෙතැනදී යෙදූ මුල් පද තුනින් අවකාශ ලෝකයා ද ප්‍රජා වශයෙන් පද දෙකකින් සත්ත්ව ලෝකයාද ගන්නා ලදැයි දතයුතුයි.

මේ තවත් ක්‍රමයකි. 'සදේවක' වචනයෙන් අරූපාවචර ලෝක අදහස් වේ. 'සමාර' වචනයෙන් කාමාවචර දිව්‍යලෝක අදහස් වේ. 'සබ්‍රහ්ම' වචනයෙන් රූපාවචර බ්‍රහ්මලෝක අදහස් වේ. සස්සමණ බ්‍රාහ්මණ ග්‍රහණයෙන් සිවුපිරිස වශයෙන් සම්මුති දෙවියන් සහිතව මනුෂ්‍ය ලෝකයා හෝ අවශේෂ සත්ත්ව ලෝකයා හෝ අදහස් වේ. තවද මෙහිදී 'සදේවක' වචනයෙන් උත්කෘෂ්ට පරිච්ඡේදයෙන් සියලුම ලෝකය බුද්ධ ඤාණයෙහි ඇතුලත්ව පරිවර්තනය වන බව දක්වයි. ඉක්බිති මේ වසවත් මාරයා මහානුභාව සම්පන්නය. සදෙව් ලොවෙහි ම ඉසුරුමත් බව (ප්‍රධානත්වය) දරයි. ඔහුත් මේ බුද්ධ ඤාණයෙහි ඇතුලත් වේද, යන විමතිය දුරුකරනු සඳහා 'සමාරකො' යැයි කියන ලදී. මේ මහා බ්‍රහ්මයාද මහානුභාව

සම්පන්නය. ඔහු එක ඇඟිල්ලෙන් සක්වළ එක් දහසක් ආලෝකමත් කිරීමට සමර්ථ වේ. ඇඟිලි දෙකකින් සක්වළ දෙදහසක් -පෙ- දසැඟිල්ලෙන් සක්වල දස දහසක් ආලෝකය පතුරුවයි. අනුත්තර වූ ධ්‍යාන සමවත් සුවයද විඳියි. කිම මේ මහා බ්‍රහ්මයාත් බුද්ධ ඤාණයට ඇතුලත් වන්නේද? යන විමතිය දුරුකරනු සඳහා 'සබ්‍රහ්මකො' යන වදන කියන ලදී. ඉක්බිති මේ බොහෝ ශ්‍රමණ බ්‍රාහ්මණයෝ, බුදුසසුනට විරුද්ධ වූවෝ වෙත් ද ඔවුහු ද බුද්ධඤාණයේ ඇතුලත් වේද, යන විමතිය දුරුකරනු සඳහා 'සස්සමණ බ්‍රාහ්මණි පජා' යැයි කියන ලදී. මෙසේ උත්කෘෂ්ටයන්ගේ බුද්ධඤාණයෙහි ඇතුලත් වන බව පවසා, අනතුරුව සම්මුති දෙවියන්ද අවශේෂ මනුෂ්‍යයන් ද ගෙන, ඉතා උසස් (උත්කෘෂ්ට) වෙන්කිරීම් වශයෙන් සෙසු සත්ත්ව ලෝකයා ද බුද්ධඤාණයෙහි ඇතුලත්ව පෙරළෙන බවප්‍රකාශ කරමින් සදේවමනුස්සා යන්න කියන ලදී. මේ දැක්වූයේ මෙහි අනුසන්ධි ක්‍රමයයි.

පොරාණාචාර්යවරු මෙසේ කියති. **සදෙවකො** යනු දෙවියන් සමග අවශේෂ ලෝකයායි. **සමාරකො** යනු මාරයා සහිත අවශේෂ ලෝකයායි. **සබ්‍රහ්මකො** බ්‍රහ්මයන් සමග අවශේෂ ලෝකයායි. මෙසේ සියලුම ත්‍රිවිධ ලෝකයට අයත් සත්ත්වයන් තුන් ආකාරයකින්, ත්‍රිවිධ පදයන්හි බහා නැවත දෙපරිද්දෙකින් සංග්‍රහ කරමින් **සස්සමණබ්‍රාහ්මණි පජා සදෙව මනුස්සා** යි කියන ලදී. මෙසේ මේ පද පහෙන් ඒ ඒ ආකාරයෙන් ත්‍රෛධාතුක බවම හාත්පසින් ගන්නා ලද්දේ වේ. **අනතමසො** උපරිම භාවයෙන් **තිමිතිමිංගල** යන මෙහි තිමි යනු එක්තරා මත්ස්‍ය වර්ගයකි. තිමියකු ගිලීමට සමර්ථ වූ ඉතා මහත් ශරීර ඇති තිමිංගල නම් මත්ස්‍ය වර්ගයක් ද ඇත. මේ තිමිංගලයකු ද ගිලීමට සමර්ථ වූ යොදුන් පන්සීයක් පමණ වූ ශරීරයක් ඇති තිමිතිමිංගල නම් මත්ස්‍ය වර්ගයක් ද ඇත. මෙහි ජාති ග්‍රහණය නිසා ඒකවචනයෙන් තැබූ බව දතයුතුයි.

ගරුළං වෙනතෙය්‍යං යන මෙහි 'ගරුළො' යනු ජාති වශයෙන් තැබූ නමයි. 'වෙනතෙය්‍ය' යනු ගෝත්‍ර නාමයයි. වෛනතේය ගුරුළු රජහු. **පදෙසෙ** එක් පෙදෙසක. **සාරිපුත්ත සමා** සියලු බුදුවරුන්ගේ ධර්ම සේනාපති තෙරුන් වහන්සේ අදහස් කරමින් මෙය කී බව දතයුතුයි. සෙසු ශ්‍රාවකයන් අතර දම් සෙනෙවි තෙරුන්ට සමානයෙක් නම් නැත. එනිසා කියන ලදී. 'මහණෙනි, මගේ මහා ප්‍රඥා සම්පන්න භික්ෂු ශ්‍රාවකයන් අතරින් සාරිපුත්ත අග්‍ර වේ' යනුයි. අට්ඨකථාවෙහි ද කියන ලදී.

ලොකනාථො යථෙවාන යෙ චඤ්ඤෙ සන්ති පාණිනො
පඤ්ඤාය සාරිපුත්තසස කලං නාගඝන්ති සොලසිං

ලෝකනාථයන් වහන්සේ හැර සෙසු තුන්ලොවෙහිම වසන සත්ත්වයෝ සාරිපුත්ත තෙරුන්ගේ ප්‍රඥාවෙන් සොළොස් කලාවෙන් එකකටවත් (දාසයෙන් එකකටවත්) සම නොවෙති.

එරිතවා යනු බුද්ධ ඤාණය සියලු දෙව් මිනිසුන්ගේ ප්‍රඥාවට පැමිණ සිටීම් වශයෙන් ඔවුන් කෙරෙහි ප්‍රඥාව පතුරුවා සිටියි. **අභිභවිත්වා** සියලු දෙව් මිනිසුන්ගේ ද ප්‍රඥාව ඉක්මවා ඒවාට විෂය වූ සියල්ල අභිභවනය කර සිටියි යන අර්ථයයි. පටිසම්භිදාප්පකරණයෙහි 'අතිඝංසිත්වා' යි පාඨයක් එයි. හප්පවා, පතුරුවා යන අර්ථයයි. **යෙපිතෙ** යනාදියෙන් මෙසේ බුද්ධඤාණය පතුරුවා අභිබවා සිටීමට ප්‍රත්‍යක්ෂ කාරණා දක්වයි.

එහි **පණ්ඩිතා** යනු පාණ්ඩිත්‍යයෙන් යුක්ත වූ. **නිපුණ** සියුම්, තියුණු බුද්ධියකින්, සියුම් අර්ථාන්තරයන්හි විනිවිද යෑමට සමත් වූ. **කත පරප්පවාදා** අනුන්ගේ වාදයන් දැනීම මෙන්ම අනුන් සමග කරන ලද වාදයන්හි පළපුරුදු බව ඇති. **වාලවෙධිරූපා** වල්විදුනා දුනුවායන් සමවූ. **වොභින්දනතා මඤ්ඤවරනති පඤ්ඤාගතෙන දිට්ඨගතානි** 'ඉතා සියුම් කෙස් රොදට විදින්නාක් මෙන් අනුන්ගේ දෘෂ්ටි ගමනයත් තමාගේ ප්‍රඥා ගමනයෙන් බිඳින්නාක් මෙන් හැසිරෙති' යන අර්ථයයි. නැතහොත් 'ගූථගතං මුත්තගතං' යනාදියෙහි මෙන් ප්‍රඥාව වූයේ ම පඤ්ඤාගතං වේ. දෘෂ්ඨිය වූයේම **දිට්ඨගතානි. පඤ්හා අභිසංඛරිත්වා අභිසංඛරිත්වා** ප්‍රශ්න දෙපදයක්, තුන්පදයක්, සිවුපදයක් ලෙස සකසාගෙන, ඒ ප්‍රශ්නයන්ගේ ඉතා බහුල භාවයෙන් සියල්ල සංග්‍රහ කරනු සඳහා දෙවරක් කියන ලදී. **ගුළ්හානි ච පටිච්ඡන්නානි ච අත්ථජාතානි ච** යනු සෙසු පාඨයයි.

ඔවුන්ගේ හික්මීම දැක, 'තමා විසින් සකසාගෙන ආ ප්‍රශ්න විචාරත්වා'යි බුදුහු අවසර දෙන සේක. ඒ අවසරයෙන් ඔවුහු ප්‍රශ්න විමසති. සෙස්සන්ට තම ප්‍රශ්න ඇසීමට අවසරයක්වත් නොදී, බුදුහු ඔවුන් පැමිණිවිටම ධර්මය දේශනා කරන සේක. එනිසා කියන ලදී. 'අපි ශ්‍රමණ භවත් ගෞතමයන් වෙත ගොස් මේ ප්‍රශ්නය විමසන්නෙමු. එසේ ඇසුවා වූ අපගේ ප්‍රශ්නය ශ්‍රමණ භවත් ගෞතමයෝ මෙසේ විසඳති.

එවිට අපි ඔහුට මෙසේ වාද ආරෝපණය කරන්නෙමු. ඉදින් මෙසේ පිළිතුරු දුනහොත් ඔහුට විරුද්ධව මේ ආකාරයෙන් අපි වාදාරෝපණය කරන්නෙමු' යනුවෙන් අන්‍යාගමිකයෝ මුලදීම ප්‍රශ්න හා පිළිතුරු සකස් කරගනිති. මෙසේ සකසාගත් ප්‍රශ්න රැගෙන ශ්‍රමණ භවත් ගෞතමයන් වෙත යන ඔවුන් පිළිගන්නා බුදුපියාණෙනි, දැහැමි කථාවෙන් ඔවුන්ට කරුණු දක්වති. සමාදන් කරවති. උත්තේජනයක් ඇතිකරති. සතුටට පත්කරති. මෙසේ ශ්‍රමණ භවත් ගෞතමයන් විසින් කරුණු දක්වන ලද, සමාදන් කරවන ලද, උත්තේජනයට පත්කරන ලද, සතුටට පත්කරන ලද ඔවුහු සකසාගෙන ආ එකදු ප්‍රශ්නයක්වත් ගෞතමයන්ගෙන් නො අසති. එහෙයින් වාදාරෝපණය කිරීමක් කෙසේ සිදුවේද? ඔවුහු ඒකාන්තයෙන්ම ශ්‍රමණ භවත් ගෞතමයන්ගේ ශ්‍රාවක බවට පැමිණෙති.' එනිසා ඇතැම්හු ප්‍රශ්න නො අසති.

භාග්‍යවතුන් වහන්සේ පිරිස් මැද සිට ධර්මදේශනා කරන සේක්, එම පිරිසේ අදහස් බලන සේක. ඉදින් එවිට 'මේ පඬිවරු සැඟවුණු රහසිගත ප්‍රශ්නයක් ඔඩොක්කුවේ තබාගෙන පැමිණියහ'යි දකින්නේ නම්, ඔවුන් මුවින් නොවිචාරණ ලද්දේම, ප්‍රශ්න විචාරීමේ දෝෂ මෙපමණකි. විසඳීමේ මෙපමණකි. අර්ථපද අක්ෂර මෙපමණකි. මේ ප්‍රශ්නය විචාරමින් මෙසේ විමසන්නේ නම් යෙහෙකි. විසඳනුයේ මෙසේ විසඳන්නේය යනුවෙන් ඔඩොක්කුවේ වූවක් මෙන් සකස්කර පැමිණි ප්‍රශ්නය දැහැමි දහම් කථාව අතුරටම බහා ඒ ප්‍රශ්නයට බුදුහු පිළිතුරු දෙති. ඒ පඬිවරු දෙසුම අවසානයේදී 'අපි සකසාගෙන පැමිණි ප්‍රශ්න නොවිමසී ඉතා උතුම්ය. ඉදින් අපි ඒ ප්‍රශ්න විමසුවේ නම් ශ්‍රමණ භවත් ගෞතමයෝ අපව කිසිදු පිහිටක් නැති අසරණයන් කර දමති'යි සතුටට පත් වෙති. තවද බුදුවරු ධර්මදේශනා කරනවිට පිරිසට මෙත් සිත පතුරුවති. මෙත් සිත පතුරුවා සිටින දසබලයන් වහන්සේ කෙරෙහි මහජනයාගේ සිත පහදියි. බුදුවරු නම් රූපශ්‍රීයෙන් අගතැන්පත් වූවෝ වෙති. දර්ශන සම්පන්නයහ. මධුර ස්වර ඇත. මෘදු වූ දිවක් ඇත. මැනවින් ස්පර්ශ වූ දන්තාවරණ ඇත. අමෘතයෙන් හදවත තෙමන්නාක් මෙන් දහම් දෙසති. මෙසේ මෙත්සිත් පැතිරවීමෙන් ප්‍රසන්න වූ සිත් ඇති ඔවුන්ට මෙසේ සිත් වෙයි. මෙබඳු වූ දෙයාකාරයක් නැති, හිස් නොවූ, නිවනටම යොමු වූ කථා භාග්‍යවතුන් වහන්සේ සමග එරෙහි වීමට, ඊට විරුද්ධ කථාවක් කීමට හෝ අසමත් වේ' යනුයි උන්වහන්සේ පිළිබඳ ඇතිවූ ප්‍රසන්න

භාවයෙන්ම තමා සකසාගෙන ආ ප්‍රශ්න නො අසති. **කථිතා විසඝජ්ජිතා වා** 'මෙසේ නුඹලා විචාරවු'යි නොවිමසූ ප්‍රශ්නයන්ගේ උච්චාරණයෙන්ම ඒ ප්‍රශ්න භාග්‍යවතුන් වහන්සේට කියන ලද්දේම වේ. එය විසඳිය යුතු පරිදිම විසඳූ හෙයින් විසඳන ලද්දේම වේ. **නිද්දිට්ඨකාරණා** මේ කාරණයෙන්, මේ හේතුවෙන් මෙසේ වෙතියි මෙසේ සහේතුකව විසඳීමෙන් භාග්‍යවතුන් වහන්සේ ඒ ප්‍රශ්න නිර්දිෂ්ඨ කරන ලද්දේම වේ. **උපකඩ්ඪිතකාව තෙ භගවතො සමපජ්ජනති** ක්ෂත්‍රිය පඬිවරු ආදීහු ඒ ප්‍රශ්න බුදුරදුන් විසින් විසඳූ පමණින් ම, උන්වහන්සේගේ සමීපයෙහි තම මත ඉවත දමා බහා තබා බුද්ධශ්‍රාවක බවට හෝ පැමිණෙති. උපාසක භාවයට හෝ පැමිණෙති යන අර්ථයයි. ශ්‍රාවක සම්පත්තියට හෝ උපාසක සම්පත්තියට පැමිණෙතියි කියන ලදී.

අථ අනතුරුව යන අර්ථයයි. ඔවුන්ගේ බුදුදහම පිළිගැනීමෙන් ශ්‍රාවක බවට පත්වීමෙන් අනතුරුව යන අර්ථයි. **තත්‍ථ** ඒ ස්ථානයෙහි, මෙකරුණෙහි ලා. **අතිරොචති** අතිශයින් බබළන සේක. ප්‍රකාශයට පත්වන සේක. **යදිදං පඤ්ඤාය** යම් ඒ භාග්‍යවතුන් වහන්සේගේ මහා ප්‍රඥාවක් වේද එය. ඒ භාග්‍යවතුන් වහන්සේගේ මහා ප්‍රඥාවම, භාග්‍යවතුන් වහන්සේම අතිශයින් බබළයි යන අරුතයි. **ඉති** ශබ්දය කාරණාර්ථයේ නිපාතයකි. මෙකරුණෙන් යන අර්ථයයි. සෙසු පදයන්ගේ අර්ථ ඉතා ප්‍රකටය.

අටවන පසුර සූත්‍ර නිද්දේස වර්ණනාව නිමියේ ය.

9.

නවවන මාගන්දිය සූත්‍ර නිද්දේසයේ පළමු ගාථාවේ අර්ථ පළමුව දැක්වේ. අජපාල නුගරුක මුලදී නානාවිධ රූප මවාගෙන දැඩි කාමුකව පැමිණි මාර දූවරු වන තණ්හා, අරති, රගා දැකීමෙන් මෙවුන්දම් සෙවීමෙහි ස්වල්ප වූද කැමැත්තක් වත් ඇති නොවිණි. කිම දැරියගේ මේ මලමුත්‍රාවලින් පිරි සිරුර දැක කවර කරුණකින් රාගයක් ඇතිවේද? මැය සර්වප්‍රකාරයෙන්ම පයිනුදු ස්පර්ශ කරන්නට නොකැමැත්තෙමි. කෙසේනම් ඇය සමග සංවාස කෙරෙම්දැයි වදාළහ. **මුත්තපුණ්ණං** ඍතුවීම් වශයෙන් මුත්‍රාසය පිරී සිටි මුත්‍රවලින් යුක්ත වූ. **කරීස පුණ්ණං** පක්වාශය නම් වූ යටින් නාභියේ සිට පිට කටු මුල අතර වූ අතුණු කෙළවර පිහිටි උසින් අඟල් අටක් පමණ වූ (හුණ බටයක් බඳු වූ) චර්මයෙන් පිරුණු **සෙම්හ පුණ්ණං** උදර පටලයේ පිහිටි එක් පාත්‍රයක් පිරෙන තරමේ සෙමින් පිරුණු. **රුහිර පුණ්ණං** යකනය (අක්මාව) පිහිටි තැන යට කොටස පුරා පාත්‍රයක් පිරෙන තරම්ව, හදවත පපුව යන මේවා මතුයෙහි ටික ටික වෑස්සෙමින් වකුගඩු - හදවත - අක්මා - පපුමස තෙමමින් පවතින සන්නිචිත ලෝධාතුව සහ කෙස්-ලොම්-නිය-දත්හි මස් නැති තැන් හා තද වියලුණු සම හැර සෙසු ධමනිජාල අනුසාරයෙන් සියලු උපාදින්නක ශරීරය පතුරුවා සිටි, සංසරණ ලේ ධාතුව යනුවෙන් දෙවැදෑරුම් ලේ ධාතුවෙන් පිරුණු. **අට්ඨිසංඝාටං** මුලු සිරුරෙහි ම යට පයැඟිලි ඇටයේ සිට හිස්කබල දක්වා තුන්සියයකට වැඩි වශයෙන් ඇති ඇටවලින් යුක්ත. **නහාරු සම්බන්ධං** මුලු සිරුරේම ඇට සම්බන්ධ කරමින් සිටි නවසීයක් පමණ නහරවැලින් යුතු. ඒ නහරවලින් සම්බන්ධ වූ වෙළාගත්.

රුහිර මංසාලෙපනං සංසරණ ලේ ධාතුවෙන් ද තුන්සීයකට වැඩි ඇට වසාගෙන පිහිටි මාංශපේශි නවසීයකින් යුක්ත වූ ශරීරය. **චම්මවිනද්ධං** මුලු සිරුරම වෙළාගෙන, පණුවෙකුගේ මෙන් ප්‍රකට වූ, මතුපිට සිවියෙන් යට පිහිටි සම. ඒ සමින් වෙළාගත්, එතුණු 'චම්මාවනද්ධං' යන පාඨයද යෙදේ. **ඡවියා පටිච්ඡන්නං** ඉතා සියුම් සිවියෙන් වැසුණු, වසාගෙන සිටි.

ඡිද්දාවඡිද්දං නානාප්‍රකාර සිදුරු. **උගඝරං** ඇස් මුව ආදියෙන් ඉතිරෙන **පගඝරං** යටභාගයෙන් වැගිරෙන. **කිමිසංඝ නිසෙවිතං** සුචිමුඛාදී

නානාප්‍රකාර පණු සමූහයාගෙන් යුක්ත වූ. **නානාකලිමල පරිපූරං** අනේකවිධ අශුචි කොටස්වලින් පිරුණු.

ඉක්බිති මාගන්දිය බමුණා 'පැවිද්දෝ නම් මානුෂීය කාමයන් හැරදමා දිව්‍යමය කාමයන් ප්‍රාර්ථනා කරමින් පැවිදි වෙති. මෙතෙම මේ ස්ත්‍රීරත්නය වැනි දිව්‍යමය කාමයන් ද කැමති නොවේ. මොහුගේ දෘෂ්ටිය කෙසේද?'යි අසනු කැමතිව දෙවන ගාථාව කියන ලදී.

එහි **එතාදිසං වෙ රතනං** යනුවෙන් දිව්‍ය ස්ත්‍රී රත්නය සඳහා කියයි. **නාරී** තම දුවණිය සඳහා. **දිට්ඨිගතං සීලබබතානුජ්ජිතං** දෘෂ්ටිය ද සීලව්‍රතය ද ජීවිතය ද භවෝත්පත්තිය ද කියන්න. **කීදිසං** කෙබඳුද? තමාගේ භවෝත්පත්තිය හෝ කෙබඳුදැ'යි කියන්න.

ඉන් අනතුරුව එන ගාථා දෙක පැණ විසඳුම් න්‍යායෙන් (නයින්) පවත්වන ලද බැවින් ප්‍රකට සම්බන්ධය ඇත්තේමය. ඒ ගාථා දෙකින් පළමු ගාථාවේ සංක්ෂිප්තාර්ථය මෙසේය. මාගන්දිය බමුණ, දෙසැට මිසදිටු දහම් මනාව විමසා බැලූ ඒ මට 'මෙයම සත්‍යය. සෙස්ස බොරුය'යි පැවසීමට සුදුසු, දැඩිව ගතයුතු එකදු දෘෂ්ටියක් නැත. විද්‍යමාන නොවේ. කවර හෙයින්ද? මම වනාහි දෘෂ්ඨීන්හි ආදීනව දක්නෙම්, කිසිදු දෘෂ්ටියක් දැඩිව නොගෙන චතුරාර්ය සත්‍යය සොයනුයෙම්, අධ්‍යාත්මයේ වූ රාගාදී කෙලෙස් සන්සිඳුවන හෙයින් 'අජ්ඣත්ත සන්ති' නම් වූ නිවන ම දුටුවෙමි. **ආදීනවං** යනු උපද්‍රව. **සබබදුකඛං** කායික දුකින් ඇතිවන සියලු දුක්. **සවිඝාතං** චෛතසික දුකින්. **සඋපායාසං** දැඩි ආයාස සහිත **සපරිලාහං** පරිදාහ සහිත ය. **න නිබ්බිදාය** සංසාර නම් වර්තයෙහි නොපැවැත්ම, නිර්වේදය පිණිස නොවේ. **න විරාගාය** සංසාර වර්තයෙහි විරාගය පිණිස නොවේ. **න නිරොධාය** සංසාර වර්තයෙහි නිරෝධය පිණිස නොවේ. **න උපසමාය** සසර වර්තයේ ඇතිවන කෙලෙස් සන්සිඳවීම සඳහා නොවේ. **න අභිඤ්ඤාය** සංසාර වර්තයේ නැවැත්ම අභිඥානය සඳහා නොවෙයි. **න සමෙබාධාය** කෙලෙස් නිද්‍රාවට පත්වීමෙන් සංසාර වර්තයෙන් (මිදීමට) මනා අවබෝධය පිණිස නොවේ. **න නිබබාණාය** අමෘත මහා නිර්වාණය පිණිස නොවේ. මෙහිදී 'න නිබ්බිදාය' යනු විදර්ශනාවයි. **විරාගාය** මාර්ගයයි. **නිරොධාය උපසමාය** යනු නිවනයි. 'අභිඤ්ඤාය සමෙබාධාය' යනු මාර්ගයයි. **නිබබාණාය**' යනු නිවනමය. මෙසේ එකම තැනකදී (වදනකින්) විදර්ශනාව, ත්‍රිවිධ මාර්ගය, ත්‍රිවිධ නිර්වාණය කියන ලදී යයි

මෙසේ ව්‍යවස්ථා කථාව දතයුතුයි. පර්යාය වශයෙන් මේ සියලුම වදන් මාර්ගයට ද නිවනට ද යෙදූ සමාන වචන වේ. **අජ්ඣත්තං රාගස්ස සන්තිං** අධ්‍යාත්මයේ රාගය ශාන්ත වූ නිවුණු බැවින් 'අජ්ඣත්ත සන්ති' නම් වූ නිවනම බැලීය. **දොසස්ස සන්ති** යනාදියෙහි ද මේ ක්‍රමයෙන්ම අර්ථ දතයුතුයි.

පවිචිනනෙතා නිද්දේසයේ උදෙසන පදයයි. **විචිනනෙතා** සත්‍යයන් සොයමින් **විභා වෙනෙතා පවිචිනනෙතා** ඒ සත්‍යයන් වෙන වෙනම දක්වමින් ඇතැමෙක් ගවේෂණය කරමින් යැයි වර්ණනා කරති. **අද්දසං** බැලුවෙමි. **අද්දක්ඛිං** විනිවිද දුටුවෙමි. **අඵසසිං** ප්‍රඥාවෙන් දුටුවෙමි. **පටිවිජ්ඣිං** ඤාණයෙන් ප්‍රත්‍යක්ෂ කළෙමි.

දෙවන ගාථාවේ සංක්ෂිප්තාර්ථය - ඒ මේ දෙසැටක් මිසදිටු ඒ සූත්‍රයෙහි දී මනාව විනිශ්චය කරගන්නා ලද බැවින් 'විනිශ්චයානි' යැයිද තමාගේ සන්තානයේ සකස් කිරීම් ආදියෙන් ප්‍රකල්පිත අභිසංස්කෘත වූ බැවින් 'පකප්පිතානි' යැයි ද කියති. ඒකාන්තයෙන් සර්වඥ මුනි නම් වූ නුඹවහන්සේ මේ දෙසැට දෘෂ්ටි ධර්ම පිළිනොගෙන 'අජ්ඣත්තසන්ති' යැයි යම් අර්ථයක් කීවෙහිද, ඒ පරමාර්ථය ධීරයන් විසින් කෙසේ ප්‍රකාශ කරයිද? කෙසේ දක්වයිද, යන මේ කාරණය මා හට පවසන්න.

මේ ගාථාවේ නිද්දේසයේ පරමත්ථ පදය හැර අර්ථ ඉතා ප්‍රකට වේ. එහි යං **පරමත්ථං** යම් උතුම් නිවණක්.

ඉක්බිති ඒ බමුණාට, යම් උපායකින් ධීරයන් විසින් නිවන පිළිබඳව ප්‍රකාශ කරන ලද්දේ ද ඒ උපායට ප්‍රතිපක්ෂ වූවක් සහිතව දක්වන භාග්‍යවතුන් වහන්සේ, **න දිට්ඨියා** යන ගාථාව වදාළහ. එහි **න දිට්ඨියා** යනාදියෙන් සමාපත්ති ඤාණයෙන් බාහිර වූ සීල ව්‍රතාදිය බැහැර කරන ලදී. **සුදධිමාහ**, මෙහි කියන ලද 'ආහ' ශබ්දය සැමතන්හි 'න' කාරය සමග යොදා මුල්පද තුනට පමුණුවා 'දිට්ඨියා සුද්ධිංති නාහ' යනුවෙන් දෘෂ්ටියෙන් ශුද්ධිය වේයැයි නොපවසමි යනුවෙන් අර්ථ දතයුතුයි. මේ ක්‍රමයම ඊට පසුව එන පදයන්හිද යෙදිය යුතුය. එහිද **අදිට්ඨියා** දසවස්තුක සම්මා දෘෂ්ටියෙන් තොරව කථා නොකරමි. එසේම **අසුතියා** ශ්‍රවණයෙන් තොරව. **අඤඤාණ** කර්මයෙන් කරන ලද සත්‍යයට අනුලොම් වූ ඤාණයෙන් තොරව. **අසීලතා** ප්‍රාතිමෝක්ෂ සංවරයෙන් තොරව. **අබබතා**

ධුතංග වතයෙන් තොරව. **නොපි තෙන** ඒවා අතුරෙහි එක් එක් වූම දෘෂ්ටි ආදී නිමිතිවලින් නොකියමි යනාදී ලෙස අර්ථ දතයුතුයි.

එතෙ ච නිසසජජ අනුගහහාය එහි ද මුලින් දැක්වූ දෘෂ්ටි ආදී භේද ඇති කෘෂ්ණපාක්ෂික (කළුපාට) ධර්මයන් දුරු කිරීමෙන්, පසුව කී අදෘෂ්ටි ආදී භේද ඇති සුක්ක පාක්ෂික (සුදුපාට) ධර්මයන් අතංමය තාපජ්ජනයෙන් (තෘෂ්ණා රහිත බවට පැමිණීමෙන්) අනුග්‍රහයෙන් ශාන්ත වූ, අනිශ්‍රිත බැවින් ශාන්ත වූ භවය ප්‍රාර්ථනා නොකරයි යනුවෙන් මේ ප්‍රතිපත්තියෙන් රාගාදී කෙලෙස් සන්සිඳුවීමෙන් ශාන්ත වූයේ ඇස ආදිය අතුරෙන් කිසි දහමක් නිශ්‍රය නොකර, එකම භවයක්වත් නොපතන්නේය. නොපැතීමට සමර්ථයෙක් ද වන්නේය. මෙසේ සිටීම මොහුගේ ආධ්‍යාත්මික ශාන්තිය සන්ති වේ යන අදහසයි.

සවණංපි ඉචඡිතබබං සූත්‍රාදි වශයෙන් ශ්‍රවණයද කැමති විය යුතුයි. **සමභාරා ඉමෙ ධමමා** සම්‍යක් දෘෂ්ටි ආදී මේ ධර්මයෝ උපකාරාර්ථයෙන් 'සම්භාර' (උපකරණ) නම් වෙති. **කණහ පකඛිකානං** අකුසල පක්ෂයට ගිය මුලිනුපුටා දමා ප්‍රහාණය කිරීම **ඉචඡිතබබං** මනාව නැසීමෙන් මුලිනුපුටා දැමීමෙන් ප්‍රහාණය කිරීම කැමති විය යුතුයි. **තෙධාතුකෙසු කුසලෙසු ධමෙමසු කාම**, රූප, අරූප සංඛ්‍යාත ත්‍රෛභූමික වූ කුශල දහම්හි. **අතමමයතා** තණ්හා රහිත බව වේ. මෙසේ පැවසූ කල්හි එහි වචනාර්ථ නොසලකා මාගන්දිය බමුණා විසින්.

නොවෙ කිර යනාදී ගාථාව කියන ලදී. දිට්ඨියා යනාදියෙහි අර්ථ ඉහත කී පරිදිමය. **කණහ පකඛිකා** යමක් සඳහා මේ දෙතැනදීම කියන ලද ද ඒ පාප දහම්. 'ආහ' ශබ්දය 'නො වෙ' යන්න හා එකතු කර යොදා 'නො වෙ කිර' (ඉදින් නො කියන්නේ නම්) යයි අර්ථ ගතයුතුයි. **මොමූළහං** ඉතා මෝඩ වූ. මුළා වූ. **පවෙචනති** දැනගනිති. මේ ගාථාවේ නිද්දේසය ප්‍රකට වූ අර්ථ ඇත්තේය. ඉක්බිති භාග්‍යවතුන් වහන්සේ ඒ මාගන්දිය බමුණාට ඒ දෘෂ්ටිය නිසා විමසන ලද්ද ප්‍රතික්ෂේප කරන සේක්.

දිට්ඨිංච නිසසාය යන ගාථාව වදාළහ. එහි අර්ථ - 'මාගන්දිය! නුඹ මිසදිටුව නිසා නැවත නැවත විචාරනුයේ, ඒ නුඹ විසින් දැඩිව ගත් දෘෂ්ටිගතයෝ වෙත්ද ඒවා දැඩිව අල්ලාගත් කල්හි දැඩිසේ මෝඩ බවට පත්වූවේ නුඹ මවිසින් වදාළ ආධ්‍යාත්මික ශාන්තියෙන් ප්‍රතිපත්තියෙන්

හෝ ධර්මදේශනාවෙන් ඉතා කුඩා වූ (අණුවක්) සංඥාවක්වත්, නොදක්නෙහිය. එකරුණෙන් නුඹ මේ ධර්මය අතිශයින් මුළා වූවක් වශයෙන් දකින්නෙහිය.

ලගහනං නිසස්සාය ලගහනං දෘෂ්ටියෙහි ලග්නව, එල්බගෙන, දැඩිව ගෙන, බන්ධනං දෘෂ්ටි බන්ධනය. **පළිබොධං** දෘෂ්ටි පළිබෝධය. **අන්ධකාර පකකනෙතාසි** බහුල වූ අඳුරට (දැඩි අඳුරට) පිවිසියෙහි. **යුත්තසඤ්ඤං** ශ්‍රමණ ධර්මයෙහි යුක්ත සංඥාව. **පත්තසඤ්ඤං** ශ්‍රමණ ධර්මයේ ලබන ලද සංඥාව **ලකඛණ සඤ්ඤං** හඳුනාගන්නා සංඥාව. **කාරණ සඤ්ඤං** හේතු සංඥාව. **ඨාන සඤ්ඤං** කාරණ සංඥාව. **න පටිලභසි** නොලබන්නෙහිය.

කුතො ඤාණං මාර්ග ඥාණය කවර කරුණකින් ලබන්නෙහි ද? **අනිච්චං වා** ඇතිවන නැතිවන අර්ථයෙන් පංචස්කන්ධය අනිත්‍යය. **අනිච්ච සංඥානු ලොමං වා** පංචස්කන්ධය අනිත්‍යයැයි උපන් සංඥාව අනිත්‍ය සංඥාවයි. ඒ සංඥාවෙන් අනුලෝම වූයේ අප්‍රතිකූල වූයේ 'අනිච්චසඤ්ඤානුලොම' වේ. විදර්ශනා ඥාණ දෙකෙහි හා දුක්ඛානත්ත සංඥානුලෝමයන්ගේද මේ ක්‍රමයමයි. මෙසේ දැඩිව ගත් කල්හි මුළාව නිසා මාගන්දිය බමුණාගේ විවාදාපත්තිය දක්වා, දැන් ඉන් අන්‍ය වූ ධර්මයන්හිද දුරුවූ මෝහ ඇති තමාගේ වාද රහිත බව දක්වමින්

සමො විසෙසි යන ගාථාව කියන ලදී. එහි අර්ථ - යමෙක් මෙසේ ත්‍රිවිධ මානයෙන් හෝ දෘෂ්ටියෙන් හෝ පුද්ගලයා කරණ කොටගෙන හෝ සිතයිද ඔහු ඒ මානයෙන් හෝ ඒ දෘෂ්ටියෙන් හෝ ඒ පුද්ගලයා සමග හෝ විවාද කරන්නේය. යමෙක් වනාහි අප වැනිව මේ ත්‍රිවිධ මානයන්හි කම්පා නොවන්නේ වේනම් ඔහු මා හට සම වේ. විශිෂ්ට වේ. හීන වේ යනු ගාථා ශේෂයයි. මේ ගාථාවේද නිද්දේසයේ අර්ථ ඉතා ප්‍රකට හෙයින් වැඩි විස්තර කුමට දක්වම්ද?

සච්චනති සො යන ගාථාවේ අර්ථ මෙසේය. ඒ රහතන් වහන්සේ මෙසේ ප්‍රහීණ වූ මාන හා දෘෂ්ටි ඇතිව, ගෙවා දැමූ පව් ඇති ආදී වශයෙන් බ්‍රාහ්මණ නම් වූයේ මා වැන්නකු 'මෙයම සත්‍යය'යි කුමට කියම්ද? 'කවර වස්තුවක් අරමුණු කරගෙන වාද කරම්ද?' 'කවර කරුණකින් කියන්නේද?' 'මම ඇත්ත කියමි. නුඹ බොරු කියන්නෙහිය'යි කවරනම්

මානයකින්, දෘෂ්ටියකින් පුද්ගලයකු සමග හෝ විවාද කරන්නේ ද? යම් මා වැනි ක්ෂීණාස්‍රවයකු කෙරෙහි 'මම සමාන වෙමි'යි පවත්නා සමභාවයෙන් හෝ අනික් දෙපරිද්දෙන් (මම හීන වෙමි, උසස් වෙමි) පවත්නා විෂමභාවයෙන් හෝ සිතුවිල්ලක් හෝ ඇති නොවේ. එවැනි මානාදියක් නැති හෙයින් කුමකින් වාද කරන්නෙම් ද? මේ ගාථාවේ නිද්දේසයද ප්‍රකට වූ අර්ථ ඇත්තකි.

මෙබඳු ස්වරූප ඇති පුද්ගලයා ඒකාන්තයෙන්ම මෙසේ වන්නේයැයි 'ඔකමභාය' යන ගාථාවෙන් දැක්වේ. එහි ඔකමභාය යනු රූපධාතු ආදී විඤ්ඤාණය ඔකසාරි නම් වේ. එහි ඡන්දරාග ප්‍රහාණයෙන් හැරදමා. අනිකෙතසාරි රූපනිමිත්තාදී නිකේතයෙහි තණ්හා වශයෙන් නො පවසන්නේය. ගාමෙ අකුබබං මුනි සඤ්ඤාති ගමෙහි ගිහි සඤ්ඤයන් නොකරනුයේ. කාමෙහි රිත්තෙතා කාමයන්හි ඡන්ද රාගය නොමැති හෙයින් සියළු කාමයන්ගෙන් වෙන්වූයේ. අපුරෙකබරාතො අනාගත ආත්මභාව ප්‍රාර්ථනා නොකරනුයේ. කථන්නුවිගඟඣ ජනෙන කයිරා ජනයා සමග කලහ කථා කරන්නේ ය. හලිදදකානි එනම් ගහපතියා. යෙන ආයසමා මහා කච්චානො තෙනුපසංකමි යන්තෙහි 'යෙන' යනු සත්තමී අර්ථයේ කරණ විභක්ති වචනයකි. එහෙයින් මහා කච්චායන තෙරුන් යම්තැනකද එතනට පැමිණියේ යැයි මෙසේ අර්ථ දතයුතුයි. යම් කරුණකින් මහාකච්චාන තෙරහු දෙව් මිනිසුන් විසින් සමීපයට පැමිණියේ යැ'යි මෙසේද එහි අර්ථ දතයුතුයි. කවර කරුණකින් මහාකච්චාන තෙරුන් වෙත යා යුතුද? නානාප්‍රකාර ගුණ විශේෂයන් අවබෝධ කරගැනීමේ අභිප්‍රායෙනි. රසවත් ඵලවැල කැමති පක්ෂි සමූහයා විසින් පැමිණිය යුතු නිතර ඵලදරණ මහරුකක් මෙනි. උපසංකමි යනු ගියේය යන අර්ථයයි. උපසංකමිත්වා එළඹීම, සමීපයට යෑමේ අවසානය දක්වයි. නැතහොත් මෙසේ ගියේ මහාකච්චාන තෙරුන්වහන්සේගේ සමීප සංඛ්‍යාත ආසන්නතම ස්ථානයට ගොස් යයිද කියන ලද්දේ වෙයි.

අභිවාදෙත්වා පසඟ පිහිටුවා වැඳ දැන් යම් අර්ථයකින් මහාකච්චායන තෙරුන්වහන්සේගේ සමීපයට පැමිණියේ ද, එකරුණ විමසනු කැමතිව දසැඟිලි එකතුකර දොහොත්මුදුනේ තබා ඇඳිලිබැඳ වැඳගෙන එකත්පසෙක හුන්නේය. එකමන්තං භාවනපුංසක වචනයකි. 'විසමං චන්දිමසූරියා පරිවත්තන්ති' ආදියෙහි මෙනි. එහෙයින් යම්සේ හුන්නේ, එකත්පසෙක හුන්නේ වේද මෙසේ හුන්නේයැයි මෙහි අර්ථ

මෙසේ දතයුතුයි. නැතහොත් මෙය සත්තමී අර්ථයේ යෙදුණු දුතියා විභක්ති වචනයකි. **නිසීදි** හිඳගත්තේය. නුවණැති දෙව් මිනිස්සු ගරුකළ යුත්තන් වෙත පැමිණ, ආසන කුසලතාවයෙන් එකත්පසෙක හිඳිති. මේ ගෘහපතියා ද එබඳු අයෙකි. එනිසා ඔහු එකත්පසෙක හුන්නේය. කෙසේ සිටියහු එකත්පසෙක හුන්නාහු නම් වෙත්ද? හිඳීමෙන් වන දොස් සයකින් වැලකී හිඳීමයි. ඒ කෙසේද? අතිදූර, අති ආසන්න, උපරි වාත, උන්නත පදෙස, අති සම්මුඛ හා අතිපච්ඡා යනු ඒ සයයි. ඉතා දුරින් හුන් තැනැත්තා වනාහි ඉඳින් යමක් කියනු කැමති නම් උස්හඬින් කිවයුතු වේ. ඉතා ආසන්නයේ හුන් තැනැත්තේ ගැටීම කරයි. උඩු සුළඟෙහි හුන්නේ ශරීර ගන්ධයෙන් බාධා ඇතිකරයි. උන්නත (උස්) පෙදෙසක සිටි තැනැත්තා අගෞරව බව ප්‍රකාශ කරයි. අතිසම්මුඛයේ (ඉදිරියෙන්ම) සිටියහොත් ඉඳින් දකිනු කැමැත්තේ ඇසින් ඇස ගටා දැකිය යුතු වේ. අතිපච්ඡා (ඉතා පිටුපසින්) සිටියවිටදීත් ඉඳින් දකිනු කැමති වීනම් බෙල්ල හරවා බැලිය යුතු වේ. එනිසා මොහුද මේ හිඳීමේ දොස් හයෙන් වැලකී හුන්නේය. එනිසා **එකමන්තං නිසිදි** යි කියන ලදී. **එතදවොච එතං** - මෙය, අවොච - කීවේය. **වුත්තමිදං භන්තෙ කච්චාන භගවතා අට්ඨක වගිගියෙ මාගන්දිය පඤ්හ** අට්ඨක වග්ගයේ මාගන්දිය පඤ්හ නම් සූත්‍රයක් ඇත. ඒ ප්‍රශ්නයේ දී රූපධාතුවෙන් රූපස්කන්ධය අදහස් කරන ලදී. **රූපධාතුරාග විනිබන්ධං** රූපධාතුවෙහි රාගයෙන් බැඳුණු. **විඤ්ඤාණං** කර්ම විඤ්ඤාණය. **ඔකසාරී** ගේහසාරී, ආලයෙහි හැසිරෙන කවර හෙයින් මෙහිදී 'විඤ්ඤාණ ධාතු බො ගහපති' යනුවෙන් නො කීවේද? මුළාව නැසීම පිණිසයි. 'ඔක' යනු අර්ථ වශයෙන් 'ප්‍රත්‍යය' කියනු ලැබේ. මුලින් උපන් කර්ම විඤ්ඤාණ පසුව උපන් කර්ම විඤ්ඤාණයට හා විපාක විඤ්ඤාණයටද පසුව උපන් විපාක විඤ්ඤාණය විපාක විඤ්ඤාණයටද කර්ම විඤ්ඤාණයටද ප්‍රත්‍ය වේ. එහෙයින් මෙහි විඤ්ඤාණය යනු කවරක්දැයි මුළාවක් ඇතිවන්නේ ය. එය නැතිකිරීම සඳහා එය නොගෙන අමිශ්‍රවම දේශනාව කරන ලදී.

තවද විපාක ආරම්මණ වශයෙන් සිවු වැදෑරුම් අභිසංඛාර විඤ්ඤාණයේ පැවැත්ම කියන ලදී. එය දක්වනු සඳහා ද මෙහි විඤ්ඤාණය නොගන්නා ලදී. **උපායුපාදානා තණ්හා උපාය**, දිට්ඨි උපාය යනුවෙන් උපාය දෙකකි. කාමූපදාන ආදියේද උපාදාන සතරකි. **චෙතසො අධිට්ඨානාභිනිවෙසානුසයා** අකුසල් සිතේ අධිෂ්ඨාන වූ ද අභිනිවේශ වූද අනුශය වූ ද, **තථාගතස්ස සම්මා සම්බුදුරජාණන් වහන්සේගේ සියලුම**

ක්ෂීණාශ්‍රවයන්ගේ මේ ක්ලේශ ප්‍රහීණ වූයේමය. ශාස්තෘන් වහන්සේගේ ක්ෂීණාශ්‍රව බව ලෝකයේ ඉතා ප්‍රකට බැවින් උපරිම කෙළවරින් මෙසේ කියන ලදී. **විඤ්ඤාණ ධාතුයා** මෙහි විඤ්ඤාණය කුමක් හෙයින් ගන්නා ලද්දේ ද? කෙලෙස් ප්‍රහාණ වූ බව දක්වනු සඳහායි. කෙලෙස් වනාහි නුදෙක් ස්කන්ධ හතරක පමණක් දුරු නොවේ. පංචස්කන්ධයේම කෙලෙස් ප්‍රහාණ වන බව දක්වනු සඳහා ගන්නා ලදී. **එවං ඛො ගහපති අනෙකසාරී** හොති මෙසේ කර්ම විඤ්ඤාණයෙන් ඔකය සිහි නොකිරීම 'අනේකසාරී' නම් වේ. **රූප නිමිත්ත නිකෙත විසාර විනිබන්ධා** රූපයම කෙලෙසුන්ගේ ප්‍රත්‍යය වන අර්ථයෙන් නිමිත්ත වේ. අරමුණු ගැනීම් ක්‍රියාවට නිවාස වූ අර්ථයෙන් නිකේත වේනුයි රූප නිමිත්ත නිකෙත වේ. පැතිරීම බැඳීමද විසාර විනිබන්ධ නම් වේ. මේ අර්ථ දෙකින්ම කෙලෙසුන්ගේ පැතිරුණු බවද බැඳුණු බව ද කියන ලදී. රූප නිමිත්ත නිකේතයෙහි පැතිරීම හා බැඳීම රූප නිමිත්ත නිකේත විසාර විනිබද්ධ වේ. රූපය නමැති නිවාසයේ පැතිරීම, බැඳීම හේතුවෙන් රූපය නම් නිවාසයෙහි උපන් කෙලෙස් පැතිරීමෙන් ද කෙලෙස් බන්ධනයෙන් ද යන අර්ථයයි. **නිකෙතසාරී වුච්චති** ආරම්මණ වශයෙන් නිවාස වූ අර්ථයෙන් 'නිකේතසාරී' යැයි කියනු ලැබේ. **පහීනා** රූප නම් නිවාසයේ කෙලෙස් පැහිර, බැඳී සිටීම ප්‍රහීණ කරන ලදී.

මෙහිදී කවර හෙයින් පංචස්කන්ධය 'ඔකස' යැයි ද ඡට් ආරම්මණ 'නිකේතය' යැයි ද කියන ලද්දේ ද? ඡන්ද රාගයේ ඉතා බලවත් දුර්වලතාවයෙනි. සමාත්තයෙහි ද මේවායේ ආලය අර්ථයෙන් ද විශේෂ භාවයෙහි 'ඔක' යැයි නිෂ්පර්යායයෙන් ශුද්ධ ගේහයම කියයි. **නිකෙතං** 'අද අසුවල් තැන ක්‍රීඩා කරමු'යි කරන ලද සංකේත ඇති වසන උයනයි. එහි පුත්‍රදාරා, ධනධාන්‍ය සහිත ගෙදර පිළිබඳව ඡන්දරාගය ඉතා බලවත් වන්නාක් මෙන් ආධ්‍යාත්මික ස්කන්ධයන්හි ඇල්ම බලවත්ය. උයන්කෙළි ආදියේ දී මෙන් බාහිර වූ ඡට් අරමුණු පිළිබඳව ඡන්දරාගය ඉතා දුර්වල වේ. මෙසේ ඡන්දරාගයේ බලවත් හා දුර්වලභාවයෙන් මෙසේ දේශනාව කරන ලදැයි දතයුතුයි.

සුඛිතෙසු සුඛිතො උපස්ථායකයන් ධනධාන්‍යාදී ලාභාදියකින් සුඛිත වූ කල්හි, 'දැන්මම ප්‍රියමනාප වූ සිවුරක්, මනාප ආහාරයක් ලබන්නෙමි'යි ගේහසිත පිළිබඳ සුඛයෙන් සුවපත් වෙයි. ඔවුන් සමග සම්පත් තමා

අනුභව කරන්නාක් මෙන් හැසිරෙයි. **දුක්ඛිතෙසු දුක්ඛිතා** ඔවුන්ට කිසියම් කරුණකින් දුකක් ඇති වූ විට තමා දෙගුණව ඒ පිළිබඳව දුක් වේ. **කිච්ච කරණීයෙසු** කටයුතු සංඛ්‍යාත කළ යුතු කටයුතු. **වොයොගං ආපජ්ජති** තම කටයුතු කළයුතු බවට පැමිණ ඔවුන්ගේ කටයුතු කර දෙයි. **කාමෙසූ** වස්තු කාමයෙහි. **එවං ඛො ගහපති කාමෙහි අරිත්තෙතා හොති** මෙසේ කෙලෙස් කාමයෙහි නොසිස් වූයේ වේ. එවිට අභ්‍යන්තර කාමයන් පිළිබඳව ස්වභාවයෙන් ම තුච්ඡ නො (අතුච්ඡ) වේ. ශුක්ල (යහපත්) පක්ෂයේ වූ මේ ගුණාංග නොමැතිවීමෙන් සිස් වූ, තුච්ඡ වූ යැයි අර්ථ දතයුතුයි. **පුරෙඛඛරානො** සංසාර වර්තය පෙරටු කරගත්තේ වේ. **එවරූපො සියං** යනාදියෙහි අනාගතයේදී දික් - කෙටි - කළු - සුදු ආදී රූපයන් අතුරින් මෙබඳු රූ ඇතිවෙම්වා'යි සංඥාවන්ගෙන් මෙබඳු සංඥාවක් ඇතිවෙම්වායි ද පුණ්‍යාභි සංස්කාරාදියෙහි මෙසේ සංස්කාරයන් ද චක්ඛු විඤ්ඤාණාදි විඤ්ඤාණාදියෙහි මෙසේ විඤ්ඤාණ ඇතිවෙම්වා යි ද ප්‍රාර්ථනා කරයි. **අපුරෙඛඛාරානො** සංසාර වර්තය පෙරටු කරනොගෙන. **සහිතමෙම අසහිතං තෙ** නුඹේ වචන අධර්මානුකූලය. මට සිලිටි නොවේ. මගේ වචන සිලිටිය. ධර්මානුකූලය. මිහිරිය. මිහිරිපානයක් බඳුය. **ආචිණ්ණං තෙ විපරාවත්තං** නුඹ විසින් ඉතා දිගු කාලයක් පුරුදු කරන ලද, ප්‍රගුණ කරන ලද යම් වාදයක් වූයේ ද එය මාගේ වාදයට පැමිණ, සියලුම ආකාරයෙන් විපරීත විය. නැවතිණි. **ආරොපිතො තෙ වාදො.** නුඹට මවිසින් දොස් නගන ලදී. **චර වාදප්පමොඛ්ඛාය** ඒ ඒ ආචාර්යවරයා වෙත ගොස් පිළිතුරු සොයමින් මේ වාදයෙන් මිදීමට උත්සාහ ගනුව. වෙහෙසව. **නිබ්බෙයෙහි වා සචෙ පහොසි** ඉදින් තමන්ම සමර්ථ වේනම් මෙහිම නවතුව. තමා දොසින් මිදෙව.

යෙහි විවිත්තෙතා යන ගාථාවෙහි - **යෙහි** දෘෂ්ටිගතාදියෙකින්. **විවිත්තෙතා විචරෙය්‍ය** හිස්ව හැසිරෙන්නේ ය. **න තානි උගගයහ වදෙය්‍ය නාගො** අපරාධ නොකරනුයේනුයි ආදී වශයෙන් 'නාග' නම් වේ. ඒ දෘෂ්ටිගතයන් දැඩිව ගෙන නොකියන්නේ ය. **ඵලමබුජං** ඵල නම් වූ දියෙහි උපන්. කටු සහිත නටුවක දියේ පිපුණු පියුමකැයි කියන ලදී. **යථා ජලෙන පංකෙන ච නූපලිත්තං** ඒ පියුම ජලයේ ද මඩේ ද නොගෑවී සිටින්නාක් මෙන්. **එවං මුනි සනතිවාදො අගිදෙධා** මෙසේ අධ්‍යාත්ම ශාන්තිවාද ඇති මුනිතෙම, ගිජුභාවයක් නොමැති හෙයින් ලොවෙහි ආශාවෙන් නො ඇලුණේය. **න ගචඡති** අගතියට යෑම් වශයෙන් නොයයි. **නාගචඡති** කෙලෙස් ප්‍රහීණ බැවින් උත්පත්තියට නො පැමිණේ. **පාපකා**

මෙනම් ඇත්තෝ. **අකුසලා අදක්ඛභාවයෙන් යුතු තෙ කිලෙසෙ න පුනෙති** යම් ක්ලේශයක් ප්‍රහීණ වූයේ ද ඒ කෙලෙස් නැවත නො පැමිණේ. නො පැසේ. **න පචෙචති** නැවත නො පැමිණේ. **න පච්චාගච්ඡති** නැවත නො නවතියි. **බර දණ්ඩා** බර පත්‍ර දණ්ඩ, කර්කශ රළු දණ්ඩ **චත්තගෙධො** හරන ලද තණ්හාව ඇති, **වන්තගෙධො** වමනය කළ ගිජුබව ඇති, **මුත්තගෙධො** සිදි බන්ධන ගේධය ඇති, **පහීනගෙධො** දුරුකළ ගිජු බව ඇති. **පටිනිස්සට්ඨ ගෙධො** නැවත සිතට නොනැගෙන සේ දුරින්ම දුරුකළ ගිජු බව ඇති, ඉන්මතුව එන **වීතරාගා** දියෙහි ද මේ ක්‍රමයමයි. ඒ සියලු පදයෝ ගන්නා ලද තණ්හාවගේ දුරුකළ බවට සමානාර්ථවත් පදයෝ වෙති. වැඩිපුර වර්ණනා කුමටද?

න වෙදගූ යන ගාථාවෙහි **න වෙදගූ දිට්ඨියා සිවුමග නුවණට** පැමිණි එවැන්නෙක් දෘෂ්ටියට යන්නෙක් නොවේ. දෘෂ්ටිය යන්නේ හෝ එය සාර වශයෙන් ගැනීමක් සිදු නොවේ. එහි වචනාර්ථ මෙසේය. දෘෂ්ටියෙන් යන්නේනුයි දිට්ඨියා නම් වේ. තතියා විභක්ති අර්ථයෙනි. දෘෂ්ටියට යානුයි දිට්ඨියා නම් වේ. දුතියා විභක්ති අර්ථයෙනි. ඡට්ඨී විභක්ති අර්ථයෙන් ද දෘෂ්ටියේ යෑම දිට්ඨියා නම් වේ. **න මුතියා සමාන** මෙති මුත රූපාදී භේද ඇති මුතියෙන් ද ඔහු මානයට නො පැමිණේ. **නහි තම්මයො සො තණ්හා දෘෂ්ටි වශයෙන් තම්මය** වේ. සංකල්ප රාග වශයෙන් නොවේ. මොහු වනාහි එවැන්නෙක් නොවේ. **න කම්මනා නොපි සුතෙන නෙය්‍යො පුඤ්ඤාභිසංස්කාරාදී කර්මයෙන් හෝ ශ්‍රැත** ශුද්ධි ආදී ශ්‍රැතයෙන් හෝ ඔහු ඊට පැමිණවිය යුත්තෙක් නොවේ. **අනුපනීතො සො නිවෙසනෙසූ** ඔහු උපාය දෙකින්ම දුරු වූ බැවින්, ප්‍රහීණ කළ බැවින් සියලුම තෘෂ්ණා දෘෂ්ටි නිවාසයන්හි නොඑළඹෙන්නේ වේ.

මුතරූපෙන වා මෙහි මුත රූපය නම් ගන්ධ-රස-ස්පර්ශ යන රූප තුනයි. **මානං නෙති** අස්මිමානයට නො පැමිණේ. **න උපෙති** සමීපයට නො එයි. **න උපගච්ඡති** සමීපයට ගොස් නො සිටියි. **තම්මයො** එය ප්‍රකෘති කොට ඇති මේ ආකාරයෙන් යුක්ත ක්ෂීණාස්‍රවයාට.

සඤ්ඤා විරත්තසස යනාදී ගාථාවෙහි **සඤ්ඤා විරත්තසස** යනු නෙක්ඛම්ම සංඥා පූර්වාංගම වූ භාවනාවෙන් ප්‍රහීණ වූ කාමාදී සංඥා ඇත්තහුට. මේ පදයෙන් උභතෝභාගයෙන් විමුක්ත වූ සමථයානිකයා

අදහස් කරන ලදී. **පඤ්ඤා විමුත්තසස** විදර්ශනාව පූර්වාංගම වූ භාවනාවෙන් සියලු කෙලෙසුන්ගෙන් මිදුණු තැනැත්තාට, මේ වදනෙන් ශුෂ්ක විදර්ශකයා අදහස් විය. **සඤ්ඤඤ්ඤව දිටඨිඤ්ඤව යෙ අගගහෙසුං තෙ සටටමානා විවදනති ලොකෙ** යමෙක් කාම සංඥාදී සංඥාවක් ගන්නා ලද්දාහු ද ඔවුහු විශේෂයෙන් ගිහියෝ කාමය හේතුකොටගෙනද යමෙක් දෘෂ්ටිය ගන්නා ලද්දාහු ද ඔවුහු විශේෂයෙන් පැවිද්දෝ ධර්මය හේතුකොට ගෙනද ඔවුනොවුන් හා ගැටෙමින් විවාද කරති. **සො සමථපුබබංගමං අරියමගගං භාවෙති** යම් පුද්ගලයෙක් සමථය පූර්වාංගම කරගෙන, විදර්ශනාව සමග ආර්ය මාර්ගය වඩයිද පළමුව සමාධිය උපදවා, පසුව විදර්ශනාව සමග ආර්ය මාර්ගය උපදවයි යන අර්ථයයි. **තසස ආදිතො** ඒ පුද්ගලයාගේ පඨම ධ්‍යානයේ පටන් **උපාදාය** හේතුවෙන් පැමිණ **ගහටා විකඛමහිතා හොනති** ග්‍රන්ථයෝ දුරින්ම දුරු වූවෝ වෙති. **අරහතත පතෙත** අර්හත් ඵලයට පත්වූ කල්හි. **අරහතො** අර්හත්ඵලයෙහි සිටියහුගේ **ගහටා ච මොහා ච** ආදි සියලු කෙලෙස් ප්‍රහීණ වේ. **යො විපසසනා පුබබංගමං අරියමගගං භාවෙති** යම් පුද්ගලයෙක් විදර්ශනා පූර්වාංගම කර, මුලින් එහි හැසිරී ආර්ය මාර්ගය වඩයි ද පළමුව විදර්ශනාව උපදවා පසුව ආර්යමාර්ග සම්ප්‍රයුක්ත සමාධිය වඩන්නේය යන අර්ථයයි. **තසස ආදිතො උපාදාය** ඒ පුද්ගලයාගේ විදර්ශනා වැඩීමේ පටන්, විදර්ශනාව නිසා **මොහා විකඛමහිතා හොනතී** මෙහි විෂ්කම්භනය කරන ලද යනු ඉතා දුරට පමුණුවන ලද යන්නයි.

පඤ්ඤාවසෙන සටටෙනති යමෙක් කාම සංඥාදිය ගනිත් ද ඔවුහු සංඥා වශයෙන් පෙළෙති. **සංසටටෙනති** දැඩිව පෙළෙති. දැන් ගැටෙන්නන් දැක්වීමට රජවරු ද රජුන් සමග වාද කරති ආදී වශයෙන් විස්තරය කියන ලදී. **අඤ්ඤමඤ්ඤං පාණිහිපි උපකකමනති** මෙහි ඔවුනොවුන් අතින් පහරදී ගනිති. ලෙඩඩූනි කැටකැබලිතිවලින් දණ්ඩනි අඩුදඬු ආදියකින් **සතෙථහි** දෙපැත්ත කැපෙන ආයුධවලින් **අභිසංඛාරානං අපපහීනත්තා** පුඤ්ඤාභිසංඛාරාදී අභිසංස්කාරයන් ප්‍රහීණ නොකළ බැවින්, **ගතියා සටටෙනති** යායුතු බැවින්, පිහිටාධාර වූ ගතියෙන් පෙළෙති. ගැටීමට පැමිණෙති. නිරයාදියෙහි ද මේ ක්‍රමයමයි. සෙසු පදයන්ගේ අර්ථ ඉතා ප්‍රකටමය.

නවවන මාගන්දිය සූත්‍ර නිද්දේස වර්ණනාව නිමියේ ය.

10.

දසවන පුරාණේද සූත්‍ර නිද්දේසයේ **'කථංදසසී'** යන ගාථාවයි. මේ සූත්‍රයේත් ඉන්පසුව එන කලහවිවාද, චූලවියූහ, මහා වියූහ, තුවටක, අත්තදණ්ඩ සූත්‍රයන්ගේ සම්මා පරිබ්බාජනීය සූත්‍ර වර්ණනාවේ කියූ ක්‍රමයෙන්ම සාමාන්‍යයෙන් උත්පත්තිය දතයුතුයි. විශේෂයෙන් වනාහි යම්සේ ඒ මහා සමාගමයේදී රාග චරිතවත් දෙවියන්ගේ සත්පාය වශයෙන් (දෙවියන්ට ගැලපෙන පරිදි) ධර්මය දෙසීමට නිර්මිත බුදුරදුන් විසින් තමාගෙන් ප්‍රශ්න කරවා, සම්මා පරිබ්බාජනීය සූත්‍රය දේශනා කළ සේක්ද මෙසේ මේ මහා සමාගමයේදී 'පූර්ව ශරීරය බිඳියෑමෙන් කුමක් කළයුතුද?'යැයි උපන් දෙවියන්ගේ සිත දැන, ඔවුන්ට අනුග්‍රහ පිණිස එක්දහස් දෙසිය පනසක් වූ භික්ෂු සමූහයා පිරිවරාගත් නිර්මිත බුදුවරයෙකු අහසින් වඩමවා ගෙනවුත්, උන්වහන්සේ ලවා තමන් වහන්සේගෙන් ප්‍රශ්න කරවා මේ සූත්‍රය දේශනා කළ සේක.

කෙසේද? බුදුවරු නම් මේ සත්ත්වයන්ට වඩා මහත් වූ සත්ව විශේෂයකි. තමන්වහන්සේම දෙවියන් සහිත ලෝකයේ දුටු, ඇසූ, විඳි, දැනගත්, පැමිණි, පර්යේෂිත අනුව හැසිරුණු මනසින් කිසියම් නීලාදී වශයෙන් බෙදූ රූපාරම්මණයන්හි එන රූපාරම්මණයක් හෝ බෙර ශබ්ද ආදී වශයෙන් බෙදූ ශබ්දාරම්මණාදීන්හි ශබ්දාරම්මණයක් හෝ යන මේවා අතරින් උන්වහන්සේලාගේ ඥාණයට නොවැටහී සිටින්නක් නම් නැත. එනිසා කියන ලදී. 'මහණෙනි, දෙවියන් සහිත ලෝකයේ දෙව්මිනිස් ප්‍රජාවගේ දුටු, ඇසූ, විඳි, දැනගත්, පැමිණි, පර්යේෂිත (සෙවූ), අනුව හැසිරුණු යමක් වීද මනසින් ඒ සියල්ල මම දැනගතිමි. මම ඒ සියල්ල අවබෝධ කළෙමි'යනුයි. මෙසේ සැමතැන්හිම අප්‍රතිහත ඥාණයෙන් භාග්‍යවතුන් වහන්සේ සියලුම ඒ දේව සමූහයා භබ්බ හා අභබ්බ වශයෙන් දෙකොටසකට බෙදූහ. කර්මාවරණයෙන් හෝ යුක්ත වූයේයැයි ආදී ක්‍රමයෙන් දක්වන ලද සත්ත්වයෝ අභබ්බ නම් වෙති. ඔවුහු එකම විහාරයේ විසූවත් බුදුවරු නොදකිති. ඊට විපරීත වූ වෙනස් වූවෝ භබ්බ නම් වෙති. ඔවුහු ඉතා දුර විසූවත් බුදුන් වෙත පැමිණ දැකගනිති. ඒ දේව සන්නිපාතයේ යම් අභබ්බ දිව්‍ය සමූහයක් වීද, ඔවුන් හැරදමා, භබ්බයන් පමණක් ගෙන ඔවුන්ගෙන් මෙපමණ රාග චරිතයෝ ය. මෙපමණක් ද්වේෂ චරිතයෝ යැයි චරිත වශයෙන් සය කොටසකට බෙදූහ. ඉන්පසුව

බුදුහු ඔවුන්ට ගැලපෙන ධර්ම දේශනාවක් විමසා බලන සේක්, රාග චරිත දෙවියන්ට සම්මා පරිබ්බාජනීය සූත්‍රය දේශනා කරන්නෙමි. ද්වේෂ චරිතයන්ට කලහවිවාද සූත්‍රය ද මෝහ චරිතයන්ට මහාවියූහ සූත්‍රය ද විතර්ක චරිතයන්ට චුල්ලවියූහ සූත්‍රයද සද්ධා චරිතයන්ට තුවටක ප්‍රතිපදාවද බුද්ධි චරිතයන්ට පුරාභේද සූත්‍රය ද කියන්නෙමියි දේශනාව ව්‍යවස්ථාපනය කර, නැවත ඒ පිරිස් සිහිපත් කළ සේක. ඒ දෙවිවරු කෙසේ නම් දේශනාව දැන ගන්නෝද? අත්තජ්ඣාසය වශයෙන් ද? පරජ්ඣාසය වශයෙන්ද? අනුප්පත්තික වශයෙන් ද? පුච්ඡාවසික වශයෙන්ද? මෙසේ විමසා බැලූ විට පුච්ඡාවසිත වශයෙන් දෙවිවරුන් දහම් අවබෝධ කරගන්නා බව දැන, 'මේ භික්ෂු පිරිස අතර දෙවියන්ගේ අදහස ගෙන චරිත වශයෙන් ප්‍රශ්න විසඳීමට සමත් කිසි භික්ෂුවක් වේද?යි විමසා පන්සියක් භික්ෂූන් අතුරින් එබඳු සමත් වූ එකදු භික්ෂුවක්වත් නුදුටුවහ. ඉන්පසු අසූමහා ශ්‍රාවකයන් ද දැගසවුවන් ද විමසා බලා, ඔවුන් ද අසමත් බව දැක මෙසේ සිතූහ. 'ඉදින් පසේ බුදුවරයෙක් වීනම් උන්වහන්සේට හැකියාවක් වේදැ'යි විමසා බැලූ සේක්, උන්වහන්සේ ද අසමත් වන බව දැන ශක්‍ර සුයාම ආදීන් අතුරින් කවරෙකු සමත් වන්නේදැයි විමසනුයේ, ඔවුන්ගෙන් කිසිවෙක් සමත් වන්නේ නම් ඉදින් ඔහු ලවා ප්‍රශ්න කරවා තමන් වහන්සේ විසඳන්නේ යැයි විමසා බැලූවත් ඔවුන්ටද නොහැකි බව වටහාගත් සේක. ඉක්බිති උන්වහන්සේට මෙබඳු සිතක් පහළ විය. 'මා වැනි බුදුවරයෙක්ම ඊට සමත් වන්නේය. වෙනත් කිසියම් බුදුවරයෙක් ඇත්ද?'යි අනන්තාපරිමාණ ලෝකධාතූන්හි අනන්ත වූ ඥාණය පතුරුවා ලෝකය දෙස බලන සේක් එවැනි අන් බුදුකෙනෙකු නොදුටු සේක. දැන් තමා හා සම කෙනෙක් නොදැකීම යන මෙය අසිරිමත් දෙයක් නොවේ. සිදුහත් කුමරු උපන් දවසෙහි ද බ්‍රහ්මජාල වර්ණනාවේ පැවසූ පරිදිම තමා හා සමවූවෙකු නොදක්නේ 'අග්ගෝ හමස්මි ලෝකස්ස' යනුවෙන් නොපෙරළිය හැකි සිංහනාද පැවැත්වූයේ නොවේද? මෙසේ තමන්වහන්සේට සමාන අන් කිසිවකු නොදැක, 'ඉදින් මම ම ප්‍රශ්න අසා මම ම විසඳන්නෙමි නම්, එවිට ඒ දෙවිවරු අර්ථාවබෝධයට අසමත් වෙති' 'මා වැනි අනික් බුදු කෙනෙකුන්ම ප්‍රශ්න අසන කල්හි මවිසින් විසඳන විට ඉන් ආශ්චර්යයක්ද වන්නේය. දෙවිවරු පහසුවෙන් ධර්මාවබෝධය ලබන්නට හැකිවන්නෝය. එනිසා නිර්මිත බුදුරුවක් මවන්නෙමි'යි අභිඥාපාදක ධ්‍යානයට සමවැදී ඉන් නැගී සිට, 'පාසිවුරු ගැනීම, ඉදිරි බැලීම්, පසුපස බැලීම්, අත්පා හැකිලීම, දිගහැරීම සමානවම සිදුකරන බුදුවරයෙක් වේවායි කාමාවචර සිත්වලින් පරිකර්මකොට,

පෙරදිග යුගන්ධර පරිකෙෂ්පයෙන් මතුවන සඳමඬල පලාගෙන නික්මෙන්නා මෙන් ඒවායි රූපාවචර සිතින් අධිෂ්ඨාන කළ සේක. දේව සමූහයා ඒ දැක අනික් සඳක් උදාවූයේදැයි කීහ. ඉන්පසු සඳින් නැගි මඳක් ළංවූ විට 'සඳක් නොවේ. සූර්යයෙක් උදාවූයේය'යිද තවත් ආසන්න වූ කල්හි 'දෙව් පුත්‍රයෙක් නොවේ. එක් මහා බ්‍රහ්මයෙක් යැ'යි ද තවත් ආසන්න වූ කල්හි 'මහා බ්‍රහ්මයකු නොවේ. වෙනත් බුදුවරයෙක් පැමිණේ'යැයි පැවසූහ. එහි සිටි පුහුදුන් දෙවිවරු මෙසේ සිතූහ. 'එක් බුදුවරයෙකු සඳහා මෙපමණ දේව සන්නිපාතයක් විය. බුදුවරු දෙදෙනෙක් වූ විට කෙතරම් මහත් දේව සන්නිපාතයක් වේද?' ආර්ය දෙවිවරු මෙසේ සිතූහ. 'එක ලෝකධාතුවක බුදුවරු දෙනමක් නම් නැත. ඒකාන්තයෙන් බුදුහු තමන්වහන්සේ හා සමාන බුදුරුවක් මවන ලදී' යනුයි.

නැතහොත් නිර්මිත බුදුරුවේ සිරුරින් නික්මුණු ෂඩ්වර්ණ රැස් දහරා නිර්මාපක භාග්‍යවතුන් වහන්සේගේ සිරුරේ ගැටේ. නිර්මාපක භාග්‍යවතුන් වහන්සේගෙන් නික්මෙන රැස්දහරා නිර්මිත බුදුරුවේ සිරුරේ ගැටේ. ඒ දෙ බුදුවරුන්ගේ ශරීරයන්ගෙන් නික්මුණු රාශි ජාලා උඩට නැගී භවාග්‍රයේ ගැටී, ඉන් නැවත හැරී අවුත් දෙවියන්ගේ මස්තක පර්යන්තයෙන් බැස සක්වල මුවවිටෙහි පිහිටියේය. මුලු මහත් සක්වල ගැබම රන්මය වක් වූ ගොනැසි සහිත චේතිය ඝරයක් මෙන් බැබලුණේය. දස දහසක් සක්වල දෙවියෝ එක් සක්වලකට රැස් වූවාහු බුදුවරුන් දෙදෙනා වහන්සේගේ රශ්මි ජාලා ගර්භයට පිවිස සිටියහ.

නිර්මිත බුදුරුව හිඳගනිමින්ම **කථං දසසී කථං සීලෝ උපසනෙතාති වුච්චති** යනාදී ක්‍රමයෙන් අධිප්‍රඥාදී ප්‍රශ්නය ගාථාවකින් විමසන ලදී. ඒ ප්‍රශ්නයේ ඒ නිර්මිත බුදුරදුන්ගේ **කථං දසසී** අධිප්‍රඥා ආදියයි. **කථං සීලෝ** අධිශීලයයි **උපසනෙතා** අධි චිත්තයයි. සෙසු පදයන්හි අර්ථ ප්‍රකටය. නිර්මිත බුදුරදුන් ප්‍රකට කර දක්වනු සඳහා පෙටකෝපදේශයේ මෙසේ දක්වා ඇත.

උපෙති ධම්මං පරිපුච්ඡමානෝ කුසලං අත්ථ සංහිතං
නච්චති න උපජ්ඣති තං පුග්ගලං කතමං වදනති බුද්ධා

'කුසල වූ අර්ථ සහිත වූ ධර්මානුකූල ප්‍රඥාවන්ත ප්‍රශ්න විමසීමට පැමිණෙන, චුත නොවන, (නොමැරෙන) නූපදින ඒ උතුම් පුද්ගලයා කවුදැයි බුදුවරු පවසති.'

සංසාරෝ ඛීණෝ න ච වනතරාගෝ
න චාපි සෙඛෝ නව දිට්ඨධම්මෝ
ඛීණාසවෝ නානතිමදෙහධාරී
තං පුගගලං කතමං වදනති බුද්ධා

සංසාරය ක්ෂය කරන ලදී. රාගය වමාරා දැමූයේ නොවේ. සේඛයෙක් ද නොවේ. චතුරාර්ය සත්‍ය අවබෝධ කරගත්තෙකු ද නොවේ. නමුත් ඔහු ක්ෂීණාස්‍රවයෙක් හා අන්තිම දේහය දරන්නෙක් වේ. ඒ පුද්ගලයා කවරකුදැයි බුදුවරු පවසති.

න දුකඛසචචෙන සමංගිභූතෝ
න මගග සචෙව කුතෝ නිරොධෝ
සමුදය සචචතෝ සුවිදූරෙ දූරෙ
තං පුගගලං කතමං වදනති බුද්ධා

දුක්ඛ සත්‍යයෙන් යුක්ත නොවේ. මාර්ග සත්‍යය ද නැත. නිරෝධයක් ඔහුට කොයින්ද? හෙතෙම සමුදය සත්‍යයෙන් ද ඉතා දුරටම දුරුවූයේය. මේ පුද්ගලයා කවුදැයි බුදුවරු පවසති.

සහෙතුකෝ තෝ පි ච රූප නිසසිතෝ
සපපචචයෝ නොපි ච සෝ අසංඛතෝ
අසංඛතාරමමණෝ නොව රූපී
තං පුගගලං කතමං වදනති බුද්ධා

සහේතුකයෙක් ද රූප නිශ්‍රිතයෙක් ද නොවේ. ප්‍රත්‍ය සහිත වූවෙක්ද අසංඛත වූවෙක් ද නොවේ. අසංඛතාරම්මණයක් මෙන්ම රූපාරම්මණයක්ද ඔහුට නැත. මේ පුද්ගලයා කවුදැයි බුදුවරු පවසති.

මෙහි පළමු ගාථාව නිර්මිත බුදුවරු සඳහා කියන ලදී. දෙවන ගාථාව පශ්චිම භවික බෝධිසත්ත්වයන් සඳහාය. තෙවන ගාථාව අර්හත්

එලස්ථ පුද්ගලයා සඳහා කියන ලදී. සිවුවන ගාථාව අරූපාවචර නිර්වාණය ප්‍රත්‍යවේක්ෂා කරන පුරේචාරිකාර්ථයෙන් චිත්තයෙන් යුක්ත වූවහු සඳහා කියන ලදැයි දතයුතුයි.

කිදිසෙන දස්සනෙන කවරාකාර දර්ශනයකින් **කිං සඤ්ඤිතෙන** කවර ගැලපීමකින් **කිං පකාරෙන** කවර විධියකින් **කිං පටිභාගෙන** කවර ආකාරයකින් **යං පුච්ඡාමි** යම් පුද්ගලයකුගෙන් විචාරම් ද ඒ පුද්ගලයා මා හට විසඳ දෙන්න. **යාචාමි** ආරාධනා කරමි. **අජ්ඣෙසාමි** අණ කරමි. **පසාදෙමි** නුඹගේ සන්තානයේ සොම්නසක් උපදවමි. **බ්‍රූහි** යනු නිද්දේසයේ උදෙසන පදයයි. **ආචික්ඛ** දෙසිය යුත්තන්ගේ නම් වශයෙන් කියන්න. **දෙසෙහි** දක්වන්න. **පඤ්ඤාපෙහි** දන්වන්න.

ඤාණමුඛ වශයෙන් අර්පණාව දක්වමින් **පඤ්ඤාපෙහී** යනුවෙන් කියන ලදී. **පට්ඨපෙහි** පණවන්න. පවත්වන්න යන අර්ථයයි. ඤාණමුඛයෙහි හෝ තබන්න. **විවර** විවෘත කරවන්න. විවෘත කර දක්වන්න. **විභජ** විභාග කර, විභාවනය කරමින් දක්වන්න යන අර්ථයයි. **උත්තානී කරොහි** ප්‍රකට භාවයට පත්කරන්න. නැතහොත් **ආචික්ඛ** යනු දේශනාදී පද සයට මූල වූ පදයයි. දේශනාදිය මේ අර්ථය විවරණය කිරීම සඳහා කියන ලදී. එහි **දෙසෙහි** යනු උග්ඝටිතඤ්ඤූ පුද්ගලයන්ගේ වශයෙන් සංක්ෂිප්තව පළමුව උද්දේස වශයෙන් දෙසන්න. උග්ඝටිතඤ්ඤූ පුද්ගලයෝ වනාහි සංක්ෂිප්තව කියන ලද්ද පළමුව දේශනා කළ අයුරින් අවබෝධ කරගනිති. **පඤ්ඤපෙහි** විපචිතඤ්ඤූ පුද්ගලයන්ගේ වශයෙන් ඔවුන්ගේ සිත් පිනවීමෙන් බුද්ධිය නම් කරගලින් අවබෝධ කරගැනීමට පළමුව සංක්ෂිප්තව දෙසූ කරුණු නිද්දේස වශයෙන් සවිස්තරව පනවන්න. **පට්ඨපෙහි** ඒ නිර්දිෂ්ඨ නිද්දේසය පටිනිද්දේස වශයෙන් විස්තර කර තබන්න. පිහිටුවන්න. **විවර** නිර්දිෂ්ට වූ දෙය ද නැවත නැවතත් වචනවලින් විවරණය කරන්න. **විභජ** පුන පුනා කියූ දෙය විභාග කිරීම් වශයෙන් බෙදා දක්වන්න. **උත්තානී කරොහි** විවෘත කළ, විස්තර වචනයෙන් බෙදා දැක්වූ දෙය නිදර්ශන වචනයන්ගෙන් අර්ථ ප්‍රකට කර දක්වන්න. මෙසේ කරන දේශනාව නෙය්‍ය පුද්ගලයන්ගේ පවා ධර්මාවබෝධය පිණිස වේ. මේ ප්‍රශ්නය විසඳන භාග්‍යවතුන් වහන්සේ, සරූප වශයෙන් අධි ප්‍රඥාදිය අත්නොහැර ම අධිප්‍රඥාදී ස්වභාවයෙන්, යම් කෙලෙස් ධර්මයක සන්සිඳීමෙන් ශාන්ත වූයේ යැයි කියනු ලැබේද, නානා දෙවිවරුන්ගේ ආශ්‍රවයන්ට අනුලෝම වශයෙන් ඔවුන්ගේ

ශාන්තභාවයම (උපසමනය) දක්වන සේක් **විතතණ්හා** යන ගාථා වදාළ සේක.

එහි මුලින් එන ගාථා අට අතුරින් 'තං බ්‍රූමි උපසනෙතා' යන මේ ගාථාවේ සම්බන්ධය දතයුතුයි. ඉන් අනතුරුව **සවෙ සනන්‍ාති** වුචචති මේ සියල්ලට පසුව එන පදයෙන් අනුපද වර්ණනා න්‍යාය දතයුතුයි. **විතතණ්හා පුරා භෙදා** යමෙක් ශරීර භේදයකට පූර්වයෙන්ම තණ්හාව ප්‍රහීණ කළේද **පුබබමනතමනිසසිතෙ** අන්ත ද්වයට බෙදීමෙන් පූර්වාන්තය ඇසුරු නොකළේ. **වෙමජ්ඣනුපසංඛෙයොා** වර්තමාන කාලයෙහිද රාගයෙන් ඇලුනේය' ආදී වශයෙන් නොසැලකිය යුතු වූ **තසස නත්‍ථි පුරෙකඛතං** ඒ රහතන් වහන්සේට තෘෂ්ණා දෘෂ්ටි දෙක නොමැති බැවින් අනාගත භවෝත්පත්තියද නැත. ඔහු උපශාන්තයෙකුයි මම කියමි යි මෙසේ අර්ථ යෝජනාව දතයුතුයි. මේ න්‍යාය සෑමතන්හි දතයුතුයි. **පුරා කායසස භෙදා** කරජ කයෙහි භේදයට (බිඳීයාමට) පෙරදීම. **අතතභාවසස** කර්මනය ආත්මභාවයාගේ **කලෙබරසස නිකෙඛපා** කලේබරයේ බහා තැබීමෙන්, ශරීරය තැබීමෙන්. **ජීවිතින්‍ද්‍රියසස උපචෙජ්ඡදා** ජීවිතින්‍ද්‍රිය දෙකෙහි සිඳී යෑමට පෙරදීම. **පුබබනෙතා වුචචති අතීතො අදධා** පූර්වාන්ත සංඛ්‍යාත අන්තය කොට්‍යාශය, කාලය ඉක්මවන ලදී. ඉක්මවන ලද කාලය යයි කියනු ලැබේ. **අතීතං අදධානං ආරබභ** ඉක්මවන ලද කාලය නිසා තණ්හාව ප්‍රහීණය. තවත් යහපත් පර්යායක් (භද්දේක පර්යායක්) දක්වමින් අථවා යනාදිය කියන ලදී. එහි **එවංරූපො අහොසි** කාලය හා සමාන වූයේ ඉන්‍ද්‍රනීල මාණික්‍යමය වර්ණ ඇත්තේ වීමියි මෙසේ මනෝඥ වූ රූප සම්පත් වශයෙන් මෙවැනි රූ ඇති වීමි. කුසල සුඛ, සොම්නස් වේදනා වශයෙන් ම **එවං** වෙදනො යි. එය සම්ප්‍රයුක්ත වූ ම සංඥාදී වශයෙන් **එවං සඤ්ඤා එවං සංඛාරො එවං විඤ්ඤාණො** (මෙබඳු සංඥා ඇතියෙක්, මෙබඳු සංස්කාර ඇතියෙක්, මෙබඳු විඥාන ඇතියෙක්) අතීත ආත්ම භාව වලදී වීමි. එහි **නන්‍දි නං සමනන්‍ානෙති** ඒ රූපාදියෙහි තණ්හාව හෝ තණ්හා සම්ප්‍රයුක්ත දෘෂ්ටිය හෝ අනුව නො යොදයි. නො එළඹෙයි. තවත් පර්යායකින් මහා කච්චාන භද්දේකරත්ත පර්යාය දක්වමින්, "නැතහොත් මෙසේ මගේ ඇස විය" ආදී වශයෙන් කියන ලදී. එහි **චක්ඛුං** යනු චක්ෂු ප්‍රාසාදයයි. **රූපා චතුසමුට්ඨානික** රූපයෝ ය. මේ න්‍යායෙන් සෙසු ආයතන ද දතයුතුයි. **විඤ්ඤාණං** නිශ්‍රිත විඤ්ඤාණය. **න තදභිනන්‍දති** ඒ චක්ෂුව ද රූපය ද තෘෂ්ණා දෘෂ්ටි වශයෙන් සතුටු නොවෙති. **ඉති මෙ මනො අහොසි ඉති ධම්මා** මෙහි වනාහි මනො යනු

භවංග සිත. ධම්මා තෙභූමික ධර්මාරම්මණය. **හසිතලපිත කිළිතානි** දත් පෙන්නා සිනාසීම, ප්‍රියවදන් තෙපලීම, කායික ක්‍රීඩාදී කෙළිකවටකම් ද **හසිත ලපිත** ක්‍රීඩාවන්ද **න තදසසාදෙති** ඒ සිනාසීම් ආදියෙන් තුටු නොවේ. **න නං නිකාමෙති.** කැමැත්ත නොකරයි. **න තෙන ච චිත්තිං ආපජ්ජති** එයින් සතුටට නොපැමිණෙයි. ඒ ඒ ප්‍රත්‍යය නිසා උපන්නේනුයි පච්චුප්පන්න නම් වේ. **රත්තෙනාති නූපසංඛෙය්‍යා** රාගයෙන් ඇලුණේ යැයි නොගිණිය යුතුය. සෙසු පදයන්හිද මේ ක්‍රමයමයි. **එවං රූපොසියං** ආදියෙහි ද ප්‍රණීත මනෝඥ රූපාදී වශයෙන් ම තෘෂ්ණා දෘෂ්ටි පැවැතීම් සංඛ්‍යාත තෘෂ්ණාව නො එළවඹීම දතයුතුයි. **ණ පණිදහති** ප්‍රාර්ථනා වශයෙන් නො තබයි. **අපණිධාන පචචයා** ප්‍රාර්ථනා නොතැබීම හේතු කොටගෙන. **අසන්තාසි** ඒ ඒ අලාභ වීම්වලින් තැතිනොගෙන ශාන්තව. **අවිකත්ථී** ශීලාදියෙන් තමා හුවා නොදක්වනුයේ **අකුකකුචෙචා** අතින් කෙරෙන වැරදි ක්‍රියා ආදියෙන් තොර වූයේ. **මන්තභාණී** මන්ත්‍ර පිරිවහා වචන කියන්නේ. **අනුද්ධතො** උද්ධච්ච බවින් තොර වූයේ **සවෙ වාචා යතො** හෙතෙම වචනයෙන් සංයම වූයේ සිවු දෝෂයන්ගෙන් තොර වූ වචන කථා කරන්නේ වේ. **අකෙකාධනොති** යං හි ඛො වුත්තං ක්‍රෝධ විරහිතයැයි යමක් මුලින් කියන ලද ද පළමුව ඒ ක්‍රෝධය පිළිබඳව විස්තර කරනු කැමතිව **"අපිච කොධො තාව වත්තබෙබා"** යි කියන ලදී. **කොධො තාව වත්තබෙබා** පළමුව ක්‍රෝධය කිවයුතුයි. **දසාහාකාරෙහි කොධො ජායති** කරුණු දහයක් නිසා ක්‍රෝධය උපදියි. **අනත්ථං** මෙ **අචරිං** අනර්ථයක් මවිසින් කළේය. මේ ක්‍රමයෙන් සියලු පදයන්හි අර්ථ දතයුතුයි. **අඨානෙ වා පන කොධො ජායති** නොකරුණෙහි ක්‍රෝධය උපදියි. ඇතැමෙක් දැඩිව වසින්නේ යැයි කිපෙයි. නොවසීයැයි කිපෙයි. සූර්ය රශ්මිය දැඩියැයි තැවෙයි. සූර්ය රශ්මිය නැතැයි තැවේ. සුළඟ හමනවිට කිපෙයි. නොහමන විට ද කිපෙයි. ඇමදීමට නොහැක්කේ බෝකොළවලට කිපෙයි. සිවුර පොරවාගත නොහැකිව සුළඟට කිපෙයි. පය පැකිලී කුඩා උල් ආදියට කිපෙයි. ඒ සඳහා කියන ලදී. **"අඨානෙ වා පන ආඝාතො ජායති"** (අස්ථානයෙහි හෝ ක්‍රෝධය උපදී) යනුයි. එහි යටකී නව තැන්හි සත්ත්වයන් අරබයා උපන් බැවින් කර්මපථභේදය වේ. අස්ථාන ආඝාතය වනාහි සංස්කාරයන්හි උපන්නේ කර්මපථ භේදය නොකරයි. **චිත්තං ආඝාතෙනෙතා උපපනෙනා සිතේ ආඝාතො ඉතා** දැඩි, බලවත් **පටිඝාතො.** නැසීම්, වැනසීම් වශයෙන් **පටිඝං, ප්‍රතිවිරුද්ධ** වන්නේනුයි **පටිවිරොධො කිපීම් වශයෙන් කොපො. පකාපො සම්පකොපො** යි උපසර්ග යොදා පදය වර්ධනය කරන ලදී. ද්වේෂයට

පත්වීම් වශයෙන් දොසො, පදොසො සමපදොසො යි උපසර්ග වශයෙන් පදය වර්ධනය කරන ලදී. **චිත්තසස ව්‍යාපත්ත** සිතේ විපන්නතාව, විපන්නාකාරය, විපරිවර්තන වන ආකාරය ව්‍යාප්තියයි. සිත කිළිටිවෙමින් උපදින්නේනුයි **මනො පදොසො.** කිපීම් වශයෙන් **කොධො.** කිපෙන ආකාරය **කුජ්ඣනා** කිපෙන්නහුගේ ස්වභාවය **කුජ්ඣිතත්තං.** දූෂණය වේනුයි **දොසො. දුසසනා** දූෂණය වන ආකාරය. **දුසසිතත්තං** දූෂිත බව. ප්‍රකෘති ස්වභාවය දුරුකරන අර්ථයෙන් වන විපතට පත්වීම **ව්‍යාපත්ති.** ව්‍යාපජ්ජනා විපතට පත්වන ආකාරය. විරුද්ධ වන්නේනුයි **විරොධො** නැවත නැවත විරුද්ධ වේනුයි **පටිවිරොධො.** විරුද්ධ, ප්‍රතිවිරුද්ධ ආකාර වශයෙන් හෝ මෙය කියන ලදී. චණ්ඩික යනු චණ්ඩ තද පුද්ගලයා යි. ඔහුගේ ස්වභාවය **චණ්ඩිකකං.** "මෙය මනාව නොකියන ලදී. නපුරු ලෙස කියන ලදී. පුරිපූර්ණ නොවේ"යැයි **අසුරොපො.** කිපුණුවිට පිරිපුන් වචනයක් නම් නො පැවසේ. ඉදින් කිසිවකුට හෝ වේනම් එය අප්‍රමාණය. ඇතැමෙක් කඳුළු වගුරුවන අර්ථයෙන් අස්සුරොපනයෙන් "අස්සුරොපො"යි මේ පදයට අර්ථ දෙති. එය කරුණු රහිත ප්‍රකාශයකි. සතුටුවන්නාගේ ද කඳුලු වැගිරෙන බැවිනි. ඉහතින් පැවසූ පරිදි සතුටුසිත් ඇතිබවට විරුද්ධ, සතුටු සිත් නොමැති බව **අනත්තමනතා.** ඒ චිත්තයේම විපරීත බව මිස සත්ත්වයාගේ ස්වභාවයක් නොවන හෙයින් **චිත්තසස** යැයි කියන ලදී. **අධිමත්ත පරිත්තතා** වෙදිතබබා අධිමාත්‍ර භාවය ද ඉතා අඩු බවද බලවත් බව හා මඳ බව (අඩු වැඩි බව) යන අර්ථයයි. **කිඤ්චිකාලං** එක් දිනක්. "කඤ්චිකාලං" යන පාඨය ද යෙදේ. **චිත්තාවිලකරණමත්තෙනා හොති** සිතේ කළඹන ප්‍රමාණ. සිත කිළිටි කරන ප්‍රමාණය යන අර්ථයයි. "චිත්තල පකරණමත්තෙනා" යන පාඨය ද යෙදේ. එය එතරම් යහපත් පාඨයක් නොවේ. එහි සිත ක්ලාන්ත කරන මාත්‍රයක් යන අරුත ඇත. **නව තාව මුඛකුලාන විකුලානො හොති.** මුඛයේ හැකිලීම් දිගහැරීම් සිදු නොවේ. **න ච තාව හනුසඤ්ඣාපනො හොති.** දෙහනුයේ ඔවුනොවුන්ගේ සෙලවීමවත් සිදු නොවේ. **නව තාව ඵරුස වාචං නිච්ඡාරණො හොති** අනුන්ගේ මර්මස්ථාන සිදින ඵරුෂ වදන් මුවින් පිටකිරීම, පරොස් බස් මුවින් නික්මීමවත් සිදු නොවේ. **නව තාව දිසා විදිසානුවිලොකනො හොති** අනුන්ගේ සිත් විසිරවීමට ද දඬු ආදිය ගැනීමට ද දිශාද අනුදිශාවන් නැවත නැවත බැලීමවත් සිදු නොවේ.

නව තාව දණ්ඩසත්ථපරාමසනො හොති නැසීම සඳහා දඬුද එක් පැත්තක මුවහත ඇති ආයුධ ආදිය ද නොද ගන්නේ වෙයි. **න ච තාව**

දණ්ඩ සත්ථං අබභූකකිරණෝ හොති කියූ ආකාරයෙන් ම දඬුසැත් ආයුධ ආදී කිසිවක් ඔසවා පහරදීමවත් සිදු නොවේ. **නව තාව දණ්ඩසත්ථං අභිනි පාතනෝ හොති** මෙසේ දෙපරිද්දෙන් ම අනුන්ට දඬුවම් කිරීමට, පහර දීමට ආයුධ ගසාවත් නොදමයි. **න ච තාව ඡිදදවිඡිදදකරණෝ හොති** දඬු සැත් ආදිය දමාගැසීමෙන්, අනුන්ගේ ශරීරය දෙකඩ කිරීම ද දෙපරිද්දෙන් වණ කිරීම ද සිදු නොවේ. "ඡීවත්ත විචඡීවනකරණෝ" යන පාඨය ද යෙදේ. **නවතාව සමඞඤඣාන පළිභඤඣනෝ හොති** ශරීරය බිඳී, සුණු විසුණු කිරීමද නොම සිදුවේ. **නව තාව අංගමංග අපකඩ්ඪනෝ හොති** අංග ප්‍රත්‍යංග ගෙන, අල්ලා කැඩීම-බිඳීම ආදියක්වත් නොකරයි. **න ච තාව ජීවිතා වොරොපනෝ හොති** ජීවිතින්ද්‍රිය නැසීම ද සිදුනොවේ. **නව තාව සබ්බපරිචචාගාය සණ්ඨිතෝ හොති** සියලු අනුන්ගේ ජීවිත ද වනසා සියදිවි නසාගැනීම සඳහා සිටියේ නොම වෙයි. මෙය කියන ලදී:- යම්කලෙක අනුන්ගේ ජීවිත වනසා, තම දිවි නසා ගැනීමට සිටියේ ද එම අවස්ථාව "සබ්බචාග පරිචචාගී" නම් වේ. භාග්‍යවතුන් වහන්සේ එය වදාළේ මැයි.

"කොධං ඣත්වා සුඛං සෙති - කොධං ඣත්වා න සොචති
කොධස්ස විසමූලස්ස මධුරගඝස්ස බ්‍රාහමණ
වධං අරියා පසංසන්ති තංහි ඣත්වා න සොචති"

ක්‍රෝධය නසා සුවසේ නිදයි. ක්‍රෝධය නසා ශෝක නොකර සිටියි. බ්‍රාහ්මණය! විෂ වූ මුලක් ඇති මිහිරි අඟක් ඇති ක්‍රෝධයේ නැසීම ආර්යයෝ පසසති. එය නසා ශෝක නොකර, සුවසේ වසන්න.

යතෝ යම්කලෙක පරපුගගලං සාතෙත්වා සතුරු පුද්ගලයා නසා **අත්තානං සාතෙති** තමා මරයි. සිය දිවි නසා ගනියි. **පරමුස්සද ගතෝ** ඉතා බලවත් භාවයට ගියේ. **පරම වෙපුල්ලප්පත්තෝ** අති විපුල භාවයට ගියේ. **කොධස්ස පහීනත්තා** අනාගාමී මාර්ගයෙන් පැවසූ ස්වරූප ඇති ක්‍රෝධය ප්‍රහීණ කළ බැවින්. **කොධ වත්ථුස්ස පරිඤ්ඤාතත්තා** ක්‍රෝධයට පිහිටාධාර වූ හේතුභූත වූ ප්‍රිය, අප්‍රිය අස්ථාන සංඛ්‍යාත වූ වස්තුවේ ඤාත තීරණ පරිඥාවන්ගෙන් ව්‍යවස්ථාපනය කර දත් බැවින්. **කොධහෙතුස්ස උපඡ්ඣනත්තා** ක්‍රෝධයෙහි ජනක හේතුව වූ දෝමනස්ස සහගත සිතේ පහළවීම නැසූ බැවින් **තාසිං** බියවෙන ස්වරූප ඇත්තේ

වේ. **උත්තාසිං** ඉතා බියවන ස්වභාව ඇත්තේ වෙයි. **පරිතාසිං** හාත්පසින්ම බියවන ස්වභාව ඇත්තේ වෙයි.

භායති බියට පැමිණේ. **සන්තාසං ආපජ්ජති** විරූප භාවයට පැමිණේ. **කම්පී හොති** තමාගේ වර්ණනාව පවසන ස්වභාව ඇත්තේ වෙයි. **විකම්පී** විවිධව නානාප්‍රකාරව ගුණ වර්ණනා කරන ස්වභාව ඇත්තේ. **ජාතියා වා** ක්ෂත්‍රිය බව ආදී ජාති සම්පත්තියෙන් හෝ. **ගොත්තෙන වා** ගෞතම ගෝත්‍රාදී උත්කෘෂ්ඨ ගෝත්‍රයකින් හෝ. **කොල පුත්තියෙන වා** මහත් වූ කුලවත් භාවයෙන් හෝ. **වණ්ණපොක්ඛරතාය වා** වර්ණ සම්පන්න ශරීර ඇති බැවින්, ශරීරය ද පොක්ඛර යැයි කියයි. ඒ වර්ණ සම්පත්තියෙන් යුතු ඉතා රූප සම්පන්න භාවයෙන් යන අරුතයි. **ධනෙන වා** ආදියේ අර්ථ ඉතා ප්‍රකටය.

කුක්කුච්චං යනු නිද්දේසයේ උද්දේස පදයයි. එහි නපුරු ලෙස කල දෙය කුකතු නම්. ඒ ස්වභාවය කුක්කුච්ච නම්. එය පසුතැවෙන ලක්ෂණයයි. කළ නොකළ දේ ගැන ශෝක කිරීම රසයයි. විපිළිසර වීම පච්චුපට්ඨානයයි. කළ නොකල බව අත්තිවාරමයි. දාස බව මෙන් දතයුතුයි. **හත්ථ කුක්කුච්චං පි** අතින් කළ නපුරු ක්‍රියාව කුකත නම් වේ. එහි ස්වභාවය හත්ථ කුක්කුච්ච නම් වේ. **පාද කුක්කච්ච** ආදියෙහි ද මේ ක්‍රමයමයි. **අකප්පියෙ කප්පිය සඤ්ඤිතා** වලස් මස්, ඌරු මස් යැයි කියා කයි. අකැප භෝජන කැප භෝජන යැයි වළඳයි. විකාලයෙහි කාල සංඥාවෙන් අනුභව කරයි. අකැප පාන වර්ග කැප පානවර්ග සේ ගෙන බොයි. මෙය අකැප වූවෙහි කැප වූ සංඥාව නම් වේ.

කප්පියෙ අකප්පිය සඤ්ඤිතා ඌරුමස් ද, වලස් මස් යැයි කියා කයි. මුව මස් දිවි මස් යැයි ගෙන යයි. කැප වූ භෝජන අකැප භෝජනයැයි කියමින් වළඳයි. කාලයෙහි විකාල සංඥාවෙන් අනුභව කරයි. කැප වූ පාන වර්ග අකැප පාන සේ සලකා බොයි. මෙය "කැපවූවෙහි අකප්පිය සංඥාව" නම් වේ. **අවජ්ජවජ්ජ සංඤ්ඤිතා** නිදොස් වූවෙහි දෝෂ සංඥාව. **කුක්කුච්චායනා** කුකුස් කරන ආකාරය. **කුක්කුච්චායිතත්තං** කුකුස් කරන බව. **චෙතසො විප්පටිසාරෝ** සිතේ විරූප බව, නැසූ බව. **මනො විලෙඛො** සිතේ විපිළිසර බව. **කතත්තා ච අකතත්තා ච** කාය දුශ්චරිත කළ බැවින් ද කාය සුචරිත නොකළ බැවින් ද **කතං මෙ කාය දුච්චරිතං** මවිසින් කයින්, කෙලෙසුන්ගෙන් පිරී කුණුබවට ගෙනයන දුශ්චරිත කරන ලදී. **අකතමෙම**

කායසුචරිතං මවිසින් කයින් මනාව හැසිරීම නො කරන ලදී. **වචී දුච්චරිතවචී සුචරිතාදියෙහිද** මේ ක්‍රමයමයි. **නිරොධපරියොසානෙසු චිත්තසස** සත්ත්වයකුගේ, පුරුෂයකුගේ නොවේ. **උද්ධච්චං** උඩඟු වන, කලබල වන ආකාරය අවූපසමො නොසන්සිඳෙන බව. **සිත වික්ෂේප වේනුයි චෙතසො විකෙඛපො. භනතතතං චිත්තසස** යනු සිතේ තැතිගත් ස්වභාවයයි. භ්‍රාන්තයාන, භ්‍රාන්තගොන් ආදින්ගේ මෙනි. මෙයින් ඒකාරම්මණයෙහිම කම්පාවීම කියන ලදී. උද්ධච්චය වනාහි ඒකාරම්මණයේම කම්පා වේ. විචිකිච්ඡාව නානාරම්මණයන්හි (සැලේ.) කම්පා වේ. **ඉදං වුච්චති උද්ධච්චං** යන්නෙන් මෙයින් උද්ධත (සැලෙන) බව කියයි.

මුසාවාදං පහාය මෙහි මුසා යනු රැවටීම පෙරටු කරගත් අර්ථය බිඳින වාග් ප්‍රයෝගයයි. නැතහොත් කාය ප්‍රයෝගයයි. රවටන, මුළාකරන අදහසින් අනුන් රැවටීම පිණිස, වාග් ප්‍රයෝගයෙන් ඔසවා තැබූ චේතනාව මුසාවාදයයි. මේ වෙනත් ක්‍රමයකි. මුසා යනු අභූත වූ සත්‍ය නොවූ වස්තුවයි. **වාදො** එය සත්‍ය, තත්‍ය අයුරින් දැනුම්දීමයි. ලක්ෂණ වශයෙන් වනාහි අසත්‍ය වූවක්, සත්‍ය වූවක් ලෙස දක්වනු කැමැත්තා හට ඊට උත්සාහවත් වූ චේතනාව මුසාවාදයයි. **තං මුසාවාදං පහාය** මේ මුසාවාද චේතනා සංඛ්‍යාත දුසිල් බව අත්හැර. **පටිවිරතො** ප්‍රහීන වූ කාලයේ සිටම ඒ දුසිල් බවින් වෙන් වූ, දුරු වූ බැවින්, ඔහුට චක්ඛුසෝත විඤ්ඤෙය්‍ය ධර්ම මිශ්‍රවීමක් නැත. මෙසේ සෙසු පදයන්හි ද අර්ථ දතයුතුයි. සත්‍ය කියයි නුයි **සච්චවාදී**. සත්‍යයෙන් සත්‍ය සසඳයි. ගටයිනුයි **සච්චසන්ධො**. අතරින් පතරවත් බොරු නො කියයි යන අර්ථයයි. යම් පුරුෂයෙක් විටෙක බොරු කියයි. තවත් විටෙක ඇත්ත කියයි. ඔහු මුසාවාදයෙන් නො වැළකුණු හෙයින් සත්‍යයෙන් සත්‍ය නොගටයි. එනිසා ඔහු සච්චසන්ධ නොවේ. මොහු එවැන්නෙක් නොවේ. සිය ජීවිතය හේතුවෙනුදු බොරු නොකියා, සත්‍යයෙන් සත්‍ය ගලපන්නේනුයි සච්චසන්ධ නම්. **ථෙතො** තිර වූයේ, ස්ථිර කථා ඇති යන අර්ථයයි. ඇතැම් පුද්ගලයෙක් කහදියර සායමක් මෙන් ද දහයියා ගොඩක සිටවූ කණුවක් මෙන් ද අසුපිට තැබූ කොමඬු ගෙඩියක් මෙන් ද අස්ථිර වූ කථා ඇත්තේ වේ. ඇතැම් පුද්ගලයෙක් ගල කෙටූ අකුරක් මෙන් ද ඉන්ද්‍රඛීලයක් මෙන් ද වූ ස්ථිර වූ කථා ඇත්තේ වෙයි. කඩුවෙන් හිස සිඳින්නේ නමුදු වචන දෙකක් නම් නොකියයි. මෙතෙම "ථෙතො" (තිර) යයි කියනු ලැබේ. **පච්චයිකො** යනු ඇදහිය යුතු, පිළිගත යුතු කථා ඇති යන අර්ථයයි. ඇතැම් පුද්ගලයෙක් ඇදහිය යුතු කථා ඇත්තෙක් නොවේ. "මෙය කවරකු විසින් කියන

ලද්දේ ද?"යි ඇසූවිට "අසුවලා විසින්" යැයි කී කල්හි "ඔහුගේ වචන විශ්වාස කරන්න එපා"යි කිවයුතු බවට පැමිණේ. එකෙක් ඇදහිය යුතු කථා ඇත්තෙක් වේ. "මෙය කවරකු විසින් කියන ලද්දේ ද?"යි අසා "අසුවලා විසින්"යැයි කී විට "ඉදින් ඔහු කීවේ නම් එයම සැහේ" යැයි කියා "මෙහි පරීක්ෂා කළයුත්තක් නැත. සැකයක් නැත. මෙය මෙසේමයැ"යි කිවයුතු වන්නේද ඔහු පච්චයික නම් වූ ඇදහිය යුතු කථා ඇත්තෙකි. **අවිසංවාදකො ලොකස්ස** "ඒ සත්‍යවාදී බවනිසා ලෝකයා නොරවටනුයේ වේ" යන අරුතයි. **පිසුනාවාචං පහාය** ආදියෙහි යම් වචනයකින් යමෙකුට කථා කරයි ද එය ඇසීමෙන් ඔහුගේ හදවතේ එය කියන්නා කෙරෙහි ප්‍රියබවක් ද කියවෙන්නා පිළිබඳව කළකිරුණු ශූන්‍ය බවක් ද ඇතිකරනුයේ පිසුණාවාචාවයි. කේලමයි. යම් වචනයක් කියනවිට තමාත්, අනුනුත් සැඩපරුෂ වේ නම්, යම් වචනයක් ස්වභාවයෙන්ම රළු පරුෂ නම්, කණට ප්‍රිය නොවේනම් - හදවතට ප්‍රිය බවක් නොමැති නම් එය "ඵරුසාවාචා" නම් වේ. යමෙකු විසින් හිස්, නිරර්ථක කථා කරනු ලබයිද ඔහු **සම්ඵප්පලාපො** නම් වේ. මේ පාපධර්මයන්ට, වාග් දෝෂයන්ට මූල භූත වූ චේතනාවත් "පිසුණාවාචා" යනාදී නාමයන්ම ගෙන සිටින්නේය. එයම මෙහිදී අදහස් කරන ලදී. **ඉමෙසං භෙදාය** කියන ලද යමකුන්ගේ සමීපයේ අසන ලද ද ඔවුන්ගේ භේදය සඳහා. **භතනානං වා සඤ්ඤාතා** මිතුරන් දෙදෙනෙකු හෝ සමාන උපාධ්‍යායවරු ආදීන් හෝ කිසියම් කරුණකින් බිඳුනාහු ද ඔවුන් වෙත වෙන වෙනම ගොස්, මෙබඳු කුලයක උපන්නා වූ, මෙසේ බහුශ්‍රැත වූ යුෂ්මතුන්ට මෙය සුදුසු නොවේ යනාදිය කියා ඔවුනොවුන් සමගි කරන ලදුයේ. **අනුප්පදාතා** සමගි බවෙහි දැඩි කිරීමයි. සමගිව වෙසෙන දෙදෙනෙකු දැක, මෙබඳු කුලයක උපන් නුඹලාට, මෙබඳු වූ ගුණ සම්පත්තීන්ගෙන් යුතු නුඹලාට මේ සමඟිව විසීම ඉතාම සුදුසුයැයි ආදිය කියා සමඟි බව දැඩිකරන ලදී යන අර්ථයයි. සමගි වූ විසීමක් ඇත්තේනුයි ඇලුම් ඇති **සමගහාරාමො** වේ. යම්තැනක සමගියක් නොමැති ද එහි විසීමද නො කැමති වේ යන අර්ථයයි. "සමගග රාමො" යන පාඨය ද වේ. මේ අර්ථයම වේ. **සමගහරතො** සමඟි වූවන් කෙරෙහි ඇලුණු, ඔවුන් අත්හැර වෙනත් තැනක යෑමටද කැමති නොවේ යන අර්ථයයි. සමඟි වූවන් දැකත්, ඔවුන් ගැන අසාත් අතිශයින් සතුටු වේනුයි **සමගහනන්දි. සමගහකරණිං වාචං භාසිතා** යම් වචනයක් සත්ත්වයන් සමගි කිරීමට ම යෙදේ ද, ඒ සමගි බවේ ගුණ පළකරන වචනම කියයි. වෙනෙකක් නොකියයි.

අනුන්ගේ මර්මස්ථාන සිඳින කාය-වාග් ප්‍රයෝගයෙන් යුතු ඒකාන්ත පරුෂ චේතනාව **එරුසාවාචා** නම් වේ. නෙලා යන්නෙහි එලා යනු දෝෂ සහිත අර්ථයයි. "මොහුට එල නැතැ" (න+අසස+එලා)යි නෙලා වේ. නිදොස් වූ යන අරුතයි. 'නෙලංහොසෙත පඤ්ඤද' යන මෙහි කියූ ශීලය මෙනි. **කණණසුඛා** බාහිර්ජන මධුරභාවයෙන් කණට මිහිරි වූ ඉදිකටුවෙන් විදින්නාක් මෙන් කණට දුක් නූපදවයි. මිහිරි අර්ථ ඇති බැවින් මුලු සිරුරෙහි ම කෝපය නූපදවා ප්‍රේමය උපදවානුයි **පෙමනීයා**. නොනසමින් හදවතට යයි. සුවසේ සිතට පිවිසේනුයි **හදයංගමා**. ගුණයන්ගෙන් පිරිපුන් බැවින් පුරෙහි වූ **පොරී**. පුරයේ හැදී වැඩුණු ස්ත්‍රිය මෙන් සියුමැලි වූ අර්ථයෙන් ද "පොරී" නම් වේ. මොවුහු පුරයේ වූයේ නුයි පොරී නම් වේ. නගරවාසීන්ගේ ශිෂ්ට කථාව යන අර්ථයයි. නුවරවැසියෝ වනාහි යෝග්‍ය වූ කථාවෙන් ම යුක්ත වෙති. පියා වැන්නන්ට පියාණෙනි!යිද සෝයුරන් වැන්නන්ට "සහෝදරය" යැයි ද අමතති. මෙවැනි ප්‍රිය කථාව බොහෝ ජනයාට කැමති වේනුයි **බහුජන කනතා**. කැමති වූ හෙයින් ම බොහෝ ජනයාගේ සිතේ මනාප වූ චිත්ත වෘද්ධියක් ඇතිකරන්නේනුයි **බහුජන මනාපා**.

අනර්ථය දන්වන, කාය වාග් ප්‍රයෝගයෙන් ඔසවා තැබූ අකුසල චේතනාව **සමඵපලාපො**. සුදුසු කාලයෙහි කියන්නේනුයි **කාලවාදී**. "කිවයුතු කාලය, අවස්ථාව සලකා කියයි" යන අර්ථයයි. සිදු වූ සත්‍ය වූ ස්වභාවයක්ම කියන්නේනුයි **භූතවාදී**. මෙලෝ පරලෝ යහපත ගෙන දෙන අර්ථ සහිත වූ දෙයක්ම කියන්නේනුයි **අත්ථවාදී**. නව ලෝකෝත්තර ශ්‍රී සද්ධර්මය ආශ්‍රය කරගෙන කථා කරන්නේනුයි **ධම්මවාදී**. සංවර විනය, ප්‍රහාන විනය ආශ්‍රය කරගෙන කියානුයි **විනයවාදී**. නිධාන යනු තැබීමට සුදුසු අවකාශයයි. එබඳු නිදානයක් මෙයට ඇත්තේනුයි **නිධානවති** නම් වේ. හදවතේ තබාගත යුතු වචන කියන්නේය යන අර්ථයයි. **කාලෙන** මෙබඳු කථා කරමින් ද "මම නිධානවත් වචන කථා කරමි"යි අකාලයේ, නුසුදුසු අවස්ථාවේ කථා නොකරයි. සුදුසු - යෝග්‍යතම අවස්ථාවේ කථා කරන්නේ වෙයි. **සාපදෙසං** උපමා උදාහරණාදිය සහිතව, කරුණු සහිතව. **පරියන්තවතිං** පිරිසිදීම් දක්වා, ඔහුගේ කථාවේ වෙන් වෙන් කිරීම් ඇතිව කථාකරන යන අර්ථයයි. **අත්ථ සංහිතං** නානාප්‍රකාරව හික්මීමෙන් යුක්තව බෙදා දක්වන නිසා, සම්පූර්ණයෙන්ම ගැනීමට හැකිවන්නේය, අර්ථ සම්පන්නය. යම් යහපත් වැඩදායක කරුණක් වේද ඔහු එය කථා කරයි.

ඒ අර්ථයෙන් යුක්ත හෙයින් අර්ථ සංහිත වචන කියයි. අනිකක් දක්වා අනිකක් නොකියයි යන අර්ථයයි. **චතුදොසා පගතං වාචං භාසති** මුසාවාදාදී සිවු දෝෂයන්ගෙන් දුරු වූ, ඉවත් වූ වචන කථා කරයි. **අත්තනිංසාය තිරච්ඡානකථාය** දෙතිස් තිරිසන් කථාවෙන්, සගමොක් සුව වලකන කථාවෙන් යුක්ත වූයේ යන අදහසයි. **දසකථා වත්ථූනි** අල්පේච්ඡාදී දස විවට්ට නිශ්‍රිත කථාවට වස්තු වූ කාරණ **අප්පිච්ඡකථං** මෙහි අප්පිච්ඡ යනු අධික ආශාවෙන්, ඉච්ඡාවෙන් දුරු වූ, ආශා රහිත, තෘෂ්ණා රහිත කථාවයි.

මෙහි ඛ්‍යඤ්ජනය ඉතිරි වූවක් (සාවශේෂය) මෙනි. අර්ථය වනාහි ඉතිරි නොවූවක් (නිරවශේෂය) මෙනි. රහතන් වහන්සේලාට අණුවක් පමණ වූ ද තණ්හාවක් (ඉච්ඡා-ආශාවක්) නම් නැත. තවද මෙහිදී අත්‍රිච්ඡතා, පාපිච්ඡතා, මහිච්ඡතා, අප්පිච්ඡතා යන භේදයන් පිළිබඳව දතයුතුයි. මෙහි තමාට ලැබුණු දෙයෙහි අතෘප්තියත් අනුන්ගේ ලැබීමෙහි දුක්වෙමින් එයද තමාට වේවායි පතන අධික ආශාව අත්‍රිච්ඡතා නම් වේ. මේ අත්‍රිච්ඡතාවයෙන් යුතු පැවිද්දාට එක බඳුනෙහි පිසූ කැවුම්වලින් වුවත් තමාගේ පාත්‍රයට බෙදූ කැවුම මනාව නොපිසූ, ඉතා කුඩා කැවුමක් මෙන් වැටහේ. ඒ භාජනයෙන්ම අන්‍යයන්ට බෙදූ කැවුම් මනාව පිසූ, ඉතා විශාල කැවුම් මෙන් වැටහේ. නැති ගුණයට කෙරෙන සම්භාවනා පිළිගැනීමෙහි පමණ නොදන්නා බව ද පාපිච්ඡතා නම් වේ. මේ සසුනෙහි ඇතැමෙක් අශ්‍රද්ධාවන්තව සිටිමින්, 'ජනයා මා ශ්‍රද්ධාවන්තයෙකි'යි දනීවායි ආදී වශයෙන් ආවේමය. මෙයින් යුතු ඒ පුද්ගලයෝ කුහක බවෙහි පිහිටියෝ වෙති. ඇති ගුණ සම්භාවනා පිළිගැනීමෙහි පමණ නොදන්නා බව මහිච්ඡතා නම් වේ. මෙ සසුනෙහි ඇතැමෙක් ශ්‍රද්ධාවන්තව සිටිමින් 'ජනයා මා ශ්‍රද්ධාවන්තයකු ලෙස දනීවා'යි කැමති වේ. සිල්වතෙකුව සිටිමින්, 'ජනයා මා ශ්‍රද්ධාවන්තයෙකි'යි දනීවායි ආදී වශයෙන් ආවේමය. මෙයින් යුතු ඒ පුද්ගලයෝ කුහක බවෙහි පිහිටියෝ වෙති. ඇති ගුණ සම්භාවනා පිළිගැනීමෙහි පමණ නොදන්නා බව මහිච්ඡතා නම් වේ. මෙ සසුනෙහි ඇතැමෙක් ශ්‍රද්ධාවන්තව සිටිමින් 'ජනයා මා ශ්‍රද්ධාවන්තයකු ලෙස දනීවා'යි කැමති වේ. සිල්වතෙකුව සිටිමින්, 'ජනයා මා සිල්වතෙකු ලෙස දනීවා'යි මේ ක්‍රමයෙන් ආවේමය. මේ මානසිකත්වයෙන් යුතු පුද්ගලයා සතුටුකිරීම ඉතා අපහසුය. වැදූ මවට පවා ඔහුගේ සිත සැනසීමට නොහැකිවන්නීය. එහෙයින් මෙය කියන ලද්දේමැයි.

අගිකඛඤ්ඤා සමුදෙඤ්ඤා චමහිචෙඡා චාපි පුගගලෝ
සකටෙන පචචයෙ දෙනතු තයොපෙතෙ අතපපියාති

ගිනිකඳ, මුහුද හා මහිච්ඡ පුද්ගලයා යන තුන්දෙන කරත්ත ගණනින් ප්‍රත්‍ය ලබාදුන්නත් කිසිදාක දැන් ඇත'යි සෑහීමකට පත් නොවේ.

ඇති ගුණ ප්‍රකට නොකිරීම ද ආහාරාදියේ පමණ දන්නා බව ද අප්පිච්ඡතා නම් වේ. ඉන් යුක්ත පුද්ගලයා තමා කෙරෙහි විද්‍යමාන වූද ගුණ සඟවනු කැමතිව ශ්‍රද්ධාවන්තයෙක්ව සිටිමින්, ජනයා මා සැදැහැවතෙකු ලෙස දනීවා'යි කැමති නොවේ. සිල්වතෙක්ව, ප්‍රකර්ශ විවේකයෙහි නිරත වූවෙක්ව, බහුශ්‍රැතයෙක්ව, ආරඹූ වීර්ය ඇත්තෙක්ව, සමාධි සම්පන්නව, ප්‍රඥාවන්තයෙක්ව, ක්ෂීණාශ්‍රවයෙක්ව සිටිමින් 'ජනයා මා ක්ෂීණාශ්‍රවයෙකැ'යි දනීවායි කැමති නොවේ. මජ්ඣන්තික තෙරුන් මෙනි. මෙසේ අල්පේච්ඡ භික්ෂුව නූපන් ලාභ උපදවයි. උපන් ලාභ ස්ථාවර කරයි. දායකයන්ගේ සිත සතුටු කරවයි. තමාගේ අල්පේච්ඡ බව නිසා එම භික්ෂුව යම් යම් සේ අල්පව ගන්නේ ද ඒ ඒ ආකරයෙන්ම ඒ පිළිවෙතෙහි පැහැදුණු මිනිස්සු බොහෝ ප්‍රත්‍ය දෙති. තවත් ක්‍රමයකට අනුව අල්පේච්ඡ පුද්ගලයෝ සතරදෙනෙක් වෙති. පච්චයප්පිච්ඡ, ධුතංගප්පිච්ඡ පරියත්ති අප්පිච්ඡ හා අධිගම අප්පිච්ඡ යනු ඒ සතරදෙනායි. එහි සිව්පසයෙහි අල්පේච්ඡ වූයේ පච්චයපපිච්ච වේ. යමෙක් දායකයාගේ බලය (සිතැඟි) ද දනියි. දෙය්‍යධර්ම සම්පත්තිය ද දනියි. තමාගේ බලය ද දනියි. ඉදින් දෙය්‍ය ධර්මය (දාන වස්තුව) බොහෝ වේද දායකයා අල්පයක් දෙනු කැමති වේද එනිසා දායක සිත බලා අල්පයක් ගනියි. දාන වස්තුව අල්ප වුවත් දායකයා බොහෝ දෙනු කැමති වේද එවිට දාන වස්තුව අනුව සලකා අල්පයක් ගනියි. දාන වස්තුවද බොහෝ වේද දායකයාද බොහෝ කොට දෙනු කැමතිවේද එවිට තමාගේ බලය, ප්‍රමාණය වටහාගෙන තම ප්‍රමාණයට පමණක් පිළිගනියි. (මෙසේ පච්චයප්පිච්ඡ පුද්ගලයා දතයුතුයි.)

ධුතංග සමාදන් වූ පුද්ගලයාගේ තමා සතු ගුණාංග අනුන් දැන නොගනීවා යන කැමැත්ත ඇති බව ධුතංගප්පිච්ඡ නම් වේ. යමෙක් තම බහුශ්‍රැත බව දන්වනු නො කැමැත්තේ ද එය පරියත්ති අප්පිච්ඡතාවයයි. යමෙක් සෝවාන් ආදී මගඵල ලැබ, ඒ බව දන්වනු නො කැමති වේද, මෙය අධිගම අප්පිච්ඡතාවයයි. ක්ෂීණාස්‍රවයා වනාහි අත්‍රිච්ඡතාවද

පාපිච්ඡතාවද අත්හැර සර්වප්‍රකාරයෙන්ම ආශාවන්ට විරුද්ධ වූ, අලෝභ නම් වූ පිරිසිදු අල්පේච්ඡතාවයෙන් යුක්ත බැවින්, අප්පිච්ඡ නම් වේ. ඇවැත්නි, අත්‍රිච්ඡතා, පාපිච්ඡතා, මහිච්ඡතා යන මේ ධර්ම අත්හළ යුතුයැයි ඒවායෙහි ආදීනව දක්වා, මෙබඳු වූ අල්පේච්ඡතාවයේ නියුක්තව හැසිරිය යුතුයැයි කියමින් අල්පේච්ඡ කථාව කරයි නම් වේ.

සන්තුට්ඨිකථං ආදියෙහි විශේෂාර්ථ පමණක්ම දක්වන්නෙමු. සෙසු පදයන්හි අර්ථ යෝජනාව ඉහත පැවසූ පරිදිම දතයුතුයි. **සන්තුට්ඨිකථං** ඒ ඒ ප්‍රත්‍ය සන්තෝෂයෙන් යුක්ත කථාවයි. ඒ මේ සන්තෝෂය දොළොස් වැදෑරුම් වේ. ඒවානම්, චීවරයෙහි යථාලාභ සන්තෝෂය, යථාබල සන්තෝෂය, යථා සාරුප්‍ය සන්තෝෂය යනුවෙන් තුන්වැදෑරුම් වේ. පිණ්ඩපාතයෙහි ද මේ ක්‍රමයමයි. මේ එහි ප්‍රභේද වර්ණනාවයි.

මේ සසුනෙහි භික්ෂුවක් සුන්දර හෝ අසුන්දර සිවුරක් ලබයි. උන්වහන්සේ ඉන් ම සතුටට පත්වෙති. අනිකක් නො පතති. ලැබුනත් වෙනත් සිවුරක් නොගනී. මෙය මොහුගේ සිවුරෙහි යථාලාභ සන්තෝෂය නම් වේ. එසේම යමෙක් ප්‍රකෘති (ස්වභාව) යෙන්ම දුර්වල, ආබාධ සහිත ජරා ජීර්ණ වූවෙක් වේද, ඔහු බර ගොරෝසු සිවුරක් දැරීමට අසමත් වේද, තමාට ලැබුණු ගරු සිවුර සබ්‍රහ්මචාරී භික්ෂුවක සමග හුවමාරු කරගෙන සැහැල්ලු සිවුරක් ලැබ ඉන් සතුටට පත්වේ. මෙය උන්වහන්සේගේ චීවරයේ යථාබල සන්තෝෂයයි. තවත් භික්ෂුවකට ප්‍රණීත වූ උතුම් ප්‍රත්‍ය ලැබේ ද උන්වහන්සේ ඉතා උතුම් වස්ත්‍රයෙන් කළ සිවුරු ආදියෙන් එක්තරා වටිනා සිවුරක් හෝ බොහෝ සිවුරු හෝ ලැබ, මෙය පැවිදිව බොහෝ කල් ඉක්මවූ තෙරවරුන්ට 'මෙය බහුශ්‍රැත භික්ෂූන්ට සුදුසුය'යි මෙය ගිලන් භික්ෂූන්ට 'මෙය අල්පලාභී භික්ෂූන්ට වේවා'යි යනාදී ලෙස යෝග්‍ය පරිදි පරිත්‍යාගකොට උන්වහන්සේලාගෙන් ලැබෙන පැරණි සිවුරකින් හෝ කැලිකසල ගොඩවල් ආදියෙන් හෝ අහුලාගත් රෙදි සෝදා මසාගත් සඟල සිවුරක් දරන්නේ නමුදු සතුටට පත්වේ. ඒ ප්‍රණීත ප්‍රත්‍යලාභී භික්ෂුවගේ සන්තෝෂය, චීවරයේ යථා සාරුප්‍ය සන්තෝෂය නම් වේ.

මේ සසුනෙහි භික්ෂුව රළු වූ හෝ ප්‍රණීත වූ හෝ පිණ්ඩපාතයක් ලැබ ඉන් යැපේනම් වෙනත් ආහාරයක් නොපතයි නම්, ලැබුනත් පිළිනොගනියි නම් මෙය උන්වහන්සේගේ පිණ්ඩපාතයේ යථාලාභ

සන්තෝෂයයි. යම් භික්ෂුවකට තමාගේ ස්වභාවයට විරුද්ධ වූ හෝ අපත්‍ය වූ හෝ පිණ්ඩපාතයක් ලැබේද එය වැළඳීමෙන් උන්වහන්සේගේ රෝග වැඩේ ද අපහසුවක් ඇති වේද උන්වහන්සේ ඒ ආහාරය සබ්‍රහ්මචාරී භික්ෂූන්ට දී උන්වහන්සේලාගෙන් ලැබෙන පථ්‍ය වූ යෝග්‍ය වූ පිණ්ඩපාතයක් වළඳ මහණදම් පුරමින් සතුටට පත් වෙති. මෙය උන්වහන්සේගේ පිණ්ඩපාතයෙහි යථාබල සන්තෝෂය නම් වේ. තවත් භික්ෂුවක් බොහෝ ප්‍රණීත පිණ්ඩපාතාහාරයක් ලබා, උන්වහන්සේ එය සිවුරු දුන්නාක් මෙන් චිරපබ්බජිත භික්ෂූන්ට ද බහුශ්‍රැත අල්ප ප්‍රත්‍යලාභීන්ට ද ගිලන් භික්ෂූන්ට ද දී, උන්වහන්සේලාගෙන් ලැබෙන හෝ ඉතිරි වූ හෝ ආහාරයකින් යැපේ. නැතිනම් පිණ්ඩපාතයේ හැසිර ලැබෙන මිශ්‍ර වූ අහරකින් යැපේ. මෙසේ සතුටට පත්වීම ඒ භික්ෂුවගේ පිණ්ඩපාතයේ යථාසාරුප්‍ය සන්තෝෂය නම් වේ.

මේ සස්නෙහි භික්ෂුවක් තමාට ලැබුණු මනාප වූ හෝ අප්‍රියජනක වූ හෝ සෙනසුනින් ම සතුටට පත්වේ. ඊට එරෙහි වූ ද්වේෂ සිතුවිල්ලකුදු නූපදවයි. යටත්පිරිසෙන් තණ ඇතිරියකින් පවා ලද පරිදි සතුටුවේ. මෙය උන්වහන්සේගේ සෙනසුනෙහි යථාලාභ සන්තෝෂයයි. යම් භික්ෂුවකටත තම ස්වභාවයට විරුද්ධ වූ හෝ රෝගාබාධයන්ට විරුද්ධ වූ හෝ සෙනසුනක් ලැබේ. එහි විසීමෙන් උන්වහන්සේට අපහසුවක් වේ. එය වෙනත් සබ්‍රහ්මචාරී හිමිනමකට දී, හුවමාරු වශයෙන් ලැබෙන සප්පාය සෙනසුනින් සතුටු වේ. මෙය උන්වහන්සේගේ සෙනසුනෙහි යථාබල සන්තෝෂයයි. අනික් භික්ෂුවක් සසර මහ පින් කළ බැවින් ලෙන්, මණ්ඩප, කූටාගාරාදී බොහෝ උසස් සෙනසුන් ලබයි. උන්වහන්සේ එම සෙනසුන්ද ඉහත සිවුරු බෙදා දුන්නාක් මෙන් චිර පබ්බජිත භික්ෂූන්ට ද බහුශ්‍රැත භික්ෂූන්ට ද අල්පලාභී හා ගිලන් භික්ෂූන්ට ද දී, ලද තැනක වෙසෙමින් සතුටට පත් වෙති. මෙය උන්වහන්සේගේ සේනාසනයේ යථාසාරුප්‍ය සන්තෝෂයයි. යමෙක් 'සැප පහසු ඇති උතුම් සෙනසුන් නම් ප්‍රමාදයට ස්ථානය. එහි හුන්නහුගේ සිත කය ථීනමිද්ධ නීවරණයෙන් වෙලාගනියි. නිදිමත වී, නිදාගත්තහුට නැවත නැගිටීමේදී පාප විතර්ක පහළ වේ'යැයි සලකා බලා එබඳු සුවපහසු සෙනසුනක් ලැබුණේ නමුදු නොපිළිගනියි. එබඳු සෙනසුන් හැරදමා අභ්‍යවකාශ, එළිමහන්හි රුක් මුල් ආදියෙහි වසමින් සතුටු වේ. මෙය එම භික්ෂුවගේ යථා සාරුප්‍ය සන්තෝෂයයි.

මේ සසුනෙහි ඇතැම් භික්ෂුවක් රළු වූහෝ උතුම්-ප්‍රණීත වූ හෝ බෙහෙත් ආදියක් ලබා, ඉන් සතුටට පත් වේ. අනිකක් නොපතයි. ලැබුන ද වෙනත් බෙහෙතක් නොගනියි. මෙය ඒ භික්ෂුවගේ ගිලානපච්චය පිළිබඳ යථාලාභ සන්තෝෂය නම් වේ. තෙලින් ප්‍රයෝජන ඇති යම් භික්ෂුවකට පැණි ලැබේද උන්වහන්සේ එය සබ්‍රහ්මචාරී භික්ෂූන්ට දී, උන්වහන්සේලාගෙන් ලද හෝ වෙනත් ක්‍රමයකින් හෝ ලද තෙලක් යොදා බෙහෙත් සාදාගෙන ඉන් සතුටට පත්වෙති. මෙය උන්වහන්සේගේ ගිලානප්‍රත්‍යයෙහි යථාබල සන්තෝෂයයි. වෙනත් මහ පිනැති භික්ෂුවකට බොහෝ තෙල්, මීපැණි ආදී ප්‍රණීත බෙහෙත් ආදිය ලැබේ. උන්වහන්සේ ඒවා සිවුරු මෙන් චිර පබ්බජිත, බහුශ්‍රැත, අල්පලාභී, ගිලන් භික්ෂූන්ට දී අනික් බෙහෙතක් සොයාගෙන හෝ අනික් භික්ෂූන්ගෙන් ලද දෙයකින් හෝ යැපෙමින් සතුටට පත්වෙති. යම් භික්ෂුවකට එක බඳුනක චතුමධුරද තවත් බඳුනක ගව මුත්‍රවල දැමූ අරළුද තබා 'ස්වාමීනි, කැමති බෙහෙතක් ගනුව'යි පැවසූ කල්හි 'උන්වහන්සේගේ ඒ රෝගය ඒ දෙකෙන් ඕනම එකකින් සන්සිඳේ නම් මුත්‍ර හරීටකය නම් බුද්ධාදී මහෝත්තමයන් විසින් වර්ණනා කරන ලදී' යැයි චතුමධුර ප්‍රතික්ෂේප කර මුත්‍ර පාරීටකයෙන් බෙහෙත් කරන්නේ අතිශයින් සතුටට පත්වූවෙක්ම වේ. මෙය උන්වහන්සේගේ ගිලානප්‍රත්‍යයෙහි යථාසාරුප්‍ය සන්තෝෂයයි. මේ දැක්වූ සිවුපසයන්ගේ ත්‍රිවිධාකාර සන්තෝෂයන් අතුරින් යථා සාරුප්‍ය සන්තෝෂයම අග්‍ර වේ. රහතන් වහන්සේ එක් එක් ප්‍රත්‍යයෙහි මේ ත්‍රිවිධ සන්තෝෂයෙන් ම සතුටු වෙති.

පවිවෙකං කථං යනු විවේකයෙන් යුතු කථාව දක්වයි. ප්‍රකර්ශ (උතුම්) විවේක තුනකි. කාය පවිවේකය, චිත්ත පවිවේකය හා උපධි පවිවේකය යනුවෙනි. මෙහි ඇතැම් භික්ෂුවක් තනිවම, හුදකලාව යයි. සිටියි. හිඳියි. නිදාගනියි. ගමට පිඬු පිණිස යයි. ඉන් නික්මෙයි. සක්මන් කරයි. තනිව හැසිරෙයි. තනිව වාසය කරයි. මෙසේ සියලු කටයුතු තනිව කිරීම 'කාය පවිවේක' නම් වේ. එය කියන ලදී. 'කෙලෙස් රහිත වූ කයින් හුදකලා බවෙහි ඇලී වෙසෙන්නවුන්ගේ කාය විවේකය ද ඉා පිරිසිදු භාවයට පත්, නීවරණ රහිත වූවන්ගේ පවිත්‍ර වූ චිත්ත විවේකය ද විසංඛාරගත වූ උපධි රහිත පුද්ගලයන්ගේ උපධි විවේකය ද යන විවේකයන්ගෙන් යුක්තව වෙසේ' යනුයි.

අසංසගගකථං අසංසර්ග කථාවයි. මෙහි සවණ සංසර්ගය, දස්සන සංසර්ගය, සමුල්ලාප සංසර්ගය, සම්භෝග සංසර්ගය හා කාය සංසර්ගය යනුවෙන් සංසර්ගය පස්වැදෑරුම් වේ. ඒ අතුරින් 'මේ සසුනෙහි භික්ෂුවක් 'අසුවල් ගමේ හෝ අසුවල් නියම්ගමේ හෝ වෙසෙන අසුවල් ස්ත්‍රිය හෝ අසුවල් කුමරිය ඉතා ලස්සනය. දර්ශනීය වන්නේය. ප්‍රසාද ඵලවන්නීය. උතුම් ශරීර වර්ණයෙන් යුක්ත වන්නීයැ'යි අසයි. මේ වර්ණනාව අසන එම භික්ෂුව ශෝකයෙන් ගිලාබසියි. උකටලී වෙයි. බඹසර වාසය පවත්වාගත නොහැකි වෙයි. ශික්ෂා රැකීම දුබල බව ප්‍රකාශ නොකර ගිහිබවට පත්වේ.' මෙසේ අනුන් විසින් කියනු ලබන රූප වර්ණනාව හෝ තමා සමග දැක්වූ සිනාසීම්, කෙළිකවටකම්, ගීත ශබ්ද ඇසීමෙන් ශ්‍රෝත විඤ්ඤාණ වීථි වශයෙන් උපදින රාගය, සවණ සංසර්ග නම්වේ.

'මේ සසුනෙහි ඇතැම් භික්ෂුවක් ඉහත කීලෙස නො අසයි. නමුත් තමන් ම ඉතා ලස්සන, දැකුම්කළු, ප්‍රසාද ඵළවන, විශිෂ්ට රූසපුවකින් යුතු ස්ත්‍රියක් හෝ කුමරියක් දකියි. ඇය දැකීමෙන් ශෝකයෙන් හැකිලෙයි. උකටලී වෙයි. බඹසර වාසය රැකගැනීමට අසමත් වෙයි. ශික්ෂා රැකීම අපහසු බව නොපවසා ගිහිබවට පත්වේ. මෙසේ විෂභාග රූපයක් බලන භික්ෂුවට චක්ෂු විඤ්ඤාණ චිත්ත වීථි වශයෙන් උපදින රාගය දස්සන සංසග්ග නම් වේ. ඔවුනොවුන් අල්ලාප සල්ලාපයේ යෙදීම් වශයෙන් උපදින රාගය සමුල්ලාප සංසර්ගය නම් වේ. භික්ෂුවක් භික්ෂුණියකට අයත් හෝ භික්ෂුණියක් භික්ෂුවකට අයත් හෝ යමක් ගෙන පරිභෝගකිරීම් වශයෙන් උපන් රාගය සම්භෝග සංසර්ග නම් වේ. අත් අල්ලා ගැනීම් වශයෙන් උපදින රාගය කායසංසග්ග නම් වේ. රහතන් වහන්සේ මේ පස්වැදෑරුම් සංසර්ගයන් සිවුවනක් පිරිස සමග නොපැවැත්වීමෙන් ග්‍රහණයෙන් මිදුනෙක් මෙන්ම සංසර්ගයෙන් මිදුනෙක් ද වූවාහු අසංසර්ග වීමේ ආනිසංස කියන්නාහු 'අසංසග්ග කථා' කියති නම් වේ.

විරියාරම්භකථං මෙහි යමෙක් එළඹි වීර්ය ඇතිව, පිරිපුන් කායික හා චෛතසික වීර්යයෙන් යුක්ත වෙත් ද ඔහු ගමන් කිරීමෙහි දී උපදින කෙලෙස් සිතුවිලි සිටීමේදී පැමිණීමට නොදෙයි ද සිටීමේදී උපන් කෙලෙස් සිත් හිඳීමේදී පැමිණීමට නොදෙයි ද හිඳීමේදී උපන් කෙලෙස් සිතුවිලි සයනය කිරීමේදී පැමිණීමට නොදෙයිද මන්ත්‍රවලින් කළු සර්පයකු මැඩ අල්ලාගන්නාක් මෙන් ද සතුරකු බෙල්ලෙන් අල්ලා ඉවතලන්නාක් මෙන් ද කෙලෙස් මැඩ හැසිරෙයි ද මෙබඳු ඇරඹූ වීර්ය ඇත්තහුගේ වර්ණනාව

සිදුකිරීම 'විරියාරම්භ කථාව කියයි' නම් වේ. **සීලකථං** යනාදියෙහි **සීලං** යනු චතුපාර්ශුද්ධි ශීලයයි. **සමාධිං** යනු විදර්ශනා පාදක අෂ්ට සමාපත්තියයි. **පඤ්ඤා** ලෞකික ලෝකෝත්තර ඤාණයයි. **විමුත්ති** ආර්යඵල විමුක්තිය. **විමුත්ති ඤාණදස්සනං** දහනව වැදෑරුම් වූ ප්‍රත්‍යවේක්ෂණ ඤාණය, ශීලාදියේ ගුණය ප්‍රකාශ කරමින් කරන කථාව **සීලාදිකථං** නම් වේ. **සතිපට්ඨාන කථං** ආදියේ සිට **සංගජාල මතිච්ච සෝ මුනී** යන්නෙන් අවසන් වන සියලු පදයන්ගේ අර්ථ පෙරකී ක්‍රමයෙන් දතයුතුයි.

නිරාසත්ති තණ්හා රහිත. **විවෙකදස්සි** ඵස්සසහ ප්‍රත්‍යුත්පන්න වූ චක්ෂු සම්ඵස්සාදියෙහි අත්තාදිභාව විවේකය දකියි. **දිට්ඨීසු ච න නීයති** දෙසැට මිසදිටු අතරින් කිසි දෘෂ්ටියකින් නොපමුණුවයි. වස්තු ආදියේ විපරීත භාවයෙන් ශෝක නොකරයි. ප්‍රකෘත බව අත්හැර නැසුණු කිසිදු වස්තුවක් පිළිබඳව ශෝක නොකරයි. ප්‍රකෘත බව අත්හැර නැසුණු කිසිදු වස්තුවක් පිළිබඳව ශෝක කිරීමට නොපැමිණෙයි. **විපරිණතම්පි වා** වස්තුව නැසෙන කල්හි. **චක්ඛු සම්ඵස්සෝ** චක්ෂුව (ඇස) වස්තු කරගෙන, චක්ඛු විඤ්ඤාණයත් සමග එකට උපන් ස්පර්ශය චක්ඛු සම්ඵස්ස නම් වේ. සෙසු පදයන්හි ද අර්ථ මෙසේ දතයුතුයි. මෙහිද චක්ෂු ප්‍රසාදාදී වස්තූන්ම පෙරටු වේ. මනෝ සම්ඵස්සයට හදය වස්තුව වස්තු වේ. සියලු චතුර්භූමික ස්පර්ශය අවස්තුකය. **අධිවචන සම්ඵස්සෝ** පර්යාය වශයෙන් මේ නම ඇති වන්නේම ය. තෙවැදෑරුම් අරූපී ස්කන්ධ, තමන්ම පිටිපස හැරී තමා හා සහජාත ස්පර්ශයම 'අධිවචන සම්ඵස්ස' යන නාමය තබයි. **පටිඝ සම්ඵස්සෝ** නිෂ්පර්යාය වශයෙන් ප්‍රතිඝ සම්ඵස්සය නම් පඤ්චද්වාරික ස්පර්ශයයි. අධිවචන සම්ඵස්සය නම් මනෝද්වාරික ස්පර්ශයයි. **සුඛවෙදනියෝ ඵස්සෝ** සුඛ වේදනාවෙන් හිත වූ උපදවන්නා වූ ස්පර්ශයයි. සෙසු දෙපදයෙහි මේ ක්‍රමයමයි.

කුසලෝ ඵස්සෝ විසිඑකක් කුසල් සිත්සමග එකට උපන් (සහජාත) ස්පර්ශය. **අකුසලෝ** දොළොස් අකුසල් සිත් සමග උපන් ස්පර්ශය. **අව්‍යාකතෝ පනස්හයක්** වූ අව්‍යාකත සිත් සමග එකට උපන් ස්පර්ශය. **කාමාවචරෝ** සිවුපනස් කාමාවචර සිත් හා සහජාත වූ ස්පර්ශය. **රූපාවචරෝ** කුසලාදී පසළොසක් වූ රූපාවචර සිත් හා සම්ප්‍රයුක්ත ස්පර්ශය. **අරූපාවචරෝ** කුසල ව්‍යාකත වශයෙන් දොළොසක් වූ අරූපාවචර සිත් හා සම්ප්‍රයුක්ත ස්පර්ශය. **සුඤ්ඤතෝ** අනන්තානුපස්සනා වශයෙන් විදර්ශනා වඩන්නහුට උපන් මාර්ගය ශූන්‍ය වශයෙන්. එය හා

සහජාත වූ ස්පර්ශය ශූන්‍ය ස්පර්ශය නම් වේ. සෙසු දෙපදයෙහි ද මේ ක්‍රමයෙන් අර්ථ ගතයුතුයි. **අනිමිත්තෙතා** මෙහි දී අනිච්චානුපස්සනා වශයෙන් බලන්නහුට උපන් අනිමිත්ත මාර්ගයයි. **අපපනිහිතො** දුක්ඛානුපස්සනා වශයෙන් බලන්නහුට උපන් අනිමිත්ත මාර්ගයයි. **අප්පනිහිතො** දුක්ඛානුපස්සනා වශයෙන් බලන්නහුට උපන් අනිමිත්ත මාර්ගයයි. **ලොකියො** ලෝක යනු කැඩෙන බිඳෙන අර්ථයෙන් වර්තයයි. සංසාරයයි. එහි පර්යාපන්න භාවයෙන් ලෝකයේ නියුක්ත වූයේනුයි ලෝකිය නම් වේ. ත්‍රෛභූමික ධර්මයයි. **ලොකුත්තරො** ලෝකයෙන් එතෙර වූ, උත්තීර්ණ වූ අරුතින් ලෝකුත්තර නම් වේ. ලෝකයෙහි අපර්යාපන්න භාවයෙන් ද ලෝකුත්තර නම් වේ. **අත්තෙතන වා** ආත්මභාවයෙන් (ශරීරයෙන්) හෝ. **අත්තනියෙන වා** තමාට අයත් වූ හෝ. (ආත්මනීය වූ.)

පතිලීනො රාගාදිය ප්‍රහීණ කළ බැවින්, රාගාදියෙන් පහ වූ. **අකුහකො** ත්‍රිවිධ කුහක වස්තූන්ගෙන් දුරු වූ **අපිහාලූ** අපේක්ෂා කරන, ප්‍රාර්ථනා කරන ස්වභාව ඇති තණ්හාව රහිත වූ යන අර්ථයයි. **අමච්ඡරී** පස්වැදෑරුම් මසුරු බවින් දුරු වූ. **අපපගබ්භො** කාය පුදගල්භාදියෙන් දුරු වූ. **අජෙගුච්ඡො** යුක්ත වූ ශීලාදී ගුණයන් ඇති බැවින් ජුගුප්සා නොකටයුතු, ඉවත නොදැමිය යුතු, ප්‍රිය මනාප වූ. **පෙසුණෙයේ‍ය ච නො යුතො** දෙයාකාරයකින් ගෙනහැර දැක්විය යුතු කේලාම් කීමෙහි නො යෙදුණු. **රාගසස පහීනත්තා** අර්හත් මාර්ගයෙන් රාගාදී කෙලෙස් ප්‍රහීණ කළ බැවින් **අසම්මානො පහීනො හොති** 'මේ මම වෙමි'යි උපන් උස්කර දක්වන මානය මුලිනුපුටා දැමීමෙන් ප්‍රහීණ කරන ලදී. **තීණි කුහන වත්ථූනි** කුහක වස්තු තුනෙන් දුරු විය. ප්‍රත්‍ය ප්‍රතිශේධන සංඛ්‍යාත කුහන වස්තුව යනු සිවුරු ආදිය පිණිස ආරාධනා කරන ලදුව, ඒ ප්‍රත්‍යයෙන් ප්‍රයෝජන ඇතියකුව සිටි නමුත් ඇතැම් භික්ෂුවක් පාපී ආශාව නිසා ඒවා ප්‍රතික්ෂේප කරයි. එවිට ගෘහපතිවරු එම භික්ෂුව කෙරෙහි අතිශයින් පැහැදී මෙසේ කියති. 'අහෝ අපගේ ආර්යයන් වහන්සේ ඉතා අල්පේච්ඡයහ. කිසිවක් පිළිගැනීමට කැමති නැත. උන්වහන්සේ අපට මහත් ලාභයකි. ඉදින් අපගෙන් අල්පමාත්‍ර වූ දෙයක්වත් පිළිගන්නේ නම් 'මැනවි'යි නානාප්‍රකාර උපායවලින් ඉතා උසස් සිවුරු ආදී සිවුපසය එළවූ කල්හි ඔවුන්ට අනුග්‍රහ පිණිස බව දක්වමින්, අකමැත්තෙන් මෙන් ඒවා පිළිගනියි. එතැන් පටන් කරත්ත පුරවා සිවුපසය ලැබීම සිදුවේ.

මෙසේ උසස් සිවුරු බොහෝකොට ලැබීමේ ආශාවෙන් අල්පේච්ඡ බව පෙන්වීම් වශයෙන් දායකයන් පුදුම කරවන, ප්‍රත්‍ය ප්‍රතික්ෂේප කිරීම නම් ප්‍රත්‍ය ප්‍රතිශෝධන සංඛ්‍යාත කුහන වස්තුව යැයි දතයුතුයි. පාපී ආශාවෙන් මැඩී එමෙන්ම ගරු සම්භාවනා පමුණුවාගැනීමේ අදහසින් කරන ලද ඉරියවු පැවැත්මෙන් දායකයන් පුදුම කරවීම, ඉරියාපථ සන්නිශ්‍රිත කුහන වස්තුව යැයි දතයුතුයි. පාපී ආශා සහිත සිතින් උතුරු මිනිස්දම් අවබෝධ කරගත් බව ප්‍රකට කරවන වචනවලින් ඒ ඒ ආකාරයෙන් ජනයා පුදුමයට පත්කිරීම සාමාන්‍ය ජල්පන සංඛ්‍යාත කුහන වස්තුව යැයි දතයුතුයි.

කතමං පච්චය පටිසෙධන සංඛාතං යන මෙහි ප්‍රත්‍ය ප්‍රතිශේධනය යනු මෙබඳු වූ ප්‍රත්‍ය ප්‍රතික්ෂේප කිරීම් සංඛ්‍යාත, **ඉධ ගහපතිකා භික්ඛං ගණ්හථාති භික්ඛූං නිමන්තෙනති** යන මෙයම පාඨයයි. ඇතැමෙක් 'නිමන්තෙන්ති වා' යයි ද වදන්ති වා යයි ද කියති. එබඳු වූ 'නිමනතාපෙනති' 'නිමන්තෙනති' යන පාඨයේ සම්භවයද දතයුතුයි. **චීවරං පච්චක්ඛාති** සිවුර ප්‍රතික්ෂේප කරයි. **එතං සාරුප්පං යං සමණෝ** යම් සිවුරු පෙරවීමක් ශ්‍රමණයා කරයි ද ඊට සාරුප්‍ය වූ අනුරූප වූ. **පාපණිකා වා නහතකානි** කඩවල ඉදිරිපිට දමන ලද රෙදිකැබලි. **උච්චිනිත්වා** එක්රැස් කොට. **උඤ්ඡාචරියාය භික්ඛාවේ හැසිරීමෙන්. පිණ්ඩියා ලොපෙන** පිඬුකර ලබාගත් බත්හුලුවලින් **පූතිමුත්තෙන වා** ගවමුත්‍රයෙන් හෝ **ඔසධං කරෙය්‍ය** බෙහෙත් කිස කරන්නේ ය. **තදුපාදාය** එතැන් පටන්.

ධුතවාදෝ ධුත ගුණ කියන. **භියෝ භියෝ නිමන්තෙනති** නැවත නැවත ආරාධනා කරති. **සම්මුඛීභාවා** ඉදිරියේ වූ බැවින්, විද්‍යමාන වන බැවින් යන අර්ථයයි. **පසවති** ලබාගනියි. රැස්කරයි. **සද්ධාය සම්මුඛීභාවෙන සකකාකාතුං** යනුවෙන් ශ්‍රද්ධාව පෙරටු කරගත් බැවින් ආදිය කීය. දාන වස්තු, ප්‍රතිග්‍රාහකයෝ සුලභය. නමුත් ශ්‍රද්ධා සිත දුර්ලභය. පුහුදුන් පුද්ගලයන්ගේ ශ්‍රද්ධාව ස්ථාවර නැත. මොහොතින් මොහොත වෙනස් වෙයි. එහෙයින් මහමුගලන් තෙරුන් වැනි අගසවු වූ ඍද්ධි මහිම ඇති තෙරවරු පවා ශ්‍රද්ධාවට ඇපවීමෙහි අසමත්ව මෙසේ වදාළහ. 'ඇවැත්නි, මම නුඹගේ දාන වස්තුව හා ජීවිතය යන කරුණු දෙක ගැන පමණක් ඇප වන්නෙමි. ශ්‍රද්ධා සිත පිළිබඳව නුඹම ඇපවන්නෙහි ය' මෙසේ නුඹලා පිනෙන් පිරිහෙන්නාහු යැයි යන මෙහි **පුඤ්ඤන** පංචමී විභක්ති අර්ථයේ තතියා විභක්ති වචනයකි. පිනෙන් පිරිහීමෙන් මුහුණු හරවා

ගත්තෝ වන්නෙහු. **භාකුටිකා** ප්‍රධාන පිරිමැදීම් බව දැක්වීමෙන් භාකුටිකරණය මුව හැකිළීම යැයි කියන ලදී. මුහුණ හැකිළීම් ස්වභාවය මොහුට ඇත්තේනුයි භාකුටික නම් වේ. භාකුටික බව භාකුටියං නම් වේ. **කුහනා** විෂ්මයපත් වීමයි. කුහ (නැති ගුණ පෙන්වීම) කුහස්ස + ආයතා කුහායනා වේ. කුහකයාගේ බව කුහිතත්ත නම් වේ. **පාපිච්ඡා** තමා තුල නැති ගුණ දක්වනු කැමති බව. **ඉච්ඡාපකතෝ** ආශාවෙන් (ඉච්ඡාය) මඬන ලද (ආපකතෝ) උපද්‍රව කරන ලද යන අර්ථයයි. **සම්භාවනාධිප්පායෝ** බහුමන්කරන අදහසයි. **ගමනං සණ්ඨාපෙති** පිටත්ව යෑම් ආදීගමන් සකස් කරයි. ප්‍රසාද එළවන පරිදි සිදුකරයි. සෙසු පදයන්හි ද මේ ක්‍රමයෙන් අර්ථ දතයුතුයි. **පණිධාය ගච්ඡති.** ප්‍රාර්ථනා තබාගෙන යයි. සෙසු පදයන්හි ද මේ ක්‍රමයයි. **සමාහිතෝ විය ගච්ඡති** උපචාර, අර්පණාදියට පත්වූවෙකු මෙන් යයි. සෙසු පදයන්හි ද මෙසේ අර්ථ දතයුතුයි. **ආපාථකඤ්ඣායී ච හොති** තමාගේ ඉදිරියට එන මිනිසුන්ට තමා ධ්‍යානයට සමවැදුනකුගේ මෙන් ශාන්තභාවය දක්වයි. **ඉරියාපථස්ස** සතර ඉරියව්වෙන්. **අට්ඨපනා** මුලදී හෝ තබයි. ආදරයෙන් හෝ තබයි. **ඨපනා** තබන ආකාරයයි. **සණ්ඨපනා** අභිසංස්කරණ, ප්‍රසාද බව ඇතිකරන යැයි කියන ලදී.

අරියධම්ම සන්නිස්සිතං ලෝකෝත්තර ධර්මය හා ප්‍රතිබද්ධ වූ. **කුඤ්චිකං** කෙස්සක් (යතුරක්) **මිත්තා** සෙනෙහස දක්වන්නෝ **සන්දිට්ඨා** දුටු මිතුරෝ. **සම්භත්තා** දැඩි මිතුරෝ. උදුම්බරික එක් ශ්‍රමණ වාසයට උචිත ශාලාවකි. දිග්හලෙක. **කොරඤ්ජකකොරඤ්ජිකෝ** හකුලනුයේ වඩාත් හකුලනුයේ, දැඩිව හකුලනුයේ යි කියන ලදී. 'කොරඤ්ජකකෝ' යන පාඨය ද යෙදේ. **භාකුටික භාකුටිකෝ** ඉතා දැඩිව මුහුණ හකුලුවන ස්වභාව ඇති. **කුහක කුහකෝ** ඉතා දැඩිව විෂ්මයට පත් කරවන **ලපක ලපකෝ** ඉතා දැඩිව සල්ලාපයේ යෙදෙන. **මුඛ සම්භාවිකෝ** එය මුවින්ම අන්‍යයන් විසින් සම්භාවනා කරන ලද්දේ ඇතැම්හු 'ළඟට පැමිණි සිත' යැයි අර්ථ කියති. **සන්තානං** කෙලෙස් සන්සිඳවීමෙන් ශාන්ත වූ. **සමාපත්තීනං** සමවැදිය යුත්තන්ගේ. **ගම්භීරං** ගැඹුරු නිම්නයෙහි පිහිටුවන. **ගණ්හං** දැක්වීමට අපහසු. **නිපුණං** සියුම් වූ. **පටිච්ඡන්නං** පදාර්ථ වශයෙන් අවබෝධ කරගැනීම ඉතා අපහසු. **ලොකුත්තරං** ලෝකෝත්තර ධර්ම උද්දීපනය කරන **සුඤ්ඤතා පටිසංයුත්තං** නිර්වාණ ප්‍රතිසංයුක්ත. නැතහොත් **ලොකුත්තර සුඤ්ඤතා පටිසංයුත්තං** ලෝකෝත්තර ධර්ම වූ නිර්වාණ ප්‍රතිසංයුක්ත.

කායිකං පගබහියං කයෙහි වූ, (ඊට අයත්) කායික, වාචසික, චෛතසික යන පදයන්හි ද එසේම අර්ථ දතයුතුයි. **අචිතනිකාර කතො** බුහුමන් කිරීම් රහිත වූ. **අනුපාහනානං චංකමනානං** පාවහන් රහිතව සක්මන් කරන්නවුන්ගේ සමීපයෙහි අනාදරයෙහි ඡට්ඨී විභක්ති වචනයකි. **ස උපාහනො** පාවහන් මත නැගී සක්මන් කරයි. **නීවෙ චංකමෙ චංකමනානං** වෙන් නොකළ බිමෙහි සක්මන් කරන, සීමා වෙන් කර වැලි අතුරා එල්ලෙන කණු යොදා කරන ලද සක්මන්මලුවෙහි, නීච සක්මනෙහි සක්මන් කරන. **උවෙව චංකමෙ චංකමති** මනෝඥ ගඩොල්වලින් යුතු වේදිකාවලින් වටකරන ලද, උස් සක්මනෙහි සක්මන් කරයි. ඉදින් පවුරෙන් වට කරන ලද, ද්වාර කොටුවලින් යුතු, පර්වත අතර, වන අතර, ගොමු අතර මනාව වසා සෙවිලි කළ උතුම් සක්මන්හි සක්මන් කිරීම සුදුසුය. නොවැසුණු සක්මනේ උපචාරය මුදා සක්මන් කිරීම සුදුසුය. **සටට යනෙනාපි තිටඨති** ඉතා සමීපයේ සිටියි. **පුරතොපි තිටඨති** ඉදිරියෙන් ද සිටියි. **ඨිතකොපි භණති** කණුවක් මෙන් නොනැමී කථා කරයි. **බාහා විකෙඛපකො** අත් දමා ගසා, අත සල සලා කථා කරයි.

අනුපහජ්ජ සියලු මහ ස්ථවිරවරු වැඩහුන් තැනට පිවිස **නවෙපි භික්ඛූ ආසනෙන පටිබාහති** තමාට පැමිණි අසුනෙහි නොහිඳ මුලින් හෝ පසුව හෝ පිවිසෙන්නේ අසුනින් වැලැක්වීම නම් වේ. **අනාපුචඡාපි කටඨං පකඛිපති** නොවිමසා, වටපිට නොබලා ගින්නට දර දමයි. **දවාරං පිදහති** ගිනිහල්ගෙයි දොර වසයි. **ඔතරති** දිය තොටට පිවිසෙයි. **නහායති** සිරුර තෙමයි. **උත්තරති** දියතොටින් උඩට නගියි. (ගොඩ වෙයි.) **වොකකමමාපි ඉක්මවාද ඔවරකානි** ඇතුලුගැබෙහි පිහිටි ඇඳ සහිත කුටියෙහි. **ගුළහානි** වැසුණු. **පටිචඡනනානි** අන්‍යයන් විසින් වසන ලද **අනජඣිට්ඨො වා** තෙරුන් විසින් 'බණ කියව'යි අණ නොකරන ලදුයේ, නො ඉල්ලන ලද්දේ **පාපධමෙමා ළාමක**, පවිටු දහම් ඇති **අසුචි සංකසසරසමාචාරො** අන්‍යයන් විසින් 'මොහු දුස්සීලයෙකි'යි සැකයෙන් සිහිකළ යුතු ආචාර, සංයෝග මොහුට ඇත්තේනුයි 'අසුචිං සංකසසරසමාචාරො' වේ. **සංකසස සමාචාරො** යනු කිළිටිසහිත සයෝග පථය 'සංයොගපථ' නමින් ද කියති. **පටිචඡනන කමමනෙතා** වැසූ, සැඟවූ කාය වාග් ක්‍රියා ඇති. **අසසමණො** ශ්‍රමණයකු නොවූ. **සමණ පටිඤඤා** 'මම ශ්‍රමණයෙක්මි'යි දක්වනුයේ **අබ්‍රහමචාරී** ශ්‍රේෂ්ඨ බඹසරින් දුරු වූයේ. බ්‍රහමචාරී පටිඤඤා බඹසරින් යුක්ත බව පෙන්වමින් **අනෙතා පූති**

අභ්‍යන්තරයෙහි කුසල්දහම් නැති බැවින් ඇතුලත කුණු වූ. **අවසසුතො** රාගයෙන් වැසුණු. **කසම්බුජතො** කිළිටි, කසල සහිත ස්වභාවයෙන්. **ආචාර ගොචර සම්පනෙනා** මෙහි 'මේ සසුනෙහි භික්ෂුව ගෞරව සහිතව, ප්‍රතිෂ්ඨා සහිතව ලැජ්ජා බිය ඇතිව, මනාව හැඳ පොරවා, ප්‍රසාද එළවන ඉදිරියට යෑම, ආපසු ඒම, ඉදිරිය බැලීම, පසුපස බැලීම, අත් පා හැකිලීම, දිගහැරීම සහිත වූයේ, බිම හෙලූ ඇස් ඇත්තේ සන්සුන් ඉරියව්වෙන් යුක්ත වූයේ, ඉන්ද්‍රියන්හි වැසූ දොරටු ඇත්තේ, ආහාරයේ පමණ දන්නේ, නිදිවැරීමෙහි නිරත වූයේ, සතිසම්පජඤ්ඤයෙන් යුක්ත වූයේ, අල්පේච්ඡ වූයේ, ලද දෙයින් සතුටු වූයේ, ඇරඹූ වීර්ය ඇත්තේ, අභිසමාචරිය ශික්ෂාවන්හිසකසා ගරු කරන්නේ, ගරු සිත් පෙරටු කරගෙන වාසය කරයි. මෙය 'ආචාරය' 'හැසිරීම' යැයි කියනු ලැබේ.' යනුවෙන් ආචාරය දතයුතුයි. ගෝචරය වනාහි තුන්වැදෑරුම් වේ. උපනිස්සය ගෝචරය, ආරක්ඛ ගෝචරය හා උපනිබන්ධගෝචරය යනුවෙනි. එහි උපනිස්සය ගෝචරය කවරේද? දස කථාවස්තු ගුණයෙන් යුක්ත කල්‍යාණ මිත්‍රයා යමක් ඇසුරින්, නොඇසූ දෙය අසයි ද ඇසූ දෙය මනාව සිතේ සනිටුහන් කරගනියි ද සැක සංකා දුරුකර ගනියි ද දෘෂ්ටිය ඍජු කර ගනියි ද සිත පහදවා ගනියි ද යම් ප්‍රතිපදාවක් අනුව හික්මීමෙන් (අනුගමනයෙන්) ශ්‍රද්ධාව වැඩේද සීලයෙන්, ශ්‍රැතයෙන්, ත්‍යාගයෙන්, ප්‍රඥාවෙන් වැඩෙයි ද මෙය උපනිස්සය ගෝචරය නම් වේ.

ආරක්ඛ ගෝචරය කවරේද? මේ සසුනෙහි භික්ෂුව ඇතුලුගෙට පිවිසියේ වීථියට පිවිසියේ බිම හෙලූ ඇස් ඇතිව වියදඬු පමණ දුර බලමින් ඉතා සංවරව යයි ද ඇත්, අස්, රිය, පාබල සෙනග දෙස හෝ ස්ත්‍රී පුරුෂාදීන් දෙස හෝ නොබලමින් ද උඩ, යට, දිසා, අනුදිසා නොබලමින්ද ඉදිරිය බලාගෙන ම යයි ද මෙය ආරක්ඛ ගෝචරය නම් වේ.

උපනිබන්ධ ගෝචරය නම් කවරේද? යම්තැනක සිත ළංකර බැඳ තැබිය යුතු ද ඒ සතර සතිපට්ඨානයේ සිත හැසිරවීමයි. බුදුහු මෙසේ වදාළහ. 'මහණෙනි, භික්ෂුවගේ ගෝචරය වූ ස්වකීය පියාගේ දායාදය කුමක්ද? මේ සතර සතිපට්ඨානයයි.' මෙය උපනිබන්ධ ගෝචරය නම් වේ. මෙසේ ඉහත දැක්වූ ආචාරයෙන් ද ඉහත දැක්වූ ගෝචරයෙන් ද යුක්ත වේ. සමන්විත වේ. පිරිපුන් වේ. එබඳු භික්ෂුව 'ආචාරගොචර සම්පන්න' යැයි කියනු ලැබේ.

අණුමත්තෙසු වජ්ජෙසු භය දස්සාවී යනු කිපීම් ඇති නො කරන, සිහිකල්පනා රහිතව පැමිණි සේඛියා, අකුසල් සිත් ඉපිදවීම් ආදී භේද ඇති ඉතා කුඩා වරදෙහි ද භය දක්නා සුලු වූයේ. **සමාදාය සික්ඛති සික්ඛා** පදෙසූ කිසියම් ශික්ෂාපදයෙක්හි හික්මිය යුතු ද එහි සමාදන්ව හික්මෙයි. මෙහිදී ද ප්‍රාතිමෝක්ෂ සංවරයෙන් සංවර වූයේ යැයි යන මෙපමණකින් පුද්ගල අධිෂ්ඨාන දේශනාවෙන් ප්‍රාතිමෝක්ෂ සංවර ශීලය දක්වන ලදී. ආචාරගෝචර සම්පන්න යැයි යනාදි සියල්ල එසේ පිළිපන්නහුගේ ඒ ශීලය සම්පූර්ණ වීමට අවශ්‍ය ඒ ප්‍රතිපත්තිය දැක්වීමට කියන ලද්දේ යැයි දතයුතුයි.

සාතඅයෙසු අනස්සාවී අසාත වස්තු වූ පංචකාම ගුණයන්හි තණ්හා වශයෙන් ඇලීම දුරුකරගත්, **සඞ්ඝා සිනිදු** වූ කාය කර්මාදියෙන් යුක්ත වූයේ. **පටිභානවා** පර්යාප්ති, පරිපුච්ඡා, අධිගම, ප්‍රතිභානාදියෙන් යුක්ත වූ. **න සද්ධා තමන්ම** අවබෝධ කරගත් ධර්මය ඇති බැවින් වෙනත් කිසිවකු නො අදහයි. **න විරජ්ජති** රාගය ක්ෂය කළ, වීතරාගී වූ බැවින් දැන් කිසිතැනෙක නොඇලෙයි. **න විරජ්ජති** රාගය ක්ෂය කළ, වීතරාගී වූ බැවින් දැන් කිසිතැනෙක නො ඇලෙයි. **යෙසං එසා** යම් පුද්ගලයන්ගේ පංචකාම ගුණයන්හි, ඇලුම් ඇතිකරන වස්තූන්හි ආශාවක්. **තණ්හා අපපහීනා** සංවාසයෙන් යුක්ත තණ්හාව අර්හත් මාර්ගයෙන් ප්‍රහීණ නොකළ, **තෙසං චක්ඛුතො රූප තණ්හා සවති** මොවුන්ගේ චක්ෂුද්වාරයෙන් පවතින ජවන වීථියෙන් යුක්ත රූපාරම්මණ තණ්හාව උපදියි. **අස්සවතී** අවකාශ වශයෙන් භවග්‍රය දක්වාත් ධර්ම වශයෙන් ගෝත්‍රභූ සිත දක්වාත් ගලා යයි. **සන්දති** ගං දියපහරක් මෙන් පහත් බිම දෙසට ගලයි. **පවත්තති** නැවත නැවත චුති උත්පත්ති වශයෙන් පවතියි. සෙසු ද්වාරයන්හි ද මේ ක්‍රමයෙන්ම අර්ථ දතයුතුයි.

ශුක්ල පක්ෂයෙහි (යහපත් පැත්තෙහි) කියූ විපර්යාස වශයෙන් තණ්හාව අර්හත් මාර්ගයෙන් මනාව ප්‍රහීණ කරන ලදී. ඒ ක්ෂීණාශ්‍රවයන්ගේ ඇසින් රූප තණ්හාව නො ගලයි. **සඞ්ඝන කාය කම්මෙන සමන්නාගතො** පරුෂ නොවූ මෘදු වූ කාය කර්මයෙන් යුක්ත වූ, ඒකීභූත වූ, වාග් කර්මාදියෙහි ද මේ ක්‍රමයමයි. **සඞ්ඝහි සතිපට්ඨානෙහි** යනාදියෙහි සතිපට්ඨානාදී ධර්ම ලෞකික - ලෝකෝත්තර මිශ්‍ර වශයෙන් සැලකිය යුතුයි. පුහුණු කරන අර්ථාදී ප්‍රශ්න කිරීම් ලෞකික, ලෝකෝත්තර, අධිගම

ධර්ම වශයෙන් සැලකීම්, විභාවනය කිරීම්, ව්‍යවස්ථා කිරීම් ආදියෙහි සමර්ථ වූ ත්‍රිවිධ ප්‍රතිභාන ප්‍රභේද සංඛ්‍යාතඒ ප්‍රඥාව යමෙකුට වේනම් ඔහු 'ප්‍රතිභානයෙකි' **තස්ස පරියත්තිං නිස්සාය පටිභායති** ඒ පුද්ගලයාගේ පුනුණුවීම අලලා ඤාණය පවතියි. ඤාණය අභිමුඛ වේ. **චතූසු සතිපට්ඨානා** සත්තිස් බෝධිපාක්ෂික ධර්ම ලෞකික ලෝකෝත්තර මිශ්‍රකිරීම් වශයෙන් කියන ලදී. මාර්ගඵල උපදවන ලෝකෝත්තරධර්ම වශයෙන් සතර පටිසම්භිදාවෝත්, ෂට් අභිඥාවෝත් විමෝක්ෂාන්තික වශයෙන් කියන ලදැයි දතයුතුයි. එහි **චතසෙසා පටිසම්භිදායෝ** යනු සතර ඥානප්‍රභේද යන අර්ථයයි. ඉද්ධිවිධ ඥානයේ සිට ආශ්‍රවක්ෂය ඥානයෙන් අවසන් වන ෂට් අභිඥා ඥානයන්, **තස්ස** යනුවෙන් පදයේ අර්ථ වටහාගනියි යැයි සම්බන්ධය වේ. ඔහු වනාහි යම්හෙයකින් **අත්ථෝ** අර්ථය යනු සංක්ෂේප වශයෙන් හේතුඵල ධර්මයයි. එය වනාහි යම්හෙයකින් හේතු අනුසාරයෙන් අවබෝධ කරගනියි. වටහාගනියි. පැමිණෙයි. එනිසා අර්ථය යැයි කියනු ලැබේ. ප්‍රභේද වශයෙන් යම්කිසි ප්‍රත්‍යුත්පන්නය. නිර්වාණය, කියූ අර්ථය, විපාකය, ක්‍රියාව යන මේ ධර්ම පහ පිළිබඳ දැනීම අර්ථය යැයි දතයුතුයි. ඒ අර්ථය ප්‍රත්‍යවේක්ෂා කරන්නාට ඒ ඒ පදයන්ගේ අර්ථය ප්‍රභේද වශයෙන්, ප්‍රකට වේ. මනාව වැටහේ.

ධම්මෝ සංක්ෂේප වශයෙන් ප්‍රත්‍යයි. එය යම්හෙයකින් බුදුවදන දක්වයි ද පවත්වා ගනියි ද ඊට පමුණුවයි ද එහෙයින් ධර්මය යැයි කියනු ලැබේ. ප්‍රභේද වශයෙන් යම්කිසි ඵල නිෂ්පත්තියද හේතුව ද ආර්ය මාර්ගය ද කියන ලද කුසලය හා අකුසලයද යන මේ කරුණු පහ ධර්මය යැයි දතයුතුයි. ඒ ධර්ම ප්‍රත්‍යවේක්ෂා කරන්නාට ඒ ධර්ම ප්‍රභේද වශයෙන් ප්‍රකට ව මනාව වැටහේ. ඒ අර්ථයෙහි ද ධර්මයෙහි ද යම් ස්වභාව නිරුක්තියක්, අව්‍යභිචාරී ව්‍යවහාරයක් වේද ඔහුගේ අභිලාපයෙහි, භාෂණයෙහි, ප්‍රකාශනයෙහි ඒ කියූ, දැක්වූ, ප්‍රකාශ කළ ස්වභාව නිරුක්ති ශබ්දය අරමුණු කර, ප්‍රත්‍යවේක්ෂා කරන්නාට ඒ නිරුක්තිය ප්‍රකට වේ. මනාව වැටහේ. මෙහි **අත්ථෙ ඤාතෙ අත්ථෝ පටිභායති** දැන් ඒ ශබ්දය ගෙනහැර දක්වා කියූ ප්‍රභේද ඇති අර්ථය ප්‍රකට වූ කල්හි කියූ ප්‍රභේද ඇති අර්ථය, ඒ පුද්ගලයාට වැටහේ. **නිරුත්තියා ඤාතාය නිරුත්ති පටිභායති** කියන ලද භේද ඇති නිරුක්තියෙන් ප්‍රකට වූ කල්හි, ඉහත දැක්වූ භේද ඇති නිරුක්තිය නුවනට වැටහේ. **ඉමෙසු තීසු ඤාණෙසු ඤාණං** අර්ථ, ධර්ම, නිරුක්ති යන මේ ත්‍රිවිධ ධර්මයන්හි සෑමතැන්හි ඤාණය අරමුණු කර, ප්‍රත්‍යවේක්ෂා කරන්නාට, ඒ ත්‍රිවිධ ඤාණයෙහි

ප්‍රභේදගත වූ ඤාණය, කියන ලද පරිදි හෝ ඒ ඒ ඤාණයෙහි ගෝචර කෘත්‍යාදි වශයෙන් විස්තීර්ණ වන ඤාණය ප්‍රතිභාන පටිසම්භිදාවයි. **ඉමාය පටිභාණ පටිසම්භිදාය** මෙ කියන ලද පරිදි විස්තීර්ණ ප්‍රඥාවෙන් උපේත වේ. යුක්ත වේ. **සො වුච්චති පටිභාණවා** යනුවෙන් නිගමනය කරමින් 'පටිභාණවා' යන පදයේ අර්ථ දක්වන ලදී.

යසස පරියත්ති නත්ථි පර්යාප්තිය නම් බුද්ධ වචනයයි. එය උගන්නවුන්ට පටිසම්භිදාව පිරිසිදු වේ. යම් පුද්ගලයෙකුට මෙබඳු පර්යාප්ති හැදෑරීමක් නොවේ නම් **පරිපුච්ඡා නත්ථි** පරිපුච්ඡාව නම් පාලි අටුවාදියෙහි ගැටමුසු පද, අර්ථ පද විනිශ්චය කරන කථාවයි. උගත් පෙළ දහමෙහි අර්ථ කියන්නාට පටිසම්භිදාව පිරිසිදු වේ. **අධිගමො නත්ථි** අධිගමය නම් අර්හත්වයට පත්වීමයි. රහත් වූවහුට පටිසම්භිදාව පිරිසිදු වේ. මෙකියන ලද ත්‍රිවිධ සම්පත් යමෙකුට නැතිනම් ඔහුට සද්ධර්මය කෙසේ වැටහේද? ඒ පුද්ගලයාට ප්‍රභේදගත ඤාණය නොවැටහේ. අවබෝධ නොවේ. **සාමං** තමන්ම **සයමභිඤ්ඤාතං** තමන්ම ඒ ඤාණයෙන් අවබෝධ කරගත්. **අනත්තපවවකඛං ධම්මං** තමා විසින් නැවත විමසා බැලූ, ප්‍රත්‍යවේක්ෂා කළ ධර්මය. **න කසසවි සද්දහති** තමා විසින් සද්ධර්මය අවබෝධ කරගත් බැවින් අන්‍ය දහමක් නො අදහයි. ඇදහීමට නොයයි. **අවිජ්ජා පචචයා සංඛාරා** යනාදී දොළොස් පදය ප්‍රත්‍යාකාරය දැක්වීම් වශයෙන් කියන ලදී. **අවිජ්ජා නිරොධො** ආදිය සසර ගමන නැවැත්ම සඳහා කියන ලදී. **ඉදං දුකඛං** ආදිය චතුරාර්ය සත්‍ය දැක්වීම් වශයෙනි. **ඉමෙ ආසවා** ආදිය තවත් ක්‍රමයකින් කෙලෙස් වශයෙන් සත්‍ය දැක්වීමයි. **ඉමෙ ධම්මා අභිඤ්ඤෙය්‍යා** ආදිය අභිඤ්ඤෙය්‍ය පරිඤ්ඤෙය්‍ය, පහාතබ්බ, භාවේතබ්බ, සච්ඡිකාතබ්බ (අවබෝධ කරගත යුතු, පිරිසිඳ දතයුතු, ප්‍රහීණ කළයුතු, වැඩිය යුතු හා සාක්ෂාත් කළ යුතු) ධර්ම වශයෙන් දක්වන ලදී. **ඡන්නං ඵසසායතනානං** ආදිය ස්පර්ශායතනයන්ගේ උපත ද නැතිවීම ද ආශ්වාදය ද ආදීනවය ද නිස්සරණය ද දැක්වීම් වශයෙන් කියන ලදී. උපාදානස්කන්ධ පංචකයේ ඇතිවීම විසිපස් ආකාරයකින් ද නැතිවීම විසිපස් ආකාරයකින් ද, ඒවායෙහි ඡන්දරාග වශයෙන් ආශ්වාද කිරීම ද ඒවායේ පරිණාමයට පත්වීමෙන් ඇතිවන ආදීනව ද නිස්සරණ නම් වූ නිවන ද සතරමහා භූතයන්ගේ අවිද්‍යාදියේ ඇතිවීමත් අවිද්‍යා නිරෝධයේදී නැතිවීමත් මේ ආදී වශයෙන් දක්වමින් කියන ලදී. මෙකියන ලද ධර්ම ඒ ඒ තැන කියූ ආකාරයෙන්ම දතයුතුයි.

අමතොගධං යනු මරණ සංඛ්‍යාත 'මතං' මෙහි නැත්තේනුයි 'අමතං' නම් වේ. කෙලෙසුන්ට ප්‍රතිපක්ෂ බැවින් - විරුද්ධ බැවින් අගද යනුද 'අමතං' නම් වේ. එහි නැඹුරු වූ, බැසගත් බැවින් 'අමතොගධ' නම් වේ. **අමතපරායණං** කියූ ආකාර ඇති උතුම් නිවනට යන ගමන, මාර්ගය මෙහි පිහිටකර ඇත්තේනුයි අමත පරායණ නම්. **අමතපරියොසානං** ඒ නිවන සසුනේ ප්‍රතිෂ්ඨාව, නිෂ්ඨාව වූ බැවින් මෙය අවසානය වූයේ නුයි 'අමත පරියෝසාන' නම් වේ.

ලාභකම්‍යා න සිකබති ලාභ ප්‍රාර්ථනාවෙන් සූත්‍රාන්දියේ නො හික්මෙයි. **අවිරුඬ්ධො ච තණ්හාය රසෙ ච නානුගිජ්ඣති** විරෝධ නැති හෙයින් ද අවිරුද්ධ වී තණ්හාදී මූල රසාදියෙහි ගිජු බවට නොපැමිණෙයි. **කෙන නුඛො ලාභ ප්‍රාර්ථනාවෙන්, ඒවා ලැබෙන්නේ** කෙසේදැයි හේතු සොයන්නා වූ, පර්යේෂණාර්ථයේ නිපාතයකි. **ලාභානිනිබබතතියා සිවුපසය විශේෂයෙන් ලැබීමෙන්. ලාභං පරිපාචෙනෙතා ප්‍රත්‍ය මුහුකුරා යමින්. අත්තදමථාය** විදර්ශනා සම්ප්‍රයුක්ත ප්‍රඥාවෙන් සමාදානය පිණිස. **අත්ත සමථාය** සමාධි සම්ප්‍රයුක්ත ප්‍රඥාවෙන් තමාගේ පරිනිර්වාණය සඳහා කියන ලද්දේ මැයි. 'අනුපාදිසේස නිර්වාණය පිණිස භාග්‍යවතුන් වහන්සේ කෙරෙහි බඹසර හැසිරෙයි' යනුයි. **අපපිචජංයෙව නිසසාය** මෙහි පච්චයප්පිච්ඡ, අධිගමප්පිච්ඡ, පරියත්ති අප්පිච්ඡ හා ධුතංගප්පිච්ඡ යැයි ද අප්පිච්ඡතා සතරකි. ඒවායෙහි වෙනස්කම් පිළිබඳව ඉහතින් කියන ලද්දේමය. ඒ අල්පේච්ඡ බවෙහි ඇලී. **සනතටඨි** මෙව සිවුපසයෙහි ද ත්‍රිවිධ සන්තෝෂයෙන් ම ඇලී, ඒවායේ විභාග ඉහතින් දක්වන ලදී. **සලෙලබං** යනු කෙලෙස් ලියා දැමීමයි. **ඉදමජ්ඣිතං** මේ කුසල දහම් මෙහි ඇත්තේනුයි 'ඉදමජ්ඣි' නම් වේ. එහි ස්වභාවය ඉදමජ්ඣිතා නම්. ඒ කුසල දහම්හි ප්‍රයෝජන ඇති බවෙහි ම ඇලී.

රසො යන නිද්දේසයේ උදෙසන පදය. **මූලරසො** යම්කිසි මූලයක් නිසා උපන් රසය, **ඛන්ධරසො** යනාදියේ ද මේ ක්‍රමයමයි. **අම්බිලං** මෝරු ආදී ඇඹුල්. **මධුරං** ගව ගිතෙල් මෙන් ඒකාන්තයෙන් මිහිරි. **මධු** යනු කසමින් යුතු. බොහෝ කලක් පැසවූ, කසටින් යුතු. **පාණීතං** පැණි රසැති. බොහෝකලක් තැබූ පැණි රස ඇති. **සපපි** බොහෝ කලක් තැබූ වර්ණ, ගන්ධාදියෙන් තොර වූවත් රසය අත්නොහළ, ඒකාන්තයෙන් මිහිරි.

තිත්තකං කොසඹ මෙන් තිත්ත. කටුකං ඉඟුරු, මිරිස් ආදිය මෙන් කටුක. ලොණිකං මුහුදු ලුණු ආදිය බාරිකං වම්බටු ආදී කර රස. ලපිලං තල්, දිවුල්, සල් ආදී නොකසට රස. කසාවං අරළු ආදිය. මේ සියලුම රසයන් වස්තු වශයෙන් කියන ලදී. ඒ ඒ වස්තුක වූම රසය අම්බිලාදී නාමයන්ගෙන් කියන ලදැයි දතයුතුයි. සාදු ඉෂ්ට රස අසාදු අනිෂ්ට රස. මේ දෙපදයෙන් ද සියලුම රස අයත් කරන ලදී. සීතං සීත රසය. උණ්හං උෂ්ණ රසය.

මෙසේ මේ මූලාදී භේදයෙන් රසය බිඳී ගියත්, ලක්ෂණාදියෙන් නොබිඳුණේමය. මේ සියලු රසවල දිවේ වැදෙන-හැපෙන ලක්ෂණය ඇත. ජිව්හා විඤ්ඤාණයේ විෂය භාව රසය ඇත. එයම ගෝචර පච්චුපට්ඨානයයි. තෙ ජිවහගෙහන රසගගානී ඇතැම් ශ්‍රමණ බ්‍රාහ්මණයෝ ප්‍රසාද ජිවිහාග්‍රයෙන්, උතුම් රසාදිය. පරියෙසනතා සොයමින්. ආහිණ්ඩනති ඒ ඒ තැන හැසිරෙති.

තෙ අමබිලං ලහිතවා අනමබිලං පරියෙසනති මෝරු ආදී ඇඹුල් ලැබ, ඇඹුල් නොවූ රස සොයති. මෙසේ ඉහත කී සියලු රස පෙරලා විරුද්ධ පද සමග යොදන ලදී. පටිසංඛායොනිසො ආහාරං ආහාරෙති නුවණින් විමසා බලන, ප්‍රඥාවෙන් දැන උපායෙන් අනුභව කරයි. දැන් උපාය දැක්වීමට 'නෙව දවාය' ආදිය කියන ලදී. එහි නෙව දවාය යනු සෙල්ලම් පිණිස අනුභව නොකරයි. එහි නටන්නෝ පිනුම් ගසන්නෝ ක්‍රීඩා පිණිස ආහාර අනුභව කරති. යම් භෝජනයක් අනුභව කළ අයෙක් නෘත්‍ය ගීත, කාව්‍ය ශ්ලෝක සංඛ්‍යාත ක්‍රීඩාවන්හි විශේෂයෙන්, ඉතා වැඩියෙන් යෙදේ ද, ඒ භෝජනය අධර්මයෙන් විෂමව සොයා ඔවුහු අනුභව කරති. මේ භික්ෂුව එසේ ආහාර අනුභව නොකරයි. ක්‍රීඩා පිණිස භික්ෂුව ආහාර අනුභව නොකරයි.

න මදාය මාන මද, පුරුෂ මදයන්ගේ වැඩීම සඳහා ආහාර නොගනියි. එහි රාජරාජ මහාමාත්‍යවරු මදය සඳහා ආහාර ගනිති. ඔවුහු තමන්ගේ මාන මද, පුරුෂ මදයන්ගේ වර්ධනය සඳහා පිඬුරස බොජුන් ද ප්‍රණීත ආහාරපාන ද අනුභව කරති. මේ භික්ෂුව වනාහී එසේ ආහාර නොගනිති. න මණ්ඩනාය අලංකාරය පිණිස ආහාර නොගනියි. එහි රූපය නිසා ජීවත්වන ස්ත්‍රීහු ද අන්තඃපුර ස්ත්‍රීහු ද ගිතෙල් මීපැණි ආදිය පානය කරති. සිනිදු මෘදු භෝජනම ආහාරයට ගනිති. මෙනිසා

අපගේ ශරීර අංග මනාව පිහිටියේ වන්නේය. ශරීරයේ ඡවි වර්ණය ප්‍රසන්න වන්නේය යන අදහසිනි. මේ භික්ෂුව එසේ ශරීර අලංකාරය පිණිස ආහාර නොගනියි. **න විභූසනාය** ශරීරයේ මාංස විභූෂණය සඳහා ආහාර නොගනිති. **යාවදෙව මින්පසු** ආහාර ගැනීමේ ප්‍රයෝජන දැක්වීමට, මේ වෙන්කර දැක්වීම් නියමය දක්වන ලදී. **ඉමස්ස කායස්ස ඨිතියා** මේ සිවුමහා භූතමය ශරීරයේ පැවැත්ම පිණිස ආහාර ගනියි. මෙය භික්ෂුවගේ ආහාර ගැනීමේ ඇති ප්‍රයෝජනයයි යන අර්ථයයි. **යාපනාය** ජීවිතේන්ද්‍රියේ පැවැත්ම පිණිස ආහාර ගනියි. **විහිංසූපරතියා** විහිංසා නම් නොකා සිටීමෙන් ඇතිවන කුසගින්නයි. ඒ ක්ෂුදාව වැනසීමට, සන්සිඳවීමට ආහාර ගනියි යන අර්ථයයි. **බ්‍රහ්මචරියානුගහාය** බඹසර නම් ත්‍රිවිධ ශික්ෂා පිරීමයි. ඒ සියලු ශාසනික පැවැත්මට අනුග්‍රහ පිණිස ආහාර ගනියි. **ඉති** යනු ආකාරය දැක්වීමයි. මේ ආකාරයෙන් යන අර්ථයයි. **පුරාණං ච වෙදනං පටිහංඛාමි** යන්නෙහි පුරාණ වේදනාව නම් නො වළඳ සිටීමෙන් උපදින වේදනාවයි. ඒ බඩගින්න නසමියි ආහාර ගනියි. **නවං ච වෙදනං න උප්පාදෙස්සාමි** නව වේදනාව නම් වැඩිපුර ආහාර ගැනීමෙන් පසුව බඩ පුරවා දැමීම් ආදී වේදනාවන් ය. එම අලුත් වේදනාවන් ද නූපදවන්නෙමියි ආහාර ගනියි. නැතහොත් **නව වෙදනා** නම් වැළඳූ ආහාරයෙන් ඇතිවන වේදනාවයි. ඒ වේදනාව නූපන් බැවින්, නූපදවීම සඳහා ම ආහාර ගනියි. **යාත්‍රාච මෙ භවිස්සති** මගේ ශරීර යාපනය පැවැත්ම ද සිදුවන්නේ ය. **අනවජ්ජතා** මේ ආහාර අනුභවයෙහි සාවද්‍ය වූ පරිභෝජනයක් ද නිරවද්‍ය වූ පරිභෝජනයක් ද ඇත. මෙහි අධාර්මිකව සපයා ගත් (ලබාගත්) අධාර්මිකව පිළිගත් අධාර්මිකව පරිභෝග කරන ආහාරය සාවද්‍ය පරිභෝජනයකි. ධර්මයෙන් සොයා, සපයාගත් ධර්මයෙන් පිළිගත් ප්‍රත්‍යවේක්ෂා කර පරිභෝජනය කිරීම නිරවද්‍ය පරිභෝජනය නම් වේ. ඇතැම් භික්ෂුවක් නිරවද්‍යව ලැබූ ආහාරය ද සාවද්‍යව පරිභෝජනය කරයි. 'මේ ආහාරය 'මා හටම ලැබුණේයැ'යි පමණ ඉක්මවා අනුභව කරයි. ඒ ආහාරය දිරවීමට අපහසු වී, වමනය යෑමෙන් - බඩ යෑමෙන්, වෙහෙසට පත්වෙයි. මුලු විහාරයේ ම වසන භික්ෂූහු, ඒ රෝගී භික්ෂුවගේ සිරුර පිළිදැගුම් කිරීම්, බෙහෙත් සෙවීම් ආදියෙහි උත්සාහවත් බවට පැමිණෙති. 'මේ කිම් ද?'යි අනෙක් භික්ෂූන් ඇසූවිට 'අසුවල් භික්ෂුවගේ කුස ඉදිමී ඇත'යි පවසති. 'මොහු හැමවිට ම මේ ස්වභාවය ඇත්තේමය. තම කුසේ ප්‍රමාණය නොදනියි' මෙසේ නින්දා කරති. ගරහති. මෙය අනවද්‍ය වූ භෝජනයෙහි සාවද්‍ය පරිභෝජනය කිරීම නම් වේ. මෙසේ

නො කර අනවද්‍යව ම ආහාර ගන්නේය යන අර්ථයයි. **ඵාසු විහාරෝ ච** මෙහි ද අපහසු විහරණයක් හා පහසු විහරණයක් දැයි විහරණ දෙකක් ඇත. එහි ආහාරහත්ථක (අත දෙන්නයි ඉල්ලා නැගී සිටින) අලංසාටක (වස්ත්‍රය ඇඳ පොරවා ගැනීමට අසමත්) තත්‍රවට්ටක (ආහාර ගත් තැනම පෙරළී දපන) කාකමාසක (කවුඩන් විසින් කෑ හැකි සේ උගුරට ආහාර ගත්) භුත්තවමිත (අනුභව කළ දේ වමාරන) යන බ්‍රාහ්මණයන් පස්දෙනාගේ භෝජනය අඵාසුවිහාර නමි. මොවුන් අතරින් ද ආහරහත්ථකයා නම් බොහෝ අනුභව කර, තම ශක්තියෙන් නැගීසිටීමට අපහසුව, 'අත දෙන්න'යි කියා අනුන්ගේ අත අල්ලාගෙන නැගී සිටින්නාය. අලංසාටක නම් කුස ඉතා ඉදිමුණු බැවින් නැගී සිටියත් සලුව ඇඳ පොරවා ගැනීමට අසමත් වන්නාය. තත්‍රවට්ටකයා නම් කෑම වැඩිවීම නිසා නැගී සිටීමට අසමත්ව, එහිම පෙරලෙන්නාය. කාකමාසකයා නම් කපුටන් විසින් ගන්නා තරමට උගර දක්වා ම ආහාර ගත් පුද්ගලයායි. භුත්තවමිතකයා නම් ගත් ආහාර මුවින් වළක්වාගත නොහැකිව එතැන ම වමනය කරන්නා යි. මේ පස් ආකාරයෙන් බැහැරව 'මට පහසු විහරණය වන්නේ යයි ආහාර ගන්නේ ද එය පහසු විහරණය නමි. තවත් බත් පිඬු සතරක් පහක් කෑමට හැකිව තිබිය දී, එපමණ කුස ඉඩ තිබිය දී ආහාර ගැනීම නවත්වා ජලය පානය කරන්නාට සිවු ඉරියවු සුවසේ පැවැත්විය හැකිය. එබැවින් ධර්ම සේනාපති සැරියුත් මාහිමියෝ මෙසේ පෙන්වා දුන්හ.

චත්තාරෝ පඤ්ච ආලොපෙ අභුත්වා උදකං පිවෙ
අලං ඵාසු විහාරාය පහිතත්තස්ස භික්ඛුනෝ

බත් පිඬු සතරක් පහක් කුස ඉඩ තිබියදී දියකිස කරන්නේ ය. කෙලෙස් තැවීමෙහි නිරත භික්ෂුවට එය පහසු විහරණය සඳහා හේතු වන්නේ ය.

මෙතැන්හිදී මෙම පාඨයේ පැමිණි කරුණු හෙවත් අංග ගැලපිය යුතුයි. **තෙවදවාය** යනු එක් අංගයකි. **න මදාය** යනු තවත් අංගයකි. **ඉති පුරාණං ච වෙදනං පටිහංඛාමි නවං ච වෙදනං න උප්පාදෙස්සාමි** යනු තවත් අංගයකි. **යාත්‍රා ච මෙ භවිස්සති** යනු තවත් අංගයකි. **අනවජ්ජතාච ඵාසුවිහාරෝ චාති** යනු මෙහි භෝජනානිසංසයයි. මහාසීව

තෙරුන්වහන්සේ වනාහි ඉහත කී සතර අංගයන් ප්‍රතික්ෂේප කරති. මතු දැක්වෙන අංග අට උන්වහන්සේ අනුමත කරති. එහි **යාවදෙව ඉමස්ස කායස්ස ඨිතියා** යනු එක් අංගයකි. දෙවන අංගය **යාපනාය** යන්නයි. **විහිංසූපරතියා** යනු තෙවන අංගයයි. **බ්‍රහ්මචරියානුග්ගහාය** යනු සිවුවන අංගයයි. **ඉති පුරාණඤ්ච වෙදනං පටිහංඛාමි** යනු පස්වන අංගයයි. **නවඤ්ච වෙදනං න උප්පාදෙස්සාමි** යනු සයවන අංගයයි. **යාත්‍රාච මේ භවිස්සති** යනු සත්වන අංගයයි. **අනවජ්ජතා ච** යනු අටවන අංගයයි. **ඵාසුවිහාරෝ** යන්න භෝජනානිසංසයයි. මෙසේ අංග අටකින් යුක්ත ආහාරය අනුභව කරයි යන අර්ථයයි.

උපෙක්ඛකෝ යනු අංග සයකින් යුතු උපේක්ෂාවෙන් යුක්තව. **සතෝ කායානුපස්සනා** ආදී සිහියෙන් යුක්තව. **උපෙක්ඛකොති ඡළංගුපෙක්ඛාය සමන්නාගතෝ** යන මෙහි අංග සයක් ඇති උපේක්ෂා ධර්මය නම් කවරේද? ඤාණාදියයි. 'ඤාණ'යැයි කී කල්හි අටමහ කුසල් සිත් ලැබේ. 'රජ්ජන දුස්සන' (ඇලීම්-ගැටීම්) නැතැයි' කී කල්හි දස සිත් අදහස් වේ. ආසේවන වශයෙන් සෝමනස්සය ලැබේ. **චක්ඛුනා රූපං දිස්වා** යන කාරණ වශයෙන් 'චක්ඛු' යැයි ලද ව්‍යවහාරයෙන්, රූප දැකීමට සමත් වූ චක්ඛු විඤ්ඤාණයෙන් රූප දැක. පොරාණ චාර්යවරයෝ මෙසේ කීහ. 'ඇස සිතක් නොවන බැවින් රූප නොදකියි. මේ චක්ඛු ද්වාරය හා රූපාරම්මණය ගැටීමෙන්, ප්‍රසාදවස්තුක වූ සිතින් රූප දකියි. මෙබඳු තැන්හිදී 'දුන්නෙන් විදී' යනාදියෙහි මෙන්, උපකරණ පිළිබඳ කථාව (සම්භාර කථා) වේ. එහෙයින් චක්ඛු විඤ්ඤාණයෙන් රූප දැක යැයි මෙසේ අර්ථ ගතයුතුයි.

නෙව සුමනෝ ලෝභය ඉපදීම් වශයෙන් නොසතුටු වෙයි. **දුම්මනෝ** තරහ ඉපදීම් වශයෙන් දුෂ්ට සිත් ඇතිවේ. **උපෙක්ඛකෝ හොති** ඉපදීමෙන්, පැමිණෙන ආකාරයෙන් බලා සිටියි. අපක්ෂපාතීව ඉරියවු පවත්වයි. **සතෝ සම්පජානෝ** සිහිය ඇතිව ඤාණයෙන් යුක්තව. **මනාපං නාභිගිඤ්ඡතී** මනවඩන ඉෂ්ටාරම්මණයන්හි ගිජු නොවෙයි. නො පතයි. **නාභිහසති** සතුටු නොවෙයි. **න රාගං ජනෙති** ඒ ඒ තැන ඇලීම නූපදවයි. **තස්සටඨිතොව කායෝ හොති** ඒ ක්ෂීණාස්‍රවයාගේ චක්ෂු ආදී කය කර්මයෙන් තොර වූ බැවින්, සිටියේ නිශ්චල වූයේ වේ. **අමනාපං අනිෂ්ටාරම්මණය න මංකු හොති** දෝමනස්ස බවට පත් නොවේ. **අපපතිටඨිත චිත්තෙනා**

ක්‍රෝධ වශයෙන් සිටි සිත් ඇත්තේ නොවේ. **අලීනමනසෝ** නොහැකිලුණු සිත. **අව්‍යාපන්න චෙතසෝ** ව්‍යාපාද රහිත සිත. **රජනීයෙ න රජ්ජති** ඇලිය යුතු වස්තුවෙහි රාග නූපදවයි. **දොසනීයෙ න දුස්සති** දෝෂ (ද්වේෂ) ඉපදවිය යුතු වස්තුවෙහි ද්වේෂ නූපදවයි. **මොහනීයෙ න මුය්හති** මුළාවන වස්තුවෙහි මෝහය නූපදවයි. **කොපනීයෙ න කුප්පති** ක්‍රෝධ ඉපිදවිය යුතු වස්තුවෙහි නොසැලී සිටියි. **මදනීයෙ නමද්දති** මදයෙන් යුක්ත විය යුතු වස්තුවෙහි නොගිලා බැස සිටියි. **කිලෙසනීයෙ න කිලිස්සති** තැවීම්, කෙළෙසීම් සිදුවිය යුතු වස්තුවෙහි නොතැවේ. නො කෙළෙස්. **දිට්ඨෙ දිට්ඨමත්තෙනා** රූපාරම්මණයෙහි චක්ඛු විඤ්ඤාණයෙන් දක්නා ලද්ද පමණි. **සුතෙ සුතමත්තෙනා** ශබ්දායතනයෙහි ශ්‍රෝත විඤ්ඤාණයෙන් ඇසුවා පමණි. **මුතෙ මුතමත්තෙනා** ඝාණ, ජිව්හා, කාය විඤ්ඤාණයන්ගෙන් අරමුණු පැමිණ ස්පර්ශ කිරීම සිදුවූවා පමණි. **විඤ්ඤාතෙ විඤ්ඤාතමත්තෙනා** මනෝ විඤ්ඤාණයෙන් ධර්ම කරුණු දැනගත්තා පමණි. **දිට්ඨෙ න ලිප්පති** චක්ඛු විඤ්ඤාණයෙන් දක්නා ලද රූපාරම්මණයෙහි තෘෂ්ණා නැතිවූයේ ම වේ. **අනපායෝ** අල්ප වූ හෝ දුෂ්ට සිතක් නැතිව. **සංවිජ්ජති** විද්‍යමාන වේ. ලැබේ. **පඝසති** බලයි. **ඡන්දරාගෝ** ස්නේහය, සෙනෙහස. **රූපාරමං** රූපයේ සිත පිනවීම ඇත්තේනුයි රූපාරාම නම් වේ. රූපයෙහි ඇලුණේය යන අරුතින් **රූපරතං**. රූපයෙන් සතුටු වූ යන අරුතින් **රූප සම්මුදිතං**.

දනතං නයනති සමිතිං උයන්කෙළි මණ්ඩලාදියෙහි දී රැස් වූ මහා ජනකාය මැදට යන්නෝ දමනය වූ, හොඳටම හීලෑ වූ ගොනෙකු හෝ අශ්වයෙකු යෙදූ යානයකින්ම යති. **රාජා** ඉහත කී මහාජන රැස්වීම් ආදියට යන රජු ද හික්මුණු සත්ත්වයකු පිට ම නගියි. **මනුසෙසසු** මනුෂ්‍යයන් අතරෙන් ද සතර ආර්ය මාර්ගයන්ගෙන් ම දමනය වූ නිර්විෂ පුද්ගලයාම ශ්‍රේෂ්ඨ වේ. **යොති වාක්‍යං** මෙක් මෙබඳු වූ ඉතා දරුණු, ඉවසිය නොහැකි වදන් නැවත නැවත කියන කල්හිදු ඉවසත් ද ප්‍රතිචාර නොදක්වයි ද නොවෙහෙසේ ද මෙබඳු දැමුණු පුද්ගලයා ශ්‍රේෂ්ඨය යන අරුතයි. **අසසතරා** අශ්ව දෙනකට (වෙළඹකට) කොටලුවකු නිසා උපන්. **ආජානියා** අශ්වයන් දමනය කරන්නෙක් යම් දෙයක් කරයි ද එය වහා දැනගත හැකි අශ්වයෝ **සින්ධවා** සින්ධු රටේ උපන් අශ්වයෝ. **මහානාගා** කුඤ්ජර නම් වූ මහා ඇත්තු **අත්ත දනෙනා** මේ අශ්වතරීය හෝ සෛන්ධව අශ්වයෝ හෝ කුඤ්ජර ඇත්තු හෝ උතුම් දමනයෙන් දැමුණාහුය.

යමෙක් වනාහි සිවු මාර්ග සංඛ්‍යාත ආත්මදමනයෙන් දැමුණාහු ද උතුම් නිවන සෙවුනා වූ ඒ ක්ෂීණාස්‍රවයන් වහන්සේ මෙකී දැමුණු සියලු ම සත්ත්වයන්ට වඩා ඉතා උතුම් වෙති යන අර්ථයයි.

නහි එතෙහි යානෙහි මේ ඉහත දැක්වූ ඇත්, අස් ආදී යානයන්ගෙන් කිසිදු පුද්ගලයෙකුට සිහිනෙන්වත් යා නොහැකි විරූ හෙයින් 'අගත' නම් වූ නිර්වාණයට එම බාහිර යානාවලින් යා නොහැක. පූර්ව භාගයේදී ඉන්ද්‍රිය දමනයෙන් දැමුණා වූ ද අපරභාගයෙහි ආර්ය මාර්ග භාවනාවෙන් මනාව දැමුණා වූ ද තමන්ම දැමුණාව වූ, නිවන සෙවුනා වූ ප්‍රඥාවන්ත පුද්ගලයා ඒ නොගියවිරූ දිශාවට යයි. දාන්ත භූමියට පැමිණෙයි. එනිසා ආත්ම දමනයම උතුම්ය යන අර්ථයයි. **විධාසු නවිකම්පනති** 'මම ශ්‍රේෂ්ඨයාට වඩා ශ්‍රේෂ්ඨ වෙමි'යි ආදී වශයෙන් පවත්වන මාන විධීන්හි නොසැලෙති. ඉන් පීඩා නොවෙති. **විප්පමුත්තා පුනබ්භවා** පුනර්භවය, ප්‍රතිසන්ධි වශයෙන් නැවත නැවත ඉපදීම නැතිකර ඉන් මනාව මිදුනෝය. මිදී සිටිති. **දන්තභූමිං අනුප්පත්තා** ඒකාන්ත දමනයට අර්හත්ඵල භූමියට පැමිණ සිටිති. **තෙ ලොකෙ විජිතාවිනො** ඒ රහතන් වහන්සේලා සත්ත්ව ලෝකයෙහි දිනූවන් අතරින් ද දිනූ බැවින් 'විජිතවන්ත' නම් වෙති. යම්හෙයකින් වැඩූ ඉන්ද්‍රිය ඇති නිර්භය නිර්විකාර තැනැත්තේ දැමුණේ වේද එහෙයින් එම අර්ථය දක්වමින් **යස්සින්ද්‍රියානි** යන ගාථාව කියන ලදී.

එහි අර්ථ මෙසේය. යමෙකුගේ චක්ඛු ආදී යස ඉඳුරන් ගෝචර භාවනාවෙන් අනිත්‍යාදී ත්‍රිලක්ෂණ ආරෝපනය කර, වාසනා භාවනාවෙන් සතියෙන් යුක්ත බව නැමති සුගන්ධාලේපය ද තවරා වඩන ලද්දේ ද, ඒ ඉන්ද්‍රිය සංවරය අධ්‍යාත්මික ගෝචර භාවනාවෙන් මෙන්ම බාහිරවද වඩන ලද්දේනුයි **සබ්බලොකෙ** නම් වේ. යම් යම් තැනෙක ඉන්ද්‍රියයන්ගේ විකලාතවක් හෝ විකල බවක් පහළ වේනම් එහි ගිජු නොවීම් වශයෙන් ඉඳුරන් වඩන ලදී. මෙසේ **නිබ්බිජ්ඣං** බව දැන, මනාව දැන මෙලොව, පරලොව ද තමන්ගේ හා අනුන්ගේ සන්තතිය, ස්කන්ධ ලෝකයාගේ සැරීම මරණය අපේක්ෂාවෙන් කාලය ගතකරයි. ජීවිතින්ද්‍රියේ ක්ෂය වීම, මරණය අපේක්ෂා කරයි. බලාපොරොත්තු වේ. මරණයට භය නොවේ. එය කියන ලදී.

මරණෙ මෙ භයං නත්ථි - නිකනති නත්ථි ජීවිතෙ
නාභිකංඛාමි මරණං - නාභිකංඛාමි ජීවිතං
කාලං ච පතිමානෙමි - නිබ්බිසං භතකෝ යථා

මට මරණය පිළිබඳ භයක් නැත. ජීවිතය පිළිබඳ බලවත් ආශාවක් ද මා හට නැත. මම මරණය ද ජීවත්වීම ද නොපතමි. කුලිය අපේක්ෂාවෙන් සිටින කුලීකරුවකු මෙන් මම මරණය පිළිබඳ කාලය අපේක්ෂාවෙන් සිටිමි.

භාවිතෝ සදනෙත්තා මෙසේ වඩනා ලද ඉඳුරන් ඇති ඒ දැමුණු පුද්ගලයා.

නිසසයතා තණ්හා දෘෂ්ටි නිශ්‍රය බව ඤත්වා ධම්මං අනිත්‍යාදී වශයෙන් ධර්මය දැන. **අනිසසිතෝ** මෙසේ ඒ නිශ්‍රයයන්ගෙන් මිදී, අනිශ්‍රිතව නිශ්‍රයයන්ගේ අභාවයෙන් හැර, අන්තැනක ධර්ම ඤාණය නොමැති බව මෙහිදී දීපනය කරයි. **භවාය විභවාය වා** ශාස්වතව හෝ උච්ඡේදව හෝ මේ ගාථාවේ නිද්දේසයේ අර්ථ ඉතා ප්‍රකටය.

තං බ්‍රූමි උපසනෙත්තා මෙබඳු එක් එක් ගාථාවෙන් කියන ලද ඒ රහතන් වහන්සේ උපශාන්ත වූවෙකැයි කියමි. **අතරි සෝ විසත්තිකං** උන්වහන්සේ මේ පැතිරීගිය බැවින් ඇලුම් ඇතිකරන විසත්තික නම් මහා තණ්හාව තරණය කළ සේක. **අත්තනෝ දිට්ඨියා රාගෝ අභිජ්ඣාතාය ගත්තෝ** තමන් ගන්නා ලද දෘෂ්ටියේ ඇලීම්, රැඳීම් සංඛ්‍යාත රාගය අභිජ්ඣා (දැඩි ලෝභ සහගත) කාය ග්‍රන්ථයයි. **පරවාදෙසු ආඝාතෝ අපච්චයෝ** අනුන්ගේ වාදයන්හි හා ප්‍රතිවාදයන්හි කෝපය ද සතුටු නොවීම ද යන ව්‍යාපාදය කාය ග්‍රන්ථයයි. **අත්තනෝ සීලංවා වතං වා** තමන් විසින් ගන්නා ලද මෛථුන ධර්මයෙන් වැලකීම නම් වූ සීලය හෝ ගෝව්‍රතාදී ව්‍රතයක් හෝ **සීලබ්බතං වා** ඒ දෙකම හෝ **පරාමසති** මෙයින් පාරිශුද්ධිය වේයයි ආදී වශයෙන් දැඩිව අල්ලා ගනියි. **අත්තනෝ දිට්ඨි ඉදං සච්චාභිනිවෙසෝ කාය ගත්තෝ** තමන් විසින් ගත් දෘෂ්ටියෙන්. **ඉදමෙව සච්චං මොඝමඤ්ඤං** 'මෙයම සත්‍යය, සෙසු දහම් බොරු යැ'යි නුණුවණින් අල්ලා ගත් දෘෂ්ටිය ඉදං සත්‍යාභිනිවේෂණ කාය ග්‍රන්ථයයි. **ගත්තා තසස න විජ්ජනති** ඒ ක්ෂීණාස්‍රවයාට දෘෂ්ටි ග්‍රන්ථ දෙක සෝවාන්

මාර්ගයෙන් දුරු වේ. අනාගාමී මාර්ගයෙන් ව්‍යාපාද කායග්‍රන්ථය දුරුවේ. අර්හත් මාර්ගයෙන් අභිධ්‍යා කාය ග්‍රන්ථය දුරු වේ. දැන් ඒ උපශාන්ත වූ පුද්ගලයාම පසසමින්.

න තස්ස පුත්තා යනාදිය කියන ලදී. එහි අත්‍රජ ආදී වශයෙන් පුත්තු සිවු දෙනෙකි. මෙහිදී ද පුතාට අයත් වස්තුව ද පුත්‍රාදී නාමයෙන්ම කියන ලදැයි දතයුතුයි. **තෙහිස්ස න විජ්ජං** ඔවුන්ගේ අභාවයෙන් පුත්‍රාදීහු යමෙකුට නොවෙත් ද **අත්තා** ආත්මය ඇතැයි යැයි ගන්නා ලද ශාස්වත දෘෂ්ටිය නැත. **නිරත්තා** ආත්මය විනාශ වේ යැයි ගන්නා ලද උච්ඡේද දෘෂ්ටිය නැත. **ගහිතං නත්ථි** ගතයුත්තක් නැත. **මුඤ්චිතබ්බං නත්ථි** අත්හළ යුත්තක් නැත. **යස්ස නත්ථි ගහිතං** යම් පුද්ගලයකුට තණ්හාදී වශයෙන් ගතයුත්තක් නැත. **තස්ස නත්ථි මුඤ්චිතබ්බං** ඒ පුද්ගලයාට හත්හළ යුත්තක් නැත. **ගාහමුඤ්චනා සමතික්කනෙතා** ගැනීම ද මිදීම ද ඉක්මවූයේ. **වුද්ධිපරිහානි වීතිවත්තෙතා** වැඩීම ද හානිය ද ඉක්මවා සිටියේ.

යෙන නං වජ්ජුං පුථුජ්ජනා අථෝ සමණ බ්‍රාහ්මණා යම් රාගාදී වරදකින් දෙව් මිනිස් ආදී සියලු පුහුදුන් පුද්ගලයෝ ද ශාසනයෙන් බාහිර වූ ශ්‍රමණ බ්‍රාහ්මණයෝ ද ඒ රහතන් වහන්සේට 'ඇලුණෙකි'යි 'ගැටුනෙකි'යි කියන්නේ නම් **තං තස්ස අපුරෙක්ඛතං** ඒ රාගාදී වැරදි ඒ රහතන් වහන්සේ විසින් පෙරටු නොකරන ලද්දේ ය. **තස්මා වාදෙසු නෙජති** එකරුණෙන් නින්දා වචනයන්හි කම්පා නොවේ. **නෙජති** යනු නිද්දේසයේ උදෙසන පදයයි. **න ඉඤ්ජති** නොසැලේ. **න චලති** එහි කම්පා නොවේ. **න වෙධති** කම්පා වීමට අසමත් බැවින් නොසැලේ. **නප්පවෙධති** කම්පා නොවේ. **න සම්පවෙධති** නො පෙරළේ. **න උසෙසසු වදතෙ විශිෂ්ටයන් අතුරෙහි** තමා ද ඇතුලත් කර, 'මම විශිෂ්ටයෙක්මි'යි අතිමාන වශයෙන් නො පවසයි. ඉතිරි දෙපදයෙහි ද මේ න්‍යායෙන් අර්ථ දතයුතුයි.

කප්පං නෙති අකප්පියෝ ඒ ක්ෂීණාශ්‍රවයා මෙබඳු දෙවැදෑරුම් වූ කල්පයට නොපැමිණේ. කුමක් නිසා ද? නොකැප වූවෙකි ප්‍රහීණ වූ කල්පන ඇත්තෙකැයි කියන ලද බැවිනි. මේ ගාථාවේ නිද්දේසයේ ද අර්ථ ඉතා ප්‍රකටය.

සකං මගේ යැයි ගන්නා ලද. **අසතා ච න සොචති** අවිද්‍ය මානවන බැවින්, නොමැති බැවින් ශෝක නො කරයි. **ධම්මෙසු ච න ගච්ඡති** සියලු

ධර්මයන්හි ඡන්දාදී වශයෙන් ඇලීමට නොයයි. **ස වෙ සනෙත්‍යාති වුච්චති** ඒ මෙබඳු වූ නරෝත්තමයා ශාන්ත වූවෙකි යි කියනු ලැබේ. මේ ගාථාවේද නිද්දේසය ප්‍රකට වූ අර්ථ ඇත්තකි. මෙසේ අර්හත්භාවය දක්වා දේශනාව ගෙනවුත් නිමා කරන ලදී. මෙම සූත්‍ර දේශනාවසානයේ දී කෙළ ලක්ෂ ගණනක් දෙවියෝ අර්හත්ඵලයෙහි පිහිටියහ. සෝවාන් ආදී මගඵල ලැබූවන්ගේ සංඛ්‍යාවක් නම් නැත.

දසවන පුරාභේද සූත්‍ර වර්ණනාව නිමියේ ය.

11.

එකොළොස්වන කලහ විවාද සූත්‍ර නිර්දේශයේ **කුතො පභූතා කලහ විවාදා** කලහය ද එහි පූර්වභාගය වූ විවාදය ද යන මේවා කොතැනින් උපන්නේ ද? **පරිදෙවසොකා සහමච්ඡරා වා** පරිදේව ශෝකයෝ ද මාත්සර්යයෝ ද කොතැනින් උපන්නාහු ද? **මානාතිමානා සහ පෙසුනා ච** මානයෝ ද අතිමානයෝ ද පිසුනාවාචයෝ ද (කේලාම්) කොතැනින් උපන්නාහු ද? **තෙ** ඒ සියලු අටවැදෑරුම් කෙලෙස් ධර්ම. **තදිංඝ බ්‍රූහි** ඒ මවිසින් විමසූ ප්‍රශ්නයට පිළිතුරු වදාළ මැනවි. මම ඒ ඉල්ලීම කරමි. යාචනාර්ථයේ 'ඉංඝ' යන නිපාතය යෙදේ.

එකෙනාකාරෙන එක් අයුරකින්, **අපරෙන ආකාරෙන** අනික් කාරණයකින් **අගාරිකා දණ්ඩපසූතා** ගෘහපතියෝ ද ගෘහපතීන් විහෙසවති. **පබ්බජිතා ආපත්තිං ආපජ්ජනතා** අනගාරිකයෝ, සත් ආපත්තිවලින් එකකට පැමිණෙන්නෝ. **කුතො පභූතා** කොතැනින් වූවාහු ද? **කුතො ජාතා** කොතැනින් උපන්නාහු ද? **කුතො සංජාතා** කොතැනින් හටගත්තාහු ද? උපසර්ගයොදා පද වඩන ලදී. **කුතො නිබ්බත්තා** කොතැනින් නිපන්

ලක්ෂණයට පැමිණියාහු ද? උපසර්ග යොදා පදය වැඩිකරන ලදුව **කුතො අභිනිබ්බත්තා** යි කියන ලදී. **කුතො පාතුභූතා** කොතැනින් ප්‍රකට වූවාහුද?

කිං නිදානා ආදියෙහි තමාගේ ඵලය නිදන් කෙරේනුයි **නිදානං**. මෙයින් ඵලය හටගත්තේනුයි **සමුදයො**. මෙයින් ඵලය හටගනියි **ජාති**. මෙයින් ඵලය ප්‍රභවය වේනුයි **පභවො**. **මූල පුච්ඡති** යනු කලහයට හේතුව විමසයි. කාරණය, හේතුව වනාහි පිහිටීම් වශයෙන් 'මූල' නම් වේ. තමාගේ ඵල නිෂ්පාදය සඳහා පිහිට වේ. පවත්නේනුයි **හෙතු**. 'එසේනම් මෙය ගනිවු' යයි දක්වන්නාක් මෙන් තමාගේ ඵලය තැන්පත් කරයිනුයි **නිදානං**. මෙයින් ඵලය හට ගනීනුයි **සමභවො**. මෙයින් ඵලය ප්‍රභවය වේනුයි **පභවො**. මෙහි ඵලය හටගනියි හෝ මෙයින් ඵලය හටගනියි නුයි **සමුට්ඨානං**. තමාගේ ඵලය ගෙනඒනුයි **ආහාරො**. ප්‍රතික්ෂේප නොකළ යුතු යන අර්ථයෙන් තමාගේ ඵලය ඇලුම් කෙරේනුයි **ආරම්මණං**. මෙය නිසා, මේ හේතුවෙන් අත්නොහැර මේ ඵලය පැමිණේ පවතියිනුයි **පවවයො**. මෙයින් ඵලය හටගනියිනුයි **සමුදයො**. මේ ආකාරයෙන් මෙම පදයන්ගේ වචනාර්ථ දතයුතුයි. ඒ සඳහා 'කලහයේ ද විවාදයේ ද මූලය, හේතුව විචාරයි' ආදී වශයෙන් දේශනාව පවත්වන ලදී.

පියප්පභූතා ප්‍රිය වස්තුවෙන් හටගන්නා ලදී. **මච්ඡරියයුත්තා කලහා විවාදා** මේ කලහ විවාදාදිය ප්‍රියවස්තු හේතුවෙන් ම පමණක් නොව මසුරුකම නිසාත් ඇතිවේ යැයි දක්වයි. කලහ විවාද යන ශීර්ෂයෙන් ම සියලුම ඒ ක්ලේශ ධර්ම ඇතිවේයැයි මෙහිදී කියන ලද බව දතයුතුයි. මසුරුකම නිසා කලහවිවාද ඇතිවන්නාක් මෙන් විවාද ඇති වූ කල්හි කේලාම් බස ද ඇති වේ. එනිසා **විවාද ජාතෙසු ච පෙසුනානී** යි කියන ලදී. මේ ගාථාවේ නිද්දේසය ඉතා ප්‍රකට වූ අර්ථ ඇත්තක් ම වේ.

පියාසු ලොකසමිං කුතො නිදානා යෙ චාපි ලොභා විචරන්ති ලොකෙ ප්‍රියවස්තු නිසා කලහ ඇතිවේ යැයි මෙහිදී කියන ලදී. ලෝකයේ ඒ ප්‍රියවස්තූන්ට කුමක් නිදාන වේද? කුමකින් උපන්නේ ද? හුදෙක් ප්‍රිය වස්තු පමණක් නොවේ. යම් ඒ ක්ෂත්‍රියාදී රජවරු ලෝභයෙන් හැසිරෙත්ද ලෝභ හේතුවෙන්, ලෝභයෙන් මැඩී හැසිරෙත්ද ඔවුන්ගේ ඒ ලෝභය ද කොතැනින් උපන්නේ ද?යන අර්ථ දෙක ම මේ එකම ප්‍රශ්නයෙන් විමසයි. **කුතො නිදානා** යන මෙහි කුමක් නිදාන වේද? කුමක් හේතු

වේද? යන අරුතින් කිං නිදානා, කිං හේතුකා යි ප්‍රථමා විභක්ති වචනයට 'කුතො' යන්න ආදේශ වූ බව දතයුතුයි. මෙහි සමාසයක් වන බැවින් ලෝපය සිදු නොවේ. නැතහොත් 'නිදාන' යනු උපන්, හටගත් යන අර්ථ දෙන්නකි. එහෙයින් **කුතො නිදානා** යන්නෙන් කොතැනින් උපන්නේ ද? කොතැනින් හටගත්තේ ද'යි කියන ලදී. **ආසා ච නිටයා ච** ආශාව ද ඒ ආශාවේ සමෘද්ධිය ද. **යෙ සමපරායාය නරසස හොනති** යම් මිනිසකුට පිහිටක් වේද, පරලොව සඳහා පිහිට වේනුයි කියන ලදී. මේ ප්‍රශ්නය එකක්මය. **දීපා හොනති** පිහිටක් වෙයි. **සරණා හොනති** දුක් නැසීමට උපකාරී වේ. **නිටයා පරායනො හොතී** සමෘද්ධිය පිහිට කර සිටියි.

ඡන්ද නිදානානි කාමච්ඡන්දය නිදාන කර ඇත. **යෙචාපි ලොභා විවරනති** යම් ඒ ක්ෂත්‍රියාදීහු ලෝභයෙන් හැසිරෙත් ද ඔවුන්ගේ ඒ ලෝභ සිත ද කාමච්ඡන්ද නිදාන කරන උපදියි යැයි යන අර්ථ දෙකම එකම පිළිතුරෙන් විසඳයි. **ඉතො නිදානා** කාමච්ඡන්දය නිදාන කරගත්තේමයැයි කියන ලදී. මේ කාමච්ඡන්දයෙන් යන්න පර්යේෂණ කැමැත්ත ආදී ඡන්දය සඳහා කියන ලදී. ලෝභාදිය ඡන්දය නිදාන කරගෙන ඇතිවේ. 'ඉතො නිදානා' යන වචනයේ පදසිද්ධිය 'කුතො නිදානා' යන්නට පැවසූ පරිදි දතයුතුයි. ආශාවේ සමෘද්ධිය **නිටයා** යි කියන ලදී. අදහස් නිෂ්පත්තිය යයි ලෝකයෙහි කියනු ලැබේ.

විනිචඡයා තෘෂ්ණා දෘෂ්ටි විනිශ්චය. **යෙචාපි ධමමා සමඤඤ වුතතා** යම් අන්‍ය වූ ද ක්‍රෝධාදිය සමග සම්ප්‍රයුක්තව වූ හෝ ඊට සමාන වූ අකුසල ධර්ම පිළිබඳව බුද්ධ ශ්‍රමණයන් විසින් දේශනා කරන ලද්දේ ද ඒ කෙලෙස් දහම් කුමකින් උපදින්නේ ද? **අඤඤජාතිකා** අන්‍ය ස්වභාව ඇති. **අඤඤ විහිතකා** අනෙකෙකු විසින් කියන ලද කරුණාවෙන් සිටී. **සමිත පාපෙන** නිවා දැමූ පව් ඇති තැනැත්තා විසින් **බාහිත පාපධමෙමන** ප්‍රහීණ කරනලද ලාමක ධර්ම ඇත්තහු විසින් **භිනනකිලෙස** මූලෙන කෙලෙස් මුල් බිඳ දමා සිටියහු විසින් **සබබාකුසල බඳධනා පමුතතන** දොළොස් අකුසල් බන්ධන මුදා සිටියහු විසින්. **වුතතා** කියන ලදී. **පවුතතා** ප්‍රකාශයට පත්කරන ලද.

තමුපනිසසාය පහොති ඡන්දො ඒ සුඛ දුක්ඛ වේදනාව, ඒ දෙකින්ම යුතු සාතාසාත වේදනාව නිසා සංයෝග, වියෝග ප්‍රාර්ථනා වශයෙන්

ඡන්දය උපදී. මෙපමණෙකින් ලෝකයෙහි ප්‍රියවස්තු කෙරෙහි කාමච්ඡන්දය කුමකින් ඇතිවේද'යි යන මේ ප්‍රශ්නය විසඳන ලදී.

රූපෙසු දිසවා විභවං භවඤ්ච රූපයන්හි විනාශයත් ඉපදීමත් දැක. **විනිච්ඡයං කුරුතෙ ජන්තු ලොකෙ** අපායාදී ලෝකයේ මේ සත්ත්වයා භෝගාධිගමය සඳහා තණ්හා දෘෂ්ටි විනිශ්චය **අත්තා මෙ උප්පජ්ජතෙනා** යනාදී නයින් දෘෂ්ටි විනිශ්චය කරන්නේය. මෙපමණෙකින් 'තෘෂ්ණා දෘෂ්ටි විනිශ්චයෝ කොතැනින් උපන්නාහු ද?' යන මේ ප්‍රශ්නය විසඳන ලදී.

සාතා සාතං නිසස්සාය මිහිරි වූ ද, නොමිහිරි වූ ද දෙය උපනිශ්‍රය කර. **ඉට්ඨානිට්ඨඤ්ච** ඉෂ්ටාරම්මණය ද අනිෂ්ටාරම්මණය ද **සුරාමෙරය මජ්ජපමා දට්ඨානානුයොගං** යන මෙහි සුරා යන පූවසුරා, පිටිසුරා, බත්සුරා, කිණ්ණ පක්ඛිත්ත (රා මණ්ඩි දැමූ) සහ සම්භාර සංයුත්ත යනාදී පංච සුරාවයි. **මෙරයං** පුප්ඵාසව, ඵලාසව, මධ්වාසව, ගුලාසව, සම්භාර සංයුත්ත යැයි මද්‍යසාර පහකි. ඒ සියල්ල මත්භාවය ඇතිකරන බැවින් 'මජ්ජ' නම් වේ. **පමාදට්ඨානං** ප්‍රමාදයට හේතුවන, යම් සිතකින් ඒ මද්‍යපාන බොන්නේ ද ඒ ක්‍රියාවට මේ තවත් වචනයකි. **අනුයොගං** ඒ සුරාමේරයන් මද්‍යසාරයන්, මදයට හා ප්‍රමාදයට හේතුවන පරිදි ගැනීම නැවත නැවත කිරීමයි.' මේ මද්‍යසාර ගැනීමෙන් මගේ උපන් භවභෝග පිරිහී යයි. නූපන් භව භෝග සම්පත් නූපදියි. ඒ නිසා මගේ භව භෝග සම්පත් පිරිහීමට ක්ෂය වීමට යන්නෙ යැයි දනියි" සැමතැන්හිම මෙසේ අර්ථ ගත යුතුයි.

විකාල විසිඛා චරියානුයොගං නෙකල්හි. වීථි සංචාරයන්හි යෙදීම. **සමජ්ජාභිචරණං** නෘත්‍යාදිය බලමින් පිරිස් මැද හැසිරීම. **ආලස්සානුයොගං** කායික අලස භාවයෙන් යුතුව. **අපාය මුඛනි වා න සෙවති** භෝගයන් විනාශ වන මාර්ගාදිය හෝ සේවනය නොකරයි. **කසියා වා** කෘෂිකර්මාන්තයෙන් හෝ **වානිජ්ජාය වා** ධාර්මික වෙළඳාමෙන් හෝ **ගොරක්ඛන** ගවපාලනයෙන් හෝ. **ඉස්සත්ථෙන වා** දුනුශිල්පාදියකින් හෝ **රාජාපොරි සෙන වා** රාජ්‍ය සේවයෙන් හෝ **සිප්පඤ්ඤතරෙන වා** කුඹල් කර්මාන්තය ආදී අනෙකුත් ශිල්පයකින් හෝ **පටිපජ්ජති** ප්‍රයෝග කරයි. **චක්ඛුසමිං උප්පජ්ජනෙනා ඤානාති** සසම්භාර චක්ෂුව උපන් කල්හි

දැනගනියි. **අත්තා මෙ උප්පන්නො** දෘෂ්ටිය ගනියි. **චක්ඛුසම්ං අනන්තරහිතෙ** ඒ ඇස් නැසුණු කල්හි. **අත්තා මෙ අනන්තරහිතො** මගේ ආත්මය නැසුණේයැයි යන දෘෂ්ටිය ගනියි. **විගතො මෙ අත්තා** මගේ ආත්මය ඉක්මගියේය. නැසුණේය. **සොත සම්ං** යනාදියෙහි ද මේ ක්‍රමයෙන් අර්ථ ගත යුතුයි.

එතෙපි ධම්මා ද්වයමෙව සන්තෙ මේ ක්‍රෝධාදී ධර්මයෝ සාත අසාත යන ධර්ම දෙක ඇති කල්හිම ඇති වෙති උපදිති. මෙපණකින් තුන්වන ප්‍රශ්නයද විසඳන ලදී. දැන් යමෙක් මෙසේ විසඳන ලද මේ ප්‍රශ්නවල, සැකසංකා සහිත බවට පත්වන්නේ නම්, ඒ ඔහුගේ සැක සංකා ප්‍රහානය කිරීමට උපායක් දක්වමින් **"කථංකථී ඤාණපථය සික්ඛෙ** යන්න වදාළහ. ඥාණ දර්ශන ඤාණාධිගමනය සඳහා ත්‍රිවිධ ශික්ෂාවේ හික්මෙන්නේ යැයි කියන ලදී. කුමක් හෙයින් ද? **ඤත්වා පවුත්තා සම්මෙන ධම්මා** බුද්ධ ශ්‍රමණය විසින් දැනගෙනම ධර්මය වදාල හෙයිනි. උන්වහන්සේට ධර්මය පිළිබඳ අවබෝධයක් නම් නැත. තමාට ඤාණය නොමැති හෙයින් ම ඔවුහු ඒ ධර්ම කරුණු අවබෝධ කර නොගන්නේ ඒ ධර්මය නොමදන්නෝය. එය දේශනාවේ දෝෂයක් නොවේ. එනිසා තථාගතයන් හික්මීම දේශනා කරන ලදී.

පරිකෙඛප බන්ධනෙන වා බද්ධො බන්ධනාගාරගත කරන බන්ධනයෙන් බඳනා ලදී. **පරිකඛ බන්ධනෙන වා** වැටකින් වටකර හෝ බඳින ලද්දේ නම් වේ. **තස්ස බන්ධනස්ස මුත්තත්ථාය** ඒ කියන ලද ආකාර ඇති බන්ධනයන්ගෙන් මිදීමට.

ඤාණම්පි ඤාණපථො මුලින් උපන් ඤාණය ඉන් අනතුරුව උපන් ඤාණයම හැසිරෙන මාර්ගයක් වෙනුයි ඤාණය ද ඤාණපථයක් වේ. ඤාණස්ස ආරම්මණම්පි ඤාණපථො ඤාණයට ප්‍රත්‍යය වී එහි එල්බී ඉපදෙන හෙයින් ඤාණපථයයි. **ඤානසහභුනොපි ධම්මා ඤාණපථො** ඤාණය සමග එකට උපන් අවශේෂ චිත්ත චෛතසික ධර්ම ඤාණපථ යි. දැන් උපමාවකින් කරුණු දක්වමින් "ආර්යමාර්ගය, ආර්යපථය, මෙනි" යනාදිය කියන ලදී.

කථං කථී පුග්ගලො විචිකිච්ඡාව ඇති පුද්ගලයා. **සකඩෙඛා** සැක සංකා සහිත. **සවිලෙඛො සිතේ හිරි** ඇතිව. **සදෙවළ්හකො** සැක සහිතව

සචිචිකචෙඡා සැකයෙන් යුක්තව **ඤාණාධිගාමය** ඤාණ ප්‍රතිලාභය සඳහා. **ඤාණසචඡිකිරියා ය** ඤාණයේ ප්‍රත්‍යක්ෂකරණය සඳහා **සනිදානං** මම නිදාන සහිතව, ප්‍රතය සහිතව ධර්මදේශනා කරමි. **සපපටිහාරියං** නෛර්යානික වූ දෙය නෛර්යාණික කර **නො අපපටිහාරියං** අනෛර්යාණික වූවක් නොකර නෛර්යාණික වූවක් කර දහම් දෙසමි.

සාතං අසාතඤච කුතො නිදානා යන මෙහි **සාතසාතං** යන මෙහි සුව දුක් වේදනාව ම අදහස් කරන ලදී. **න භවනති හෙතෙ** මේ ධර්මය නොවෙත් ද? **විභවං භවඤාපි යමෙතමත්ථං එතං මෙ පබුදහි යතො නිදානං** සාතසාතයන්ගේ විනාශය ද පහළවීම ද යන මේ යම් අර්ථයක් ලිංගව්‍යාක්තියෙන් මෙහි තබන ලදී. මෙය කියන ලද්දේය. "සාතාසාතයන්ගේ විනාශය ද පහළවීම ද" යන මේ ප්‍රකාශයේ අර්ථ මා හට කියන්න. ඊට නිදාන කුමක් ද? මෙහි ද සාතසාතයන්ගේ නැතිවීම, ඇතිවීම වස්තු කරගත් විභව, භව දෘෂ්ටිහූම තිවීම (විභව) ඇතිවීම (භව) වශයෙන් අර්ථ දතයුතුයි. ඒ එසේමැයි ගාථාවෙහි දී මේ ප්‍රශ්නය විසඳමින් භව දෘෂ්ටියටත් විභව දෘෂ්ටියටත් ස්පර්ශය නිදාන වේ යැයි කියවේ. මෙම ගාථාවෙහි නිද්දේසයේ අමුතුවෙන් අර්ථ කිවයුත්තක් නැත.

ඉතො නිදානං ස්පර්ශය (ඵස්සය) නිදාන කරගෙන. මේ ගාථාවේ හා නිද්දේසයේ ද කිවයුත්තක් නැත

නාමඤච රූපඤච පටිචච සම්ප්‍රයුක්ත නාමය ද වස්තු ආලම්භන රූපය ද නිසා **රූපෙ විභූතෙ න ඵුසනති ඵස්සා** රූපය ඉක්මවූ කල්හි පංච ස්පර්ශයෝ ස්පර්ශ නොකෙරති. **තිණණං සංගති ඵසෙසා** ඇස, රූපය, විඤ්ඤාණය යන තුනේ එකතුවීමෙන් ස්පර්ශය හටගනියි. **චකඛු ච රූපා ච රූපසමිං** ප්‍රසාද චක්ෂුවද රූපාලම්බනයෝද රූප කොටසෙහි රූප භාගයේ කොටැ, **චකඛු සමඵසසං ඨපෙසවා** ඉහත කී ධර්ම තුනේ එකතු වීමෙන් උපන් ස්පර්ශය හැර **සමපයුත්තකා ධමමා නාමසමිං** අවශේෂ වූ වේදනා දී ස්පර්ශයක් සමඟ එකට උපන් ධර්ම නාම කොටසෙහි වැටේ. **සොතඤච පටිචච** යනාදියෙහි ද මේ ක්‍රමයමයි.

චතුහාකාරයෙහි රූපං විභූතං හොති සතර අයුරකින් රූපය ඉක්මවන ලදී. **ඤාත වීතිවතෙතන** ප්‍රකට කර ඉක්මවීමෙන් **තීරණ විභූතෙන**

අනිත්‍යාදී වශයෙන් තීරණය කර. **ඉක්මවීමෙන් පහාන විභූතෙන** ඡන්දරාග ප්‍රහාණ වශයෙන් ඉක්මවීමෙන්. **සමතික්කමම විභූතෙන** සතරවැදෑරුම් අරූප සමාපත්තීන්ගේ ප්‍රතිලාභ වශයෙන් ඉක්මවීමෙන්. **කථං සමෙතස්ස** කෙසේ පිළිපන්නහුට. **විඤ්ඤාති රූපං** රූපය පහළ නොවේද? **න විභවෙය්‍ය වා සුඛං දුක්ඛං වා** ඉෂ්ටානිෂ්ට රූප පිළිබඳවම විචාරයි. **ජානෙය්‍යාම** දැන ගන්නෙමු. **අජානෙය්‍යාම** විශේෂයෙන් දැනගන්නෙමු. **පජානෙය්‍යාම** ප්‍රකර්ශ වශයෙන් දැනගන්නෙමු. **පටිවිජානෙය්‍යාම** මනාව දැනගන්නෙමු. **පටිවිජ්ඣෙය්‍යාම** සිතින් අවබෝධ කරගන්නෙමු.

න සඤ්ඤා සඤ්ඤී යම්සේ රූපය නොවන සේ පිළිපන් හෙතෙම ප්‍රකෘති සංඥාවෙන් සංඥා ඇත්තේ නොවෙයි. **න විසඤ්ඤා සඤ්ඤී** විකෘති සංඥාවෙන් විසංඥ වූයේ නොවෙයි. උම්මත්තකයෙක් හෝ පිස්සු වැටුනෙක් නොවෙයි. **නො පි අසඤ්ඤී** සංඥාවෙන් තොර වූවෙක් ද නොවෙයි. නිරෝධ සමාපත්තියට සමවැදුනෙක් හෝ අසංඥතලයේ උපන් සත්ත්වයෙක් හෝ නොවේ. **න විභූතසඤ්ඤී** සර්වප්‍රකාරයෙන් ම රූප සංඥාවන්ගේ යැයි කියූ න්‍යායෙන් මනාව ඉක්ම වූ සංඥා ඇත්තේ ද නොවේ. අරූප ධ්‍යානලාභියෙක් ද නොවෙයි. **එවං සමෙතස්ස විඤ්ඤාති රූපං** මෙසේ සංඥා සංඥතාදිභාවයෙහි නොසිටි කියන ලද අයුරින් "හෙතෙම මෙසේ සතරවන ධ්‍යානයෙන් සිත එකඟ වූ කල්හි -පෙ- ආකාසානඤ්චායතන සමාපත්ති. ප්‍රතිලාභය පිණිස සිත එළවයි. මෙසේ පිළිපන්නහුට අරූප චිත්තයෙන් යුක්ත බැවින් රූපය නොවෙයි. **සඤ්ඤා නිදානා හි පපඤ්චසංඛා** මෙසේ පිළිපන් පුද්ගලයාට යම් සංඥාවක් තණ්හාදී ප්‍රපංචයෙන් නිදාන කර ඇත්තේ ද ඒ සංඥාව අප්‍රහීණව පවතී යැයි දක්වයි.

අසඤ්ඤිනො වුච්චන්ති නිරොධ සමාපන්නා සංඥාව, වේදනාව දුරුකර නිරෝධ සමාපත්තියට සමවැදුණු පුද්ගලයෝ සංඥාව නැති හෙයින් "අසඤ්ඤී" යැයි කියති. **අසඤ්ඤා සත්තා** සර්වප්‍රකාරයෙන් ම සියලු සංඥා දුරුවූ හෙයින් අසංඥා භාවයෙහි උපන් "**සො එවං සමාහිතෙ චිත්තෙ** එහි **සෝ** යනු ඒ භික්ෂුව **එවං** යනු සිව්වන ධ්‍යානයට සමවැදීම දක්වන්නකි. මේ ක්‍රමයෙන් සතරවන ධ්‍යානයට සමවැදී යැයි කියන ලදී.

සමාහිතෙ මේ සතරවන ධ්‍යාන සමාධියෙන් සිත එකඟ වූ කල්හි, **පරිසුද්ධෙ** ආදියෙහි ද උපේක්ෂා සති පාරිශුද්ධියෙන් පිරිසිදු වූ.

ඉතා පිරිසිදු වූ හෙයින් ම **පරියෙදාතෙ** ප්‍රභාස්වර වූ යැයි කියන ලදී. සුබාදී ප්‍රත්‍යයන්ගේ නැසීමෙන්, දුරුකළ රාගාදී අංගන ඇති බැවින් **අනංගනෙ** අනංගන වූ හෙයින් ම **විගතූපකකි ලෙසෙ**, අංගනයන්ගෙන් සිත කිළිටි වන්නේය. මනාව වඩන ලද හෙයින් **මුදූභූතෙ**. වශීභාවයට පැමිණි කල්හි කියන ලද්දේ වෙයි. වසඟයට පමුණුවා ගත් සිත මුදු වූවකැයි කියයි. මෘදු වූ බැවින්ම **කමමඤ්ඤෙ** කර්මක්ෂම වූ කර්ම යෝග්‍ය වූයේයැයි කියන ලදී. මෘදු වූ සිත කර්මණ්‍ය වේ. මනාව පිරිසිදු කළ ස්වර්ණයක් මෙනි. මේ දෙකම ඇති වූයේ මනාව වැඩූ හෙයිනි. එය කියන ලදී. - "මහණෙනි මම වෙනත් එකදු ධර්මයක්වත් නොදකින්නෙමි. මෙසේ මනාව වඩන ලද්දේ බහුල වශයෙන් වඩන ලද්දේ මෘදු බවට ද කර්මණ්‍ය බවටද පැමිණෙන සිත වැනි (අන් එකදු ධර්මයක් නොදකිමි.)

මෙ කියන ලද පිරිසිදු භාවයන්හි සිටි බැවින් **ඨිතෙථ**, සිටි බැවින්ම **ආනෙඤ්ජප්පත්තෙ** අචල වූ, අම්පිත වූයේ යැයි කියන ලදී. මෘදු කර්මණ්‍ය භාවයෙන් හෝ තම වසඟයේ පවත්වා ගත යුතු බැවින් ඨිතෙ. ශ්‍රද්ධාදියෙන් මනාව පිළිගත් බැවින් **ආනෙඤ්ජප්පත්තෙ**. ශ්‍රද්ධාවෙන් අල්ලාගත් සිත, අශ්‍රද්ධාවන්හි කම්පා නොවේ. වීර්යයෙන් අල්ලාගත් සිත, කුසීත භාවෙහි කම්පා නොවේ. සිහියෙන් අල්වාගත් සිත ප්‍රමාදයෙහි කම්පා නොවේ. සමාධියෙන් අල්වාගත් සිත විසිරීයෑමෙහි කම්පා නොවේ. ප්‍රඥාවෙන් අල්ලාගත් සිත අවිද්‍යාවෙන් කම්පා නොවේ. ආලෝකයෙන් යුක්ත වූ සිත කෙළෙස් අඳුරෙන් කම්පා නොවේ. මෙසේ මේ සද්ධා, වීරිය, සති, සමාධි, ප්‍රඥා හා ඕභාස යන ධර්ම සයෙන් මනාව අල්වාගත් (පරිගෘහිත) සිත නිශ්චල බවට පත් වේ. මෙසේ උක්ත මෘදු බව, කර්මණ්‍ය බව හා සද්ධාදී ධර්මතා සය යන අංග අටෙන් යුක්ත සිත ඉදිරියට ගෙන යෑමට සුදුසු වේ. එය ඉදිරි ආකාසානඤ්චායතනාදී ධ්‍යාන සමාපත්ති ලැබීමට සුදුසු වේ.

මේ තවත් ක්‍රමයකි. චතුර්ථ ධ්‍යාන සමාධියෙන් සන්සිඳුණු කල්හි, නීවරණයන් දුරුකළ බැවින් පිරිසිදු වූ, විතර්කාදිය මනාව ඉක්මවීමෙන් ඉතා පිරිසිදු වූ, ධ්‍යාන ප්‍රතිලාභයට විරුද්ධ වූ පවිටු වූ ආශාවලින් පිරුණු ස්වභාවයෙන් දුරු වූ හෙයින් අනංගන නම් වේ. "ඉච්ඡාවචර" යනු කැමැත්තෙන් ආශාවෙන් හැසිරෙන, ආශාවෙන් බැස පවතින නානාප්‍රකාර කෝප, තරහාදී කෙලෙස් යන අර්ථයයි. අභිධ්‍යාදී උපක්ලේෂයන්ගෙන්

දුරු වූ හෙයින් විගතූපක්කිලේස නම් වේ. මේ දෙපදය මෙහි අනංගනනවත්‍ථ සූත්‍රානුසාරයෙන් දත යුතුයි. වශී භාවයට පත් වූ හෙයින් කර්මණ්‍ය වූ භාවනාවන් සම්පූර්ණ කර, ප්‍රණීත භාවයට පැමිණි සිටි කල්හි අනෙජ්ජප්‍රාප්ත වූ. යම් සේ ආශාවන්ට වහල්ව හැසිරෙන ස්වභාවයෙන් වැලකී අනෙජ්ජ ප්‍රාප්ත වේද මෙසේ සිටී යන අර්ථයයි. මෙසේ කියන ලද අට්‍යාංගයන්ගෙන් සමන්විත වූ සිත ආකාසානඤ්චා-යතන සමාපත්ති ප්‍රතිලාභයට, ඉදිරියට ගමන් කිරීමට පාදක වූ අඩිතාලමක් වේ.

ආරුප්පමගඝ සමංගි අරූප සමාපත්තියෙන් අපරිහීනව ගමන් කරයි. යුක්ත වේ. **පපඤ්චායෙව පපඤ්චසංඛා** තණ්හාදී ප්‍රපංචයෝම ප්‍රපංච නම් වෙති.

එත්තාවතගඝං නො වදනති සත්තසස සුදධිං ඉධ පණ්ඩිතසෙ උදාහු අඤ්ඤමපි වදනති එත්තෙතා” මෙපමණකින් මෙලොව නුවණැත ශ්‍රමණ බ්‍රහ්මණයෝ සත්ත්වයාගේ අග්‍ර වූ ශුද්ධිය කියත් ද? නැතහොත් මේ අරූප සමාපත්තියෙන් අන්‍ය වූ ශුද්ධියක්, ඊට අධික වූවක් පෙන්වත්ද? යනුවෙන් විචාරයි. **එත්තෙතා අරූපසමාපත්තිතො** මේ අරූප සමාපත්තියෙන්.

එත්තාවතගඝමපි වදනති හෙකෙ යනු ඇතැම් ශාශ්වතාදී ශ්‍රමණ බ්‍රාහ්මණ කෙනෙක් පණ්ඩිතමානීව මෙපමණකින්ම සත්ත්වයාගේ අග්‍ර වූ ශුද්ධි දක්වති. යලි ඔවුන් අතුරෙන් උච්ඡේදවාදී ඇතැම් ශ්‍රමණ බ්‍රාහ්මණයෙක් උච්ඡේද වශයෙන් ශුද්ධිය පණවති. **අනුපාදිසෙසෙ කුසලාවදාන** අනුපාදි ශේෂයෙහි දක්ෂ වූ වාද ඇත්තන් සේ **භාවතඡ්ඡිතා** යනු භවයෙන් තැති ගනී. **විභවං අභිනන්දති** උච්ඡේදය නිසා තුටුවෙයි.

තෙ සත්තසස සමං ඔවුන් උච්ඡේදය පුද්ගලයාගේ ව්‍යුපසමනය, නොපැවැත්ම පෙන්වති. **උපසමං** අතිවූපසමනය. **වූපසමං** ශාන්තිය. **නිරෝධං** නූපදීම. **පටිප්පසසද්ධිං** නැවත නූපදීම.

එතෙ ච ඤත්වා උපනිසසතා මේ දෘෂ්ටිගතිකයන් ශාශ්වත උච්ඡේද දෘෂ්ටි ඇසුරු කළා යැයි දැන. **මුනී නිසසයෙ සො වීමංසී** තෘෂ්ණා දෘෂ්ටි නිශ්‍රයන් ඇන, ඒ විමසුම්ශීලී පණ්ඩිත වූ බුද්ධමුනීන්ද්‍රයන් වහන්සේ,

ඤත්වා විමුත්තෙතා දුක්, අනිත්‍යාදී දහම් දැන කෙලෙසුන්ගෙන් මිදී. භාවාභවාය නසමෙත නැවත නැවත ඉපදීමට නොපැමිණේ. අපරාමසං පරාමර්ශනය නොකර, ස්පර්ශ කිරීමට නොපැමිණ යන අර්ථයයි.

එකොළොස්වන කලහ විවාද සූත්‍ර නිද්දේස වර්ණනාව නිමියේ ය.

12.

දොළොස්වන චූල ව්‍යූහ සූත්‍ර නිද්දේසයේ **සකං සකං දිට්ඨි පරිබ්බසානා** යන මෙයද, ඒ මහා සමාගමයේදීම සියලු මේ දෘෂ්ටිගතිකයෝ "අපි එහි දක්ෂයෝ වෙමු"යි ගනිති. "කිම මේ යහපත් ස්වභාව ඇත්තේ විෂමව තමන්ගේ දෘෂ්ටියේම පිහිටත් ද? නැතහොත් වෙනත් දෘෂ්ටියක් ගනිත්ද? "යනුවෙන් උපන් සැක සහිත සිත් ඇති ඇතැම් දෙවිවරුන්ට එහි අර්ථ ප්‍රකාශකිරීමට පෙර පැවසූ පරිදි නිර්මිත බුදුවරු ලවා තමන් වහන්සේගෙන් ප්‍රශ්න කරවා ඊට පිළිතුරු දුන් සේක. මේ සූත්‍රයේ මුලින්ම එන ගාථා දෙකම ප්‍රශ්න කරන ගාථාවන් ය.

ඒ දෙකින් **සකං සකං දිට්ඨි පරිබ්බසානා** තම තම දෘෂ්ටියේ වෙසෙමින් **විග්ගය්හ නානා කුසලා වදන්ති** ඒ දෘෂ්ටිය බලවත්ව ගෙන, "එහි දක්ෂයෝ වෙමු"යි ප්‍රතිඥා කරමින් වෙන වෙනම කියති. එකක් නොම දක්වති. යමක් මෙසේ දනී නම් ඔහු ධර්මය අවබෝධ කරගත්තේය. මෙය ගරහන්නා වූ යමෙක් වේ නම් හෙතෙම ළාමක වන්නේය. ඒ දෘෂ්ටිය නිසා යමෙක් මෙසේ දනියි නම් ඔහු දහම දනියි. මෙය ප්‍රතික්ෂේප කරන්නා, ගරහන්නා හීනයෙකි, ළාමකයෙකි කියති. බාලො යනු හීන වූ. **අකුසලා** විද්වත් නොවූ. **නානාවදන්ති** නානා හේතු කියති. **විවිධං වදන්ති** නානාවිධ කරුණු දක්වති. **අඤ්ඤා කුකුං වදන්ති** එකක් නොකියා අනික් අනික් කරුණක් ගෙන කියති. **අකෙවලී සෝ** ඒ අදක්ෂයා. **අසමත්තෙතා** පරිපූර්ණ නොවී. **අපූණ්ණා** සම්පූර්ණ නොවූ.

ඉන් අනතරුරුව දැක්වෙන ගාථා තුන ඒ ප්‍රශ්නවලට පිළිතුරු දීම සඳහා දේශිතය. එහි මුල් දෙපදයෙන් කියන ලද කරුණ පදනම් කරගෙන, අවසන් දෙපදයෙන් එකරුණ තර්කානුකූලව බැහැර කර සිටියි. එසේ කරන විසුරුවා දැමීමෙන් මතු කියවෙන සූත්‍රයට වඩා අල්ප වූ බැවින් මේ සූත්‍රය චූලවියූහ නම් වේ. එහි පළමු ගාථාවෙහි පළමු පදය **පරසස වෙ ධම්මං** ඉදින් අනුන්ගේ දෘෂ්ටි **සබ්බපි මෙ බාලා** "මෙසේ ඇති කල්හි මේ සියලු වාදීහු මෝඩයෝ වෙති" යන අදහසයි. කුමක් නිසාද? සියලු මහණ බමුණෝ තම තම දෘෂ්ටි පිළිගෙන වසන බැවිනි.

සන්දිට්ඨියා වෙව න විවදාතා සංසුද්ධ පඤ්ඤා කුසලා මූනීමා යනු ස්වකීය දෘෂ්ටියෙන් ම පිරිසිදු නොවූවාහු , පවිත්‍ර නොවූවාහු, කිළිටි වූවාහුම සංශුද්ධ ප්‍රඥා ඇත්තාහූ දක්ෂ වූවාහු බුද්ධිමත් වූවාහු වෙත් නම්, නැතහොත් **සන්දිට්ඨියා වෙවදානා** යන පාඨයද යෙදේ. එහි අර්ථය- ඉදින් ස්වකීය දෘෂ්ටියෙන් පිරිසිදු ව, සංශුද්ධ ප්‍රඥාවෙන් යුතුව, දක්ෂව, බුද්ධිමත්ව සිටිත් නම්, **න තෙසං කොචි** මෙසේ ඇතිකල්හි ඒ මහණ බමුණන්ගෙන් කිසිවකු විසින් නිහීන ප්‍රඥා ඇති. මෝඩයෝ නොවෙති. කුමක් නිසාද? ඒ දෘෂ්ටියෙහි ඔවුන් සමාදන්ව සිටින බැවිනි. "අන්‍යයන් යම් සේද තමන්ද එසේමය." යන්න ගාථාවේ සංක්ෂිප්තාර්ථයයි.

"නචාහමෙතං" යන ගාථාවේ සංක්ෂිප්තාර්ථය :

යම්හෙයකින් කළහ කරුවෝ දෙදෙනෙක් ඔවුනොවුන්ට "බාලයෝ" යැයි කියත් ද එහෙයින් මම මේ දෘෂ්ටිය ගත යුත්තෙකි" යි නොකියමි. කුමක් නිසා ද? මේ දෘෂ්ටිවාදී සියල්ලෝම "මෙයම සත්‍යය. සෙස්ස බොරුය" යි ගෙන තම තම දෘෂ්ටියම සත්‍යයයි පවසති. එකරුණෙන් ම අනෙකා මෝඩයෙකැයි ගරහති. මෙපමණකින් පිළිතුරු ගාථා තුන නිම වේ.

ඉන් පසු ගාථා දෙක ප්‍රශ්න කිරීමක් හා එහි විසඳයි. **තච්ඡං** තුච්ච නොවූ, හිස් නොවූ. **තථං** විපරීත නොවූ. **භූතං** විද්‍යාමාන වූ **යථාවතං** සංවිද්‍යමාන වූ **අවිපරීතං** අවිසංකේත වූ. සැක රහිත වූ. **යමාහු** ප්‍රශ්න කරන ගාථා වේ. යම් දෘෂ්ටි සත්‍යයක් එය එසේමයැයි ඇතමෙක් කීහ.

එකංහි සච්චං යන විසඳන ගාථාවේ සත්‍ය එකක්මය. නිරෝධ සත්‍ය හෝ මාර්ග සත්‍යයයි. **මසම්ං පජා නො විවදෙ පජානං** යම් සත්‍යක්

දක්නා වූ පුද්ගලයා විවාද නොකරන්නේ නම් **සයං ථුනනති** තමාම කියති. කවර හෙයින්ද? යි ඇසූ ප්‍රශ්න ගාථාවට අනුව පිළිතුර තබන ලදී.

පවාදියාසෙ කියන්නෝ තෙ තක්කමනුසසරනති ඒ වාදීහු නැතිනම් තමාගේ තර්ක මාත්‍රය අනුව යති. **තක්ක පරියාහතං** විතර්කයෙන් හාත්පසින්ම ගෙනෙන ලදී. **විමංසානුචරිතං** තමාගෙන් හැඟීමෙන් විමසන ලද **සයං පටිභානං**, තමාගේ ප්‍රතිභානය.

න හෙව යන විසඳුම ඉදිරිපත් කරන ගාථාවේ **අඤඤත සඤඤය නිච්චානි** සංඥා මාත්‍රයෙන් ලෝකය නිත්‍ය යැයි ගන්නා ලද ග්‍රහණයන්, **තක්කඤව දිට්ඨීසු පකපපයිත්වා** දෘෂ්ටි විෂයෙහි තමාගේ මිථ්‍යා සංකල්ප උපදවා, යම් හෙයකින් දෘෂ්ටිය මනා වූ තර්ක ඇත්තක් කරන්නේ දෘෂ්ටියද ජනනය කරන්නේ ද එහෙයින් කියන ලද දෘෂ්ටිගතයන් ජනනය කරති, උපදවති ආදියයි. **ජනෙනති** මතු මතුයෙහි දෘෂ්ටි උපදවමින් ජනනය කරති. **සඤජානෙනති** ආදියේ උපසර්ග යොදා පදය වැඩිකර කියන ලදී. **මයහං සචචං** යනු මගේ වචන සත්‍ය වේ.

දැන් මෙසේ නානාවිධ සත්‍යයන් නො පවත්නා කල්හි තර්ක මාත්‍රය සිහිකරන්නා වූ දෘෂ්ටිගතාකයන්ගේ වැරදි පිළිවෙත දැක් වීමට දිටෙඨ සුතෙ යන ගාථාව වදාලහ. එහි **දිටෙඨ**, දෘෂ්ටිය, රූපාලම්බනය, දෘෂ්ටි ශුද්ධිය යන අදහසයි. මේ ක්‍රමය **සුතෙ** ආදියෙහිද දතයුතුයි. **එතෙව නිසසය විමාන දසසි** මේ දෘෂ්ටි ධර්මයන් ආශ්‍රය කර, ඉතා පිරිසිදු දෘෂ්ටි ස්වභාව යැයි සම්මාන නොකරනුයේ. **විනිචඡයො යත්ථා පහසසමානො බාලො පරො අකුසලොති චාහ.** මෙසේ දොම්නස් උපදවනුයේ නමුත් ඒ දෘෂ්ටි විනිශ්චයෙහිම පිහිටා තුටු සිතැති ප්‍රීතිමත් අයෙකු වී "අනෙකා හීනයකි. මෝඩයෙකි" යයි මෙසේ කියන්නේමය. **නසමමා නෙතීපි විමානදස්සී** යනු සම්මාන නොකෙරේ. බුහුමන් නො උපදවයි. මෙසේ ද සම්මාන නොකෙරෙන, බුහුමන් නොකර සිටී. **දොමනසසං ජනෙති** යැයි පළමුව දෘෂ්ටි නිශ්‍රයන් අල්ලාගෙන දොම්නසට පැමිණ, පස්වන දෘෂ්ටි විනිශ්චයෙහි සිටි කාලයේ සොම්නස් උපදවයි යන අර්ථයයි. **විනිචඡය දිට්ඨියා යත්ථා** දෘෂ්ටි විනිශ්චයෙහි සනිටුහන් කරගත් දෘෂ්ටියේ පිහිටා.

යෙනෙව යනාදී ගාථාවෙහි **සයමත්තනා** යනු තමන්ම තමාට **විමානෙති** ගරහයි. **තදෙව පාවා** හැම වචනයම, ඒ දෘෂ්ටියට හෝ ඒ පුද්ගලයාම.

අනිසාර දිට්ඨියා යන ගාථාවේ අර්ථය මෙසේය. මෙසේ කියන ලද ලක්ෂණයන්ගෙන් යුතු දෘෂ්ටියෙන්, ඉක්මවාගිය, ඉදිමීගිය, සමර්ථ වූ, පිරිපුන් වූ පිපී ගිය හෙතෙම; ඒ දෘෂ්ටි මානයෙන්ම සමර්ථ වූයේ පිරිපුන් වූයේ "මම දක්ෂයෙක්මි" "මම පිරිපුන් වූවෙක්මි" යි තමන්ම තම සිතින් "මම පණ්ඩිතයෙක්මි" යි අභිෂේක කරගනියි. කුමක් නිසාද? ඔහු විසින් ඒ දෘෂ්ටිය ඒ ආකාරයෙන්ම ගෙන එහි පර්පූර්ණ වූ හෙයිනි.

සබ්බා තා දිට්ඨියා ලක්ඛණාතික්කනතා ඒ සියලු දෙසැට මිසදිටු ලක්ෂණ ඉක්මවා යන ලදී. **අතියනති** ඉක්මවා යති. **අනොමා** අනූනව.

පරසස වෙ යනා දී ගාථාවේ සම්බන්ධයද අර්ථයද බොහෝ සෙයින් කියනුයේ කුමකට ද? ඔහු තම විනිශ්චයේ සිට බලනුයේ අන්‍යයන් බාලයන්, අකුසලයන් (අදක්ෂයන්) ලෙස දකී. අන්‍යයන්ගේ දුක්ම අනුව ඔහු නින්දා වචනයන්ට ලක්ව නිහීනයෙක් වේ. **තුමො සහ හොති නහීන පඤ්ඤා** ඔහුත් අන්‍යයා සමගම නිහීන ප්‍රඥා ඇත්තෙක් වේ. ඔහු ද අනිකා බාලයෙක් යැයි කියයි. ඉක්බිති ඔහුගේ වචනය අපමණ වේ. ඔහු තමන්ම වේදයේ අන්තයට ගිය පුද්ගලයෙක් වේ. මෙසේ ඇති කල්හි **න කොචි බාලො සමණෙසු අත්ථි** ඒ ශ්‍රමණ බ්‍රාහ්මණ සියල්ලෝම පඬිවරුයේ දැකීමට ඔවුහු කැමති වෙති. **වාචාය කථා කිරීමෙන් වචනෙන භාෂණයෙන්. නින්දිත කාරණා** අවමාන හේතුවෙන්. **උපවාදිත කාරණා** උපවාද හේතුවෙන්.

අඤ්ඤං ඉතො යන ගාථාවේ අර්ථය ද මේ හා සම්බන්ධය. නැතහොත් තමාම වේදාන්තයට පත්, ධීර වූ නුවණැති වූයේ, එහෙයින්ම ශ්‍රමණයන් අතර කිසිදු මෝඩයෙක් නැතැයි මෙසේ කියූවත් කිසිවකු එය නොපිළිගනියි. කුමක් නිසාද? ඒ සඳහා කියනු ලැබේ. **අඤ්ඤං ඉතො යාභිවාදනති ධම්මං අපරාදධා සුදධිං කෙවලීනො එවං තිත්‍ථියා පුථුසො වදනති** යම් කෙනෙක් මෙයින් අන්‍ය වූ දහමක් කියත් නම් අපරිපූර්ණ වූ ඔවුහු ශුද්ධි මාර්ගය වරදවා දක්වන්නාහුය. මෙසේ බොහෝ තීර්ථකයෝ

යම්හෙයකින් කියත් ද කුමක් හෙයින් මෙසේ කියත් ද? **සන්දිට්ඨිරාගෙන හි තේහිරත්තා** යම් හෙයකින් ස්වකීය දෘෂ්ටිරාගයෙන් ඇලී සිටියාහුද එහෙයිනි. **තෙ සුදධිමගගං** ඒ අන්‍ය තීර්ථකයෝ නොකිලිටි මාර්ගය **විසුදධිමගං** නිර්දෝෂ (නිදොස් මාවත) මාර්ගය. **පරිසුදධගගං** ශුක්ල (සුදු) මාර්ගය **වේදාතමගගං** සුදුවන් මාවත. **පරියෝදාතමගගං** ප්‍රභාවත් මාවත. **විරදධා** ඉහත කියූ මාර්ගයෙන් වෙන්ව වරදවා සිටි. **අපරදධා** වරදවා, වැලකී සිටී. බාලිත පිරිහුණු. **ගලිතා** එතැනින් ගිලිහුණු. **ඤඤායා** නොදැනීමෙන් **අපරදධා** පරාජයට පැමිණියාහුය. නැතහොත් **ඤායාපරදධා** යන පදයද යෙදේ. දන්නා වූ මාර්ගයෙන් වැලකී ගිය යන අර්ථයයි. මෙසේ දූඩියේ ඇලුණු.

ඉධෙව සුදධිං යන ගාථාවෙහි **සකායනෙ** යනු ස්වකීය මාර්ගයේ දළහං වදානා දූඩි වාද ඇති. **ථිරවාද** අධිෂ්ඨාන (ස්ථිර) වාද ඇති. බලිකවාදා බලවත් වාද ඇති. **අවත්ථිතවාදා** පිහිටා කියන ලද වාද ඇති. යමෙක් මෙසේ දූඩි වූ වාද ඇත්තෝ වේද ඔවුන් අතුරින් යම්කිසි තීර්ථකයෙක් "තම දෘෂ්ටිවාදයේ දූඩිව පිහිටා කියන්නා වූ තම වාදයෙන් අන්‍ය වූ කවරෙක් නම් බාලයෙකියි දක්වන්නේ ද? යන මෙකරුණ සංක්ෂේප වශයෙන් ශාශ්වත හා උච්ඡේද වාද සඳහා කියන ලදී. විස්තර වශයෙන් නාස්තිකවාද, ඉස්සර නිම්මාණවාද, නියතිවාද ආදී භේද ඇති ස්වකීය මාර්ගයේ "මෙය ම සත්‍යයයැ"යි දූඩිව කියමින් සිටියි. මෙබදු කාහටනම් එබදුම අන්‍ය දෘෂ්ටි ගති නැතියකුට "මෝඩයෙකි" යි කරුණු සහිතව (සහේතුකව) කිවහැකි වන්නේ ද? සියල්ලෝම තම තමන්ගේ මතය, පිළිගැනීම අනුව පණ්ඩිතයෝ ම නොවෙත් ද? මෙසේ ඇති කල්හි **සයමෙව සො මෙධගං ආවහෙය්‍ය පරං වදං බාලමසුදධි ධම්මං"** හෙතෙම **අනිකා බාලයෙක්, අශුද්ධි ධම්මං** ඇත්තෙක් ලෙස කියා නම් ඔහුම තමා පළමුව කලහයට කැඳවන්නේය. කුමක් නිසා ද? සියල්ලෝම තම පිළිගැනිම අනුව පණ්ඩිතයෝ ද මනාව පිළිපන්නෝ ද වන හෙයිනි. මෙසේ සර්වප්‍රකාරයෙන් ම **"විනිච්ඡයෙ යත්‍ථා සයංපමාය උදධං සො ලෝකසමිං"** දෘෂ්ටියේ සිට තමන්ම ශාස්තෘ ආදීන් ප්‍රමාණ කරගෙන බෝ සෙයින් ලෝකයෙහි විවාදයට පැමිණෙයි.

මෙසේ සියලුම ආකාරයෙන් දෘෂ්ටිවාද පිළිගැනීමෙහි ආදීනව දුටු නුවණැත්තා ආර්යමාර්ගයෙන් සියලු දෘෂ්ටි විනිශ්චයන් බැහැර කර.

ලෝකයේ කලහ කරන්නේ යැයි අර්හත්වය මාතෘකා කරගෙන සූත්‍ර දේශනාව නිමා කළ සේක. **සයං පමාය** තමා විසින් මැන, **පමිනිත්වා** ප්‍රමාණ කර, **සමිනිත්වා** යන පාඨයද යෙදේ. එය එතරම් සුන්දර නොවේ. **උදධං වාදෙන සදධිං** තමාගේ මතුයෙහිලා කථා කරන්නෙකු සමඟ. මේ චූලවියූහ සූත්‍ර දේශනාව අවසානයේ දී ද පුරාභේද සූත්‍රයේ කියූ ප්‍රමාණ ඇති ප්‍රාණීන්ට ධර්මාභිසමය විය.

දෙළොස්වන චූල වියූහ සූත්‍ර නිද්දේස වර්ණනාව නිමියේ ය.

13.

දහතුන්වන මහා වියූහ සූත්‍ර නිද්දේසයේ යෙ කෙචිමෙ දිටඨි පරිබ්බසනා යන මෙහි "කිම මේ දෘෂ්ඨිවාදයෙහි දැඩිව ගෙන සිටීමෙන් නුවණැත්තන් සමීපයේ දී නින්දා ලබත් ද? නැතහොත් ප්‍රසංශා ලබත්දැයි"යි උපන් සිත් ඇති ඇතැම් දෙවිවරුන්ට ඒ ප්‍රශ්නයට පිළිතුරු දීම සඳහා මුළින් කියූ පරිදි නිර්මිත බුදුරුව ලවා තමන්වහන්සේගෙන් විචාරවා ඊට පිළිතුරු දෙන ලදී. එහි **අනෙවනති** නැවත නැවත ගෙනෙති. පුන පුනා එළවති. **නිසෑමෙව අනෙවනති** ගැරහීමටම පත්වෙති.

දැන් "මෙයම සත්‍යය" යි කියන දෘෂ්ටිගතිකයෝ ඇතැම් විටෙක නුවණැත්තන්ගේ පැසසුම්ද ලබති. මෙම වාද සඳහා ලැබෙන යම් මේ ප්‍රශංසා සංඛ්‍යාත වාද ඵලය ඉතා අල්පය. රාගාදී ක්ලේශ ධර්ම සන්සිඳවීමට එම දෘෂ්ටිවාද සමත් නොවේ. දෙවන ඵලය වූ නින්දාවන් ලැබීමෙහි කරුණු කියනු කුමට ද? එනිසා මෙම අර්ථය දක්වමින් පළමුකොට ප්‍රශ්නයට පිළිතුරු ගාථාව ලෙස. **අපපං හි එතං නාලං සමාය දුවෙ විවාදසස ඵලානි බ්‍රූමි** ආදිය වදාළහ. එහි **දුවෙ විවාදසස ඵලානි** නින්දා

ප්‍රශංසාවත් ජය පරාජය ආදියත් වාදය හා සම්බන්ධය. **ඒතමපි දිසවා** නින්දා ප්‍රශංසා දෙකම නිෂ්ඵල සේ දැක. **නාලං සමායා** මෙකී විවාදයෙන් ඇතිවන ඵලයන්හි ආදීනව දැක. **ඛෙමාභිපඝසං අවිවාදභූමිං** අවිවාද භූමිය වූ නිවන ක්ෂේම භූමියකින් දකිමින්. **අපපකං** මදය. අල්පය. **පරිත්තකං** ටිකකි. **ඔමකං** පහත්ය. **ලාමකං** පවිටු සහගතය. **සමාය** රාගාධි ක්ලේශ ධර්ම සන්සිඳවීමට. **උපසමාය** මතුමතුයෙහි සන්සිඳවීමට වූපසමාන සන්සිඳවීම පිණිස **නිබ්බාපනාය** අමෘත මහා නිවන අවබෝධ කර ගැනීම පිණිස. **පටිනිසඝගාය** ආර්ය මාර්ගයෙන් කෙළෙසුන්ගේ ඉවත් කිරීම පිණිස. **පටිපඝසදධියා** ඵලයන් හරින ලද කෙලෙස් බර නූපදවීම පිණිස සමත් නොවේ. මෙසේ විවාද නො කරමින්.

යා කාචිමා යන ගාථාවේ **සම්මුතියෝ** දෘෂ්ටීහු **පුථුජ්ජා** පුහුදුන් අය කෙරෙහි පහළ වූ **සෝ උපයං කිමෙය්‍ය** ඔහු එළඹිය යුතු අර්ථයෙන් උපය නම් වූ රූපාදී ධර්මයන්ගෙන් කවරකට පැමිණෙන්නේ ද? කවර කරුණකින් පැමිණෙන්නේ ද? **දිටෙ සුතෙ ඛනති මකුබබමානො** ඇසූ දුටු වීද (දිට්ඨ, සුත, මුත) විඤ්ඤාණයන්හි ප්‍රේම (ආශා) නොකරනුයේ. **පුථුජ්ජනෙහි ජනිතා වා** පුථුජ්ජනයන් අතර ඉපදුණු හෝ **න සම්මුතියෝ** ඒ දෘෂ්ටීහු. පුථුජ්ජා පුථුජ්ජනයන් අතර ජනිත වූ හෝ අනේකප්‍රකාරය දෘෂ්ටිගතිකයන් විසින් උපදවන ලද හෝ **නෙති**, න එයි, නොපැමිණේ. **න උපගඣති** නවතියි. **නිහිනිවිසති** පිවිස නො පිහිටයි.

ශීලයම උතුමැයි සිතන්නෝ මෙයින් බාහිරය යන **සීලුත්තමා** ගාථාවේ අර්ථය සීලයම උතුම් යැයි සිතන්නෝ සීලුත්තමා වේ. ඇතැම් මහණ බමුණෝ සීලය ප්‍රධාන කරගෙන සංයම මාත්‍රයෙන් ශුද්ධිය කියති. හස්තිව්‍රතා දී ව්‍රත සමාදන්ව එළඹසිටියා වූ මේ දෘෂ්ටියෙහි ම හික්මීමෙන් සත්වයාගේ ශුද්ධිය වේයැයි පවසති. නමුත් ඔවුහු භවයට පැමිණ, භාවයේ බැසගෙන සිටිමින් මෙසේ කියත. එනමුත් ඔවුන් කුශලවාද ඇත්තාහු "අපි දක්ඛයෝය"යනාදී (කියුම්) විද ඇත්තෝ වෙති. මෙසේ සීලය උතුම් කරගෙන ඒවායේ ක්‍රියාකිරීමයට පිළිපන් ඔවුන් අතරින් ඒ සීලව්‍රත අනුගමනය කරන යම්කිසිවෙක් වේනම්

ඔවුහු **සවෙදුතො** යන ගාථාවේ අර්ථය ඉදින් යමෙක් ඒ ශීලව්‍රතාදීයෙන් අනුන් විසින් වෙන් කිරීමෙන් හෝ නොහැකි වීමෙන් හෝ ගිලිහුණේ වේද ඔහු ඒ සීලව්‍රතය හෝ පුණ්‍යාභි සංස්කාරාදී කරම

හෝ වරදවාගෙන කම්පා වේ. හුදෙක් කම්පා වීම පමණක් නොා ඒ ශීලවෘත ශුද්ධිය පිළිබඳ ගුණ කියයි. වැලපෙයි. එයම ප්‍රාර්ථනා කරයි. කවරෙකු මෙන් ද? **සත්‍යාව හීනෝ පවසං සරමහා** දුරු රට වෙසෙන්නෙක් අනුන් විසින් වෙන් කිරීමෙන් හෝ අනුන් විසින් ගෙනයනු ලබන්නේ හෝ සමූහයෙන් පිරිහුණේ තම ගෙදර හෝ සමූහය හෝ පතන්නාක් මෙනි. "අනභිසමභූනතෙතා වා" යනු ඒ ප්‍රතිපත්තිය සම්පූර්ණ නොකරන්නේ හෝ යනුයි. **ඤායපරදෙධා** නිවනින් හෝ මාර්ගයෙන් පිරිහුණේ **ඤායපරඬෝ** නිවනින් හෝ මාර්ගයෙන් පිරිහුනේ **තං වා සත්‍ථං අනුබන්ධති** ඒ සමූහයා හෝ සියලු තැන පසුපසින් යයි. සීලය උතුම් යැයි ගත්තවූවන්ගේ කම්පාවීමේ හේතුව මෙසේ දක්වන ලදී.

ආර්ය ශ්‍රාවකයා වනාහි **සීලබබතං වාපි පාහාය සබබං** යන ගාථාවෙන් දැක්වේ. එහි **සාවජ්ජානවජ්ජං** සියලු අකුශල හා ලෞකික කුශලයන්. **එතං සුදධිං අසුදධිනති අපත්ථයානෝ** පංචකාම ගුණ ආදී භේද ඇති මේ ශුද්ධිය ද අකුශලාදී භේද ඇති අශුද්ධියෙන් ද ප්‍රාර්ථනා නොකරනුයේ. **විරංතා චරෙ** ශුද්ධියෙන් ද අශුද්ධියෙන් ද වෙන්ව හැසිරෙන්නේය. **සන්ති මනුගහාය** දෘෂ්ටියක් නොගෙන. **සුකකං සුකක විපාකං** ලෞකික කුසං කර්ම, අකුසල විපාක ගෙන දෙන **නියාම වත්තනං** මාර්ගයට පිවිසෙන. **සෙකඛා** සත් වැදෑරුම් සේඛයෝ. අගග ධම්මං උතුම් ධර්මය, අර්හත් ඵලය. මෙසේ මේ බුදුසසුනින් බැහැර සීල ව්‍රතාදීය ප්‍රධාන කරගත් සංයම වූ විශුද්ධිවාදයන් බැහැරලා, සීලවෘත දුරු කිරීමෙන් ලබන අර්හත්වය ද ප්‍රතිපත්තිය ද දක්වා, දැන් අන්‍යවු ද බාහිර ශුද්ධිවාදීන් දක්වනු සඳහා

තමුපනිසසාය යන ගාථාව වදාරණ ලදී. එහි අර්ථය මෙසේය. ඇතැම් ශ්‍රමණ බ්‍රාහ්මණ පිරිසක් ආර්යයන් විසින් ජුගුස්සිත වූ අමරතපස් හෝ දිට්ඨ ශුදිධි ආදියෙහි හෝ එක්තරා අක්‍රිය දෘෂ්ටියක් ඇසුරු කර හෝ සංස්කාරයන්ගේ ශුද්ධිය වේ යැයි පවසන (අකිරිය දුෂ්ටියෙන් හෝ) උද්ධංසරවාද ඇතිව පිළිබඳව ශෝකාලාප කියති. පෙන්වති. දක්වති. **තපො ජිගුචඡවාදා** ගත පීඩාවට පත්කරන තපසින් පව් ගෙවේයැයි පැවසීම. **පාපා ජිගුචඡමානා** ඒ තපසින්ම ලැජ්ජාවෙන් අත් නොහරින. **උදධංසරවාදා** සංසාරයෙන් ශුද්ධිය වේ යයි කියමින්, මෙසේ ඒ පහනොවූ තණ්හාව ඇති ශුද්ධිය ශෝකාන්විතව ප්‍රකාශ කරන්නා වූ යමෙක් වේ නම්, ඔහු තමා ශුද්ධියට පත්වූවකු සේ සිතන්නේ නමුදු ඒ තණ්හාව ක්ෂය

නොකළ හෙයින් නැවත නැවත භවෝත්පත්තියේ ඒ ඒ වස්තූන් ප්‍රාර්ථනා කරමින්, ජල්පානය කිරීම පුනපුනාවේ යන අදහසයි. තණ්හාව වනාහි සේවනය කරන ලදුයේ තණ්හාව වැඩෙන්නේම.

හුදෙක් මෙසේ ප්‍රාර්ථනා කරන්නාට තෘෂ්ණා ජල්පන පමණක් නොව **පවෙධිතං වාපි පකප්පිතෙසු** තණ්හා දෘෂ්ඨීන්, ප්‍රකල්පිත වස්තූන් කෙරෙහි අතිශයින් සැලීම ද වේ යැයි දැක්විණි. පුන පුනා භවයෙහි ඉපදීමට ඇති තණ්හාව දුරුකළ හෙයින් අනාගතයෙහි චුති උපත්ති දෙක මේ ලෝකයේ යමෙකුට නැතිනම්, ඔහුට කුමකින් සැලෙන්නේ ද? කුමකින් ජල්පනය කරන්නේ ද? මෙය මේ ගාථාවන්ගේ සම්බන්ධයයි.

ආගමනං නැවත පැමිණිම. **ගමනං** මෙයින් අන් තැනකට යෑම. **ගමනා ගමනං** මෙතැනින් ගොස් නැවත නැවතීම. **කාලං** මරණය **ගතී** ගමන් කිරීම් වශයෙන් ගතිය, ගතියෙන් යායුතු **යාමාහු ධම්මං** යනු ප්‍රශ්න කරන ගාථාවයි.

දැන් "මේ එකම වාදයකවත් සත්‍යයක් නැත්ද හුදෙක් දෘෂ්ටි මාත්‍රයෙන්ම මෙසේ කියත් ද එමනිසා ඒ අර්ථය දක්වමින් **සකං හි** යන මේ විසඳන ගාථාව කියන ලදී. එහි **සම්මුතිං** දෘෂ්ටිය. **අනොමං** අනූනව මෙසේ මේ ශ්‍රමණ බ්‍රාහ්මණයන් අතරෙහි ස්වකීය ධර්මය පිරිපුන් යැයි පවසන, අන්‍යයන්ගේ ධර්මය හීන යැයි පවසන්නන් අතර යම් කිසිවෙක්.

පරස්ස වෙ වම්හයිතෙන හීනො යන ගාථාවේ එන පරිදි. ඉදින් අනුන් විසින් අවමන් කළ කරුණෙන් හීනවූයෙක් වන්නේ නම්, ධර්මයන් අතර කිසිවෙක් විශිෂ්ට වූවෙක් නොවන්නේය. කුමක් නිසා ද? බොහෝ මහණ බමුණන් අන්‍යයන්ගේ දහම නිහීන යැයි ද ස්වකීය දහම දැඩිව ගෙන කියත්ද එහෙයිනි. තම දෘෂ්ටියේ දැඩිව එල්බ මෙසේ සෙසු දහම් හීන කිරීම, විධිවංසනය කිරීම, හේතුවෙනි. **ගරහිතකාරණ** ළාමක කර කරුණෙන් **උපවදිත කාරණා** අක්‍රෝශ පරිභව කළ කරුණෙන්. **සකායනං** තමා පිළිගත් මාර්ගය.

බොහෝ සෙයින් කියනුයේ කුමටද ?**ඡමෙමසු පූජා** යන ගාථාවේ අර්,ය මෙසේය. ඒ අන්‍ය තීර්ථකයෝ ලබ්දි මාර්ගයන්ට යම් සේ පසසත් ද තම සද්ධර්මයට පූජා පැවැත්වීමත් එසේම පවතී. ඔවුහු වනාහි ශාස්තෘ

ආදීන්ට දැඩිව සත්කාර කරති. ඉදින් ඔවුහු ඒ පිළිබඳ ප්‍රාමාණිකයෝ වෙත් නම් එවිට සියලුම වාදයෝ සත්‍යම වෙති. කුමක් නිසාද? **සුද්ධිහි තෙසං පචචත්ත මෙව** ඒ මහණ බමුණන්ගේ ශුද්ධිය අන්‍යයන් කෙරෙහි නොවේ. පරමාර්ථ වශයෙන්ද නොවේ. තමන් තමන් ම කෙරෙහි දෘෂ්ටි දැඩිව පිළිගත් මාත්‍රයෙන්ම, එය ඔවුන්ගේ අනුන් අයත් ඤාණ බුද්ධියක් වේ. **පචචත්තමෙවා** වෙන වෙන ම වේ.

යමෙක් වනාහි පරමාර්ථ වශයෙන් බහා තැබූ පාප ධර්ම ඇති බ්‍රාහ්මණයෙක් වෙත් නම් ඔහුගේ; **න බ්‍රාහමණස්ස ජරනෙයාමඤ්ඤී** යන ගාථාවේ අර්ථය. ඒ බාහිත පාපි වූ බ්‍රහ්මණයාට "සියලු සංස්කාර ධර්ම අනිත්‍ය වේ."යනාදී ක්‍රමයෙන් මනාව දුටු බැවින් අනුන් විසින් පැමිණවිය යුතු ඤාණයක් නම් නැත. දෙසැට මිසදුටු දහම්හි "මෙයම සත්‍ය" යැයි නිශ්චය කර, දැඩිව ගන්නා ලද්දක් ද නැත. එකරුණෙන් ඔහු දෘෂ්ටි කළහාදිය ඉක්ම වූයේය. අන් තැනක අන්‍ය වූ සතිපට්ඨානි දී ශ්‍රේෂ්ඨ දහමක් නො දක්නේමය. **න පරනෙයෝ** අනුන් විසින් පැමිණවිය යුතු, දැන්විය යුතු නොවේ. අනුන්ගේ බසින් ඇදහිය යුතු නොවේ. පර ප්‍රත්‍ය වූයේ නොවෙයි. අනුන් විසින් පැමිණවිය යුතු අයෙක් ද නොවේ. **න පරපටිබඬගූ** අනුන් සමඟ බැඳුණු ගමන් ඇත්තේ නොවේ.

ජානාමි යන ගාථාවේ අර්ථයද මේ හා සම්බන්ධය. මෙසේ පළමුව ක්ෂීණාශ්‍රව බ්‍රාහ්මණයා පරමාර්ථ වශයෙන් අන්‍ය ශ්‍රේෂ්ඨ ධර්මයක් නොදකියි. අනය තීර්ථකයෝ වනාහි අනුන්ගේ සිත් දන්නා නුවණින් දනිමින්, දකිමින් " දනිමි, බලමි," මෙය මෙසේ "යැයි මෙසේ කියූවත්; දෘෂ්ටියෙන් ශුද්ධිය අදහති. කුමක් නිසාද? ඔවුන් අතුරින් එක් අයකු ද දුටුයේ නමුත් තමාගේ ඒ දර්ශනයෙන්, අනුන්ගේ සිත් දන්නා ඤාණ ආදියෙන් තත් වූ පරිදි යථාර්ථය දැක. **කිං හි තුමසස තෙන** ඔහුගේ ඒ දැකීමෙන් කුමක් කරන ලද ද? තම දුක්ඛ පරිඥාවක් ඇද්ද? නැතහොත් සමුදය ප්‍රහාණාදියෙන් එක්තරා එකක් වේද? නැත ඉදින් මෙසේ ආර්ය මාර්ගය සර්වප්‍රකාරයෙන් ම ඉක්මවා (බැහැර වී ගිය) ඒ අන්‍ය තීර්ථකයෝ අනවබෝධයෙන් ම ශුද්ධිය පෙන්වති. නැතහොත් බුද්ධාදීහු ඒ තීර්ථකයන් ඉක්මවා දැනගෙනම ශුද්ධිය දේශනා කරති.

පසසං නරෝ යන ගාථාවේ අර්ථයද මීට සම්බන්ධය. බොහෝ සෙයින් කියනුයේ කුමට ද? යම් අයෙක් පරචිත්ත විජානණාදියෙන්

බලනුයේ, හෙතෙම නාමරූප ධර්ම නිත්‍යාදී වශයෙන් දකියි. ඉන් අනතුරුව දැක ඒ නාම රූපයෙන් ම නිත්‍යාදී වශයෙන් හෝ සුඛ වශයෙන් දකියි. අන් අයුරකින් නොදකියි. ඔහු මෙසේ දක්නේ කැමති අයුරකින් බොහෝ කොට හෝ මද වශයෙන් හෝ කාම රූප නිත්‍ය වශයෙන් හෝ සුඛ වශයෙන් දකින්නේය. ඉක්බිති ඔහුගේ මෙබඳු දර්ශනයෙන් දක්ෂයෝ සංසාර ශුද්ධිය නොම කියති.

නි විසඝවාදී ගාථාවේ සම්බන්ධය හා අර්ථය මෙසේය. යමෙක් ඒ දර්ශනයෙන් ද ශුද්ධියක් නොමැති වූවත් "දනිමි, දකිමි, එය එසේමය"යි. මෙසේ පිහිටා කියන්නේවේද; මේ දර්ශනය නිසා හෝ දෘෂ්ටියෙන් ශුද්ධිය දක්වමින් "මෙයම සත්‍යය" යැයි මෙසේ පිහිටා කියයි ද; ඔහු සුවසේ හික්මිය හැකි නොවෙයි. ඔහු ඒ ඒ ආකාරයෙන් පිළියෙළ කරගත්. අභිසංස්කරණය කරගත් දෘෂ්ටිය පෙරටු කරගත්තේ; ඔහු යමු ශාස්තෘ කෙනෙක් ඇසුරු කරන්නේ වේද මම එහිම ශුභවාද ඇති, ශුද්ධිවාද ඇති ඉතා පිරිසිදු වාද ඇති, පිරිසිදු දර්ශන ඇති, අයෙක් වෙමි"යි තමා පිළිබඳ සිතයා. එහි ඔහු එසේ දුටුවේය. එහි සක්කාය දෘෂ්ටියෙන් විපරිත නොවූයේ ම ඔහු දුටුවේය. යම් සේ ඒ දෘෂ්ටිය පවතියි ද එසේම එය දුටුවේය. අන් අයුරකින් දැකීමට කැමති නොවේ යන අදහසයි.

නි විසඝවාදී පිහිටා කියමින් **දුබ්බිනයො** ඉක්මවීම ඉතා දුෂ්කරය. **දුප්පඤ්ඤපියො** දැන්වීමට, හැඟවීමට, සිතින් එල්ඛ ගැනීමට දුෂ්කරය. **දුනනිජඣාපියො** සිතින් විමසා ගැනීමට, නැවත නැවත විමසීමට දුෂ්කරය. **දුපෙපකඛියෝ** දැක්වීමට දුෂ්කරය. **දුප්පසාදියො** සිතෙහි පැහැදීම ඉපදවීමට දුෂ්කරය. **අපඝසී** ඤාණයෙන් ප්‍රතිවේදයට පැමිණියේය. **පටිවිජඣි** සිතින් අවබෝධ කරගැනීමට පැමිණියේ ය.

මෙසේ ප්‍රකල්පනය කරගත් දෘෂ්ටි පෙරටුකොටගත් අන්‍ය තීර්ථකයන් අතුරෙන් **න බ්‍රාහමණො කප්පමුපෙති සංඛං** යන ගාථාවෙන් "ක්ෂීණාශ්‍රවයෝ තණ්හා දෘෂ්ටි කල්පනයට නො පැමිණෙයි "යැයි කියන ලදී. එහි **සංඛං** යනු නුවනින් දන යන අර්ථයයි. **නපි ඤාණ බන්ධ** සමාපත්ති ඤාණාදියෙන් නොකළ තණ්හාව දෘෂ්ටි බන්ධන ඇති, විග්‍රහ යම්සේය. ඔහුගේ ඤාණයෙන් කළ බන්ධනයක් නැත්තේනුයි **නපි ඤාණ** නම් වේ. සම්මුතායො දෘෂ්ටි සම්මතයෙන්. **පුථුජ්ජා** පෘථජ්ජනයන්ගෙන් උපන්. **උගගණ්හනති මඤ්ඤඳා** අන්‍යයෝ දැඩිව ගනිති. "අන්‍ය තීර්ථකයෝ

ඒ දෙසැට මිසදිටු සම්මතයන් දැඩිව ගනිති" යි කියන ලදී **උපෙක්ඛති** උප්පත්තියෙන් අපක්ෂපාතීව දකියි. වැඩි විස්තර කුමටද?

විසඤ්ඤ ගන්ථානි යන ගාථාවේ අනුගගහො දැඩිව ගැනීමෙන් දුරු වූයේ. ඔහුට දැඩිව ගැනීම නැත්තේනුයි අනුග්ගහ නම් වේ. නැතහොත් නූගැන්විය යුතු වූයේනුයි අනුග්ගහ නම් වේ. **ගන්‍ථො වොඝඝජිඤ්ඤා වා** අභිධ්‍යාදී ග්‍රන්ථයන් අතැර. නැතහොත් **විඝඝජ** යනු නැවත නොගැනීම් වශයෙන් අත් හැර. **ගථිතෙ** ගැටුණු **ගණ්ඨිතෙ** නූලකින් බැන්දාක් මෙන් ගැට ගැසූ **බාඬ්ධෙ** මනාව බඳින ලදී. **විබඬ්ධෙ** විවිධාකාරයෙන් බඳිනා ලද. **පළිබඬ්ධෙ** හාත්පසින්ම බන්ධනයෙන් බැඳී. **බන්ධනෙ** කෙලෙස් බන්ධනයෙන් ඵෙටයිත්වා පොළා පියා **සඡ්ඡං විඝඝජ්ඡං කරොනති** සුණුවිසුණු කර, නැවත පරිභෝග නොකළ හැක්කක් කරත් ද **විකොපෙනති** සුණු කරති. වැඩි විස්තර කුමට කියම්ද?

මෙබදු ස්වරූප ඇති ක්ෂිණාශ්‍රවයා **පුබ්බාඝවෙ** යන ගාථාවෙන් වර්ණනාවේ. එහි **පුබ්බාඝවෙ** යනු අතීත රූප දිය - අරබයා උපදින කෙලෙස් ධර්ම. **න ජඤ්ඤා** ජන්දාදී වශයෙන් අගතියට නොයයි. අගතියට නොයයි. **අනත්ත ගරාහී** කළ, නොකළ දෑ වශයෙන් තමාට නො ගරහන්නේ ම අනත්තගරහී නම් වේ.

ස සබ්බ ධමෙමසු යන ගාථාව ද මීට සම්බන්ධය. එහි **සබ්බධමෙමසු** දෙසැට මිසදිටු ධර්ම අතුරින් කිසියම් රූප, ශබ්දාදී අරමුණක් වේද ආදී මෙබදු ප්‍රභේදයන්හි **පඤ්ඤාරොහා** බහා තැබූ බර ඇති. **න කපපති** දෙවැදෑරුම් වූ කල්පනයන් නොකරයි. යන අර්ථයයි. **නුපරතො** කල්‍යාණ පුථුජ්ජන හා සේඛයන් මෙන් උපරති (ආශා වැලැක්වීම) යෙන් යුක්ත වූයේද නොවේ. **න පඨීයො**, තණ්හාව නැති. තණ්හාව වණාහි පතයි, ප්‍රාර්ථනා කරයිනූයි. "පඨීය" නම් වේ. මොහුට පරමාර්ථයක්, ප්‍රාර්ථනාවක් නැත්තේ නූයි. "නපඨීයො" නම් වේ. මින් අනතුරුව එන පදයන්ගේ අර්ථ ඉහත කියා ඇති හෙයින් අර්ථ වහා ප්‍රකට කරවන්නේමය. මෙසේ අර්හත්වය මාතෘකා කරගෙන දේශනාව නිමා කළ සේක. දේශනාවසානයේ දී පුරාභේද සූත්‍රයේ දැක්වූ ප්‍රමාණ ඇති ප්‍රාණීන්ට ධර්මාවබෝධ විය.

දහතුන්වන මහා වියූහ සූත්‍ර නිර්දේශ වර්ණනාව නිමියේ ය.

14.

දාහතර වන තුවටක සූත්‍ර නිද්දේශයේ **පුච්ඡාමිතං** යන මේ ප්‍රශ්නයද ඉහතින් පැවසූ මහා සමාගමයේ දී අර්හත්වය ලැබීමේ පිළිවෙත (මාර්ගය) කවරේද?"යි උපන් සිත් ඇති ඇතැම් දෙවිවරුන්ට එම ප්‍රශ්නයට පිළිතුරු දීම සඳහා පෙර පැවසූ පරිදිම නිර්මිත බුදුවරු ලවා තමන් වහන්සේගෙන් ප්‍රශ්න කරවමින් මේ සූත්‍ර දේශිතය. එහි මුල්ම ප්‍රශ්න කරන ගාථාවේ පළමුව **පුච්ඡාමි** යනු ප්‍රශ්න කරමි. එහි අදිට්ඨජොතනා ආදී වශයෙන් ප්‍රශ්න කරන ආකාර තුනක් බෙදා දක්වන ලදී. ආදිවච බන්ධූ සූර්යයාට ගෝත්‍රයෙන් ඥාති වූ **විවෙකං සන්ති පදඤ්ච** විවේකයද ශාන්ති පදය ද, කථං දිසවා කුමන කරුණකින් දැක, කෙසේ පවතින දර්ශනයකින් සිදුවන්නේද? යි අසන ලදී. **නිසෙසා පුච්ඡා** සංඛ්‍යාව දැක්වීමයි. **අදිට්ඨ ජොතනා** යමක් පියවි ඇසින් නොදකින ලද්දේද එය ප්‍රකට කරුණු සඳහා අසන ප්‍රශ්නයයි. **දිට්ඨ සංසන්දනා** යමක් ඤාණ චක්ෂුවෙන් (නුවණැසින්) දක්නා ලද්දේ ද එකරුණ සැසඳීම සඳහා කරන ප්‍රශ්න කිරීමයි. **විමති චෙජ්දනා** යම් සැකයක් වේද ඒ සැක දුරුකර ගැනීම සඳහා ප්‍රශ්න කිරීමයි.**පකතියා ලක්ඛණං** අඤ්ඤාතං ධර්මයන්ගේ තථ ලක්ෂණය ස්වභාවයෙන්ම නොදන්නා වූ.

අදිට්ඨං නොදුටු. **න දිට්ඨං** පාඨයද යෙදේ. **අතුලිතං** තරාදියෙන් තුලනය කළාක් මෙන් තුලින නොවූ.(සමාන නොවූ.) **අතිරිතං** තීරණයෙන්, තිරණය නොකළ. **අවිභූතං** ප්‍රකට නොවූ අවිභාවිතං ප්‍රඥාවෙන් නොවැඩුණු. **තස්ස ඤාණාය** ඒ ධර්මයේ ලක්ෂණ දැනගැනීම සඳහා. **දස්සනාය** දැකීම සඳහා. **තුලතාය** තුලනය කිරීම සඳහා. **තීරණය** තීරණය කිරීම සඳහා. **විභාවනාය විභාග කිරීම සඳහා.** අඤ්ඤෙහි පණ්ඩිතෙහි අනෙක් බුද්ධාදී පඬිවරුන් සමඟ. **සංසය පක්ඛනෙතා** සැකයට පත් වූයේ. **මනුස්ස පුච්ඡා** මනුෂ්‍යයන්ගේ ප්‍රශ්න කිරීම. **අමනුස්ස පුච්ඡා** නාග සුපර්ණාදීන්ගේ ප්‍රශ්න කිරීම. **ගහට්ඨා** සෙසු ගිහියෝ. **පබ්බ ජිතා** ලිංග වශයෙන් කියන ලදී. **නාගා සුඵස්ස** ආදී නාගයෝ. **සුපණ්ණා** සුපර්ණයන්ගෙන් සමන්විත වශයෙන්. **යක්ඛා** යක්ෂයන්ගෙන් යුක්ත වශයෙන් දතයුතුයි. **අසුරා** පහාරාදී අසුරයෝ. **ගන්ධබ්බා** පංචසිඛ වැනි ගන්ධබ්බ පුත්‍රයෝ. **මහාරාජානෝ** සිවුවරම් රජ දරුවෝ. **අහීනින්ද්‍රියං** පිහිටීම් වශයෙන් විකල නොවූ ඉන්ද්‍රිය ඇති. **සොනිම්මිතෝ** භාග්‍යවතුන් වහන්සේ විසින් නිර්මිත ඒ බුදුරුව.

වොදානක පුච්ඡා විශේෂ ධර්ම පිළිබඳ ප්‍රශ්න කිරීම. **අතීත පුච්ඡා** ඉක්මගිය ධර්ම අරබයා ප්‍රශ්න කිරීම. **අනාගතා** දියෙහිද මේ ක්‍රමයෙන් අර්ථ දත යුතුයි. **කුසල පුච්ඡා** නිවැරදි ධර්ම පිළිබඳ ප්‍රශ්න කිරීම **අකුසල පුච්ඡා**. වැරදි දහම් පිළිබඳව කරන ප්‍රශ්න කිරීම. **අව්‍යාකත පුච්ඡා** ඒ දෙකින්ම යුතු විපරීත ධර්ම පිළිබඳ ප්‍රශ්න කිරීම. **අජ්ඣෙසාමි තං** නුඹට ආරාධනය කරමි. **කථස්සු මෙ** මාහට කියන්න. **ගොත්‍ත කදාතකො** ගෝත්‍රයෙන් ඥාති වූ. ගොත්‍තබන්ධු ගෝත්‍රයේ උපන්. **එකෙනාකාරෙන** එක් කොට්ඨාශයකින්. **සන්ති පදං** ශාන්ති සංඛ්‍යාත නිර්වාණ පදය. **යෙ ධම්මා සන්නාධිගමාය** යම් සතිපට්ඨානාදී ධර්මයක් නිවන ලැබීම පිණිස පවතියිද.**සන්ති එසනාය** කදාණ ස්පර්ශයෙන් නිවන ස්පර්ශ කිරීම සඳහා. **සච්ඡිකිරියාය** ප්‍රත්‍යක්ෂ කරනු පිණිස. **මහන්තං සීලක්ඛන්ධං** මහත් වූ ශීල රාශිය. **සමාධික්ඛන්ධා** දියෙහිද මේ ක්‍රමයමයි. සීලස්කන්ධාදිය ලෞකික ලෝකෝත්තර වශයෙන් වේ. විමුක්ති කදාණ දර්ශනය ලෞකිකමය. **තමෝ කායස්ස පදාලනං** අවිද්‍යා රාශිය විධ්වංසනය කිරීමෙහි.

විපල්ලාසස්ස භේදනං සිවු වැදෑරුම් විපල්ලාසයන්ගේ බිඳීම. **තණ්හාසල්ලස්ස** අබ්බුළහං තණ්හා නම් හුල ලිහා දැමීම, ඉදිරීම. **අභිසංඛාරස්ස වූපසමං** පුණ්‍යාදී අභිසංස්කාරයන් නිවා දැමීම පිණිස. **භාරස්ස නික්ඛෙපනං** පංචස්කන්ධ භාරය බහා තැබීම. **සංසාරවට්ටස්ස උපච්ඡෙදනං** සංසාර පැවැත්ම සිඳ දැමීම. **සන්තාපස්ස නිබ්බාපනං** කෙලෙස් සන්තාපයේ නිවා දැමීම.

පරිලාහස්ස පටිප්පස්සද්ධි කෙලෙස් දැවීමෙහි සන්සිඳීමට පත්වීම, දෙවදෙවොා දෙවියන්ට දෙවි වූ.

ඉක්බිති භාග්‍යවතුන් වහන්සේ යම් හෙයකින් යම් සේ දකිමින් කෙලෙස් උදුරා දමයිද එසේ දැක, එසේ පැවති දර්ශන ඇත්තෙක්ව පිරිනිවන්පායිද සේක. එහෙයින් ඒ අර්ථය ප්‍රකට කරවමින්, නානාප්‍රකාරව ඒ දෙව් පිරිස කෙලෙස් ප්‍රහාණයේ යොදවමින් "**මූලං පපඤ්ච සංඛාය**"යැයි ආරම්භ කර, ගාථා පහක් දේශනා කළහ. එහි මුල්ම ගාථාවේ සංක්ෂිප්තාර්ථය **පපඤ්ච සංඛ්‍යා** පපංච සංඛ්‍යාත, තෘෂ්ණා ප්‍රපංචයෝම "පපංච සංඛ්‍යා" නම් වේ. එයට අවිද්‍යාදි කෙලෙස් මුල් වේ. ප්‍රපංච නම් තෘෂ්ණා දෘෂ්ටීන්ගේ මූලය මම වෙමි'යි පැවති මානය ද සියලු මානය ද නුවණින්, ප්‍රඥාවෙන් සිඳදමන ලදී. කිසියම් අධ්‍යාත්මික තණ්හාවක් උපදින්නේ නම්, ඒවා දුරු

කිරීමට ප්‍රහාණයට සැමදා සිහි ඇතිව හික්මෙන්නේය. එළඹී සිහි ඇතිව හික්මෙන්නේය. **අජඣත්ත සමුට්ඨානා වා** සිතේ උපන් හෝ. **පුරෙ භත්තං** දවල් බතට පෙර කාලය. අත්‍යන්ත සංයෝගයේ දුතියා විභක්ති වචනයකි. එහි අර්ථ වශයෙන් උදේ වරුවේ යනුවෙන් සත්තමී අර්ථයම වේ. **පච්ඡාභත්ත** ආදියෙහි ද මේ ක්‍රමයමයි. **පච්ඡාභත්තං** දවල් බතට පසු කාලයයි.**පුරිමයාමං** රාත්‍රියේ ප්‍රථම යාමය, **මජ්ඣිම යාමං** රාත්‍රියේ දෙවන කොටස **පච්ඡිම යාමං** යනු රාත්‍රියේ තුන්වන කොටසයි. **කාලෙ** අවපක්ෂයේ **පුණ්ණ** පුර පක්ෂයේ **වස්සෙ** වැසි වසිනා සාර මාසයේ **හෙමන්තෙ** හේමන්ත සාර මාසයේ **ගිම්හෙ** ගිම්හාන සාර මාසයේ **පුරිමෙ** වයොඛන්ධ පළමු වයස් කාණ්ඩයේ, පළමු වයසේ යන අර්ථයයි. වර්ෂ සීයක් ජීවත්වන පුරුෂයාගේ අවුරුදු තිස්තුනක් හා මාස හතරක් බැගින් වයස් කාණ්ඩ තුනකි. ඒ අතුරින් පළමු අවුරුදු තිස්තුනයි මාස හතරක කාලය පඨම වයසයි. මෙසේ පළමු ගාථාවෙන් ත්‍රිවිධ ශික්ෂාවෙන් යුතු දේශනා අර්හත්වය දක්වා ගෙනගොස්; නැවත මාන ප්‍රහාණ වශයෙන් දේශනා කිරීමට

යං කිඤ්චි යන ගාථාව වදාළහ. එහි **යංකිඤ්චි ධම්මමභිජඤ්ඤා අජ්ඣත්තං** යම්කිසි උසස් කුලීනත්ව ආදී වශයෙන් තමාගේ ගුණ දන්නේනම්. **අථවාපි බහිද්ධා** නැතහොත් බාහිර ආචාර්ය උපාධ්‍යාය වරුන්ගේ ගුණ දන්නේනම් **න තෙන ථාමං කුබ්බෙථ** ඒ ගුණයෙන් මාන නූපදවන්නේය. **මහන්තානං** මහත්වූ ගුණවතුන්ගේ. **සන්තානං** නිවුණු සන්තාන ඇත්තන්ගේ. **න වුත්තා** නොකියන ලදී.**තප්පවුත්තා** නොවිසඳන ලදී.

දැන් ඔහුගේ නොකරන විධි දක්වමින් "**සෙය්‍යො න තෙන**" යන ගාථාව වදාලහ. එහි අර්ථ-ඒ මානයෙන්ම "මම උතුම් වෙමි" යි හෝ "මම නීච වෙමි" කියා හෝ "මම සමාන වෙමි" කියා හෝ නොසිතන්නේය. ඒ උසස් කුලවත් බව ආදී ගුණයන්ගෙන් විමසන ලද්දේ නොයෙක් ආකාරයෙන් "මම උසස් කුලයකින් පැවිදි වීමි"යි ආදී ක්‍රමයෙන් තමා හුවා දක්වමින් නොසිටින්නේය. මෙසේ මානය ප්‍රහාන කිරීම් වශයෙන් දේශනා කර, දැන් සියලු කෙලෙස් සන්සිඳවීම් වශයෙන් දේශනා කිරීමට

අජඣත්තමෙව යන ගාථාව වදාළහ. එහි **අජඣත්තමෙව උපසමෙ** තමන් කෙරෙහිම. රාගාදි සියලු කෙලෙස් සන්සිඳ වන්නේය. **න අඤ්ඤතො භික්ඛු සන්තිමෙසෙය්‍ය** සතිපට්ඨානාදී ධර්ම හැර අනික් ක්‍රමයකින් ශාන්තිය

නොසොයන්නේය. **කුතෝ නිරත්තං වා** නො ඇලීමක් කොයින්ද? **න එසෙය්‍ය සීල** වෘත ආදියෙන් නො සෙවුනේය. **න ගවෙසෙය්‍ය** නොබලන්නේය. **න පරියෙසෙය්‍ය** පුන පුනා නො කැමති වන්නේය.

දැන් අධ්‍යාත්මිකව උපශාන්ත වූ ක්ෂීණාස්‍රවයාගේ තාදි බව දක්වමින් **මජෙඣ යථා** යන ගාථාව වදාළහ. එහි අර්ථ - යම් සේ මහා සමුද්‍රයේ මතු භාගයටද යට භාගයටද මැද වූ යොදුන් හාර දහසක් පමණ වූ මධ්‍ය භාගයෙහි මධ්‍ය පර්වත අතර පිහිටි හෝ මධ්‍ය සමුද්‍රයේ රළ පහර හට නොගන්නේද නොකම්පා වී සිටි අයුරින්ම ජලස්කන්ධය සිටින්නේද එලෙසින්ම තෘෂ්ණා රහිත වූ ක්ෂීණාස්‍රවයන් වහන්සේ ලාභාදියේ කම්පා නොවෙමින් සිටියාහු වෙති. එ බඳු වූ ඒ භික්ෂුව කිසිවෙක්හි රාගාදී උස්සදයක් නොකරන්නේ ය. **උබ්බෙධෙන** යටිභාගයෙන් **ගම්භීරෝ** දිය පිට සිට අසූ හාරදාහක් යොදුන් ගැඹුරුය. **උබ්බෙධෝ** යන පාඨය ද යෙදේ. එය එතරම් යහපත් නොවේ. **හෙට්ඨා** දිය යට **උපරී** දිය මතුපිට **මජෙඣ** දිය මැද **න කම්පති** සිටී තැනින් නො සෙලවේ. **න විකම්පති** ඔබිනොබ නො සැලේ. **න චලති** නිශ්චල වේ.

න වෙධති නොසැලේ. **න උප්පවෙධති** නොපෙරළේ. **න සම්පවෙධති** පරිභ්‍රමණය නොවේ. **අනෙරිතෝ අකම්පිත** වූයේ. **අසට්ඨිතෝ** නො කැළඹුණේ.**අචලිතෝ** කම්පා නොවූයේ. **අනාලුලීතෝ** නො කැරකුණේ වේ. **තත්‍ර ඌමි නො ජායති** ඒ ස්ථානයේහි රළ නූපදියි.**සතතනනං පබ්බතානං අනන්තරිතාසු** යුගන්ධරාදී සත්කුළුපව් අතරතුර.

සීදනන්තරා යටත් පිරිසෙන් පුලුන් පොදක් පවා මතුපිට වැටුනොත් ගිලී යානුයි "සීදා" නම් වේ. පර්වත අතර හටගත් බැවින් සීදන්තර නම් වේ. **සීදනන්තර** යන පාඨයද යෙදේ. දැන් මෙසේ අර්හත්වය කෙළවර කොට දෙසූ ධර්ම දේශනාව අනුව විශේෂයෙන් සතුටුවෙමින්, ඒ ක්ෂණාස්‍රවයාගේ අර්හත්වයේ මුල් පිළිවෙත් විමසන නිර්මිත බුදුරජාණෝ

අකිත්තයී යන ගාථාව වදාළහ. එහි **අකිත්තයී** යනු කීවේය. **විවටචක්ඛු** විවෘත වූ අනාවරණය වූ පස් ඇස් වලින් යුක්ත වූ. **සක්ඛිධම්මං** තමාට අයත් වූ තමා විසින් මනාව දැනගත් ආත්ම ප්‍රත්‍යක්ෂ ධර්මය. **පරිසය්‍ය** විනයං උවදුරු දුරු කරන පටිපදං වදෙහි දැන් ප්‍රතිපත්තිය කියන්න. **භද්‍දනෙත** භද්‍ර වූවක් නුඹ වහන්සේට ඇත්තේනුයි භාග්‍යවතුන් වහන්සේට

අමතමින් මෙසේ කියයි. නැතහොත් භද්‍ර වූ සුන්දර වූ නුඹවහන්සේගේ ප්‍රතිපදාව වදාරාන්න යැයි කියන ලදී.**පාතිමොක්ඛං අථවා පි සමාධිං** ඒ ප්‍රතිපත්තියම බිඳ විචාරයි. **පටිපදං** යන මෙයින් මාර්ගය විචාරයි. ඉතිරි පදයන්ගෙන් සීලය ද සමාධිය ද විචාරයි.

මංස චක්ඛුනාපි සසම්භාරික වූ මසැසින් ද **දිබ්බචක්ඛු නාපි** දෙවියන්ට සමාන වූ බැවින් දිව්‍යමය, දෙවියන්ට වනාහි යහපත් ක්‍රියාවලින් උපන් පිත් සෙම් ලේ ආදියෙන් පළිබෝධයට, පීඩාවට නොපත්, උපක්ලේශයන්ගෙන් මිදුණු බැවින් ඉතා දුර වූද අරමුණ පිළිගැනීමට සමත් වූ ද දිව්‍යමය ප්‍රසාද චක්ෂුව වේ. වීර්ය භාවනා බලයෙන් උපන් මේ ඤාණ චක්ෂුවද (නුවණැස) එබඳුමය. දිවැසට සමාන බැවින් "දිබ්බ"නම් වේ. දිව්‍ය විහාර වශයෙන් ලබන ලද බැවින් ද තමාද දිව්‍යමය විහරණයන් ඇසුරු කළ බැවින්ද "දිබ්බ" නම් වේ. ආලෝකය පරිග්‍රහණය කර ගැනීමෙන් මහත් වූ දිළිසීමක් ඇති බැවින් "දිබ්බ"නම් වේ. බිත්තියෙන් පිටත රූප පවා දැකීමට සමත් වූ මහා ගතික වූ බැවින් ද "දිබ්බ"නම් වේ. ඒ සියලු අර්ථ ශබ්ද ශාස්ත්‍රානුසාරයෙන් දත යතුයි. දර්ෂණය වේ.යන අර්ථයෙන් චක්ඛු නම් වේ. බැලීම් කෘත්‍ය කරන හෙයින් චක්ෂුවක් වූයේ නුයි චක්ඛු නම් වේ. දිබ්බ වූ ඒ චක්ඛුව-දිබ්බචක්ඛු වේ. ඒ දිවැසින්ද "විවට චක්ඛු" වූහ .මේ පස් වැදෑරුම් ඇස් පිළිබඳව සවිස්තරව කරුණු දැකීවීමට **කථං භගවා මංස චක්ඛු නාපි විවට චක්ඛු** (බුදුහු මසැසිනිදු විවට චක්ඛු වූහ.) යනාදිය කීය. **මංස චක්ඛුමහි භගවතො පංචවණ්ණානි සංවිජ්ජන්ති** යන මෙහි බුදුරන්ගේ සසම්භාරික වූ මසැසෙහි කොටස් පහක් වෙන වෙනම දක්නට ලැබේ.

නීලො ච වණ්ණො දියබෙරලිය මල් නිල්පාට ඇත. **පීතකො ච වණ්ණො** කිණිහිරි මල් මෙන් කහපාට ඇත. **ලෝහිත කො ච වණ්ණො** ඉදිගොවුවන් මෙන් රතු පාට ඇත. **කණ්හා ච වණ්ණො** අඳුන් මෙන් කළු පාට ඇත. **ඔදාතොච වණ්ණො** ඕසධී තාරකාව මෙන් සුදු පාට ඇත. **යථා අක්ඛිලෝමානි පතිට්ඨිතානි** යම් තැනක ඇස් රෝම පිහිටා නැගීසිටියේද ඒ රෝම නිල්පාටින්ද ඉතා තදනිල් පාටින්ද යුතුය. මෙහි **නීලං** සියල්ල සංග්‍රහ කිරීම් වශයෙන් කියන ලදී. **සුනීලං** අතරක් නැතැකි අතිශයින්ම පිරසිදු නිල් වූ. **පාසාදිකං** ප්‍රසාද එළවන. **දස්සනෙය්‍යං** දර්ශනීය. **උමාපුප්ඵ සමානං** දියබෙරලිය මල් සමාන වූ **තස්ස පරතො** එය ඇතුලත පිට පැත්තේ **පීතකං** සියල්ල කහ පාටය. **සුපීතං** අතර නැවතී මනාව කහ

පාටය. **උභයතො ච අකඬි කුටානී** දෙ ඇස් කෙළෙවර. **ලොහිතකානි** සියල්ල සංග්‍රහ කිරීම් වශයෙන් කියන ලදී. **සුලොහිතකානි** විවරක් නොපෙනෙන සේ සියල්ල රතු පාටය. **මඡ්ඣ කණ්හං** ඇසේ මධ්‍යස්ථානය අඳුන් මෙන් කලු පාටය. **සුකණ්හං** අතරක් නැතිව මනාව කළු පාටය. **භද්දකං** භද්‍රය, සශ්‍රීකය. **සිනිද්ධං** ප්‍රණීතය. **භද්දාරිට්ඨක සමානං** සිවිය ඉවත් කළ රුක් පෙනෙල ඇට සමාන. **අඳ්දාරිට්ඨක සමානං** යන පදය ද යෙදේ. තිත්ත කලු පාටින් යුතු යන අරුතයි.

ඔදාතං සියල්ලම සුදුපාටින් යුතුය යන අරුතයි. **සුඔදාතං** අතරක් නැතිව රිදී මණ්ඩලයක් සමානව මැනවින් සුදුවූ වූ. **සෙත පණ්ඩරං** මේ වචන දෙකෙන්ම ඉතා සුදු බව දක්වයි. **පාකතිකෙන මංසචක්ඛුනා** ස්වභාවික වූ මසැසින්. **අත්තභාව පරියාපන්නෙන** ආත්ම භාවයෙන් යුක්ත **පුරිම සුචරිත තම්මාහිනිබ්බත්තෙතන** පෙර කාලයේ ඒ ඒ තැන, ආත්මභාවයෙහි ඉපිද කරන ලද කාය සුචරිතාදී කර්මයන්ගෙන් උපන්. **සමන්නා යෝජනං පස්සති** හාත්පසින් සතර ගව්වක්, යොදුනක් පමණ වූ බිත්ති පිටත ඇති රූප ආවරණ විරහිතව ප්‍රකෘති (පියවි) මසැසින් දකියි. **දිවා චෙව රත්තිංච** දවල් කාලයේද රාත්‍රී භාගයේ ද **චතුරංග සමන්නාගතො** සතර අංගයන්ගෙන් යුක්ත වූ. පිරිපුන් අඳුර, ආලෝකය කිසිවක්ම නැති අඳුර **සුරියො ච අත්ථමිතො** ශූරභාවය උපදවමින් උදා වූ සූර්යයා ද පහවූ කල්හි, **කාලපක්ඛා ච උපොසථෝ** අවපක්ෂයේ චාතුද්දසී උපොසථ දිනයද **තිබ්බා වනසණ්ඩා ච** ගහණ වූ වෘක්ෂ සමූහය. රුක්වණ ගහන. **මහාච කාළමෙඝො අබභූටඨිතො** මහත් වූ කලු වලා ගැබක් උදා වූයේ වේ.

කුඩ්ඩාව ගඩොල් බිත්ති හෝ **කවාටං වා** දොර කවුළු ආදියක් හෝ **පාකාරොවා** මැටි ආදී පවුරක් හෝ **පබ්බතො වා** පාංශු පර්වතාදී පර්වතයක් හෝ **ගච්ඡංවා** තරුණ ගසක් හෝ **ලතාවා** කරවික්ඛාදී වැලක් හෝ **ආවරණං රූපානං දස්සනාය** රූපාරම්මණ දැකීම සඳහා ආවරණයක්, වැළැක්වීමෙන් නොවේ. **එකතිලඵලං නිම්මත්තං කත්වා** ඉදින් එක් තල ඇටයක් ලකුණු කර **තිලවාහෙ පක්ඛිපෙය්‍ය** කරත්තයේ තල ගොඩ මතුයෙහි දමන්නේය. ඇතැමෙක් "වාහො" නම් එකට එක්කර බැඳි කරත්ත දෙකකියි කියති. **තඤ්ඤදව තිලඵලං උද්ධරෙය්‍යො** ඒ ලකුණු කළ තල ඇටයම ගෙන දක්වන්නේය.

දිබ්බන චක්ඛුනා මෙහි අරුත කියන ලදී. විසුදෙධන චුතූපපාත ඥානයෙන් දැකීමෙන්, දිට්ඨි විශුද්ධි හේතුවෙන් පිරිසිදු වූ. යමෙක් චුතවීම් මාත්‍රයම දකියිද , නැවත උපදීම නොදකින ඔහු උච්ඡේද දෘෂ්ඨිය ගනියි. යමෙක් ඉපදීම පමණක් දකියිද චුතවීම නොදකින්නේද ඔහු නව සත්ත්වයකු පහළ වූයේ යැයි ශාශ්වත දෘෂ්ටිය ගනියි. මේ චුති උප්පත්ති දෙකම යමෙක් දකීනම්, ඔහු එම දෘෂ්ටීන් දෙකම ඉක්මවා සිටියි. එහෙයින් ඔහුගේ දර්ශනය දෘෂ්ටි විශුද්ධි හේතුවෙන් වේ. මේ චුති උප්පත්ති දෙකම බුදුපුත් වූ ආර්ය ශ්‍රාවකයෝ දකිති. එනිසා කියන ලදී. "දෘෂ්ටි විශුද්ධිය ඇති වන හෙයින් චුතූපපාත ඥාන දර්ශනයෙන් පිරිසිදු වූ" මනුෂ්‍ය භාවය ඉමක් වූ රූප දැකීමෙන් "අතික්කනත මානුසකං"වේ. නැතහොත් මානුෂික මසැසද ඉක්මවා සිටි බැවින් "අතික්කනත මානුසකං" යයි දතයුතුයි.

තෙන දිබ්බන චක්ඛුනා අතික්කනත මානුසකෙන සත්තෙ න පස්සති. මිනිස්සු මසැසින් මෙන් සත්ත්වයන් දකියි. **චවමානෙ උපපජ්ජමානෙ** මෙහි චුතික්ෂණයේ හෝ උත්පත්තික්ෂණයේ දිවැසින් දැකීමට හැකි නොවේ. යමෙක් වනාහි ආසන්න වූ චුතිය ඇත්තේ දැන් චුතවන්නෝ ද ඔවුහු "චවමාන"නම් වෙති. යමෙක් ගන්නා ලද ප්‍රතිසන්ධි ඇත්තාහූ ද මේ මොහොතේ උපන්නා හුද ඔවුහු "උප්පජ්ජමානි"නම් වෙති. "චුතූපපාත ඤාණය ලැබුවෝ මේ චවමාන, උප්පජ්ජමාන සත්ත්වයන් දකිති" යැයි දක්වයි.

හීනෙ මෝහාන්ධකාරයෙන් යුතු බැවින් හීන නම් වූවන්, ඊට ප්‍රතිවිරුද්ධ වූවන් **පණීතෙ සුවණ්ණ** යනු අදොස විපාකයෙන් යුක්තව ඉෂ්ට, කාන්ත, මනාප වර්ණයන්ගෙන් යුතු. ඊට විරුද්ධ වූවන් **දුබ්බණ්ණ.ඉතා** දැඩි විරූප බවින් යුතු.**සුගතෙ** සුගතියට ගියවුන්. නැතහොත් අලෝභ සිතේ විපාක වශයෙන් ආඪ්‍ය වූ මහත් ධන ඇති **දුගතෙ** දුගතියට ගියවුන් නැතහොත් ලෝභයේ විපාක වශයෙන් දිළිදු වූ, අල්ප වූ ආහාර පාන ඇති. **යථා කම්මූපගෙ** යම් යම් කර්මයක් රුස් කරන ලද ද, ප්‍රතිසන්ධිය ගෙන දීමට බලවත් වේද ඒ සමර්ථ වේද කර්මයන්ගෙන් එළඹියාවුන්.

එහි මුලින් යෙදූ **චවමානෙ** ආදියෙන් දිබ්බචක්ඛු කෘත්‍ය කියන ලදී. මේ පදයෙන් වනාහි යථා කම්මූපග ඤාණ කෘත්‍ය දක්වන ලදී. ඒ ඤාණයේ මේ උප්පත්ති ක්‍රමයයි . මේ සසුනේ භික්ෂුව යට නිරයට අභිමුඛව ආලෝක

සංඥාව වඩා නිරයේ මහා දුක් අනුභව කරනසත්ත්වයන් දකියි.එසේ දැකීම දිබ්බචක්ඛු කෘත්‍යයක්ම ය. ඒ භික්ෂුව මෙසේ සිහි කරයි."මේ සත්ත්වයෝ කවර නම් ක්‍රියාවක් සිදුකර මෙවැනි දුක් අනුභව කරත් ද?" ඉක්බිති උන්වහන්සේට "මෙනම් ක්‍රියාවක් කර" යැයි ඒ කර්මය අරමුණු කරගත් ඤාණය උපදියි. මෙය යථා කම්මූපග ඤාණය නම් වේ. මෙයට වෙනම වූ පරිකර්මයක් නම් නැත. අනාගතංස ඤාණය පිළිබඳව ද මෙසේමය. දිබ්බචක්ඛු ඤාණය ම පාදක කරගත් මේ ඤාණයන් දිබ්බචක්ඛුවත් සමඟම සමෘද්ධ වේ. **ඉමෙ වත භොනෙතා** යනාදියෙහි **ඉමෙ** යන දිවැසින් දුටුවන් දැක්වෙන වචනයයි. **වත** යනු අනුශෝචනාර්ථයේ නිපාතයකි. **භොනෙතා** පින්වතුනි! දුෂ්ඨ චරිතය දූෂිත චරිතය හෝ කෙලෙසුන්ගෙන් කුණු වූ චරිතය **දුච්චරිතං**, කය කරණකොටගෙන කළ හෝ කයින් උපන් දූශ්චරිතය **කායදුච්චරිතං** සෙසු පදයන්හි මේ ක්‍රමයමයි. **සමනනාගත** යුක්ත වූ **අරියානං උපවාදකා** බුදු, පසේ බුදු, බුද්ධ ශ්‍රාවකාදී ආර්යයන්ගේ, යටත් පිරිසෙන් ගිහි වූ සෝවාන් වූවන්ගේ ද අනර්ථකාමීව අන්තිම වස්තුවෙන් හෝ ගුණ විනාශ කිරීමෙන් හෝ දොස් නගන්නෝ, ආක්‍රෝශ කරන්නෝ, ගරහන්නෝ යන අර්ථයයි."මේ ඤාණ මොවුන්ට නැත" ශ්‍රමණ ධර්ම නැති මොවුහු අශ්‍රමණයෝය" මෙසේ කියමින් අන්තිම වස්තුවෙන් උපවාද කරයි. "මොවුන්ට ධ්‍යානයක් හෝ විමෝක්ෂයක් හෝ මාර්ගයක් (මෝක්ෂ)හෝ ඵලයක් හෝ නැතැයි" ආදී වශයෙන් කියන්නේ ගුණ විනාශ කිරීමෙන් දොස් කියයි යැයි දතයුතුයි. දැන දැන හෝ නොදැන යන දෙපරිද්දන්ම කරන උපවාදයන් "අරියුපවාදය"නම් වේ. ඒ පාප කර්මය ආර්ය මාර්ගාවබෝධය ද ස්වර්ගගාමිත්වය ද වලකන ආනන්තරීය කර්මයක් හා සමාන බලවත් එකකි. පිළියම් කළ හැක්කේ වෙයි.එහෙයින් යමෙක් ආර්යයන් වහන්සේට උපවාද කළේනම් උන්වහන්සේ වෙත ගොස් ඉදින් තමන් ඔහුට වඩා වැඩිමහල් නම් උක්කුටිකයෙන් හිඳ "මම ආයුෂ්මතුන් වහන්සේට මෙසේ ද මෙසේ ද දෝෂාරෝපණ කළෙමි. මට ඒ සඳහා ක්ෂමාවන්න"යි ක්ෂමා කරගත යුතුයි. ඉදින් යෑමට ද යැවීමටද නොහැකි වන්නේනම්,ඒ විහාරයේ යම් භික්ෂුහු වෙත්ද ඔවුන් සමීපයට ගොස් උක්කුටිකයෙන් හිඳ "මම අසවල් ආයුෂ්මතුන්ට මෙසේද මෙසේද කීවෙමි. ආයුෂ්මතුන් වහන්සේ මට එයට සමාවන සේක්වා"යි කියා ක්ෂමා කරගත යුතුය. ඉදින් නවකයෙක් වේ නම්, තමාට වැඩිමහල් වූ ආර්යයන් වහන්සේට වැඳ උක්කුටිකයෙන් හිඳ ඇදිලි බැඳගෙන "ස්වාමීනි! මම නුඹවහන්සේට මෙසේ මෙසේ දොස් කිවෙමි. මා හට සමාවනු මැනවි"යි ක්ෂමා කරගත යුතුය. ඉදින් වෙනත් ඈත දිශාවකට

ආර්යයන් වහන්සේ වැඩියේ නම් තමා ම ගොස් හෝ තම ශිෂ්‍යයකු යවා හෝ ක්‍ෂමා කරවා ගතයුතුයි. ඉදින් යෑමට ද යැවීමටද නොහැකි වේ නම්; එම විහාරයේ යම් භික්‍ෂු පිරිසක් වෙසෙත් නම්, උන්වහන්සේලා හමුවට ගොස්; ඉදින් තමාට වඩා බාලවේ නම් උක්කුටිකයෙන් හිඳ හෝ ඉදින් තමාට වඩා වැඩිමහලු වේ නම් ඉහත කී පරිදි පිළිපැද; "ස්වාමීනි මම අසුවල් ආයුෂ්මතුන්ට මෙසේ මෙසේ දෝෂාරෝපණය කළෙමි. උන්වහන්සේ මාහට කමත්වා" යි කියා ක්‍ෂමා කරගත යුතුයි. ඉදින් යාමට ද යැවීමටද නොහැකි වේ නම්; ඉදින් තමාට වඩා බාල වේ නම් උක්කුටිකයෙන් හිද හෝ ඉදින් තමාට වඩා වාඩිමහලු වේ නම් ඉහත කී පරිදි පිළිපැද; "ස්වාමීනි, මම අසුවල් ආයුෂ්මතුන්ට මෙසේ මෙසේ දෝෂාරෝපණය කළෙමි. උන්වහන්සේ මාහට කමත්වා"යි කියා ක්‍ෂමා කරවාගත යුතුයි.

ඉදිරියේදී ක්‍ෂමා නොකරන්නේ නම් ඊට මෙසේ පිළියම් කටයුතුයි.ඉදින් හුදකලාව වසන භික්‍ෂුවක් නම් උන්වහන්සේ වසන තැන, ගිය තැන් සොයා ගත නොහැකි නම් ද මෙසේ කළ යුතුයි. එක් නුවණැති භික්‍ෂුවක් සමීපයට ගොස් ,"ස්වාමීනි, මම අසවල් ආයුෂ්මතුන් වහන්සේට මෙසේ මෙසේ දොස් කීවෙමි. ඒ පිළිබඳව සිහිකරණ වාරයක් වාරයක් පාසා මාහට විපිළිසර බව ඇති වේ. මම කුමක් කළ යුතුද? යි කියනු මැනවි." එවිට නුවණැති භික්‍ෂුව මෙසේ කියයි. "නුඹ ඒ පිළිබඳව නොසිතන්න. ආර්යයන් වහන්සේ නුඹට ක්‍ෂමා කරන සේක. නුඹ සිත සන්සුන් කරගන්න"යි වරද කළ භික්‍ෂුව විසින්ද ක්‍ෂීණාශ්‍රවයන් වහන්සේ ගිය දිශාවට අභිමුඛව ඇඳලි බැඳ වැඳ "ක්‍ෂමා වන්න"යි කිවයුතු වේ. ඉදින් ආර්යයන් වහන්සේ පිරිනිවියේ නම්, ඒ පිරිනිවි තැනට ගොස්, අමුසොහොනට හෝ ගොස් ක්‍ෂමාකරවා ගතයුතුයි. එසේ කළ කල්හි උපදවා කළ භික්‍ෂුවට ස්වර්ගගාමී වීමට හෝ ආර්ය මාර්ගාවබෝධයට හෝ බාධාවක් නොම වේ. ප්‍රකෘති ස්වභාවයෙන්ම සිටියි.

මිච්ඡා දිට්ඨිකා විපරිත දර්ශන ඇති **මිච්ඡා දිට්ඨි කම්ම සමාදානා** මිසදිටු වශයෙන් සමාදන් වූ නානාවිධ කර්ම ඇති. යමෙක් මිසදිටු මුල් ඇති කාය කර්මාදියෙහි අන්‍යයන් ද සමාදන් කරවත් ද. මෙහිදී වාග් දුශ්චරිත ග්‍රහණයෙන් ම ආර්යෝපවාදය ද මනෝ දුශ්චරිත ග්‍රහණයෙන් මිසදිටු ගත් බව ද සංග්‍රහ කරන ලද්දේ නමුදු මේ දෙක නැවත කිරීම එහි මහා සාවද්‍ය බව දැක්වීම සඳහායයි දත යුතුයි. මහා සාවද්‍ය වූ

ආර්යෝපවාදය වනාහි ආනන්තරීය කර්මයක් හා සමානයහයි කියන ලද්දේමය." සාරිපුත්‍රය යම් සේ භික්ෂුව සීලසම්පන්නව, සමාධි සම්පන්නව, ප්‍රඥා සම්පන්නව සිටියේ. මෙලොවදීම රහත්බව ලබාගන්නේ ද, උන්වහන්සේට නින්දා කළ වචනය අත්නොහැර, සිත අත්නොහැර, දෘෂ්ටිය අත් නොහැර සිටි පාපියා බහා තැබුවක් මෙන් නිරයේ උපදියි"

මිසදිටු බවට වඩා මහා සාවද්‍ය වූ අනෙක් තැන් කියන ලදී." මහණෙනි, මම මේ මිසදිටුබව තරම් මහා සාවද්‍ය වූ වෙනත් එකදු ධර්මයක් හෝ නොදකිමි, මහණෙනි, මේ මිසදුටු බව අතිශය දරුණු පාපයකි."**කායස්ස භෙදා** උපාදානස්කන්ධ පංචකය අත්හැරීමෙන්. **පරම්මරණ** ඊළඟ භවයට නියමිත ස්කන්ධ පංචක අල්වා ගැනීමෙන් අනතුරුව (මරණින් පසු) නැතහොත් **කායස්ස භෙදා** යනු ජීවිතේන්ද්‍රියේ නැසීමෙන්. **පරම්මරණා** චුති සිතට පසුව. **අපායං** මේ ආදි සියලු පද යෙදූ සමාන යෙදුම්ය. නිරය වනාහි ස්වර්ග මෝක්ෂ සුවයට හේතු භූත වූ "පින"යැයි සම්මත අයෙක් තොර වූ (දුර වූ) බැවින් සැප නම් අයෙන් දුරු වූ බැවින් ද අපාය නම් වේ. දුකට ගතිය වූ පිළිසරණ වූ හෙයින් **දුගති**. දෝශ බහුලතාවයෙන් හෝ දුෂ්ට කර්මයෙන් උපන් ගති ඇති බැවින් **දුගති**. පව්කම් කරන්නෝ එහි විමසව් (නපුරුව) වැටෙනුයි **විනිපාත** නම් වේ. විනාශවෙමින් මෙහි වැටෙති. බිදී කැඩී යන අංග ප්‍රත්‍යංග ඇත්තේනුයි ද **විනිපාත** නම් වේ. මෙහි ආශ්වාද සංඥාවෙන් උපන් "අය"නැත්තේනුයි "නිරය" නම් වේ. නැතහොත් අපාය යන්නෙන් තිරිසන් යෝනිය දක්වයි. සැපෙන් දුරු වූ බැවින් තිරිසන් යෝනිය අපායකි. මහේශාක්‍ය නාගරාජාදීන් උපදින බැවින් තිරිසන් යෝනිය දුගතියක් නොවේ. දුග්ගති යනු ප්‍රේත විෂයයයි. සැපෙන් පහ වූ බැවින් ද දුකට ගති වූ බැවින් ද ප්‍රේත විෂය අපායක් මෙන්ම දුගතියක් ද වේ. අසුරයන් හා සමානව නොවැටෙන බැවින් ප්‍රේත විෂය විනිපාතයක් නොවේ. විනිපාත යනු අසුර කායයි. එය ද ඉහත කී අර්ථය අනුව අපායක් ද වේ. දුගතියක් ද වේ. සියලු ශරීරයෙන් වැටෙන බැවින් විනිපාත යැයි කියයි. නිරය යනුවෙන් අවීචිය ආදී අනෙක ප්‍රකාර නිරයන් ම අදහස් කරන ලදී. **උපපන්නා** එහි උපගත වූ, එහි උපන් යන අර්ථයයි. කියූ ආකාරයට විරුද්ධව ශුක්ල පක්ෂය දත යුතුයි. මෙහි ඇති විශේෂය නම්, එහි සුගති යන්නෙන් මනුෂ්‍ය ගතියද සංග්‍රහ කරයි. සග්ග යන්නෙන් දේවගති පමණක් ම අදහස් වේ. එහි සුන්දර වූ ගතිය වන්නේනුයි **සුගතිං නම්** වේ. රූපාදි විෂය සම්පත් වලින්

මනාව අග්‍රවූයේනුයි **සඟං** නම් වේ. මේ සියල්ලම කැඩෙන බිඳෙන අරුතින් ලොකො යැයි කියනු ලැබේ.මෙසේ **දිබ්බන චක්ඛුනා** යනාදී සියල්ල නිගමන වචනයන් ය. මෙසේ දිවැසින් දකියිනුයි මේ මෙහි සංක්ෂිප්තාර්ථයයි.

දිබ්බචක්ඛු ඤාණය පරිත්තාරම්මණ, ප්‍රත්‍යුත්පන්නාරම්මණ, බහිද්ධාරම්මණ අජ්ඣත්තිකාරම්මණ වශයෙන් සතර ආරම්මණයන්හි පවතියි. යථාකම්මුපගඤාණයපරිත්තාරම්මණ, මහග්ගතාරම්මණ, අතීතාරම්මණ, අජ්ඣත්තිරම්මණ, බහිද්ධාරම්මණ යන පංචාරම්මණයන්හි පවති. අනාගතංසඤාණය, පරිත්තාරම්මණ, මහග්ගතාරම්මණ, අප්පමාණාරම්මණ, මග්ගාරම්මණ, අනාගතාරම්මණ, අජ්ඣත්තාරම්මණ, බහිද්ධා රම්මණ, **නවතබ්බාරම්මණ** යන අට වැදෑරුම් ආරම්මණයන්හි පවතියි.

ආකංඛමානොති ච භගවා භාග්‍යවතුන් වහන්සේ කැමැත්තෙන් **එකමපි ලෝකධාතුං පසෙසය්‍ය** එක් සක්වලක් බලන්නේය. **සහසසමපි චූලනිකං** මෙහි යම්තාක් සඳහිරු දෙදෙන හැසිරෙයිද දිශාවන් බබුළුවයි ද ඒ තාක් සහ ශ්‍රී ලෝක ධාතුව වේ. එය සහ ශ්‍රී චූලනිකා ලෝක ධාතුව නම් වේ. චූලනිකං යනු කුඩා වූ.

දවිසහසසිමපි මජඣිමිකං ලෝකධාතුං මෙහි දහසක් සක්වල දහස් ගණනින් වැඩිකර දස ලක්ෂයක් සක්වල ප්‍රමාණය ද්විසහශ්‍රී මධ්‍යමික ලෝක ධාතුව නම් වේ. මෙපණකින් බුදුවරුන්ගේ ජාතික්ෂේත්‍රය දක්වන ලදී. මහබොසත්වරු අවසන් අත්බවයෙහි දී දෙව්ලොවින් චුත වී, මවුකුස පිළිසිඳ ගන්නා දිනයේ ද මහාබිනික්මන් කරන දිනයේ ද බුදුවන, දම්සක් පැවතුම් පවත්වන, ආයුසංස්කරණය අත්හරින හා පිරිනිවෙන දිනයන්හි දී ද මේ දස ලක්ෂයක් සක්වල පමණ වූ තැන් දක්වා කම්පා වේ. **තිසහසසී මහා සහසසිමපි ලෝකධාතු** සහශ්‍රී ලෝකධාතුවේ සිට දෙවන සහශ්‍රී, පළමු සහශ්‍රී, සහශ්‍ර ලෝකධාතුවක් දක්වා,ගණනය කරන ලද මජ්ඣිම ලෝකධාතුව දහසකින් ගුණ කර ගණනය කර බැවින් මහත් වූ සහශ්‍රයෙන් ගිනු බැවින් මහා සහස්සී නම් වේ. මෙපණකින් කෙළ සීයක් සක්වල පරිමාණ වූ ලෝකය දක්වන ලදී. ගණක පුත්ත තිස්ස තෙරණුවෝ මෙසේ වදාලහ. "තිසහශ්‍රී මහා සහශ්‍රී ලෝකධාතුව මෙපමණ ප්‍රමාණයකි. මෙය

ටනාහි ආචාර්යවරුන්ගේ හැදෑරීමෙන් මුළාවූ වචනවලින් පිරිහුණු තැනකි. කෙළ ලක්‍ෂයක් සක්වල පරිමාණ වූ තැන තිසහශ්‍රී මහා සහශ්‍රී ලෝකධාතුව නම් වේ." යනුයි. මෙපමණ ප්‍රදේශය භාග්‍යවතුන් වහන්සේගේ ආඥා ක්‍ෂේත්‍රය නම් වේ. මේ ප්‍රදේශය අතර ආටානාටිය පිරිත, ඉසිගිලි පිරිත, ධජග්ග පිරිත, බොජ්ඣංග පිරිත, කඳ පිරිත ,මෝර පිරිත, මෙත්ත පිරිත, රතන සූත්‍රය යන සූත්‍රයන්ගේ ආඥාව පැතිර සිටියි.

යාවතාවා පන ආකංඛෙය්‍ය යම්තාක් කැමති වන්නේ නම්, මෙයින් විෂය ක්‍ෂෙත්‍රය දක්වන ලදී.බුදුවරුන්ගේ විෂයක්‍ෂේත්‍රයේ ප්‍රමාණය පිරිසිඳ දැක්වීමක් නම් නැත.ඒ නැති බව දක්වීමට මේ උපමාව ගෙනහැර දක්වති. කෙළ ලක්‍ෂයක් සක්වල බඹලොව දක්වාම අබ ඇටවලින් පුරවා, ඉදින් කිසිවෙක් නැගෙනහිර දිසාවට එක් සක්වලක එක් අබඇටයක් දමමින් යන්නේ නම්, ඒ සියලු අබ ඇට නිමවූවත් පෙරදිග වූ සක්වලෙහි නිමාවක් නම් නැත. දකුණු දිශාදී සෙසු දිශාවල ද මෙය මෙසේම දත යුතුය.

එහි බුදුවරුන්ට අවිෂය වූවක් නම් නැත. **තාවතකං පසෙය්‍ය** ඒ තාක් බලන්නේය."මෙසේ භාග්‍යවතුන් වහන්සේගේ පිරිසිදු දිබ්බචක්ඛුව වේ"යැයි දිවැස් කථාව නිමවන ලදී. **කථං භගවා පඤ්ඤා චක්ඛුනා විවට චක්ඛු** කවර ආකාරයකින් ප්‍රඥා චක්ඛුවෙන් (පැණැසින්) නොවැසූ ඇස් ඇතිවේද? මහත් ප්‍රඥා ඇති, පතල මහා ප්‍රඥා ආදී වශයෙනි. එහි මේ ප්‍රඥාවෙන් ඉමහත් සේ බබලයි ප්‍රකාශ වේ. එහි අවසානය දක්වා ම ඉහත පැවසූ පරිදි අර්ථ දත යුතුයි.

බුද්ධ චක්ඛුනා ඉන්ද්‍රිය පරොපරියත්ති ඤාණයෙන් ආසයානුසය ඤාණයෙන් ද යන මේ ඤාණ දෙකින් යුතු බව බුද්ධචක්ඛු නම් වේ. සර්වඥ ඤාණයට සමන්තචක්ඛු යැයි කියයි. ත්‍රිවිධ මාර්ග ඤාණයන්ට ධම්මචක්ඛු නම් වේ. **ලොකං ඔලොකෙන්තා අද්දස සත්තෙ** සත්ත්වයන් දුටුවේය. **අප්ප රජකෙඛ** ආදියෙහි යම් පිරිසකට ඉහත කීපරිදි ප්‍රඥා ඇසෙහි රාගාදී රජස් අල්ප වේ ද ඔවුහු **අපපරජක්ඛා**. යම් පිරිසකගේ මහත්ව පවතීද ඔවුහු **මහාරජක්ඛ** නම් වේ. යම් පිරිසකගේ ශ්‍රද්ධා දී ඉන්ද්‍රියයන් තියුණු වේද ඔවුහු **තික්ඛින්ද්‍රියා**, එම ඉන්ද්‍රියන් යම් පිරිසකගේ මෘදුව පවතීද ඔව්හු **මුදින්ද්‍රියා**. යම් පිරිසකගේ එම ශ්‍රද්ධාදීන්හි ආකාරය සුන්දර වේද ඔවුහු **සාකාර** යමෙක් කිවූ කාරණය වහා වටහා ගනිත්ද සුවසේ කරුණු අවබෝධ කරවීමට පහසුද ඔවුහු **සුවිඤ්ඤාපියා** යමෙක්

පරලොවකය මෙන්ම වැරදි ද භය වශයෙන් දකිත් නම් ඔවුහු පරලොවක වජ්ජ භයදස්සාවිනො නම් වේ. **උප්පලිනියං** උපුල් වනයේ සෙසු පදයන්හි ද මේ ක්‍රමයෙන් අර්ථගත යුතුය. **අනෙකා නිමුගග පොසිනී** යමක් දිය තුළම ගැලී පෝෂණය ලබත් ද ඒවා **උදකං අච්චුගගම්ම තිට්ඨන්ති** දිය ඉක්මවා සිටිති. එහි යම් මලක් ඉතා උඩට විත් සිට සූර්ය රශ්මියේ ස්පර්ශය විඳින කැමැතිව සිටීද ඒවා "අද පිපි මල්" නම් වේ. යම් මලක් දිය හා සමව පිහිටියේද ඒවා "හෙට පිපෙන මල්"නම් වේ. යම් මලක් දියෙන් පිටතට නොපැමිණ, ඇතුලත පවතිමින් පෝෂණය වේ ද ඒවා "තෙවනි දින පිපෙන මල්"නම් වේ. දියෙන් පිටතට නො ආ අනෙක් රෝගාබාධ සහිත උපුල් ද ඇත. යම් මලක් නොපිපෙන්නේද ඒවා මත්ස්‍ය, කැසිබු ආදීන්ට ආහාරම වන්නේය. එම මල් පෙළෙහි නොදැක්විණි. ගෙනහැර දැක්විය යුතු මල් පිළිබඳ පමණක් දැක්විණි. ඉහත දැක්වූ සතර වැදෑරුම් මල් මෙන් මේ ලෝකයේද **උග්ඝටිතඤ්ඤ, විපචිතඤ්ඤා, පදපරම** යනුවෙන් පුද්ගලයෝ සතර දෙනකි. යම් පුද්ගලයකුට මාතෘකාව දැක්වූ අවස්ථාවෙහිම ධර්මාවබෝධය වේ නම් ඒ පුද්ගලයා **උගඝටිතඤ්ඤා** නම් වේ.යම් පුද්ගලයකුට සංක්ෂිප්ත දෙසූ ධර්මය විස්තර විභජන කරමින් දේශනා කරණ කල්හි ධර්මාවබෝධය වේ ද ඒ පුද්ගලයා **විපචිතඤ්ඤ** නම් වේ. යම් පුද්ගලයකුට අදෙසීමෙන්, විමසිමෙන්, යෝනිසෝ මනසිකාරය ඉපදවීමෙන්, කළණ මිතුරන් ඇසුරු කිරීමෙන්, සේවනය කිරීමෙන් හා පයිරුපාසානය කිරීමෙන් ධර්මාවබෝධය ලැබේද ඔහු **නෙය්‍ය** නම් වේ. යම් පුද්ගලයකුට ඉතා බොහෝ කොට ධර්මය ඇසුවත්, දෙසුවොත්, ධාරණය කරගත්තත්, කටපාඩම් කළත් ධර්මාවබෝධයක් මේ අත් බවේදී සිදු නොවේ නම් ඒ පදපරම පුද්ගලයායි.

එහි භාග්‍යවතුන් වහන්සේ උපුල් වනය සමාන දසසහශ්‍රී ලෝකධාතුව දෙස බලන සේක්, අද පිපෙන මල් බදු **උග්ඝටිතඤ්ඤ** පුද්ගලයන් ද හෙට පිපෙන මල් බදු **විපචිතඤ්ඤ** පුද්ගලයන් ද යනාදී ක්‍රමයෙන් සියලු ආකාරයෙන්ම දුටු සේක. එහි මුලින් දැක්වූ පුද්ගලයෝ තිදෙනා මේ අත්බවේදී භාග්‍යවතුන් වහන්සේගේ ධර්ම දේශනාව අවබෝධ කර ගනිති. පදපරමයාට අනාගත භවයක ධර්මාවබෝධය සඳහා එය හේතු වාසනා වේ.

රාගචරිතො ආදියෙහි අර්ථ මෙසේය. මේ ලෝකයේ ඇලීම් වශයෙන් අරමුණේ හැසිරීම මොහුට ඇත්තේනුයි. **රාගචරිතො**. ගැටීම්

වශයෙන් අරමුණු හැසිරීම් මොහුට ඇත්තෙනුයි **දෝසචරිතො.** මුලාවීම් වශයෙන් අරමුණේ හැසිරීම මොහුට ඇත්තෙනුයි **මොහචරිතො** විතර්ක කරන, කල්පනා කරණ ස්වභාවයෙන් අරමුණේ හැසිරෙන්නේ නුයි **විතක්ක චරිතො.** ඔකප්පන ශ්‍රද්ධාදී වශයෙන් අරමුණේ හැසිරීම මොහුට ඇත්තේනුයි **සද්ධා චරිතො.** ඤාණයම ගෙන හැසිරීම හෝ ඤාණාන්විතව හැසිරීම හෝ ඤාණයෙන් හැසිරීම හෝ ඤාණය සදහා හැසිරීම මොහුට ඇත්තෙනුයි **ඤාණචරිතො.** රාග සිත්, රාග දැවීම් බහුලයාට **රාගාචරිතස්ස** නම් වේ. සෙසු පද වලද මෙසේ අර්ථ ගත යුතුයි.**අසුභ කථං කථෙති** උද්ධුමාතකාදි දශවිධ අසුභ ප්‍රතිසංයුක්ත කථා ගෙනහැර දක්වයි. කියන ලදී. "රාගය ප්‍රහාණය සදහා අසුභයෝ වැඩිය යුත්තාහ"යනුයි. **මෙත්තා භාවනං ආචිකඛති.** මෛත්‍රී භාවනාව, සිතේ සෙනෙහස පවසයි.කියන ලදී. "තරහා-ව්‍යාපාදය නැසීම පිණිස මෛත්‍රී සිත වැඩිය යුතුය" යනුයි **උදෙසෙ** සජ්ඣායනා කිරීමෙහි **පරිපුචඡාය** අටුවාවෙන් **කාලෙන ධම්මසවණෙ** සුදුසු යෝග්‍ය පැමිණි කාලයෙහි උතුම් පර්යාප්ති ධර්මය ශ්‍රවණය කිරීමෙහි **ධම්ම සාකචඡා** අන්‍යයන් සමග ධර්මය සාකච්ඡා කිරීමෙහි **ගරුසංවාසෙ** ගුරුවරු ඇසුරු කිරීමෙහි **නිවෙසෙති** ආචාර්ය උපාධ්‍යායවරුන් සමීපයේ වාසය කරවයි. **ආනාපාන සතිං කථෙති** ආනාපානා සති සම්ප්‍රයුක්ත වූ කමටහන පවසයි. කියන ලදී. "විතර්කය නැසීම පිණිස ආනාපානා සතිය වැඩිය යුතුයි." යනුයි. **පසාදනියං නිමිත්තං ආචිකඛති** චුල්ලවේදල්ල, මහා වේදල්ල ආදී ප්‍රසාද ජනනය කරන සූත්‍ර දේශනා කරයි. බුද්ධ සුබෝධිං භාග්‍යවත් බුදුරදුන්ගේ බුද්ධත්ව ප්‍රතිවේධය ද ධම්ම සුධම්මතං නව ලෝකෝත්තර ශ්‍රී සද්ධර්ම මනාව දෙසු බවද සංඝ සුපපටිපත්ති අෂ්ටවිධ ආර්ය සංඝයාගේ සුපටිපන්නාදී ඍජු පිළිවෙත් ඇති බවද **සීලානි ච අත්තනො** තමාගේ සංතකයේ ඇති සීලාදිය ද කියයි. **විපස්සනා නිමිත්තං** උදය ව්‍යය ආදී ප්‍රතිසංයුක්ත ධර්මයක් කියයි. **අනිච්චාකාරං** ඇතිව නැතිවන ආකාරය. **දුකඛාකාරං** උදයව්‍යය වශයෙන් පීඩාවට පත්වන ආකාරය. **අනත්තාකාරං** සිය වසඟයට පත්ව නොසිටින ආකාරය.

සෙලෙ යථා පබබතමුදධනි යීතො ශෛලමය ඒකඝන වූ පර්වත මුදුනක සිටියේම, එහි සිටි පුද්ගලයාට අවට බැලිමේදී ගෙල එසවීම් දිගු කිරීම් අවශ්‍ය නොවේ. **තූපමං** ඊට සමාන, ගල් පර්වතයට බදු උපමා ඇති. මේ දැක්වූ සංඛිප්ත අර්ථයයි. ශෛලමය පර්වතය මුදුනේ සිටි ඇස් ඇති පුරුෂයා හාත්පස වූ ජනයා යම් සේ දකින්නේද මනා නුවණැති, සුන්දර ප්‍රඥා ඇති සමන්තචක්ඛු නම් වූ භාග්‍යවතුන් වහන්ස, එසේම

ඔබද ධර්මමය වූ ප්‍රඥාමය වූ ප්‍රාසාදයට නැගි තමන් ශෝකය දුරු වූවෙක්ව, ශෝකයෙන් ආකීර්ණ වූ, ජාති ජරාවන්ගෙන් වැඩුණු ජනයා දෙස සර්වඥතා ඥානයෙන් බලනු මැනව, සලකනු මැනව. යනුයි.

මෙහි අදහසයි :

පර්වත පාමුල හාත්පස මහත් වූ කෙතක් කර, නියරවල කුටි සාදා යම්සේ රාත්‍රියේ ගිනි දල්වන්නේද සිවු අංගයන්ගෙන් යුතු අන්ධකාරයක් වේද ඉක්බිති ඒ පර්වත මස්තකයේ සිට බිම බලන ඇස් ඇති පුරුෂයාට, කෙත හෝ නියරවල් හෝ කුටි හෝ එහි නිදාගත් මිනිසුන් හෝ නොපෙනෙන්නේද කුටිවල දැල් වූ ගිනිජාලාවන් පෙනෙන්නේද. මෙසේ ධර්ම නම් මහා ප්‍රාසාදයට නැගී සත්වකායන් බලන්නාවූ තථාගතයන් වහන්සේට යම් ඒ පුරුදු නොකළ කල්‍යාණ සිත් ඇති සත්ත්වයෝ, ඉදින් ඔවුහු එකම විහාරයේ දකුණු දණමඬල ලඟ හුන්නත් බුදු ඇසට නම් ආපාථගත නොවෙත්මය. රාත්‍රියේ විදි හී මෙනි. යම් කෙනෙක් කරණ ලද කල්‍යාණ පුරුදු ඇති, හික්මවිය හැකි පුද්ගලයෝ වෙත් ද ඔවුහු ඉතා දුර සිටියත් බුදු ඇසට ආපාථගත වෙත්මය. ගින්න මෙන්ද හිමවත් පව්ව මෙන්ද ඔවුහු වහා පෙනෙති. මෙය කියන ලද්දේමය.

දුරෙ සන්තෝ පකාසෙන්ති හිමවන්තෝව පබ්බතෝ
අසන්තෝ ඵථ න දිස්සන්ති රත්තිං චිත්තා යථා සරා

හිමවත් පවුව මෙන් හේතු වාසනා සහිත සත්ත්වයෝ ඉතා දුර වූවත් බුදු ඇසට පෙනෙති.ඉතා සමීපයේ සිටි පාපී, අනුවණ සත්ත්වයෝ රාත්‍රිය් විදි හී මෙන් බුදු ඇසට නොපෙනෙති.

සබ්බඤ්ඤුත ඤාණං මෙහි පස්වැදෑරුම් නෙය්‍යපථ ප්‍රභේද ඇති සියල්ල දැනගත්තේනුයි සබ්බඤ්ඤු නම් වේ. සංඛත අසංඛතාදී භේද ඇති, සියලු ධර්ම අභිසංස්කාර, විකාර, ලක්ෂණ නිර්වාණ හා ප්‍රඥප්ති යන පසම නෙය්‍යපථ වේ. සියල්ල දන්න බව ම සබ්බඤ්ඤුතා නම් වේ. සබ්බඤ්ඤුත වූ ම ඤාණය "සබ්බඤ්ඤුතාඤාණය"යැයි කිව යුතු තැන. "සබ්බඤ්ඤුතඤාණං" යැයි කියන ලදී. සර්වඥ බව වනාහී ක්‍රම සබ්බඤ්ඤු, සකිං සබ්බඤ්ඤු, සත්තසබ්බඤ්ඤු, සත්තිසබ්බඤ්ඤු, ඤාණ සබ්බඤ්ඤු යැයි පස්වැදෑරුම් වේ. ඒ අතුරින් ක්‍රමයෙන් සියල්ල දැනගන්නා කාලය,

නොලැබීමෙන්ද කාම සබ්බඤ්ඤුතාව සිදු නොවේ. වරක් සියලු අරමුණු ගැනීම නොමැති වීමෙන් සකිං සබ්බඤ්ඤුතාව ද නැත. චක්ඛු විඤ්ඤාණයේ අරමුණට ගැලපෙන සේ සිත හට ගැනීමට ද භවංග චිත්ත විරෝධයෙන් ද යුක්ති අභාවයෙන්ද සත්තසබ්බඤ්ඤුතාව නොවේ. ඉතිරි නොවන සේ සියල්ල දැන ගැනීමේ සමර්ථකමින් සත්ති සබ්බඤ්ඤුතාව හෝ දැනගත් සියලු ධර්ම ඇති බැවින් ඤාත සබ්බඤ්ඤුතාව හෝ වන්නේය. සත්ති සබ්බඤ්ඤුන්ගේ සියල්ල දැන ගැනීමක් නැතැයි එයද නොයෙදේ. "න තසස අදිටඨමිධඨති කිඤචි-පෙ-සමනත චකඛු"යි කියූ බැවින් ඥාත සබ්බඤ්ඤුතාව ම යෙදේ. මෙසේ ඇති කල්හි කෘත්‍ය වශයෙන් ද නොමුලා වශයෙන් ද කාරණ සිද්ධි වශයෙන්ද ආවර්ජන ප්‍රතිබද්ධ වශයෙන්ද සර්වඥභාවය සාධනය කිරීමට **න තසසා** යන ගාථාව කියන ලදී.

එහි **න තසස අදිටඨමිධඨති කිඤචි** ඒ තථාගතයන් වහන්සේට මෙම ත්‍රෛධාතුක ලෝකයෙහි මේ වර්තමාන කාලයේ හෝ ප්‍රඥා චක්ෂුවෙන් නොදුටු අල්ප මාත්‍ර වුවක් වත් නම් නැත. විද්‍යමාන නොවේ. අත්ථි යනු වර්තමාන කාලීන ආඛ්‍යාත පදයයි. මෙයින් වර්තමානකාලික වූ සියලු ධර්මයන් ගේ දන්නාබව දක්වයි. ගාථා බන්ධනයේ පහසුවට මෙහි "ධ"කාරය යොදන ලදී. **අථෙ අවිඤඤාතං** යන මෙහි "අථෙ"යනු වචනෝපාදානයේ නිපාතයකි. **අවිඤඤාතං** අතීතකාලීන වූ ද නොදත් කිසිදු ධර්ම ජාතියක් නොවීයැයි පාඨ ශේෂය යොදා අර්ථ ගත යුතුයි. අව්‍යයක් වූ (නිපාතයක්) අත්ථි ශබ්දය ඇති හෙයින් උක්ත පාඨ ශේෂය නැතිවූවක් එය යෙදෙන්නේමය. මෙයින් අතීත වූ ඉක්ම ගිය සියලු ධර්ම පිළිබඳව දන්නා බව කියවේ. **අජානිතබබං** අනාගත කාලික වූ නො දැනෙන කිසිදු ධර්මයක් මතු ඇති නොවන්නේ ය. නැතහොත් නැත මෙයින් අනාගතකාලික වූ සියලු ධර්මයන්ගේ දන්නා බව දක්වයි. නැතහොත් මෙහි ආකාර ඥානන ක්‍රියාවේ (දන්නා බව) විශේෂණ මාත්‍රයක්ම **සබ්බං අභිඤඤාසි යදත්ථි නෙය්‍යං** මෙහි යම් ත්‍රෛකාලීක වූ හෝ කාල විනිර්මුක්ත වූ දතයුතු යම් ධර්මයක් වේනම් ඒ සියල්ල තථාගතයන් වහන්සේ අවබෝධ කරගත් සේක. අධික වූ සර්වඥතා ඤාණයෙන් සියල්ල දැනගත් සේක. අවබෝධ කරගත් සේක. මෙහි අර්ථ ශබ්දයෙන් ත්‍රෛකාලීක වූද කාලයෙන් විනිර්මුක්ත වූ ද අර්ථයෙන් අර්ථ ශබ්දය අව්‍යක්ත වූ බව ම

දතයුතුයි. **තථාගතො තෙන සමන්ත චකඛු කාල වශයෙන්**, අවකාශ වශයෙන් නොදැක්වූ බැවින් හාත්පසින් සර්වප්‍රකාරයෙන් ම පැවති ඤාණ ඇස ඇත්තේනුයි සමන්ත චක්ඛු නම්. ඒ ඉහත පැවසූ කාරණයෙන් තථාගතයන් වහන්සේ සමන්ත චක්ඛු බවද සර්වඥ බවද කියන ලද්දේ වේ. මේ ගාථාවෙන් පුද්ගල අධිෂ්ඨාන දේශනා වශයෙන් සර්වඥතා ඤාණය දක්වන ලදී.

න ඉතිහිතිහං "මෙසේ මෙයවිය",මෙසේ වනාහි මෙය වේ යැයි නොවේ. **න ඉති කිරාය** "මෙසේ මෙය වේ"**න පරම්පරාය** පරම්පරා කථාවෙන් ද නෙවේ. **න පිටක සම්පදාය** අපගේ පිටක සම්ප්‍රදාය සමඟ සම වේ යැයි නොවේ. **න තක්කහෙතු** තර්ක ග්‍රහනයෙන් ද නොවේ. **න ආකාර පරිවිතක්කෙන** මේ කාරණය සුන්දරය යනුවෙන් මෙසේ කාරණ පරිවිතර්කයෙන්ද නොවේ. **න දිට්ඨිනිජ්ඣානක්ඛනියා** අපගේ රුචි වූ කැමති වූ දෘෂ්ටියට සමවේ යැයි නොම වේ. **අථවා පි සමාධි** මෙහි " සමාධි"යනු කුසල චිත්ත ඒකග්ගතා සමාධියයි. කවර අර්ථයෙන් සමාධි නම් වේ ද? සමාධාන අර්ථයෙන් සමාධි නම් වේ. මේ සමාධානය නම් කුමක්ද? එක අරමුණුක චිත්ත චෛතසික එකවිට සමානව දැඩිව පවත්වා ගැනීමයි. එනිසා යම් ධර්මයක ආනුභාවයෙන් එක අරමුණක චිත්ත චෛතසිකයෝ එකවිට මනාව, වික්ෂිප්ත නොවිසිරී පවතිත්ද මෙය "සමාධානය"යැයි දතයුතුයි.

ඒ සමාධියේ ලක්ෂණය කුමක්ද? අවික්ෂිප්ත බවයි. සමාධිය වික්ෂිප්ත බව නැසීම රසය කොට ඇත්තේය කම්පා නොවීම පච්චුපට්ඨාන කොට ඇත්තේය. සුඛය පදට්ඨානය කොට ඇත්තේය. නොකැළඹෙන අචල ස්වභාවයෙන් සිත අරමුණේ සිටියිනුයි **ඨිති** නම් වේ. ඊළග පද දෙක උපසර්ග යොදා වඩන ලදී. තවද සම්ප්‍රයුක්ත ධර්ම අරමුණේ සම්පිණ්ඩනය වී සිටිනුයි **සණ්ඨිති**. අරමුණේ බැසගෙන අනුව පිවිස සිටියි නුයි අවට්ඨිත. කුසල පක්ෂයෙහි සතර ධර්මයෝ ම අරමුණේ බැසගනිති. ඒවා නම් ශ්‍රද්ධාව, සතිය, සමාධි හා ප්‍රඥාවයි. එම නිසා ශ්‍රද්ධාව "ඔකප්පන" යැයි කියන ලදී. සිහිය අපිලාපනය යැයි ද සමාධිය අවට්ඨිති යැයි ප්‍රඥාව "පරියෝගතා"යැයි ද නියනු ලැබේ. අකුශල පක්ෂයේ වනාහි තණ්හා, දිට්ඨි හා අවිජ්ජා යන ධර්ම තුනම අරමුණේ බැසගනිති. ඒ නිසා ඒවා ඕඝ යැයි කියන ලදී. චිත්තේකාග්‍රතාව මෙහිදි බලවත්ව නොපවතියි. යම්

සේ දූවිලි නැගෙන තැනක ඉස ඇමදී කල්හි මද වේලාවක් දූවිලි තැන්පත්ව සිටියද නැවත වියලෙන වියලෙන කල්හි දූවිලි ප්‍රකෘති ස්වභාවයෙන් පැතිර යයිද එලෙසින්ම අකුශල පක්ෂයේ චිත්තේකාග්‍රතාවය බලවත් නොවේ.

උද්ධච්ච විචිකිච්ඡා වශයෙන් පැවති විසිරීයාමට විරුද්ධව පැවති බව **අවිසාහාරෝ**. උද්ධච්ච විචිකිච්ඡා වශයෙන්ම යන සිත(පැතිරීම) "වික්ඛෙප" නම් වේ. මෙහි මෙබදු වික්ෂේපයක් නොවේනුයි **අවික්ඛෙපෝ**. උද්ධච්ච විචිකිච්ඡා වශයෙන් ම සිත විසාහත නම් වේ. එහේ මෙහේ ගෙනයනු ලැබේ. මෙය එබදු විසිරීමක් නොමැති අවිසාහට මාන වූ බැවින් **අවිසාහට මාන සතා** වේ. **සමථෝ** යනු සමථය තුන් වැදෑරුම් ය. චිත්ත සමථය අධිකරණ සමථය, හා සබ්බ සංඛාර සමථ යනුවෙනි. එහි අෂ්ට සමාපත්තිහි චිත්තේකාග්‍රතාවය චිත්ත සමථ නම් වේ. ඊට පැමිණි සිත චලනය වීම, සිත විප්ඵන්දනය වීම සන්සිඳේ සන්සුන් වේ. එනිසා එය චිත්ත සමථ යැයි කියයි. සම්මුඛා විනයාදී විනය ක්‍රම සත අධිකරණ සමථ නම් වේ. ඊට පැමිණි ඒ ඒ අධිකරණයෝ සන්සිදෙති. සන්සුන්වෙති එහෙයින් එය අධිකරණ සමථ නම් වේ. යම් හෙයකින් සියලු සංස්කාරයෝ නිවනට පැමිණ සන්සිදෙත් ද සන්සුන් වෙත් ද එනිසා එය සබ්බසංඛාර සමථ නම් වේ. මෙතනදී චිත්ත සමථය අදහස් කරන ලදී.

සමාධි ලක්ෂණයෙහි ප්‍රධාන බව පවත්වන්නේ නුයි **සමාධින්ද්‍රියං** නම් වේ. උද්ධච්චයෙහි සිත කම්පා නොවේනුයි **සමාධිබලං** නම් වේ. **සම්මා සමාධි** යනු සත්‍ය වූ සමාධියයි. නෛර්යාණික සමාධියයි. ඉක්බිති භාග්‍යවතුන් වහන්සේ ඉන්ද්‍රිය සංවරය ශීලයේ ආරක්ෂාව වන බැවින් ද අනුක්‍රමයෙන් දේශනා කෙරෙන මේ සූත්‍ර දේශනාව ඒ දෙවියන්ගේ ධර්මාවබෝධයට යෝග්‍ය වන බැවින්ද ඉන්ද්‍රිය සංවරයේ සිට නිර්වාණගාමී ප්‍රතිපදාව දක්වමින්

චක්ඛුහි යන ගාථාව ඇරඹූ සේක. එහි **චක්ඛුහි නෙව ලොලස්ස** නොදුටු, දැකිය යුතු වශයෙන් ඇසින් රූප දැකීමට ලොල් නොවූ. **ගාම කථාය ආවරයේ සොතං තිරිසන් කථාවෙන් කණ වළකන්නේය. චක්ඛු ලොලියෙන** චක්ඛුද්වාරයේ උපන් ලෝභ වශයෙන් චක්ඛු ලෝලයෙන් යුතු වූ **අදිට්ඨං දක්ඛිතබ්බං** නුදුටු විරූ රූපාරම්මණ දැකීමට සුදුසුය. **දිට්ඨං සමතික්කමිතබ්බං** දුටු විරූ රූපාරම්මණ ඉක්මවීමට සුදුසුය.

ආරාමෙන ආරාමං පුෂ්පාරාමාදියෙන් ඵලාරාමාදියට හෝ පුෂ්පාරාමාදියට හෝ **දීඝචාරිකං** දිගු සංචාරයන්ට. **අනවඣිත චාරිකං** නොනැවතුණු හැසිරීමෙන් **අනුයුත්තො විහරති රූප දස්සනාය** රූප අරමුණු දැකීමට පුන පුනා යෙදුණේ වේ. **අන්තරඝරං පවිට්ඨෙ** එළිපත්තෙන් ඇතුලට පිවිසෙයි. **වීථිපටිපන්නො** ඇතුලු වීථියට බැසගත්තේ. **සරමුඛානි ඔලොකෙන්තො.** නිවෙස්වල දොරවල් දෙස බලමින් **උඞ්ඛං ඔලොකෙන්තො** උඩදිශාව, උඩුකුර මුහුණින් බලමින් යයි. **චක්ඛුනා රූපං දිස්වා කාරණ** වශයෙන් චක්ඛු යැයි ව්‍යවහාර කරන රූප දැකීමට සමත් වූ චකඛු විඤ්ඤාණයෙන් රූප දැක පොරණාචාර්යවරු මෙසේ කීහ. ඇස රූප නොදකියි. සිතක් නොවන හෙයිනි. සිත රූප නොදකියි. ඇසක් නොවන හෙයින් ද්වාරය හා අරමුණ ගැටීමෙන්, ප්‍රසාද වස්තුවෙන් යුතු සිතින් රූප දකියි. මෙබදු මෙය වනාහි "දුන්නෙන් විදියි" යනාදී ප්‍රකාශයන්හි මෙන් සසම්භාර කථා නම් වේ. එහෙයින් චක්ඛු විඤ්ඤාණයෙන් රූප දැකීයැයි මෙහිදී අර්ථ දතයුතුය.

නිමිත්තගාහී ස්ත්‍රී පුරුෂ නිමිත්තක් හෝ සුභ නිමිත්තාදියක් හෝ කෙලෙසුන්ට වස්තු වූ නිමිත්තක් හෝ ඡන්දරාග වශයෙන් ගනියි. දුටු මතින් ම නො පිහිටයි. **අනුබ්‍යඤ්ජනගාහී** කෙලෙසුන්ගේ අනුබ්‍යඤ්ජන වශයෙන් ප්‍රකට කරණ හෙයින් අනුබ්‍යඤ්ජන යැයි ලැබූ ව්‍යවහාර ඇති අත් පා, ගායන, කථන, බැලුම් ආදී භේද ඇති ආකාරය ගනියි. **යත්වාධිකරණ මෙනං** ආදියෙහි යම් කරුණෙකින් යමෙකුගේ චක්ඛුන්ද්‍රිය අසංවර වූයේ ද ඒ හේතුවෙන් ඒ පුද්ගලයා සිහිය නම් දොරපලුවෙන් චක්ඛුන්ද්‍රියන් අසංවෘත වූයේ ද නොවැසූ චක්ඛුද්වාර ඇතිව වසන මොහුගේ අභිධ්‍යාදී ධර්ම ලුහුබැඳ අනුව පවතින්නේය. **තස්ස සංවරාය න පටිපජ්ජති** ඒ චක්ඛුන්ද්‍රිය සිහිය නම් දොර පලුවෙන් වසා දැමීමට උත්සාහවත් නොවේ." මෙසේ ඇත්තා වූ ම හැකිවූයේ ම චක්ඛුන්ද්‍රිය නොරකියි. චක්ඛුන්ද්‍රිය සංවර කරගැනීමට නොපැමිණෙයි." යැයි කියන ලදී. තවද ඒ චක්ඛුන්ද්‍රියේ සංවරයක් හෝ නැත්ද චක්ඛු ප්‍රසාදය නිසා සිහිය හෝ මුළා සිහිය හෝ නූපදියිද තවද යම්විටක රූප ආරම්මණයක් ඇසට ගොදුරු වේද, එවිට භවාංගය දෙවරක් ඉපදී නිරුද්ධ වූ කල්හි කියා මනෝ ධාතුව ආවර්ජන කෘත්‍ය සිදුකරමින් ඉපද නිරුද්ධ වේ. එවිට චක්ඛු විඤ්ඤාණය දර්ශන කෘත්‍ය සිදුකරයි. එවිට විපාක මනෝධාතුව සම්පටිච්ඡන කෘත්‍යය ද විපාක අහේතුක මනෝ විඤ්ඤාණ ධාතුව සන්තීරණ කෘත්‍යයද ක්‍රියා අහේතුක

මනෝ විඤ්ඤාණ ධාතුව ඵොඨපන කෘත්‍යයද සිදුකරමින් ඉපද ඉපද නිරුද්ධ වේ. ඉන් අනතුරුව ජවනය වුවයි. එහිද භවංග සමයෙහි ආවර්ජනාදින්ගේ එක්තරා සමයක අසංවරයක් හෝ සංවරයක් නොම ඇත්තේමය. ජවන ක්‍ෂණයේ ඉදින් දුසිල් බව හෝ මුළා සිහි ඇති බව හෝ නොදැනිම හෝ නො ඉවසීම හෝ කුසීත බව හෝ උපදයි ද එය අසංවර ය වේ.

මෙසේ වන කල්හි "ඔහු චක්‍ෂුන්ද්‍රියෙහි අසංවර වූවෙකි"යි කියනු ලැබේ. කුමක් නිසාද? එසේ ඇති කල්හි චක්ඛුද්වාරය නොරකින ලද්දේ වෙයි. භවංගය ද ආවර්ජනාදී වීථි සිත් ද නො රකින ලද්දේමය. එහෙයිනි කුමක් මෙන්ද? නගරයේ ප්‍රධාන සතර වාසල් දොරටු නොවසන ලද කල්හි, ඇතුලු නුවර සරද්වාර, කොටු ගර්භාදිය මනාව වැසුවත්, ඇතුලු නුවර සියලු බඩු භාණ්ඩ අනාරක්‍ෂිත, අගෝපිත ම වේ. නුවර දොරින් පිවිසි සොරු තමාට රිසි බඩු ගෙන යන්නාහුය. මේ අයුරින්ම ජවන් සිත්හි දුශ්ශීලාදී ධර්ම උපන් කල්හි, එහි සංවරය නොමැති කල්හි ද්වාරයද භවාංගය ද ආවර්ජනාදී වීථි සිත් ද නොරක්නා ලද්දේ ම වේ.

සද්ධ දෙය්‍යානි කර්මය ද ඵලය ද මෙලොව ද පරලොව ද අදහා දෙන ලද, මොහු මාගේ නෑයෙකි. මිත්‍රයෙකි කියා හෝ, මොහු මතු උපකාර කරන්නේය කියා හෝ මොහු පෙර උපකාර කරන ලදී කියා හෝ නොදෙන ලදී යන අර්ථයයි. මෙසේ දෙන ලද කල්හි "ශ්‍රද්ධාවෙන් දෙන ලද"නම් නොවේ. **භෝජනානි** මේ දේශනා ශීර්ෂ මාත්‍රයක් ම ය. අර්ථ වශයෙන් වනාහි - ශ්‍රද්ධාවෙන් දුන් භෝජන වළඳා, ඒ සිවුරු පොරවා සෙනසුන් ඇසුරු කරමින්, ගිලන් පස බෙහෙත් ආදිය වළඳමින් යන මේ සියලු පදයන්ගේ අර්ථ කියන ලද්දේමය. **සෙය්‍යථීදං** යනු නිපාතයකි. එහි අර්ථ - ඒ කෙසේද? **නච්චං** යනු යම්කිසි නැටුමකි. ගමට යන්නා විසින් ද බෙල්ල දිගු කර දැකීමට වත් නොවටියි. **ගීතං** යනු කිසියම් ගීතයක් **වාදිතං** යම්කිසි වාදනයක්. **පෙකඛං** නාටක මුළුවක්. අකඛානං භාරත රාමායනාදී පුවතක් යම් තැනක කියනු ලැබේද එහි යාමට නුසුදුසුය. **පාණිසසරං** යනු කස්තල (අත්පුඩි ගැසීම) ය. **පාණිතාලං** යැයි ද කියති.

වෙතළාං යනු සන තාල (කුප්කාලම්) ය. මන්ත්‍රයෙන් මෘත ශරීර ඔසවා තැබීම යැයි ඇතමෙක් කියති. **කුමභ ථූනං** සතර අරමුණක පැතිර

යන තාලය. කළ පිඹීම **කුම්භ සද්දං** යැයි ඇතැමෙක් කියති. **සෝභනගරං** යනු නළුවන්ගේ විසිරවීමයි. සෝභනගරකයක් හෝ ප්‍රතිභාන චිත්‍රයකැයි කියන ලදී. **චණ්ඩාලං** යගුලිය දැමීම, සැඩොලුන්ගේ සඟ දෙවන කෙළියකි යි ද කියති. **වංසං** උණගස් ඔසවා කරණ ක්‍රීඩාවකි. **ධොවනං** යනු ඇට දෙවීමයි. ඇතැම් පිටිසර ජනපදයන්හි කළුරිය කළ ඥාතීන්ගේ ශරීර නොදවා වළ දමා තබති. ඉක්බිති ශරීරය කුණුවී ගිය කාලය දැන පස් ඉවත් කර, ඇට සැකිල්ල ගෙන සෝදා සුවඳ ද්‍රව්‍ය ගල්වා තබති. ඔවුහු නැකැත් උත්සව සමයේ දී එක් තැනක ඇට තබා, තවත් තැනක සුරාදී රහමෙර තබාගෙන හඬමින් දුක්වෙමින් සුරාව බොති. මෙය කියන ලදී. "මහණෙනි, දකුණු දෙස ජනපදයන්හි ධෝවන නම් ක්‍රීඩාවක් ඇත. එහි බොහෝ ආහාරපාන, කෑ යුතු බුදිය යුතු ලෙවිය යුතු දේ රැස්කර විනෝද වේ. මහණෙනි ඒ ධෝවන ක්‍රීඩාවේ අර්ථයක් නම් නැත. "ඇතැමෙක් වනාහි ඉන්‍ද්‍රජාලිකව ඇට දෙවීම මෙනමින් හැඳින්වූ බව කියති. **හත්ථි යුද්ධා** දියෙහි භික්ෂුවට ඇත් ආදීන් සමඟ යුද්ධ කිරීමටද ඔවුන් යුධ කරවීමටද එම යුද්ධ දැකීමටත් නොවටියි. **නිබ්බුද්ධං** මල්ලව පොර **උය්‍යොධිකං** යම් තැනෙක පහරදීම් සිදුවේද ඒ යුධ පෙරමුණ. **බලග්ගං** බලසෙන් සමූහයා ගණින තැන. **සෙනාබ්‍යූහං** කඳවුරු, සේනාවන් වසන තැන, රිය පාබල පෙළපාලි ආදිය පවත්වන තැන. **අනීක දස්සනං** තුන්පත් රැළ, පශ්චිම හත්ථානික ආදී වශයෙන් දැක්වූ බල ඇති දැකීම් ආදිය. **න නිමිත්තග්ගාහී හොති** ඡන්දරාග වශයෙන් ඉහත දැක්වූ පරිදි නිමිති නොගනියි. මෙසේ සෙසු පදයන්හි ද කියූ දෙයට විරුද්ධ ක්‍රමයෙන් අර්ථ දත යුතුයි. ඉහත පරිදි ජවන සිත් දුසිල් සහගතව උපන් කල්හි එය අසංවර වූ කල්හි ද්වාරයද භවාංගයද ආවර්ජනාදී වීථි සත්ද නොකරන්නා ලදී යැයි කියන ලදී. මෙසේ ඒ ශීලාදි ධර්මයන්හි යෙදුණු විට ද්වාරය ද භවංගය ද ආවර්ජනාදී වීථි චිත්තයන් ද ආරක්ෂිත වේ. රක්නා ලද්දේය. කුමක් වේ ද යත් ? නගරත් ද්වාර සතර මනාව වසා දැමූ කල්හි ඇතුලු නුවර සියලු ම බඩු බාහිරාදිය මනාව ආරක්ෂා වේ. මනාව ගෝපනය වූයේ වේ. නගරද්වාර වසා ඇති කල්හි සොරුන් නොපිවිසෙන බැවිනි. මේ අයුරින්ම ජවනයෙහි ශීලාදි ධර්ම උපන් කල්හි ද්වාරය ද භවාංගයද ආවාර්ජනාදී වීථි සිත්ද සංවර වූයේ වෙයි. ඒ නිසා ජවනක්ෂණයේ උපදින චක්ඛුන්ද්‍රියේ සංවරය යැයි කියන ලදී. මින් අනතුරුව ඉහතින්ද පසුවද කියූ කියැවෙන කරුණුවල විපර්යාසයෙන් අර්ථ දතයුතුයි. **විසුක දස්සනා** විසුළු දසුන්. **ගාමකථා** ගම් වැසියන්ගේ කථා **ඤාතිංසා** දෙතිස් කථාව.

නිවන නො එළවෙන, සගමොක් සුව වලකන තිරිසන් වූ කථා වූයේනුයි **තිරච්ඡාන කථා** නම් වේ. එහි රජවරුන් අරබයා ; මහා සම්මත, මහා මන්ධාතු, ධර්මාශෝක ආදීහු මහානුභාව සම්පන්නය ආදී වශයෙන් පවත්වන කථාව **රාජකථා** නම් වේ. චෝරකථාදියෙහිද මේ ක්‍රමයෙන් අර්ථ ගතයුතුයි. ඒ කථා අතුරින් "අසුවල් රජු ඉතා දැකුම්කළුය. දර්ශනීය විය." ආදී වශයෙන් ගේහසිත වඩන කාමුක කථාව තිරිසන් කථා නම් වේ. ඔවුන් පිළිබඳව ද "මෙසේ මහානුභාව වූවත් ඔවුහු මිය ගියහ. විනාශ වූහ" යි පැවති කථාව කමටහනකි. එළවන සොරුන් අතුරින්ද මුලදේව මෙසේ මහානුභාව සොරෙකි. මෙසමාල මෙසේ මහානුභාව සොරෙකි" යනුවෙන් ඔවුන්ගේ ක්‍රියා පිළිබඳව පැවති, "අහෝ සුරයෙකි"යි ගේහසිත් වඩන කථාව තිරිසන් කථාවකි. යුධ පිළිබඳව ද "භාරත යුද්ධයේදී අසුවලා විසින් අසුවලා මරන ලදී, මෙසේ විද්දේය, මෙසේ මැරුවේය" ආදී වශයෙන් කාමාශ්වාද වශයෙන් පැවති කථාව තිරිසන් කථාවකි. "ඔවුහු ද ක්‍ෂයවීමට, විනාශයට ගියෝය" ආදී වශයෙන් සෑම දෙයක්, කෙනෙක් පිළිබඳව කරන කථාව කමටහනක් ම වේ. තවද ආහාරාදිය වර්ණවත්ය, සුවඳවත්ය, රසවත්ය, ස්පර්ශවත්ය කෑවෙමු, වැළඳුවෙමු, බීවෙමු, පරිභෝග කළෙමු යනාදී ලෙස කාමාශ්වාද වශයෙන් කීම නුසුදුසු ය. අර්ථවත්ව ගෙන "පෙර අපි මෙවැනි වර්ණයෙන් යුත් ආහාරපාන, වස්ත්‍ර, ඇඳ පුටු, මල් මාලා, ගද සුවඳ සිල්වතුන්ට දුන්නෙමු චෛත්‍ය පූජා කළෙමු" ආදී වශයෙන් කථා කිරීම සුදුසුය. ඤාති කථාදියෙහි ද "අපගේ ඤාතීහු ශූරයෝ ය. සමර්ථයෝය" යනුවෙන් ද "අපි පෙර මෙබඳු විසිතුරු යානාවලින් හැසිරුණෙමු" ආදී වශයෙන්ද ආශ්වාද වශයෙන් ද කරන කථාව නුසුදුසුය. එය අර්ථ සහිතව ගෙන "අපේ ඤාතීහු විනාශ වූහ. නැසී ගියහ. පෙර අපි මෙවැනි වටිනා පාවහන් ආදිය සංඝයාට දුනිමු." ආදී වශයෙන් කථා කිරීම සුදුසුය. ග්‍රාම කථාවන්ද ජනාකීර්ණ ජනශූන්‍ය, දුර්භික්ෂ, සුභික්ෂ ආදී වශයෙන් "අසුවල් ගම්වැසියෝ ශූරයෝය. සමර්ථයෝය." යනුවෙන් ආශ්වාද වශයෙන් කරණ කථාව නුසුදුසුය. අර්ථ සහිතව ගෙන "අසුවල් ගම්වැසියෝ ශ්‍රද්ධාවන්තයෝය. ප්‍රසන්නයෝය. ක්‍ෂය වීමට ව්‍යයවීමට ගියහ"යි ආදී වශයෙන් කථා කිරීම සුදුසුය. නිගම, නගර, ජනපද කථාදියෙහිද මේ ක්‍රමයමයි.

ඉතී කථාවන් ද වර්ණ, ශරීරාවයව ආදිය පිළිබඳව ආශ්වාද වශයෙන් කරණ කථාව නුසුදුසු ය."සැදැහැවත්ය. තුනුරුවන්හි ප්‍රසන්නය, ක්‍ෂයවීමට

මරණයට පත් වූවාහ" යනුවෙන් ස්ත්‍රීන් පිළිබඳව කථා කිරීම සුදුසුය. සූර කථාවන්හි ද "නන්දිමිත්‍ර නම් යෝධයා ශූරයෙකි"යි ආශ්වාද වශයෙන් කරණ කථාව නුසුදුසුය. "ඔහු ශ්‍රද්ධාවන්තය. විනාශයට ගියේයැයි" කථා කිරීම සුදුසුය. වීථී පිළිබඳ කථාවන්හි ද "අසුවල් වීථිය ජනාකීර්ණය, ජනශූන්‍යය" "අසුවල් වීථියේ වසන්නෝ ශූරයෝය. සමර්ථයෝය" ආදී වශයෙන් ආශ්වාද විදිමින් කථාකිරීම නුසුදුසු ය. "ශ්‍රද්ධාවන්තයහ. ප්‍රසන්නයහ. විනාශයට ගියෝය" ආදී ලෙස කථා කිරීම සුදුසුය. **කුම්භට්ඨාන කථා** කල තබන තැන දිය කොට හෝ කල දාසීන් පිළිබඳ කරන කථාය. ඇයද ප්‍රසාද ඵලවයි. නැටීමට, ගැයීමට දක්ෂය" ආදී වශයෙන් ආශ්වාදමය කථාව නුසුදුසු ය. "ශ්‍රද්ධාවන්තය. පැහැදුනු අයයි" ආදී වශයෙන් කථා කිරීම සුදුසු ය. **පූබ්බපෙත කථා** මිය ගිය ඥාතීන් පිළිබඳ කථාවයි. එය වර්තමාන ඥාතීන් පිළිබඳව ඉහත දැක්වූ ඥාති කථා විනිශ්චයටම සමානය. **නානත්ත කථා** පෙර පසු කථාවලින් මිදුණු ඉතිරි නානා ස්වභාව ඇති නිරර්ථක කථාවයි. ලොකක්ඛායිකා "මේ ලෝකය මැවූවේ කවුද? අසුවලා විසින් මවන ලදී. ඇට සුදු බැවින් කපුටා සුදු පාටය. ලේ රතු බැවින් කොකා රතුපාටය. මේ ආදී **ලෝකායත** විතණ්ඩ සල්ලාප කථාවයි. **සමුද්දක්ඛායිකා** නම්, කුමක් නිසා සමුද්‍රයට "සාගර"යන නම වී ද? සාගර දෙවියා විසින් කණින ලද බැවින් සාගර නම් වේ. මා විසින් කණින ලදී යයි හස්ත මුද්‍රාවෙන් තමා දැන්වූ හෙයින් සමුද්‍ර නම් විය. මෙසේ සාගරය පිළිබඳව පවත්වන නිරර්ථක කථාවයි. **භාවො** යනු වෘද්ධියයි. **අභවො** යනු හානියයි. මෙසේ වෘද්ධිය වේ, හානිය වේ, යනුවෙන් ඒ ඒ දේ පිළිබඳව පැවැත්වූ නිරර්ථක කරුණු පිළිබඳ කථාව **ඉතිභවාභව** නම් වේ.

ආවරෙය්‍ය ආවරණ කරන්නේය. **නිවාරෙය්‍ය** අරමුණින් වලකන්නේය. **සංවරෙය්‍ය** මනාව, ඉතිරි නොකර වළකන්නේය. **රක්ඛෙය්‍ය** රක්ෂා කරන්නේ ය. **ගොපෙය්‍ය** මනාව ලෝපනය කරන්නේ ය. **පිදහෙය්‍ය** වසන්නේ ය. **පච්ඡින්දෙය්‍ය** ශ්‍රෝතස සිදින්නේය. **තෙන තෙන න තුස්සන්ති**, ඒ ඒ ඇඹුල් ආදී රසවලින් සත්තෝෂයට නො පැමිණෙති. **අපරාපරං පරියෙසන්ති තව තවත් සොයමින් ඇවිදිති. එස්සෙන** රෝග ස්පර්ශයෙන්. **භාවඤ්ඤූ නාභිජප්පෙය්‍ය** ඒ ස්පර්ශයේ දුරු කිරීම පිණිස කාමභවාදී භවයන්ද නොපතන්නේය. **භෙරවෙසු ච න සම්පවෙධෙය්‍ය** ඒ ස්පර්ශයට ප්‍රත්‍ය වූ සීහව්‍යාඝ්‍රා දී බියජනක සත්ත්වයන් පිළිබඳව කම්පා නොවන්නේ ය. සෙසු ඝාණෙන්ද්‍රිය, මනින්ද්‍රිය පිළිබඳ විෂයන්හි ද කම්පා නොවන්නේය.

මෙසේ පරිපූර්ණව ඉන්ද්‍රිය සංවරය පිලිබඳව කියන ලදී. මුල් ගාථාවෙන් ඉන්ද්‍රිය සංවරය දක්වා; මේ ගාථාවෙන් අරණ්‍යයෙහි වසන්නට බියජනක දේ දැක හෝ අසා හෝ කම්පා නොවිය යුතු බව දක්වයි. **එකෙනා කාරෙන** එක් අයුරකින් **භයංපි හෙරවා ංපි තඤ්ඤඤ්ඤ ව** භයත් හෛරවයත් යන දෙක කුඩා වූවත් ඉතා මහත් වූ උත්‍රාස නිමිත්තමය. එම අර්ථය දැක්වීමට ම "වුත්තං හෙතං"යි කියන ලදී.

භයං බියජනක ප්‍රත්‍යයෙන් උපන් බිය. **භයානාකං** ආකාරය දැක්වීම යි. **ජමහිතත්තං** භයවීම වශයෙන් ගත (ශරීරය) සෙලවී යාමයි. ලොමහංසො ලොමුඩැහැ ගැනීම, රෝම කෙළින් වීමයි. මේ පද දෙකින් කෘත්‍ය වශයෙන් භය දක්වා, නැවත සිතේ උද්වේගය, උත්‍රාසය යැයි ස්වභාවය දක්වයි. **උබ්බිගො** යනු වහා උද්වේගයට පත්වීමයි. **ජාති භයං** යනු ජාති නිසා උපදින භයයි. සෙසු පදයන්හි ද මේ ක්‍රමයයි. රජුගෙන් උපදින භය **රාජභයං** නම් වේ. සෙසු පදයන් හි ද මෙසේ අර්ථ ගතයුතුයි. **අත්තානුවාදභයං** පව්කම් කරන්නාට තමාට තමාම බණින්නේ යැයි උපදින බිය **පරානුවාද භයං** අනුන්ගේ උපවාදයෙන් උපදින බිය. **දණ්ඩභයං** ගිහිගේ වූවන්ට රජයෙන් පවත්වන දඬුවම් ද පැවිදි වූවන්ට විනය නීති අනුව පවත්වන දඬුවම් ද නිසා උපන් බිය. **දුගගති භයං** සතර අපාය නිසා උපදින බිය. **ඌමිභයං** මහ මුහුදේ දියට බසින්නාට වන බිය. මහ මුහුදේ වනාහි "මහින්ද වීචිය" නම් සැට යොදුනක් උඩට නගින්නකි. පනස් යොදුනක් උඩට නගිනුයේ. "ගංගා වීචි"යයි. රොහණවීචි නම් රළ සතලිස් යොදුනක් උඩට නඟයි. මෙවැනි මහා රළ පිළිබඳව බිය ඌමිභය නම් වේ. මත්ස්‍ය සමූහයාගෙන් වන බිය **කුම්හීල භයං** නම් වේ. දියසුළි ආදියෙන් පවතින බිය ආවටට **භයං** නම් වේ. සුසුකා යනු චණ්ඩ මත්ස්‍යයන්ය. ඔවුන්ගෙන් ඇතිවන බිය **සුසුකාභයං ආජීවිකභයං** යනු ජීවිත පැවතුම් හේතුවෙන් උපදින භයයි. **අසිලොකභයං** යනු ගර්හාවෙන් උපදින බියයි.

ලද්ධා න සන්නිධිං කයිරා මේ ආහාරපානාදියෙන් යම්කිසිවෙක් දැහැමිව ලැබ ආරණ්‍යයෙහි ද සෙනසුනෙහි ද වසන්නට දුර්ලභ යැයි සිතා රැස් කිරීම නො කරන්නේය. **ඔදනො** හැල්, වී, යව, තිරිගු, තණහාල්, වරක, කුද්‍රූසක යන ධාන්‍ය වර්ග හතද ධාන්‍ය සඳහා සුදුසු වෙනත් දෙයෙහි සහලින් උපන් බත **කුම්මාසො** යව ධාන්‍යයෙන් උපන් යව

කොමු. **සත්තු** සහල් ආදියෙන් කළ අත්සුණු. **මච්ඡා** දියේ හටගත්, මාළු මංසං අර්ථ ප්‍රකටමය. **අම්බපානං** අඹු හෝ ඉදුණු අඹවලින් සෑදූ පානය **ජම්බුපානං** දඹ ඵලයෙන් සෑදූ පානය **චොචපානං** ඇට කෙසෙල් ගෙඩියෙන් සෑදූ පානය. **මොචපානය** ඇට නැති මස්, කෙලෙස් ගෙඩි වලින් සෑදූ පානය **මධුපානං** මිදි රසයෙන් කළ පානය. මිදිරසය ජලය හා මිශ්‍ර කළේ සුදුසුය. පිරිසිදු මිදි රසය පමණක් නුසුදුසුය. **මුද්දිකං පානං** යනු මිදි දියෙන් කවලම් කර මිරිකා අඹ පානයක් මෙන් සාදාගත් බීමයි. **සාලුක පානං** රතු උපුල්, **නිල් උපුල්** ආදියේ ඇට ගෙන මිරිකා සෑදූ පානය. **එරුසක පානං** බොරලු දමන හෝ උගුරුස්ස ගෙඩි මිරිකා අඹ පානය සෑදූ පානය. **කොසම්බ පානං** කෝසම්බ ඵලයෙන් සෑදූ පානය. **කෙල පානං** කෝල (ඩෙබර) ඵලවලින් සෑදූ පානය. **බදර පානං** මහා දෙබර ගෙඩි වලින් අඹ පානය මෙන් සෑදූ පානය. මේ එකොළාස් පානයන් සීතල කර හෝ අව්වේ පැසවා හෝ පානය කිරීම සුදුසුයි.

සත පානං ගිතෙල් පානය **තෙල පානං** තල තෙල් ආදී පාන **පයොපානං** කිරි පානය **යාගු පානං** සීතලාදී කැඳ පානය. **රස පානං** ශාකාදි රස පානය. **පීඨඛජ්ජකං** ඉහත දැක්වූ ධාන්‍ය වර්ග ධාන්‍ය හා සමවූ අපරන්ත හෙවත් උඳු මුං ආදියෙන් කළ පිටි වලින්, පනස (කොස්) පිටි, ලබුජ(දෙල්) පිටි, අම්බාටක (ඇඹරල්ලා) පිටි, චීරවල්ලිය (කිරිවැල්) පිටි, මේ ආදී පිටිවලින් සෑදූ පිටි කැවිලි. **පුවඛජ්ජකමපි** ඉහත කී පිටි වලින් ම තැනූ පුව බාදය. **මූලඛජ්ජකං** මුලක මුල් බාරක මුල්, චුච්චු(මුල් පලා) මුල්, ආදී මුල්වලින් කළ ආහාර **තව ඛජ්ජකං** උක් ආදී පොතුවලින් කළ. **පත්තඛජ්ජකං** නාබ්බ කෙළ, කුටජ (කෙලිඳ) කොළ, පටොල (පතෝල) කොළ, සුලස කොළ, ආදියෙන් සෑදූ ආහාරය. **පුප්ඵ ඛජ්ජකං** මුලක මල්, බරක මල්, සුදු වර්ණ, සිග්ගු, උපුල්, පියුම්, ආදී මලින් කළ ආහාර. **ඵලඛජ්ජකං** යනු පනස(කොස්), ලබුජ(දෙල්), නාලිකේර(පොල්), අම්බටක(ඇඹරුල්ල), තින්තිනික(සියඹලා), මාතුලුංග(නාරං),කපිට්ඨ, ඵල(දිවුල්), අලාබු (දියලබු), කුම්භණ්ඩ පුස්ස(කොමඩු) ඵල, තිම්බරූසක (තිඹිරි), තිල(තල්), එතිංගලන, බෙව(ඇටි කෙසෙල්), මොච(කෙසෙල්), මධුකා(මී) දී ගෙඩිවලින් සෑදූ ආහාරය. **න කුහනාය** විශ්මයට පත් කරවීමෙන් නොව. **න ලපනාය** සිවුපස ලාභය සඳහා චාටුබස් නොකීමෙන් විහාරයට පිවිසි මිනිසුන් දැක "පින්වතුනි, කුමක් පිණිස පැමිණියේද? කිම භික්ෂූන්ට ආරාධනාවකට ද? ඉදින් එසේ නම්

දැන් යන්න. මම පසුව එමි" ආදී වශයෙන් චාටුබස් නොකීමෙන්. නැතහොත් තමා දක්වමින් "මම තිස්සය. මා කෙරෙහි රජු පැහැදුණේ ය මා කෙරෙහි අසුවල් අසුවල් රාජමහාමාත්‍යවරු ප්‍රසන්නයහ." මෙසේ චාටු බස් නොකීමෙන් **න නෙමිත්ති කතාය** යම්කිසිවෙකුට අනුන්ට ප්‍රත්‍ය දාන සංඥා උපදවන යම්කිසි කාය වාග් කර්මයෙන් නිමිති කථා නොකර. **න නිප්පෙසිකතාය** යම් ඒ අනුන්ගේ අක්‍රෝශ පරිභව ආදී ක්‍රියාවකින්, උණ පෙතිවලින් එළිමහන වසන මෙන් අනුන්ගේ ගුණ වැසීම, වැලැක්වීම නොකරයි. සුවඳ ද්‍රව්‍ය සුණුකර සුවඳ සොයන්නාක් මෙන්, අනුන්ගේ ගුණ කුඩුකර, සුණුකර එමගින් ලාභ සෙවීම කරයි. එය නිප්පෙසිකා නම් වේ. මෙබඳු නිප්පේසිකතාවයෙන් යුතු නොවේ. **න ලාභෙන ලාභං නිජිගිංසනතාය** මෙහි නජිගිංසනා යනු සෙවීමයි. අනිකකුට ලැබුණු දෙය අන් තැනකට ගෙන යෑම් වශයෙන් ලාභයෙන් ලාභ සෙවීම නම් වේ. මෙබඳු ලාභයෙන් ලාභ සෙවීමෙන් දුරුව. **න දාරදානෙ න සිවුපස** ලැබීම පිණිස දැව ආදිය නොදීමෙන්. විහාරයේ වැටුණු හෝ අනුන් විසින් ගෙනවුත් රක්ෂා කළ, ගෝපනය කළ, දැව ආදිය "මෙසේ මට ප්‍රත්‍ය දෙන්නේය"යි උපස්ථායකයන්ට දීමට නො සුදුසුය. මෙසේ ජීවිකාව ගෙන යෑම සාවද්‍ය වූ මිථ්‍යාජීවයෙන් ජීවත් වීම නම් වේ. මෙබඳු කටයුතු කරණ පැවිද්දා මෙලොවදී ගැරහුමට පැමිණෙයි. පරලොවදී ද අපාය පුරවන්නේ වේ. තමාගේ පුද්ගලික දැව කුල සංග්‍රහ පිණිස දෙන්නේ නම් කුලදූසක දුක්කටාපත්තියට පැමිණේ. අනුන් අයත් දර ආදියක් සොර සිතින් දෙන්නේ නම් භාණ්ඩයේ අගය අනුව පාරාජිකාවෙන් චෝදනා කළ යුතුයි. සාංඝික දෙයෙහි ද මේ ක්‍රමයමයි. ඉදින් එය ප්‍රධාන බව පිණිස දේ නම් ගරුභාණ්ඩ විස්සර්ජනාපත්තියට පැමිණෙයි. කවර දැවයක් ගරුභාණ්ඩ වේ ද? කවර දැවයක් ගරුභාණ්ඩයක් නොවේද? සංඝයා විසින් සීමා වෙන්කර තැබූ අරමෙහි යමක් රෝපණය නොකර ස්වභාවයෙන් ම හටගනියි නම් ඒ ගරුභාණ්ඩ නම් වේ. ඉන් බැහැර වූ දෙය ගරුභාණ්ඩ නොවේ. රෝපණය කළ යුතු තැන සියලු දෙය ගරුභාණ්ඩ වේ. ප්‍රමාණ වශයෙන් ඉදිකටු දඬුවක ප්‍රමාණය ද ගරු භාණ්ඩයකි.

න වෙළුදානෙන ආදියෙහි ද **න වෙළු දානෙන** යනු ප්‍රත්‍ය ලැබීමට උණගස් දීම නොකර. ඉහත දැව පිලිබඳව පැවසූ ක්‍රමයෙන් මේ සියලු පදයන්හි අර්ථ දතයුතුය. උණගස්වල වනාහි තෙල් නැලියක් ප්‍රමාණය

ගරු භාණ්ඩයකි. ඊට වඩා කුඩා දෙය ගරු භාණ්ඩ නොවේ. මිනිසුන් විහාරයට ගොස් උණගස් ඉල්ලති. භික්ෂූහු සාංඝික දේ දීමට කැමති නොවෙති. මිනිසුන් නැවත නැවත ඉල්ලති. තර්ජනය කරති. එවිට භික්ෂූන් විසින් දඩ ගැසීමක් කර, "ගනිවු"යැයි කිව යුතුය. "වේළුදාන" වරදට එවිට හසුනොවේ. ඉදින් ඒ ගැසූ දඩයට වෑ පොරෝ ආදියක් හෝ ඛාද්‍ය භෝද්‍යාදියක් දෙන්නේ නම් ඒවා ගැනීම නුසුදුසුයි. විනයට්ඨ කථාවේ වනාහි "දාගිය උණ ආදිය මිනිස්සු ගෙන යානම් නො වැළැක්විය යුතුය" යි කියන ලදී. ඉදින් සංඝයාට අයත් උණ ලැහැබක එය විනාශ කරණ රෝගයක් ඇති වේ. එවිට ගොදුරුගමෙහි මිනිසුන්ට "උණ ලැහැබට රෝගයක් වැළදුණි" එය ඉවත් නොකළොත් උණපඳුර වැනසේ. කුමක් කළ යුතුද?" කිවයුතුයි. ඉදින් කොටා දැමීමට අකමැති නම් සම භාගය ලැබේ යැයි කිවයුතුයි. එසේත් නො කැමති නම් තුනින් දෙකොටසක් ලැබේ යැයි කිවයුතුයි. එසේත් අකමැතිනම් "නැසුණු උණපඳුරින් කාටවත් වැඩක් නැත. ඉදින් නුඹලා කැමති නම් කිසිවක් දී මුළු උණපඳුරම ගන්න" යි කිවයුතුයි. මෙය වේළුදාන නම් නොවේ. ඉදින් උණ ලැහැබෙහි ගිනි ඇවිලුනොත් දිය ඉස ගැනීමේ දී ද මේ ක්‍රමය යෙදිය යුතුයි. **පත්තදානෙන** පාත්‍රය ගරුභාණ්ඩයක් බැවින් මේ එහි විනිශ්චයයි. විකුණන පාත්‍රය ද සුවඳ ද්‍රව්‍ය වෙළෙන්දෝ සුවඳ ද්‍රව්‍ය දැමීම පිණිස මිළට ගනිති. එබඳු දුර්ලභ අවස්ථාවක දීම පාත්‍රය ගරුභාණ්ඩයක් වේ. මේ දැක්වූයේ කිංසුක පාත්‍ර, පිලඳන තාල පත්‍රාදියෙහි විනිශ්චයයි. තල් කොළ පිළිබඳව ද මේ අවස්ථාවෙහි ම කිවයුතුයි. තල් කොළ ද හටගත් කල්හි තල් වනය සංඝයාට වෙන් කර පූජා කළ ස්ථානයේ සිට ම ගරුභාණ්ඩයකි. ඉන් එහා තල් කොළ ගරු භාණ්ඩ නොවේ. සාංඝික ඉඩමක වගාකළ (රෝපිත) තල්ගස්වල සියල්ලම ගරු භාණ්ඩ වේ. එහි ප්‍රමාණයට ම කෙළවරේ සිට අගල් අටක් ප්‍රමාණ වූ ද හිස් පොත්තේ සිට ගතයුතුයි. තණ ද මේ විස්තරයෙ හි ම බහා කිවයුතුය. යම් තැනක තණ නැති එහි දී තලනාලි (තලකොළ), කේර කොළ (පොල් කොළ) ආදියෙන් ද වසති. එනිසා එම කොළ ද තණ වලටම ඇතුලත් කරන ලදී. මෙසේ මුඤ්ජ පළාලාදියෙහි ද මිටියක් පමණ තණ ද පොල් අතු ආදියෙහි එක් අත්තක් වූවද සංඝයාට දෙන ලදුව හෝ සඟ සතු ඉඩමක උපන්නේ හෝ ආරාමයෙන් පිටත සංඝයාගේ තෘණ වස්තුවෙහි උපන් තණ හෝ රක්ෂා කළ, ගෝපනය කළ, තණ හෝ ගරුභාණ්ඩ නම් වේ. ඒවා වනාහි සංඝ කර්මයෙහි දී ද චෛත්‍ය කර්මාන්තාදිහෙතිද ප්‍රයෝජනයට ගෙන ඉතිරිය පුද්ගලික කර්මයන්හි ද දීම සුදුසුයි. ඉහතින් දැක්වූ දැව, උණ ආදියෙහිද මේ

ක්‍රමයමය. පුජඵ දානෙන පුෂ්ප දානයේ දී "මෙපමණ ගස්වල මල් විකුණා කැඳ බත් පිණිස දිය යුතුය. මෙපමණ ගස්වල මල් විකුණා සෙනසුන් පිළිසකර කිරීම් සඳහා දිය යුතු." මෙසේ නියම කළ ස්ථානවල ම මල් ගරු භාණ්ඩ වේ.

ඉදින් සාමණේරවරු මල් කඩා රුස් කරත්ද අංග පසකින් යුක්ත වූ මල්ද බෙදා දෙන සංඝසම්මත භික්ෂුව සංඝයා ගණන් කර මල් කොටස් කරයි. උන්වහන්සේ තමා වෙත පැමිණි පිරිසට සංඝයා නොවිමසා ම මල් දීම සුදුසු වෙති. සංඝ සම්මතය නොලැබූ භික්ෂුවක් නම් සංඝයාගෙන් විමසාම දිය යුතුවේ. භික්ෂූන්ට වනාහි කාහට මල් දීමට සුදුසු වේ ද? කාහට නම් නොදිය යුතු වේ ද? මාපියාදීන්ට ගෙදරට ගෙනගොස් හෝ ගෙදරින් කැඳවා හෝ වස්තු පූජා කරවයි. දීමට සුදුසුය. සැරසීම් පිණිස දීම නුසුදුසුය. සෙසු ඥාතීන්ට වනාහි ගෙන ගොස් නොදිය යුතුයි. කැඳවා පූජා කිරීම පිණිස දිය යුතුයි.සෙසු ජනයාට පූජා ස්ථානයට පැමිණි කල්හි, අපේක්ෂාවකින් තොරව දිය යුතුය. එය පුෂ්පදාන සංඛ්‍යාවට නොගැනේ. විහාරයේ බොහෝ මල් පිපෙත්ද භික්ෂූන් විසින් පිඬු පිණිස හැසිරෙන කල්හි මිනිසුන් දැක "විහාරයේ බොහෝ මල් ඇත. ඒවා ගෙන පූජා කරවු" කියයුතුය. වචන මාත්‍රයෙහි දෝෂයක් නැත "මිනිසුන් කැමබීම රැගෙන පැමිණෙත්වා"යි සිතින් නොකිව යුතුය. ඉදින් එසේ සිතා කීවේ නම් ගෙනෙන ලද කැමබීම නොවැළඳිය යුතුය.

මිනිසුන් තමන් සිතාම "විහාරයේ මල් ඇත්ද?" යි අසා "ඇතැයි" කී කල්හි, "අසුවල් දින විහාරයට එන්නෙමු. සාමණේරවරුන්ට මල් කැඩීමට නොපසන්න" යි කියති. භික්ෂූන්ට මේ බව සාමණේරවරුන්ට දැනුම් දීමට අමතක වේ. සාමණේරවරු මල් කඩා තබති. මිනිස්සු භික්ෂූන් වෙත අවුත්, අපි නුඹවහන්සේට "අසුවල් දින පන්සලේ සාමණේරවරුන්ට මල් කැඩීමට අවසර නොදෙන්න"යි කීවෙමු. කුමක් නිසා මල් කැඩීම නොවැලැක් වූවෙහුද? එවිට භික්ෂුව මෙසේ කිව යුතුය. "මගේ සිහිය මුළා විය. තවම මල් කැඩුවා පමණි. තවම පූජා කළේ නැත"යි කිව යුතුයි. "මේ කැඩූ මල් ගෙන පූජා කරවු "යි නොකිව යුතුයි. ඉදින් එසේ කීවේ නම් මිනිස්සු ගෙන ආමිෂ පූජා පරිභෝග නොකළ යුතුයි.

තවත් භික්ෂුවක් සාමණේර වරුන්ට කියයි. "අසුවල් ගම්වැසියෝ

මල් නොකඩන්න යැයි පැවසූහ." ගම්වැසියෝ ද ආමිෂ ද්‍රව්‍ය ගෙනවුත් දන් දී "අපගේ මිනිස්සු බහුල නොවෙති. අපත් සමඟ මල් නෙලීමට එන්න යැයි සාමණේරවරුන්ට අණ කරන්න"යි කියති. එවිට භික්ෂුව "උපාසකවරුනි, සාමණේර වරු පිඬු පිණිස යති. යමෙක් පිඬු පිණිස නොයන්නේ නම් ඔවුහු කළයුතු දේ තමන්ම දනිති"යි කිවයුතුයි. මෙපණකින් අවස්ථාව ලැබ සාමණේරයන් පුතුන් හෝ සොයුරන් මෙන් සිතා මල් කඩවා ගැනීමෙහි දෝෂයක් නැත. එසේ මල් කඩා දීම "පූෂ්පදානයක්"ද නොවේ. ඵල දානයේදී මල් මෙන් ම ඵලයද නියම කළේ නම් ගරුභාණ්ඩයක් වේ.

විහාරයේ බොහෝ ඵලාඵල ඇති කල්හි දිලිඳු මිනිස්සු පැමිණ ඒවා ඉල්ලති. භික්ෂූහු මේවා සාංඝික"යැයි දීමට මැලිවෙති. මිනිස්සු විපිළිසරව අක්‍රෝශ කරති, පරිභාස කරති. එවිට කුමක් කළයුතුද? "ගෙඩිවලින් හෝ ගස්වලින් වෙන්කර කතිකාවතක් කළයුතුයි. අසුවල් අසුවල් ගස්වලින් මෙපමණ ගෙඩි ගන්නෝ හෝ මෙපමණ ගස්වලින් ගෙඩි කඩාගන්නෝ හෝ මෙපමණ ගස්වලින් ගෙඩි කඩාගන්නෝ නොවැළැක්විය යුත්තාහ යනුවෙනි. සොරු හෝ ප්‍රධානියෝ හෝ බලහත්කාරයෙන් එම ගෙඩි කඩාගැනීම නොවැළැක්විය යුතුය. කිපුණු ඔවුහු සියලු විහාරයම නසන්නාහ." ආදීනව කිවයුතුය. නහනු දීමේදී කොටන ලද නහනු කුඩු ගරුභාණ්ඩයක් නොවේ. නොසුනු කර ගසේ තිබියදී ගස් පොතු ගරුභාණ්ඩ වේ. සුණු මැටි වනාහි ගිලන් නොවූවන්ගේ ඇඟ ගැල්වීමට සුදුසුය. ගිලන් වූවන්ට යම්කිසි චූර්ණයක්ම සුදුසුම ය. නචුණුණදානෙන ඉහත කී පරිදිම මහරි ගස් චූර්ණාදිය දීමෙන්. මැටි දානයේදී මැටි ආදිය දුර්ලභ ප්‍රදේශයකදීම ඒවා ගරුභාණ්ඩ වේ. එය ද යටත් පිරිසෙන් පලන් තිහක ගුලි පිඬු ප්‍රමාණකි. ඊට වඩා කුඩා ගුලියක් ගරු භාණ්ඩයක් නො වේ. දැහැටිදඬු දීමෙහි දැහැටිදඬු නොකැපූවේ ම ගරුභාණ්ඩයකි. යම් සාමණේරවරුන්ට සංඝයාගෙන් දැහැටිදඬු වාරය පැමිණේ ද ඔවුහු තම ආචාර්ය උපාධ්‍යායවරුන්ට වෙන වෙන ම දීමට නො ලබති. යම් කෙනෙකුන් විසින් මෙපමණ දැහැටිදඬු එළවිය යුතුයයි වෙන්කර වාරය ගන්නා ලද්දේ ද, ඔවුන්ගේ ඉතිරිය ආචාර්ය උපධ්‍යායවරුන්ට යැයි පවසමින් එක් භික්ෂුවක විසින් දැහැටිදඬු මාලකයෙන් බොහෝ දැහැටිදඬු නොගත යුතුයි. දිනපතා එක එකක්ම ගතයුතුයි. වෙන වෙනම වසන්නා විසින්ද භික්ෂු සංඝයාට දී, යම් පමණ තමාට

ඉතිරිවේද එපමණ ගෙන එළවිය යුතුයි. ආගන්තුකයන් අතරෙහි හෝ දිසාවලින් පැමිණියවුන් අතරින් පිටත්ව යන්නන් විසින් ගෙනවුත් ගත් තැනම තැබිය යුතුයි. **න මුඛොදක දානෙන** මුව සෝදන දිය නොදීමෙන් **න චාටුකම්‍යතාය** යනාදියෙහි චාටුකම්‍යතා යනු තමා දාසයකු මෙන් පහත් තැන් තබා, අනුන්ගේ දෝෂ වචනය ද පිළිගෙන ප්‍රිය කැමතිව චාටුබස් කීමයි. මුගඟ **සුප්‍යතාය** මුංඇට හොද්දට සමාන බැවින්. මුග්ගසුප්‍යතා යනු ඇත්ත, බොරු, දෙකින්ම යුතු දිවිපැවැත්ම පිණිස කරණ කථාවෙන් යුතු බවයි. යම් සේ මුංඇට ව්‍යඤ්ජනය පැසෙන කල්හි බොහෝ මුංඇට මනාව පැසෙයිද ස්වල්පයක් නොපැසෙයිද එමෙන් බොරු මිශ්‍ර සත්‍ය කථාවෙන් ජීවිතය ගෙන යන්නා බොහෝ බොරු කියයි. අල්ප සත්‍ය කියයි. නැතහොත් මුංඇට හොද්දට නොපිවිසෙන තැනක් නැත්තේ යම් සේ ද එමෙන්ම සත්‍ය අසත්‍ය මිශ්‍ර කථා කරන්නාට නොපිහිටීමක් නම් නැත. කතිරයකින් මෙන් කැමති කැමති ධාරාවේ හෝ සිවුමංසන්ධියක මෙන් කැමති කැමති පාරේ පිහිටයි. එහෙයින් ඔහුගේ ඒ මුසාවාද ඇති බැව් මුගඟසුප්‍යතා යයි කියන ලදී.

න පාරිභට්ටතාය පරිභට්ට කර්මයෙන් තොරව පරිභටයාගේ ක්‍රියාව පරිභට්ට යැයි. ඔහුගේ ස්වභාවය පරිභට්ටතා නම් වේ. අලංකාර කිරීම ආදියෙන් දරුවන් නැලවීමට මේ තවත් වචනයකි. **න පිඨීමංසිකතාය** වහා ගෙවල් තුළට පිවිස පුටුවල හිඳගන්නා ස්වභාවයෙන් දුරු වූ. **න වත්‍ථුවිජ්ජාය** ආදියෙහි වාස්තු විද්‍යාව නම් ගම්, නියම්ගම්, නගර ආදියේ ජනාකීර්ණ හා ජනශූන්‍ය බව දැනගන්නා ශාස්ත්‍රයකි. **තිරච්ඡාන විජ්ජා නම් නෛර්යානික** නොවූ සඟමොක් මඟ වළකන හෙයින් තිරිසන් වූ අංග ශාස්ත්‍ර නිමිති ආදී වශයෙන් විද්‍යාවයි. **අංගවිජ්ජා** නම් ස්ත්‍රී පුරුෂයන්ගේ සුභග, දුභග ලක්ෂණ දැනගන්නා ශාස්ත්‍රයයි. **නක්ඛත්ත විජ්ජා** නම් නැකැත්වල යෝග දැනගන්නා ශාස්ත්‍රයයි. **න දූතගමනෙන** දූතයකු මෙන් ගමන් කිරීමෙන්. **පහිණගමනෙන** ගිහියන්ගේ හසුන් ගෙන, ගෙන් ගෙට යෑමෙන්. **න ජංඝපෙසනියෙන** ග්‍රාමාන්ත, දේශාන්තරාදියෙහි ඒ ඒ ගිහියන්ගේ හසුන්, පිළිතුරු හසුන් ගෙන යෑමෙන් මෙහිදී ජංඝපෙසනික වූවත් තමන්ගේ මාපියන්ගේ, යමෙකු තම මාපියන්ට උපස්ථාන කරත්ද ඔවුන්ගේ පණිවිඩාදියකට එසේ යෑමෙන් සුදුසුය. චෛත්‍ය කර්මාන්තාදියක දී හෝ සංඝයාගේ හෝ තමාගේ අවශ්‍යතාවයේදී වඩු ආදීන්ට හසුන්පත් ගෙනයෑම්, ගෙන ඒම් සුදුසුය. මිනිසුන්ද "දන් දෙන්නෙමු.

පූජා කරන්නෙමු. ඒ බව භික්ෂු සංඝයාට කියන්න" යි කියති. "අසවල් තෙරුන්ට මේ සිවුරු හෝ පිණ්ඩපාතය හෝ බෙහෙත් දෙන්න" යි කියා දෙති. "විහාරයට පූජා කරන්න." යි මල් ගඳ විලවුන් හෝ ඔප්පතාක හෝ පවරා දෙති. ඒවා පිළිගෙන ගෙනයෑම සුදුසුය. එය ජංඝපෙසනිය නම් නොවේ. සෙසු පණිවිඩ පමණක් ගෙනයන්නාට පියවරක් පියවරක් පාසා දොස් ඇතිවේ. **න වෙජ්ජ කමෙමන** වෙදකු වී කායික පිළියම් ආදියෙන් බෙහෙත් කිරීමෙන් බෙහෙත් කිරීම වනාහි පස්වැදෑරුම් සහ ධාර්මිකයන්ට කළ යුතුයි. භික්ෂුවට, භික්ෂුණියට, ශික්ෂාමානාවට, සාමණේරයාට හා සාමණේරියට යන පස්දෙනාටයි. සම වූ ශීල, ශ්‍රද්ධා, ප්‍රඥාවන්තයන්ට, මේ ත්‍රිවිධ ශික්ෂාවන්හි යෙදුනවුන්ට බෙහෙත් නොකිරීමට නො ලැබේ. දෙමාපියන්ට, ඔවුන්ට උපස්ථාන කරන්නන්ට, තමාගේ වතාවත් කරන්නාට, පණ්ඩු පලාසයාට යන පස්දෙනාට ද බෙහෙත් කිරීම සුදුසුය. අයියා, මල්ලී, අක්කා, නංගි, පුංචි අම්මා, ලොකු අම්මා, බාප්පා, ලොකු තාත්තා, මාමා, නැන්දා මේ දස දෙනාට බෙහෙත් කරන්නා විසින් ඔවුන්ට අයත් දෙයින් බෙහෙත් ගෙන ගොස් කවලම් කර දියයුතුයි. ඉදින් නොපොහොනේ නම් තමා අයත් දෙයින් තාවකාලිකව බෙහෙත් දිය යුතුය. මොවුන්ගේ දරු පරපුරේ සත්වන කුල පරපුර දක්වාම සිවුපසය එළවන්නාට, නොකළ විඤ්ඤත්ති (හැඟවීම්) ඇත්තහුට හෝ බෙහෙත් කරන්නාට වෛද්‍ය කර්මය හෝ කුලදූසකාපත්තියට හෝ නොවේ. **න පිණ්ඩපටිපිණ්ඩ කෙන** මෙහි පිණ්ඩපාතය කාහට නම් දිය යුතු ද? කවරෙකුට නොදිය යුතු ද? මාපිය දෙදෙනාට, ඔවුන්ට උපස්ථාන කරන්නන්ට, වතාවක් කරන්නාට, පණ්ඩු පලාසයාට, සපැමිණි දාමරිකයාට, ප්‍රසිද්ධියාට ද දිය යුතුයි. මොවුන් දීමෙන් පසුව ලැබෙන පිණ්ඩපාතය "පිණ්ඩ පිටිපිණ්ඩ"නම් නොවේ. **න දානානුප්පදිනෙන** තමාට දුන්නවුන්ට නැවත කිසිවක් නොදීමෙන්. **ධමෙමන** දැහැමි උපන් **සමෙන** කාය සුචරිතාදියෙන් **ලද්ධා** කයින් ලැබූ. **ලභිත්වා** සිතින් පැමිණ. **අධිගන්ත්වා** සපැමිණි, **අවබෝධ කර විඳිත්වා** ඤාණයෙන් වින්දනය කර **පටිලභිත්වා** නැවත නැවත ලැබ, ප්‍රතිලාභ කර **අනනසනධිං** මෙහි ආහාර කථාව දෙවැදෑරුම් ය. විනය වශයෙන් හා සල්ලේඛ වශයෙනි. විනය වශයෙන් නම්, යම්කිසි ආහාරයක් අද පිළිගත්තේ ද එය පසුදින (හෙට) සන්නිධිකාරයක් වේ.එ ය පරිභෝග කිරීම පචිති ඇවතකි. තමාට ලැබුණු ආහාර සාමණේරවරුන්ට දී, ඔවුන් ලවා අරන් කියවා දෙවන දින වැළඳීම සුදුසුය. සල්ලේඛ නම් නොවේ. පාන සන්නිධියෙහි ද මේ

ක්‍රමයමයි. මෙහි පාන යනු අඹ පානාදී අෂ්ටපාන වර්ගයන් හා ඊට අනුලෝම වූ පාන වර්ගයි. **වත්ථ සන්නිධිං** ආදියෙහි අධිෂ්ඨාන නොකළ විලප්පනය නොකළ වස්ත්‍රය සන්නිධියක් වේ. සල්ලේඛය විනාශ කරයි. මේ නිෂ්පර්යාය කථාවයි.

පර්යාය වශයෙන් වනාහි තුන් සිවුරින් සතුටුවිය යුතුයි. සිවුවන සිවුරක් ලැබුණේ නම් අනිකකුට දිය යුතුය. ඉදින් කිසිවකුට දීමට නොහැකි වේ නම්, යම් අයකුට දෙනු කැමති ද ඔහු උදෙසීම සඳහා හෝ විමසනු සඳහා පැමිණියේ, පැමිණි වේලෙහි ම දියයුතුයි. නොදී සිටීම නොවටියි. තුන් සිවුරු වනාහි ප්‍රමාණවත් නොවන කල්හි, පසුව ගැනීමට අනුමත කළ කාලයක් තබාගත හැකිය. ඉදිකටු, නූල්, සිවුරු මසන්නන් නොලැබෙන කල්හි ඊට වඩා කාලයක් වූවද චිනය කර්ම කර තැබීමට සුදුසුවේ. මේ දිරූ කල්හි නැවත කොතැනින් ලබන්නේ නම් ද? අරන් තැබීම නුසුදුසුය. එය සන්නිධියක් ද වේ. සල්ලේඛයක් ද විනාශ කරයි.

යානසන්නිධිමහි යාන යනු ගෙනයන රථයයි. කරත්තයයි. රැගෙන යන දෝනාවයි. පාටංගියයි. මේවා පැවිද්දන්ගේ යානා නොවේ. පාවහන් පැවිද්දන්ගේ යානාවයි. එක් භික්ෂුවට කැළයේ ඇවිදීමට එකක් හා පා සෝදා ගැනීමට එකක් වශයෙන් උපරිමව පාවහන් යුගල දෙකක් සුදුසු වේ. තෙවැනි පාවහන් යුවලක් ලැබුණු කල්හි අනිකකුට දිය යුතුයි. "මෙය දිරූ කල්හි අනිකක් කොතනින් ලැබේද? මෙය අරන් තබමි'යි තැබීම නුසුදුසුය. එය සන්ධිකාරකයක් වේ. සල්ලේඛයද විනාශ කරයි. **සයන සන්නිධි** යන මෙහි සයන යනු ඇඳයි. එක් භික්ෂුවකට ගැබෙහි එක් ඇඳක් හා දවල් වසන තැන එක් ඇඳක් වශයෙන් උපරිමව ඇඳ දෙකක්ම සුදුසුය. ඊට වඩා ඇඳක් ලැබුණහොත් එය අනු භික්ෂුවකට හෝ සමූහයාට දිය යුතුයි. නොදී සිටීම නොවටියි. එය සන්නිධියක්ද වේ. සල්ලේඛයද විනාශ වේ.

ගන්ධ සන්නිධියෙහි භික්ෂුවගේ කණ්ඩු, කච්ඡු, ඡවි දෝෂාදී ආබාධයකදී ගන්ධය සුදුසුය. ඒ ගන්ධයෙන් අදාළ රෝගය සුව වූ කල්හි, වෙනත් එම රෝගය ඇති අයකුට ගන්ධය දියයුතුයි. ද්වාරයේ පසැඟිලි දීමට, සරඹූපනාදියට හෝ දිය යුතයි. නැවත රෝගය ඇති වූ විට ගැනීම සඳහා තැබීම නුසුදුසුය. එවිට ගන්ධ සන්නිධියද වේ. සල්ලේඛයද විනාශ වේ.

ආමිසං ආදියෙහි කියා ඉතිරි අර්ථ දතයුතුයි. ඒ කෙසේද? මේ සසුනෙහි ඇතැම් භික්ෂුවක්, "ආහාර අඩු වූ කාලයෙහි ගනිමි"යි තල, සහල්, මුං, කව්පි, නාලිකෙර, ලුණුමාළු, වියලි මස්, ගිතෙල්, තෙල් ආදිය වළං ආදී බඳුන් පුරවා ගෙනවුත් තබයි. ඒ භික්ෂුව වැසි කාලයේ දී වේලාසනින්ම නැගිට සාමණේරවරුන් ලවා කැඳ පිසවා, එය වළඳා "සාමණේරය, මේ දිය සහිත මඩෙහි ගමට පිවිසීම දුෂ්කරය. එනිසා අසුවල් පවුල වෙත ගොස් මා විහාරයේ සිටින බව දන්වන්න. අසුවල් පවුලෙන් මිදුණු කිරි ආදී ආහාර රැගෙන එන්න'යි සාමණේර නමක් යවයි. වෙහෙර වසන භික්ෂූන්ද පැමිණ "ස්වාමීනි, කිම ගමට පිඬු පිණිස නොවඩින්නේද?" යි ඇසූ කල්හි "ඇවැත්නි, දැන් ගමට පිවිසීම මා හට ඉතා දුෂ්කරය"යි පවසයි. ඒ භික්ෂුහූ එවිට 'එසේ වේවා, ස්වාමීනි, නුඹවහන්සේ මෙහිම සිටින්න. අපි පිණ්ඩපාතය කරගෙන ඔබවහන්සේටත් සමඟ ආහාර ගෙනෙන්නෙමු"යි පවසා ගමට වඩිති. ඉන්පසු යැවූ සාමණේරයන් වහන්සේ මිදුණු කිරි ගෙනවුත් බත් ද ව්‍යඤ්ජන ද සම්පාදනය කර ඉහත කී තෙරුන් වහන්සේට දෙයි. එය වළඳනවිට පණිවිඩ යැවූ උපස්ථායක පවුලෙන්ද බත් ආදිය ගෙන එයි. ඉන්ද කැමති ප්‍රියමනාප ආහාර වළඳයි. ඉන්පසු පිණ්ඩපාතයේ ගිය භික්ෂුහූද පිණ්ඩපාත හැරගෙන පැමිණෙති. එයින්ද ප්‍රියමනාප ආහාර බෙල්ල දක්වාම වළඳන්නේමය. මෙසේ වස් සාරමස ම ගතකරයි. මෙය "මුණ්ඩ කුටුම්බික ජීවිකාව" නම් වේ. එය ශ්‍රමණ ජීවිතයක් නොවේ. මෙසේ ආමිෂය සඳහාම ජීවත්වීම ආමිස සන්නිධි නම් වේ.

භික්ෂුවට වනාහි තමා වසන තැන එක් සහල් නැළියක්ද එක් උක් සකුරු පිඬක්ද ගිතෙල් කළයක් ද යන මේ ද්‍රව්‍ය පමණක් ආරක්ෂිතව ගබඩා කරතැබීම සුදුසුය. ඒ නොකල්හි එන සොරුන් සඳහාය. ඔවුහු මෙපමණ වූ හෝ ආමිෂයෙන් සංග්‍රහ කිරීමක්වත් නොමැති කල්හි භික්ෂූන් මරා දමන්නාහ. එනිසා මෙපමණක්වත් විහාරයේ නැතිනම් ගෙනවුත් තැබීමට තරම් සුදුසුය.

අපහසු කාලයේදී යමක් කැපනම් ඒවා තමන්ම ගෙන වැළඳීම සුදුසුය. කප්පිය කුටියේ බොහෝ ආහාර ද්‍රව්‍ය තබාගෙන සිටියත් එය සන්නිධියක් නම් නොවේ.

ඣායී න පාදලොලසස ධ්‍යාන වැඩීමේ ආශාවෙන් ධ්‍යාන වඩයි.ඔහුට පාද ලෝලීත්වයක් නැත. **විරමෙ කුකකුචචං නපපමජ්ජය්‍ය** අත් කුකුස් ආදී කුකුස් ආදී දුරුකරන්නේය. සකසා කටයුතු කිරීම් ආදියෙන් නොපමා වන්නේය. **එකතතමනුයුතතො** ඒකීභාවයෙහි යෙදුණේ. **සඋජුගරුකෙ** උත්තමාර්ථයේ ගරුක වූයේ. සකඋජුගරුක පාඨයද සුදුසුය. **පටිසලලානාරාමො** සිත ඇලවීම ආරාමයයි. ඒ ඒ ආරම්මණයෙන් සිත බැහැර කරවා ඒකීයභාවයේ, තනිව විවේකීව විසීමේ කැමැත්ත යමෙකුට වේ නම් ඔහු පටිසල්ලානාරම නම් වේ. **අසස** වන්නේ නම්. **තසමිං රතො** විවේක වාසයෙහි ඇලී. මේ ප්‍රකාශයෙන් සීලයෙහි පිරිපුන් බව දක්වයි. ඊට හේතු කවරේද? සීල විපත්තියට පත් වූ ඔහුගේ සිත එකඟබවට නොපැමිණෙන හෙයිනි.

අජඣතතං චෙතොසමථමනුයුතතෙතා තමාගේ අභ්‍යන්තරික චිත්ත සමාධියේ නියලුණේ. මෙහි අජ්ඣත්ත හෝ අත්තනො යන්නෙහි එකම අර්ථයක් වේ. ව්‍යඤ්ජන වශයෙන් ම දෙකක් වේ. මෙය සත්තමී අර්ථයේ දුතියා විභක්තියෙන් යෙදූ වචනයකි. අනු යනු උපසර්ගය යොදා පදසිද්ධිය කරණ ලදී. **අනිරාකතඣඣානො** නො ඇසූ ධ්‍යාන ඇති, විනාශ නොකළ ධ්‍යාන ඇති, පිටපත් ගෙනයෑම විනාශ කිරීම මෙහිදී නිරාකරණ නම් වේ. "ඨමහං නිරාකත්වා නිවාතවුතතී" ආදීයෙහිද මේ ප්‍රයෝගය දතයුතුයි. **විපසසනාය සමනනාගතතො** සත්වැදෑරුම් අනුපස්සනාවෙන් යුතුවූයේ. අනුපස්සනා සතකි - අනිච්චානුපස්සනා, දුක්ඛානුපස්සනා, අනත්තානුපස්සනා, නිබ්බානපස්සනා, විරාගානුපස්සනා, නිරෝධානුපස්සනා, පටිනිස්සග්ගානුපස්සනා යනුයි. එම සත විශුද්ධි මාර්ගයේ විස්තර කරණ ලදී.

බ්‍රූහෙතා සුඤඤාගාරනං ශූන්‍යාගාරයන්හි සිත වඩන ලදී. මෙහිද සමථ විදර්ශනා වශයෙන් කමටහන් ගෙන රෑ දවල් ශූන්‍යාගාරයකට පිවිස හිදින සිත් වඩන භික්ෂුව බ්‍රූහෙතා සුඤ්ඤාගාර නම් වන බව දතයුතුයි. එක් මහල් ආදී ප්‍රභේද ප්‍රසාදයෙහි භාවනා කරන්නා ශූන්‍යාගාරයෙහි ධ්‍යාන වඩන්නෙක් නොවේ. **සකකචචකාරී** ආදියෙහි දානාදී දහම් වැඩීමෙන් පුද්ගලයාට හෝ දෙය්‍ය ධර්මයට හෝ කළයුතු දේ කළ බැවින් සක්කච්චකාරී නම් වේ. අසස වන්නේ නම්, සත්‍ත බව සාතච්ච නම් වේ. නිරන්තරව කරන ලද බැවින් අට්ඨිතකාරී යම්සේ

කටුස්සා මඳ දුරක් ගොස් මඳ වේලාවක් නැවතී සිටියි ද නිරතුරුවම නොයයි ද එලෙසින්ම යම් පුද්ගලයෙක් එක්දිනක් දන් දී හෝ පූජාවක් කර හෝ ධර්මයක් හෝ අසා නැතිනම් සුළු කාලයක් ශ්‍රමණ ධර්මයක් හෝ පුරා බොහෝ කාලයක් නොකරයිද නිරතුරුව නොපවත්වයිද ඔහු යීතකාරී නම් වේ. යමෙක් මෙසේ නොවී නිරතුරුව කුසල් වඩයිද ඔහු අට්යීතකාරී නම් වේ. **අනොලීනචුත්තිකෝ** නිරතුරුව පැතිරවීම් සංඛ්‍යාත නොහැකුළුණු පැවතුම් ඇති බැවින් ඔලීන වුත්තික නොවූයේ **අනික්කිත්තඡන්දෝ** කුසල ක්‍රියාවේ වීර්ය ඡන්දයෙන් යුතු බහා නොතැබූ වීර්ය ඇති බව. **අනික්කිත්තධුරෝ** වීර්ය ධුරය රෝපණය කළේ. වීර්යයෙහි ඔසවා තැබූ සිත් ඇති යන අර්ථයයි. **අපපටිවානී** නොනැවතීම. අධිට්ඨානං කුසල් කිරීමෙහි පිහිටි බව. අනුයොගෝ අනුව යෙදීම. අප්පමාදෝ නොනැවතීම. සිහියෙන් නොවෙන්ව විසීම.

තඤ්ඤේව මායං හසඤ්ඤං ඛිඩ්ඩං අලසබව ද හාස්‍යය ද කායික වාචික ක්‍රීඩාවන් ද **සවිභූසං** සැරසීම් සහිත වූ, **රත්තිඤ්ඤේව ඡ කොට්ඨාසං කරිත්වා** පෙරයාමය, මධ්‍යම යාමය, පශ්චිම යාමය, වශයෙන් රාත්‍රිය තෙ කොටසකට ද දවාලත් එසේ තුන් කොටසකට දැයි රෑ දවාල කොටස් හයකට බෙදා. **පඤ්ච කොට්ඨාසං ජහෙය්‍ය** රාත්‍රී මධ්‍යම යාමය හැර සෙසු කොටස් පහෙහි නො නිදාගන්නේය. **එකං කොට්ඨාසං නිපජ්ජෙය්‍ය** එකම මධ්‍යම යාම කොටසේදී සිහි ඇතිව, සිහි කල්පනාවෙන් නින්දට බැසගන්නේ ය. **ඉධ භික්ඛු දිවාසං** පෙරවරු, මැදියම, සවස යන දවාල කොටස් තුන ගන්නා ලදී. **චංකමෙන නිසජ්ජාය** මුලු දාවල් කාලයම මේ ඉරියව් දෙකෙන් වාසය කරමින් සිතේ කෙලෙස් දුරුකිරීමෙන්. **ආවරණියෙහි ධම්මෙහි** පංච නීවරණ වූ සියලු අකුසල ධර්මයන් ගේන්. **චිත්තං පරිසොධෙය්‍ය** ඒ අකුසල ධර්මයන්ගෙන් සිත පිරිසිදු කරන්නේය. විශේෂයෙන් දුරු කරන්නේය.

මෙහි ස්ථානාදියක් නොගන්නා ලදී. සක්මන, හිඳීම, ආශ්‍රය කරගෙනම අර්ථ ගතයුතුය. **පඨමං යාමං** සියලු ප්‍රථම යාමයෙහි. **සෙය්‍යං** මෙහි කාමභෝගි සෙය්‍යාව, ප්‍රේත සෙය්‍යාව, සීහ සෙය්‍යාව හා තථාගත සෙය්‍යාව යැයි සෙය්‍යා සතරකි. එහි "මහණෙනි, බොහෝමයක් කාමභෝගීහු වම් ඇලයෙන් නිදති"යි වදාළේ කාමභෝගී සෙය්‍යාවයි. බොහෝ වශයෙන් ම ඔවුන්ගේ නම් දකුණු ඇලයෙන් නිදීමක් නම්

නැත. "මහණෙනි, බොහෝ සෙයින් ම ප්‍රේතයෝ උඩුකුරුව සයනය කරති" මේ ප්‍රේත සෙය්‍යාවයි. අල්ප මස් ලේ ඇති බැවින්, ඇට සැකිල්ල බැවින්, ඇට සැකිල්ල ගැටෙන නිසා එක් ඇලයකින් නිදීමට අසමත් ප්‍රේතයෝ උඩුකුරුව නිදති. "මහණෙනි මෘගරාජ වූ සිංහයා දකුණු ඇලයෙන් නිදයි. -පෙ- සතුටු සිත් ඇතිවේ"යි වදාළේ සීහ සෙය්‍යාවයි. තේජස් බහුල වූ බැවින් මෘගරාජ වූ සිංහයා පෙර පා දෙක අතර තබා, පෙර පසු සිවුපාද වලිගය පිහිටි තැන් සලකා, පෙර පා දෙක මත හිස තබාගෙන නිදයි. දවසක් ඌ නිදා පිබිදෙනුයේ බිය නොවී අවදි වෙයි. හිස ඔසවා පෙර පා, වලිගාදිය පිහිටි තැන සළකා බලයි. ඉදින් ශරීරාවය එකක් හෝ සිටින තැනින් බැහැර වී සිටියේ නම් "මෙය නුඹගේ ජාතියෙන් ශූර භාවයට සුදුසු නොවේ"යි නොසතුටු සිතැතිව නැවත එහි ම නිදයි. ගොදුරු පිණිස නොයයි. අවයව බැහැර නොවී සිටියේ නම් එය නුඹගේ ජාතියටත් ශූරභාවයටත් මෙය ඉතාම සුදුසු යැයි තුටු පහටුව නැගිට, සීහ කිළිපෙලීමෙන් කිළිපොලා, කෙසරු බර විදහා තෙවරක් සිංහනාද කර ගොදුරු පිණිස යයි. චතුර්ථ ධ්‍යානයෙන් නිදීම තථාගත සෙය්‍යාවනම් වේ. එම සෙය්‍යා අතරින් මෙහි සීහ සෙය්‍යාවේ පැමිණි අයුරින් ම දත යුතුයි. එය වනාහී තේජස් බහුල ඉරියවු ඇති බැවින් උතුම් සෙය්‍යාව නම් වේ.

පාදෙ පාදං පයෙහි වම් පස. **අච්චාධාය** "අති ආධාය -අච්චාධය" මදක් ඉක්මවා තබා ගොපමසින් ගොපමස හා දණමඬලින් දණමඬල ගැටෙන විට නිතර වේදනා උපදියි. සිත එකඟ නොවේ. සයනය කිරීම අපහසු වේ. නොගැටෙන සේ මෙසේ මදක් ඉක්මවා තබාගත් කල්හි මෙවැනි වේදනා ඇති නොවේ. සිත එකඟ වේ. සයනය කිරීම පහසු වේ. එනිසා "දකුණු පයෙහි වම් පය මදක් ඈත් කර තබා"යි කියන ලදී. **සතො සම්පජානො** සිහියෙන් ද සම්පජඤ්ඤ ප්‍රඥාවෙන්ද යුක්ත ව, මෙයින් මනාව පරිග්‍රහිත සම්පජඤ්ඤය කියන ලදී. **උට්ඨාන සඤ්ඤං මනසිකරිත්වා** "අසුවල් වේලාවෙහි මම නැගිටින්නෙමි" යි මෙසේ නැගිටින වේලාව පිරිසිඳ උට්ඨාන සංඥාව සිතේ තබා, මෙසේ කර හොත්තා වූ උන්වහන්සේ නියම කළ කාලයෙහි ම නැගී සිටිති.

විරියින්ද්‍රිය නිද්දේසයේ - **චෙතසිකො** මෙය වීර්යයේ නියම වශයෙන් චෛතසික බව දීපනය කිරීම සඳහා කියන ලදී. මේ වීර්ය යනු

"මහණෙනි, යම් ඒ කායික වීර්යයක් වේද එයම විරිය සම්බොජ්ඣංගයයි. යම් චෛතසික වීර්යයක් වේද එය ද විරිය සම්බොජ්ඣංගයයි. මෙසේ උද්දේසයට පැමිණේ." මේ ආදී සූත්‍රයන්හි සක්මන් ආදිය කරන්නාට උපදින්නාට කායික යැයි කිවයුතු වූ ද කාය විඤ්ඤාණය මෙන් කායික වූවක් නම් නැත. චෛතසිකය ම මෙහිදී දැක්වීමට "චෙතසික" යැයි කියන ලදී. **විරියාරම්භ** යනු වීර්ය සංඛ්‍යාත ආරම්භයයි. මේ ආරම්භ ශබ්දය කම්ම, ආපත්ති, කිරිය, විරිය, හිංසාය, විකෝපන යනාදී අනේකවිධ අර්ථයන් හි යෙදේ.

යං කිඤ්චි දුක්ඛං සමෙහාති සබ්බං ආරබ්භ පච්චයා
ආරම්භනං නිරොධෙන නත්ථි දුක්ඛස්ස සම්භවොා

කිසියම් දුකක් වේ නම් ඒ සියලු දුක් ආරම්භ ප්‍රත්‍යයෙන් හටගනියි. ආරම්භයන්ගේ නිරෝධයෙන් දුකෙහි හටගැනීමක් නැත. මෙහිදී කර්මය ආරම්භ යැයි දැක්විනි. "ආරම්භති විප්පටිසාරී ච හොති" මෙහි ආරම්භ යනු ආපත්තියයි. "මහායඤ්ඤා මහාරම්භ නතෙ හොන්ති මහප්ඵලා"මෙහි ආරම්භ යන්න යූප එසවීම් ආදී ක්‍රියා (කිරිය) අර්ථයේ යෙදී ඇත. "ආරභථ නික්ඛමථ යුඤ්ජථ බුද්ධසාසනෙ" මෙහි විරියාර්ථයේ යෙදී ඇත. "සමණං ගොතතං උද්දිස්ස පාණං ආරභන්ති"යන මෙහි හිංසාර්ථයේ යෙදී ඇත. "බීජගාම භූතගාමසමාරම්භ පටිවිරතො හොති"යන මෙහි ඡේදන භඤ්ජනාදී විකෝපනාර්ථයේ යෙදී ඇත. මෙම සූත්‍රයේ දී ආරම්භ පදයෙන් වීර්යම අදහස් කරන ලදී. එනිසා කියන ලදී. "විරියාරම්භ යනු වීර්ය සංඛ්‍යාත ආරම්භයයි. වීර්ය වනාහි ආරම්භන වශයෙන් ආරම්භ යැයි කියයි. මෙය මෙහි භාව පදයයි. කුසීතකමින් බැහැරවීම - නික්මයෑම **නික්ඛමො.** උතුම් උතුම් ස්ථානයට පත් වීමට උත්සාහ කිරීම **පරක්කමො.** නැගී උද්‍යෝගීව ගමන් කිරීම් වශයෙන් **උය්‍යාමො.** වෑයම් කිරීම් වශයෙන් **වායාමො.** උත්සහය කිරීම් වශයෙන් **උස්සාහො.** අධික මාත්‍රව ඉවසීම් වශයෙන් **උස්සොළ්හී.** ස්ථිරභාවයෙන් **ථාමො.** චිත්ත චෛතසිකයන්ගේ දැරීම් වශයෙන් නොසැදී පැවතීම් වශයෙන් හෝ කුසල සන්තානය ධරන්නේනුයි **ධිති.** මේ තවත් අර්ථ දක්වන ක්‍රමයකි. මෙතෙම කාමයන්ගේ දුරුකිරීම පිණිස නික්මෙයි. බන්ධන සිඳීම පිණිස මෙතෙම පරාක්‍රම කරයි. චතුරෝඝ තරණයට මෙතෙම උද්‍යෝගී වේ. පරතෙරට යෑම පිණිස මෙතෙම වෑයම් කරයි. පූර්වාංගමාර්ථයෙන් මෙතෙම උත්සහ

වඩයි. අධිමාත්‍රාර්ථයෙන් මෙතෙම උත්සාහවත් වේ. මෙතෙම පලිසයන් උපුටා දැමීම පිණිස ස්ථිරව යොමුවේ. නොසිටි බව ඇතිකිරීම පිණිස ධෛර්ය ඇත්තේ වේ.

"ඒකාන්තයෙන් සම ද නහර ද ඇට ද ඉතිරිවේවා" යි මෙසේ පැවති කාලයේ නොලිහිල් පරාක්‍රම වශයෙන් **අසිථිල පරක්කමතා**, ස්ථිර පරාක්‍රම ඇති, දැඩි පරාක්‍රම ඇති යන අර්ථයයි. යම්හෙයකින් මේ වීර්යය කුසල කර්ම කිරීමට ඡන්දය බහා නොතබයිද ධුරය බහා නොතබයිද නොබැස ගනියිද අත්හරියිද නොපසුබස්නා බව එළවයිද එහෙයින් **අනික්ඛිත්ත ඡන්දතා, අනික්ඛිත්ත ධුරතා** යි කියන ලදී. යම්සේ නදී ආදී ජල පහර ඇති තැනකදී බර උසුලන ගොනා "ගනිවු"යැයි කියත්ද ඒ ගොනා දණින් බිම මැඩගෙන වූවත් බර උසුලයි. උසුලන බර බිම වැටීමට ඉඩ නොදෙයි. මෙලෙසින්ම වීර්යය කුසල කර්ම කිරීමේ දී ධුරය බහා නොතබයි. දැඩි කොට ගනියි. එනිසා **ධුර සම්පග්ගාහෝ** යි කියන ලදී. ගැනීම් ලක්ෂණයේ ප්‍රධාන බව කරන්නේනුයි **විරියින්ද්‍රියං**. කුසීත බවෙහි අකම්පිත වේනුයි **විරිය බලං**. සත්‍ය වූ නෛර්යාණික වූ කුසලය සඳහා වෑයම් කරන හෙයින් **සම්මා වායාමෝ**. අලස බව **තන්දි තන්දියනා** අලස ආකාරය. **තන්දිමනකතා** අලසභාවයෙන් මැඩලූ සිත් ඇති බව. අලස බව **ආලසියං**. අලස, මැලිවන ආකාරය **ආලස්‍යනා**. අලස බවින් මැඩුණු බව **ආලස්‍යායිතත්තං**. මෙසේ සියලුම මේ පදයන්ගෙන් කෙලෙස් වශයෙන් කායික අලස බව කියන ලදී. **වඤ්චනකචාරියා** වංචනික ක්‍රියාව. **මා මං ඡඤ්ඤාති වාචං භාසති**. දන්නේ ම ප්‍රඥප්තිය ඉක්මවා ගියේ, "භික්ෂුව බැරෑරුම් වූවක් කරයි. අපගේ වනාහි ඉකිමවා ගිය ස්ථානයක් නම් නැත"යි උපශාන්ත වූවන් මෙන් කියයි. **කායෙන පරක්කමති** මවිසින් කරණ ලද මේ පාප කර්මය කිසිවකු දැන නොගනිත්වායි කායික වැරදි සඟවා විද්‍යමාන දෝෂයන් වැසීමෙන් ඇස මුළාකරන මායාවක් මෙන් වූයේ **මායා**. මායා වියාගේ ස්වභාවය **මායාවිතා**. පවු කර නැවත වසා දැමීමෙන් ඉතා වැඩියෙන් ඉක්මවා යයි, එයින් යුක්ත වූයේ **අච්චසරා**. වාචික ක්‍රියාවලින් අන් අයුරකින් දැකීමෙන් රවටානුයි **වංචනා**. මෙයින් සත්ත්වයෝ රැවටෙත්නුයි **නිකති**, වැරදි කරති යන අර්ථයයි. "මම මෙසේ නො කරමි"යි පාපයන්ගේ බහා තැබීමෙන් **නිකිරණා**. මම මෙසේ නො කරමි යි වර්ජනය කිරීමෙන් **පරිහරණා**. කායාදියෙන් වැසීමෙන් ගුහනා. සියලු ආකාරයෙන් ම වැසීම **පරිච්ඡාදනා**. උඩුකුරු කර, මතුකර

නොදක්වයි. **අනුත්තානීකමමං** ප්‍රකට කර නොදක්වන්නේනුයි **අනාවිකමමං** මනාව වැසීම වොච්ඡාදනා කරන ලද පවු වසා දැමීම් වශයෙන් නැවතත් පවු කිරීමෙන් **පාපකිරියා අයං වුච්චති** මේ කළ දේ වසාදමන ලක්ෂණය මායා නම් වන බව කියනු ලැබේ. මේ මායාවෙන් යුක්ත වූ පුද්ගලයා මනාව හාත්පසින් වැසුණු ගිනිඅඟුරක් මෙන් ද දියෙන් වැසී ගිය හුලක් මෙන්ද රෙදි කඩ වලින් ඔතා තැබූ ආයුධයක් මෙන්ද අතිශය භයානක වේ.

අතිවෙලං දනතවිදං සකං හසති. පමණ ඉක්මවා දත් විවෘත කරමින් අනුන්ට දක්වා සිනාසීම, සොම්නස් උපදවා සිනාසෙයි.

කායිකාව ඛිඩ්ඩා කයින් කරන ක්‍රීඩාදියයි. වාචසිකා දියෙහි ද ඒ නයින් අර්ථ ගත යුතුයි. **හත්ථීහිපි කීළනති** ඇතුන් සමඟ කරන සෙල්ලම්, ඉදිරියෙන් දිවීම්, පසුපස දිවීම් හා ඇතුපිට යෑම් ආදී ක්‍රීඩාවන් සිදුකරති. අසුන්, රිය ආදියෙහි ද මෙම නයින් අර්ථ ගතයුතුයි. **අට්ඨපදෙපි කීළනතී** එක් එක් පේළියට කැට අට බැගින් ගෙන ක්‍රීඩා කරනුයේ අට්ඨපදයයි. ඒ කට්ටිය අටක් ඇති දාන් ලෑල්ලෙන් සෙල්ලම් කරති. දසපදයෙහි ද ඒ අනුසාරයෙන් අරුත් දතයුතු **ආකාසෙ** යනු අටපද, දසපද ආදියෙහි මෙන් අහසෙහිම ක්‍රීඩා කරති. **පරිහාර පථෙපි** භූමියෙහි නානා මාර්ග ඇති මණ්ඩලයක් කර, එහි රූකගතයුතු දේ රූකගනිමින් ක්‍රීඩා කරති. **සන්තිකායපි කීළනතී** සත්තික ක්‍රීඩාවෙන් කෙළිති. (පෙළෙහි "සනතික" යැයි යෙදේ.) එක් තැනක සිටි හැල් වී හෝ ගල් කැට නොසොලා නියපිටින් ම ගෙනයෑම ද ගෙන ඒමද කරයි. ඉදින් කිසිවකු නියෙන් එය ගිලිහේද ඔහුට පරාජය වේ. **කලිකාය** සුදු ඵලකයෙහි පස ඇටින් ක්‍රීඩා කරති. **සටිකාය** සටිකා යනු දිග දණ්ඩකින් කෙටි දණ්ඩකට ගසන (කල්ලි ගැසීම) ක්‍රීඩාවයි. එයින් ක්‍රීඩා කරති. **සලාකහත්ථෙන** ලාකඩවල හෝ මදටිය දියේ හෝ පිටි වතුරක හෝ සලාක අත (උණ ලී ඇති) බහා තෙමාගෙන, "කුමක් වේ ද?" යි අසමින් බිම හෝ බිත්තියකට හෝ ඉන් ගසා ඇත් - අස් ආදී රූප දක්වමින් කරන ක්‍රීඩාවකි. **අක්ඛන පඤ්ඤ කෙලියෙන් පංගචීරයෙන්** පංගචීර යනු පන්නළයයි. එය පිඹිමින් ක්‍රීඩා කරති. වංකෙන ගැමි දරුවන්ගේ ක්‍රීඩා කිරීම් සඳහා වූ කුඩා නගුලෙන් **මොක්ඛ චිකාය** මනාව පරිවර්ත ක්‍රීඩාවෙන්, අහසෙහි දණ්ඩක් ගෙන හෝ බිම හිස තබා හෝ උඩට යටට ආදී වශයෙන් පෙරළෙමින් ක්‍රීඩා කරත් යැයි කියන ලදී. **චිංගුලකෙන** නම් තල් කොළ ආදියෙන් සෑදූ සුළං

පහරින් කැරකෙන සක. රෝදයකි. ඉන් ක්‍රීඩා කරති. **පත්තාළහනෙක** පත්තාළ්හක නම් පන් නැළියයි. ඉන් වැල ආදී ද්‍රව්‍ය මනිමින් ක්‍රීඩා කරති. **රථකෙන කුඩා** රථ වලින් **ධනුකෙන කුඩා** දුණු වලින්. **අක්ඛරිකාය** අක්ඛරික යනු අහසෙහි හෝ පිටෙහි හෝ අකුරු අදින ක්‍රීඩාවයි. ඉන් ක්‍රීඩා කරති. **මනෙසිකාය** මනේසිකා නම් සිතින් සිතූ දෙය දැන ගන්නා (එය පවසන) ක්‍රීඩාවයි. ඉන් ක්‍රීඩා කරති. **යථාවජ්ජන** යථාවජ්ජ නම් කණ අත් කොර, පාකොර ආදීන්ගේ යම් යම් අඩුපාඩු වේද ඒවා ප්‍රදර්ශනය කරමින් කරන ක්‍රීඩාවකි. එම ක්‍රීඩාව කරති. **මුඛභෙරියං** මුවින් බෙරයක් මෙන් ශබ්ද පවත්වන ක්‍රීඩාව **මුඛාලම්බරං** යනු මුවින් පනාබෙරයේ හඬ පැවැත්වීම. **මුඛදෙණ්ඩිමකං** මුවින් පටහ බෙර හඬ අනුකරණය කිරීමයි. **මුඛවලිමකං** තොල් මසෙහි දිව තබා ශබ්ද කිරීමයි. **මුඛවලිමකං** යන පාඨයද යෙදේ. මුඛය පෙරලා පිඹීම හෙවත් සීරුසත් (සිවුරුහත්) බෑමයි. **මුඛභෙරිලං** (මුඛභෙරුලකං) අභිනය දක්වමින් අදහස් පැවසීමයි. **නාටකං** යන පාඨයද යෙදේ. **ලාසං** ඔල්වර හඬ, මහත් සෝෂා කිරීමයි. **ගීතං** ගායනය. **දව කම්මං** සිනා කෙළිය කිරීම. **අයං වාචසිකා ඛිඩ්ඩා** මේ ක්‍රීඩාව වචනවලින්, වාග් ද්වාරයෙන් කරන, මුවින් කරන ක්‍රීඩා වේ.

කෙසා ච මස්සුච ආදියෙහි ඉතිරි නොකර කතුරින් කෙස් කැපීමද දැළි තබා රුවුළ බෑම ද එකතු කළ නැටි මාල ද මුල් සුවඳ ආදී සුවඳ ද්‍රව්‍යද සමේ ගල්වන ආලේපනාදිය ද බෙල්ලෙහි පළඳන ආභරණ ද හිසේ වෙළන බඳ පටි, හිස් වෙළුම් ආදිය ද ශරීරය වසන විසිතුරු වස්ත්‍ර ද මනාව වෙලා බඳින වටිනා වස්ත්‍ර ද **රසනං** යන පාඨය ද යෙදේ. හිස් වෙළුම් පට සංඛ්‍යාත රසන්දම් ද **උච්ඡාදනා** දියෙහි - මවු කුසින් බිහි වූ දරුවන්ගේ ශරීරයේ ඇති ගඳ වයස අවුරුදු දොළහක් වන විට නැසේ. ඔවුන්ගේ ශරීරයේ ගඳ නැසීමට සුවඳ සුනු ආදිය අතුල්ලති. මෙබදු ඇඟ ඉලීම් නැහැවීම් නුසුදුසුය. පින්වත් දරුවන් කලවයස්හි හොවා, තෙලින් සම්බානය කරමින් අත් පා, කලවා නැබ ආදී ශරීරාවයව මනාව සිටින සේ පිරිමැදීම් ආදිය කිරීම පිරිමද්දන නම් වේ. මෙබඳු පිරිමැදීම් නොහොබියි. **නහාපනං** ඒ දරුවන්ගේම සුවඳ ද්‍රව්‍යාදියෙන් නෑවීමයි. **සම්බාහනං** මහා මල්ලවපොර කරුවන්ගේ මෙන් අත් පාවලට මුගුරු ආදියෙන් පහර දී බාහු වර්ධනය කිරීම. **ආදාසං** කිසියම් ආකාරයක හෝ කැටපත් ආදියක් පරිහරණය කිරීම නුසුදුසුයි. **අඤ්ජනං** යනු අඳුන් ආදියෙන් අලංකාරය ඇති කිරීමයි. **මාලා** යනු ගෙතූ මල්මාලා හෝ

නොගෙතූ මල් මාලා විලෙපනං කිසියම් සමේ ආලේපාදිය කිරීමක්. මුඛචණ්ණකං මුඛාලෙපං මුවෙහි කළු පිළිකාදිය ඉවත් කිරීමට මැටි කල්ක ආදිය තවරති. ඉන් ලේ සැලුණු විට අඹ කල්කය දෙති. ඉන් දෝෂය නැසුණු කල්හි තල කල්කය දෙති. එයින් ලේ සංසිඳුණු කල්හි අමුකහ අල කල්කය දෙති. එයින් ඡවිවණ්ණය වැඩුණු විට ගත් මුඛ චූර්ණයකින් මුව ආලේප කරති. හත්ථබන්ධනා දියෙහි - අතෙහි විසිතුරු හක්ගෙඩි, කටු වර්ග ආදිය බැඳගෙන ඇවිදිති. මේවා හෝ වෙනත් හෝ සියළුම ආකාරයේ හස්ථාභරණ නුසුදුසුය. ඇතමෙක් සිළු බැඳ හැසිරෙති. එය රන්වන් පොතුවලින් කළ නූල්, මුතුවැල් ආදියෙන් වෙළති. මේ සියලු සැරසීම් නුසුදුසුය. ඇතැමෙක් රියන් සතරක් දිග දණ්ඩක් හෝ වෙනත් අලංකාර කළ බෙහෙත් තළයක්, මනාව සරසාගෙන වම් පසින් එල්ලා ගනිති. ඇතැමෙක් නානාවිධ විසිතුරු කර්මාන්ත ඇති කොපුවක් සහිත ඉතා තියුණු කඩුවක් පළඳිති. පස් වර්ණයන්ගෙන් යුතු නූල් වලින් මැසූ මෝර දත් කැටයමින් අලංකාර කළ කුඩ ගෙනයති. ඇතමෙක් රන් රිදී ආදියෙන් අලංකාර කළ, මොණර පිල්වලින් වටකර සෑදූ පාවහන් පළඳිති. ඇතැමෙක් රියනක් පමණ දික් වූ, අඟල් සතරක් පමණ පලල් වූ, කේශ කළාපයේ කෙළවර දක්වමින් වැසි වළාවේ විදුලියක් මෙන් නළලෙහි නළල් පට බැඳ, සිළුමිණක් දරති. සෙමෙර වල්විදුනා ද දරති. මේ සියලු සැරසීම් නුසුදුසුය.

ඉමස්ස පූතිකායස්ස මේ සිවු මහාභූතයන්ගෙන් සෑදුණු කුණු ශරීරයේ, **කෙළායනා** (කෙළනා) ක්‍රීඩා කරවීම, **පරිකෙළායනා** (පරිකෙළන) සර්ව ප්‍රකාරයෙන්ම ක්‍රීඩා කරවීම, **ගධිතතා** ඉතා කැමති බව **ගධිතත්තං** ගිජුබව, ඉතා ආශා සහිත බව (පෙළෙහි "ගෙධිතතා," "ගෙධිතත්තං") **චපලතා** අලංකාර කිරීම, **චාපල්‍යං** චපල බව **සවිභූසං** ආදියෙහි "අලංකාර බව (සැරසීම්) සහිත" අර්ථය සවිභූත නම් වේ. සම අලංකාර කිරීම නම් වූ පිරිවර සහිත **සපරිවාරං** පිරිබඩ සහිත **සපරිභණ්ඩං** පිරිකර සහිත **සපරික්ඛාරං.**

ආථබ්බණං අනුන් නසන අර්ථ වන මන්ත්‍ර ප්‍රයෝග **සුපිනං** සිහින ශාස්ත්‍රය. **ලක්ඛණං** මණි ලක්ෂණාදී ලක්ෂණ ශාස්ත්‍රය. **නො විදහෙ** නොකරන්නේය. **විරූතඤ්ච** මුව ආදීන්ගේ හඬ අනුව දක්වන ශාස්ත්‍රය **ආථබ්බනිකා** අනුන් නසන මන්ත්‍ර සාදන්නෝ **ආතබ්බණං පයොජෙන්ති**

ආථබ්බණිකයෝ (සූනියම් කරන්නෝ) සත්දිනක් ලුණු රහිත ආහාර වළඳා, කුසතණ අතුරා පොළවෙහි නිදමින් තපස් රැක, සත්වන දින සුසාන භූමිය සරසවා, සත්වන පදයෙහි (පිරිවරෙහි) සිට අත කරකවමින් මුවින් මන්ත්‍ර පිරුවහති. ඔවුන්ගේ අභිලාෂ සමෘද්ධිමත් වේ. මෙබඳු ස්වරූපයෙන් කරණ සූනියම් ආදියට "ආථබ්බණ කරති" යි කියන ලදී. එහි **පයොජෙනත** යනු කරති. සිදුකරති. **නගරෙවා රුන්ධෙ** නගරය හාත්පසින් අවුරා ආරක්ෂාව සලසා ගත් කල්හි **සංගාමෙ වා පච්චුපට්ඨිතෙ** යුද්ධයක් හෝ පැමිණ සිටි කල්හි **පච්චත්ථිකෙසු පච්චමිත්තෙසු** සතුරු සේනාවෙහි සතුරන් කෙරෙහි **ඊතිං උප්පාදෙනෙති** ශරීරබල චලනය, කම්පනය, උවදුරු උපදවති. **උපද්දවං** කය පෙළීම කරති. **රොගං** ව්‍යාධිය, රෝගය. **පජ්ජරකං** ජ්වරය (උණ) **සූළං** උද්ධුමාතකය (ඉදිමුම්). **විසූචිකං** විදීම (පාචන) **පක්ඛන්දිකං** ලෝහිත පක්ඛන්දිකාව **කරොනති** උපදවති

සුපිනපාඨකා සිහින අර්ථ පවසන්නෝ **ආදිසන්ති** සිහින අර්ථ විවරණය කරති. **යො පුබ්බණ්හ සමයං සුපිනං පස්සති** ආදියෙහි අත්‍යන්ත සංයෝගයේ දුතියා විභක්ති වචනයකි. පෙරවරු සමයෙහි යන අරුතයි.**ඒවං විපාකො හොති** ඉටු'නිටු වශයෙන් මෙබඳු විපාක ඇති වේ. **අවකුජ්ජ නිපන්නෙනා** යටිකුරු වී හොත්තහු දකියි. මෙසේ සුපින පාඨකයෝ ද ඔහු දකිති. දකිමින් ද අර්ථ පවසති. ඒ සිහින දකින්නා සතර කරුණකින් සිහින දකියි. ධාතුකැපීමෙන් (ධාතුක්ෂෝභයෙන්) හෝ අනුභූත පූර්වයෙන් පෙර විදි දේ වශයෙන් හෝ දෙවියන්ගේ ගෙනහැර දැක්වීමෙන් හෝ පූර්ව නිදිති වශයෙන් හෝ යන සිවු අයුරින් සිහින කැදවයි. එහි පිත් සෙම් ආදී ධාතු කිපීම, (තුන් දොස්) කැළඹීම හේතුවෙන් කැළඹුණු ධාතු ඇති තැනැත්තා ධාතු ක්ෂෝභනයෙන් සිහින දකියි. දකින්නේ ද නානාප්‍රකාර විවිධ රූප - සිහින දකියි. පෙර, අත්දුටු, ඇසු දුටු දෙයක් හේතුවෙන් සිහින දකින්නා පෙර ඇසු දුටු අරමුණක් දකී. දෙවියන්ගේ ගෙනහැර දැක්වීමෙන් සිහින දකින්නා, දෙවියන්ගේ ආනුභාවයෙන් අරමුණු දකියි. පූර්ව නිමිති වශයෙන් දකින්නා පින් පවු වශයෙන් උපදින කැමැති අර්ථයට හෝ අනර්ථයට පූර්ව නිමිති වූ සිහින දකී. මේ සිවු සිහින අතුරින් ධාතු කිපීමෙන් ද අනුභූත පූර්වයෙන් යම් සිහිනයකින් දකියි ද එය සත්‍ය සිහිනයක් නොවේ. දෙවියන් ගෙනහැර දක්වන සිහින විටෙක සත්‍ය වේ. විටෙක බොරු වේ. කිපුණු දෙවිවරු උපායෙන් පුද්ගලයා විනාශ කිරීමට විපරිත වූ සිහින දක්වති. යම් සිහිනයක් පූර්ව නිමිති

වශයෙන් දකී ද එය ඒකාන්තයෙන් සත්‍ය වූම සිහිනය වේ. ඉහත දැක්වූ සතර මූලකාරණයන්ගේ සංසර්ග භේද වශයෙන් ද සිහින භේද වන්නේමය. එහිදී මේ සිවු වැදෑරුම් සිහින සේඛ, පුහුදුන් පුද්ගලයෝ දකිති. ඒ ප්‍රහීන නොකළ විපර්යාස ඇති බැවින් සිහින නොදකිති. මෙය සිහින දැකීමේ කිම නිදාසිටිය දී දකී ද? නැතිනම් අවදි වී සිටිය දී දකී ද? නැතහොත් නිදිගත් තැනැත්තා නොදකීද? පිබිදි තැනැත්තා නොදකීද? මෙහිදී ඉදින් නිදා සිටියදී සිහින දකී නම් එය අභිධර්මයට අනුව විරුද්ධ කියමණකි. භවංග සිතින් නිදා සිටිය දී රූපාදී නිමිති අරමුණු වශයෙන් නොගනියි. රාග සම්ප්‍රයුක්ත වීම හෝ නොවේ. සිහින දකින්නාට රූපාදී අරමුණු ද රාගාදී සිත් ද ඇතිවේ. ඉදින් අවදිව සිටියදී සිහින දකී නම් එය විනය විරෝධී වූවකි. ඉදින් අවදිව සිටියදී සිහින දකී නම් එය සම්බෝහාරික සිතින් දකියි. සබ්බෝහාරික සිතින් කළ කල්හි ශික්ෂාපද කැඩීමේ දී අනාපත්තියක් නම් නැත. සිහින දකින්නා විසින් ශික්ෂාපද කැඩීම කළ කල්හි ඒකාන්තයෙන් ආනාපත්තියක් ම වේ. එසේ නම් නිදා නොගත් අවදියෙන් ද නොසිටින්නා සිහින දකියි ද? කිසිවෙක් නම් නොදකියි. මෙසේ ඇති කල්හි සිහිනයේ අභාවයක්ම පැමිණේ. අභාවයක් නැත. කුමක් නිසා .ද? වඳුරු නින්ද වැනි අවස්ථාවේ සිහින දකියි. එය කියන ලද්දේමය. "කපිමිද්ධ පරෙතො බො මහාරාජ සුපීනං පස්සත" (මහරජ, වඳුරු නින්දෙන් යුත් තැනැත්තා සිහින දකී) යනුයි කපිමිද්ධ පරතො යනු වඳුරු නින්දෙන් යුක්ත වීමයි. යම්සේ වඳුරාගේ නින්ද ඉක්මණින් වෙනස් වේද එමෙන්ම යම් නින්දකදී නැවත නැවත කුසලාදී සිත් පැතිරුණු බැවින් වහ වහා පෙරළේ ද යම් පැවැත්මක නැවත නැවත භවංගයෙන් නැගී සිටීමක් වේද මෙබඳු අවස්ථාවෙන් යුතු නින්දේදී සිහින දකියි. එනිසා මේ සිහින කුසල ද අකුසල ද අව්‍යක්ත ද වේ. එහිදී සිහිනෙන් සෑ වැඳුම්, බණ ඇසීම්, දහම් දෙසීම් කරයි ද එය කුසල වේ. ප්‍රාණඝාතාදිය සිහිනෙන් කිරීම අකුසලයකි. මේ අංග දෙකින් මිදී ආවර්ජන තදාරම්මණ ක්ෂණයේ දී අව්‍යක්ත වේ යැයි දතයුතුයි. ඒ සිත ඉතා දුර්වල වූවක් බැවින් ප්‍රතිසන්ධිය ඇදගැනීමට අසමත්ය. පවතින කල්හි අන්‍ය කුසලාකුසලයන්ගෙන් උපස්ථම්භන ලැබ විපාක දෙයි.

මණිලක්ඛණ ආදියෙහි මෙබඳු වූ මැණික ප්‍රශස්තය. මෙබඳු මැණික මිල අඩුය. හිමියාගේ ආරෝග්‍ය, ඓශ්වර්ය ආදී ලාභයන්ට හේතු වේ. එබඳු ලාභයන්ට හේතු නොවේ. මෙසේ වර්ණ, පිහිටීම් ආදී

වශයෙන් මැණික් ආදියේ ලක්ෂණ දක්වන්නේය යන අර්ථයයි. එහි **ආවුධ ලක්ඛණං** අසි (කඩු) ආදීහු ආයුධ හැර අනෙකුත් සියලු ආයුධ වර්ග **ඉත්ථී ලක්ඛණං** ආදියෙහි යම් කුලයක ස්ත්‍රී පුරුෂ ආදීහු වෙසෙත් ද ඒ කුලවල වෘද්ධි, හානි මෙසේ වේ යැයි පැවසීමයි. **අජලක්ඛණං** ආදියෙහි මෙබඳු වූ එළුවන්ගේ මස් කෑ යුතුයි. මෙවැනි එළුවන්ගේ මස් නොකෑ යුතුයි යනුවෙන් විශේෂ අර්ථ දතයුතුයි. තවද මෙහි දී **ගොධා ලක්ඛණං** යන්නෙහි විසිතුරු කර්ම, පළඳනාවල මෙවැනි ගොයකු වේ නම් ඔහුට මේ දේ වේයැයි විශේෂ අර්ථ දතයුතුයි. **කණ්ණිකා ලක්ඛණං** පිලන්ධන (ආභරණ,පළඳනා) කඩුක්කන් ද ගෘහ කර්ණිකාව හෙවත් ගෙයක මුදුන් කොත ද වශයෙන් අර්ථ දතයුතුයි. **කච්ඡප ලක්ඛණං** යන්න ගොයාගේ ලක්ෂණ මෙන් දතයුතුයි. **මිග ලක්ඛණං** යන්නෙහි මෘග යන්නට සියලු සිවුපා සතුන් සංග්‍රහ කර දක්වන ලදී. **එවං ලක්ඛණ පාඨකා ලක්ඛණං ආදී සත්ති** මෙසේ ලක්ෂණ ශාස්ත්‍ර පවසන්නෝ ඒ ඒ ලක්ෂණ පවසති. දක්වති.

නක්ඛත්තානි කැති ආදී නැකත් විසි අටයි. මේ නැකතෙන් **ඝරපවෙසොකාතබ්බෝ** යනු ගෘහප්‍රවේශය මංගල්‍යය කළ යුතුයි. **මකුටං බන්ධිතබ්බං** යනු ආභරණ පළඳින (මුහුළු බඳින) මංගල්‍යය කළ යුතුයි. **වාරෙය්‍ය,** " මේ දරුවාට අසුවල් කුලයෙන් අසුවල් නැකතින් දූරියක ගෙනෙවු" යි කියා ආවාහ කිරීමද,"මේ දූරිය අසුවල් දරුවාට අසුවල් නැකතේ දී පවරා දෙමු. මෙසේ ඔවුන්ට අභිවෘද්ධියක් ම වේවා" යි විවාහ කිරීමද යනුවෙන් වාරෙය්‍ය සංඛ්‍යාත ආවාහ විවාහ මංගල්‍යයක් කළ යුතු යැයි පවසති. **බීජනීහාරෝ** බිජු වැපිරීමට පිටතට ගැනීම, "නීහාරෝ" යැයි ද පෙළෙහි යෙදේ. **මිගපක්ඛං** මෙයද සියල්ල සංග්‍රහ කළ වදනකි. සියලු පක්ෂීන් හා සිවුපාවුන්ගේ නාද කිරීම් දැනගැනීම් වශයෙන්ම කියන ලදී. **මිගපක්ඛපාඨකා** සිවුපා, පක්ෂීන් ආදීන්ගේ ශබ්ද පිළිබඳ පවසන්නෝ **මිගපක්ඛං ආදී සත්ති** ඔවුන්ගේ ශබ්ද අසා විවරණය කරති. **රුතං** යනු ශබ්දයයි. "රුදං යන පාඨයද යෙදේ. **වස්සිතං** නාදය, හඬ **ගබ්භ කරණියා** විනාශ වන ගැබ, නැවත විනාශ නොවීමට ඖෂධ තැවරීම් ආදියෙන් ගැබ පිහිටුවීම් කිරීමයි. ගැබ වාතයෙන් හෝ පණුවන් විසින් කෑමෙන් හෝ කර්මයෙන් යන කරුණු තුනින් විනාශ වේ. එහි වාතයෙන් නැසෙන කල්හි වාතය නැසීමට සීතල බෙහෙතක් දෙයි. පණුවන් විසින් ගැබ නසන කල්හි පණුවන්ට පිළියමක් කරයි. කර්මයෙන් ගැබ නැසේනම් බුදුවරුන්ටද එය වැලකිය නොහැක. එහෙයින් මෙහිදී

එය නොගන්නා ලදී. **සාලාකියං** සලාකයෙන් කරන වෙදකමයි. **සල්ලකත්තියං** සැත්කම් කරන වෙදකම **කායතිකිච්ඡා** මුල් බෙහෙත් ආදිය යොදා කරණ කාය චිකිත්සා වෙදකමයි. **භූතියං** භූතයන් පිළිබඳ වෙදකමයි. **කොමාරකභච්චං** කෝමාරක (ළදරු පෝෂණය පිළිබඳ) වෙදකමයි.

කුහා කුහක වූ ඵඳ්ධා දරකඩක් මෙන් තද වූ සිරුර ඇති, **ලපා** ප්‍රත්‍ය පිළිබඳ කථාවෙන් යුතු **සිංගී** ස්වභාවයෙන් ම සරසන **උන්නළා** නැගුණු මාන නළ ඇති **අසමාහිතා** උපචාර, අර්පණා සමාධි රහිත වූ **න ගණ්හෙය්‍ය** ආදියෙහි උද්දේස ග්‍රහණ වශයෙන් නොගන්නේය. සජ්ඣායනා කිරීම් වශයෙන් **න උග්ගණ්හෙය්‍ය** සිතෙහි තබාගැනීම් වශයෙන් **න ධාරෙය්‍ය**. සමීපයට කර තබා ගැනීම් වශයෙන් **න උපධාරෙය්‍ය**. පරීක්ෂා කර, විමසා බැලීම් වශයෙන් **න උපලක්ඛෙය්‍ය** අන්‍යයන්ගේ කීම් වශයෙන් **නප්පයොජෙය්‍ය**. (නොයොදන්නේය).

පෙසුනෙය්‍යං පිසුණු බස්කීම කේලාම් කීමයි. සෙසු නිද්දේස පදයන්ගේ අර්ථ සුගමය.

කය විකකයෙ පස් සහ ධාර්මිකයන් සමඟ වංචා කිරීම් වශයෙන් හෝ වැඩියක් පතමින් හෝ නොසිටින්නේය. **උපවාදං භික්ඛු න කරෙය්‍ය** උපවාද කරන, කෙලෙස් නූපදවමින් තමා කෙරෙහි හෝ අන්‍ය ශ්‍රමණ බ්‍රාහ්මණයන් උපවාද නො කරන්නේය. **ගාමෙවා නාභිසජ්ජෙය්‍ය** ගමෙහිද ගිහි සංසාර්ගාදියෙන් නො ඇළෙන්නේය. **ලාභකම්මා ජනං න ලපෙය්‍ය** ලාභ කැමති බැවින් ජනයාට කථා නොකරන්නේය. **යෙ කයවික්කයා විනයෙ පටික්ඛිත්තා** යම් දීම් - පිළිගැනීම් වශයෙන් ගණුදෙනු කිරීම නුසුදුසු යැයි කය විකකය ශික්ෂා පදයෙහි ප්‍රතික්ෂේප කරන ලදී. මෙහිදී අදහස් කළ ගණුදෙනු කිරීම දැක්වීමට "පඤ්චන්නං සදධිං පත්තංවා චීවරං වා" යනාදිය කියන ලදී.

එහි පඤ්චන්නං සද්ධිං යනු පස් සහදහැමියන් සමග. පස් සහ දහැමියෝ නම් භික්ෂුව, භික්ෂුණිය, ශික්ෂාමානාව, සාමණේර, සාමණේරිය යන පස්දෙනයි. වඤ්චනියං වා ප්‍රතිරූප දෙයක් දක්වා වංචා කිරීමයි. **උද්දයං වා පටිච්ඡන්නෙනා** අභිවෘද්ධියක් පතමින් හෝ. පරිවර්තනය කරයිනූයි. **පරිවත්තෙති.** ඉද්ධිමන්තෙනා යනු ඍද්ධිය ප්‍රභාවය ඇති **දිබ්බ චක්ඛුකා** දෙවියන්ට බඳු කදාණ ඇස් ඇති. නැතහොත් දිව්‍ය විහාර ආශ්‍රයෙන්

උපදවාගත් නුවණැසින් (දිවැස් ඇති). **පරචිත්ත විදුනො** තමාගේ සිතින් අනුන්ගේ සිත් දැනගන්නෝ. **තෙ දුරතොපි පසසනතති,** එක් යොදුනක් දුරින් ද යොදුන් සියයකින් ද සක්වල දෙක, තුන, සතර, පහ, දස, විසි, සතලිස, දහසකිනුත් එහා අනන්තාපරිමාණ සක්වලින් ද එහා සිටින්නන් දකිති. බලති. **අසනනාපි න දිසසනති** සමීපයේ සිටියනුත්, හුන් අයත් නොපෙනෙති. **චෙතසාපි චිත්තං පජානනති** තම සිතිනුත් අනුන්ගේ සිත් දැනගනිති. **දෙවතාපි ඛො සනති ඉද්ධිමනතිනියො** දෙවියෝ ද මෙසේ ඍද්ධිමත් ප්‍රභාව මහිම ඇතිව සිටිති. **පරචිත්තවිදුනියො** අනුන්ගේ සිත් දැනගන්නා දෙවියෝ ද සිටිති.

ඔලාරිකෙහි වා කිලෙසෙහි කාය දුශ්චරිතාදී තැවීම් වලින්. **මජඣිමකෙහි වා** කාම විතර්කාදියෙන් හෝ. **සුඛුමකෙහි වා** ඤාති විතර්කාදියෙන් හෝ. කාය දුශ්චරිතාදිය කර්මපථ වශයෙන් ද කාම විතර්කාදිය සසරට මුල වූ කෙලෙස් වශයෙන් ද දතයුතුය. ඤාති විතර්කාදියෙහි මගේ නෑයෝ සුවසේ ජීවත් වෙති. සම්පත් විඳිති. මෙසේ පංචකාම සම්පත් නෑයන්ට ඇතැයි ඤාතීන් අරභයා උපන් විතර්කය ඤාතිවිතකෙකා නම් වේ. "මගේ නෑයෝ මැරුණි. වැණසුණු. ශ්‍රද්ධාවන්තයෝ ය. ප්‍රසන්නයෝය." මෙසේ සිතීම ඤාති විතර්කයක් නොවේ. අපගේ ජනපදය සුභික්ෂය. ධනධාන්‍යයෙන් යුක්තයයි සතුටු සිත් ඇති තැනැත්තාට ගෙහසිත වශයෙන් උපන් විතර්කය ජනපද විතර්ක නම් වේ. අපගේ ජනපදයේ මිනිස්සු සැදැහැවත්ය, ප්‍රසන්නය, ක්ෂයවීමට ගියහ. වැයවීමට ගියහ (මැරුණහ) ආදී වශයෙන් මෙසේ පැවති විතර්ක ජනපද විතර්ක නම් නොවේ. නොමැරී සිටීම සඳහා වූ විතර්කය හෝ ආඳකුබඳ විතර්කය **අමරවිතකෙකා** නම් වේ. එහි උක්කුටිකයෙන් සිටීම ආදී දුක් සහිත, ජීර්ණ වූ; "පරලොව සුවපත් ආත්මභාවය වේ. අමරවේවා යි දුෂ්කර ක්‍රියා කරන්නාගේ ඒ දුෂ්කර ක්‍රියාව හා ප්‍රතිසංයුක්ත විතර්කය අමර බව(නොමැරී සිටීම) සඳහා වූ විතර්කයයි. දෘෂ්ටිගතියෙක් "ශාශ්වත යැයි කියන්නෙහි ද?"යි ඇසූවිට "මෙසේ යැයි මගේ අදහසක් නැත. එසේ යැයි මගේ අදහසක් නැත. අන් අයුරකින් යැයි ද මගේ අදහසක් නැත. නැතැයි ද මගේ අදහසක් නැත. නැත්තේ නැතැයි ද මගේ අදහසක් නැත" යනුවෙන් වික්ෂේපයට පැමිණේ. ඔහුට ඒ දෘෂ්ටියෙන් යුක්ත විතර්කය වේ. යම් සේ ආඳා නම් මත්ස්‍යයා දියෙහි දී අල්ලාගෙන මැරීම අසීරු වේ ද ඔබිනොබ පනිනුයේ

අල්ලා ගැනීමට අසමත් වේ ද එලෙසින් ම ස්ථිරව එක් පක්ෂයක, එක් එක් පිළිතුරක සිටීමට අසමත් වූයේනුයි ද 'නමරති' නොමැරේනුයි අමර නම් වේ. ඒ දෙවිදියම එක්කොට "අමර විතර්කය" යැයි කියන ලදී.

පරානුද්දයතා පටිසංයුත්තෙතා කරුණාවට ප්‍රතිරූපක වූ ගෙහාශ්‍රිතව ප්‍රේමයෙන් යුක්ත වූ. උපස්ථායකයන් අඬන කල්හි, වැළපෙන කල්හි ඔවුන් සමඟ දෙගුණව ශෝක කරයි. ඔවුන් සුඛිතව සුවපත් වූ විට තමාද සතුටු වේ. දුකක් ඔවුන්ට පැමිණි විට දෙගුණයක් ව දුක් වේ. කළයුතු කිසි කටයුත්තක් එළඹි කල්හි තමා උත්සාහවත් බවට පැමිණේ. ඒ ඒ ගිහියන්ගේ කටයුතු කර දෙමින් ශික්ෂා ප්‍රඥප්ති ඉක්මවයි. කෙළෙස් ලිහා දැමීම කඩකරයි. කෝපකරයි. යමෙක් ඒ තමා සම්බන්ධ වූ විහාරයෙහි හෝ වියෝගාදී කටයුත්තකදී හෝ ගේහසිතින් ඇඳී බැඳී කටයුතු කරයි ද මෙය පරානුද්දයතා ප්‍රතිසංයුක්ත විතර්කය නම් වේ. **ලාභ සක්කාර සිලොක පටිසංයුත්තෙතා** සිවුරු ආදී ලාභයකින් මෙන් ම සත්කාරයකින් ද කීර්ති ශබ්දයකින් ද යුතු එබඳු දෙයක් අරමුණු කරගෙන පවත්නා විතර්කයයි. **අනවඤ්ඤත්ති පටිසංයුත්තෙතා** යනු "අහෝ මට ඒකාන්තයෙන්ම අන්‍යයෝ අවමන් නොකරන්නෝ නම් මැනවි. අන්‍යයෝ මා හට හෙළා පෙළා කථා නොකරන්නේ නම් මැනවි" මෙසේ අවඥා නොකරත්වා යි පතමින් උපදින විතර්කයයි. යමෙක් ඒ අන්‍යයෝ මා හට අවමන් නොකෙරෙත්වා"යි උපන් විතර්කයෙහි, පංචකාම ගුණ සංඛ්‍යාත ගේහ නිශ්‍රිතව උපන් විතර්කය අනවඤ්ඤත්ති ප්‍රතිසංයුක්ත විතර්කය නම් වේ.

තත්‍ර තත්‍ර සජ්ජති ඒ ඒ අරමුණෙහි ඇලෙයි. **තත්‍ර තත්‍ර ගණ්හාති** කියූ ආකාර ඇති අරමුණට පිවිසෙයි. අල්ලා ගනියි. **බජ්ඣති** ඒ ඒ අරමුණු සමඟ බැඳේ. ඒකීය වේ. **අනයව්‍යසනං** නොවැඩීමට - විනාශයට යයි. **ආපජ්ජති** පැමිණෙයි. **ආමිස චක්ඛුකස්ස** චීවරාදී ආමිෂයන්ට ලොල් වූවහුට. **ලොකධම්ම ගරුකස්ස** ලෝකෝත්තර ධර්මය අතහැර රූපාදී ලෞකික ධර්මයන් ගුරුතන්හි තබාගෙන හැසිරෙන්නාට **ආලපනා** විහාරයට පැමිණි මිනිසුන් දැක; "පින්වත්හු, කුමක් පිණිස පැමිණියාහුද? කිම භික්ෂූන්ට ආරාධනා කිරීමකටද? ඒසේ නම් ඉදින් මෙසේ යවු. මම පසුව ගෙන එන්නෙමි" යි මෙසේ මුලදීම කථා කිරීමයි. නැතහොත් තමා දායකයන් ඉදිරියට ගොස් "මම තිස්ස වෙමි. රජු මා කෙරෙහි ප්‍රසන්නය. අසුවල් අසුවල් ඇමතිවරු ද, මන්ත්‍රීවරු ද මා කෙරෙහි පැහැදුණේය."

මෙසේ තමා හුවා දක්වා කථා කිරීම "ආලපනා" නම් වේ. **ලපනා** යනු පන්සලට පැමිණි දායකයන් විමසූ කල්හි ඉහත සඳහන් අයුරින් පැවසීමයි. **සල්ලපනා** යනු ගහපතියන්ගේ කළ කිරීමේ දී බිය වී, ඔහුන්ට අවසර දෙමින් මඳින් මඳ මනාව කථා කිරීමය. **උල්ලපනා** යනු මහා කෙළඹිය! මහා නැවිය! මහා දානපතිය! මෙසේ දායකයා හුවා දක්වමින් කථා කිරීමයි. **සමුල්ලපනා** යනු සර්වප්‍රකාරයෙන්ම හුවා දක්වමින් කථා කිරීමයි. **උන්නහනා** උපාසක වරුණි, පෙර මෙබදු කාලයෙහි දන් දුන්නෙහුය. කිම දැන් දන් නොදෙන්නහුද? යි විමසූවිට; "ස්වාමීනි දැනුත් දන් දෙනු කැමැත්තෙමු. නමුත් ඊට ඉඩක් නොලබමු." යි දායකයෝ කියති. මෙසේ දිගින් දිගට ආගිය තොරතුරු කථා කිරීමයි. නැතිනම් උක්ගස් අතෙහි ඇති බව දැක "මේ උක් කොතනින් ගෙන ඒ ද?"යි උපාසකවරුන්ගෙන් විමසයි. "ස්වාමීනි, උක් කෙතෙනි"යි කී විට "කිම උපාසකවරුනි එහි උක් රසද?"යි අසයි. එවිට උපාසකවරු "ස්වාමීනි, වළඳාම එය දැනගනු මැනවි"යි කියති. එසේ පැවසූ විට "උපාසකවරුනි, භික්ෂුවට උක් දෙවු"යි කීමට නුසුදුසුය. ආදී වශයෙන් නිරවුල් කරන්දීත් අවුල් සහගතව කරන කථාව **උන්නහනා** නම් වේ. සර්ව ප්‍රකාරයෙන්ම ගෙන, නැවත නැවත කථා කිරීම **සමුන්නහනා**. **උක්කාචනා** "මේ පවුල මා ගැන පමණක්ම දනියි, ඉදින් මේ පවුල වෙත දිය යුතු වස්තුවක් උපදී නම් එය මා හටම දෙයිය"යි. මෙසේ හුවා දක්වමින් කරන කථාව උක්කාචනාවයි. උද්දීපනය යැයි කියන ලදී. සර්ව ප්‍රකාරයෙන්ම නැවත නැවත කරන බොරු උසස් කර දක්වන කථාව **සමුක්කාචනා** නම් වේ. **අනුප්පියභානිතා ප්‍රත්‍ය පිණිස** නැවත නැවත ප්‍රිය වචන කථා කිරීම. **සණ්හවාචතා** මෘදු වදන් ඇති බව, **සබිල වාචතා** මද පමණින් යුතු කථාව හෝ සිනිඳු වචන ඇති බව. **ලිත්තවචනතා** ඇලෙන වචන ඇති බව. **අඵරුස වචනතා** මිහිරි වචන ඇති බව.

පොරාණං මතා පෙත්තිකං පෙර උපන් මාපියන් සතු **අනන්තර හිතං** වැසුණු නොපෙනී ගිය. **ඤායාමි** යනු ප්‍රකට වෙමි. **අසුකස්ස කුලූපගො** අහුවල් ඇමතියාගේ පවුල ඇසුරු කරන්නා **අසුකාය** අසුවල් උපාසිකාවගේ. **මං උජ්ඣිත්වා මා අත්හැර සංයුත්තං** චීවරාදියෙන් යුක්ත වූ. නැතහොත් ඒ සඳහා යොදන ලද මේ ගාථාවේ සියලු නිද්දේසට ඉහත කී පරිදිමය.

මොසවජ්ජේ න නියෝජේ බොරු කීමෙහි නෙයෙදෙවු. **ජීවිතෙන** ජීවත් වීම සඳහා, **සඵො තමා තුළ** නැති ගුණ දැක්වීම් වශයෙන් මනාව

නොකියන ලදී. සර්ව ප්‍රකාරයෙන්ම ඇති කපටිකම **පරිසඨෝ. යං තත්‍ර** ඒ පුද්ගලයා කෙරෙහි යම් සඨං නැති ගුණ දක්වන කපටිකම. **සඨතා** කපටි ආකාරය. **සඨෙය්‍යං** කපටි බව **කක්ඛළතා** නෙළුම් දණ්ඩ මෙන් ස්පර්ශ කිරීමට අපහසු, එරුෂ බව. **කක්ඛළියං** යනු ඒ කර්කශ බවටම යෙදුණු සමාන වචනයකි. **පරිකඩ්ඪතා පරිකඩ්ඪත්තියං** යන දෙපදයෙන් ම සාරා තැබුවාක් වැනි දැඩි කෙරොටික බව අදහස් කරණ ලදී ඇතැමෙක් (අභයගිරිකාදී) "**කක්කරිතා** යනු සම්භාවනය කොට කීමයි. **කක්කරියං** සම්භාවනය කර කියන බවයි. **පරිකඩ්ඪතා** අලංකාර කරණ ආකාරයයි. **පරිකඩ්ඪත්තියං** අලංකාර කරන බව" යැයි අර්ථ වර්ණනා කරති. **ඉදංවුච්චති** යනු මේ අයුරින් තමා තුළ නැති ගුණ ප්‍රකාශ කිරීම් ලක්ෂණය කපටිකම යයි කියනු ලැබේ. ඒ සාඨෙය්‍ය නම් කපටිකමින් යුතු පුද්ගලයා කුසින් හෝ පිටින් දැන ගැනීමට නොහැක.

වාමෙන සුකරෝ හොති දක්ඛිණේන අජාමිගෝ
සරෙන ඵලකොහොති විසාණේන ජරගගවෝ'ති

ඔහු වම්පසින් ඌරෙක් මෙන් වේ. (පෙනේ) දකුණු පසින් එළුවෙක් මුවෙක් මෙන් පෙනේ. ස්වරයෙන් එළුවෙක් වේ. අංවලින් මහලු ගවයෙක් වේ.

මෙසේ කියන ලද ලක්ෂණ ඇති යක්ෂ ඌරෙක් හා සමාන වේ.

අතිමඤ්ඤති අනුන් ඉක්මවා සිතයි. **කිංපනායං බහුලාජීවෝ** මේ බහුලාජීවක පුද්ගලයා නම් කවරේ ද? **සබ්බං සංහක්ඛති** ලද ලද සියල්ල කයි. **අප්ප පුඤ්ඤෝ** මඳ පිං ඇති **අප්පසක්කෝ** පරිවාර සම්පත්තිය රහිතව **පඤ්ඤා සම්පන්නෝ** ප්‍රඥාවෙන් යුක්ත පිරිපුන් ප්‍රඥා ඇති. **පඤ්හං විස්සජ්ජති,** ප්‍රශ්න විසඳති. විවරණය කරති.

සුත්වා දූසිතෝ බහුං වාචං සමණානං වා පුථුවචනානං යනු අන්‍ය වූ බාහිර ශ්‍රමණයන්ගේ ක්ෂත්‍රියාදීන්ගේ හෝ අනෙකුත් බොහෝ පුහුදුන් පුද්ගලයන්ගේ අනිෂ්ට වචන අසා, දූෂිත වූයේ, ගටන ලදුයේ. **න පතිවජ්ජා** පෙරළා පිළිවදන් නොකියන්නේය. කුමක් නිසාද? **නහී සන්තෝ**

පටිසෙනිං කරොනති. රාගාදි කෙලෙස් දහම් සංසිදුණු පුද්ගලයාගේ විරුද්ධ බවක් (කිපීමක්) නොමැති හෙයිනි.

කකඛලෙන දරුණු වූ **සඤ්ඤා** ශාන්ත වූ, නිවුණු කෙලෙස් ඇති බව **පටිසෙනිං** යනු ප්‍රතිවිරුද්ධ බව **පටිමල්ලං** පතිමල්ලව බව. **පටිඝණ්ටං** ප්‍රති වෛර ඇති බව (මහා නිද්දේස පාලි- බු.ජ.ත්‍රි."පටිහඤ්ඤනං" යන වදන ඇත.) **පටිපක්ඛං** කෙලෙසුන්ගේ ප්‍රතිපක්ෂ බව. කෙලෙස් වශයෙන් එක්වීමක් නොකරති යන අර්ථයයි. **එතඤ්ඤව ධම්ම මඤ්ඤාය** මේ සියලු ධර්ම කරුණු ඉහත කියූ පරිදි දැන. **විචිනං** විමසමින් **සන්තිං** නිවේ. **ඤත්වා** රාගාදී කෙලෙස් සංසිදීම නිවන යැයි දැන **සමංච කාය සුචරිතාදිය විසමංච කාය දුශ්චරිතාදිය පථඤ්ච** දශ කුසල කර්මපථය. **විපථඤ්ච** දශ අකුසල කර්මපථය. **සාවජ්ජඤ්ච** අකුසලයද **අනවජ්ජඤ්ච** කුසලයද **හීන පණීත කණ්හ සුක්ක විඤ්ඤුගරහිත පසත්ථං** මෙහි දී කුසලා කුසල කර්මයන්ම අදහස් කරණ ලදි.

එහි කාය සුචරිතාදීයෙන් කෙලෙස් සන්සිඳවීම **සමං.** කාය දුශ්චරිතාදීයෙන් කෙලෙස් විෂම කිරීම **විසමං.** කුසල කර්මපථය, සුගති තමන් පථය වන බැවින් **සුපථං** නම් වේ. අකුශල කර්මපථය සුගති ගමනට විරුද්ධ බැවින් අපායට යන මාර්ගයක් බැවින් **විපථං.** අකුසලය දොස් සහිත බැවින් **සාවජ්ජං** කුසලය නිර්දෝෂ වන බැවින් **අනවජ්ජං.** එසේම මෝහයෙන් හෝ ද්වේෂ මෝහයෙන් හෝ ලෝභ මෝහයෙන් හෝ යුක්ත බව **හීනං** නම් වේ. අලෝභ අදෝස හා අමෝහයන්ගෙන් යුක්ත බව **පණීතං** නම් වේ. කලු, විනාශ දායක විපාක ගෙනදෙන බැවින් **කණ්හං** නම් වේ. සුදු, සුභදායී විපාක ගෙන දෙන බැවින් **සුක්කං** නම් වේ. බුද්ධාදී නුවණැත්තන් විසින් ගරහන ලද බැවින් **විඤ්ඤූගරහිතං.** ඔවුන් විසින්ම ස්තුති කළ ගුණ කියන බැවින් **විඤ්ඤූපසත්ථං** යැයි දතයුතුයි. කුමක් නිසාද? ඉදින් නොපමා වන්නේ කෙසේදැයි දැක්වීමට "**අභිභූසෝ**" යන ගාථාව දැක්වීනි.

එහි **අභිභූ** යනු රූපාදී අරමුණු අභිභවනය කළා වූ **අනභිභූතෝ** ඒ කෙලෙසුන්ගෙන් නොමැඩුණේ **සකඛිධම්මං අනීතිහමදසසි** ප්‍රත්‍යක්ෂයෙන්ම අනීතිහව (තමන්ට ප්‍රත්‍යක්ෂ කරගෙන) ධර්මය දුටු සේක.

සදානමස්සමනුසිකෙඛ සැමදා ඒ බුදුරදුන්ට නමස්කාර කරමින් ත්‍රිවිධ ශික්ෂාවන්හි හික්මෙන්නේය. **කෙහිචි කිලෙසෙහි කිසි** රාගාදී තැවීම් ඇති කරන කෙලෙස්වලින් **අධිභොසි නෙ** ඒ කෙලෙසුන් අභිභවනය කළ සේක. සෙසු පදයන්ගේ අර්ථ ඉතා ප්‍රකටය. හුදෙක් මෙහිදී **චකඛුහි නෙව ලොලො** යනාදියෙහි ඉන්ද්‍රිය සංවරය අදහස් විය. **අන්නානමථො පනානං** යනාදියෙහි රැස්කිරීම් ප්‍රතික්ෂේප කිරීම් සහිත තේමාවෙන් ප්‍රත්‍යය ප්‍රතිසේවන ශීලය(අදහස් වේ). මෞනධර්ම, මුසාවාද, කේලාම් කීම ආදියෙන් ප්‍රාතිමෝක්ෂ සංවර ශීලය අදහස් වේ. **ආථබ්බනං පිසුණං ලකඛණං** ආදියෙන් ආජීව පාරිශුද්ධි ශීලයයි. **ඣායී න පාදලොලස්ස** යන්නෙන් සමාධිය අදහස් විය. **විචිනං භික්ඛු** යන මෙයින් ප්‍රඥාව අදහස් විය. **සදා සතො සිකෙඛ** යන මෙයින් සංක්ෂිප්ත වශයෙන් ත්‍රිවිධ ශික්ෂාවන් අදහස් විය. **අථාසනෙසූ සයනෙසු අප්පසද්දෙසු භික්ඛු විහරෙය්‍ය නිද්දං න බහුලී කරෙය්‍ය** යනාදියෙහි සීල සමාධි ප්‍රඥාදීන්ගේ උපකාර, සංගණ්හනය හා විනොදනය කියන ලදී යයි මෙසේ භාග්‍යවතුන් වහන්සේ, නිර්මිත බුදුරුවට පිරිපුන් ප්‍රතිපදාව දේශනා කොට අර්හත්වය කුළුගන්වමින් දේශනාව නිමා කළ සේක.

සූත්‍ර දේශනාවසානයේදී පුරාභේද සූත්‍රයේ දැක් වූ ආකාරයෙන්ම සත්ත්වයන්ට ධර්මාවබෝධය විය.

දාහතරවන තුවටක සූත්‍ර නිද්දේස වර්ණනාව නිමියේ ය.

15.

පසළොස්වන අත්ත දණ්ඩ සූත්‍ර නිද්දේසයේ **අත්ත දණ්ඩා භයං ජාතං** යන පළමු ගාථාවේ අර්ථය- "ලෝකයාට මෙලොව හෝ පරලොවදී යම් භයක් ඇති වේ නම් ඒ සියලු භය ආත්ම දණ්ඩ භය හේතුවෙන් ඇති වේ. තමාගේ කායාදී දුශ්චරිත හේතුවෙන්ම ඇති වේ. මෙසේ ඇති කල්හි මේ ප්‍රතිවිරුද්ධ වූ ජනයා බලවූ. ඔවුනොවුන්ට විරුද්ධව සිටියා වූ මේ ශාක්‍යාදී ජනයා දෙස බලවූ." මෙසේ ඒ ප්‍රතිවිරුද්ධව සටන් අභිමුඛව එළඹී ජනයාට නින්දා කරමින් තමාගේ සම්‍යක් ප්‍රතිපත්තිය දැක්වීම් වශයෙන් ඔවුන්ට සංවේග දැනවීමට කියන ලදී.

"සංවෙගං කිත්තයිස්සාමි යථා සංවිජිතං මයා" පෙර මවිසින් දැනගත් ආකාරයෙන්, පෙර බෝසත්ව සිටියදී දැනගත් අයුරින් සංවේගය ප්‍රකාශ කරන්නෙමි. **තයෝ** යනු සංඛ්‍යාව දැක්වීමයි. **දණ්ඩා** යනු දුශ්චරිතයන්ය. **කාය දණ්ඩා** යනු කාය දුශ්චරිතයයි. වචී දණ්ඩාදියෙහිද මේ ක්‍රමයමයි. **තිවිධං කායදුච්චරිතං** පර පණ නැසීමේ ආදී කයින් පවත්වන දුෂ්ට චරිතය. කෙලෙස් වලින් කුණු වූ බැවින් හෝ "දුෂ්ට චරිත"යයි ලැබූ නම් ඇති ත්‍රිවිධ වූ කාය දුෂ්චරිත **චතුබ්බිධං** මුසාවාදා දී වාග් දුෂ්චරිත සතරකි. **තිවිධං** අභිධ්‍යාදී වශයෙන් සිතින් වන දුෂ්චරිත තුනකි. **දිට්ඨධම්මිකං** මෙලොවදීම, මේ ආත්ම භාවයේදීම විඳිය යුතු වූ, **සම්පරායිකං** අනාගත ආත්ම භාවයේ විඳිය යුතු වූ **ආගුචාරිං** පව් කරණ අපරාධ කරන රාජා **තං පරිභාසති** පවු කරන්නාට රජු නින්දා කරයි. අපහාස කරයි. **භයං උප්පා දෙති දුක්ඛදෝමනස්සං පටිසංවෙදෙති** කායික දුක්, චෛතසික දොම්නස් විඳියි. **එතං භයං දුක්ඛං දොමනස්සං** මෙබඳු භයක් ද දුකක් ද දොම්නසක් ද **කුතො තස්ස** ඒ සොරාට කොයින් උපදී ද? **අත්ත දණ්ඩතො ජාතං** තමා කළ දුශ්චරිතයෙන් උපන්. **අනත්තමසෝ** යටත් පිරිසෙන් කිවයුත්තෙකු කරයි. **න තෙ ලබ්භා ඉතො පක්කමිතුං** මෙයින්, මෙතනින්, මේ ගමෙන් යෑමට නොලැබේ. **න සක්කා බහි නික්කමිතුං** පළිබෝධ සඳහා කරයි.

ධනජානි පච්චයාපි ධන පරිහානියට හේතු වූ ද; රජු ඔහුට විවිධ කර්ම විවිධ දඬුවම් කරවයි. **කසාහිපි තාළෙන්ති** කසයෙන් තලති.

වෙතෙතනිපි තාළෙනති කටු සහිත වේවැල් වලින් ගසති තලති. **අඩ්ඩදණ්ඩකෙහි** ආදිය ඉහත කිවූ පරිදිමය. **සුණඛෙහිපි ඛාදාපෙනති** කිහිප දිනක් ආහාර **දුරාසදා.** දුටුමතින් හෝ ඇසූ පමණින් හෝ **ලොමානි හංසෙන්ති** ලොමුඩැහැ ගන්නා ස්වභාවය ඇති, බිහිසුණු වූ බැවින් **භිසමා** (භෙසමා) බිය උපදවන බැවින් **පටිභයා.** සැපයෙන් දුරු වූ බැවින් **දුක්ඛා පුරාජීමාය ච භිත්තියා** ආදී ගාථාවන්ගේ "අවීචි නිරය මෙසේය" යනුවෙන් පරියන්ත කර එහි ඇති දුක් සංක්ෂිප්තව පවසන ලදී. ගිනිදැල්වල හෝ සත්ත්වයන්ගේ හෝ දුකෙහි හෝ කෙළවරක්, අතරක් මෙහි නැත්තේනුයි "අවීචි" නම් වේ. එහිදී පෙරදිග බිත්තියෙන් පැනනගින, ගිනි ජාලාව පවුකම් කළ පුද්ගලයන් දවමින් බටහිර දිග බිත්තියේ වැදේ. පහර දේ. ඒ බිත්තිය විනිවිද හාත්පස යොදුන් සීයක් විහිද යයි. යටින් උඩට නැගීම ගිනිදැල් මතුයෙහි සිට ද සත්ත්වයා පීඩාවට පත් කරයි. උඩින් නැගී ගිනිදැල් යටට වැදී පීඩාවට පත් කරයි මෙසේ මේ නරකයෙහි ගිනිදැල්වල අතරක් නම් (නැවැත්මක්) නැත. එහි ඇතුලත යොදුන් සීයක් තැන කිරිවැල් පිටිවලින් (බීරවල්ලිපිටඨ) පිරවූ නැලියක් මෙන් සතර ඉරියව්වෙන් සිටින සත්ත්වයන් අතුරින් නිතර පැසෙන සත්ත්වයන්ගේ ප්‍රමණයක් නම් නැත. ඔවුනොවුන් පෙළීමක් ගැටීමක් නම් නැත. තම තමා සිටින තැනම පැසෙති. මෙසේ මෙහි සත්ත්වයන්ගේ අතරක් නම් නැත. යම්සේ දිව අග මී පැණි බිඳු හයක් ම දමා සත්වැනිව දැමූ තඹ ලෝහ බිඳුව දිව දැමීමට හේතු වේද මීබිඳු ගණන් නොගත යුතු තත්ත්වයට පත් වේද, එමෙන්ම නිරයෙහි දැවීම බලවත් හෙයින් සෙසු අකුසල විපාක උපේක්ෂා සිය ගණන් නොගතයුතු තත්ත්වයට පැමිණේ. දුකම නිරතුරුව ප්‍රකට වේ. මෙසේ මේ නිරයේ ඇති දුක් සහගත භාවයෙහි අතරක්නම් නැත. ආශ්වාද රහිත වූ අරුතින් **නිරයෝ** නම් වේ. **තත්‍ථ සත්ත මහාලුද්දා** එහි උපන් සත්ත්වයෝ මහා රෞද්‍රයෝය. **මහා කිබ්බිසකාරිනෝ** මහත් වූ දරුණු ක්‍රියා කරන්නෝය. **අචන්න පාප කම්මන්තා** ඒකාන්තයෙන්ම පව්කම් කරන්නෝමය. **පච්චන්ති නව මීයරේ** සිව්දිසාවෙන් වැදෙන ගිනිදැල් මැද පැසෙති. නොමැරෙති. **ජාතවෙදසමෝ කායෝ** ඔවුනොවුන්ගේ ශරීරය ගිනි වැනිය. **තෙසං නිරයවාසීනං** ඒ පවුකම් කළ නිරයවාසීන්ගේ. **පසස කම්මානං දළ්හත්තං** පවුකම්වල ස්ථිර දැඩි බව බලව. **නහස්මා හොති න මසි.** අළුද නැත අඟුරුද නැත. **පුරාජීමෙන** යම්කිසි කලෙක ඒ නැගෙනහිර ද්වාරය විවෘත වූ කල්හි ඒ දිශාවට දුවති. එහිදී ඔවුන්ගේ සම් ආදිය දැවී යයි. දොර සමීපයටම පැමිණිවිට එය වැසී යයි. බටහිර දිශාවේ දොර ඇරුණාක් මෙන් පෙනේ. සියලු තන්හි මේ ක්‍රමයයි.

නික්ඛමිතාසා තෙ නිරයෙන් නික්මවීමට ආශාව මොවුන්ට ඇත්තේනුයි. නික්ඛමිතාසා. **මොක්ඛගවෙසිනො** මිදෙන උපායක් සොයන නමුත් ඔවුහු ඉන් මිදීමට මඟක් නොලබති. **කම්ම පච්චයා** ඒ සත්ත්වයෝ නිරයෙන් නික්මෙන දොරටුව පාපකර්ම හේතුවෙන්ම නොදැන ගනිති. **තෙසං ච පාපකම්මං අවිපක්ක විපාකං කතං බහුං** ඒ සත්ත්වයෝ ළාමක දරුණු කර්ම, නොපැසුණු විපාක ඇති බොහෝ වූ නානාප්‍රකාර නොදුන් විපාක ඇති පාපකර්ම කළාහු, රැස් කළාහු වෙති. **සංවේගං** සංවේගය ලැජ්ජා වීම **උබ්බගං** සිටින තැනින් යෑම. **උත්‍රාසං** තැති ගැනීම, අස්ථිර බව. භයං සිතේ හටගත් බිය උත්‍රාසය. **සට්ඨනං** පෙලීම, ගැටීම. **උපද්දවං** විපත, උපද්‍රවය. **උපසග්ගං** නිරුද්ඛනය, ඇවිරීම.

දැන් මොහු විසින් මනාව දිනන ලද ආකාරය දක්වමින් **එඤ්ජමානං** යනාදී ගාථාව වදාළහ. එහි **එඤ්ජමානං** කම්පනය වන සැලෙන. **අපොදකෙ** දිය කඩිත්තක. **අඤ්ඤමඤ්ඤෙහි** බ්‍යාරුද්ධ **දිසවා** නානාවිධ සත්ත්වයන් අන්‍යෝන්‍යව විරුද්ධ වූවන් ද දැක. **මං භයමාවිසි** මා කරා භය පැමිණියේය. **කිලෙස එඤ්ජනාය එඤ්ජමානං** රාගාදී කෙලෙස් චලනයෙන් සෙලවෙනුයේ **පයොගො** කාය වාග් මන ප්‍රයෝග **විරුද්ධා** විරුද්ධ බවට පැමිණියෝ. **පටිවිරුද්ධා** ප්‍රතිමුඛව විරෝධභාවයට පැමිණියෝ. කිපියෝ හෝ විරුද්ධ වූවෝ. ආහතා ක්‍රෝධයෙන් පහර දුන් ගසන ලද **පච්චාහතා** ප්‍රතිමල්ලයෝ වී පහර දුන් **ආඝටිකා** ගැටුණු. **පච්චා ඝටිතා** විශේෂයෙන් ගැටුණු. **පාණිහිපි උපක්කමන්ති** අතින්ද ගසති **සමන්තමසාරො ලොකො** නිරය මුල් කරගත් හාත්පස වූ ලෝකය අසාරය, නිත්‍ය හර ස්වභාවයෙන් තොර දිසා **සබ්බා** සමෙරිතා සියලු දිශාවන් අනිත්‍ය ස්වභාවය නිසා කම්පනය විය. **ඉච්ඡං භවනමත්තනො** තමාට ත්‍රාණයක් පිහිටක් කැමති වන්නේ **නාද්දසාසිං අනොසිතං** කිසිතැනෙක ජරා දියෙන් නොතැවරුණු තැනක් නොදුටුවෙමි. **අසාරො** හරයක් සාරයක් නැත. නැතහොත් සාර විරහිතය. **නිස්සාරො** සියල්ලෙන් සියල්ල සාරවිරහිතය. **සාරාපගතො** සාරයෙන් පහ විය. **නිච්චසාර සාරෙනවා** නිතර සාරසංඛ්‍යාත වූ සාරයෙන් හෝ මතුයෙහි එන පද දෙකෙහිද මේ ක්‍රමයෙන් අර්ථ ගතයුතු. **යෙ පුරත්ථිමාය දිසාය සංඛාරා** පෙරදිග යම් සංස්කාරයක්, ප්‍රත්‍යය එකතු වීමෙන් හේතුප්‍රත්‍ය සමවායෙන් කරන ලද සංස්කාරයක්. **තෙපි එරිතා** ඒ සංස්කාරයෝ ද කම්පා කරන ලදී. **සමෙරිතා** මැනවින් කම්පා කරන ලදී. **චලිතා** චලනයට ගියේය. **ඝට්ටිතා** උදයව්‍යයයෙන් පෙළෙන ලදී. **අනිච්චතාය** වී අභාවයට

යන බැවින්. **ජාතියා අනුගතා** ඉපදීමට පැමිණියේය. **ජරාය අනුසටා** ජරාවෙන් මුහුකුරා යෑමට පැමිණියේය. **බ්‍යාධිනා අභිභූතා** ධාතු විෂම වීමෙන් උපන් ව්‍යාධියෙන් මඬන ලදී. **මරණෙන අබ්භාහතා** මාරයා විසින් මනාව පහර දෙන ලදී. **ආතාණා රක්ඛා විරහිතය.** **අලෙණා** රැකවරණ රහිතය. **අසරණා** මොවුන්ට කිසි සරණක් නැත්තේනුයි අසරණය. **අසරණීභූතා** තමා කිසි සරණක් පිහිටක් නොකරත්නුයි අසරණ වූ.

අත්තනෝ භවනං යනු නිද්දේස පදයේ උද්දේසයයි. **තාණං** පාලනය. **ලෙණං** රැකවරණ ස්ථානය. **සරණං** දුක් නැසීමයි. **ගතිං** පිහිටයි. **පරායනං** පරංඅයනං, පිහිට, පරම ප්‍රතිෂ්ඨාව. **අජ්ඣොසිතංයෙව අද්දසං** ජරාදියෙන් මඬනා ලද්දෙකුම දුටුවෙමි. **සබ්බං යොබ්බඤ්ඤං** යෞවන බව, යෞවනත්වය යොබ්බඤ්ඤ නම් වේ. චේතනා සහිත සියලු යොවුන් බව. **ජරාය ඔසිතං** මුහුකුරා ගිය ජරාවෙන් මඬනා ලදී. වැසුණි. මෙසේ සියලු තැන්හි අර්ථය ගතයුතුයි.

ඔසානෙ ත්වෙව බ්‍යාරුද්ධෙ දිස්වා මෙ අරති අහු යෞවනාදියේ, අවසානයෙහිම, අස්තංගමයේ දී ම, පරිනාමයේ දී, මෙසේ විනාශයට යන, මෙසේ ජරාදිය සමඟ විරුද්ධ වූ, ඉන් පහරදුන් සිතැති සත්ත්වයන් දැක මට අතිර සිතක් පහළ විය. **අථෙසා සල්ලං** අනතුරුව, මේ සත්ත්වයන් කෙරෙහි වූ රාගාදී හූල **හදයනිස්සිතං** සිත ඇසුරු කළ, යොවුන් බව ජරාව විසින් වනසා දැමෙයි. අවසාන කෙරෙයි. මෙසේ සියලු තැන් පවත්නා කථාව හුලකි.

යෙනසල්ලෙන ඔතිණ්ණා යන ගාථාවේ යම් රාගාදී ශල්‍යයකින් විදින ලද **ද දිසා සබ්බා විධාවති** සියලු දුශ්චරිතාදී දිශාවන්ට පෙරදිග ආදී දිශාවන්ට ද ගති දිශාවන්ට ද දුවයි. **තමෙව සල්ලං අබ්බුයහ න ධාවති න සීදති.** ඒ හූලම උඩට ගෙන, උදුරා ගන්නා ලද්දේ නම් එවිට දිශාවන්හි නොදුවයි සතර ඕඝයන්හි ද නො ගැලේ. **අඤ්ඤාණං** ආදියෙහි ඤාණ දර්ශනයට විරුද්ධ වූ බැවින් නොදැනීම, නොදැකීමයි. අභිමුඛ වී ධර්මයෙන් අවබොධ නොවේ. වැටහිමට නොපැමිණේනුයි **අනභිසමයො.** අනුරූප වශයෙන් ධර්මය අවබෝධ කරගනියිනුයි **අනුබොධො** ඊට විරුද්ධ වූ බැවින් **අනනුබොධා.** අනිත්‍යාදී ධර්ම සමඟ යොදා අවබෝධ කර නොගනියිනුයි **අසම්බොධො** ආශාන්ත වූ අසම වූවක් අවබෝධ කර ගනිනුයි ද අසම්බෝධ නම් වේ. චතුරාර්ය සත්‍ය ධර්මය අවබෝධ

නොකළේනුයි. **අපපටිවෙධෙ.** රූප ආදියෙහි එක් ධර්මයක්වත් අනිත්‍යාදී සාමාන්‍ය ධර්මවශයෙන් නොගන්නේය. අරුතින් **අසංගාහනා.** එම ධර්මය හාත්පසින් බැලීමෙක් නැත්තේනුයි. **අපරියොගාහනා.** නොබලන්නේනුයි **අසමපෙක්ඛනා.** ධර්මයන්ගේ ස්වභාවය ප්‍රත්‍යවේක්ෂා නොකරයිනුයි **අපච්චවෙක්ඛනා.** කුසලාකුසල කර්මන්හි විපරීත වූ පැවතුම් ඇති හෙයින් හෝ ස්වභාවය ගැනීමෙන් දුරු වූ හෙයින් හෝ එකම කර්මයක්, මොහුට ප්‍රත්‍යක්ෂවූවක් නැත. තමා ම හෝ කිසිදු දහමක් ප්‍රත්‍යක්ෂ කරගැනීමක් නම් නොවේ යන අරුතින් **අපච්චක්ඛ කම්මං** නම් වේ.

පිරිසිදු පවිත්‍ර සිත් නූපදනා කල්හි චිත්ත සන්තානය අපවිත්‍ර වන්නේනුයි **දුම්මෙජක්ඛං** එය මෙයින් දූෂිතය, අපවිත්‍රය යනුයි. බාල බව බාල්‍යං මුලා වේනුයි **මොහෙ** ඉතා බලවත් මෝහය **පමොහෙ.** හාත්පසින් මුලා වේනුයි **සම්මොහෙ** විද්‍යාවෙන් විරුද්ධ වූ හෙයින් නොදනීනුයි **අවිජ්ජා.** ඔඝ යෝගාර්ථ ඉහත පැවසූ පරිදිමය. තදින්ම සිතේ තැන්පත්ව අත්නොහැර පවතිනුයි **අනුසයෝ** සිත මැඩගෙන නගියි, අභිභවනය කරයිනුයි. **පරියුට්ඨානං** හිත වූ දෙය නොගන්නා බැවින්, යහපත් කරුණු පෙරදැරිව යෑමට අසමත් වේ. ඒකාන්තයෙන් ම පවෙහිම ලග්නේය යන අරුතින් **ලංගී** නො ඇලේ යන අරුතයි. උදුරා දැමීමට අපහසු අර්ථයෙන් හෝ ලංගී නම් වේ. යම්සේ මහා ද්වාරයේ දොර අගුල නම් ලංගිය උගුලා දැමීම අපහසුවේ ද එමෙන් වූ අකුසල් නැමති ලංගිය වේ යන අර්ථයයි. සෙසු පදයන්ගේ අර්ථය සුගම ය.

යම් මෙබදු සැකයක් වේ නම් මෙහි සැක කිරීම් වශයෙන් **කංඛා,** සැකයට පැමිණේනුයි **කංඛායනා,** මුල් සැකයෙන් පසුව ඇතිවන සැකය පැමිණේනුය "ආදියති" නම් වේ. නැතහොත් ආකාර වශයෙන් මෙය කියවන ලදී. සැකයෙන් යුක්ත සිත, සැකයෙන් පිරුණු හෙයින් **කංඛායිතං** නම් වේ. එහි ස්වභාවය **කංඛායිතත්තං** නම් වේ. **විමති** යනු දුරු වූ බුද්ධිය" විමතියයි. **විචිකිච්ඡා** දුරුවූ කිච්ඡාව විචිකිච්ඡාව යි. ස්වභාවය හෝ සොයමින් මෙයින් වෙහෙසට පත්වේ. ක්ලාන්ත වෙනුයි විචිකිච්ඡා නම් එය සංසය ලක්ෂණ කර ඇත. කම්පනය රසය කර ඇත. අනිච්ඡය පච්චුපට්ඨානය කර ඇත. නැතහොත් අනෙකංසග්‍රාහය පච්චුපට්ඨාන කර ඇත. විචිකිච්ඡාව අයොනිසෝ මනසිකාරය පදට්ඨානය කර ඇත. ප්‍රතිපත්තියට අන්තරාය කරන්නේ යැයි දතයුතුයි. කම්පණය වන අර්ථයෙන් දෙපරිදිව බෙදේනුයි **දෙවළහකං.** ප්‍රතිපත්තිය වැලැක්වීමෙන්

දෙකට බෙදූ පථයක් මෙන් වේනුයි **දෙධාපථෝ**. මෙය නිත්‍ය හෝ අනිත්‍ය ආදී වශයෙන් පැවති එකම ආකාරයකින් සිටීම ට අසමත් බැවින් හාත්පසින් ම සැකකෙරේනුයි **සංසයෝ**. ඒකාන්තයෙන් ගැනීමට අසමත් බැවින් න එකංසගාහොයි **අනෙකංසගාහෝ** අරමුණු නිශ්චය කිරීමට අසමත්ව, ආරම්මණයෙන් පසුබසීනුයි **ආසජ්ජනා**. ග්‍රහණය කරගැනීමට අසමත්ව හාත්පසින් ගමන් කරයි නුයි **පරිසජ්ජනා**. අරමුණට බැස ගැනීමට අසමත් බැවින් **අපරියොගාහණ**. අනිශ්චය වශයෙන් අරමුණේ පැවතීමට අසමත් බැවින් **ජම්හිතත්තං** තැති ගැන්මක් යන අර්ථයයි. විචිකිච්ඡාව ඉපදී සිත තද කරයි. එය උපදින්නා වූ අරමුණ මනස (සිත) ලියා දමන්නාක් මෙන් වන හෙයින් **මනෝ විලෙඛෝ** යි කියන ලදී. විද්ධෝ සැරයෙන් (ඊතලයෙන්) ලැබූ පහර ඇති (විදිනලද) වූටෙඨෝ ගටනා ලදී. **පරෙතෝ** පෙළෙන ලද. **ධාවති** ඉදිරියෙන් දුවයි. **විධාවති** අනේකවිධව යයි. **සන්ධාවති** වේගයෙන් දුවයි. **සංසරති** ඔබිනොබ හැසිරෙයි. **අචෙලකෝ**, නිර්වස්ත්‍ර, නග්න, **මුත්තාචරෝ** හැරදැමූ හැසිරීම් ඇති. මල මූත්‍රා කිරීම් ආදියෙහි ලෞකික කුල පුතුන් හැසිරෙන ආකාරයෙන් දුරස්ව, සිටගෙනම මල මූත්‍රා කිරීම කරයි. කයි, බොයි. **හත්ථාපලෙඛනෝ** අතෙහි පිඬ නිමවූ කල්හි දිවෙන් අත ලෙවකයි. මූත්‍රා කිරීම හෝ කර අතෙහි ම "දණ්ඩක්" යන සංඥාව උපදවා අතින් හූරා දමයි. ඔවුහූ වනාහි දණ්ඩ "සතෙකුයැ"යි පනවති. භික්ෂාව පිළිගැනීමට "ස්වාමීනි, එන්න" යි කී කල්හි නො පැමිණේනුයි **න එහි භදන්තිකෙ**. "එසේ නම් ස්වාමීනි සිටින්න"යි කී කල්හි නොසිටින්නේනුයි **න තිටඨභදන්තිකෝ**. ඒ දෙකම ඔහු "මොහුගේ වචනය කරන ලදී" වන්නේයැයි නොකරයි. **අභිහටං** මුලදී ම ගෙන එළවූ භික්ෂාව. **උද්දිස්සකතං** මෙය නුඹවහන්සේ සඳහා කරන ලදී යැයි කියා දෙන භික්ෂාව. **න නිමන්තණං** "අසුවල් කුළයට හෝ පිවිසෙන්න" යි මෙසේ ආරාධනා කළේ නම් එම භික්ෂුව ද නො පිළිගනී යි. **න කුමහිමුඛා** සැලයේ දමාගෙන විත් දෙන භික්ෂාව නොගනියි. **න ඛලොපිමුඛා** "බල" යනු සැළියක් හෝ පැසකි. එයින් දෙන භික්ෂාව ද නොගනී. කුමක් නිසාද? කළය හා පැස මා නිසා හැදිපහර ලබයි යනුවෙන් සිතා නොගනියි. **න එළකමන්තරං** එළිපත මැද සිටින සේ දෙනු ලබන දෙය නොගයි. කුමක් නිසාද? "මා නිසා අන්තරකරණය ලබයි"යැයි සිතන හෙයිනි. දඬු මොහොල් අතර ද මේ ක්‍රමයමය. **ද්වින්නං** දෙදෙනෙක් වළඳමින් සිටි තැනින් එක් අයෙක් නැගිට දෙන කල්හි එය නොගන්නීය. මා නිසා බත් පිඬට අනතුරක් වන්නේ යැයි සිතන හෙයිනි. **න ගබ්භිනියා** ආදියෙහි

ගැබිනියගේ කුස හොත් දරුවා වෙහෙසේ යැයි නොගනියි. **පායන්තියා** දරුවාගේ කිරි බීමට අනතුරක් වේ යැයි නොගනියි. **පුරිසන්තරගතාය** රතියට අනතුරක් වේ යැයි නොගනියි. **න සංකිත්තීසු** සංකීර්තනය කර (ගුණ කියා) කළ බතෙහි.

දුර්භික්ෂ සමයේ අචේලක ශ්‍රාවකයෝ සඳහා ඒ ඒ තැනින් සහල් ආදිය සපයාගෙන බත් පිසති. උසස් අචේලකයා ඉන් නොපිළිගනියි. **න යත්ථ සා කෑම පිණිස පැමිණ සිටි සුනඛයෙකු සිටින විට, ඌට නොදී තමාට එළ වූ පිණ්ඩපාතය නොපිළිගනී.** කුමක් නිසා ද? බල්ලාගේ ආහාරයට අනතුරක් වේ යන හැඟීමෙනි. **සණ්ඩ සණ්ඩ චාරිණී** සමූහ සමූහව හැසරෙන, ඉදිං අචේලකයකු දැක "මොහුට භික්ෂාව දෙන්නෙමු"යි මිනිස්සු බත් ගෙයට පිවිසෙති. ඔවුන් පිවිසෙන විටදී සැලි කටවලින් නිල මැසි, මදුරු ආදීහූ නැගී සමූහ සමූහව ඉවත්ව යති. එතැනින් ගෙන භික්ෂාව නො ගනියි. කුමක් නිසාද? "මා නිසා මැස්සන්ගේ භෝජනයට අනතුරක් විය" යනුවෙන් සිතන නිසයි. **ථුසොදකං** සියලු ශස්‍ය දමා සෑදූ සෝවීරක පානය. මෙහිදී සුරා පානයම සාවද්‍යය. මෙහිදී සියල්ල කෙරෙහි සාවද්‍යය යන සංඥාව ඇත. **එකාගාරිකො** යමෙක් එකම ගෙයක භික්ෂාව ලැබ නැවතෙයි. **එකාලොපිකො** යනු එකම බත් පිඬකින් යැපෙයි. **ඛාගාරික** ආදියෙහිද මේ ක්‍රමයෙන් අර්ථ දතයුතුයි. **එකිස්සපි දත්තියා** එක් දත්තියකින් යැපෙයි. දත්තිය නම් එක් කුඩා පාත්‍රයකි. තලියකි. එහි අග්‍ර භික්ෂාව දමා තබති. **එකාහිකං** එක් දවසක් අතර කළ ආහාරය. **අඩ්ඩමාසිකං** අඩමසක් අතර කළ **පරියාය භත්ත** භෝජනං වාර බත් භෝජනය, එක් දින වාරයෙන්, දෙදවස වාරයෙන්, සත්දින වාරයෙන් මෙසේ දින වාර වශයෙන් පැමිණි.

බත් භෝජනය **සාකභක්ඛා** ආදියේ අර්ථ ප්‍රකටය. **උබ්භටඨකො** ආසන ප්‍රතික්ෂේප කර උඩුකුරුව සිටියි. **උක්කුටිකප්පධාන මනුයුත්තො** උක්කුටික වීර්යයෙහි යෙදුණු යන්නේ ද උක්කුටිකවම පැන පැන යයි. **කණ්ටකා පස්සයිකො** යකඩ කටු හෝ ස්වභාවික කටු හෝ ගෙන බිම සාරා තබා, එහි සම්කඩ අතුරා සිටීම්, සක්මන් ආදිය කරයි. **සෙය්‍යං** නිදන්නේද එහිම සයනය කරයි. **එලක සෙය්‍යං** ගස් එලක සෙය්‍යාව. **ඵණ්ඩිල සෙය්‍යං** ඵණ්ඩිලයෙහි උස් බිම නිදීම **එක පස්සයිකො** එක පසකින්ම නිදයි. **රජො ජල්ලධරො** ශරීරය තෙලින් පිරිමැද දූවිලි නඟින

තැන සිටියි. එවිට ඔහුගේ මුලු සිරුරම දූවිලි වලින් ඇලුණේ වේ. ඔහු එසේ සිටී. **යථා සත්තීතිකෝ** ලැබූ අසුන වෙනස් නොකර යම් සේ ලබයිද එහිම හිඳින ස්වභාව ඇත. **වෙකටිකෝ** මෙහි **විකටං** යනු අසූචි කියනු ලැබේ. **ආපානකෝ** ප්‍රතික්ෂේප කළ සීත දිය පාන ඇති. සවස තුන් වැනි වූයේ නූයි **සායතතියකං** නම් වේ. උදෑසන, මධ්‍යාහ්නය හා සවස යැයි දවසට තෙවරක් පව් සෝදා හරිමි යි දියෙහි කිමිදීම ආදියෙහි යෙදී වාසය කරයි. **තෙ සල්ලෙ අභිසංඛරොති** ඔවුහු රාගාදී හුල් සත උපදවති. **අභිසංඛරොන්තෙ** උපදවන්නේ **සල්ලාභිසංඛාරවසෙන** හුල් (සල්ල) උපදවන්නාවූ හේතු කාරණා **පුරත්ථිමං** දිසං **ධාවති** පෙරදිගට යයි. **තෙ සල්ලාභිසංඛාරානං අපහීනත්තා** ශල්‍ය (හුල්) ප්‍රයෝගයන්ගේ අප්‍රහීණභාවයෙන් **ගතියා ධාවති** ගතියට දුවයි. **ගතියාගතිං** ගතියෙන් ගතියට **නසීදති** නොකිමිදේ. **න ඔසීදති** නොබැසගනියි. **න අවසීදති** ඇතුලට නොපිවිසෙයි.**න අධොගච්ඡති** යටට නොයයි. මෙසේ මහානුභාව වූ හුලෙන් විඳින ලද සත්ත්වයන් කෙරෙහි.

තත්‍ර (තත්‍ථ) සික්ඛානුගීයන්ති යානි **ලොකෙ ගධිතානී (ගථිතානි)** යන ගාථාවෙහි අර්ථ - යමෙක් සත්ත්වලෝකයෙහි යම් පංචකාම ගුණයක් වේ නම් එය ලබා ගැනීමට හිජුවන්නේනුයි **ගධිතානී** යැයි කියනු ලැබෙති. නැතහොත් බොහෝ කාලයක් සේවනය කරන ලද හෙයින් හෝ ගධිතානි යැයි කියති. එහිදී ඒ නිමිති කරගෙන හස්ති ශික්ෂාදී (හස්ති ශිල්ප) නොයෙක් විධ ශික්ෂාවන් කියනු ලැබෙති. නැතහොත් ඉගෙන ගනිති. මේ ලෝකයේ පණ්ඩිත නුවණැති එහෙත් ප්‍රමාදී වූ කුලපුත්‍රයා දෙස බලවු. ඒ පස්කම් ගුණයෙහි හෝ හස්ති ශික්ෂාදියෙහි හෝ හිජු වූ කල්හි අධිමුක්තියෙක් (ඉන් මිදුනෙක්) නම් අනෙක් අතට අනිත්‍යාදිය දැකීමෙන් සියලු ආකාරයෙන් කාමයෙහි කළකිරී තමාගේ නිවනෙහිම හික්මෙන්නේය. **පටිවිජ්ඣිත්වා** ඥාණයෙන් නික්මී කාමය කෙරෙහි කළකිරී හෝ දැන් යම්සේ නිවන පිණිස හික්මිය යුතුවේද එය දක්වමින්.

සච්චෙ සියා යන ගාථාව වදාළහ. එහි **සච්චෙ** වාචා සත්‍යයෙන් ද ඤාණ සත්‍යයෙන් ද මාර්ග සත්‍යයෙන් ද යුක්ත වූ **රිත්ත** පෙසුණෙ පිසුණුකීම ප්‍රහීන කරන ලද **වෙචිච්ඡං** මසුරුකම **නිද්දං තන්දිං සහෙ ථීනං** යනු නිදාවැටීම ද කය අලසකම ද සිත අලසකම ද යන මේ ධර්ම තුන මැඩලා සිටින්නේය. **නිබ්බාණ මනසො** නිවනෙහි නැමුණු සිත **කායස්ස අකල්ලතා** ස්කන්ධත්‍රය සංඛ්‍යාත නාමකයේ පහත් කර බැඳීමක්. හාත්පසින්

බැඳීමෙක් රෝගියා අකල්ලක යැයි කියනු ලැබේ. විනයෙහි ද කියන ලදී. "නාහං භන්තෙ අකල්ලකෝ" ස්වාමීනි! අකල්ලකයෙක් නොවෙමි. **අකම්මඤ්ඤතා** කායික ගිලන් බව නම් වූ අකර්මණ්‍ය බව ඇති කරන. අහසට මේඝය මෙන් කය පහත් කර බැඳලානූයි **ඔනාහෝ** සර්වප්‍රකාරයෙන්ම බැඳ වෙළා දැමීම **පරියෝ නාහෙ**. අභ්‍යන්තරයේ ඇවිරීමක් ඇත්තේනුයි **අන්තෝ සමොරොධෝ**. නිදනුයේනූයි **මිද්ධං** අකර්මණ්‍යභාවයෙන් පෙළීමයි, හිංසා කරයි යන අර්ථයයි. නිදති, සයනය කරතියිනූයි. **සුප්පං** ඇසිපිය හෙළමින් ආදිය කරමින් කපි නිද්‍රාව ඇත්තේනුයි **පචලා යිකා**. නිදීමෙන් නිදි ආකාරයෙක් යනුවෙන් ආකාර ස්වභාවය දැක්වීමයි. ඔලීයනා නිදන ආකාරයයි. දෙවනි උපසර්ග වශයෙන් වඩන ලදී. **ලීනං** යනු පැකිලීම් නැති බැවින් හැකිලීමයි සෙසු දෙපදයෙන් ආකාර බව දැක්විනි. **ථීනං** යනු "ගිතෙල් පිඩක් මෙන් නොපැතිරී යන ඝන ස්වභාවයෙන් සිටී" යන අරුතයි. **ථීයනා** යනු ආකාර නිද්දේසයයි. නොපැතිරුණු බව **ථීයිතත්තං**. නොපැතිරීම් වශයෙන් බැඳී සිටින යන අරුතයි. **සබ්බ සංඛාරධාතුයා** සියලු ත්‍රෛභූමික සංඛ්‍යාත සංස්කාර ධාතුවෙන්. **චිත්තං පටිවාපෙත්වා සිත නවත්වා එතං සන්තං** මේ නිවන කෙලෙස් ශාන්ත භාවයෙන් ශාන්තය. නොතවයි, පීඩා නොකරයි අරුතින් **ප්‍රණීතං** ප්‍රණීතය.

පණ්ඩිතා උපධිසුකස්ස හෙතු පණ්ඩිත වූ, කාම සුඛයට හේතු වූ **දානානි දදන්ති කාමඤ්ච තෙ උපධිපරික්ඛයාය** ඒකාන්තයෙන්ම ඒ පඬිවරු කාමක්ෂය කරණු පිණිස, කාම සම්පත් විෂයෙහි ආශාව ක්ෂය කිරීමට දන් දෙති. **අපුනබ්භවාය** නිවන පිණිස **ඣානානි භාවන්ති** පඨමජ්ඣානාදිය වඩති. **පුනබ්භවාය** පුනර්භවය ඇති කරන ඒ පඬිවරු නිවණම අරමුණු කරගන දන් දෙති. **සාහසා** යනු රාගයෙන් රත් වූවහුගේ රාග චර්යාව ආදී භේද, සැහැසි කාරණයි.

පුරාණං නාභිනන්දෙය්‍ය අතීත වූ රූපාදී අරමුණු පිළිබඳ නො සතුටු වන්නේය. නවෙ වර්තමානයේ. **හීනමානෙ** විනාශ වන කල්හි. **ආකාසං න සිතො සියා** තණ්හාව ඇසුරු කළ අයෙක් නොවන්නේය. තණ්හාව වනාහි රූපාදියේ ආකර්ශනය කිරීමෙන් "ආකාශය" යැයි කියනු ලැබේ. වෙමානෙ නොවන කල්හි, **විගච්ඡමානෙ** පහව යන කල්හි ආකාසති, ආකස්සති යැයි පාඨ දෙකකි. කුමන කරුණකින් තණ්හාව ඇසුරු නොකළේ ද?

මම වනාහි මේ **ගෙධං බ්‍රූමි** යන ගාථාවේ අර්ථය.- මම වනාහි මේ ආකාස නම් වූ තණ්හාව රූපාදියෙහි ගිජු වන බැවින් "ගෙධ" යැයි කියමි. "බලවත් ඇල්ම" යැයි ද කියමි. වැඩිදුර අර්ථ කියනු කුමටද? ගසාගෙන යන බැවින් **ඔඝො** යි ද දිවෙන හෙයින් **ආජවං** යි ද මේ මගේ යැයි ජල්පන කිරීම වශයෙන් **ජප්පනං** යි ද මිදවීම අපහසු අර්ථයෙන් **ආරම්මණං** යි ද කම්පා කරන අර්ථයෙන් **පකම්පනං** යි ද කියමි. මේ කාමයද ලෝකයේ පළිබෝධාර්ථයෙන් ද ඉක්මවීමට අපහසුය යන අර්ථයෙන් ද **කාමපංකො දුරච්චයො** යනු වේ. **ආජවං** යනු ප්‍රතිසන්ධියේ පටන් දුවයි, ජවන කරයි අරුතින් ආජව නම් වේ. සංසාර පැවැත්මට මූලාධාර වූ බැවින් පුනර්භවයේ ප්‍රතිසන්ධිය ගෙන දෙන තණ්හාවට තවත් නමෙකි. **ජප්පනං** ප්‍රාර්ථනා කරන තණ්හාවට මේ යෙදූ තවත් නමෙකි. **ආරම්මණම්පවුච්චති තණ්හා** රූපාදී අරමුණුවල උපන් තණ්හාවෙන් මිදීමට අසමත්ය යන අර්ථයෙන් අරමුණක් යැයි කියනු ලැබේ.

කාමපංකො ගිලා බස්නා අරුතින් කාමය මඩවගුරකි. **කඳ්දමො** සංඝ (ඇලීම්) අර්ථයෙන් මඩවගුරකි. තවත අර්ථයෙන් **කිලෙසො.** ලාටුමෙන් ඇලෙන අර්ථයෙන් **පලිපො.** අවහිර කර ධාරණය කර ගන්නා අරුතින් බළිසො. මේ ආකාරයෙන් ගෙධා දී පර්යාය වශයෙන් දැක් වූ ආකාස නම් තණ්හාව අනිශ්‍රිතය. එය එසේමය.

සච්චා අවොක්කම්ම යන ගාථාවේ අර්ථය - පෙර කියන ලද ත්‍රිවිධාකාර සත්‍යයන් නොඉක්මවා මෝනෙය්‍ය බවට පත් වීමෙන් "චුති" යැයි සංඛ්‍යාවට ගිය, ඒ ක්ෂීණාස්‍රව බ්‍රාහ්මණයා නිවන් ඵලයෙහි සිටියි. මෙබදු වූ ඔහු සියලු ආයතන අත්හැර "ශාන්ත" යැයි කියනු ලැබේ. නිද්දේසයේ අර්ථ කිව යුතු අමාරු වචන නැත.

බොහෝ සෙයින් කියනුයේ කුමට ද? **සවෙ විඳ්වා** යන ගාථාවයි. එහි **ඤත්වා ධම්මං** අනිත්‍යාදී වශයෙන් සංඛත ධර්ම දැනගෙන **සම්මා සො ලොකො ඉරියාතො** අයහපත්ව ඉරියවු පවත්වන කෙලෙසුන් ප්‍රහානය කළ බැවින් ඔහු සත්ත්ව ලෝකයේ මනාව ඉරියවු පවත්වන්නේය. මෙසේ ආශා නැති බව දක්වනු සදහා

යෝධ කාමෙ යන ගාථාව දේශනා කරන ලදී. එහි **සංගං** සත් වැදෑරුම් සංගය යමෙක් ඉක්මවූයේ ද ඔහු **නාඡ්ඣෙති** දැඩි ලෙස ආශා

නොකරයි. එනිසා නුඹලා අතුරෙන්ද යමෙක් මෙබඳු ස්වරූප ඇත්තෙක් වීමට කැමති වේ ද එය කියමි. යි දක්වමින්

"යං පුබ්බෙ" යන ගාථාව කියන ලදී. එහි පුබ්බ යනු අතීත සංස්කාරයන් අරබයා උපදින ධර්ම, කෙලෙස්වලින් හටගත් අතීත කර්මයද වේ. **පච්ඡා තෙ මාහු කිඤ්චනං** අනාගතයේ ද සංස්කාරයන් අරබයා උපදින ධර්ම, රාගා දී කිඤ්චන නොවේවා. **මජ්ඣෙ වෙ නො ගහෙස්සසි** ඉදින් වර්තමාන රූපාදි සංස්කාර ධර්ම නොගන්නෙහි නම් මෙසේ උපශාන්ත වන්නේ හැසිරෙන්නෙහිය. **අබීජං කරොහී** මාර්ග ඤාණයෙන් බොල්, අබීජයක් කරව. **රාග කිඤ්චනං** රාගය, තණ්හාව දෝස කිඤ්චනාදියෙහිද මේ ක්‍රමයෙන් අර්ථ දතයුතුයි. මෙසේ අරහත් ප්‍රාප්තිය දක්වා දැන්, ඒ අරහත්වයට ස්තුති කිරීම් වශයෙන් මීට පසු එන ගාථා වදාරණ ලදී.

එහි **සබ්බසො** යන ගාථාවේ **මමායිතං** යනු මමත්වය කිරීම, "මෙ මගෙය "ය ගන්නා ලද වස්තුවක් හෝ **අසතා ච න සොචති** මමත්වයක් නැති හෙයින් ශෝක නොකරයි **න ජීයති** හානියට පිරිහීමට නො පැමිණේ. **අහු වත මේ** මට ඒකාන්තයෙන් වූයේ නම් **තං වත මෙ නත්ථි** යමක් අතීතයේ මට වී ද එය දැන් මා ලඟ නැත. **සියා වත මෙ** යමක් මට අනාගතයේ ලැබෙම් ද ඒකාන්තයෙන්ම එය ද නොලබමි. දැන් මම ඒකාන්තයෙන්ම නොපැමිණෙන්නෙමි. වැඩිපුර කියනු කුමට ද?

යස්ස නත්ථි ගාථාවෙහි **කිංචං** යනු රූපාදී ධර්මයෙන් හටගත් දෙයයි. (අරමුණු සයයි) **අභිසංඛතං** කර්මයෙන් සංස්කරණ කරගත්, සකසාගත් **අභිසඤ්චෙතයිතං** සිතෙන් රැස් කළ. **අවිජ්ජායත්වෙව** අවිජ්ජාය+තු+එව, අවිද්‍යාවේ ම යන අරුතයි. **අසෙස විරාග නිරොධා** විරාග සංඛ්‍යාත මාර්ගයෙන් ඉතිරි නොකරම නිරෝධයෙන් ගාථාවෙහි එන **සුඤ්ඤතො ලොකං අවෙක්ඛස්සු** තමාට අවශ්‍ය පරිදි නොපවතින ලක්ෂණ වශයෙන් හෝ හිස් සංස්කාර පුඤ්ජයක් බව සිහිපත් කිරීම් වශයෙන් හෝ යන දෙයාකාරයෙන් ම ශූන්‍ය වශයෙන් ලෝකය දෙස බලන්න. **අත්තානුදිට්ඨිං ඌහච්ච** සත්කාරය දෘෂ්ටිය උදුරා දමා, **එවං මච්චු තෙරො සියා** මෙසේ මරණයෙන් තරණය කිරීම වන්නේය. **එවං ලොකං අවෙක්ඛන්තං** මෙසේ ස්කන්ධ ලෝකය දෙස බලන. **මච්චුරාජ න පස්සති**

මරණයේ රජු, මාරයා නොබලයි. නොදකි. **න අඤ්ඤං පස්සතෙ කිඤ්චි** අනික් අල්ප මාත්‍රවූ ද දෙයක් නොපතයි ප්‍රිය නොකරයි. **න අඤ්ඤත්‍ර පටිසන්ධියා** නිවන හැර අන් තැනක ප්‍රතිසන්ධියක් නැත. නාඤ්ඤත්‍ර යැයි එක පදයක් ලෙස ද කියති. වැඩිදුර කීමෙන් කවර ප්‍රයෝජයනක් ද?

අනිට්ඨුරී යන ගාථාවයි. එහි **අනිට්ඨුරී** යනු ඊර්ෂ්‍යා නැත්තෙකි. ඇතමෙක් මෙය "අනුද්ධරී" යයි කියති. **සබ්බධි සමෝ** සෑම තැන්හිම සමානව උපේක්ෂා සහගත පුද්ගලයා යන අදහසය කුමක් ද? යමෙක් මේ මමය, මගේය යැයි ගෙන ශෝක කරන්නේ ද ඒ අකම්පිත පුද්ගලයා පිළිබඳ විමසූ විට මම; ඒ ඊර්ෂ්‍යා නැති, ගිජු නොවූ, තණ්හාව නැතිකළ, සියලු තැන්හි සම පැවතුම් ඇති යනුවෙන් ඔහු කෙරෙහි පවතින සිවු වැදෑරුම් ආනිසංස ප්‍රකාශ කරමි. **නිට්ඨුරියො** ,ඊර්ෂ්‍යා කරන බව **නිට්ඨුරියං** ඔහු නිසා "මෙපමණක්වත් නැතැයි"යි කෙල ගසයි. යන අර්ථයයි. **නිට්ඨුරය කමමං** ඊර්ෂ්‍යා කිරීමයි. ගිහියෙක් ගිහියෙකුට හෝ පැවිද්දෙක් පැවිද්දෙකුට හෝ එක්ව වසද්දී අල්පමාත්‍ර වරදකින් කිපී, "මොහු කෙළ තරම්වත් නොවටී"යැයි බිම කෙළ ගසා පයින් පාගන්නාක් මෙන් කිරීම නිට්ඨුරිය නම් වේ. ඊර්ෂ්‍යාවන්තයාගේ ඒ ක්‍රියාව නිට්ඨුරිය කර්ම වේ.

ඉසා යනු ස්වභාව නිද්දේසයයි. (හෙවත් ඊර්ෂ්‍යාවේ ස්වභාවයයි.) ඉන් අනතුරුව එන වචන දෙක එහි ආකාර දැක්වීමයි. ඊළඟට එන උසුයා දී වචන තුන ඊර්ෂ්‍යාවය ම යෙදූ සමාන වදන් වේ. ලක්ෂණාදී වශයෙන් අනුන්ගේ සැප සම්පත් නො ඉවසන තාක්ෂණය ඊර්ෂ්‍යාව නම් වේ. එහිම රසය අනභිරතියයි. (නොඇලීමයි.) ඉන් ඉවත හරවා ගත් මුහුණ ඇති බව පච්චුපට්ඨානයයි. අනුන්ගේ සම්පත් දැකීම පදට්ඨානයයි. **ලාභොපි න ඉඤ්ජති** ප්‍රත්‍යය ලාභයෙහි නොසැලේ. **අලාභෙපි** ප්‍රත්‍ය නොලැබීමෙහි ද නොසැලේ බොහෝ කොට කීමෙන් කවර ප්‍රයෝජනයක් ද,

අනෙජස්ස යන ගාථාවේ **විසංඛිති** යනු පුඤ්ඤාභිසංස්කාරාදියෙහි කිසියම් සංස්කාරයක්.(නිසංඛිත යැයි පෙළෙහි යෙදේ.) එය වනාහි රැස් කිරීම විනාශ කරයි යන අරුතින් හෝ විසංඛිති යැයි කියනු ලැබේ. **වියාරමභා** විවිධාකාර පුඤ්ඤාභි සංස්කාරයන්ගේ ආරම්භය. **ඛෙමං පස්සති සබ්බධි** සෑමතැන්හිම අභයම (නිර්භයව) දකියි. **ආරමභා** පුණ්‍යාභි-සංස්කාරාදී කර්මයන්ගේ පළමු ආරම්භයෙන් **වියාරමභා** මතු මතුයෙහි

විවිධාකාර ආරම්මන කිරීම වශයෙන් වියාරම්භ වූ තුන් භාවයෙහි ප්‍රතිසන්ධිජනක කර්මයන්ට මේ යෙදූ තවත් වදනයකි. ඒ නිසා වියරම්භයෙන් දුරුව මෙසේ දකින්නේ,

න සමෙසූ යන අවසන් ගථාවේ **න වදති** "මා හට සමාන වේ"ආදී ලෙස මනා වශයෙන් තමා හා සම වූවන්ට නො කියයි. තමාට වඩා හීන වූවන්ට තමාට වඩා උසස් වූවන්ට ද නොකියයි. **නා දෙති න නිරස්සතී** රූපාදියෙහි කිසිදු දහමක් නොගනියි. බැහැර නොකරයි. සෙසු සියලු වචන ඒඒ තැන් කියූ ක්‍රමයෙන් අර්ථ ප්‍රකට වන බැවින් අර්ථ සුගමය. මෙසේ අර්හත්වය කෙළවර කොට දේශනාව නිමාකළ සේක. අර්ථදණ්ඩ සූත්‍ර නිද්දෙස්ස අර්ථ වර්ණනාව නිමියේ ය.

පහළොස්වන අත්ත දණ්ඩ සූත්‍ර නිද්දේස වර්ණනාව නිමියේ ය.

16.

දහසය වන සාරිපුත්‍ර සූත්‍ර නිද්දේසයේ පළමු ගාථාව **න** මෙ දිටෙඨා නම් වේ. එහි **ඉතො පුබ්බෙ** යනු මේ සංකස්ස නගරයට බැසීමට පෙර **වගගුවදො** මිහිරි වදන් ඇති **තුසිතා ගණිමාගතො** තුසිත ලෝකයෙන් චුතවී මවුකුසට පැමිණි බැවින් "තුසිතයෙන් පැමිණි"නම් වේ ගණයාට, සමූහයාට, ආචාර්ය වන බැවින් **ගණී** නම් වේ. නැතහොත් සතුටු වූ යන අර්ථයෙන් තුසිත නම් වූ දෙව්ලොවින් ගණයා වෙත පැමිණ. නැතහොත් තුසිතයාගේ, රහතුන්ගේ සමූහය මැදට පැමිණි. **ඉමිනා චක්ඛුනා** මේ ආත්මභාවයට අයත් ප්‍රකෘති මසැසින් **ඉමිනා අත්තභාවෙන** මේ අවසන් ආත්ම භාවයෙන් **තාවතිංස භවනෙ** තව්තිසා දෙව්ලොව. **පාරිච්ඡත්තක** මූලෙ පරසතු ගස් මුල **පණ්ඩුකම්බලසිලායං** රතු කම්බිලියක් බඳු ගල් මත. **වස්සං වුත්ථො** විසූ වස් ඇති **දෙවගණපරිවුතො** දේව සමූහයා විසින් පිරිවරා ගත්. **ඔතිණ්ණො** බැසගත්, අවතීර්ණ වූ **ඉමං දස්සනං පුබ්බෙ** මේ දර්ශනය මිස ඊට පෙර **න** දිටෙඨා වෙනත් කිසිදාක නොදුටු. **ඛත්තියස්ස වා** ක්ෂත්‍රියකුගේ බසින් නො ඇසීම. බ්‍රාහ්මණාදීන්ගේ ද මේ ක්‍රමයෙන් අර්ථ දතයුතුයි.

මධුර වාදො යනාදියෙහි අර්ථ ව්‍යඤ්ජන සම්පන්නව මිහිරිව කියානුයි මධුරවදො නම් වේ. ප්‍රේම ජනනය කරන, ප්‍රේමයට සුදුසුව කියානුයි **පෙමනීයවදො**. කුරවි කොවුල් හඬ මෙන් මිහිරි සෝෂා ඇත්තේනුයි **කරවීකරුත** මඤ්ඤුස්සොසො **විස්සටෙඨා ච** විශිෂ්ඨ වූයේ, නොපැකිළෙනුයේ වේ. ඒ ඒ තැන නැවති නැවති කථා නොකරන. **විඤ්ඤුඤ්ඤයේ‍යා ච** මනාව දනගත හැකි වන්නේය. **මඤ්ඤු ච** මිහිරිවූයේ ද වේ. **සවණියො ච** කණට මිහිරි වේ. **බින්දුව** හැපුණේද වේ. **අවිසාරීව** නොපැතිරුණේ ද වේ. **ගම්භිරො ච** ගැඹුරු වූයේ වේ. **නිනනා දීව** නින්නාද ඇත්තේ වේ. **අස්ස** මේ බුදුරජුන්ගේ **බහිද්දා පරිසාය** පිරිසෙන් බැහැර. **න නිච්ඡරති** නොනික්මෙයි. කවර කරුණකින් ද? "මෙබදු වූ මිහිරි ශබ්දය නිකරුනේ විනාශ නොවේවා" යි යන කාරණයෙනි. බ්‍රහ්මසරො අන්‍යයන්ට සිඳුණු ස්වර ඇත. බිඳුණු ස්වර ඇත. කාක ස්වර ඇත. බුදුරදුන් මහා බ්‍රහ්මයාගේ ස්වරය හා සමාන සවරයකින් යුක්තය. මහා බ්‍රහ්මයා වනාහි පිත්, සෙම් ආදී පීඩා නොවන්නෙක් වන නිසා ස්වරද

ඉතා පිරිසිදු වූයේ වේ. කළ පින් බෙලෙන් බුදුරදුන්ගේ ශරීරාංග (වපුං) ඉතා පිරිසිදුය. ශරීරාංගයන්ගේ පාරිශුද්ධභාවය නිසා නාභියේ සිට හටගන්නා වූ ස්වරය ඉතා පවිත්‍රය. අංග අටකින් සමන්විතව ම හටගනී. කෙවිල්ලන් (කොවුලන්) මෙන් හඬ ඇත්තේනුයි **කරවීක භාණී** නම් වේ. මත් කොවුලන්ගේ හඬ මෙන් මංජුස්වර ඇත්තේ වේ යන අර්ථයයි. **තාරෙති** යනු බිය සැක සහිත ස්ථානය දක්වා ඉක්මවා යයි. **උත්තාරෙති** ක්ෂේම භූමියට පමුණුවමින් තරණය කරවයි. **නිත්තාරෙති** අක්ෂේම (බිය සැක සහිත) ස්ථානයෙන් නික්මවමින්, පිටත් කරමින් තරණය කරවයි. **පතාරෙති** මනාව ගෙන තරණය කරවයි. අතින් මනාව අල්ලාගෙන මෙන් එතෙර කරවයි යන අර්ථයයි.

මේ සියල්ල එතෙර කිරීම, රැගෙන යාම ආදී ක්ෂේමස්ථානයේ තැබීමම යයි දක්වමින් **ඛෙමන්තං භූමිං සම්පාපෙති** යයි වදාළහ. **සත්තෙ** යනු හික්මවන සත්ත්වයන්. මහත් වූ ගහණයක් බැවින් ද මහත් අනර්ථ එළවන බැවින් ද තරණය කිරීම ඉතා අපහසු හෙයින් ද ජාතියම කාන්තාරය වූයේ ජාතිකන්තාර නම් වේ. එය **ජාති කන්තාරං** වේ. **ගණසස සුසසුසති** සමූහයා මොහුගේ වචන අසනු කැමති වේයි. ශ්‍රවණය කරයි. සැලකිල්ලට ගනියි. **සොතං ඔදහති** අසනු කැමතිව කන් යොමයි. පිහිටුවයි. **අඤ්ඤා චිත්තං උපට්ඨපෙති** දැනගනු කැමතිව සිත යොමු කරයි. **ගණං අකුසලා වුට්ඨාපෙත්වා** ජන සමූහයා, අදක්ෂ බවින් හටගත් අකුශලයෙන් නැගිටුවා **කුසලයේ පතිට්ඨාපෙති** දක්ෂභාවයෙන් හටගත් කුසලයෙහි පිහිටුවයි. **සංඝී** යනු රාශි වශයෙන් සමූහයක් මොහුට ඇත්තේනුයි සංඝී නම් වේ. පිරිස් වශයෙන් ගණනයක්, සමූහයක් ඇත්තේනුයි **ගණී** නම් වේ. ගණයාගේ ආචාර්ය වූයේනුයි **ගණාචරියෝ** නම් වේ.

දෙවන ගාථාවේ **සදෙවකස්ස ලොකස්ස යථා දිස්සති** සදේවක ලෝකයාට පෙනෙන්නාක් මෙන් මිනිස්සුන්ටද පෙනේ. නොහොත් යථා දිස්සති යනු සත්‍ය වශයෙන් අවිපරීතව. **චක්ඛුමා** උතුම් ඇස් ඇති. **එකෝ** පැවිදි ආදීන්ගෙන් හුදකලාව. **රතිං නෙෂ්ක්‍රම්‍ය** රතියට **පටිරූපකෝ** ස්වර්ණ ප්‍රතිරූපක වූ කුණ්ඩලාභරණයක් මත්තිකා කුණ්ඩලෝවා මැටියෙන් කළ කුණ්ඩලාභරණයක් මෙන් **ලොහඩ්ඩමාසෙව සුවණ්ණ ඡන්නෙනා** රනින් වැසූ ලෝහ මස්සක් මෙන් **පරිවාර ඡන්නා** පිරිවරින් වැසුනාහු. **අන්තෙනා** අසුද්ධා අභ්‍යන්තර වශයෙන් රාගාදියෙන් අපරිශුද්ධ වූ. **බහිසොභමානා** සිවුරු ආදියෙන් බාහිර වූ සුන්දර වූ, ශෝභමාන වූ. **අකප්පිත ඉරියාපථා ච**

නො සැරසූ ඉරියව්වලින් **පණීධි සමපන්නා** පිරිපුන් ප්‍රාර්ථනා ඇති **විසුද්ධ සද්දෝ** පිරිසිදු කීර්ති ශබ්ද ඇති, යථාභූත (තත්ත්වාකාරයෙන් පැවති) ස්තුති ඝෝෂා ඇති යන අර්ථයයි. **ගතකිත්තිසද්ද සිලොකෝ** කීර්ති ශබ්දයද ප්‍රශංසාව ද ගෙන හැසිරෙන සුලු වූයේ. කිසිතැනක **සුද්ධ සද්දෝ** යි ද යෙදේ. නාගභවනයේද සුපර්ණ භවනයේද ආදී ක්‍රමයෙන් විස්තර කර දැක් වූ ස්ථානයන්හි. **තතොච භීයෝ** මෙකී ආකාරයට වඩා ගෞරවාන්විත වශයෙන් ඉතා වැඩි ලෙස, අතිරේකව දක්නා ලැබේ. **සබ්බං රාගතමං** සියලු රාගන්ධකාරය. දෝෂ තමාදියෙහි ද මේ ක්‍රමයෙන් අර්ථය ගතයුතුයි.

අන්ධකරණං ප්‍රඥාලෝකය වලක්වන, වසන. **අචක්ඛුකරණං** ප්‍රඥා චක්ෂුවෙන් නොකිරීම. **අඤ්ඤාණ කරණං** ඤාණයෙන් නොදැනීම ඇති කරන **පඤ්ඤානිරොධිකං** ප්‍රඥා ඇස නසන. **විඝාත පක්ඛිකං** පීඩා කොටසෙහි වූ **අනිබ්බාණ සංවත්තනිකං** ප්‍රත්‍ය රහිත අමාමහ නිවන පිණිස හේතු නොවන්නා වූ. **සබ්බං තං තෙන බොධිඤාණෙන බුජ්ඣි** ඒ සියල්ල ඒ සිවුමඟ ඥානයින් අවබෝධ කළ සේක. පළමු මාර්ග වශයෙන් දැනගත් සේක. අවබෝධ කරගත් සේක. දෙවන මාර්ගය වශයෙන් නැවත දැනගත් සේක. අවබෝධ කරගත් සේක. තෙවන මාර්ගය වශයෙන් ප්‍රතිවේධ කරගත් සේක. මැනවින් අවබෝධ කරගත් සේක. සිවුවන මාර්ග වශයෙන් ඉතිරි නොකරම මනාව අවබෝධ කරගත් සේක. අවබෝධයට ගිය සේක. ස්පර්ශ කළ සේක. සාක්ෂාත් කළ සේක යන මේ තුන ඵල වශයෙන් යෙදිය යුතුයි. පළමු, දෙවන මාර්ග වශයෙන් ලැබගත් සේක. තෙවන මාර්ග වශයෙන් ඤාණ ස්පර්ශයෙන් ස්පර්ශ කළ සේක. සිවුවන මාර්ග වශයෙන් ප්‍රත්‍යක්ෂ කළ සේක. නැතහොත් එක් එක් ඵලයන්හි මේ තුනම ලැබ ලබත්මය. **නෙක්ඛම්මරතිං** පැවිදිවීම් ආදිය නිසා උපන් රතිය. **පවිවෙකරතිං** කාය ප්‍රවිවේකාදියෙහි උපන් රතිය. **උපසමරතිං** කෙලෙස් සන්සිඳවීමෙහි උපන් රතිය. **සම්බොධි රතිං** ආර්ය මාර්ගය ප්‍රත්‍යවේක්ෂා කරන්නාට උපදින රතිය.

තෙවැනි ගාථාවේ **බහුනානාමිධ බද්ධානං** යනු මේ සසුනෙහි ක්ෂත්‍රියාදී බොහෝ සිසුන් අතුරින්, ශිෂ්‍යයෝ වනාහි ආචාර්යවරුන් සමඟ බද්ධ වූ දිවි පැවතුම් ඇති බැවින් "බද්ධා"යි කියනු ලැබෙත්. **අත්ථි පඤ්හන ආගමං** ප්‍රශ්නයක් අසනු සඳහා පැමිණියෙමි. නොහොත් ප්‍රයෝජ ඇත්තන්ගේ ප්‍රශ්නයකින් පැමිණියෙමි, නොහොත් ප්‍රශ්නය කරණ

කොටගෙන පැමිණීමක් ඇත. යනුයි. "බුද්ධා"පදය ගාථාවේ නැති වූවත් බුද්ධං යන පදයෙන් දක්වූ ඒ බුදුරජාණන් වහන්සේගේ ශ්‍රී නාමය දක්වනු කැමතිව බුද්ධ යි කියන ලදී. **සයම්භූ** යනු ගුරු උපදේශ රහිතව තමන්ම අවාබෝධ කරගත් බැවිනි. තමාම වූ. **අනාචරියකො** යනු සයම්භූ පදයේ අර්ථ විවරණයයි. යමෙක් වනාහී ගුරුවරයකු නැතිව චතුරාර්ය සත්‍යයෙන් අවබෝධ කරගත් සේක් ද ඒ උතුමන් වහන්සේ සයම්භූ නම් වේ. **පුබ්බ අනනුස්සුතෙසු** යනාදියෙන් ගුරුවරයකු රහිත බවේ අර්ථ ප්‍රකාශ කරයි. අනනුස්සුත යනු "ගුරුවරයෙකුගෙන් නො ඇසූ විරූ" යනුයි. **සාමං** තමන්ම **අභිසම්බුජ්ඣි** මනාව අවබෝධ කරගත් සේක. **තඤ්ච සබ්බඤ්ඤුතං පාපුණි** යනු ඒ චතුරාර්ය සත්‍යයන් පිළිබඳ සර්වඥ බවට පැමිණි සේක. යම්සේ සත්‍යයන් අවබෝධ කරගැනීම මගින් සර්වඥ වෙත් ද එසේ සත්‍යයන් අවබෝධ කරගත් බව දක්වනු සඳහා මෙසේ කියන ලදී. **සබ්බඤ්ඤුතං පත්තො** යන පාඨය ද යෙදේ.

බලෙසු ච වසීභාවං දශවිධ තථාගත බලයෙන් ප්‍රධාන බවට පැමිණි සේක. යම් උත්තමයෙක් වශීභාවයට පත් වූවාහු වෙත් ද උන්වහන්සේ "බුද්ධ යයි කියන ලද්දේ වෙයි. එහි සියලු ධර්මයන් හි අප්‍රතිහත ඥාණ නිමිති, අනුත්තර විමෝක්ෂාධිගමයෙන් වැඩූ ස්කන්ධ සන්තානය අරමුණු කොට පණවන ලද හෝ සර්වඥබව පදවිධාන කරගත් සත්‍යාභිසම්බෝධිය අරමුණු කොට හෝ පනවන ලද විශේෂ සත්ත්වයා බුද්ධ නම් වේ. මෙපමණකින් "බුද්ධ" යන වචනයේ අර්ථ දැක්වීම කරන ලද්දේ වෙයි.

දැන් එය ව්‍යඤ්ජන වශයෙන් විග්‍රහ කරමින් **බුද්ධොති කෙනට්ඨෙන** යනාදිය කියන ලදී. එහි යම්සේ ලෝකයේ අවබෝධ කර ගත්තෝ "අවගත"(අවබෝධ කරගත්) නම් වේද එමෙන් **බුජ්ඣිතා සච්චානීති බුද්ධා** (සත්‍යය අවබෝධ කරගත් හෙයින් බුද්ධ වේ) නම් වන සේක. යම්සේ කොළ වියලක වායුව (පණ්ණ සෝසාවාතා)"පණ්ණසුසා" නම් වේද එමෙන් **බොධෙතා පජයාති බුද්ධා** නම් වෙති. **සබ්බඤ්ඤුතාය බුදෙධා** යන්නෙන් සියලු ධර්මය අවබෝධ කරගැනීමට සමත් බුද්ධියක් ඇති හෙයින් "බුද්ධ"නම් වී යැයි කියන ලදී. **සබ්බ දස්සාවිතාය බුද්ධා** සියලු ධර්මයෙන් නුවණැසින් දුටු බැවින් "බුද්ධ" වී යැයි කියන ලදී. **අනඤ්ඤනෙය්‍යතාය බුද්ධා** අනෙකුත් උපකාරයෙන් නොව තමන්

වහන්සේ තනිවම අවබෝධ කරගත් බැවින් "බුද්ධ" යැයි කියන ලදී. **විසවිතාය බුද්ධා** යනු නොයෙක් .නොයෙක් ගුණ පහළ කරවන බැවින් පියුමක් මෙන් විකසනය වේ යන අරුතින් "බුද්ධ" යැයි කියන ලදී.

ඛීණාසව සංඛාතෙන බුද්ධා යනාදියෙහි සමාන යෙදුම් සයකින්, සිත හකුලුවන ධර්ම ප්‍රහානයෙන්, නිදා සිට අවදි වූ මිනිසකු මෙන් සියලු කෙලෙස් නම් නින්දෙන් මිදී, එය අවසන් කර අවදි වූ බැවින් "බුද්ධ" යැයි කියන ලද්දේ වෙයි. **සංඛා සංඛාතං** අර්ථ වශයෙන් එකක්මය. සංඛාතයෙන් යන වචනයේ කොටසින් යන අර්ථය ඇත. තණ්හා ලේප, දිට්ඨි ලේප නැති වූ බැවින්, නිරූප ලේප නම් වූ වාසනා ගුණ සහිත සියලු කෙලෙසුන්ගෙන් මිදුණු බැවින්, ප්‍රහීණ කළ බැවින් ඒකාන්ත වචනයෙන් විශේෂ කර කියන ලදී.

එකනත නික්කිලෙසො රාග, ද්වේෂ, මෝහ වශයෙන් ප්‍රහාණය කළ යුතු කෙලෙස් රහිත බැවින් නික්කිලේස නම් වේ. **එකායන මගඤ්ඤතොති බුද්ධා** යන ගමනාර්ථ ඇති ධාතූන්ගේ අවබෝධ කිරීම් අර්ථයද අවබෝධ කිරීම් අර්ථය ඇති ධාතූන්ගේ ගමනාර්ථය ඇත. එම නිසා ඒකායන මාර්ගයේ (නිවනට ඇති එකම මාවතේ) ගිය බැවින් බුද්ධ යැයි කියන ලදී. මෙහි ඒකායන මාර්ගය වනාහි

මග්ගො පන්ථො පථො පජ්ජා අඤ්ජසං වටුමායනං
නාවා උත්තරසෙතු ච කුල්ලෝ ච භිසි සංකමෝ තී

මාර්ගය, පන්ථය, පථය, පජ්ජය, අඤ්ජස, වටුමය, අයනය යනු මාර්ග වාචී වචනය. නැව උත්තර සේතුව, කුල්ල (පහුර), භිසි ආදියෙන් එය ඉක්මවා යයි.

මාර්ගයට යෙදෙන බොහෝ නම් අතුරින් "අයන" නමින් මාර්ගය අදහස් වේ. එ නිසා එකම මාර්ගය වූ අර්ථයෙන් "මග්ග" වේ. පාරවල් දෙකක් නම් නැත. යන අර්ථයයි. නැතහොත් තනිවම යායුතු මාර්ගය වූයේනුයි ඒකායන මග්ග නම් වේ. "එකේන "යනු සමූහ වාසය අත්හැර විවේකයෙන් යුතු වූ අයිතබ්බ යනු පිළිපැදිය යුතුයි. මෙයින් යන්නේනුයි "අයන" නම් වේ. සංසාරයෙන් නිවණට යති යන අර්ථයයි. එකම වූ මාර්ගයනුයි ඒකායනො. "එකේසං" යනු ශ්ෂ්ඨ වූ සියලු සත්ත්වයන්

අතුරින් ශ්‍රේෂ්ඨ වූ සම්මා සම්බුදුරජාණන් වහන්සේමය. එනිසා ඒ උතුමන්ට මාර්ග වූයේ, සම්මා සම්බුදුවරුන් ට අයන වූයේනුයි "මාර්ග" යැයි කියන ලදී. යන්නේනුයි අයනො නම් වේ යයි. පවතී යන අර්ථයන්ය. එකක් වූම පිළිවෙත, මාර්ගය වූයේනුයි "ඒකායනමග්ග"නම් වේ. එක ම බුදුසසුනෙහි පමණක් පවත්නා මාර්ගයයි. අන් සමයක මේ මාර්ගය නොදක්වේ යැයි කියන ලද්දේ වෙයි. තවද තනියම (හුදකලාව) යන්නේනුයි ඒකායනෝ පූර්ව භාගයේ දී නානාවිධ මාර්ග, භාවනා විධි අනුව පවතින ආර්ය මාර්ගය අවසාන භාගයේ දී එකම නිවනට ම යන්නේ වෙයි කියන ලද්දේ වෙයි. එ නිසා ඒකායන මග්ග යනු "එකම නිවනට යන මාර්ගය" යන අර්ථයයි.

එකො අනුත්තරං සම්මා සම්බොධිං අභිසම්බුද්ධොති බුද්ධො යනු අනුන් විසින් අවබෝධ කළ හෙයින් බුද්ධ වූයේ නොවේ. වැලිදු තමන්ම අනුත්තර වූ සම්මා සම්බෝධිය අවබෝධ කරගත් බැවින් ම බුද්ධ යැයි කියනු ලැබේ. **අබුද්ධි විහතතා බුද්ධි පටිලාභා ති බුද්ධො** යනු බුද්ධි බුද්ධ, බෝධ යනු පර්යාය වචනයි. එහි යම්සේ නිල්, රතු, ගුණයන්ගෙන් යුතු වස්ත්‍රය නිල් වස්ත්‍රය, රතු වස්ත්‍රය යැයි කියනු ලැබේ ද මෙසේ බුද්ධ ගුණයෙන් යුක්ත වූ හෙයින් "බුද්ධෝ" යැයි දැන්වීමට කියන ලදී.

ඉන් අනතුරුව **බුදොධාති නෙතං නාමං** යනාදියට අර්ථයට අනුගතව මේ ප්‍රඥප්තිය වේයැයි දැන්වීමට කියන ලදී. එහි මිතුරෝ, සහායකයෝ **මිත්තා** නම් වේ. **අමච්චා** යනු මෙහෙකරුවෝය. (භච්චා) **ඤාති** පියපස ඥාතීහුය. **සාලෝහිතා** මවුපස ඥාතීහුය. **සමණා** යනු පැවිදි වූවෝය. **බ්‍රාහමණා** යනු භෝවාදීහුය. බමුණෝය. පාපධර්ම සංසිඳුවූවෝ හා පාපධර්ම නැසුවෝ මෙයින් අදහස් වේ. **දෙවතා** යනු ශක්‍රාදීහු හා බ්‍රහ්මාදීහුය. **විමොක්ඛන්තිකං** යනු **විමෝක්ෂය** වූ අර්හත් මාර්ගයයි. විමෝක්ෂයේ කෙළවර අර්හත් ඵලයයි. **ඒ විමෝක්ෂාන්තයේ** වූ දෙය විමොක්ඛන්තික නම් වේ. සර්වඥ බව වනාහි අර්හත් මාර්ගයෙන් සිද්ධ වේ. අර්හත් ඵල උදාවේදි සිද්ධ වේ. ඒ නිසා සර්වඥ බව යනු විමෝක්ෂය අන්තයේ වන්නකි. ඒ නේමිත්තක නාමයද විමෝක්ෂය අන්තයෙහි ලැබෙන නාමයකි. එනිසා **විමොක්ඛන්තිකමෙතං බුද්ධානං භගවන්තානං** යනුවෙන් කියන ලදී.

බොධියා මූලෙ සහ සබ්බඤ්ඤුතඤාණස්ස පටිලාභා යනු මහ බෝමැඩ මුල දී කියන ලද ක්‍ෂණයෙහි සර්වඥතා ඥාණයේ ප්‍රතිලාභයත් සමඟ **සචජිකා පඤ්ඤත්ති** අර්හත්ඵල සාක්‍ෂාත් කරගැනීමෙන් හෝ සියලු දහම් සාක්‍ෂාත් කර ගැනීමෙන් හෝ උපන් ප්‍රඥප්තියකි. බුද්ධා යනු මෙය ව්‍යඤ්ජන වශයෙන් බුද්ධිය විදහා දක්වීමයි. ඉන් අනතුරුව **වහස්සෙතං භාරං** යනු නිද්දේසයේ අවසානයයි. ඒ ඒ තැන කියූ පරිද්දෙන්, පෙළෙහි දැක්වූ පරිදි ම අර්ථ පමුණුවයි.

සතරවන ගාථාවේ **විජිගුච්ඡතො** ජාති ආදියෙන් ජුගුප්සා කරන. ලැජ්ජා කරන **රිත්තමාසනං** හිස් ඇඳ පුටු **පබ්බතානං ගුහාසු වා** පර්වත ගුහාවෙහි හෝ "හිස් අසුන් භාජනය කළ"යැයි සම්බන්ධ කළ යුතුයි. **ජාතියා විජිගුච්ඡතො** ජාතියෙන් ජුගුප්සා කරන්නට, ජරාවෙන් මඬනා ලද්දහුට. යනාදියෙහි ද මේ ක්‍රමයයි. සේවනය කරයි. යනාදියෙහි සෙවතො සේවනය කරන්නාට **නිසෙවතො** මනාව සේවනය කරන්නාට. **සංසෙවතො** පුන පුනා සේවනය කරන්නාට. **පටිසෙවනො** සමීපයට ගොස් සේවනය කරන්නාට. **භජතො** භජනය කරන්නාට. **පබ්බත පබභාර** පර්වත කුක්ෂිහු.

පස්වන ගාථාවේ **උච්චාවචෙසු** යනු හීන ප්‍රණීත වූ (උසස් පහත් වූ) **සමණේසු විහාරාදී** සෙනසුන්හි **කුවනෙතා** නාද කරමින් **කීවනෙතා** යන පාඨය ද යෙදේ. කොපමණකි එය එහි භය කාරණාවේද? යන අර්ථයයි. **කුවනෙතා** යනු ශබ්ද කරමින්. **කූජනෙතා** අව්‍යක්ත ශබ්දය කරමින්, නදනෙතා මහත් ඝෝෂා කරමින් **සද්දං කරොනෙතා** වචන කියමින්. **කති** යනු ප්‍රශ්න කිරීමයි. **කිත්තකා** ප්‍රමාණය විමසීම යි. **කීවකා** පරිච්ඡේද (සීමාව) විමසීමයි. **කිව බහුකා** ප්‍රමාණ සීමා දක්වන ප්‍රශ්න කිරීමයි. **තෙ භෙරවා** ඒ භය ජනනය කරන උපද්‍රව, භයාරම්මණ. **කීවබහුකා** යි විමසූ කල්හි ආරම්මණයන් දැක්වීමට; සීහ, ව්‍යාඝ්‍ර, දීප ආදී වශයෙන් විසඳයි.

සයවන ගාථාවේ **කති පරිස්සයා** යනු ලොව උපද්‍රව කීයක් වේද? **අගතං දිසං නිවණයි.** එය වනාහි පෙර නොගිය විරූ බැවින් අගතං යනු ද නිර්දේශ කළ යුතු හෙයින් දිසං යි ද යන දෙපදය එක් කර "අගතං දිසං" යයි එනිසා කියන ලදී. අමතං දිසං යන පාඨයද යෙදේ. **අභිසමභවෙ**

මඬලන්නේ නම් **පන්නමහි** කෙළවරෙහි, **අගතපුබ්බා සා දිසා** යම් දිසාවනට සිහිනෙන්වත් නොගිය විරූ ද ඒ දිශාව "ගත පුබ්බ" නම් නොවේ. එම දිශාව ඉහත කියූ පරිදිම "අගතපුබ්බ"නම් වේ. **ඉමිනා දීඝෙන අදධුනා** මේ දීර්ඝ කාලයෙන්. **සමතන්තිකං** ඇතුලත මුවවිට දක්වාම (කට ලඟටම) පිරුණු **අනවසෙසකං** නොවැගිරෙන සේ, නො ඉහිරෙන සේ කොට **තෙලපත්තං** දැමූ තෙල් ඇති, තෙල් පාත්‍රය. **පරිහරෙය්‍ය** පරිහරණය කරන්නේය. රැගෙන යන්නේය. **එවං සචිත්ත මනුරක්ඛ** ඒ තෙල් පිරුණු පාත්‍රය මෙන් තමාගේ සිත කායගතා සතියෙන් ද අරමුණු කර යෑමේ දී සම්ප්‍රයුක්ත සතියෙන් ද යන මේ දෙක අතර බහා, මොහොතක්වත් බාහිර අරමුණකට යා නොදී රැකගනියි ද, එලෙසින් ම නුවණැති යෝගාවචරයෝ තම සිත රැකගන්නේය. ගෝපනය කරන්නේය. කවර හෙයිද මෙහිදී

දුනිග්ගහස්ස ලහුනෝ යත්ථා කාමනිපාතිනෝ
චිත්තස්ස දමථෝ චිත්තං සාධු චිත්තං දන්තං සුඛාවහං

දමනය කිරීමට අපහසු , වහ වහා වෙනස් වන, කැමති තැනෙක වැටෙන සිත දමනය කරගැනීම යහපතකි. දැමුණු සිත් සැප ගෙන දේ. එනිසා

සුදුද්දසං සුනිපුනං යත්ථා කාමනිපාතිනං
චිත්තං රක්ඛේථ මේධාවී චිත්තං ගුත්තං සුඛාවහං

දැකිය නොහැකි ඉතා සියුම් වූ කැමති තැනක වැටෙන සිත නුවණැත්තා රැකගන්නේය. ගෝපණය වූ රැකගත් සිත සැප ගෙන දේ. මෙහිදී

දූරංගමං එකචරං අසරීරං ගුහාසයං
යෙ චිත්තං සඤ්ඤමෙස්සන්ති මොක්ඛන්ති මාරබන්ධනා

ඉතා දුර යන, තනිව හැසිරෙන, ශරීරයක් නැති, හදවත නම් ගුහාවේ වසන සිත යමෙක් දමනය කර ගනිත්ද ඔවුහු මාර බන්ධනයෙන් මිදෙති.

අනිකක් ද ඇත -

අනවට්ඨිත චිත්තසස සද්ධම්මං අවිජානතො
පරිපලවපසාදසස පඤ්ඤාය න පරිපූරතී

ස්ථිර නොවූ, අසංවර වූ සද්ධර්මය අවබෝධ කර නොගත් වහ වහා සැලෙන සිත් ඇත්තාගේ ප්‍රඥාව නොපිරේ. ස්ථිරව සිත කමටහනේ යොදාගත්තහුයේ වනාහි

අනවසසුත චිත්තසස අනනවාහත චෙතසො
පුඤ්ඤපාපපහීනසස නත්ථි ජාගරතො භයං

රාගයෙන් තෙත් නොවූ, ද්වේෂයෙන් දැඩි නොවූ සිත් ඇති පින් පව දෙකම දුරලූ නිදිවැරීමෙහි යෙදුනු රහතන් වහන්සේට කිසිදු භයක් නැත. එනිසා

එඳනං චපල චිත්තං දුරක්ඛං දුන්නිවාරයං
උජුං කරොති මෙධාවී උසුකාරොවා තෙජනං

සැලෙන, චපල, නොරැකිය හැකි තුන් දුසිරිතෙන් වළකාලීම අසීරු සිත නුවණැත්තා සෘජු කරන්නේ ය හී වඩුවා හී හී දණ්ඩකින් ඇද හරින්නාක් මෙනි. මෙසේ සිත සෘජු කරමින් තම සිත රකින්නේය. පඨයානො දිසං අගත පුබ්බං, "මේ කායගතාසති කමටහනෙහි පරිකර්ම අරඹ ඉමක් කොණක් නැති මේ සසරේ පෙර නොගියවිරූ දිශාව (නිවන) පතමින් ඉහත විස්තර කළ පරිදි සිත රකින්නේ නම් මැනවි" යන අර්ථයයි.

මේ දිසාව නම් කුමක් ද?

මාතා පිතා දිසා පුබ්බා - ආචරියා දක්ඛිණ දිසා
පුත්තදාරා දිසා පච්ඡා - මිත්තාමච්චා ච උත්තරා
දාසකම්මකරා හෙට්ඨා - උද්ධං සමණ බ්‍රාහමණා
එතා දිසා නමස්සෙයය - අලමත්තො කුලේ ගිහී ති

යන මෙහි මවුපියාදීන් "දිසා" නාමයෙන් දැක්විණි.

දිසා චතසෙසා විදිසා චතසසා උදධං අධො දසදිසා ඉමායො,
තං දිසං තිටඨති නාගරාජා යමදදසා සුපිනෙ ජබබිසානං තී

යන මෙහි මවුපියාදීන් "දිසා" යැයි කියන ලදී.

අගාරිනො අනනද පානවසථදා අවහායිකානමපි දිසං වදනති
එතා දිසා පරමා සෙතකෙත යං පතවා දුකඛී සුඛිනො භවනත

මෙහි නිවන "දිසා"යැයි කියන ලදී. මෙහි දී ද ඒ නිවනම අදහස් කරන ලදී "තණහකඛයං විරාගං" යනාදියෙන් පෙනේ. පෙන්වයි. එනිසා "දිසා" යැයි කියනු ලැබේ. අග මුල නැති සසර කිසිදු අදබාල පුහුදුන් අයෙකු විසින් සිහිනෙන්වත් නොගියවිරූ බැවින් "අගතපුබබා දිසා" නම් වේ යයි කියනු ලබයි. ඒ උතුම් නිවන ප්‍රාර්ථනා කරන්නා විසින් කායගතාසතියෙහි යෙදීම (වැඩීම) කළයුතුයි.

වජතො යනාදියෙහි ද - මෙහි මාර්ගෝත්පත්තියේ සමීපයට **වජතො** යනුයේ වේ. යීතික්ෂණයෙහි ගච්ඡතො ගමන් කරනුයේ, ඵලය දැකීමෙන් **අභික්කමතො** අභිමුඛයට යන්නාට, **අනෙත** කෙළවරෙහි සිටි. **පනෙත** ගැඹුරු වන ගහනයේ සිටිකල්හි. **පරියනෙත** ඉතා දුර බැවින් කෙළවර සිටි. **සෙලානත** පර්වතයන්ගේ කෙළවර. **වනනෙතා** වන ගහනයෙන් කෙළවර, **න දනෙත** නදියේ කෙළවර **උදකනෙතා** දියේ කෙළවර. **යතථ න කසීයති න වපීයති** යම්තැනක සීසෑමත්, වැපිරීමත් නොකරයි ද **වනත්තං අතික්කම්ම** යීතෙ මනුසසානං අනුපවාරෙ සීසාන වපුරන මිනිසුන් විසින් නොසෙවුනා ලද සෙනසුන්හි. (නිර්ජන ජනශූන්‍ය සෙනසුන්හි)

සත්වන ගාථාවේ **කාසස** බාහපපථයො අසසු ඔහුගේ වචන කවරාකාර වේද? **මුසාවාදං පහාය** මෙහි "මුසා" යනු අනුන් රැවටීමේ සිත පෙරටුකරගත් යහපත නැතිකරන වාග් ප්‍රයෝගය හෝ කාය ප්‍රයෝගයයි. රැවටීමේ අදහසින් අනුන් රවටන කාය වාග් ප්‍රයෝගයෙන් ඉස්මතු වූ චේතනාව මුසාවාදයයි. මේ තවත් ක්‍රමයකි. මුසා යනු සිදු නොවූ අසත්‍ය වස්තුවකි. 'වාද' යනු ඒ සත්‍ය ලෙස, සිදු වූ ලෙස දැන්වීමයි. ලක්ෂණ වශයෙන් වනාහි අසත්‍ය වස්තුවක් (කරුණක්) සත්‍ය ලෙස අනුන්ට දන්වනු කැමැත්තෙන්, එසේ දන්වන කාය වාග් විඤ්ඤත්තියෙන් හටගත්

සිතුවිල්ල චේතනාව 'මුසාවාද' නම් වේ. ඔහු යම් අර්ථයක් බිඳ දමයි ද එහි අල්ප භාවයෙන් මුසාවාදය අල්ප සාවද්‍ය වේ. මහත් වූ අර්ථයක් බිඳ දමයි නම් මෙය මහාසාවද්‍ය අකුශලයකි. තවද ගිහියන්ගේ තම සන්තක වස්තු අනුන්ට නොදෙනු කැමැත්තෙන් පැවති 'නැත' යනාදී කියුම් අල්ප සාවද්‍ය වේ. සාක්ෂිකාරයෙක්ව අර්ථය, යහපත බිඳිනු සඳහා කියන ලද්දේ නම් මහා සාවද්‍ය වේ. පැවිද්දන්ගේ ඉතා අල්ප වූ තෙල්, ගිතෙල් ආදියක් ලැබ සිනහසීමේ අදහසින් 'අද ගමේ තෙල් ගඟක් ගලන්නේයි සිතමි' ආදී වශයෙන් පැරණි කටවහරින් ගෙන කියන කියුම් අල්ප සාවද්‍ය වේ. නොදුටුම දෙයක් 'දුටුවෙමි' ආදී වශයෙන් පැවසීම මහාසාවද්‍ය වේ. මුසාවාදය සම්පූර්ණ වීමට කරුණු හතරක් අවශ්‍යය. අසත්‍ය වස්තුවක් වීම, රවටන සිත, රැවටීම දරනු ලබන වෑයම හා උත්සාහය, අනිකා එම අසත්‍යයෙන් රැවටීම (අර්ථ හානි කරගැනීම) යනුයි. එක් ප්‍රයෝගයක් සියතින්ම කරන්නේය. ඔහු කයින් හෝ කය හා බැඳුණු වචනයෙන් හෝ අනුන් රවටන ක්‍රියා කිරීමෙහි දතයුතුයි. ඉදින් ඒ ක්‍රියාවෙන් අනිකා එම අරුත දැනගනියි. මෙහි ක්‍රියාවෙන් උපදවන ලද චේතනාව පහළ වූ ක්ෂණයෙහි ම මුසාවාද කර්මයෙන් බැඳේ.

සත්‍ය කියනුයේනුයි **සච්චවාදී**. සත්‍යයෙන් සත්‍ය ගලපයි. ගටයිනුයි. **සච්ච සන්ධො** අතරින් පතර බොරු නොපවසයි. යන පුරුෂයෙක් කිසි කලෙක බොරු නොකියයි. කිසිකලෙක ඇත්ත කියයි. ඔහුගේ මුසාවාදයෙන් අතරක් ඇතිකළ හෙයින් සත්‍යයෙන් සත්‍ය නොගැටෙයි. එනිසා ඔහු සච්චසන්ධ නොවේ. සච්චසන්ධයා එසේ කිසිකලෙකත් බොරු නොකියයි. ජීවිත හේතුවෙන්වත් බොරු නොකියා ඔහු සත්‍යයෙන් සත්‍ය ගලපන්නේනුයි සච්චසන්ධ නම් වේ.

ථෙතො යනු ස්ථිර වූ. තදින් ම පිහිටි කථා ඇත්තේ වේ. ඇතැම් පුද්ගලයන්ට අමු කහපාට මෙන්, දහයියා ගොඩේ ගැසූ ඉන්න මෙන්, අසු පිට තැබූ කොමඩු ගෙඩියක් මෙන් අස්ථිර වූ කථා ඇත. ඔවුහු 'ඨිතකථ' නම් නොවේ. 'ඇතැමෙක් ගලේ කෙටූ අකුරක් මෙන් ද ඉඳුබීලයක් මෙන් ද සිටිති. ඔවුහු 'ඨිතකථ' නම් වෙති. කඩුවෙන් හිස සින්දත් ඔවුන්ගේ වචන දෙකක් නම් නැත. මෙම ස්වභාවය 'ථෙත' නම් වේ. **පච්චයිකො** ඇදහිය යුතු වදන් ඇත්තා, පිළිගත හැකි වදන් ඇති ඇතැම් පුද්ගලයෝ වනාහි ඇදහිය යුතු වචන ඇත්තෝ නොවේ. 'මෙය

කා විසින් කියන ලද්දේ ද?' 'අසුවලා විසින් කියන ලදී' යැයි නම කී කල්හි ඔහුගේ වචන නො ඇදහිය යුතු යැයි කියනු ලබන්නෙක් බවට පත්වේ. සමහරු ඇදහිය යුතු කථා ඇත්තෝ වෙති. 'මෙය කා විසින් කියන ලද්දේ ද?' ඇසූවිට 'අසුවලා විසින්'යැයි කී කල්හි 'ඉදින් ඔහු විසින් කියන ලද්දේ නම් එයම ප්‍රමාණවත්ය. මෙහි විමසා බැලිය යුත්තක් නැත'යි මෙ කරුණ මෙසේමය. කියනු ලබන්නේ ද එවැනි පුද්ගලයෝම 'පච්චයික' නම් වෙති.

අවිසංවාදකො ලොකස්ස ඒ සත්‍යවාදී බව නිසා, ලෝකයා නොරවටයි යන අර්ථයයි. **පිසුනාවාචං පහාය** යනාදියෙහි, යම් වදනකින් එය කියනු ලබන්නාගේ සිතේ තමා පිළිබඳව ප්‍රියභාවයක් ද ඉන් කියවෙන්නා පිළිබඳ කේලමක් කිම සිදුවන්නේනුයි 'පිසුනාවාචා' නම් වේ. යම් වචනයක් කීමේදී තමා මෙන්ම අනිකා ද පරුෂ වූවෙක් කරයි ද, එමෙන් ම යම් වදනක් ස්වභාවයෙන් ම එරුස ද කණට ප්‍රිය නොවේ ද, හදවතට ප්‍රිය නොවේ ද මෙය 'ඵරුසා වාචා' නම් වේ. යමෙකු විසින් නිෂ්ඵල, හිස් වදන් කථා කර කර සිටියි ද එය 'සම්ඵප්පලාප' නම් වේ. මීට මුල් වූ චේතනාව 'පිසුනාවාචා' දී නම ම ලබයි. එයම මෙහිදී අදහස් කරන ලදී.

එහි කිළිටි සිත් ඇත්තාගේ අනුන් බිඳවීම සඳහා හෝ තමාට ප්‍රියභාවය ඇතිකරගනු සඳහා වූ හෝ කාය-වාග් ප්‍රයෝගයෙන් උපන් චේතනාව පිසුනාවාචා නම් වේ. එය යමකු භේද කරයි ද ඔහු අල්පගුණ ඇත්තකු නම් අල්පසාවද්‍ය වේ. මහත් ගුණ ඇත්තකු භේද කළහොත් එය මහා සාවද්‍ය අකුශලයකි. එහිද කරුණු සතරක් සම්පූර්ණ වීමෙන් පිසුනාවාචා අකුසලය සිදුවේ. මොවුහු දෙදෙන හෝ මොවුහු බිඳලිය යුතුය යන භේද හින්න කිරීමේ සිත හෝ මෙසේ මොවුන් හෝ වන්නාහ'යි බිඳීම පෙරටු කරගත් බව. මෙසේ මම ප්‍රියභාවයට විශ්වාස බවට යන්නෙමි'යි ප්‍රිය බව කැමති වීම, ඊට උත්සාහයක් වැයමක් කිරීම, ඒ උත්සාහයෙන් වචනයේ අර්ථ ගෙන දෙදෙනා බිඳීම යනු ඒ කරුණු සතරයි. **ඉමෙසං භෙදාය** යමෙකු පිළිබඳව 'අසුවලා මෙසේ කීය' ආදී වශයෙන් කියන ලද්දේ ද එය ඇසූ පුද්ගලයාගේ හා කියවුනු පුද්ගලයාගේ බිඳී යාම. **භින්නානං වා සන්ධාතා** මිතුරන් දෙදෙනෙකු හෝ සමාන උපාධ්‍යායවරු හෝ කිසියම් කරුණකින් බිඳී වෙන්ව ගියවිට එක් එක් පුද්ගලයා වෙත

එළඹ නුඹවහන්සේලා මෙවැනි කුලයක උපන්හ. මෙසේ බහුශ්‍රැතයහ. මෙසේ භේද වී සිටීම නුසුදුසුය' ආදී වශයෙන් කියා සමගි කළ යුතුයි. අනුප්පදාතා සමගිවීම, සන්ධානය ගෙන දෙයි. පුද්ගලයන් දෙදෙනෙකු සමගිව සිටිනු දැක, නුඹලා මෙවැනි කුලයක උපන්හ. මෙවැනි ගුණ ධර්මයන්ගෙන් පිරිපුන් වෙති. මෙසේ සමගිව සිටීම ඉතාම සුදුසුය' ආදී වශයෙන් කියා සමගි බව දැඩි කළයුතුය යන අර්ථයයි.

සමගි බවේ සිත් අලවා විසීම ඇත්තේනුයි **සමගගාරාමෝ**. යම්තැනෙක සමගියක් නැතිනම් එහි විසීමටවත් නොයයි යන අර්ථයයි. **සමගරාමෝ** යන පාඨය ද යෙදේ. දෙපදයේම එකම අර්ථයයි. **සමගරතෝ** සමගියෙහි ඇලුණු ඔවුහු අත්හැර වෙනත් තැනක යෑමට ද නොකැමති වේ. සමගිව වෙසෙන්නන් දැක, අසා ඒ පිළිබඳ සතුටු වීම **සමගග නන්දී** නම් වේ. **සමගගකරණිං වාචං භාසිතා** යම් වචනයක් නිසා සත්ත්වයන් සමගි වේද එබඳු සමගි බව ඇතිකරන වචනම කියයි. අන්‍ය වචන නො කියයි. අනුන්ගේ මර්මස්ථාන සිඳින කාය වචී ප්‍රයෝගයෙන් උපන් ඒකාන්ත එරුෂ සිතේ සෙනෙහසින්, ආදරයෙන් කියනු ලබන වචන 'එරුස වාචා' නම් නොවේ. මාපියාදීහු ද ඇතැම් දිනෙක දරුවන්ට මෙසේ කියති. සොරු නුඹලා කඩ කඩ කරත්වා', මෙසේ කියූවත් හදවතින් ඔවුන් මත උපුල් පෙත්තක්වත් වැටීම නො ඉවසති. ආචාර්ය උපාධ්‍යායවරුද වැරදි දෙයකදී තමා ලඟ හික්මෙන්නන්ට, මෙසේ කියති. මොවුහු කුමක් හෙයින් විලි ලැජ්ජා නැති, විලිබිය නැති හිස් පුද්ගලයන් සේ හැසිරෙත් ද? මෙතැනින් පහ වෙවු. ඉවත්ව යවු'යි මෙසේ වචනයෙන් කියූවත් ඒ සිසුන්ගේ දියුණුවම, ආගමාධිගම සම්පත්තියම කැමති වෙති.

මෙසේ සිතේ සිනිඳු, ස්නේහ සහගත බව නිසා, 'එරුස වචනයක්' නොවන නමුත් වචන මෘදු, සිනිදු භාවයෙන් යුතු නිසා අඵරුස වචනයක් ද නොවේ. කෙනෙකු මරවනු කැමතිව මොහු සුවසේ නිදිකරවන්න ආදී ප්‍රියවදන් කීම අඵරුෂ වාචාවක් නොවන්නේමය. සිතේ පවතින එරුෂ බව නිසා මෙය අඵරුෂ උපමාවක් නොවේ. සිතේ එරුෂ බව නිාස එරුෂ වාචාවක්ම වේ. අල්ප ගුණ ඇත්තෙකුට කියන ලද එරුෂ වදන අල්ප සාවද්‍ය වේ. මහත් ගුණවතෙකුට කියන ලද නම් මහා සාවද්‍ය වේ. එරුෂ වදන සම්පූර්ණ වීමට කරුණු තුනක් සම්පූර්ණ විය යුතුයි. ආක්‍රෝශ, පරිභව කළයුතු කරුණක් තිබීම, අනිකකු කෙරෙහි කිපි සිත, ආක්‍රෝශ පරිභව කිරීම යනු ඒ කරුණු තුනයි. නෙලා යන්නේ 'ඵලං' යනු දෝෂයයි.

මෙහි එලයක් හෙවත් දෝෂයක් නැත්තේනුයි නෙලා වේ. නිර්දෝෂ යන අර්ථයයි. 'නෙලංගො සේතපච්ඡාදො' යන්නෙහි කියූ සීලය මෙනි. **කණණ සුඛා** ඛ්‍යඤ්ජන මධුර භාවයෙන් කණට මිහිරි වචන, ඉදිකටුවලින් කණට අනින්නාක් මෙන් අපහසුවක් නූපදවන වචනයි.

අර්ථ මධුරභාවයෙන් මුලු සිරුරෙහි ම කෝපය ජනනය නොකර, ප්‍රේමය ජනනය කරන්නේනුයි **පෙමනීයා** නම් වේ. හදවතට ප්‍රිය වෙයි. හදවත නොනසා සුවසේ සිතට පිවිසේනුයි **හදයංගමා** නම් වේ. ගුණවලින් පිරිපුන් බැවින් නගරයේ, පුරයේ වූ අරුතින් **පොරී**. නගරයේ වැඩුණු ස්ත්‍රීන් මෙන් සුකුමාල බැවින් ද 'පෝරී' නම් වේ. 'පුරසස එසා' යන අරුතින් ද 'පොරී' නම් වේ. 'පුරසස එසා' යනු නගරවාසීන්ගේ කථාවයි. නගරවාසීන්ගේ සුදුසු, යෝග්‍ය කථාවක් ම වේ. ප්‍රිය වූවහුට 'පියා' යැයිද සෝයුරාට 'භාතා' යැයි ද කියති. (තමාට වැඩිමහල්ලන්ට පියා යැයි ද තමා හා සම වූවන්ට සෝයුර යැයි ඇමතීම නගරයේ සිරිතකි.) මෙවැනි කථාව බොහෝ ජනයාට ප්‍රිය වේ. මනාප වේනුයි **බහුජන කනතා**. කාන්ත භාවයෙන්ම බොහෝ ජනයාට මනාප වූයේ, සිත අභිවෘද්ධියට පත් කරන්නේනුයි **බහුජන මනාපා** අනර්ථය හඟවන කාය වාග් ප්‍රයෝගයෙන් හටගත් අකුසල චේතනාව **සමඵප්පලාපො** නම් වේ. එය සේවනය කිරීමේ මද භාවයෙන් අල්ප සාවද්‍ය වේ. සේවනය කිරීමේ මහත් තත්ත්වයෙන් මහා සාවද්‍ය වේ. මේ සම්ඵප්පලාපය සම්පූර්ණ වීමට කරුණු දෙකක් සම්පූර්ණ විය යුතුයි. සීතාහරණාදී නිරර්ථක කථාවක් පෙරටු කරගැනීම හා එම කථාවේ නිරතව සිටීම යනු ඒ දෙකරුණයි.

සුදුසු කල්හි කියානුයි **කාලවාදී**. කිවයුතු - සුදුසු කාලය සලකා බලා කියයි' යන අර්ථයයි. සිදු වූ සත්‍ය, ස්වභාවයක්ම කියයි නුයි **භූතවාදී**. මෙලෝ පරලෝ අර්ථය ආශ්‍රය කරගෙනම කියානුයි **අත්ථවාදී**. නව ලෝකෝත්තර ධර්ම සන්නිශ්‍රිත වූවක් කර කියයිනුයි **ධම්මවාදී**. සංවර විනය, පහාන විනය ආශ්‍රය කර කියයිනුයි **විනයවාදී**. නිධාන යනු තබන අවකාශයයි. මෙහි තබාගැනීම ඇත්තේනුයි **නිධානවතී**. හදවතේ තබාගත යුතු වදන් කියයි යනු අර්ථයයි. **කාලෙන** මෙබඳු වචන කියන්නේ ද 'මම සිතේ තබාගත යුතු වචනයක් කියමි'යි නුසුදුසු කාලයේ නොකියයි. සුදුසු කාලය බලාම කියයි යන අර්ථයයි. **සාපදෙසං** උපමා සහිතව, කරුණු සහිතව යන අර්ථයයි. **පරියනතවතිං** වෙන්කිරීම්, පරිච්ඡේද දක්වා යම්සේ කරුණින් කරුණ වෙන් කිරීම් ඇති ද එසේ කියයි යන අර්ථයයි.

අත්ථසංහිතං යනු නානාප්‍රකාර න්‍යායවලින් බෙදා දක්වනු ලබන්නේ දැඩිව ගැනීමට නොහැකි බැවින් අර්ථ සම්පන්නය. නැතහොත් ඒ අර්ථවාදියා යම් යහපත ගෙන දෙන වදනක්ම කියයි ද ඒ අර්ථයෙන් යුක්ත බැවින් අර්ථ සහිත වචනයක් කියයි. 'අනිකක් බහා, අනිකක් නොකියයි' යන අර්ථයයි. **චතූහි වචීසුචරිතෙහි** මුසාවාද අත්හැර ආදී වශයෙන් කියූ සතර වාග් දෝෂයන්ගෙන් මිදී සිටු වාග් සුචරිතයේ මනාව යෙදුණු. **සමන්නාගතෝ** නො පිරිහුණු.

චතුදෙඝාසාපගතං වාචමභාසති අප්‍රියාදී සතර වාග් දෝෂයන්ගෙන් පහ වූ, පිරිහුණු වචන කියයි. **අසී ගොචරෝ** තෙරුන් වහන්සේ ශ්‍රමණ ගෝචර කටයුතු කියනු කැමැත්තේ 'අසී ගොචරෝ අසීඅගොචරෝ' යනුවෙන් පදය ගෙනහැර දැක්වීය. යම්සේ මාර්ග පිළිබඳවද දක්ෂ පුරුෂයෙක් මාර්ගයක් කියා දෙනුයේ, 'වම් මාර්ගය අත්හරුව, දකුණු මාර්ගය ගනුව'යි පළමුව අත්හළ යුතු භය හා විපත් කරදර ඇති මාර්ගය නොමග පෙන්වා දී පසුව යායුතු, ගතයුතු ක්ෂේම මාර්ගය සෘජු ගතිය දක්වයි ද එලෙසින්ම මාර්ග දැක්වීමේ දක්ෂ පුරුෂයා වැනි ධර්ම සේනාපති සැරියුත් මහ රහතන් වහන්සේ පළමුව අත්හළ යුතු, බුදු වදනට පටහැනි, අගෝචර මග ගෙනහැර දක්වා පසුව සුදුසු ගෝචර මග දක්වනු කැමතිව ප්‍රථමයෙන් **කතමෙ අගොචරෝ** යනාදිය වදාළහ. පුරුෂයා විසින් දැක්වූ මාර්ගය ශක්‍රයා විසින් විසි කළ වජ්‍රායුධය මෙන් නොවැරදීම නිවන් නමැති නගරයට ම සත්ත්වයා පමුණුවන්නේය. එනිසා 'පුරිසෝ මග්ගකුසලෝ' යනු තථාගත සම්මා සම්බුදු රජුන්ට යොදන තවත් වදනකි'යි කියන ලදී.

සිය හිස නෑමෙන් දහඩිය, කුණු, තට්ටු, මල ආදිය දුරු කර පවිත්‍ර කරගෙන, දෙවනුව මල් ගඳවිලවුන් ආදියෙන් අලංකාර කරගන්නාක් මෙන් පාපධර්ම බැහැරලා කලණ දහම්හි යෙදීමෙන් ඉතා යහපත් රූප සම්පත්තියකින් යුතු වේ. එනිසා දහඩිය, කුණු තට්ටු, මල මෙන් පළමුව අගෝචර ස්ථාන අත්හළ යුතුයැයි දක්වා දෙවනුව දහඩිය, කුණු ආදියෙන් පවිත්‍ර කරගත් හිසේ මල් ගඳ විලවුන් යොදා සරසන්නාක් මෙන් පසුව ගෝචර ස්ථාන දක්වනු කැමතිව **කතමෝ අගොචරෝ** යනාදිය කියන ලදී. එහි **ගොචරෝ** පිණ්ඩපාතාදිය පිණිස එළඹීමට සුදුසු තැන්ය. අයුතු නුසුදුසු ස්ථාන අගෝචර නම් වේ. වෛශ්‍යාවන් වාසය කරන ස්ථානය **වෙසියගොචරෝ** නම් වේ. මිත්‍ර සත්ථව වශයෙන් එළඹිය යුතු ස්ථානය

යන අර්ථයයි. එහි වෙසියා යනු රූපය නිසා ජීවත් වන්නෝ ය. යම්කිසි කරුණකින් සුලභ වූ හැසිරීම් ඇතිව ඈලා වෙත මිත්‍රසඤ්ඤව වශඤයන් එළඹීම වෙසියාගොචර නම් වේ. එනිසා මෙසේ ඔවුන් වෙත නොයා යුතුයි. කුමක් නිසා ද? ආරක්ෂා විපත්ති ඇතිවන හෙයිනි. වෛශ්‍යස්ථාන වෙත එළඹෙන්නා වූ ශ්‍රමණයාගේ, ඉතා බොහෝ කලක් රැකගත් ශ්‍රමණ ධර්ම පවා දින කිහිපයකින්ම නැසේ. ඉදින් ශ්‍රමණ ධර්ම නොනැසුනත් සමාජයෙන් ගර්හා, නින්දා ලබයි. දක්ෂිණාවක් පිණිස එම නිවෙස් වෙත යන්නේ නම් සිහිය පිහිටුවාගෙන යා යුතුයි.

විධවා යනු සැමියා මළ හෝ සැමියා හැර දැමූ බිරිඳයි. වැන්දඹුවයි. **ථුල්ලකුමාරියෝ** මහලු වූ නොඇලුණු කුමරියෝ. **පණ්ඩකා** ලෝකාමිෂ ආශ්‍රිත කථා බහුල වූ, උත්සන්න කෙලෙස් ඇති, නොසන්සුන් පරිදාහ ඇති නපුංසකයෝ. මේ සියල්ලන් වෙත පැමිණීමේ ඇති ආදීනව ඉහත පැවසූ පරිදි දතයුතුයි. භික්ෂුණීන් පිළිබඳව ද එසේමය. තවද භික්ෂූහු නම් උසස් බඹසර ඇත්තෝ ය. භික්ෂුණීන් ද එසේමය. ඔවුහු අන්‍යෝන්‍යව එක්වී, කතාබහ, මිත්‍රසඤ්ඤව කිරීම් වශයෙන් දින කිහිපයකින්ම සුරැකි ශ්‍රමණ ධර්ම නිසා ගනිති. ගිලන් වූ විට විමසීම් වශයෙන් යෑම සුදුසුය. මල් ලැබ පිදීමට ද අවවාද දීමට ද සුදුසු කල්හි යෑම මැනවි.

පානාගාරං, සුරාසල්, මේවායෙහි බඹසරට අනර්ථ කරන සුරාසොඬුන්ගෙන් නිතර පිරුණේය. එහි සුරාසොඬුන් සමග හිතමිත්‍රවීම් වශයෙන් යෑම නුසුදුසුය. බඹසරට අනතුරක් වේ. **සංසට්ඨා විහරති රාජූහි** යනාදියෙහි **රාජානෝ** අභිෂේක කළ හෝ නොකළ යමෙකු රාජ්‍යයේ අනුශාසනා කරන්නේ ද ඔවුහු. **රාජමහාමත්තා** රජවරුන්ගේ ඉසුරු සම්පත් හා සමාන වූ ඉසුරුමත් බවින් යුතු වූවෝ. **තිත්ථියා** වැරදි දෘෂ්ටි, දර්ශනවාද ඇති අන්‍යාගමික පිරිවැජියෝ. **තිත්ථිය සාවකා** භක්තියෙන් ඒ තීර්ථකයන්ට සිවුපසය දෙන්නෝ. ඔවුන් සමග 'එක්වීමට ගියේය' යන අර්ථයයි.

අනනුලොමිකෙන සංසග්ගෙන අනනුලෝමික වූ සංසර්ගයෙන්. ත්‍රිවිධ ශික්ෂාවට අනුලොම් නොවූ, විරුද්ධ වූ සංසර්ගය මෙනමින් හැඳින්වේ. යමකින් බඹසරට අනතුරක් ප්‍රඥප්ති ඉක්මවා යෑමක්, කෙලෙස් ලිහා දැමීමේ පරිහානියක් වේද, ඒවානම්? රාජරාජ මහාමාත්‍යාදීන් සමග එක්ව ශෝකවෙමින්, එක්ව ප්‍රීතිවෙමින්, එක්ව සුවදුක් විඳිමින් සිටියි ද කිසියම් කළයුතු කටයුත්තක් එළඹි කල්හි තමා වඩාත් උත්සාහවත්ව,

ඔවුන්ගේ එම කටයුතු කරයිද මෙය අනනුලෝමික සංසර්ගයකි. තීර්ථක ශ්‍රාවකයන් සමග සමාන කැමති, රුචි කිරීම් ඇතිව එක්ව හැසිරේ ද එකම කැමති - රුචි සමාචාර භාවය ගෙන දීම හෝ සෙනෙහස, බුහුමන, මිත්‍රසන්ථ ඇතිව වෙසෙත් ද එය ද අනනුලෝමික සංසර්ගයකි. මෙහි රාජරාජ මහාමාත්‍යාදීන් සමග පවතින සංසර්ගය බඹසරට අනර්ථකර වේ. අනික් කරුණ මිසදිටු ගැනීමට හේතු වේ. අන්‍යාගමිකයන්ගේ පිළිගැනීම් බිඳලා, තම පිළිගැනීමට ඔවුන් නතු කරගනු හැකි දක්ෂ භික්ෂුවට ඒ අන්‍ය තීර්ථකයන් වෙත එළඹීම සුදුසුය.

දැන් තවත් ක්‍රමයකින් (පර්යායකින්) අගෝචර ස්ථාන දක්වමින් **යානිවා පන තානි කුලානි** යි අරඹන ලදී. එහි **අස්සද්ධානි** යනු බුද්ධාදීන් කෙරෙහි ශ්‍රද්ධා විරහිත අයයි. ඔවුහු බුදුරදුන්ගේ සර්වඥ බව, ධර්මයේ නෛර්යාණික බව, සංඝයාගේ සුපටිපන්න බව නො පිළිගනිති. **අප්පසන්නානි** සිත ප්‍රසන්න වූවක්, නොකැළඹුනක් කිරීමට සමත් නොවෙති. **අක්කොසක පරිභාසකානි** අක්‍රොශ කිරීම මෙන්ම පරිභාස කිරීම ද, නුඹ සොරෙක - බාලයෙක - මෝඩයෙක - ඔටුවෙක - ගොනෙක - ගද්‍රභයෙක - අපායෙහි උපන්නෙක - නිරයේ උපන්නෙක - තිරිසනෙක - නුඹට සුගතියක් නම් නැත. නුඹ දුගතියම කැමතිවිය යුතුයි යනුවෙන් දසවිධ ආක්‍රෝශ වස්තුවෙන් පරිභව කරති. චේවා! දැන් නුඹට පහර දෙන්නෙමු. බඳින්නෙමු. වධ පමුණුවන්නෙමු. මෙසේ භය දැක්වීමෙන් (භය කිරීමෙන්) පරිභාස කරති යන අර්ථයයි. **අනත්ථකාමානි** අර්ථය, යහපත කැමති නොවෙති. අනර්ථයම කැමති වෙති. **අහිතකාමානි** අහිතයම, අනර්ථයම කැමති වෙති. හිත-යහපත නොකැමති වෙති. **අඵා සුකාමානි** යනු පහසුව නොකැමති වෙති. අපහසුවම කැමති වෙති. **අයොගක්ඛෙම කාමානි** යනු සතර යෝගයන්ගෙන් ක්ෂේමය, නිර්භය බව නො කැමති වෙති. භය ම කැමති වෙති. **භික්ඛූනං** යන මෙහි සාමණේරවරු ද ඇතුලත් වෙති. **භික්ඛුනීනං** යන මෙහි ද ශික්ෂ මානාවෝද සාමණේරියෝද ඇතුල් වෙති. භාග්‍යවතුන් වහන්සේ උදෙසා පැවිදි වූවන්ගේද සරණ ගියවුන්ගේද සිවුපිරිසට ඇතුලත් සියල්ලන්ගේම අනර්ථය - පිරිහීම ඔවුහු කැමති වෙති. **තථාරූපානි කුලානි** යනු මෙබඳු ක්ෂත්‍රියාදී කුලයන් **සෙවති** ඇසුරේ ජීවත් වේ ද, **භජති** යනු එළඹෙති. **පයිරුපාසති** යනු නැවත නැවත එළඹෙති. **අයං වුච්චති** යනු මේ වෛශ්‍යාදී ගෝචර වශයෙන් වෙසඟනෝ ආදීහුද රාජ සංසර්ග වශයෙන් රාජාදීහු ද අශ්‍රද්ධාවන්ත කුල සේවකාදී

වශයෙන් අශ්‍රද්ධාවන්තාදී කුලාදියද යනුවෙන් ත්‍රිවිධාකාරයකින් දැක්වූ අයුක්ත අගෝචරයෝ 'අගෝචර' යැයි දතයුතුයි.

මෙහි මෙම පර්යායයෙන් ද 'අගෝචර බව' දතයුතුයි. වෙසියාදීහු පස්කම් ගුණ පිරුණු තැන් බැවින් පළමුව අගෝචර යැයි දතයුතුයි. එනිසා කියන ලදී. 'කො ච භික්ඛුනො අගොචරො පරවිසයො යදිදං පංචකාමගුණ (භික්ෂුවට අගෝචරය පරවිෂය කවරේද? යම් පස්කම් ගුණයක් වේද එයයි) යනුයි. රාජාදීහු උපත අනුව යෙදුණු, ලාභ සත්කාරාදිය ආශ්‍රය නොකිරීමෙන්ද සත් විතර්කයන් ගසා දමන දෘෂ්ටි විපත්ති හේතුවෙන්ද (අගෝචර වේ) අශ්‍රද්ධාවන්ත කුලාදීහු ශ්‍රද්ධාවට හානිකරන සිත් හා දෝෂයන් පමුණුවන හෙයින් ද අගෝචර ස්ථාන වේ. ඇතුලුගෙට පිවිසෙන්නාද ඇසින් රූප දැක නිමිති ගන්නා තැනැත්තාද ශ්‍රද්ධාවෙන් දුන් භෝජන වළඳ විසූක දර්ශන බැලීම් ආදියෙහි යෙදීමද පංචකාම ගුණයෝ ද යන සතර වැදෑරුම් වූ කෙලෙස් උත්පත්ති ස්ථානද 'අගෝචර' වේයැයි දතයුතුයි. **මා භික්ඛවෙ අගොචරෙ චරථ** යනු හැසිරීමට නුසුදුසු ස්ථානයන්හි නො හැසිරෙවු. **පරවිසයෙ** සතුරු විෂයෙහි **අගොචරෙ භික්ඛවෙ චරතං** නුසුදුසු ස්ථානයේ හැසිරෙන්නන්ට.

ලච්ඡති ලබන්නේය. දකින්නේය. **මාරො** යනු දේවපුත්ත මාරයාද මෘත්‍යු මාරයාද **ඔතාරං** යනු හිඩැසක්, සිදුරක්, විවරයක්. ගෝචර නිද්දේසයේ **න වෙසියගොචරො හොති** ආදිය කියන ලද ආකාරයට විරුද්ධ වශයෙන් දතයුතුයි. මෙහි ඇති විශේෂය නම් **චත්තාරො සතිපට්ඨානා ගොචරො** යනු හැසිරීමට සුදුසු ස්ථාන වශයෙන් සතර සතිපට්ඨානය ගොදුරුකොට ඇති. **සකෙ** තමාගේ සන්තකයේ. **පෙතිකෙ විසයෙ** පියාගෙන් පැමිණි විෂයෙහි. **ආරද්ධවිරියස්ස** යනු මනාව එළවූ, සතර සම්‍යක් ප්‍රධාන වීර්යවන්ත වූ. ථාමවතො බලයට පත් වූ. **දළ්හ පරක්කමස්ස** දැඩි වීර්ය ඇත්තාට **යස්සත්‍ථාය පෙසිතො** අර්හත් බව පිණිස ආත්මභාවය හැරදැමූ. **අත්තත්‍ථෙ ච** තමාගේ අර්ථයෙහි, අර්හත් ඵලයෙහි. **ඤායෙ ච** ආර්ය අෂ්ටාංගික මාර්ගයෙහි ද **ලක්ඛණෙච** අනිත්‍යාදී ලක්ෂණ ප්‍රතිවේධයෙහිද **කාරණෙ ච** හේතුවෙහි ද **ඨානාඨානෙ ච** ස්ථානයේ ද අස්ථානයේ ද කාරණයේ ද අකාරණයෙහි ද යන අර්ථයයි. දැන් විස්තර කර දැක්වීමට 'සබ්බ සංඛාරා අනිච්චා' යනාදිය කියන ලදී.

අටවන ගාථාවේ **එකොදි නිපකො** එකඟ සිත් ඇති පණ්ඩිතයා **ජාතරූපසස ඔලාරිකමපි මලං ධමති** යනු ස්වර්ණයේ දැඩි වූ මල ගින්නෙහිලා ඉවත් කරන්නාක් මෙන් **සන්ධමති** මනාව ඉවත් කරයි. **නිදධමති** නැවත හට නොගන්නක් කොට බැහැර කරයි. ඇතැමෙක් 'ඣාපෙති' දවයි යැයි කියති. **මජ්ඣිමකමපි** ඊට ද වඩා අතිශය සියුම් වූ. **සුඛුමකමපි** අතිශය සූක්ෂම වුවත්. **එවමෙව** උපමාව දැක්වීමයි. **අත්තනො ඔලාරිකෙපි කිලෙසෙ ධමති** කාය දුශ්චරිතාදී දැඩි කෙලෙස් වීර්ය නැමති අච්චෙන් දුරුකරයි. **මජ්ඣිමකෙපි කිලෙසෙපි** කාම විතර්කාදී ඕළාරික, සියුම්, මධ්‍යම වූ කෙලෙස් අතරින් **සුඛුමකෙපි** ඤාති විතර්කාදී වූ ඉතා සියුම් වූ ක්ලේශයන්හි.

සම්මා දිට්ඨියා මිච්ඡාදිට්ඨිං ධමති යනු විදර්ශනාවත් සමග මාර්ග සම්ප්‍රයුක්ත වූ සම්මා දිට්ඨියෙන් විපරීත නම් වූ මිසදිටුව බැහැර කරයි. සම්මා සංකප්ප යනාදියෙහි ද මේ ක්‍රමයමයි. මෙසේ ආයුෂ්මත් සාරිපුත්‍ර මාහිමියන් විසින් මුල් ගාථා තුනින් බුදුරජාණන් වහන්සේට ස්තුති කර, පසුව එන ගාථා පහෙන් පන්සීයක් සිසුන්ගේ යහපත සඳහා සෙනසුන්, ගෝචර, සීලවතාදිය පිළිබඳව විචාරන ලද්දේ, එම අර්ථය ප්‍රකාශ කිරීමට, දෙසනු සඳහා (බුදුහු)

විජගුඣ මානසස යනාදී ක්‍රමයෙන් විසඳීම ඇරඹූ සේක. එහි පළමු ගාථාවේ අර්ථය පළමුව දැක්වේ. ශාරිපුත්‍රය! ජාති ආදියෙන් පිළිකුල් කරන්නා වූ හිස් වූ අසුන විවික්තාසනය ශයනය සේවනය කරන සම්බෝධිය කැමැත්තා වූ භික්ෂුවට ඉදින් යම් පහසු විහරණයක් වේද, යම් අනුධර්මයක් වේද එය නුඹට කියමි. දැනගත් පරිදි, ප්‍රත්‍යක්ෂ කරගත් පරිදි එය කියමි. **යං ඵාසු විහාරං** යම් සුඛ විහරණයක්. **අසප්පාය රූප දස්සනෙන ස්ත්‍රී** රූපාදී ශ්‍රමණ අසප්පාය වූ රූප දැකීමෙන්. **තං බොධිං බුජ්ඣිතු කාමසස** ඒ සිව්මාර්ග ඤාණ සංඛ්‍යාත වූ බෝධිය අවබෝධ කරගනු කැමැත්තහුට අනුබුජ්ඣිතුකාමසස අනුරූප වූ ප්‍රතිපත්තියෙන් අවබෝධ කරගනු කැමැත්තාට **පටිවිජ්ඣිතුකාමසස** යනු ඉදිරියේ තබා නිවන් දකිනු කැමැත්තාට. **සමබුජ්ඣිතුකාමසස** ප්‍රහීණ වූ කෙලෙස් නැවත නොපැමිණීම් වශයෙන් මනාව අවබෝධ කරගනු කැමැත්තාට **අධිගන්තු කාමසස** පැමිණෙනු කැමැත්තහුට. **සච්ඡිකාතු කාමසස** යනු ප්‍රතිලාභයට, සාක්ෂාත් කිරීමට පැමිණෙනු කැමැත්තහුට.

නැතහොත් බුජ්ඣිතුකාමස්ස යනු සෝවාන් මාර්ග ඤාණය දැනගනු කැමැත්තාට අනුබුජ්ඣිතු කාමස්ස යනු සකෘදාගාමී මාර්ග ඥානයනැවත දැනගනු කැමැත්තාට. පටිවිජ්ඣිතුකාමස්ස යනු අනාගාමී මාර්ග ඤාණය ප්‍රතිවේධ වශයෙන් දැනගනු කැමැත්තාට. සම්බුජ්ඣිතු කාමස්ස යනු අර්හත් මාර්ග ඤාණය මනාව දැනගනු කැමැත්තාට. මේ සිවු මාර්ගයන් අවබෝධ කරගනු කැමැත්තාට. **ඵුසසිතුකාමස්ස**, ඤාණ ස්පර්ශයෙන් ස්පර්ශ කරනු කැමැත්තාට. **සච්ඡිකාතුකාමසස** යනු ප්‍රත්‍යවේක්ෂාවෙන් ප්‍රත්‍යක්ෂ කරගනු කැමැත්තාට. **චතුනනං මගගානං පුබබභාගෙ විපසසනා** සතර ආර්ය මාර්ගයන්ගේ මුල් කොටසෙහි උපන්, ඇතිවීම-නැතිවීම පිළිබඳ වූ විදසුන් නුවණයි.

දෙවැනි ගාථාවේ **පරියනතචාරී** යනු ශීලාදී සතර පර්යන්තයන්හි හැසිරෙන්නා වූ. **ඩංසාධිපතානාං** යනු ඇටමැස්සන්ගේ ද සෙසු මැස්සන්ටද ඔවුහු ඒ ඒ තැනින් උඩට නැගී කති. එනිසා 'අධිපාතා' යැයි කියති. **මනසසඵසසානං** සොර ආදීන්ගේ ස්පර්ශ. **චතතාරෝ පරියනතා** යනු සතර සීමාවන් වෙන්කිරීම්. **අනෙතා පූතිභාවං පචචවෙකඛමානො** යනු අභ්‍යන්තරයේ පිළිකුල් බව සිල් රහිත බව සිහිකර බලමින්. **අනෙතා සීල සංවර පරියනෙත චරති** යනු සීල සංවරයෙන් පරිච්ඡේද අභ්‍යන්තරයේ හැසිරෙයි. සැරිසරයි. **මරියාදං න භිනදති**. සීල මර්යාදය, සීල පරිච්ඡේදය (සීමාව) නොබිඳියි. **ආදිත්ත පරියායං පචචවෙකඛමානො** ආදිත්ත සූත්‍ර දේශනාව සිහිකර බලමින් **අකඛභඤඣන පටිචඡාදන පුත්තමංසූපමං පචචවෙකඛමානො** රියදුරාගේ අක්ෂය (අලවංගුව) නොබිඳින උපමාව ද කුෂ්ඨාබාධිතයාගේ තුවාල වසන තෙල් රෙදිකඩ උපමාවද කාන්තාරයට පිළිපන් අඹුසැමි දෙදෙනාගේ පුත්‍රමාංසය කෑම පිළිබඳ උපමාවද සිහිකර බලමින්. **භදදෙක රතත විහාරං පචචවෙකඛමානො** යනු

අතීතං නානුාගමෙය්‍ය නපපටිකංඛෙ අනාගතං
තං වෙ භදදෙකරතෙතාති සතෙතා ආචිකඛතෙ මුනී'තී

අතීතය පිළිබඳ මෙනෙහි නොකරන්නේය. අනාගතය ද කැමති නොවන්නේය. මේ වර්තමානයේ පමණක් සිත තබාගත් ශාන්ත අවස්ථාව භද්දේකරත්ත යැයි මුනිහු වදාළහ.

මෙසේ කියන ලද භද්දේකරත්ත විහරණය සිහිකර බලමින්. **තා උපපතිත්වා උපපතිත්වා ඛාදනති** යනු ඒ මැස්සෝ පැන පැන කති.

තෙවැනි ගාථාවේ **පරධම්මිකා** නම් සත්වැදෑරුම් සහධම්මික නොවූවෝ, බාහිර සමයන්හි වූ සියල්ලෝ ද **කුසලානු එසී** යනු කුශල ධර්මයන් පිළිබඳව සොයන **සත්ත සහධම්මිකෙ** යපෙත්වා යනු භික්ෂුව, භික්ෂුණිය, ශික්ෂමානාව, සාමණේරයා, සාමණේරිය, උපාසකයා, උපාසිකාව යන සත්දෙන අත්හැර. **අථාපරානිපත්ථී අහිසමෙතබ්බානි** යනු අන්‍ය වූ මැඩිය යුතු කරුණු ඇත. විද්‍යමාන වේ.

සිවුවන ගාථාවේ **ආතංක එසෙසන** යනු රෝග ස්පර්ශයෙන්. **සීතං අථුණ්හං** යනු සීතලත් උණුසුමත් සො තෙහි ථුථෙයා බහුධා යනු ඔහු ඒ රෝගාදී අනේකවිධ ස්පර්ශයන් නානාප්‍රකාරව පහස්නා ලද්දේ. (ස්පර්ශ කරන ලද්දේ.) අනොකො අභිසංස්කාර, විඤ්ඤාණාදියට අවකාශ රහිත වූයේ. **අබ්භනතර ධාතුසංඛොභවසෙන වා** යනු ශරීරාභ්‍යන්තරයේ ආපෝ ධාතුව කැළඹීම් වශයෙන් හෝ අනික් අතින් ධාතුවක් කිපීම් වශයෙන් හෝ. **උණ්හං** යනු ශරීරාභ්‍යන්තරයේ තේජෝ ධාතුව කිපීම් වශයෙන් උෂ්ණය ඇතිවේ. **අභිසංඛාර සහගත විඤ්ඤාණසස** යනු කුශලාකුශල චේතනා සම්ප්‍රයුක්ත සිතට. **ඔකාසං න කරොති** යනු අවකාශයක් පිහිටක් නොකරයි. **අවත්ථිත සමාදාතො** යනු බැසගැනීමයි. මෙසේ භික්ෂුවට 'විජිගුච්ඡතො'යි යනාදී ගාථාවලින් මනාව අර්ථය ගෙනහැර දක්වා, දැන් 'ක්‍යාසස ව්‍යප්පථයො' යනාදී ලෙස ඇසූ ප්‍රශ්නය විසඳමින්.

ථෙය්‍යං න කරෙය්‍ය යනාදී ගාථාව කියන ලදී. එහි **එසෙස** පතුරුවන්නේය. **යදාවිලත්තං මනසො විජඤ්ඤා** යනු යම් සිතේ කැළැඹුණු බවක් දන්නේ නම්, ඒ සියල්ල මාරයාගේ පක්ෂය යැයි දුරුකරන්නේය. **අදින්නාදානං පහාය** යන මෙහි නොදුන් දෙය ගැනීම අදින්නාදානයයි. අනුන්ගේ දේ ගැනීම සොරකමකි. එසේ කරන්නා සොරු නම් වෙති. එහි **අදින්නං** යනු අනුන් විසින් ගන්නා ලද. (අනුන්ට අයත් වූ.) යමක් පිළිබඳව අන්‍යයන් කැමති දේ කිරීමට පැමිණෙන්නේ දඬුවමට, චෝදනාවට නුසුදුසු වේද ඒ අනුන් අයත් වූ, අනුන්ගේය යන සංඥා ඇති වස්තුවෙහි ගැනීම සඳහා වූ උපක්‍රමයෙන් නැඟි සොර සිත අදින්නාදාන නම් වේ. එහිදී සොරාගත් දෙය හීන, කුඩා දෙයක් නම් අකුසලය අල්ප සාවද්‍ය වේ. උසස් වස්තුවක් නම් මහා සාවද්‍ය වේ. කුමක් නිසා ද? වස්තුවේ උසස්

බව නිසයි. වස්තුව සමාන වූ කල්හි වස්තු හිමියාගේ ගුණ සම්පත්තිය අධික නම් අකුසලය මහා සාවද්‍ය වේ. ඒ ඒ ගුණාධික බව ගැනීමෙනි. ඒ ඒ ගුණයන්ගෙන් හීන වූවහුගේ වස්තුව සොරාගත් විට එය අල්ප සාවද්‍ය වේ. අදින්නාදානය සම්පූර්ණ වීමට කරුණු පහක් සම්පූර්ණ විය යුතුයි. අනුන් අයත් වස්තුවක් තිබීම, අනුන් අයත් බව දැනීම, සොර සිත, සොරාගැනීමට උපක්‍රමයක් යෙදීම හා ඒ උපක්‍රමයෙන් සිතූ දෙය ගැනීම යනු ඒ කරුණු පහයි. **පහාය** මේ අදින්නාදාන චේතනාව නම් වූ දුසිල් බව අත්හැර. **පටිවිරතෝ** යනු ප්‍රහීණ වූ කාලයේ පටන්, ඒ දුසිල් බවින් වැලකී, වෙන්ව. දුන්දෙය ම ගන්නේ නුයි **දිනනාදායී** නම් වේ. සිතිනුදු දුන් දෙයම කැමති වේනුයි **දින්න පාටිකංඛී** නම් වේ. සොරකම් කරන්නේනුයි 'ථේන' නම් වේ. සොරකමින් වැලකීමෙන් න+ථේනෙන = **අථේනෙන** නම් වේ. සොරකම් නොකරන නිසාම **සුචිභූතෙන**, පිවිතුරු සිතින්. **අත්තනා** යනු ආත්ම භාවයෙන්. සොරකමින් තොරව පිරිසිදු භාවයෙන් යුතු ආත්මභාවයක් කර වෙසේයයි කියන ලදී. මින්පසු එන නිද්දේසපදයන්ගේ අර්ථ ඉහත පැවසූ පරිදිමය.

මෛත්‍රී කිරීම් වශයෙන් **මෙත්ති** මෛත්‍රී කිරීම. **මෙත්තායනා** මෛත්‍රියෙන් යුක්ත චිත්ත ස්වභාවය **මෙත්තායිතත්තං**. කරුණාව දක්වන්නේනුයි **අනුද්දයා** රක්ෂා කරයි යන අර්ථයයි. කරුණාව, දයාව දක්වන ආකාරය **අනුද්දයනා**. කරුණාවෙන් යුතු පුද්ගලයාගේ ස්වභාවය **අනුද්දායිතත්තං** හිතවත් බව සෙවීම් වශයෙන් **හිතෙසිතා**. අනුකම්පා කිරීම **අනුකම්පා**. මේ සියලු වදන්වලින් උපචාර අර්පණාවට පත් මෛත්‍රිය අදහස් කරන ලදී. **විපුලෙන** යනු මෙහි පැතිරවීම් වශයෙන් විපුල බව දතයුතුයි. භූමි වශයෙන් එය මහග්ගතය. ප්‍රගුණ කිරීම් වශයෙන් ද සත්ත්වයන් අරමුණු කිරීම් වශයෙන් ද එය **අප්පමාණ** වූ බැවින් **අප්පමාණං** වේ. තරහව, සතුරුකම ප්‍රහාණය කිරීමෙන් **අවෙරං**. දොම්නස ප්‍රහාණය කිරීමෙන් **අබ්‍යාපජ්ඣං**. නිදුක්යැයි කියන ලදී. **ආවිලං** යනු අප්‍රසන්නය. කැළඹුණේය. **ලුලිතං** මඩ වූයේය. **එරිතං** කම්පිත වූයේය. **සටිතං** අරමුණේ ගැටෙමින් පවතියි. **චලිතං** සෙලවේ. කම්පනය වේ. **භන්තං** භ්‍රාන්ත වේ. **අවුපසන්නං** නොසන්සිඳුණි. නොමනිවුණි.

යෝ සෝ මාරෝ යනාදියෙහි මහජනයා අනර්ථයේ යොදවා මරා දමයිනුයි **මාරෝ** කලු කර්ම ඇති නිසා **කණ්හා**, කාමාවචර ලෝක සත්ත්වයා ඇලුණු හෙයින් **අධිපති**. මරණයට පමුණුවන බැවින් **අන්තගූ**

මිදීමට අවස්ථාව නොදෙන හෙයින් **නමුචි.** මාරයාගේ බිල්ල **මාරබලිසං.** සංසාර වට්ටය ආශ්‍රිත අර්ථයෙන් මාරයාගේ ආමිෂය වන්නේනුයි **මාරාමිසං.** සිය වසඟයේ පවත්වා ගනී යන අර්ථයෙන් මාරයාගේ විෂය වූයේ නුයි **මාර විසයෝ.** ගෝචර අර්ථයෙන් මාරයාගේ නිවාප වූයේනුයි **මාරනිවාපෝ.** කාමාචාරයේ හැසිරෙන අර්ථයෙන් මාරයාගේ ගෝචර වූයේනුයි **මාරගොචරෝ.** මිදීම අපහසු අර්ථයෙන් මාරයාගේ බන්ධනය වූයේනුයි **මාරබන්ධනං. දුක්ඛදදසෝ** යනු දුක්ඛ බන්ධනයයි.

මූලම්පි තෙසං පිළිබඤ්ඤ තිටේඨ යනු ඒ ක්‍රෝධාතිමානයන්ගේ අවිද්‍යාදී මූලය ද උදුරා දමා සිටින්නේය. **අඳ්ධා භවනෙත්තා අභිසමභවෙය්‍ය** යනු මේ ප්‍රිය, අප්‍රිය වස්තු මැඩලා අභිභවනය කරන්නා ඒකාන්තයෙන් මාරයා මැඬලන්නේය. එනිසා මෙහි ලිහිල් වීර්යයක් නොකල යුතුය යන අර්ථයයි.

අවිජ්ජා මූලං ආදියේ අර්ථ - අවිද්‍යාව ක්‍රෝධයට උපනිශ්‍රය වීම, සහජාත වීම් ආදී වශයෙන් 'මූල' වේ. උපාය රහිත මනසිකාරය ද අස්මිමානයද යන දෙක උපනිශ්‍රය වශයෙන් 'මූල' වේ. අහිරිකය - අනොත්තප්පය - උද්ධච්චය යන තුන උපනිශ්‍රය, සහජාතාදී වශයෙන් 'මූල' වේ. අතිමානයේ ද මෙසේමය.

පඤ්ඤං පුරකඛ්වා යනු ප්‍රඥාව පූර්වාංගම කරගෙන. **කල්‍යාණ පීති** කල්‍යාණ ප්‍රීතියෙන් යුක්ත වූ. **චතුරෝ සහෙථ පරිදෙව ධම්මෙ,** මීට පසුව එන ගාථාවේ කියනු ලබන පරිදේව ධර්මයන් ඉවසන්නේ ය. **විචය බහුලෝ විමසීම** බහුලකර ඇත්තේනුයි. **පවිචය බහුලෝ** යනු විශේෂයෙන් විමසීම් බහුලව. **පෙකඛායන බහුලෝ** නුවණින් දැකීම බහුල කර ඇත්තේ **සමෙකඛායන බහුලෝ** යනු සෙවීම බහුල කර ඇත්තේ **විභූත විහාරී** ප්‍රකට කර, දැන හැසිරෙන **අභික්කනෙත පටික්කනෙත** මෙහි පළමුව දැක්වී අභික්කන්තං යනු ගමන් කිරීමයි. පටික්කන්තං යනු නැවතීමයි. ඒ දෙකම සිවු ඉරියව්වෙහි ලැබේ. ගමන් කිරීමේදී පෙරටුව කය ගෙන යන්නේ 'අභික්කමති' නම් වේ. ගොස් නැවත හැරීම 'පටික්කමති' නම් වේ. සිටින තැන ද සිටියේ කය පෙරටුව නැමීම අභික්කමති නම් වේ. පසුපසින් කය එළවීම 'පටික්කමති' නම් වේ. හිඳීමේදී හුන්නේම අසුනේ පෙරටුවට (ඉදිරිපසට) කය එළවා සිටීම 'අභික්කමති' නම් වේ. පසුපසට

කය එළවා සිටීම පටික්කමති නම් වේ. සයනය කිරීමේදී ද මෙසේ අර්ථ දතයුතුයි. **සම්පජාන කාරී හොතී** යනු සිහිකල්පනාවෙන් සියලු කටයුතු කරයි. නොහොත් සිහියෙන් පිහිටුවාගෙනම කරයි. ඔහු වනාහී අභික්කන්තාදී සියලු කටයුතු සිහියෙන් ම සිදුකරයි. කිසිදු ක්‍රියාවක් අසිහියෙන් නොකරයි. **ආලොකිතෙ විලොකිතෙ** යන මෙහි ආලොකිත නම් පෙරටුව බැලීමයි. විලෝකිත නම් වටපිටාව බැලීමයි. අනිකුත් යට, උඩ, පසුපස යන දිසාවන් බැලීම් වශයෙන් ඔලෝකිත, උල්ලෝකිත හා අපලෝකිත යන වදන් පිළිවෙලින් යෙදේ. ඒවා මෙහිදී අදහස් නොකෙරුණි. සාරූප්‍ය වශයෙන් මේ දෙපදය පමණක් දක්වන ලද බැවින් සෙසු සියලු වදන් ද යෙදූ බව (අදහස් කරන බව) දතයුතුයි. **සම්මිඤ්ජිතෙ පසාරි තෙ** අවයව හැකිලීම හා දිගහැරීමයි. **සංඝාටිපත්තචීවර ධාරණෙ** යන මෙහි සඟලසිවුරු ඇඳීම් පෙරවීම් වශයෙන් ද පාත්‍රයේ භික්ෂාවන් පිළිගැනීම් වශයෙන් ද පරිභෝග කිරීම ධාරණ නම් වේ.

අසිතාදියෙහි **අසිතෙ** යනු පිණ්ඩපාත භෝජනයෙහි **පීතෙ** යනු කැඳ ආදිය බීමේ දී. **ඛායිතෙ** යනු පිටි කැවිලි ආදිය කෑමේදී. **සායිතෙ** මීපැණි ආදිය බීමේදී. **උච්චාරපස්සාව කම්මෙ** මලමූත්‍රා කිරීමෙහි. ගතාදියෙහි **ගතෙ** යනු ගමන් කිරීමෙහි. **ඨිතෙ** සිටීමෙහි. **නිසින්නෙ** හිඳීමෙහි. **සුත්තෙ** සයනය කිරීමෙහි. **ජාගරිතෙ** නිදානොගෙන සිටින අවස්ථාවෙහි. **භාසිතෙ** යනු කථනයෙහි දී. එහි උපාදා රූපයේ ශබ්දායතනය නොපවතින කල්හි භාෂණය සිදු නොවේ. එහි පවත්නා කල්හි ම වේ. අල්වාගත් භික්ෂුව භාෂණයේ දී සිහිකල්පනාවෙන් යුතුව වෙසේ. විමුක්තායතන ශීර්ෂයෙන් ධර්මදේශනා කරනවිට ද දෙතිස් තිරිසන් කථා අත්හැර දසකථා වස්තු නිශ්‍රිත කථාව කරන විටද දෙතිස් තිරිසන් කථා අත්හැර දසකථා වස්තු නිශ්‍රිත කථාව කරන විට ද කථාකිරීමෙහි නුවණින් දැන කථා කරයි. **තුණ්හීභාවෙ** කථා නොකිරීමෙහි. එහි උපාදා රූප ශබ්දායතනයේ පවත්වන තුණ්හීභාවයක් නම් නැත. නොපැවැත්ම චේතුයි පරිග්‍රහණය කරගත භික්ෂුව නිශ්ශබ්දව සිටීමේ නුවනින් මෙහෙයවා කටයුතු කරන්නේ වේ. තිස්අටක් අරමුණුවල සිතට රුචි කමටහන් ගෙන හුන්නහුගේ ද දුතිය ධ්‍යානයට සම වැදුනහුගේ ද තුෂ්ණීම්භාවයේ සිහිකල්පනා ඇතිව සිටීම වේ. මෙහි ද එකම ඉරියව්ව දෙතැනක දැක්විණි. එය ඉහත **අභික්කන්තෙ** යැයි කී තැන භික්ෂාචාර ගමට යෑමේදී නැවත හැරී ඒමේ දී, මාර්ගයේ යෑම් ඒම් වශයෙන් කියන ලදී. **ගතෙඨිතෙ** යැයි මෙතැනදී විහාරයේ,

තමා වසන තැන සුලු සුලු ඉරියව් පැවැතුම් වශයෙන් කියන ලදැයි දතයුතුයි. බුද්ධානුසසති වසෙන යනාදිය ඉහත ඒ ඒ තැන්වලදී විස්තර කර ඇත. **අරති** යනු රතියට විරුද්ධ බවයි. **අරතිතා** යනු රමණය නොකරන ආකාරයයි. **අනභිරති** යනු තදින් නොඇලෙන බවයි. **අභිරමනා** යනු අභිරමණය නොකරන ආකාරයයි. **උකකුණඨිතා** යනු කළකිරෙන බවයි. **පරිතසසනා** උක්කට්ඨාන වශයෙන් ම තැවීමයි.

කිංසු අසිසසාමි යනු කුමක් වළඳම්ද? **කුවං වා අසිසසං** කොහි හෝ වළඳම්ද? **දුකඛං වත සෙජජ කුවජජ සෙසසං** යනු මේ රෑ ඒකාන්තයෙන් දුකසේ ශයනය කෙළෙමි. අද රෑට කොතැනක නිදන්නෙම් ද? **එතෙ විතකෙක** යනු මෙසේ පිණ්ඩපාතය නිසාත් සෙනසුන් නිසාත් දෙක දෙක බැගින් වූ විතර්ක සතරකි. **අනිකෙතචාරී** පළිබෝධයක් නැතිව හැසිරෙන, තණ්හා විරහිතව හැසිරෙන. **එලකෙ වා** යනු වක් වූ පුවරු පුටුවෙහි (ඇඳි පුටුවේ) හෝ **ආගාමිනි රතනිං** අද පැමිණෙන රාත්‍රියේ දී. **ආදෙවනෙයෝ** යනු විශේෂයෙන් වැලපිය යුතු වූ **පරිදෙවනියෝ** හාත්පසින්ම වැලපෙන්නේය.

කාලෙ යනු පිඬු පිණිස යන කාලයේ, පිණ්ඩපාත සංඛ්‍යාත ආහාර හෝ සිවුරු හෝ මේ ආදී ආමිෂයක් දැහැමින් සෙමෙන් ලබන කාලයේ දී. **මතතං සො ජඤඤා** යනු පිළිගැනීමේ දී ද පරිභෝගයේ දී ද ඒ නුවණැති භික්ෂුව පමණ දැනගන්නේ ය. **ඉධ** යනු මේ සසුනේ නැතහොත් මෙය නිපාතයක් පමණි. **තොසනතථං** යනු සන්තෝෂ කිරීමට. මෙහි අර්ථය 'පමණ දන්නේය' යැයි කියන ලදී. (ලද දෙයින් තුටුවීම සඳහා) **සො තෙසු ගුතතො** යනු ඒ භික්ෂුව එම සිවුපසයෙහි සංවර වූයේ. **යතචාරී** යනු සංවර විහාර ඇති, රැකි ඉරියවු ඇති, සුරැකි කාය වාග් මනෝද්වාර ඇති යි කියන ලදී. **යතිචාරී** යන පාඨය ද යෙදේ. එකම අර්ථයමයි. **රුසිතො** යනු අනුන් විසින් පීඩා කළේ, ගටන ලද්දේ නමුත්,

දවීහි කාරණෙහි මතතං ජානෙයය යනු කරුණු දෙකකින් තමාගේ ප්‍රමාණය දැනගන්නේ ය. **පටිගහණතො වා** යනු අනුන් විසින් දෙනු ලබන දේ ගන්නා කාලයේ හෝ. **පරිභොගතො වා** යනු පරිභෝග කරන කාලයේ හෝ. **ථොකෙපි දියයමානෙ** යනු ඉතා අල්ප දෙයක්වත් දෙනු ලබන කල්හි. **කුලානුදදයා** යනු කුලයන් කෙරෙහි කරුණාවෙන්.

කුලානුරක්ඛාය යනු කුලයන්ගේ ආරක්ෂාව සඳහා. **පතිගණ්හාති** යනු ඉතා අල්පයක් වුවත් පිළිගනියි. **බහුකෙපි දීයමානෙ** යනු අනල්පව දෙනු ලබන කල්හි. **කායපරිහාරියං චීවරං පතිගණ්හාති** යන මෙහි කය පරිහරණය කරයි. පෝෂණය කරයි නුයි කාය පරිහාරිය නම් වේ. **කුච්ඡිපරිහාරියං** යනු කුස පරිහරණය කරයි. පෝෂණය කරයි නුයි කුච්ඡිපරිහාරිය නම් වේ. මෙසේ ඉතරීතර ප්‍රත්‍ය සන්තෝෂයෙන් යුක්ත භික්ෂුවට අටපිරිකර සුදුසුය. ඒවානම්, තුන්සිවුර, පාත්‍රය, දැහැටි දඬු කපාගන්නා වෑය, ඉදිකටුව හා නූල, කය බඳිනා පටිය හා පෙරහන්කඩ යන අටයි. එය කියන ලදී.

තිචීවරඤඤ පතෙනා ච වාසි සූචිච බන්ධනං
පරිසඤාවනෙන අට්ඨතෙ යුත්තයොගසස භික්ඛුනො'තී

මේ අටම කාය පරිහාරික ද කුච්ඡි පරිහාරික ද වේ. ඒ කෙසේද? තුන්සිවුර පළමුව හැඳ පොරවා ඇවිදින කාලයේ දී කය පරිහරණය කරයි. පෝෂණය කරයිනුයි, කාය පරිහාරික වේ. සිවුරු කොණෙන් දිය පෙර වළඳනවිට ද කෑ යුතු ඵලාඵලාදියක් පිළිගන්නා විට ද සිවුර කුස පරිහරණය කරයි. පෝෂණය කරයි යන අරුතින් කුච්ඡි පරිහාරික වේ. පාත්‍රය ද ඉන් දිය ගෙන නානවිට ද කුටියේ ගොමමැටි ගාන විට ද කාය පරිහාරික වේ. ආහාර ගෙන වළඳන අවස්ථාවේ දී පාත්‍රය කුච්ඡිපරිහාරික වේ. වෑයෙන් දැහැටි දඬු කපාගන්නා විට ද ඇඳපුටුවල කැඩුණු කකුල්, සිවුරු කුටියේ දඬු ආදිය කපාගන්නා විට ද කාය පරිහාරික වේ. උක්ගස් සිදින, පොල් ලෙලිගසන හා ගාගන්නා විට ද (ලියාගැනීම) වෑය කුච්ඡිපරිහාරික වේ. ඉදිකටුව ඉරුණු සිවුරු මසාගන්නා විටදී කාය පරිහාරික වේ. කැවුම් හෝ ගෙඩි හෝ විඳ අනුභව කරනවිටදී කුච්ඡිපරිහාරික වේ. කාය බන්ධනය (පටිය) කය බැඳ ඇවිදින කාලයේ දී කාය පරිහාරිකද උක්ගස් ආදිය බැඳ රැගෙන එනවිටදී කුච්ඡිපරිහාරික ද වේ පෙරහන්කඩ, එයින් දිය පෙරා නානවිට ද සෙනසුන ගොමමැටි ගාන හෝ සෝදන විට ද කාය පරිහාරික වේ. බොන පැන් පෙරා වළඳනවිට ද එයින්ම තල, සහල්, හබලපෙති ආදිය පිළිගෙන වළඳන විට ද කුච්ඡි පරිහාරික වේ.

පටිසංඛායොනිසො යනු උපාය මාර්ගයෙන්, නුවණින් දැන, ප්‍රත්‍යවේක්ෂා කරමින් යන අර්ථයයි. මෙහිදී ද **සීතසස පටිඝාතාය** ආදී ක්‍රමයෙන් දෙසූ ප්‍රත්‍යවේක්ෂාව ම 'යොනිසො පටිසංඛා' නුවණින් සලකා

බලන බව දතයුතුයි. එහි **චීවරං** යනු අන්තරවාසකාදී යම්කිසිවක් (තුන් සිවුරෙන් එකක්). **පටිසෙවති** යනු වළඳයි. පොරවයි හෝ හැඳ පොරවා ගනියි. **යාවදෙව** යනු ප්‍රයෝජනය වෙන්කර දක්වන වචනයකි. මේ සඳහාම පමණක් යෝගාවචර භික්ෂුව චීවර හැඳ පොරවයි යනුවෙන් ප්‍රයෝජනය දක්වයි. ඒවානම් - සීතල නැසීම් ආදියයි. ඉන් ඔබ කිසිදු ප්‍රයෝජනයක් නැත. **සීතස්ස** යනාදියේ අභ්‍යන්තර ධාතු කිපීම් වශයෙන් හෝ බාහිර ඍතු විපරිණාමී තත්ත්ව නිසා හෝ උපන් කිසියම් ශීතලක් **පටිඝාතාය** යනු නැසීම, වැනසීම සඳහා. ශරීරයේ ශීතලින් ආබාධා ඇති නොවන සේ රැකගැනීම සඳහා. ශීතලින් ශරීරය පීඩිත වූ කල්හි සිත විසිර යන බැවින් නුවණින් මෙනෙහිකර බැලීම ඉතා අපහසු වේ. එනිසා සීතල නැසීමට සිවුරු පෙරවිය යුතුයැයි බුදුහු අනුදත්හ. මේ ක්‍රමයෙන් සියලු පදවල අර්ථ දතයුතුයි. මෙහි හුදෙක් **උණ්හස්ස** යනු ගින්නෙන් තැවීමෙන්, වනලැව්ගිනි ආදියෙන් තැවීමද මින් අදහස් වේ. **ඩංසමකස වාතාතපසිරිංසප සම්ඵස්සානං** යන මෙහි **ඩංස** යනු ඩැහැ ලේ බොන මැසි, අඳුමක්බිකා යැයි ද කියති. **මකස** යනු මදුරුවන්ය. **වාතා** යන සුළඟ දූවිලි සහිත, රහිත වේ. **ආතපෝ** යනු ඉර අව්ව. **සිරිසංපා** යනු යම්කිසි බිම හැසිරෙන, දිග ඇදී යන දිගු ශරීර ඇති ස්පර්ශාදීනුය. ඔවුන්ගේ දට්ඨ සම්ඵස්ස හා ඵුට්ඨ සම්ඵස්ස යනුවෙන් ස්පර්ශ දෙකකි. දෂ්ට කිරීමද ස්පර්ශය ද සිවුරු පොරවාගත් විට නැති වේ. එනිසා එබඳු සර්පාදීන් බහුල තැන්වලදී එම උවදුරු නැසීම සඳහා සිවුරු පරිභෝග කරයි. **යාවදෙව** යනු නැවත මේ ප්‍රයෝජන මිස වෙනත් ප්‍රයෝජන කිසිවක් සඳහා සිවුරු පරිභෝග නොකරන බව, වෙන්කර දැක්වීමට යෙදූ වචනයකි. **හිරිකොපීන පටිච්ඡාදනත්ථං** යන ලැජ්ජාව වසා ගැනීම නම් මෙකරුණ සිවුරු පෙරවීමේ ඇති නියත ප්‍රයෝජනයකි. සෙසු ප්‍රයෝජන ඒ ඒ අවස්ථාවල ලැබේ. එහි **හිරිකොපීනං** යනු ඒ ඒ සම්බාධ ස්ථාන, ඒ ඒ අංග ප්‍රත්‍යංග එළිපෙහෙළි වූ විට ලැජ්ජාව ඇතිවේ. හිරිය කිපේ. නැසේ. ඒ ඒ හිරියන්ගේ කෝපවීවෙන් 'හිරිකෝපීන' යැයි කියන ලදී. ඒ ලැජ්ජා කෝපනය වසාගැනීම සඳහා යනු 'හිරිකොපීන පටිච්ඡාදනත්ථං' වේ. 'හිරිකොපන පටිච්ඡාදනත්ථං' යන පාඨය ද යෙදේ.

පිණ්ඩපාතං යනු යම්කිසි ආහාරයකි. කිසියම් ආහාරයක් භික්ෂුවගේ පාත්‍රයේ පිඬු පිඬු වශයෙන් වැටුණු බැවින් පිණ්ඩපාත යැයි කියයි. පිණ්ඩයන්ගේ පතනය පිණ්ඩපාතයයි. ඒ ඒ තැන ලද භික්ෂාවන්ගේ එකතුව,

සමූහය යැයි කියන ලදී. සෙසු පදයන්ගේ අර්ථ ඉහතින් විස්තර කරන ලදී.

සෙනාසනං යනු සයනය ද ආසනය ද වේ. යම් යම් තැනක සයනය කරයි ද විහාරයක හෝ අඩ්ඪයෝගාදියක හෝ සයනය කරන තැන සේනාසනයයි. යම් යම් තැනක හිඳියි ද එය ආසනයයි. මේ දෙපදය එකතුකර සයන + ආසන = 'සේනාසන' යැයි කියයි. **උතුපරිසසය විනොදන පටිසල්ලාණාරාමත්ථං** යනු විපතක්, අනතුරක් අර්ථයෙන් ඍතුවම 'උතුපරිස්සය' නම් වේ. උතු පරිස්සයන් (ඍතුවලින් වන උවදුරු) දුරුකිරීමටත් විවේක වාසය සඳහාත් සෙනසුන උපකාරී වේ. යම් ශරීර, චිත්ත විරූප කරන අසත්පාය (නුසුදුසු) ඍතුවලින් මිදීමට, ඉවත්වීමට සේනාසන පරිභෝගය උපකාර වේ. එසේ සියලු උවදුරු නැතිකිරීම, විනාශ කිරීමට සෙනසුන් පරිභෝග කරයි. සිත එකඟ කරගැනීම 'සැපයකි'යි කියන ලදී. කාමය ද සීතල නැසීම් ආදියද ඍතු විපර්යාස උවදුරු නැසීම ද කියන ලද්දේමය. සිවුරු පරිභෝජනයේදී ලැජ්ජාව කෝප නොවන සේ සිටීම නියත ප්‍රයෝජනයක් බව ද සෙසු ප්‍රයෝජන ඒ ඒ අවස්ථානුකූලව ලැබෙන බව ද ඉහත කියන ලදී. එමෙන්ම මේ සෙනසුනේ ඇති නියත ප්‍රයෝජනය වූ ඍතු විපර්යාස උවදුරු නැතිකිරීම සඳහා මෙසේ කියන ලද්දේයයි දතයුතුය.

නැතහොත් ඉහත පැවසූ ලෙස **උතු** යනු ඍතුවමයි. **පරිසසයා** දෙයාකාරයකින් දැක්වේ. සීහ ව්‍යාඝ්‍රාදී ප්‍රකට පරිස්සයන් (උවදුරු) ද රාග දෝෂාදී පටිච්ඡන්න (සැඟවුණු) පරිස්සයන් (උවදුරු) ද යනුවෙනි. ඔවුහු යම් තැනක අසංවර බව ද නුසුදුසු රූප දර්ශනාදිය ද නොමැතිව, ඒවායින් බාධා නොවේ ද එබඳු සෙනසුන මෙසේ දැන, ප්‍රත්‍යවේක්ෂා කොට ඇසුරුකරන - සේවනය කරන භික්ෂුව 'පටිසංඛා යොනිසො සෙනාසනං -පෙ- උතුපරිසසය විනොදනත්ථං පටිසෙවතී' යැයි දතයුතුයි.

ගිලානපචචය හෙසජ්ජ පරිකඛාරං යන මෙහි රෝගයට පති+අයන අර්ථයෙන් **පචචයො** නම් වේ. 'උවදුරු, සතුරු දෙය පහකරන' යන අර්ථයයි. සුදුසු, සත්පාය කිසියම් දෙයක් වේනම් ඒ සඳහා යෙදූ තවත් වදනකි. භිසක්ක නම් වෛද්‍යවරයාගේ ක්‍රියාවකින් අනුමත කළ බැවින් **හෙසජ්ජං** නම් වේ. ගිලන්පසම බෙහෙත් වූයේනුයි **ගිලානපචචය හෙසජ්ජ**

නම් වේ. කිසියම් ලෙඩුන්ට යෝග්‍ය, වෙදකමින් අනුදත් තෙල්, මීපැණි ආදියෙන් කළ ආහාර-පානාදියක්ම මෙයින් අදහස් වේ. **පරිකඛාරො** යන්නෙහි අර්ථ කිහිපයකි. 'සත්තහි නගරපරිකඛාරෙහි සුපරිකඛිතං හොති' යනාදියෙහි පරික්ඛාර යන්නෙන් පිරිවර අදහස් වේ. 'රථො සෙතපරිකඛාරො කඤනකෙඛා චකකවිරියො' යනාදියෙහි අලංකාර යන අරුත දෙයි. 'සෙචි මෙ පබබජිතෙන ජීවිත පරිකඛාරා සමුදානෙතබබා' යනාදියෙහි සම්භාර (උපකරණ රාශිය) අර්ථයෙන් යෙදී ඇත. මෙතැනදී පරික්ඛාර යන්නෙන් සම්භාර අර්ථය ද පිරිවර යන අර්ථය ද යෙදේ. ඒ ගිලන්පස බෙහෙත් ජීවිතයට පිරිවරක් වේ. ජීවිතය නසන ආබාධ ඉපදීමට අවස්ථාවක් නොදී ආරක්ෂා කිරීම් වශයෙන් සම්භාරයක් ද වේ. සිරුර බොහෝ කලක් පවත්වා ගැනීම සඳහා උපකාර වන හෙයින් පරික්ඛාර යැයි කියනු ලැබේ. මෙසේ ගිලන්පස බෙහෙත් ආදිය පරික්ඛාර වූයේනුයි 'ගිලානපච්චය භේසජ්ජ පරික්ඛාර' නම් වේ. ඒ ගිලන්පස බෙහෙත් පිරිකර ගිලනාට කිසියම් යෝග්‍ය වූ වෛද්‍යවරයා විසින් අනුදත් පහළ වූ. **වෙය්‍යාබාධිකානං** යන මෙහි ව්‍යාබාධ යනු ධාතු කිපීමයි. ඒ හේතුවෙන් හටගන්නා කුෂ්ට, ගඩු, පිළිකාදියයි. ව්‍යාබාධයෙන් උපන් බැවින් වෙය්‍යාබාධික නම් වේ. **වෙදනා** යනු දුක් වේදනාවයි. අකුසල විපාක වේදනාවයි. ඒ වෙය්‍යාබාධික වේදනාවන්ගේ, **අබ්‍යාපජ්ඣ පරමතාය** යනු නීරෝගී බව ඉතා උතුම් බැවිනි. යම් දුකක්, පීඩාවක් වේනම් ඒ සයිල්ල පළමුව දුරුකරන ලද්දේය යන අර්ථයයි. **සන්තුට්ඨො හොති** යනු ප්‍රත්‍ය සන්තෝෂයෙන් සතුටු වූයේ වේ. **ඉතරීතරෙන චීවරෙන** ගොරෝසු, සියුම්, රුක්ෂ, ප්‍රණීත, ස්ථිර, දිරාගිය මේ ආදී සිවුරු ගොඩගසා ගැනීමෙන්, රැස්කිරීමෙන් දුරු වේ.

නැතහොත් ලැබෙන පරිදි, තමාට ලද පමණින්, කිසියම් සිවුරකින් සතුටට පත්වේ යන අර්ථයයි. සිවුරෙහි තිබිය යුතු සන්තෝෂ තුනකි. ඒවානම් - යථා ලාභ සන්තෝෂය, යථාබල සන්තෝසය හා යථා සාරුප්‍ය සන්තෝෂය යන තුනයි. පිණ්ඩපාතාදී සෙසු ප්‍රත්‍යයන් පිළිබඳව ද මෙය අදාළ වේ. **වණ්ණවාදී** යනු ඇතැමෙක් මේ තුන්ආකාර සන්තෝෂයෙන් යුක්ත වූවත් එය වර්ණනා නොකරති. ඇතැමෙක් සන්තෝෂ නොවන නමුත් සන්තෝෂ වීමේ ගුණ වර්ණනා කරති. තවත් ඇතැමෙක් සන්තෝෂ නොවන අතරම සන්තෝෂවීමේ ගුණ ද නොකියති. සිවුවන පිරිස ඉතරීතර සන්තෝෂයෙන් යුක්තව එහි ගුණ ද පවසයි. එම සිවුවන පිරිස දක්වනු සඳහා **ඉතරීතර සන්තුට්ඨියා ච වණ්ණවාදී** යි කියන ලදී.

අනෙසනං යනු දූතයන් යැවීම්, ගමනානුයෝගාදී ප්‍රභේද ඇති නානාප්‍රකාර අන්වේෂණයන්, **අපපටිරූපං** නුසුදුසුය. **ලද්ධා ච** දැහැමින් සෙමින් ලැබ. **අගධිතො ලෝභයෙන්** නොමැඩුණේ. **අමුච්ඡිතො** ඉතා වැඩි (අධික) තණ්හාවෙන් මුසපත් නොවී, **අනජ්ඣාපන්නො** යනු තණ්හාවෙන් නොබැසගත්තේ, නොබැඳගත්තේ. **ආදීනව දස්සාවී** අන්වේෂණාපත්තිය ද ගිජු වූ පරිභෝජනයේද ආදීනව දකිමින් **නිස්සරණ පඤ්ඤා** 'යාවදෙව සීතස්ස පරිඝාතාය' යනාදී ලෙස කියන ලද නිස්සරණය ද නුවණින් විමසා බලමින්, **ඉතරීතර චීවර සන්තුට්ඨියා** යනු ලැබුණු කිසියම් සිවුරකින් සතුටුවීම. **නෙවත්තානුක්කංසෙති** යනු 'මම පාංශුකූලිකයෙකි', 'මම උපසම්පදා මාලකයේදීම පාංශුකූලිකංගය සසමාදන් වූයෙමි. මා හා සමාන කෙනෙක් සිටීද?'යි තමා උසස් කර දැක්වීම නොකරයි. **න පරං වමෙති**, 'මේ අනෙකුත් භික්ෂූහු පාංශුකූලික නොවෙති. බෙල්ලේ පාංශුකූලික මාත්‍රයක්වත් මොවුන්ට නැතැ'යි මෙසේ අනුන් හෙළා නොදකියි.

යො හි තත්‍ථ දක්ඛො යනු ඒ චීවර සන්තෝෂයේ ගුණ වර්ණනා කරන, එහි දක්ෂ වූ හෝ ව්‍යක්ත වූ කුසල වූ. **අනලසො** යනු නිරන්තර ක්‍රියාවෙන්, අලස බැවින් තොරව. **සම්පජානො පතිස්සතො** සම්ප්‍රජාන ප්‍රඥාවෙන් ද සිහියෙන් ද යුක්තව. **පොරාණෙ** දැන් උපන් අය විසින් නොවේ. **අග්ගඤ්ඤෙ** අග්‍රයැයි දතයුත්තේ **අරියවංසෙ ඨිතො** යනු ආර්යයන්ගේ වංසයෙහි පිහිටි. අරියවංසො යනු - ක්ෂත්‍රිය වංස, බ්‍රාහ්මණ වංස, වෛශ්‍ය වංස, ශූද්‍ර වංස, ශ්‍රමණ වංස, කුල වංස, රාජ වංස යන ලෙස මේ අටවන අරියවංසය වේ. 'අරියත' යනු ආර්ය ප්‍රවේණිය නම් වේ. ඒ මේ ආර්යවංශය අනෙකුත් වංසයන් අතුරින් අග්‍ර වේ. ප්‍රධාන වේ. මූල ගන්ධාදීන් අතුරින් කාලානුසාරික ගන්ධය ප්‍රධාන වන්නාක් මෙනි.

කෙ පන තෙ අරියො යෙසං එසො වංසො යන්නේ 'අරියා' යනු බුදුවරු ද පසේබුදුවරු ද තථාගත ශ්‍රාවකයෝ ද වෙති. මේ ආර්යයන්ගේ වංසයයි. මීට පෙර සාරාසංඛ්‍ය කල්ප ලක්ෂයකට පෙරදී තණ්හංකර, මේධංකර, සරණංකර, දීපංකර යැයි සතර බුදුකෙනෙක් උපන්හ. ඔවුහු ආර්යයෝ ය. ඒ ආර්යයන්ගේ වංසය අරියවංස යයි. ඒ බුදුවරුන්ගේ පිරිනිවීමට පසුව එක් අසංඛ්‍යයක් ගිය පසු කොණ්ඩඤ්ඤ නම් බුදුරජාණෝ පහළ වූහ. මේ මහා භද්‍ර කල්පයෙහිදී ද කකුසඳ, කෝණාගමන, කස්සප, අපගේ ගෞතම භාග්‍යවතුන් වහන්සේ යන සතර බුදුවරු උපන්හ. ඒ

ආර්යයන්ගේ වංසය අරියවංස නමි. තවද අතීත, අනාගත, වර්තමාන සියලු බුදු-පසේබුදු-බුද්ධශ්‍රාවක යන ආර්යයන්ගේ වංසය 'අරියවංස' නම් වේ. ඒ අරියවංසයේ පිහිටි. **ඉතරීතරෙන පිණ්ඩපාතෙන** යනු කිසියම් පිණ්ඩපාතයකින්, සේනසනාදියෙහි ද මේ ක්‍රමයමයි.

ආයතනෙසු චක්ඛු ආදී ආයතනයන්හි. **යතො** සංයත වූ **යතත්තො** යනු සංයත වූ සිත් ඇති. **පටියතත්තො** අතිශයින් සංයත වූ සිතැත්තේ. **ගුත්තො** යනු රක්ෂිත වූයේ **ගොපිතො** මංජුසාවක දමා මෙන් ආරක්ෂා කරන ලදුයේ **රක්ඛිතො** යනු තැන්පත් කර තැබූයේ **සංවුතො** ද්වාර සංවරයෙන් වසන ලදුයේ **ඛුංසිතො** ගරහන ලද්දේ. **වම්භිතො** අවමන් කරන ලදුයේ **ඝට්ටිතො** ගටන ලදුයේ. **ගරහිතො** අවමන්, ගර්හා කරන ලදුයේ **උපවදිතො** අක්‍රෝශ කරන ලදුයේ **එරුඝෙන** මර්මච්ඡේදන වචනයෙන්. **කක්කලෙන** ඉතා දරුණු වදනින් **න පටිවජ්ජ** පතුරුවා කථා නොකරන්නේය.

ඣානානුයුත්තෙතා යනු නූපන් ධ්‍යාන උපදවමින්, උපන් ධ්‍යාන සේවනය කරමින් ධ්‍යානයන්ගෙන් යුක්තව වෙසේ. **උපෙක්ඛාභාවනා සමාහිතත්තෙතා** සිවුවන ධ්‍යාන උපේක්ෂාව උපදවා සන්සිඳුණු සිත් ඇතිව. **තක්කාසයං කුක්කුච්චියුපච්ඡේදෝ** යනු කාම විතර්කාදී විතර්කයන් ද කාම සංඥාදී විතර්කයේ ආශ්‍රවයන් ද අත් කුකුස් ආදී කුකුස් ද සිඳින්නේ ය.

අනුපපන්නස්ස වා පඨමජ්ඣානස්ස උපපාදාය යනු ඒ ආත්මභාවයේ දී නූපන් හෝ ඉපිද පිරිහී ගිය ප්‍රථමධ්‍යානය ඉපදවීමට, තම සන්තානයේ උපදවා ගැනීමට. **උප්පන්නඤ්ච පඨමජ්ඣානං ආසෙවති** යනාදියෙහි මෙහි ආදරයෙන් සේවනය කරයි. ප්‍රගුණ කරයි. වඩයි. දියුණු කරයි. බොහෝ කොට කරයි. නැවත නැවත කරයි. **උපෙක්ඛාය** යනු සිවුවන ධ්‍යානයේ උපන් තත්‍රමජ්ඣත්තතා උපේක්ෂාවෙන්, උපෙක්ඛාය යනු ස්වභාව පදයකි. **උපෙක්ඛනා** පැන නැඟීමෙන් බලන ආකාරයයි. අජ්ඣුපෙක්ඛනා අධිකව බැලීම. **චිත්ත සමථෝ** යනු සිතේ ඌන, අතිරික්ත ස්වභාවයන් අත්හැර සමභාවයෙන් පවත්වා ගැනීමයි. **චිත්තපස්සද්ධනා** යනු සිතේ පුගල්භ බව, තද නැති බව යන අර්ථයයි. **මජ්ඣත්තතා චිත්තස්ස** සත්ත්වයාගේ නොවේ. පුද්ගලයාගේ නොවේ. සිතේ මධ්‍යස්ථභාවය යන අර්ථයයි. **චතුත්ථජ්ඣානෙ උපෙක්ඛං ආරබ්භ** සිව්වන ධ්‍යානයෙහි උපන් තත්‍ර මජ්ඣත්ත උපේක්ෂාව නිසා. **එකග්ග චිත්තෙතා**

එක අරමුණක පවතින සිත. **අවිකඛිත්ත චිත්තෙනා** යනු උද්ධච්ච විරහිත නො විසුරුණු සිත නව විතර්කයෝ කියූ පරිදිම දතයුතුයි. **කාමවිතක්කානං කාමසඤ්ඤාසයෝ** යනු කාම විතර්කයන් විතර්කනය කරන්නාට උපන් කාම සංඥාවයි. ඒ විතර්කයන්ගේ නිවාසය, වසන ස්ථානය වූයේනුයි **කාමසඤ්ඤාසයෝ.** ව්‍යාපාද විතර්කාදියෙහි ද මේ ක්‍රමයෙන් ම අර්ථ දතයුතුයි.

චුදිතෝ වචීහි සතිමාභිනන්දෙ යනු උපාධ්‍යාදීන්ගේ වචනවලින් චෝදනා කරන ලදුයේ සිහි ඇතිව, ඒ චෝදනා අනුව සතුටු වන්නේය. **වාචං පමුඤ්චේ කුසලං** යනු නුවණින් උපන් වචන කියන්නේ ය. **නාතිවෙලං** ඉතා බොහෝ වේලා කාලවේලා, ශීල වේලා ඉක්මවා කථා නොකරන්නේය. **ජනවාද ධම්මාය** යනු ජනයාගේ උපවාද කථාවෙන් **න චෙතයෙය්‍ය** යනු සිතුවිලි නූපදවන්නේය.

ඉදං තෙ අප්පතිතං යනු 'මෙය නුඹට නොපැමිණියේය. **අසාරුප්පං** යනු 'නුඹේ ප්‍රයෝගය අසාරුප්‍යය.' **අසීලට්ඨං** යනු 'නුඹේ ප්‍රයෝගය සීලයේ නොපිහිටියේය.'නුයි අසීලට්ඨ නම් වේ. සීලයේ පිහිටියහුගේ ප්‍රයෝගයක් නොවේ යැයි කියන ලදී. ඇතැමෙක් **අසිලිට්ඨං** යැයි ද කියති. නො පිහිටි, මටසිලිටි නොවූ වචන යැයි අර්ථ කියති. **නිධිනං** යනු ඒ ඒ තැන බහාතබන ලද, රන්-රිදී ආදියෙන් පිරුණු නිධිකුම්භයන්ගේ. **පවත්තාරං** යනු දුෂ්කර ජීවිතයක් ගෙවන, දුප්පත් මිනිසුන්ට අනුකම්පා කර, 'එන්න නුඹලාට සුවසේ ජීවත්වන උපායක් පෙන්වන්නෙමි'යි නිධානයක් ඇති තැනකට ගෙනගොස්, අත දිගහැර 'මේවා ගෙන සුවසේ ජීවත් වෙන්න'යි පවසන්නාක් මෙනි. **වජ්ජදස්සිනං** යනු වැරදි දැකීම් දෙකකි. 'මේ වරදින් හෝ නොගැලපෙන දෙයින් හෝ මොහුට සඟ මැද නිග්‍රහ කරන්නෙමි'යි සිදුරක්, වරදක් සෙවීම පළමු වරද දැකීමයි. නොදත් දේ දැනගන්වනු සඳහාත් දැනගත් දේට අනුග්‍රහ කරනු සඳහාත් සීලාදියෙන් ඔහුගේ අභිවෘද්ධිය කැමැතිව ඒ ඒ වරද බලා එය උලුප්පා දක්වා නිවැරදි කරවීමේ අදහසින් වැරදි සෙවීම දෙවන වරද දැකීමයි. මෙම ගාථාවේදී මේ දෙවැනි වැරදි දැකීම අදහස් විය. දුප්පත් මිනිසෙක් 'මෙය ගනුව'යි තර්ජනය කර, තළා පෙළා නිධානයක් දක්වනවිට කෝපනොවී, ප්‍රමුදිතවන්නේ යම්සේ ද එසේම මෙබඳු පුද්ගලයා තමාගේ නොගැලපෙන දෙය හෝ වරද (දෝෂය) හෝ දැක, එය පෙන්නා දෙනවිට කෝප නොකළ යුතුයි. සතුටින් ම එය පිළිගත යුතුයි. 'ස්වාමීනි, නුඹවහන්සේ

මා හට මහත් වූ උපකාරයක් කළ සේක. මගේ ආචාර්ය උපාධ්‍යාය ස්ථානයේ හිඳ මට තව තවත් අවවාද අනුශාසනා කරනු මැනවි'යි ආරාධනා කළයුත්තේමය. **නිගඝයහවාදිං** ඇතැමෙක් තම සද්ධිවිහාරිකාදීන්ගේ නොගැලපෙන දෙයක් හෝ වරදක් හෝ දැක, 'මොහු මා හට මුවදෝනා පැන් ආදිය ගෙන එමින් මනාව සත්කාර සම්මාන කරයි. ඉදින් මොහුගේ වරද හෝ දෝෂය පෙන්වුවහොත් මොහු මා හට උවටැන් නොකරන්නේය. එය මගේ පිරිහීමට හේතුවේ' මෙසේ සිතානම්, වරද පෙන්වීමට අසමත් වේනම් එම වෘද්ධ භික්ෂුව නිග්ගය්හවාදියකු නොවේ. උන්වහන්සේ මේ සසුනේ කසල විසුරුවති. (සසුන හැඩි කරති.)

යමෙක් වනාහී එබඳු අයෙකුගේ වරදක් දැක වරදට අනුරූප වූ ලෙස තර්ජනය කර, නෙරපමින්, දඬුවම් කරමින්, විහාරයෙන් බැහැර කරමින් හික්මවයි ද ඔහුම නිග්ගය්හවාදී නම් වේ. අප සම්මා සම්බුදුරජාණන් වහන්සේ මෙනි. කියන ලදී. 'නිග්‍රහ කළයුත්තාට ආනන්දය! මම නිග්‍රහ කරමින් කරුණු පවසමි. ඔසවා තැබිය යුත්තා, ඔසවා තබමින් සාරවත් භාවයෙහි තබන්නෙමි'. **මෙධාවිං** යනු ධර්මයෙන් හටගත් ප්‍රඥාවෙන් යුක්තව. **තාදිසං** මෙබඳු පඬිවරයා, **භජෙ** ඇසුරු කරන්නේය. පයිරුපාසනය කරන්නේය. මෙබඳු ගරුවරයකු ආශ්‍රය කරන්නා වූ අන්තේවාසිකයාට යහපතක්ම වේ. පව්කාරයෙක් නොවේ. වෘද්ධියක්ම වේ. පරිහානියක් නොම වේ. **ඔවදෙය්‍ය** යනු දෙයක් සිදු වූ විට වරද පෙන්වාදීම 'අවවාදය' නම් වේ. වරදක් සිදුවීමට කලින්, නූපන් කල්හිම 'නුඹලාට අයසක්, අපකීර්තියක් වන්නේය'යි ආදී වශයෙන් අනාගතය දක්වමින් කරුණු දැක්වීම 'අනුශාසනා කිරීම' නම් වේ. ඉදිරියේ සිට කරුණු දැක්වීම 'අවවාද කිරීම' නම් වේ. ඉදිරියේ නොවූවෙකු වෙත දූතයකු හෝ හසුනක් හෝ යැවීම 'අනුශාසනා කිරීම' නම් වේ. වරක් දෙයක් පැවසීම 'අවවාද කිරීම' නම් වේ. නැවත නැවතත් ප්‍රකාශ කිරීම 'අනුශාසනාව' නම් වේ. අවවාද කරමින් සිටීම ම හෝ අනුශාසනා කිරීම නම් වේනුයි **ඔවදෙය්‍යානුසාසෙය්‍ය** නම් වේ. **අසබභා ච** අකුශල ධර්මයෙන් වළකන්නේ ය. කුසල ධර්මයන්හි පිහිටුවන්නේය යන අර්ථයයි. **සතං හි සෝ පියෝ හොති** යනු මෙවැනි අවවාද අනුශාසනා කරන පුද්ගලයා බුද්ධාදී සත්පුරුෂයන්ට ප්‍රිය වේ. ඇතැමෙක් දහම නොදැක, හැරදැමූ පරලොව ඇතිව, ආමිෂය ලබමින් ජීවත්වීම සඳහාම පැවිදිව සිටිත් ද ඒ අසත්පුරුෂයෝ තමාගේ වරද පෙන්වමින් අවවාද අනුශාසනා කරන්නාට 'නුඹ අපගේ උපාධ්‍යායවරයා නොවේ. ආචාර්යවරයා නොවේ. කුමක්

නිසා අපට අවවාද කරන්නෙහිද?'යි මුඛ සැතින් විදිමින්, කපමින් විමසා සිටිති. මෙවැනි අසත්පුරුෂයන්ට එවැනි පඬිවරයා අප්‍රිය වේ.

එකකම්මං යනු අපලෝකන කර්මාදී ඒක කර්ම ඇති **එකුද්දෙසො** යනු නිදානුද්දේස ආදී වූ ඒක උද්දේස ඇති. **සමසික්ඛතා** යනු සමාන ශික්ෂා ඇති **ආහත චිත්තතං** යනු ක්‍රෝධයෙන් පහළ (ගැටුණු) සිත් ඇති බව. **බ්‍රහ්මජාතං** තද බව. **පඤ්චපි වෙතො බ්‍රහ්මේ** යනු බුද්ධ, ධම්ම, සංඝ, ශික්ෂා, සබ්‍රහ්මචාරී යන පස්දෙනා කෙරෙහි සිතේ තද බව. **ඤාණ සමුට්ඨිතං වාචං** යනු ඤාණ සම්ප්‍රයුක්ත සිතින් උපදවන ලද වාක්‍යයක් **මුඤ්චෙය්‍ය** මුදන්නේය. **අත්ථූපසංහිතං** යනු අර්ථ සහිත. **ධම්මූපසංහිතං** යනු ධර්මයෙන් යුතු. **කාලාතික්කනතං වාචං න භාසෙය්‍ය** යනු කල් ඉක්මවූ වචනයක් නො කියන්නේය. ඒ වචනය කිවයුතු කාලය ඉක්මගිය බැවිනි. **වෙලාතික්කනතං** සීමාව ඉක්මවූ වචන නොකියන්නේය. වචන සීමාව ඉක්මගිය බැවිනි. මේ දෙකම එකතුකර කාලවෙලා නම් වේ. **කාලෙ අසම්පත්තෙ** යනු තමාගේ වචන කිවයුතු අවස්ථා නොපැමිණි කල්හි. **අතිවෙලං** යනු වේලාව ඉක්මවා, අතිරේකව - ඉතා වැඩියෙන් පවසයි. **නිහතො සෙති** යනු නසන ලදුයේ හොවයි. **කොකිලායෙව අත්‍ර ජෝ** යනු කැවිඩිය විසින් පෝෂණය කළ කෙවිලියට දාව උපන් කොවුල් පැටියා මෙන්.

අථාපරං යනු ඉක්බිති, ඉන් අනතුරුව. **පඤ්ච රජානි** යනු රූප රාගාදී පස් සංයෝජනයන්. **රංජනයන් යෙසං සතිමා විනයාය සික්ඛෙ** යමෙකුගේ එළවූ සිහි ඇතිව ද හික්මවීම පිණිස ත්‍රිවිධ ශික්ෂාවන්හි හික්මෙන්නේ ය. මෙසේ හික්මෙන්නේ ද රූපයෙහි ද -පෙ- ස්පර්ශයෙහි ද ඡන්දරාගය මඩින්නේය. අනිකක් කෙරෙහි නොවේ. **රූපරජෝ** යනු රූපාරම්මණය නිසා උපන් රාගාදී රජස්. ශබ්ද රජාදියෙහි මේ ක්‍රමයමයි.

ඉක්බිති ඒ භික්ෂුව කෙලෙසුන් දුරලා මනාව හික්මෙන අයුරු අනුක්‍රමයෙන් දක්වනු සඳහා **එතෙසු ධම්මෙසු** යන ගාථාව දැක්විණි. එහි **එතෙසු** යනු රූපාදියෙහි. **කාලෙන සො සම්මා ධම්මං පරිවීමංසමානො** යන්නෙහි 'සො' යනු ඒ භික්ෂුව. යමෙක් මේ විසිරුණු සිතේ සමථයට සන්සිඳීමට කාලය වේයැයි ආදී ක්‍රමයෙන් කාලය කියන ලද්දේ ද ඒ කාලයෙන් සියලු සංඛත ධර්ම අනිත්‍යාදී ක්‍රමයෙන් මනාව විමසා බලනුයේ. **එකොදිභූතො විහනෙ තමං සො** ඒ භික්ෂුව එකඟ සිත් ඇතිව සියලු

මෝහාදී අඳුර නසන්නේ ය. එහි සැකයක් නම් නැත. **උදධතෙ චිතෙත** යනු විරියින්ද්‍රිය වශයෙන් සිත නොසන්සිඳුණු කල්හි. බලවත් වීර්යය වනාහි මන්ද සමාධිය වීර්යයේ උද්ධච්චයට පක්ෂ වන බැවින් උද්ධච්චය අභිබවා සිටියි. මෙසේ සිත නොසන්සුන් වූ කල්හි. **සමථසස කාලො** යනු සමාධි භාවනාවට කාලයයි. **සමාහිතෙ චිතෙත** යනු උපචාර අර්පණාවලින් සිත සමාධිගත වූ කල්හි. බලවත් සමාධිය වනාහි මන්ද වීර්යය සමාධියේ කුසීතබවට පක්ෂ වන බැවින් කුසීතබව මැඬලයි. සමාධි වීර්යයෙන් එක්කොට බඳින ලද්දේ කුසීත බවෙහි වැටීමට අවස්ථාව නොලබයි. වීර්යය සමාධියෙන් මෙහෙයවන ලදුයේ උද්ධච්චයේ වැටීමට අවස්ථාව නොලබයි. එනිසා ඒ දෙකම සම කළ යුතුයි. උභය සමතාව (වීර්යයේ හා සමාධියේ සමබව) ඇතිවූ කල්හිම අර්පණාව ඇතිවේ. **විපසසනාය කාලො** යනු මෙසේ සිත සමාධිගත වූ කල්හි අනිත්‍යාදී වශයෙන් විවිධ වූ (විශේෂ) දර්ශනයට කාලයයි. සමාධි කම්මිකයාට බලවත් වූ ශ්‍රද්ධාව සුදුසුය. මෙසේ අදහනුයේ, විශ්වාස කරනුයේ අර්පණාවට (යෝගාවචරයාගේ සිත) පැමිණේ. සමාධි ප්‍රඥා දෙක අතුරින් සමාධි කම්මිකයාගේ ප්‍රඥාව බලවත්වීම සුදුසුය. මෙසේ ඔහු ලක්ෂණ ප්‍රතිවේධයට පැමිණේ. සමාධි ප්‍රඥා දෙකේ සමතාවය ඇතිවූ කල්හිම අර්පණාවට සිත පැමිණේ.

කාලෙ පගහණහාති චිතතං යනු යම් කාලයක ඉතා ලිහිල් වීර්යයෙන් අප්‍රකට සිතක් ඇති වේද, එම කාලයේ දී (එවිට) ධර්ම විචය, විරිය, පීති යන සම්බොජ්ඣංගයන් ඉපදවීමෙන් සිතට අනුග්‍රහ කරයි. **නිගහණහාති.** යම්කලෙක ඉතා දැඩිව ඇරඹූ (වේගවත්) වීර්ය නිසා සිත විසිරී යයි ද එවිට පස්සද්ධි, සමාධි, උපෙක්ඛා යන සම්බොජ්ඣංගයන් ඉපදවීමෙන් සිතට නිග්‍රහ කරයි. **සමපහංසති කාලෙන** යනු යම්විටෙක සිත ප්‍රඥා ප්‍රයෝගයේ මඳ බව නිසා හෝ උපසම සුඛයන්ගේ දුරුවීමෙන් හෝ සිත නිරාශ්වාද ඇතිවේද එවිට අෂ්ට සංවේග වස්තු පිළිබඳ ප්‍රත්‍යවේක්ෂාවෙන් සංවේග ඇතිකරයි. අෂ්ට සංවේග වස්තු නම් ජාති, ජරා, ව්‍යාධි (රෝග), මරණ යන සතරත්, සතර අපා දුක, අතීතයේ වූ සංසාරික දුක, අනාගතයේ වන සංසාරික දුක හා වර්තමානයේ ඇති ආහාර සෙවීම් මූලික දුක යන සතරත් වේ. තුණුරුවනේ සූවිසි මහ ගුණ සිහිකිරීමෙන් ඔහුගේ සිතේ ප්‍රසාදය ඇතිවේ. මෙය 'සුදුසු කාලයෙහි සංවේග ඇති කරයි' (සම්පහංසති කාලෙන) නම් වේ. **චිතතං සමාදහෙ** යනු යම්විටෙක ශ්‍රද්ධා ප්‍රඥා දෙකේත් සමාධි විරිය දෙකේත් සමභාවයක්

(සම තත්ත්වයක්) ඇතිවේ ද එවිට සිත සමාධිගත කරන්නේ ය. සිත අර්පණාවට පමුණුවන්නේය.

අජ්ඣුපෙකඛති කාලෙන යනු යම්විටෙක සම්‍යක් ප්‍රතිපත්තියට පැමිණ, ප්‍රකට වූ, නොවිසුරුණු, නිරාශ්වාද රහිත වූ, අරමුණේ මනාව පවත්නා වූ සමාධි වීථියට පිළිපන් සිතක් ඇතිවේද, එවිට ඔහුගේ සිත අනුග්‍රහ, නිග්‍රහ, සංවේග පත් කිරීම් ආදියෙහි ව්‍යාපාරයට නොපැමිණෙයි. සමව යන අසුන් ඇති කල්හි සන්සුන් වූ රියදුරා මෙනි. මෙය 'කාලෙන අජ්ඣුපෙකඛති' නම් වේ. **සො යොගී කාලකොවිදො** යනු මෙසේ කියන ලද ආකාරයෙන් කමටහනෙහි යෙදෙන, අනුග්‍රහ - නිග්‍රහ - සතුටුකරන - සමාදන් කරවන - මධ්‍යස්ථ කරවන අවස්ථාවෙහි දක්ෂ වූ ව්‍යක්ත වූ. **කිමහි කාලමහි** යනාදියෙන් අනුග්‍රහ කිරීම් ආදී කාලය විමසා සිටියි. දැන් ඒ පග්ගහා (අනුග්‍රහ) දී කාලයන් විසඳමින් (පැහැදිලි කරමින්) **ලීනෙ චිත්තමහි** යන ගාථාවන් කියන ලදී. ඉතා ලිහිල් වීර්යාදිය නිසා සිතේ හැකිලුණු කල්හි ධම්මවිචය, විරිය, ප්‍රීති යන සම්බොජ්ඣංගයන් උපදවා ගැනීමෙන් සිතට අනුග්‍රහ කළයුතුයි. **උද්ධතසමිං හි නිගහනො** යනු ඉතා දැඩිව ඇරඹූ වීර්යය නිසා සිත විසිරුණු කල්හි පස්සද්ධි, සමාධි, උපේක්ෂා යන සම්බොජ්ඣංගයන් ඉපදවීමෙන් නිග්‍රහ කරයි. **නිරසසාදිකතං චිත්තං සම්පහංසෙය්‍ය තවදෙ** යනු ප්‍රඥා ප්‍රයෝගයේ මද බව නිසා හෝ උපසම සුඛයේ දුරුවීමෙන් හෝ ආශ්වාද විරහිතව කරන ලද අෂ්ට සංවේග වස්තු ප්‍රත්‍යවේක්ෂා කිරීමෙන් හෝ තුණුරුවනේ ගුණ සිහි කිරීමෙන් හෝ එකෙණෙහිම සිත සතුටට පත් කරන්නේය. **සම්පහට්ඨං යදා චිත්තං** යම්කලෙක කියන ලද ආකාරයෙන් ම සතුටට පත් සිතක් ඇතිවේනම්.

අලීනං භවති අනුද්ධතං යනු විරිය සමාධි දෙකින් යොදන ලද බැවින් සිතේ සැඟවීම, උද්ධච්ච බව විරහිත වේ. **සමථ නිමිත්තසස** යනු සමථය ද නිමිත්ත ද සමථ නිමිත්ත වේ. ඒ සමථ නිමිත්තේ යන අර්ථයයි. **සො කාලො** යනු යමෙක් ලීන උද්ධච්ච (සැඟවුණු-විසිරුණු) භාවයෙන් විරහිත වූ කාලයක් වේ ද එම කාලය **අජ්ඣත්තං රමයෙ මනො** යනු ධ්‍යාන සම්ප්‍රයුක්ත සිත කසිණාදී ගෝචරවලින් අධ්‍යාත්මය සතුටු කරන්නේය. අභිරමණය කරවන්නේය. **එතෙන මෙව උපායෙන** යනු මෙයින් කියූ උපායෙන් ම. 'ම' කාරය පද සන්ධි කිරීම් වශයෙන් කියන ලදී. **අජ්ඣුපෙකඛය්‍ය තාවදෙ** යනු යම්කලෙක උපචාර, අර්පණාවන්ගෙන් ඒ සිත සමාධිගත වේද, එකල්හි සමාහිත වූ සිත දැන, අනුග්‍රහ - නිග්‍රහ

- සතුටු කිරීම් ආදියෙහි නොයෙදී එකෙණෙහි ම සිත මධ්‍යස්ථ කරගැනීම ම කරන්නේය.

දැන් කිමහි කාලමහි පගහාහො යි විමසූ ගාථාවට නියමිත පිළිතුර දෙමින් එවං කාලවිදූ ධීරෝ යන ගාථාව කියන ලදී. කාලෙන කාලං චිත්තසස නිමිත්තමුපලක්ඛයෙ යනු කලින් කලට සමාධි සම්ප්‍රයුක්ත සිතේ අරමුණ සලකා බලන්නේ ය. විමසා, පරීක්ෂා කර බලන්නේ ය. සෙසු පදයන්ගේ අර්ථ සුගමය. මෙසේ අර්හත්භාවය දැක්වීමෙන් (හෙවත් අර්හත් බවට ශ්‍රාවකයා යොමුකරමින්) සූත්‍රය නිමා කළ සේක.

දාසයවන සාරිපුත්ත සූත්‍ර නිද්දේස වර්ණනාව නිමියේ ය.

සද්ධම්මපජ්ජොතිකා නම් වූ ඛුද්දක නිකායට්ඨකථාවේ
මහා නිද්දේසයේ අට්ඨක වර්ග වර්ණනාව නිමියේ ය.

මහා නිද්දේස වර්ණනාව සමාප්තයි.

කර්තෘ සංදර්ශනාදිය වූල නිද්දේස අට්ඨකථාව අවසානයේ දැක්වෙන්නේය.

මාතර, පහළ පීක්වැල්ල, පඤ්ඤාරාම විහාරවාසී,
බෙලිඅත්ත - නිහිළුව හ/සිරි ධම්මානන්ද පිරිවෙන්පති
හත්තොටුවේ ඉන්දරතන හිමියන් විසින් මහානිද්දේසට්ඨකථාවට කළ
සිංහල පරිවර්තනය නිමියේ ය.

පාලි අට්ඨකථා සහ එහි පරිවර්තන වියත්හු

1.	සුමංගල විලාසිනී - දීඝනිකායට්ඨ කථා-I	දයා ගුණසේකර මහතා පී.එල්.කේ. පෙරේරා මහතා
2.	සුමංගල විලාසිනී දීඝනිකායට්ඨ කථා-II	බී.එම්.පී. බාලසූරිය මහතා
3.	පපඤ්චසූදනී මජ්ඣිම නිකායට්ඨ කථා I	ආඳාවල දේවසිරි හිමි
4.	පපඤ්චසූදනී මජ්ඣිම නිකායට්ඨ කථා II	විජිතනන්ද සරත්චන්ද්‍ර මහතා
5.	පපඤ්චසූදනී මජ්ඣිම නිකායට්ඨ කථා III	දයා ගුණසේකර මහතා
6.	පපඤ්චසූදනී මජ්ඣිම නිකායට්ඨ කථා IV	බලපිටියේ සිරිසීවලී හිමි
7.	සාරත්ථප්පකාසිනී සංයුත්ත නිකායට්ඨ කථා I	එන්.එච්. පෙරේරා මහතා
8.	සාරත්ථප්පකාසිනී සංයුත්ත නිකායට්ඨ කථා II	හත්තොටුවේ ඉන්දරතන හිමි
9.	සාරත්ථප්පකාසිනී සංයුත්ත නිකායට්ඨ කථා III	ජිනදාස ගොඩකන්ද මහතා
10.	මනෝරථපූරණී අංගුත්තර නිකායට්ඨ කථා I	කපිල අභයවංස මහතා
11.	මනෝරථපූරණී අංගුත්තර නිකායට්ඨ කථා II	කපිල අභයවංස මහතා
12.	පරමත්ථජෝතිකා ඛුද්දක පාඨට්ඨ කථා	මැදඋයන්ගොඩ විජයකිත්ති හිමි
13.	ධම්මපදට්ඨ කථා I	වැලමිටියාවේ සිරිධම්මරක්ඛිත හිමි
14.	ධම්මපදට්ඨ කථා II	පන්නල සුමේධ හිමි
15.	පරමත්ථදීපනී උදානට්ඨ කථා	ඩබ්.ඇල්.පී. ධර්මදාස මහතා
16.	පරමත්ථදීපනී ඉතිවුත්තකට්ඨ කථා	ඇස්වත්තේ රේවත හිමි
17.	පරමත්ථදීපනී සුත්තනිපාතට්ඨ කථා	නිමල් ලාල් රංජිත් මහතා
18.	පරමත්ථදීපනී සුත්තසංගහට්ඨ කථා	ආඳාවල දේවසිරි හිමි
19.	පරමත්ථදීපනී පේතවත්ථු අට්ඨකථා	විජිතනන්ද සරත්චන්ද්‍ර මහතා
20.	පරමත්ථදීපනී විමානවත්ථු අට්ඨකථා	ජිනදාස ගොඩකන්ද මහතා ලක්ෂපතියේ සමාධි මෙහෙණිය
21.	පරමත්ථදීපනී ථේරගාථා I	හත්තොටුවේ ඉන්දරතන හිමි
22.	පරමත්ථදීපනී ථේරගාථා II	පී.එල්.කේ. පෙරේරා මහතා
23.	පරමත්ථදීපනී ථේරීගාථා	ජී.එස්.බී. සේනානායක මහතා
24.	සාරත්ථ සමුච්චය චතුභාණවාරට්ඨ කථා	වටගෙදර විමලබුද්ධි හිමි
25.	ජාතකට්ඨ කථා පළමුවන භාගය	යාලේගම චන්දකිත්ති හිමි
26.	ජාතකට්ඨ කථා දෙවෙනි භාගය	ටී.ජී. ජයතිලක මහතා
27.	ජාතකට්ඨ කථා තෙවෙනි භාගය	පල්ලේගම සමිත හිමි
28.	ජාතකට්ඨ කථා සිව්වෙනි භාගය	මාවනානේ සෝමින්ද හිමි

29.	ජාතකටඨ කථා පස්වෙනි භාගය	මාවනානේ සෝමින්ද හිමි
30	ජාතකටඨ කථා සයවෙනි භාගය	සරත්චන්ද්‍ර අමරතුංග මහතා
31.	ජාතකටඨ කථා සත්වෙනි භාගය	එච්.ජී.එස්. නිශ්ශංක මහතා පී.එල්.කේ. පෙරේරා මහතා
32.	සද්ධම්මපජ්ජොතිකා චූලනිද්දෙස අට්ඨකථා	නිමල්ලාල් රංජිත් මහතා
33.	සද්ධම්මපජ්ජොතිකා මහානිද්දෙස අට්ඨකථා	හත්තොටුවේ ඉන්දරතන හිමි
34.	විසුද්ධ ජනවිලාසිනී අපදානටඨ කථා I	සරත්චන්ද්‍ර අමරතුංග මහතා
35.	විසුද්ධ ජනවිලාසිනී අපදානටඨ කථා II	දයා ගුණසේකර මහතා
36.	මධුරත්ථවිලාසිනී බුද්ධවංස අට්ඨකථා	කීර්ති නාරම්පනාව මහතා
37.	පරමත්ථදීපනී චරියාපිටකටඨ කථා	මැදඋයන්ගොඩ විජයකිත්ති හිමි
38.	සමන්තපාසාදිකා විනයටඨ කථා I	අම්බලන්ගොඩ ධම්මකුසල හිමි
39.	සමන්තපාසාදිකා විනයටඨ කථා II	අම්බලන්ගොඩ ධම්මකුසල හිමි
40.	සමන්තපාසාදිකා විනයටඨකථා III	අම්බලන්ගොඩ ධම්මකුසල හිමි
41.	කංඛාවිතරණී ප්‍රාතිමෝක්ෂ වර්ණනා	කපිල අභයවංස මහතා
42.	නෙත්තිප්පකරණටඨ කථා	මැදගම්පිටියේ විජිතධම්ම හිමි
43.	පරමත්ථදීපනී පංචප්පකරණටඨ කථා	බී.එම්.පී. බාලසූරිය මහතා
44.	පරමත්ථදීපනී පංචප්පකරණටඨ කථා	බී.එම්.පී. බාලසූරිය මහතා
45.	සමෙමාහවිනොදනී විභංගටඨ කථා	බී.එම්.පී. බාලසූරිය මහතා
46.	අත්ථසාලිනී ධම්මසංගණිප්පකරණටඨ කථා	සෝමරත්න ගම්ලත් මහතා
47.	සද්ධම්මප්පකාසිනී පටිසම්භිදා මග්ගටඨ කථා	ඩබ්ලිව්.ඇල්.පී. ධර්මදාස මහතා
48.	විසුද්ධි මාර්ගය පළමුවන කොටස	හේමචන්ද්‍ර දිසානායක මහතා
49.	විසුද්ධි මාර්ගය දෙවන කොටස	හේමචන්ද්‍ර දිසානායක මහතා
50.	කංඛා විතරණී මාතිකට්ඨ කථා	

නමින් අටුවාවක් ඇත. එය කංඛාවිතරණී ප්‍රාතිමෝක්ෂ වර්ණනාව හා එකම සමාන බැවින් පරිවර්තනය කර නැත.